බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා: 7

සූත්‍රාන්තපිටකයෙහි

01 වන ග්‍රන්ථය

දීඝනිකාය

ප්‍රථමභාගය

ශීලස්කන්ධවර්ගය

ලංකා බෞද්ධ මණ්ඩලයෙහි ආරාධනයෙන්

ශ්‍රී ලංකා විද්‍යෝදය විශ්ව විද්‍යාලයෙහි මහායාන බෞද්ධ ධර්මාංශයෙහි
ප්‍රමුඛාචාර්ය

අග්‍රමහාපණ්ඩිත
බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය නායක ස්ථවිරයන්
වහන්සේ

විසින් කරණ ලද

සිංහල පරිවර්තනයෙන් යුක්තයි.

බු.ව. 2550
ක්‍රි.ව. 2006

Buddha Jayanti Tripitaka Series, Volume 7

The First Book in the

Suttanta-Pitaka

1

DĪGHA-NIKĀYA (I)

With the Sinhala translation by

The Venerable Aggamahāpandita
Balangoda Ānanda Maitreya Nāyaka Thera
Professor of the Mahāyāna Buddha-Dharma at
the Vidyodaya University of Ceylon

නමෝ තස්ස භගවතෝ සබ්බධම්මේසු අප්පටිහතඤාණචාරස්ස දසබලධරස්ස
චතුවේසාරජ්ජවිසාරදස්ස සබ්බසත්තුත්තමස්ස ධම්මිස්සරස්ස ධම්මරාජස්ස ධම්මස්සාමිස්ස
තථාගතස්ස සබ්බඤ්ඤුනො සම්මාසම්බුද්ධස්ස !!!

භාග්‍යවත් වූ සියලු ධර්මයන්හි නොපැකිල ඥානචාර සහිත වූ දසබලධාරී වූ
චතුර්වෛශාරදත්ව විශාරද වූ සියලු සත්වයන්ට උත්තම වූ ධර්මයට ඊශ්වර වූ ධර්මරාජ වූ
ධර්මස්වාමී වූ තථාගත වූ සර්වඥ වූ සම්මා සම්බුදුනට නමස්කාර කරමි !!!

කෙළලක්ෂයක් සක්වලයන්හි සියලු ආර්යයෝ ද සියලු සත්පුරුෂයෝ ද
මාගේ නමස්කාරය පිළිගනිත්වා !!!

<u>බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා</u>
<u>පරිගණක ගත කර නොමිළයේ බෙදාහැරීමේ</u>
<u>මහා ධර්ම දානමය පුණ්‍යකර්මය</u>

"අපාරුතා තේසං අමතස්ස ද්වාරා
යේ සෝතවන්තෝ පමුඤ්චන්තු සද්ධං"

"කන් ඇත්තාහු සැදැහැ මුදත්වා
ඔවුනට අමා දොර විවෘත කරන ලදී"

අප භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම අනුසාසනය මෙහි ලා සිහි කිරීම ත්‍රිපිටක ශ්‍රී සද්ධර්මය පරිශීලනය කරන්නා වූ පින්වතුන්ගේ අභිවෘද්ධිය පිණිස ම වන බව අපගේ හැඟීම ය.

සැම කල්හි ඥාන සම්ප්‍රයුක්ත ව ක්‍රියා කරන්නා වූ සියලු සම්මා සම්බුදුරජාණන් වහන්සේලාගේ පලමු අනුශාසනය, බුද්ධ රත්නය කෙරෙහි ගෞරව කරන්නා වූ බුදුරජාණන් වහන්සේගේ සම්මා සම්බුදු බෝධිය අදහන්නා වූ කවර නම් පුද්ලයෙකු නො සළකා හිඳිත් ද ? චතු වෛශාරදත්ව සහිත වූ දශ බල සහිත වූ අනාවරණ ඥාන සහිත වූ සර්ව්ඥ වූ මහා කාරුණිකයන් වහන්සේ පවා නිවන අවබෝධ කර ගැනීම පිණිස ධම්මානුධම්ම ප්‍රතිපදාව ආරම්භ කරන පුද්ගලයා තුල 'සද්ධා' නම් වූ ගුණය අත්‍යාවශ්‍ය ය යන්න අවධාරනය කරන සේක.

මෙම ත්‍රිපිටක ශ්‍රී සද්ධර්මය සැක නොකළ යුතු ය. සැක කරමින් හදාරන ලෞකික ශිල්ප ශාස්ත්‍ර පවා පරිපූර්ණ ව නො පිහිටන බව සිහි ඇතිව බැලීමෙන් නුවණ ඇත්තාහට දැක ගත හැකි ය. පුරුෂයා ශ්‍රේෂ්ඨ බවට පමුනු වන්නා වූ සද්ධා ධනය සහිත ව ("සද්ධීධ විත්තං පුරිසස්ස සෙට්ඨං") මෙම ධර්ම රත්නය පරිශීලනය කරන්නාහට සද්ධා අංගයෙන් ලැබිය යුතු සියල්ල ලැබෙනු නො අනුමාන ය. එසේ ම සිහියෙන් ලැබිය යුතු කොටස ද වීර්යයෙන් ලැබිය යුතු කොටස ද සමාධියෙන් ලැබිය යුතු කොටස ද ප්‍රඥාවෙන් ලැබිය යුතු කොටස ද ලැබෙන පරිදි සද්ධා, සති, විරිය, සමාධි සහ ප්‍රඥා යන පංච ධර්මයන් තමා තුල ඇති කර ගෙන මහත් වූ ගෞරවය සහිත ව ධර්මාවබෝධය පිණිස ම යොමු වූ දැඩි අධිෂ්ඨානයෙන් මෙම ධර්ම පුස්තක පරිශීලනය කළ යුතු ය. අපගේ බුද්ධ ශාසනයෙහි

ධර්ම ශ්‍රවනයෙන් මග ඵල ලැබුවෝ ම අධික ය. විමුක්තිය ලබන්නා වූ ක්‍රම වේදයන් පහක් විස්තර කරන්නා වූ අංගුත්තර පංචක නිපාතයෙහි 'විමුත්තායතන' සූත්‍රයෙහි නිවන ලබන ක්‍රම වේද සතරක් ම ධම්ම දේශණාමය සහ ධම්ම සවනමය පුණ්‍ය කර්ම ඇසුරින් සිදුවන බව පැහැදිලි කර ඇත. පස්වැනි ක්‍රම වේදය භාවනාමය පුණ්‍ය කර්මය ප්‍රගුණ කිරීමෙන් සාර්ථක වන බව ද එහි සඳහන් වේ.

මහත් වූ ගෞරවාදරයෙන් මහා සුගතයන් වහන්සේගේ අනුශාසනය පිළිපදින්නා වූ අප්‍රමාදී ව ධම්මානුධම්ම ප්‍රතිපදාව වඩන්නා වූ සියලු සත්නට, ත්‍රෛකාලික වූ සියලු දුකින් මිදී ලබන්නා වූ අජර වූ අමර වූ අමා මහ නිවන අවබෝධ වීම පිණිස මෙම මහඟු පුණ්‍ය කර්මය උපනිශ්‍රය වේවා !

ආර්යයන් වහන්සේලා පහළවීමෙන් සිරිලක බැබලේවා !
බුද්ධ ශාසනය දියුණුවී චිරස්ථිතික වේවා !
ලෝ සත්නට සෙත් වේවා !

"අමතං දදෝ ච සෝ හෝති, යෝ ධම්මමනුසාසති"
(*යමෙක් ධර්මානුශාසනය කරන්නේ ද, හේ අමෘතය දෙන්නේ ය*)

මෙම ධර්ම දානමය පුණ්‍ය කර්මය
මෝහ තිමිර විධ්වංසනය කරන්නා වූ ලොවට උතුම් ආලෝකය වූ මහා කාරුණික වූ
සම්මාසම්බුදුරජාණන් වහන්සේගේ සර්වඥතා ඥානයට ද මහා කරුණා ගුණයට ද
පූජෝපහාරයක් ම වේවා !!!

කෙළලක්ෂයක් සක්වලයන්හි සියලු ආර්යයෝ ද සියලු සත්පුරුෂයෝ ද
අපගේ පුණ්‍ය කර්මය අනුමෝදන් වෙත්වා !!!

ශාසනාභිවෘද්ධිකාමී,
සමින්ද රණසිංහ.
2009.06.28

සුත්තන්තපිටකෙ

දීඝනිකායො

සීලක්ඛන්ධවගෙගා

සූත්‍රාන්තපිටකයෙහි

දීඝනිකාය

ශීලස්කන්ධවර්ගය

“තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති නො පටිච්ඡන්නො.”

“මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දේශනා කරණ ලද ධර්මය හා විනය විවෘත වූයේ බබලයි. වැසුණේ නො ම බබලයි.”

(අඞ්ගුත්තරනිකායෙ, තිකනිපාත - භරණ්ඩුවග්ග, 9 සූත්‍රය)

සැලකිය යුතුය : මෙම පොතෙහි පටුන, පිටු අංක 15 හි ඇතුලත් කර ඇත. එම පටුනෙහි මාතෘකාවන් හා පිටු අංක අදාළ පිටු සමඟ සම්බන්ධ කර ඇත. මෙහි කියවීමට ඇති ප්‍රදේශයට වම් පසින් ඇති 'පිටු යොමුව' භාවිතා කිරීමෙන් නැවත පටුනට පැමිණීමට පුලුවන. වම් පසින් පාළි පිටුව ද දකුණු පසින් අදාළ සිංහළ පිටුව ද කියවීම සඳහා VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS යන ක්‍රමය භාවිතා කරන්න.

Please note : The TABLE OF CONTENTS of this book is located in page no:15 and it is linked with associated pages in the book for your convenience. You can easily click on the page number or content description in the 'Table of Contents' and you will be directed to the relevant page. Bookmarks located to the left of reading area can be used to navigate back to 'Table of Contents' Page. If you would like to view Pali page on your left and the relevant Sinhala page on your right select the menu items as follows; VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS.

පටුන

CONTENTS

සංස්කාරක නිවේදනය	xix
සංඥපනය	xxi
සඞ්කේත නිරූපණය -Abbreviations	xxv
පාලි හෝඩිය-Pali Alphabet	xxvi
විෂයසූචි	xxvii
පෙළ හා පරිවර්තනය	2 - 643
පදානුක්‍රමණිකා	645 - 672
සඤ්ඤානාමානුක්‍රමණිකා	673 - 674

සංසකාරකනිවේදනය

සූත්‍රාන්තපිටකයෙහි චතුරාගම විසින් දන්නා ලද සිවුමඟ සඟි අතුරෙහි පළමු සඟිය වූ දීඝනිකායෙහි ශීලස්කන්ධවර්ගයෙන් යුත් ප්‍රථමභාගය බුද්ධජයන්ති ත්‍රිපිටකග්‍රන්ථමාලා සඛ්‍යායෙන් සත්වන – සූත්‍රාන්තපිටක ග්‍රන්ථසඛ්‍යායෙන් පළමු වන ග්‍රන්ථය වේ.

ලඞ්කාබෞද්ධමණ්ඩලය විසින් ආරාධිත වූ – දැනට ශ්‍රීලඞ්කා විශ්වෝදය විශ්වවිද්‍යාලයෙහි මහායාන බෞද්ධධර්මය පිළිබඳ ප්‍රමුඛාචාර්ය වූ බළන්ගොඩ ආනන්දමෛත්‍රේය නායක ස්ථවිරයන් වහන්සේ විසින් මෙහි පාළිය සිංහල භාෂායෙන් පරිවර්තනය කරණ ලදී.

භාෂාන්තර – සමයාන්තර අභ්‍යාසයෙන් දීප්ත වූ බුද්ධිප්‍රභා ඇති බැවින් තථාගතප්‍රවේදිත ධර්මිතයෙහි දුරවබෝධ වූ තැන් සුබෝධ කරලීමෙහි සමර්ථතා ඇති අඟහමහාපණ්ඩිත ආනන්දමෛත්‍රේය නායක ස්ථවිරයන් වහන්සේ විසින් දීඝනිකායාගත දිට්ඨිවිනිවෙඨන කථාදිය විෂය කොට ඇති ශීලස්කන්ධවර්ගයෙහි ගම්භීරාවභාසයෙන් යුත් පාළිපදයන්ට ලීලා අර්ථව්‍යාඛ්‍යානය පුරාතනාචාර්යවර්යයන්ගේ ව්‍යාඛ්‍යාස්වරූප ගෙණ ඇති බව එය කියන සුමතීන්ට වැටහෙනු නියතයි.

අපගේ අවසාන සංස්කරණයෙන් මුද්‍රණයට පැමිණි මේ ග්‍රන්ථය මෙසේ ප්‍රකට කරලීම පිළිබඳ සිය යුතුකම් ඉටු කළ සියලු පින්වත්හු ධර්මදානමය කුශලමහිමයෙන් සුඛභාගී වෙත්වා.

පරවාහැර වජිරඤාණ ස්ථවිර.
ත්‍රිපිටකපරිවර්තන කාරක සභාවෙහි ද
සංස්කාරක මණ්ඩලයෙහි ද සම්පාදක.

බුද්ධවර්ෂ 2505,
ත්‍රිපිටකකාර්යාලය,
ධර්මදූතාශ්‍රම විද්‍යාලය,
174, දෙමටගොඩ, කොළඹ.

සංක්ෂේපනය

දීඝනිකායඃ

මහාසංගීති තුනට තැගුණු බුද්ධවචනය සූත්‍ර අභිධර්ම විනය විසින් පිටක තුනෙකින් පරිපූර්ණ ය. එහි සූත්‍රපිටකය දීඝාගම (දික්සඟි), මජ්ඣිමාගම (මැදුම්සඟි), සංයුත්තාගම (සංයුත්සඟි), අඞ්ගුත්තරාගම (අඟුතුරු සඟි), ඛුද්දකාගම (කුදුගත්සඟි) යි පංචාගමයෙකින් (පඟි පසෙකින්) යුක්ත ය. එයින් පාඨශෝධන පූර්වක වැ සිංහලව්‍යාඛ්‍යා සහිත ව මෙහි පළවනුයේ දීඝාගමය ය. ඉතර සිවුසඟියෙහි එන සූත්‍රගතට වඩා දීර්ඝ වූ සූත්‍ර ඇතියෙන් මේ දීඝාගම - දීඝනිකාය නම් විය. එහි වර්ගයෝ සීලක්ඛන්ධ-වග්ග, මහාවග්ග, පාටිකවග්ග ය යි තුනෙකි. සූත්‍ර ගණන සූතිසෙක. මෙ හැම ඛණවර විසින් සූසැටෙක. සසුන් පිළිවෙතෙහි මූල ම වූ සිල් පිළිබඳ කථා බහුල වන බැවින් මුල් ම වර්ගය සීලක්ඛන්ධවග්ග නම් විය. ඉතිරි තෝ කොට හැම දිවු ම ඇතුලත් කොට දිට්ඨිවිනිවෙඨනය කළ බැවින් බ්‍රහ්මජාල සූත්‍රය එහි මුලට තැබිණ. එහෙයින් කිහු පැරැණි ටීකායෙහි:

"සීලකථාබහුලත්තා පන සීලක්ඛන්ධවග්ගො පඨමං නික්ඛිත්තො... දිට්ඨිවිනිවෙඨනකථාභාවතො පන සුත්තන්තපිටකස්ස නිරවසෙසදිට්ඨි-විභජනං බ්‍රහ්මජාලං පඨමං නික්ඛිත්තන්ති දට්ඨබ්බං" යි.

බුදුසව්වන් විසින් දෙසූ සූත්‍ර ද මෙහි ඇත. බුදුරජුන්ගේ ඉදිරියෙහි ම සැරිපුත්තෙරුන් සියලු බුද්ධවචනය කැපි කොට එකක-දුකාදි නයින් ගලපා දෙසූ දසුත්තරසූත්‍ර, සංගීතිසූත්‍ර දෙක මෙහි විශෙෂ ස්ථානයක් ගනී. මෙයට අනුව බුද්ධපරිනිර්වාණයෙන් පසු පැවැති සංගීති විසි සතක් වූ බව සිතිය හෙයි.

ත්‍රිපිටකය ම ප්‍රථම සංගීතියෙන් සංගීත වූයේ, බුදු රජුන් ධරමාණ කාලයෙහි ම සව්වන් විසින් අසා සිතැ දරා ගෙන ආ පරිදි ම ය. එය ටීකායෙහි මෙසේ දැක්වෙයි: "යෙහුය්‍යෙන හි තීණි පිටකානි භගවතො ධරමානකාලෙ සීතානුක්කමෙනෙව සංගීතානි, විසෙසතො විනයාභිධම්ම-පිටකානීති දට්ඨබ්බං" යි.

දීඝනිකායෙහි හැම සූත්‍රයෙක ම ශීලසමාධිප්‍රඥාකථාව බෙහෙවින් එයි. එහෙත් අතුරු කථාවන්හි බුද්ධකාලයෙහි මිනිසුන් අතර පැවැති සමාජචාරිත්‍ර, ඉතිහාසප්‍රවෘත්ති, නානා දෘෂ්ටිවාද, කුලවාද, විද්‍යා, ශිල්ප, රාජනීති ආදිය ද සඳහන් වෙයි.

අන්‍යශම්ප්‍රදායයෝ:

ථෙරවාදීන්ගෙන් ම බෙදී ගිය සබ්බත්ථිවාදීන්ගේ සූත්‍රපිටකයෙහි ද දීර්ඝාගම මධ්‍යමාගම සංයුක්තාගම එකොත්තරාගම ක්ෂුද්‍රකාගම යැ යි පස් ආගමයෙක් ඇත. එහි දීර්ඝාගමය මහාවිහාරීය ථෙරවාදීන්ගේ දීඝනිකායට ඇතැම් තැන්හි සමාන වුව ද වෙනස් තැන් බොහෝ වේ. බුද්ධඝෝෂ නම්

තෙරුන් විසින් ක්‍රි: ව: 412 – 413 පමණේ දී සකුවෙන් චීනභාෂාවට නගන ලද දීර්ඝාගමයෙහි සූත්‍ර 30 කි. අපගේ දික්සහියේ එන මහාලි ජාලිය සහ මහාසුදස්සන මහාසතිපට්ඨාන පාටික අඟුත්තරික පාසාදික ලක්ඛණ ආටානාටිය යන සූත්‍ර එහි දක්නට නැත. ඒ වෙනුවට පාළි දික්සහියේ නැති අන්‍ය වූ තමෙකින් හැඳින්වෙන සූත්‍ර කොනෙක් ඇත.

"එහි පළමු වැන්න චතුර්ශීති පිළිබඳ එකෙකි. දෙවැන්න එකොත්තර ධර්ම පිළිබඳ ය. තෙවැන්න ත්‍රිරාශිධර්ම පිළිබඳ ය. සිවුවැන්න නගර වර්ණනාවෙකි. පස් වැන්න ප්‍රතිපත්තිශුද්ධිය පිළිබඳ ය. සවැන්න ලෝකප්‍රජ්ඥප්ති පිළිබඳ ව ය."හි චීන සර්වාස්තිවාදී දීර්ඝාගමය පිරික්සා බැලූ **අනුකූල්චන්ද්‍ර බනර්ජී** මහතා[1] කියයි.

පාළි දික්සහියේ 34 වැන්න වූ දසුත්තර සූත්‍රය සර්වාස්තිවාදීන්ගේ පොතේ 10 වැන්න වී ඇත. පාළි පොතේ 16 වැන්න වූ මහාපරිනිර්වාණ සූත්‍රය සර්වාස්තිවාදීන්ගේ පොතේ දෙවෙනි සූත්‍රය වෙයි. පාළි පොතේ 15 වැන්න වූ මහානිදාන සූත්‍රය සර්වාස්තිවාදි පොතේ පළමුවැන්න ව සිටී. සංගීති සූත්‍රය පාළි පොතේ 33 වැන්න වුව ද සර්වාස්තිවාදි පොතේ 9 වැන්නයි. සත්විසිවන අඟුත්තරික සූත්‍රය ඒ පොතේ ම පස් වැන්න ව ද, සුවිසිවන පාටික සූත්‍රය පසළොස් වැන්න ව ද, එකුන්තිස්වන පාසාදික සූත්‍රය එහි සතළොස් වැන්න ව ද එයි.

පාළි දික්සහියේ 22 වැන්න වූ මහාසතිපට්ඨාන සූත්‍රය සර්වාස්ති-වාදීන්ගේ මධ්‍යමාගමයෙහි 98 සූත්‍රය ව ද, තිස්වන ලක්ෂණ සූත්‍රය එහි තිස් වැන්න ව ද, බ්‍රහ්මජාල සූත්‍රය එහි එක්විසි වැන්න ව ද සිටී.

චීන පොත්හි එන පිළිවෙළට වඩා පාළි දීඝනිකායේ එන සූත්‍ර පිළිවෙළ පිළිගත යුතු යැ යි ආචාර්ය Franke (ෆ්‍රාංක) කියයි.[2]

සම්මතිය ආදි අන් නිකායනට අයත් සූත්‍ර ග්‍රන්ථයන්හි මුල් පිටපත් මෙතෙක් සොයා ගෙන නැත. චීන – ටිබෙට් භාෂාවනට නගන ලද ඔවුන්ගේ ඇතැම් සූත්‍ර දක්නා ලැබෙතත් ඔවුන්ගේ ආගමයක් සම්පූර්ණයෙන් ඇති නියාවෙක් නො පෙනේ.

සූත්‍රසංක්ෂේප:

1. බ්‍රහ්මජාල සූත්‍රයෙහි – තෙරුවනට මෙරමා කරන තීර්ථයෙහි නොකිපියැ යුතු බව ද, තෙරුවන් ගුණ කියනු අසා උදම් නොවියැ යුතු බව ද, පුහුදුනන් කරන බුදුගුණවැනුම් සිල් පමණක් අරබැ කරන සුළු දෘෂ්ටියක් බව ද දක්වෙයි. එයට පසු ශීලකථා ද, දෙසැට මිසදිටු ද, දෘෂ්ටි-ශීර්ෂයෙන් ප්‍රතීත්‍යසමුත්පාදය ද, තථාගතයන් වහන්සේ දෘෂ්ටිජාලයෙන් මිදුණු බව ද දක්වේ.

---

1. Sarvastivadi Literature p. 23.
2. Origins of Buddhism by G. C. Pande. p 79, Zeitschrift fur Vergleichende Sprachforschung. 1913 (409f).

2. සාමඤ්ඤඵල සූත්‍රයෙහි – නිගණ්ඨනාතපුත්තාදි ශාස්තෘන් සදෙනාගේ බණ ද, සිල් පුරනු පටන් රහත් බව තෙක් ලබන මහණ දම් පල ද දැක්වෙයි.

3. අම්බට්ඨ සූත්‍රයෙහි – බුදු රජුන් අම්බට්ඨයාගේ කුල මන් බිඳුම, බමුණු කුලයට වඩා කැත්කුලය උසස් නියාව, වෛදිකයන්ගේ විදුවරණ, ශාසනික විදුවරණ, තවුස් පැවිද්ද ශාසනයේ විනාශමුඛය බව යන මෙතෙක් ද දැක්වේ.

4. සොණදණ්ඩ සූත්‍රයෙහි – සොණදණ්ඩබමුණාගේ බුදුගුණ වැනීම ද, බමුණන්ගේ ජාතිවාදදිගේ නිසරු බව ද, සැබෑ බමුණකු වන සැටි ද, ශීල ප්‍රඥා දෙකේ අගය ද පැවැසේ.

5. කූටදන්ත සූත්‍රයෙහි – දහැමි යාගයේ විස්තර දැක්වේ.

6. මහාලි සූත්‍රයෙහි – දෙව් රු දැකුම් ආදියට වඩන සමාධියේ තතු ද, මහණ දහමේ පරමාර්ථය ආර්‍ය ඵල ලාභය බව ද, රූප ජීව දෙක පිළිබඳ ව ඇති වාදකථා ද එයි.

7. ජාලිය සූත්‍රයෙහි – ජීවයත් රූපයත් එකෙක් ම ද? නැත හොත් දෙකෙක් ද?යි ප්‍රශ්නය ද, බුදුදහම් ඒ අන්ත දෙක ම නො ගන්නා බව ද දැක්වෙයි.

8. සීහනාද සූත්‍රයෙහි – බැහැරියන්ගේ තපොධර්ම ද, ශාසනික විමුක්ති ක්‍රමය ද, බුදු රජුන්ගේ සිංහනාදය ද දැක්වේ.

9. පොට්ඨපාද සූත්‍රයෙහි – සංඥා නිරෝධය ද, ශීලාදි ස්කන්ධ තුන ද, ආත්මවාද විභාගය ද, බුදුරජුන් වදාළ නොවදාළ දෑ ද, සස්සතාසස්සත, අන්තානන්තික, අමාරාවික්ඛේපික යන වාද ද, චතුස්සත්‍යය ද, ආත්මභාව ප්‍රතිලාභ තුන ද දැක්වේ.

10. සුභ සූත්‍රයෙහි – ආර්‍ය ශීල, ආර්‍ය සමාධි, ආර්‍ය ප්‍රඥා තුන දැක්වේ.

11. කේවට්ට* සූත්‍රයෙහි – තුන් පෙළහර ද, අනුශාසන ප්‍රාතිහාර්‍යයේ උතුම් බව ද, නාම රූප අනුත්පාද නිරෝධයට පැමිණෙන තැන ද දැක්වේ.

12. ලෝකිවව සූත්‍රයෙහි – 'පරහට දහම් නො දෙසිය යුතු ය' යන මිසදිටුවේ ආදීනව ද, වොදනාහී ශාස්තෘන් තිදෙනාගේ සැටි ද, අවෝදා ශාස්තෘහුගේ ගුණ ද දැක්වේ.

13. තෙවිජ්ජ සූත්‍රයෙහි – යාග හොම බඹලොව මඟ නොවන බව ද, සතර බඹවෙහෙර තතු ද, බඹා හා එක් වන මඟ ද දැක්වේ.

---

* බොහෝ පොත්හි 'කෙවට්ට' යැයි පෙනේ. මේ පිළිබඳ විවේචනයෙක් මතු උපන්‍යාසයෙහි එයි.

මේ සූත්‍ර තෙළෙහිත් ශීලස්කන්ධ වර්ගය නිමාවට යෙහි. ඉතිර සූත්‍ර පිළිබඳ කථා මී ළඟ කාණ්ඩ දෙක්හි එහි.

මේ සූත්‍රයන්හි එන අවිශද තැන් පිළිබඳ විවරණ ද, දික්ඝනිගේ තතු භගවන ප්‍රකෘතිවකාව ද දීඝනිකායේ තුන් වන කාණ්ඩයෙහි ඇතුළත් වෙයි.

මේ ශීලස්කන්ධ වර්ගයේ පෙළ හා ව්‍යාඛ්‍යානය සකස් කිරීමෙහි දර්ශනවිශාරද පරවාහැර වජිරඤාණ, කොළඹ තව කෝරළයේ ප්‍රධාන සඞ්ඝනායක සවාමීන්වහන්සේගේ ද, පණ්ඩිත ලබුගම ලංකානන්ද මහාස්ථවිරයන් වහන්සේගේ ද, පණ්ඩිත කෝදාගොඩ ඤාණාලෝක, දක්ෂිණ ලංකාවේ ප්‍රධාන සඞ්ඝනායක යතීන්ද්‍රයන් වහන්සේගේ ද උපදෙස් බොහෝ ප්‍රයෝජනවත් වූ බව කෘතඥතා පූර්වක ව සඳහන් කරමිහ.

බලන්ගොඩ ආනන්දමෛත්‍රෙය ස්ථවිර,

බුද්ධ වර්ෂ 2505 වන්නෙහි
ඉල් පුරපසොළොස්වක් ලත් කුජ දිනැ
ශ්‍රී ලංකා විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ දී යැ.

සඞ්කෙතනිරූපණය

ABBREVIATIONS

සී	——	තාලපණ්ණපොත්කං.
සීමු	——	සීහලකඛර – මුද්දිතපොත්කං.
ස්‍යා	——	ස්‍යාමකඛර – මුද්දිතපොත්කං.
මජසං	——	මරමමජ්ඣිමසඞ්ගීතිපිටකපොත්කං.
PTS.	——	Pali Text Society - Dighanikaya.

THE PĀLI ALPHABET

IN SINHALESE CHARACTERS.

VOWELS

අa ආā ඇæ ඉi ඊī උu ඌū එē ඔō

CONSONANTS

කka	ඛkha	ගga	ඝgha	ඞṅa
චca	ඡcha	ජja	ඣjha	ඤña
ටṭa	ඨṭha	ඩḍa	ඪḍha	ණṇa
තta	thta	දda	ධdha	නna
පpa	ඵpha	බba	භbha	මma

යya	රra	ලla	වva	සsa	හha	ළḷa	අංaṃ
කka	කාkā	කිki	කීkī	කුku	කූkū	කෙkē	කොkō
ඛkha	ඛාkhā	ඛිkhi	ඛීkhī	ඛුkhu	ඛූkhū	ඛෙkhē	ඛොkhō
ගga	=	=	=	=	=	=	=

Conjunct - Consonants

කක kka	ජ්ඣ jjha	ට්ඨ ttha	බ්‍ර bra
ක්ඛ kkha	ඤ්ඤ ññ	ත්‍ර tra, ත්ව tva	ම්ප mpa
ක්‍ය kya	ඤ්ඣ ñha	ද්ද dda	ම්ඵ mpha
ක්‍රි kri	ඤ්ච, ච ñca	ද්ධ, ඩ ddha	ම්බ, ඹ mba
ක්ව kva	ඤ්ඡ, ඡ ñcha	ද්‍ර dra	ම්භ mbha
ඛ්‍ය khya	ඤ්ජ, ජ ñja	ද්ව, dva	ම්ම mma
ඛ්ව khva	ඤ්ඣ ñjha	ධ්ව dhva	ම්හ mha
ඞ්ක ṅka	ට්ට ṭṭa	න්ත nta	ය්‍ය, ය්‍ය yya
ඞ්ඛ ṅkha	ට්ඨ, ඨ ṭṭha	න්ථ ntha	ය්හ yha
ඟ්ග gga	ඩ්ඩ ḍḍa	න්ද nda	ල්ල lla
ඟ්ඝ ggha	ඩ්ඪ ḍḍha	න්ධ ndha	ල්‍ය lya
ග්‍ර gra	ණ්ණ ṇṇa	න්න nna,	ල්හ lha
ඟ්ග ṅga	ණ්ට ṇṭa	න්හ nha	ව්හ wha
ඟ්ඝ ṅgha	ණ්ඨ ṇṭha	ප්ප ppa	ස්ස ssa
ච්ච cca	ණ්ඩ, ඩ ṇḍa	ප්ඵ ppha	ස්ම sma
ච්ඡ ccha	ණ්හ ṇha	බ්බ bba	ස්ව swa
ජ්ජ jja	ත්ත tta	බ්භ bbha	හ්ම hma
	හ්ව hva	ළ්හ ḷha	

ා ෘ ි ී ු ූ ෙ ො

විසයසූචි

දීඝනිකායෙ සීලක්ඛන්ධවග්ගො

විසයා	පිටඨඛකා
1. බ්‍රහ්මජාලසුත්තං	2 – 80
2. සාමඤ්ඤඵලසුත්තං	82 – 148
3. අම්බට්ඨසුත්තං	150 – 220
4. සොණදණ්ඩසුත්තං	222 – 246
5. කූටදන්තසුත්තං	248 – 322
6. මහාලිසුත්තං	324 – 346
7. ජාලියසුත්තං	348 – 354
8. සීහනාදසුත්තං	356 – 386
9. පොට්ඨපාදසුත්තං	388 – 436
10. සුභසුත්තං	438 – 482
11. කෙවට්ටසුත්තං	484 – 538
12. ලොහිච්චසුත්තං	540 – 592
13. තෙවිජ්ජසුත්තං	594 – 642

සීලක්ඛන්ධවග්ගො නිට්ඨිතො.

සුත්තන්තපිටකෙ

දීඝනිකායො

පඨමො භාගො

සීලක්ඛන්ධවගෙගො

සුත්තන්තපිටකෙ

දීඝනිකායො

සීලක්ඛන්ධවග්ගො

—:—

නමො තස්ස භගවතො අරහතො
සම්මාසම්බුද්ධස්ස.

1.

බ්‍රහ්මජාලසුත්තං

1. එවං මෙ සුතං එකං සමයං භගවා අන්තරා ච **රාජගහං** අන්තරා ච **නාලන්දං** අද්ධානමග්ගපටිපන්නො හොති මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි. **සුප්පියො**'පි ඛො පරිබ්බාජකො අන්තරා ච රාජගහං අන්තරා ච නාලන්දං අද්ධානමග්ගපටිපන්නො හොති සද්ධිං අන්තෙවාසිනා **බ්‍රහ්මදත්තෙන** මාණවෙන.

තත්‍ර සුදං **සුප්පියො** පරිබ්බාජකො අනෙකපරියායෙන බුද්ධස්ස අවණ්ණං භාසති, ධම්මස්ස අවණ්ණං භාසති, සඞ්ඝස්ස අවණ්ණං භාසති. **සුප්පියස්ස** පන පරිබ්බාජකස්ස අන්තෙවාසී **බ්‍රහ්මදත්තො** මාණවො අනෙකපරියායෙන බුද්ධස්ස වණ්ණං භාසති, ධම්මස්ස වණ්ණං භාසති, සඞ්ඝස්ස වණ්ණං භාසති. ඉතිහ තෙ උභො ආචරියන්තෙවාසී අඤ්ඤමඤ්ඤස්ස උජුවිපච්චනීකවාදෙ භගවන්තං පිට්ඨිතො පිට්ඨිතො අනුබන්ධා[1] හොන්ති භික්ඛුසඞ්ඝං ච.

2. අථ ඛො භගවා **අම්බලට්ඨිකායං** රාජාගාරකෙ එකරත්තිවාසං උපගංසි සද්ධිං භික්ඛුසඞ්ඝෙන. සුප්පියො'පි ඛො පරිබ්බාජකො **අම්බලට්ඨිකායං** රාජාගාරකෙ එකරත්තිවාසං උපගංසි සද්ධිං අන්තෙවාසිනා බ්‍රහ්මදත්තෙන මාණවෙන. තත්‍ර'පි සුදං **සුප්පියො** පරිබ්බාජකො අනෙකපරියායෙන බුද්ධස්ස අවණ්ණං භාසති, ධම්මස්ස අවණ්ණං භාසති, සඞ්ඝස්ස අවණ්ණං භාසති. **සුප්පියස්ස** පන පරිබ්බාජකස්ස අන්තෙවාසී **බ්‍රහ්මදත්තො** මාණවො බුද්ධස්ස වණ්ණං භාසති, ධම්මස්ස වණ්ණං භාසති, සඞ්ඝස්ස වණ්ණං භාසති. ඉතිහ තෙ උභො ආචරියන්තෙවාසී අඤ්ඤමඤ්ඤස්ස උජුවිපච්චනීකවාදෙ විහරන්ති.

---

1. අනුබන්ධා, මජ්ජ ස.

සුත්‍රාන්තපිටකයෙහි

දීඝනිකාය

සීලක්ඛන්ධවග්ගය

—:—

ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේට
නමස්කාර වේ වා.

1.

බ්‍රහ්මජාලසූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ පන්සියක් පමණ වූ මහත් භික්ෂුසඟන සමග රජගහනුවරටත් නාලන්ද නුවරටත් අතරෙහි දීඝීමාර්ගයට පිළිපන්සේක් වෙති. සුප්පිය නම් පිරිවැජියාත් බඹදත් නම් තරුණ අතැවැස්සා සමග රජගහ නුවරටත් නාලන්ද නුවරටත් අතර වූ දික් මඟට පිළිපන්නේ වේ. එහි දී සුප්පිය පිරිවැජි නොයෙක් කරුණින් බුදුරජාණන් වහන්සේට දොස් කියයි, ධර්මයට දොස් කියයි, සංඝයාට දොස් කියයි. එහෙත් ඔහුගේ අතැවැසි තරුණ බඹදත් තෙමේ නොයෙක් කරුණින් බුදුරජාණන් වහන්සේ පසසයි, ධර්මය පසසයි, සංඝයා පසසයි. මෙසේ ඒ ඇදුරු අතැවැසි දෙදෙන එකෙක් අනෙකාට ඉදුරා ම විරුද්ධවාද ඇත්තෝ භාග්‍යවතුන් වහන්සේත් භික්ෂුපරිෂත් අනු ව ගියෝ වෙත්.

2. ඉක්බිත් භාග්‍යවතුන් වහන්සේ අම්බලට්ඨිකා උයනෙහි රාජාගාරකයෙහි (රජ ගෙහි) භික්ෂුසඟන සමග එක් රැයක් නවාතැනට එළැඹිසේක. බඹදත් නම් තරුණ අතැවැස්සා හා සුප්පිය පිරිවැජ්ජාත් එක් රැයක් විසීමට එහි ම එළැඹියේ ය. එහි දී ද සුප්පියපිරිවැජ්ජා නොයෙක් කරුණින් බුදු රජාණන් වහන්සේට නිඳා කෙරෙයි, ධර්මයට නිඳා කෙරෙයි, සංඝයාට නිඳා කෙරෙයි. ඔහුගේ අතැවැසි තරුණ බඹදතා නොයෙක් කරුණින් බුදුගුණ කියයි, දහම්ගුණ කියයි, සඟගුණ කියයි. මෙසේ ඒ ඇදුරු අතැවැසි දෙදෙනා එකෙක් අනෙකාට ඉදුරා ම විරුද්ධවාද ඇත්තෝ වැ වෙසෙත්.

3. අථ ඛො සම්බහුලානං භික්ඛූනං රත්තියා පච්චූසසමයං පච්චුට්ඨිතානං මණ්ඩලමාළෙ සන්නිසින්නානං සන්නිපතිතානං අයං සඞ්ඛියාධම්මො උදපාදි: "අච්ඡරියං ආවුසො, අබ්භුතං ආවුසො, යාවඤ්චිදං තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන සත්තානං නානාධිමුත්තිකතා සුප්පටිවිදිතා. අයං හි සුප්පියො පරිබ්බාජකො අනෙකපරියායෙන බුද්ධස්ස අවණ්ණං භාසති, ධම්මස්ස අවණ්ණං භාසති, සඞ්ඝස්ස අවණ්ණං භාසති. සුප්පියස්ස පන පරිබ්බාජකස්ස අන්තෙවාසී බ්‍රහ්මදත්තො මාණවො අනෙකපරියායෙන බුද්ධස්ස වණ්ණං භාසති, ධම්මස්ස වණ්ණං භාසති, සඞ්ඝස්ස වණ්ණං භාසති. ඉතිහ'මෙ උභො ආචරියන්තෙවාසී අඤ්ඤමඤ්ඤස්ස උජුවිපච්චනීකවාදා භගවන්තං පිට්ඨිතො පිට්ඨිතො අනුබද්ධා හොන්ති භික්ඛුසඞ්ඝං වා"ති.

4. අථ ඛො භගවා තෙසං භික්ඛූනං ඉමං සඞ්ඛියාධම්මං විදිත්වා යෙන මණ්ඩලමාළො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: "කාය නු' ත්ථ භික්ඛවෙ එතරහි කථාය සන්නිසින්නා සන්නිපතිතා? කා ච පන වො අන්තරා කථා විප්පකතා?" ති.

එවං වුත්තෙ තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: "ඉධ භන්තෙ අම්හාකං රත්තියා පච්චූසසමයං පච්චුට්ඨිතානං මණ්ඩලමාළෙ සන්නිසින්නානං සන්නිපතිතානං අයං සඞ්ඛියාධම්මො උදපාදි "අච්ඡරියං ආවුසො, අබ්භුතං ආවුසො යාවඤ්චිදං තෙන භගවතා අරහතා සම්මාසම්බුද්ධෙන සත්තානං නානාධිමුත්තිකතා සුප්පටිවිදිතා. අයං හි සුප්පියො පරිබ්බාජකො අනෙකපරියායෙන බුද්ධස්ස අවණ්ණං භාසති, ධම්මස්ස අවණ්ණං භාසති, සඞ්ඝස්ස අවණ්ණං භාසති. සුප්පියස්ස පන පරිබ්බාජකස්ස අන්තෙවාසී බ්‍රහ්මදත්තො මාණවො අනෙකපරියායෙන බුද්ධස්ස වණ්ණං භාසති, ධම්මස්ස වණ්ණං භාසති, සඞ්ඝස්ස වණ්ණං භාසති. ඉතිහ 'මෙ උභො ආචරියන්තෙවාසී අඤ්ඤමඤ්ඤස්ස උජුවිපච්චනීකවාදා භගවන්තං පිට්ඨිතො පිට්ඨිතො අනුබද්ධා හොන්ති භික්ඛුසඞ්ඝඤ්චා'ති. අයං ඛො නො භන්තෙ අන්තරාකථා විප්පකතා. අථ භගවා අනුප්පත්තො" ති.

5. "මමං වා භික්ඛවෙ පරෙ අවණ්ණං භාසෙය්‍යුං, ධම්මස්ස වා අවණ්ණං භාසෙය්‍යුං, සඞ්ඝස්ස වා අවණ්ණං භාසෙය්‍යුං, තත්‍ර තුම්හෙහි න ආඝාතො න අප්පච්චයො න චෙතසො අනභිරද්ධි කරණීයා. මමං වා භික්ඛවෙ පරෙ අවණ්ණං භාසෙය්‍යුං, ධම්මස්ස වා අවණ්ණං භාසෙය්‍යුං, සඞ්ඝස්ස වා අවණ්ණං භාසෙය්‍යුං, තත්‍ර චෙ තුම්හෙ අස්සථ කුපිතා වා අනත්තමනා වා, තුම්හං යෙවස්ස තෙන අන්තරායො. මමං වා භික්ඛවෙ පරෙ අවණ්ණං භාසෙය්‍යුං, ධම්මස්ස වා අවණ්ණං භාසෙය්‍යුං, සඞ්ඝස්ස වා අවණ්ණං භාසෙය්‍යුං, තත්‍ර තුම්හෙ අස්සථ කුපිතා වා අනත්තමනා වා, අපි නු පරෙසං සුභාසිතං දුබ්භාසිතං තුම්හෙ ආජානෙය්‍යාථ?"ති

"නො හෙතං භන්තෙ."

"මමං වා භික්ඛවෙ පරෙ අවණ්ණං භාසෙය්‍යුං, ධම්මස්ස වා අවණ්ණං භාසෙය්‍යුං, සඞ්ඝස්ස වා අවණ්ණං භාසෙය්‍යුං, තත්‍ර තුම්හෙහි අභූතං අභූතතො නිබ්බෙඨෙතබ්බං: 'ඉති'පෙතං අභූතං. ඉති'පෙතං අතච්ඡං. නත්ථි වෙතං අම්හෙසු. න ච පනෙතං අම්හෙසු සංවිජ්ජති' ති."

3. ඉක්බිති රෑ අලුයම්හි නැගී සිටි, නිශිදන ශාලායෙහි රැස් වැ හුන් බොහෝ භික්ෂූන් අතරැ මේ කථාව පහළ විය: "ඇවැත්නි, සත්ත්වයන්ගේ ආශයානුශයයන් දක්නා, අර්හත් වූ සම්‍යක්සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් සත්ත්වයන්ගේ එකකු අනෙකකුට වෙනස් අදහස් ඇති නියාව කොතරම් මැනැවින් සියල්ල දන්නා ලද්දෙ ද යන මෙය ආශ්චර්ය ය, අද්භූත ය. මේ සුප්පියපිරිවැජියා වනාහි නොයෙක් කරුණින් බුදු රජාණන් වහන්සේට දෙස් කියයි, ධර්මයට දෙස් කියයි, සංඝයාට දෙස් කියයි. එහෙත් මොහු තරුණ අතැවැසි බඹදත් තෙමේ නොයෙක් කරුණින් බුදු ගුණ කියයි, දහම් ගුණ කියයි, සඟගුණ කියයි. මෙසේ මේ ඇඳුරු අතැවැසි දෙදෙන එකෙක් අනෙකාට ඉඳුරා විරුද්ධකථා ඇත්තෝ භාග්‍යවතුන් වහන්සේත් භික්ෂුසංඝයාත් පසුපස්සෙහි ගියෝ වෙති" යනු සි.

4. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂූන්ගේ මේ කථාව දැන, නිශිදනශාලාව කරා එළැඹිසේක. එළැඹ, පණවන ලද අස්නෙහි හිඳ ගත් සේක. හිඳ ගෙන ම, භික්ෂූන් අමතා "මහණෙනි, තෙපි දැන් කවර කථාවෙකින් හුන්නෝ වහු ද? කවර නම් අතුරු කථාවෙක් තොප විසින් අඹාල කරන ලද දැ?" සි විචාරා වදාළ සේක.

මෙසේ වදාළ කල්හි, ඒ භික්ෂූහු "වහන්ස, මෙහි රෑ අලුයම්හි නැගී සිටි, නිශිදනශාලායෙහි රැස් ව හුන් අප අතරැ මේ කථාව පහළ විය: 'ඇවැත්නි, සත්ත්වයන්ගේ ආශයානුශය දන්නා, සියල්ල දක්නා, ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ විසින් සත්ත්වයන් එකකු අනෙකකුට වෙනස් අදහස් ඇති නියා කොතරම් මැනැවින් දන්නා ලද ද' යන මෙය ආශ්චර්ය ය, අද්භූත ය. මේ සුප්පිය පිරිවැජියා නොයෙක් කරුණින් බුදුරජාණන් වහන්සේට දෙස් කියයි, ධර්මයට දෙස් කියයි, සංඝයාට දෙස් කියයි. එහෙත් ඔහු තරුණ අතැවැසි බඹදතා නොයෙක් කරුණින් බුදුගුණ කියයි, දහම්ගුණ කියයි, සඟගුණ කියයි. මෙසේ මේ ඇඳුරු අතැවැසි දෙදෙනා එකෙක් අනෙකාට ඉඳුරා විරුද්ධ කථා ඇති වැ භාග්‍යවතුන් වහන්සේත් භික්ෂු සංඝයාත් පසු පස්සෙහි ගියෝ වෙති" සි වහන්ස, අප අතරැ මේ කථාව අඹාල විය. එ විටැ භාග්‍යවතුන් වහන්සේ මෙහි එළැඹි සේකැ" සි භාග්‍යවතුන් වහන්සේට සැල කළහ.

5. (ඒ භික්ෂූන්ගේ කථාව අසා භාග්‍යවතුන් වහන්සේ වදාරන සේක්) "මහණෙනි, අනුන් මට දෙස් කියතොත්, ධර්මයට හෝ දෙස් කියතොත්, සංඝයාට හෝ දෙස් කියතොත්, එ තන්හි දී තොප විසින් කොප නො ඉපැදුවියැ යුතු ය. නොසතුට නො ම ඉපැදුවියැ යුතු ය. සිතැ අමනාප බව නො කට යුතු ය. මහණෙනි, අනුන් මට දෙස් කියතොත්, ධර්මයට හෝ දෙස් කියතොත් සඟඝයාට හෝ දෙස් කියතොත් ඒ දෙස් කීමෙහි තෙපි කිපෙන්නහු නම්, නොසතුටු හෝ වන්නහු නම්, එයින් තොපට ම (තොපගේ ම ධ්‍යානලාභාදියට) අන්තරාය (බාධා) වන්නේ ය.

"මහණෙනි, අනුන් මට හෝ ධර්මයට හෝ සංඝයාට හෝ දෙස් නගතොත්, එහි තෙපි කුපිත වන්නහු නම්, එසේ කල්හි තෙපි ඒ අනුන් කී දැ සුභාෂිත ද (සත්‍ය කථාවෙක් ද) නැත හොත් දුර්භාෂිත ද (අසත්‍ය කථාවෙක් ද) සි දැනැ ගත හැකි වන්නහු ද?" සි ප්‍රශ්න කළ සේක.

"වහන්ස, මෙය නො වන්නේ ම යැ (කිපුණොත් කියන කථාවේ ඇත්ත නැත්ත දැන ගත හැකි නො වන්නමෝ මැ යැ)" සි ඒ භික්ෂූහු උත්තර දුන්හ.

(එ විට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.) "මහණෙනි, අනුන් මට හෝ ධර්මයට හෝ සංඝයාට හෝ දෙස් කියතොත්, එහි තොප විසින් 'මේ කාරණයෙනුත් මෙය අභූතයෙකි. මේ කාරණයෙනුත් මෙය අසත්‍යයෙකි. මේ කියන දෙෂය අප කෙරෙහි නැත, මෙය අප කෙරෙහි අවිද්‍යමාන යැ' සි නැති දෙස් නැති සැටියට ම ලිහා ඉවත් කළ යුතු ය."

6. "මමං වා භික්ඛවෙ පරෙ වණ්ණං භාසෙය්‍යුං, ධම්මස්ස වා වණ්ණං භාසෙය්‍යුං, සඞ්ඝස්ස වා වණ්ණං භාසෙය්‍යුං, තත්‍ර තුම්හෙහි න ආනන්දො න සොමනස්සං න චෙතසො උබ්බිලාවිතත්තං[1] කරණීයං. මමං වා භික්ඛවෙ පරෙ වණ්ණං භාසෙය්‍යුං, ධම්මස්ස වා වණ්ණං භාසෙය්‍යුං, සඞ්ඝස්ස වා වණ්ණං භාසෙය්‍යුං, තත්‍ර චෙ තුම්හෙ අස්සථ ආනන්දිනො සුමනා උබ්බිලාවිතො[2], තුම්හං යෙවස්ස තෙන අන්තරායො. මමං වා භික්ඛවෙ පරෙ වණ්ණං භාසෙය්‍යුං, ධම්මස්ස වා වණ්ණං භාසෙය්‍යුං, සඞ්ඝස්ස වා වණ්ණං භාසෙය්‍යුං, තත්‍ර තුම්හෙහි භූතං භූතතො පටිජානිතබ්බං: "ඉති'පෙතං භූතං, ඉති'පෙතං තච්ඡං. අත්ථි චෙතං අම්හෙසු. සංවිජ්ජති ච පනෙතං අම්හෙසු'ති."

7. "අප්පමත්තකං ඛො පනෙතං භික්ඛවෙ ඔරමත්තකං සීලමත්තකං, යෙන පුථුජ්ජනො තථාගතස්ස වණ්ණං වදමානො වදෙය්‍ය. කතමඤ්ච තං භික්ඛවෙ අප්පමත්තකං ඔරමත්තකං සීලමත්තකං, යෙන පුථුජ්ජනො තථාගතස්ස වණ්ණං වදමානො වදෙය්‍ය. ?

8. "පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො සමණො ගොතමො නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණභූත-හිතානුකම්පී විහරතී"ති. ඉති වා හි භික්ඛවෙ පුථුජ්ජනො තථාගතස්ස වණ්ණං වදමානො වදෙය්‍ය.

9. "අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො සමණො ගොතමො දින්නාදායී දින්නපාටිකඞ්ඛී අථෙනෙන සුචිභූතෙන අත්තනා විහරතී"ති. ඉති වා හි භික්ඛවෙ පුථුජ්ජනො තථාගතස්ස වණ්ණං වදමානො වදෙය්‍ය.

10. "අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී සමණො ගොතමො ආරාචාරී විරතො මෙථුනා ගාමධම්මා"ති. ඉති වා හි භික්ඛවෙ පුථුජ්ජනො තථාගතස්ස වණ්ණං වදමානො වදෙය්‍ය.

11. "මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො සමණො ගොතමො සච්චවාදී සච්චසන්ධො ඨෙතො පච්චයිකො අවිසංවාදකො ලොකස්සා"ති. ඉති වා හි භික්ඛවෙ පුථුජ්ජනො තථාගතස්ස වණ්ණං වදමානො වදෙය්‍ය.

---

1. උබ්බිල්ලාවිතත්තං, ම ජ සං. 2. උබ්බිල්ලාවිතො, ම ජ සං.

6. "මහණෙනි, අනුන් මාගේ හෝ ධර්මයේ හෝ සංඝයාගේ හෝ ගුණ කියතොත්, එහි තොප විසින් ප්‍රීතිය නො ඉපැදවිය යුතු ය. සොම්නස නො කළ යුතු ය. සිතෙහි ප්‍රීතියෙන් ඉල්පුණුබව නො කළ යුතු ය. මහණෙනි, අනුන් මාගේ හෝ ගුණ කියතොත්, ධර්මයේ හෝ ගුණ කියතොත්, සංඝයාගේ හෝ ගුණ කියතොත්, එහි තෙපි ප්‍රීත වන්නහු නම්, සතුටු වන්නහු නම්, තොපට ම එයින් අන්තරාය වේ. (=තොපගේ ම ධ්‍යානාදිගුණලාභයට එය බාධක වේ.) මහණෙනි, අනුන් මාගේ හෝ ධර්මයේ හෝ සඞ්ඝයාගේ හෝ ගුණ කියතොත්, එහි තොප විසින් 'මේ කරුණිනුත් මෙය ඇත්ත ය. මේ කරුණිනුත් මෙය එසේ ම ඇති එකෙක. මෙය අප කෙරෙහි ඇත්තේ වේ. මෙය අප තුළ විද්‍යමාන ම යැ'යි ඇතිගුණ ඇතිගුණ වශයෙන් පිළිනි කට යුතු යි.

7. මහණෙනි, තථාගතයන්ගේ ගුණ කියන පුහුදුන් තෙමේ යමෙකින් (=ඔවුන් වහන්සේ කෙරෙහි වූ යම් ගුණයක් කරණ කොට ගෙන) කියන්නේ නම්, ඔහු කියන ඒ ගුණය අල්පමාත්‍ර එකෙක. සවල්ප-මාත්‍ර එකෙක. ආචාරශීලගුණ පමණක් ම වූ මඳ දෙයෙක. මහණෙනි, තථාගතයන්ගේ ගුණ කියන පුහුදුන් තෙමේ යමෙකින් කියන්නේ නම්, ඔහු කියන ඒ අල්පමාත්‍ර වූ සවල්පමාත්‍ර වූ ශීලමාත්‍ර වූ ගුණය කවරේ ද? යත්:-

8. "ශ්‍රමණගෞතම තෙමේ පණිවා හැර දමා, පණිවායෙන් වැළැක්කේ ය. බහා තැබූ දඬුමුගුරු ඇත්තේ ය (දඬු මුගුරු නො දරන්නේ ය). බහා තැබූ ආයුධ ඇත්තේ ය (ආයුධ නො දරන්නේ ය). පවට පිළිකුල් කරන්නේ ය. මෛත්‍රියට පැමිණියේ ය. (මෛත්‍රියෙන් යුක්ත ය). සියලු සතුන් කෙරෙහි හිතානුකම්පා ඇති ව වෙසේ යැ"යි මෙසේ හෝ මහණෙනි, තථාගතයන්ගේ ගුණ කියන පුහුදුන් තෙමේ කියන්නේ ය.

9. "ශ්‍රමණගෞතම තෙමේ අසිනාදත් හැර දමා අසිනාදනින් වැළැකුණේ ය. දුන් දෙය ම පිළිගන්නාසුලු ය. දුන් දෙය ම සිතිනුත් කැමැති වැ ඉවසන සුලු ය. තොසොර වූ පිරිසිදුසිතින් යුතු වැ වෙසේ යැ" යි මෙසේ හෝ මහණෙනි, තථාගතයන්ගේ ගුණ කියන පුහුදුන් තෙමේ කියන්නේ ය.

10. "ශ්‍රමණගෞතම තෙමේ අබ්‍රහ්මචරිය දුරු කොට බඹසර හැසිරෙන්නේ ය. ගැමි දහමක් වූ මෙවුන්දමින් දුරු වැ හැසිරෙන්නේ එයින් වැළැක්කේ යැ" යි මහණෙනි, මෙසේ හෝ තථාගතයන්ගේ ගුණ කියන පුහුදුන් තෙමේ කියන්නේ ය.

11. "ශ්‍රමණගෞතම තෙමේ බොරු කීම දුරු ලා, බොරු කීමෙන් වැළැක්කේ ය. ඇත්ත කියන්නේ ය. ඇත්තෙන් ඇත්ත ගලපා කියන්-නේ ය. තහවුරු වැ පිහිපි කථා ඇත්තේ ය. ඇදහිය යුතු කථා ඇත්තේ ය. ලොව නො රවටන්නෙකැ" යි මහණෙනි, මෙසේ හෝ තථා-ගතයන්ගේ ගුණ කියන පුහුදුන් තෙමේ කියන්නේ ය.

12. "පිසුණං වාචං පහාය පිසුණාය වාචාය පටිවිරතො සමණො ගොතමො. ඉතො සුත්වා න අමුත්‍ර අක්ඛාතා ඉමෙසමෙදාය. අමුත්‍ර වා සුත්වා න ඉමෙසං අක්ඛාතා අමූසමෙදාය. ඉති භින්නානං වා සන්ධාතා සංහිතානං වා අනුප්පදාතා. සමග්ගාරාමො සමග්ගරතො සමග්ගනන්දී සමග්ගකරණිං වාචං භාසිතා"ති. ඉති වා හි භික්ඛවෙ පුථුජ්ජනො තථාගතස්ස වණ්ණං වදමානො වදෙය්‍ය.

13. "ඵරුසං වාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතො සමණො ගොතමො. යා සා වාචා නෙලා කණ්ණසුඛා පෙමනීයා හදයඞ්ගමා පොරී බහුජනකන්තා බහුජනමනාපා, තථාරූපිං වාචං භාසිතා"ති. ඉති වා හි භික්ඛවෙ පුථුජ්ජනො තථාගතස්ස වණ්ණං වදමානො වදෙය්‍ය.

14. "සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතො සමණො ගොතමො, කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී, නිධානවතිං වාචං භාසිතා කාලෙන සාපදෙසං පරියන්තවතිං අත්ථසංහිතන්ති" ඉති වා හි භික්ඛවෙ පුථුජ්ජනො තථාගතස්ස වණ්ණං වදමානො වදෙය්‍ය.

15. "බීජගාමභූතගාමසමාරම්භා පටිවිරතො සමණො ගොතමො. එකභත්තිකො සමණො ගොතමො රත්තූපරතො විරතො විකාලභොජනා. නච්චගීතවාදිතවිසූකදස්සනා පටිවිරතො සමණො ගොතමො. මාලාගන්ධවිලෙපනධාරණමණ්ඩනවිභූසනට්ඨානා පටිවිරතො සමණො ගොතමො. උච්චාසයනමහාසයනා පටිවිරතො සමණො ගොතමො. ජාතරූපරජතපටිග්ගහණා පටිවිරතො සමණො ගොතමො. ආමකධඤ්ඤපටිග්ගහණා පටිවිරතො සමණො ගොතමො. ආමකමංසපටිග්ගහණා පටිවිරතො සමණො ගොතමො. ඉත්ථිකුමාරිකපටිග්ගහණා පටිවිරතො සමණො ගොතමො. දාසිදාසපටිග්ගහණා පටිවිරතො සමණො ගොතමො. අජෙළකපටිග්ගහණා පටිවිරතො සමණො ගොතමො. කුක්කුටසූකරපටිග්ගහණා පටිවිරතො සමණො ගොතමො. හත්ථිගවාස්සවළවපටිග්ගහණා පටිවිරතො සමණො ගොතමො. ඛෙත්තවත්ථුපටිග්ගහණා පටිවිරතො සමණො ගොතමො. දූතෙය්‍ය පහිණගමනානුයොගා පටිවිරතො සමණො ගොතමො. කයවික්කයා පටිවිරතො සමණො ගොතමො. තුලාකූට-කංසකූට-මානකූටා පටිවිරතො සමණො ගොතමො. උක්කොටන-වඤ්චන-නිකති-සාවියොගා පටිවිරතො සමණො ගොතමො. ඡේදන-වධබන්ධන-විපරාමොස- ආලොප-සහසාකාරා පටිවිරතො සමණො ගොතමො"ති. ඉති වා හි භික්ඛවෙ පුථුජ්ජනො තථාගතස්ස වණ්ණං වදමානො වදෙය්‍ය.

චුල්ලසීලං නිට්ඨිතං.

12. "ශ්‍රමණ ගෞතම තෙමේ පිසුණු බස් දුරු ලා, පිසුණු කිණිමෙන් වැළැක්කේ ය. මේ තැනින් අසා ගෙන මොවුන් කිඳුවනු පිණිස එ තන්හි නො කියනසුලු ය. එ තැනින් අසා ගෙන ඔවුන් කිඳුවනු පිණිස මෙ තන්හි නො කියන සුලු ය. මෙ සේ බිඳුණවුන් ගළපන්නේ (සමග කරන්නේ) ද වෙයි. එකට ගැළැපුණවුන්හට (=සමගියට පැමිණ සිටිනවුන් හට) රැකුල් දෙන්නේ ද වෙයි. සමගියෙන් සිටිනවුන් හා වාසය කැමැත්-තේ ය. සමගියෙන් වසන්නවුනට කැමැත්තේ ය. සමග ව සිටින්නවුනට සතුටු ය. සමගිය ඇති කරන බස් කියන්නේ යැ" යි මෙසේ හෝ මහණෙනි, තථාගතයන්ගේ ගුණ කියන පුහුදුන් තෙමේ කියන්නේ ය.

13. "ශ්‍රමණ ගෞතම තෙමේ රළුකිණුම් දුරු ලා, රළුකිණුම්වලින් වැළැක්කේ ය. නිදෙස්, කන්කලු, පෙම් උපදවන, පහසුයෙන් සිතැ වැද ගන්නා, තොගැමි (මොළොක්) වූ, බොහෝ දෙනාට ප්‍රිය, බොහෝ දෙනාට මනාප යම් බසෙක් වේ නම්, එ බඳු වූ බස් කියන්නේ යැ" යි මෙසේ හෝ මහණෙනි, තථාගතයන්ගේ ගුණ කියන පුහුදුන් තෙමේ කියන්නේ ය.

14. "ශ්‍රමණ ගෞතම තෙමේ හිස් දෙඩුම් හැරැ දමා, හිස් දෙඩුමෙන් වැළැක්කේ ය. සුදුසු කාලයෙහි කථා කරන්නේ ය. ඇත්තක් ම කියන්නේ ය. වැඩ සලසන බසක් ම කියන්නේ ය. නවලොවුතුරාදහම් ඇසුරු කොට ම කියන්නේ ය. හික්මුම ඇසුරු කළ (=හික්මුම ඇති කරන) බසක් ම කියන්නේ ය. සිතැ තබා ගන්නට සුදුසු වූ, කරුණු සහිත වූ, සීමාවක් ඇති (=ප්‍රමාණවත් වූ), දෙ ලෝ වැඩ පසස්නා වූ ම බසක් සුදුසු කාලයෙහි කියන්නේ යැ" යි මහණෙනි, මෙසේ හෝ තථාගතයන්ගේ ගුණ කියන පුහුදුන් තෙමේ කියන්නේ ය.

15. "ශ්‍රමණගෞතම තෙමේ බීජසමූහ (=පැළ වන දෑ) ද, භූත සමූහ (=පැළ වුණු දෑ) ද සිඳුමෙන් කිඳුමෙන් වැළැක්කේ ය. එක් වේලේ (පෙරවරු) වළඳන බත් ඇත්තේ ය. රැබොජුනෙන් වැළැක්කේ ය. නොකල්බොජුනෙන් වැළැක්කේ ය. නටනු – ගනු – වයනු – විසුළුදස්නෙන් වැළැක්කේ ය. ඇඟ අඬු තැන් පිරැවීමට, ඇඟ සැරැසීමට කරුණු වන මල් ගඳ විලෙවුන් දැරැමෙන් වැළැක්කේ ය. පමණ ඉක්මැවූ උසසුන් ද නොකැප වූ මහඅසුන් ද යන දෙකින් ම වැළැක්කේ ය. රන් රිදී මසු කහවණු පිළිගැන්මෙන් වැළැක්කේ ය. අමු (නොපිසූ) ධාන්‍ය පිළිගැන්-මෙන් වැළැක්කේ ය. අමුමස් පිළිගැන්මෙන් වැළැක්කේ ය. ස්ත්‍රීන් කුමාරිකාවන් පිළිගැන්මෙන් වැළැක්කේ ය. දැසිදසුන් පිළිගැන්මෙන් වැළැක්කේ ය. එළුබැටළුවන් පිළිගැන්මෙන් වැළැක්කේ ය. කුකුළන් හූරන් පිළිගැන්මෙන් වැළැක්කේ ය. ඇතුන් ගෙරින් අසුන් වෙළෙඹුන් පිළිගැන්මෙන් වැළැක්කේ ය. කෙත්වතු පිළිගැන්මෙන් වැළැක්කේ ය. ගිහියනට දූතමෙහෙවර කැරැමෙහි ද, ගෙන් ගෙට පණිවුඩ පණත් ගෙන යැමෙහි ද යෙදීමෙන් වැළැක්කේ ය. වෙළෙඳ ගනුදෙනුයෙන් වැළැක්කේ ය. හොරතරාදියෙන් කිරැමෙන්, බොරු රන් ආදිය පැමෙන්, හොරමිනුම්-වලින් මිනුමෙන් වැළැක්කේ ය. අල්ලස් ගෙන හිමියන් නොහිමි කැරැ-මෙන්, තානාඋපායයෙන් අනුන් රැවැටුමෙන්, අගතා දැයට හුරු නො-අගතා දැයක් පෙන්නා කරන මායායෙන්, මෙ කී තොකී හැම කෛරාටික කම්වලින් ම වැළැක්කේ ය. අත් පා ආදිය සිඳුමෙන්, මැරැමෙන්, රැහැන් ආදියෙන් බැඳුමෙන්, මං පැහැරැමෙන්, ගම් පැහැරැමෙන්, සැහැසිකම් කැරැමෙන් වැළැක්කේ යැ" යි මෙසේ හෝ මහණෙනි, තථාගතයන්ගේ ගුණ කියන පුහුදුන් තෙමේ කියන්නේ ය.

චූලශීලය නිමි.

16. "යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං බීජගාමභූතගාමසමාරම්භං අනුයුත්තා විහරන්ති සෙය්‍යථිදං: මූලබීජං ඛන්ධබීජං ඵලුබීජං අග්ගබීජං බීජබීජමෙව පඤ්චමං. ඉති වා ඉතිඑවරූපා බීජගාමභූතගාමසමාරම්භා පටිවිරතො සමණො ගොතමො"ති. ඉති වා හි භික්ඛවෙ පුථුජ්ජනො තථාගතස්ස වණ්ණං වදමානො වදෙය්‍ය.

17. "යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං සන්නිධිකාරපරිභොගං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථිදං: අන්නසන්නිධිං පානසන්නිධිං වත්ථසන්නිධිං යාන-සන්නිධිං සයනසන්නිධිං ගන්ධසන්නිධිං ආමිසසන්නිධිං. ඉති වා ඉති එවරූපා සන්නිධිකාරපරිභොගා පටිවිරතො සමණො ගොතමො"ති. ඉති වා හි භික්ඛවෙ පුථුජ්ජනො තථාගතස්ස වණ්ණං වදමානො වදෙය්‍ය.

18. "යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විසූකදස්සනං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථිදං: නච්චං ගීතං වාදිතං පෙක්ඛං අක්ඛානං පාණිස්සරං වෙතාලං[1] කුම්භථූනං සොභනකං[2] වණ්ඩාලං වංසං ඛොවනං[3] හත්ථියුද්ධං අස්ස-යුද්ධං මහිසයුද්ධං උසභයුද්ධං අජයුද්ධං මෙණ්ඩයුද්ධං[4] කුක්කුටයුද්ධං වට්ටක-යුද්ධං දණ්ඩයුද්ධං මුට්ඨියුද්ධං නිබ්බුද්ධං උය්‍යොධිකං බලග්ගං සෙනා-බ්‍යූහං අනීකදස්සනං. ඉති වා ඉතිඑවරූපා විසූකදස්සනා පටිවිරතො සමණො ගොතමො"ති. ඉති වා හි භික්ඛවෙ පුථුජ්ජනො තථාගතස්ස වණ්ණං වදමානො වදෙය්‍ය.

---

1. වෙතාලං, P T S. 2. සොභන ගරකං, P T S.
3. ඛොපනං, P T S. 4. මෙණ්ඩකයුද්ධං, කත්ථචි.

16. "තව ද, යම් සේ සමහර භවත් මහණබමුණු නෙතෙක් (ගිහියන්) සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, මූලබීජ ද (හිඟුරු ඇ පැළ වන මුල් ද) ස්කන්ධබීජ ද (තුග ඇ පැළ වන කඳ ද) පරුබීජ ද (උක් උණ බට ඇ පැළ වන පුරුක් ද) අග්‍රබීජ ද (ඉරිවේරිය ඇ පැළ වන දළු ද) පස් වන බීජබීජ ද (වී ඇ පැළ වන ඇට ද) යන මෙ කී බීජසමූහ ද (=පැළ වන දෑ ද), භූතසමූහ ද (=පැළ වුණු දෑ ද), පෙළීමෙහි (=සිඳුම් බිඳුම් තැළුම් තැවුම් යැ යි කියන ලද සමාරම්භයෙහි) යෙදුණෝ වැ වෙසෙත් ද, මේ ආදි වූ හෝ මෙ බඳු වූ බීජග්‍රාම භූතග්‍රාම සමාරම්භයෙන් ශ්‍රමණ ගෞතම තෙමේ වැළැක්කේ යැ" යි, මහණෙනි, මෙ සේ හෝ තථාගත යන්ගේ ගුණ කියන ලෞකික ජන තෙමේ කියන්නේ ය.

17. "යම් සේ වනාහි සමහර පින්වත් මහණබමුණු කෙනෙක් (ගිහියන්) සැදැහැයෙන් දුන් බොජුන් වළඳ අන්නසන්නිධි (=කෑම රැස් කොට තබා ගැන්ම), පානසන්නිධි (=බොන දෑ රැස් කොට තබා ගැන්ම), වස්ත්‍රසන්නිධි (=වස්ත්‍ර රැස් කොට තබා ගැන්ම), යානසන්නිධි (=රිය ගැල් ආදිය ද පාවහන් ආදිය ද රැස් කොට තබා ගැන්ම), ශයනසන්නිධි (=යහන් රැස් කොට තබා ගැන්ම), ගන්ධසන්නිධි (=සුවඳ දෑ රැස් කොට තබා ගැන්ම), ආමිසසන්නිධි (=ඉහත කී දෑ හැර තවත් තල සහල් ඇ වුව මනා පසය රැස් කොට තබා ගැන්ම) යන මෙ සේ වූ සන්නිධිකාර-පරිභෝගයෙහි (=පසය රැස් කොට තබා ගෙන වැළැඳීමෙහි) යෙදී වෙසෙත් ද, ශ්‍රමණගෞතම තෙමේ මේ ආදි වූ හෝ මෙ බඳු වූ සන්නිධිකාර පරිභෝගයෙන් (=පසය රැස් කොට තබා ගෙන වැළැඳීමෙන්) වැළැක්කේ යැ" යි, මහණෙනි, මෙසේ හෝ තථාගතයන්ගේ ගුණ කියන පුහුදුන් තෙමේ කියන්නේ ය.

18. "යම් සේ සමහර පින්වත් මහණබමුණෝ ගිහියන් සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, නැටුම් ගැයුම් වැයුම්, නටසමජ්ජා (=නළුවන් සමූහයක් එක් වැ ජනසමූහයා ඉදිරියෙහි දක්වන නැටුම්), ආඛ්‍යාන (=මහාභාරත රාමායණාදි කථා කීම් හෝ ඇසීම්), පාණිස්වර (=අතින් ලොහොබෙර ගැසීම් හෝ අත්තල ගැසීම්), වේතාල (=ලිමුවා තාලම්පට ගැසීම් හෝ මතුරු දපා මළසිරුරු නැඟිටුවීම්), කුම්භථූන (සිවුරස් බෙර වැයීම්), ශෝභනක (රංගබලිකරණය හෙවත් රඟමඬලෙහි දී දේවතාවනට සෙනෝත්‍රවශයෙන් නාන්දීගීත ගායනය නොහොත් ප්‍රති-භානචිත්‍ර කිරීම්), සණදෙවුන් කෙළිය (හෝ අයොගුඩ ක්‍රීඩාව), උණ-ගස් ඔසොවා ගෙන කැරෙන ක්‍රීඩාව, අසිධාවනය (=මළවුන්ගේ ඇට සුවඳ කවා තබා නකත්සෙමෙහි ඒ වටා සිට උත්සව කැරැම), ඇත් යුද (=ඇතුන් පිට නැග යුද කැරැම), අස් යුද (=අසුන් තැග යුද කැරැම) ඇත්පොර, අස්පොර, මියුපොර, ගොන්පොර, එළුපොර, බැටළු-පොර, කුකුළුපොර, වටුපොර, පොලුහරඹ, මිටුයුද, මල්ලපොර, යුද පවත්නා තැන් දක්නට යැම, බලසෙන් ගණිත තැන් දක්නට යැම, බලසෙන් බෙදන තැනට යැම, ඇත්ඇති අස්ඇතිඇ බලඇති දක්නට යැම යන විසුළුදස්නෙහි යෙදී වෙසෙත් ද, මහණගොයුම් තෙමේ මේ ආදි වූ හෝ මෙ බඳු වූ විසුළුදස්නෙන් වැළැක්කේ යැ" යි, මහණෙනි, මෙසේ හෝ තථාගතයන්ගේ ගුණ කියන පුහුදුන් තෙමේ කියන්නේ ය.

19. "යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙයානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං ලුත්තපමාදට්ඨානානුයොගං අනුයුත්තා විහරන්ති - සෙය්‍යථිදං: අක්ඛපදං දසපදං ආකාසං පරිහාරපථං සන්තිකං ඛලිකං ඝටිකං සලාකහත්ථං අක්ඛං පඞ්ගචීරං වඩ්ඩකං මොක්ඛචිකං විඩ්ඩලකං පත්තාළ්හකං රථකං ධනුකං අක්ඛරිකං මනෙසිකං යථාවජ්ජං. ඉති වා ඉතිඑවරූපා ලුත්තපමාදට්ඨානානුයොගා පටිවිරතො සමණො ගොතමො"ති. ඉති වා හි භික්ඛවෙ පුථුජ්ජනො තථාගතස්ස වණ්ණං වදමානො වදෙය්‍ය.

20. "යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙයානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං උච්චාසයනමහාසයනං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථිදං: ආසන්දිං පල්ලඞ්කං ගොනකං[1] චිත්තකං පටිකං පටලිකං තූලිකං විකතිකං උද්දලොමිං එකන්තලොමිං කට්ඨිස්සං කොසෙය්‍යං කුත්තකං හත්ථත්ථරං අස්සත්ථරං රථත්ථරං අජිනප්පවෙණිං කාදලිමිගපවරපච්චත්ථරණං සඋත්තරච්ඡදං උභතොලොහිතකූපධානං. ඉති වා ඉතිඑවරූපා උච්චාසයනමහාසයනා පටිවිරතො සමණො ගොතමො"ති. ඉති වා හි භික්ඛවෙ පුථුජ්ජනො තථාගතස්ස වණ්ණං වදමානො වදෙය්‍ය.

21. "යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙයානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං මණ්ඩනවිභූසනට්ඨානානුයොගං අනුයුත්තා විහරන්ති - සෙය්‍යථිදං: උච්ඡාදනං පරිමද්දනං නහාපනං සම්බාහනං ආදාසං අඤ්ජනං මාලාවිලෙපනං මුඛචූණ්ණකං මුඛලෙපනං හත්ථබන්ධං සිඛාබන්ධං දණ්ඩකං නාළිකං අසිං ඡත්තං චිත්‍රුපාහනං උණ්හීසං මණිං වාලවීජනිං ඔදාතානි වත්ථානි දීඝදසානි. ඉති වා ඉතිඑවරූපා මණ්ඩනවිභූසනට්ඨානානුයොගා පටිවිරතො සමණො ගොතමො"ති. ඉති වා හි භික්ඛවෙ පුථුජ්ජනො තථාගතස්ස වණ්ණං වදමානො වදෙය්‍ය.

1. ගොණකං, කත්ථචි.

19. "යම් සේ සමහර පින්වත් මහණබමුණෝ (අනුන්) සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, අටපාකෙළිය, දසපාකෙළිය, අහස්දූකෙළිය, මඹුලුපැනුම, සන්තිකාක්‍රීඩාව, දැදුකෙළිය, කල්ලිගැසුම, ලහඅත් කෙළිය, ගුළකෙළිය, කොළනලා පිඹීම, කෙළි නගුලින් සෑම, කරණම්පැනුම, කත්තංගුරුවා කෙළිය, කොළ තැළියෙන් වැලි ආදිය මැනුම, කුඩා රිය පැදැවීම, කුඩා දුනුයෙන් විදුම, ඇකිරි කෙළිය, සිතු දෑ කීම, විකලාංගානුකරණය යන ආදි වූ හෝ මෙ බඳු වූ, පමාවට කරුණු වූ දූකෙළියෙහි යෙදී වෙසෙත් ද, මහණගොයුම් තෙමේ එ සේ පමාවට කරුණු වූ දූ-කෙළිවලැ යෙදීමෙන් වැළැක්කේ යැ" සි, මහණෙනි, මෙ පරිද්දෙන් හෝ තථාගතයන්ගේ ගුණ කියන පුහුදුන් තෙමේ කියන්නේ ය.

20. "යම් සේ වනාහි සමහර පින්වත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, දික්සඟලා පුටු ය, පලඟය, මහකොදුපලස ය, වියමනින් විසිතුරු කළ එළුලොම් ඇතිරිය, එළුලොම්මුවා සුදුඇතිරිය, ගන මල් යෙදූ එළුලොම්ඇතිරිය, තිලිය (පුලුන් මෙත්තය), සිංහාදී රූපවලින් විසිතුරු කළ එළුලොම් ඇතිරිය, දෙ පැත්තේ ම ලොම් ඇති එළුලොම්මුවා ඇතිරිය, එක් පැත්තේ ම ලොම් ඇති එළුලොම්මුවා ඇතිරිය, රත්කසුකම් කොට තැනූ පසතුරුණ, කෝසෙය්‍ය නූලින් වියූ පසතුරුණ, සොළොසක් නිළියකට සිටැ නටන්නට තරම් දිග පුලුල ඇති එළු-ලොම්මුවා ඇතිරිය, ඇතුන් පිටැ එළන ඇතිරිය, අසුන් පිටැ එළන ඇතිරිය, රියවලැ එළන ඇතිරිය, ඇඳට සරි ලන සේ අඳුන්දිවිසමින් මසා කළ පසතුරුණ, ඉස්දෙරැ පාමුලැ රතුකොට්ට තබා ඇති රතුඋඩුවියන් සහිත මහඟු යහන යන ආදි වූ හෝ මෙ බඳු වූ උස්යහන් මහයහන් පරිහරණය කැරැමෙහි යෙදී වෙසෙද්ද, මහණගොයුම් තෙමේ මෙ ආදි වූ හෝ මෙ බඳු වූ උස්යහනින් මහයහනින් වැළැක්කේ යැ" සි, මහණෙනි, මෙ සේ හෝ තථාගතයන්ගේ ගුණ කියන පුහුදුන් තෙමේ කියන්නේ ය.

21. "යම් සේ සමහර පින්වත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ සුවඳසුණුයෙන් ඇඟ ඉලීම, අත් පා ආදියේ මනා සටහන් ගන්වනු පිණිස තෙල් ගා මැඩීම, සුවඳ දියෙන් නෑවීම, උරහිස් ආදියේ මස් වැඩෙනුවට මුගුරින් තැළීම, කැඩපතින් මුහුණ බැලීම, ඇඟ ඔප ගන්වනුවට අඳුන් ගෑම, මල් පැළැඳීම හා විලෙවුන් දැරීම, මුවසුණු මුවවිලෙවුන් දැරීම, හස්තාභරණ දැරීම, හිසැ කුඩුම්බිය බැඳීම, විසිතුරු සැරයපි දැරීම, විසිතුරු බෙහෙත් තළ දැරීම, කඩු දැරීම, විසිතුරු කුඩ දැරීම, විසිතුරු පාවහන් දැරීම, නළල්පට බැඳීම, සිළුම්ණි පැළැඳීම, විසිතුරු සෙමෙර වල්විදුනා දැරීම, දික් දවලු ඇති සුදු රෙදි හැඳීම යන ආදි ඇඟ උනු තැන් පිරුවීමටත් ඇඟ සැරැසීමටත් කරුණු වන දෑ පරිභොග කිරීමෙහි යෙදී වෙසෙත් ද, මහණගොයුම් තෙමේ එබඳු දෑ පරිභොග කැරැමෙන් වැළැක්කේ යැ" සි, මහණෙනි, මෙ සේ හෝ තථාගතයන්ගේ ගුණ කියන පුහුදුන් තෙමේ කියන්නේ ය.

22. "යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං තිරච්ඡානකථං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: රාජකථං චොරකථං මහාමත්තකථං සෙනාකථං භයකථං යුද්ධකථං අන්නකථං පානකථං වත්ථකථං සයනකථං මාලාකථං ගන්ධකථං ඤාතිකථං යානකථං ගාමකථං නිගමකථං නගරකථං ජනපදකථං ඉත්ථිකථං[1] සූරකථං විසිඛාකථං කුම්භට්ඨානකථං පුබ්බපෙතකථං නානත්තකථං ලොකක්ඛායිකං සමුද්දක්ඛායිකං ඉතිභවාභවකථං. ඉති වා ඉතිඑවරූපාය තිරච්ඡානකථාය පටිවිරතො සමණො ගොතමො''ති. ඉති වා හි භික්ඛවෙ පුථුජ්ජනො තථාගතස්ස වණ්ණං වදමානො වදෙය්‍ය.

23. "යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විග්ගාහිකකථං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි. අහං ඉමං ධම්මවිනයං ආජානාමි. කිං ත්වං ඉමං ධම්මවිනයං ආජානිස්සසි? මිච්ඡාපටිපන්නො ත්වමසි, අහමස්මි සම්මා පටිපන්නො. සහිතං මෙ, අසහිතං තෙ. පුරෙ වචනීයං පච්ඡා අවච. පච්ඡා වචනීයං පුරෙ අවච. ආවිණ්ණං[2] තෙ විපරාවත්තං. ආරොපිතො තෙ වාදො. නිග්ගහිතො ත්වමසි. චර වාදප්පමොක්ඛාය. නිබ්බෙඨෙහි වා සචෙ පහොසී'ති. ඉති වා ඉතිඑවරූපාය විග්ගාහිකකථාය පටිවිරතො සමණො ගොතමො''ති. ඉති වා හි භික්ඛවෙ පුථුජ්ජනො තථාගතස්ස වණ්ණං වදමානො වදෙය්‍ය.

24. "යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං දූතෙය්‍යපහිණගමනානුයොගං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: රාජරාජමහාමත්තානං ඛත්තියානං බ්‍රාහ්මණානං ගහපතිකානං කුමාරානං 'ඉධ ගච්ඡ. අමුත්‍රාගච්ඡ. ඉදං හර. අමුත්‍ර ඉදං ආහරා'ති. ඉති වා ඉතිඑවරූපා දූතෙය්‍යපහිණගමනානුයොගා පටිවිරතො සමණො ගොතමො'ති. ඉති වා හි භික්ඛවෙ පුථුජ්ජනො තථාගතස්ස වණ්ණං වදමානො වදෙය්‍ය.

25. "යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ කුහකා ච භොන්ති ලපකා ච නෙමිත්තිකා ච නිප්පෙසිකා ච ලාභෙන ලාභං නිජිගීංසිතාරො. ඉති වා ඉතිඑවරූපා කුහනලපනා පටිවිරතො සමණො ගොතමො''ති. ඉති වා හි භික්ඛවෙ පුථුජ්ජනො තථාගතස්ස වණ්ණං වදමානො වදෙය්‍ය.

මජ්ඣිමසීලං නිට්ඨිතං.

1. ඉත්ථි කථං පුරිස කථං, මජ්ඣිමං. 2. අතිවිණ්ණං, මජ්ඣිමං.

22. "යම් සේ සමහර පින්වත් මහණබමුණෝ (අනුන්) සැදැහෙන් දුන් බොජුන් වළඳ, රාජකථා, චෝරකථා, මහාමාත්‍යකථා, සේනාකථා, භයකථා, යුද්ධකථා, ආහාරකථා, පානකථා, වස්ත්‍රකථා, ශයනකථා, මාලාකථා, ගන්ධකථා, ඥාතිකථා, යානකථා, ග්‍රාමකථා, නිගමකථා, නගරකථා, ජනපදකථා, ස්ත්‍රීකථා, ශූරකථා, වීථිකථා, කුම්භස්ථානකථා, පුබ්බේ ප්‍රේතකථා, නානත්වකථා, ලෝකාඛ්‍යායිකා කථා, සමුද්‍රාඛ්‍යායිකා කථා, ඉතිභවාභවකථා යන මේ කී හෝ අන් මේ බඳු වූ තිරශ්චීනකථාවල යෙදී වෙසෙත් ද, මහණ ගොයුම් තෙමේ මේ ආදි හෝ මේබඳු කථාවලින් වැළැක්කේ යැ යි මහණෙනි, මෙසේ හෝ තථාගතයන්ගේ ගුණ කියන පුහුදුන් තෙමේ කියන්නේ ය.

23. "යම් සේ ඇතැම් පින්වත් මහණබමුණෝ අනුන් සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, 'තෝ මේ දහම්විනය නො දන්නෙහි. මම ම මේ දහම් විනය දනිමි. 'මේ දහම්විනය කිමැ' යි තෝ දනිහි ද ? තෝ වරදවා පිළිපන්නෙහි ය. මම මැනැවින් පිළිපන්නෙම් වෙමි. මා බස කරුණු සහිත ය. තා බස කරුණු රහිත ය. තෝ පළමුවෙන් කියැ යුත්ත පසු වැ කියෙහි ය. පසු වැ කියැ යුත්ත පළමුවෙන් කියෙහි ය. තා කලක් ම පුහුණු කළ දැය මගේ එක වචනයෙන් ම පෙරැළී හියේ ය. මා විසින් තට දෙස් තැබිණ. මා විසින් නිගන්නා ලද්දෙහි. මා නැගූ දෙසින් මිදෙන්නට හැකිරෙව (=ඒ ඒ තැන ගොස් උගනුව). හැක්කෙහි නම් එය විසඳව' යන ආදීන් මේ බඳු වූ උනුන් බැණ දෙඩා ගැනුම්හි යෙදෙත් ද, මහණගොයුම් තෙමේ මේ බඳු වූ බැණුමෙන් දෙවුමෙන් වැළැක්කේ යැ" යි කියා හෝ, මහණෙනි, තථාගතයන්ගේ ගුණ කියන පුහුදුන් තෙමේ කියන්නේ ය.

24. "යම් සේ ඇතැම් පින්වත් මහණබමුණෝ අනුන් සැදැහෙන් දුන් බොජුන් වළඳ, 'මෙහි යන්නැ. අසෝ තැනට එන්නැ. මෙය ගෙනැ යන්නැ. අසෝ තැනට මෙය ගෙනෙන්නැ යි (කල නියෝග පිළිගෙන) රජුන් ගේ, රජමහමාත්‍යයන් ගේ, ක්ෂත්‍රියයන් ගේ, බ්‍රාහ්මණයන්ගේ, ගෘහපතියන්ගේ, රජකුමරුවන්ගේ මේ බඳු වූ දූතමෙහෙවරෙහි, පණිවුඩ ගෙනැ යැමෙහි යෙදී වෙසෙත් ද, මහණගොයුම් තෙමේ මේ බඳු දැයෙන් වැළැක්කේ යැ" යි, මහණෙනි, මෙ සේ හෝ තථාගතයන්ගේ ගුණ කියන පුහුදුන් තෙමේ කියන්නේ ය.

25. "යම් සේ වනාහි සමහර පින්වත් මහණබමුණෝ අනුන් සැදැහෙන් දුන් බොජුන් වළඳ, කුහකකම් කරන්නෝ වෙත් ද, ලාභ සත්කාර තකා අනුන් සිත් ඇදෙන සේ වූ වාදු බස් දෙඩන්නෝ වෙත් ද, සිවුපසය ලබනු සඳහා කසින් හෝ බසින් ඇඟැවීම් කරන්නෝ වෙත් ද, ලාභාපේක්ෂායෙන් අනුනට ගරහන්නෝ වෙත් ද, ලාභයෙන් ලාභය සොයන්නෝ වෙත් ද, මහණගොයුම් තෙමේ මේ කී හෝ මේ බඳු වූ හෝ කුහනලපනවලින් වැළැක්කේ යැ" යි මහණෙනි, මෙ සේ හෝ තථාගතයන්ගේ ගුණ කියන පුහුදුන් තෙමේ කියන්නේ ය.

මජ්ඣිමසීලය නිමි.

26. "යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති – සෙය්‍යථිදං: අඞ්ගං නිමිත්තං උප්පාතං සුපිනං ලක්ඛණං මූසිකචිත්තානං අග්ගිහොමං දබ්බිහොමං ථුසහොමං කණහොමං තණ්ඩුලහොමං සප්පිහොමං තෙලහොමං මුඛහොමං ලොහිතහොමං අඞ්ග–විජ්ජා වත්ථුවිජ්ජා ඛත්තවිජ්ජා සිවවිජ්ජා භූතවිජ්ජා භූරිවිජ්ජා අහිවිජ්ජා විසවිජ්ජා විච්ඡිකවිජ්ජා මූසිකවිජ්ජා සකුණවිජ්ජා වායසවිජ්ජා පක්කජ්ඣානං[1] සරපරිත්තාණං මිගචක්කං. ඉති වා ඉතිඑවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො සමණො ගොතමො"ති. ඉති වා හි භික්ඛවෙ පුථුජ්ජනො තථාගතස්ස වණ්ණං වදමානො වදෙය්‍ය.

27. "යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති – සෙය්‍යථිදං: මණිලක්ඛණං දණ්ඩලක්ඛණං වත්ථලක්ඛණං අසිලක්ඛණං උසුලක්ඛණං ධනුලක්ඛණං ආවුධලක්ඛණං ඉත්ථිලක්ඛණං පුරිසලක්ඛණං කුමාරලක්ඛණං කුමාරීලක්ඛණං දාසලක්ඛණං දාසීලක්ඛණං හත්ථිලක්ඛණං අස්සලක්ඛණං මහිසලක්ඛණං උසභලක්ඛණං ගොලක්ඛණං අජලක්ඛණං මෙණ්ඩලක්ඛණං කුක්කුටලක්ඛණං වට්ටකලක්ඛණං ගොධා-ලක්ඛණං කණ්ණිකාලක්ඛණං කච්ඡපලක්ඛණං මිගලක්ඛණං. ඉති වා ඉති–එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො සමණො ගොතමො'ති. ඉති වා හි භික්ඛවෙ පුථුජ්ජනො තථාගතස්ස වණ්ණං වදමානො වදෙය්‍ය.

28. "යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති – සෙය්‍යථිදං: 'රඤ්ඤං නිය්‍යානං භවිස්සති. රඤ්ඤං අනියානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං උපයානං භවිස්සති. බාහිරානං රඤ්ඤං අපයානං භවිස්සති. බාහිරානං රඤ්ඤං උපයානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං අපයානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං ජයො භවිස්සති. බාහිරානං රඤ්ඤං පරාජයො භවිස්සති. බාහිරානං රඤ්ඤං ජයො භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං පරාජයො භවිස්සති'. ඉති ඉමස්ස ජයො භවිස්සති. ඉමස්ස පරාජයො භවිස්සති. ඉති වා ඉතිඑවරූපාය තිරච්ඡාන–විජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො සමණො ගොතමො'ති. ඉති වා හි භික්ඛවෙ පුථුජ්ජනො තථාගතස්ස වණ්ණං වදමානො වදෙය්‍ය.

---

1. පක්කජ්ඣානං, කත්ථචි.

26. "යම්සේ වනාහි ඇතැම් පින්වත් මහණ බමුණෝ (අනුන්) සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, අංගශාස්ත්‍රය, නිමිත්තශාස්ත්‍රය, උත්පාත-ලක්ෂණය, සුප්තශාස්ත්‍රය, පුරුෂලක්ෂණශාස්ත්‍රය, මූෂකවික්‍රාන්ත විද්‍යාව, අග්නිහෝමය, දර්වීහෝමය, තුෂහෝමය, කණහෝමය, තණ්ඩුලහෝමය, සර්පිර්හෝමය, තෛලහෝමය, මුඛහෝමය, ලෝහිතහෝමය, අංගවිද්‍යාව, වාස්තුවිද්‍යාව, ක්ෂත්‍රවිද්‍යාව, ශිවවිද්‍යාව, භූතවිද්‍යාව, භූරිවිද්‍යාව, අහිවිද්‍යාව, විෂවිද්‍යාව, වෘශ්චිකවිද්‍යාව, මූෂකවිද්‍යාව, ශාකුනවිද්‍යාව, වායසවිද්‍යාව, පක්වඛ්‍යාතය, ශරපරිත්‍රාණය, මෘගලක්ෂය යන මෙකී හෝ මෙබඳු තිරශ්චීනවිද්‍යයෙන් මිථ්‍යාජීවයෙන් දිවි පවත්වන් ද, මහණගොයුම් තෙමේ වනාහි මෙබඳු තිරශ්චීන විද්‍යයෙන් මිථ්‍යාජීවිකායෙන් වැළැක්කේ යැ"යි මහණෙනි, මෙසේ හෝ තථාගතයන්ගේ ගුණ කියන පුහුදුන් තෙමේ කියන්නේ ය.

27. "යම්සේ වනාහි ඇතැම් මහණබමුණෝ (අනුන්) සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, මිණිලකුණු ය, දඹුලකුණු ය, වත්ලකුණු ය, කඩු-ලකුණු ය, ඊලකුණු ය, දුනුලකුණු ය, අවිලකුණු ය, ඉතිරිලකුණු ය, පුරිස්ලකුණු ය, කුමරලකුණු ය, කුමරිලකුණු ය, දස්ලකුණු ය, දැසිලකුණු ය, ඇත්ලකුණු ය, අස්ලකුණු ය, මිගුලකුණු ය, වහස්ලකුණු ය, ගොත්ලකුණු ය, එළුලකුණු ය, බැටෙළුලකුණු ය, කුකුළුලකුණු ය, වටුලකුණු ය, ගොයි-ලකුණු ය, කැණිලකුණු ය, කසුබුලකුණු ය, මුවලකුණු ය යන ආදි වූ මෙ බඳු තිරශ්චීන විද්‍යයෙන් මෙ බඳු වූ මිථ්‍යා ආජීවයෙන් දිවි පවත්වන් ද, මහණගොයුම් තෙමේ වනාහි මේ ආදි වූ හෝ මෙබඳු වූ තිරශ්චීන විද්‍යයෙන් මෙබඳු වූ මිථ්‍යාආජීවයෙන් වැළැක්කේ යැ"යි මහණෙනි, මෙසේ හෝ තථාගතයන්ගේ ගුණ කියන පුහුදුන් තෙමේ කියන්නේ ය.

28. "යම්සේ වනාහි ඇතැම් පින්වත් මහණබමුණෝ (අනුන්) සැදැ-හැයෙන් දුන් බොජුන් වළඳ, 'අසෝ දිනැ (අසෝ නැකැතින්) අසෝ රජුන්ගේ සිය නුවරින් (යුද සඳහා) නික්මීම වන්නේ ය. අසෝ නැකැතින් පෙරළා සිය නුවරට ඒම වන්නේ ය. අසෝ නැකැතින් රට ඇතුළත වූ රජුන්ගේ පිටත සිටින සතුරුරජුන් හමුවට යෑම වන්නේ ය. (අසෝ නැකැතින්) පිටත සිටින සතුරුරජුන්ගේ ඉවත් වැ යෑම වන්නේ ය. (අසෝ නැකැතින්) පිටත සිටින සතුරුරජුන්ගේ රට ඇතුළත සිටින රජුන් කරා පැමිණීම වන්නේ ය. (අසෝ නැකැතින්) ඇතුළත සිටින රජුන්ගේ ඉවත් වැ යෑම වන්නේ ය. රට ඇතුළත සිටින රජුනට ජය වන්නේ ය. පිටත සිටින සතුරුරජුනට පරාජය වන්නේ ය. (අසෝ නැකැතින්) පිටත සිටින සතුරුරජුනට ජය වන්නේ ය. රට ඇතුළත සිටින රජුනට පරාජය වන්නේ යැ සි මෙසේ 'මොහුට ජය වන්නේ ය. මොහුට පරාජය වන්නේ යැ'සි කියමින් මෙ බඳු වූ තිරශ්චීන විද්‍යයෙන් මෙබඳු වූ මිථ්‍යාජීවිකායෙන් දිවි පවත්වන් ද, ශ්‍රමණගෞතම තෙමේ මේ හෝ මෙබඳු වූ තිරශ්චීනවිද්‍යයෙන් මිථ්‍යා ජීවිකායෙන් වැළැක්කේ යැ" සි මෙසේ හෝ මහණෙනි, තථාගතයන්ගේ ගුණ කියන පුහුදුන් තෙමේ කියන්නේ ය.

29. "යථා වා පනෙකෙ හොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි හොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කපෙනති—සෙය්‍යථිදං: චන්දග්ගාහො භවිස්සති, සූරියග්ගාහො භවිස්සති, නක්ඛත්තග්ගාහො භවිස්සති, චන්දිමසූරියානං පථගමනං භවිස්සති, චන්දිමසූරියානං උපපථගමනං භවිස්සති, නක්ඛත්තානං පථගමනං භවිස්සති, නක්ඛත්තානං උපපථගමනං භවිස්සති, උක්කාපාතො භවිස්සති, දිසාඩාහො භවිස්සති, භූමිචාලො භවිස්සති, දෙවදුන්දුභි භවිස්සති, චන්දිමසූරිය-නක්ඛත්තානං උග්ගමනං ඔගමනං සංකිලෙසං වොදානං භවිස්සති. එවං-විපාකො චන්දග්ගාහො භවිස්සති, එවංවිපාකො සූරියග්ගාහො භවිස්සති, එවංවිපාකො නක්ඛත්තග්ගාහො භවිස්සති, එවංවිපාකං චන්දිමසූරියානං පථගමනං භවිස්සති, එවංවිපාකං චන්දිමසූරියානං උපපථගමනං භවිස්සති, එවංවිපාකං නක්ඛත්තානං පථගමනං භවිස්සති, එවංවිපාකං නක්ඛත්තානං උපපථගමනං භවිස්සති, එවංවිපාකො උක්කාපාතො භවිස්සති, එවං-විපාකො දිසාඩාහො භවිස්සති, එවංවිපාකො භූමිචාලො භවිස්සති, එවං-විපාකො දෙවදුන්දුභි භවිස්සති, එවංවිපාකං චන්දිමසූරියනක්ඛත්තානං උග්ගමනං ඔගමනං සඞ්කිලෙසං වොදානං භවිස්සති. ඉති වා ඉතිඑව-රූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො සමණො ගොතමො'ති." ඉති වා හි භික්ඛවෙ පුථුජ්ජනො තථාගතස්ස වණ්ණං වදමානො වදෙය්‍ය.

30. "යථා වා පනෙකෙ හොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි හොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කපෙනති—සෙය්‍යථිදං: සුබ්බුට්ඨිකා භවිස්සති, දුබ්බුට්ඨිකා භවිස්සති, සුභික්ඛං භවිස්සති, දුබ්භික්ඛං භවිස්සති, ඛෙමං භවිස්සති, භයං භවිස්සති, රොගො භවිස්සති, ආරොග්‍යං භවිස්සති, මුද්දා ගණනා සඞ්ඛානං කාවෙය්‍යං ලොකායතං. ඉති වා ඉතිඑවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡා-ජීවා පටිවිරතො සමණො ගොතමො'ති." ඉති වා හි භික්ඛවෙ පුථුජ්ජනො තථාගතස්ස වණ්ණං වදමානො වදෙය්‍ය.

31. "යථා වා පනෙකෙ හොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි හොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කපෙනති—සෙය්‍යථිදං: ආවාහනං විවාහනං සංවදනං විවදනං සඞ්කිරණං විකිරණං සුභගකරණං දුබ්භගකරණං විරුද්ධගබ්භකරණං ජිව්හානිජ්ජොමහනං[1] හනුසංහනනං හත්ථාභිජප්පනං භමුජප්පනං කණ්ණජප්පනං ආදාසපඤ්හං කුමාරිකපඤ්හං දෙවපඤ්හං ආදිච්චුපට්ඨානං මහතුපට්ඨානං අබ්භුජ්ජලනං සිරිවහානං. ඉති වා ඉතිඑවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො සමණො ගොතමො'ති." ඉති වා හි භික්ඛවෙ පුථුජ්ජනො තථාගතස්ස වණ්ණං වදමානො වදෙය්‍ය.

---

1. හිත්ථිඛනං. බහූසු.

29. "යම්සේ ඇතැම් පින්වත් මහණබමුණෝ අනුත් සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, "අසෝ දිනැ චන්ද්‍රග්‍රහණය වන්නේ ය. අසෝ දිනැ සූර්‍යග්‍රහණය වන්නේ ය. අසෝ දිනැ නක්ෂත්‍රග්‍රහණය වන්නේ ය. අසෝ දිනැ සඳ හිරු දෙදෙනාගේ නිසි මඟින් යැම වන්නේ ය. අසෝ දිනැ ඔවුන් නොමඟින් යැම වන්නේ ය. අසෝ දිනැ නකත් තරුන් නිසි මඟින් යැම වන්නේ ය. අසෝ දිනැ ඔවුන් නොමඟින් යැම වන්නේ ය. අසෝ දිනැ උල්කාපතනය වන්නේ ය. දිග්දහය වන්නේ ය. භූමිකම්පනය වන්නේ ය. වැසි නැති වැ අහස් ගෙරැවුම් වන්නේ ය. සඳ හිරු දෙදෙනාගේ ද නකත් තරුවල ද උදුව බැසීම කෙලෙසීම පිරිසිදුව වන්නේ ය. සූර්‍යග්‍රහණය ලොවට මෙබඳු පල ගෙනැ දෙන්නේ ය. චන්ද්‍රග්‍රහණය මෙබඳු පල ගෙනැ දෙන්නේ ය. නක්ෂත්‍රග්‍රහණය මෙබඳු පල ගෙනැ දෙන්නේ ය. සඳු හිරු දෙදෙනාගේ පථගමනය (නිසි මඟ යැම) මෙබඳු පල ගෙනැ දෙන්නේ ය. සඳු හිරු දෙදෙනාගේ උත්පථ (අනියම් මඟ) ගමනය මෙබඳු පල ගෙනැ දෙන්නේ ය. නකත්තරුවල පථගමනය මෙබඳු විපාක ගෙනැ දෙන්නේ ය. ඔවුන්ගේ උත්පථගමනය මෙබඳු විපාක ගෙනැ දෙන්නේ ය. උල්කාපතනය මෙබඳු පල දෙන්නේ ය. දිග්දහය මෙබඳු පල දෙන්නේ ය. භූමිකම්පනය මෙබඳු පල දෙන්නේ ය. වැසි නැති වැ අහස් ගෙරැවුම මෙබඳු පල දෙන්නේ ය. සඳ හිරු දෙදෙනාගේ ද නකත්තරුවල ද උදුවත් බැසීමත් කෙලෙසීමත් පිරිසිදු වීමත් මෙබඳු මෙබඳු පල දෙන්නේ යැ' සි කියමින් මෙබඳු තිරශ්චීනවිද්‍යායෙන් මිථ්‍යාජීවිකායෙන් දිවි පවත්වන් ද, මහණගොයුම් තෙමේ මේ හෝ අන් මෙබඳු වූ තිරශ්චීනවිද්‍යයෙන් මිථ්‍යාජීවිකායෙන් වැළැක්කේ යැ"සි තථාගතයන්ගේ ගුණ කියන පුහුදුන් තෙමේ මෙසේ හෝ කියන්නේ ය.

30. "යම්සේ ඇතැම් පින්වත් මහණබමුණෝ අනුත් සැදැයෙන් දුන් බොජුන් වළඳ, 'මෙ සමයෙහි වැසි වස්නේ ය. මෙසමයෙහි නියං වන්නේ ය. මෙසමයෙහි රට සුභික්ෂ වන්නේ ය. මෙසමයෙහි රට දුර්භික්ෂ වන්නේ ය. මෙසමයෙහි රටට උවදුරු නැති වන්නේ ය. මෙ සමයෙහි රටට උවදුරු ඇති වන්නේ ය. මෙ කලැ රෝග වන්නේ ය. මෙ කලැ රෝග දුරු වන්නේ යැ' සි පලාපල කීම ද, මුද්‍රාව (ඇඟිලි පුරැක්හි සංඥ තබා ගිණීම) ද, ගණනාව (එක දෙක යන ආදීන් දිගට ම කියා ගෙන යමින් ගිණීම) ද, සංඛ්‍යානය (පිණ්ඩ ගණනාව) ද, කාව්‍ය ශාස්ත්‍රය, ලෝකායත ශාස්ත්‍රය යන මෙබඳු වූ තිරශ්චීන විද්‍යයෙන්, මිථ්‍යා ආජීවයෙන් දිවි පවත්වන් ද, මහණගොයුම් තෙමේ මේ හෝ අන් මෙබඳු වූ තිරශ්චීන විද්‍යයෙන් මිථ්‍යාජීවයෙන් වැළැක්කේ යැ"සි මෙසේ හෝ මහණෙනි, තථාගතයන්ගේ ගුණ කියන පුහුදුන් තෙමේ කියන්නේ ය.

31. "යම්සේ වනාහි ඇතැම් පින්වත් මහණබමුණෝ අනුත් සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, ආවාහ සඳහා නකත් කීම, විවාහ සඳහා නකත් කීම, වෙන් වූ අඹු සැමියන් සමග වන්නට නකත් කීම, අඹු සැමියන් වෙන් වන්නට නකත් කීම, දුන් ණය රැස් කිරීමට නකත් කීම, මුදල් ණයට පොලියට දීමට නකත් කීම, සෞභාග්‍යය ඇති කරනුවට යන්ත්‍ර මන්ත්‍රාදිය කැරැ දීම, කිම් පාලු කිරීම ආදි නීඃශ්‍රීක බව ඇති කරන යන්ත්‍ර මන්ත්‍රාදිය කැරැ දීම, නැසෙන්නට යන දරු ගබ් රැකෙන්නට පිළියම් කිරීම, මන්ත්‍රාදි බලයෙන් දිවගුළු බැඳීම, මන්ත්‍රාදියෙන් හත්‍ර තද කිරීම, අත් පෙරැලෙන්නට මතුරු දැපීම, කන් අගුළු වැටෙනුවට මතුරු දැපීම, කැඩපතෙහි දෙවතාවේශය කරවා ප්‍රශ්න ඇසීම (අංජනම් බැලීම), කුමරියකට දේවතාවේශය කරවා ප්‍රශ්න ඇසීම (කුමරියක ලවා ජෙන කියැවීම), ජීවිකා පිණිස හිරු වැඳීම හා පිදීම, මහබඹු පිදීම, මතුරු දපා මුවින් ගිනි ජල් විහිදුවීම, මතුරු දපා සිරි කත කැඳැවීම යන මෙබඳු වූ තිරශ්චීන විද්‍යයෙන් මිථ්‍යාජීවයෙන් දිවි පවත්වන් ද, මහණ ගොයුම් තෙමේ මේ හෝ මෙබඳු අන්‍ය ව තිරශ්චීන විද්‍යයෙන් මිථ්‍යාජීවයෙන් වැළැක්කේ යැ"සි, මෙසේ හෝ මහණෙනි, තථාගතයන්ගේ ගුණ කියන පුහුදුන් තෙමේ කියන්නේ ය.

32. "යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති—සෙය්‍යථිදං: සන්තිකම්මං පණිධිකම්මං භූරිකම්මං[1] වස්සකම්මං වොස්සකම්මං වත්ථුකම්මං වත්ථුපරිකම්මං වත්ථුපරිකිරණං ආචමනං නහාපනං ජූහනං වමනං විරෙචනං උද්ධවිරෙචනං අධොවිරෙචනං සීසවිරෙචනං කණ්ණතෙලං නෙත්තතප්පනං නත්තුකම්මං අඤ්ජනං පච්චඤ්ජනං සාලාකියං සල්ලකත්තියං දාරකතිකිච්ඡා මූලභෙසජ්ජානං අනුප්පදානං ඔසධීනං පටි-මොක්ඛො. ඉති වා ඉතිඵවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො සමණො ගොතමො'ති." ඉති වා හි භික්ඛවෙ පුථුජ්ජනො තථාගතස්ස වණ්ණං වදමානො වදෙය්‍ය.

33. ඉදං ඛො තං භික්ඛවෙ අප්පමත්තකං ඔරමත්තකං සීලමත්තකං යෙන පුථුජ්ජනො තථාගතස්ස වණ්ණං වදමානො වදෙය්‍ය.

මහාසීලං නිට්ඨිතං.

34. අත්ථි භික්ඛවෙ අඤ්ඤෙසුව ධම්මා ගම්භීරා දුද්දසා දුරනුබොධා සන්තා පණීතා අතක්කාවචරා නිපුණා පණ්ඩිතවෙදනීයා, යෙ තථාගතො සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති, යෙහි තථාගතස්ස යථාභූතං වණ්ණං සම්මා වදමානා වදෙය්‍යුං. කතමෙ ච තෙ භික්ඛවෙ ධම්මා ගම්භීරා දුද්දසා දුරනුබොධා සන්තා පණීතා අතක්කාවචරා නිපුණා පණ්ඩිතවෙදනීයා යෙ තථාගතො සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති, යෙහි තථාගතස්ස යථාභූතං වණ්ණං සම්මා වදමානා වදෙය්‍යුං?

35. සන්ති භික්ඛවෙ එකෙ සමණබ්‍රාහ්මණා පුබ්බන්තකප්පිකා පුබ්බන්තානුදිට්ඨිනො පුබ්බන්තං ආරබ්භ අනෙකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති අට්ඨාදසහි වත්ථූහි. තෙ ච භොන්තො සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිමාරබ්භ පුබ්බන්තකප්පිකා පුබ්බන්තානුදිට්ඨිනො පුබ්බන්තං ආරබ්භ අනෙකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති අට්ඨාරසහි වත්ථූහි?

---

1. භූතකම්මං. කෙසුචි.

32. "යම්සේ ඇතැම් පින්වත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, ශාන්තිකර්ම (දෙවියනට බාර වීම), ප්‍රණීතිකර්ම (බාර ඔප්පු කිරීම), හූරිකර්ම (කිම් ගෙහි ඉඳ පිරුවැහු මන්ත්‍රයට උපචාර කිරීම), පණ්ඩිකයා (බෙහෙත් බලයෙන්) පිරිමියකු කිරීම, පිරිමියා පණ්ඩකයකු කිරීම, වාස්තු කර්මය (අළුත් කිමිහි ගෙවල් තැංවීම), වාස්තු පරිකිරණය (ගෙකිමිහි උවදුරු දුරු ලන්නට කිලියම් කිරීම), මතුරු දපා මුව ගේදීම, මතුරු දපා අනුත් නැවීම, අනුනට සෙත් පතා ගිනි පිදීම, වමන කැරවීම, විරේක කැරවීම, ඌර්ධ්ව විරේචනය, අධෝවිරේචනය (වස්ති කිරීම), ශීර්ෂ විරේචනය, ගිහියන්ගේ කන් ලෙඩට තෙල් පිසීම, ඇස සිසිල් කරන බෙහෙත් තෙල් පිසීම, නස්‍ය කිරීම, ඇස පටල කැපෙන්නට කාරම් අඳුන් සාදා දීම, ඇසැ සිසිල ගන්වන අඳුන් සාදා දීම, අනුන් ඇසැ උල්-ඇන ලෙඩට බෙහෙත් කිරීම, ශල්‍යකර්ම කිරීම, ළදරුවන්ගේ ලෙඩවලට පිළියම් කිරීම, මුල් බෙහෙත් දීම (කාය චිකිත්සාව), කාරම් බෙහෙත් බැඳ වණ සුව වූ පසු ඒවා ගලවා දැමීම යැ යි මෙසේ වූ තිරශ්චීන විද්‍යයෙන්, මිථ්‍යා-ජීවයෙන් දිවි පවත්වත් ද, මේ හෝ මෙබඳු අන් සියලු තිරශ්චීන විද්‍යයෙන් මිථ්‍යාජීවයෙන් මහණගොයුම් තෙමේ වැළැක්කේ යැ"යි මෙසේ හෝ තථාගතයන්ගේ ගුණ කියන පුහුදුන් තෙමේ කියන්නේ ය.

33. මහණෙනි, තථාගතයන් ගේ ගුණ කියන පුහුදුන් තෙමේ යමෙ-කින් එය කියන්නේ නම්, මේ (ඔහු කියන) ඒ ගුණය වනාහි මඳ වූ සුළු වූ හුදෙක් සිල් පමණක් ම වූ එකෙක.

මහාසීලය නිමි.

34. මහණෙනි, තථාගත තෙමේ යම් දහම් කෙනෙකුන් අනුන්ගේ උපදෙස් නැති වැ විශිෂ්ට ඥානයින් දැන පසක් කොට ලොවට දන්වා ද, තථාගත බුදුහුගේ ඇති පරිදි වූ ම ගුණ කියනු කැමැත්තෝ යම් දහම් කෙනෙකුන්ගෙන් එය මොනොවට කිය හැකි වන්නෝ ද, එසේ වූ, ගැඹුරු වූ, එ හෙයින් ම දුක සේ දැක්ක යුතු, දුක සේ දැන ගත යුතු, ශාන්ත වූ, උතුම් වූ, තර්කයෙන් බැස ගත නොහැකි වූ, (හෙවත් ප්‍රත්‍යක්ෂ ඥානයෙන් ම බැස ගත යුතු වූ), සියුම් වූ, නුවණැත්තන් විසින් ම දත යුතු වූ, අන්‍ය වූ ම ධර්ම කෙනෙක් ඇත්තාහ. මහණෙනි, තථාගත බුදු රජ තෙමේ යම් දහම් කෙනෙකුන් අනුන්ගේ උපදෙස් නැති වැ විශිෂ්ට ඥානයින් දැන පසක් කොට ලොවට දන්වා ද, ... සියුම් වූ, නුවණැත්තන් විසින් ම දත යුතු වූ ඒ ධර්මයෝ තම් කවුරු ද ? යත්:

35. මහණෙනි, පූර්වාන්තකල්පික වූ (අතීත ආත්මභාවසංඛ්‍යාත ගත වූ ස්කන්ධපරම්පරා කොටස තාමණදෘෂ්ටි වශයෙන් වරදවා කල්පනා කොට ගත්), ඒ අතීත ස්කන්ධපරම්පරා කොටස අනුවැ පහළ කොට ගත් දෘෂ්ටි ඇති සමහර මහණබමුණු කෙනෙක් ඇත්තාහ. ඔහු අතීතස්කන්ධපරම්පරා කොටස ඇරැඹැ කරුණු අටොළොසෙකින් අනේකප්‍රකාර දෘෂ්ටිප්‍රකාශක වචන කියත්. ඒ භවත් මහණබමුණෝ කුමක් නිසා කුමක් ඇරැඹැ අතීත ස්කන්ධපරම්පරා කොටස වරදවා කල්පනා කොට ගන්නෝ, අතීත ස්කන්ධපරම්පරා කොටස අනුවැ පහළ කොට ගත් දෘෂ්ටි ඇත්තෝ, අතීත ස්කන්ධපරම්පරා කොටස ඇරැඹැ අවලෝස් කරුණෙකින් නොයෙක් වැදැරුම් දෘෂ්ටිප්‍රකාශකවචන කියත් ද ? යත්:

36. සන්ති භික්ඛවෙ එකෙ සමණබ්‍රාහ්මණා සස්සතවාදා සස්සතං අත්තානඤ්ච ලොකඤ්ච පඤ්ඤපෙන්ති චතූහි වත්ථූහි. තෙ ච භොන්තො සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිමාරබ්භ සස්සතවාදා සස්සතං අත්තානඤ්ච ලොකඤ්ච පඤ්ඤපෙන්ති චතූහි වත්ථූහි ?

37. ඉධ භික්ඛවෙ එකච්චො සමණො වා බ්‍රාහ්මණො වා ආතප්පමන්වාය පධානමන්වාය අනුයොගමන්වාය අප්පමාදමන්වාය සම්මාමනසිකාරමන්වාය තථාරූපං චෙතොසමාධිං ඵුසති යථා සමාහිතෙ චිත්තෙ අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථිදං: ''එකම්පි ජාතිං ද්වෙ'පි ජාතියො තිස්සො'පි ජාතියො චතස්සො'පි ජාතියො පඤ්ච'පි ජාතියො දස'පි ජාතියො වීසතිම්පි ජාතියො තිංසම්පි ජාතියො චත්තාරීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි අනෙකානි'පි ජාතිසතානි අනෙකානි'පි ජාතිසහස්සානි අනෙකානි'පි ජාතිසතසහස්සානි අමුත්‍රාසිං එවන්නාමො එවඛ්ගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො අමුත්‍ර උපපාදිං[1] තත්‍රාපාසිං එවන්නාමො එවඛ්ගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො ඉධූපපන්නො'ති.''

ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සො එවමාහ: 'සස්සතො අත්තා ච ලොකො ච වඤ්ඤො කූටට්ඨො එසිකට්ඨායිට්ඨිතො. තෙව සත්තා සන්ධාවන්ති සංසරන්ති චවන්ති උපපජ්ජන්ති, අත්ථිත්වෙව සස්සතිසමං. තං කිස්ස හෙතු ? අහං හි ආතප්පමන්වාය අනුයොගමන්වාය අප්පමාදමන්වාය සම්මාමනසිකාරමන්වාය තථාරූපං චෙතොසමාධිං ඵුසාමි යථාසමාහිතෙ චිත්තෙ අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරාමි. සෙය්‍යථිදං: එකම්පි ජාතිං ද්වෙ'පි ජාතියො —පෙ— අනෙකානි'පි ජාතිසතසහස්සානි 'අමුත්‍රාසිං එවන්නාමො එවංගොත්තො -පෙ- ඉධූපපන්නො'ති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරාමි. ඉමිනාමහං එතං ජානාමි: යථා සස්සතො අත්තා ච ලොකො ච වඤ්ඤො කූටට්ඨො එසිකට්ඨායිට්ඨිතො. තෙව සත්තා සන්ධාවන්ති සංසරන්ති චවන්ති උපපජ්ජන්ති අත්ථිත්වෙව සස්සතිසම''න්ති.

ඉදං භික්ඛවෙ පඨමං ඨානං යං ආගම්ම යං ආරබ්භ එකෙ සමණබ්‍රාහ්මණා සස්සතවාදා සස්සතං අත්තානඤ්ච ලොකඤ්ච පඤ්ඤපෙන්ති.

---

1. උදපාදිං සී මු.

36. මහණෙනි, යම් කෙනෙක් ආත්මයත් ලෝකයත් ශාස්වත යැ යි (සදාභාවී යැ යි) කරුණු සතරෙකින් පණවත් (උගන්වත්) ද, එසේ වූ ශාස්වත දෘෂ්ටි ගත් ඇතැම් මහණබමුණු කෙනෙක් ඇත්තාහ. ඒ භවත් මහණබමුණෝ කුමක් ඇසුරු කොට, කිමෙකැ එල්බැ, ශාස්වතදෘෂ්ටි ගත්තෝ ආත්මයත් ලෝකයත් ශාස්වත යැ යි කරුණු සතරෙකින් ලොවට කියා පාත් ද? යත්:

37. මහණෙනි, මෙහි කිසි මහණෙක් හෝ බමුණෙක් හෝ වීර්‍ය ප්‍රත්‍යය කොට ගෙන (වැර වඩා), උත්සාහය ප්‍රත්‍යය කොට ගෙන (උත්සාහ වඩා), යලි යලි වියතියෙහි යෙදීමට පැමිණ (පුන පුනා වැර වඩා), නොපමා බවට පැමිණ (එළඹැ සිටිය සිහිය තිසා), නුවණ තිසා, යම් සමාධියෙකින් සිත මතා වැ පිහිටි කල්හි අනේකවිධ වූ පෙරැ වුසු කඳ පිළිවෙළ සිහි කෙරේ ද, එසේ වූ චිත්තසමාධියක් ලබයි. ඒ මෙසේ යි: "අසෝ තැනැ වීමි, එහි මේ නම් ඇතියෙමි වීමි, මෙ නම් ගෝත්‍ර ඇතියෙමි වීමි, මෙබඳු පැහැ ඇතියෙමි වීමි, මෙබඳු ආහාර ඇතියෙමි වීමි, මෙ බඳු සුව දුක් විඳින්නෙමි වීමි, මෙ තෙක් වයස් සීමාවක් ඇතියෙමි වීමි, ඒ මම එයින් සැව අසෝ තැන උපනිමි, එහි ද මෙ නම් ඇතියෙමි වීමි, මෙ නම් ගෝත්‍ර ඇතියෙමි වීමි, මෙබඳු පැහැ ඇතියෙමි වීමි, මෙබඳු ආහාර ඇතියෙමි වීමි, මෙබඳු සුව දුක් විඳින්නෙමි වීමි, මෙතෙක් ආයු සීමාවක් ඇතියෙමි වීමි, ඒ මම එයින් සැව මෙහි උපනිමි" යි මෙසේ එක් ජාතියක් ද, ජාති දෙකක් ද, ජාති තුනක් ද, ජාති සතරක් ද, ජාති පසක් ද, ජාති දශයක් ද, ජාති විස්සක් ද, ජාති තිසක් ද, ජාති සතළිසක් ද, ජාති පනසක් ද, ජාති සියයක් ද, ජාති දහසක් ද, ජාති සියදහසක් ද, නොයෙක් සිය ගණන් ජාතීන් ද, නොයෙක් දහස් ගණන් ජාතීන් ද, නොයෙක් සියදහස් ගණන් ජාතීන් ද, මෙසේ පැහැ සටහන් ආදි ආකාර සහිත කොට, නාම්ගෝත්‍ර වශයෙන් උද්දේශ සහිත කොට නොයෙක් වැදැරුම් පෙරැ වුසු කඳ පිළිවෙළ සිහි කෙරෙයි.

මෙසේ ධ්‍යානානුභාවයෙන් යුක්ත හෙ තෙමේ දෘෂ්ටිගතික වූයේ මෙලෙස කියයි: "ආත්මයත් ලෝකයත් ශාස්වත ය (සදාභාවී ය), වඳ ය (අචල ය හෙවත් කිසිවක් නො උපදවන්නේ ය), ගිරි කුළක් සේ නිශ්චල වැ සිටියේ වෙයි ගැඹුරු වළ කැන සිටුවන ලද ඉන්ද්‍රකීලයක් සේ ස්ථිර වැ සිටියේ වෙයි. ඒ සත්ත්වයෝ ම මෙයින් අත් තැනට යෙති. භවයෙන් භවයට හැසිරෙති, මැරෙති, මැරී උපදිති. (මහාපෘථිවි ආදී) සදාභාවී වස්තූන් මෙන් ඒ ආත්මය ද ලෝකය ද සදාභාවී වැ විද්‍යමාන ම ය. එසේ (මා) කියනුයේ කවර හෙයින? යත්: මම වනාහි වීර්‍ය වඩා, උත්සාහ වඩා, පුන පුනා වැර වඩා, නොපමා බව තිසා, නුවණ තිසා, යම් සමාධියෙකින් සිත මතා වැ පිහිටි කල්හි නොයෙක්වැදැරුම් පෙර වුසු කඳ පිළිවෙළ සිහි කෙරෙම් ද, එබඳු වූ චිත්තසමාධියක් ලැබීමි. ඒ මෙසේ ය: "අසෝ තැන වීමි, එහි මෙ නම් ඇතියෙමි වීමි. ...ඒ මම එයින් සැව මෙහි උපනිමි"යි මෙසේ එක් ජාතියක් ද, ජාති දෙකක් ද, ... නොයෙක් සියදහස් ගණන් ජාතීන් ද මෙ සේ පැහැ සටහන් ආදි ආකාර සහිත කොට, නාම ගෝත්‍ර වශයෙන් උද්දේශ සහිත කොට, නොයෙක්වැදැරුම් පෙරැ වුසු කඳපිළිවෙළ සිහි කෙරෙමි. මේ කාරණයෙනුත් මම, යම්සේ ආත්මයත් ලෝකයත් ශාස්වත ද, වඳ ද, ගිරිකුළක් සේ තහවුරු වැ සිටියේ ද, ඉන්ද්‍ර-කීලයක් සේ නිසල වැ සිටියේ ද, ඒ සත්ත්වයෝ ම මෙයින් අත් තැනට යෙතැ යි, ඒ සත්ත්වයෝ ම භවයෙන් භවයට යෙතැ යි, ඒ සත්ත්වයෝ ම මැරෙතැ යි, මැරී යලි උපදිතැ යි මෙ සේ ආත්මයත් ලෝකයත් පොළොව ආදි නො නැසී පවත්නා වස්තූනට සම වැ හැම කල්හි ම විද්‍යමාන යහ යි මෙය දනිමි."

මහණෙනි, යමක් අරමුණු කොට ඇතැම් මහණබමුණෝ ශාස්වත දෘෂ්ටි ඇත්තෝ ආත්මයත් ලෝකයත් ශාස්වත කොට පණවත් ද, මේ ඒ පළමු කාරණය යි.

38. දුතියෙ ච භොතෙතා සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිමාරබ්භ සස්සතවාදා සස්සතං අත්තානඤ්ච ලොකඤ්ච පඤ්ඤපෙන්ති ?

ඉධ භික්ඛවෙ එකච්චෙ සමණෙ වා බ්‍රාහ්මණෙ වා ආතප්පමන්වාය පධානමන්වාය අනුයොගමන්වාය අප්පමාදමන්වාය සම්මාමනසිකාරමන්වාය තථා-රූපං චෙතොසමාධිං ඵුසති යථා සමාහිතෙ චිත්තෙ අනෙකවිහිතං පුබ්බෙ-නිවාසං අනුස්සරති—සෙය්‍යථිදං: එකම්පි සංවට්ටවිවට්ටං දෙ'පි සංවට්ට-විවට්ටානි තීණි'පි සංවට්ටවිවට්ටානි චත්තාරි'පි සංවට්ටවිවට්ටානි පඤ්ච'පි සංවට්ටවිවට්ටානි දස'පි සංවට්ටවිවට්ටානි 'අමුත්‍රාසිං එවන්නාමො එවඞ්ගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායු-පරියන්තො. සො තතො චුතො අමුත්‍ර උපපාදිං. තත්‍රාපාසිං එවන්නාමො එවඞ්ගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එව-මායුපරියන්තො. සො තතො චුතො ඉධූපපන්නො'ති.'' ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

සො එවමාහ: 'සස්සතො අත්තා ච ලොකො ච වඤ්ඤො කූටට්ඨො එසිකට්ඨායිට්ඨිතො. තෙව සත්තා සන්ධාවන්ති සංසරන්ති චවන්ති උපපජ්ජන්ති අත්ථිත්වෙව සස්සතිසමං. තං කිස්ස හෙතු ? අහං හි ආතප්පමන්වාය —පෙ— තථාරූපං චෙතොසමාධිං ඵුසාමි යථා සමාහිතෙ චිත්තෙ අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරාමි—සෙය්‍යථිදං: එකම්පි —පෙ— දස'පි සංවට්ට-විවට්ටානි 'අමුත්‍රාසිං එවන්නාමො —පෙ— ඉධූපපන්නො'ති. ඉති සාකාරං සඋද්දෙසං අනෙක විහිතං පුබ්බෙනිවාසං අනුස්සරාමි. ඉමිනා'පාහං එතං ජානාමි යථා සස්සතො අත්තා ච ලොකො ච වඤ්ඤො කූටට්ඨො එසිකට්ඨා-යිට්ඨිතො. තෙව සත්තා සන්ධාවන්ති සංසරන්ති චවන්ති උපපජ්ජන්ති. අත්ථිත්වෙව සස්සතිසමං'ති.''

ඉදං භික්ඛවෙ දුතියං ඨානං යං ආගම්ම යං ආරබ්භ එකෙ සමණ-බ්‍රාහ්මණා සස්සතවාදා සස්සතං අත්තානඤ්ච ලොකඤ්ච පඤ්ඤපෙන්ති.

39. තතියෙ ච භොතෙතා සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිමාරබ්භ සස්සතවාදා සස්සතං අත්තානඤ්ච ලොකඤ්ච පඤ්ඤපෙන්ති ?

38. දෙවෙනි කාරණයෙහිත් භවත් මහණබමුණෙනි කුමක් නිසා කුමක් අරමුණු කොට ශාස්වතදෘෂ්ටික වූවෝ ආත්මයත් ලෝකයත් ශාස්වත කොට පණවත් ද ? යත්:

මහණෙනි, මෙහි ඇතැම් මහණෙක් හෝ බමුණෙක් හෝ උත්සාහ කොට, වීර්‍ය්‍ය කොට, පුත පුනා වැර වඩා, සමාධිසම්ප්‍රයුක්ත බව නිසා, සම්‍යක්මනස්කාරය* නිසා, යම් සමාධියෙකින් ඝිත මනා වැ පිහිටි කල්හි අනේකවිධ වූ පෙරැ වුසු කඳ පිළිවෙළ සිහි කෙරේ ද, එසේ වූ චිත්ත සමාධියක් ලබයි. ඒ මෙසේ ය: "අසෝ තැන වීමි, එහි මෙ නම් ඇතියෙම් වීමි, මෙ නම් ගෝත්‍ර ඇතියෙම් වීමි, මෙබඳු පැහැ ඇතියෙම් වීමි, මෙබඳු ආහාර ඇතියෙම් වීමි, මෙබඳු සුව දුක් විඳින්නෙම් වීමි, මෙ තෙක් ආයු සීමාවක් ඇතියෙම් වීමි, ඒ මම එයින් සැව අසෝ තැන උපතිමි, එහි ද මෙ නම් ඇතියෙම් වීමි, මෙ නම් ගෝත්‍ර ඇතියෙම් වීමි, මෙබඳු පැහැ ඇති-යෙම් වීමි, මෙබඳු ආහාර ඇතියෙම් වීමි, මෙබඳු සුව දුක් විඳින්නෙම් වීමි, මෙ තෙක් ආයු සීමා ඇතියෙම් වීමි, ඒ මම එයින් සැව මෙහි උපතිමි" යි මෙසේ එක් සංවර්ත්තිවර්ත්තියක් ද සංවර්ත්තිවර්ත්ත දෙකක් ද සංවර්ත්තිවර්ත්ත තුනක් ද සංවර්ත්තිවර්ත්ත සතරක් ද සංවර්ත්තිවර්ත්ත පහක් ද සංවර්ත්තිවර්ත්ත දශයක් ද, පැහැ සටහන් ආදී ආකාර සහිත කොට, නම් ගොස් විසින් උදෙසුම් සහිත කොට, නොයෙක් වැදැරුම් පෙරැ වුසු කඳ පිළිවෙළ සිහි කෙරෙයි.

මෙබඳු ධ්‍යානානුභාව ඇති හේ දෘෂ්ටිගතික වූයේ මෙසේ කියයි: "ආත්මයත් ලෝකයත් සදකාලික ය, වඳ ය, ගිරි කුළක් සේ නිසල ය, ඉන්ද්‍රකීලයක් සේ තහවුරු ය, ඒ සත්ත්වයෝ ම මෙයින් අත් තැනට යෙති, භවයෙන් භවයට හැපිදිති, මැරෙති, මැරී උපදිති, (මහාපෘථිව්‍යාදි) සදකාලික වස්තූන් මෙන් ආත්මය ද ලෝකය ද හැම කල්හි විද්‍යමාන ම ය. "මෙසේ මා කියනුයේ කවර හෙයින ? යත්: මම වතාහි උත්සාහ කොට, වීර්‍ය්‍ය කොට, පුත පුනා වැර වඩා, සමාධිසම්ප්‍රයුක්ත බව නිසා, සම්‍යඤ්මනස්කාරය නිසා, යම් සමාධියෙකින් ඝිත මනා ව පිහිටි කල්හි නොයෙක් වැදැරුම් පෙරැ වුසු කඳපිළිවෙළ සිහි කෙරෙම් ද, එසේ වූ චිත්තසමාධියක් ලැබීමි. ඒ මෙසේ ය: 'අසෝ තැන වීමි. ...,මෙසේ එක් සංවර්ත්තිවර්ත්තියක් ද, සංවර්ත්තිවර්ත්ත දෙකක් ද... සංවර්ත්තිවර්ත්ත දශයක් ද ආකාර සහිත කොට උද්දේශ සහිත කොට පෙරැ වුසු කඳපිළිවෙළ සිහි කෙරෙමි. මේ කාරණයෙනුත් යම්සේ ආත්මයත් ලෝකයත් සදකාලික ද, වඳ ද, ගිරිකුළක් සේ නිසල ද, ඉන්ද්‍රකීලයක් සේ තහවුරු ද, ඒ සත්ත්වයෝ ම මෙයින් අත් තැනට යෙත් ද, භවයෙන් භවයට හැපිදිත් ද, මැරෙත් ද, මැරී උපදිත් ද (මහාපෘථිව්‍යාදිය මෙන්) හැම ද ම ඇත්තාහු ද, එසේ මේ කාරණය දනිමි."

මහණෙනි, සමහර මහණ බමුණෝ යමක් නිසා යමෙක එල්බැ ගෙන ශාස්වතදෘෂ්ටිගතික වූවෝ ආත්මයත් ලෝකයත් ශාස්වත කොට පණවත් නම්, මේ ඒ දෙවෙනි කාරණය යි.

39. තෙවෙනි කාරණයෙහි ද භවත් මහණබමුණෝ කුමක් නිසා, කිමෙක එල්බැ ගෙන, ශාස්වත දෘෂ්ටි ගත්තෝ ආත්මයත් ලෝකයත් ශාස්වත කොට පණවත් ද ? යත්:

---

* සම්මාමනසිකාරෝ'ති උපායමනසිකාරෝ පථමනසිකාරෝ. අත්ථතො ඤාණසම්පයුත්තා චිත්තුප්පාදා. විභා.

ඉධ භික්ඛවෙ එකච්චො සමණො වා බ්‍රාහ්මණො වා ආතප්පමත්තාය පධානමත්තාය අනුයොගමත්තාය අප්පමාදමත්තාය සම්මාමනසිකාරමත්තාය තථාරූපං චෙතොසමාධිං ඵුසති යථාසමාහිතෙ චිත්තෙ අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති — සෙය්‍යථිදං: දස'පි සංවට්ටවිවට්ටානි වීසතිම්පි සංවට්ටවිවට්ටානි තිංසම්පි සංවට්ටවිවට්ටානි චත්තාරීසම්පි සංවට්ටවිවට්ටානි "අමුත්‍රාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛ-දුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො අමුත්‍ර උපපාදිං.[1] තත්‍රාපාසිං එවන්නාමො එවඛොත්තො එවංවණ්ණො එවමාහාරො එවං-සුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො සො තතො චුතො ඉධූපපන්නො'ති." ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

සො එවමාහ: "සස්සතො අත්තා ච ලොකො ච වඤ්ඤො කූටට්ඨො එසිකට්ඨායිට්ඨිතො. තෙව සත්තා සන්ධාවන්ති සංසරන්ති චවන්ති උපපජ්ජන්ති අත්ථිත්වෙව සස්සතිසමං. තං කිස්ස හෙතු? අහං හි ආතප්පමත්තාය —පෙ— තථාරූපං චෙතොසමාධිං ඵුසාමි යථාසමාහිතෙ චිත්තෙ අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරාමි— සෙය්‍යථිදං: දස'පි සංවට්ටවිවට්ටානි —පෙ— චත්තාරීසම්පි සංවට්ටවිවට්ටානි 'අමුත්‍රාසිං එවන්නාමො —පෙ— ඉධූප-පන්නො'ති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරාමි. ඉමිනා මහං එතං ජානාමි: යථා සස්සතො අත්තා ච ලොකො ච වඤ්ඤො කූටට්ඨො එසිකට්ඨායිට්ඨිතො තෙව සත්තා සන්ධාවන්ති සංසරන්ති චවන්ති උපපජ්ජන්ති අත්ථිත්වෙව සස්සතිසමං'ති."

ඉදං භික්ඛවෙ තතියං ඨානං යං ආගම්ම යං ආරබ්භ එකෙ සමණ-බ්‍රාහ්මණා සස්සතවාදා සස්සතං අත්තානං ච ලොකං ච පඤ්ඤපෙන්ති.

40. චතුත්ථෙ ච භොන්තො සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිමාරබ්භ සස්සතවාදා සස්සතං අත්තානඤ්ච ලොකඤ්ච පඤ්ඤපෙන්ති.?

ඉධ භික්ඛවෙ එකච්චො සමණො වා බ්‍රාහ්මණො වා තක්කී හොති වීමංසී. සො තක්කපරියාහතං වීමංසානුචරිතං සයම්පටිභානං එවමාහ: 'සස්සතො අත්තා ච ලොකො ච වඤ්ඤො කූටට්ඨො එසිකට්ඨායිට්ඨිතො. තෙව සත්තා සන්ධාවන්ති සංසරන්ති චවන්ති උපපජ්ජන්ති අත්ථිත්වෙව සස්සතිසමන්ති.

---

1. උදපාදිං, සී මු.

මහණෙනි, මෙහි ඇතැම් මහණෙක් හෝ බමුණෙක් උත්සාහය නිසා, වීර්යය නිසා, පුන පුනා වැර වැඩුම් නිසා, අප්‍රමාදය නිසා, සම්‍යක්මනස්කාරය නිසා, යම් සමාධියෙකින් සිත මොනොවට පිහිටි කල්හි නන් වැදැරුම් පෙරැ වුසු කඳපිළිවෙළ සිහි කෙරේ ද, එසේ වූ චිත්ත සමාධියක් ලබයි. එය (සිහි කරනුයේ) මෙසේ ය: "අසෝ තැන වීමි, එහි මෙ නම් ඇතියෙම් වීමි, මෙ නම් ගෝත්‍ර ඇතියෙම් වීමි, මෙබඳු පැහැ ඇතියෙම් වීමි, මෙබඳු ආහාර ඇතියෙම් වීමි, මෙබඳු සුව දුක් විඳින්නෙම් වීමි, මෙ තෙක් ආයු සීමාවක් ඇතියෙම් වීමි, ඒ මම එයින් සැව අසෝ තැන උපතිමි, එහි ද මෙ නම් ඇතියෙම් වීමි, මෙ නම් ගෝත්‍ර ඇතියෙම් වීමි, මෙබඳු පැහැ ඇතියෙම් වීමි, මෙබඳු ආහාර ඇතියෙම් වීමි, මෙබඳු සුව දුක් විඳින්නෙම් වීමි, මෙ තෙක් ආයු සීමා ඇතියෙම් වීමි, ඒ මම එයින් සැව මෙහි උපතිමි"යි සංවර්ත්විවර්ත දශයක් ද, සංවර්ත්විවර්ත විස්සක් ද, සංවර්ත්විවර්ත තිසක් ද, සංවර්ත් විවර්ත සතළිසක් දැ යි මෙසේ ආකාර සහිත වූ උද්දේශ සහිත වූ නොයෙක් වැදැරුම් පෙරැ වුසු කඳ පිළිවෙළ සිහි කෙරෙයි.

හේ මෙසේ කියයි: "ආත්මයත් ලෝකයත් සදුකාලිකය, වඳ ය, ගිරි කුළක් සේ නිසල ය. ඉඳුකිලක් සේ තර ය. ඒ සත්හු ම මෙයින් අන් තැනට යෙති, භවයෙන් භවයට යෙති, මැරෙති, මැරී උපදිති, මහාපෘථිව්‍යාදී ශාස්වත වස්තූනට සම ව හැම කල්හි ම ඇත්තාහු ය. මෙසේ මා කියනු යේ කවර හෙයින ? යත්: මම වතාහි උත්සාහය නිසා, වීර්යය නිසා, පුන පුනා වැර වැඩුම් නිසා, නොපමා බව නිසා, මනාසේ මෙනෙහි කැරැම් නිසා, යම් සමාධියෙකින් සිත මොනොවට පිහිටි කල්හි නොයෙක්වැදැරැම් පෙරැ වුසු කඳ පිළිවෙළ සිහි කෙරෙම් ද, එසේ වූ චිත්තසමාධියක් ලැබීමි. ඒ මෙසේ ය: 'අසෝ තැන වීමි එයින් සැව මෙහි උපතිමි"යි සංවර්ත්විවර්ත දශයක් ද...සංවර්ත්විවර්ත සතළිසක් දැ යි මෙ සේ ආකාර සහිත, උද්දේශ සහිත නොයෙක් වැදැරැම් පෙරැ වුසු කඳපිළිවෙළ සිහි කෙරෙමි. මේ කරුණින් මම යම්සේ ආත්මයත් ලෝකයත් ශාස්වත ද, වඳ ද, ගිරි කුළක් සේ තිසල ද, ඉඳුකිලක් සේ තහවුරු ද, ඒ සත්හු ම මෙයින් අන් තැනට යෙත් ද, භවයෙන් භවයට හැවිදිත් ද, මැරෙත් ද, මැරී උපදින් ද, මහාපෘථිව්‍යාදී ශාස්වත වස්තූන් හා සම ව හැම දා ම ඇත්තාහු ද, එසේ මේ කාරණය දනිමි" යනු යි.

මහණෙනි, ඇතැම් මහණබමුණෝ ශාස්වතදෘෂ්ටි ඇත්තෝ, යමක් නිසා, යමෙක එල්බැ ගෙන, ආත්මයත් ලෝකයත් ශාස්වත කොට පණවත් නම්, මේ ඒ තෙවෙනි කාරණය යි.

40. සිවු වන කරුණෙහි ද, භවත් මහණබමුණෝ කුමක් නිසා කිමෙක එල්බැ ගෙන ශාස්වතවාදී වූවෝ, ආත්මයත් ලෝකයත් ශාස්වත කොට පණවත් ද? යත්:

මහණෙනි, මෙහි එක්තරා මහණෙක් හෝ බමුණෙක් හෝ තර්ක කරන්නේ වෙයි, විමසන්නේ වෙයි. හේ ඒ ඒ කරුණින් තර්ක කොට, විමැසුම් නුවණ පමණින් ම කාරණය මැන "ආත්මයත් ලෝකයත් සදුකාලික ය, වඳ ය, ගිරිකුළක් සේ නිසල ය, ඉඳුරුකිලක් සේ තර වැ සිටියේ ය, ඒ සත්හු ම මෙයින් අන් තැනට යෙත්, භවයෙන් භවයට යෙත්, මැරෙත්, මැරී උපදිත්, මහාපෘථිව්‍යාදී ශාස්වතීනට (සදුකාලික වස්තූන්හට) සම වැ හැමදා ම ඇත්තාහ"යි මෙසේ තමාගේ ක්‍රුදු වැටැහීම කියයි.

ඉදං භික්ඛවෙ වතුත්ථං ඨානං යං ආගම්ම යං ආරබ්ම එකෙ සමණ-බ්‍රාහ්මණා සස්සතවාදා සස්සතං අත්තානඤ්ච ලොකඤ්ච පඤ්ඤපෙන්ති.

41. ඉමෙහි ඛො තෙ භික්ඛවෙ සමණබ්‍රාහ්මණා සස්සතවාදා සස්සතං අත්තානඤ්ච ලොකඤ්ච පඤ්ඤපෙන්ති වතූහි වත්ථූහි. යෙ හි කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා සස්සතවාදා සස්සතං අත්තානඤ්ච ලොකඤ්ච පඤ්ඤපෙන්ති, සබ්බෙ තෙ ඉමෙහෙව වතූහි වත්ථූහි එතෙසං වා අඤ්ඤ-තරෙන නත්ථි ඉතො බහිද්ධා.

42. තත්‍රිදං භික්ඛවෙ තථාගතො පජානාති: 'ඉමෙ ඛො දිට්ඨිට්ඨානා එවංගහිතා එවංපරාමට්ඨා එවංගතිකා භවිස්සන්ති එවංඅභිසම්පරායා'ති. තඤ්ච තථාගතො පජානාති තතො ච උත්තරිතරං පජානාති. තං ච පජානනං න පරාමසති. අපරාමසතො චස්ස පච්චත්තඤ්ඤෙව නිබ්බුති විදිතා. වෙදනානං සමුදයඤ්ච අත්ථංගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සර-ණඤ්ච යථාභූතං විදිත්වා අනුපාදා විමුත්තො භික්ඛවෙ තථාගතො.

43. ඉමෙ ඛො තෙ භික්ඛවෙ ධම්මා ගම්භීරා දුද්දසා දුරනුබොධා සන්තා පණීතා[1] අතක්කාවචරා නිපුණා පණ්ඩිත වෙදනීයා[2] යෙ තථා-ගතො සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති යෙහි තථාගතස්ස යථාභූතවං වණ්ණං සම්මා වදමානා වදෙය්‍යුං.

පඨමභාණවාරං

---

44. සන්ති භික්ඛවෙ එකෙ සමණබ්‍රාහ්මණා එකච්චසස්සතිකා එකච්ච-අසස්සතිකා එකච්චං සස්සතං එකච්චං අසස්සතං අත්තානඤ්ච ලොකඤ්ච පඤ්ඤපෙන්ති වතූහි වත්ථූහි. නෙ ච හොන්තො සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිමාරබ්ම එකච්චසස්සතිකා එකච්චඅසස්සතිකා එකච්චං සස්සතං එකච්චං අසස්සතං අත්තානඤ්ච ලොකඤ්ච පඤ්ඤපෙන්ති වතූහි වත්ථූහි. ?

---

2. පණීතා, ම ජ සං.
3. වෙදනියා, ම ජ සං.

මහණෙනි, ඇතැම් මහණබමුණෝ යමක් නිසා, යමක් ඇරැඹැ, ශාශ්වත දෘෂ්ටි ගත්තෝ ආත්මයත් ලෝකයත් ශාශ්වත කොට පණවත් නම් මේ ඒ සිවු වන කාරණය යි,

41. මහණෙනි, ශාශ්වතදෘෂ්ටි ගත් ඒ මහණබමුණෝ මේ සතර කරුණින් ආත්මය ද ලෝකය ද ශාශ්වත කොට පණවත්. මහණෙනි, ශාශ්වත දෘෂ්ටි ගත් යම් මහණ බමුණු කෙනෙක් ආත්මයත් ලොකයත් ශාශ්වත කොට පණවත් නම්, ඒ සියල්ලෝ මේ කරුණු සතරින් ම හෝ මොවුන් අතුරෙන් එකෙකින් හෝ එසේ පණවත්. මේ සතර කරුණින් පිටත් අන් කරුණෙක් ඔවුහට නැත.

42. මහණෙනි, මේ දෘෂ්ටිහු (හෝ දෘෂ්ටිකාරණයෝ) මෙසේ ගන්නා ලද්දේ, මෙ සේ පරාමෘෂ්ට වූවෝ, මෙබඳු වූ නිරයාදී විපාකගති ඇත්තෝ වන්නාහ, මෙබඳු පරලොවක් ඇතියෝ වන්නාහ' යි ඒ මේ සතර දෘෂ්ටි-ගතය ම තථාගත තෙමේ තන් අයුරින් දනී. තථාගත තෙමේ එයත් දනී. එයින් මත්තෙහි වූ (ශීල සමාධි ප්‍රඥ විමුක්ති විමුක්තිඥානදර්ශන සමන්විතාඥන යන මේ) සියල්ලත් දනී. එය දන්නේ, 'මෙය මම් දනිමි'යි තෘෂ්ණා දෘෂ්ටි මාත්‍ර වශයෙන් පරාමර්ශනය නො කෙරෙයි, එය පරාමර්ශනය නොකරන ඒ තථාගත බුදුහු විසින් තමා ම කෙලෙස් නිවීම දන්නා ලද්දේ ය. (මෙහි සුව පත් වමු යි අසෝ තැන සුව පත් වමු යි සිතමින් යම් සැප වේදනාවන්හි ඇළුණු අන් තොවුවෝ නානාවිධ දෘෂ්ටිගහනයට වදින් ද), තථාගත තෙමේ ඒ වේදනාවන්ගේ උත්පත්තිය ද විනාශය ද ආස්වාදය ද ආදීනවය ද ඒ වේදනාවන්ගේ නික්මීම ද තත් වූ පරිදි දැන, ඡන්දරාගය දුරු වූ බැවින් උපාදාන රහිත ව මිදුණේ වෙයි.

43. මහණෙනි, තථාගත තෙමේ යම් ධර්ම කෙනෙකුන් තෙමේ ම විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කෙරේ නම්, යම් ධර්ම කෙනෙකුන් කරණ කොට ගෙන තථාගත බුදුහුගේ ඇති පරිදි වූ ම ගුණ කියන්නට තැත් කරන්නෝ කියන්නාහු නම්, මේ - ගැඹුරු වූ, සර්ව බුදු කෙනෙකුන් විසින් ම විනා සෙස්සවුන් විසින් නො දැක්ක හැකි වූ, එ හෙයින් ම සෙස්සවුන් විසින් අවබෝධ නො කට හැකි වූ, ශාන්ත වූ ප්‍රණීත වූ, තර්කයෙන් බැස නො ගත හැකි වූ, සියුම් වූ, ප්‍රාඥයන් විසින් ම දත හැකි වූ ඒ ධර්මයෝ ය.

පළමු බණවර යි.

---

44. මහණෙනි, යම් කෙනෙක් ආත්මයත් ලෝකයත් එක් කොටසක් ශාශ්වත කොට ද එක් කොටසක් අශාශ්වත කොට ද කරුණු සතරෙකින් පණවත් නම්, එසේ වූ ඒකත්‍යශාශ්වතික වූ ද ඒකත්‍යඅශාශ්වතික වූ ද ඇතැම් මහණබමුණු කෙනෙක් ඇත්තාහ.

ඒ හවත් මහණ බමුණෝ කුමක් නිසා කිමෙක එල්බැ ඒකත්‍ය-ශාශ්වතික ද ඒකත්‍යඅශාශ්වතික ද වූවාහු (එක් කොටසක් සදකාලික යැ යි ද එක් කොටසක් සදකාලික නො වේ යැ යි ද යන දෘෂ්ටි ඇත්තාහු) ආත්මයත් ලෝකයත් එක් කොටසක් ශාශ්වත යැ යිත් එක් කොටසක් අශාශ්වතයැ යිත් කියා සතර කරුණෙකින් පණවත් ද ? යත්:

45. හොති ඛො සො භික්ඛවෙ සමයො යං කදාචි කරහචි දීඝස්ස අද්ධුනො අච්චයෙන අයං ලොකො සංවට්ටති. සංවට්ටමානෙ ලොකෙ යෙභුය්‍යෙන සත්තා ආභස්සරසංවත්තනිකා හොන්ති. තෙ තත්ථ හොන්ති මනොමයා පීතිභක්ඛා සයම්පභා අන්තලික්ඛචරා සුභට්ඨායිනො චිරං දීඝමද්ධානං තිට්ඨන්ති.

හොති ඛො සො භික්ඛවෙ සමයො යං කදාචි කරහචි දීඝස්ස අද්ධුනො අච්චයෙන අයං ලොකො විවට්ටති. විවට්ටමානෙ ලොකෙ සුඤ්ඤං බ්‍රහ්මවිමානං පාතුභවති. අථඤ්ඤතරො සත්තො ආයුක්ඛයා වා පුඤ්ඤක්ඛයා වා ආභස්සරකායා චවිත්වා සුඤ්ඤං බ්‍රහ්මවිමානං උපපජ්ජති. සො තත්ථ හොති මනොමයො පීතිභක්ඛො සයම්පභො අන්තලික්ඛචරො සුභට්ඨායී චිරං දීඝමද්ධානං තිට්ඨති. තස්ස තත්ථ එකකස්ස දීඝරත්තං නිබ්බුසිතත්තා අනභිරති පරිතස්සතා උප්පජ්ජති: 'අහො වත අඤ්ඤෙ'පි සත්තා ඉත්ථත්තං ආගච්ඡෙය්‍යුන්ති'. අථ අඤ්ඤතරෙ'පි සත්තා ආයුක්ඛයා වා පුඤ්ඤක්ඛයා වා ආභස්සරකායා චවිත්වා බ්‍රහ්මවිමානං උපපජ්ජන්ති තස්ස සත්තස්ස සහව්‍යතං. තෙ'පි තත්ථ හොන්ති මනොමයා පීතිභක්ඛා සයම්පභා අන්තලික්ඛචරා සුභට්ඨායිනො චිරං දීඝමද්ධානං තිට්ඨන්ති.

තත්‍ර භික්ඛවෙ යො සො සත්තො පඨමං උපපන්නො තස්ස එවං හොති: 'අහමස්මි බ්‍රහ්මා මහාබ්‍රහ්මා අභිභූ අනභිභූතො අඤ්ඤදත්ථුදසො වසවත්තී ඉස්සරො කත්තා නිම්මාතා සෙට්ඨො සජිතා[1] වසී පිතා භූතභව්‍යානං. මයා ඉමෙ සත්තා නිම්මිතා. තං කිස්ස හෙතු? මමං හි පුබ්බෙ එතදහොසි: අහො වත අඤ්ඤෙ'පි සත්තා ඉත්ථත්තං ආගච්ඡෙය්‍යුන්ති. ඉති මමඤ්ච[2] මනොපණිහි. ඉමෙ ච සත්තා ඉත්ථත්තං ආගතා'ති. යෙ'පි තෙ සත්තා පච්ඡා උපපන්නා[3] තෙසම්පි එවං හොති: අයං ඛො භවං බ්‍රහ්මා මහාබ්‍රහ්මා අභිභූ අනභිභූතො අඤ්ඤදත්ථුදසො වසවත්තී ඉස්සරො කත්තා නිම්මාතා සෙට්ඨො සජිතා වසී පිතා භූතභව්‍යානං. ඉමිනා මයං භොතා බ්‍රහ්මුණා නිම්මිතා. තං කිස්ස හෙතු? ඉමං හි මයං අද්දසාම ඉධ පඨමං උපපන්නං, මයං පනම්හා පච්ඡා උපපන්නා'ති.

---

1. සංජිතා. PTS.
2. මම ච. මජ්ඣං.
3. උපපන්නා. සී මු. 1.

45. මහණෙනි, දික් කලක් ඇවැමෙන් කිසි සමයෙක මේ ලොව නස්නේ ද, එබඳු වූ කාලයෙක් වේ ම ය. එසේ ලොව නැසෙන කල්හි සත්හු බෙහෙවින් ආභස්සර බඹලොවැ උපදින්නෝ වෙති. ඔහු එහි ධ්‍යානචිත්ත බලයෙන් උපන්නෝ වෙති, ප්‍රීතිය ම ආහාර කොට ඇත්තෝ වෙති, තුමූ ම බැබළෙන්නෝ වෙති, අහසෙහි හැසිරෙන්නෝ වෙති, සිත්කළු වස්ත්‍රාභරණ හැඳ පැළැඳ සිටින්නෝ වෙති. එහි ඔහු ඉතා බොහෝ කලක් සිටිත්.

මහණෙනි, දික් කලක් ඉක්මීමෙන් කිසි සමයෙක මෙලොව නැවැත හට ගන්නේ නම් එසේ වූ කාලයෙක් වෙයි. එසේ ලොව හට ගන්නා කල්හි හිස් බඹවිමනෙක් පහළ වෙයි. එ කල්හි එක්තරා සත්ත්වයෙක් ආයු ගෙවී යෑමෙන් හෝ පින් ගෙවී යෑමෙන් ආභස්සර බඹ ලොවින් සැව ඒ හිස් බඹවිමනෙහි උපදී. හෙ තෙමේ එහි ධ්‍යාන සිතින් උපන්නේ ප්‍රීතිය ම ආහාර කොට ඇත්තේ වෙයි. සිය සිරුරු එළියෙන් ම බබළන්නේ වෙයි, ආකාශචාරී වෙයි, සිත්කළු වස්ත්‍රාභරණ ඇති වැ සිටින්නේ වෙයි. හේ එහි ඉතා බොහෝ කලක් සිටියි. එහි ඔහු හුදෙකලා වැ බොහෝ කලක් වූසු හෙයින් 'අන් සත්හු ද මේ අත්බවට එන්නාහු නම් යෙහෙකැ'යි ප්‍රාර්ථනාවෙක් තාෂ්ණාවෙක් ඔහුට පහළ වෙයි. ඉක්කිති එක්තරා සත්ත්ව කෙනෙක් ද ආයු ගෙවීමෙන් හෝ පින් ගෙවීමෙන් හෝ ආභස්සර ලොවින් සැව ඒ බඹවිමනට, ඔහුගේ සහභාවයට පැමිණෙත්. ඔහු ද එහි ධ්‍යානමනසින් උපන්නෝ ප්‍රීතිය ම ආහාර කොට ඇත්තෝ වෙත්, ස්වයම්ප්‍රභ වෙත්, ආකාශචාරී වෙත්, සිත්කළු උයන් විමන් ආදියෙහි සිටින්නෝ (නොහොත් සිත්කළු වස්ත්‍රාභරණ හැඳ පැළැඳ සිටින්නෝ) වෙත්. ඔහු එහි ඉතා දික් කලක් සිටිත්. මහණෙනි, එහි යම් සත්ත්වයෙක් පළමු වැ උපන්නේ ද, ඔහුට මෙසේ සිතෙක් වෙයි: "මම බ්‍රහ්ම වෙමි, මහා-බ්‍රහ්ම වෙමි, අන් හැම මැඩ පවත්වා සිටින්නෙමි වෙමි, අනුන් විසින් නො මඩනා ලදුයෙමි වෙමි, ඒකාන්තයෙන් සියල්ල දක්නෙමි වෙමි, සියල්ලන් වශයෙහි පවත්වන්නෙමි වෙමි, ඊශ්වර වෙමි, කර්තෘ වෙමි, මවන්නා වෙමි, ලොවට උත්තම වෙමි, ලොව සකස් කරන්නා වෙමි, පුරුදු කළ වශිතා ඇත්තෙමි, උපන්නවුන්ගේ ද උපදිනවුන්ගේ ද පියා වෙමි. මා විසින් මේ සත්ත්වයෝ මවන ලදහ. ඒ (එසේ සිතනුගේ) කවර හෙයින ? යත්: 'අන් සත්ත්ව කෙනෙකුත් මෙහි මේ අත්බවට එන්නාහු නම් යෙහෙකැ'යි පූර්වයෙහි මට මේ සිත පහළ විය. මෙසේ මාගේ ප්‍රාර්ථනාව ද විය. මේ සත්ත්වයෝත් මගේ ඒ ප්‍රාර්ථනාව අනු ව මේ අත්බවට ආහ" යනු යි. යම් සත්ත්ව කෙනෙක් පසු වැ උපන්නෝ ද ඔවුනට ද මේ සිත වෙයි. 'මේ භවත් තෙමේ බ්‍රහ්ම ය, මහා-බ්‍රහ්ම ය, අනුන් මැඩැ පවත්වා සිටින්නා ය, අනුන් විසින් නො මැඩුණේ ය, ඒකාන්තයෙන් සියල්ල දක්නේ ය, ලොව තමා වශයෙහි පවත්වන්නේ ය, ඊශ්වර ය, කර්තෘ ය, නිර්මාතෘ ය, උත්තමයා ය, ලොව සකස් කරන්නා ය, පුරුදු කළ වශිතා ඇත්තා ය, උපන් උපදනා සියල්ලන් ගේ පියා ය. මේ භවත් බඹහු විසින් අපි මවන ලද්දමෝ වමු. ඒ කවර හෙයින ? යත්: මොහු වනාහි අපට පළමු ව මෙහි උපන්නහු අපි දුටුවමු. අපි වනාහි පසු වැ උපන්නමිහ" යනු යි.

46. තත්‍ර භික්ඛවෙ යො සො සත්තො පඨමං උපපන්නො, සො දීඝායු-කතරො ච හොති වණ්ණවන්තතරො ච මහෙසක්ඛතරො ච. යෙ පන තෙ සත්තා පච්ඡා උපපන්නා, තෙ අප්පායුකතරා ච හොන්ති දුබ්බණ්ණතරා ච අප්පෙසක්ඛතරා ච. ඨානං ඛො පනෙතං භික්ඛවෙ විජ්ජති යං අඤ්ඤතරො සත්තො තම්හා කායා චුතො ඉත්ථත්තං ආගච්ඡති.

ඉත්ථත්තං ආගතො සමානො අගාරස්මා අනගාරියං පබ්බජති. අගාරස්මා අනගාරියං පබ්බජිතො සමානො ආතප්පමන්වාය පධානමන්වාය අනුයොග-මන්වාය අප්පමාදමන්වාය සම්මාමනසිකාරමන්වාය තථාරූපං චෙතොසමාධිං ඵුසති යථා සමාහිතෙ චිත්තෙ තං පුබ්බෙනිවාසං අනුස්සරති, තතො පරං නානුස්සරති. සො එවමාහ:

'යො ඛො සො භවං බ්‍රහ්මා මහාබ්‍රහ්මා අභිභූ අනභිභූතො අඤ්ඤදත්ථුදසො වසවත්තී ඉස්සරො කත්තා නිම්මාතා සෙට්ඨො සජිතා වසී පිතා භූත-භව්‍යානං, යෙන මයං හොතා බ්‍රහ්මුණා නිම්මිතා, සො නිච්චො ධ්‍රුවො සස්සතො අවිපරිණාමධම්මො සස්සතිසමං තථෙව ඨස්සති. යෙ පන මයං අහුම්හා තෙන හොතා බ්‍රහ්මුණා නිම්මිතා, තෙ මයං අනිච්චා අද්ධුවා අප්පායුකා චවනධම්මා ඉත්ථත්තං ආගතා'ති.

ඉදං භික්ඛවෙ පඨමං ඨානං යං ආගම්ම යං ආරබ්භ එකෙ සමණ-බ්‍රාහ්මණා එකච්චසස්සතිකා එකච්චඅසස්සතිකා එකච්චං සස්සතං එකච්චං අසස්සතං අත්තානඤ්ච ලොකඤ්ච පඤ්ඤපෙන්ති.

47. දුතියෙ ච හොන්තො සමණබ්‍රාහ්මණා කිම්මාගම්ම කිම්මාරබ්භ එකච්චසස්සතිකා එකච්චඅසස්සතිකා එකච්චං සස්සතං එකච්චං අසස්සතං අත්තානඤ්ච ලොකඤ්ච පඤ්ඤපෙන්ති ?

46. මහණෙනි, එහි යම් සත්ත්වයෙක් පළමු වැ උපන්නේ ද, හේ සෙස්සනට වඩා දීඝායුෂ්ක වෙයි, සෙස්සනට වඩා වර්ණවත් වෙයි, සෙස්සනට වඩා මහායශස් ඇත්තේ වෙයි. යම් කෙනෙක් වනාහි පසු වැ උපන්නෝ ද ඔහු පළමු උපන්නහුට වඩා මන්දායුෂ්ක ද වෙති, ඔහුට වඩා වර්ණයෙන් හීන ද වෙති, ඔහුට වඩා අල්පයශස් ඇත්තෝ ද වෙති. මහණෙනි, යම් හෙයෙකින් ඔවුන් අතුරෙන් කිසි සත්ත්වයෙක් ඒ බ්‍රහ්මනිකායයෙන් සැව මේ මිනිසත්බවට පැමිණේ ය යන කාරණයෙක් ඇද්ද මෙය විද්‍යමාන ය. (වත එකෙක). එසේ හේ මේ මිනිසත්බවට ආයේ ම ගිහි ගෙයින් පැවිදි බිමට වදී. ගිහි ගෙයින් පැවිදි බිමට වන්නේ ම, හේ උත්සාහ වඩා වැර වඩා පුන පුනා වැයම් කොට නොපමා බව නිසා නුවණ නිසා, යම් සමාධියෙකින් සිත මනා වැ පිහිටි කල්හි මෙයින් පෙරැ වූ ජාතිය සිහි කෙරේ ද, එයින් ඔබ්බෙහි සිහි නො කෙරේ ද, එසේ වූ චිත්තසමාධියක් ලබයි. හෙ තෙම මෙසේ කියයි: "යම් ඒ භවත් බ්‍රහ්මයෙක් මහාබ්‍රහ්ම ද, අනුන් මැඩ පවත්වන්නේ ද, ඊශ්වර ද, කාරක ද, නිර්මාපක ද, උත්තම ද, ලොව සකස් කරන්නේ ද, පුරුදු කළ වශිතා ඇත්තේ ද, උපනුන්හටත් උපදනාවුන්හටත් පිතා ද, යම් භවත් මහබඹක්හු විසින් අපි මවන ලදුමෝ ද, ඒ මහබඹ තෙමේ නිත්‍ය ය, ධ්‍රැව ය (නො මැරෙන්නේ ය), සදාකාලික ය, නොවෙනස් වන සවභාව ඇත්තේ ය, මහාපෘථිවි ආදි ශාශ්වත වස්තූන් හා සම වැ එසේ ම නොවෙනස් වැ සිටින්නේ ය. යම් බඳු අපි ඒ භවත් බඹහු විසින් මවන ලදුමෝ ද, ඒ අපි අනිත්‍යයම්හ, අධ්‍රැවයම්හ, අල්පායුෂ්කයම්හ, මැරෙන සවභාවය ඇත්තම්හ, එ බැවින් බඹ ලොවින් සැව මෙහි මේ මිනිසත්බවට ආම්හ" යනු යි.

මහණෙනි, යමක් නිසා යමක් ඇරැබැ ඇතැම් මහණ බමුණෝ ඒකත්‍යශාශ්වතිකත් ඒකත්‍යඅශාශ්වතිකත් වූවෝ ආත්මයත් ලෝකයත් එක් කොටසක් ශාශ්වත කොටත් එක් කොටසක් අශාශ්වත කොටත් පණවත් නම්, මේ ඒ පළමු කාරණය යි.

47. දෙවෙනි කාරණයෙහිත් — පින්වත් මහණ බමුණෝ කුමක් නිසා කිමෙක එල්බැ ඒකත්‍යශාශ්වතික ද ඒකත්‍ය අශාශ්වතික ද වූවෝ ආත්මයත් ලෝකයත් එක් කොටසක් ශාශ්වතත් එක්කොටසක් අශාශ්වතත් කොට පණවත් ද? යත්:

සන්ති භික්ඛවෙ ඛිඩ්ඩාපදොසිකා නාම දෙවා. තෙ අතිවෙලං හස්ස-ඛිඩ්ඩාරතිධම්මසමාපන්නා විහරන්ති. තෙසං අතිවෙලං හස්සඛිඩ්ඩාරතිධම්ම-සමාපන්නානං විහරතං සති මුස්සති. සතියා සම්මොසා තෙ දෙවා තම්හා කායා චවන්ති.

ඨානං ඛො පනෙතං භික්ඛවෙ විජ්ජති යං අඤ්ඤතරො සත්තො තම්හා කායා චවිත්වා ඉත්ථත්තං ආගච්ඡති. ඉත්ථත්තං ආගතො සමානො අගාරස්මා අනගාරියං පබ්බජති. අගාරස්මා අනගාරියං පබ්බජිතො සමානො ආතප්පමන්වාය පධානමන්වාය අනුයොගමන්වාය අප්පමාදමන්වාය සම්මාමනසි-කාරමන්වාය තථාරූපං චෙතොසමාධිං ඵුසති යථාසමාහිතෙ චිත්තෙ තං පුබ්බෙනිවාසං අනුස්සරති, තතො පරං නානුස්සරති.

සො එවමාහ: යෙ ඛො තෙ භොන්තො දෙවා න ඛිඩ්ඩාපදොසිකා, තෙ න අතිවෙලං හස්සඛිඩ්ඩාරතිධම්මසමාපන්නා විහරන්ති. තෙසං න අතිවෙලං හස්සඛිඩ්ඩාරතිධම්මසමාපන්නානං විහරතං සති න මුස්සති. සතියා අසම්මොසා තෙ දෙවා තම්හා කායා න චවන්ති, නිච්චා ධුවා සස්සතා අවිපරිණාමධම්මා සස්සතිසමං තථෙව ඨස්සන්ති. යෙ පන මයං අහුම්හ ඛිඩ්ඩාපදොසිකා, තෙ මයං අතිවෙලං හස්සඛිඩ්ඩාරතිධම්මසමාපන්නා විහරිම්හ. තෙසං නො අතිවෙලං හස්සඛිඩ්ඩාරතිධම්මසමාපන්නානං විහරතං සති මුස්සි. සතියා සම්මොසා එවං මයං තම්හා කායා චුතා අනිච්චා අධ්‍රුවා අපාය්‍යකා චවනධම්මා ඉත්ථත්තං ආගතා'ති.

ඉදං භික්ඛවෙ දුතියං ඨානං යං ආගම්ම යං ආරබ්භ එකෙ සමණ-බ්‍රාහ්මණා එකච්චසස්සතිකා එකච්චඅසස්සතිකා එකච්චං සස්සතං එකච්චං අසස්සතං අත්තානඤ්ච ලොකඤ්ච පඤ්ඤපෙන්ති.

48. තතියෙ ච භොන්තො සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිමාරබ්භ එකච්චසස්සතිකා එකච්චඅසස්සතිකා එකච්චං සස්සතං එකච්චං අසස්සතං අත්තානඤ්ච ලොකඤ්ච පඤ්ඤපෙන්ති?

සන්ති භික්ඛවෙ මනොපදොසිකා නාම දෙවා. තෙ අතිවෙලං අඤ්ඤ-මඤ්ඤං උපනිජ්ඣායන්ති. තෙ අතිවෙලං අඤ්ඤමඤ්ඤං උපනිජ්ඣායන්තා, අඤ්ඤමඤ්ඤමහි චිත්තානි පදූසෙන්ති. තෙ අඤ්ඤමඤ්ඤමහි පදූසිතචිත්තා කිලන්තකායා කිලන්තචිත්තා. තෙ දෙවා තම්හා කායා චවන්ති.

මහණෙනි, ඛිඩ්ඩාපදෝසික නම් දෙවි කෙනෙක් ඇත්තාහ. ඔහු ආහාරෝ-පභෝගකාලය ඉක්මවා මෙවුන්දමින් ද කායික වාචසික ක්‍රීඩායෙහි ද යෙදුණේ වැ වෙසෙත්. බොජුන් ගන්නා කාලසීමාව ද ඉක්මවා මෙවුන්-දමින් ද කායික වාචසික ක්‍රීඩායෙහි ද ඇලෙන සභාවයට පැමිණ වසන ඔවුන්ගේ බොජුන් ගැන්මෙහි සිහි නැති වේ. එසේ සිහි නැති වීමෙන් ඒ දෙවියෝ ඒ දේවනිකායයෙන් චුත වෙත්.

මෙසේ වූ එක්තරා සත්ත්වයෙක් ඒ දේවනිකායයෙන් සැව මේ මිනිස්බවට පැමිණේ ය යන යමක් ඇද්ද, මෙය ඇති එකෙක. එසේ මේ මිනිසත්බවට පැමිණියා වූ ම හේ ගිහිගෙන් නික්ම පැවිදි වේ. පැවිදි වූයේ ම උත්සාහ වඩා, වැර වඩා, පුනපුනා වැර වඩා, එළැඹ සිටි සිහිය වඩා, නුවණ වඩා, යම් සමාධියෙකින් සිත මනා වැ පිහිටි කල්හි ඒ පෙරැ අත්බව සිහි කෙරේ ද, එහින් යට සිහි නො කෙරේ ද, එබඳු වූ චිත්තසමාධියක් ලබයි.

හේ මෙසේ කියයි: "යම් පින්වත් දෙවි කෙනෙක් ඛිඩ්ඩාපදෝසික නො වෙත් ද, ඔහු බොජුන්වේලාව ඉක්මවා මෙවුන්දමින් කායික වාචසික ක්‍රීඩායෙහි ඇලෙන සභාවයට පැමිණියෝ වැ නො වෙසෙත්. එසේ වේලාව ඉක්මවා මෙවුන්දමින් සෙසු කායික වාචසික ක්‍රීඩායෙහි ඇලෙන සභාවයට පැමිණ නොවසන ඔවුනට බොජුන් ගැන්මෙහි සිහි නැති නො වේ. එසේ සිහි නැති නොවනුයෙන් ඒ දෙවියෝ ඒ දේව-නිකායයෙන් චුත නො වෙත්. ඔහු නිත්‍ය හ. ඒකාන්ත හ. සදාකාලික හ. නො පෙරැළෙන සුලු හ. ශාශ්වතීනට (පෘථිවි ආදි සදාකාලික වස්තූනට) සම් වැ එසේ ම සිටුනාහ. යම් බඳු වූ අපි වනාහි ඛිඩ්ඩාපදෝසික වමෝ ද, ඒ අපි වේලාව ඉක්මවා හස්ත්‍රීඩාරතිධර්මයට පැමිණියෝ වැ වුසුමෝ ද, වේලාව ඉක්මවා හස්ත්‍රීඩාරතිධර්මයට පමිණියෝ වැ වසන ඒ අපට බොජුන් ගැන්මෙහි සිහි නැති විය. සිහි නැති වීමෙන් මෙසේ අපි ඒ දිව්‍යනිකායයෙන් චුත වූවමෝ එ හෙයින් ම අනිත්‍ය වූවමෝ අධ්‍රැව වූවමෝ අල්පායුෂක වූවමෝ මැරෙන සභාවය ඇත්තමෝ මේ මිනිස්බවට පැමිණියමහ" යනු සි.

මහණෙනි, යමක් නිසා යමෙක එල්බැ ඇතැම් මහණබමුණෝ ඒකත්‍යශාශ්වතික ද ඒකත්‍යඅශාශ්වතික ද වූවෝ ආත්මයත් ලෝකයත් එක් කොටසක් ශාශ්වත ද එක් කොටසක් අශාශ්වත ද කොට පණවත් නම්, මේ ඒ දෙවෙනි කාරණය සි.

48. තෙවෙනි කරැණෙහි ද – පින්වත් මහණබමුණෝ කුමක් උදෙසා කුමක් ඇරැබැ ඒකත්‍යශාශ්වතික ද ඒකත්‍යඅශාශ්වතික ද වූවෝ ආත්මයත් ලෝකයත් කොටසක් ශාශ්වත වශයෙනුත් කොටසක් අශාශ්වත වශයෙනුත් පණවත් ද ? යත්:

මහණෙනි, මනෝපදෝෂික නම් දෙවි කෙනෙක් ඇත්හ. ඔහු කිපුණු සිතින් බොහෝ වේලා උනුන් බලත්. ඔහු කිපුණු සිතින් උනුන් බලත්නෝ, උනුන් කෙරෙහි හිත් දූෂිත කෙරෙත්. මෙසේ උනුන් කෙරෙහි දූෂිත කළ සිත් ඇති ඔහු (එ හෙයින් ම) මිරිකුණු කය ඇත්තෝ මිරිකුණු සිත් ඇත්තෝ ඒ දේවනිකායයෙන් චුත වෙත්.

ඨානං ඛො පනෙතං භික්ඛවෙ විජ්ජති යං අඤ්ඤතරො සත්තො තස්මා කායා චවිත්වා ඉත්ථත්තං ආගච්ඡති. ඉත්ථත්තං ආගතො සමානො අගාරස්මා අනගාරියං පබ්බජති. අගාරස්මා අනගාරියං පබ්බජිතො සමානො ආතප්පමන්වාය පධානමන්වාය අනුයොගමන්වාය අප්පමාදමන්වාය සම්මා-මනසිකාරමන්වාය තථාරූපං චෙතොසමාධිං ඵුසති යථාසමාහිතෙ චිත්තෙ තං පුබ්බෙනිවාසං අනුස්සරති තතො පරං නානුස්සරති.

සො එවමාහ: යෙ ඛො තෙ භොනෙතා දෙවා න මනොපදොසිකා, තෙ න අතිවෙලං අඤ්ඤමඤ්ඤං උපනිජ්ඣායන්ති. තෙ න අතිවෙලං අඤ්ඤමඤ්ඤං උපනිජ්ඣායන්තා අඤ්ඤමඤ්ඤමහි අපදුට්ඨචිත්තා අකිලන්ත-කායා අකිලන්තචිත්තා. තෙ දෙවා තස්මා කායා න චවන්ති නිච්චා ධුවා සස්සතා අවිපරිණාමධම්මා සස්සතිසමං තත්ථෙව ඨස්සන්ති. යෙ පන මයං අහුම්හ මනොපදොසිකා, තෙ මයං අතිවෙලං අඤ්ඤමඤ්ඤං උපනිජ්ඣායිම්හ. තෙ මයං අතිවෙලං අඤ්ඤමඤ්ඤං උපනිජ්ඣායන්තා අඤ්ඤමඤ්ඤමහි[1] චිත්තාති පදූසිම්හ. තෙ මයං අඤ්ඤමඤ්ඤමහි පදුට්ඨචිත්තා කිලන්තකායා කිලන්තචිත්තා එවං තස්මා කායා චුතා අනිච්චා අධ්‍රුවා අපාය්‍යුකා චවනධම්මා ඉත්ථත්තං ආගතා'ති.

ඉදං භික්ඛවෙ තතියං ඨානං යං ආගම්ම යං ආරබ්භ එකෙ සමණ-බ්‍රාහ්මණා එකච්චසස්සතිකා එකච්චඅසස්සතිකා එකච්චං සස්සතං එකච්චං අසස්සතං අත්තානඤ්ච ලොකඤ්ච පඤ්ඤපෙන්ති.

49. චතුත්ථෙ ච භොනෙතා සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිමාරබ්භ එකච්චසස්සතිකා එකච්චඅසස්සතිකා එකච්චං සස්සතං එකච්චං අසස්සතං අත්තානඤ්ච ලොකඤ්ච පඤ්ඤපෙන්ති?

ඉධ භික්ඛවෙ එකච්චො සමණො වා බ්‍රාහ්මණො වා තක්කී හොති වීමංසී. සො තක්කපරියාහතං වීමංසානුචරිතං සයම්පටිභානං එවමාහ: යං ඛො ඉදං වුච්චති චක්ඛුන්ති'පි සොතන්ති'පි ඝාණං'ති'පි කායො'ති'පි, අයං අත්තා අනිච්චො අධ්‍රුවො අසස්සතො විපරිණාමධම්මො. යං ච ඛො ඉදං වුච්චති චිත්තන්ති වා මනො'ති වා විඤ්ඤාණන්ති වා අයං අත්තා නිච්චො ධ්‍රුවො සස්සතො අවිපරිණාමධම්මො සස්සතිසමං තත්ථෙව ඨස්සති ති.

ඉදං භික්ඛවෙ චතුත්ථං ඨානං යං ආගම්ම යං ආරබ්භ එකෙ සමණ-බ්‍රාහ්මණා එකච්චසස්සතිකා එකච්චඅසස්සතිකා එකච්චං සස්සතං එකච්චං අසස්සතං අත්තානඤ්ච ලොකඤ්ච පඤ්ඤපෙන්ති.

---

1. අඤ්ඤමඤ්ඤං. සීමු.

එක්තරා සත්ත්වයෙක් ඒ දේවනිකායයෙන් සැව මේ මිනිසත්බවට පැමිණේ ය යන යමක් ඇද්ද, මහණෙනි, මේ කාරණය ඇති එකෙකි. එසේ හේ මේ මිනිසත්බවට පැමිණියේ ම ගිහිගෙන් නික්මැ පැවිදිබිමට පැමිණේ. පැවිදිබිමට පැමිණි හෙ තෙමේ උත්සාහය නිසා වීර්යය නිසා නැවත නැවත වැර වැඩුම් නිසා නොපමාව නිසා නුවණ නිසා, යම්සේ සිත මොනවට පිහිටි කල්හි ඒ පෙර අත්බව සිහි කෙරේ ද, එසින් යට සිහි නො කෙරේ ද, එබඳු වූ චිත්තසමාධියක් ලබයි.

හේ මෙසේ කියයි: "යම් පින්වත් දෙව් කෙනෙක් මනෝප්‍රදෝෂික නො වෙත් ද, ඔහු බොහෝ වේලාවක් උනුන් කිපි සිතින් නො බලත්. ඉතා බොහෝ වේලාවක් කිපිසිතින් උනුන් නො බලන ඔහු උනුන් කෙරෙහි සිත් රිදුවා නො ගනිත්. උනුන් කෙරෙහි සිත් රිදුවා නො ගත් ඔහු කලාන්ත නො වූ කය ඇත්තෝ, කලාන්ත නො වූ සිත් ඇත්තෝ, ඒ දිව්‍ය නිකායයෙන් ච්‍යුත නො වෙත්. යම් බඳු වූ අපි වනාහි මනෝප්‍රදෝෂික වූමු ද, ඒ අපි ඉතා බොහෝ වේලාවක් උනුන් කිපි සිතින් බැලුම්හ. ඒ අපි බොහෝ වේලා උනුන් කිපි සිතින් බලන්නමෝ උනුන් කෙරෙහි සිත් රිදුවා ගතුම්හ. ඒ අපි උනුන් කෙරෙහි රිදුවා ගත් සිත් ඇත්තමෝ කලාන්ත වූ කය ඇත්තමෝ කලාන්ත වූ සිත් ඇත්තමෝ මෙසේ ඒ දේවනිකායයෙන් ච්‍යුත වූවමෝ (එහෙයින් ම) අනිත්‍යයම්හ. අ‍ධ්‍රැවයම්හ. අල්පායුෂ්කයම්හ. මැරෙන සභාවය ඇත්තමෝ මේ මිනිස්බවට ආම්හ" යනු යි.

මහණෙනි, ඇතැම් මහණබමුණෝ යමක් උදෙසා යමක් ඇරැබැ ඒකත්‍යශාශ්වතික ද ඒකත්‍යඅශාශ්වතික ද වූවෝ ආත්මයත් ලෝකයත් එක් කොටසක් ශාශ්වත ද එක් කොටසක් අශාශ්වත ද කොට පණවත් නම්, මේ ඒ හෙවෙනි කාරණය යි.

49. මහණෙනි, සතර වත කරැණෙහි – භවත් මහණබමුණෝ කුමක් උදෙසා කුමක් ඇරැබැ ඒකත්‍යශාශ්වතික ද ඒකත්‍යඅශාශ්වතික ද වූවෝ ආත්මයත් ලෝකයත් එක් කොටසක් ශාශ්වත කොටත් එක් කොටසක් අශාශ්වත කොටත් පණවත් ද? යත්:

මහණෙනි, මෙහි එක්තරා මහණෙක් හෝ බමුණෙක් හෝ තර්ක විතර්ක කරන්නේ වෙයි, අයෝනිසෝමනස්කාරයෙන් විමසන්නේ වෙයි. හේ තර්ක කොට ගන්නා ලද, නොනුවණින් විමසා ගැන්ම අනුවැ පැවැති, තමාගේ හුදු වැටැහීම මෙසේ පවසයි: "ඇස යැ යි ද කණ යැ යි ද දිව යැ යි ද කය යැ යි ද කියා මේ යමක් කියනු ලැබේ නම්, එසේ වූ මේ ආත්මය අනිත්‍ය ය, අ‍ධ්‍රැව ය, අශාශ්වත ය, පෙරැළෙනසුලු ය. සිත ය කියා හෝ මනස ය කියා හෝ විඥාන ය කියා හෝ යමක් කියනු ලැබේ නම්, එසේ වූ මේ ආත්මය වනාහි නිත්‍ය ය, ධ්‍රැව ය, ශාශ්වත ය, නොපෙරැළෙනසුලු ය, (මහාපාථව්‍යාදි) සදාකාලික වස්තූන් හා සම වැ එසේ ම නො වෙනස් වැ සිටුනේ ය" යනු යි.

මහණෙනි, යමක් උදෙසා යමක් ඇරැබැ ඇතැම් මහණබමුණෝ ඒකත්‍යශාශ්වතික ද ඒකත්‍ය අශාශ්වතික ද වූවෝ ආත්මයත් ලෝකයත් එක් කොටසක් ශාශ්වත කොට ද එක් කොටසක් අශාශ්වත කොට ද පණවත් නම්, මේ ඒ සතරවත කාරණය යි.

ඉමෙ හි ඛො තෙ භික්ඛවෙ සමණබ්‍රාහ්මණා එකච්චසස්සතිකා එකච්චඅසස්සතිකා එකච්චං සස්සතං එකච්චං අසස්සතං අත්තානඤ්ච ලොකඤ්ච පඤ්ඤපෙන්ති චතූහි වත්ථූහි.

යෙ හි කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා එකච්චසස්සතිකා එකච්චඅසස්සතිකා එකච්චං සස්සතං එකච්චං අසස්සතං අත්තානඤ්ච ලොකඤ්ච පඤ්ඤපෙන්ති, සබ්බෙ තෙ ඉමෙහෙව චතූහි වත්ථූහි, එතෙසං වා අඤ්ඤතරෙන. තත්‍රපි ඉතො බහිද්ධා.

50. තයිදං භික්ඛවෙ තථාගතො පජානාති: "ඉමෙ දිට්ඨිට්ඨානා එවං ගහිතා එවං පරාමට්ඨා එවංගතිකා භවිස්සන්ති එවංඅභිසම්පරායා"ති. තං ච තථාගතො පජානාති. තතො ච උත්තරිතරං පජානාති. තං ච පජානතං න පරාමසති. අපරාමසතො චස්ස පච්චත්තංයෙව නිබ්බුති විදිතා. වෙදනානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං විදිත්වා අනුපාදා විමුත්තො භික්ඛවෙ තථාගතො.

51. ඉමෙ ඛො තෙ භික්ඛවෙ ධම්මා ගම්භීරා දුද්දසා දුරනුබොධා සන්තා පණීතා අතක්කාවචරා නිපුණා පණ්ඩිතවෙදනීයා, යෙ තථාගතො සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති, යෙහි තථාගතස්ස යථාභූතවණ්ණං සම්මා වදමානා වදෙය්‍යුං.

52. සන්ති භික්ඛවෙ එකෙ සමණබ්‍රාහ්මණා අත්තානත්තිකා අත්තානත්තං ලොකස්ස පඤ්ඤපෙන්ති චතූහි වත්ථූහි. තෙ ච හොන්තො සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිමාරබ්භ අත්තානත්තිකා අත්තානත්තං ලොකස්ස පඤ්ඤපෙන්ති චතූහි වත්ථූහි?

ඉධ භික්ඛවෙ එකච්චො සමණො වා බ්‍රාහ්මණො වා ආතප්පමන්වාය පධානමන්වාය අනුයොගමන්වාය අප්පමාදමන්වාය සම්මාමනසිකාරමන්වාය තථාරූපං චෙතොසමාධිං ඵුසති යථාසමාහිතෙ චිත්තෙ අත්තසඤ්ඤී ලොකස්මිං විහරති. සො එවමාහ: "අත්තවා අයං ලොකො පරිවට්ටුමො. තං කිස්ස හෙතු? අහං හි ආතප්පමන්වාය -පෙ- තථාරූපං චෙතොසමාධිං ඵුසාමි යථා සමාහිතෙ චිත්තෙ අත්තසඤ්ඤී ලොකස්මිං විහරාමි. ඉමිනා මහං එතං ජානාමි: යථා අත්තවා අයං ලොකො පරිවට්ටුමො"ති.

ඉදං භික්ඛවෙ පඨමං ඨානං යං ආගම්ම යං ආරබ්භ එකෙ සමණබ්‍රාහ්මණා අත්තානත්තිකා අත්තානත්තං ලොකස්ස පඤ්ඤපෙන්ති.

මහණෙනි, ඒ මහණබමුණෝ ඒකත්‍යශාශ්වතික ද ඒකත්‍යඅශාශ්වතික ද වූවෝ මේ සතර කරුණින් ආත්මයත් ලෝකයත් එක් කොටසක් ශාශ්වත ද එක් කොටසක් අශාශ්වත ද කොට පණවත්.

මහණෙනි, යම් මහණකෙනෙක් හෝ යම් බමුණුකෙනෙක් හෝ ඒකත්‍යශාශ්වතික ද ඒකත්‍යඅශාශ්වතික ද වූවෝ ආත්මයත් ලෝකයත් එක් කොටසක් ශාශ්වත ද එක් කොටසක් අශාශ්වත ද කොට පණවත් නම්, ඒ සියල්ලෝ මේ සතර කරුණින් ම හෝ මොවුන් අතුරෙන් එක් කරුණෙකින් හෝ එසේ පණවත්. මෙයින් පිටත් අන් කරුණෙක් නැත.

50. මහණෙනි, 'මේ දෘෂ්ටිකාරණයෝ මෙසේ ගන්නා ලද්දේ, මෙසේ පරාමර්ශනය කරන ලද්දේ මෙබඳු නිරයාදි විපාකගති ඇත්තෝ වෙත්, මෙබඳු පරලොව් ඇතියෝ වෙත් යැ' යි මේ සතර දෘෂ්ටිගතය ම තථාගත තෙමේ දන්නේ ය. තථාගත තෙමේ එය ද එයින් මත්තෙහි වූ සියල්ල ද දනී. එය දන්නේ, 'මෙය මම දනිමි' යි ඒ දන්ම තෘෂ්ණා දෘෂ්ටි මාන වශයෙන් පරාමර්ශනය නො කෙරෙ යි. එය පරාමර්ශනය නො කරන්නා වූ ඔහු විසින් ම තමාගේ කෙලෙස් නිවීම දන්නා ලද්දේ ය. (සුව ඇති තැන් පතපතා අන්‍යතීර්ථිකයෝ තානාදෘෂ්ටිගහනයට පිවිසෙත් නම්) තථාගත තෙමේ ඒ වේදනාවන්ගේ උපත ද නැස්ම ද රසය ද දෙස ද නික්මුම ද ඇති සැටි දැන උපාදාන රහිත වැ මිදුණේ වෙයි.

51. මහණෙනි, තථාගත බුදුරජ යම් ධර්ම කෙනෙකුන් තෙමේ ම විශිෂ්ට ඥානයෙන් දැන පසක් කොට පවසා නම්, තථාගත බුදුහුගේ ඇති පරිදි වූ ම ගුණ කියන්නට තැත් කරන්නෝ යම් ධර්ම කෙනෙකුන් කරණ කොට ගෙන කියන්නෝ නම්, මේ වනාහි ගැඹුරු වූ දුර්දර්ශී වූ දුරනුබෝධ වූ ශාන්ත වූ ප්‍රණීත වූ අතර්කාවචර වූ සියුම් වූ පණ්ඩිතවේදනීය වූ ඒ ධර්මයෝ ය.

52. මහණෙනි, ඇතැම් මහණබමුණු කෙනෙක් ලොව කෙළවරක් ඇති-නැතිබව පිළිබඳ උපදවා ගත් දෘෂ්ටි ඇත්තෝ, කරුණු සතරෙකින් ලොවෙහි අන්තය හෝ අනන්තය පණවත්. ඒ හවත් මහණබමුණෝ කුමක් නිසා කුමක් ඇරැබැ අන්තානන්තකවාද ඇත්තෝ කරුණු සතරෙකින් ලොවැ අන්තානන්තය පණවත් ද? යත්:

මහණෙනි, මෙහි ඇතැම් මහණෙක් හෝ බමුණෙක් උත්සාහය නිසා වීර්‍යය නිසා පුනපුනා වැර වැඩුම් නිසා අප්‍රමාදය නිසා නුවණ නිසා, යම් සමාධියෙකින් සිත මොනොවට පිහිටි කල්හි ලොවෙහි අන්ත-සංඥී වැ වෙසේ නම්, එසේ වූ චිත්තසමාධියක් ලබයි. හේ මෙසේ කියයි: "මෙ ලොව අන්තවත් ය, හාත්පසින් ම වට ය.* ඒ කවර හෙයින ? යත්: මම වනාහි උත්සාහය නිසා ... යම් සමාධියෙකින් සිත මොනොවට පිහිටි කල්හි ලොවෙහි අන්තසංඥී ව වෙසෙම් ද, එසේ වූ චිත්තසමාධියක් ලැබීමි. මේ කරුණින් මෙලොව යම්සේ අන්තවත් ද, හාත්පසින් වට ද, එසේ මෙය මම දනිමි" යනු යි.

මහණෙනි, යමක් නිසා යමක් ඇරැබැ ඇතැම් මහණ බමුණෝ අන්තා-නන්තිකදෘෂ්ටි ඇත්තෝ ලොවෙහි අන්තානන්තය පණවත් නම්, මේ ඒ පළමු වන කාරණය යි.

---

*. පරිවටුම (පරිවර්ත්මත්)=වටින් ම මාර්ගය ඇත්තේ යනු පදවි යි. එයින් 'සර්වමය, වට ය' යන අදහස ලැබේ.

53. දුතියෙ ච භොතෙතා සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිමාරබ්භ අන්තානන්තිකා අන්තානන්තං ලොකස්ස පඤ්ඤපෙන්ති ?

ඉධ භික්ඛවෙ එකච්චො සමණො වා බ්‍රාහ්මණො වා ආතප්පමන්වාය පධානමන්වාය අනුයොගමන්වාය අප්පමාදමන්වාය සම්මාමනසිකාරමන්වාය තථාරූපං චෙතොසමාධිං ඵුසති, යථාසමාහිතෙ චිත්තෙ අනන්තසඤ්ඤී ලොකස්මිං විහරති. සො එවමාහ: "අනන්තො අයං ලොකො අපරියන්තො. යෙ තෙ සමණබ්‍රාහ්මණා එවමාහංසු: අන්තවා අයං ලොකො පරිවට්ටමො'ති, තෙසං මුසා. අනන්තො අයං ලොකො අපරියන්තො. තං කිස්ස හෙතු? අහං හි ආතප්පමන්වාය -පෙ- තථාරූපං චෙතොසමාධිං ඵුසාමි යථාසමාහිතෙ චිත්තෙ අනන්තසඤ්ඤී ලොකස්මිං විහරාමි. ඉමිනාමහං එතං ජානාමි යථා අනන්තො අයං ලොකො අපරියන්තො'ති."

ඉදං භික්ඛවෙ දුතියං ඨානං යං ආගම්ම යං ආරබ්භ එකෙ සමණ-බ්‍රාහ්මණා අන්තානන්තිකා අන්තානන්තං ලොකස්ස පඤ්ඤපෙන්ති.

54. තතියෙ ච භොතෙතා සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිමාරබ්භ අන්තානන්තිකා අන්තානන්තං ලොකස්ස පඤ්ඤපෙන්ති ?

ඉධ භික්ඛවෙ එකච්චො සමණො වා බ්‍රාහ්මණො වා ආතප්පමන්වාය පධානමන්වාය අනුයොගමන්වාය අප්පමාදමන්වාය සම්මාමනසිකාරමන්වාය තථාරූපං චෙතොසමාධිං ඵුසති, යථාසමාහිතෙ චිත්තෙ උද්ධමධො අන්තසඤ්ඤී ලොකස්මිං විහරති තිරියං අනන්තසඤ්ඤී. සො එවමාහ: "අන්තවා ච අයං ලොකො අනන්තො ච. යෙ තෙ සමණබ්‍රාහ්මණා එවමාහංසු: 'අන්තවා අයං ලොකො පරිවට්ටමො'ති, තෙසං මුසා. යෙ'පි තෙ සමණබ්‍රාහ්මණා එවමාහංසු: 'අනන්තො අයං ලොකො අපරියන්තො'ති, තෙසම්පි මුසා. අන්තවා ච අයං ලොකො අනන්තො ච. තං කිස්ස හෙතු? අහං හි ආතප්පමන්වාය -පෙ- තථාරූපං චෙතොසමාධිං ඵුසාමි යථා සමාහිතෙ චිත්තෙ උද්ධමධො අන්තසඤ්ඤී ලොකස්මිං විහරාමි තිරියං අනන්තසඤ්ඤී. ඉමිනාමහං එතං ජානාමි: යථා අන්තවා ච අයං ලොකො අනන්තො" චාති.

ඉදං භික්ඛවෙ තතියං ඨානං යං ආගම්ම යං ආරබ්භ එකෙ සමණ-බ්‍රාහ්මණා අන්තානන්තිකා අන්තානන්තං ලොකස්ස පඤ්ඤපෙන්ති.

55. චතුත්ථෙ ච භොතෙතා සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිමාරබ්භ අන්තානන්තිකා අන්තානන්තං ලොකස්ස පඤ්ඤපෙන්ති ?

53. දෙවෙනි කරුණෙහි ද – භවත් මහණබමුණෙනි කුමක් නිසා කිමෙක එල්බැ අන්තානන්තිකදෘෂ්ටි ගත්තෝ ලොවෙහි අන්තානන්තය පණවත් ද? යත්:

මහණෙනි, මෙහි එක්තරා මහණෙක් හෝ බමුණෙක් හෝ උත්සාහය නිසා පුනපුනා වැර වැඩුම් නිසා තොපමාව නිසා නුවණ නිසා, යම් සමාධියෙකින් (ධ්‍යානයෙකින්) සිත මනා වැ පිහිටි කල්හි ලොවෙහි අනන්තසංඥී වැ වෙසේ ද, එසේ වූ චිත්තසමාධියක් උපදවයි. හේ මෙසේ කියයි: "මේ ලොව අනන්ත ය, අපරියන්ත ය. යම් ඒ මහණබමුණු කෙනෙක් 'මේ ලෝකය කෙළවරක් ඇත්තේ ය. හාත්පසින් වට යැ' යි මෙසේ කීහු ද, ඔවුන්ගේ කීම බොරු ය. මේ ලෝකය අනන්ත ය, අපරියන්ත ය. කවර හෙයින? යත්: මම වනාහි උත්සාහය නිසා . . . යම් සමාධියෙකින් සිත මනා වැ පිහිටි කල්හි ලොවෙහි අනන්තසංඥී වැ වෙසෙම් ද, එබඳු වූ චිත්තසමාධියක් ලැබීමි. ලෝකය යම් සේ අනන්ත ද අපරීන්ත ද, මම මේ කාරණයෙන් මෙය එසේ දනිමි" යනු යි.

මහණෙනි, යමක් නිසා යමෙක එල්බැ ඇතැම් මහණබමුණෙනි අන්තානන්තිකදෘෂ්ටි ගත්තෝ ලෝකය පිළිබඳ අන්තානන්තය පණවත් නම්, මේ ඒ දෙවෙනි කාරණය යි.

54. මහණෙනි, තෙවෙනි කරුණෙහි ද – මහණබමුණෙනි කුමක් නිසා කුමක් ඇරැබැ අන්තානන්තිකදෘෂ්ටි ඇත්තෝ ලොවැ අන්තානන්තය පණවත් ද? යත්:

මහණෙනි, මෙහි ඇතැම් මහණෙක් හෝ බමුණෙක් හෝ උත්සාහය නිසා වීර්යය නිසා පුනපුනා වැර වැඩුම් නිසා තොපමාබව නිසා නුවණ නිසා, යම් සමාධියෙකින් සිත මොහොවට පිහිටි කල්හි, 'ලොවෙහි උඩින් යටින් කෙළවරක් ඇතැ' යි සංඥා ඇති වැ, එහෙත් 'ලොවෙහි සරසින් කෙළවරක් නැතැ' යි යන සංඥා ඇති වැ වෙසේ ද, එසේ වූ චිත්තසමාධියක් ලබයි. හේ මෙසේ කියයි: "මේ ලොව කෙළවරක් ඇත්තේ ද කෙළවරක් නැත්තේ ද වේ. යම් මහණබමුණුකෙනෙක් 'මෙලොව කෙළවරක් ඇත්තේ ය, වට යැ' යි කීහු ද, ඔවුන්ගේ වචන හිස් ය. යම් මහණබමුණුකෙනෙක් වනාහි 'මෙ ලොව කෙළවරක් නැත්තේ ය. සීමාවක් නැත්තේ යැ' යි කීහු ද, ඔවුන්ගේ වචන ද හිස් ය. මෙ ලොව අන්තවත් ද අනන්ත ද වේ. ඒ කවර හෙයින? යත්: මම වනාහි උත්සාහ වඩා, වීර්ය වඩා . . . යම් සමාධියෙකින් සිත සමාහිත කල්හි ලොවෙහි උඩින් යටින් කෙළවරක් ඇතැ යි ද සරසින් කෙළවරක් නැතැ යි ද යන සංඥා ඇති වැ වෙසෙම් ද, එසේ වූ චිත්තසමාධියක් ලැබීමි. ලෝකය යම් සේ කෙළවරක් ඇත්තේත් නැත්තේත් වේ ද, මේ කරුණින් එසේ මෙය මම දනිමි." යනු යි.

මහණෙනි, යමක් නිසා යමෙක එල්බැ ඇතැම් මහණබමුණෙනි අන්තානන්තිකදෘෂ්ටි ගත්තෝ ලෝකයේ අන්තානන්තය පණවත් ද, මේ ඒ තෙවෙනි කාරණය යි.

55. සිවුවන කාරණයෙහි ද – භවත් මහණබමුණෙනි කුමක් නිසා කුමක් ඇරැබැ අන්තානන්තිකදෘෂ්ටි ගත්තෝ ලොවේ අන්තානන්තය පණවත් ද? යත්:

ඉධ භික්ඛවෙ එකච්චො සමණො වා බ්‍රාහ්මණො වා තක්කී හොති වීමංසී. සො තක්කපරියාහතං වීමංසානුචරිතං සයමපටිභානං එවමාහ: "නෙවායං ලොකො අනන්තවා න පනානන්තො. යෙ තෙ සමණබ්‍රාහ්මණා එවමාහංසු: 'අනන්තවා අයං ලොකො පරිවට්ටුමො'ති, තෙසං මුසා. යෙ'පි තෙ සමණබ්‍රාහ්මණා එවමාහංසු: 'අනන්තො අයං ලොකො අපරියන්තො'ති, තෙසම්පි මුසා. යෙ'පි තෙ සමණබ්‍රාහ්මණා එවමාහංසු: 'අනන්තවා ච අයං ලොකො අනන්තො වා'ති තෙසම්පි මුසා. නෙවායං ලොකො අනන්තවා න පනානන්තො"ති.

ඉදං භික්ඛවෙ චතුත්ථං ඨානං යං ආගම්ම යං ආරබ්භ එකෙ සමණ-බ්‍රාහ්මණා අනන්තානන්තිකා අනන්තානන්තං ලොකස්ස පඤ්ඤපෙන්ති.

56. ඉමෙහි ඛො තෙ භික්ඛවෙ සමණබ්‍රාහ්මණා අනන්තානන්තිකා අනන්තානන්තං ලොකස්ස පඤ්ඤපෙන්ති චතූහි වත්ථූහි. යෙ හි කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා අනන්තානන්තිකා අනන්තානන්තං ලොකස්ස පඤ්ඤපෙන්ති, සබ්බෙ තෙ ඉමෙහෙව චතූහි වත්ථූහි, එතෙසං වා අඤ්ඤතරෙන. නත්ථි ඉතො බහිද්ධා.

57. තත්‍රිදං භික්ඛවෙ තථාගතො පජානාති: "ඉමෙ දිට්ඨිට්ඨානා එවං ගහිතා එවං පරාමට්ඨා එවංගතිකා භවිස්සන්ති එවං අභිසම්පරායා"ති. තඤ්ච තථාගතො පජානාති, තතො ච උත්තරිතරං පජානාති. තඤ්ච පජානනං න පරාමසති. අපරාමසතො ච්ඡ පච්චත්තඤ්ඤෙව නිබ්බුති විදිතා. වෙදනානං සමුදයඤ්ච අත්ථඟමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං විදිත්වා අනුපාදා විමුත්තො භික්ඛවෙ තථාගතො.

58. ඉමෙ ඛො තෙ භික්ඛවෙ ධම්මා ගම්භීරා දුද්දසා දුරනුබොධා සන්තා පණීතා අතක්කාවචරා නිපුණා පණ්ඩිතවෙදනීයා යෙ තථාගතො සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති, යෙ හි තථාගතස්ස යථාභූතවණ්ණං සම්මා වදමානා වදෙය්‍යුං.

මහණෙනි, මෙහි ඇතැම් මහණෙක් හෝ බමුණෙක් හෝ තර්ක කරන්නේ වෙයි, විමසන්නේ වෙයි. හේ ඒ ඒ කරුණින් තර්ක කළ, විමැසුම්නුවණ පමණින් ම මැත ගන්නා ලද සිය වැටැහීම මෙසේ පවසයි: "මේ ලොව අනන්තයක් (කෙළවරක්) ඇත්තේත් නො වෙයි. අනන්තයක් නැත්තේත් නො වෙයි. යම් මහණබමුණුකෙනෙක් 'මේ ලොව අන්තවත් ය, වට යැ' යි කියත් නම්, ඔවුන්ගේ වචන හිස් ය. යම් මහණබමුණු-කෙනෙක් 'මේ ලොව අනන්තයක් නැත්තේ යැ යි, කොණක් නැත්තේ යැ' යි කීහු නම්, ඔවුන්ගේ ද වචන හිස් ය. යම් මහණබමුණුකෙනෙක් 'මේ ලොව අන්තවත් ද වේ, අනන්ත ද වේ' යැ යි කියත් නම්, ඔවුන්ගේ ද වචන හිස් ය. මේ ලොව අනන්තයක් ඇත්තේත් නො වේ ම ය. අනන්තයක් නැත්තේත් නො වේ ම ය" යනුයි.

මහණෙනි, යමක් නිසා යමක් ඇරැබූ ඇතැම් මහණබමුණෝ අන්තානන්තික වූවෝ ලොවේ අන්තානන්තය පණවත් නම්, මේ ඒ සිවුවන කාරණය යි.

56. මහණෙනි, ඒ මහණබමුණෝ අන්තානන්තික දෘෂ්ටි ගත්තෝ මේ සතර කරුණින් ලෝකයේ අන්තානන්තය පණවත්. මහණෙනි, යම් මහණකෙනෙක් හෝ බමුණුකෙනෙක් හෝ අන්තානන්තික දෘෂ්ටි ගත්තෝ ලෝකයේ අන්තානන්තය පණවත් නම්, ඒ සියල්ලෝ මේ කී සතර කරුණින් ම හෝ මොවුන් අතුරෙන් එක්තරා කරුණෙකින් හෝ එය පණවත්. මෙයින් පිටත්හි කරුණෙක් එයට නැත.

57. මහණෙනි, "මේ දෘෂ්ටිහු හෝ දෘෂ්ටිකාරණයෝ මෙසේ ගන්නා ලද්දේ, මෙසේ පරාමෘෂ්ට වූවෝ මෙබඳු නිරයාදිවිපාකගති ඇත්තෝ වන්නාහ. මෙබඳු වූ පරලොව් ඇතියෝ වන්නාහ" යි තථාගත තෙමේ ඒ මේ සතර දෘෂ්ටිගතය ම නන් අයුරින් දනී. තථාගත තෙමේ එය ද දනී. එයින් මත්තෙහි වූ (ශීල සමාධි ප්‍රඥා විමුක්ති විමුක්තිඥානදර්ශන සම්පන්නතාඥාන යන මේ) සියල්ලත් දනී. එය දන්නේ, 'මෙය මම දනිමි' යි තෘෂ්ණා දෘෂ්ටි මාන වශයෙන් ඒ දැනීම පරාමර්ශනය නො කෙරෙයි. එය පරාමර්ශනය නොකරන ඒ තථාගත බුදුහු විසින් ම තමාගේ කෙලෙස් නිවීම දන්නා ලද්දේ ය. (මෙහි සුව පත් වමු යි, අසෝ තැන සුව පත් වමු යි සිතමින් යම් සැප වේදනාවන්හි ඇලුණු අන්තොටුවෝ නානාවිධදෘෂ්ටි-ගහනයට වදිත් ද,) තථාගත තෙමේ ඒ වේදනාවන්ගේ උත්පත්තිය ද විනාශය ද ආස්වාදය ද ආදීනවය ද නිස්සරණය ද තත් වූ පරිදි දැන උපාදාන රහිත වැ මිදුණේ වෙයි.

58. මහණෙනි, තථාගත තෙමේ යම් ධර්ම කෙනෙකුන් පරෝපදේශ රහිත වැ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කෙරේ නම්, යම් ධර්ම කෙනෙකුන් කරණ කොට ගෙන තථාගත බුදුහුගේ ඇති පරිදි වූ ම ගුණ කියන්නට තැත් කරන්නෝ කියන්නාහු නම්, මේ, ගැඹුරු වූ සම්පන්න බුදු කෙනෙකුන් විසින් ම විනා සෙස්සවුන් විසින් නො දැක්ක හැකි වූ සෙස්සවුන් විසින් අවබෝධ නො කට හැකි වූ ශාන්ත වූ ප්‍රණීත වූ තර්කයෙන් බැස ගත නො හැකි වූ සියුම් වූ ප්‍රාඥයන් විසින් ම දත හැකි වූ ඒ ධර්මයෝ යි.

59. සන්ති භික්ඛවෙ එකෙ සමණබ්‍රාහ්මණා අමරාවික්ඛෙපිකා තත්ථ තත්ථ පඤ්හං පුට්ඨා සමානා වාචාවික්ඛෙපං ආපජ්ජන්ති අමරාවික්ඛෙපං වතුඤ්චි වත්ථූහි. කෙ ච භොන්තො සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිමාරබ්භ අමරාවික්ඛෙපිකා තත්ථ තත්ථ පඤ්හං පුට්ඨා සමානා වාචාවික්ඛෙපං ආපජ්ජන්ති අමරාවික්ඛෙපං වතුඤ්චි වත්ථූහි?

60. ඉධ භික්ඛවෙ එකච්චෙ සමණෙ වා බ්‍රාහ්මණෙ වා ඉදං කුසලන්ති යථාභූතං නප්පජානාති. ඉදං අකුසලන්ති යථාභූතං නප්පජානාති. තස්ස එවං හොති: "අහං ඛො ඉදං කුසලන්ති යථාභූතං නප්පජානාමි. ඉදං අකුසලන්ති යථාභූතං නප්පජානාමි. අහඤ්චෙව ඛො පන ඉදං කුසලන්ති යථාභූතං නප්පජානන්තො, ඉදං අකුසලන්ති යථාභූතං නප්පජානන්තො, ඉදං කුසලන්ති වා ව්‍යාකරෙය්‍යං, ඉදං අකුසලන්ති වා ව්‍යාකරෙය්‍යං, තත්ථ මෙ අස්ස ඡන්දො වා රාගො වා දොසො වා පටිඝො වා. යත්ථ මෙ අස්ස ඡන්දො වා රාගො වා දොසො වා පටිඝො වා, තං මමස්ස මුසා. යං මමස්ස මුසා, සො මමස්ස විඝාතො. යො මමස්ස විඝාතො, සො මමස්ස අන්තරායො" ති.

ඉති සො මුසාවාදභයා මුසාවාදපරිජෙගුච්ඡා නෙවිදං කුසලන්ති ව්‍යාකරොති. න පනිදං අකුසලන්ති ව්‍යාකරොති. තත්ථ තත්ථ පඤ්හං පුට්ඨො සමානො වාචාවික්ඛෙපං ආපජ්ජති අමරාවික්ඛෙපං: "එවම්පි මෙ නො. තථා'ති'පි මෙ නො. අඤ්ඤථා'ති'පි මෙ නො. නො'ති'පි මෙ නො. නො නො'ති'පි මෙ නො" ති.

ඉදං භික්ඛවෙ පඨමං ඨානං යං ආගම්ම යං ආරබ්භ එකෙ සමණ-බ්‍රාහ්මණා අමරාවික්ඛෙපිකා තත්ථ තත්ථ පඤ්හං පුට්ඨා සමානා වාචාවික්ඛෙපං ආපජ්ජන්ති අමරාවික්ඛෙපං.

61. දුතියෙ ච භොන්තො සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිමාරබ්භ අමරාවික්ඛෙපිකා තත්ථ තත්ථ පඤ්හං පුට්ඨා සමානා වාචාවික්ඛෙපං ආපජ්ජන්ති අමරාවික්ඛෙපං?

ඉධ භික්ඛවෙ එකච්චෙ සමණෙ වා බ්‍රාහ්මණෙ වා ඉදං කුසලන්ති යථා-භූතං නප්පජානාති. ඉදං අකුසලන්ති යථාභූතං නප්පජානාති. තස්ස එවං හොති: "අහං ඛො ඉදං කුසලන්ති යථාභූතං නප්පජානාමි. ඉදං අකුසලන්ති යථාභූතං නප්පජානාමි. අහඤ්චෙව ඛො පන ඉදං කුසලන්ති යථාභූතං නප්ප-ජානන්තො, ඉදං අකුසලන්ති යථාභූතං නප්පජානන්තො, ඉදං කුසලන්ති වා ව්‍යාකරෙය්‍යං, ඉදං අකුසලන්ති වා ව්‍යාකරෙය්‍යං, තත්ථ මෙ අස්ස ඡන්දො වා රාගො වා දොසො වා පටිඝො වා. යත්ථ මෙ අස්ස ඡන්දො වා රාගො වා දොසො වා පටිඝො වා, තං මමස්ස උපාදානං. යං මමස්ස උපාදානං, සො මමස්ස විඝාතො. යො මමස්ස විඝාතො, සො මමස්ස අන්තරායො"ති.

59. මහණෙනි, අමරාවික්ෂේපක වූ සමහර මහණබමුණුකෙනෙක් ඇත්තාහ. ඔහු ඒ ඒ කරුණෙහි ප්‍රශ්න විචාරන ලද්දේ ම වස්තු සතරෙකින් වාග්වික්ෂේපයට අමරාවික්ෂේපයට පැමිණෙත්. ඒ භවත් මහණබමුණෝ කුමක් නිසා කුමක් ඇරැබැ අමරාවික්ෂේපක වූවෝ, ඒ ඒ තන්හි ප්‍රශ්න විචාරන ලද්දේ ම වස්තු සතරෙකින් වාග්වික්ෂේපයට අමරාවික්ෂේපයට පැමිණෙත් ද ? යත්:

60. මහණෙනි, මෙහි එක්තරා මහණෙක් හෝ බමුණෙක් හෝ 'මේ කුසලැ' යි ඇති සැටි නො දනී. 'මේ අකුසලැ' යි ඇති සැටි නො දනී. ඔහුට "මේ කුසලැ' යි මම ඇතිසැටි නො දනිමි, 'මේ අකුසලැ' යි ඇතිසැටි නො දනිමි. මම වනාහි 'මේ කුසලැ' යි ඇති සැටියෙන් නො දන්නෙමි, 'මේ අකුසලැ' යි ඇති සැටියෙන් නො දන්නෙමි, 'මේ කුසලැ' යි කියා හෝ පවසන්නෙමි නම්, 'මේ අකුසලැ' යි කියා හෝ පවසන්නෙමි නම්, ඒ පැවැසුමෙහි මට ඡන්දයෙක් හෝ රාගයෙක් හෝ දෝෂයෙක් හෝ පටහැණිබවෙක් හෝ වන්නේ ය. යම් කරුණෙක්හි මට ඡන්දය හෝ රාගය හෝ දෝෂය හෝ පටහැණිබව හෝ වන්නේ නම්, ඒ මගේ ප්‍රකාශය බොරුවෙක් වන්නේ ය. මගේ යම් ප්‍රකාශයෙක් බොරු වන්නේ නම්, එය මට දුකෙක් වන්නේ ය. මට යම් දුකෙක් වන්නේ නම්, එය මට සවඥ මෝක්ෂ දෙකට බාධක වන්නේ යැ" යි මෙසේ සිතෙක් වෙයි.

මෙසේ හෙතෙම මුසාවාදයට බියෙන්, මුසාවාදයට පිළිකුලෙන්, 'මෙය කුසලැ' යි නො ම පවසයි. 'මෙය අකුසලැ' යි නො ද පවසයි. ඒ ඒ කරුණෙහි ප්‍රශ්න විචාරන ලද්දේ ම "මෙසේත් මගේ පිළිගැන්මෙක් නැත. එසේත් මගේ පිළිගැන්මෙක් නැත, ඒ දෙකින් ම අන් පරිද්දෙකිනුත් පිළිගැන්මෙක් මට නැත. 'නො පිළිගනිමි' යි කියා එකෙකුත් මට නැත. 'නො ම නො පිළිගනිමි' යි කියා එකෙකුත් මට නැතැ" යි වාග්වික්ෂේපයට අමරාවික්ෂේපයට පැමිණේ.

මහණෙනි, යමක් නිසා යමක් ඇරැබැ ඇතැම් මහණබමුණෝ අමරාවික්ෂේපක වූවෝ, ඒ ඒ කරුණෙහි ප්‍රශ්න විචාරන ලද්දේ ම වාග්වික්ෂේපයට අමරාවික්ෂේපයට පැමිණෙත්නාහු නම්, මේ ඒ පළමු කරුණ යි.

61. මහණෙනි, දෙවෙනි කරුණෙහි ද – භවත් මහණබමුණෝ කුමක් නිසා කුමක් ඇරැබැ අමරාවික්ෂේපක වූවෝ, ඒ ඒ කරුණෙහි ප්‍රශ්න විචාරන ලද්දේ ම වාග්වික්ෂේපයට අමරාවික්ෂේපයට පැමිණෙත් ද ? යත්:

මහණෙනි, මෙහි එක්තරා මහණෙක් හෝ බමුණෙක් හෝ 'මේ කුසල් යැ' යි ඇති සැටියෙන් නො දනියි. 'මේ අකුසල් යැ' යි ඇති සැටි නො දනියි. ඔහුට මෙසේ සිතෙක් වෙයි: "මම වනාහි 'මේ කුසල් යැ' යි ඇති සැටියෙන් නොදනිමි. 'මේ අකුසල් යැ' යි ඇති සැටියෙන් නො දනිමි. 'මේ කුසලැ' යි ඇති සැටියෙන් නො දන්නෙමි 'මේ කුසලැ' යි පැවැසුයෙමි නම්, 'මේ අකුසලැ'යි ඇති සැටි නො දන්නෙමි 'මේ අකුසලැ'යි පැවැසුයෙමි නම්, එ කරුණෙහි මට ඡන්දයෙක් හෝ රාගයෙක් හෝ දෝෂයෙක් හෝ ප්‍රතිඝයෙක් හෝ පියැ හැක්කේ ය. යමෙක දී මට ඡන්දයෙක් හෝ රාගයෙක් හෝ දෝෂයෙක් හෝ ප්‍රතිඝයෙක් හෝ වන්නේ නම්, එය මට උපාදානයෙක් වන්නේ ය. යමෙක් මට උපාදානයෙක් වන්නේ නම්, එය මට දුකෙක් වන්නේ ය. මට යම් දුකෙක් වන්නේ නම්, එය මට සවඥමෝක්ෂ දෙකට බාධක වන්නේ ය" යනු යි.

ඉති සො උපාදානහෙතු උපාදානපරිජෙගුච්ඡා නෙවිදං කුසලන්ති ව්‍යාකරොති. න පනිදං අකුසලන්ති ව්‍යාකරොති. තත්ථ තත්ථ පඤ්හං පුට්ඨො සමානො වාචාවික්ඛෙපං ආපජ්ජති අමරාවික්ඛෙපං: "එවම්පි මෙ නො. තථා'ති'පි මෙ නො. අඤ්ඤථා'ති'පි මෙ නො. නො'ති'පි මෙ නො. නො නො'ති'පි මෙ නො" ති.

ඉදං භික්ඛවෙ දුතියං ඨානං යං ආගම්ම යං ආරබ්භ එකෙ සමණ-බ්‍රාහ්මණා අමරාවික්ඛෙපිකා තත්ථ තත්ථ පඤ්හං පුට්ඨා සමානා වාචාවික්ඛෙපං ආපජ්ජන්ති අමරාවික්ඛෙපං.

62. තතියෙ ච භොතො සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිමාරබ්භ අමරාවික්ඛෙපිකා තත්ථ තත්ථ පඤ්හං පුට්ඨා සමානා වාචාවික්ඛෙපං ආපජ්ජන්ති අමරාවික්ඛෙපං?

ඉධ භික්ඛවෙ එකච්චො සමණො වා බ්‍රාහ්මණො වා ඉදං කුසලන්ති යථාභූතං නප්පජානාති. ඉදං අකුසලන්ති යථාභූතං නප්පජානාති. තස්ස එවං හොති: "අහං ඛො ඉදං කුසලන්ති යථාභූතං නප්පජානාමි. ඉදං අකුසලන්ති යථාභූතං නප්පජානාමි. අහඤ්චෙව ඛො පන ඉදං කුසලන්ති යථාභූතං නප්පජානන්තො, ඉදං අකුසලන්ති යථාභූතං නප්පජානන්තො, ඉදං කුසලන්ති වා ව්‍යාකරෙය්‍යං, ඉදං අකුසලන්ති වා ව්‍යාකරෙය්‍යං, සන්ති හි ඛො පන සමණබ්‍රාහ්මණා පණ්ඩිතා නිපුණා කතපරප්පවාදා වාලවෙධිරූපා වොභින්දන්තා මඤ්ඤෙ චරන්ති පඤ්ඤාගතෙන දිට්ඨිගතානි, තෙ මං තත්ථ සම්පුග්ගණ්හෙය්‍යුං සම්පුගාහෙය්‍යුං සම්පුභාසෙය්‍යුං. යෙ මං තත්ථ සම්පු-ග්ගණ්හෙය්‍යුං සම්පුගාහෙය්‍යුං සම්පුභාසෙය්‍යුං, තෙසාහං න සමපායෙය්‍යං. යෙසාහං න සමපායෙය්‍යං, සො මමස්ස විඝාතො. යො මමස්ස විඝාතො, සො මමස්ස අන්තරායො"ති.

ඉති සො අනුයොගහෙතු අනුයොගපරිජෙගුච්ඡා නෙවිදං කුසලන්ති ව්‍යාකරොති. න පනිදං අකුසලන්ති ව්‍යාකරොති. තත්ථ තත්ථ පඤ්හං පුට්ඨා සමානා වාචාවික්ඛෙපං ආපජ්ජති අමරාවික්ඛෙපං: "එවම්පි මෙ නො. තථා'ති'පි මෙ නො. අඤ්ඤථා'ති'පි මෙ නො. නො'ති'පි මෙ නො. නො නො'ති'පි මෙ නො"ති.

ඉදං භික්ඛවෙ තතියං ඨානං යං ආගම්ම යං ආරබ්භ එකෙ සමණ-බ්‍රාහ්මණා අමරාවික්ඛෙපිකා තත්ථ තත්ථ පඤ්හං පුට්ඨා සමානා වාචාවික්ඛෙපං ආපජ්ජන්ති අමරාවික්ඛෙපං.

මෙසේ හෙතෙම උපාදානය කෙරෙන් බියෙන්, උපාදානය කෙරෙන් පිළිකුලින් 'මෙය කුසලැ' යි කියා හෝ නො පවසයි. 'මෙය අකුසලැ' යි කියා හෝ නො පවසයි. ඒ ඒ කරුණෙහි ප්‍රශ්න විචාරන ලද්දේ ම, "මෙසේත් මගේ පිළිගැන්මෙක් නැත. එසේත් මගේ පිළිගැන්මෙක් නැත. අන් සැටියෙකිනුත් මගේ පිළිගැන්මෙක් නැත. 'එසේ නැතැ' යි කියාත් මගේ පිළිගැන්මෙක් නැත. 'එසේ නැත්තේත් නො වේ' යැ යි කියාත් මගේ පිළිගැන්මෙක් නැතැ" යි වාග්වික්ෂේපයට අමරාවික්ෂේපයට පැමිණෙයි.

මහණෙනි, ඇතැම් මහණබමුණෝ යමක් නිසා යමෙක එල්බැ අමරාවික්ෂේපක වූවෝ, ඒ ඒ කරුණෙහි ප්‍රශ්න විචාරන ලද්දේ ම වාග්වික්ෂේපයට අමරාවික්ෂේපයට පැමිණෙත් නම්, මේ ඒ දෙවෙනි කාරණය යි.

62. මහණෙනි, තෙවෙනි කාරණයෙහිත් – හවත් මහණබමුණෝ කුමක් නිසා කිමෙක එල්බැ අමරාවික්ෂේපක වූවෝ, ඒ ඒ කරුණෙහි ප්‍රශ්න විචාරන ලද්දේ ම වාග්වික්ෂේපයට අමරාවික්ෂේපයට පැමිණෙත් ද ? යත්:

මහණෙනි, මෙහි ඇතැම් මහණෙක් හෝ බමුණෙක් හෝ 'මේ කුසලැ'යි ඇති සැටියෙන් නො දනී. 'මේ අකුසලැ' යි ඇති සැටියෙන් නො දනී. ඔහුට මෙසේ සිතෙක් වෙයි: "මම වනාහි මේ කුසලැ යි තත් වූ පරිදි නො දනිමි. 'මේ අකුසලැ' යි තත් වූ පරිදි නො දනිමි. මම ද 'මේ කුසලැ' යි තත් වූ පරිදි නො දන්නෙමි, 'මේ අකුසලැ' යි තත් වූ පරිදි නො දන්නෙ මි, 'මේ කුසලැ' යි කියා හෝ පවසන්නෙමි නම්, 'මේ අකුසලැ' යි කියා හෝ පවසන්නෙමි නම්, නුවණැති සියුම් බුද්ධි ඇති මෙරමා හා කළ වාද ඇති අස්ලොමක් ඊයෙන් විද පළා ලන දුනුවාවන් බඳු වූ, තමන්ගේ තීයුණු නුවණින් අනුන්ගේ ලබ්ධීන් බිඳ ලන්නවුන් බඳු වැ යම් කෙනෙක් හැසිරෙත් ද, එසේ වූ මහණබමුණු කෙනෙක් ඇත්හ, ඔහු ඒ කුශලාකුශලයෙහි මගේ ලබ්ධිය මා අතින් විචාරන්නාහ. 'කවර කරුණෙකින් මේ අර්ථය ගතී ද ?' යි කරුණු විචාරන්නාහ. මා කරුණු කී කල්හි එහි දෙස් දක්වා තර්ජනය කරන්නාහ. මම ඔවුනට කරුණු දක්වා මගේ මතය සඳුට කොට කියන්නට සමත් නො වෙමි. යම් කෙනෙක්නට කරුණු දක්වා සවමතස්ථාපනය කරන්නට ම සමත් නො වෙමි ද, එය මට පීඩාවෙක. මට යම් පීඩාවෙක් මේ ද, එය මට සවශී මෝක්ෂ දෙකට බාධක වන්නේ ය" යනු යි. මෙසේ හෙතෙම ප්‍රශ්න කරනුවට බියෙන්, ප්‍රශ්න කළ හොත් උත්තර දීමට බැරි වෙතැ'යි ලජ්ජායෙන්, 'මේ කුසලැ' යි සෘජු වැ (ඉඳුරා) නො ම කියයි. 'මේ අකුසලැ'යි කියා හෝ සෘජු ව නො කියයි. ඒ ඒ කරුණෙහි ප්‍රශ්න විචාරන ලද්දේ ම, "මගේ මෙසේත් ගැන්මෙක් නැත. මගේ එසේත් ගැන්මෙක් නැත. අන් පරිද්දෙකිනුත් මගේ ගැන්මෙක් නැත. 'නැතැ' යි කියා මගේ ගැන්මෙක් ද නැත. 'එසේ නැත්තේත් නැතැ' යි කියාත් මගේ ගැන්මෙක් නැතැ" යි වාග්වික්ෂේපයට අමරාවික්ෂේපයට පැමිණෙත්.

මහණෙනි, ඇතැම් මහණබමුණෝ යමක් නිසා යමෙක එල්බැ අමරාවික්ෂේපක වූවෝ, ඒ ඒ කරුණෙහි ප්‍රශ්න විචාරන ලද්දේ ම වාග්-වික්ෂේපයට අමරාවික්ෂේපයට පැමිණෙත් නම්, මේ ඒ තුන්වන කාරණය යි.

63. චතුත්ථෙ- ච භොතො සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිමාරබ්ධ අමරාවික්ඛෙපිකා තත්ථ තත්ථ පඤ්හං පුට්ඨා සමානා වාචාවික්ඛෙපං ආපජ්ජන්ති අමරාවික්ඛෙපං ?

ඉධ භික්ඛවෙ එකච්චො සමණො වා බ්‍රාහ්මණො වා මන්දො හොති මොමූහො. සො මන්දත්තා මොමූහත්තා තත්ථ තත්ථ පඤ්හං පුට්ඨො සමානො වාචාවික්ඛෙපං ආපජ්ජති අමරාවික්ඛෙපං: "අත්ථි පරො ලොකො'ති ඉති චෙ මං පුච්ඡසි, අත්ථි පරො ලොකො'ති ඉති චෙ මෙ අස්ස, අත්ථි පරො ලොකො'ති ඉති තෙ නං ව්‍යාකරෙය්‍යං. එවම්පි මෙ නො. තථා'ති'පි මෙ නො. අඤ්ඤථා'ති'පි මෙ නො. නො'ති'පි මෙ නො. නො නො'ති'පි මෙ නො. නත්ථි පරො ලොකො'ති ? -පෙ- අත්ථි ච නත්ථි ච පරො ලොකො ? -පෙ- අත්ථි සත්තා ඔපපාතිකා ? -පෙ- අත්ථි ච නත්ථි ච සත්තා ඔපපාතිකා ? -පෙ- නෙවත්ථි න නත්ථි සත්තා ඔපපාතිකා ? -පෙ- අත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො ? -පෙ- නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො ? -පෙ- අත්ථි ච නත්ථි ච සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො ? -පෙ- නෙවත්ථි න නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො ? -පෙ- හොති තථාගතො පරම්මරණා ? -පෙ- න හොති තථාගතො පරම්මරණා ? -පෙ- හොති ච න හොති ච තථාගතො පරම්මරණා ? -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණා ති ? ඉති චෙ මං පුච්ඡසි "නෙව හොති න න හොති තථාගතො පරම්මරණා'ති ඉති චෙ මෙ අස්ස, නෙව හොති න න හොති තථාගතො පරම්මරණා'ති ඉති තෙ නං ව්‍යාකරෙය්‍යං. එවම්පි මෙ නො. තථා'ති'පි මෙ නො. අඤ්ඤථා'ති'පි මෙ නො. නො'ති'පි මෙ නො. නො නො 'ති'පි මෙ නො"ති.

ඉදං භික්ඛවෙ චතුත්ථං ඨානං යං ආගම්ම යං ආරබ්ධ එකෙ සමණ-බ්‍රාහ්මණා අමරාවික්ඛෙපිකා තත්ථ තත්ථ පඤ්හං පුට්ඨා සමානා වාචාවික්ඛෙපං ආපජ්ජන්ති අමරාවික්ඛෙපං.

64. ඉමෙහි ඛො තෙ භික්ඛවෙ සමණබ්‍රාහ්මණා අමරාවික්ඛෙපිකා තත්ථ තත්ථ පඤ්හං පුට්ඨා සමානා වාචාවික්ඛෙපං ආපජ්ජන්ති අමරා-වික්ඛෙපං චතූහි වත්ථූහි. යෙ හි කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා අමරාවික්ඛෙපිකා තත්ථ තත්ථ පඤ්හං පුට්ඨා සමානා වාචාවික්ඛෙපං ආපජ්ජන්ති අමරාවික්ඛෙපං, සබ්බෙ තෙ ඉමෙහෙව චතූහි වත්ථූහි, එතෙසං වා අඤ්ඤතරෙන. නත්ථි ඉතො බහිද්ධා.

63. සතර වැන්නෙහි ද – භවත් මහණබමුණෝ කුමක් නිසා කිමෙක එල්බැ අමරාවික්ෂේපක වූවෝ, ඒ ඒ කරුණෙහි ප්‍රශ්න විචාරන ලද්දේ ම වාග්වික්ෂේපයට අමරාවික්ෂේපයට පැමිණෙත් ද? යත්:

මහණෙනි, මෙහි ඇතැම් මහණෙක් හෝ බමුණෙක් හෝ මඳ නුවණැත්තේ වෙයි, බොහෝ සේ මූස වෙයි. හේ නුවණ මඳ බැවින්, බොහෝ සේ මූස බැවින්, ඒ ඒ කරුණෙහි ප්‍රශ්න විචාරන ලද්දේ ම, වාග් වික්ෂේපයට අපර්යන්ත වික්ෂේපයට පැමිණෙයි ඒ මෙසේ ය: 'පරලොවෙක් ඇද්ද?' යි මෙසේ මා අතින් විචාරයි නම්, 'පරලොවෙක් ඇතැ' යි මෙසේ මට හැඟීමක් වී නම්, 'පරලොවෙක් ඇතැ' යි මෙසේ එය තට විසඳන්නෙමි. එහෙත් 'මට මෙසේත් හැඟීමක් නැත. අන් පරිද්දෙනුත් හැඟීමෙක් නැත. මට හැඟීමෙක් නැත්තේත් නො වෙයි, මට හැඟීමෙක් නැති නො වන්නේත් නො වෙයි. 'පර ලොවක් නැද්ද?' යි විචාරයි නම්... 'පර ලොවෙක් ඇත්තේත් නැත්තේත් වේ ද?' යි විචාරයි නම් ..'පරලොවෙක් නො ම ඇත්තේත් නො ම නැත්තේත් වේ ද?' යි විචාරයි නම්... උපපාදුක (=මැරී උපදනා) සත්ත්වයෝ ඇත්තෝ ද?' යි විචාරයි නම්.. 'උපපාදුක සත්ත්වයෝ නැත්තෝ ද?' යි ... උපපාදුක සත්ත්වයෝ ඇත්තෝත් නැත්තෝත් වෙත් ද?' යි... උපපාදුක සත්ත්වයෝ නො ම ඇත්තෝත් නො ම නැත්තෝත් වෙද් ද?' යි... සුකෘතදුෂ්කෘතකර්මයන්ගේ ඵල විපාක ඇද්ද?' යි... සුකෘතදුෂ්කෘතකර්මයන්ගේ ඵල විපාක නැද්ද? යි... සුකෘතදුෂ්කෘතකර්මයන්ගේ ඵල විපාක ඇත්තේත් නැත්තේත් වේ ද යි... සුකෘතදුෂ්කෘතකර්මයන්ගේ ඵල විපාක නො ම ඇත්තේත් නො ම නැත්තේත් වේ ද?' යි... සත්ත්වයා මරණින් මතු වන්නේ ද?' යි... සත්ත්වයා මරණින් මතු නො වන්නේ ද? යි... සත්ත්වයා මරණින් මතු නො ම වන්නේත් නො ම නොවන්නේත් වේ ද?' යි විචාරයි නම්, 'සත්ත්වයා මරණින් මතු නො ම වන්නේත් නො ම නො වන්නේත් වේ යැ' යි මට හැඟීමෙක් වේ නම්, 'සත්ත්ව තෙමේ මරණින් මතු නො ම වන්නේත් නො ම නො වන්නේත් වේ යැ' යි එය තට විසඳන්නෙමි. එහෙත් මේසේ මට හැඟීමෙක් නැත. එසේත් මට හැඟීමෙක් නැත. අන් ලෙසෙකිනුත් මට හැඟීමෙක් නැත. එසේ නැතැ යි කියාත් මට හැඟීමෙක් නැත. නැත්තේ ම නැතැ යි කියාත් මට හැඟීමෙක් නැත" යනු යි.

මහණෙනි, යමක් නිසා යමක් අරබැ ඇතැම් මහණබමුණෝ අමරාවික්ෂේපක වූහු, ඒ ඒ කරුණෙහි ප්‍රශ්න විචාරන ලද්දේ ම වාග්වික්ෂේපයට අපර්යන්ත වික්ෂේපයට පැමිණෙත් නම්, මේ ඒ සතර වන කාරණය යි.

64. මහණෙනි, ඒ මහණබමුණෝ අමරාවික්ෂේපක වූවෝ, ඒ ඒ කරුණෙහි ප්‍රශ්න විචාරන ලද්දේ ම මේ සතර වස්තුවෙන් වාග්වික්ෂේපයට අපර්යන්තවික්ෂේපයට පැමිණෙත්. මහණෙනි, යම් මහණ කෙනෙක් හෝ බමුණුකෙනෙක් හෝ අමරාවික්ෂේපක වූවෝ, ඒ ඒ කරුණෙහි ප්‍රශ්න විචාරන ලද්දේ ම වාග්වික්ෂේපයට පැමිණෙත් නම්, අපර්යන්ත වික්ෂේපයට පැමිණෙත් නම්, ඒ සියල්ලෝ මේ වස්තු සතරින් ම හෝ මොවුන් අතුරෙන් එක්තරා වස්තුවෙකින් හෝ වාග්වික්ෂේපයට අපර්යන්ත වික්ෂේපයට පැමිණෙත්. මේසින් පිටත්හි වස්තුවෙක් ඔවුනට නැත.

65. තයිදං භික්ඛවෙ තථාගතො පජානාති: "ඉමෙ දිට්ඨිට්ඨානා එවං ගහිතා එවං පරාමට්ඨා එවංගතිකා භවිස්සන්ති එවංඅභිසම්පරායා"ති. තඤ්ච තථාගතො පජානාති. තතො ච උත්තරිතරං පජානාති. තඤ්ච පජානතො න පරාමසති. අපරාමසතො චස්ස පච්චත්තං යෙව නිබ්බුති විදිතා. වෙදනානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං විදිත්වා අනුපාදා විමුත්තත්තා භික්ඛවෙ තථාගතො.

ඉමෙ ඛො තෙ භික්ඛවෙ ධම්මා ගම්භීරා දුද්දසා දුරනුබොධා සන්තා පණීතා අතක්කාවචරා නිපුණා පණ්ඩිතවෙදනීයා යෙ තථාගතො සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති, යෙහි තථාගතස්ස යථාභුච්චං වණ්ණං සම්මා වදමානා වදෙය්‍යුං.

66. සන්ති භික්ඛවෙ එකෙ සමණබ්‍රාහ්මණා අධිච්චසමුප්පන්නිකා අධිච්චසමුප්පන්නං අත්තානඤ්ච ලොකඤ්ච පඤ්ඤපෙන්ති දළ්හි වත්ථූහි. තෙ ච ඛොපනෙතා සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිමාරබ්භ අධිච්චසමුප්පන්නිකා අධිච්චසමුප්පන්නං අත්තානඤ්ච ලොකඤ්ච පඤ්ඤපෙන්ති දළ්හි වත්ථූහි ?

සන්ති භික්ඛවෙ අසඤ්ඤසත්තා නාම දෙවා. සඤ්ඤුප්පාදා ච පන තෙ දෙවා තම්හා කායා චවන්ති. ඨානං ඛො පනෙතං භික්ඛවෙ විජ්ජති යං අඤ්ඤතරො සත්තො තම්හා කායා චවිත්වා ඉත්ථත්තං ආගච්ඡති. ඉත්ථත්තං ආගතො සමානො අගාරස්මා අනගාරියං පබ්බජති. අගාරස්මා අනගාරියං පබ්බජිතො සමානො ආතප්පමන්වාය පධානමන්වාය අනුයොගමන්වාය අප්පමාදමන්වාය සම්මාමනසිකාරමන්වාය තථාරූපං චෙතොසමාධිං ඵුසති, යථාසමාහිතෙ චිත්තෙ සඤ්ඤුප්පාදං අනුස්සරති තතො පරං නානුස්සරති. සො එවමාහ: "අධිච්චසමුප්පන්නා අත්තා ච ලොකො ච. තං කිස්ස හෙතු ? අහං හි පුබ්බෙ නාහොසිං. සොඞ්මහි එතරහි අහුත්වා සන්තත්තායෙ[1] පරිණතො"ති.

ඉදං භික්ඛවෙ පඨමං ඨානං යං ආගම්ම යං ආරබ්භ එකෙ සමණබ්‍රාහ්මණා අධිච්චසමුප්පන්නිකා අධිච්චසමුප්පන්නං අත්තානඤ්ච ලොකඤ්ච පඤ්ඤපෙන්ති.

---

1. සත්තත්තායෙ, කත්ථචි.

65. මහණෙනි, 'මේ දෘෂ්ටිස්ථානයෝ මෙසේ ගන්නා ලද්දේ, මෙසේ පරාමෘෂ්ට වූවෝ, මෙබඳු විපාකගති ඇත්තෝ වන්නාහ, මේ බඳු පරලොව් ඇතියෝ වන්නාහ' යි තථාගත තෙමේ ඒ කාරණය දනී. තථාගත තෙමේ එය ද එයින් මත්තෙහි දැ ද දනී. එහෙත් ඒ දැන්ම 'මම මෙය දනිමි' යි තෘෂ්ණාමානදෘෂ්ටි වශයෙන් පරාමර්ශනය නො කෙරෙයි. එසේ පරාමර්ශනය නොකරන ඔහු විසින් පරෝපදේශ නැති වැ (තමා විසින් ම) තමාගේ සෙලෙස් නිවීම දන්නා ලද්දේ වෙයි. ('මෙහි සුව පත් වමිහ' යි 'අසෝ තැනැ සුව පත් වමිහ' යි සිතමින් යම් සැප වේදනාවන්හි ඇලුණු අන්තොටුවෝ නානාවිධ දෘෂ්ටිගහනයට වදින් ද,) තථාගත තෙමේ ඒ වේදනාවන්ගේ උත්පත්තිය ද විනාශය ද ආස්වාදය ද ආදීනවය ද නිස්සරණය ද තතු වූ පරිදි දැන ඡන්දරාගය දුරැ වූ බැවින් උපාදාන රහිත ව මිදුණේ වෙයි.

මහණෙනි, තථාගත තෙමේ යම් ධර්ම කෙතෙකුත් තෙමේ ම විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කෙරේ නම්, යම් ධර්ම කෙතෙකුත් කරණ කොට ගෙන තථාගත බුදුහුගේ ඇති පරිදි වූ ම ගුණ කියන්නට තැත් කරන්නෝ කියන්නාහු නම්, මේ – ගැඹුරු වූ, සදිඥ බුදු කෙනෙකුත් විසින් ම විනා සෙස්සන් විසින් නො දැක්කැ හැකි වූ, එ හෙයින් ම සෙස්සන් විසින් අවබෝධ කට නො හැකි වූ, ශාන්ත වූ, ප්‍රණීත වූ, තර්කයෙන් බැස ගත නොහැකි වූ, සියුම් වූ, ප්‍රාඥයන් විසින් ම දත හැකි වූ ඒ ධර්මයෝ ය.

66. මහණෙනි, අධිච්චසමුප්පන්න දෘෂ්ටි ඇති ඇතැම් මහණබමුණු කෙනෙක් ඇත්තාහ. ඔහු ආත්මය ද ලෝකය ද අකාරණෝත්පන්න කොට (හේතු ප්‍රත්‍යය නැති ව උපන්නවුන් කොට) කරුණු දෙකෙකින් පණවත්. ඒ හවත් මහණබමුණෝ කුමක් නිසා කුමක් අරබා අධිච්ච-සමුප්පන්නවාද ඇත්තෝ දෙ කරුණෙකින් ආත්මයත් ලෝකයත් අකාරණෝත්පන්න කොට (ඉබේ පහළ වූවන් කොට) පණවත් ද? යත්:

මහණෙනි, අසංඥසත්ත්ව නම් දෙව් කෙනෙක් ඇත්හ. ඒ දෙවියෝ අන් සසංඥ භවයෙක ප්‍රතිසන්ධිසංඥවගේ පහළ වීමෙන් ම ඒ බ්‍රහ්ම-නිකායයෙන් චුත වෙත්. 'එක්තරා සත්ත්වයෙක් ඒ බ්‍රහ්මනිකායයෙන් සැව මේ මිනිසත් බවට පැමිණේ. හේ මේ මිනිසත්බවට ආයේ ම ගිහිගෙයින් නික්මැ පැවිදි බිමි වදී. ගිහි ගෙයින් පැවිදිබිමට වන්නේ ම උත්සාහය නිසා වීර්යය නිසා පුනපුනා වැර වැඩුම් නිසා සිහිය නිසා සම්‍යඞ්මනසිකාරය නිසා යම් සමාධියෙකින් සිත මොනොවට පිහිටි කල්හි ඒ ප්‍රතිසන්ධිසංඥවගේ උත්පත්තිය සිහි කෙරේ ද, එයින් යට සිහි නො කෙරේ ද, එසේ වූ චිත්තසමාධියක් ලබයි' යන යමෙක් ඇද්ද, මේ කාරණය ඇත්තේ ම ය. (මෙය සිදු වන දැයෙකි.) නැ තෙමේ "ලෝකය ද ආත්මය ද කාරණ රහිත ව (ඉබේ) පහළ වී ය. ඒ එසේ මා කියනුගේ කවර හෙයින? යත්: මම වනාහි පෙරැ නො වීමි. ඒ මම පෙරැ නො ඇති වී දැන් ඇති බවට පිරිනැමුණෙමි" යි මෙසේ කිය යි.

මහණෙනි, ඇතැම් මහණබමුණෝ යමක් නිසා යමක් ඇරබා අධිච්චසමුප්පන්නවාද ඇත්තෝ ආත්මයත් ලෝකයත් අකාරණෝත්පන්න කොට පණවත් නම්, මේ ඒ පළමුවන කාරණය යි.

67. දුතියෙ ච භොන්තො සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිමාරබ්භ අධිච්චසමුප්පන්නිකා අධිච්චසමුප්පන්නං අත්තානඤ්ච ලොකඤ්ච පඤ්ඤපෙන්ති?

ඉධ භික්ඛවෙ එකච්චො සමණො වා බ්‍රාහ්මණො වා තක්කී හොති වීමංසී. සො තක්කපරියාහතං වීමංසානුචරිතං සයම්පටිභානං එවමාහ: "අධිච්චසමුප්පන්නො අත්තා ච ලොකො චා"ති.

ඉදං භික්ඛවෙ දුතියං ඨානං යං ආගම්ම යං ආරබ්භ එකෙ සමණ-බ්‍රාහ්මණා අධිච්චසමුප්පන්නිකා අධිච්චසමුප්පන්නං අත්තානඤ්ච ලොකඤ්ච පඤ්ඤපෙන්ති.

68. ඉමෙහි ඛො තෙ භික්ඛවෙ සමණබ්‍රාහ්මණා අධිච්චසමුප්පන්නිකා අධිච්චසමුප්පන්නං අත්තානඤ්ච ලොකඤ්ච පඤ්ඤපෙන්ති දීහි වත්ථූහි.

යෙ හි කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා අධිච්චසමුප්පන්නිකා අධිච්චසමුප්පන්නං අත්තානඤ්ච ලොකඤ්ච පඤ්ඤපෙන්ති, සබ්බෙ තෙ ඉමෙහෙව දීහි වත්ථූහි, එතෙසං වා අඤ්ඤතරෙන. නත්ථි ඉතො බහිද්ධා.

69. තත්‍රිදං භික්ඛවෙ තථාගතො පජානාති -පෙ-* යෙ හි තථාගතස්ස යථාභූතවණ්ණං සම්මා වදමානා වදෙය්‍යුං.

70. ඉමෙහි ඛො තෙ භික්ඛවෙ සමණබ්‍රාහ්මණා පුබ්බන්තකප්පිකා පුබ්බන්තානුදිට්ඨිනො පුබ්බන්තං ආරබ්භ අනෙකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති අට්ඨාරසහි වත්ථූහි. යෙ හි කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා පුබ්බන්තකප්පිකා පුබ්බන්තානුදිට්ඨිනො පුබ්බන්තං ආරබ්භ අනෙකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති, සබ්බෙ තෙ ඉමෙහෙව අට්ඨාරසහි වත්ථූහි, එතෙසං වා අඤ්ඤතරෙන. නත්ථි ඉතො බහිද්ධා.

71. තත්‍රිදං භික්ඛවෙ තථාගතො පජානාති "ඉමෙ දිට්ඨිට්ඨානා එවං ගහිතා එවං පරාමට්ඨා එවංගතිකා භවිස්සන්ති එවංඅභිසම්පරායා"ති. තඤ්ච තථාගතො පජානාති. තතො ච උත්තරිතරං පජානාති. තඤ්ච පජානතො න පරාමසති. අපරාමසතො චස්ස පච්චත්තඤ්ඤෙව නිබ්බුති විදිතා. වෙද-නානං සමුදයඤ්ච අත්ථඟමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං විදිත්වා අනුපාදාවිමුත්තො භික්ඛවෙ තථාගතො.

---

* 65 ජෙද්දෙ ඔලොකෙතබ්බං.

67. දෙවෙනි කරුණෙහි – භවත් මහණබමුණෝ කුමක් නිසා කුමක් ඇරැබැ අධිච්චසමුප්පන්න දෘෂ්ටි ඇත්තෝ ආත්මයත් ලෝකයත් අකාරණෝත්පන්න කොට පණවත් ද? යත්:

මහණෙනි, මෙහි එක්තරා මහණෙක් හෝ බමුණෙක් හෝ තර්ක විතර්ක කරන්නේ වෙයි. අයෝනිසෝමනස්කාරයෙන් විමසන්නේ වෙයි. හේ තර්ක කොට ගන්නා ලද, නොනුවණින් විමසා ගැන්ම අනුවැ පැවැති, 'ආත්මයත් ලෝකයත් අකාරණෝත්පන්න ය' යන තමා ගේ හුදු වැටැහීම මෙසේ කියයි.

මහණෙනි, ඇතැම් මහණබමුණෝ යමක් නිසා යමක් ඇරැබැ අධිච්චසමුප්පන්නවාද ඇත්තෝ ආත්මයත් ලෝකයත් අකාරණෝත්පන්න කොට පණවත් නම්, මේ ඒ දෙවෙනි කාරණය යි.

68. මහණෙනි, ඒ මහණබමුණෝ අධිච්චසමුප්පන්නවාද ඇත්තෝ මේ දෙ කරුණින් ම ආත්මයත් ලෝකයත් අකාරණෝත්පන්න කොට පණවත්.

මහණෙනි, යම් මහණබමුණු කෙනෙක් අධිච්චසමුප්පන්න වාද ඇත්තෝ ආත්මයත් ලෝකයත් අකාරණෝත්පන්න කොට පණවත් නම්, ඒ සියල්ලෝ මේ දෙ කරුණින් ම හෝ මොවුන්ගෙන් එක්තරා කරුණෙකින් හෝ එසේ පණවත්. මේ දෙකින් පිටත්හි කරුණෙක් ඔවුනට නැත.

69. මහණෙනි, 'මේ දෘෂ්ටිහු (හෝ මේ දෘෂ්ටිකාරණයෝ) මෙසේ ගන්නා ලද්දේ, මෙසේ පරාමෘෂ්ට වූවෝ මෙබඳු නිරයාදි විපාකගති ඇත්තෝ වන්නාහ. මෙබඳු වූ පරලොව් ඇතියෝ වන්නාහ' යි තථාගත තෙමේ මේ දෙවැදෑරුම් දෘෂ්ටිගතය ම නත් අසුරින් දනී. තථාගත තෙමේ එය ද දනී... තථාගත බුදුහුගේ ගුණ ඇති සැටියෙන් කියන්නට තැත්-කරන්නෝ යමෙකින් කියන්නෝ නම්... ඒ ධර්මයෝ වනාහි මොහු වෙති.

70. මහණෙනි, ඒ මහණබමුණෝ පූර්වාන්තකල්පික වූවෝ, පූර්වාන්තය අනු වැ පහළ කැරැ ගත් දෘෂ්ටි ඇත්තෝ මේ කරුණු අටලොසින් පූර්වාන්තය ඇරැබැ අනේකප්‍රකාර දෘෂ්ටිප්‍රකාශක වචන (දර්ශනවාද භගවන වචන) කියත්. මහණෙනි, යම් මහණ කෙනෙක් හෝ යම් බමුණු කෙනෙක් හෝ පූර්වාන්තකල්පික වූවෝ, පූර්වාන්තය අනු වැ පහළ කොට ගත් දෘෂ්ටි ඇත්තෝ පූර්වාන්තය ඇරැබැ අනේකප්‍රකාර දෘෂ්ටිප්‍රකාශක වචන කියත් ද, ඒ සියල්ලෝ මේ කරුණු අටලොසින් ම හෝ මොවුන් අතුරෙන් එක්තරා කරුණෙකින් හෝ කියන්නාහ. මෙයින් පිටත් කරුණෙක් ඔවුනට නැත.

71. මහණෙනි, "මේ දෘෂ්ටිහු (හෝ දෘෂ්ටිකාරණයෝ) මෙසේ ගන්නා ලද්දේ, මෙසේ පරාමෘෂ්ට වූවෝ, මෙබඳු නිරයාදි විපාකගති ඇතියෝ වන්නාහ, මෙබඳු පරලොව් ඇතියෝ වන්නාහ" යි මේ අටොළොස් දෘෂ්ටිගතය ම තථාගත තෙමේ දන්නේ ය. තථාගත තෙමේ එයත් දනී. එයින් මත්තෙහි වූ සියල්ලත් දනී. ඒ දැන්ම තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් පරාමර්ශනය නො කෙරෙයි. එය පරාමර්ශනය නො කැරැ ඒ තථාගත බුදුහු විසින් පරෝපදේශ රහිත වැ (තමා විසින් ම) කෙලෙසුන්ගේ නිවීම දන්නා ලද්දේ ය. (යම් සැප වේදනාවන්හි ඇලුණු අත්තොටුවෝ නත් වැදෑරුම් දෘෂ්ටිගතයට වදිත් නම්) තථාගත තෙමේ ඒ වේදනා-වන්ගේ උත්පත්තිය ද විනාශය ද ආස්වාදය ද ආදීනවය ද නිස්සරණය ද නත් වූ පරිදි දැන උපාදාන රහිත වැ මිදුණේ වේ.

ඉමෙ ඛො තෙ භික්ඛවෙ ධම්මා ගම්භීරා දුද්දසා දුරනුබොධා සන්තා පණීතා අතක්කාවචරා නිපුණා පණ්ඩිතවෙදනීයා යෙ තථාගතො සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති, යෙහි තථාගතස්ස යථාභූතවං වණ්ණං සම්මා වදමානා වදෙය්‍යුං.

72. සන්ති භික්ඛවෙ එකෙ සමණබ්‍රාහ්මණා අපරන්තකප්පිකා අපරන්තානුදිට්ඨිනො අපරන්තං ආරබ්භ අනෙකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති චතුවත්තාරීසාය වත්ථූහි. තෙ ච හොන්තො සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිමාරබ්භ අපරන්තකප්පිකා අපරන්තානුදිට්ඨිනො අපරන්තං ආරබ්භ අනෙකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති චතුවත්තාරීසාය වත්ථූහි?

73. සන්ති භික්ඛවෙ එකෙ සමණබ්‍රාහ්මණා උද්ධමාඝාතනිකා සඤ්ඤීවාදා උද්ධමාඝාතනා සඤ්ඤිං අත්තානං පඤ්ඤාපෙන්ති සොළසහි වත්ථූහි. තෙ ච හොන්තො සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිමාරබ්භ උද්ධමාඝාතනිකා සඤ්ඤීවාදා උද්ධමාඝාතනා සඤ්ඤිං අත්තානං පඤ්ඤා-පෙන්ති සොළසහි වත්ථූහි?

රූපී අත්තා හොති අරොගො පරම්මරණා සඤ්ඤීති නං පඤ්ඤාපෙන්ති. අරූපී අත්තා හොති අරොගො පරම්මරණා සඤ්ඤීති නං පඤ්ඤාපෙන්ති. රූපී ච අරූපී ච අත්තා හොති -පෙ-. නෙව රූපී නාරූපී අත්තා හොති -පෙ-. අන්තවා අත්තා හොති -පෙ-. අනන්ත වා අත්තා හොති -පෙ-. අන්තවා ච අනන්තවා ච අත්තා හොති -පෙ-. නෙවන්තවා[1] නානන්තවා ච අත්තා හොති -පෙ-. එකත්තසඤ්ඤී අත්තා හොති -පෙ-. නානත්ත-සඤ්ඤී අත්තා හොති -පෙ-. පරිත්තසඤ්ඤී අත්තා හොති -පෙ-. අප්පමාණසඤ්ඤී අත්තා හොති -පෙ-. එකන්තසුඛී අත්තා හොති -පෙ-. එකන්තදුක්ඛී අත්තා හොති -පෙ-. සුඛදුක්ඛී අත්තා හොති -පෙ-. අදුක්ඛමසුඛී අත්තා හොති අරොගො පරම්මරණා සඤ්ඤීති නං පඤ්ඤාපෙන්ති.

1. නෙවන්තවා ච. කත්ථච.

මහණෙනි, තථාගත තෙමේ යම් ධර්ම කෙනෙකුන් තෙමේ ම විශිෂ්ට ඥානයෙන් දැන පසක් කොට පවසා නම්, යම් ධර්ම කෙනෙකුන් කරණ කොට ගෙන තථාගත බුදුහුගේ ඇති පරිදි වූ ම ගුණ කියන්නට තතනන්නෝ කියන්නාහු නම්, මේ - ගැඹුරු වූ, සවිඥ බුදු කෙනෙකුන් විසින් ම විනා සෙස්සවුන් විසින් නො දැක්කැ හැකි වූ, සෙස්සවුන් විසින් අවබෝධ නො කට හැකි වූ, ශාන්ත වූ, ප්‍රණීත වූ, තර්කයෙන් බැසැ ගත නො හැකි වූ, සියුම් වූ, ප්‍රාඥයන් විසින් ම දත හැකි වූ ඒ ධර්මයෝ ය.

72. මහණෙනි, අපරාන්තකල්පික වූ, අනාගත ස්කන්ධපරම්පරාව තෘෂ්ණාදෘෂ්ටි වශයෙන් වරදවා කල්පනා කොට ගත්, ඒ අනාගත ස්කන්ධපරම්පරා කොටස අනුවැ පහළ කොට ගත් දෘෂ්ටි ඇති, ඇතැම් මහණබමුණු කෙනෙක් ඇත්හ. ඔහු අනාගත ස්කන්ධපරම්පරා කොටස ඇරැඹැ කරුණු සුසාළිසෙකින් නොයෙක් වැදැරුම් දෘෂ්ටිප්‍රකාශක වචන කියත්. ඒ භවත් මහණබමුණෝත් කුමක් නිසා කිමෙකැ එල්බැ අපරාන්තකල්පික වූවෝ, අපරාන්තය අනුවැ ගිය දෘෂ්ටි ඇත්තෝ සුසාළිස් කරුණෙකින් අපරාන්තය ඇරැඹැ නොයෙක් වැදැරුම් දෘෂ්ටි-ප්‍රකාශක වචන කියත් ද? යත්:

73. මහණෙනි, උද්ධමාඝාතනික වූ ('මරණින් මතු ආත්මය ඇතැ'යි කියන) 'ඒ ආත්මය සංඥ ඇත්තෙකැ'යි දෘෂ්ටි ගත් ඇතැම් මහණබමුණු කෙනෙක් ඇත්හ. ඔහු මරණින් මත්තෙහි වූ ආත්මය සංඥ ඇත්තක්හු කොට කරුණු සොළොසෙකින් පණවත්. ඒ භවත් මහණබමුණෝ කුමක් නිසා කුමක් ඇරැඹැ 'මරණින් මත්තෙහි ආත්මය සංඥී යැ' යි දෘෂ්ටි ඇත්තෝ වස්තු සොළොසෙකින් මරණින් මත්තෙහි ආත්මය සංඥවත් කොට පණවත් ද? යත්:

කෙනෙක් 'ආත්මය රූපවත් ය, මරණින් මතු නිත්‍ය ය, සංඥ ඇත්තේ යැ' යි පණවත්. ඇතැම් කෙනෙක් 'ආත්මය රූපවත් නො වේ, මරණින් මතු නිත්‍ය ය, සංඥ ඇත්තෙකැ' යි පණවත්. අන් කෙනෙක් 'ආත්මය රූපීත් වේ, අරූපීත් වේ, මරණින් මතු නිත්‍ය ය, සංඥ සහිත යැ' යි පණවත්. සමහරු 'ආත්මය රූපයක් ඇත්තෙක් ද නො වේ, රූපයක් නැත්තෙක් ද නො වේ, මරණින් මතු නිත්‍ය ය, සංඥ සහිත යැ' යි පණවත්. තවත් කෙනෙක් 'ආත්මය (එය පැතිරැ ඇති ප්‍රදේශ වශයෙන්) කෙළවරක් ඇත්තෙක, එහෙත් මරණින් මතු නිත්‍ය ය, සංඥ සහිත යැ' යි පණවත්. තවත් කෙනෙක් 'ආත්මය (පැතිරැ පැවැති ප්‍රදෙශ වශයෙන්) කෙළවරක් නැත්තෙක, මරණින් මතු නිත්‍ය ය, සංඥ සහිත යැ' යි පණවත්. අන් කෙනෙක් 'ආත්මය (උඩු යැටි දෙදිගින්) සීමාසහිත ය, සරසින් සීමාරහිත ය, මරණින් මතු නිත්‍ය ය, සසංඥ යැ' යි පණවත්. අන් කෙනෙක් 'ආත්මය (ප්‍රදේශවශයෙන්) සීමාවක් ඇත්තෙක් ද නො වේ, නැත්තෙක් ද නො වේ, මරණින් මතු නිත්‍ය ය, සසංඥ යැ' යි පණවත්. සමහරු 'ආත්මය ඒකාකාර සංඥ ඇත්තේ ය, මරණින් මතු නිත්‍ය ය, සසංඥ යැ' යි පණවත්. සමහරු 'ආත්මය නානාවිධ සංඥ ඇත්තේ ය, මරණින් මතු නිත්‍ය ය, සසංඥ යැ' යි පණවත්. සමහරු 'ආත්මය ප්‍රමාණ වශයෙන් නොමහත් සංඥ ඇත්තෙක, මරණින් මතු නිත්‍ය ය, සසංඥ යැ' යි පණවත්. සමහරු 'ආත්මය අප්‍රමාණසංඥ ඇත්තෙක, මරණින් මතු නිත්‍ය ය, සසංඥ යැ' යි පණවත්. ඇතැම්හු 'ආත්මය ඒකාන්ත සැප ඇත්තෙක, මරණින් මතු නිත්‍ය ය, සසංඥ යැ' යි පණවත්. ඇතැම්හු 'ආත්මය ඒකාන්ත දුක් ඇත්තේ ය, මරණින් මතු නිත්‍ය ය, සසංඥ යැ' යි පණවත්. සමහර කෙනෙක් 'ආත්මය සුව ද දුක් ද ඇත්තෙක, මරණින් මතු නිත්‍ය ය, සසංඥ යැ' යි පණවත්. සමහරු 'ආත්මය සුව ද දුක් ද යන දෙක ම නැත්තෙක, මරණින් මතු නිත්‍ය ය, සසංඥ යැ' යි පණවත්.

74. ඉමෙහි ඛො තෙ භික්ඛවෙ සමණබ්‍රාහ්මණා උද්ධමාඝාතනිකා සඤ්ඤීවාද උද්ධමාඝාතනා සඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති සොළසහි වත්ථූහි.

යෙ හි කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා උද්ධමාඝාතනිකා සඤ්ඤීවාද උද්ධමාඝාතනා සඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති සබ්බෙ තෙ ඉමෙහෙව සොළසහි වත්ථූහි, එතෙසං වා අඤ්ඤතරෙන. නත්ථි ඉතො බහිද්ධා.

75. තයිදං භික්ඛවෙ තථාගතො පජානාති "ඉමෙ දිට්ඨිට්ඨානා එවං ගහිතා එවං පරාමට්ඨා එවංගතිකා භවිස්සන්ති එවංඅභිසම්පරායා"ති. තඤ්ච තථාගතො පජානාති තතො ච උත්තරිතරං පජානාති. තඤ්ච පජානනං න පරාමසති. අපරාමසතො ච්ඡ පච්චත්තඤ්ඤෙව නිබ්බුති විදිතා. වෙදනානං සමුදයඤ්ච අත්ථඟමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්ස-රණඤ්ච යථාභූතං විදිත්වා අනුපාද විමුත්තො භික්ඛවෙ තථාගතො.

76. ඉමෙ ඛො තෙ භික්ඛවෙ ධම්මා ගම්භීරා දුද්දසා දුරනුබොධා සන්තා පණීතා අතක්කාවචරා නිපුණා පණ්ඩිතවෙදනීයා, යෙ තථාගතො සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති, යෙහි තථාගතස්ස යථාභූතවං වණ්ණං සම්මා වදමානා වදෙය්‍යුං.

දුතියභාණවාරං.

77. සන්ති භික්ඛවෙ එකෙ සමණබ්‍රාහ්මණා උද්ධමාඝාතනිකා අසඤ්ඤීවාද උද්ධමාඝාතනා අසඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අට්ඨහි වත්ථූහි. තෙ ච භොන්තො සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිමාරබ්භ උද්ධමාඝාතනිකා අසඤ්ඤීවාද උද්ධමාඝාතනා අසඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අට්ඨහි වත්ථූහි?

78. 'රූපී අත්තා හොති අරොගො පරම්මරණා අසඤ්ඤී' ති නං පඤ්ඤපෙන්ති. 'අරූපී අත්තා හොති -පෙ-. රූපී ච අරූපී ච අත්තා හොති -පෙ-. නෙව රූපී නාරූපී අත්තා හොති -පෙ-. අන්තවා අත්තා හොති -පෙ-. අනන්තවා අත්තා හොති -පෙ-. අන්තවා ච අනන්තවා ච අත්තා හොති -පෙ-. නෙවන්තවා නානන්තවා අත්තා හොති අරොගො පරම්මරණා අසඤ්ඤී ති නං පඤ්ඤපෙන්ති.

74. මහණෙනි, 'මරණින් මතු ආත්මය ඇතැ යි එය සසංඥ යැ' යි දෘෂ්ටි ගත් ඒ මහණබමුණෝ මේ සොළොස් කරුණින් මරණින් මතු සංඥ සහිත වූ ආත්මයක් පණවත්.

මහණෙනි, යම් මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ 'මරණින් මතු සංඥ සහිත ආත්මයක් ඇතැ'යි දෘෂ්ටි ගත්තෝ සංඥ ඇති ආත්මයක් පණවත් ද, ඒ සියල්ලෝ මේ වස්තු සොළොසින් ම හෝ මොවුන් අතුරෙන් එක්තරා වස්තුවෙකින් හෝ එය පණවත්. මෙයින් පිටත් කරුණෙක් ඔවුනට නැත.

75. මහණෙනි, 'මේ දෘෂ්ටිස්ථානයෝ මෙසේ ගන්නා ලද්දේ, මෙසේ පරාමෘෂ්ට වූවෝ, මෙබඳු විපාක ගති ඇත්තෝ, මෙබඳු පර ලොව් ඇත්තෝ වන්නාහ'යි ඒ කාරණය තථාගත තෙමේ දනී. තථාගත තෙමේ එයත් දනී, එයින් වැඩි තරම් දුත් දනී. හේ ඒ තමාගේ දුන්ම ද තාෂ්ණාදීන් දැඩි කොට නො ගනී. එසේ දැඩි කොට නො ගන්නා ඔහු විසින් තමා ම කෙලෙස් නිවීම දන්නා ලද්දේ ය. (අන් තොවුවෝ යම් සැප වේදනා පතා දෘෂ්ටි ගනිත් නම් ඔවුන්ගේ ඒ) වේදනාවන්ගේ හට ගැන්ම ද විනාශය ද ආස්වාදය ද ආදීනවය ද නිඃශරණය ද තත් වූ පරිදි දැනීමෙන් ඒ තථාගත තෙමේ උපාදාන රහිත වැ මිදුණේ වෙයි.

76. මහණෙනි, තථාගත තෙමේ යම් ධර්ම කෙනෙකුත් තෙමේ ම දැන පසක් කොට පවසා නම්, යම් ධර්ම කෙනෙකුත් කරණ කොට ගෙන තථාගත බුදුහුගේ ඇති පරිදි වූ ම. ගුණය මොනොවට කියන්නට තැත් කරනුවෝ කියන්නෝ නම්, මේ ඒ ගැඹුරු වූ දුදර්ශ වූ දුරනුබෝධ වූ ශාන්ත වූ ප්‍රණීත වූ අතර්කාවචර වූ නිපුණ වූ පණ්ඩිතවේද්‍ය වූ ධර්මයෝ ය.

දෙවෙනි බණවර නිමියේ ය.

77. මහණෙනි, උද්ධමාඝාතනික අසඤ්ඤීවාද ඇති (මරණින් මතු ආත්මය අසංඥී යැ යි පණවන) ඇතැම් මහණබමුණු කෙනෙක් ඇත්තාහ. ඔහු මරණින් පසු සංඥරහිත ආත්මයක් කරුණු අටෙකින් පණවත්. ඒ හවත්හු කුමක් නිසා කුමක් ඇරැබැ උද්ධමාඝාතනික අසඤ්ඤීවාද ඇත්තෝ මරණින් පසු සංඥරහිත ආත්මයක් කරුණු අටෙකින් පණවත්ද? යත්:

78. මහණෙනි, ඇතැම්හු "ආත්මය රූපවත් ය, මරණින් පසු නො බිඳෙන්නේ ය හෙවත් නිත්‍ය ය, අසංඥී යැ" යි පණවත්. ඇතැම් කෙනෙක් "ආත්මය අරූපී ය, මරණින් පසු නිත්‍ය ය, අසංඥී යැ" යි පණවත්. ඇතැම්හු "ආත්මය රූපවත් ද රූපරහිත ද වෙයි, මරණින් පසු නිත්‍ය ය, අසංඥී යැ" යි පණවත්. ඇතැම්හු "ආත්මය රූපවත් ද නො වේ, අරූපී ද නො වේ, මරණින් පසු නිත්‍ය ය, අසංඥී යැ" යි පණවත්. සමහරු "ආත්මය අන්තයක් ඇත්තේ වෙයි, මරණින් පසු නිත්‍ය ය, අසංඥී යැ" යි පණවත්. සමහරු "ආත්මය අන්තරහිත යැ යි, මරණින් පසු නිත්‍ය ය, අසංඥී යැ" යි පණවත්. සමහරු "ආත්මය අන්තවත් ද අනන්ත ද වේ, මරණින් පසු නිත්‍ය ය, අසංඥී යැ" යි පණවත්. සමහරු "ආත්මය අන්තවත් ද නො වේ, අනන්ත ද නො වේ, මරණින් පසු නිත්‍ය ය, අසංඥී යැ" යි පණවත්.

79. ඉමෙහි ඛො තෙ භික්ඛවෙ සමණබ්‍රාහ්මණා උද්ධමාඝාතනිකා අසඤ්ඤීවාදා උද්ධමාඝාතනා අසඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අට්ඨහි වත්ථූහි. යෙ හි කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා උද්ධමාඝාතනිකා අසඤ්ඤීවාදා උද්ධමාඝාතනා අසඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති, සබ්බෙ තෙ ඉමෙහෙව අට්ඨහි වත්ථූහි, එතෙසං වා අඤ්ඤතරෙන. තත්‍රි ඉතො බහිද්ධා.

80. තයිදං භික්ඛවෙ තථාගතො පජානාති -පෙ- යෙහි තථාගතස්ස යථාභූතං වණ්ණං සම්මා වදමානා වදෙය්‍යුං.

81. සන්ති භික්ඛවෙ එකෙ සමණබ්‍රාහ්මණා උද්ධමාඝාතනිකා නෙවසඤ්ඤීනාසඤ්ඤීවාදා උද්ධමාඝාතනා නෙවසඤ්ඤීනාසඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අට්ඨහි වත්ථූහි. තෙ ච හොන්තො සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිමාරබ්භ උද්ධමාඝාතනිකා නෙවසඤ්ඤීනාසඤ්ඤීවාදා උද්ධමාඝාතනා නෙවසඤ්ඤීනාසඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අට්ඨහි වත්ථූහි?

82. "රූපී අත්තා හොති අරොගො පරම්මරණා නෙවසඤ්ඤී නාසඤ්ඤී' ති නං පඤ්ඤපෙන්ති. 'අරූපී අත්තා හොති අරොගො පරම්මරණා නෙවසඤ්ඤී නාසඤ්ඤී' ති නං පඤ්ඤපෙන්ති. 'රූපී ච අරූපී ච අත්තා හොති අරොගො පරම්මරණා නෙවසඤ්ඤී නාසඤ්ඤී' ති නං පඤ්ඤපෙන්ති. 'නෙවරූපී නාරූපී අත්තා හොති අරොගො පරම්මරණා නෙවසඤ්ඤී නාසඤ්ඤී' ති නං පඤ්ඤපෙන්ති. 'අන්තවා අත්තා හොති අරොගො පරම්මරණා නෙවසඤ්ඤී නාසඤ්ඤී' ති නං පඤ්ඤපෙන්ති. 'අනන්තවා අත්තා හොති අරොගො පරම්මරණා නෙවසඤ්ඤී නාසඤ්ඤී' ති නං පඤ්ඤපෙන්ති. 'අන්තවා ච අනන්තවා ච අත්තා හොති අරොගො පරම්මරණා නෙවසඤ්ඤී නාසඤ්ඤී' ති නං පඤ්ඤපෙන්ති. 'නෙවන්තවා නානන්තවා අත්තා හොති අරොගො පරම්මරණා නෙවසඤ්ඤී නාසඤ්ඤී" ති නං පඤ්ඤපෙන්ති.

83. ඉමෙහි ඛො තෙ භික්ඛවෙ සමණබ්‍රාහ්මණා උද්ධමාඝාතනිකා නෙවසඤ්ඤීනාසඤ්ඤීවාදා උද්ධමාඝාතනා නෙවසඤ්ඤීනාසඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අට්ඨහි වත්ථූහි. යෙ හි කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා උද්ධමාඝාතනිකා නෙවසඤ්ඤීනාසඤ්ඤීවාදා උද්ධමාඝාතනා නෙවසඤ්ඤීනාසඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති, සබ්බෙ තෙ ඉමෙහෙව අට්ඨහි වත්ථූහි, එතෙසං වා අඤ්ඤතරෙන. තත්‍රි ඉතො බහිද්ධා

84. තයිදං භික්ඛවෙ තථාගතො පජානාති -පෙ- යෙහි තථාගතස්ස යථාභූතං වණ්ණං සම්මා වදමානා වදෙය්‍යුං.

79. මහණෙනි, උද්ධමාඝාතනික අසඤ්ඤීවාද ඇති ඒ මහණබමුණෝ මේ අට කරුණින් මරණින් මතු සංඥ රහිත ආත්මයක් පණවත්. මහණෙනි, යම් මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් උද්ධමාඝාතනික අසංඥීවාද ඇත්තෝ මරණින් මතු අසංඥී ආත්මයක් පණවන්නෝ නම්, ඒ සියල්ලෝ ම මේ අට කරුණින් ම හෝ මොවුන් අතුරෙන් එක්තරා කරුණෙකින් හෝ එය පණවත්. මෙසින් පිටත් කරුණෙක් ඔවුනට නැත.

80. මහණෙනි, තථාගත බුදුහුගේ ඇති පරිදි ම වූ ගුණය මොනොවට කියනු කැමැත්තෝ කියන්නාහු නම්, . . . මේ ඒ ගැඹුරු වූ දුදීර්ශ වූ . . . කරුණු සි.

81. මහණෙනි, උද්ධමාඝාතනික නෙවසඤ්ඤීනාසඤ්ඤී වාද ඇති ඇතැම් මහණබමුණු කෙනෙක් මරණින් මතු සංඥ නොමැති වූත් අසංඥ නොවූත් ආත්මයක් අට කරුණෙකින් පණවත්.

ඒ හවත් මහණබමුණෝ කුමක් නිසා, කුමක් අරමුණු කොට, උද්ධ-මාඝාතනික නෙවසඤ්ඤීනාසඤ්ඤීවාද ඇත්තෝ, මරණින් මතු අසංඥත් නො වූ සසංඥත් නො වූ ආත්මයක් අට කරුණෙකින් පණවත් ද? යත්:

82. "ආත්මය රූපවත් වේ, මරණින් මතු නිත්‍ය ය, අසංඥත් නො ම වේ, සසංඥත් නො වේ යැ" යි සමහරු පණවත්. සමහරු "ආත්මය අරූපි වේ, මරණින් මතු නිත්‍ය ය, සසංඥ ද අසංඥ ද නො වේ යැ" යි පණවත්. සමහරු "ආත්මය රූපිත් අරූපිත් වේ, මරණින් මතු නිත්‍ය ය, සසංඥත් අසංඥත් නො ම වේ" යැ යි පණවත්. සමහරු ආත්මය රූපි ම ද අරූපි ම ද නො වේ, මරණින් මතු නිත්‍ය ය, සසංඥ ම ද අසංඥ ම ද නො වේ යැ" යි පණවත්. සමහරු "ආත්මය සසීම (සීමාසහිත) වේ, මරණින් මතු නිත්‍ය ය, සසංඥ ද අසංඥ ද නො ම වේ යැ" යි පණවති. සමහරු "ආත්මය සසීම ද අසීම ද නො වේ, මරණින් මතු නිත්‍ය ය, සසංඥ ද අසංඥ ද නො ම වේ" යැ යි පණවත්. සමහරු "ආත්මය සීමාසහිත මත් නො වේ, සීමා රහිත මත් නො වේ, මරණින් මතු නිත්‍ය ය, සසංඥත් අසංඥත් නො ම වේ" යැ යි පණවත්.

83. මහණෙනි, උද්ධමාඝාතනික නෙවසඤ්ඤීනාසඤ්ඤීවාද ඇති, ඒ මහණබමුණෝ මේ අට කරුණින් මරණින් මතු සසංඥ ද අසංඥ ද නො වූ ආත්මයක් පණවත්. මහණෙනි, යම් මහණබමුණු කෙනෙක් උද්ධමාඝාතනික නෙවසඤ්ඤීනාසඤ්ඤීවාද ඇත්තෝ, මරණින් මතු සංඥ සහිත ම නො වූත් සංඥ රහිත ද නො වූත් ආත්මයක් පණවන්නෝ නම්, ඒ සියල්ලෝ මේ අට කරුණින් ම හෝ මොවුන් අතුරෙන් එක්තරා කරුණෙකින් හෝ එය පණවත්. මෙසින් පිටත්හි කරුණෙක් ඔවුනට නැත.

84. මහණෙනි, ඒ කාරණය... තථාගත තෙමේ දනී. මහණෙනි, යම් කෙනෙක් තථාගත බුදුහුගේ ඇති සැටියෙන් ම වූ ගුණය කියනු කැමැත්තෝ කියන්නාහු නම් . . . මේ ඒ ගැඹුරු වූ දුදීර්ශී වූ . . . කරුණු සි.

85. සන්ති භික්ඛවෙ එකෙ සමණබ්‍රාහ්මණා උච්ඡෙදවාදා සතො සත්තස්ස උච්ඡෙදං විනාසං විභවං පඤ්ඤපෙන්ති සත්තහි වත්ථූහි. කෙ ච භොන්තො සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිමාරබ්භ උච්ඡෙදවාදා සතො සත්තස්ස උච්ඡෙදං විනාසං විභවං පඤ්ඤපෙන්ති සත්තහි වත්ථූහි?

86. ඉධ භික්ඛවෙ එකච්චො සමණො වා බ්‍රාහ්මණො වා එවංවාදී හොති එවංදිට්ඨි: 'යතො ඛො භො අයං අත්තා රූපී චාතුම්මහාභූතිකො මාතාපෙත්තිකසම්භවො කායස්ස භෙදා උච්ඡිජ්ජති විනස්සති. න හොති පරම්මරණා. එත්තාවතා ඛො භො අයං අත්තා සම්මා සමුච්ඡින්නො හොතී' ති. ඉත්ථෙකෙ සතො සත්තස්ස උච්ඡෙදං විනාසං විභවං පඤ්ඤපෙන්ති.

87. තම්කිඤ්ඤ එවමාහ: 'අත්ථි ඛො භො එසා අත්තා යං ත්වං වදෙසි තෙසො නත්ථීති වදාමි. නො ච ඛො භො අයං අත්තා එත්තාවතා සම්මා සමුච්ඡින්නො හොති. අත්ථි ඛො භො අඤ්ඤා අත්තා දිබ්බා රූපී කාමාවචරො කබලීඞ්කාරා[1]හාරභක්ඛා, තං ත්වං න ජානාසි න පස්සසි. තම්හං ජානාමි පස්සාමි. සො ඛො භො අත්තා යතො කායස්ස භෙදා උච්ඡිජ්ජති විනස්සති න හොති පරම්මරණා. එත්තාවතා ඛො භො අයං අත්තා සම්මා සමුච්ඡින්නො හොතී' ති. ඉත්ථෙකෙ සතො සත්තස්ස උච්ඡෙදං විනාසං විභවං පඤ්ඤපෙන්ති.

88. තම්කිඤ්ඤ එවමාහ: 'අත්ථි ඛො භො එසො අත්තා යං ත්වං වදෙසි. න සො නත්ථීති වදාමි. නො ච ඛො භො අයං අත්තා එත්තාවතා සම්මා සමුච්ඡින්නො හොති. අත්ථි ඛො භො අඤ්ඤා අත්තා දිබ්බා රූපී මනොමයො සබ්බඞ්ගපච්චඞ්ගී අහීනින්ද්‍රියො. තං ත්වං න ජානාසි න පස්සසි. තම්හං ජානාමි පස්සාමි. සො ඛො භො අත්තා යතො කායස්ස භෙදා උච්ඡිජ්ජති විනස්සති න හොති පරම්මරණා. එත්තාවතා ඛො භො අයං අත්තා සම්මා සමුච්ඡින්නො හොතී' ති. ඉත්ථෙකෙ සතො සත්තස්ස උච්ඡෙදං විනාසං විභවං පඤ්ඤපෙන්ති.

89. තම්කිඤ්ඤ එවමාහ: 'අත්ථි ඛො භො එසො අත්තා යං ත්වං වදෙසි. තෙසො නත්ථීති වදාමි. නො ච ඛො භො අයං අත්තා එත්තාවතා සම්මා සමුච්ඡින්නො හොති. අත්ථි ඛො භො අඤ්ඤා අත්තා සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා[2] නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසොති ආකාසානඤ්චායතනූපගො. තං ත්වං න ජානාසි න පස්සසි. තම්හං ජානාමි පස්සාමි. සො ඛො භො අත්තා යතො කායස්ස භෙදා උච්ඡිජ්ජති විනස්සති න හොති පරම්මරණා. එත්තාවතා ඛො භො අයං අත්තා සම්මා සමුච්ඡින්නො හොතී' ති. ඉත්ථෙකෙ සතො සත්තස්ස උච්ඡෙදං විනාසං විභවං පඤ්ඤපෙන්ති.

---

1. කබලීකාරාහාර භක්ඛා, මජ්ඣං. 2. අත්ථඞ්ගමා, මජ්ඣං.

85. මහණෙනි, උච්ඡේදදෘෂ්ටික වූ ඇතැම් මහණබමුණු කෙනෙක් ඇත්හ. ඔහු විද්‍යමාන වූ සත්ත්වයාගේ මුල්සුන් වීම, විනාශය, භව විගමය කරුණු සතෙකින් පණවත්. ඒ භවත් මහණබමුණෝ කුමක් නිසා කුමක් අරමුණු කොට උච්ඡේදදෘෂ්ටික වූවෝ ඇති සත්හුගේ සිදීම, වැනැස්ම, නො පැවැත්මට පැමිණීම සත්කරුණෙකින් පණවත් ද? යත්:

86. මහණෙනි, මෙහි ඇතැම් මහණෙක් හෝ බමුණෙක් හෝ මෙබඳු වාද ඇත්තේ මෙබඳු දෘෂ්ටි ඇත්තේ වේ. (කෙසේ ද? යත්:) "පින්වත, යම් හෙයකින් මේ ආත්මභාවය රූපවත් ද, සතර මහා භූතයන්ගෙන් නිපන්නේ වේ ද, මාපියන්ගේ ශුක්‍රශෝණිතයෙන් හටගත්තේ වේ ද, කරජ කය බිඳීමෙන් මරණින් මතු සිදේ ද, වැනැසේ ද, මරණින් මත්තෙහි නො වේ ද, පින්වත, මෙ පමණෙකින් ම මේ ආත්මභාවය මුළු මනින් ම සිඳී ගියේ වේ" යනු යි. මෙසේ සමහරු විද්‍යමාන සත්ත්වයාගේ උච්ඡේදය, විනාශය, භවවිගමය පණවත්.

87. ඔහුට අනෙකෙක් මෙසේ කියයි: "භවත, තා කියන ඒ ආත්මය ඇත්තේ ම ය. එය නැතැ යි නො කියමි. භවත, මේ ආත්මය මෙතෙකින් මුළු මනින් සුන් නො වේ. භවත, රූපී වූ, කාමාවචර දෙවිලෝ සයට ඇතුළත්, කබළීකාර ආහාර වළඳන, දිව්‍ය වූ අන් ආත්මයෙක් ඇත. තෝ එය නො දනී, නො දකී. එය මම දනිමි, දකිමි. භවත, එකී දිව්‍යාත්මය යම් හෙයෙකින් කය බිඳීමෙන් මරණින් මතු සිඳී යන්නේ ද, වැනැසෙන්-නේ ද, මරණින් මතු නො වන්නේ ද, මෙ පමණින් ම මේ ආත්මය මුළු මනින් සුන් වේ" යනු යි. මෙසේ සමහරු විද්‍යමාන වූ සත්ත්වයාගේ උච්ඡේදය, විනාශය, භවවිගමය පණවත්.

88. ඔහුට අනෙකෙක් මෙසේ කියයි: "භවත, තා කියන මේ ආත්මය ඇත්තේ ම ය. මෙය නැතැයි නො කියමි. භවත, මේ ආත්මය මෙතෙකින් මුළු මනින් සුන් නො වෙයි. භවත, රූපී වූ, (ධ්‍යාන) සිතින් උපන්, සියලු අඟපසඟ ඇති, නො පිරිහුණු ඉඳුරන් ඇති, දිව්‍ය වූ අන් ආත්මයෙක් ඇත්තේ ම ය. එය තෝ නො දනී, නො දකී. එය මම දනිමි, දකිමි. භවත, ඒ ආත්මය යම් හෙයෙකින් ඒ කය බිඳීමෙන් සිඳී යේ ද, වැනැසේ ද, මරණින් මතු නො වේ ද, භවත, එතෙකින් ම මේ ආත්මය මුළු මනින් සුන් වූයේ වේ" යනු යි. මෙසේ සමහරු විද්‍යමාන සත්ත්වයාගේ උච්ඡේදය, විනාශය, භවවිගමය පණවත්.

89. ඔහුට අනෙකෙක් මෙසේ කියයි: "භවත, තා කියන මේ ආත්මය ඇත්තේ ම ය. එය නැතැයි නො කියමි. එතෙකුදු වුවත් මේ ආත්මය මෙතෙකින් මුළු මනින් සුන් නො වේ භවත, හැම ලෙසින් ම රූපසංඥ ඉක්මීමෙන්, ප්‍රතිඝසංඥ නිරුද්ධ වීමෙන්, නානාත්වසංඥ නො මෙනෙහි කිරීමෙන්, 'අහස අනන්ත' යැ යි ධ්‍යාන වඩා ආකාශානන්ත්‍යායතන භූමියට පැමිණි අන්‍ය ආත්මයෙක් ඇත. එය තෝ නො දනී, නො දකී. එය මම දනිමි, දකිමි. භවත, එ කී ආත්මය වනාහි ඒ (නාම) කය බිඳීමෙන් සිඳී යේ, වැනැසේ, මරණින් මතු නො වේ" යනු යි. මෙසේ සමහරු විද්‍යමාන වූ සත්ත්වයාගේ උච්ඡේදය, විනාශය, භවවිගමය පණවත්.

90. තම්කිඤ්ඤ එවමාහ: 'අත්ථි ඛො භො එසො අත්තා යං ත්වං වදෙසි. තෙසො නත්ථීති වදාමි. නො ච ඛො භො අයං අත්තා එත්තාවතා සම්මා සමුච්ඡින්නො හොති. අත්ථි ඛො භො අඤ්ඤො අත්තා සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනූපගො. තං ත්වං න ජානාසි න පස්සසි. තම්හං ජානාමි පස්සාමි. සො ඛො භො අත්තා යතො කායස්ස භෙදා උච්ඡිජ්ජති විනස්සති න හොති පරම්මරණා. එත්තාවතා ඛො භො අයං අත්තා සම්මා සමුච්ඡින්නො හොතී'ති. ඉත්ථෙකෙ සතො සත්තස්ස උච්ඡෙදං විනාසං විභවං පඤ්ඤපෙන්ති.

91. තම්කිඤ්ඤ එවමාහ: 'අත්ථි ඛො භො එසො අත්තා යං ත්වං වදෙසි. න සො නත්ථීති වදාමි. නො ච ඛො භො අයං අත්තා එත්තාවතා සම්මා සමුච්ඡින්නො හොති. අත්ථි ඛො භො අඤ්ඤො අත්තා සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනූපගො තං ත්වං න ජානාසි න පස්සසි. තම්හං ජානාමි පස්සාමි. සො ඛො භො අත්තා යතො කායස්ස භෙදා උච්ඡිජ්ජති විනස්සති න හොති පරම්මරණා. එත්තාවතා ඛො භො අයං අත්තා සම්මා සමුච්ඡින්නො හොතී'ති. ඉත්ථෙකෙ සතො සත්තස්ස උච්ඡෙදං විනාසං විභවං පඤ්ඤපෙන්ති.

92. තම්කිඤ්ඤ එවමාහ: 'අත්ථි ඛො භො එසො අත්තා යං ත්වං වදෙසි. නෙසො නත්ථීති වදාමි. නො ච ඛො භො අයං අත්තා එත්තාවතා සම්මා සමුච්ඡින්නො හොති. අත්ථි ඛො භො අඤ්ඤො අත්තා සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම සන්ත

්මතං පණීතමෙතන්ති නෙවසඤ්ඤානාසඤ්ඤායතනූපගො. තං ත්වං න ජානාසි න පස්සසි. තම්හං ජානාමි පස්සාමි. සො ඛො භො අත්තා යතො කායස්ස භෙදා උච්ඡිජ්ජති විනස්සති න හොති පරම්මරණා. එත්තාවතා ඛො භො අයං අත්තා සම්මා සමුච්ඡින්නො හොතී'ති. ඉත්ථෙකෙ සතො සත්තස්ස උච්ඡෙදං විනාසං විභවං පඤ්ඤපෙන්ති.

93. ඉමෙහි ඛො තෙ භික්ඛවෙ සමණබ්‍රාහ්මණා උච්ඡෙදවාදා සතො සත්තස්ස උච්ඡෙදං විනාසං විභවං පඤ්ඤපෙන්ති සත්තහි වත්ථූහි. යෙ හි කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා උච්ඡෙදවාදා සතො සත්තස්ස උච්ඡෙදං විනාසං විභවං පඤ්ඤපෙන්ති, සබ්බෙ තෙ ඉමෙහෙව සත්තහි වත්ථූහි, එතෙසං වා අඤ්ඤතරෙන. නත්ථි ඉතො බහිද්ධා.

94. තයිදං භික්ඛවෙ තථාගතො පජානාති -පෙ- යෙහි තථාගතස්ස යථාභූතවණ්ණං සම්මා වදමානා වදෙය්‍යුං.

95. සන්ති භික්ඛවෙ එකෙ සමණබ්‍රාහ්මණා දිට්ඨධම්මනිබ්බානවාදා සතො සත්තස්ස පරම්දිට්ඨධම්මනිබ්බානං පඤ්ඤපෙන්ති පඤ්චහි වත්ථූහි. කතමෙ ච භොන්තො සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිමාරබ්භ දිට්ඨධම්මනිබ්බානවාදා සතො සත්තස්ස පරම්දිට්ඨධම්මනිබ්බානං පඤ්ඤපෙන්ති පඤ්චහි වත්ථූහි?

90. ඔහුට අනෙකෙක් මෙසේ කියයි: "භවත, තා කියන මේ ආත්මය ඇත්තේ ම ය, එය නැත්තේ යැ යි නො කියමි. භවත, එතෙකුදු වුවත් මේ ආත්මය මෙතෙකින් මුල්සුන් නො වෙයි. භවත, හැම ලෙසින් ම අනන්ත ආකාශ අරමුණ ඉක්මැ 'විඥානය අනන්තයැ' යි සමාධි වඩා විඥානාන්ත්‍යායතනභූමියට පැමිණැ සිටින අන් ආත්මයෙක් ඇත. තෝ එය නො දනී, නො දකී. එය මම දනිමි, දකිමි. භවත, එකී ආත්මය යම් හෙයකින් ඒ (නාම) කය බිඳී යැමෙන් මුල් සිඳී ගේ ද, වැනැසේ ද, මරණින් මත්තෙහි නො වේ ද, භවත, මෙතෙකින් මේ ආත්මය මුළුමනින් සුන් වේ" යනු යි. මෙසේ සමහරු විද්‍යමාන සත්ත්වයාගේ උච්ඡේදය, විනාශය, භවවිගමය පණවත්.

91. ඔහුට අනෙකෙක් මෙසේ කියයි: "භවත, තා කියන ඒ ආත්මය ඇත්තේ ම ය, එය නැත්තේ යැ"යි නො කියමි. "භවත එතෙකුදු වුවත් ඒ ආත්මය මෙතෙකින් මුළුමනින් සුන් නො වේ. භවත, හැම ලෙසින් විඥානාන්ත්‍යායතනය ඉක්මැ, 'කිසිත් නැතැ'යි සමාධි වඩා ආකිඤ්චන්‍යා-යතනභූමියට පැමිණ සිටින අන්‍ය ආත්මයෙක් ඇත. එය තෝ නො දනී, නො දකී. එය මම දනිමි, දකිමි. භවත, ඒ ආත්මය ඒ නාම කය බිඳීමෙන් සිඳෙන බැවින්, වැනැසෙන බැවින්, මරණින් මත්තෙහි නො වන බැවින් භවත, මෙතෙකින් මේ ආත්මය මුළුමනින් සුන් වේ" යනු යි. මෙසේ සමහරු විද්‍යමාන සත්ත්වයාගේ උච්ඡේදය, විනාශය, භවවිගමය පණවත්.

92. ඔහුට අනෙකෙක් මෙසේ කියයි: "භවත, තා කියන ඒ ආත්මය ඇත්තේ ම ය. එය නැතැයි නො කියමි. වැලි දු භවත, මේ ආත්මය මෙතෙකින් මුළුමනින් සුන් නො වේ. භවත, හැම පරිද්දෙන් ආකිංචන්‍යා-යතනය ඉක්මැ, 'මෙය ශාන්තය, මෙය උතුමැ' යි සමාධි වඩා නෙවසංඥා-නාසංඥභූමියට පැමිණ සිටින අන්‍ය වූ ආත්මයෙක් ඇත්තේ ම ය. එය තෝ නො දනී, නො දකී. එය මම දනිමි, දකිමි. භවත, ඒ ආත්මය ඒ නාම කය බිඳීමෙන් සිඳී යන බැවින්, වැනැසෙන බැවින්, මරණින් මත්තෙහි නො වන බැවින් මෙතෙකින් ම, භවත, මේ ආත්මය මුළුමනින් සුන් වේ" යනු යි. මෙසේ සමහරු විද්‍යමාන සත්ත්වයාගේ උච්ඡේදය, විනාශය, භවවිගමය පණවත්.

93. මහණෙනි, ඒ මහණබමුණෝ උච්ඡේදදෘෂ්ටි ඇත්තෝ මේ කරුණු සතෙකින් විද්‍යමාන සත්ත්වයා ගේ උච්ඡේදය, විනාශය, භවවිගමය පණවත්. මහණෙනි, යම් උච්ඡේදදෘෂ්ටික මහණබමුණු කෙනෙක් විද්‍යමාන සත්ත්වයාගේ උච්ඡේදය, විනාශය, විභවය පණවත් නම් ඒ සියල්ලෝ මේ කරුණු සතින් ම හෝ මොවුනතුරෙන් එක්තරා කරුණෙකින් හෝ එය පණවත්. මෙයින් පිටත කරුණෙක් ඔවුනට නැත.

94. මහණෙනි, ඒ කාරණය තථාගත තෙමේ දනී . . . තථාගත බුදුහුගේ ඇති පරිදි වූ ම ගුණ කියනු කැමැත්තෝ කියන්නාහු නම්, මේ ඒ ගැඹුරු වූ දුර්දර්ශ වූ . . . කරුණු යි.

95. මහණෙනි, දෘෂ්ටධර්මනිර්වාණදෘෂ්ටි ගත් සමහර මහණබමුණු කෙනෙක් ඇත්හ. ඔහු විද්‍යමාන සත්ත්වයාගේ පරමදෘෂ්ටධර්මනිර්වාණය කරුණු පසෙකින් පණවත්. ඒ භවත් මහණ බමුණෝ කුමක් නිසා කුමක් ඇරැබැ දෘෂ්ටධර්මනිර්වාණදෘෂ්ටි ගත්තෝ විද්‍යමාන සත්ත්වයා ගේ පරමදෘෂ්ටධර්මනිර්වාණය කරුණු පසෙකින් පණවත් ද? යත්:

96. ඉධ භික්ඛවෙ එකච්චො සමණො වා බ්‍රාහ්මණො වා එවංවාදී හොති එවංදිට්ඨි 'යතො ඛො හො අයං අත්තා පඤ්චහි කාමගුණෙහි සමප්පිතො සමඞ්ගීභූතො පරිචාරෙති, එත්තාවතා ඛො හො අයං අත්තා පරමදිට්ඨධම්මනිබ්බානං පත්තො හොතී'ති. ඉත්ථෙකෙ සතො සත්තස්ස පරමදිට්ඨධම්මනිබ්බානං පඤ්ඤපෙන්ති.

97 තත්‍රඤ්ඤ එවමාහ: 'අත්ථි ඛො හො එසො අත්තා යං ත්වං වදෙසි. තෙසො නත්ථීති වදාමි. නො ච ඛො හො අයං අත්තා එත්තාවතා පරමදිට්ඨධම්මනිබ්බානං පත්තො හොති. තං කිස්ස හෙතු? කාමා හි හො අනිච්චා දුක්ඛා විපරිණාමධම්මා තෙසං විපරිණාමඤ්ඤථාභාවා උප්පජ්ජන්ති සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා යතො ඛො හො අයං අත්තා විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති, එත්තාවතා ඛො හො අයං අත්තා පරමදිට්ඨධම්මනිබ්බානං පත්තො හොතී'ති. ඉත්ථෙකෙ සතො සත්තස්ස පරමදිට්ඨධම්ම නිබ්බානං පඤ්ඤපෙන්ති.

98. තත්‍රඤ්ඤ එවමාහ: 'අත්ථි ඛො හො එසො අත්තා යං ත්වං වදෙසි. තෙසො නත්ථීති වදාමි. නො ච ඛො හො අයං අත්තා එත්තාවතා පරමදිට්ඨධම්මනිබ්බානං පත්තො හොති. තං කිස්ස හෙතු? යදෙව තත්ථ විතක්කිතං විචාරිතං එතෙනෙතං ඔළාරිකං අක්ඛායති. යතො ඛො හො අයං අත්තා විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති, එත්තාවතා ඛො හො අයං අත්තා පරමදිට්ඨධම්ම-නිබ්බානං පත්තො හොතී'ති. ඉත්ථෙකෙ සතො සත්තස්ස පරමදිට්ඨධම්ම-නිබ්බානං පඤ්ඤපෙන්ති.

99. තත්‍රඤ්ඤ එවමාහ: 'අත්ථි ඛො හො එසො අත්තා යං ත්වං වදෙසි. තෙසො නත්ථීති වදාමි. නො ච ඛො හො අයං අත්තා එත්තාවතා පරමදිට්ඨධම්මනිබ්බානං පත්තො හොති. තං කිස්ස හෙතු? යදෙව තත්ථ පීතිගතං චෙතසො උබ්බිල්ලාවිතත්තං එතෙනෙතං ඔළාරිකං අක්ඛායති. යතො ඛො හො අයං අත්තා පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති සතො ච සම්පජානො සුඛං ච කායෙන පටිසංවෙදෙති, යන්තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති තං තතියං ඣානං උපසම්පජ්ජ විහරති, එත්තාවතා ඛො හො අයං අත්තා පරමදිට්ඨධම්මනිබ්බානං පත්තො හොතී'ති. ඉත්ථෙකෙ සතො සත්තස්ස පරමදිට්ඨධම්ම නිබ්බානං පඤ්ඤපෙන්ති.

96. මහණෙනි, මෙහි එක්තරා මහණෙක් හෝ බමුණෙක් හෝ මෙබඳු වාද ඇත්තේ මෙබඳු දෘෂ්ටි ඇත්තේ වෙයි. (කෙසේ ද? යත්:) "භවත, යම් හෙයකින් මේ ආත්මය පස්කම්කොටසින් සමර්පිත වැ (මොනොවට පිහිටා, ඇලී), සමන්විත වැ ඉඳුරන් පිණවා ද, භවත, මෙතෙකින් ම මේ ආත්මය පරමදෘෂ්ටධර්මනිර්වාණය ලැබුයේ වෙයි" යනු යි. මෙසේ සමහරු විද්‍යමාන සත්ත්වයා පිළිබඳ පරමදෘෂ්ටධර්මනිර්වාණය පණවත්.

97. ඔහුට අනෙකෙක් මෙසේ කියයි: "භවත, තා කියන මේ ආත්මය ඇත්තේ ම ය. එය නැතැ යි නො කියමි. එතෙකුදු වුවත්, භවත, එය මෙතෙකින් පරමදෘෂ්ටධර්මනිර්වාණයට පැමිණියේ නො වෙයි. ඒ කවර හෙයින ? යත්: භවත, පස්කම්හු වූ කලි අනිත්‍ය හ, දුක් හ, පෙරැලෙන සුලු හ. ඔවුන් ගේ පෙරැළීමෙන්, අත් පිරිද්දෙකින් වීමෙන් හෝ හැඹුම් වැළැපුම්, දුක් දෙම්නස්, සිත තුළැ දැඩි පෙළුම් උපදී. භවත, යම් විටෙක මේ ආත්මය කාමයන්ගෙන් වෙන් ව ම අකුසල් දහමුන්ගෙන් වෙන් ව ම, විතර්කසහිත විචාරසහිත, විවේකයෙන් උපන් ප්‍රීතියත් සුවයත් ඇති ප්‍රථමධ්‍යානය ලැබ වෙසේ ද, භවත, මෙ පමණෙකින් ම මේ ආත්මය පරමදෘෂ්ටධර්මනිර්වාණය ලැබුයේ වේ" යනු යි. මෙසේ සමහරු විද්‍යමාන සත්ත්වයාගේ පරමදෘෂ්ටධර්මනිර්වාණය පණවත්.

98. ඔහුට අනෙකෙක් මෙසේ කියයි: "භවත, තා කියන මේ ආත්මය ඇත්තේ ම ය. මෙය නැතැ යි නො කියමි. එතෙකුදු වුවත්, භවත, මේ ආත්මය මෙතෙකින් පරමදෘෂ්ටධර්මනිර්වාණය ලැබුයේ නො වෙයි. ඒ කවර හෙයින ? යත්: යම් බඳු වූ ම විතර්කයෙක් විචාරයෙක් වේ ද, එයින් මෙය ඖදාරික වැ වැටැහෙයි. එහෙත් යම් විටෙක මේ ආත්මය විතර්කවිචාරයන්ගේ සංසිඳීමෙන් සිය සිත්සතන් වෙසෙයින් පහදවන, සිතැ එකඟ බව ඇති, විතර්ක රහිත, විචාර රහිත, සමාධියෙන් උපන් ප්‍රීතිය හා සුවය ඇති දෙවෙනි ධ්‍යානය ලැබ වෙසේ ද, භවත, මෙ පමණකින් මේ ආත්මය පරමදෘෂ්ටධර්මනිර්වාණය ලැබුයේ වේ" යනු යි. මෙසේ සමහරු විද්‍යමාන සත්ත්වයාගේ පරමදෘෂ්ටධර්මනිර්වාණය පණවත්.

99. ඔහුට අනෙකෙක් මෙසේ කියයි: "භවත, තා කියන මේ ආත්මය ඇත්තේ ම ය. එය නැත්තේ නො වේ. භවත, එතෙකුදු වුවත් මේ ආත්මය මෙතෙකින් පරමදෘෂ්ටධර්මනිර්වාණය ලැබුයේ නො වේ. ඒ කවර හෙයින ? යත්: එහි යම් ප්‍රීතියෙක් සිතේ ඉල්පුණු බවෙක් වේ ද, මෙයින් මේ දෙවෙනි ධ්‍යානය ඖදාරික වැ (දළ වැ) වැටැහෙයි. භවත, යම් විටෙක වනාහි මේ ආත්මය ප්‍රීතියෙනුත් වෙන් වීමෙන් උපේක්ෂාව ඇත්තෙක් ද වී, සිහි ද ඇත්තේ, නුවණින් දක්නේ වෙසේ ද, සුවයත් තම කයින් විඳී ද, ආර්‍යයෝ යමක් හේතු කොට ගෙන ඔහුට 'මේ තෙමේ උපේක්ෂා ඇත්තේ ය. සිහි ඇත්තේ ය. සුවවිහරී ඇත්තේ යැ' යි කියත් නම්, ඒ තුන්වන ධ්‍යානය ලැබ වෙසේ ද, භවත, මෙතෙකින් ම මේ ආත්මය පරම දෘෂ්ටධර්මනිර්වාණය ලැබුයේ වේ" යනු යි. මෙසේ සමහරු විද්‍යමාන සත්ත්වයාගේ පරමදෘෂ්ටධර්මනිර්වාණය පණවත්.

100. තමයේඤ්ඤ එවමාහ: 'අත්ථි ඛො හො එසො අත්තා, යං ත්වං වදෙසි, නෙසො නත්ථීති වදාමි. තො ච ඛො හො අයං අත්තා එත්තාවතා පරමදිට්ඨධම්මනිබ්බානං පත්තො හොති. තං කිස්ස හෙතු? යදෙව තත්ථ සුඛමිති චෙතසො ආභොගො එතෙතෙතං ඔළාරිකං අක්ඛායති. යතො ඛො හො අයං අත්තා සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථගමා[1] අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති, එත්තාවතා ඛො හො අයං අත්තා පරමදිට්ඨධම්මනිබ්බානං පත්තො හොතී'ති. ඉත්ථෙකෙ සතො සත්තස්ස පරමදිට්ඨධම්මනිබ්බානං පඤ්ඤපෙන්ති.

101. ඉමෙහි ඛො තෙ භික්ඛවෙ සමණබ්‍රාහ්මණා දිට්ඨධම්මනිබ්බානවාදා සතො සත්තස්ස පරමදිට්ඨධම්ම නිබ්බානං පඤ්ඤපෙන්ති පඤ්චහි වත්ථූහි. යෙ හි කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා දිට්ඨධම්ම නිබ්බානවාදා සතො සත්තස්ස පරමදිට්ඨධම්මනිබ්බානං පඤ්ඤපෙන්ති, සබ්බෙ තෙ ඉමෙහෙව පඤ්චහි වත්ථූහි, එතෙසං වා අඤ්ඤතරෙන. නත්ථි ඉතො බහිද්ධා.

102. තයිදං භික්ඛවෙ තථාගතො පජානාති -පෙ- යෙහි තථාගතස්ස යථාභූතං වණ්ණං සම්මා වදමානා වදෙය්‍යුං.

103. ඉමෙහි ඛො තෙ භික්ඛවෙ සමණබ්‍රාහ්මණා අපරන්තකප්පිකා අපරන්තානුදිට්ඨිනො අපරන්තං ආරබ්භ අනෙකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති චතුවත්තාරීසාය වත්ථූහි. යෙ හි කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා අපරන්තකප්පිකා අපරන්තානුදිට්ඨිනො අපරන්තං ආරබ්භ අනෙකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති, සබ්බෙ තෙ ඉමෙහෙව චතුවත්තාරීසාය වත්ථූහි, එතෙසං වා අඤ්ඤතරෙන. නත්ථි ඉතො බහිද්ධා.

104. තයිදං භික්ඛවෙ තථාගතො පජානාති -පෙ- යෙහි තථාගතස්ස යථාභූතං වණ්ණං සම්මා වදමානා වදෙය්‍යුං.

105. ඉමෙහි ඛො තෙ භික්ඛවෙ සමණබ්‍රාහ්මණා පුබ්බන්තකප්පිකා ච අපරන්තකප්පිකා ච පුබ්බන්තාපරන්තකප්පිකා ච පුබ්බන්තාපරන්තානු-දිට්ඨිනො පුබ්බන්තාපරන්තං ආරබ්භ අනෙකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති ඨානසතීයා වත්ථූහි. යෙ හි කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා පුබ්බන්තකප්පිකා ච අපරන්තකප්පිකා ච පුබ්බන්තාපරන්තකප්පිකා ච පුබ්බන්තාපරන්තානුදිට්ඨිනො පුබ්බන්තාපරන්තං ආරබ්භ අනෙකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති, සබ්බෙ තෙ ඉමෙහෙව ඨානසතීයා වත්ථූහි, එතෙසං වා අඤ්ඤතරෙන. නත්ථි ඉතො බහිද්ධා.

---

1. අත්ථඞ්ගමා. සොතුම් පොත්ථකෙසු.

100. ඔහුට අනෙකෙක් මෙසේ කියයි: "භවත, තා කියන මේ ආත්මය ඇත්තේ ම ය. මෙය නැතැ යි නො කියමි. එහෙත්, භවත, මේ ආත්මය මෙතෙකින් පරමදෘෂ්ටධර්මනිර්වාණය ලැබුයේ නො වේ. ඒ කවර හෙයින ? යත්: එහි 'සුව' යැ යි (ධ්‍යානයන් නැගී සිටියහුගේ ඒ සුවයෙහි) සිතේ නැමුණුබවෙක් වේ ද, මෙයින් මේ ධ්‍යානය ඔදරික වැ (දළ වැ) වැටැහේ. භවත, යම් විවෙක වනාහි මේ ආත්මය සුඛයාගේ ද ප්‍රහාණයත් දුඃඛයාගේ ද ප්‍රහාණයෙන්, පළමුවෙන් ම (කලින් ම) සොම්නස් දෙම්නස් දුරු වී යෑමෙන්, දුක් නැති සුව නැති උපේක්ෂාසමාධි දෙකේ පිරිසිදුබව ඇති, සිවුවන ධ්‍යානය ලැබ වෙසේ ද, භවත, මෙතෙකින් ම මේ ආත්මය පරමදෘෂ්ටධර්මනිර්වාණය ලැබුයේ වේ" යනු යි. මෙසේ සමහරු විද්‍යමාන සත්ත්වයාගේ පරමදෘෂ්ටධර්ම නිර්වාණය පණවත්.

101. මහණෙනි, ඒ මහණබමුණෝ දෘෂ්ටධර්මනිර්වාණවාද ඇත්තෝ මේ කරුණු පසින් විද්‍යමාන සත්ත්වයාගේ පරමදෘෂ්ටධර්මනිර්වාණය පණවත්.

මහණෙනි, යම් මහණකෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ දෘෂ්ටධර්ම-නිර්වාණවාද ඇත්තෝ විද්‍යමාන සත්ත්වයාගේ පරමදෘෂ්ටධර්මනිර්වාණය පණවත් නම්, ඒ සියල්ලෝ මේ කරුණු පසින් ම හෝ මොවුනතුරෙන් එක්තරා කරුණෙකින් හෝ එය පණවත්. මෙයින් පිටත්හි කරුණෙක් ඔවුනට නැත.

102. මහණෙනි, . . . ඒ කරුණ තථාගත තෙමේ දනී . . . යම් කෙනෙක් තථාගත බුදුහුගේ ඇති පරිදි වූ ගුණ මොනොවට කියනු කැමැත්තෝ කියන්නාහු නම්, මේ ඒ ගම්භීර වූ දුර්දර්ශ වූ . . . කරුණු යි.

103. මහණෙනි, ඒ මහණබමුණෝ අපරාන්තකල්පික වූවෝ (තෘෂ්ණාදෘෂ්ටි වශයෙන් අනාගත සකඛි කොටස කල්පනා කොට ගත් ලබ්ධි ඇත්තෝ), අපරාන්තය (අනාගත සකඛි කොටස) අනුව ඇති කැරැ ගත් දෘෂ්ටි ඇත්තෝ මේ කරුණු සුසාලිසෙකින් අනාගත සකඛි කොටස අරමුණු කොට අනේකවිධ අධ්‍යුක්තිපද (දර්ශනවාදප්‍රකාශක වචන) කියත්. මහණෙනි, යම් මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ අපරාන්තකල්පික වූවෝ අපරාන්තානුදෘෂ්ටික වූවෝ අපරාන්තය (අනාගත සකඛි කොටස) අරමුණු කොට දර්ශනවාදප්‍රකාශක වචන කියත් නම්, ඔහු හැම මේ කරුණු සුසාලිසෙන් ම හෝ මොවුනතුරෙන් එක්තරා කරුණෙකින් හෝ එසේ කියත්. මෙයින් පිටත්හි කරුණෙක් ඔවුනට නැත.

104. මහණෙනි, එය තථාගත තෙමේ දනී . . . යම් කෙනෙක් තථාගත බුදුහුගේ ඇති පරිදි වූ ම ගුණ කියනු කැමැත්තෝ කියන්නාහු නම්, මේ ඒ ගැඹුරු වූ දුක සේ දැක්ක යුතු වූ . . . කරුණු යි.

105. මහණෙනි, පූර්වාන්තකල්පික වූ ද අපරාන්තකල්පික වූ ද ඒ මහණබමුණෝ අතීත සකඛි පරම්පරා කොටස ද අනාගත සකඛි පරම්පරා කොටස ද අරමුණු කොට මේ කරුණු දෙසැටින් අනේකවිධ දෘෂ්ටිප්‍රකාශක වචන (දෘෂ්ටිවාද හඟවන වචන) කියා පාත්. මහණෙනි, පූර්වාන්තකල්පික ද අපරාන්තකල්පික ද පූර්වාන්තාපරාන්තකල්පික ද පූර්වාන්තාපරාන්තානුදෘෂ්ටික ද වූ යම් මහණබමුණුකෙනෙක් පූර්වාන්ත අපරාන්ත දෙක අරමුණු කොට අනේකවිධ දෘෂ්ටිප්‍රකාශක වචන කියා පාත් නම්, ඒ සියල්ලෝ මේ දෙසැට කරුණින් ම හෝ මොවුනතුරෙන් එක්තරා කරුණෙකින් හෝ එය කියා පාත්. මෙයින් බැහැරැ වූ කරුණෙක් ඔවුනට නැත.

106. තයිදං භික්ඛවෙ තථාගතො පජානාති: ඉමෙ දිට්ඨිට්ඨානා එවං ආගතා එවං පරාමට්ඨා එවංගතිකා භවිස්සන්ති එවංඅභිසම්පරායා'ති. තඤ්ච තථාගතො පජානාති තතො ච උත්තරිතරං පජානාති. තඤ්ච පජානනං න පරාමසති. අපරාමසතො චස්ස පච්චත්තඤ්ඤෙව නිබ්බුති විදිතා. වෙදනානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං විදිත්වා අනුපාදාවිමුත්තො භික්ඛවෙ තථාගතො.

107. ඉමෙ ඛො තෙ භික්ඛවෙ ධම්මා ගම්භීරා දුද්දසා දුරනුබොධා සන්තා පණීතා අතක්කාවචරා නිපුණා පණ්ඩිතවෙදනීයා, යෙ තථාගතො සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති, යෙහි තථාගතස්ස යථාභූතවණ්ණං සම්මා වදමානා වදෙය්‍යුං.

108. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා සස්සතවාදා සස්සතං අත්තානඤ්ච ලොකඤ්ච පඤ්ඤපෙන්ති වත්තුභි වත්ථුභි, තදපි තෙසං භවතං සමණබ්‍රාහ්මණානං අජානතං අපස්සතං වෙදයිතං තණ්හාගතානං පරිතස්සිතවිප්ඵන්දිතමෙව

109. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා එකච්චසස්සතිකා එකච්චඅසස්සතිකා එකච්චං සස්සතං එකච්චං අසස්සතං අත්තානඤ්ච ලොකඤ්ච පඤ්ඤපෙන්ති වත්තුභි වත්ථුභි, තදපි තෙසං භවතං සමණබ්‍රාහ්මණානං අජානතං අපස්සතං වෙදයිතං තණ්හාගතානං පරිතස්සිතවිප්ඵන්දිතමෙව.

110. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා අන්තානන්තිකා අන්තානන්තං ලොකස්ස පඤ්ඤපෙන්ති වත්තුභි වත්ථුභි, තදපි තෙසං භවතං සමණබ්‍රාහ්මණානං අජානතං අපස්සතං වෙදයිතං තණ්හාගතානං පරිතස්සිතවිප්ඵන්දිතමෙව.

111. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා අමරාවික්ඛෙපිකා තත්ථ[1] තත්ථ පඤ්හං පුට්ඨා සමානා වාචාවික්ඛෙපං ආපජ්ජන්ති අමරාවික්ඛෙපං වත්තුභි වත්ථුභි, තදපි තෙසං භවතං සමණබ්‍රාහ්මණානං අජානතං අපස්සතං වෙදයිතං තණ්හාගතානං පරිතස්සිතවිප්ඵන්දිතමෙව.

1. තත්‍ර තත්‍ර. සෙසුපි පොත්ථකෙසු

106. මහණෙනි. 'මේ දෘෂ්ටිස්ථානයෝ මෙසේ ගන්නා ලද්දේ මෙසේ පරාමෘෂ්ට වූවෝ මෙ බඳු (පරලොවැ) ගති ඇතියෝ වන්නාහ. මෙ බඳු පරලොව් ඇතියෝ වන්නා හැ' යි මේ කාරණය තථාගත තෙමේ දනී. එය ද තථාගත තෙමේ දනී. එයින් වැඩි දෑ ද දනී. ඒ දැන්ම ද තෘෂ්ණාදෘෂ්ටිවශයෙන් පරාමර්ශනය නො කෙරෙයි. එසේ පරාමර්ශනය නොකරන ඔහු විසින් පරෝපදේශ රහිත වැ තමා කෙරෙහි ම නිර්වාණය දන්නා ලද්දේ ය. වේදනාවන්ගේ ඉපැද්ම ද වැනැස්ම ද රසය ද දෙස ද නික්මුම ද තතු වූ පරිදි දැන තථාගත තෙමේ උපාදාන රහිත වැ මිදුණේ වේ.

107. මහණෙනි, තථාගත තෙමේ යම් දහම් කෙනෙකුන් තෙමේ ම වෙසෙසා දැන පසක් කොට ලොවට පවසා ද, යම් දහම් කෙනෙකුන් කරණ කොට ගෙන තථාගත බුදුහුගේ ඇති පරිදි ම වූ ගුණ මොනොවට කියනු කැමතියෝ කියන්නාහු ද, මොහු වනාහි ගැඹුරු වූ, දුක සේ දැක්ක යුතු වූ, දුක සේ අනුබොධ කට යුතු වූ, ශාන්ත වූ, ප්‍රණීත වූ, තර්කයෙන් බැසැ ගත නො හෙන, සියුම් වූ, නුවණැත්තන් විසින් දත යුතු වූ ඒ ධර්මයෝ ය.

108. මහණෙනි, එහි (ඒ දෘෂ්ටිවාදීන් අතුරෙහි) යම් මහණ බමුණු කෙනෙක් ශාශ්වතවාද ඇත්තෝ කරුණු සතරෙකින් ආත්මය ද ලෝකය ද ශාශ්වත කොට පණවත් නම්, එය ද තතු නොදන්නා නොදක්නා ඒ භවත් මහණබමුණන්ගේ පිඳීමෙක්, තෘෂ්ණාවට පැමිණි (තෘෂ්ණායෙන් සමන්විත) ඒ දෘෂ්ටිගතිකයන්ගේ (දෘෂ්ටිතෘෂ්ණා හුලින් විදුනා ලද බැවින් වූ) පරිත්‍රාසයෙක්, චංචල බවෙක් ම ය.

109. මහණෙනි, එහි ඒකත්‍යශාශ්වතික ද ඒකත්‍යඅශාශ්වතික ද වූ යම් මහණබමුණු කෙනෙක් කරුණු සතරෙකින් ආත්මය ද ලෝකය ද එක් කොටසක් ශාශ්වතත් එක් කොටසක් අශාශ්වතත් කොට පණවත් නම්, එය ද (එහි තතු) නොදන්නා නොදක්නා ඒ භවත් මහණබමුණන්ගේ පිඳීමෙක්, තෘෂ්ණාවට පැමිණි ඔවුන්ගේ පරිත්‍රාසයෙක්, සැලීමෙක් ම ය.

110. මහණෙනි, එහි යම් මහණ බමුණු කෙනෙක් තුමූ අනන්තානන්තික වාද ඇත්තෝ ලොව අනන්තවත් බව හෝ අනන්තබව සතර කරුණෙකින් පණවත් ද, එය ද එහි තතු නොදන්නා නොදක්නා ඒ භවත් මහණබමුණන්ගේ වේදනාවෙක්, තෘෂ්ණාවට පැමිණි ඔවුන්ගේ පරිත්‍රාසයෙක්, සැලෙනබවෙක් ම ය.

111. මහණෙනි, එහි යම් මහණබමුණු කෙනෙක් අමරාවික්ෂේපක වාද ඇත්තෝ ඒ ඒ කරුණෙහි ප්‍රශ්න විචාරන ලදුවෝ සතර කරුණෙකින් වාග්වික්ෂේපයට අමරාවික්ෂේපයට පැමිණෙත් ද, එයත් එහි තතු නොදන්නා නොදක්නා ඒ භවත් මහණබමුණන්ගේ පිඳීමෙක්, තෘෂ්ණාගත වූ ඔවුන්ගේ පරිත්‍රාසයෙක්, චංචලතාවෙක් ම ය.

112. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා අතීච්චසමුප්පන්නිකා අතීච්චසමුප්පන්නං අත්තානඤ්ච ලොකඤ්ච පඤ්ඤපෙන්ති දීඝෙහි වත්තුහි, තදපි තෙසං භවතං සමණබ්‍රාහ්මණානං අජානතං අපස්සතං වෙදයිතං, තණ්හාගතානං පරිතසිතවිප්ඵන්දිතමෙව.

113. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා පුබ්බන්තකප්පිකා පුබ්බන්තානුදිට්ඨිනො පුබ්බන්තං අරබ්භ අනෙකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති අට්ඨාරසහි වත්තුහි, තදපි තෙසං භවතං සමණබ්‍රාහ්මණානං අජානතං අපස්සතං වෙදයිතං, තණ්හාගතානං පරිතසිතවිප්ඵන්දිතමෙව.

114. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා උද්ධමාඝාතනිකා සඤ්ඤීවාදා උද්ධමාඝාතනා සඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති සොළසහි වත්තුහි, තදපි තෙසං භවතං සමණබ්‍රාහ්මණානං අජානතං අපස්සතං වෙදයිතං, තණ්හාගතානං පරිතසිතවිප්ඵන්දිතමෙව.

115. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා උද්ධමාඝාතනිකා අසඤ්ඤීවාදා උද්ධමාඝාතනා අසඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අට්ඨහි වත්තුහි, තදපි තෙසං භවතං සමණබ්‍රාහ්මණානං අජානතං අපස්සතං වෙදයිතං, තණ්හාගතානං පරිතසිතවිප්ඵන්දිතමෙව.

116. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා උද්ධමාඝාතනිකා නෙවසඤ්ඤීනාසඤ්ඤීවාදා උද්ධමාඝාතනා නෙවසඤ්ඤිං නාසඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අට්ඨහි වත්තුහි, තදපි තෙසං භවතං සමණබ්‍රාහ්මණානං අජානතං අපස්සතං වෙදයිතං, තණ්හාගතානං පරිතසිතවිප්ඵන්දිතමෙව.

117. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා උච්ඡෙදවාදා සතො සත්තස්ස උච්ඡෙදං විනාසං විභවං පඤ්ඤපෙන්ති සත්තහි වත්තුහි, තදපි තෙසං භවතං සමණබ්‍රාහ්මණානං අජානතං අපස්සතං වෙදයිතං, තණ්හාගතානං පරිතසිතවිප්ඵන්දිතමෙව.

118. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා දිට්ඨධම්මනිබ්බානවාදා සතො සත්තස්ස පරමදිට්ඨධම්මනිබ්බානං පඤ්ඤපෙන්ති පඤ්චහි වත්තුහි, තදපි තෙසං භවතං සමණබ්‍රාහ්මණානං අජානතං අපස්සතං වෙදයිතං, තණ්හාගතානං පරිතසිතවිප්ඵන්දිතමෙව.

119. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා අපරන්තකප්පිකා අපරන්තානුදිට්ඨිනො අපරන්තං ආරබ්භ අනෙකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති චතුවත්තාරීසාය වත්තුහි, තදපි තෙසං භවතං සමණබ්‍රාහ්මණානං අජානතං අපස්සතං වෙදයිතං, තණ්හාගතානං පරිතසිතවිප්ඵන්දිතමෙව.

112. මහණෙනි, එහි යම් මහණ බමුණු කෙනෙක් අධිච්චසමුප්පන්න වාද ඇත්තෝ ආත්මයත් ලෝකයත් අධිච්චසමුප්පන්න යැ (හේතු රහිත ව උපදා) යි කරුණු දෙකෙකින් පණවත් ද, එය ද එහි තතු නො දන්නා නොදක්නා ඒ මහණබමුණන්ගේ දෘෂ්ටිවේදනාවෙක්, තෘෂ්ණාගත වූ ඔවුන්ගේ පරිත්‍රාසයෙක්, චංචලතාවෙක් ම ය.

113. මහණෙනි, එහි යම් මහණබමුණුකෙනෙක් පූර්වාන්තකල්පික වූවෝ, පූර්වාන්තානුදෘෂ්ටික වූවෝ අටලොස් කරුණෙකින් අතීතසඤ්ඤ පරම්පරා කොටස අරමුණු කොට අනේකවිධ දෘෂ්ටිප්‍රකාශක වචන කියා පාත් ද, එයත් එහි තතු නොදන්නා නොදක්නා ඒ භවත් මහණබමුණන්ගේ වේදනාවෙක් ම ය. තෘෂ්ණාගත වූ ඔවුන්ගේ පරිත්‍රාස-යෙක්, සසලබවෙක් ම ය.

114. මහණෙනි, යම් මහණබමුණු කෙනෙක් උද්ධමාඝාතනික සඤ්ඤීවාද ඇත්තෝ මරණින් මතු සංඥී වූ ආත්මයක් සොළොස් කරුණෙකින් පණවත් ද, එයත් එහි තතු නොදන්නා නොදක්නා ඒ භවත් මහණබමුණන්ගේ වේදනාවෙක් ම ය. තෘෂ්ණාගත වූ ඔවුන්ගේ පරිත්‍රාසයෙක්, විෂ්පන්දනයෙක් ම ය.

115. මහණෙනි, එහි යම් මහණබමුණු කෙනෙක් උද්ධමාඝාතනික අසඤ්ඤීවාද ඇත්තෝ කරුණු අටෙකින් මරණින් මත්තෙහි සංඥරහිත ආත්මයක් පණවත් ද, එයත් එහි තතු නොදන්නා නොදක්නා ඒ භවත් මහණබමුණන්ගේ වේදනාවෙක් ම ය. තෘෂ්ණාගත වූ ඔවුන්ගේ පරිත්‍රාසයෙක්, සැසැලුමෙක් ම ය.

116. මහණෙනි, එහි යම් මහණබමුණු කෙනෙක් උද්ධමාඝාතනික නෙවසඤ්ඤීනාසඤ්ඤීවාද ඇත්තෝ කරුණු අටෙකින් සංඥී නො ම වූත් අසංඥී නො ම වූත් ආත්මයක් පණවත් ද, එයත් එහි තතු නොදන්නා නොදක්නා ඒ භවත් මහණබමුණන්ගේ වේදනාවෙක් ම ය. තෘෂ්ණාගත වූ ඔවුන්ගේ පරිත්‍රාසයෙක්, විෂ්පන්දනයෙක් ම ය.

117. මහණෙනි, එහි යම් මහණබමුණු කෙනෙක් උච්ඡේදවාදී වූවෝ විද්‍යමාන වූ සත්ත්වයාගේ උච්ඡේදය, විනාශය, භවවිගමය කරුණු සතෙකින් පණවත් ද, එයත් එහි තතු නොදන්නා නොදක්නා ඒ භවත් මහණබමුණන්ගේ වේදනාවෙක් ම ය. තෘෂ්ණාගත වූ ඔවුන්ගේ පරිත්‍රාසයෙක්, විෂ්පන්දනයෙක් ම ය.

118. මහණෙනි, එහි යම් මහණබමුණු කෙනෙක් දෘෂ්ටධර්මනිර්වාණවාද ඇත්තෝ විද්‍යමානසත්ත්වයාගේ පරමදෘෂ්ටධර්මනිර්වාණය කරුණු පසෙකින් පණවත් ද, එයත් එහි තතු නොදන්නා නොදක්නා ඒ භවත් මහණ බමුණන්ගේ වේදනාවෙක් ම ය. තෘෂ්ණෝපගත වූ ඔවුන්ගේ පරිත්‍රාස-යක්, චංචලතාවෙක් ම ය.

119. මහණෙනි, එහි යම් මහණබමුණු කෙනෙක් අපරාන්තකල්පික වූවෝ, අපරාන්තානුදෘෂ්ටික වූවෝ කරුණු පුසාළිසෙකින් අනාගත සඤ්ඤ පරම්පරා කොටස ඇරැබැ අනේකවිධ දෘෂ්ටිප්‍රකාශක වචන කියා පාත් ද, එයත් එහි තතු නොදන්නා නොදක්නා ඒ භවත් මහණබමුණන්ගේ වේදනාවෙක් ම ය. තෘෂ්ණෝපගත වූ ඔවුන්ගේ පරිත්‍රාසයෙක්, චංචල බවෙක් ම ය.

120. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා පුබ්බන්තකප්පිකා ච අපරන්තකප්පිකා ච පුබ්බන්තාපරන්තකප්පිකා ච පුබ්බන්තාපරන්තානු-දිට්ඨිනො පුබ්බන්තාපරන්තං ආරබ්භ අනෙකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති ඉමානි ද්වාසට්ඨියා වත්ථූහි, තදපි තෙසං භවතං සමණබ්‍රාහ්මණානං අජානතං අපස්සතං වෙදයිතං, තණ්හාගතානං පරිතස්සිතවිප්ඵන්දිතමෙව.

121. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා සස්සතවාදා සස්සතං අත්තානඤ්ච ලොකඤ්ච පඤ්ඤපෙන්ති චතූහි වත්ථූහි, තදපි එස්සපච්චයා.

122. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා එකච්චසස්සතිකා එකච්චඅසස්සතිකා එකච්චං සස්සතං එකච්චං අසස්සතං අත්තානඤ්ච ලොකඤ්ච පඤ්ඤපෙන්ති චතූහි වත්ථූහි, තදපි එස්සපච්චයා.

123. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා අන්තානන්තිකා අන්තානන්තං ලොකස්ස පඤ්ඤපෙන්ති චතූහි වත්ථූහි, තදපි එස්සපච්චයා.

124. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා අමරාවික්ඛෙපිකා තත්ථ තත්ථ පඤ්හං පුට්ඨා සමානා වාචාවික්ඛෙපං ආපජ්ජන්ති අමරාවික්ඛෙපං චතූහි වත්ථූහි, තදපි එස්සපච්චයා.

125. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා අධිච්චසමුප්පන්නිකා අධිච්චසමුප්පන්නං අත්තානඤ්ච ලොකඤ්ච පඤ්ඤපෙන්ති ද්වීහි වත්ථූහි, තදපි එස්සපච්චයා.

126. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා පුබ්බන්තකප්පිකා පුබ්බන්තානුදිට්ඨිනො පුබ්බන්තං ආරබ්භ අනෙකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති අට්ඨාරසහි වත්ථූහි, තදපි එස්සපච්චයා.

127. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා උද්ධමාඝාතනිකා සඤ්ඤීවාදා උද්ධමාඝාතනා සඤ්ඤීං අත්තානං පඤ්ඤපෙන්ති සොළසහි වත්ථූහි, තදපි එස්සපච්චයා.

128. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා උද්ධමාඝාතනිකා අසඤ්ඤීවාදා උද්ධමාඝාතනා අසඤ්ඤීං අත්තානං පඤ්ඤපෙන්ති අට්ඨහි වත්ථූහි, තදපි එස්සපච්චයා.

120. මහණෙනි, එහි පූර්වාන්තකල්පික වූ ද, අපරාන්තකල්පික වූ ද, පූර්වාන්තාපරාන්තකල්පික වූ ද, පූර්වාන්තාපරාන්තානුදෘෂ්ටික වූ ද, යම් මහණ-බමුණු කෙනෙක් දෙසැටක් කරුණින් පූර්වාන්ත අපරාන්ත දෙක අරමුණු කොට අනේකවිධ දෘෂ්ටිප්‍රකාශක වචන කියා පාත් නම්, එය ද එහි තතු නොදන්නා නොදක්නා ඒ භවත් මහණබමුණන්ගේ වේදනාවෙක් ම ය. තෘෂ්ණෝපගත වූ ඔවුන්ගේ පරිත්‍රාසයෙක්, විඝාතයෙක් ම ය.

121. මහණෙනි, එහි යම් මහණබමුණු කෙනෙක් ශාශ්වතදෘෂ්ටි ඇත්තෝ සතර කරුණෙකින් ආත්මයත් ලෝකයත් ශාශ්වත කොට පණවත් ද, (එසේ පැණැවීමට කරුණු වූ) ඒ (දෘෂ්ට්‍යාසවාද) වේදනාව ද (ඡඩායතනයත් නිසා සිතැ උපදනා) ස්පර්ශයාගේ ප්‍රත්‍යයයෙන් වේ.

122. මහණෙනි, එහි යම් මහණබමුණු කෙනෙක් ඒකත්‍යශාශ්ව-තික ද ඒකත්‍යඅශාශ්වතික ද වූවෝ ආත්මයත් ලෝකයත් එක් කොටසක් ශාශ්වත ද එක් කොටසක් අශාශ්වත ද කොට කරුණු සතරෙකින් පණවත් නම්, එයට කරුණු වූ ඒ වේදනාව ද ස්පර්ශප්‍රත්‍යයෙන් වේ.

123. මහණෙනි, එහි යම් මහණබමුණු කෙනෙක් අන්තානන්තික-වාද ඇත්තෝ ලෝකය පිළිබඳ සසීම අසීම බව කරුණු සතරෙකින් පණවත් ද, එයට කරුණු වූ දෘෂ්ටිවේදනාව ද ස්පර්ශප්‍රත්‍යයෙන් වේ.

124. මහණෙනි, එහි යම් මහණබමුණු කෙනෙක් අමරාවික්ෂේපක වූවෝ ඒ ඒ කරුණෙහි ප්‍රශ්න විචාරන ලදුවෝ ම සතර කරුණෙකින් වාග්වික්ෂේපයට අමරාවික්ෂේපයට පැමිණෙත් ද, එයට කරුණු වූ දෘෂ්ටිවේදනාව ද ස්පර්ශප්‍රත්‍යයෙන් ම වේ.

125. මහණෙනි, එහි යම් මහණබමුණු කෙනෙක් අධිච්චසමුප්පන්නික වූවෝ ආත්මයත් ලෝකයත් ඉබේ ම පහළ වූවත් කොට කරුණු දෙකෙකින් පණවත් ද, එසේ පැණැවීමට කරුණු වූ දෘෂ්ටිවේදනාව ද ස්පර්ශප්‍රත්‍යයෙන් වේ.

126. මහණෙනි, එහි යම් මහණබමුණු කෙනෙක් පූර්වාන්තකල්පික වූවෝ පූර්වාන්තානුදෘෂ්ටික වූවෝ පූර්වාන්තය අරමුණු කොට අටලොස් කරුණෙකින් අනේකවිධ දෘෂ්ටිප්‍රකාශක වචන කියා පාත් ද, එයට කරුණු වූ දෘෂ්ටිවේදනාව ද ස්පර්ශප්‍රත්‍යයෙන් වේ.

127. මහණෙනි, එහි යම් මහණබමුණු කෙනෙක් උද්ධමාඝාතනික සඤ්ඤීවාද ඇත්තෝ, මරණින් මත්තෙහි සොළොස් කරුණෙකින් සංඥාවත් වූ ආත්මය පණවත් ද, එයට කරුණු වූ දෘෂ්ටිවේදනාව ද ස්පර්ශප්‍රත්‍යයෙන් වේ.

128. මහණෙනි, එහි යම් මහණබමුණු කෙනෙක් උද්ධමාඝාතනික අසංඥීවාද ඇත්තෝ මරණින් මත්තෙහි සංඥාරහිත ආත්මයක් කරුණු අටෙකින් පණවත් ද, එයට කරුණු වූ දෘෂ්ටිවේදනාව ද ස්පර්ශ ප්‍රත්‍යයෙන් වේ.

129. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා උද්ධමාඝාතනිකා නෙවසඤ්ඤීනාසඤ්ඤීවාදා උද්ධමාඝාතනා නෙවසඤ්ඤිං නාසඤ්ඤිං අත්තානං පඤ්ඤපෙන්ති අට්ඨහි වත්ථූහි, තදපි එස්සපච්චයා.

130. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා උච්ඡෙදවාදා සතො සත්තස්ස උච්ඡෙදං විනාසං විභවං පඤ්ඤපෙන්ති සත්තහි වත්ථූහි, තදපි එස්සපච්චයා.

131. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා දිට්ඨධම්මනිබ්බානවාදා සතො සත්තස්ස පරමදිට්ඨධම්මනිබ්බානං පඤ්ඤපෙන්ති පඤ්චහි වත්ථූහි, තදපි එස්සපච්චයා.

132. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා අපරන්තකප්පිකා අපරන්තානුදිට්ඨිනො අපරන්තං ආරබ්භ අනෙකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති චතුවත්තාරීසාය වත්ථූහි, තදපි එස්සපච්චයා.

133. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා පුබ්බන්තකප්පිකා ච අපරන්තකප්පිකා ච පුබ්බන්තාපරන්තකප්පිකා ච පුබ්බන්තාපරන්තානු-දිට්ඨිනො පුබ්බන්තාපරන්තං ආරබ්භ අනෙකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති අට්ඨාසට්ඨියා වත්ථූහි, තදපි එස්සපච්චයා.

134. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා සස්සතවාදා සස්සතං අත්තානඤ්ච ලොකඤ්ච පඤ්ඤපෙන්ති චතූහි වත්ථූහි, තෙ වත අඤ්ඤත්‍ර එස්සා පටිසංවෙදිස්සන්තීති නෙතං ඨානං විජ්ජති.

135. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා එකච්චසස්සතිකා එකච්චඅසස්සතිකා එකච්චං සස්සතං එකච්චං අසස්සතං අත්තානඤ්ච ලොකඤ්ච පඤ්ඤපෙන්ති චතූහි වත්ථූහි, තෙ වත අඤ්ඤත්‍ර එස්සා පටිසංවෙදිස්සන්තීති නෙතං ඨානං විජ්ජති.

136. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා අන්තානන්තිකා අන්තානන්තං ලොකස්ස පඤ්ඤපෙන්ති චතූහි වත්ථූහි, තෙ වත අඤ්ඤත්‍ර එස්සා පටිසංවෙදිස්සන්තීති නෙතං ඨානං විජ්ජති.

137. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා අමරාවික්ඛෙපිකා තත්‍ර තත්‍ර පඤ්හං පුට්ඨා සමානා වාචාවික්ඛෙපං ආපජ්ජන්ති අමරාවික්ඛෙපං චතූහි වත්ථූහි, තෙ වත අඤ්ඤත්‍ර එස්සා පටිසංවෙදිස්සන්තීති නෙතං ඨානං විජ්ජති.

129. මහණෙනි, එහි යම් මහණබමුණු කෙනෙක් උද්ධමාඝාතනිකවාදී ඇත්තෝ මරණින් මත්තෙහි සංඥීත් නො ම වූ අසංඥීත් නො ම වූ ආත්මයක් කරුණු අටෙකින් පණවත් ද, එයට කරුණු වූ දෘෂ්ටිවේදනාව ද ස්පර්ශප්‍රත්‍යයයෙන් වේ.

130. මහණෙනි, එහි යම් මහණබමුණු කෙනෙක් උච්ඡේදවාදී ඇත්තෝ විද්‍යමාන සත්ත්වයාගේ උච්ඡේදය, විනාශය, භවවිගමය කරුණු සතෙකින් පණවත් ද, එයට කරුණු වූ දෘෂ්ටිවේදනාව ද සපර්ශ-ප්‍රත්‍යයයෙන් වේ.

131. මහණෙනි, එහි යම් මහණබමුණු කෙනෙක් දෘෂ්ටධර්මනිර්වාණවාදී ඇත්තෝ විද්‍යමාන සත්ත්වයාගේ පරමදෘෂ්ටධර්මනිර්වාණය පස් කරුණෙකින් පණවත් ද, එයට කරුණු වූ දෘෂ්ටිවේදනාව ද ස්පර්ශප්‍රත්‍යයයෙන් වේ.

132. මහණෙනි, එහි යම් මහණබමුණු කෙනෙක් අපරාන්තකල්පික වූවෝ, අපරාන්තානුදෘෂ්ටික වූවෝ අපරාන්තය (අනාගත ස්කන්ධ පරම්පරා කොටස) ඇරඹූ කරුණු සූසාළිසෙකින් අනේකවිධ දෘෂ්ටිප්‍රකාශක වචන කියා පාත් ද, එයට කාරණ වූ දෘෂ්ටිවේදනාව ද ස්පර්ශ ප්‍රත්‍යයයෙන් වේ.

133. මහණෙනි, එහි යම් මහණබමුණු කෙනෙක් පූර්වාන්තකල්පික ද අපරාන්තකල්පික ද පූර්වාන්තාපරාන්තකල්පික ද වූවෝ, පූර්වාන්ත අපරාන්ත අනුවැ පහළ කළ දෘෂ්ටි ඇත්තෝ අතීත ස්කන්ධ පරම්පරා කොටසත් අනාගත ස්කන්ධ පරම්පරා කොටසත් අරමුණු කොට දෙසැටක් කරුණුවලින් අනේකවිධ දෘෂ්ටිප්‍රකාශක වචන කියත් ද, එයට කරුණු වූ දෘෂ්ටිවේදනාව ද ස්පර්ශප්‍රත්‍යයයෙන් වේ.

134. මහණෙනි, එහි යම් මහණබමුණු කෙනෙක් ශාශ්වතදෘෂ්ටික වූවෝ කරුණු සතරෙකින් ආත්මයත් ලෝකයත් ශාශ්වත කොට පණවත් ද, ඔහු වූ කලී ඒ දෘෂ්ට්‍යාසවාදය ස්පර්ශයෙන් තොර වැ විඳින්නාහ යන මේ කරුණ විද්‍යමාන නො වේ.

135. මහණෙනි, එහි යම් මහණබමුණු කෙනෙක් එකත්‍යශාශ්වතික එකත්‍යඅශාශ්වතික වූවෝ සතර කරුණෙකින් ආත්මයත් ලෝකයත් කොටසක් ශාශ්වතත් කොටසක් අශාශ්වතත් කොට පණවත් නම්, ඔහු කලී ස්පර්ශයෙන් තොර වැ ඒ දෘෂ්ට්‍යාසවාදය විඳින්නාහ යන මේ කාරණය විද්‍යමාන නො වේ.

136. මහණෙනි, එහි යම් මහණබමුණු කෙනෙක් අන්තානන්තික වාදී ඇත්තෝ කරුණු සතරෙකින් ලෝකය පිළිබඳ සසීම අසීම බව පණවත් ද, ඔහු කලී ස්පර්ශයෙන් තොර වැ ඒ දෘෂ්ටිවේදනාව විඳින්නාහ යන මේ කාරණය විද්‍යමාන නො වේ.

137. මහණෙනි, එහි යම් මහණබමුණු කෙනෙක් අමරාවික්ෂේපික වූවෝ ඒ ඒ විෂයයෙහි ප්‍රශ්න විචාරන ලදුවෝ ම සතර කරුණෙකින් වාග්වික්ෂේපයට අමරාවික්ෂේපයට පැමිණෙත් ද, ඔහු කලී ස්පර්ශයෙන් තොර වැ ඒ දෘෂ්ටිවේදනාව විඳින්නාහ යන මේ කාරණය නැත්තේ ය.

138. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා අධිච්චසමුප්පන්නිකා අධිච්චසමුප්පන්නං අත්තානඤ්ච ලොකඤ්ච පඤ්ඤපෙන්ති දිට්ඨි වත්ථූහි, තෙ වත අඤ්ඤත්‍ර ඵස්සා පටිසංවෙදිස්සන්තීති නෙතං ඨානං විජ්ජති.

139. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා පුබ්බන්තකප්පිකා පුබ්බන්තානුදිට්ඨිනො පුබ්බන්තං ආරබ්භ අනෙකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති අට්ඨාරසහි වත්ථූහි, තෙ වත අඤ්ඤත්‍ර ඵස්සා පටිසං-වෙදිස්සන්තීති නෙතං ඨානං විජ්ජති.

140. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා උද්ධමාඝාතනිකා සඤ්ඤීවාද උද්ධමාඝාතනා සඤ්ඤීං අත්තානං පඤ්ඤපෙන්ති සොළසහි වත්ථූහි, තෙ වත අඤ්ඤත්‍ර ඵස්සා පටිසංවෙදිස්සන්තීති නෙතං ඨානං විජ්ජති.

141. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා උද්ධමාඝාතනිකා අසඤ්ඤීවාද උද්ධමාඝාතනා අසඤ්ඤීං අත්තානං පඤ්ඤපෙන්ති අට්ඨහි වත්ථූහි, තෙ වත අඤ්ඤත්‍ර ඵස්සා පටිසංවෙදිස්සන්තීති නෙතං ඨානං විජ්ජති.

142. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා උද්ධමාඝාතනිකා නෙවසඤ්ඤීනාසඤ්ඤීවාද උද්ධමාඝාතනා නෙවසඤ්ඤීං නාසඤ්ඤීං අත්තානං පඤ්ඤපෙන්ති අට්ඨහි වත්ථූහි, තෙ වත අඤ්ඤත්‍ර ඵස්සා පටිසංවෙදිස්සන්තීති නෙතං ඨානං විජ්ජති.

143. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා උච්ඡෙදවාද සතො සත්තස්ස උච්ඡෙදං විනාසං විභවං පඤ්ඤපෙන්ති සත්තහි වත්ථූහි, තෙ වත අඤ්ඤත්‍ර ඵස්සා පටිසංවෙදිස්සන්තීති නෙතං ඨානං විජ්ජති.

144. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා දිට්ඨධම්මනිබ්බානවාද සතො සත්තස්ස පරමදිට්ඨධම්මනිබ්බානං පඤ්ඤපෙන්ති පඤ්චහි වත්ථූහි, තෙ වත අඤ්ඤත්‍ර ඵස්සා පටිසංවෙදිස්සන්තීති නෙතං ඨානං විජ්ජති.

145. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා අපරන්තකප්පිකා අපරන්තානුදිට්ඨිනො අපරන්තං ආරබ්භ අනෙකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති චතුවත්තාරීසාය වත්ථූහි, තෙ වත අඤ්ඤත්‍ර ඵස්සා පටිසංවෙදි-ස්සන්තීති නෙතං ඨානං විජ්ජති.

146. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා පුබ්බන්තකප්පිකා ච අපරන්තකප්පිකා ච පුබ්බන්තාපරන්තකප්පිකා ච පුබ්බන්තාපරන්තානු-දිට්ඨිනො පුබ්බන්තාපරන්තං ආරබ්භ අනෙකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති දාසට්ඨියා වත්ථූහි, තෙ වත අඤ්ඤත්‍ර ඵස්සා පටිසංවෙදිස්ස-න්තීති නෙතං ඨානං විජ්ජති.

138. මහණෙනි, එහි යම් මහණබමුණු කෙනෙක් අධිච්චසමුප්පන්න වාද ඇත්තෝ, කරුණු දෙකෙකින් ආත්මයත් ලෝකයත් ඉබේ උපන් සි පණවත් ද, ඔහු කලී ඒ දෘෂ්ටිවේදනාව ස්පර්ශයෙන් තොර වැ විඳින්නාහ යන කාරණය නැත්තේ ය.

139. මහණෙනි, යම් මහණබමුණු කෙනෙක් පූර්වාන්තකල්පික වූවෝ, පූර්වාන්තය අනුවැ පහළ කැරැගත් දෘෂ්ටි ඇත්තෝ, කරුණු අටොළොසෙකින් පූර්ව ස්කන්ධපරම්පරා කොටස ඇරැබැ අනේකවිධ දෘෂ්ටිප්‍රකාශක වචන කියා පාන් ද, ඔහු ස්පර්ශයෙන් තොර වැ ඒ දෘෂ්ටිරසාස්වාදය විඳින්නාහ යන මේ කරුණ නො මැත්තේ ය.

140. මහණෙනි, එහි යම් මහණබමුණු කෙනෙක් උද්ධමාඝාතනික සඤ්ඤීවාද ඇත්තෝ, මරණින් මතු සංඥ ඇති ආත්මයක් සොළොස් කරුණෙකින් පණවත් ද, ඔහු කලී ස්පර්ශයෙන් තොර වැ ඒ දෘෂ්ට්‍යාස්වාදය විඳින්නාහ යන මේ කරුණ නො මැත්තේ ය.

141. මහණෙනි, එහි යම් මහණබමුණු කෙනෙක් උද්ධමාඝාතනික අසඤ්ඤීවාද ඇත්තෝ, මරණින් මතු සංඥ නැති ආත්මයක් කරුණු අටෙකින් පණවත් ද, ඔහු කලී එයට කරුණු වූ දෘෂ්ටිවේදනාව ස්පර්ශයෙන් තොර වැ විඳින්නාහ යන මේ කාරණය නැත්තේ ය.

142. මහණෙනි, එහි යම් මහණබමුණු කෙනෙක් උද්ධමාඝාතනික නෙවසඤ්ඤීනාසඤ්ඤීවාද ඇත්තෝ, මරණින් මත්තෙහි සංඥී නො ම වූත් අසංඥී නො ම වූත් ආත්මයක් පණවත් ද, එයට කාරණ වූ දෘෂ්ටි වේදනාව ස්පර්ශයෙන් තොර වැ විඳින්නාහ යන මේ කාරණය නැත්තේ ය.

143. මහණෙනි, එහි යම් මහණබමුණු කෙනෙක් උච්ඡේදවාදී වූවෝ විද්‍යමාන සත්ත්වයාගේ උච්ඡේදය, විනාශය, භවවිගමය කරුණු සතෙකින් පණවත් ද, ඔහු කලී එයට කාරණ වූ දෘෂ්ටිවේදනාව ස්පර්ශයෙන් තොර වැ විඳින්නාහ යන මේ කරුණ නැත්තේ ය.

144. මහණෙනි, එහි යම් මහණබමුණු කෙනෙක් දෘෂ්ටධර්මනිර්වාණ වාද ඇත්තෝ, විද්‍යමාන සත්ත්වයා පිළිබඳ පරමදෘෂ්ටධර්මනිර්වාණය කරුණු පසෙකින් පණවත් ද, ඔහු කලී එයට කරුණු වූ දෘෂ්ට්‍යාස්වාදය ස්පර්ශයෙන් තොර වැ විඳින්නාහ යන මේ කාරණය විද්‍යමාන නො වේ.

145. මහණෙනි, එහි යම් මහණබමුණු කෙනෙක් අපරාන්තකල්පික වූවෝ අපරාන්තය අනුවැ පහළ කැරැගත් දෘෂ්ටි ඇත්තෝ කරුණු සුසාළිසෙකින් අපරාන්තය ඇරැබැ අනේකවිධ දෘෂ්ටිප්‍රකාශක වචන කියා පාන් ද, ඔහු කලී එයට කාරණ වූ දෘෂ්ටිවේදනාව ස්පර්ශයෙන් තොර වැ විඳින්නාහ යන මේ කාරණය විද්‍යමාන නො වේ.

146. මහණෙනි, යම් මහණබමුණු කෙනෙක් පූර්වාන්තකල්පිකත් වූවෝ, අපරාන්තකල්පිකත් වූවෝ, පූර්වාන්තාපරාන්තකල්පිකත් වූවෝ, පූර්වාන්ත-අපරාන්තයන් ඇරැබැ පහළ කැරැගත් දෘෂ්ටි ඇත්තෝ, කරුණු දෙසැටෙකින් පූර්වාන්ත අපරාන්ත දෙක අරමුණු කොට අනේකවිධ දෘෂ්ටිප්‍රකාශක වචන කියන් ද, ඔහු කලී එයේ දෘෂ්ටි ගැන්මට කාරණ වූ දෘෂ්ට්‍යාස්වාදය ස්පර්ශයෙන් තොර වැ විඳින්නාහ යන මේ කාරණය විද්‍යමාන නො වේ.

147. තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා සස්සතවාදා සස්සතං අත්තානඤ්ච ලොකඤ්ච පඤ්ඤපෙන්ති චතූහි වත්ථූහි, යෙ'පි තෙ සමණ-බ්‍රාහ්මණා එකච්චසස්සතිකා එකච්චඅසස්සතිකා, යෙ'පි තෙ සමණබ්‍රාහ්මණා අන්තානන්තිකා, යෙ 'පි තෙ සමණබ්‍රාහ්මණා අමරාවික්ඛෙපිකා, යෙ 'පි තෙ සමණබ්‍රාහ්මණා අධිච්චසමුප්පන්නිකා, යෙ'පි තෙ සමණබ්‍රාහ්මණා පුබ්බන්ත-කප්පිකා, යෙ 'පි තෙ සමණබ්‍රාහ්මණා උද්ධමාඝාතනිකා සඤ්ඤීවාදා, යෙ 'පි තෙ සමණබ්‍රාහ්මණා උද්ධමාඝාතනිකා අසඤ්ඤීවාදා, යෙ'පි තෙ සමණ-බ්‍රාහ්මණා උද්ධමාඝාතනිකා නෙවසඤ්ඤීනාසඤ්ඤීවාදා, යෙ 'පි තෙ සමණබ්‍රාහ්මණා උච්ඡෙදවාදා, යෙ 'පි තෙ සමණබ්‍රාහ්මණා දිට්ඨධම්ම-නිබ්බානවාදා, යෙ 'පි තෙ සමණබ්‍රාහ්මණා අපරන්තකප්පිකා, යෙ'පි තෙ සමණබ්‍රාහ්මණා පුබ්බන්තකප්පිකා ච අපරන්තකප්පිකා ච පුබ්බන්තා-පරන්තකප්පිකා ච, පුබ්බන්තාපරන්තානුදිට්ඨිනො පුබ්බන්තාපරන්තං ආරබ්භ අනෙකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති ද්වාසට්ඨියා වත්ථූහි, සබ්බෙ තෙ ඡහි ඵස්සායතනෙහි ඵුස්ස ඵුස්ස පටිසංවෙදෙන්ති. තෙසං වෙදනාපච්චයා තණ්හා, තණ්හාපච්චයා උපාදානං, උපාදානපච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති. යතො ඛො භික්ඛවෙ භික්ඛු ඡන්නං ඵස්සායතනානං සමුදයං ච අත්ථඟමං ච අස්සාදං ච ආදීනවං ච නිස්සරණං ච යථාභූතං පජානාති, අයං ඉමෙහි සබ්බෙහෙව උත්තරිතරං පජානාති.

148. යෙ හි කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා පුබ්බන්ත-කප්පිකා වා අපරන්තකප්පිකා වා පුබ්බන්තාපරන්තකප්පිකා වා පුබ්බන්තා-පරන්තානුදිට්ඨිනො පුබ්බන්තාපරන්තං ආරබ්භ අනෙකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති, සබ්බෙ තෙ ඉමෙහෙව ද්වාසට්ඨියා වත්ථූහි අන්තොජාලීකතා එත්ථ සිතා 'ව උම්මුජ්ජමානා උම්මුජ්ජන්ති, [නිමුජ්ජමානා නිමුජ්ජන්ති.] එත්ථ පරියාපන්නා අන්තොජාලීකතා 'ව උම්මුජ්ජමානා උම්මුජ්ජන්ති, [නිමුජ්ජමානා නිමුජ්ජන්ති.]* සෙය්‍යථාපි භික්ඛවෙ දක්ඛො කෙවට්ටො වා කෙවට්ටන්තෙවාසී වා සුඛුමච්ඡිකෙන ජාලෙන පරිත්තං උදකදහං ඔත්ථරෙය්‍ය, තස්ස එවමස්ස: "යෙ ඛො කෙචි ඉමස්මිං උදකදහෙ ඔළාරිකා පාණා, සබ්බෙ තෙ අන්තොජාලීකතා එත්ථ සිතා 'ව උම්මුජ්ජමානා උම්මුජ්ජන්ති, [නිමුජ්ජමානා නිමුජ්ජන්ති]. එත්ථ පරියාපන්නා අන්තො-ජාලීකතා 'ව උම්මුජ්ජමානා උම්මුජ්ජන්ති, [නිමුජ්ජමානා නිමුජ්ජන්ති"ති.] * එවමෙව ඛො භික්ඛවෙ යෙ හි කෙචි සමණා වා බ්‍රාහ්මණා වා පුබ්බන්ත-කප්පිකා වා අපරන්තකප්පිකා වා පුබ්බන්තාපරන්තකප්පිකා වා පුබ්බන්තා-පරන්තානුදිට්ඨිනො පුබ්බන්තාපරන්තං ආරබ්භ අනෙකවිහිතානි අධිවුත්ති-පදානි අභිවදන්ති, සබ්බෙ තෙ ඉමෙහෙව ද්වාසට්ඨියා වත්ථූහි අන්තොජාලීකතා එත්ථ සිතා'ව උම්මුජ්ජමානා උම්මුජ්ජන්ති, [නිමුජ්ජමානා නිමුජ්ජන්ති.]* එත්ථ පරියාපන්නා අන්තොජාලීකතා'ව උම්මුජ්ජමානා උම්මුජ්ජන්ති, [නිමුජ්ජමානා නිමුජ්ජන්ති.]*

---

* [ ] චිහ්නන්තරිත පදානි පොත්තකෙසු න දිස්සන්ති

147. මහණෙනි, එහි යම් මහණ බමුණුකෙනෙක් ශාශ්වතදෘෂ්ටි ගත්තෝ සතර කරුණෙකින් ආත්මයත් ලෝකයත් ශාශ්වත කොට පණවත් ද, යම් මහණ බමුණු කෙනෙක් ඒකත්‍යශාශ්වතිකත් ඒකත්‍යඅශාශ්වතිකත් වූවෝ ද, යම් මහණබමුණු කෙනෙක් අන්තානන්තික වාද ඇත්තෝ ද, යම් මහණ බමුණුකෙනෙක් අමරාවික්ෂේපික වාද ඇත්තෝ ද, යම් මහණ බමුණුකෙනෙක් අධිච්චසමුප්පන්නික වාද ඇත්තෝ ද, යම් මහණ බමුණු කෙනෙක් පූර්වාන්තකල්පික ද, යම් මහණබමුණු කෙනෙක් උද්ධමාඝාතනික සඤ්ඤීවාද ඇත්තෝ ද, යම් මහණබමුණු කෙනෙක් උද්ධමාඝාතනික අසඤ්ඤී වාද ඇත්තෝ ද, යම් මහණ බමුණු කෙනෙක් උද්ධමාඝාතනික නෙවසඤ්ඤීනාසඤ්ඤීවාද ඇත්තෝ ද, යම් මහණබමුණු කෙනෙක් උච්ඡේදවාද ඇත්තෝ ද, යම් මහණ බමුණු කෙනෙක් දෘෂ්ටධර්මනිර්වාණවාද ඇත්තෝ ද, යම් මහණබමුණු කෙනෙක් අපරාන්තකල්පික ද, යම් මහණ බමුණු කෙනෙක් පූර්වාන්තකල්පිකත් අපරාන්තකල්පිකත් පූර්වාන්ත-අපරාන්තකල්පිකත් වූවෝ පූර්වාන්තාපරාන්තානුදෘෂ්ටික වූ දෙසැටක් කරුණුවලින් අනේකවිධ දෘෂ්ටිප්‍රකාශක වචන කියත් ද, ඒ සියල්ලෝ සඵස්පර්ශයතන සයින් උපන් ස්පර්ශයෙන් රූපාදි අරමුණු ස්පර්ශ කොට දෘෂ්ට්‍යාස්වාදය විඳින්. ඔවුන්ගේ දෘෂ්ටිවේදනාප්‍රත්‍යයයෙන් තෘෂ්ණාව වේ. තෘෂ්ණාප්‍රත්‍යයයෙන් උපාදානය වේ. උපාදානප්‍රත්‍යයයෙන් භවය වේ. භවප්‍රත්‍යයයෙන් ජාතිය වේ. ජාතිප්‍රත්‍යයයෙන් ජරා මරණ ශෝක පරිදේව දුඃඛ දෞර්මනස්‍ය උපායාසයෝ යන මොහු පහළ වෙත්. මහණෙනි, යම් කලෙක වනාහි මහණ තෙම ස්පර්ශායතන සදෙනාගේ හේතුව ද නිරෝධය ද ආස්වාදය ද ආදීනවය ද ප්‍රහාණය ද තතු වූ පරිදි දැන ගනී ද, මේ තෙමේ මෙකී හැම දෘෂ්ටිගතයනට වැඩියක් ම (ශීලසමාධිප්‍රඥා ප්‍රඥාවිමුක්ති යන මේ සියල්ල ම) දැනැ ගනී.

148. මහණෙනි, පූර්වාන්තකල්පික වූ හෝ අපරාන්තකල්පික වූ හෝ පූර්වාන්තාපරාන්තකල්පික වූ හෝ යම් මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ පූර්වාන්ත අපරාන්ත අරමුණු කොට පහළ කැරැ ගත් දෘෂ්ටි ඇත්තෝ, අතීතානාගත සකල පරම්පරා කොටස් අරමුණු කොට, අනේකවිධ දෘෂ්ටිප්‍රකාශක වචන කියා පාන්නෝ ද, ඒ සියල්ලෝ මේ දෙසැට කරුණින් ම (මගේ මේ) දේශනාදැල තුලට හසු කරන ලදුවෝ, මේ දේශනාදැලෙහි බැඳුණෝ ම, මෙහි තුළ ම ඉපිලෙන්නාහු ඉපිලෙත්. ගැලෙන්නාහු ගැලෙත්. මෙයට ඇතුලත් වූහු ම ඉපිලෙන්නාහු, ඉපිලෙත්. ගැලෙන්නාහු ගැලෙත්. මහණෙනි, යම් සේ දක්ෂ වූ කෙවුළෙක් හෝ කෙවුළකුගේ අතැවැසියෙක් හෝ සියුම් ඇස් ඇති දැලින් මඳ දිය ඇති දියවලක් කිඹිසිනි කොටැ අතුරන්නේ ද, "මේ දියවලෙහි යම් කිසි මහත් ප්‍රාණි කෙනෙක් වෙත් නම්, ඒ සියල්ලෝ ම මේ දැලට හසු කැරැ ගන්නා ලද්දේ ම මතු වන්නෝ මතු වෙත්. ගැලෙන්නාහු ගැලෙත්. මෙහි ඇතුලත් වූවෝ දැල තුලට හසු වූවෝ ම මතු වන්නෝ මතු වෙත්. ගැලෙන්නෝ ගැලෙත් යැ" යි ඔහුට මෙසේ සිතෙක් වන්නේ ද, මහණෙනි, එ පරිදෙන් ම පූර්වාන්ත කල්පික වූ හෝ අපරාන්තකල්පික වූ හෝ පූර්වාන්තාපරාන්තකල්පික වූ හෝ පූර්වාන්ත අපරාන්ත දෙක අනුවැ පහළ කැරැගත් දෘෂ්ටි ඇති යම් මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ දෙසැටක් කරුණින් පූර්වාන්ත අපරාන්ත දෙක අරමුණු කොට අනේකවිධ දෘෂ්ටිප්‍රකාශක වචන කියා පාන් ද, ඒ සියල්ලෝ මේ දෙසැට කරුණින් ම (මගේ) දේශනාදැලට හසු වූවෝ ම, මේ දෙශනාදැලෙහි බැඳුණෝ, මෙහි ම මතු වන්නෝ මතු වෙති. ගැලෙන්නෝ ගැලෙති. මෙහි ම ඇතුලත් වූවෝ මේ දේශනා දැල තුලට හසු වූවෝ ම, මතු වන්නෝ මතු වෙති. ගැලෙන්නෝ ගැලෙති.

149. උච්ඡින්නභවනෙත්තිකො භික්ඛවෙ තථාගතස්ස කායො තිට්ඨති. යාවස්ස කායො ඨස්සති, තාව නං දක්ඛිත්‍රති දෙවමනුස්සා. කායස්ස හෙද උද්ධං ජීවිතපරියාදානා න නං දක්ඛිත්‍රති දෙවමනුස්සා.

සෙය්‍යථාපි භික්ඛවෙ අම්බපිණ්ඩියා වණ්ටවිච්ඡින්නාය යානි කානිචි අම්බානි වණ්ටූපනිබද්ධානි, සබ්බානි තානි තදන්වයානි භවන්ති, එවමෙව ඛො භික්ඛවෙ උච්ඡින්නභවනෙත්තිකො තථාගතස්ස කායො තිට්ඨති. යාවස්ස කායො ඨස්සති, තාව නං දක්ඛිත්‍රති දෙවමනුස්සා. කායස්ස හෙද උද්ධං ජීවිතපරියාදානා න නං දක්ඛිත්‍රති දෙවමනුස්සා'ති.

150. එවං වුත්තෙ ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: 'අච්ඡරියං භන්තෙ, අබ්භුතං භන්තෙ, කො නාමායං භන්තෙ ධම්මපරියායො ?'ති

"තස්මාතිහ ත්වං ආනන්ද ඉමං ධම්මපරියායං අත්ථජාලන්ති'පි නං ධාරෙහි. ධම්මජාලන්ති'පි නං ධාරෙහි. බ්‍රහ්මජාලන්ති'පි නං ධාරෙහි. දිට්ඨිජාලන්ති'පි නං ධාරෙහි. අනුත්තරො සඞ්ගාමවිජයො'ති'පි නං ධාරෙහි"ති.

ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

ඉමස්මිං ච පන වෙය්‍යාකරණස්මිං භණ්‍යමානෙ දසසහස්සී ලොකධාතු අකම්පිත්ථාති.

ब्रह्मजालसुत्तं निट्ठितं पठमं.

149. මහණෙනි, තථාගත බුදුහුගේ ශරීරය මුලින් සිඳිනා ලද හව තාෂණා ඇත්තේ සිටී. යම් තාක් කල් ඔහුගේ කය සිටින්නේ ද ඒ තාක් දෙවිමිනිස්සු ඔහු දක්නාහ. කය බිඳීමෙන් ජීවිතයාගේ පරික්ෂීණ වීමෙන් මත්තෙහි දෙවිමිනිස්සු ඒ බුදුහු නො දක්නාහ. මහණෙනි, යම් සේ අඹකැන නටුවෙන් ගිලිහුණු කල්හි, නටුව හා බැඳුණු යම් අඹ පල කෙනෙක් වූහු නම්, ඔහු හැම එය අනුව යන්නෝ වෙත් ද, එ පරිද්දෙන් ම තථාගත බුදුහුගේ කය මුල් සුන් වූ භවතාෂණා ඇත්තේ සිටී. යම් තාක් කල් ඒ බුදුහුගේ කය සිටුනේ ද, ඒ තාක් දෙවිමිනිස්සු ඔහු දක්නාහ. කය බිඳීමෙන් ජීවිතය පරික්ෂීණ වීමෙන් මත්තෙහි දෙවිමිනිස්සු ඔහු නො දක්නාහ.

150. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ කල්හි ආයුෂ්මත් ආනන්ද සථවිර තෙමේ "වහන්ස, ආශ්චර්‍ය ය! වහන්ස, අද්භුත ය! වහන්ස, මේ ධර්‍මක්‍රමය කිනම් වේ ද?" යි මෙය භාග්‍යවතුන් වහන්සේට සැළ කෙළේය. එවිට භාග්‍යවතුන් වහන්සේ වදාරන සේක්, "ආනන්දය, එසේ නම්, මෙහි ලා මේ ධර්‍මපර්‍යායය අර්‍ථජාල නමැයි ද සලකා ගනුව. ධර්‍මජාල නමැ යි ද සලකා ගනුව. බ්‍රහ්මජාල නමැ යි ද සලකා ගනුව. දෘෂ්ටිජාල නමැයි ද සලකා ගනුව. නිරුත්තරසංග්‍රාමවිජය යැ යි ද සලකා ගනුව" යි වදාළ සේක.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක ආරාධිත සිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ වචන සතුටින් පිළිගත්හ.

මේ නිර්ගාථක සූත්‍රය වදාරනු ලබන කල්හි දසදහසක් ලෝ ද කම්පිත වී ය.

පළමුවන බ්‍රහ්මජාල සූත්‍රය නිමියේ ය.

2

සාමඤ්ඤඵලසුත්තං

1. එවං මෙ සුතං. එකං සමයං භගවා රාජගහෙ විහරති ජීවකස්ස කොමාරභච්චස්ස අම්බවනෙ මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං අඩ්ඩතෙලසෙහි භික්ඛුසතෙහි. තෙන ඛො පන සමයෙන රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො තදහුපොසථෙ පණ්ණරසෙ කොමුදියා චාතුමාසිනියා පුණ්ණාය පුණ්ණමාය රත්තියා රාජාමච්චපරිවුතො උපරිපාසාදවරගතො නිසින්නො හොති. අථ ඛො රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො තදහුපොසථෙ උදානං උදානෙසි:

"රමණීයා වත භො දොසිතා රත්ති, අභිරූපා වත භො දොසිතා රත්ති, දස්සනීයා වත භො දොසිතා රත්ති, පාසාදිකා වත භො දොසිතා රත්ති, ලක්ඛණ්ණූ වත භො දොසිතා රත්ති. කන්නු ඛො අජ්ජ සමණං වා බ්‍රාහ්මණං වා පයිරූපාසෙය්‍යාම යන්නො පයිරූපාසතො චිත්තං පසීදෙය්‍ය!"ති

2. එවං වුත්තෙ අඤ්ඤතරො රාජාමච්චො රාජානං මාගධං අජාතසත්තුං වෙදෙහිපුත්තං එතදවොච: 'අයං දෙව පූරණො කස්සපො සඞ්ඝී චෙව ගණී ච ගණාචරියො ච ඤාතො යසස්සී තිත්ථංකරො[1] සාධුසම්මතො බහුජනස්ස රත්තඤ්ඤූ චිරපබ්බජිතො අද්ධගතො වයො අනුප්පත්තො. තං දෙවො පූරණං කස්සපං පයිරූපාසතු. අප්පෙවනාම දෙවස්ස පූරණං කස්සපං පයිරූපාසතො චිත්තං පසීදෙය්‍ය'ති. එවං වුත්තෙ රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො තුණ්හී අහොසි.

3. අඤ්ඤතරො'පි ඛො රාජාමච්චො රාජානං මාගධං අජාතසත්තුං වෙදෙහිපුත්තං එතදවොච: 'අයං දෙව මක්ඛලි ගොසාලො සඞ්ඝී චෙව ගණී ච ගණාචරියො ච ඤාතො යසස්සී තිත්ථංකරො සාධුසම්මතො බහුජනස්ස රත්තඤ්ඤූ චිරපබ්බජිතො අද්ධගතො වයොඅනුප්පත්තො. තං දෙවො මක්ඛලිං ගොසාලං පයිරූපාසතු. අප්පෙවනාම දෙවස්ස මක්ඛලිං ගොසාලං පයිරූපාසතො චිත්තං පසීදෙය්‍ය'ති. එවං වුත්තෙ රාජා මාගධො අජාතසත්තු තුණ්හී අහොසි.

---

1. තිත්ථකරො, බහුත්‍ර.

2

ශ්‍රාමණ්‍යඵලසූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදි. එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ එක්දහස් දෙසියපණසක් පමණ වූ මහත් භික්ෂුසඞ්ඝයා සමග රජගහ නුවර සමීපයේ මෙකෝමාරභව්ව ජීවකයාගේ අඹවෙනෙහි වසන සේක. එ සමයෙහි වජිරාහි මගධ රටට අධිපති වූ, වෛදේහීපුත්‍ර වූ අජාසත් රජ තෙමේ එ දවසට පැමිණි පුණු පොහෝ දිනයෙහි සිවු මසක්හුගේ අවසන්හි වූ සුපිපි කුමුදු ඇති පුරා සඳ කැල්මෙන් බබලන රැයෙහි (ඉල්මස පසොළොස්වක් ඇ රැයෙහි) රජපහයෙහි මතු මහල්තලයට නැඟුණේ, රජ ඇමැතියන් විසින් පිරිවැරුණේ (එසැවුණු සේසත් ඇති මහඟු කසුන් අස්තෙහි) හුන්නේ වෙයි. ඉක්බිති වෛදේහීපුත්‍ර වූ මගධාධිපති අජාසත් රජ ඒ පුණුපොහෝ දිනැ මෙසේ උදන් ඇතී ය:

"භවත්නි, ආශ්චර්‍ය යි! රාත්‍රිය සඳ රැසින් සිත්කළු වෙයි (අභ්‍රමඟිකාදි දෝෂයන්ගෙන් පහ වූ රාත්‍රිය රමණීය ය)! භවත්නි, රාත්‍රිය සඳරැසින් විශෙෂයන් ශෝභන ය! භවත්නි, රාත්‍රිය සඳරැසින් දැකුම් කළු ය! භවත්නි, රාත්‍රිය සඳරැසින් ප්‍රසාදජනක ය! භවත්නි, රාත්‍රිය සඳ රැස කරණ කොට ගෙන ලක්ෂණීය ය! යමක්හු ඇසුරු කරන අපගේ සිත පහදනේ නම් එසේ වූ කවර නම් මහණකු බමුණකු අද ඇපි එළැඹ ඇසුරු කරන්න මෝ ද!" යනු යි.

2. රජහු මෙසේ කී කල්හි, එක්තරා රජ ඇමතියෙක් වෛදේහී-පුත්‍ර වූ මගධාධිපති අජාසත් රජහට "දේවයන් වහන්ස, මේ කාශ්‍යප-ගෝත්‍රික පූරණයෝ පැවිදි මුළුවක් ඇත්තෝ ද, පැවිදි ගණයා ඇත්තෝ ද වෙති. ගණාචාර්‍ය ද වෙති. ප්‍රකටයහ. කීර්තිමත්හ. බොහෝ දෙනා විසින් සත්පුරුෂයෙකැ යි සම්මත වූ තීර්ථංකර කෙනෙක. චිරරාත්‍රඥ හ. පැවිදි වූ බෝහෝ කල් ඇත්තෝ ය. දෙතුන් රජ පරපුරක් තරම් කල් ඉක්මවා සිටියෝ ය. මහළු වියට පැමිණියෝ ය. දේවයන් වහන්සේ ඒ කාශ්‍යපගෝත්‍රික පූරණයන් වෙත එළැඹ ඇසුරු කරන සේක් වා. කාශ්‍යපීය පූරණයන් වෙත එළැඹ ඇසුරු කරන දේවයන් වහන්සේගේ සිත පහදනේ නම් ඉතා යෙහෙකැ" යි මේ වචන කී ය. මෙසේ කී කල්හි වෛදේහීපුත්‍ර මගධෙශ්වර අජාතශත්‍රු රජ තෙමේ තූෂ්ණීම්භූත විය.

3. අන් කිසි රජ ඇමැත්තෙක් ද වෛදේහීපුත්‍ර මගධෙශ්වර අජාතශත්‍රු රජ්ජහට "දේවයන් වහන්ස, මේ ගෝසාල මක්ඛලීහු පැවිදි පිරිසක් ඇත්තෝ ද, පැවිදි ගණයා ඇත්තෝ ද, ගණාචාර්‍ය ද වෙති. ප්‍රකට යහ. කීර්ති-මත් හ. තීර්ථංකර කෙනෙක. බෝහෝ දෙනා විසින් සාධු යැ යි සම්මත හ. රාත්‍රඥ හ. පැවිදිවූ බොහෝ කල් ඇත්තෝ ය. රජපරපුර දෙක තුනක් ඉක්මැ යන තරම් දික් කලක් ගෙවූවෝ ය. පැසිමි වයසට පැමිණියෝ ය. දේවයන් වහන්සේ ඒ ගෝසාල මක්ඛලීන් ඇසුරු කරන සේක් වා. ගෝසාල මක්ඛලීන් වෙත එළැඹ ඇසුරුකරන දේවයන් වහන්සේගේ සිත පහදනේ නම්, ඒ ඉතා යෙහෙකැ" යි මෙ බස් කී ය. මෙසේ කී කල්හි වෛදේහීපුත්‍ර මගධෙශ්වර අජාතශත්‍රු රජ තෙමේ තූෂ්ණීම්භූත විය.

4. අඤ්ඤතරෝ 'පි ඛො රාජාමච්චො රාජානං මාගධං අජාතසත්තුං වෙදෙහිපුත්තං එතදවොච: 'අයං දෙව **අජිතො** කෙසකම්බලො සඞ්ඝී චෙව ගණී ච ගණාචරියො ච ඤාතො යසස්සී තිත්ථංකරො සාධුසම්මතො බහුජනස්ස රත්තඤ්ඤූ චිරපබ්බජිතො අධිගතො වයො අනුප්පත්තො. තං දෙවො අජිතං කෙසකම්බලං පයිරුපාසතු. අප්පෙවනාම දෙවස්ස අජිතං කෙසකම්බලං පයිරුපාසතො චිත්තං පසීදෙය්‍ය'ති. එවං වුත්තෙ රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො තුණ්හී අහොසි.

5. අඤ්ඤතරෝ 'පි ඛො රාජාමච්චො රාජානං මාගධං අජාතසත්තුං වෙදෙහිපුත්තං එතදවොච: 'අයං දෙව **පකුධො** කච්චායනො[1] සඞ්ඝී චෙව ගණී ච ගණාචරියො ච ඤාතො යසස්සී තිත්ථංකරො සාධුසම්මතො බහුජනස්ස රත්තඤ්ඤූ චිරපබ්බජිතො අධිගතො වයො අනුප්පත්තො. තං දෙවො පකුධං කච්චායනං පයිරුපාසතු. අප්පෙවනාම දෙවස්ස පකුධං කච්චායනං පයිරුපාසතො චිත්තං පසීදෙය්‍ය' ති. එවං වුත්තෙ රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො තුණ්හී අහොසි.

6. අඤ්ඤතරෝ 'පි ඛො රාජාමච්චො රාජානං මාගධං අජාතසත්තුං වෙදෙහිපුත්තං එතදවොච: 'අයං දෙව **සඤ්ජයො** බෙලට්ඨපුත්තො සඞ්ඝී චෙව ගණී ච ගණාචරියො ච ඤාතො යසස්සී තිත්ථංකරො සාධුසම්මතො බහුජනස්ස රත්තඤ්ඤූ චිරපබ්බජිතො අධිගතො වයො අනුප්පත්තො. තං දෙවො සඤ්ජයං බෙලට්ඨපුත්තං පයිරුපාසතු. අප්පෙවනාම දෙවස්ස සඤ්ජයං බෙලට්ඨපුත්තං පයිරුපාසතො චිත්තං පසීදෙය්‍ය'ති. එවං වුත්තෙ රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො තුණ්හී අහොසි.

7. අඤ්ඤතරෝ'පි ඛො රාජාමච්චො රාජානං මාගධං අජාතසත්තුං වෙදෙහිපුත්තං එතදවොච: 'අයං දෙව නිගණ්ඨො **නාතපුත්තො** සඞ්ඝී චෙව ගණී ච ගණාචරියො ච ඤාතො යසස්සී තිත්ථංකරො සාධුසම්මතො බහුජනස්ස රත්තඤ්ඤූ චිරපබ්බජිතො අධිගතො වයො අනුප්පත්තො. තං දෙවො නිගණ්ඨං නාතපුත්තං පයිරුපාසතු. අප්පෙවනාම දෙවස්ස නිගණ්ඨං නාතපුත්තං පයිරුපාසතො චිත්තං පසීදෙය්‍ය'ති. එවං වුත්තෙ රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො තුණ්හී අහොසි.

8. තෙන ඛො පන සමයෙන **ජීවකො** කොමාරභච්චො රඤ්ඤො මාගධස්ස අජාතසත්තුස්ස වෙදෙහිපුත්තස්ස අවිදූරෙ තුණ්හීභූතො නිසින්නො හොති. අථ ඛො රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො ජීවකං කොමාරභච්චං එතදවොච: 'කිං පන සම්ම ජීවක කිං තුණ්හී ?'ති

---

1. කම්මාතො, කඤ්චි.

4. අන් එක්තරා රජඇමැත්තෙක් ද වෛදේහීපුත්‍ර මගධේශ්වර අජාතශත්‍රු රජුට "දේවයන් වහන්ස, මේ කෝශකම්බල අජිතයෝ සංඝී ද ගණී ද ගණාචාර්‍ය ද වෙති. ප්‍රකට වූ, කීර්තිමත් වූ, බොහෝ දෙනා විසින් සාධුසම්මත වූ, රාත්‍රඥ වූ, දික්වයස් ගිය, මහළු විය පැමිණි තීර්ථංකර කෙනෙක. දේවයන් වහන්සේ ඒ කෝශකම්බල අජිතයන් ඇසුරු කරන සේක් වා. කෝශකම්බල අජිතයන් වෙත එළැඹ ඇසුරු කරන දේවයන් වහන්සේගේ සිත පහදින්නේ නම් ඉතා යෙහෙකැ" යි මේ බස් කී ය. මෙසේ කී කලැ වෛදේහීපුත්‍ර මගධේශ්වර අජාතශත්‍රු රජ මුවෙන් කිසිත් නො බැණ හුන්නේ ය.

5. අන් එක් රජඇමැතියෙක් ද වෛදේහීපුත්‍ර මගධේශ්වර අජාතශත්‍රු රජුට "දේවයන්වහන්ස, කාත්‍යායනගෝත්‍රික මේ පකුධයෝ සංඝී ද ගණී ද ගණාචාර්‍ය ද වෙති. ප්‍රකට වූ, කීර්තිමත් වූ, බොහෝ දෙනා විසින් සාධුසම්මත වූ, රාත්‍රඥ වූ, පැවිදි වූ බොහෝ කල් ඇති, දික්වයස් ගිය, මහළු වියට පැමිණි තීර්ථංකර කෙනෙක. දේවයන්වහන්සේ ඒ කාත්‍යායන පකුධයන් වෙත එළැඹ ඇසුරු කරන සේක් වා. කාත්‍යායන පකුධයන් ඇසුරු කරන දේවයන් වහන්සේගේ සිත පහදනේ නම් ඉතා යෙහෙකැ" යි මේ බස් කී ය. මෙසේ කී කල්හි වෛදේහීපුත්‍ර මගධේශ්වර අජාතශත්‍රු රජ තෙමේ කිසිත් නො බැණ හුන්නේ ය.

6. අන් රජඇමැත්තෙක් ද වෛදේහී පුත්‍ර මගධාධිපති අජාතශත්‍රු රජුට "දේවයන් වහන්ස, මේ වෛරාටීපුත්‍ර සංජයයෝ සංඝී ද ගණී ද ගණාචාර්‍ය ද වෙති. බොහෝ දෙනා විසින් සාධු සම්මත වූ, රාත්‍රඥ වූ, පැවිදි වූ බොහෝ කල් ඇති, දික් වයස් ගිය, පැසිම් වයසට පැමිණි, ප්‍රකට වූ, කීර්තිමත් තීර්ථංකර කෙනෙක. දේවයන් වහන්සේ ඒ වෛරාටීපුත්‍ර සංජයයන් ඇසුරු කරන සේක් වා. වෛරාටීපුත්‍ර සංජයයන් ඇසුරු කරන දේවයන් වහන්සේගේ සිත පැහැදෙන්නේ නම් ඒ ඉතා යෙහෙකැ" යි මෙ බස් කී ය. මෙසේ කී කල්හි වෛදේහීපුත්‍ර මගධේශ්වර අජාතශත්‍රු රජ තෙමේ කිසිත් නො බැණ හුන්නේ ය.

7. අන් රජඇමැත්තෙක් ද වෛදේහීපුත්‍ර වූ මගධාධිපති අජාතශත්‍රු රජුට "දෙවයන් වහන්ස, මේ ඥාතපුත්‍ර නිර්ග්‍රන්ථයෝ සංඝී ද ගණී ද ගණාචාර්‍ය ද වෙති. බොහෝ දෙනා විසින් සාධුසම්මත වූ, රාත්‍රඥ වූ, පැවිදි වූ බොහෝ කල් ඇති, දික් කලක් ගත කළ, මහළු විය පත්, ප්‍රකට වූ, කීර්තිමත් තීර්ථංකර කෙනෙකි. දේවයන් වහන්සේ ඒ ඥාතපුත්‍ර නිර්ග්‍රන්ථයන් ඇසුරු කරන සේක් වා. ඥාතපුත්‍ර නිර්ග්‍රන්ථයන් ඇසුරු කරන දේවයන් වහන්සේගේ සිත පහදින්නේ නම් ඒ ඉතා යෙහෙකැ"යි කී ය. මෙසේ කී කල්හි වෛදේහීපුත්‍ර මගධේශ්වර අජාතශත්‍රු රජ තෙමේ කිසිත් නො බැණ හුන්නේ ය.

8. එ වේලෙහි වනාහි කෝමාරභච්ච ජීවක තෙමේ වෛදේහී පුත්‍ර මගධාධිපති අජාතශත්‍රු රජුට තොදුරෙහි නිහඬ වැ හුන්නේ වෙයි. ඉක්බිත්තෙන් වෛදේහීපුත්‍ර මගධාධිපති අජාතශත්‍රු රජ තෙමේ කෝමාරභච්ච ජීවකයා අමතා, "යහළු ජීවකය, ශ්‍රමණතා වූ කලී කවර හෙයින් කිසිත් නො බැණ ඉන්නෙහි දැ?"යි කී ය.

"අයං දෙව භගවා අරහං සම්මාසම්බුද්ධො අම්හාකං අම්බවනෙ විහරති මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං අඩ්ඩතෙළසෙහි භික්ඛුසතෙහි. තං ඛො පන භගවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො: 'ඉති පි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා'ති. තං දෙවො භගවන්තං පයිරුපාසතු. අපෙවනාම දෙවස්ස භගවන්තං පයිරුපාසතො චිත්තං පසීදෙය්‍යා"ති.

"තෙන හි සම්ම ජීවක හත්ථියානානි කප්පාපෙහි"ති.

9. 'එවං දෙවා'ති ඛො ජීවකො කොමාරභච්චො රඤ්ඤො මාගධස්ස අජාතසත්තුස්ස වෙදෙහිපුත්තස්ස පටිස්සුත්වා[1] පඤ්චමත්තානි හත්ථිනිකා-සතානි[2] කප්පාපෙත්වා රඤ්ඤො ච ආරොහණීයං නාගං, රඤ්ඤො මාගධස්ස අජාතසත්තුස්ස වෙදෙහිපුත්තස්ස පටිවෙදෙසි: 'කප්පිතානි ඛො තෙ දෙව හත්ථියානානි යස්ස 'දානි කාලං මඤ්ඤසී'ති.

අථ ඛො රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො පඤ්චසු හත්ථිනිකාසතෙසු පච්චෙකා ඉත්ථියො ආරොපෙත්වා ආරොහණීයං නාගං අභිරුහිත්වා උක්කාසු ධාරියාමානාසු රාජගහමහා නිය්‍යාසි මහච්ච රාජානුභාවෙන. යෙන ජීවකස්ස කොමාරභච්චස්ස අම්බවනං තෙන පායාසි.

10. අථ ඛො රඤ්ඤො මාගධස්ස අජාතසත්තුස්ස වෙදෙහිපුත්තස්ස අවිදූරෙ අම්බවනස්ස අහුදෙව භයං අහු ඡම්භිතත්තං අහු ලොමහංසො. අථ ඛො රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො භීතො සංවිග්ගො ලොමහට්ඨජාතො ජීවකං කොමාරභච්චං එතදවොච: 'කච්චි මං සම්ම ජීවක න වඤ්චෙසි? කච්චි මං සම්ම ජීවක න පලම්භෙසි? කච්චි මං සම්ම ජීවක න පච්චත්තිකානං දෙසි? කථං හි නාම තාවමහතො භික්ඛුසඞ්ඝස්ස අඩ්ඩතෙළසානං භික්ඛුසතානං නෙව ඛිපිතසද්දො භවිස්සති න උක්කාසිතසද්දො න නිග්ඝොසො?'ති.

"මා භායි මහාරාජ[3] න තං දෙව වඤ්චෙමි. න තං දෙව පලම්භෙමි. න තං දෙව පච්චත්තිකානං දෙමි. අභික්කම මහාරාජ, අභික්කම මහාරාජ. එතෙ මණ්ඩලමාළෙ[4] දීපා ඣායන්ති"ති.

---

1. පටිස්සුණිත්වා, මජ්ඣං. 2. හත්ථිකා, සී හත්ථිනියො, කත්ථචි.
3. මා භායි මහාරාජ මා භායි මහාරාජ, සීහළ. 4. මණ්ඩලසාළෙ, මජ්ඣං.

එ විට කෝමාරභච්ච ජීවක කියනුයේ, "දෙවයන් වහන්ස, මේ භාග්‍යවත් අර්හත් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ එක්දහස් දෙසිය පණසක් පමණ භික්ෂූන් ඇති මහත් භික්ෂුසමූහයක් හා අපේ අඹවෙතෙහි වැඩ වසන සේක. 'ඒ භාග්‍යවතුන් වහන්සේ මේ මේ ගුණයින් අර්හත් ය, සම්‍යක්සම්බුද්ධ ය, විද්‍යාචරණසම්පන්න ය, සුගත ය, ලෝකවිත් ය, නිරුත්තර පුරුෂදම්‍යසාරථි ය, දෙවිමිනිස්නට ශාස්තෘ ය, බුද්ධ ය, භාග්‍යවත් යැ' යි ඒ භාග්‍යවත් ගෞතමයන් වහන්සේ පිළිබඳ වැ මෙසේ කල්‍යාණ වූ කීර්තිශබ්දයෙක් උස් වැ නැංගේ ය. මහරජ තෙමේ ඒ භාගවතුන් වහන්සේ වෙත එළැඹ ඇසුරු කෙරේ වා. ඒ භාග්‍යවතුන් වහන්සේ ඇසුරු කරන මහරජහුගේ සිත පැහැදෙන්නේ නම් ඒ ඉතා යෙහෙකි"යි කියේ ය.

"යහළු, ජීවකය, එසේ නම් හස්තියානයන් සරසව"යි රජ කී ය.

9. 'දේවයිනි, එසේ යැ'යි කියා, කෝමාරභච්ච ජීවක තෙමේ වෛදේහී-පුත්‍ර වූ මගධෙශ්වර අජාතශත්‍රු රජුට පිළිවදන් දී (පිරිවර ස්ත්‍රීන් සඳහා) පන්සියක් පමණ ඇතින්නන් සරසවා, රජුට ද නැඟීමට සුදුසු ඇතකු සදවා, වෛදේහීපුත්‍ර වූ මගධෙශ්වර අජාතශත්‍රු රජුට "දේවයිනි, ඔබට හස්තියාන සරසවන ලදි. යම් ගමනකට දැන් කලැ යි ඔබ සිතත් නම් එය කරන්නැ"යි දැන්වී ය.

එ විට වෛදේහීපුත්‍ර මගධෙශ්වර අජාතශත්‍රු රජ පන්සියක් ඇතින්නන් මතැ එක් එක් ස්ත්‍රිය බැගින් නංවා, තෙමේ තමාට නැඟීමට සුදුසු ඇතු පිට නැඟ, දඹුවැට පහන් දරනු ලබන කල්හි, මහත් රාජර්ද්ධියෙන් රජගහ නුවරින් නික්මුණේ ය. නික්මැ කෝමාරභච්ච ජීවකයාණේ අඹවනය කරා ගියේ ය.

10. ඉක්බිත්තෙන් අඹවනයට නොදුරෙහිදී වෛදේහීපුත්‍ර වූ මගධාධි-පති අජාතශත්‍රු රජුට බියෙක් වූයේ ම ය, ඇඟ වෙවුලුමෙක් වූයේ ම ය, ලොමුදහ ගැන්මෙක් වූයේ ම ය. එ විට ...අජාතශත්‍රු රජතෙමේ බිය ගත්තේ, කැතිගත්තේ, හටගත් ලොමුදහ ගැනුම් ඇත්තේ, කෝමාරභච්ච ජීවකයා අමතා "කිමෙක් ද? යහළු ජීවකය, මට වංචා නො කෙරෙහි ද, කිමෙක් ද යහළු ජීවකය, මා නො රවටයි ද? කිමෙක් ද, යහළු ජීවකය, මා සතුරනට පාවා නො දෙයි ද? භික්ෂූන් එක්දහස් දෙසිය පණසක් පමණ වූ ඒ සා මහත් භික්ෂුසමූහයකගේ කිවිසුම් හඬෙක් කෙසේ නම් නො වන්නේ ද? උකැසි හඬෙක් හෝ කෙසේ නම් නො වන්නේ ද? කටහඬෙක් හෝ කෙසේ නම් නො වන්නේ ද?"යි ඇසී ය.

එ විට "මහ රජාණනි, බිය නො ගත්තැ. දේවයිනි, ඔබට වංචා නො කරමි. දේවයිනි, ඔබ නො රවටමි. දේවයිනි, ඔබ සතුරනට පාවා නො දෙමි. මහරජාණනි, ඉදිරියට වඩින්නැ. මහරජාණනි, ඉදිරියට වඩින්නැ. තෙල, මණ්ඩලමාළයෙහි (වට හලෙහි හෙවත් හිඳුනා හලෙහි) පහන් දැල්වේ" යැ යි කෝමාරභච්ච ජීවක කී ය.

11. අථ ඛො රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො යාවතිකා නාගස්ස භූමි නාගෙන ගන්ත්වා නාගා පච්චොරොහිත්වා පත්තිකො 'ව යෙන මණ්ඩලමාළස්ස ද්වාරං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ජීවකං කොමාරභච්චං එතදවොච: කහං පන සම්ම ජීවක භගවා'ති.

"එසො මහාරාජ භගවා. එසො මහාරාජ භගවා මජ්ඣිමං ථම්භං නිස්සාය පුරත්ථාභිමුඛො නිසින්නො පුරක්ඛතො භික්ඛුසඞ්ඝස්සා"ති.

12. අථ ඛො රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො තුණ්හීභූතං තුණ්හීභූතං භික්ඛුසඞ්ඝං අනුවිලොකෙත්වා රහදම්ව විප්පසන්නං, උදානං උදානෙසි: 'ඉමිනා මෙ උපසමෙන උදායිභද්දො[1] කුමාරො සමන්නාගතො හොතු යෙනෙතරහි උපසමෙන භික්ඛුසඞ්ඝො සමන්නාගතො'ති.

"අගමා ඛො ත්වං මහාරාජ යථාපෙමං"ති ?

"පියො මෙ භන්තෙ උදායිභද්දො[1] කුමාරො. ඉමිනා මෙ භන්තෙ උපසමෙන උදායිභද්දො[1] කුමාරො සමන්නාගතො හොතු යෙනෙතරහි උපසමෙන භික්ඛුසඞ්ඝො සමන්නාගතො"ති.

13. අථ ඛො රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො භගවන්තං අභිවාදෙත්වා භික්ඛුසඞ්ඝස්ස අඤ්ජලිපණාමෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො භගවන්තං එතදවොච: "පුච්ඡෙය්‍යාමහං භන්තෙ භගවන්තං කිඤ්චිදෙව දෙසං, සචෙ මෙ භගවා ඔකාසං කරොති පඤ්හස්ස වෙය්‍යාකරණායා"ති.

"පුච්ඡ මහාරාජ යදාකඞ්ඛසී"ති.

14. "යථා නු ඛො ඉමානි භන්තෙ පුථුසිප්පායතනානි සෙය්‍යථීදං[2]: හත්ථාරොහා අස්සාරොහා රථිකා ධනුග්ගහා[3] වෙලකා වලක්ඛා පිණ්ඩදායකා[4] උග්ගා රාජපුත්තා පක්ඛන්දිනො මහාතාගා සූරා චම්මයොධිනො දාසකපුත්තා[5] ආලාරිකා[6] කප්පකා නහාපකා[7] සූදා[8] මාලාකාරා[9] රජකා පෙසකාරා තලකාරා[10] කුම්භකාරා ගණකා මුද්දිකා, යානි වා පනඤ්ඤානි'පි එවංගතිකානි[11] පුථුසිප්පායතනානි, තෙ දිට්ඨෙව ධම්මෙ සන්දිට්ඨිකං සිප්පඵලං උපජීවන්ති. තෙ තෙන අත්තානං සුඛෙන්ති පීනෙන්ති.[12] මාතාපිතරො සුඛෙන්ති පීනෙන්ති. පුත්තදාරං සුඛෙන්ති පීනෙන්ති. මිත්තාමච්චෙ සුඛෙන්ති පීනෙන්ති. සමණෙසු බ්‍රාහ්මණෙසු[13] ඌධග්ගිකං දක්ඛිණං පතිට්ඨාපෙන්ති[14] සොවග්ගිකං සුඛවිපාකං සග්ගසංවත්තනිකං. සක්කා නු ඛො භන්තෙ එවමෙව[15] දිට්ඨෙව ධම්මෙ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පඤ්ඤපෙතුන්ති".[16]

---

1. උදායිභද්දො, සොසුමී. 2. සෙය්‍යථීදං, මජ්ඣං. 3. ධනුග්ගහා, සිත්‍රි.
4. °දායිකා, සිත්‍රි. දායකා PTS. 5 දාසිකා, මජ්ඣං.
6. ආලාරිකා, සිත්‍රි. 7. නහාපකා, මජ්ඣං. නහාපිකා, ඝ්‍ය.
8. සූරා, මජ්ඣං 9. මාල, මජ්ඣං. 10. තාල, ඝ්‍ය.
11. ගතානි, සී. I. 12 පීනෙන්ති, මජ්ඣං. පීණෙන්ති, ඝ්‍ය (සඞ්ඛ්‍යෙ)
13. සමණබ්‍රාහ්මණෙසු, සී. I. සිත්‍රි. 14. පතිට්ඨ, සී. I. 15. එවමෙවං, (කත්‍රෙව්.)
16. පඤ්ඤපෙන්ති, සී. I.

11. එක්කිති වෛදේහීපුත්‍ර මගධෙශ්වර අජාතශත්‍රු රජ ඇතුපිටින් යෑ හැකි තෙක් දුර ඇතු පිටින් ගොස්, ඇතුගෙන් බැස, පාගමන් ඇතියේ ම (පයින් ම) මණ්ඩලමාලද්වාරය (වට හල් දෙර) කරා එළැඹියේ ය. එළැඹැ කෝමාරභවව ජීවකයාගෙන් 'යහළු ජීවකය, භාග්‍යවත් තෙමේ කොහි ද?' යි ඇසී ය.

"මහ රජාණනි, තෙල භාග්‍යවතුන් වහන්සේ ය. මැදුම් ටැඹ නිසා (මැද කණුවට පිටු දී) පෙර දිගට මුහුන ලා, භික්ෂුසමූහයා විසින් පෙරටු කරන ලදු වැ තෙල වැඩ ඉන්නෝ භාග්‍යවතුන් වහන්සේ යැ"යි කෝමාරභවව ජීවක කී ය.

12. එ විට වෛදේහීපුත්‍ර වූ මගධෙශ්වර අජාතශත්‍රු රජ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ ය. එළැඹ පසෙක සිටියේ ය. එසේ සිටි රජ තෙමේ වෙසෙසින් පහන් වූ, කැළැඹුම් නැති විලක් සේ බැලූ බැලූ පැත්තෙහි තුණිම්හුත වැ හුන් භික්ෂුසඞ්ඝයා දෙස නැවත කැවත බලා, "දැන් මේ භික්ෂුසඞ්ඝා යම් සංහුත්බවෙකින් යුක්ත ද මගේ උදයිභද්‍ර කුමාර තෙමේ ද මෙ බඳු වූ ම සංහුත්බැවින් සමන්විත වේ වා"යි උදන් ඇතී ය.

එ විට, භාග්‍යවතුන් වහන්සේ "මහරජ, තොප සිත ප්‍රේමය ඇති දෙසට ගියේ වේ ද"යි වදාළ සේක.

"වහන්ස, උදයිභද්‍ර කුමාර තෙමේ මට ප්‍රිය ය. වහන්ස, භික්ෂුසංඝයා දැන් යම් බඳු සංගිදීමෙකින් සමන්විත ද, මගේ උදයිභද්‍ර කුමාර තෙමේ මෙ බඳු වූ සංගිදීමෙන් සමන්විත වේ වා"යි රජ කී ය.

13. එක්කිති වෛදේහීපුත්‍ර මගධාධිපති අජාතශත්‍රු රජ භාග්‍යවතුන් වහන්සේ ආදරයෙන් වැඳ, භික්ෂුසංඝයා ද ඇඳිලි බැඳ වැඳ, පසෙක ඉඳ ගත්තේ ය. පසෙක හිඳගත් රජ තෙමේ "වහන්ස, ඉඳින් භාග්‍යවතුන් වහන්සේ පැණයක් විසඳන්නට කිසි ලේශමාත්‍ර අවකාශයක් ගන්නා සේක් නම්, මම විචාරන්නෙමි"යි භාග්‍යවතුන් වහන්සේට කී ය.

"මහරජ, ඉඳින් කැමැත්තෙහි නම් විචාරන්නැ"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

14. "වහන්ස, යම්සේ ඇතරුවෝ ය, අසරුවෝ ය, රියරුවෝ ය, දුනුවාවෝ ය, දියදද දරනුවෝ ය, සෙත් විදහනුවෝ ය, සැඟැසි මහ සෙබලෝ ය, යුද වදිනා උසස් රජපුත්තු ය, යුද මැදට පැනවදුනා යෝධයෝ ය, ඇතුන් බඳු මහ සෙබලෝ ය, හුදෙකලා වැ යුද වදිනා සෙබලෝ ය, සම්සැට්ටයෙන් වැසී හෝ පලිහත් දරා යුද කරන්නෝ ය, ගෙහි ම වූ ගෘහදාස යෝධයෝ ය, මේ වඩන්නෝ ය, ඇම්බැට්ටයෝ ය, නාවන්නෝ ය, සූපකාරයෝ ය, මාලාකාරයෝ ය, රජකයෝ ය, පෙහෙරැ ය, කුලුපොත්තෝ ය, කුඹල්ලු ය, අවශිෂ්ට ගණකයෝ ය, හස්තමුද්‍රා ගණකයෝ ය යන මොවුන් පුරුදු පුහුණු කරන ශිල්ප කෙනෙක් වෙත් ද, මෙබඳු වූ යම් අන්‍ය බොහෝ ශිල්පයෝ හෝ වෙත් ද, ඔහු හැම මෙ අත්බවිහි ම තමන් විසින් ම අත් දැක්කැ හැකි ඵල ඇති ශිල්ප නිසා දිවි රකිත්. ඔහු එසින් තමන් සුවපත් කෙරෙත්, පිනවත්. මාපියන් සුවපත් කෙරෙත්, පිනවත්. අඹුදරුවන් සුවපත් කෙරෙත්, පිනවත්. මිත්‍රාමාත්‍යයන් (සග යහළුවන්) සුවපත් කෙරෙත්, පිනවත්. මත්තෙහි පල දෙන සග සැපතට සුදුසු සුඛවිපාක ඇති සඟහිය පිණිස පවත්නා දන් මහණ-බමුණන් කෙරෙහි පිහිටුවත්. වහන්ස, මෙසේ ම මහණ දමෙහි සාන්දෘෂ්ටික (මෙහි ම අත්දැක්කැ හැකි) ඵලවිපාකයක් පණවන්නට (දක්වන්නට) හැකි ද?" යි රජ විචාළේ ය.

15. "අභිජානාසි නො ත්වං මහාරාජ ඉමං පඤ්හං අඤ්ඤෙසු සමණ-බ්‍රාහ්මණෙ පුච්ඡිතා"ති.

"අභිජානාමහං භන්තෙ ඉමං පඤ්හං අඤ්ඤෙසු සමණබ්‍රාහ්මණෙ පුච්ඡිතා"ති.

"යථාකථං පන තෙ මහාරාජ ව්‍යාකරිංසු, සචෙ තෙ අගරු භාසස්සූ"ති

"න ඛො මෙ භන්තෙ ගරු යත්ථස්ස භගවා වා නිසින්නො භගවන්ත-රූපො වා" ති. "තෙන හි මහාරාජ භාසස්සූ"ති.

16. "එකමිදාහං භන්තෙ සමයං යෙන පූරණො කස්සපො තෙනුපසඞ්කමිං. උපසඞ්කමිත්වා පූරණෙන කස්සපෙන සද්ධිං සම්මොදිං. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිං. එකමන්තං නිසින්නො ඛො අහං භන්තෙ පූරණං කස්සපං එතදවොචං: යථා නු ඛො ඉමානි භො කස්සප පුථුසිප්පායතනානි සෙය්‍යථිදං හත්ථාරොහා -පෙ- යානි වා පනඤ්ඤානි'පි එවංගතිකානි පුථුසිප්පායතනානි. තෙ දිට්ඨෙව ධම්මෙ සන්දිට්ඨිකං සිප්පඵලං උපජීවන්ති. තෙ තෙන අත්තානං සුඛෙන්ති පීනෙන්ති මාතාපිතරො සුඛෙන්ති පීනෙන්ති පුත්තදාරං සුඛෙන්ති පීනෙන්ති මිත්තාමච්චෙ සුඛෙන්ති පීනෙන්ති සමණෙසු බ්‍රාහ්මණෙසු උඩ්ඩගාමිකං දක්ඛිණං පතිට්ඨාපෙන්ති සොවග්ගිකං සුඛවිපාකං සග්ගසංවත්තනිකං. සක්කා නු ඛො භො කස්සප එවමෙව දිට්ඨෙව ධම්මෙ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පඤ්ඤපෙතුන්ති.

17. එවං වුත්තෙ භන්තෙ පූරණො කස්සපො මං එතදවොච: කරොතො ඛො මහාරාජ කාරයතො ඡින්දතො ඡෙදාපයතො පචතො පාචයතො සොචයතො සොචාපයතො කිලමයතො[1] කිලමාපයතො ඵන්දයතො ඵන්දාපයතො පාණමතිපාතයතො අදින්නං ආදියතො සන්ධිං ඡින්දතො නිල්ලොපං හරතො එකාගාරිකං කරොතො පරිපන්ථෙ තිට්ඨතො පරදාරං ගච්ඡතො මුසා භණතො කරොතො න කරීයති පාපං. ඛුරපරියන්තෙන චෙ'පි චක්කෙන යො ඉමිස්සා පඨවියා[2] පාණෙ එකමංසඛලං එකමංසපුඤ්ජං කරෙය්‍ය, නත්ථි තතො නිදානං පාපං, නත්ථි පාපස්ස ආගමො. දක්ඛිණෙසු'පි ගඞ්ගාය[3] තීරං ගච්ඡෙය්‍ය හනන්තො ඝාතෙන්තො ඡින්දන්තො ඡෙදාපෙන්තො පචන්තො පාචෙන්තො, නත්ථි තතො නිදානං පාපං, නත්ථි පාපස්ස ආගමො. උත්තරෙසු'පි ගඞ්ගාය[3] තීරං ගච්ඡෙය්‍ය දදන්තො දාපෙන්තො යජන්තො යජාපෙන්තො, නත්ථි තතො නිදානං පුඤ්ඤං, නත්ථි පුඤ්ඤස්ස ආගමො. දානෙන දමෙන සංයමෙන සච්චවජ්ජෙන නත්ථි පුඤ්ඤං නත්ථි පුඤ්ඤස්ස ආගමො'ති.

---

1. කිලමෙතො, කෙසුචි. 2. කරතො ඵන්දතො, PTS.
3. ගංගාතීරං, PTS.

15. "මහරජ, ඔබ මේ පැණය අන් මහණබමුණන් අතින් විචාළා දන්නෝ ද (මතෙක ඇද්දැ) ?"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

"වහන්ස, මේ පැණය අන් මහණබමුණන් අතින් විචාළා දනිමි (මතෙක ඇතැ)"යි රජ කී ය.

"මහරජ, කෙසේ නම් ඔබට ඔහු මෙය විසැඳුවෝ ද ? ඉඳින් ඔබට බරෙක් නො වේ නම් එය කියන්නැ"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

"වහන්ස, භාග්‍යවතුන් වහන්සේ හෝ භාග්‍යවතුන් වහන්සේ වැන්නකු හෝ ඉන්නා තැනෙක එය කීම මට බරෙක් නො වේ"යැ යි රජ කී ය.

"මහරජ, එසේ නම් කියන්නැ"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

16. (එ විට රජ මෙසේ කී ය:) "වහන්ස, මම එක් වරෙක කාශ්‍යප පූරණයන් කරා එළැඹියෙමි. එළැඹ ඔහු හා සතුටු වීමි. සතුට උපදවන, සිතැ රැඳැවියැ යුතු කතාබස් අවසන් කොට පසෙක ඉඳ ගතිමි. වහන්ස, එසේ පසෙක ඉඳැගත් මම කාශ්‍යප පූරණයන් අමතා, 'භවත් කාශ්‍යපයිනි, යම් සේ ඇතරැවෝ ය, අසරැවෝ ය,... යන මොහු හැම මෙ අත්බව්හි ම තමන් විසින් අත් දැක්කැ හැකි පල ඇති ශිල්ප නිසා දිවි රකිත් ද, ඔහු එයින් තමන්... මා පියන්... අඹුදරුවන් .. මිත්‍රාමාත්‍යයන් සුවපත් කෙරෙත් ද පිනවත් ද, මහණබමුණන් කෙරෙහි... දන් පිහිටුවත් ද, භවත් කාශ්‍යපයිනි, එසේ ම මහණදමෙහි මෙහි ම අත් දැක්කැ හැකි ඵල විපාකයක් දක්වන්නට හැකි ද ?'යි මෙය විචාළෙමි.

17. 'වහන්ස, මෙසේ කී කල්හි කාශ්‍යප පූරණයෝ මට මෙය කීහ:

"මහරජ, තමා ම කරන්නහුට ද අනුන් ලවා කරවන්නහුට ද, අනුන්ගේ අත් ආදිය සිඳින්නහුට ද සිඳුවන්නහුට ද, අනුන් දඬු ආදියෙන් පෙළන්නහුට ද පෙළවන්නහුට ද, පරා සතු දැ පැහැරැ ගැනුම් ආදියෙන් මෙරමා තවන්නහුට ද අනුන් ලවා තවවන්නහුට ද, අහර වැළැක්වීම් ආදියෙන් අනුන් වෙහෙසන්නහුට ද මෙරමා ලවා වෙහෙසවන්නහුට ද, මෙරමා කම්පිත කරන්නහුට ද අනුන් ලවා කම්පිත කරවන්නහුට ද, පණ තසන්නහුට ද නස්වන්නහුට ද, නොදුන් දැ ගන්නහුට ද ගන්වන්නහුට ද, ගෙවල් බිඳින්නහුට ද බිඳුවන්නහුට ද, කිසිත් නො ඉතිරි කොට සියල්ල පැහැරැ ගන්නහුට ද පැහැරැ ගන්වන්නහුට ද, එක් ගෙයක් වටා සිට එහි ඇති බඩුමුට්ටු පැහැරැ ගන්නහුට ද ගන්වන්නහුට ද, මඟැ රැක සිට එහි යනෙනුවන්ගේ බඩු පැහැරැ ගන්නහුට ද, පරඹුවන් කරා යන්නහුට ද, මුසාවා නෙපලන්නහුට ද, පවක් කරමි යි සිතා කරන්ත-හුට ද පවෙක් නො කැරෙයි. යමෙක් කරකැත්තක් සේ තියුණු නිමි වලල්ලක් ඇති චක්‍රයකින් මේ පොළොවෙහි සතුන් මරා එක් මස්ගොඩක් එක් මස්රැසක් කරන්නේ නම්, ඒ හේතුයෙන් වත පවෙක් නැත, පාපයාගේ පැමිණීමක් නැත. සතුන් මරමින් මරවමින්, සිඳිමින් සිඳුවමින්, පෙළමින් පෙළවමින්, ගංගා නදියේ දකුණු තෙරට නමුදු යන්නේ නම්, ඒ හේතුයෙන් පවෙක් නැත, පවේ පැමිණීමෙක් නැත. දෙමින් දෙවමින්, යාග කරමින් කරවමින්, ගංගා නදියේ උතුරු තෙරට නුමුදු යන්නේ නම් ඒ හේතුයෙන් පිනෙක් නැත, පින් පැමිණීමෙක් නැත. දීමෙන්, ඉඳුරන් දැමීමෙන් (හෝ පෙහෙවස් විසීමෙන්) ශීලසංය-මයෙන්, සබවස් රැකීමෙන් පිනෙක් නැත, පින් පැමිණීමෙක් නැත" යනු යි.

ඉත්ථං ඛො මෙ භන්තෙ පූරණො[1] කස්සපො සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුට්ඨො සමානො අකිරියං ব්‍යාකාසි.[2]

සෙය්‍යථාපි භන්තෙ අම්බං වා පුට්ඨො ලබුජං ව්‍යාකරෙය්‍ය[2] ලබුජං වා පුට්ඨො අම්බං ව්‍යාකරෙය්‍ය[2], එවමෙව ඛො මෙ භන්තෙ පූරණො[1] කස්සපො සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුට්ඨො සමානො අකිරියං ව්‍යාකාසි.[2]

තස්ස මයහං භන්තෙ එතදහොසි: 'කථං හි නාම මාදිසො සමණං වා බ්‍රාහ්මණං වා විජිතෙ වසන්තං අපසාදෙතබ්බං මඤ්ඤෙය්‍යා'ති. සො ඛො අහං භන්තෙ පූරණස්ස කස්සපස්ස භාසිතං නෙව අභිනන්දිං නප්පටික්කොසිං.[3] අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා අනත්තමනො අනත්තමනවාචං අනිච්ඡාරෙත්වා තමෙව වාචං අනුග්ගණ්හන්තො[4] අනිකුජ්ජන්තො[5] උට්ඨායාසනා පක්කාමිං.[6]

18. එකමිදාහං භන්තෙ සමයං යෙන මක්ඛලි ගොසාලො තෙනුප-සංකමිං. උපසංකමිත්වා මක්ඛලිනා ගොසාලෙන[7] සද්ධිං සම්මොදිං. සම්මොදනීයං කථං සාරාණීයං[8] වීතිසාරෙත්වා එකමන්තං නිසීදිං. එකමන්තං නිසින්නො ඛො අහං භන්තෙ මක්ඛලිං ගොසාලං[9] එතදවොචං:[10] 'යථා නු ඛො ඉමානි භො ගොසාල පුථුසිප්පායතනානි සෙය්‍යථීදං: හත්ථාරොහා -පෙ- සක්කානු ඛො භො ගොසාල එවමෙව දිට්ඨෙව ධම්මෙ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පඤ්ඤපෙතුන්ති.

19. එවං වුත්තෙ භන්තෙ මක්ඛලි ගොසාලො මං එතදවොච: 'නත්ථි මහාරාජ හෙතු නත්ථි පච්චයො සත්තානං සංකිලෙසාය. අහෙතු අප්පච්චයා සත්තා සංකිලිස්සන්ති. නත්ථි හෙතු නත්ථි පච්චයො සත්තානං විසුද්ධියා. අහෙතු අප්පච්චයා සත්තා විසුජ්ඣන්ති. නත්ථි අත්තකාරෙ නත්ථි පරකාරෙ නත්ථි පුරිසකාරෙ නත්ථි බලං නත්ථි වීරියං නත්ථි පුරිසථාමො නත්ථි පුරිසපරක්කමො. සබ්බෙ සත්තා සබ්බෙ පාණා සබ්බෙ භූතා සබ්බෙ ජීවා අවසා අබලා අවීරියා නියතිසඞ්ගතිභාවපරිණතා ඡස්සෙවාභිජාතිසු සුඛදුක්ඛං පටිසංවෙදෙන්ති.

චුද්දස ඛො පනිමානි යොනිප්පමුඛසතසහස්සානි සට්ඨි ච සතානි ඡ ච සතානි, පඤ්ච ච කම්මුනො සතානි, පඤ්ච ච කම්මානි, තීණි ච කම්මානි, කම්මෙ ච අඩ්ඩකම්මෙ ච.

---

1 පුරාණො, මජ්ඣං. 2. ව්‍යා, PTS. 3. නප්පටික්කොසිං, PTS.
4. අනුග්ගණ්හාන්තො, PTS 5. අනිකුජ්ජන්තො, මජ්ඣං. ස්‍යා.
6 පක්කාමිං, මජ්ඣං. 7. මක්ඛලිගොසාලෙන, PTS. 8. සාරණීයං, මජ්ඣං.
9. මක්ඛලිගොසාලං, PTS. 10. එතදවොච, PTS.
11. පඤ්ඤපෙන්ති PTS.

වහන්ස, මෙසේ කාශ්‍යප පූරණයෝ මා විසින් සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍ය ඵලය විචාරන ලදුවෝ ම අක්‍රියාවාදය දැක්වූහ. වහන්ස, අඹ කෙබඳු ද? සි විචාරන ලදුයේ දෙල් මෙබඳු යැ සි කියන්නේත් දෙල් විචාරන ලදු වැ අඹ මෙබඳු යැ සි කියන්නේත් යම්සේ ද, එසේ ම වහන්ස, කාශ්‍යප පූරණයෝ මා විසින් සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍යඵලය විචාරන ලදුවෝ ම අක්‍රියාවාදය පැවැසූහ.

වහන්ස, ඒ මට 'මා වැන්නෙක් සිය රටෙහි වසන මහණකු හෝ බමුණකු පෙළියැ යුතු කොට කෙසේ නම් සිතනු හැක්කේ ද?' සි මේ සිත විය. වහන්ස, ඒ මම කාශ්‍යප පූරණයන්ගේ වචනය නො පැසැසීමි. විරුද්ධ බසකුදු නො කීමි. නො පසසා විරුදු බසක් ද නො කියා, නො සතුටු සිතැත්තෙමි, නොසතුටු බසක් නො නික්මවා, ඔවුන් බස සාර වශයෙන් නො ගන්නෙමි, සාර වශයෙන් සිතැ නො තබන්නෙමි, උකස්තෙන් නැගී නික්මණිමි.

18. වහන්ස, අන් එක් වරෙක මම ගෝසාල මක්කලීන් වෙත එළැඹියෙමි. එළැඹ ඔවුන් හා සතුටු වීමි. සතුටට කරුණු වූ සිතැ රැඳැවියැ යුතු වූ කතා බස් කොට අවසනැ පසෙක ඉඳ ගතිමි. පසෙක ඉඳ ගත්තෙමි, වහන්ස, මම ගෝසාල මක්කලිහු අමතා, 'භවත් ගෝසාලයිනි, යම් සේ ඇතැරුවෝ ය අසරුවෝ ය ... යන මොහු හැම මේ අත්බවිහි ම තමන් විසින් දැක්කැ හැකි ඵල විපාක ඇති ශිල්ප නිසා දිවි රකින් ද, ඔහු එසින් තමන්... මාපියන්... අඹුදරුවන්... හා යහළුවන් සුවපත් කෙරෙත් ද, පිතවත් ද, මහණබමුණන් විෂයයෙහි... දන් පිහිටුවත් ද, භවත් ගෝසාලයිනි, මෙසේ ම මහණදමෙහි මෙහි ම අත් දැක්කැ හැකි ඵලවිපාක-යක් දක්වන්නට හැකි ද?'සි මෙය විචාළෙමි.

19. වහන්ස, මෙසේ විචාළ කල්හි ගෝසාල මක්කලිහු මට මෙය කිහ: "මහරජ, සත්ත්වයන්ගේ කෙලෙසීමට හේතුවෙක් ප්‍රත්‍යය-යෙක් නැත. හේතුවක් නැති වැ ප්‍රත්‍යයයක් නැති වැ (ඉබේ ම) සත්ත්වයෝ කෙලෙසෙත්. සත්ත්වයන්ගේ පිරිසිදු වීමට ද හේතුවෙක් නැත, ප්‍රත්‍යයයෙක් නැත. හේතු නැති වැ ප්‍රත්‍යය නැති වැ සත්ත්වයෝ පිරිසිදු වෙත්. තමාගේ යහපත සඳහා තමා විසින් කළ යුතු කමියෙක් නැත. අනුන්ගේ යහපත සඳහා කළයුතු අවවාදානුශාසනාදි කමියෙක් ද නැත. කරන්නහු සැපතට පමුණුවන... පුරුෂ කාරියෙක් ද නැත. සැපත් ලබනුවට ඉවහල් වන බලය කියා එකෙක් නැත. වීර්ය කියා එකෙක් නැත. පුරුෂශක්තිය කියා එකෙක් නැත. පුරුෂ පරාක්‍රමය කියා එකෙක් නැත. හැම සත්තු හැම ප්‍රාණීහු හැම භූතයෝ හැම ජීවයෝ තමන්ගේ ශක්තියක් බලයක් වීර්යයක් නැත්තෝ ම නියමය, සංගතිය (තම තමා අයත් වර්ගයට පැමිණීම), ස්වභාවය යන මේ තුනින් පරිණාමයට පැමිණියෝ අභිජාති සයෙක්හි ම සැප දුක් විඳිත්.

මේ ප්‍රමුඛ යෝනිහු තුදුස් ලක්ෂ හදහස් හසියෙකි. කම් පන්සියෙකි. (අන් සැටියෙකින්) කම් පසෙක් ද කම් තුනෙක් ද වෙත්. (කායවාක්-කම් වූ) පුණ කම් ද, (මනඃකම් වූ) අපි කම් ද වේ.

ඛත්තී පරිසා, ඛත්තීඅන්තරකප්පා, ජලිතිජාතියො, අට්ඨ පුරිස-භූමියො, එකූනපඤ්ඤස ආජීවකසතෙ, එකූනපඤ්ඤස පරිබ්බාජකසතෙ, එකූනපඤ්ඤස නාගාවාසසතෙ, වීසෙ ඉන්ද්‍රියසතෙ, තිංස නිරයසතෙ, ඡත්තිංස රජොධාතුයො, සත්ත සඤ්ඤීගබ්භා, සත්ත අසඤ්ඤීගබ්භා, සත්ත නිගණ්ඨීගබ්භා, සත්ත දෙවා, සත්ත මානුසා, සත්ත පෙසාචා, සත්ත සරා, සත්ත පවුටා, සත්ත පවුටසතානි, සත්ත පපාතා, සත්ත පපාතසතානි, සත්ත සුපිනා, සත්ත සුපිනසතානි, චූලාසීති මහාකප්පුනො සතසහස්සානි යානි බාලෙ ච පණ්ඩිතෙ ච සන්ධාවිත්වා සංසරිත්වා දුක්ඛස්සන්තං කරිස්සන්ති.

තත්ථ නත්ථි ඉමිනාහං සීලෙන වා වතෙන වා තපෙන වා බ්‍රහ්මචරියෙන වා අපරිපක්කං වා කම්මං පරිපාචෙස්සාමීති පරිපක්කං වා කම්මං ඵුස්ස ඵුස්ස බ්‍යන්තී කරිස්සාමීති හෙවං නත්ථි. දොණමිතෙ සුඛදුක්ඛෙ පරියන්තකතෙ. සංසාරෙ නත්ථි හායනවඩ්ඪනෙ, නත්ථි උක්කංසාවක්කංසෙ. සෙය්‍යථාපි නාම සුත්තගුළෙ ඛිත්තෙ නිබ්බෙඨියමානමෙව පලෙති, එවමෙව බාලෙ ච පණ්ඩිතෙ ච සන්ධාවිත්වා සංසරිත්වා දුක්ඛස්සන්තං කරිස්සන්තීති.

ඉත්ථං ඛො මෙ භන්තෙ **මක්ඛලි** ගොසාලො සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුට්ඨො සමානො සංසාරසුද්ධිං ඛ්‍යාකාසි. සෙය්‍යථාපි භන්තෙ අම්බං වා පුට්ඨො ලබුජං ඛ්‍යාකරෙය්‍ය, ලබුජං වා පුට්ඨො අම්බං ඛ්‍යාකරෙය්‍ය, එවමෙව ඛො මෙ භන්තෙ මක්ඛලි ගොසාලො සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුට්ඨො සමානො සංසාරසුද්ධිං ඛ්‍යාකාසි. තස්ස මය්හං භන්තෙ එතදහොසි: කථං හි නාම මාදිසො සමණං වා බ්‍රාහ්මණං වා විජිතෙ වසන්තං අපසාදෙතබ්බං මඤ්ඤෙය්‍යාති. සො ඛො අහං භන්තෙ මක්ඛලිස්ස ගොසාලස්ස භාසිතං නෙව අභිනන්දිං නප්පටික්කොසිං. අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා අත්තමනො අත්තමනවාචං අනිච්ඡාරෙත්වා තමෙව වාචං අනුඤ්ඤාණහනෙතා අතික්කුජ්ජෙතා උට්ඨායාසනා පක්කාමිං.

20. එකමිදාහං භන්තෙ සමයං යෙන **අජිතො** කෙසකම්බලො[1] තෙනුපසඞ්කමිං. උපසඞ්කමිත්වා අජිතෙන කෙසකම්බලෙන[2] සද්ධිං සම්මොදිං. සම්මොදනීයං කථං සාරාණීයං[3] වීතිසාරෙත්වා එකමන්තං නිසීදිං. එකමන්තං නිසින්නො ඛො අහං භන්තෙ අජිතං කෙසකම්බලං[4] එතදවොචං:[5] 'යථා නු ඛො ඉමානි භො අජිත පුථුසිප්පායතනානි සෙය්‍යථිදං[6] හත්ථාරොහා -පෙ- සක්කා නු ඛො භො අජිත[7] එවමෙව දිට්ඨෙව ධම්මෙ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පඤ්ඤපෙතුන්ති ?'[8].

---

1. කෙසකම්බලි, කත්ථචි. 2. කෙසකම්බලිනා, කත්ථචි
3. සාරණීයං. මජ්ඣං. 4. කෙසකම්බලිං, කත්ථචි
5. එතදවොච, කත්ථචි 6. සෙය්‍යථිදං, මජ්ඣං. 7. ඛො අජිතො, කත්ථචි
8. පඤ්ඤපෙන්ති, මජ්ඣං.

ප්‍රතිපත්ති දෙසැටෙකි. අන්තඃකල්ප දෙසැටෙකි. අභිජාති සයෙකි. පුරුෂභූමි අටෙකි. ජීවිකාවෘත්ති සාරදහස් නවසියෙකි. පරිව්‍රාජකයන් පිළිබඳ ප්‍රව්‍රජ්‍යා සාරදහස් නවසියෙකි. නාගමණ්ඩල සාරදහස් නවසියෙකි. ඉන්ද්‍රියයෝ දෙදහසෙකි. නිරයයෝ තුන්දහසෙකි. අත්පිටු පාපිටු ආදි ගුලි තැවැරෙන තැන් සතිසෙකි. සංඥීගර්භ සතෙකි. අසංඥී ගර්භ සතෙකි. නිර්ග්‍රන්ථගර්භ සතෙකි. (පුරුකින් පැල වෙත උක් හුණ ආදි ගර්භ සතෙකි.) දෙව වර්ග සතෙකි. මනුෂ්‍යවර්ග සතෙකි පිශාච ජාති සතෙකි. මහවිල් සතෙකි. මහාපරිවර්ත සතෙකි. කුඩා පරිවර්ත සත්සියෙකි. මහාප්‍රපාත සතෙකි. කුඩා ප්‍රපාත සත්සියෙකි. මහාසඞ්ඝට්ට සතෙකි. කුඩා සඞ්ඝට්ට සත්සියෙකි. අනුවණයනුත් නුවණැත්තනුත් සසරැ දිවැ හැවිද දුක් කෙළවර කිරීමට ගෙවියැ යුතු කල්ප අසූසාර ලක්ෂයෙකි.

එහි මේ ශීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තපසින් හෝ බඹසරින් හෝ නොමුහු කල කර්මය මුහුකුරුවත්නෙමි යි කියා කල යුත්තෙක් නැත. මුහුකල කර්මය විඳ විඳ ක්ෂීණ කරත්නෙමි යි කියා හෝ මෙසේ කල යුතු දෙයක් නැත. ද්‍රෝණයෙන් මැන ප්‍රමාණවත් කරන ලද්දක් සේ සුව දුක් දෙක (කියනලද කාල සීමාව ගෙවුණු කල්හි) කෙළවර කැරැණේ වෙයි. සසර ගමනෙහි අඩු වීමෙක් වැඩි වීමෙක් නැත. නැගීමෙක් බැසීමෙක් නැත. යම්සේ දමාලූ හුවටෙක් ලිහෙමින් දිග ඇති තෙක් ම යේ ද, එසින් මතු නො යේ ද, එ පරිදි ම අනුවණයෝත් නුවණැත්තෝත් (සසරැ) දිව හැවිද දුක් කෙළවර කරත්නාහ' යනු යි.

වහන්ස, මෙසේ ගෝසාල මක්ඛලිපුත්‍ර මා විසින් සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍යඵලය විචාරන ලදුවෝ ම සංසාරශුද්ධිවාදය පැවැසූ හ. වහන්ස, අඹ කෙබඳු දැ යි විචාරන ලදුයේ දෙල් මෙබඳු යැ යි කියන්නේත් දෙල් කෙබඳු දැ යි විචාරන ලදුයේ අඹ මෙබඳු යැ යි කියන්නේත් යම්සේ ද, එ සේ ම ගෝසාල මක්ඛලිපුත්‍ර මා විසින් සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍යඵලය විචාරන ලදුවෝ ම සංසාර ශුද්ධිය පැවැසූහ.

වහන්ස, ඒ මට 'මා වැන්නෙක් සිය රටැ වසන මහණකු හෝ බමුණකු පෙළියැ යුතු කොට කෙසේ නම් සිතියැ හැකි ද'යි මේ සිත විය. වහන්ස, ඒ මම ගෝසාල මක්ඛලිත්ගේ වචනය නො පැසැසීමි, එයට විරුද්ධ බසකුත් නො කීමි. මෙසේ නො පසසා, නො ද විරුදු බසක් කියා, නො සතුටු සිතැත්තෙමි නුමුදු, නො සතුටු බසක් නො නික්මවා, එ ම බස සාර වශයෙන් නො ගන්නෙමි, සාර වශයෙන් සිතැ ද නො තබන්නෙමි, හුතස්තෙන් නැගී නික්මිණිමි.

20. වහන්ස, මම එක් විටෙක කේශකම්බල අජිතයන් කරා එළැඹියෙමි. එළැඹ ඔහු හා සතුටු වීමි. සතුටට කරුණු වූ සිතැ රැඳැවියැ යුතු වූ කතා බස් නිමවා එක් පසෙක හිඳැ ගතිමි. එසේ හිඳැ ගත්තෙමි, ඔහු අමතා 'භවත් අජිතයෙනි, යම්සේ ඇතරුවෝ ය අසරුවෝ ය ... යන මොහු හැම මේ අත්බව්හි ම තමන් විසින් දැක්කැ හැකි ඵල ඇති ශිල්ප නිසා ජීවත් වෙත් ද, ඔහු එසින් තමන්... තම මාපියන්... අඹුදරුවන්... මිත්‍රාමාත්‍යයන් සුව පත් කෙරෙත් ද, පිනවත් ද, මහණබමුණන් විෂයයෙහි... දන් පිහිටුවත් ද, භවත් අජිතයෙනි, මෙසේ ම මහණදමෙහිත් මේ අත්බව්හි මැ දැක්කැ හැකි ඵල විපාකයක් දක්වන්නට හැකි ද ?'යි මෙය විචාළෙමි.

එවං වුත්තෙ භන්තෙ **අජිතො** කෙසකම්බලො[1] මං එතදවොච: "නත්ථි මහාරාජ දින්නං. නත්ථි යිට්ඨං. නත්ථි හුතං. නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො. නත්ථි අයං ලොකො. නත්ථි පරො[2] ලොකො. නත්ථි මාතා. නත්ථි පිතා. නත්ථි සත්තා ඔපපාතිකා. නත්ථි ලොකෙ සමණබ්‍රාහමණා සම්මග්ගතා[3] සම්මාපටිපන්නා යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්ති. චාතුම්මහාභූතිකො අයං පුරිසො යදා කාලං කරොති, පඨවී පඨවිකායං අනුපෙති අනුපගච්ඡති. ආපො ආපොකායං අනුපෙති අනුපගච්ඡති. තෙජො තෙජොකායං අනුපෙති අනුපගච්ඡති. වායො වායොකායං අනුපෙති අනුපගච්ඡති. ආකාසං ඉන්ද්‍රියානි සංකමන්ති. ආසන්දිපඤ්චමා පුරිසා මතං ආදාය ගච්ඡන්ති. යාව ආළහනා පදානි පඤ්ඤායන්ති. කාපොතකානි අට්ඨීනි භවන්ති. භස්සන්තා ආහුතියො. දත්තුපඤ්ඤත්තං යදිදං දානං. තෙසං තුච්ඡං මුසා විලාපො යෙ කෙචි අත්ථිකවාදං වදන්ති. බාලෙ ච පණ්ඩිතෙ ච කායස්ස භෙදා උච්ඡිජ්ජන්ති විනස්සන්ති න හොන්ති පරම්මරණා"ති.

ඉත්ථං ඛො මෙ භන්තෙ අජිතො කෙසකම්බලො සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුට්ඨො සමානො උච්ඡෙදං බ්‍යාකාසි. සෙය්‍යථාපි භන්තෙ අම්බං වා පුට්ඨො ලබුජං බ්‍යාකරෙය්‍ය, ලබුජං වා පුට්ඨො අම්බං බ්‍යාකරෙය්‍ය, එවමෙව ඛො භන්තෙ අජිතො කෙසකම්බලො සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුට්ඨො සමානො උච්ඡෙදං බ්‍යාකාසි.

තස්ස මය්හං භන්තෙ එතදහොසි: 'කථං හි නාම මාදිසො සමණං වා බ්‍රාහමණං වා විජිතෙ වසන්තං අපසාදෙතබ්බං මඤ්ඤෙය්‍යා' ති සො ඛො අහං භන්තෙ අජිතස්ස කෙසකම්බලස්ස භාසිතං නෙව අභිනන්දිං නප්පටි-ක්කොසිං. අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා අනත්තමනො අනත්තමනවාචං අනිච්ඡාරෙත්වා තමෙව වාචං අනුග්ගණ්හන්තො අනිකුජ්ජන්තො උට්ඨායාසනා පක්කාමිං.

---

1. කෙසකම්බලි, PTS. 2. පරලොකො, කත්ථචි.
3. සම්ගග්ගතා, . සම්ගග්ගතා, මජ්ඣං.

වහන්ස, මෙසේ මා විචාළ කල්හි, කේශකම්බල අජිතයෝ මට මෙය කීහ: "මහරජ, දුන් දෙයෙහි ඵල නැත. කළ මහායාගයෙහි ඵල නැත. කුශලාකුශල කර්මයන්ගේ ඵලයෙක් විපාකයෙක් නැත. පරලොව සිටියා හට මේ ලොව නැත, මේ ලොව සිටියා හට පරලොවෙක් නැත. මවට උපකාර අපකාර කිරීමෙහි ඵල විපාක නැත. පියාට උපකාර අපකාර කිරීමෙහි ඵල විපාක නැත. උපපාදුක (මෙයින් සැව නැවත උපදනා) සත්ත්වයෝ නැත. සම්‍යග්ගත (නිවැරැදි මඟින් ගිය) සම්‍යක්ප්‍රතිපන්න (නිසි මඟ පිළිපන්), මේ ලොවත් පරලොවත් තුමූ ම වෙසෙසින් දැන පසක් කොට (ලොවට) හෙළි කරන මහණබමුණු කෙනෙක් නැත. සතර මහාභූතයන්ගෙන් නිපන් මේ පුරුෂ තෙමේ යම් විටෙක කළුරිය කෙරේ නම්, එ විටැ (මොහුගේ කයෙහි වූ) පෘථිවීධාතුව බාහිර පෘථිවීධාතු රැස කරා යෙහි, එය අනුගමනය කරයි. ආපෝධාතුව බාහිර ආපෝධාතු රැස කරා යෙහි, එය අනුගමනය කරයි. තේජෝධාතුව බාහිර තේජෝධාතු රැස කරා යෙහි, එය අනුගමනය කරයි. වායුධාතුව බාහිර වායුධාතුව කරා යෙහි, එය අනුගමනය කරයි. ඇස් ආදී ඉන්ද්‍රියයෝ අහසට පැන යෙත්. වැද හොත් ඇඳ පස්වනු කොටැති පුරුෂයෝ මළ සිරුර ගෙන යෙත්. සොහොන තෙක් පමණක් පදයෝ (ගුණාගුණ වචනයෝ) පැණෙත්. ඇට පරෙවි-වන් වේ. ආහුතිකසත්කාරාදි වශයෙන් දුන් දන් මළ සිරිරෙහි අළු කිස නිමගම් තෙක් ම වේ. (එයින් පසු එහි කිසිත් ඉතිරි නො වේ.) දැන යනු අඥයන් විසින් පණවන ලද්දෙකි. යම් කෙනෙක් ආස්තික වාදය (පරලොවක් ඇතැයි කර්ම විපාක ඇතැයි යන ආදි වූ වාදය) කියත් නම්, එය ඔවුන්ගේ හිස් බොරුවෙකි, ප්‍රලාපයෙකි. අනුවණයෝ ද නුවණැත්-තෝ ද යන හැම කය බිඳීමෙන් මුල් සුන් වෙත්, වැනැසෙත්, මරණින් මතු ඇති නො වෙත්" යනු යි.

වහන්ස, මෙසේ කේශකම්බල අජිතයෝ මා විසින් සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍යඵලය විචාරන ලදුවෝ ම උච්ඡේදවාදය පැවැසූහ. වහන්ස, යම්සේ අඹ විචාරන ලද්දේ දෙල් කියන්නේ ද, දෙල් හෝ විචාරන ලද්දේ අඹ හෝ කියන්නේ ද, එසේ ම, වහන්ස, කේශකම්බල අජිතයෝ සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍යඵලය විචාරන ලදුවෝ ම උච්ඡේදවාදය පැවැසූහ.

වහන්ස, ඒ මට 'මා වැන්නෙක් සිය රටෙහි වසන මහණකු හෝ බමුණකු වෙතහැසිය සුතු කොට කෙසේ නම් සිතියැ හෙන්නේ ද ?'යි මේ සිත විය. වහන්ස, ඒ මම කේශකම්බල අජිතයන්ගේ බස නො ම පැසැසීමි, එයට විරුද්ධ බසක් ද නො කීමි. එය නො ම පසසා, විරුදු බසකුත් නො කියා, නො සතුටු සිතැත්තෙමි, නො සතුට හඟවන බසකුත් නො නික්මවා, ඔවුන්ගේ ඒ වචන සාර වශයෙන් නො ගත්තෙමි, සාර වශයෙන් සිතැ නො පිළිගන්නෙමි, ඝනස්තෙන් තැබී නික්මණිමි.

21. එකමිදාහං භන්තෙ සමයං යෙන **පකුධො කච්චායනො** තෙනුපසඞ්කමිං. උපසඞ්කමිත්වා පකුධෙන කච්චායනෙන සද්ධිං සම්මොදිං. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිං. එකමන්තං නිසින්නො ඛො අහං භන්තෙ පකුධං කච්චායනං එතදවොචං: යථා නු ඛො ඉමානි භො කච්චායන පුථුසිප්පායතනානි, සෙය්‍යථිදං: හත්ථාරොහා -පෙ- සක්කා නු ඛො භො කච්චායන එවමෙව දිට්ඨෙව ධම්මෙ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පඤ්ඤපෙතු ?න්ති.

එවං වුත්තෙ භන්තෙ පකුධො කච්චායනො මං එතදවොච: "සත්තිමෙ මහාරාජ කායා අකටා අකටවිධා අනිම්මිතා අනිම්මාතා වඤ්ඤා කූටට්ඨා එසිකට්ඨායිට්ඨිතා. තෙ න ඉඤ්ජන්ති, න විපරිණමන්ති, න අඤ්ඤමඤ්ඤං ව්‍යාබාධෙන්ති, නාලං අඤ්ඤමඤ්ඤස්ස සුඛාය වා දුක්ඛාය වා සුඛදුක්ඛාය වා. කතමෙ සත්ත ? පඨවිකායො ආපොකායො තෙජොකායො වායොකායො සුඛෙ දුක්ඛෙ ජීවෙ සත්තමෙ. ඉමෙ සත්ත කායා අකටා අකටවිධා අනිම්මිතා අනිම්මාතා වඤ්ඤා කූටට්ඨා එසිකට්ඨායිට්ඨිතා. තෙ න ඉඤ්ජන්ති, න විපරිණමන්ති, න අඤ්ඤමඤ්ඤං ව්‍යාබාධෙන්ති, නාලං අඤ්ඤමඤ්ඤස්ස සුඛාය වා දුක්ඛාය වා සුඛදුක්ඛාය වා. තත්ථ නත්ථි හන්තා වා ඝාතෙතා වා සොතා වා සාවෙතා වා විඤ්ඤූතා වා විඤ්ඤාපෙතා වා. යො'පි තික්ඛෙන සත්ථෙන සීසං ඡින්දති, න කොචි කඤ්චි ජීවිතා වොරොපෙති. සත්තන්නං යෙව කායානමන්තරෙන සත්ථං විවරමනුපතතී"ති.

ඉත්ථං ඛො මෙ භන්තෙ පකුධො කච්චායනො සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුට්ඨො සමානො අඤ්ඤෙන අඤ්ඤං ව්‍යාකාසි. සෙය්‍යථාපි භන්තෙ අම්බං වා පුට්ඨො ලබුජං ව්‍යාකරෙය්‍ය, ලබුජං වා පුට්ඨො අම්බං ව්‍යාකරෙය්‍ය, එවමෙව ඛො මෙ භන්තෙ පකුධො කච්චායනො සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුට්ඨො සමානො අඤ්ඤෙන අඤ්ඤං ව්‍යාකාසි.

තස්ස මය්හං භන්තෙ එතදහොසි: කථං හි නාම මාදිසො සමණං වා බ්‍රාහ්මණං වා විජිතෙ වසන්තං අපසාදෙතබ්බං මඤ්ඤෙය්‍ය ?'ති. සො ඛො අහං භන්තෙ පකුධස්ස කච්චායනස්ස භාසිතං නෙව අභිනන්දිං. නප්පටි-ක්කොසිං. අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා අනත්තමනො අනත්තමනවාචං අනිච්ඡාරෙත්වා තමෙව වාචං අනුග්ගණ්හන්තො අනික්කුජ්ජන්තො උට්ඨා-යාසනා පක්කාමිං.

22. එකමිදාහං භන්තෙ සමයං යෙන **නිගණ්ඨො නාතපුත්තො** තෙනුපසඞ්කමිං. උපසඞ්කමිත්වා නිගණ්ඨෙන නාතපුත්තෙන සද්ධිං සම්මොදිං. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිං. එකමන්තං නිසින්නො ඛො අහං භන්තෙ නිගණ්ඨං නාතපුත්තං එතදවොචං:

21. වහන්ස, අත් එක්වරෙක මම් කාත්‍යායනගෝත්‍රික පකුධයන් වෙත ගියෙමි. ගොස් ඔවුන් හා සතුටු වීමි. සතුටට කරුණු වූ සිතැ රැඳැවියැ ශ්‍රුතු වූ කතාබස් නිමවා පසෙක ඉඳගතිමි. එසේ ඉඳගත් මම් කාත්‍යායන පකුධයන් අමතා "භවත් කාත්‍යායනයිනි, යම් සේ ඇතරුවෝ ය, අසරු වෝ ය ... යන මොනු හැම මේ අත්බව්හි ම තමන් විසින් දුක්ක හැකි ඵල ඇති ශිල්ප නිසා ජීවත් වෙත්ද, ඔහු එයින් තමන් ... තම මා පියන්... අඹුදරුවන් ... මිතුරන් කම්කරුවන් සුවපත් කෙරෙත් ද, පිණවත් ද, මහණබමුණනට ... දන් දෙත් ද, භවත් කාත්‍යායනයෙනි, මෙසේ ම මහණ-දමෙහිත් මෙ අත්බව්හි ම දුක්කැ හැකි ඵලයක් දක්වන්නට හැකි ද ?"යි මෙය විචාළෙමි.

වහන්ස, මෙසේ මා විචාළ කල්හි කාත්‍යායන පකුධයෝ මට මෙය කීහ:

"මහරජ, කිසිවකු විසින් නො කරන ලද, නො කළ විධාන ඇති, ඉදු බෙලෙනුදු නො මවන ලද, අත් කිසිදු ලෙසෙකින් නො ම මවනලද, වඳ වූ (කිසිවක් නො උපදවන), පවුකුලක් සේ ස්ථිර (හෙවත් පරිණාම රහිත), ඉඳුකීලයක් සේ තර වැ සිටිනුයෙන් තාවුරු වූ, කාය (සමූහ) සතෙක් වෙත්. කවර සතෙක් ද ? යත්: පඨවිකාය, ආපොකාය, තෙජොකාය, වායොකාය, සුඛ, දුක්ඛ, සත්වන ජීවය ද වෙත්. ඔහු නො සැලෙත්. නො පෙරැළෙත්. උනුනට බාධක නො වෙත්. උනුනට සුවය හෝ දුක හෝ සුව දුක් දෙක ම හෝ දීමට සමත් නො වෙත් ඒ කාය සතෙහි නසන්නෙක් හෝ නස්වන්නෙක් හෝ, අසන්නෙක් හෝ අස්වන්නෙක් හෝ, දැන ගන්නෙක් හෝ දන්වන්නෙක් හෝ නැත. යමෙක් තියුණු සැතෙකින් හිස සිඳින්නේ නම්, එහි කිසිවෙක් කිසිවකු දිවියෙන් තොර නො කරයි. වැලි, සප්තකායයන් අතරින් ආයුධය විවරයට වැද ගනී" යනු යි.

වහන්ස, මෙසේ මා විසින් සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍යඵල විචාරන ලද කාත්‍යායන පකුධයෝ අනෙකකින් අනෙකක් (ඉදුරා ම එයට විරුද්ධ දෑයක්) පැවැසූහ. වහන්ස, අඹ විචාරන ලද්දේ දෙල් ගැන කරුණු කියන්නේත් දෙල් විචාරන ලද්දේ අඹ ගැන කරුණු කියන්නේත් යම්සේ ද, එසේ ම, වහන්ස, කාත්‍යායන පකුධයෝ මා විසින් සාන්-දෘෂ්ටික ශ්‍රාමණ්‍යඵල විචාරන ලදුවෝ ම අනෙකෙන් අනෙකක් (ඉදුරා ම වෙනස් දෑයක්) පැවැසී ය.

වහන්ස, ඒ මට "සිය රටෙහි වසන මහණකු හෝ බමුණකු වෙහෙසිය යුතු කොට මා වැන්නෙක් කෙසේ නම් සිතන්නේ ද ?"යි මේ සිත විය. වහන්ස, ඒ මම් කාත්‍යායන පකුධයන්ගේ වචනය නො පැස-ගීමි. නො ද විරුද්ධ බසක් කීමි. නො පසසා, විරුද්ධ බසක් ද නො කියා, නො සතුටු සිතැත්තෙමි, නො සතුට හඟවන බසක් නො කියා, ඒ ඔවුන් ගේ බස සාරවශයෙන් නො ගන්නෙමි, සාරවශයෙන් සිතැ නො තබා ගන්නෙමි, ඝනස්නෙන් නැගී නික්මිණිමි.

22. වහන්ස, තවත් එක් විටෙක මම් ඥාතපුත්‍රනිර්ග්‍රන්ථයන් කරා එළැඹුණෙමි. එළැඹැ ඔවුන් හා සතුටු වීමි. සතුටට කරුණු වූ සිතැ රැඳැවියැ ශ්‍රුතු වූ කතාබස් නිමවා එක් පසෙක හුන්නෙමි. වහන්ස, පසෙක හුන් මම් ඔවුන් අමතා-

"යථා නු ඛො ඉමානි හො අග්ගිවෙස්සන පුථුසිප්පායතනානි, සෙය්‍යථිදං: හත්ථාරොහා -පෙ- සක්කා නු ඛො හො අග්ගිවෙස්සන එවමෙවං දිට්ඨෙව ධම්මෙ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පඤ්ඤපෙතු" ?නති

එවං වුත්තෙ භන්තෙ නිගණ්ඨො නාතපුත්තො මං එතදවොච: "ඉධ මහාරාජ නිගණ්ඨො චාතුයාමසංවරසංවුතො හොති. කථඤ්ච මහාරාජ නිගණ්ඨො චාතුයාමසංවරසංවුතො හොති? ඉධ මහාරාජ නිගණ්ඨො සබ්බවාරිවාරිතො ච හොති, සබ්බවාරියුතො ච, සබ්බවාරිධුතො ච, සබ්බ-වාරිපුට්ඨො[1]ච. එවං ඛො මහාරාජ නිගණ්ඨො චාතුයාමසංවරසංවුතො හොති. යතො ඛො මහාරාජ නිගණ්ඨො එවං චාතුයාමසංවරසංවුතො හොති, අයං වුච්චති මහාරාජ නිගණ්ඨො ගතත්තො ච යතත්තො ච ඨිතත්තො චා" ති.

ඉත්ථං ඛො මෙ භන්තෙ නිගණ්ඨො නාතපුත්තො සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුට්ඨො සමානො චාතුයාමසංවරං ඛ්‍යාකාසි. සෙය්‍යථාපි භන්තෙ අම්බං වා පුට්ඨො ලබුජං ඛ්‍යාකරෙය්‍ය, ලබුජං වා පුට්ඨො අම්බං ඛ්‍යාකරෙය්‍ය, එවමෙව ඛො භන්තෙ නිගණ්ඨො නාතපුත්තො සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුට්ඨො සමානො චාතුයාමසංවරං ඛ්‍යාකාසි.

තස්ස මය්හං භන්තෙ එතදහොසි: කථං හි නාම මාදිසො සමණං වා බ්‍රාහ්මණං වා පිජිතෙ වසන්තං අපසාදෙතබ්බං මඤ්ඤෙය්‍ය? 'ති. සො ඛො අහං භන්තෙ නිගණ්ඨස්ස නාතපුත්තස්ස භාසිතං නෙව අභිනන්දිං. නප්පටික්කොසිං. අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා අනත්තමනො අනත්ත-මනවාචං අනිච්ඡාරෙත්වා තමෙව වාචං අනුග්ගණ්හන්තො අනික්කුජ්ජන්තො උට්ඨායාසනා පක්කාමිං.

23. එකමිදාහං භන්තෙ සමයං යෙන සඤ්ජයො බෙලට්ඨිපුත්තො[2] තෙනුපසඞ්කමිං. උපසඞ්කමිත්වා සඤ්ජයෙන බෙලට්ඨිපුත්තෙන සද්ධිං සම්මොදිං. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිං. එකමන්තං නිසින්නො ඛො අහං භන්තෙ සඤ්ජයං බෙලට්ඨිපුත්තං එතදවොචං: "යථා නු ඛො ඉමානි හො සඤ්ජය පුථුසිප්පායතනානි, සෙය්‍යථිදං – හත්ථාරොහා -පෙ- සක්කා නු ඛො හො සඤ්ජය එවමෙව දිට්ඨෙව ධම්මෙ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පඤ්ඤපෙතු" ?නති

1. පුට්ඨො, PTS. පුඩ්ඩො (ජෙනමාගධී). 2. බෙලට්ඨිපුත්තො, කත්ථචි.

"භවත් අග්නිවෛශ්‍යායනයෙනි, යම් සේ ඇතරුවෝ ය, අසරුවෝ ය ... යන මොහු හැම මේ අත්බව්හි ම තමන් විසින් අත් දුක්කැ හැකි ශිල්ප නිසා ජීවත් වෙත් ද, ඔහු එසින් තමන්... මාපියන්... අඹුදරුවන් ... මිතුරන් කම්කරුවන් ... සුවපත් කොරෙත් ද, පිණවත් ද, මහණබමුණනට ... දන් දෙත් ද, භවත් අග්නිවෛශ්‍යායනයෙනි, මේ සේ ම මහණදමෙහිත් මේ අත්බව්හි ම දුක්කැ හැකි ඵලවිපාකයක් පෙන්වියැ හැකි ද ?"සි මෙය විචාළෙමි.

වහන්ස, මෙසේ මා විචාළ කල්හි ඥාතපුත්‍ර නිර්ග්‍රන්ථයෝ මට මෙය කී ය:

"මහරජ, මේ නිර්ග්‍රන්ථශාසනයෙහි නිර්ග්‍රන්ථ තෙමේ යාම (භාග) සතරක් ඇති ශීලසංවරයෙන් වැසුණේ වේ. මහරජ, කෙසේ නම් නිර්ග්‍රන්ථ තෙමේ යාම සතරක් ඇති සංවරයෙන් සංවෘත වේ ද ? යත්: මහරජ, මෙහි නිර්ග්‍රන්ථ තෙමේ වැළැකුණු සියලු සිසිල් දිය ඇත්තේ වේ. සර්ව්‍රකාර සංවරලක්ෂණයෙන් සමන්විත වේ. පිඹ හළ සියලු වාරියන් (හෙවත් පව්) ඇත්තේ වේ. (කර්මක්ෂයලක්ෂණ වූ) සියලු පාපවාරණයෙන් (මෝක්ෂය) සපගී කොට සිටියේ වේ. මහරජ, මෙසේ නිර්ග්‍රන්ථ තෙමේ චාතුර්යාමසංවරයෙන් සංවෘත වූයේ වේ. මහරජ, යම් හෙයෙකින් නිර්ග්‍රන්ථ තෙමේ මෙසේ චාතුර්යාමසංවරයෙන් සංවෘත වේ ද, එහෙයින් (මෝක්ෂාධිගමයෙන් ම කෙළවරට) පත් සිතැත්තේ ද, (කායාදී ඉන්ද්‍රියයන්හි තව දුරවත් සංයම් කළ යුත්තක් නැති බැවින්) සංයත ආත්ම ඇත්තේ ද, (මොනොවට) පිහිටි සිතැත්තේ ද වේ යැ සි කියනු ලැබේ."

වහන්ස, මෙසේ ඥාතපුත්‍ර නිර්ග්‍රන්ථ තෙමේ මා විසින් සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍යඵලය විචාරන ලද්දේ ම චාතුර්යාමසංවරය පැවැසී ය. යම්සේ අඹ විචාරන ලද්දේ දෙල් දක්වන්නේ ද, දෙල් විචාරන ලද්දේ අඹ දක්වන්නේ ද, එසේ ම, වහන්ස, ඥාතපුත්‍ර නිර්ග්‍රන්ථයෝ සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍යඵල විචාරන ලදුවෝ ම චාතුර්යාමසංවරය පැවැසූහ.

වහන්ස, ඒ මට "කෙසේ නම් මා වැන්නෙක් සිය රටෙහි වසන මහණකු හෝ බමුණකු වෙහෙසියැ යුතු කොට සිතන්නේ ද ?" සි මේ සිත වී ය. වහන්ස, ඒ මම් වනාහි ඥාතපුත්‍ර නිර්ග්‍රන්ථයන්ගේ වචනය මැනැවැසි නො පැහැසීමි, විරුද්ධ බසකුදු නො කීමි. නො ම පසසා, නො ද විරුදු බසක් කියා, නො සතුටු සිතැතියෙමි, නොසතුට හඟවන වචනයක් ද නො කියා, ඔවුන් කී ඒ බස් සාරවශයෙන් ද නො පිළිගත්තෙමි, සිතැ ද නො ම තබා ගත්තෙමි, ඝනස්තෙන් නැගී නික්මැ ගියෙමි.

23. නැවත ද වහන්ස, එක් වරෙක මම් **සෛවරාපිපුත්‍ර සංජයයන්** කරා ගියෙමි. ගොස් ඔවුන් හා සතුටු වීමි. සතුටට කරුණ වූ සිතැ රැඳැවියැ යුතු වූ කථාව නිමවා පසෙක ඉඳැ ගතිමි. වහන්ස, එසේ ඉඳැ ගත්තෙමි, ඔවුන් අමතා, "භවත් **සංජයයෙනි**, යම්සේ ඇතරුවෝ ය, අසරුවෝ ය ... යන මොවුන් හැම මේ අත්බව්හි ම තමන් විසින් අත් දුක්කැ හැකි ශිල්ප නිසා ජීවත් වෙත් ද, එසින් තමන් ... මාපියන් ... තම අඹුදරුවන් ... තම මිතුරන් කම්කරුවන් සුවපත් කොරෙත් ද, පිණවත් ද, මහණබමුණනට ... දන් දෙත් ද, භවත් **සංජයයෙනි**, මෙ පරිද්දෙන් ම මහණදමෙහිත් මේ අත්බව්හි ම දුක්කැ හැකි ඵලයක් දුක්වියැ හැකි ද " ?සි මෙය කීමි.

එවං වුත්තෙ භන්තෙ සඤ්ජයො බෙලට්ඨිපුත්තො මං එතදවොච: 'අත්ථි පරො ලොකො?'ති ඉති චෙ මං පුච්ඡසි, 'අත්ථි පරො ලොකො'ති ඉති චෙ මෙ අස්ස, 'අත්ථි පරො ලොකො'ති ඉති තෙ නං ඛ්‍යාකරෙය්‍යං. එවන්ති'පි මෙ නො. තථා'ති'පි මෙ නො. අඤ්ඤථා'ති'පි මෙ නො. නො 'ති'පි මෙ නො. නො නො 'ති'පි මෙ නො. 'නත්ථි පරො ලොකො'ති -පෙ- 'අත්ථි ච නත්ථි ච පරොලොකො ?' -පෙ- 'නෙවත්ථි න නත්ථි පරො ලොකො' -පෙ- 'අත්ථි සත්තා ඔපපාතිකා ?'-පෙ- 'නත්ථි සත්තා ඔපපාතිකා ?' -පෙ- 'අත්ථි ච නත්ථි ච සත්තා ඔපපාතිකා ?' -පෙ- 'නෙවත්ථි න නත්ථි සත්තා ඔපපාතිකා ?' -පෙ- 'අත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො ?' -පෙ- 'නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො ?' -පෙ- 'අත්ථි ච නත්ථි ච සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො ?' -පෙ- 'නෙවත්ථි න නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො?' -පෙ- 'හොති තථාගතො පරමම්මරණා ? -පෙ- 'න හොති තථාගතො පරමම්මරණා ?' -පෙ- 'හොති ච න හොති ච තථාගතො පරමම්මරණා ?' -පෙ- 'නෙව හොති න න හොති තථාගතො පරමම්මරණා ?' ති ඉති චෙ මං පුච්ඡසි, 'නෙව හොති න න හොති තථාගතො පරමම්මරණා'ති ඉති චෙ මෙ අස්ස, 'නෙව හොති න නහොති තථාගතො පරමම්මරණා'ති ඉති තෙ නං ඛ්‍යාකරෙය්‍යං. එවන්ති'පි මෙ නො. තථා'ති'පි මෙ නො. අඤ්ඤථා'ති'පි මෙ නො. නො'ති'පි මෙ නො. නො නො'ති'පි මෙ නො'ති.

ඉත්ථං ඛො මෙ භන්තෙ සඤ්ජයො බෙලට්ඨිපුත්තො සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුට්ඨො සමානො වික්ඛෙපං ඛ්‍යාකාසි. සෙය්‍යථාපි භන්තෙ අම්බං වා පුට්ඨො ලබුජං ඛ්‍යාකරෙය්‍ය, ලබුජං වා පුට්ඨො අම්බං ඛ්‍යාකරෙය්‍ය, එවමෙව ඛො භන්තෙ සඤ්ජයො බෙලට්ඨිපුත්තො සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුට්ඨො සමානො වික්ඛෙපං ඛ්‍යාකාසි.

තස්ස මය්හං භන්තෙ එතදහොසි: අයඤ්ච ඉමෙසං සමණබ්‍රාහ්මණානං සබ්බබාලො සබ්බමූළ්හො. කථං හි නාම සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුට්ඨො සමානො වික්ඛෙපං ඛ්‍යාකරිස්සති ?ති. තස්ස මය්හං භන්තෙ එතදහොසි: කථං හි නාම මාදිසො සමණං වා බ්‍රාහ්මණං වා විජිතෙ වසන්තං අප-සාදෙතබ්බං මඤ්ඤෙය්‍ය?ති. සො ඛො අහං භන්තෙ සඤ්ජයස්ස බෙලට්ඨිපුත්තස්ස භාසිතං නෙව අභිනන්දිං. නප්පටික්කොසිං. අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා අනත්තමනො අනත්තමනවාචං අනිච්ඡාරෙත්වා තමෙව වාචං අනුග්ගණ්හන්තො අනික්කුජ්ජන්තො උට්ඨායාසනා පක්කාමිං.

වහන්ස, මෙසේ මා කී කල්හි වෛරට්ටිපුත්‍ර සංජයයෝ මට මෙය කීහ:

'පරලොවෙක් ඇත් ද ?'යි ඉදින් මා විචාරයි නම්, (පරලොවෙක් ඇතැ) යි මට අදහස් වී නම්, 'පරලොවෙක් ඇතැ'යි යුක්තත්හට එය විසඳන්නෙමි. එහෙත් මෙසේත් මගේ අදහසෙක් නැත. 'පරලොවෙක් ඇතැ'යි එ පරිදි වූ අදහසෙකුත් මට නැත. අන් පරිද්දෙකිනුත් මගේ අදහසෙක් නැත. 'පරලොවෙක් ඇත්තේ නො වේ'යි කියාත් මගේ අදහසෙක් නැත. 'පරලොවෙක් නො මැත්තේ නො වේ' කියාත් මගේ අදහසෙක් නැත. 'පරලොවෙක් නැත් ද ?'යි ඉදින් මා විචාරයි නම්, ... 'පරලොවෙක් ඇත්තේත් නැත්තේත් වේ ද ?'යි මා විචාරයි නම් ... 'පරලොවෙක් නො ම ඇත්තේත් නැත්තේත් නො ම වේ ද ?'යිත් මා විචාරයි නම් ... 'මෙයින් සැව පරලොවැ උපදනා සත්තු ඇත් ද ?'යි... 'මෙයින් සැව පරලොවැ උපදනා සත්තු නැත් ද ?' යි... 'මෙයින් සැව පරලොවැ උපදනා සත්තු ඇත්තෝත් නැත්තෝත් වෙත් ද ?' යි... 'මෙයින් සැව පරලොවැ උපදනා සත්තු ඇත්තෝත් නො ම වෙත් ද, නැත්තෝත් නො ම වෙත් ද ?'යි... 'කුශලා-කුශලකර්මයන්ගේ ඵල විපාක ඇද්ද ? යි... 'කුශලාකුශලකර්මයන්ගේ ඵල විපාක නැද් ද ?'යි... 'කුශලාකුශලකර්මයන්ගේ ඵල විපාක ඇත්තේත් නැත්තේත් වේ ද ?'යි... 'කුශලාකුශලකර්මයන්ගේ ඵල විපාක ඇත්තේත් නැත්තේත් නො වේ ද ?යි ... 'සත්ත්වයා මරණින් මත්තෙහි වන්නේ ද ?යි ...'සත්ත්වයා මරණින් මත්තෙහි නො වන්නේ ද ?'යි... 'සත්ත්වයා මරණින් මත්තෙහි වන්නේත් නො වන්නේත් වේ ද ?'යි... 'සත්ත්වයා මරණින් මත්තෙහි වන්නේත් නො වන්නේත් නො වේ ද ?'යි මෙසේ මා විචාරයි නම්, 'සත්ත්වයා මරණින් මත්තෙහි නො ම වන්නේ යැ' යි, 'නො වන්නේ නො වෙයි, කියා මට අදහස් වී නම්, 'සත්ත්ව තෙමේ මරණින් මත්තෙහි නො ම වන්නේ ය, නො වන්නේ නො වේ'යි කියා යුක්තත්හට එය විසඳන්නෙමි. මේ කාරණය මෙසේ ම යැ යිත් මට අදහසෙක් නො වේ. එසේ ම මේ කාරණය වෙනැයිත් මට අදහසෙක් නො වේ. 'අන් සැටියකින් මේ කාරණය වෙනැ'යිත් මට අදහසක් නො වේ. 'මේ කාරණය මෙසේ නො වෙනැයිත් මට අදහස් නො වේ. 'මෙය මෙසේ නො වන්නේ නැතැ' යි ද මට අදහස් නො වේ" යනු යි.

වහන්ස, මා විසින් වෛරට්ටිපුත්‍ර සංජයයෝ සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍ය-ඵලය විචාරන ලදුවෝ ම අපයීනතාවිඤ්ඤේපය (ඉමක් කොණක් නැති සේ වචනයන්ගෙන් ප්‍රශ්නය ඉවත් කිරීම) පැවැසූහ. වහන්ස, අඹ විචාරන ලද්දේ දෙල් ගැන කියනුයේත්, දෙල් විචාරන ලදුයේ අඹ ගැන කියනුයේත් යම්සේ ද, එසේ ම, වහන්ස, වෛරට්ටිපුත්‍ර සංජයයෝ සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍යඵල විචාරන ලදුවෝ ම විඤ්ඤේපය පැවැසූහ.

වහන්ස, ඒ මට "මෙ තෙමේ මහණබමුණන් අතුරෙන් හැම ගෙන් ම බාලතම ය, මූඪතම ය. සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍යඵල විචාරන ලදුයේ ම කෙසේ නම් විඤ්ඤේපය කියා පාන්නේ ද ?" යි මේ අදහස විය. වහන්ස, ඒ මට "කෙසේ නම් මා වැන්නෙක් මා රටවැසි මහණකු හෝ බමුණකු හෝ වෙහෙසිය යුතු කොට සිතන්නේ ද ?"යි මේ සිත විය. වහන්ස, ඒ මම වෛරට්ටිපුත්‍ර සංජයයන්ගේ වචනය නො ම පැසැසීමි. එයට විරුද්ධ බසකුත් නො කීමි. නො පසසා, විරුදු බසකුත් නො කියා, නො සතුටු වූයෙම් නමුදු නො සතුට හඟවන බසක් නො නික්මවා, ඒ බහුගේ වචන සාර විසිනුදු නො පිළිගනුයෙමි, සිතැ ද නො තබනුයෙමි, යුතස්තෙත් නැගී නික්මැ ගියෙමි.

24. සො 'හං භන්තෙ භගවන්තමපි පුච්ඡාමි: යථා නු ඛො ඉමානි භන්තෙ පුත්තසිප්පායතනානි, සෙය්‍යථිදං: හත්ථාරොහා -පෙ- සක්කා නු ඛො මෙ භන්තෙ එවමෙව දිට්ඨෙව ධම්මෙ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පඤ්ඤපෙතු ?නති".

"සක්කා මහාරාජ". තෙන හි මහාරාජ තඤ්ඤෙවෙත්ථ පටිපුච්ඡිස්සාමි. යථා තෙ ඛමෙය්‍ය, තථා නං බ්‍යාකරෙය්‍යාසි".

25. "තං කිම්මඤ්ඤසි, මහාරාජ, ඉධ තෙ අස්ස පුරිසො දූසො කම්මකරො පුබ්බුට්ඨායී පච්ඡානිපාතී කිඤ්චිකාරපටිස්සාවී මනාපචාරී පියවාදී මුඛුල්ලොකකො. තස්ස එවමස්ස: 'අච්ඡරියං වත භො, අබ්භුතං වත භො, පුඤ්ඤානං ගති පුඤ්ඤානං විපාකො. අයං හි රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො මඤ්ඤෙ. අහම්පි මඤ්ඤෙ. අයං හි රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො පඤ්චහි කාමගුණෙහි සමප්පිතො සමඞ්ගීභූතො පරිචාරෙති දෙවො මඤ්ඤෙ. අහම්පනම්හි'ස්ස දූසො කම්මකරො පුබ්බුට්ඨායී පච්ඡානිපාතී කිඤ්චිකාරපටිස්සාවී මනාපචාරී පියවාදී මුඛුල්ලොකකො. සො වතස්සාහං පුඤ්ඤානි කරෙය්‍යං. යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය'නති.

සො අපරෙන සමයෙන කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය. සො එවං පබ්බජිතො සමානො කායෙන සංවුතො විහරෙය්‍ය, වාචාය සංවුතො විහරෙය්‍ය, මනසා සංවුතො විහරෙය්‍ය, ඝාසච්ඡාදනපරමතාය සන්තුට්ඨො අභිරතො පවිවෙකෙ.

තඤ්ඤෙව තෙ පුරිසා එවමාරොචෙය්‍යුං: 'යඤ්ඤ දෙව ජානෙය්‍යාසි, යො තෙ පුරිසො දූසො කම්මකරො පුබ්බුට්ඨායී පච්ඡානිපාතී කිඤ්චිකාර-පටිස්සාවී මනාපචාරී පියවාදී මුඛුල්ලොකකො, සො දෙව කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතො. සො එවං පබ්බජිතො සමානො කායෙන සංවුතො විහරති, වාචාය සංවුතො විහරති, මනසා සංවුතො විහරති, ඝාසච්ඡාදනපරමතාය සන්තුට්ඨො අභිරතො පවිවෙකෙ'ති. අපි නු ත්වං එවං වදෙය්‍යාසි: එතු මෙ භො සො පුරිසො. පුනදෙව භොතු දූසො කම්මකරො පුබ්බුට්ඨායී පච්ඡානිපාතී කිඤ්චිකාරපටිස්සාවී මනාපචාරී පියවාදී මුඛුල්ලොකකො" ති.

24. වහන්ස, ඒ මම භාග්‍යවතුන් වහන්සේ ද විචාරමි. වහන්ස, යම්සේ ඇතරුවෝ ය, අසරුවෝ ය ... යන මොහු හැම මෙ අත්බව්හි ම තමන් විසින් අත් දැක්කැ හැකි සිප් සතර නිසා ජීවත් වෙත් ද, එසින් තමන් ... මාපියන් ... අඹුදරුවන් ... මිත්‍රාමාත්‍යයන් සුවපත් කෙරෙත් ද, පිණවත් ද, මහණබමුණනට ... දන් දෙත් ද, වහන්ස, එපරිද්දෙන් ම මේ අත්බවහි ම සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍යඵලයක් පණවන්නට හැකි ද ?" යි රජ විචාළේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක: "මහරජාණෙනි, හැක්කේ ය. එසේ නම් තොප පිළිවිසමි. තොප රිසි ලෙසකින් උත්තර දෙන්නැ.

25. මහරජාණෙනි, මතු දැක්වෙන කරුණු තෙපි කිමැ යි (කෙසේ) සිතන්නහු ද ? මෙහි තොපගේ වැඩ පල කරන, පළමුවෙන් නැගී සිටින, සවාමියාට කළ යුතු වතාවත් හැම කොට නිමවා පසු වැ හෝනා සුළු, කිකරු වැ හැසිරෙන, තොප මනාප දැ ම කරන, ප්‍රිය කථා ඇති, තොපගේ තුටුපහටු මුහුණ ම බලමින් හැසිරෙන (=මුහුණ සතුටු කරන්නට ම උත්සාහ කරන) දාසයෙක් ඇත්තේ නම්, ඔහුට "පිනෙහි ගතිය, පිනෙහි ඵල විපාක අහෝ ආශ්චර්ය යි! අහෝ පුදුම යි! මේ වෛදේහීපුත්‍ර මගධෙශ්වර **අජාතශත්‍රු** රජ වනාහි මිනිසෙකි. මම ද මිනිසෙක්මි. මෙ රජ වූ කලී පඤ්චකාමගුණයෙන් යුක්ත වූයේ සමන්විත වූයේ දෙවියකු මෙන් ඉඳුරන් පිණවයි. මම වූ කලී ඔහුගේ වැඩ පල කරන, පළමුවෙන් නැගී සිටින, සියලු කටයුතු නිමවා හැමට ම පසු වැදූ හෝනා, කිකරු වැ පවත්නා, ඔහුට මනාප සේ හැසිරෙන, ප්‍රිය වචන කියන, ඔහු සතුටු මුහුණ දක්නට බලා සිටින දාසයෙකිමි. පින් කෙළෙම් වීම් නම්, ඒ මමත් මොහු සේ වන්නෙමි. එබැවින් කෙහෙරවුලු බහවා කසාවත් හැඳ ගිහිගෙන් පැවිදිබිමට වදින්නෙමි නම්, ඉතා යෙහෙකැ" යි මෙසේ සිතෙක් වෙයි.

හේ පසු කලෙක කෙහෙ රවුලු බහවා කසාවත් හැඳ ගිහිගෙන් පැවිදි බිමට වදනේ නම්, මෙසේ පැවිදි වූයේ දැහැමින් ලබන කන බොන දැ හා හඳනා පොරෝනා සිවුරු ම පරම කොටැති බැවින් (එසින් මත්තෙහි අන් කිසි ආමිසයක් නො සොයන බැවින්) පරමසංලේඛයෙන් (කෙලෙස් තුනී කරන අග්‍ර පැවැත්මෙන්) තෘප්ත වූයේ, කායවිත්තවිවේක දෙක්හි ඇලුණේ, කායද්වාරයෙන් සංවෘත වැ (අකුසල් නො කැරෙන සේ කය රැක ගෙන) වසන්නේ නම්, වාග්ද්වාරයෙන් සංවෘත වැ (වාග්ද්වාරයෙන් අකුසල් නො කැරෙන සේ වචනය රැක ගෙන) වසන්නේ නම්, මනෝද්වාරයෙන් සංවෘත වැ (සිතෙන් අකුසල් නො කැරෙන සේ සිත රැක ගෙන) වසන්නේ නම්–

ඉඳින් තොපගේ රාජපුරුෂයෝ තොපට 'අවසර! දේවයන් වහන්ස, දැනගත්ත: ඔබ වහන්සේගේ වැඩ කටයුතු කරන, කලින් නැගී සිටින, හැමට ම පසු වැ සැතැපෙන, කිකරු වැ හැසිරෙන, ඔබ වහන්සේට මනාප දැ ම කරන, පිය බස් ඇති, ඔබ වහන්සේගේ තුටු පහටු මුහුණ ම බලමින් හැසිරෙන, ඔබ වහන්සේගේ යම් දාසපුරුෂයෙක් වී නම්, දේවයන් වහන්ස, හෙ තෙමේ කෙහෙරවුලු බහවා, කසාවත් හැඳ ගිහිගෙන් පැවිදිබිමට වන්නේ ය. හේ මෙසේ පැවිදි වූයේ, දැහැමින් ලැබෙන ආහාර පාන වස්ත්‍ර ම පරම කොටැති බැවින් තෘප්ත වැ, ප්‍රවිවේකයෙහි ඇලුණේ, කයින් සංවෘත වැ වෙසෙයි. වචනයෙන් සංවෘත වැ වෙසෙයි. සිතින් සංවෘත වැ වෙසේ යැ'යි දන්වන්නෝ නම්– 'භවත්නි, ඒ මගේ පුරුෂ තෙමේ ඒ වා. නැවැත ද මගේ වැඩපල කරන, පළමුවෙන් නැගී සිටින, හැමට ම පසු වැ සැතැපෙන, කිකරු වැ හැසිරෙන, මනාපවාරී ප්‍රියවාදී, මා මුහුණ සතුටු කරන්නට බලා සිටින, මගේ දාසයෙක් වේ වා' යි තෙපි මෙසේ කියන්නහු ද ?" යි (භාග්‍යවතුන් වහන්සේ ඇසූසේක.)

"නො හෙතං භන්තෙ. අථ ඛො නං මයමෙව අභිවාදෙය්‍යාමපි, පච්චුට්ඨෙය්‍යාමපි, ආසනෙනපි නිමන්තෙය්‍යාම. අභිනිමන්තෙය්‍යාමපි නං චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙහි. ධම්මිකම්පි'ස්ස රක්ඛාවරණගුත්තිං සංවිදහෙය්‍යාමා"ති.

"තං කිම්මඤ්ඤසි මහාරාජ, යදි එවං සන්තෙ හොති වා සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං නො වා ?"ති

"අථා ඛො භන්තෙ එවං සන්තෙ හොති සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං"ති.

"ඉදං ඛො තෙ මහාරාජ මයා පඨමං දිට්ඨෙව ධම්මෙ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පඤ්ඤත්ත"න්ති.

26. "සක්කා පන භන්තෙ අඤ්ඤම්පි එවමෙව දිට්ඨෙව ධම්මෙ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පඤ්ඤපෙතු ?"න්ති

"සක්කා මහාරාජ. තෙන හි මහාරාජ, තඤ්ඤෙවෙත්ථ පටිපුච්ඡිස්සාමි. යථා තෙ ඛමෙය්‍ය තථා තං ඛ්‍යාකරෙය්‍යාසි. තං කිම්මඤ්ඤසි මහාරාජ ඉධ තෙ අස්ස පුරිසො කස්සකො ගහපතිකො කාරකාරකො රාසිවඩ්ඪකො, තස්ස එවමස්ස: "අච්ඡරියං වත භො අබ්භුතං වත භො පුඤ්ඤානං ගති පුඤ්ඤානං විපාකො. අයං හි රාජා මාගධො **අජාතසත්තු** වෙදෙහිපුත්තො මනුස්සො. අහම්පි මනුස්සො. අයං හි රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො පඤ්චහි කාමගුණෙහි සමප්පිතො සමඞ්ගීභූතො පරිචාරෙති දෙවො මඤ්ඤෙ. අහම්පනම්හි'ස්ස කස්සකො ගහපතිකො කාරකාරකො රාසිවඩ්ඪකො. සො වතස්සාහං පුඤ්ඤානි කරෙය්‍යං. යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය'න්ති.

සො අපරෙන සමයෙන අප්පං වා භොගක්ඛන්ධං පහාය මහන්තං වා භොගක්ඛන්ධං පහාය අප්පං වා ඤාතිපරිවට්ටං පහාය මහන්තං වා ඤාතිපරිවට්ටං පහාය කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය. සො එවං පබ්බජිතො සමානො කායෙන සංවුතො විහරෙය්‍ය, වාචාය සංවුතො විහරෙය්‍ය, මනසා සංවුතො විහරෙය්‍ය, ඝාසච්ඡාදනපරමතාය සන්තුට්ඨො අභිරතො පවිවෙකෙ.

තං වෙ තෙ පුරිසා එවමාරොචෙය්‍යුං: 'යගෙඝ දෙව ජානෙය්‍යාසි. යො තෙ පුරිසො කස්සකො ගහපතිකො කාරකාරකො රාසිවඩ්ඪකො, සො දෙව කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතො. සො එවං පබ්බජිතො සමානො කායෙන සංවුතො විහරති වාචාය සංවුතො විහරති, මනසා සංවුතො විහරති, ඝාසච්ඡාදනපරමතාය සන්තුට්ඨො අභිරතො පවිවෙකෙ'ති. අපි නු ත්වං එවං වදෙය්‍යාසි: 'එතු මෙ භො සො පුරිසො. පුත්තදෙව හොතු කස්සකො ගහපතිකො කාරකාරකො රාසිවඩ්ඪකො'ති ?

"වහන්ස, එය එසේ නො වෙයි. වැලි, අපි ම ඔහු ආදරයෙන් වඳින්නමෝ ද වමු. දැක හුනස්නෙන් නැගී සිටින්නමෝ ද වමු. අස්නෙන් නිමතන්නමෝ ද වමු. සිවුරු බොජුන් සෙනසුන් ගිලන්පස බෙහෙත්-පිරිකරින් ආදරයෙන් නිමතන්නමෝ ද වමු. ඔහුට ධාර්මික රක්ෂාවරණ-ගුප්තිය (දැහැමි රකවල) ද සලසන්නමු" යි රජ කී ය.

"මහරජාණෙනි, එය කිමැ යි සිතන්නවු ද? ඉඳින් මෙසේ ඇති කල්හි මහණදම් පිරීමේ සාන්දෘෂ්ටිකඵලයෙක් ඇත්තේ වේ ද? නො වේ ද?" යි (භාග්‍යවතුන් වහන්සේ පුළුවුත් සේක).

"වහන්ස, මෙසේ ඇති කලැ ඒකාන්තයෙන් සාන්දෘෂ්ටිකශ්‍රාමණ්‍ය-ඵලය වේ" යි (රජ කී ය.)

"මහරජ, මේ වනාහි තොපට මා විසින් පණවන ලද මේ අත්බවහි ම ලැබෙන පළමු වන සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍යඵලය වේ" යි (භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.)

26. "වහන්ස, මෙසේ ම අනෙකුදු මේ අත්බවහි වූ සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍යඵලයක් පණවන්නට හැක්කේ ද?" යි (රජ පුළුවුත.)

"හැක්කේ ය, මහරජාණෙනි. එසේ වී නම්, මහරජාණෙනි, තොප ම මෙහි ලා පිළිවිසිමි. තොපට රිසියෙන පරිදි එය කියන්නැ. මහරජාණෙනි, ඒ කිමැයි හඟනාහු ද? මෙහි ගොවිතැන් කරන, එක් ගෙයකට අධිපති වූ, තොප අයබදු සපයන, ධනධාන්‍ය වඩාලන, තොපගේ පුරුෂයෙක් ඇත්තේ නම්, ඔහුට 'පින්වත්නි, පිනෙහි ගතිය, පිනෙහි ඵලය ආශ්චර්ය ය! අද්භුත ය! මේ වෛදේහීපුත්‍ර මගධේශ්වර අජාතශත්‍රු රජ ද මිනිසෙකි. මම ද මිනිසෙකිමි. මේ... රජ වනාහි පස්කම් ගුණයෙන් යුක්ත වැ, සමන්විත වැ, දෙවියකු සේ ඉඳුරන් හසුරුවයි. මම වූ කලී එක් ගෙයකට ම අධිපති, අයබදු සපයන, ධනධාන්‍ය වඩා ලන, ඔහුගේ ගොවියෙක් වෙමි. ඒ මම ඉඳින් පින් කරන්-නෙම් වීම් නම්, ඒකාන්තයෙන් මොහු බඳු වන්නෙමි. ඒ මම කෙහෙරවුලු බහවා, කසාවත් හැඳැ, ගිහිගෙන් පැවිද්දට වදනෙමි නම්, ඉතා යෙහෙකැ' යි මෙසේ සිතෙක් වන්නේ නම්-

හේ පසු කඹලකා මඳ වූ හෝ සම්පත්රැස හැරැ දමා, මහත් වූ හෝ සම්පත්රැස හැරැ දමා, මඳ වූ හෝ ඥාතිවර්ගයා හැරැ දමා, මහත් වූ හෝ ඥාතිවර්ගයා හැරැ දමා, කෙහෙරවුලු බහවා, කසාවත් හැඳ, ගිහිගෙන් පැවිද්දට වදින්නේ නම්, මෙසේ පැවිදි වූ ම හේ දැහැමින් ලත් ආහාර පාන චීවර පමණෙකින් ම සතුටු වැ, කායචිත්ත විවේකයෙහි ඇලුණෙක් වැ, කයින් සංවෘත වැ වචනයෙන් සංවෘත වැ මනසින් සංවෘත වැ වෙසෙන්නේ නම්-

තොපගේ පුරුෂයෝ තොපට "අවසර! දේවයන් වහන්ස, කාරණයක් දැන ගන්න. ගෘහපතික වූ, අයබදු සපයන, ධනධාන්‍ය වඩාලන, ඔබ වහන්සේගේ ගොවියෙක් වූ යම් පුරුෂයෙක් වී ද, හේ කෙහෙරවුලු බහවා කසාවත් හැඳ ගිහිගෙන් පැවිද්දට වන්නේ ය. හේ මෙසේ පැවිදි වූයේ ම දැහැමින් ලත් ආහාරපානචීවර පමණෙකින් තෘප්ත වැ ප්‍රවිවේකයෙහි ඇලුණේ, කයින්... වචසින්... මනසින් සංවෘත වැ වෙසේ යැ' යි මෙසේ දන්වන්නෝ නම්- 'භවත්නි, ඒ මගේ පුරුෂ තෙමේ ඒ වා. නැවැතත් ගෘහපතික වූ, අයබදු සපයන, ධනධාන්‍ය වඩාලන මගේ ගොවියෙක් වේ වා' යි තෙපි කියන්නහු ද?" යි (භාග්‍යවතුන් වහන්සේ පුළුවුත් සේක.)

"තො හෙතං භන්තෙ. අථ ඛො නං මයමෙව අභිවාදෙය්‍යාමපි පච්චුට්ඨෙය්‍යාමපි, ආසනෙනපි නිමන්තෙය්‍යාම, අභිනිමන්තෙය්‍යාමපි නං චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙහි. ධම්මිකම්පි'ස්ස රක්ඛාවරණගුත්තිං සංවිදහෙය්‍යාමා"ති.

"තං කිම්මඤ්ඤසි මහාරාජ, යදි එවං සන්තො හොති වා සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං නො වා ?"ති

"අඤ්ඤ ඛො භන්තෙ එවං සන්තො හොති සන්දිට්ඨිකං සාමඤ්ඤඵල"න්ති.

"ඉදං ඛො තෙ මහාරාජ මයා දුතියං දිට්ඨෙව ධම්මෙ සංදිට්ඨිකං සාමඤ්ඤඵලං පඤ්ඤත්තන්ති".

27. "සක්කා පන භන්තෙ අඤ්ඤම්පි දිට්ඨෙව ධම්මෙ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පඤ්ඤපෙතුං ඉමෙහි සන්දිට්ඨිකෙහි සාමඤ්ඤඵලෙහි අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච ?"ති

"සක්කා මහාරාජ. තෙන හි මහාරාජ සුණොහි සාධුකං මනසි කරොහි භාසිස්සාමි"ති.

"එවං භන්තෙ"ති ඛො රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො භගවතො පච්චස්සොසි.

28. භගවා එතදවොච: "ඉධ මහාරාජ තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා. සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං. බ්‍රහ්මචරියං පකාසෙති.

29. තං ධම්මං සුණාති ගහපති වා ගහපතිපුත්තො වා අඤ්ඤතරස්මිං වා කුලෙ පච්චාජාතො. සො තං ධම්මං සුත්වා තථාගතෙ සද්ධං පටිලභති. සො තෙන සද්ධාපටිලාභෙන සමන්නාගතො ඉති පටිසංචික්ඛති: 'සම්බාධො ඝරාවාසො රජාපථො[1]. අබ්භොකාසො පබ්බජ්ජා. තදිදං සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්තපරිසුද්ධං සංඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං. යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය'න්ති.

---

1. රජොපථො, ක්‍යන්ච්.

"වහන්ස, එය එසේ නො වන්නේ ය. වැලි අපි ම ඔහු ආදරයෙන් වඳින්නමෝ ද වමු. දැක හුනස්නෙන් නැගී සිටින්නමෝ ද වමු. අස්නෙන් නිමන්නමෝ ද වමු. සිවුරු බොජුන් සෙනසුන් ගිලන්පස බෙහෙත්පිරිකර යන මෙයින් ඔහු වෙසෙසින් නිමන්නමෝ ද වමු. ඔහුට දැහැමි වූ රකවල් ද සලසන්නමු" යි රජ කී ය.

"මහරජාණෙනි, ඉදින් මෙසේ ඇති කලැ සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍ය ඵලයෙක් වේ ද? නො වේ ද? ඒ කිමැ යි සිතවු ද?" යි (භාග්‍යවතුන් වහන්සේ පුළුවුන් සේක).

"වහන්ස, මෙ සේ ඇති කලැ ඒකාන්තයෙන් සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍ය-ඵලයෙක් වේ" යැ යි රජ කී ය.

"මහරජාණෙනි, මේ - තොපට මා විසින් පෙන්වන ලද මෙ අත්බව්හි ම වූ දෙවෙනි සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍යඵලය යැ" යි (භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක).

27. "වහන්ස, මේ සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍යඵලයනට වඩා මනාප වූ, වඩා උතුම් වූ, මේ අත්බව්හි ම ලැබෙන අතෙකුදු සාන්දෘෂ්ටිකශ්‍රාමණ්‍ය ඵලයක් පැණවිය හැක්කේ ද?" යි (රජ පුළුවුත).

"හැකි යි මහරජාණනි. එසේ නම් අසන්නැ. මොනොවට සිත යොමු කරන්නැ. කියන්නෙමි"යි (භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක).

"එසේ ය, වහන්සැ"යි කියා වෛදෙහීපුත්‍ර මගධෙශ්වර අජාතශත්‍රු රජ පිළිවදන් දුන්නේ ය.

28. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

"මහරජාණෙනි, මෙහි අර්හත් වූ සම්‍යක් සම්බුද්ධ වූ විද්‍යාචරණසම්පන්න වූ සුගත වූ ලෝකවිත් වූ නිරුත්තරපුරුෂදම්‍යසාරථි වූ දෙව්මිනිස්නට ශාස්තෘ වූ බුද්ධ වූ භගවත් වූ තථාගත තෙමේ ලොවැ පහළ වෙයි. හේ දෙවියන් සහිත වූ මරුන් සහිත වූ බඹුන් සහිත වූ මේ ලෝකය ද, මහණබමුණන් සහිත, සම්මත දෙවියන් (රජුන්) හා සෙසු මිනිසුන් හා සහිත සත්ත්වප්‍රජාව ද තෙමේ විශිෂ්ට නුවණින් දැන ප්‍රත්‍යක්ෂ කොට ඔවුනට අවබෝධ කරවයි. හේ දහම් දෙසනුයේ ආදියෙහි භද්‍රක (නිවරද) කොට, මධ්‍යයෙහි භද්‍රක (නිවරද) කොට, අවසානැ භද්‍රක (නිවරද) කොට, අර්ථ සහිත කොට, ව්‍යංජනයෙන් සහිත කොට, සර්ව්‍රකාරයෙන් පුණි කොට, පිරිසිදු කොට, දහම් දෙසයි. (එසේ දෙසනුයේ ශික්ෂා-ත්‍රයයෙන් සංගෘහීත වූ සියලු) ශාසනබ්‍රහ්මචර්‍යය ප්‍රකාශ කෙරෙයි.

ගෘහැවියෙක් හෝ ගෘහැවිපුතෙක් හෝ අන් එක්තරා කුලයෙක උපන්නෙක් හෝ ඒ ධර්මය අසයි. හේ ඒ දහම් අසා තථාගත බුදුහු කෙරෙහි සැදැහැ ඇති කෙරෙයි. හේ ඒ ශ්‍රද්ධාලාභයෙන් සමන්විත වූයේ, 'ගිහිගෙයි විසීම සම්බාධයෙකි (අවහිරයෙකි). (රාගාදි රජස් නැගෙන) රජස් පථයෙකි. පැවිද්ද (සම්බාධ නැති) අභ්‍යවකාශය (එළි මහන) වැන්න. ගිහිගෙයි වසන්නහු විසින් ඒකාන්තයෙන් පිරිපුන් කොට, ඒකාන්තයෙන් පිරිසිදු කොට, ශංඛලිඛිතයක් සේ මේ බඹසර සරන්නට පහසු නො වේ. (එබැවින්) මම කෙහෙරවුලු බහවා කසාවත් හැඳ පෙරෙවැ ගිහිගෙන් පැවිදිබිමට වදනෙම් නම් යෙහෙකැ'යි මෙසේ නුවණින් සලකයි.

සො අපරෙන සමයෙන අප්පං වා භොගක්ඛන්ධං පහාය මහන්තං වා භොගක්ඛන්ධං පහාය අප්පං වා ඤාතිපරිවට්ටං පහාය මහන්තං වා ඤාතිපරිවට්ටං පහාය කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජති. සො එවං පබ්බජිතො සමානො පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී. සමාදාය සික්ඛති සික්ඛාපදෙසු කායකම්මවචීකම්මෙන සමන්නාගතො කුසලෙන. පරිසුද්ධාජීවො සීලසම්පන්නො ඉන්ද්‍රියෙසු ගුත්ත-ද්වාරො භොජනෙ මත්තඤ්ඤූ සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො සන්තුට්ඨො.

29. කථඤ්ච මහාරාජ භික්ඛු සීලසම්පන්නො හොති? ඉධ මහාරාජ භික්ඛු පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො. සබ්බපාණභූතහිතානුකම්පී විහරති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො හොති දින්නාදායී දින්නපාටිකඞ්ඛී. අථෙනෙන සුවිසුද්ධෙන අත්තනා විහරති. ඉදම්පි'ස්ස හොති සීලස්මි.

අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී හොති ආරාචාරී[1] විරතො මෙථුනා ගාමධම්මා. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො හොති සච්චවාදී සච්චසන්ධො ඨෙතො[2] පච්චයිකො අවිසංවාදකො ලොකස්ස. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

පිසුණං වාචං[3] පහාය පිසුණාය වාචාය පටිවිරතො හොති. ඉතො සුත්වා න අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය. අමුත්‍ර වා සුත්වා න ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය. ඉති භින්නානං වා සන්ධාතා, සංහිතානං වා අනුප්පදාතා[4] සමග්ගාරාමො[5] සමග්ගරතො සමග්ගනන්දිං සමග්ගකරණිං වාචං භාසිතා හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

ඵරුසං වාචං[6] පහාය ඵරුසාය වාචාය පටිවිරතො හොති. යා සා වාචා නෙලා කණ්ණසුඛා පෙමනීයා[7] හදයඞ්ගමා පොරී බහුජනකන්තා බහුජනමනාපා, තථාරූපිං[8] වාචං භාසිතා හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතො හොති කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී. නිධානවතිං වාචං භාසිතා හොති කාලෙන සාපදෙසං පරියන්තවතිං අත්ථසඤ්හිතං. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

---

1 අනාචාරි, මජ්ඣ. 2. ඨෙතො, ස්‍යා.
3. පිසුණාවාචං, PTS. 4. අනුප්පාදතා, PTS. 5. සමග්ගාරාමො, මජ්ඣ.
6. ඵරුසාවාචං, PTS සිත්‍රි 7. පෙමනියා, මජ්ඣ.
8. එවරූපිං. PTS. සිත්‍රි.

හේ පසු කලෙක අල්ප වූ හෝ සම්පත් රැස හැරැ, මහත් වූ හෝ සම්පත් රැස හැරැ, මඳ වූ හෝ තැපිරිස හැරැ, මහත් වූ හෝ තැපිරිස හැරැ, කෙහෙරවුලු බහවා, කසාවත් හැඳ පෙරෙවා, ගිහිගෙන් පැවිදිකිමට වදී. හේ මෙසේ පැවිදි වූයේ ම පාතිමොක්ඛසංවරයෙන් සමන්විත වූයේ, ආචාරයෙන් හා ගෝචරයෙන් යුක්ත වූයේ, සවල්පමාත්‍ර වූ ද වරදෙහි භිය දක්නේ, නිවරද වූ කායවාක්කර්මයෙන් සමන්විත වූයේ, එහෙයින් ම පිරිසිදු ආජීව ඇතියේ, සිල්වත් වූයේ ඉන්ද්‍රියයන්හි වැසූ දොර ඇතියේ, බොජ්ජන්හි පමණ දන්නේ, (සත් තන්හි) සිහියෙන් හා නුවණින් හා යුක්ත වූයේ, සිවුපසයෙහි තුන්වැදෑරුම් සතුටින් සතුටු වූයේ, ශික්ෂා-පදයන්හි සමාදන් වැ හික්මෙයි.

29. මහරජ, මහණ තෙමේ කෙසේ තම් සිල්වත් වේ ද? යත්: මහරජ, මෙහි මහණ තෙමේ ප්‍රාණඝාතය හැරැ දමා, ප්‍රාණඝාතයෙන් වෙසෙසින් වැළැක්කේ වෙයි. බහා තැබූ දඬුමුගුරු ඇත්තේ (දඬුමුගුරු නො දරන්නේ), බහා තැබූ ආයුධ ඇත්තේ (ආයුධ නො දරන්නේ), පවට පිළිකුල් කරන්නේ, මෛත්‍රියට පැමිණියේ (මෛත්‍රියෙන් යුක්ත වූයේ), සියලු සතුන් කෙරෙහි හිතානුකම්පා ඇති වැ වෙසේ. මේ ද ඔහුගේ එක් ශීලයෙක් වේ.

හේ අදත්තාදානය හැරැ දමා, නොදුන් දෑ ගැන්මෙන් මුළු මනින් වැළැක්කේ වෙයි. දුන් දෑය ම පිළිගන්නාසුලු වූයේ, දුන් දෑය ම සිතිනුත් කැමැති වැ ඉවසනසුලු වූයේ, නොසොර වූ පිරිසිදුසිතින් යුතු වැ වෙසේ. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

හේ අබ්‍රහ්මචරිය දුරැ ලා බඹසර සරන්නේ වෙයි. ගැම්දහමක් වූ මෙවුන්දමින් දුරු වැ හැසිරෙන්නේ, එයින් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

හේ බොරු කීම දුරැ ලා, බොරු කීමෙන් වැළැක්කේ වෙයි. ඇත්ත කියනසුලු වූයේ, ඇත්තෙන් ඇත්ත ගලපා කියන්නේ, තහවුරු වැ පිහිටි කථා ඇත්තේ, ඇදහිය යුතු කථා ඇත්තේ, ලොව නො රවටන්නේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

හේ කේලාම් කීම දුරැ ලා, කේලාම් කීමෙන් වැළැක්කේ වේ. මෙ තැනින් අසා මොවුන් (ඔවුන් ගෙන්) බිඳුවනු පිණිස එතැන්හි නො කියනසුලු වූයේ, එ තැනින් අසා ඔවුන් (මොවුන්ගෙන්) බිඳුවනු පිණිස මෙ තන්හි නො කියනසුලු වූයේ, මෙසේ බිඳුනවුන් ගලපන්නේ (සමග කරන්නේ) ද, එකට ගැළැපුනවුන් (සමගියට පැමිණියවුන්) හට රැකුල් දෙන්නේ ද වෙයි. සමගියෙන් සිටින්නවුන් හා වාසය කැමැත්තේ, සමගියෙන් වසන්නවුනට කැමැත්තේ, සමග වැ සිටින්නවුනට සතුටු වනුයේ, සමගිය ඇති කරන බස් කියන්නේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

හේ රළු කිණුම් දුරැ ලා, රළු බස් දෙඩුමෙන් වැළැක්කේ වෙයි. නිදොස්, කන්කලු, පෙම් උපදවන, පහසුවෙන් සිතැ වැදහන්නා, නො ගැම්, බොහෝ දෙනාට ප්‍රිය, බොහෝ දෙනාගේ මන වඩන යම් බසෙක් වේ ද, එබඳු වූ බස් කියන්නේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

හේ බොල් හිස් දෙඩැවිලි හැරැදමා, බොල් දෙඩැවිල්ලෙන් වැළැක්කේ වෙයි. සුදුසු කාල වේලායෙහි කථා කරන සුලු වූයේ, ඇත්ත ම කියන-සුලු වූයේ, වැඩ සලසන බසක් ම කියනසුලු වූයේ, නව ලොවුතුරුදහම් ඇසුරු කොට ම කියනසුලු වූයේ, හික්මීම ඇති කරන බසක් ම කියන-සුලු වූයේ, සිතැ තබා ගන්නට සුදුසු වූ, කරුණු සහිත වූ, ඉමක් කොනක් ඇති (ප්‍රමාණවත් වූ), දෙලෝ වැඩ හා සම්බඳ වූ ම බසක් සුදුසු කාලයෙහි කියන්නේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

30. බීජගාමභූතගාමසමාරම්භා[1] පටිවිරතො හොති. එකභත්තිකො[2] හොති රත්තූපරතො[3] පටිවිරතො[4] විකාලභොජනා. නච්චගීතවාදිත-විසූකදස්සනා[5] පටිවිරතො හොති. මාලාගන්ධවිලෙපනධාරණමණ්ඩන-විභූසනට්ඨානා පටිවිරතො හොති. උච්චාසයනමහාසයනා පටිවිරතො හොති. ජාතරූපරජතපටිග්ගහණා[6] පටිවිරතො හොති. ආමකධඤ්ඤ-පටිග්ගහණා[6] පටිවිරතො හොති. ආමකමංසපටිග්ගහණා[6] පටිවිරතො හොති. ඉත්ථිකුමාරිකපටිග්ගහණා[6] පටිවිරතො හොති. දාසිදාසපටිග්ගහණා[6] පටිවිරතො හොති. අජෙළකපටිග්ගහණා[6] පටිවිරතො හොති. කුක්කුට-සූකරපටිග්ගහණා[6] පටිවිරතො හොති. හත්ථිගවස්සවළවා[7]පටිග්ගහණා පටිවිරතො හොති. ඛෙත්තවත්ථුපටිග්ගහණා පටිවිරතො හොති. දූතෙය්ය-පහෙණ[8]ගමනානුයොගා පටිවිරතො හොති. කයවික්කයා පටිවිරතො හොති. තුලාකූටකංසකූටමානකූටා[9] පටිවිරතො හොති. උක්කොටනවඤ්චන-නිකතිසාචි[10]යොගා පටිවිරතො හොති. ඡේදනවධබන්ධනවිපරාමොස-ආලොපසහසාකාරා[11] පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

චූලසීලං[12] නිට්ඨිතං

31. යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං බීජගාමභූතගාමසමාරම්භං[13] අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: මූලබීජං ඛන්ධබීජං ඵළුබීජං[14] අග්ගබීජං බීජබීජමෙව[15] පඤ්චමං. ඉති වා ඉතිඑවරූපා[16] බීජගාමභූතගාමසමාරම්භා[17] පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

32. යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං සන්නිධිකාරපරිභොගං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: අන්නසන්නිධිං පානසන්නිධිං වත්ථසන්නිධිං යානසන්නිධිං සයනසන්නිධිං ගන්ධසන්නිධිං ආමිසසන්නිධිං. ඉති වා ඉති එවරූපා සන්නිධිකාරපරිභොගා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

---

1. සමාරම්භා, මජ්ඣං. 2. එකං භත්තිකො, මජ්ඣං.
3. රත්තූපරතො, මජ්ඣං. 4. විරතො, ඵෙ. සෙ.
5. විසූකං, මජ්ඣං. 6. පරිග්ගහණං, (සබ්බත්ථ)
7. ගවස්සං, සෙ. වළවං, මජ්ඣං. 8. පහිණ, සීමු. මජ්ඣ. ස්‍ය.
9. කූටං, මජ්ඣං. 10. සාචි, මජ්ඣං. 11. සහසං, මජ්ඣං.
12. චූළ සීලං, මජ්ඣං. 13. සමාරම්භා, මජ්ඣං.
14. ඵලං, සෙ. ඵලුං, සි. ඵෙ. 15. බීජ බීජං එව. ඵෙ.
16. ඉති එවරූපා, සෙසුවි. 17. සමාරම්භා, මජ්ඣං.

30. හේ බීජසමූහ (=පැළ වන දෑ)ද, භූතසමූහ (පැළ වුණු දෑ) ද සිදු-මෙන් බිඳුමෙන් වැළැක්කේ වෙයි. රැ බොජුනෙන් වැළැක්කේ, එක් වේලේ වළඳන බත් ඇත්තේ, නොකල්බොජුනෙන් වැළැක්කේ වෙයි. නටනු ගනු වයනු පිසුළුදසුන් යන මෙයින් වැළැක්කේ වෙයි. ඇඟැ අඩු තැන් පිරැවීමට, ඇඟ සැරැසීමට කරැණු වන මල්ගඳවිලෙවුන් දැරීමෙන් වැළැක්කේ වෙයි. පමණ ඉක්මැවූ උසසුන් ද, නොකැප වූ මහඅසුන් ද යන දෙකින් ම වැළැක්කේ වෙයි. රන් රිදී මසු කහවණු පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. අමු ධාන්‍ය පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. අමු මස් පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. ස්ත්‍රීන් කුමාරිකාවන් පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. දූසිදසුන් පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. එළුවන් බැටළුවන් පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. කුකුළන් හූරන් පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. ඇතුන් අසුන් වෙළඹුන් ගෙරින් පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. කෙත්වතු පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. ගිහියනට දූත මෙහෙවර කිරීමෙහි ද ගෙන්ගෙට පණිවුඩ පණිත් ගෙන යැමෙහි ද යෙදීමෙන් වැළැක්කේ වෙයි. වෙළෙඳ ගනුදෙනුයෙන් වැළැක්කේ වෙයි. හොරතරුදියෙන් කිරැමෙන්, බොරු රන් පැමෙන්, හොර මිනුම්වලින් මිනුමෙන් වැළැක්කේ වෙයි. අල්ලස් ගෙන හිමියන් නොහිමි කිරීමෙන්, තාතා උපායෙන් අනුන් රැවැටුමෙන්, අගතා දූයව හුරු නො අගතා දූයක් පෙන්නා කරන මායායෙන්, මේ කී නොකී හැම කෙරැටිකකම්වලින් ම වැළැක්කේ වෙයි. අත් පා ආදිය සිඳීමෙන් ද, මැරීමෙන් ද, රැකැත් ආදියෙන් බැඳීමෙන් ද, සැහැසිකම්වලින් ද වැළැක්කේ වෙයි මේ ද ඔහුගේ ශීලයෙක් වෙයි.

චුල්ලශීලය නිමියේ ය.

31. යම්සේ වනාහි සම්හර භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, මූලබීජ ද (හිඳුරු ආදි පැළ වන මුල් ද), ස්කන්ධ බීජ ද (තුග ආදි පැළ වන කඳ ද), පරුබීජ ද (උක් උණ බට ආදි පැළ වන පුරැක් ද), අග්‍රබීජ ද (ඉරිවේරිය ආදි පැළ වන දළු ද), පස් වනු බීජ-බීජ ද (වී ආදී පැළ වන ඇට ද) යන මෙ කී බීජසමූහ ද (පැළ වන දෑ ද) භූතසමූහ ද (පැළ වුණු දෑ ද) පෙළීමෙහි (සිඳුම් බිඳුම් තැළුම් තැවුම් යැ යි) කියන ලද සමාරම්භයෙහි යෙදුණෝ වෙසෙත් ද, හෙ තෙමේ මෙ බඳු වූ බීජග්‍රාම භූතග්‍රාම සමාරම්භයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහු ගේ ශීලයෙක් වේ.

32. යම්සේ වනාහි ඇතැම් භවත් මහණබමුණු කෙනෙක් සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, කැම රැස් කොට තබා ගැන්ම, බොන දෑ රැස් කොට තබා ගැන්ම, වස්ත්‍ර රැස් කොට තබා ගැන්ම, රිය ගැල් ආදිය ද පාවහන් ආදිය ද යන යාන රැස් කොට තබා ගැන්ම, ඉහතැ කී දෑ හැර තවත් තල සහල් ආ වුව මනා පසය රැස් කොට තබා ගැන්ම යන මෙසේ වූ සන්නිධිකාරපරිභෝගයෙහි (පසය රැස් කොට තබා ගෙන වැළැඳීමෙහි) යෙදී වෙසෙත් ද, හෙ තෙමේ මේ හෝ මෙබඳු වූ හෝ සන්නිධිකාර පරිභෝගයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

33. යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විසූකදස්සනං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: නච්චං ගීතං වාදිතං පෙක්ඛං අක්ඛානං පාණිස්සරං වෙතාලං කුම්භථූනං සොභනකං[1] චණ්ඩාලං වංසං ධොපනකං[2] හත්ථියුද්ධං අස්සයුද්ධං මහිසයුද්ධං[3] උසභයුද්ධං අජයුද්ධං මෙණ්ඩයුද්ධං[4] කුක්කුට-යුද්ධං වට්ටකයුද්ධං දණ්ඩයුද්ධං මුට්ඨියුද්ධං[5] නිබ්බුද්ධං උය්‍යොධිකං බලග්ගං සෙනාබ්‍යූහං අනීකදස්සනං[6]. ඉති වා ඉති එවරූපා විසූකදස්සනා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

34. යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං ජූතපමාදට්ඨානානුයොගං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: අට්ඨපදං දසපදං ආකාසං පරිහාරපථං සන්තිකං ඛලිකං ඝටිකං සලාකහත්ථං අක්ඛං පඞ්ගචීරං වඩ්ඩකං මොක්ඛචිකං චිඞ්ගුලකං පත්තාළ්හකං රථකං ධනුකං අක්ඛරිකං මනෙසිකං යථාවජ්ජං. ඉති වා ඉති එවරූපා ජූතපමාදට්ඨානානුයොගා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

35. යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං උච්චාසයනමහාසයනං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: ආසන්දිං පල්ලඞ්කං ගොනකං චිත්තකං පටිකං පටලිකං තූලිකං විකතිකං උද්දලොමිං එකන්තලොමිං කට්ඨිස්සං කොසෙය්‍යං කුත්තකං හත්ථත්ථරං අස්සත්ථරං රථත්ථරං අජිනප්පවෙණිං කාදලිමිගපවරපච්චත්ථරණං සඋත්තරච්ඡදං උභතොලොහිතකූපධානං ඉති වා ඉති එවරූපා උච්චාසයනමහාසයනා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

---

1. සොභනගරකං, කත්ථචි. සොභනකරකං, PTS. සොභනකරකං, මජ්ඣං.
2. ධොවනං, කත්ථචි ධොපනං, සීහ්‍ලි. 3. මහිංසං, මජ්ඣං.
4. මෙණ්ඩකං, මජ්ඣං. 5 සීහල පොත්තකෙසු න දිස්සති.
6. අනීකං- කෙසුචි.

33. යම්සේ සමහර භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, නැටුම් ගැයුම් වැයුම්, නටසමජජා (නළුවන් සමූහයක් එක් වැ ජනසමූහයා ඉදිරියේ දක්වන නැටුම්), ආඛ්‍යාන (මහාභාරතාදිය කීම හෝ ඇසීම), පාණිසඛර (අතින් ලොහොබෙර ගැසුම් හෝ අත්තල ගැසුම), වේතාල (දඹුමුවා තාලම්පට ගැසීම හෝ මතුරු දපා මළසිරුරු නැගිටුවීම), කුම්භථූන (සිවුරස් බෙර වැයුම්), ශෝභනක (රංගබලිකරණය හෙවත් රඟමඩුල්ලෙහි දී දේවතාවනට ස්තෝත්‍ර වශයෙන් තාන්ත්‍රීගීත ගායනය හෝ ප්‍රතිහානචිත්‍ර කිරීම), සණදෙවුන් කෙළිය (හෝ අයෝගුඩක්‍රීඩාව), උණගස් ඔසොවා ගෙන කරන ක්‍රීඩාව, අසිඛොවනය (මළවුන්ගේ ඇට සුවඳ කවා තබා තකත්සෙමෙහි ඒ වටා සිට උත්සව කිරීම), ඇත්පොර, අස්පොර, මියුපොර, ගොන්-පොර, එළුපොර, බැටෙළුපොර, කුකුළුපොර, වටුපොර, පොලුහරඹ, මිටුසුද, මල්ලපොර, සුද පවත්තා තැන් දක්නට යැම, බලසෙන් ගණිතා තැන් දක්නට යැම යන මෙබඳු විසුළු දස්නෙහි යෙදී වෙසෙන් ද, හෙ තෙමේ මේ හෝ මෙ බඳු වූ විසුළු දස්නෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

34. යම්සේ වනාහි සමහර භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, අටපාකෙළිය, දසපාකෙළිය, අහස්දූකෙළිය, මඩුලු පැනුම, සන්තිකාක්‍රීඩාව, දදුකෙළිය, කල්ලි ගැසුම, සලාඅත්-කෙළිය, ගුළකෙළිය, කොළ තලා පිඹුම, කෙළිතගුලින් හැම, කරණම් ගැසුම, කන්තංගුරුවා කෙළිය, කොළනැළියෙන් වැලි ඇ මැනුම, ක්‍රීඩාරථ පැදවීම, කුඩා දුන්නෙන් විදීම, ඇකිරිකෙළිය (පිටේ හෝ අහසේ අකුරු ඇඳ ඒ කියැවීම), සිතු දැය කීමේ ක්‍රීඩාව, විකලාංගානුකරණය (කකුන් කොරුන් ආදීන් සේ ඉරියවූ පැවැත්වීම) යන මෙබඳු වූ පමාවට කරුණු වූ දූකෙළියෙහි යෙදී වෙසෙන් ද, හෙ තෙමේ මේ හෝ මෙ බඳු වූ පමාවට කරුණු වූ දූකෙළියෙහි යෙදීමෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

35. යම්සේ වනාහි ඇතැම් භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, දික්සඟළා පුටු ය, පලඟය, මහකොඳුපලඟය, වියමතෙන් විසිතුරු කළ එළුලොම්මුවා ඇතිරිය, එළුලොම්මුවා සුදු ඇතිරිය, ගනමල් යෙදූ එළුලොම් ඇතිරිය, තිලිය (පුලුන් මෙත්තය), සිංහාදිරූපවලින් විසිතුරු කළ එළුලොම් ඇතිරිය, දෙපැත්තේ ම ලොම් ඇති එළුලොම්මුවා ඇතිරිය, එක් පැත්තත් පමණක් ලොම් ඇති එළු-ලොම්මුවා ඇතිරිය, රන්කසුකම් කළ පසතුරුණ, කෝසෙය්‍ය ඝනින් විසූ ඇතිරිය, අසු පිටැ එලන ඇතිරිය, රියැ එලන ඇතිරිය, ඇඳට සරි ලන සේ අඳුන් දිවිසමින් මසා කළ ඇතිරිය, කෙහෙල්මුවසමින් කළ මහතු පසතුරුණ, ඉස්දෙර පාමුල රතුකොළට තබා ඇති රතු උඩුවියන් සහිත මහතු යහන යන මෙබඳු වූ උස් යහන් මහ යහන් පරිහරණය කිරීමෙහි යෙදී වෙසෙද්ද, හෙ තෙමේ මේ හෝ මෙ බඳු වූ උස් යහන් මහ යහන් පරිභෝගයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

36. යථා වා පනෙකෙ හොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං මණ්ඩනවිභූසනට්ඨානානුයොගං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: උච්ඡාදනං පරිමද්දනං නහාපනං සම්බාහනං ආදාසං අඤ්ජනං මාලාවිලෙපනං මුඛචූණ්ණකං[1] මුඛලෙපනං[2] හත්ථබන්ධං සිඛාබන්ධං දණ්ඩකං නාළිකං ඛග්ගං ඡත්තං චිත්‍රුපාහනං උණ්හීසං මණිං වාලවීජනිං ඔදාතානි වත්ථානි දීඝදසානි. ඉති වා ඉති-එවරූපා මණ්ඩනවිභූසනට්ඨානානුයොගා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

37. යථා වා පනෙකෙ හොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං තිරච්ඡානකථං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: රාජකථං චොරකථං මහාමත්තකථං සෙනාකථං භයකථං යුද්ධකථං අන්නකථං පානකථං වත්ථකථං සයනකථං මාලාකථං ගන්ධකථං ඤාතිකථං යානකථං ගාමකථං නිගමකථං නගරකථං ජනපදකථං ඉත්ථිකථං පුරිසකථං [කුමාරකථං කුමාරිකථං][3] සූරකථං විසිඛාකථං කුම්භට්ඨානකථං පුබ්බපෙතකථං නානත්තකථං ලෝකක්ඛායිකං සමුද්ද-ක්ඛායිකං ඉතිභවාභවකථං. ඉති වා ඉතිඑවරූපාය තිරච්ඡානකථාය පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

38. යථා වා පනෙකෙ හොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විග්ගාහිකකථං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: "න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි. අහං ඉමං ධම්මවිනයං ආජානාමි. කිං ත්වං ඉමං ධම්මවිනයං ආජානිස්සසි? මිච්ඡාපටිපන්නො ත්වමසි. අහමස්මි සම්මාපටිපන්නො. සහිතං මෙ, අසහිතං තෙ. පුරෙ වචනීයං පච්ඡා අවච. පච්ඡා වචනීයං පුරෙ අවච. ආවිණ්ණං[4] තෙ විපරාවත්තං. ආරොපිතො තෙ වාදො. නිග්ගහිතො ත්වමසි. චර වාදප්පමොක්ඛාය. නිබ්බෙඨෙහි වා සචෙ පහොසි"ති. ඉති වා ඉතිඑවරූපාය විග්ගාහිකකථාය පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං

39. යථා වා පනෙකෙ හොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං දූතෙය්‍යපහිණගමනානුයොගමනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: රාජූනං රාජමහාමත්තානං ඛත්තියානං බ්‍රාහ්මණානං ගහපතිකානං කුමාරානං "ඉධ ගච්ඡ. අමුත්‍රාගච්ඡ. ඉදං හර. අමුත්‍ර ඉදං ආහරා"ති. ඉති වා ඉතිඑවරූපා දූතෙය්‍යපහිණගමනානුයොගා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං

---

1. මුඛචූණ්ණං, මජ්ඣං. 2. මුඛාලෙපනං, සීමු.
3. මරම්මිපොත්ථකෙසුයෙව දිස්සතෙ 4. අවිවිණ්ණං, කොසුම්.

36. යම්සේ වනාහි සමහර භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, සුවඳසුණුයෙන් ඇඟ ඉලීම, අත්පාඇඟි මතා සටහන් ගන්වනුවට තෙල් ගා මැඩීම, සුවඳ දියෙන් නෑවීම, උරහිස්ඇඟි මස් වැඩෙනුවට මුගුරින් නැළීම, කැඩපතින් මුහුණ බැලීම, අලංකාර වශයෙන් අඳුන් ගෑම, මල් පැලැඳීම හා විලෙවුන් දැරීම, මුවසුණු මුව-විලවුන් දැරීම, හස්තාභරණ දැරීම, ඝිසැ කුඩුම්බිය බැඳීම, විසිතුරු සැරයටි දැරීම, විසිතුරු බෙහෙත්නළ දැරීම, කඩු දැරීම, විසිතුරු කුඩ දැරීම, විසිතුරු පාවහන් දැරීම, තලප්පට බැඳීම, සිළුමිණ පැලැඳීම, විසිතුරු සෙමෙර වල්මිදුනා දැරීම, දික් දවලු ඇති සුදු රෙදි හැඳීම යන ආදී ඇඟ අඩු තැන් පිරවීමටත් ඇඟ සැරැසීමටත් කරුණු වන දෑ පරිභෝග කිරීමෙහි යෙදී වෙසෙත් ද, හේ මහණ තෙමේ මේ හෝ මේ බඳු දෑ පරිභෝග කිරීමෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

37. යම්සේ වනාහි සමහර භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, රාජකථා, චෝරකථා, මහාමාත්‍ය කථා, සේනා කථා, භය කථා, යුද්ධ කථා, ආහාර කථා, පානකථා, වස්ත්‍රකථා, ශයන කථා මාලා කථා, ගන්ධ කථා, ඥාති කථා, යාන කථා, ග්‍රාම කථා, නිගම කථා, නගර කථා, ජනපද කථා, ස්ත්‍රී කථා, පුරුෂ කථා, කුමාර කථා, කුමාරි කථා, ශූර කථා, වීථි කථා, කුම්භඨාන කථා, පාතාළකථා, ලෝකාඛ්‍යායිකා කථා, සමුද්‍රාඛ්‍යායිකා කථා, ඉතිභවාභව කථා යන මෙ බඳු වූ තිරශ්චීන කථාවල යෙදී වෙසෙත් ද, ඒ මහණ තෙමේ මෙ කී හෝ මෙයින් අන්‍ය වූ හෝ මේ බඳු කථාවලින් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

38. යම්සේ වනාහි ඇතැම් පින්වත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, "තෝ මේ දහම් විනය නො දනිහි. මම ම මේ දහම් විනය දනිමි. 'මේ දහම් විනය කිමැ'යි තෝ දනිහි ද? තෝ වරදවා පිළිපන්නෙහි. මම මැනැවින් පිළිපන්නෙමි වෙමි. මා බස කරුණු සහිත ය. තා බස කරුණු රහිත ය. තෝ පළමුයෙන් කියැ යුත්ත පසු වැ කියෙහි ය. පසු වැ කියැ යුත්ත පළමුයෙන් කියෙහි ය. තා කලක් ම පුහුණු කළ දෑ ය මගේ එක් වචනයෙන් ම පෙරැළී ගියේ ය. මා විසින් තට දොස් තැබිණ. මා විසින් නිගත්තා ලද්දෙහි. මා නැගූ ගැටලු විසින් මිදෙන්නට හැකිරෙව (ඒ ඒ තැන ගොස් උගනුව). හැකි නම් එය විසඳව" යන ආදීන් මෙ බඳු වූ උනුන් බැණ දෙඩා ගැනුම්හි යෙදෙත් ද, ඒ මහණ තෙමේ මෙ කී හෝ අන් මෙ බඳු වූ හෝ බැණුම්දෙඩුම්වලින් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

36. යම්සේ සමහර භවත් මහණබමුණෝ "මෙහි යන්නැ, අසෝ තැනට එන්නැ, මෙය ගෙනැ යන්න, අසෝ තැනට මෙය ගෙනෙන්නැ"යි කළ නියෝග පිළිගෙන, රජුන්ගේ රජමහඇමැතියන්ගේ ක්ෂත්‍රියයන්ගේ බමුණන්ගේ ගැහැටියන්ගේ රජකුමරුවන්ගේ, මෙ බඳු දූත මෙහෙවරෙහි පණිවුඩ ගෙන යැමෙහි යෙදී වෙසෙත් ද, ඒ මහණ තෙමේ මෙ කී හෝ අන් මෙ වැනි වූ හෝ දූත මෙහෙවරින්, පණිවුඩ ගෙන යැමෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

40. යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ කුහකා ච හොන්ති ලපකා ච නෙමිත්තිකා ච නිප්පෙසිකා ච ලාභෙන ච ලාභං නිජිගිංසිතාරො. ඉති වා ඉතිඑවරූපා කුහනලපනා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

මජ්ඣිමසීලං නිට්ඨිතං.

41. යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථිදං: අඞ්ගං නිමිත්තං උප්පාතං[2] සුපිණං[3] ලක්ඛණං මූසිකච්ඡින්නං අග්ගිහොමං දබ්බිහොමං තුසහොමං කණ්ඩුලහොමං සප්පිහොමං තෙලහොමං මුඛහොමං ලොහිතහොමං අඞ්ගවිජ්ජා වත්ථුවිජ්ජා ඛත්තවිජ්ජා[4] සිවවිජ්ජා භූතවිජ්ජා භූරිවිජ්ජා අහිවිජ්ජා විසවිජ්ජා විච්ඡිකවිජ්ජා මූසිකවිජ්ජා සකුණවිජ්ජා වායසවිජ්ජා පක්කජ්ඣානං[5] සරපරිත්තානං මිගචක්කං. ඉති වා ඉතිඑවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

42. යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථිදං: මණිලක්ඛණං වත්ථලක්ඛණං දණ්ඩලක්ඛණං[6] අසිලක්ඛණං උසුලක්ඛණං ධනුලක්ඛණං ආවුධලක්ඛණං[7] ඉත්ථිලක්ඛණං පුරිසලක්ඛණං කුමාරලක්ඛණං කුමාරිලක්ඛණං දාසලක්ඛණං දාසිලක්ඛණං හත්ථිලක්ඛණං අස්සලක්ඛණං මහිංසලක්ඛණං[8] උසභලක්ඛණං ගො-ලක්ඛණං[9] අජලක්ඛණං මෙණ්ඩලක්ඛණං[10] කුක්කුටලක්ඛණං වට්ටක-ලක්ඛණං ගොධාලක්ඛණං කණ්ණිකාලක්ඛණං කච්ඡපලක්ඛණං මිගලක්ඛණං. ඉති වා ඉතිඑවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

43. යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති සෙය්‍යථිදං: රඤ්ඤං නිය්‍යානං භවිස්සති, රඤ්ඤං අනිය්‍යානං භවිස්සති, අබ්භන්තරානං රඤ්ඤං උපයානං භවිස්සති, බාහිරානං රඤ්ඤං අපයානං භවිස්සති, බාහිරානං රඤ්ඤං උපයානං භවිස්සති, අබ්භන්තරානං රඤ්ඤං අපයානං භවිස්සති, අබ්භන්තරානං රඤ්ඤං ජයො භවිස්සති, බාහිරානං රඤ්ඤං පරාජයො භවිස්සති, බාහිරානං රඤ්ඤං ජයො භවිස්සති, අබ්භන්තරානං රඤ්ඤං පරාජයො භවිස්සති. ඉති ඉමස්ස ජයො භවිස්සති. ඉමස්ස පරාජයො භවිස්සති. ඉති වා ඉති-එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

---

1. ජීවිතං, මජ්ඣං.
2. උප්පාදං, සීමු. 3. සුපිනං, මජ්ඣං. සුපිණකං, සී.
4. ඛත්තං, කොසුම්. 5. පක්ක, කොසුම්.
6. දණ්ඩලක්ඛණං සණ්ඩලක්ඛණං, මජ්ඣං. 7. ආයුධ, කොසුම්.
8. මහිංස, මජ්ඣං. 9 ගොණ, මජ්ඣං. 10. මෙණ්ඩක, කොසුම්.

40. යම්සේ සමහර පින්වත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, කුහකකම් කරන්නෝ වෙත් ද, ලාභසත්කාර පතා අනුන් සිත් ඇදෙන සේ වූ වාදු බස් දෙඛන්නෝ වෙත් ද, සිවුපසය ලබනු සඳහා කයින් හෝ බසින් ඇඟැවීම් කරන්නෝ වෙත් ද, ලාභාපේක්ෂායෙන් අනුනට ගරහන්නෝ වෙත් ද, ලාභයෙන් ලාභය සොයන්නෝ වෙත් ද, ඒ මහණ තෙමේ මෙ කී හෝ මෙබඳු වූ හෝ කුහනලපනවලින් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

මධ්‍යමශීලය නිමිසේ ය.

41. යම්සේ ඇතැම් පින්වත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, අංගශාස්ත්‍රය, නිමිත්තශාස්ත්‍රය, උත්පාතලක්ෂණය, සුප්තශාස්ත්‍රය, ලක්ෂණශාස්ත්‍රය, මූෂකවර්ජිත්තවිද්‍යාව, අග්නිහෝමය, දර්වීහෝමය, තුෂහෝමය, කණහෝමය, තණ්ඩුලහෝමය, සර්පිර්හෝමය, තෛලහෝමය, මුඛහෝමය, ලෝහිතහෝමය, අංගවිද්‍යාව, වාස්තුවිද්‍යාව, ක්ෂත්‍රවිද්‍යාව, ශිවවිද්‍යාව, භූතවිද්‍යාව, භූරිවිද්‍යාව, අහිවිද්‍යාව, විෂවිද්‍යාව, වෘශ්චිකවිද්‍යාව, මූෂකවිද්‍යාව, ශාකුනවිද්‍යාව, වායසවිද්‍යාව, පක්වඛ්‍යානය, ශරපරිත්‍රාණය, මෘගපක්ෂය යන මෙ කී හෝ මෙබඳු වූ හෝ තිරශ්චීනවිද්‍යයෙන් මිථ්‍යාජීවයෙන් දිවි පවත්වත්ද, ඒ මහණ තෙමේ එයින් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වෙයි.

42. යම්සේ වනාහි ඇතැම් පින්වත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, මිණිලකුණුය, වත්ලකුණුය, දඬුලකුණුය, කඩුලකුණුය, ඊලකුණුය, දුනුලකුණුය, අවිලකුණුය, ඉතිරිලකුණුය, පුරිස්ලකුණුය, කුමරලකුණුය, කුමරිලකුණුය, දස්ලකුණුය, දසිලකුණුය, ඇත්ලකුණුය, අස්ලකුණුය, මිගුලකුණුය, වහස්ලකුණුය, ගොන්ලකුණුය, එළුලකුණුය, බැටෙළුලකුණුය, කුකුළුලකුණුය, වටුලකුණුය, ගොස්ලකුණුය, කැණලකුණුය, කසුබුලකුණුය, මුවලකුණුය යන ආදී මෙබඳු තිරශ්චීන විද්‍යයෙන්, මෙබඳු මිථ්‍යාජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ තෙමේ එයින් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

43. යම්සේ වනාහි ඇතැම් පින්වත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, "අසෝ දිනැ අසෝ නැකැතින් (ශුද සඳහා) සිය නුවරින් අසෝ රජුන්ගේ නික්මීම වන්නේ ය, අසෝ නැකැතින් පෙරළා සිය නුවරට ඒම වන්නේ ය, අසෝ නැකැතින් පිටතැ සිටින සතුරු රජුන් හමු වන්නට රට තුළ උන් රජුන්ගේ යෑම වන්නේ ය, අසෝ නැකැතින් පිටතැ සිටින සතුරු රජුන්ගේ ඉවත් වැ යෑම වන්නේ ය, අසෝ නැකැතින් රට තුළැ සිටින රජුන් කරා පිටතැ සිටින සතුරු රජුන්ගේ පැමිණීම වන්නේ ය, අසෝ නැකැතින් අතුළතැ සිටින රජුන්ගේ ඉවත් වැ යෑම වන්නේ ය. රට ඇතුළතැ සිටින රජුනට ජය වන්නේ ය. පිටතැ සිටින සතුරු රජුනට පරාජය වන්නේ ය. පිටතැ සිටින සතුරු රජුනට ජය වන්නේ ය. රට තුළ සිටින රජුනට පරාජය වන්නේ යැ'' යි මෙසේ 'මොහුට ජය වන්නේ ය, මොහුට පරාජය වන්නේ යැ'යි කියමින් මෙ බඳු වූ තිරශ්චීනවිද්‍යයෙන්, මෙ බඳු වූ මිථ්‍යාජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ තෙමේ මෙ හෝ මෙ බඳු වූ තිරශ්චීනවිද්‍යයෙන් මිථ්‍යාජීවිකායෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

44. යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති. සෙය්‍යථිදං: චන්දග්ගාහො භවිස්සති. සූරියග්ගාහො භවිස්සති. නක්ඛත්තග්ගාහො භවිස්සති. චන්දිමසූරියානං පථගමනං භවිස්සති. චන්දිමසූරියානං උපපථගමනං භවිස්සති. නක්ඛත්තානං පථගමනං භවිස්සති. නක්ඛත්තානං උපපථගමනං භවිස්සති. උක්කාපාතො භවිස්සති. දිසාඩාහො භවිස්සති. භූමිචාලො භවිස්සති. දෙවදුන්දුභී භවිස්සති. චන්දිමසූරියනක්ඛත්තානං උග්ගමනං ඔගමනං[1] සංකිලෙසං වොදානං භවිස්සති. එවංවිපාකො චන්දග්ගාහො භවිස්සති. එවංවිපාකො සූරියග්ගාහො භවිස්සති. එවංවිපාකො නක්ඛත්තග්ගාහො භවිස්සති. එවං-විපාකං චන්දිමසූරියානං පථගමනං භවිස්සති. එවංවිපාකං චන්දිමසූරියානං උපපථගමනං භවිස්සති. එවංවිපාකං නක්ඛත්තානං පථගමනං භවිස්සති. එවංවිපාකං නක්ඛත්තානං උපපථගමනං භවිස්සති. එවංවිපාකො උක්කාපාතො භවිස්සති. එවංවිපාකො දිසාඩාහො භවිස්සති. එවංවිපාකො භූමිචාලො භවිස්සති. එවංවිපාකො දෙවදුන්දුභී භවිස්සති. එවංවිපාකං චන්දිමසූරියනක්ඛත්තානං උග්ගමනං ඔගමනං සඞ්කිලෙසං වොදානං භවිස්සති. ඉති වා ඉතිඑවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

45. යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති. සෙය්‍යථිදං: සුබ්බුට්ඨිකා භවිස්සති. දුබ්බුට්ඨිකා භවිස්සති. සුභික්ඛං භවිස්සති. දුබ්භික්ඛං භවිස්සති. ඛෙමං භවිස්සති. භයං භවිස්සති. රොගො භවිස්සති. ආරොග්‍යං භවිස්සති. මුද්දා ගණනා සංඛානං කාවෙය්‍යං ලොකායතං. ඉති වා ඉතිඑවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

46. යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති. සෙය්‍යථිදං: ආවාහනං විවාහනං සංවදනං විවදනං සංකිරණං විකිරණං සුභගකරණං දුබ්භගකරණං විරුද්ධගබ්භකරණං ජිව්හානිප්ඵෙඩනං[2] හනුසංහනනං හත්ථාභිජ්ජපනං හනුජ්ජපනං කණ්ණ-ජ්ජපනං ආදාසපඤ්හං කුමාරිපඤ්හං දෙවපඤ්හං ආදිච්චුපට්ඨානං මහතුපට්ඨානං අබ්භුජ්ජලනං සිරිභද්දිකා. ඉති වා ඉතිඑවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

---

1. ඔග්ගමනං, සොසුවි. 2. ජිව්හානිප්ඵෙඩනං. බහුසු.

44. යම්සේ වනාහි ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, "අසෝ දිනැ චන්ද්‍රග්‍රහණය වන්නේ ය. අසෝ දිනැ සූර්‍යග්‍රහණය වන්නේ ය. අසෝ දිනැ සඳ හිරු දෙදෙනා නිසි මඟින් යැම වන්නේ ය. අසෝ දිනැ ඔවුන් නොමඟින් යැම වන්නේ ය. අසෝ දිනැ තකත් තරුන් නිසිමඟින් යැම වන්නේ ය. අසෝ දිනැ ඔවුන් නොමඟින් යැම වන්නේ ය. අසෝ දිනැ උල්කාපතනය වන්නේ ය. දිග්දාහය වන්නේ ය. භූමිකම්පනය වන්නේ ය. වැසි නැති වැ අහස් ගෙරැවුම් වන්නේ ය. සඳහිරුන්ගේ ද, තකත් තරුන්ගේ ද උදාව බැසීම කෙලෙසීම පිරිසිදුබව වන්නේ ය. සූර්‍යග්‍රහණය ලොවට මෙබඳු පල ගෙනැ දෙන්නේ ය. චන්ද්‍රග්‍රහණය මෙබඳු පල ගෙනැ දෙන්නේ ය. නක්ෂත්‍රග්‍රහණය මෙබඳු පල ගෙනැ දෙන්නේ ය. සඳ හිරුන් නිසි මඟින් යැම මෙබඳු පල ගෙනැ දෙන්නේ ය. සඳ හිරු දෙදෙනාගේ නො මඟින් යැම මෙ බඳු පල ගෙනැ දෙන්නේ ය. තකත්තරුවල පථගමනය මෙබඳු පල ගෙනැ දෙන්නේ ය. ඔවුන්ගේ උත්පථගමනය මෙ බඳු පල ගෙනැ දෙන්නේ ය. උල්කාපතනය මෙ බඳු පල ගෙනැ දෙන්නේ ය. දිග්දාහය මෙබඳු පල ගෙනැ දෙන්නේ ය. භූමිකම්පනය මෙබඳු පල ගෙනැ දෙන්නේ ය. වැසි නැති වැ අහස්ගෙරැවුම් මෙබඳු පල දෙන්නේ ය. සඳහිරුන්ගේ ද තකත් තරුවල ද උදාවත් බැසීමත් කෙලෙසීමත් පිරිසිදු වීමත් මෙ බඳු මෙ බඳු පල දෙන්නේ යැ"යි කියනුවෝ මෙ බඳු තිරශ්චීන විද්‍යයෙන්, මෙ බඳු මිථ්‍යාජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ තෙමේ මේ හෝ මෙ බඳු තිරශ්චීන විද්‍යයෙන්, මිථ්‍යාජීවිකායෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

45. යම්සේ වනාහි ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, "මෙ සමයෙහි වැසි වස්නේ ය. මෙ සමයෙහි නියං වන්නේ ය. මෙ සමයෙහි රට සුභික්ෂ වන්නේ ය. මෙ සමයෙහි රට දුර්භික්ෂ වන්නේ ය. මෙ සමයෙහි රටට උවදුරු වන්නේ ය. මෙ සමයෙහි රටට භය වන්නේ ය. මෙ කලැ රෝග වන්නේ ය, මෙ කලැ රෝග නැති බව වන්නේ යැ"යි පලාපල කීම ද, මුද්‍රාව (ඇඟිලි පුරැක්ඟි සංඥ තබා ගිණීම) ද, ගණනාව (එක දෙක යන ආදීන් ගිණීම)ද, කාව්‍යශාස්ත්‍රය, ලෝකායත ශාස්ත්‍රය යන මේ හෝ මෙබඳු තිරශ්චීන විද්‍යයෙන්, මිථ්‍යාආජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ තෙමේ මේ හෝ අන් මෙ බඳු වූ හෝ තිරශ්චීනවිද්‍යයෙන්, මිථ්‍යාආජීවයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

46. යම්සේ වනාහි ඇතැම් පින්වත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, ආවාහ සඳහා තකත් කීම, විවාහ සඳහා තකත් කීම, වෙන් වූ අඹුසැමියන් එක් වන්නට තකත් කීම, අඹුසැමියන් වෙන් වන්නට තකත් කීම, දුන් ණය රැස් කිරීමට තකත් කීම, මුදල් ණයට පොලියට දීමට තකත් කීම, සෞභාග්‍යය ඇති වනුවට යන්ත්‍ර මන්ත්‍රාදිය කැරැ දීම, කිමි පාලු වන්නට හදි හුනියම් කිරීම, නැසෙන්නට යන දරු ගබ් රැකෙන්නට පිළියම් කිරීම, දිවගුලු බැඳීම, මන්ත්‍රාදියේ බලයෙන් හනු තද කිරීම, අත් පෙරැලෙන්නට මතුරු දැපීම, හනු පෙරැලෙන්නට මතුරු දැපීම, කන් අඟුලු වැටෙන්නට මතුරු දැපීම, කැඩපතෙහි දේවතාවේශය කොට ප්‍රශ්න ඇසීම, කුමරියක ලවා ජෙන කියැවීම, දෙවිදැස්සක ලවා ජෙන කියැවීම, ජීවිකා පිණිස හිරු පිදීම, මහබඹු පිදීම, මතුරු දපා මුවින් ගිනිජ්ල් විහිදුවීම, මතුරු දපා සිරිකත කැඳැවීම යන මේ හෝ අන් මෙ බඳු වූ තිරශ්චීන විද්‍යයෙන්, මිථ්‍යාජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ තෙමේ මෙ ද, අන් මෙබඳු වූ ද තිරශ්චීනවිද්‍යයෙන්, මිථ්‍යාජීවයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

47. යථා වා පනෙකෙ භොතො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති. සෙය්‍යථිදං: සන්තිකම්මං පණිධිකම්මං භූතකම්මං භූරිකම්මං වස්සකම්මං වොස්සකම්මං වත්ථුකම්මං වත්ථුපරිකිරණං ආචමනං නහාපනං ජ්ජූහනං වමනං විරෙචනං උද්ධවිරෙචනං අධොවිරෙචනං සීසවිරෙචනං කණ්ණතෙලං නෙත්තතප්පනං නත්ථුකම්මං අඤ්ජනං පච්චඤ්ජනං සාලාකියං සල්ලකත්තියං දාරකතිකිච්ඡා මූලභෙසජ්ජානං අනුප්පදානං ඔසධීනං පටිමොක්ඛො. ඉති වා ඉතිඑවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

48. ස ඛො[1] සො මහාරාජ භික්ඛු එවං සීලසම්පන්නො න කුතොචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතො. සෙය්‍යථාපි මහාරාජ ඛත්තියො මුද්ධාවසිත්තො[2] නිහතපච්චාමිත්තො න කුතොචි භයං සමනුපස්සති යදිදං පච්චත්තිකතො, එවමෙව ඛො මහාරාජ භික්ඛු එවං සීලසම්පන්නො න කුතොචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතො. සො ඉමිනා අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො අජ්ඣත්තං අනවජ්ජසුඛං පටිසංවෙදෙති. එවං ඛො මහාරාජ භික්ඛු සීලසම්පන්නො හොති.

49. කථඤ්ච මහාරාජ භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති ? ඉධ මහාරාජ භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දෙමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වස්සවෙය්‍යුං[3] තස්ස සංවරාය පටිපජ්ජති. රක්ඛති චක්ඛුන්ද්‍රියං. චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝාණෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙතං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදෙමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වස්සවෙය්‍යුං තස්ස සංවරාය පටිපජ්ජති, රක්ඛති මනින්ද්‍රියං. මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සො ඉමිනා අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො අජ්ඣත්තං අබ්‍යාසෙකසුඛං පටිසංවෙදෙති. එවං ඛො මහාරාජ භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති.

---

1. අථ ඛො, සොසුවි. 2. මුද්ධාභිසිත්තො, සොසුවි.
3. අන්වාසවෙය්‍යුං, අන්වාස්සවෙය්‍යුං, සොසුවි.

47. යම්සේ වනාහි ඇතැම් පින්වත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, ශාන්තිකම්, ප්‍රණීතිකම්, භූරිකම්, පණ්ඩකයා පිරිමියකු කිරීම, පිරිමියා පණ්ඩකයකු කිරීම, වාස්තුකම්, වාස්තු පරිකිරණ, මතුරු දපා මුව දෙවුම, මතුරු දපා අනුත් තැවීම, සෙත් පතා ගිනි පිදීම, ගිහියනට වමන කරවීම, බඩ විරේක කරවීම, ලය විරේකයට බෙත් දීම, වස්ති කිරීම, ශීර්ෂවිරේචන බෙත් දීම, කන් ලෙඩට තෙල් පිසැ දීම, ගිහියන් සඳහා ඇස පටලයට සිසිල ගන්වන නෙත් තෙල් පිසීම, ගිහියනට නස්‍ය දීම, කාරම් අඳුන් සාදා දීම, ඇස සිසිල ගන්වන අඳුන් සාදා දීම, ගිහියන්ගේ ඇසැ උල්ඇන ලෙඩට බෙත් කිරීම, ගිහියනට ශල්‍ය කර්ම කිරීම, ළදරුවන්ගේ ලෙඩට පිළියම් කිරීම, මුල් බෙහෙත් දීම (කායචිකිත්සාව), කාරම් බෙත් බැඳ වණ සුව වූ පසු ඒවා ගලවා දැමීම යැ"යි මේ ආදී වූ හෝ මෙබඳු වූ තිරශ්චීනවිද්‍යයෙන්, මිථ්‍යාආජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ තෙමේ ඒ සියල්ලෙන් වැළැක්කේ වෙයි, මෙ ද ඔහුගේ ශීලයෙක් වේ.

48. මහරජාණනි, ඒ මහණ තෙමේ මෙසේ ශීලසම්පන්න වූයේ ශීලසංවරහේතුයෙන් කිසි ම එක ද අසංවරතායෙකින් පහළ වියැ හැකි කියක් නො දකී. මහරජාණනි, ක්ෂත්‍රියාභිෂෙකයෙන් අභිෂෙක ලත්, වැනැසූ සතුරන් ඇති ක්ෂත්‍රියයෙක් කිසි ම එක ද සතුරකුගෙන් වියැ හැකි කිසිදු කියකුත් යම්සේ නො දක්නේ ද, මහරජාණනි, එසේ ම මහණ තෙමේ මෙ පරිද්දෙන් ශීලසම්පන්න වූයේ, ශීලසංවරහේතුයෙන් කිසි ම එක ද අංසවරයෙකින් ඉපැදියැ හැකි කියක් නො දකී. හේ මේ ආර්‍ය ශීලස්කන්ධයෙන් සමන්විත වූයේ, සිය සතන්හි නිදොස් වූ කායික චෛතසික සුවය විඳී. මහරජ, මෙසේ වනාහි මහණ තෙමේ ශීලසම්පන්න වේ.

49. මහරජාණනි, මහණ තෙමේ කෙසේ නම් ඉඳුරන්හි වැසූ දොර ඇත්තේ වේ ද? යත්: මහරජාණනි, මෙ සස්නෙහි මහණ තෙමේ ඇසින් රූපයක් දැක ශුභාදිවශයෙන් එහි ලකුණු නො ගන්නේ වේ. ශුභාදිවශයෙන් අත් පා ආදී අවයවයන්ගේ ආකාර සිතට නො ගන්නේ වේ. යම් කරුණෙකින් චක්ෂුරින්ද්‍රිය වසා නො ගෙන වසන්නහුගේ චිත්තසන්තානයට විෂම ලෝභ දෞර්මනස් ආදී ලාමක අකුශල සභාවයෝ නැවත නැවත වැස්සෙන්නාහු ද (නො හොත් චිත්තසන්තානය ලුහුබඳනාහු ද) එහි (ඒ චක්ෂුරින්ද්‍රියයාගේ) සංවරය පිණිස හේ පිළිපදී. ඒ චක්ෂුරින්ද්‍රියය රකී. ඒ චක්ෂුරින්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. කනින් හඬ අසා ... නාසයෙන් ගඳ ආඝ්‍රාණය කොට ... දිවෙන් රස ආස්වාදය කොට ... කයින් ස්ප්‍රෂ්ටව්‍යය (ඇඟට හැපෙන දෑ) ස්පර්ශ කොට ... සිතින් ධර්මාලම්බන දැන, ශුභාදිවශයෙන් එහි ලකුණු ගන්නේ නො වේ. ශුභාදිවශයෙන් අත් පා ආදි අවයවයන්ගේ ආකාර සිතට ගන්නේ නො වේ. යම් කරුණෙකින් ශ්‍රෝත්‍රෙන්ද්‍රියය ... ඝ්‍රාණේන්ද්‍රියය ... ජිහ්වේන්ද්‍රියය ... කායේන්ද්‍රියය ... මනඉන්ද්‍රියය සංවර කොට නොගෙන වසන්නහුගේ චිත්තසන්තානයට විෂමලෝභ දෞර්මනස් ආදි ලාමක අකුශල සභාවයෝ නැවත නැවත වැස්සෙන්නාහු ද (නොහොත් චිත්තසන්තානය අනුබඳනාහු ද,) ඒ ශ්‍රෝත්‍රෙන්ද්‍රියයාගේ ... ඝ්‍රාණේන්ද්‍රියයාගේ ... ජිහ්වේන්ද්‍රියයාගේ ... කායේන්ද්‍රියයාගේ ... මනඉන්ද්‍රියයාගේ සංවරය පිණිස පිළිපදී. ශ්‍රෝත්‍ර ... ඝ්‍රාණ ...ජිහ්වා ... කාය ... මන ඉන්ද්‍රියය රකී. එහි සංවරයට පැමිණේ. හේ මේ ආර්‍ය වූ ඉන්ද්‍රියසංවරයෙන් සමන්විත වූයේ සිය සතන්හි අව්‍යාසේක සුඛය (කෙලෙසුන් ගෙන් තෙත් නොවීමෙන් වූ පිරිසිදු අධිචිත්ත සුඛය) විඳී. මහරජාණනි, මෙසේ වනාහි මහණ තෙමේ ඉන්ද්‍රියයන්හි වැසූ දොර ඇත්තේ වේ.

50. කථඤ්ච මහාරාජ භික්ඛු සතිසම්පජඤ්ඤේන සමන්නාගතො හොති? ඉධ මහාරාජ භික්ඛු අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී හොති. ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති. සමිඤ්ජිතෙ[1] පසාරිතෙ සම්පජානකාරී හොති. සඞ්ඝාටිපත්තචීවරධාරණෙ සම්පජානකාරී හොති. අසිතෙ පීතෙ ඛායිතෙ සායිතෙ සම්පජානකාරී හොති. උච්චාර-පස්සාවකම්මෙ සම්පජානකාරී හොති. ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ සම්පජානකාරී හොති. එවං ඛො මහාරාජ භික්ඛු සතිසම්පජඤ්ඤේන සමන්නාගතො හොති.

51. කථඤ්ච මහාරාජ භික්ඛු සන්තුට්ඨො හොති? ඉධ මහාරාජ භික්ඛු සන්තුට්ඨො හොති කායපරිහාරියෙන චීවරෙන කුච්ඡිපරිහාරියෙන[2] පිණ්ඩපාතෙන. සො යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති. සෙය්‍යථාපි මහාරාජ පක්ඛී සකුණො යෙන යෙනෙව ඩෙති සපත්තභාරොව ඩෙති, එවමෙව ඛො මහාරාජ භික්ඛු සන්තුට්ඨො හොති කායපරිහාරියෙන චීවරෙන කුච්ඡිපරිහාරියෙන පිණ්ඩපාතෙන. සො යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති. එවං ඛො මහාරාජ භික්ඛු සන්තුට්ඨො හොති.

52. සො ඉමිනා ච අරියෙන සීලක්ඛන්ධෙන[3] සමන්නාගතො ඉමිනා ච අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො ඉමිනා ච අරියෙන සතිසම්පජ-ඤ්ඤේන සමන්නාගතො ඉමාය ච අරියාය සන්තුට්ඨියා සමන්නාගතො විවිත්තං සෙනාසනං භජති අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං. සො පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා.

53. සො අභිජ්ඣං ලොකෙ පහාය විගතාභිජ්ඣෙන චෙතසා විහරති. අභිජ්ඣාය චිත්තං පරිසොධෙති. බ්‍යාපාදපදොසං පහාය අබ්‍යාපන්නචිත්තො විහරති සබ්බපාණභූතහිතානුකම්පී. බ්‍යාපාදපදොසා චිත්තං පරිසොධෙති. ථිනමිද්ධං පහාය විගතථිනමිද්ධො විහරති ආලොකසඤ්ඤී සතො සම්පජානො. ථිනමිද්ධා චිත්තං පරිසොධෙති. උද්ධච්චකුක්කුච්චං පහාය අනුද්ධතො විහරති අජ්ඣත්තං වූපසන්තචිත්තො. උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසොධෙති. විචිකිච්ඡං පහාය තිණ්ණවිචිකිච්ඡො විහරති අකථංකථී කුසලෙසු ධම්මෙසු. විචිකිච්ඡාය චිත්තං පරිසොධෙති.

---

1. සම්මිඤ්ජිතෙ, කොසුචි. 2. පරිහාරිකෙන, සීමු.
3. ඉමිනා සීලක්ඛන්ධෙන, සක්ඛිපථ.

50. මහරජාණනි, මහණ තෙමේ කෙසේ නම් ස්මෘතිසම්ප්‍රජානතයෙන් (සිහි නුවණින්) සමන්විත වේ ද? යත්:

මහරජාණනි, මෙ සස්තෙහි මහණ තෙමේ ඉදිරියට යෑමෙහි පෙරළා ඒමෙහි (ආපසු හැරීමෙහි) මනා නුවණින් දැන ම (එය) කරනුයේ වෙයි. ඉදිරි බැලීමෙහි, අනුදික් බැලීමෙහි (වට පිට බැලීමෙහි) මනා නුවණින් දැන ම (එය) කරනුයේ වෙයි. අත් පා ආදිය හැකිලීමෙහි, දිගු කිරීමෙහි නුවණින් දැන ම (එය) කරනුයේ වෙයි. සඟළසිවුර ද පාත්‍රය ද සෙසු සිවුරු ද දැරීමෙහි නුවණින් දැන ම කරන්නේ වෙයි. ආහාර ගැන්මෙහි, පැන් පීමෙහි, පිටි කෑවිලි ආදිය කෑමෙහි, මී ආදිය රස විඳීමෙහි, නුවණින් දැන ම කරනුයේ වෙයි. මල මුත් පහ කිරීමෙහි නුවණින් දැන ම කරනුයේ වෙයි ගමනෙහි සිටීමෙහි හිඳීමෙහි නිදීමෙහි කථා කිරීමෙහි, නො කිණීමෙහි නුවණින් දැන කරනුයේ වෙයි. මහරජාණනි, මෙසේ වනාහි මහණ තෙම සිහි නුවණින් සමන්විත වෙයි.

15 මහරජාණනි, කෙසේ නම් මහණ තෙමේ ලද පමණෙහි සතුටු වේ ද? යත්:

මහරජාණනි, මෙ සස්තෙහි මහණ තෙමේ කායපරිහරණයට ප්‍රමාණ වූ සිවුරින් ද කුක්ෂිපරිහරණයට ප්‍රමාණ වූ ආහාරයෙන් ද සතුටු වෙයි. හේ යම් යම් තැනකට නික්මෑ යේ ද, අට පිරිකර පමණක් ගෙන ම නික්මෙයි. මහරජාණනි, (පියා හඹනුවට තරම්) අත්තටු ඇති කුරුලු තෙමේ යම් යම් තැනක පියා හඹා යේ නම්, පියාපත්බර සහිත ව ම යම් සේ පියාහඹා ද, එසේ ම, මහරජාණනි, ඒ මහණ තෙමේ කායපරිහරණයට ප්‍රමාණ වූ සිවුරින් ද කුක්ෂිපරිහරණයට ප්‍රමාණ වූ ආහාරයෙන් ද සතුටු වෙයි. හේ යම් යම් තැනකට යේ ද පා සිවුරු (ආදි අට පිරිකර පමණක්) රැගෙන ම යෙයි. මහරජාණනි, මෙසේ වනාහි මහණ තෙමේ ලද පසයෙහි සතුටු වේ.

52. මහරජාණනි, ඒ මහණ තෙමේ මේ ආර්‍ය ශීලසකඛයෙන් ද සමන්විත වූයේ, මේ ආර්‍ය ඉන්ද්‍රියසංවරයෙන් ද සමන්විත වූයේ, මේ ආර්‍ය සමෘතිසම්ප්‍රජානතයෙන් ද සමන්විත වූයේ, මේ ආර්‍ය සන්තුෂ්ටියෙන් ද සමන්විත වූයේ, අරණ්‍ය වෘක්ෂමූල පර්වත කන්දරැලි ගිරිගුහා සොහොන් වනපෙත් (වනප්‍රස්ථ) අභ්‍යවකාශ (එළිමහන්) පිදුරැලෙන් යන මෙ කී ජනශූන්‍ය කිසි සෙනස්නක් භජනය කෙරෙයි. හේ පිඬු සෙවීමෙන් පෙරළා ආයේ, පසුබත් සෙමෙහි, පලක් බැඳ උඩු කය කෙළිත් පිහිටුවා, කමටහනට අභිමුඛ කොට සිහිය එළවා හිඳී.

53. හේ ලොවැ (පඤ්ච උපාදානස්කන්ධය කෙරෙහි) ඇල්ම හැර, විගතාභිධ්‍යාණප්‍රහාණයෙන් (යට පත් කිරීමෙන්) පහ වූ අභිජ්ඣායෙන් ශුද්ධ සිතින් වෙසෙයි. අභිජ්ඣාව කෙරෙන් සිත පිරිසිදු කෙරෙයි. ව්‍යාපාද ප්‍රදෝෂය (ක්‍රෝධය) හැර, ව්‍යාපාද රහිත සිතැත්තේ, සියලු පණ ඇති සතුන් කෙරේ හිතානුකම්පා ඇති වැ වෙසෙයි. ක්‍රෝධය කෙරෙන් සිත පිරිසිදු කෙරෙයි. ස්ත්‍යානමිද්ධය හැර, පහ වූ ස්ත්‍යානමිද්ධය ඇත්තේ, දවල් දෙක්හි ම දුටු එළිය හඳුනනු හැකි පිරිසිදු සංඥව ඇත්තේ, සිහියෙනුත් නුවණිනුත් යුක්ත වූයේ වෙසෙයි. ස්ත්‍යානමිද්ධය කෙරෙන් සිත පිරිසිදු කෙරෙයි. උද්ධච්චකුක්කුච්චය (සිතැ තොසංහුත් බවත්) කුකුසත් (කළ නො කළ දෙයෙහි පසුතැවිල්ලත්) සිතින් දුරු ලා, අනුද්ධත වැ (තොසංහුත් බැවින් තොර වැ), සංසිඳුණු සවකීය චිත්තසන්තානය ඇත්තේ, උද්ධච්ච කුකුස් දෙක කෙරෙන් සිත පිරිසිදු කෙරෙයි. සැකය දුරු ලා, පහ වූ සැක ඇත්තේ, කුසල් දහම්හි සැක නො කරනුයේ, සැකය කෙරෙන් සිත පිරිසිදු කෙරෙයි.

54. සෙය්‍යථාපි මහාරාජ පුරිසො ඉණං ආදාය කම්මන්තෙ පයොජෙය්‍ය, තස්ස තෙ කම්මන්තා සම්ජ්ජෙය්‍යුං, සො යානි ච පොරාණානි ඉණමූලානි තානි ච ව්‍යන්තීකරෙය්‍ය, සියා චස්ස උත්තරිං අවසිට්ඨං දාරභරණාය, තස්ස එවමස්ස: "අහං ඛො පුබ්බෙ ඉණං ආදාය කම්මන්තෙ පයොජෙසිං. තස්ස මෙ තෙ කම්මන්තා සම්ජ්ජිංසු. යො හං යානි ච පොරාණානි ඉණමූලානි තානි ච ව්‍යන්තී අකාසිං. අත්ථි ච මෙ උත්තරිං අවසිට්ඨං දාරභරණාය"ති. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං, අධිගච්ඡෙය්‍ය සොමනස්සං-

55. සෙය්‍යථාපි මහාරාජ පුරිසො ආබාධිකො අස්ස දුක්ඛිතො බාළ්හගිලානො, භත්තං චස්ස නච්ඡාදෙය්‍ය, න චස්ස කායෙ බලමත්තා, සො අපරෙන සමයෙන තම්හා ආබාධා මුච්චෙය්‍ය, භත්තඤ්චස්ස ඡාදෙය්‍ය, සියා චස්ස කායෙ බලමත්තා, තස්ස එවමස්ස: "අහං ඛො පුබ්බෙ ආබාධිකො අහොසිං දුක්ඛිතො බාළ්හගිලානො. භත්තං ච මෙ නච්ඡාදෙසි. නච්චස්ස මෙ ආසි කායෙ බලමත්තා. සො'මහි එතරහි තම්හා ආබාධා මුත්තො භත්තඤ්ච මෙ ඡාදෙති. අත්ථි ච මෙ කායෙ බලමත්තා"ති. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං, අධිගච්ඡෙය්‍ය සොමනස්සං-

56. සෙය්‍යථාපි මහාරාජ පුරිසො බන්ධනාගාරෙ බද්ධො අස්ස, සො අපරෙන සමයෙන තම්හා බන්ධනාගාරා මුච්චෙය්‍ය සොත්ථිනා අබ්භයෙන[1], න චස්ස කිඤ්චි භොගානං වයො, තස්ස එවමස්ස: "අහං ඛො පුබ්බෙ බන්ධනාගාරෙ බද්ධො අහොසිං. සො'මහි එතරහි තම්හා බන්ධනාගාරා මුත්තො සොත්ථිනා අබ්භයෙන. නත්ථි ච මෙ කිඤ්චි භොගානං වයො"ති. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං, අධිගච්ඡෙය්‍ය සොමනස්සං-

57. සෙය්‍යථාපි මහාරාජ පුරිසො දාසො අස්ස අනත්තාධීනො පරාධීනො න යෙනකාමඞ්ගමො, සො අපරෙන සමයෙන තම්හා දාසබ්‍යා මුච්චෙය්‍ය අත්තාධීනො අපරාධීනො භුජිස්සො යෙනකාමඞ්ගමො, තස්ස එවමස්ස: "අහං ඛො පුබ්බෙ දාසො අහොසිං අනත්තාධීනො පරාධීනො න යෙනකාමඞ්ගමො, සො'මහි එතරහි තම්හා දාසබ්‍යා මුත්තො අත්තාධීනො අපරාධීනො භුජිස්සො යෙනකාමඞ්ගමො"ති. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං, අධිගච්ඡෙය්‍ය සොමනස්සං-

---

1. අභ්‍යභයෙන, PTS.

54. මහරජාණනි, යම් සේ පුරුෂයෙක් (පොලියට) ණය මුදලක් ගෙන කර්මාන්ත කරන්නේ ද, ඔහුගේ ඒ කර්මාන්ත සමෘද්ධ වන්නේ නම්, හේ යම් පරණ ණය මුදල් වී නම්, ඒ සියල්ල ගෙවා අවසන් කරන්නේ ද, මත්තෙහි ඉතිරි වූ යමක් ඇත් නම් එය අඹුදරුවන් රක්නා පිණිස වන්නේ ද, එසේ වූ ඔහුට "මම් පළමුයෙන් ණයට මුදල් ගෙන කර්මාන්ත කෙළෙමි, ඒ මගේ කර්මාන්ත සමෘද්ධ විය. ඒ මම් යම් පරණ ණය මුදල් වී නම් එය ගෙවා අවසන් කෙළෙමි, අඹුදරුවන් රක්නට වැඩිපුර ඉතිරි වූ මුදලෙක් ද මට ඇතැ"යි මෙසේ සිතෙක් වන්නේ ද, හේ ඒ ණයනැතිබව කරණ කොට ගෙන සතුට ලබන්නේ ද, සෞමනසට පැමිණෙන්නේ ද -

55. මහරජාණනි, යම් සේ පුරුෂයෙක් රෝගී වූයේ, දුකට පැමිණියේ, දැඩි ලෙස ගිලන් වන්නේ ද, ඔහුට බතුත් නො රිසියෙන්නේ ද, ඔහුගේ ඇඟ පත ශක්ති පමණකුත් නො වන්නේ ද, හේ මෑත කාලයෙහි ඒ ආබාධයෙන් මිදෙන්නේ නම්, ඔහුට බතුත් රිසියෙන්නේ නම්, ඔහු ඇඟ පත ශක්තිය ද වන්නේ නම්, "මම් වූ කලී පෙරැ දුකට පත්, දැඩි ගිලන් බව් ඇති ලෙඩෙක් වීමි. මට අහර ද රිසි නො වී ය. මා ඇඟ පත ශක්තිය ද නො වී ය. ඒ මම් දැන් ඒ ලෙඩින් මිදුණෙමි වෙමි. ඒ මට අහර ද රිසියෙයි. මා ඇඟ පත ශක්තිය ද ඇතැ"යි ඔහුට මෙසේ සිතෙක් වන්නේ නම්, හේ ඒ කරුණින් සතුට ලබන්නේ ද, සෞමනසට පැමිණෙන්නේ ද -

56. මහරජාණනි, යම් සේ පුරුෂයෙක් හිර ගෙහි බැඳුණේ වන්නේ ද, හේ පසු කලෙක ධනය වියදම් නො කොට පහසුවෙන් ඒ හිර ගෙන් මිදෙන්නේ ද, (ඒ හේතුයෙන්) ඔහුගේ කිසි භෝග විනාශයෙක් නො වන්නේ ද, "මම් වූ කලී පෙරැ හිර ගෙහි බැඳුණෙමි වීමි. ඒ මම් දැන් ධන වියදම් නො කොට පහසුවෙන් ඒ හිර ගෙන් මිදුණෙමි වෙමි. මගේ භෝගයනට කිසි විනාශයෙක් ද නැතැ"යි ඔහුට මෙසේ සිතෙක් වන්නේ ද, හේ ඒ කරුණින් සතුට ලබන්නේ ද, සෞමනසට පැමිණෙන්නේ ද -

57. මහරජාණනි, යම්සේ තමා අයත් පැවැතුම් නැති, අනුන් අයත් පැවතුම් ඇති, කැමැති අතෙක යන්නට අවසර නැති දාස පුරුෂයෙක් වන්නේ ද, හේ මෑත භාගයෙහි තමා අයත් පැවතුම් ඇතියේ, පරා අයත් පැවැතුම් නැත්තේ, නිදහස් වූයේ, කැමැති අතෙක යා හැකි වූයේ ඒ දාසභාවයෙන් මිදෙන්නේ ද, එවැස් වූ ඔහුට "මම් වූ කලී පෙරැ තමා අයත් පැවැතුම් නැති, පරා අයත් පැවැතුම් ඇති, කැමැති අතෙක යා නො හැකි දාසයෙක් වීමි. ඒ මම් දැන් ඒ දාසභාවයෙන් මිදුණෙමි, තමා අයත් පැවැතුම් ඇතියෙමි, පරා අයත් පැවැතුම් නැතියෙමි, නිදහස් වූයෙමි කැමැති අතෙක යා හැකියෙමි වෙමි"යි මෙසේ සිතෙක් වන්නේ ද, හේ ඒ කරුණින් සතුට ලබන්නේ ද, සෞමනසට පැමිණෙන්නේ ද-

59. සෙය්‍යථාපි මහාරාජ පුරිසො සඛනො සභොගො කන්තාරද්ධාන-මග්ගං පටිපජ්ජෙය්‍ය දුබ්භික්ඛං සප්පටිභයං. සො අපරෙන සමයෙන තං කන්තාරං නිත්ථරෙය්‍ය, සොත්ථිනා ගාමන්තං අනුපාපුණෙය්‍ය ඛෙමං අප්පටිභයං, තස්ස එවමස්ස: "අහං ඛො පුබ්බෙ සඛනො සභොගො කන්තාරද්ධානමග්ගං පටිපජ්ජිං දුබ්භික්ඛං සප්පටිභයං. සො'මහි එතරහි තං කන්තාරං තිණ්ණො සොත්ථිනා ගාමන්තං අනුප්පත්තො ඛෙමං අප්පටි-භය"න්ති. සො තතො නිදානං ලභෙථ පාමොජ්ජං අධිගච්ඡෙය්‍ය සොමනස්සං -

60. එවමෙව ඛො මහාරාජ භික්ඛු යථා ඉණං යථා රොගං යථා බන්ධනාගාරං යථා දාසබ්‍යං යථා කන්තාරද්ධානමග්ගං එවං ඉමෙ පඤ්ච නීවරණෙ අප්පහීණෙ අත්තනි සමනුපස්සති. සෙය්‍යථාපි මහාරාජ ආනණ්‍යං යථා ආරොග්‍යං යථා බන්ධනා මොක්ඛං යථා භුජිස්සං යථා ඛෙමන්තභූමිං එවමෙව ඛො මහාරාජ භික්ඛු ඉමෙ පඤ්ච නීවරණෙ පහීණෙ අත්තනි සමනුපස්සති.

61. තස්සිමෙ පඤ්ච නීවරණෙ පහීණෙ අත්තනි සමනුපස්සතො පාමොජ්ජං ජායති. පමුදිතස්ස පීති ජායති. පීතිමනස්ස කායො පස්ස-ම්භති. පස්සද්ධකායො සුඛං වෙදෙති. සුඛිනො චිත්තං සමාධියති.

62. සො විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්නෙති[1] පරිසන්නෙති[2] පරිපූරෙති පරිඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අඵුටං හොති.

63. සෙය්‍යථාපි මහාරාජ දක්ඛො න්හාපකො වා න්හාපකන්තෙවාසී වා කංසථාලෙ න්හානීයචූණ්ණානි ආකිරිත්වා උදකෙන පරිපීළෙත්වා පරිපීළෙත්වා සන්නෙය්‍ය[3] සායං න්හානීයපිණ්ඩි සෙහාභානුගතා සෙහාභපරෙතා සන්තාරබාහිරා ඵුටා සෙහාභෙන න ච පග්ඝරණී -

එවමෙව ඛො මහාරාජ භික්ඛු ඉමමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්නෙති පරිසන්නෙති පරිපූරෙති පරිඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අඵුටං හොති. ඉදම්පි ඛො මහාරාජ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුරිමෙහි සන්දිට්ඨිකෙහි සාමඤ්ඤඵලෙහි අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

---

1. අභිසන්දෙති සීමු, මජ්ඣං. 2. පරිසන්දෙති. සීමු, මජ්ඣං.
3. සන්දෙය්‍ය. සීමු, මජ්ඣ.

58. මහරජාණනි, යම්සේ ධනවත් වූ භෝගසම්පත් ඇති පුරුෂයෙක් දුර්ලභ ආහාර ඇති, උවදුරු ඇති, දිය නැති දික් කතරමඟකට බස්නේ ද, හේ පසු කලෙක සුවසේ ඒ නිරුදක පෙදෙස ඉක්මැ යන්නේ ද, උවදුරු නැති විපත් නැති ගම්මානයකට බස්නේ ද, එසේ වූ ඔහුට "මම් වූ කලි පෙර ධන ඇතියෙම්, භෝග සම්පත් ඇතියෙම්, දිය නැති, ආහාරදුර්ලභ, ප්‍රතිභය සහිත දික් මඟකට බවුයෙමි. ඒ මම් දැන් සුවසේ ඒ කාන්තාරය තරණය කෙළෙමි. නිරුපද්‍රැත භය රහිත ගමකට පැමිණියෙම් වෙමි"යි සිතෙක් වන්නේ ද, හේ ඒ කරුණින් සතුට ලබන්නේ ද, සොම්නසට පැමිණෙන්නේ ද-

59. මහරජාණනි, එසේ ම මහණ තෙමේ ණයක් මෙන් ලෙඩක් මෙන් හිරගෙයක් මෙන් වහල්බවක් මෙන් දිය නැති දික් මඟක් මෙන් (පිළිවෙළින්) මේ පහ නොවූ නීවරණ පස තමා කෙරෙහි දකී. මහරජ ණය නැති බව යම්සේ ද, ලෙඩ නැති බව යම්සේ ද, හිරගෙන් මිදුණුබව යම්සේ ද, නිවහල්බව යම්සේ ද, උවදුරු නැති බිම යම්සේ ද, එසේ ම (පිළිවෙළින්) මේ පහ වූ නීවරණ පස (හෙවත් නීවරණ පසේ දුරු වීම) තමා කෙරෙහි දකී.

60. තමා කෙරෙහි පහ වූ මේ නීවරණ පස දක්නා ඔහුට සතුට උපදී. සතුටු වූවහුට ප්‍රීතිය උපදී. සිතැ ප්‍රීතිය ඇත්තහුගේ නාම කය සංසිඳේ. සංසුන් නාම කය ඇත්තේ සුව විඳී. සුවැතියහු සිත සමාධි-ගත වේ (එකඟ වේ).

61. හේ කාමයන්ගෙන් වෙන් ව ම, සෙසු අකුසල් දහමුත් ගෙන් ද වෙන් ව ම, විතර්කසහිත, විචාරසහිත, විවේකයෙන් (නීවරණ පහ වීමෙන්) උපන් ප්‍රීතියත් සුවයත් ඇති පළමු ධ්‍යානය ලැබ වෙසේ. හේ මේ කරජ කය ම විවේකයෙන් උපන් ප්‍රීති සුඛයෙන් තෙමයි, මුළුල්ල ම තෙමයි, පුරා ලයි, මුළුල්ල ම ස්පර්ශ කෙරෙයි. සියලු අඟ පසඟ ඇති ඔහුගේ මුළු කයෙහි ඒ විවේකයෙන් උපන් ප්‍රීතිසුඛයෙන් පැතිරී වැද නොගත් (නොපහස්නා ලද) කිසි ද තැනෙක් නො වෙයි.

62. මහරජාණනි, යම් සේ කපුවෙක් (කිලිඟෙක්) හෝ කපුවකුගේ (කිලිඟකුගේ) අතැවැස්සෙක් හෝ ලොහොතලියෙක තාන සුණු බහා දිය ඉස ඉස පිඬු කරන්නේ ද, ඒ නාන සුණු පිඬ කාවැදුණු දිය ඇත්තේ, හැම තැන ම දියෙන් ශුක්ත වූයේ, ඇතුලත පිටත මුළුල්ල ම දියෙන් පැතිරී ගියේ දිය නො වගුරුවන්නේත් වේ ද -

63. මහරජාණනි, එසේ ම මහණ තෙමේ මේ කරජ කය ම විවේක-යෙන් උපන් ප්‍රීතිසුඛයෙන් තෙමයි. මුළුල්ල ම තෙමයි. පුරා ලයි. මුළුල්ල ම ස්පර්ශ කෙරෙයි. ඔහුගේ සියලු අඟ පසඟ ඇති මුළු කයෙහි විවේකජ ප්‍රීති සුඛයෙන් පැතිර වැද නොගත් කිසි ද තැනෙක් නො වෙයි. මහරජ, මේ ද පළමු දැක්වුණු සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍යඵලයනට වඩා මනෝඥ වූ ද වඩා උතුම් වූ ද සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍යඵලයෙකි.

64. පුන ච පරං මහාරාජ භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො ඒකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං සමාධිජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස සමාධිජෙන පීතිසුඛෙන අඵුටං හොති.

65. සෙය්‍යථාපි මහාරාජ උදකරහදෙ උබ්භිදෙදකො, තස්ස නෙවස්ස පුරත්ථිමාය දිසාය උදකස්ස ආයමුඛං, න දක්ඛිණාය දිසාය උදකස්ස ආයමුඛං, න පච්ඡිමාය දිසාය උදකස්ස ආයමුඛං, න උත්තරාය දිසාය උදකස්ස ආයමුඛං, දෙවො ච න කාලෙන කාලං සම්මා ධාරං අනුප්පවෙච්ඡෙය්‍ය, අථ ඛො තම්හා ච උදකරහදා සීතා වාරිධාරා උබ්භිජ්ජිත්වා තමෙව උදකරහදං සීතෙන වාරිනා අභිසන්දෙය්‍ය පරිසන්දෙය්‍ය පරිපූරෙය්‍ය පරිඵරෙය්‍ය, නාස්ස කිඤ්චි සබ්බාවතො උදකරහදස්ස වාරිනා සීතෙන අඵුටං අස්ස–

එවමෙව ඛො මහාරාජ භික්ඛු ඉමමෙව කායං සමාධිජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස සමාධිජෙන පීතිසුඛෙන අඵුටං හොති.

ඉදම්පි ඛො මහාරාජ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුරිමෙහි සන්දිට්ඨිකෙහි සාමඤ්ඤඵලෙහි අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

66. පුන ච පරං මහාරාජ භික්ඛු පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති සතො සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති. යන්තං අරියා ආචික්ඛන්ති: උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති තතියං ඣානං උපසම්පජ්ජ විහරති.

සො ඉමමෙව කායං නිප්පීතිකෙන සුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති, පරිඵරති නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස නිප්පීතිකෙන සුඛෙන අඵුටං හොති.

67. සෙය්‍යථාපි මහාරාජ උප්පලිනියං වා පදුමිනියං වා පුණ්ඩරීකිනියං වා අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවද්ධානි උදකානුග්ගතානි අන්තොනිමුග්ග-පොසීනි[1] තානි යාව චග්ගා යාව ච මූලා සීතෙන වාරිනා අභිසන්නානි[2] පරිසන්නානි[3] පරිපූරානි, පරිඵුටානි නාස්සු[4] කිඤ්චි සබ්බාවතං උප්පලානං වා පදුමානං වා පුණ්ඩරීකානං වා සීතෙන වාරිනා අඵුටං අස්ස.

---

1. අන්තො නිමුග්ග පොසීනි, බෙ. ස. ස. 2. අභිසන්දති, බෙ. ස. ස.
3. පරිසන්දති, ලෙ. ස. ස. 4. නාස්ස, බහුසු.

64. මහරජාණෙනි, තැවැත ද (අනෙකක් කියමි.) මහණ තෙමේ විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන්, සිය සතන්හි උපන්, සිය සතන් පහදවන, (ශ්‍රද්ධාව හා එක් වැ යෙදුණු) සිතැ එකඟ බව ඇති, විතර්ක නැති, විචාරය නැති, සමාධියෙන් උපන්, ප්‍රීතියත් සුවයත් ඇති, දෙවෙනි ධ්‍යානයට පැමිණ වෙසෙයි. හේ මේ කරජ කය ම සමාධියෙන් උපන් ප්‍රීතිසුඛයෙන් තෙමයි. මුළුල්ල ම තෙත් කෙරෙයි, පුරා ලයි, හැම තැන ම ස්පර්ශ කෙරෙයි.ඔහුගේ මුළුකයේ විවේකයෙන් උපන් පීති සුවයෙන් පැතිරී නොගත් කිසි ද තැනෙක් නො වෙයි.

65. මහරජ, යම්සේ යටැ උල්පතින් මතු වන දිය ඇති ගැඹුරු විලෙක් වේ ද, එයට පෙරදිගින් දිය ඇතුළු වන මඟෙක් නො වන්නේ ද, දකුණු දෙසින් ද දිය ඇතුළු වන මඟෙක් නොවන්නේ ද, පැසිම් දිගින් ද දිය ඇතුළු වන මඟෙක් නොවන්නේ ද, උතුරු දෙසින් ද දිය වැද ගන්නා මඟක් නො වන්නේ ද, වැස්ස ද කලින් කලැ සුදුසු පරිදි නො වසින්නේ ද, එතෙකුදු වුවත් ඒ විලෙන් සිසිල් දියදහර මතු වී ඒ විල ම සිසිල් දියෙන් තෙමන්නේ ද, හැම පරිදි තෙමන්නේ ද, පුරා ලන්නේ ද, හැම තැන ම වැද ගෙන පැතිරී සිටින්නේ ද, ඒ මුළු විලෙහි සිසිල් දිය පැතිරී වැද නොගත් කිසි ද තැනෙක් නො මැත් ද-

මහරජ, එසේ ම මහණ තෙමේ මේ කරජ කය ම සමාධියෙන් උපන් පීති සුවයෙන් තෙමයි, හැම තැන ම තෙත් කෙරෙයි, පුරා ලයි, හැම තැන ම පැතිරී වැද ගනී. ඔහුගේ ඒ සියලු කයේ සමාධියෙන් උපන් පීති සුවය පැතිර වැද නොගත් කිසි ද තැනෙක් නො වෙයි.

මහරජ, මේ සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍යඵලය ද පළමු දැක්වුණු සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍යඵලයනට වඩා මනෝඥ ද වඩා උතුම් ද වේ.

66. තැවත ද (අනෙකක් කියමි:) මහරජ, මහණ තෙමේ ප්‍රීතිය ගේ ද විරාගයෙන් (පහවීමෙන්, සංසිඳීමෙන්), උපේක්ෂායෙන් ද යුක්ත වැ, සිහියෙන් හා නුවණින් හා යුක්ත වැ වෙසෙයි. සුවය ද කයින් විඳී. ආර්‍යයෝ යම් ධ්‍යානයක් හේතු කොට ගෙන ධ්‍යානලාභියා ඇරැඹැ 'උපේක්ෂාව ඇත්තේ ය, සිහි ඇත්තේ ය, සුඛවිහරණ ඇත්තේ යැ'යි කියත් ද, හේ (එසේ වූ) ඒ තෙවෙනි ධ්‍යානයට පැමිණ වෙසේ.

හේ මේ කය ම නිෂ්ප්‍රීතික සුවයෙන් තෙමයි, හැම පරිදි තෙත් කෙරෙයි, පුරා ලයි, හැම තැන ම පැතිර වැද ගනී. ඔහුගේ කයෙහි ඒ නිෂ්ප්‍රීතික සුඛයන් පැතිර නොගත් කිසි ද තැනෙක් නො වෙයි.

67. මහරජ, යම්සේ උපුල් විලෙක හෝ පියුම් විලෙක හෝ පඬෙර විලෙක හෝ ඇතැම් උපුල් හෝ පියුම් හෝ පඬෙර හෝ දියෙහි උපන්නේ දියෙහි වැඩුණේ, දියෙන් නොතැගුණේ, දිය තුළැ ම ගිලී වැඩෙනුයේ ද, ඒ හැම අග දක්වාත් මුල් දක්වාත් සිසිල් දියෙන් තෙමුණේ, හැමපරිදි තෙත් වූයේ, පිරී ගියේ, හැම තැන් ම පැතිරී වැද ගත්තේ වේ ද, ඒ විලෙහි සියලු උපුල්වලැ හෝ පියුම්වලැ හෝ පඬෙරවලැ හෝ සිසිල් දිය පැතිරී නො ගත් තැනෙක් නො වන්නේ ද-

එවමෙව ඛො මහාරාජ භික්ඛු ඉමමෙව කායං නිප්පීතිකෙන සුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස නිප්පීතිකෙන සුඛෙන අඵුටං හොති.

ඉදම්පි ඛො මහාරාජ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුරිමෙහි සන්දිට්ඨිකෙහි සාමඤ්ඤඵලෙහි අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

68. පුන ච පරං මහාරාජ භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛමසුඛං උපෙක්ඛා-සතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන ඵරිත්වා නිසින්නො හොති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අඵුටං හොති.

සෙය්‍යථාපි මහාරාජ පුරිසො ඔදාතෙන වත්ථෙන සසීසං පාරුපිත්වා නිසින්නො අස්ස, නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස ඔදාතෙන වත්ථෙන අඵුටං අස්ස, එවමෙව ඛො මහාරාජ භික්ඛු ඉමමෙව කායං පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන ඵරිත්වා නිසින්නො හොති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අඵුටං හොති.

ඉදම්පි ඛො මහාරාජ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුරිමෙහි සන්දිට්ඨිකෙහි සාමඤ්ඤඵලෙහි අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

69. පුන ච පරං මහාරාජ සො භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ඤාණදස්සනාය චිත්තං අභිනීහරති අභිනින්නා-මෙති. සො එවං පජානාති: "අයං ඛො මෙ කායො රූපී චාතුම්මහාභූතිකො මාතාපෙත්තිකසම්භවො ඔදනකුම්මාසූපචයො අනිච්චුච්ඡාදනපරිමද්දන-භෙදනවිද්ධංසනධම්මො. ඉදං ච පන මෙ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධ"න්ති.

70. සෙය්‍යථාපි මහාරාජ මණි වෙළුරියො සුභො ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො අවෙජ්ජ විප්පසන්නො අනාවිලො සබ්බාකාරසම්පන්නො, තත්‍ර'ස්ස සුත්තං ආවුතං නීලං වා පීතං වා ලොහිතං වා ඔදාතං වා පණ්ඩුසුත්තං වා. තමෙනං චක්ඛුමා පුරිසො හත්ථෙ කරිත්වා පච්චවෙක්ඛෙය්‍ය "අයං ඛො මණි වෙළුරියො සුභො ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො, අවෙජ්ජ විප්පසන්නො අනාවිලො සබ්බාකාරසම්පන්නො. තත්‍රිදං සුත්තං ආවුතං නීලං වා පීතං වා ලොහිතං වා ඔදාතං වා පණ්ඩුසුත්තං වා"ති.

මහරජ, එසේ ම මහණ තෙමේ මේ කය ම නිෂ්ප්‍රීතික සුඛයෙන් තෙමයි, තාන්පසින් තෙමයි, පුරා ලයි, හැමපරිදි පැතිරී වැද ගනී. ඔහුගේ සියලු කයෙහි නිෂ්ප්‍රීතික සුඛයෙන් පැතිරී වැද නොගත් කිසි ද තැනෙක් නො වෙයි.

මහරජ, මේ සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍යඵලය ද පළමු කි සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍ය ඵලයනට වඩා මනෝඥ වූත් වඩා ප්‍රණීත වූත් එකෙකි.

68. මහරජ, නැවත ද (අනෙකක් කියමි:) මහණ තෙමේ සුඛ වේදනාව ද දුරු ලීමෙන්, දුඃඛ වේදනාව ද දුරු ලීමෙන්, පළමු කොට ම සොම්නස් දෙම්නස් දෙදනාගේ පහ වීමෙන් දුක් ද නොවූ, සුව ද නොවූ, උපේක්ෂා සමෘති යන මොවුන්ගේ පිරිසිදු බව් ඇති සතර වන ධ්‍යානය ලැබ වෙසෙයි. හේ මේ කය ම පිරිසිදු වූ ප්‍රභාස්වර වූ සිතින් පැතිරී වැද ගෙන හුන්නේ වෙයි. ඔහුගේ සියලු කයෙහි පිරිසිදු වූ ප්‍රභාස්වර වූ සිතින් පැතිරී වැද නො ගෙන සිටි කිසි ද තැනෙක් නො වෙයි.

මහරජ, යම්සේ පුරුෂයෙක් සුදු වතින් හිසින් වටා පෙරෙව හුන්නේ වේ නම්, ඔහුගේ කයෙහි සුදු වතින් වැද නොගත් (නො වැසුණ) කිසි ද තැනෙක් නො වන්නේ ද, මහරජ, එසේ ම මහණ තෙම මේ කය ම පිරිසිදු වූ ප්‍රභාස්වර වූ සිතින් පැහැරී වැද ගෙන නොසිටි කිසි ද තැනෙක් නො වෙයි.

මහරජ, මේ සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍යඵලය ද පළමු දැක්වුණු සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍යඵලයනට වඩා මනෝඥ වූ වඩා ප්‍රණීත වූ එකෙක.

69. තව ද (අනෙකක් කියමි:) මහරජ, ඒ මහණ තෙමේ මෙසේ එකඟ වූ සිත පිරිසිදු වූ කල්හි, දීප්තිමත් වූ කල්හි, කිලිටි නැති වූ කල්හි, පහ වූ චිත්තෝපක්ලේශ ඇති කල්හි, මෘදු වූ කල්හි, විදර්ශනා භාවනාවට යෝග්‍ය වූ කල්හි, සිටි කල්හි, නිශ්චල බවට පැමිණි කල්හි, විදර්ශනාඥානය පිණිස, (පරිකර්ම) සිත එයට අභිමුඛ කෙරෙයි, ඒ අතට නමා හරියි. හේ "මගේ මේ කය වූ කලී රූපවත් ය, සතර මහාභූතයන් ගෙන් හැදුණේ ය, මාපියන්ගේ ශුක්‍රශෝණිතයෙන් උපන්නේ ය, බත් කොමු ආදි අහරින් වැඩුණේ ය, අනිත්‍ය බව ද දුගඳ හරනුවට සුවඳ විලවුන් ඉළියැ සුත් බව ද, ලෙඩ දුරුලනුවට පිරිමැදුම් ඇ කළ සුතු බව ද, එසේ කළ ද බිඳෙන බව ද, විසිරෙන බව ද ගත මේ දැ සභාව කොටැත්තේ ය. මගේ මේ සිත ද මෙහි ලැග්ගේ ය, මෙහි බැඳුණේ යැ"යි මෙසේ දැන ගනී.

70. මහරජ, යම්සේ සොඳුරු වූ, පිරිසිදු ආකාරයෙක පහළ වූ අටැස් වූ මොනොවට පිරියම් කළ, සිසුම් වූ වෙසෙසින් පහන් වූ, පිවිතුරු වූ, ඛෝවනාදි සියලු ආකාරයෙන් සුත් වෙරළුමිණෙක් වන්නේ ද, එහි නිල් වූ හෝ රන්වන් වූ හෝ රත්වන් හෝ සුදුවන් හෝ පඹුවන් හෝ හුයෙක් අමුනන ලද්දේ වන්නේ ද, එය ඇස් ඇති පුරුෂයෙක් අතෙහි තොට, "මේ වූ කලී සොඳුරු වූ, පිරිසිදු ආකාරයෙහි උපන්, අටැස් වූ මොනොවට පිරියම් කැරුණු, සිසුම් වූ, වෙසෙසින් පහන් වූ, පිවිතුරු වූ, සියලු ඛෝවනාදි ආකාරයෙන් සම්පූර්ණ වූ වෙරළු මිණෙක. මෙහි නිල් වූ හෝ රන්වන් වූ හෝ රත්වන් වූ හෝ සුදුවන් වූ හෝ යම් හුයෙක් අවුනන ලදුයේ වේ යැ"යි සලකා බලන්නේ ද-

එවමේව ඛො මහාරාජ භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ඤාණදස්සනාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො එවං පජානාති අයං ඛො මෙ කායො රූපී චාතුම්මහාභූතිකො මාතාපෙත්තිකසම්භවො ඔදනකුම්මාසූපචයො අනිච්චුච්ඡාදනපරිමද්දනභෙදන විද්ධංසනධම්මො. ඉදං ච පන මෙ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධන්ති.

ඉදම්පි ඛො මහාරාජ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුරිමෙහි සන්දිට්ඨිකෙහි සාමඤ්ඤඵලෙහි අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

71. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ මනොමයං කායං අභිනිම්මිනනාය[1] චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනොමයං සබ්බඞ්ගපච්චඞ්ගිං අහීනින්ද්‍රියං,

සෙය්‍යථාපි මහාරාජ පුරිසො මුඤ්ජම්හා ඉසිකං[2] පවාහෙය්‍ය[3]. තස්ස එවමස්ස: අයං මුඤ්ජො අයං ඉසිකා අඤ්ඤො මුඤ්ජො අඤ්ඤා ඉසිකා මුඤ්ජම්හාතෙව ඉසිකා පවාළ්හාති[4].

සෙය්‍යථාපි වා පන මහාරාජ පුරිසො අසිං කොසියා පවාහෙය්‍ය. තස්ස එවමස්ස: "අයං අසි අයං කොසි, අඤ්ඤො අසි අඤ්ඤා කොසි, කොසියාතෙව අසි පවාළ්හො"ති.

සෙය්‍යථාපි වා පන මහාරාජ පුරිසො අහිං කරණ්ඩා උද්ධරෙය්‍ය. තස්ස එවමස්ස: "අයං අහි අයං කරණ්ඩො, අඤ්ඤො අහි අඤ්ඤො කරණ්ඩො, කරණ්ඩාතෙව අහි උබ්භතො"ති[5].

එවමේව ඛො මහාරාජ භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ මනොමයං කායං අභිනිම්මිනනාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනොමයං සබ්බඞ්ගපච්චඞ්ගිං අහීනින්ද්‍රියං. ඉදම්පි ඛො මහාරාජ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුරිමෙහි සන්දිට්ඨිකෙහි සාමඤ්ඤඵලෙහි අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

---

1. අභිනිම්මිනාය. බොසස.
2. ඊසිකං. බොසස.
3. පබ්බාහෙය්‍ය. බොසස.
4. පබ්බාළ්හා. බොසස.
5. උද්ධරිතො. සස.

මහරජ, එපරිද්දෙන් ම මහණ තෙමේ මෙසේ සමාධිගත සිත පිරිසිදු වූ කල්හි, දීප්තිමත් වූ කල්හි, කෙලෙස් යටපත් වූ කල්හි, උපක්ලේශයන් පහ වූ කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍ය වූ කල්හි සිටි කල්හි, නිශ්චල බවට පැමිණි කල්හි, විදර්ශනාඥානය පිණිස සිත අභිමුඛ කෙරෙයි, එය අතට තමා හරියි. හෙ තෙම "මගේ මේ කය වූ කලි රූපී ය, සතර මහාභූතයන්ගෙන් හැදුණේ ය, මාපියන්ගේ ශුක්‍ර ශෝණිතයෙන් නිපන්නේ ය, බත් කොමු ආදි අහරින් වැඩුණේ ය, අනිස බව ද දුගඳ හරනට සුවඳ විලෙවුන් ඉළියැ සුතු බව ද ලෙඩ දුරුලනුවට පිරිමැදුම් ඇ කල සුතු බව ද ඒ කලත් කිඳෙන බව ද විසිරෙන බව ද යන මේ දැ සවභාව කොටැත්තේ ය. මගේ මේ සිත ද මෙහි ලැග ගත්තේ ය, මෙහි බැඳුණේ යැ"යි මෙසේ දැන ගනී.

මහරජ, මේ ද පළමු දැක්වුණු සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍ය ඵලයනට වඩා මනෝඥ වූ වඩා උතුම් ද වූ සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍ය ඵලයෙකි.

71. හේ මෙසේ සමාහිත වූ සිත පිරිසිදු වූ කල්හි, දීප්තිමත් කල්හි, කෙලෙස් නොමැති වූ කල්හි, උපක්ලේශ පහ වූ කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍ය වූ (සෘද්ධි ඉපැදවීමට යෝග්‍ය වූ) කල්හි,සිටි කල්හි, නිශ්චල බවට පැමිණි කල්හි, මනෝමය ශරීරයක් මවා පාතු පිණිස සිත යොමු කෙරෙයි. නැඹුරු කෙරෙයි. හේ මේ සිරුරෙන් රූපී වූ, සියලු අඟපසඟින් යුත්, විකල නොවූ ඉඳුරන් ඇති මනෝමය ශරීරයක් මවා පායි.

මහරජ, යම්සේ පුරුෂයෙක් මුදුතණ ගසෙකින් තණකූර (=තණ බඩය) ඇද මැත් කරන්නේ ද, ඔහුට "මේ මුදුතණගස ය, මේ එහි තණ බඩ ය, තණ ගස එකෙකි, එහි බඩය අනෙකෙකි. මුදුතණ ගස කෙරෙන් ම එහි කූර (බඩය) මැත් කරන ලද්දේ යැ"යි මෙසේ සිතෙක් වන්නේ ද,

මහරජ, යම්සේ හෝ පුරුෂයෙක් කඩුවක් කොපුවෙන් ඇද මැත් කරන්නේ ද, ඔහුට "මේ කඩුවය, මේ කොපුව ය, කඩුව එකෙක, කොපුව අනෙකෙක. කොපුයෙන් ම කඩුව ඇද මැත් කරන ලද්දේ යැ"යි මෙසේ සිතෙක් වන්නේ ද,

මහරජ, යම්සේ වතාහි පුරුෂයෙක් තයකු සැවයෙන් ඇද වෙන් කරන්නේ ද, ඔහුට "මේ තයා ය, මේ සැවය ය. තයා එකෙක, සැවය අනෙකෙක. සැවය කෙරෙන් ම තයා ඇද වෙන් කරන ලද්දේ යැ"යි මෙසේ සිතෙක් වන්නේ ද,

මහරජ, එපරිද්දෙන් ම මහණ තෙමේ මෙසේ සමාධිගත සිත පිරිසිදු වූ කල්හි, දීප්තිමත් වූ කල්හි, කෙලෙස් රහිත වූ කල්හි, උපක්ලේශයන් පහ වැ ගිය කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍ය වූ කල්හි, සිටි කල්හි, නිශ්චල බවට පත් කල්හි, මනෝමය ශරීරයක් මවා පාතු පිණිස සිත යොමු කෙරෙයි, නැඹුරු කෙරෙයි. හේ මේ ශරීරයෙන් රූපී වූ මනෝමය වූ සියලු අඟපසඟින් යුක්ත වූ අවිකල ඉඳුරන් ඇති අන් සිරුරක් මවා පායි. මහරජ, මෙය ද පළමු දැක්වුණු සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍ය ඵලයනට වඩා කාන්ත වූ ද . . . සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍ය ඵලයෙකි.

72. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති: එකො'පි හුත්වා බහුධා හොති බහුධාපි හුත්වා එකො හොති, ආවිභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡති සෙය්‍යථාපි ආකාසෙ, පඨවියා'පි උම්මුජ්ජනිමුජ්ජං කරොති සෙය්‍යථාපි උදකෙ, උදකෙ'පි අභිජ්ජමානෙ ගච්ඡති සෙය්‍යථාපි පඨවියං, ආකාසෙ'පි පල්ලඞ්කෙන කමති සෙය්‍යථා'පි පක්ඛී සකුණො. ඉමෙ'පි චන්දිමසූරියෙ එවංමහිද්ධිකෙ එවංමහානුභාවෙ පාණිනා පරාමසති පරිමජ්ජති. යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති.

73. සෙය්‍යථාපි මහාරාජ දක්ඛො කුම්භකාරො වා කුම්භකාරන්තෙවාසී වා සුපරිකම්මකතාය මත්තිකාය යං යදෙව භාජනවිකතිං ආකඞ්ඛෙය්‍ය තං තදෙව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය-

සෙය්‍යථාපි වා පන මහාරාජ දක්ඛො දන්තකාරො වා දන්තකාරන්තෙවාසී වා සුපරිකම්මකතසම්මිං දන්තසම්මිං යං යදෙව දන්තවිකතිං ආකඞ්ඛෙය්‍ය තං තදෙව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය-

සෙය්‍යථා වා පන මහාරාජ දක්ඛො සුවණ්ණකාරො වා සුවණ්ණකාරන්තෙවාසී වා සුපරිකම්මකතසම්මිං සුවණ්ණසම්මිං යං යදෙව සුවණ්ණවිකතිං ආකඞ්ඛෙය්‍ය තං තදෙව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය-

එවමෙව ඛො මහාරාජ භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති: එකො'පි හුත්වා බහුධා හොති. බහුධා'පි හුත්වා එකො හොති. ආවිභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡති සෙය්‍යථාපි ආකාසෙ. පඨවියා'පි උම්මුජ්ජනිමුජ්ජං කරොති සෙය්‍යථාපි උදකෙ. උදකෙ'පි අභිජ්ජමානෙ ගච්ඡති සෙය්‍යථාපි පඨවියං. ආකාසෙ'පි පල්ලඞ්කෙන කමති සෙය්‍යථාපි පක්ඛී සකුණො. ඉමෙ'පි චන්දිමසූරියෙ එවංමහිද්ධිකෙ එවංමහානුභාවෙ පාණිනා පරාමසති පරිමජ්ජති. යාව බ්‍රහ්මලොකා'පි කායෙන වසං වත්තෙති.

72. හේ මෙසේ සමාහිත වූ සිත පිරිසිදු වූ කල්හි, දීප්තිමත් වූ කල්හි, කෙලෙස් රහිත වූ කල්හි, උපක්ලේශයන් පහ වැ ගිය කල්හි, මෘදු වූ කල්හි, කර්ම්ණ්‍ය වූ (=සෘද්ධියට යොග්‍ය වූ) කල්හි, සිටි කල්හි, නිශ්චලත්වයට පැමිණි කල්හි, සෘද්ධිවිධඥානය පිණිස (අභිඥාපාදක) පරිකර්ම සිත මෙහෙයයි, නැඹුරු කෙරෙයි. හේ අනේකවිධ වූ සෘද්ධිවිධය (සෘද්ධි කොට්ඨාසය) නැවත නැවත අනුභව කෙරෙයි (හෙවත් නාම කයින් සපර්ශ කෙරෙයි, ප්‍රත්‍යක්ෂ කෙරෙයි, ලබයි). පියෙපියෙන් එකෙක් වැ සිටැ ද (සෘද්ධි බලයෙන්) බහු ප්‍රකාර ද වී යළිදු එකෙක් වෙයි. තමාගේ ප්‍රකට බව කෙරෙයි (=පෙනීසිටී). අප්‍රකට බව කෙරෙයි (=නොපෙනී සිටියි). බිත්තියෙන් පිටතට, පවුරෙන් පිටතට, පර්වතයෙන් පිටතට අහසෙහි මෙන් කිසිවෙක නො ගැටෙනුයේ මැදින් විනිවිද ගෙන යෙයි. දියෙහි මෙන් පොළොවෙහි ද යටට බැසීම (=හිලී) උඩට නැගීම (=මතු වීම) කෙරෙයි. නො බිඳෙන (=යට නො බස්නා) දියෙහි පොළොවෙහි සේ යෙයි. පක්ෂ ඇති සකුණයකු මෙන් අහසෙහි ද පළඟින් (=උරුබද්ධාසනයෙන්) යෙයි. මේ සා මහර්ද්ධි ඇති මහත් අනුභාව ඇති මේ සඳ හිරු දෙදෙනා ද, අතින් පරාමර්ශන කෙරෙයි (=අල්ලයි), (ඔබමොබ අත යවා) පිරිමදී සි. බඹ ලොව තෙක් ද (සියල්ල) කයින් වශයෙහි පවත්වා සි.

73. මහරජ, යම්සේ දක්ෂ කුඹලෙක් හෝ කුඹලක්හුගේ අතැවැස්සෙක් හෝ මොනොවට පිරියම් කළ (=සකස් කළ) මැටිටෙන් යම් යම් භාජන විශෙෂයක් කැමැත්තේ නම්, ඒ ඒ දෑය ම කරන්නේ ද, මොනොවට නිපදවන්නේ ද-

මහරජ, යම්සේ දක්ෂ දන්තකාරයෙක් (ඇත්දත් ආදියෙන් විසිතුරු-කම් කරන්නෙක්) හෝ දන්තකාරයකුගේ අතැවැස්සෙක් හෝ මොනොවට පිරියම් කළ (=දෙස් ඉවත් කොට මොනොවට සකස් කළ) දතෙක්හි යම් යම් දන්තවිකෘතියක් (=දතෙහි කළ විසිතුරු රූපාදියක්) කැමැති වන්නේ නම්, ඒ ඒ දෑය ම කරන්නේ ද, වෙසෙසින් නිපදවන්නේ ද,

මහරජ, යම්සේ හෝ දක්ෂ රන්කරුවෙක් හෝ රන්කරුවකුගේ අතැවැස්සෙක් හෝ මොනොවට සකස් කළ රනෙහි යම් යම් සුවර්ණ-විකෘතියක් (ආභරණ ආදියක්) කැමැත්තේ නම් ඒ ඒ දෑය ම කරන්නේ ද-නිපදවන්නේ ද,

මහරජ, එපරිද්දෙන් ම මහණ තෙමේ මෙසේ සමාහිත වූ සිත පිරිසිදු වූ කල්හි, දීප්තිමත් වූ කල්හි, කෙලෙස් රහිත වූ කල්හි, උපක්ලේශයන් පහ වැ ගිය කල්හි, මෘදු වූ කල්හි, කර්ම්ණ්‍ය වූ කල්හි, සිටි කල්හි, නිශ්චල බවට පැමිණි කල්හි, සෘද්ධිවිධඥානය පිණිස සිත මෙහෙයයි නැඹුරු කෙරෙයි. හේ අනේකවිධ වූ සෘද්ධි කොට්ඨාසය නැවත නැවත විදී. පියෙපියෙන් එකෙක් වැ සිටැ බොහෝ දෙනෙක් වෙයි, බොහෝ දෙනෙක් වැ එකෙක් වෙයි. තෙමේ පෙනී සිටී, නො පෙනී ද සිටී. බිත්තියෙන් පිටතට, පව්වෙන් පිටතට, පවුරෙන් පිටතට විනිවිද අහසෙහි මෙන් කිසිවෙකැ නො ලැගී යෙයි. දියෙහි මෙන් පොළොවෙහිත් හිලීම ද මතුවීම ද කෙරෙයි. පොළොව මතු පිටැ සේ නො බිඳෙන දියෙහි යෙයි. පක්ෂියකු මස් පළඟින් අහසෙහි යෙයි. මේ සා මහර්ද්ධිමත් මහත් අනුභාව ඇති සඳ හිරු' දෙදෙනා පවා අල්ලයි, පිරිමදියි. බඹලොව තෙක් ද කයින් තමා වශයෙහි පවත්වයි.

ඉදමපි ඛො මහාරාජ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුරිමෙහි සන්දිට්ඨිකෙහි සාමඤ්ඤඵලෙහි අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

74. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ දිබ්බාය සොතධාතුයා චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය උභො සද්දෙ සුණාති දිබ්බෙ ච මානුසෙ ච යෙ දූරෙ සන්තිකෙ ච.

75. සෙය්‍යථාපි මහාරාජ පුරිසො අද්ධානමග්ගපටිපන්නො සො සුණෙය්‍ය භෙරිසද්දම්පි මුදිඞ්ගසද්දම්පි සඞ්ඛපණවදෙණ්ඩිමසද්දම්පි, තස්ස එවමස්ස: භෙරිසද්දො ඉති'පි මුදිඞ්ගසද්දො ඉති'පි සඞ්ඛපණවදෙණ්ඩිමසද්දො ඉති'පි. එවමෙව ඛො මහාරාජ භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ දිබ්බාය සොතධාතුයා චිත්තං අභිනීහරති අභිනින්නා-මෙති. සො දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය උභො සද්දෙ සුණාති දිබ්බෙ ච මානුසෙ ච යෙ දූරෙ සන්තිකෙ ච.

ඉදමපි ඛො මහාරාජ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුරිමෙහි සන්දිට්ඨිකෙහි සාමඤ්ඤඵලෙහි අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

76. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ චෙතොපරියඤ්ඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාති: ''සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති. වීතරාගං වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාති. සදොසං වා චිත්තං සදොසං චිත්තන්ති පජානාති. වීතදොසං වා චිත්තං වීතදොසං චිත්තන්ති පජානාති. සමොහං වා චිත්තං සමොහං චිත්තන්ති පජානාති. වීතමොහං වා චිත්තං වීතමොහං චිත්තන්ති පජානාති. සඞ්ඛිත්තං වා චිත්තං සඞ්ඛිත්තං චිත්තන්ති පජානාති. වික්ඛිත්තං වා චිත්තං වික්ඛිත්තං චිත්තන්ති පජානාති. මහග්ගතං වා චිත්තං මහග්ගතං චිත්තන්ති පජානාති. අමහග්ගතං වා චිත්තං අමහග්ගතං චිත්තන්ති පජානාති. සඋත්තරං වා චිත්තං සඋත්තරං චිත්තන්ති පජානාති. අනුත්තරං වා චිත්තං අනුත්තරං චිත්තන්ති පජානාති. සමාහිතං වා චිත්තං සමාහිතං චිත්තන්ති පජානාති. අසමාහිතං වා චිත්තං අසමාහිතං චිත්තන්ති පජානාති. විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානාති. අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති.

77. සෙය්‍යථාපි මහාරාජ ඉත්ථී වා පුරිසො වා දහරො වා සුවා මණ්ඩනකජාතිකො ආදාසෙ වා පරිසුද්ධෙ පරියොදාතෙ අච්ඡෙ වා උදකපත්තෙ සකං මුඛනිමිත්තං පච්චවෙක්ඛමානො සකණිකං වා සකණිකන්ති ජානෙය්‍ය, අකණිකං වා අකණිකන්ති ජානෙය්‍ය-

මහරජ, මෙය ද පළමු දැක්වුණු සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍ය ඵලයනට වඩා මනෝඥ වූ වඩා උතුම් වූ සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍ය ඵලයෙකි.

74. හේ මෙසේ සමාහිත සිත පිරිසිදු කල්හි, දීප්තිමත් වූ කල්හි, කෙලෙස් රහිත වූ කල්හි, උපක්ලේශ පහ වැ ගිය කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍ය වූ කල්හි, සිටි කල්හි, නිශ්චල බවට පැමිණි කල්හි, දිව්‍ය ශ්‍රෝත්‍රධාතුව පිණිස (=දිවකන් නුවණ පිණිස) සිත යොමු කෙරෙයි, නැඹුරු කෙරෙයි, හේ පිරිසිදු වූ, මිනිසුන්ගේ ශ්‍රවණෝපචාරය ඉක්මවා සිටි දිව කනින් දිව්‍ය වූ ද මානුෂක වූ ද, දුරු වූ ද ළං වූ ද යන ද්විවිධ ශබ්ද ම අසයි.

75. මහරජ, යම්සේ මිනිසෙක් දික් මඟකට පිළිපන්නේ ද, හේ බෙරහඬත් මිහිඟුබෙර හඬත් පණාබෙර හඬත් ගැටබෙර හඬත් යම්සේ අසන්නේ ද, ඒ අසන ඔහුට 'මේ බෙර හඬැයි කියාත් මේ මිහිඟුබෙර හඬැ යි කියාත් මේ සක් පණාබෙර ගැටබෙර හඬැ'යි කියාත් මෙසේ සිතෙක් වන්නේ ද, මහරජ එපරිද්දෙන් ම මහණ තෙමේ මෙසේ සමාහිත වූ සිත පිරිසිදු වූ කල්හි, දීප්තිමත් වූ කල්හි, කෙලෙස් රහිත වූ කල්හි, උපක්ලේශ පහ වැ ගිය කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍ය (කර්මක්ෂම) වූ කල්හි, සිටි කල්හි, නිශ්චල බවට පැමිණි කල්හි, දිව්‍ය ශ්‍රෝත්‍රධාතුව පිණිස සිත යොමු කෙරෙයි, නැඹුරු කෙරෙයි. හේ පිරිසිදු වූ, මිනිසුන්ගේ ශ්‍රවණෝපචාරය ඉක්මැ වූ දිව කන් නුවණින් දිව්‍ය වූත් මානුෂක වූත් දුරු වූත් ළඟැ වූත් ද්විවිධ ශබ්ද අසයි.

මහරජ, මේ ද පළමු කී සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍යඵලයනට වඩා මනෝඥ වූ වඩා උතුම් වූ සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍ය ඵලයෙකි.

76. හේ තෙමේ මෙසේ එකඟ වූ සිත පිරිසිදු වූ කල්හි, දීප්තිමත් වූ කල්හි, කෙලෙස් රහිත වූ කල්හි, උපක්ලේශ පහ වැ ගිය කල්හි, මෘදු වූ කල්හි, කර්මක්ෂම වූ කල්හි, සිටි කල්හි, නිශ්චල බවට පැමිණි කල්හි, චේතස්පර්යඥානය පිණිස (=අනුන්ගේ සිත් පිරිසිඳ දන්නා නුවණ පිණිස) සිත යොමු කෙරෙයි, නැඹුරු කෙරෙයි. හේ අන් සත්ත්වයන්ගේ අන් පුද්ගලයන්ගේ සිත සියසිතින් පිරිසිඳැ දනියි. රාග සහිත සිත රාග සහිත සිතැ යි ද දනියි. රාග රහිත සිත රාග රහිත සිතැ යි ද දනියි. ද්වේෂ සහිත සිත ද්වේෂ සහිත සිතැ යි ද දනියි. ද්වේෂ රහිත සිත ද්වේෂ රහිත සිතැ යි ද දනී. මෝහ සහිත සිත මෝහ සහිත සිතැ යි ද දනී. මෝහ රහිත සිත මෝහ රහිත සිතැ යි ද දනී. සංක්ෂිප්ත (=හැකුළුණු) සිත හැකුළුණු සිතැ යි ද දනී. වික්ෂිප්ත (=විසුරුණු) සිත විසුරුණු සිතැ යි ද දනී. මහද්ගත සිත මහද්ගත සිතැ යි ද දනී. අමහද්ගත සිත අමහද්ගත සිතැ යි ද දනී. සෝත්තර සිත සෝත්තර සිතැ යි ද දනී. අනුත්තර සිත අනුත්තර සිතැ යි ද දනී. සමාහිත සිත සමාහිත සිතැ යි ද දනී. අසමාහිත සිත අසමාහිත සිතැ යි ද දනී. විමුක්ත (=මිදුණු) සිත විමුක්ත සිතැ යි ද දනී. අවිමුක්ත (නොමිදුණු) සිත අවිමුක්ත සිතැ යි ද දනී.

77. මහරජ, යම්සේ සැරැසෙන සුළු සත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ ළදරුවෙක් හෝ තරුණයෙක් හෝ පිරිසිදු දීප්තිමත් කැඩපතෙක හෝ පහන් දිය බඳුනෙක හෝ සිය මුව සටහන පිරික්සා බලන්නේ තල-කැලැල් ආදී දෙස් ඇති තැන් සදෙස් තැතැ යි දන්නේ ද, එකී දෙස් නැති තැන දෙස් නැතැ යි දන්නේ ද-

එවමෙව ඛො මහාරාජ භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ චෙතොපරියඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති.

සො පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාති: සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති. වීතරාගං වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාති. සදොසං වා චිත්තං සදොසං චිත්තන්ති පජානාති. වීතදොසං වා චිත්තං වීතදොසං චිත්තන්ති පජානාති සමොහං වා චිත්තං සමොහං චිත්තන්ති පජානාති වීතමොහං වා චිත්තං වීතමොහං චිත්තන්ති පජානාති. සඛිත්තං වා චිත්තං -පෙ- වික්ඛිත්තං වා චිත්තං -පෙ- මහග්ගතං වා චිත්තං -පෙ- අමහග්ගතං වා චිත්තං -පෙ- සඋත්තරං වා චිත්තං -පෙ- අනුත්තරං වා චිත්තං -පෙ- සමාහිතං වා චිත්තං -පෙ- අසමාහිතං වා චිත්තං -පෙ- විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානාති අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති.

ඉදම්පි ඛො මහාරාජ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුරිමෙහි සන්දිට්ඨිකෙහි සාමඤ්ඤඵලෙහි අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

78. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ පුබ්බෙ-නිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති සෙය්‍යථිදං: එකම්පි ජාතිං දේවි'පි ජාතියො තීස්සො'පි ජාතියො චතස්සො'පි ජාතියො පඤ්ච'පි ජාතියො දස'පි ජාතියො වීසම්පි ජාතියො තිංසම්පි ජාතියො චත්තාරීසම්පි ජාතියො ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි අනෙකෙ'පි සංවට්ටකප්පෙ අනෙකෙ'පි විවට්ටකප්පෙ අනෙකෙ'පි සංවට්ටවිවට්ටකප්පෙ අමුත්‍රාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවං සුඛදුක්ඛ-පටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො අමුත්‍ර උපපාදිං තත්‍රාපාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවං-සුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො ඉධූපපන්නො'ති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

79. සෙය්‍යථාපි මහාරාජ පුරිසො සකම්හා ගාමා අඤ්ඤං ගාමං ගච්ඡෙය්‍ය තම්හා'පි ගාමා අඤ්ඤං ගාමං ගච්ඡෙය්‍ය. සො තම්හා ගාමා සකඤ්ඤෙව ගාමං පච්චාගච්ඡෙය්‍ය. තස්ස එවමස්ස: 'අහං ඛො සකම්හා ගාමා අමුං ගාමං අගච්ඡිං තත්‍ර එවං අට්ඨාසිං එවං නිසීදිං එවං අභාසිං එවං තුණ්හී අහොසිං. තම්හාපි ගාමා අමුං ගාමං අගච්ඡිං තත්‍රාපි එවං අට්ඨාසිං එවං නිසීදිං එවං අභාසිං එවං තුණ්හී අහොසිං. සො'මහි තම්හා ගාමා සකඤ්ඤෙව ගාමං පච්චාගතො'ති.

මහරජ, එ පරිද්දෙන් ම මහණ තෙමේ මෙසේ සමාහිත වූ සිත පිරිසිදු වූ කල්හි, දීප්ත වූ කල්හි, කෙලෙස් නැති කල්හි, උපක්ලේශ පහ වැ ගිය කල්හි, මෘදු වූ කල්හි, කර්ම්ක්ෂම වූ කල්හි, සිටි කල්හි, නිශ්චල බවට පැමිණි කල්හි, පරසිත් දන්නා නුවණ පිණිස සිත යොමු කෙරෙයි, නැඹුරු කෙරෙයි.

හේ අන් සතුන්ගේ, අත් පුඟුලන්ගේ සිත සියසිතින් පිරිසිදැ දනී. සරාග සිත සරාග සිතැ යි ද දනී. වීතරාග සිත වීතරාග සිතැ යි ද දනී. සදෝෂ සිත සදෝෂ සිතැ යි ද දනී, වීතදෝෂ සිත වීතදෝෂ සිතැ යි ද දනී. සමෝහ සිත සමෝහ සිතැ යි ද දනී, වීතමෝහ සිත වීතමෝහ සිතැ යි ද දනී. සංක්ෂිප්ත සිත සංක්ෂිප්ත සිතැ යි ද දනී. වික්ෂිප්ත සිත වික්ෂිප්ත සිතැ යි ද දනී. මහද්ගත සිත මහද්ගත සිතැ යි ද... අමහද්ගත සිත අමහද්ගත සිතැ යි ද... සෝත්තර සිත සෝත්තර සිතැ යි ද... අනුත්තර සිත අනුත්තර සිතැ යි ද... සමාහිත සිත සමාහිත සිතැ යි ද... අසමාහිත සිත අසමාහිත සිතැ යි ද... විමුක්ත සිත විමුක්ත සිතැ යි ද... අවිමුක්ත සිත අවිමුක්ත සිතැ යි ද දනී.

මහරජ, මේ ද පළමු දැක්වුණු සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍යඵලයනට වඩා මනෝඥ, වඩා උතුම්, සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍ය ඵලයෙකි.

78. මහ තෙමේ මෙසේ සමාහිත සිත පිරිසිදු කල්හි, දීප්ත වූ කල්හි, කෙලෙස් නැති වූ කල්හි, උපක්ලේශ පහ වැ ගිය කල්හි, මෘදු වූ කල්හි, කර්ම්ක්ෂම වූ කල්හි, සිටි කල්හි, නිශ්චල බවට පත් කල්හි, පූර්වේනිවාසානු-ස්මෘති ඥානය (=පෙර වුසු කද පිළිවෙළ දන්නා නුවණ) ලබනු පිණිස සිත යොමු කෙරෙයි. හේ එක් ජාතියක් ද ජාති දෙකක් ද ජාති තුනක් ද ජාති සතරක් ද ජාති පසක් ද ජාති දසයක් ද ජාති විස්සක් ද ජාති තිසක් ද ජාති සතළිසක් ද ජාති පනසක් ද ජාති සියක් ද ජාති දහසක් ද ජාති සුවහසක් ද, බොහෝ සංවර්ත කල්ප ද, බොහෝ විවර්ත කල්ප ද, බොහෝ සංවර්ත විවර්ත කල්ප ද, "අසෝ තන්හි මේ නම් ඇතියෙම් වීමි. මේ ගොත් ඇතියෙම් වීමි. මේ බඳු පැහැ ඇතියෙම් වීමි. මේ බඳු ආහාර ඇතියෙම් වීමි. මේ බඳු සුව දුක් විඳින්නෙම් වීමි. මේ බඳු (මෙතෙක්) ආයු කෙළවර කොටැතියෙම් වීමි. ඒ මම එයින් යැවැ අසෝ තැන උපතිමි. එහි ද මේ නම් ඇතියෙම් වීමි. මේ ගොත් ඇතියෙම් වීමි. මේ බඳු පැහැ සටහන් ඇතියෙම් වීමි. මේ බඳු ආහාර ඇතියෙම් වීමි. මේ බඳු සුවදුක් විඳින්නෙම් වීමි. මෙතෙක් ආයු සීමාවක් ඇතියෙම් වීමි. ඒ මම එයින් සැව මෙහි උපතිමි"යි මෙසේ අනේකවිධ වූ පෙරැ වුසු කද පිළිවෙළ සිහි කෙරෙයි. මෙසේ වර්ණාදි වශයෙන් ආකාර සහිත වූ නම් ගොත් විසින් උද්දේශ සහිත වූ බහුවිධ වූ පූර්වේනිවාසය සිහි කෙරෙයි.

79. මහරජ, යම්සේ පුරුෂයෙක් සිය ගමින් අන් ගමකට යන්නේ ද, ඒ ගමිනුත් අන් ගමකට යන්නේ ද, (නැවත) හේ ඒ ගමින් සිය ගමට ම පෙරළා එන්නේ ද, එසේ වූ ඔහුට "මම වූ කලි සිය ගමින් අසෝ ගමට ගියෙමි. එහි මෙසේ සිටියෙමි, මෙසේ උන්නෙමි, මෙසේ කීමි, මෙසේ නිහඬ වීමි. ඒ ගමිනුත් අසෝ ගමට ගියෙමි. එහි ද මෙසේ සිටියෙමි, මෙසේ උන්නෙමි, මෙසේ කීමි, මෙසේ නිහඬ වීමි. ඒ මම ඒ ගමින් සිය ගමට ම පෙරළා ආයෙම් වෙමි"යි ඔහුට මේ බඳු සිතෙක් වන්නේ ද–

එවමෙව ඛො මහාරාජ භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ පුබ්බෙනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති සෙය්‍යථිදං: එකම්පි ජාතිං දෙ'පි ජාතියො තිස්සො'පි ජාතියො චතස්සො'පි ජාතියො පඤ්ච'පි ජාතියො දස'පි ජාතියො වීසම්පි ජාතියො තිංසම්පි ජාතියො චත්තාරීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි අනෙකෙ'පි සංවට්ටකප්පෙ අනෙකෙ'පි විවට්ටකප්පෙ අනෙකෙ'පි සංවට්ටවිවට්ටකප්පෙ අමුත්‍රාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො අමුත්‍ර උපපාදිං තත්‍රාපාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො ඉධූපපන්නො'ති ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

ඉදම්පි ඛො මහාරාජ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුරිමෙහි සන්දිට්ඨිකෙහි සාමඤ්ඤඵලෙහි අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

80. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති: 'ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා'ති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති.

මහරජ, එ පරිද්දෙන් ම මහණ නෙමේ මෙසේ සමාහිත සිත පිරිසිදු කල්හි, දීප්ත කල්හි, කෙලෙස් රහිත කල්හි, උපක්ලේශ පහ වැ ගිය කල්හි, මෘදු වූ කල්හි, කර්ම්ක්ෂම වූ කල්හි, සිටි කල්හි, නිශ්චල බවට පැමිණි කල්හි, පෙරැ වුසූ කඳ පිළිවෙල සිහි කරන තුවණ පිණිස සිත මොනොවට යොමු කෙරෙයි, මොනොවට නැඹුරු කෙරෙයි, හේ "අසෝ තන්හි මේ නම් ඇතියෙම් වීමි, මේ බඳු ගොත් ඇතියෙම් වීමි, මේ බඳු පැහැ ඇතියෙම් වීමි, මේ බඳු ආහාර ඇතියෙම් වීමි. මේ බඳු සුවදුක් විඳුනෙම් වීමි, මේ බඳු ආයු සීමා ඇතියෙම් වීමි, ඒ මම එයින් සැව අසෝ තැන උපතිමි. එහි ද මේ නම් ඇතියෙම්, මේ නම් ගොත් ඇතියෙම්, මේ බඳු පැහැසටහත් ඇතියෙම්, මේ බඳු ආහාර ඇතියෙම්, මේ බඳු සුවදුක් විඳින්නෙම් වීමි, මෙතෙක් ආයු සීමා ඇතියෙම් වීමි, ඒ මම එයින් සැවැ මෙහි උපතිමි"යි මෙසේ එක් ජාතියක් ද, ජාති දෙකක් ද, ජාති තුනක් ද, ජාති සතරක් ද, ජාති පනසක් ද, ජාති සියයක් ද, ජාති දහසක් ද, ජාති සුවහසක් ද, බොහෝ සංවර්ත කල්ප ද, බොහෝ විවර්ත කල්ප ද, බොහෝ සංවර්ත විවර්ත කල්ප ද යි මෙසේ අනේකවිධ වූ පෙරැ වුසූ කඳ පිළිවෙල සිහි කෙරෙයි. මෙ පරිද්දෙන් ආකාර සහිත වූ උද්දේශ සහිත වූ පෙරැ වුසූ නොයෙක් වැදැරුම් කඳ පිළිවෙල සිහි කෙරෙයි.

මහරජ, මේ ද පළමු දැක්වුණු සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍යඵලයතට වඩා මනෝඥ වූ වඩා උතුම් වූ සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍යඵලයෙකි.

80. හේ මෙසේ සමාහිත සිත පිරිසිදු වැ දීප්ත වැ කෙලෙස් නැතිවැ උපක්ලේශ පහ වැ මෘදු වැ කර්ම්ක්ෂම වැ සිත වැ නිශ්චල බවට පැමිණි කල්හි, සත්ත්වයන්ගේ ච්‍යුති උපපත්ති දක්නා තුවණ පිණිස සිත යොමු කෙරෙයි, නැඹුරු කෙරෙයි. හේ පිරිසිදු වූ, මිනිසුන්ගේ දර්ශනෝපචාරය ඉක්මැ දැක්කැ හැකි දිව්‍යැසින්, "අහෝ! මේ භවත් සත්ත්වයෝ කායදුශ්චරිතයෙන් සමන්විතයහ, වාග්දුශ්චරිතයෙන් සමන්විතයහ, මනෝ දුශ්චරිතයෙන් සමන්විතයහ, ආර්‍යෝපවාද කළහ, මිසදිටු ගතුවහ, මිසදිටු වශයෙන් ගත් මිථ්‍යාව්‍රත ඇතියහ. ඒ මොහු කරජ කය බිඳීමෙන් මරණින් මතු, සැපයෙන් පහ වූ, දුෂ්ටකර්ම් හේතුයෙන් හටගත් ගතිය වූ, (කර්ම්යට තමන් පරවශ බැවින්) තමනට අවශ්‍ය වැ වැටෙන තැන වූ නිරයට වත්තහ. මේ භවත් සත්ත්වයෝ වූ කලි කායසුචරිතයෙන් සමන්විතයහ, වාක්සුචරිතයෙන් සමන්විතයහ, මනඃසුචරිතයෙන් සමන්විතයහ, ආර්‍යයතට උපවාද නො කළහ, සම්දිටු ගත්තහ, සම්දිටු වශයෙන් ගත් ශීලාදිය ඇත්තහ. ඒ මොහු කාබුන් මරණින් මතු ශෝභන වූ ගති ඇති සග ලොවට වන්නාහ"යි මරණාසන්න වූ ද, එකණෙහි පිළිසඳ, ගත්තා වූ ද ගීන වූ ද, උසස් වූ ද, මනා පැහැ සටහත් ඇති වූ ද, නොමනා පැහැ සටහත් ඇති වූ ද, සුගතියට පැමිණියා වූ ද, දුගතියට පැමිණියා වූ ද, කර්ම්ය වූ පරිදි ඒ ඒ භවයට ගියා වූ සත්ත්වයන් දකී. මෙසේ හේ පිරිසිදු වූ මානුෂක විෂය ඉක්මැ පැවැති දිව්‍යැසින් ගින ප්‍රණීත, සුවර්ණ දුර්වර්ණ, සුගත දුර්ගත, සත්ත්වයන් දකී. කර්ම්ය වූ පරිදි ඒ ඒ භවය කරා එළැඹැ සිටි සත්ත්වයන් දකී.

81. සෙය්‍යථාපි මහාරාජ මජ්ඣිමෙ සිංඝාටකෙ පාසාදෙ, තත්‍රෙ චක්ඛුමා පුරිසො ඨිතො පස්සෙය්‍ය මනුස්සෙ ගෙහං පවිසන්තෙ'පි රථියා විතිසඤ්චරන්තෙ'පි මජ්ඣිමෙ සිංඝාටකෙ නිසින්නෙ'පි, තස්ස එවමස්ස: එතෙ මනුස්සා ගෙහං පවිසන්ති, එතෙ නික්ඛමන්ති, එතෙ රථියා විතිසඤ්චරන්ති, එතෙ මජ්ඣිමෙ සිංඝාටකෙ නිසින්නා'ති.

එවමෙව ඛො මහාරාජ භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති: 'ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා'ති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති.

ඉදම්පි ඛො මහාරාජ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුරිමෙහි සන්දිට්ඨිකෙහි සාමඤ්ඤඵලෙහි අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

82. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති, අයං දුක්ඛසමුදයො'ති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධො'ති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධගාමිනීපටිපදා'ති යථාභූතං පජානාති, ඉමෙ ආසවා'ති යථාභූතං පජානාති, අයං ආසවසමුදයො'ති යථාභූතං පජානාති, අයං ආසවනිරොධො'ති යථාභූතං පජානාති, අයං ආසවනිරොධගාමිනීපටිපදා'ති යථාභූතං පජානාති. තස්ස එවං ජානතො එවං පස්සතො කාමාසවාපි චිත්තං විමුච්චති භවාසවාපි චිත්තං විමුච්චති අවිජ්ජාසවාපි චිත්තං විමුච්චති, විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති, ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාති.

81. මහරජ, යම්සේ සතර මං හන්දියෙක මහල් සහිත ගෙයෙක් වන්නේ ද, එහි උඩු මහලෙහි ඇස් ඇති පුරුෂයෙක් සිටියේ ගෙට පිවිසෙනවුනුත් ගෙන් නික්මෙනවුනුත් විදියෙහි ඇත මැත යන එන-වුනුත්, සිවුමං හන්දිය මැද හුන්නවුනුත් දක්නේ ද, ඒ දක්නා ඔහුට "මේ මිනිස්සු ගෙට පිවිසෙත්, මේ මිනිස්සු ගෙන් නික්මෙත්, මේ මිනිස්සු විදියෙහි ඇත මැත යෙත්, මොහු සිවුමංහන්දිය මැද උන්නෝ වෙත් යැ"යි මෙසේ සිතෙක් වන්නේ ද-

මහරජ, එපරිදි ම මහණ තෙමේ මෙසේ සමාහිත සිත පිරිසිදු වැ දීප්තිමත් වැ කෙලෙස් නැති වැ උපක්ලේශ පහ වැ මෘදු වැ කර්ම්ක්ෂම වැ සිත වැ නිශ්චල බවට පැමිණි කල්හි, සත්ත්වයන්ගේ ච්‍යුති උපපත්ති දක්නා නුවණ ලබනු පිණිස සිත යොමු කෙරෙයි, නැඹුරු කෙරෙයි. හේ මානුෂක විෂයය ඉක්මැ වූ පිරිසිදු වූ දිව්‍යයින් "අහෝ මේ භවත් සත්හු කායදුශ්චරිතයෙන් සමන්විතයහ, වාග්දුශ්චරිතයෙන් සමන්විතයහ, මනෝ-දුශ්චරිතයෙන් සමන්විතයහ, ආර්යයනට උපවාද කළහ, මිසදිටුවහ, මිසදිටු වශයෙන් ගත් ව්‍රත ඇතියහ. ඒ මෙහු කා බුන් මරණින් මතු, සැපයෙන් පහ වූ, දුඃඛ කර්මයෙන් උපන් ගතිය වූ, තමනට තමන් අවශ්‍ය වැ වැටෙන තැන වූ, නිරයට වන්හ. එහෙත් මේ භවත් සත්ත්වයෝ වූ කලී කායසුචරිතයෙන් සමන්විතයහ, වාක්සුචරිතයෙන් සමන්විතයහ, මනඃ-සුචරිතයෙන් සමන්විතයහ, ආර්යයනට උපවාද නො කළහ, සම්දිටු ගත්තහ, සම්දිටු විසින් ගත් ශීලාදිය ඇත්තහ. මොහු කා බුන් මරණින් මතු, ශෝභන ගති ඇති සග ලොවට වන්නාහ"යි මෙසේ මරණාසන්න වූ ද, එකෙණෙහි පිළිසිඳ ගත්තත් වූ ද, පහත් වූ ද, උසස් වූ ද, මනා පැහැ සටහන් ඇති වූ ද, නොමනා පැහැ සටහන් ඇති වූ ද, සුගතියට පැමිණියත් වූ ද, කර්ම්ය වූ පරිදි ඒ ඒ භවයට ගිය සත්ත්වයන් දකී. මෙසේ පිරිසිදු වූ, මානුෂක විෂයය ඉක්මැ පැවැති දිව්‍යයින්, හීන ප්‍රණීත, සුවර්ණ, දුර්වර්ණ සුගත දුර්ගත සත්ත්වයන් දකී. කර්ම වූ පරිදි ඒ ඒ භවය කරා එළැඹැ සිටි සත්ත්වයන් දකී.

මහරජ, මේ ද පළමු දක්වුණු සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍යඵලයනට වඩා මනෝඥ වූ, වඩා උතුම් වූ, සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍ය ඵලයෙකි.

82. හේ මෙසේ සමාහිත සිත පිරිසිදු වැ දීප්ත වැ නිකෙලෙස් වැ උපක්ලේශ පහ වැ මෘදු වැ කර්ම්ක්ෂම වැ සිත වැ නිශ්චල බවට පැමිණි කල්හි, ආස්‍රවයන්ගේ ක්ෂයය (විනාශය) පිණිස සිත මොනොවට යොමු කෙරෙයි, මොනොවට නැඹුරු කෙරෙයි. (එසේ වූ) හෙ තෙමේ 'මේ දුඃඛ' යි ඇති සැටි ලෙස දනී. 'මේ දුක් ඉපැත්මට කාරණයැ' යි ඇති සැටි ලෙස දනී. 'මේ දුක් වැනැස්මැ' යි (=දුක් නැස්වට අරමුණු වන නිවනැ'යි) ඇති සැටි ලෙස දනී, 'මේ දුක් වැනැස්මට පමුණුවන පිළිවෙතැ'යි ඇති සැටි ලෙස දනී. 'මොහු ආස්‍රවයෝ යැ'යි ඇති සැටියෙන් දනී. මේ ආස්‍රවයන් ඉපැද්මට කරුණැ'යි ඇති සැටියෙන් දනී. 'මේ ආස්‍රවනිරෝධ යැ' යි (=ආස්‍රවයන් වැනැස්මට ප්‍රත්‍යය වන නිවනැ'යි) ඇති සැටියෙන් දනී. 'මේ ආස්‍රවනිරෝධගාමිනී ප්‍රතිපත්ති යැ' යි ඇති සැටියෙන් දනී. මෙසේ දන්නා මෙසේ දක්නා ඔහුගේ සිත කාමාස්‍රවය කෙරෙන් ද මිදේ. ඔහු සිත භවාස්‍රවය කෙරෙන් ද මිදේ. (ඔහු) සිත අවිද්‍යාස්‍රවය කෙරෙන් ද මිදේ. (එසේ සිත මිදුණු කල්හි 'මා සිත ආස්‍රව කෙරෙන්) මිදුණේ යැ' යි (ප්‍රත්‍යවෙක්ෂණ) ඥානය වේ. භවෝත්පත්තිය ක්ෂීණ විය (හෙවත් නැවැත භවයෙහි තොඋපදනා සවභාවයට පැමිණියෙමි), 'මඟ බඹසර වැස නිමැවිණි. (සිවු ඔස්හි සතර මඟින් කල යුතු සොළොස් වැදැරුම්) කිස කොටැ නිමැවිණි. මේ බව පිණිස (=මේ ක්ලේශක්ෂයය පිණිස) ඔලි දු කටයුතු දෑයෙක් නැතැ'යි හේ දනී.

83. සෙය්‍යථාපි මහාරාජ පබ්බතසම්බාධෙ උදකරහදෙ අච්ඡෝ විප්පසන්නො අනාවිලො. තත්‍ර චක්ඛුමා පුරිසො තීරෙ ඨිතො පස්සෙය්‍ය සිප්පිසම්බූකම්පි සක්ඛරකථලම්පි මච්ඡගුම්බම්පි චරන්තම්පි තිට්ඨන්තම්පි. තස්ස එවම්අස්ස: අයං ඛො උදකරහදෙ අච්ඡො විප්පසන්නො අනාවිලො. තත්‍රිමෙ සිප්පිසම්බූකා'පි සක්ඛරකථලා'පි මච්ඡගුම්බා'පි චරන්තිපි තිට්ඨන්තිපීති.

එවමෙව ඛො මහාරාජ භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති. අයං දුක්ඛසමුදයො'ති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරොධො'ති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරොධගාමිනීපටිපදා'ති යථාභූතං පජානාති. ඉමෙ ආසවා'ති යථාභූතං පජානාති. අයං ආසවනිරොධො'ති යථාභූතං පජානාති. අයං ආසවනිරොධගාමිනීපටිපදා'ති යථාභූතං පජානාති.

තස්ස එවං ජානතො එවං පස්සතො කාමාසවා'පි චිත්තං විමුච්චති, භවාසවා'පි චිත්තං විමුච්චති, අවිජ්ජාසවා'පි චිත්තං විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාති.

ඉදං ඛො මහාරාජ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුරිමෙහි සන්දිට්ඨිකෙහි සාමඤ්ඤඵලෙහි අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච. ඉමස්මා ච පන මහාරාජ සන්දිට්ඨිකා සාමඤ්ඤඵලා අඤ්ඤං සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං උත්තරිතරං වා පණීතතරං වා නත්ථීති.

84. එවං වුත්තෙ රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො භගවන්තං එතදවොච: 'අභික්කන්තං භන්තෙ, අභික්කන්තං භන්තෙ. සෙය්‍යථාපි භන්තෙ නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති, එවමෙව භන්තෙ භගවතා අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භන්තෙ භගවන්තං සරණං ගච්ඡාමි, ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතං. අච්චයො මං භන්තෙ අච්චගමා යථාබාලං යථාමූළ්හං යථාඅකුසලං යො'හං පිතරං ධම්මිකං ධම්මරාජානං ඉස්සරියස්ස කාරණා ජීවිතා වොරොපෙසිං. තස්ස මෙ භන්තෙ භගවා අච්චයං අච්චයතො පටිග්ගණ්හාතු ආයතිං සංවරාය'ති.

83. මහරජ, යම්සේ කඳු මුදුනෙකැ වූ පහන් වූ, වෙසෙසින් පහන් වූ, නොකැලැඹුණු (=බොර නො වූ) දිය විලෙක් වන්නේ ද, එහි ඉවුරෙහි ඇස් ඇති මිනිසෙක් සිටියේ, එහි තුළැ හැසිරෙන්නා වූත් සිටුනා වූත් සිප්පිබෙල්ලනුත් සක්බෙල්ලනුත් කැටකැබිලිතිත් මත්ස්‍යසමූහයාත් දක්නේ ද, (එසේ දක්නා) ඔහුට "මේ දියවිල පහන් ය, වෙසෙසින් පහන් ය, නොකැලැඹුණේ ය. මෙහි මේ සිප්පිහුත් සක්බෙල්ලෝත් කැට කැබිලිතිත් මත්ස්‍ය සමූහයෝත් හැසිරෙන්නෝත් සිටින්නෝත් වෙති" යි මෙසේ සිතෙක් වන්නේ ද,

මහරජ, එපරිද්දෙන් ම මහණ තෙමේ මෙසේ සමාහිත සිත පිරිසිදු වැ දීප්තිමත් වැ, නිකෙලෙස් වැ, උපක්ලේශ පහ වැ, මෘදු වැ, කර්මණ්‍ය වැ, ඨිත වැ නිශ්චලතාවට පැමිණි කල්හි ආස්‍රවක්ෂයඥානය පිණිස සිත යොමු කෙරෙයි, නැඹුරු කෙරෙයි. හේ 'මේ දුකැ'යි ඇති සැටියෙන් දනී, 'මේ දුකට කරුණැ'යි ඇති සැටියෙන් දනී. 'මේ දුක් වැනැස්මැ'යි ඇති සැටියෙන් දනී. 'මේ දුක් වැනැස්මට පමුණුවන පිළිවෙතැ'යි ඇති සැටියෙන් දනී. 'මොහු ආස්‍රවයහ'යි ඇති සැටියෙන් දනී. මේ ආස්‍රව-සමුදය යැ (ඉපැද්මට කරුණැ)'යි ඇති සැටියෙන් දනී. 'මේ ආස්‍රව-නිරෝධයැ'යි ඇති සැටියෙන් දනී. 'මේ ආස්‍රවනිරෝධයට පැමිණෙන පිළිවෙතැ'යි අති සැටියෙන් දනී.

මෙසේ දන්නා, මෙසේ දක්නා, ඔහුගේ සිත කාමාස්‍රවය කෙරෙන් ද මිදේ, භවාස්‍රවය කෙරෙන් ද මිදේ, අවිද්‍යාස්‍රවය කෙරෙන් ද මිදේ, මිදුණු කල්හි 'මිදුණේ යැ'යි දැනීම වේ. භවෝත්පත්තිය ක්ෂීණ විය, මාර්ගබ්‍රහ්ම-චර්‍යය වැස නිමවන ලද්දේ ය, (සිවු සත්හි සිවු මගින්) කළයුතු (සොළොස් වැදැරුම්) කෘත්‍යය කොටැ නිමැවිණ. මේබව පිණිස (=මේ කෙලෙශක්ෂයය පිණිස) කළ යුතු අන් කිසිත් නැතැ'යි හේ දනී.

මහරජ, මේ වූ කලි ' පළමුවෙන් දැක්වුණු සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍ය-ඵලයනට වඩා මනෝඥ වූ, වඩා උතුම් වූ සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍ය ඵලයෙකි "මහරජ, මේ සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍ය ඵලයෙන් අන්‍ය වූ, මෙයට වඩා මනෝඥ වූ හෝ මෙයට වඩා උතුම් වූ හෝ සාන්දෘෂ්ටික ශ්‍රාමණ්‍ය ඵලයෙක් නැතැ" (යි වදාළ සේක).

84. මෙසේ වදාළ කල්හි මගධෙශ්වර වෛදේහීපුත්‍ර අජාතශත්‍රු රජ තෙම, "වහන්ස, ධර්ම දේශනාව අභිකාන්ත ය. (අතිමනෝඥ ය.) වහන්ස, ධර්ම දේශනාව අභිකාන්ත ය. වහන්ස, යම්සේ යැටිකුරු කොට තැබූ (මුහුණින් නැමූ) බඳුනක් උඩුකුරු කරන්නේ හෝ වේ ද, වැසුණු දෙයක් වැසුම් හැර දක්වන්නේ හෝ වේ ද, මං මුළා වූවකුට මඟ කියන්නේ හෝ වේ ද, 'ඇස් ඇතියෝ රූප දකිතැ'යි අඳුරෙහි තෙල් පහනක් දල්වන්නේ හෝ වේ ද, වහන්ස, එපරිද්දෙන් ම භාග්‍යවතුන් වහන්සේ විසින් මට නොයෙක් අයුරින් ධර්මය පැවැසිණ. වහන්ස, ඒ මම භාග්‍ය-වතුන් වහන්සේ ද ධර්මය ද භික්ෂු සංඝයා ද සරණ යෙමි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මා අද පටන් දිවි හිමි කොට සරණ ගිය උපාසකයකු කොට දන්නා සේක් වා. වහන්ස, යම් බඳු මම් සිය පිය වූ දෑහැමි දැමිටු රජහු ඉසුරු කරුණින් දිවියෙන් තොර කෙළෙමි වෙමි ද වහන්ස, ඒ අපරාධය බාලබවට ගැළපෙනසේ මූසාවට අනුරූපසේ අදක්ෂ බවට නිසිසේ මා මැඩගෙන ගියේ ය. වහන්ස, මත්තෙහි මා මෙබඳු වරද නො කරනු පිණිස භාග්‍යවතුන් වහන්සේ මගේ වරද වරද වශයෙන් පිළිගන්නා ඉස්ක් වා"යි භාග්‍යවතුන් වහන්සේට මෙබස් පැවැසී ය.

85. තගෙ ත්වං මහාරාජ අච්චයො අච්චගමා යථාබාලං යථාමුළ්හං යථාඅකුසලං යො ත්වං පිතරං ධම්මිකං ධම්මරාජානං ජීවිතා වොරොපෙසි. යතො ච ඛො ත්වං මහාරාජ අච්චයං අච්චයතො දිස්වා යථාධම්මං පටිකරොසි. තගෙතං මයං පටිගණ්හාම. වුද්ධි හෙසා මහාරාජ අරියස්ස විනයෙ යො අච්චයං අච්චයතො දිස්වා යථාධම්මං පටිකරොති ආයතිං සංවරං ආපජ්ජතීති.

86. එවං වුත්තෙ රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො භගවන්තං එතදවොච: හන්ද ච දානි මයං භන්තෙ ගච්ඡාම බහුකිච්චා මයං බහුකරණීයා'ති.

"යස්ස 'දානි ත්වං මහාරාජ කාලං මඤ්ඤසී''ති.

අථ ඛො රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

87. අථ ඛො භගවා අචිරපක්කන්තස්ස රඤ්ඤො මාගධස්ස අජාතසත්තුස්ස වෙදෙහිපුත්තස්ස භික්ඛූ ආමන්තෙසි: ඛතායං භික්ඛවෙ රාජා, උපහතායං භික්ඛවෙ රාජා, සචායං භික්ඛවෙ රාජා පිතරං ධම්මිකං ධම්මරාජානං ජීවිතා න වොරොපෙස්සථ ඉමස්මිං යෙව ආසනෙ විරජං විතමලං ධම්මචක්ඛුං උප්පජ්ජිස්සථාති.

ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

සාමඤ්ඤඵලසුත්තං නිට්ඨිතං දුතියං.

85. (එවිට භාග්‍යවතුන් වහන්සේ වදාරන සේක්:)
"මහරජ, යම්බඳු තෝ පිය වූ දූහැමි දූමිටු රජහු දිවියෙන් තොර කෙළෙහි වෙයි ද, එකාන්තයෙන් ඒ වරද බාලබවට අනුරිවින් මූසබවට අනුරිවින් අකුසලට අනුරිවින් තා ඉක්මැ ගියේ යැ. (මැඩැ ගෙන පැවැත්තේ ය.) මහරජ, යම් හෙයකින් යුමත් තෙමේ වරද වරද වශයෙන් දැක ධර්ම්‍ය වූ පරිදි පිළියම් කෙරෙහි නම්, යුමත්හුගේ ඒ වරද අපි පිළිගනුම්හ (=ඉවසමු). මහරජ, යමෙක් වරද වරද විසින් දැක දහම් වූ පරිදි පිළියම් කරන්නේ නම්, මත්තෙහි එ වැන්නක් නොකරනුවට සංවරයට පැමිණෙන්නේ නම් (=ආයතිසංවරයෙහි පිහිටන්නේ නම්) මෙය ආර්‍ය්‍යවිනයයෙහි (බුදු සස්නෙහි) වෘද්ධිය (=වැඩීම) නම් වේ" යැ යි වදාළ සේක.

86. මෙසේ වදාළ කල්හි වෛදේහීපුත්‍ර මගධෙශ්වර අජාතශත්‍රු රජ තෙම භාග්‍යවතුන් වහන්සේට "වහන්ස, දැන් අපි යමිහ. අපි බොහෝ කෘත්‍ය ඇත්තමෝ බොහෝ කටයුතු ඇත්තමෝ වමිහ"යි කී ය.

"මහරජ, යුමත් තෙමේ යම් ගමනකට කල් දැනිහි ද එයට යුමත් ම කල් දැන ගන්නැ"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

ඉක්බිත්තෙන් වෛදේහීපුත්‍ර මගධෙශ්වර අජාතශත්‍රු රජ තෙම භාග්‍යවතුන් වහන්සේගේ වචනය පිළිගෙන අනුමෝදන් වැ උන්හිනෙන් නැඟිට පැදකුණු කොට නික්මැ ගියේ ය.

87. ඉන් පසු භාග්‍යවතුන් වහන්සේ වෛදේහීපුත්‍ර මගධෙශ්වර අජාතශත්‍රු රජ නික්මැ ගිය නොබෝ වේලායෙහි භික්ෂූන් අමතා, "මහණෙනි, මේ රජ සිය පියා නැසීමෙන් කල කර්‍මාපරාධයෙන් උදුරාලූ උපනිශ්‍රය සම්පත් නැමැති මුල් ඇත්තේ ඉදුරුණේ වෙයි. එහෙයින් ම (නවුවා වූ ප්‍රතිඥා ඇත්තෙන්) නවුයේ වෙයි. මහණෙනි, ඉදින් මේ රජ දූහැමි වූ, දූහැමෙන් රජ බවට පැමිණි පියා ජීවිතයෙන් තොර නො කෙළේ වී නම්, මෙ අස්නෙහි ම (මෙතන්හි දී ම) රාගාදි කෙලෙස් රජස් රහිත, පහ වූ කෙලෙස් මල ඇති දහම් ඇස (සෝවාන්මඟනැණ) මොහුට පහළ වූයේ වනැ"යි වදාළ සේක.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. එ මහණහු සතුටු සිතැත්තෝ උන්වහන්සේගේ වචනය පිළිගත්හ.

දෙවෙනි වූ ශ්‍රාමණ්‍යඵල සූත්‍රය නිමියේ ය.

3

අම්බට්ඨසුත්තං

1. එවං මේ[1] සුතං එකං සමයං භගවා කොසලේසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝේන සද්ධිං පඤ්චමත්තේහි භික්ඛුසතේහි යේන ඉච්ඡානඞ්ගලං[2] නාම කොසලානං බ්‍රාහ්මණගාමො තදවසරි. තත්‍ර සුදං භගවා ඉච්ඡානඞ්ගලේ[3] විහරති ඉච්ඡානඞ්ගලවනසණ්ඩේ.

2. තේන ඛො පන සමයේන බ්‍රාහ්මණො පොක්ඛරසාති[4] උක්කට්ඨං අජ්ඣාවසති සත්තුස්සදං සත්තිණකට්ඨොදකං සධඤ්ඤං රාජභොග්ගං රඤ්ඤා පසේනදිනා[5] කොසලේන දින්නං රාජදායං බ්‍රහ්මදෙය්‍යං. අස්සොසි ඛො බ්‍රාහ්මණො පොක්ඛරසාති:

"සමණො ඛලු නො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො කොසලේසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝේන සද්ධිං පඤ්චමත්තේහි භික්ඛුසතේහි ඉච්ඡානඞ්ගලං අනුප්පත්තො ඉච්ඡානඞ්ගලේ විහරති ඉච්ඡානඞ්ගලවනසණ්ඩේ. තං ඛො පන භවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො: "ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි[6] සත්ථා දේවමනුස්සානං බුද්ධො භගවා.[7] සො ඉමං ලොකං සදේවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදේවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවේදෙති. සො ධම්මං දේසෙති ආදිකල්‍යාණං මජ්ඣේකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං[8] කේවල-පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති. සාධු ඛො පන තථාරූපානං අරහතං දස්සනං හොතී"ති.

3. තේන ඛො පන සමයේන බ්‍රාහ්මණස්ස පොක්ඛරසාතිස්ස අම්බට්ඨො නාම මාණවො[9] අන්තේවාසී හොති අජ්ඣායකො මන්තධරො තිණ්ණං වේදානං පාරගූ සනිඝණ්ඩුකෙට්ඨුභානං සාක්ඛරප්පභේදානං ඉතිහාස-පඤ්චමානං පදකො වෙය්‍යාකරණො ලොකායතමහාපුරිසලක්ඛණේසු අනවයො අනුඤ්ඤාතපටිඤ්ඤාතො සකේ ආචරියකේ තෙවිජ්ජකේ පාචිත්තේ යමහං ජානාමි තං ත්වං ජානාසි, යං ත්වං ජානාසි තමහං ජානාමීති.

---

1. එවමේම, PTS. 2. තඞ්කල, PTS. ඉච්ඡානඞ්කලන්තිපි පාඨො, අ.
3. ඉච්ඡානඞ්කලේ, PTS. සඞ්ඝට්ඨ. 4. සාදි, සඞ්ඝට්ඨ. පොක්ඛරසාතීතිපි වුච්චති, අ.
5. පසෙනදි, PTS. පසේනදිනා, සීමු. 6. සාරථි, සීමු. ස්‍යා.
7. භගවාති, මජ්ඣං. ස්‍යා. 8. සව්‍යඤ්ජනං, PTS.
9. අම්බට්ඨො මාණවො, PTS. මාතවො, PTS-n.

3

අම්බට්ඨසූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදි: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් පන්සියක් පමණ වූ මහත් බික්සඟන හා කොසොල් රටැ සැරි සරන සේක්, කොසොල් රටියන්ගේ ඉච්ඡානඞ්ගල නම් බමුණු ගමට වැඩි සේක. එහි භාග්‍යවතුන් වහන්සේ ඉච්ඡානඞ්ගල ගමට නොදුරෙහි වූ ඉච්ඡානඞ්ගල වනලැහැබෙහි වසන සේක.

2. එ සමයෙහි වනාහි පොක්ඛරසාති නම් බමුණු තෙමේ බහුජනාකීර්ණ වූ, තණ දඬු දිය යන මෙසින් යුක්ත වූ, බොහෝ ධාන්‍ය ඇති, රජහු කෙරෙන් ලත් තමාගේ පරිභෝග වස්තුව වූ, රජහුගේ දායාද්‍ය (දායද) වූ බ්‍රහ්මදේයය වූ, (රාජස්වරූපයෙන් පරිභෝග කටයුතු වූ), පසේනදි කොසොල් රජහු දුන් ශ්‍රෙෂ්ඨ ත්‍යාගය වූ උක්කට්ඨා නුවරැ වෙසෙයි. හෙ තෙමේ (රටෙහි පැතිරැ හිය) මතු දැක්වෙන කථාව ඇසී ය:

"භවත්නි, ශාක්‍යපුත්‍ර වූ, ශාක්‍යකුලයෙන් නික්මැ පැවිදි වූ ශ්‍රමණ ගෞතමයන් වහන්සේ වනාහි භික්ෂූන් පන්සියක් පමණ වූ මහබික්සඟන හා කොසොල් රටැ සැරි සරන සේක්, කොසොල්රටියන්ගේ ඉච්ඡානඞ්ගල නම් ගමට වැඩි සේක්, එයට නොදුරෙහි වූ ඉච්ඡානඞ්ගල වනලැහැබෙහි වසන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ මේ මේ කරුණින් අර්හත්හ, සම්‍යක්සම්බුද්ධියහ, විද්‍යාචරණසම්පන්නයහ, සුගත නම්හ, ලෝකවිත් (ලොව දන්නා) හ, නිරුත්තර පුරුෂදම්‍යසාරථිහ, දෙවිමිනිස්නට ශාස්තෘහ, බුද්ධියහ, භගවත්හ. උන්වහන්සේ දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත මේ ලෝකය, මහණ බමුණන් සහිත දෙවිමිනිසුන් සහිත මේ සත්ත්වවර්ගයා, තමන් ම සිය විශිෂ්ට නුවණින් දැන පැසක් කොට, දන්වන සේක. 'උන් වහන්සේ ආදිකල්‍යාණ මධ්‍යකල්‍යාණ පර්යවසානකල්‍යාණ වූ, (සතිපට්ඨානාදි) මනා අර්ථ ඇති, මනා (සම්පූර්ණ) ව්‍යංජන ඇති, සර්වාකාර පරිපූර්ණ, පිරිසිදු ධර්මය දෙසන සේක. එසේ දෙසන්නෝ ද (අධිශීල අධිචිත්ත අධිප්‍රඥා යන ත්‍රිශික්ෂාවයන් සංගෘහීත වූ) සකල ශාසන බ්‍රහ්මචර්යය පවසන සේක. එබඳු රහතුන් දැක්ම වූ කලි හිත වැඩ ගෙනැ දෙන්නෙකැ'යි ඒ භගවත් ගෞතමයන් වහන්සේ පිළිබඳ මෙසේ වූ හඳ වූ කීර්තිශබ්දයෙක් උස් වැ නැංගේ වේ" යනු යි.

3. එසමයෙහි වූ කලි පොක්ඛරසාති බමුණාට වේද හදාරන, වේදයන් ඔබපාඨයෙන් දරන, නිඝණ්ටු කෙටුභශාස්ත්‍ර සහිත අක්ෂරප්‍රභේද (ශික්ෂා හා නිරුක්ති) සහිත, ඉතිහාසය පස්වනු කොටැති ත්‍රිවේදයන්ගේ පරතෙර පත්, පදපාඨ දන්නා, තදන්‍ය සියලු ව්‍යාකරණ ද දන්නා, ලෝකායතශාස්ත්‍රයෙහිත් මහාපුරුෂලක්ෂණශාස්ත්‍රයෙහිත් නිපුණ වූ, ඇදුරන් විසින් උගන්වන ලද ත්‍රිවිධ සංඛ්‍යාත ශ්‍රෙෂ්ඨවචනයෙහි, 'මා දන්නා සියල්ල තෝ දනිහි' යැ යි ගුරුහු විසින් අනුදන්නා ලද, 'ඔබ *දන්නා සියල්ල මම් දනිමැ*'යි තමා විසින් කරන ලද ප්‍රතිඥා ඇති අම්බට්ඨ නම් මාණවකයෙක් අතැවැසි වෙයි.

4. අථ ඛො බ්‍රාහ්මණො පොක්ඛරසාති අම්බට්ඨං මාණවං ආමන්තෙසි: "අයං තාත අම්බට්ඨ සමණො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො කොසලෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි ඉච්ඡානඞ්ගලං අනුප්පත්තො ඉච්ඡානඞ්ගලෙ විහරති ඉච්ඡානඞ්ගලවනසණ්ඩෙ.

තං ඛො පන භවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො: "ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො -පෙ- බ්‍රහ්මචරියං පකාසෙති, සාධු ඛො පන තථාරූපානං අරහතං දස්සනං හොතී"ති.

එහි ත්වං තාත අම්බට්ඨ යෙන සමණො ගොතමො තෙනුපසඞ්කම. උපසඞ්කමිත්වා සමණං ගොතමං ජානාහි යදි වා තං භවන්තං ගොතමං තථාසන්තංයෙව සද්දො අබ්භුග්ගතො, යදි වා නො තථා, යදි වා සො භවං ගොතමො තාදිසො, යදිවා න තාදිසො, තථා මයං තං භවන්තං ගොතමං වෙදිස්සාමාති.

5. "යථා කථං පනාහං නො තං භවන්තං ගොතමං ජානිස්සාමි යදි වා තං භවන්තං ගොතමං තථාසන්තංයෙව සද්දො අබ්භුග්ගතො, යදි වා නො තථා, යදි වා සො භවං ගොතමො තාදිසො යදි වා න තාදිසො"ති.

6. "ආගතානි ඛො තාත අම්බට්ඨ අම්හාකං මන්තෙසු ද්වත්තිංස-මහාපුරිසලක්ඛණානි යෙහි සමන්නාගතස්ස මහාපුරිසස්ස දෙව ගතියො භවන්ති අනඤ්ඤ: සචෙ අගාරං අජ්ඣාවසති රාජා හොති චක්කවත්ති ධම්මිකො ධම්මරාජා චාතුරන්තො විජිතාවී ජනපදත්ථ-රියපප්පත්තො සත්තරතනසමන්නාගතො. තස්සිමානි සත්තරතනානි භවන්ති. සෙය්‍යථිදං: චක්කරතනං හත්ථිරතනං අස්සරතනං මණිරතනං ඉත්ථිරතනං ගහපතිරතනං පරිනායකරතනමෙව සත්තමං. පරොසහස්සං ඛො පනස්ස පුත්තා භවන්ති සූරා වීරඞ්ගරූපා පරසෙනාපමද්දනා. සො ඉමං පඨවිං සාගරපරියන්තං අදණ්ඩෙන අසත්ථෙන ධම්මෙන අභිවිජිය අජ්ඣාවසති.

සචෙ ඛො පන අගාරස්මා අනගාරියං පබ්බජති අරහං හොති සම්මාසම්බුද්ධො ලොකෙ විවත්තචජ්දෙ[1]. අහං ඛො පන තාත අම්බට්ඨ මන්තානං දූතා ත්වං මන්තානං පටිග්ගහෙතා"ති.

---

1. විවිත්තචජ්දෙ. බො.ස.ස. විවටචජ්දෙ. ස්‍යා. විවටවජ්දෙ. මජ්ස.

4. ඉක්බිති පොක්ඛරසාති බමුණු තෙම අම්බට්ඨ මාණවකයා බණවා මෙ සේ කී ය: "දරුව අම්බට්ඨය, ශාක්‍යපුත්‍ර වූ ශාක්‍ය කුලයෙන් නික්මැ පැවිදි වූ මේ ශ්‍රමණ ගෞතමයන් වහන්සේ භික්ෂූන් පන්සියක් පමණ වූ මහ බික්සඟන හා කොසල් රටැ සැරි සරන සේක්, ඉචඡානංගලයට පැමිණියෝ එයට නොදුරු වූ ඉචඡානංගල වන ළැහැබෙහි වසන සේක.

"මෙසේ මෙසේ ඒ භාග්‍යවතුන් වහන්සේ අර්හත්හ,...සම්‍යක්-සම්බුද්ධයහ,...බ්‍රහ්මචර්‍යය ප්‍රකාශ කරන සේක. මෙබඳු රහතුන් දැක්ම හිත වැඩ ගෙනැ දෙන්නෙකැ"යි ඒ භවත් ගෞතමයන් වහන්සේගේ මෙසේ වූ කීර්තිශබ්දයෙක් උස් වැ නැංගේ වේ.

දරුව අම්බට්ඨය, එන්නැ. ශ්‍රමණ ගෞතමයන් වහන්සේ කරා එළැඹෙන්නැ. එළැඹැ, "ඒ භවත් ගෞතමයන් වහන්සේගේ එසේ විද්‍යමාන වූ ම ගුණ පිළිබඳ කීර්තිශබ්දයෙක් නැංගේ වේ ද.? නැත හොත් එසේ විද්‍යමාන නොවූ ගුණ පිළිබඳ හඬෙක් නැංගේ වේ ද? ඒ භවත් ගෞතමයන් වහන්සේ එබඳු ම ද? නැත හොත් එබඳු නො වෙත් ද?"යි ඒ ශ්‍රමණ ගෞතමයන් වහන්සේ දැනැ ගන්නැ. එසේ අපි ඒ භවත් ගෞතමයන් වහන්සේ දැන ගන්නමු" යනු යි.

5. "භවත, ඒ භවත් ගෞතමයන් වහන්සේගේ එසේ විද්‍යමාන වූ ගුණ පිළිබඳ කීර්තිශබ්දයෙක් නැංගේ වේ ද? නැත හොත් එසේ විද්‍යමාන නොවූ ගුණ පිළිබඳ හඬෙක් නැංගේ වේ ද? ඒ භවත් ගෞතමයන් වහන්සේ එබඳු ම ද? නැත හොත් එබඳු නො වෙත් ද?"යි මම කෙසේ නම් දැන ගත හෙන්නෙම් ද?"යි (අම්බට්ඨ මාණවකයා කී ය.)

6. "දරුව අම්බට්ඨය, යමෙකින් සමන්විත මහාපුරුෂයන්හට නිසැකා දෙකක් ම විනා එයින් අනෙකෙක් නැත් ද,- ඉදින් ගිහි ගෙහි වසන්නේ නම් දැහැමි වූ, දැහැමෙන් ම රජය ලත්, සිවු මුහුදු හිමි කොට ඇති සතර මහාද්වීපයෙන් සැදුණු මුළු පොළොවට අධිපති, පසමිතුරන් දිනූ, දනවුහි තහවුරු බවට පැමිණි, සත්රුවනින් සමන්විත සක්විති රජෙක් වන්නේ ද, සක්රුවන ය, ඇත්රුවන ය, අස්රුවන ය, මිණිරුවන ය, ඉතිරිරුවන ය, ගැහැවිරුවන ය, සත්වන පිරිනාරුවන ය, යන මේ සත්රුවන් කෙනෙක් යම් ඒ රජුන් හට ඇත් ද, දහසකටත් වැඩි ශූර වූ (නොබාන සුලු), දෙව් කුමරුන් වැනි සිරුරු ඇති, සතුරු සෙන් මඩනට සමත් වූ පුත්‍රු ඇත් ද, යම් ඒ මහාපුරිස්ලකුණින් යුත් හේ සයුර හිමි කොටැති මේ පොළොව දංඩෙන් සැතින් වෙන් වැ (පන්සිල්) දහමෙන් වෙසසින් දිනා එයට අධිපති වැ වෙසේ ද;-

ඉදින් යම් මහාපුරිස්ලකුණු කෙනකුන්ගෙන් සමන්විත හේ ගිහි ගෙන් නික්මැ පැවිද්දට වදනේ නම් නැසූ පව් සෙවෙණි ඇති (නොහොත් ත්‍රිවගීයෙන් හා තුන් සෙවෙණියෙන් මිදුණු) අර්හත් සම්‍යක්සම්බුද්ධා-ත්තමයෙක් වන්නේ ද, දරුව අම්බට්ඨය, එසේ වූ දෙතිස් මහාපුරුෂ ලක්ෂණයෝ අපගේ වේදයහි ආවාහු ම ය. දරුව අම්බට්ඨය, මම විනාහි මන්ත්‍ර (වේද) දෙන (=උගන්වන) තැනැත්තෙම් වෙමි. තෝ මන්ත්‍ර පිළිගන්නා තැනැත්තෙහි" (යයි පොක්ඛරසාති තෙම කී ය.)

"එවං හො'ති ඛො අම්බට්ඨො මාණවො බ්‍රාහ්මණස්ස පොක්ඛරසාතිස්ස පටිස්සුත්වා උට්ඨායාසනා බ්‍රාහ්මණං පොක්ඛරසාතිං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා වළවාරථමාරුය්හ සම්බහුලෙහි මාණවෙහි[1] සද්ධිං යෙන ඉච්ඡානඞ්ගලවනසණ්ඩො තෙන පායාසි. යාවතිකා යානස්ස භූමි යානෙන ගන්ත්වා යානා පච්චොරොහිත්වා පත්තිකො'ව ආරාමං පාවිසි.

7. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ අබ්භොකාසෙ චඞ්කමන්ති. අථ ඛො අම්බට්ඨො මාණවො යෙන තෙ භික්ඛූ තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තෙ භික්ඛූ එතදවොච: "කහන්නු ඛො හො එතරහි සො භවං ගොතමො විහරති? තං හි මයං භවන්තං ගොතමං දස්සනාය ඉඛ්ඛූපසඞ්කන්තා"ති.

8. අථ ඛො තෙසං භික්ඛූනං එතදහොසි: "අයං ඛො අම්බට්ඨො-මාණවො අභිඤ්ඤාතකොලඤ්ඤෙ වෙව අභිඤ්ඤාතස්ස ච බ්‍රාහ්මණස්ස පොක්ඛරසාතිස්ස අන්තෙවාසී. අගරු ඛො පන භගවතො එවරූපෙහි කුලපුත්තෙහි සද්ධිං කථාසල්ලාපො හොතී"ති. තෙ අම්බට්ඨං මාණවං එතදවොචුං: "එසො අම්බට්ඨ විහාරො සංවුතද්වාරො. තෙන අප්පසද්දො උපසඞ්කමිත්වා අතරමාතො ආලින්දං පවිසිත්වා උක්කාසිත්වා අග්ගළං ආකොටෙහි. විවරිස්සති තෙ භගවා ද්වාරන්ති."

9. අථ ඛො අම්බට්ඨො මාණවො යෙන සො විහාරො සංවුතද්වාරො තෙන අප්පසද්දො උපසඞ්කමිත්වා අතරමාතො ආලින්දං පවිසිත්වා උක්කාසිත්වා අග්ගළං ආකොටෙසි. විවරි භගවා ද්වාරං. පාවිසි අම්බට්ඨො මාණවො. මාණවකා'පි පවිසිත්වා භගවතා සද්ධිං සමෙමාදිංසු. සමෙමාදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. අම්බට්ඨො පන මාණවො චඞ්කමනෙනා'පි නිසින්නෙන භගවතා කඤ්චි කඤ්චි කථං සාරාණීයං වීතිසාරෙති. සීතො'පි නිසින්නෙන භගවතා කඤ්චි කඤ්චි කථං සාරාණීයං වීතිසාරෙති.

10. අථ ඛො භගවා අම්බට්ඨං මාණවං එතදවොච: එවන්නු ඛො තෙ[2] අම්බට්ඨ බ්‍රාහ්මණෙහි වුද්ධෙහි මහල්ලකෙහි ආචරියපාචරියෙහි සද්ධිං කථාසල්ලාපො හොති යථයිදං වරං තිට්ඨං නිසින්නෙන මයා කඤ්චි කඤ්චි කථං සාරාණීයං වීතිසාරෙසී?"ති

"නොහිදං හො ගොතම. ගච්ඡන්තො වා හි හො ගොතම ගච්ඡන්තෙන බ්‍රාහ්මණො බ්‍රාහ්මණෙන සද්ධිං සල්ලපිතුමරහති. සීතො වා හි හො ගොතම සීතෙන බ්‍රාහ්මණො බ්‍රාහ්මණෙන සද්ධිං සල්ලපිතුමරහති. නිසින්නො වා හි හො ගොතම නිසින්නෙන බ්‍රාහ්මණො බ්‍රාහ්මණෙන සද්ධිං සල්ලපිතුමරහති. සයානො වා හි හො ගොතම සයානෙන බ්‍රාහ්මණො බ්‍රාහ්මණෙන සද්ධිං සල්ලපිතුමරහති. යෙ ච ඛො තෙ හො ගොතම මුණ්ඩකා සමණකා ඉබ්භා කණ්හා[2] බන්ධුපාදාපච්චා, තෙහිපි මෙ සද්ධිං එවං කථාසල්ලාපො හොති යථරිව භොතා ගොතමෙනා"ති.

---

1. මාණවකෙහි, කත්ථචි. 2. කිණ්හා, මජ්ඣං.

"පින්වත්නි, (යම්සේ තෙපි කියවූ තම්) එසේ කරන්නෙමි"යි අම්බට්ඨ මාණවකයා පොක්ඛරසාති බමුණාට පිළිවදන් දී, හුනස්නෙන් නැගී සිටැ, ඔහු සකසා වැඳ පැදකුණු කොට වෙළෙඹුන් යෙදූ රියක් නැඟ බොහෝ මාණවකයන් හා ඉච්ඡානංගල වනළැහැබ බලා නික්මුණේ ය. යානයට බිම යම් පමණෙක් ද එතෙක් (යානයෙන් යැ හැකි තාක්) යානයෙන් ගොස් එයින් බැස පාගමන් ඇතියේ ම (පයින් ම) ආරාමයට පිවිසියේ ය.

7. එසමයෙහි බොහෝ භික්ෂූහු එළිමහනෙහි සක්මන් කෙරෙත්. ඉක්බිති අම්බට්ඨ මාණවක තෙමේ ඒ භික්ෂූන් කරා එළැඹියේ ය. එළැඹැ ඒ භික්ෂූන් ගෙන් 'භවත්නි, ඒ භවත් ගෞතමයෝ දැන් කොහි වසන්නෝ ද? අපි වූ කලි ඒ භවද් ගෞතමයන් දක්නා පිණිස මෙහි එළැඹියමිහ"යි මෙය කී ය.

8. එකල්හි ඒ භික්ෂූන්හට "මේ අම්බට්ඨ මාණවකයා වූ කලි ප්‍රකට කුලයෙක උපන්නෙක් ද ප්‍රසිද්ධ පොක්ඛරසාති බමුණාගේ අතැවැස්සෙක් ද වේ. මෙබඳු කුලපුතුන් හා කතාබස් කිරීම භාග්‍යවතුන් වහන්සේට බරෙක් තම් නො වේ ම යැ යි මේ සිත විය. ඔහු අම්බට්ඨ මාණවකයාට "අම්බට්ඨය, මේ වැසු දොර ඇතියේ විහාරය යි. නිශ්ශබ්ද වැ එතැනට ගොස්, සෙමෙන් පිලට පිවිස කාරා අගුල ළඟට තිය-පිටින් ගසව. (එවිට) භාග්‍යවතුන් වහන්සේ දොර හරනා සේකැ"යි කීහ.

9. එවිටැ අම්බට්ඨ මාණවක තෙම වැසූ දොර ඇති ඒ වෙහෙරට නිහඬ වැ එළැඹ සෙමෙන් ගඳකිළි පිලට වැද කාරා අගුල සමීපයට තිය පිටින් ගැසී ය. (එවිට) භාග්‍යවතුන් වහන්සේ දොර හළ සේක. අම්බට්ඨ මාණවක තෙමේ (විහාරයට) පිවිසියේ ය. මාණවකයෝ ද පිවිසැ භාග්‍යවතුන් වහන්සේ හා සතුටු වූහ. සතුටට කරුණු වූ සිහි කරනුවට (සිතැරදවනුවට) නිසි වූ කතා බස් අවසන් කොට, එක් පසෙක හිඳැ ගත්හ. අම්බට්ඨ මාණවකයා වූ කලි තෙමේ සක්මන් කෙරෙමිනුත් වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ හා යම් යම් කිසි සාරණීය කථා කෙරෙයි, සිටැ ගෙනත් වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ හා යම් යම් සාරණීය කථා කෙරෙයි.

10 එකලැ භාග්‍යවතුන් වහන්සේ අම්බට්ඨ මාණවකයා බණවා, "අම්බට්ඨය, යම්සේ යමිනුත් සිටිමිනුත් තෝ හුන් මා හා කිසි යම් සාරණීය කථා කෙරෙහි නම් තගේ ආචාරී ප්‍රාචාරී වූ, වයසින් වැඩි සිටි, මහලු බමුණන් හාත් එපරිද්දෙන් ම තගේ කතා බස් කිරීම වේ දැ?"යි ඇසූ සේක.

(එවිටැ අම්බට්ඨ මාණවක තෙම) "භවද් ගෞතමය, එසේ නොවේ ම ය. යන බමුණහු යන බමුණක්හු හා ම කතා කරනු වටී. සිටි බමණහු සිටිනා බමුණක්හු හා ම හෝ කතා කරනු වටී. හුන් බමුණා හුන් බමුණකු හා ම කතා කරනු හෝ වටී. හෝනා බමුණහු හෝනා බමුණකු හා ම කතා කරනු හෝ වටී. එහෙත් භවද් ගෞතමය, ගැහැවි වූ, කළු වත් වූ, බඹහු පතුලෙන් උපන් යම් මුඛ මහණ කෙනෙක් වෙත් නම්, ඔවුන් හාත් මගේ කථාසංලාපය භවත් ගෞතමයා හා කතා කරන පරිද්දෙන් ම වේ" (යැ යි කී ය.)

11. "අත්ථිකත්තා ඛො පන තෙ අම්බට්ඨ ඉධාගමනං අහොසි. යාදිසෙව ඛො පනත්ථාය ආගච්ඡෙය්‍යාදිසො තදෙව අත්ථං සාධුකං මනසි කරෙය්‍යාථො[1]. අවුසිතවා යෙව ඛො පන හො අයං අම්බට්ඨො මාණවො, වුසිතමානී[2] කිමඤ්ඤත්‍ර අවුසිතත්තා"ති.

12. අථ ඛො අම්බට්ඨො මාණවො භගවතා අවුසිතවාදෙන වුච්චමානො කුපිතො අතත්තමනො භගවන්තංයෙව ඛුංසෙන්තො භගවන්තංයෙව වම්භෙන්තො භගවන්තංයෙව උපවදමානො සමණො ච මෙ හො ගොතමො පාපිතො භවිස්සතීති භගවන්තං එතදවොච: "වණ්ණා හො ගොතම සක්‍යජාති, ඵරුසා හො ගොතම සක්‍යජාති, ලහුසා හො ගොතම සක්‍යජාති, රහසා හො ගොතම සක්‍යජාති. ඉබ්භා සන්තො ඉබ්භා සමානා න බ්‍රාහ්මණෙ සක්කරොන්ති න බ්‍රාහ්මණෙ ගරුකරොන්ති න බ්‍රාහ්මණෙ මානෙන්ති න බ්‍රාහ්මණෙ පූජෙන්ති න බ්‍රාහ්මණෙ අපචායන්ති. තදිදං හො ගොතම නච්ඡන්නං තදිදං නප්පටිරූපං යදිමෙ සක්‍යා ඉබ්භා සන්තා ඉබ්භා සමානා න බ්‍රාහ්මණෙ සක්කරොන්ති න බ්‍රාහ්මණෙ ගරු කරොන්ති න බ්‍රාහ්මණෙ මානෙන්ති න බ්‍රාහ්මණෙ පූජෙන්ති න බ්‍රාහ්මණෙ අපචායන්තීති.

ඉතිහ අම්බට්ඨො මාණවො ඉදං පඨමං සක්‍යෙසු ඉබ්භවාදං නිපාතෙසි.

13. "කිමපන තෙ අම්බට්ඨ සක්‍යා අපරද්ධන්ති?"

"එක මිදාහං හො ගොතම සමයං ආචරියස්ස බ්‍රාහ්මණස්ස පොක්ඛර-සාතිස්ස කෙනචිදෙව කරණීයෙන කපිලවත්ථුං අගමාසිං. යෙන සක්‍යානං සන්ථාගාරං තෙනුපසඞ්කමිං. තෙන ඛො පන සමයෙන සම්බහුලා සක්‍යා වෙව සක්‍යකුමාරා ච සන්ථාගාරෙ උච්චෙසු ආසනෙසු නිසින්නා හොන්ති අඤ්ඤ-මඤ්ඤං අඞ්ගුලිපතොදකෙහි සඤ්ඤාන්තා සංකිලන්තා අඤ්ඤදත්ථු මමඤ්ඤෙව මඤ්ඤෙ අනුජ්ඣාන්තා. න මං කොචි ආසනෙන'පි නිමන්තෙසි. තදිදං හො ගොතම නච්ඡන්නං, තදිදං නප්පටිරූපං, යදිමෙ සක්‍යා ඉබ්භා සන්තා ඉබ්භා සාමානා න බ්‍රාහ්මණෙ සක්කරොන්ති න බ්‍රාහ්මණෙ ගරුකරොන්ති න බ්‍රාහ්මණෙ මානෙන්ති න බ්‍රාහ්මණෙ පූජෙන්ති න බ්‍රාහ්මණෙ අපචායන්ති"ති.

---

1. කරෙය්‍යාථ, සීමු. II 2. වාසිතවාමානී, සීමු. II.

11. (එවිටැ භාග්‍යවතුන් වහන්සේ,) "අම්බට්ඨය, පැමිණ කළ යුතු වැඩක් සඳහා ම තමේ මෙහි පැමිණීම විය. යම් කරුණක් සඳහා ආයෙහි තම් ඒ කරුණ ම මැනැවින් මෙනෙහි කරව. හවත්නි, මේ අම්බට්ඨ මාණවක තෙමේ ඇදුරු කුලයෙහි නො භික්ෂුණේ අල්පශ්‍රැත වූයේ, 'භික්ෂුණෙමි'යි බහුශ්‍රැතයෙමි'යි යන මාන ඇත්තේ වෙයි. මොහු මේ පරෝස් බස් දෙඛනුයේ ඇදුරු කුලයෙහි නොභික්ෂුණු අල්පශ්‍රැතබැවින් ම විනා අන් කරුණෙකින් නො වේ" (යැ යි වදාළ සේක.)

12. එකල්හි අම්බට්ඨ මාණවක තෙමේ භාග්‍යවතුන් වහන්සේ විසින් අවුසිතවාදයෙන් (නොභික්ෂුණෙක, නොඋගතෙක යන කථායෙන්) කියනු ලබනුයේ, කිපුණේ, නොසතුටු සිතැත්තේ භාග්‍යවතුන් වහන්සේට ම ආක්‍රෝශ කරනුයේ, භාග්‍යවතුන් වහන්සේට ම ගර්හා කරනුයේ, භාග්‍යවතුන් වහන්සේට ම දොස් නගනුයේ, ශ්‍රමණ ගෞතම තෙමේත් වණ්ඩභාවාදි දෝෂයට මා විසින් පමුණුවන ලද්දේ වන්නේ යැ යි සිතා, "භවද් ගෞතමය, ශාක්‍යජාතිය වණ්ඩ ය, භවද් ගෞතමය, ශාක්‍යජාතිය පරුෂ ය. භවද්ගෞතමය, ශාක්‍යජාතිය හැල්ලු ය (වහා පෙරැලෙන සුලු ය). ශාක්‍ය ජාතිය දෙඩමලු ය. තුමූ (බමුණනට මෙහෙකරු විය යුතු) ගෘහපතියෝ ම වන්නෝ නුමුදු බමුණනට සත්කාර නො කෙරෙත්. බමුණනට ගෞරව නො කෙරෙත්. බමුණනට බහුමන් නො කෙරෙත්. බමුණන් නො පුදත්. බමුණනට යටත් පැවැතුම් නො දක්වත්. භවද් ගෞතමය, මේ ශාක්‍යයෝ බමුණනට (මෙහෙකරු වියැ යුතු) ගෘහපතියෝ වන්නෝ ම බමුණනට සත්කාර නො කෙරෙත් ය, බමුණනට ගෞරව නො කෙරෙත් ය, බමුණනට බහුමන් නො කෙරෙත් ය, බමුණන් නො පුදත් ය, බමුණනට යටත් පැවැතුම් නො දක්වත් ය යන යමක් ඇද්ද, ඒ මේ කරුණ නො සුදුසු ය, ඒ මේ කරුණ නො නිසි යැ"යි භාග්‍යවතුන් වහන්සේට මෙබස් කී ය.

මෙසේ අම්බට්ඨ මාණවක තෙමේ ශාක්‍යයන් කෙරෙහි මේ පළමු වන ඉබ්භවාදය (බමුණන් ගේ දාසයෝ ය යන නිග්‍රහ කථාව) හෙළී ය.

13. එ විට භාග්‍යවතුන් වහන්සේ, 'කිමෙක් ද අම්බට්ඨය, ශාක්‍යයෝ තට කිසි වරදක් කළෝ දැ?'යි වදාළ සේක.

"එ සේ ය, භවද් ගෞතම ය, මම එක් කලෙක මා ඇදුරු පොක්ඛරසාති බමුණාණන්ගේ කිසි කටයුත්තෙකින් කිඹුල්වත් නුවරට ගියෙමි. එහි ශාක්‍යයන්ගේ සන්ථාගාරය කරා එළැඹුණෙමි. එසමයෙහි වූ කලි බොහෝ ශාක්‍යයෝත් ශාක්‍යකුමාරයෝත් උනුනට ඇඟිලිවලින් කෙවිටි කරමින් මහත් කොට සිනහ සෙමින්, ඇඟිලි එකට ගැටීම ආදීන් කෙළි කවට කම් පාමින්, ඒකාන්තයෙන් මට ම සිනා සෙන්නාක් මෙන් කෙරෙමින් සන්ථාගාරයෙහි උස් අසුන්හි හුන්නෝ වෙත්. කිසිවෙක් මට අස්තෙකින් නිමැතුම් පමණකුත් නො කෙළේ ය. භවද් ගෞතමය, මේ ශාක්‍යයෝ තුමූ ඉබ්භ (බමුණනට දාස වූ ගෘහපතියෝ) වන්නෝ ම, බමුණනට සත්කාර ගරුකාර බහුමාන පූජා අපචායන (යටත් පැවැතුම්) නො කරත්නාහ යන මෙය නො සුදුසු ය, නො නිසි යැ"යි අම්බට්ඨ තෙමේ පැවැසී ය.

ඉතිහ අම්බට්ඨො මාණවො ඉදං දුතියං සක්කෙසු ඉබ්භවාදං නිපාතෙසි.

14. "ලටුකිකාපි ඛො අම්බට්ඨ සකුණිකා සකෙ කුලාවකෙ කාමලාපිනී හොති. සකං ඛො පනෙතං අම්බට්ඨ සක්‍යානං යදිදං කපිලවත්ථු. න අරහතායයමා අම්බට්ඨො ඉමාය අපමත්තතාය අභිසජ්ජිතුන්ති."

15. "චත්තාරො'මෙ භො ගොතම වණ්ණා: ඛත්තියා බ්‍රාහ්මණා වෙස්සා සුද්දා. ඉමෙසං හි භො ගොතම චතුන්නං වණ්ණානං තයො වණ්ණා ඛත්තියා ච වෙස්සා ච සුද්දා ච අඤ්ඤදත්ථු බ්‍රාහ්මණස්සෙව පරිචාරිකා සම්පජ්ජන්ති. තයිදං භො ගොතම නවජ්ජනං තයිදං නපපටිරූපං යදි මෙ සක්‍යා ඉබ්භා සත්තා ඉබ්භා සමානා න බ්‍රාහ්මණෙ සක්කරොන්ති න බ්‍රාහ්මණෙ ගරුකරොන්ති න බ්‍රාහ්මණෙ මානෙන්ති න බ්‍රාහ්මණෙ පූජෙන්ති න බ්‍රාහ්මණෙ අපචායන්ති" ති.

ඉතිහ අම්බට්ඨො මාණවො ඉදං තතියං සක්කෙසු ඉබ්භවාදං නිපාතෙසි.

16. අථ ඛො භගවතො එතදහොසි: අතිබාලො ඛො අයං අම්බට්ඨො මාණවො සක්කෙසු ඉබ්භවාදෙන නිම්මානෙති[1]. යන්නූනාහං ගොත්තං පුච්ඡෙය්‍යන්ති.

අථ ඛො භගවා අම්බට්ඨං මාණවං එතදවොච: 'කථං ගොත්තොසි අම්බට්ඨා?ති' ''කණ්හායනො'හමස්මි භො ගොතමා''ති.

17. "පොරාණං ඛො පන තෙ අම්බට්ඨ මන්තාපෙත්තිකං නාමගොත්තං අනුස්සරතො අය්‍යපුත්තා සක්‍යා භවන්ති, දාසිපුත්තො ත්වමසි සක්‍යානං. සක්‍යා ඛො පන අම්බට්ඨ රාජානං ඔක්කාකං පිතාමහං දහන්ති.

"භූතපුබ්බං අම්බට්ඨ රාජා ඔක්කාකො යා සා මහෙසී පියා මනාපා තස්සා පුත්තස්ස රජ්ජං පරිණාමෙතුකාමො ජෙට්ඨකුමාරෙ රට්ඨසමා පබ්බාජෙසි උක්කාමුඛං[2] කරකණ්ඩං[3] හත්ථිනිකං නිපුරං[4]. තෙ රට්ඨසමා පබ්බාජිතා හිමවන්තපස්සෙ පොක්ඛරණියා තීරෙ මහාසාකසණ්ඩො තත්ථ වාසං කප්පෙත්වා. තෙ ජාතිසම්භෙදභයා සකාහි භගිනීහි සද්ධිං සංවාසං කප්පෙත්වා

1 .නිම්මොදෙති, කත්ථචි. 2. එකාමුඛ, කත්ථචි. 3. කරකණ්ඩු, කත්ථචි.
4. සිනිපුරු ඛො.ස ස. සිනිපුරු, PTS.

මෙසේ අම්බට්ඨ මාණවක තෙමේ ශාක්‍යයන් කෙරෙහි මේ දෙවෙනි උපවාදය හෙළී ය.

14. එ විට භාග්‍යවතුන් වහන්සේ වදාරන සේක්, "අම්බට්ඨය, කැටකිරිල්ල පවා තමා ගේ කැදැල්ලෙහි දී කැමැති සේ හඬතැලූ වේ. අම්බට්ඨය, කිඹුල්වත් පුරය යන යමක් ඇද්ද, මේය ශාක්‍යයන් සතු සඟනගරය යි. එබැවින් ආයුෂ්මත් අම්බට්ඨ තෙමේ මේ සුවල්ප මාත්‍රා-යෙහි වෛර බඳින්නට නො වටී" යැ යි වදාළ සේක.

15. එකලැ අම්බට්ඨ තෙමේ යළි දැ ශාක්‍යයනට දොස් නගනුගේ, "භවදී ගෞතමය, ක්ෂත්‍රිය බ්‍රාහ්මණ වෛශ්‍ය ශූද්‍ර යැ යි මේ වර්ණ (කුල) සතරෙකි. භවදී ගෞතමය, මේ සතර වර්ණයන් අතුරෙන් ක්ෂත්‍රිය ද වෛශ්‍ය ද ශූද්‍ර ද යන තුන් කුලයෝ ඒකාන්තයෙන් බ්‍රාහ්මණයාගේ ම මෙහෙකරු වෙත්. (එබැවින්) භවත් ගෞතමය, මේ ශාක්‍යයෝ බමුණනට මෙහෙකරු වූ ගැහැවියෝ වන්නෝ ම, බමුණනට සත්කාර ගරුකාර බහුමාන පූජන අපචායන (=යටත් පැවැත්ම) නො කෙරෙත් යන මෙය නොසුදුසු ම ය, නොතිසි ම යැ" යි කී ය.

මෙසේ අම්බට්ඨ මාණවක තෙම ශාක්‍යයන් කෙරෙහි මේ තෙවෙනි ඉබ්භවාදය (=බමුණන්ගේ මෙහෙකරු ගැහැවියෝ ය යන ගැරහීම) හෙළී ය.

16. එවිට "මේ අම්බට්ඨ මාණවක තෙමේ ඉතා දැඩි ලෙස ශාක්‍යයන් කෙරෙහි ඉබ්භවාදයෙන් පිරිහෙළා කථා කෙරෙහි. මා ඔහු අතින් ගෝත්‍රය විචාළොත් යෙහෙකැ"යි භාග්‍යවතුන් වහන්සේට මේ සිත විය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අම්බට්ඨ මාණවකයා අමතා, "අම්බට්ඨය, තෝ කවර ගොත් ඇත්තෙහි දැ?"යි විචාළ සේක.

"භවද්ගෞතමය, මම කෘෂ්ණායනයෙක් (-කෘෂ්ණ නම් ඍෂිහුගේ පෙළපතට අයත්තෙක්) වෙමි"යි අම්බට්ඨ තෙමේ (තෙ වරක් උස් හඬින්) කී ය.

17. (එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක): "අම්බට්ඨය, ඉකුත් කාලයට අයත් සිය මා පියන් අයත් නම්ගොත් සිහි කරන තාගේ සවාමිපුත්‍රයෝ ශාක්‍යයෝ වෙති. තෝ ශාක්‍යයන්ගේ ඍෂියක ගේ පුත්‍ර (පරම්පරාවට අයත්) වෙහි ය. (එබැවින් දාස වූ තා සවකීය සවාමි වූ ශාක්‍යයන් කරා නො එළැඹෙන්නහු දැක ශාක්‍යයෝ එදා සිනාසුනහ.) අම්බට්ඨය, ශාක්‍යයෝ වනාහි ඔක්කාක (=ඉක්ෂ්වාකු) රජහු තමන් මිඹුන්තණුවන් (=පූජිපුරුෂයාණන්) කොට තබත් (=පූජිපුරුෂයා යි කියත්).

"අම්බට්ඨය, තව පෙරැ වූවක් කියමි, (අතීතයෙහි) ඔක්කාක රජ තෙමේ තමහට ප්‍රිය වූ මනාප වූ යම් මෙහෙසියක් වූ නම්, ඇයගේ පුතුට රජය පිරිතමනු කැමැත්තේ උක්කාමුඛ කරණ්ඩ හත්ථනික නිපුර යන දෙවු කුමරුන් රටින් පිටත් කෙළේ ය. රටින් පිටත් කරණ ලැබූ ඔහු - හිමවත් පෙදෙසැ පොකුණක් අද්දරැ මහ ශාක ගස් ඇති වනයෙක් විය. - එහි වාසය කළහ. ඔහු ජාතිසම්භේදයට (අත්‍යකුල හා මිශ්‍ර වැ කිලිටි වීමට) බියෙන් සිය භගිනියත් හා එක් වැ වූහුහ.

අථ ඛො අම්බට්ඨ රාජා ඔක්කාකො අමච්චෙ පාරිසජ්ජෙ ආමන්තෙසි: "කහන්නු ඛො භො එතරහි කුමාරා සම්මන්තීති"?

"අත්ථි දෙව හිමවන්තපස්සෙ පොක්ඛරණියා තීරෙ මහාසාකසණ්ඩං තත්ථෙතරහි කුමාරා සම්මන්ති. තෙ ජාතිසම්භෙදභයා සක්‍යානි භගිනීහි සද්ධිං සංවාසං කප්පෙන්ති"ති.

අථ ඛො අම්බට්ඨ රාජා ඔක්කාකො උදානං උදානෙසි: "සක්‍යා වත භො කුමාරා පරමසක්‍යා වත භො කුමාරා"ති. තදග්ගෙ ඛො පන අම්බට්ඨ සක්‍යා පඤ්ඤායන්ති. සො'ව[1] තෙසං පුබ්බපුරිසො.

රඤ්ඤො ච ඛො පන අම්බට්ඨ ඔක්කාකස්ස දිසා නාම ඉසි අහොසි. සා කණ්හා[2] නාම ජාතෙසි. ජාතො කණ්හා පබ්‍යාහාසි: "ඩෙංවථ මං අම්ම, නහාපෙථ මං අම්ම, ඉමස්මා මං අම්ම අසුචිස්මා පරිමොචෙථ, අත්ථාය වො භවිස්සාමි"ති.

යථා ඛො පන අම්බට්ඨ එතරහි මනුස්සා පිසාචෙ දිස්වා 'පිසාචො'ති සඤ්ජානන්ති. එවමෙව ඛො අම්බට්ඨ තෙන සමයෙන මනුස්සා පිසාචෙ 'කණ්හා'ති සඤ්ජානන්ති. තෙ එවමාහංසු: අයං ජාතො පබ්‍යාහාසි: 'කණ්හා ජාතො පිසාචො ජාතො'ති.

තදග්ගෙ ඛො පන අම්බට්ඨ කණ්හායනා පඤ්ඤායන්ති. සො ච කණ්හායනානං පුබ්බපුරිසො. ඉති ඛො තෙ අම්බට්ඨ පොරාණං මාතා-පෙත්තිකං නාමගොත්තං අනුස්සරතො අය්‍යපුත්තා සක්‍යා භවන්ති. ඉසිපුත්තො ච්ඡමි සක්‍යානන්ති.

18. එවං වුත්තෙ තෙ මාණවකා භගවන්තං එතදවොචුං: "මා භවං ගොතමො අම්බට්ඨං මාණවං අතිබාළ්හං ඉසිපුත්තවාදෙන නිම්මානෙසි. සුජාතො ච භො ගොතම අම්බට්ඨො මාණවො කුලපුත්තො ච අම්බට්ඨො මාණවො බහුස්සුතො ච අම්බට්ඨො මාණවො කල්‍යාණවාක්කරණො ච අම්බට්ඨො මාණවො පණ්ඩිතො ච අම්බට්ඨො මාණවො. පහොති ච අම්බට්ඨො මාණවො භොතා ගොතමෙන සද්ධිං අස්මිං වචනෙ පටිමානෙතු"නති.

---

1. සොව. සීහ. I. 2. කණ්හ. සීහ. II.

"අම්බට්ඨය, ඉක්ඛ්වාකු රජ තෙම මැතිමඩුල්ලට අයත් ඇමැතියන් අමතා "භවන්තු, කුමරුවෝ දැන් කොහි වෙසෙත් ද ?"යි විචාළේ ය.

"දේවයිනි, හිමවත පැත්තෙහි පොකුණු තෙරෙක මහා ශාක වනයෙක් ඇත. එහි කුමරුවෝ වෙසෙති. ඔහු ජාතිසම්මිශ්‍රණයෙන් වූ බියෙන් සිය බිහිනියන් හා එක් වැ වෙසෙත් යැ" යි ඇමැතියෝ කීහ.

"අම්බට්ඨය, එවිටැ ඔක්කාක රජ 'භවන්තු, පුදුම යි. කුමරුවෝ ශක්‍යයෝ ය (සමත්තු ය)! කුමරුවෝ පරම ශක්‍යයෝ යැ (මහත් ම සමත්තු යැ)!"යි උදන් ඇති ය. අම්බට්ඨය, එතැන් පටන් ඔහු 'ශක්‍යයෝ' යි ('ශාක්‍යයෝ' යි) පැනෙත්. ඒ ඔක්කාක රජ ම ඔවුන්ගේ පූර්ව පුරුෂ විය.

"අම්බට්ඨය, තව ද ඔක්කාක රජහුගේ දිශා නම් දාසියක් වූ ය. ඕ කෘෂ්ණ නමැත්තහු වැදූ ය. (එසේ උපන් කෘෂ්ණ තෙමේ යකෙක් උපතැ යි බියෙන් දිවැගොස් දෙර වසා ගෙන සිටි මවට) 'මැණියනි, මා නාවත්න; මැණියනි, මේ අපවිත්‍ර දැයින් මා මුදත්න; ඔබට මම යහපත පිණිස වත්නෙමි'යි කැ ගැසී ය.

"අම්බට්ඨය, මෙ කලැ මිනිස්සු පිශාචයන් දැක 'පිශාචයෝ'යි යම්සේ හඳුනත් ද, අම්බට්ඨය, එසේ ම එසමයෙහි මිනිස්සු පිශාචයන් කළු-පැහැත්තෝ යැ යි හඳුනත්. ඔහු 'මේ තෙම උපන්නේ (=උපන් කෙණෙහි) කථා කෙළේ ය. කෘෂ්ණයෙක් (=කළුවෙක්) උපන, පිශාචයෙක් උපතැ'යි මෙසේ කීහ.

"අම්බට්ඨය, එතැන් පටන් කෘෂ්ණායනයෝ (=කෘෂ්ණ පරම්පරාවට අයත් වූවෝ යැ යි ඔහු පරපුරෙහි වූවෝ) පැනෙත්. හේ ද කෘෂ්ණ-යනයන්ගේ පූර්ව පුරුෂයා ය. අම්බට්ඨය, මෙසේ ම ශාක්‍යයෝ මාපිය පරපුරට අයත් අතීත නම් ගොත් සිඟි කරන තාගේ සවාමිපුත්‍රයෝ ය, තෝ ශාක්‍යයන්ගේ දාසීපුත්‍රයෙකැ" යි යනු යි.

18. මෙසේ වදාළ කල්හි ඒ මාණවකයෝ කියන්නෝ "භවත්-ගෞතම තෙමේ ඉතා දැඩි ලෙස දාසීපුත්‍රවාදයෙන් අම්බට්ඨ මාණවකයා නො පිරිහෙළා වා. භවද් ගෞතමයිනි, අම්බට්ඨ මාණවක තෙමේ සුජාත ද වේ. අම්බට්ඨ මාණවක තෙම කුලපුත්‍ර (මනා කුලයෙහි උපන්නෙක්) ද වේ. අම්බට්ඨ මාණවක තෙම බහුශ්‍රැත ද වේ. අම්බට්ඨ මාණවක තෙමේ මිහිරි වචන ඇත්තේ ද වේ. අම්බට්ඨ මාණවක තෙමේ පණ්ඩිත ද වේ. අම්බට්ඨ මාණවක තෙමේ මේ වචනයෙහි (=මේ වේදත්‍රය පිළිබඳ කථායෙහි හෝ මේ දාසිපුත්‍ර කථායෙහි) භවද් ගෞතමයන් හා ප්‍රතිමන්ත්‍රණය කරන්නට (=මෙහි ලා උත්තර දෙන්නට) පොහොසත් ද වේ" යැ යි භාග්‍යවතුන් වහන්සේට කීහ.

19. අථ ඛො භගවා තෙ මාණවකෙ එතදවොච: "සචෙ ඛො තුම්හාකං මාණවකා එවං හොති 'දුජ්ජාතො ච අම්බට්ඨො මාණවො, අකුලපුත්තො ච අම්බට්ඨො මාණවො, අපස්සුතො ච අම්බට්ඨො මාණවො, අකල්‍යාණවාක්කරණො ච අම්බට්ඨො මාණවො, දුප්පඤ්ඤො ච අම්බට්ඨො මාණවො, න ච පහොති අම්බට්ඨො මාණවො සමණෙන ගොතමෙන සද්ධිං අස්සිං වචනෙ පටිමන්තෙතුන්ති, තිට්ඨතු අම්බට්ඨො මාණවො, තුම්හෙ මයා සද්ධිං මන්තයවෙහා[1] අස්සිං වචනෙ. සචෙ පන තුම්හාකං මාණවකා එවං හොති: සුජාතො ච අම්බට්ඨො මාණවො, කුලපුත්තො ච අම්බට්ඨො මාණවො, බහුස්සුතො ච අම්බට්ඨො මාණවො, කල්‍යාණවාක්කරණො ච අම්බට්ඨො මාණවො, පණ්ඩිතො ච අම්බට්ඨො මාණවො, පහොති ච අම්බට්ඨො මාණවො සමණෙන ගොතමෙන සද්ධිං අස්සිං වචනෙ පටිමන්තෙතුන්ති, තිට්ඨථ තුම්හෙ, අම්බට්ඨො මාණවො මයා සද්ධිං පටිමන්තෙතූ"ති.

20. "සුජාතො ච හො ගොතම අම්බට්ඨො මාණවො, කුලපුත්තො ච අම්බට්ඨො මාණවො, බහුස්සුතො ච අම්බට්ඨො මාණවො, කල්‍යාණ-වාක්කරණො ච අම්බට්ඨො මාණවො, පණ්ඩිතො ච අම්බට්ඨො මාණවො, පහොති ච අම්බට්ඨො මාණවො භොතා ගොතමෙන සද්ධිං අස්සිං වචනෙ පටිමන්තෙතුං. තුණ්හී මයං භවිස්සාම. අම්බට්ඨො මාණවො භොතා ගොතමෙන සද්ධිං අස්සිං වචනෙ පටිමන්තෙතූ"ති.

21. අථ ඛො භගවා අම්බට්ඨං මාණවං එතදවොච: අයං ඛො පන තෙ අම්බට්ඨ සහධම්මිකො පඤ්හං ආගච්ඡති. අකාමාපි ව්‍යාකාතබ්බා. සචෙ ඛො න ව්‍යාකරිස්සසි අඤ්ඤෙන වා අඤ්ඤං පටිචරිස්සසි, තුණ්හී වා භවිස්සසි, පක්කමිස්සසි වා, එත්ථෙව තෙ සත්තධා මුද්ධා ඵලිස්සති. තං කිං මඤ්ඤසි අම්බට්ඨ ? කින්නු තෙ සුතං බ්‍රාහ්මණානං වුද්ධානං මහල්ලකානං ආචරියපාචරියානං කුතොපනුතිකා කණ්හායනා ? කො ච කණ්හායනානං පුබ්බපුරිසො ?ති

එවං වුත්තෙ අම්බට්ඨො මාණවො තුණ්හී අහොසි. දුතියම්පි ඛො භගවා අම්බට්ඨං මාණවං එතදවොච: තං කිම්මඤ්ඤසි අම්බට්ඨ ? කින්නු තෙ සුතං බ්‍රාහ්මණානං වුද්ධානං මහල්ලකානං-පෙ-කො ච කණ්හායනානං පුබ්බපුරිසො?ති දුතියම්පි ඛො අම්බට්ඨො මාණවො තුණ්හී අහොසි.

අථ ඛො භගවා අම්බට්ඨං මාණවං එතදවොච: ව්‍යාකරොහි 'දානි අම්බට්ඨ, න 'දානි තෙ තුණ්හීභාවස්ස කාලො. යො ඛො අම්බට්ඨ තථාගතෙන යාවතතියකං සහධම්මිකා පඤ්හා පුට්ඨා න ව්‍යාකරොති එත්ථෙවස්ස සත්තධා මුද්ධා ඵලිස්සති.

---

1. මන්තයෙහ. මජ්ඣං.

19. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ ඒ මාණවකයන් අමතා, "මාණවකයෙනි, අම්බට්ඨ මාණවකයා ප්‍රජාත ද වේ. අම්බට්ඨ මාණවකයා කුලපුත්‍ර ද වේ. අම්බට්ඨ මාණවකයා අල්පශ්‍රැත ද වේ. අම්බට්ඨ මාණවකයා තොමිහිරි වචන ඇත්තේ ද වේ. අම්බට්ඨ මාණවකයා අපණ්ඩිත ද වේ. ශ්‍රමණ ගෞතමයා හා මේ වචනයෙහි සාකච්ඡා කරන්නට පොහොසත් ද නො වේ යැ යි ඉදින් තොපට මෙසේ සිතෙක් වේ නම්, අම්බට්ඨ මාණවකයා සිටි වා. තෙපි මා හා මේ වචනයෙහි සාකච්ඡා කරවු. ඉදින් මාණවකයිනි, අම්බට්ඨ මාණවකයා ප්‍රජාත ද...කුලපුත්‍ර ද...බහුශ්‍රැත ද...මිහිරි වචන ඇත්තේ ද..පණ්ඩිත ද වේ. ශ්‍රමණ ගෞතමයා හා මේ වචනයෙහි සාකච්ඡා කරන්නට පොහොසත් ද වේ යැ යි තොපට මෙසේ සිතෙක් වේ නම්, තෙපි සිටිවු. අම්බට්ඨ මාණවක තෙමේ මා හා සාකච්ඡා කෙරේ වා"යි වදාළ සේක.

20. "භවද් ගෞතමය, අම්බට්ඨ මාණවක තෙමේ ප්‍රජාත ද... බහුශ්‍රැත ද...මිහිරි වචන ඇත්තේ ද...පණ්ඩිත ද...භවද් ගෞතමයන් හා මේ වචනයෙහි සාකච්ඡා කරන්නට පොහොසත් ද වේ. අපි නිහඬ වන්නමු. අම්බට්ඨ මාණවක තෙමේ භවද් ගෞතමයන් හා මේ වචනයෙහි සාකච්ඡා කෙරේ වා (උත්තර ප්‍රත්‍යුත්තර කථා කෙරේ වා)" යි මාණවකයෝ කීහ.

21. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ අම්බට්ඨ මාණවකයා අමතා, "අම්බට්ඨය, නොකැමැත්තෙන් වුව ද විසැදිය යුතු මේ කරුණු සහිත පැණයෙක් තා කරා පැමිණෙයි. ඉදින් තෝ නො විසඳන්නෙහි නම්, එක් වචනයෙකින් අන් වචනයක් වසා ලන්නෙහි නම්, තුෂ්ණීම්භූත හෝ වන්නෙහි නම්, උත්තර හෝ නොදී නැගී පලායන්නෙහි නම්, මෙහි ම තමේ හිස සත් කඩක් වැ පැළෙන්නේ ය. අම්බට්ඨ ය, එය කිමැ යි සිතහි ද? වයසින් වැඩි සිටි, මහලු වූ, (මෙහි ලා) කරුණු කියන ආචාර්‍ය ප්‍රාචාර්‍ය වූ බමුණන්ගේ කථාව තා විසින් කෙසේ අසන ලද ද? (කියව,) කෘෂ්ණායනයෝ කවරක්හු මුලසථාන කොට ඇත්තෝ ද? (කවුරුන්ගෙන් ඇති වූවෝ ද?) කෘෂ්ණායනයන්ගේ පූර්වපුරුෂයා කවරෙක් වී ද?"යි පුළුවුත් සේක.

මෙසේ ඇසූ කල්හි අම්බට්ඨ මාණවක තෙමේ තුෂ්ණීම්භූත විය. දෙවෙනි වර ද භාග්‍යවතුන් වහන්සේ අම්බට්ඨ මාණවකයා අමතා "අම්බට්ඨය, කිමැ යි සිතහි ද...කෘෂ්ණායනයන් ගේ පූර්වපුරුෂයා කවරෙක් වී ද?"යි වදාළ සේක. දෙවැනි වර ද අම්බට්ඨ මාණවක තෙමේ තුෂ්ණීම්භූත විය.

එ විට භාග්‍යවතුන් වහන්සේ අම්බට්ඨ මාණවකයාට වදාරන සේක්, "අම්බට්ඨය, දැන් විසඳව. දැන් තට නිහඬ වීමට කල් නො වේ. අම්බට්ඨය, යමෙක් වනාහි තථාගතයන් විසින් තෙවෙනි වර තෙක් කරුණු සහිත පැණයක් පිළිවිස්තා ලද්දේ උත්තර නො දේ නම්, මෙහි ම ඔහුගේ හිස සත් කඩෙක් වැ පැළෙන්නේ යැ"යි වදාළ සේක.

22. තෙන ඛො පන සමයෙන වජිරපාණි යක්ඛො මහන්තං අයොකූටං ආදාය ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං අම්බට්ඨස්ස මාණවස්ස උපරිවෙහාසං ඨිතො හොති: සචායං අම්බට්ඨො මාණවො භගවතා යාවතතියකං සහධම්මිකං පඤ්හං පුට්ඨො න ව්‍යාකරිස්සති එත්තෙවස්ස සත්තධා මූර්ධිං ඵාලෙස්සාමීති. තං ඛො පන වජිරපාණිං යක්ඛං භගවා චෙව පස්සති අම්බට්ඨො ච මාණවො.

23. අථ ඛො අම්බට්ඨො මාණවො භීතො සංවිග්ගො ලොමහට්ඨජාතො භගවන්තංයෙව තාණගවෙසී භගවන්තංයෙව ලෙණගවෙසී භගවන්තංයෙව සරණගවෙසී උපනිසීදිත්වා භගවන්තං එතදවොච: "කිං මෙ තං භවං ගොතමො ආහ? පුන භවං ගොතමො බ්‍රවීතූ"ති.

"තං කිම්මඤ්ඤසි අම්බට්ඨ? කිත්ති තෙ සුතං බ්‍රාහ්මණානං වුද්ධානං මහල්ලකානං ආචරියපාචරියානං භාසමානානං, කුතොප්පභුතිකා කණ්හායනා? කො ච කණ්හායනානං පුබ්බපුරිසො?ති."

"එවමෙව මෙ භො ගොතම සුතං, යථෙව භවං ගොතමො ආහ. තතොප්පභුතිකා කණ්හායනා. සො ච කණ්හායනානං පුබ්බපුරිසො"ති.

24. එවං වුත්තෙ තෙ මාණවකා උත්තානිතො උච්චාසද්දමහාසද්දා අහෙසුං: "දුජ්ජාතො කිර භො අම්බට්ඨො මාණවො, අකුලපුත්තො කිර භො අම්බට්ඨො මාණවො, දාසිපුත්තො කිර භො අම්බට්ඨො මාණවො සක්‍යානං, අය්‍යපුත්තා කිර භො අම්බට්ඨස්ස මාණවස්ස සක්‍යා භවන්ති. ධම්මවාදිං යෙව කිර මයං සමණං ගොතමං අපසාදෙතබ්බං අම්හසේදිමහා"ති.

25. අථ ඛො භගවතො එතදහොසි: "අතිබාළ්හං ඛො ඉමෙ මාණවකා අම්බට්ඨං මාණවං දාසිපුත්තවාදෙන නිම්මාතෙන්ති. යන්නූනාහං පරිමොචෙය්‍යන්ති." අථ ඛො භගවා තෙ මාණවකෙ එතදවොච: "මා ඛො තුම්හෙ මාණවකා අම්බට්ඨං මාණවං අතිබාළ්හං දාසිපුත්තවාදෙන නිම්මාතෙථ. උළාරො සො කණ්හා ඉසි අහොසි. සො දක්ඛිණා ජනපදං ගන්ත්වා බ්‍රහ්මෙ මන්තෙ අජ්ඣෙත්වා රාජානං ඔක්කාකං උපසඞ්කමිත්වා මට්ඨරූපිං[1] ධීතරං යාචි. තස්ස රාජා ඔක්කාකො 'කො නෙව රෙ අයං මඤ්ඤං දාසිපුත්තො සමානො මට්ඨරූපිං ධීතරං යාචතී'ති කුපිතො අත්තත්තමනො ඛුරපඤ්ඤං සන්තයති. සො තං ඛුරපඤ්ඤං නෙව අසක්ඛි මුඤ්චිතුං, නො පටිසංහරිතුං.

1. මද්දරූපිං, මජ්ඣිමං.

22. එ වේලෙහි වතාහි වජ්‍රපාණි යක්ෂ තෙමේ ගිනි ගත් දිලියෙන ගිනි දැල් සහිත මහ යකුළක් අතින් ගෙන, 'ඉදින් මේ අම්බට්ඨ මාණවකයා භාග්‍යවතුන් වහන්සේ විසින් තෙවෙනි වර තෙක් කරුණු සහිත පැනය පුළුවුන්නා ලද්දේ උත්තර නො දෙන්නේ නම්, මෙහි ම මොහු ගේ හිස සත් කඩකට පලන්නෙමි'යි කියා අම්බට්ඨ මාණවකයාට උඩින් අහසෙහි සිටියේ වෙයි. ඒ වජ්‍රපාණි යක්ෂයා වතාහි භාග්‍යවතුන් වහන්සේත් දක්නා සේක. අම්බට්ඨ මාණවකයාත් දක්නේ ය.

23. ඉක්බිති අම්බට්ඨ මාණවක තෙමේ තැති ගත්තේ, භය පත් වූයේ, හටගත් ලොමුදහ ගැනුම් ඇත්තේ, භාග්‍යවතුන් වහන්සේ ම ආරක්ෂාස්ථානය කොට සොයනුයේ, භාග්‍යවතුන් වහන්සේ ම තමාට සැඟෙවෙන තැන කොට සොයනුයේ, භාග්‍යවතුන් වහන්සේ ම පිහිට කොට සොයනුයේ, සමීපයෙහි හිඳ ගෙන, 'භවද් ගෞතම තෙමේ මට ඒ කුමක් කියේ ද? යලිත් භවද් ගෞතම තෙමේ කියාවා''යි සි ය.

එ විට භාග්‍යවතුන් වහන්සේ "අම්බට්ඨය, එය කිමෑ යි සිතයි ද? (මෙහි ලා) කරුණු කියන වයසින් වැඩි සිටි, මහලු, ආචාර්ය ප්‍රාචාර්යයන් ගේ කථාව තා විසින් කෙසේ අසන ලද ද? කෘෂ්ණායනයෝ කවරක්හු මූලස්ථාන කොට ඇත්තෝ ද? කෘෂ්ණායනයන් ගේ පූර්වපුරුෂයා කවරෙක් වී ද?''යි වදාළ සේක.

"භවද් ගෞතම තෙමේ යම්සේ ම කියේ ද, එසේ ම මා විසින් අසන ලදි. කෘෂ්ණායනයෝ ඒ කෘෂ්ණයා මූලස්ථාන කොට ඇත්තෝ ය. ගේ ම කෘෂ්ණායනයන් ගේ ප්‍රථම පුරුෂයා වී යැ" යි අම්බට්ඨයා කී ය.

24. මෙසේ කී කලෑ ඒ මාණවකයෝ "භවත්නි, අම්බට්ඨ මාණවකයා පහත් ජාතියෙක උපන්නෙක් ල! භවත්නි, අම්බට්ඨ මාණවකයා කුල පුත්‍රයෙක් නොවේ ල! භවත්නි, අම්බට්ඨ මාණවකයා ශාක්‍යයන් ගේ දාසිපුත්‍රයෙක් ල! භවත්නි, ශාක්‍යයෝ අම්බට්ඨ මාණවකයා ගේ ස්වාමිපුත්‍රයෝ වෙත් ල! අපි ධර්මවාදී වූ ම ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ගැරහියැ යුත්තන් කොට සිතුවමු!''යි හඬ ගා කියන්නෝ උස්හඬ ඇත්තෝ මහ හඬ ඇත්තෝ වූහ.

25. එ විටැ "මේ මාණවකයෝ අම්බට්ඨමාණවකයාට ඉතා දැඩි ලෙස දාසිපුත්‍ර වාදයෙන් පිරිහෙළා කියත්. මම ඔහු එයින් මුදා ලන්නෙමි නම් යෙහෙකැ''යි භාග්‍යවතුන් වහන්සේට මේ සිත විය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ මාණවකයනට මෙසේ වදාළ සේක:

"මාණවකයෙනි, තෙපි ඉතා දැඩි කොට අම්බට්ඨ මාණවකයාට දාසිපුත්‍රවාදයෙන් නො ගරහවු. ඒ (ඔහු ගේ ආදිපුරුෂ වූ) කෘෂ්ණර්ෂි තෙමේ මහානුභාව ඇත්තෙක් වී ය. ගේ දක්ෂිණාපථයට ගොස් බ්‍රහ්ම-මන්ත්‍රයන් ඉගෙන ඔක්කාක රජු කරා එළැඹැ, මධ්‍යරූපී තම දියණියන් ඉල්ලී ය. ඔක්කාක රජ තෙමේ "එම්බල, මගේ දාසීපුත්‍ර වැ හිඳත් ඕ කවරෙක් නම් (=ඕ තමා තරම නො දැන) මධ්‍යරූපී දුව ඉල්ලනුයේ ද!''යි කිපුණේ නොසතුටු සිතැත්තේ (ඔහු විද මරනු පිණිස) ඊය දුන්නෙහි හිඳුවී ය. ගේ ඒ ඊය දුන්නෙන් ඕදන්නට ද (=විදින්නට) ඇද ගන්නට ද නොහැකි විය.

අථ ඛො මාණවකා අම්බට්ඨා පාරිසජ්ජා කණ්හං ඉසිං උපසඞ්කමිත්වා එතදවොචුං: "සොත්ථි භදන්තො හොතු රඤ්ඤො, සොත්ථි භදන්තො හොතු රඤ්ඤො"ති.

"සොත්ථි භවිස්සති රඤ්ඤො, අපි ච රාජා යදි අඤ්ඤං බ්‍රහ්මචරියං මුඤ්චිස්සති යාවතා රඤ්ඤො විජිතං එත්තාවතා පඨවී උද්දිසිස්සතී"ති.

"සොත්ථි භදන්තො හොතු රඤ්ඤො, සොත්ථි ජනපදස්ස"ති.

"සොත්ථි භවිස්සති රඤ්ඤො, සොත්ථි ජනපදස්ස. අපි ච රාජා යදි උද්ධං බ්‍රහ්මචරියං මුඤ්චිස්සති යාවතා රඤ්ඤො විජිතං එත්තාවතා සත්තවස්සානි දෙවො න වස්සිස්සතී"ති.

"සොත්ථි භදන්තො හොතු රඤ්ඤො, සොත්ථි ජනපදස්ස, දෙවො ච වස්සතූ"ති.

"සොත්ථි භවිස්සති රඤ්ඤො, සොත්ථි ජනපදස්ස, දෙවො ච වස්සිස්සති. අපි ච රාජා ජෙට්ඨකුමාරෙ බ්‍රහ්මචරියං පතිට්ඨාපෙතු, සොත්ථි කුමාරො, පලෙලාමො භවිස්සතී"ති.

අථ ඛො මාණවකා, අම්බට්ඨා ඔක්කාකස්ස ආරොචෙසුං: "දෙවො ජෙට්ඨකුමාරෙ බ්‍රහ්මචරියං පතිට්ඨාපෙතු, සොත්ථි කුමාරො පලෙලාමො භවිස්සතී"ති. අථ ඛො රාජා ඔක්කාකො ජෙට්ඨකුමාරෙ බ්‍රහ්මචරියං පතිට්ඨාපෙසි. සොත්ථි කුමාරො පලෙලාමො භවි.

අථ ඛො තස්ස රාජා ඔක්කාකො භීතො සංවිග්ගො ලොමහට්ඨජාතො බ්‍රහ්මදණ්ඩෙන තජ්ජිතො ඔක්කරූපිං ධීතරං අදාසි. මා ඛො තුම්හෙ මාණවකා අම්බට්ඨං මාණවං අතිබාළ්හං දූසිපුත්තවාදෙන නිම්මානෙථ. උළාරො සො කණ්හො ඉසි අහොසි.

26. අථ ඛො භගවා අම්බට්ඨං මාණවං ආමන්තෙසි: "තං කිම්මඤ්ඤසි අම්බට්ඨ? ඉධ ඛත්තියකුමාරො බ්‍රාහ්මණකඤ්ඤාය සද්ධිං සංවාසං කප්පෙය්‍ය, තෙසං සංවාසම්භවාය පුත්තො ජායෙථ, යො සො ඛත්තියකුමාරෙන බ්‍රාහ්මණකඤ්ඤාය පුත්තො උප්පන්නො, අපි නු සො ලභෙථ බ්‍රාහ්මණෙසු ආසනං වා උදකං වා?"ති,

"ලභෙථ භො ගොතම".

"අපි නු නං බ්‍රාහ්මණා භොජෙය්‍යුං සද්ධෙ වා ථාලිපාකෙ වා යඤ්ඤෙ වා පාහුනෙ වා?"ති

මාණවකයිනි, එ විටැ මැතිමඩුල්ලට අයත් ඇමැතියෝ කෘෂ්ණර්ෂිහු වෙත එළැඹැ 'පින්වතුන් වහන්ස, රජුට සෙත් වේ වා, පින්වතුන් වහන්ස, රජුට සෙත් වේ වා'යි කීහ.

(එ විටැ කෘෂ්ණ තෙමේ) "රජුට සෙත් වන්නේ ය, එතෙකුදු වුවත්, ඉදින් රජ ඊය යට දෙසට මුදන්නේ නම්, රජුගේ රට යම් තාක් ද ඒ තාක් පොළොව ඔදී විසිරෙන්නේ යැ"යි කී ය.

'පින්වතුන් වහන්ස, රජුට සෙත් වේ වා, රටට සෙත් වේ වා'යි ඇමැතියෝ කීහ.

'රජුට සෙත් වන්නේ ය, රටට සෙත් වන්නේ ය, එතෙකුදු වුවත් ඉදින් රජ ඊය උඩ දෙසට මුදා හලොත් රජුගේ රට යම් තාක් ද එතෙක් පෙදෙසට සත් හවුරුද්දක් වැසි නො වස්නේ යැ'යි කෘෂ්ණයා කී ය.

(එ විට ඇමැතියෝ) 'පින්වතුන් වහන්ස, රජුට සෙත් වේ වා රටට ද සෙත් වේ වා, වැසි ද වසී වා' යි කීහ.

(කෘෂ්ණ තෙමේ) 'රජුට සෙත් වන්නේ ය, රටට ද සෙත් වන්නේ ය, වැසි ද වස්නේ ය, එතෙකුදු වුවත් රජ තෙමේ දෙවු කුමරා කෙරෙහි ඊය පිහිටුවා වා (=දෙවු කුමරුට ඊයෙන් විදී වා), කුමර තෙමේ නිරුපද්‍රැත වන්නේ ය, ලොමුදහ ගැනුම් පමණකුදු තොමැතියේ වන්නේ යැ'යි කී ය.

මාණවකයිනි, ඉක්බිති ඇමැතියෝ "රජ තෙමේ දෙවු කුමරා කෙරෙහි ඊය පිහිටුවා වා, කුමර තෙමේ නිරුපද්‍රැත වන්නේ ය, ලොමුදහ ගැනුම් පමණකු දු නැත්තෙක් වන්නේ යැ"යි ඔක්කාක රජුට කීහ. එවිටැ ඔක්කාක රජ දෙවු කුමරා කෙරෙහි ඊය පිහිටුවීය, (දෙවු කුමරු දෙසට ඊය මුහු හැරියේ ය). කුමර තෙමේ නිරුපද්‍රැත විය. ලොමුදහ ගැනුම් පමණකුදු ඇත්තේ නො වී ය.

ඉක්බිති ඔක්කාක රජ තැති ගත්තේ, බිය ගත්තේ, භය ගත් ලොමුදහ ගැනුම් ඇත්තේ, බ්‍රහ්මදණ්ඩයෙන් තරවටු කරනු ලැබුයේ, ඔහුට ඔවඨරූපී නම් දියැණියන් දුන්නේ ය. මාණවකයිනි, තෙපි අම්බට්ඨ මාණවකයාට ඉතා දැඩි කොට ඍසිපුත්‍රවාදයෙන් නො ගරහවු. ඒ කෘෂ්ණර්ෂි තෙමේ මහානුභාව ඇත්තෙක් වී ය" යනු යි.

26. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අම්බට්ඨ මාණවකයා අමතා "අම්බට්ඨය, මෙය කිමැ යි සිතහි ද? මෙහි කැත්කුමරෙක් බමුණුදැරියක හා එක් වැ වසන්නේ නම්, ඔවුන්ගේ එක් වැ විසීමෙන් පුතෙක් උපදනේ නම්, ඒ කැත් කුමරා නිසා බමුණු දැරියට උපන් පුතා බමුණන් අතුරෙහි අභ්‍යාසනය හෝ අභ්‍යෝදකය ලබන්නේ ද?"යි ඇසූ සේක.

[අම්බට්ඨ:] "ගෞතමයිනි, ලබන්නේ ය"

[භාග්‍යවතුන් වහන්සේ:] "බමුණෝ මළවුන් උදෙසා දෙන බතෙහි හෝ මිගුල් බතෙහි හෝ යාග බතෙහි හෝ ආගන්තුක දානයෙහි හෝ ඔහු වළඳවන්නෝ ද?"

"හොජෙය්‍යුං හො ගොතම."

"අපි නු තං බ්‍රාහ්මණා මන්තෙ වාචෙය්‍යුං වා නො වා?"ති

"වාචෙය්‍යුං හො ගොතම."

"අපිනු'ස්ස ඉත්තීසු ආවටං වා අස්ස අනාවටං වා?"ති

"අනාවටං හි'ස්ස හො ගොතම".

"අපි නු තං ඛත්තියා ඛත්තියාභිසෙකෙන අභිසිඤ්චෙය්‍යුන්ති?"

"නො හිදං හො ගොතම."

"තං කිස්ස හෙතු?"

"මාතිතො හි හො ගොතම අනුපපන්නො"ති.

27. "තං කිම්මඤ්ඤසි අම්බට්ඨ? ඉධ බ්‍රාහ්මණකුමාරො ඛත්තිය-කඤ්ඤාය සද්ධිං සංවාසං කප්පෙය්‍ය, තෙසං සංවාසම්භාය පුත්තො ජායෙථ, යො සො බ්‍රාහ්මණකුමාරෙන ඛත්තියකඤ්ඤාය පුත්තො උපපන්නො, අපි නු සො ලභෙථ බ්‍රාහ්මණෙසු ආසනං වා උදකං වා?"ති

"ලභෙථ හො ගොතම."

"අපි නු තං බ්‍රාහ්මණා හොජෙය්‍යුං සද්ධෙ වා ථාලිපාකෙ වා යඤ්ඤෙ වා පාහුනෙ වා?"ති

"හොජෙය්‍යුං හො ගොතම."

"අපි නු තං බ්‍රාහ්මණා මන්තෙ වාචෙය්‍යුං වා නො වා?"ති

"වාචෙය්‍යුං හො ගොතම."

"අපිනු'ස්ස ඉත්තීසු ආවටං වා අස්ස අනාවටං වා?"ති

"අනාවටං හි'ස්ස හො ගොතම."

"අපි නු තං ඛත්තියා ඛත්තියාභිසෙකෙන අභිසිඤ්චෙය්‍යුන්ති?"

"නො හිදං හො ගොතම."

"තං කිස්ස හෙතු?"

"පිතිතො හි හො ගොතම අනුපපන්නො"ති.

28. "ඉති ඛො අම්බට්ඨ ඉත්තියා වා ඉත්තිං කරිත්වා පුරිසෙන වා පුරිසං කරිත්වා ඛත්තියා 'ව සෙට්ඨා, හීනා බ්‍රාහ්මණා. තං කිම්මඤ්ඤසි අම්බට්ඨ? ඉධ බ්‍රාහ්මණා බ්‍රාහ්මණං කිසමිත්දෙව පකරණෙ බුරමුණ්ඩං කරිත්වා අස්සපුට්ඨෙන වධිත්වා රට්ඨා වා නගරා වා පබ්බාජෙය්‍යුං, අපි නු සො ලභෙථ බ්‍රාහ්මණෙසු ආසනං වා උදකං වා?"ති

[අම්බට්ඨ] "භවදේ ගෞතමයෙනි, ඔහු වළඳවන්නෝ ය."

[භා:] "බමුණෙනි ඔහුට වේදයන් කියවන්නෝ ද, නොකියවන්නෝ ද ?"

[අම්:] "භවදේ ගෞතමයිනි, කියවන්නෝය."

[භා:] "ඒ කැත් කුමරුට බමුණු දැරියන් කෙරෙහි ආවරණයෙක් වන්නේ ද, නො වන්නේ ද ? (බමුණු දැරියන් ලබන හැකි වන්නේ ද නො වන්නේ ද ?)"

[අම්:] "භවදේ ගෞතමයිනි, ඔහුට බමුණු දැරියන් කෙරෙහි ආවරණයෙක් නැත"

[භා:] "ක්ෂත්‍රියයෝ ඔහු ක්ෂත්‍රියාභිෂේකයෙන් අභිෂේක කරන්නෝ ද ?"

[අම්:] "අභිෂේක නො කරන්නෝ ය, භවදේ ගෞතමයිනි."

[භා:] "ඒ කවර හෙයින් ද?"

[අම්:] "භවදේ ගෞතමයිනි, හේ මවු පසින් අසම්පූර්ණ ය (අපිරිසිදු ය). එහෙයිනි."

27 [භා:] "අම්බට්ඨය, එය කිමැ සි සිතහි ද ? මෙහි බමුණු කුමරෙක් කැත් දැරියක හා එක් වැ වසන්නේ නම්, ඔවුන් හේ එක් වැ විශ්‍රමෙන් පුතෙක් උපදනේ නම්, ඒ බමුණු කුමරහු නිසා කැත් දැරියට උපන් යම් පුතෙක් වේ නම්, හේ බමුණන් අතුරෙහි අග්‍රාසන හෝ අග්‍රෝදක ලබන්නේ ද ?"

[අම්:] "ලබන්නේ ය භවදේ ගෞතමයිනි."

[භා:] "බමුණෙනි මළවුන් උදෙසා දෙන බතෙහි හෝ මඟුල් බතෙහි හෝ යාග බතෙහි හෝ අඹුතු බතෙහි හෝ ඔහු වළඳවන්නෝ ද ?"

[අම්:] "වළඳවන්නෝ ය, භවදේ ගෞතමයිනි."

[භා:] "බමුණෙනි ඔහුට වේද කියවන්නෝ ද නොකියවන්නෝ ද ?"

[අම්:] "කියවන්නෝ ය, භවදේ ගෞතමයිනි."

[භා:] "ඔහුට බමුණු දැරියන් කෙරෙහි ආවරණයෙක් වන්නේ ද, නො වන්නේ ද ?"

[අම්] "භවදේ ගෞතමයිනි, ආවරණයෙක් නො වන්නේ ය."

[භා.] "ක්ෂත්‍රියයෝ ක්ෂත්‍රියාභිෂේකයෙන් ඔහු අභිෂේක කරන්නෝ ද ?"

[අම්.] "භවදේ ගෞතමයිනි, මෙය ඔහු නො කරන්නෝ ය."

[භා.] "ඒ කවර හෙයින් ද ?"

[අම්.] "භවදේ ගෞතමයිනි, හේ පිය පසින් අසම්පූර්ණ ය (අශුද්ධ ය)."

28. [භා.] "අම්බට්ඨය, මෙසේ වනාහි (කැත් බමුණු දෙකුලෙන් එක් කුලෙක) ස්ත්‍රියක හා (අන් කුලෙහි) ස්ත්‍රියක හා සැසැඳූ කල්හි ද, (එක් කුලෙක)පිරිමියකු හා (අන් කුලයෙහි) පිරිමියකු සැසැඳූ කල්හි ද, කැත්හු ම උසස් වෙත්, බමුණෙනි පහත් වෙත්. අම්බට්ඨය, එය කිමැ සි සිතහි ද ? මෙහි බමුණෙනි බමුණකු කිසි නොකටයුත්තෙක්හි කරයෙන් හිස මුඩු කොට, අස්මපුටයෙන් වෙගෙසවා (=ගෙවත් හිසැ අළු වගුරුවා) රවින් හෝ නුවරින් නෙරපත්නෝ නම්, හේ බමුණන් අතුරෙහි අග්‍රාසනය හෝ අග්‍රෝදකය ලබත්නේ ද ?"

"නො හිදං භො ගොතම."

"අපි නු තං බ්‍රාහ්මණා භොජෙය්‍යුං සද්ධිං වා ථාලිපාකෙ වා යඤ්ඤෙ වා පාහුනෙ වා?"ති

"නො හිදං භො ගොතම."

"අපි නු තං බ්‍රාහ්මණා මන්තෙ වාචෙය්‍යුං වා නො වා?"ති.

"නො හිදං භො ගොතම."

"අපි නු'ස්ස ඉත්ථිසු ආවටං වා අස්ස අනාවටං වා?ති"

"ආවටං හි'ස්ස භො ගොතම."

29. "තං කිම්මඤ්ඤසි අම්බට්ඨ? ඉධ ඛත්තියො ඛත්තියං කිස්මිඤ්චිදෙව පකරණෙ බ්‍රහ්මුණ්ඩං කරිත්වා අස්සපුට්ඨෙන වධිත්වා රට්ඨා වා නගරා වා පබ්බාජෙය්‍ය, අපි නු සො ලභෙථ බ්‍රාහ්මණෙසු ආසනං වා උදකං වා?ති"

"ලභෙථ භො ගොතම."

"අපි නු තං බ්‍රාහ්මණා භොජෙය්‍යුං සද්ධිං වා ථාලිපාකෙ වා යඤ්ඤෙ වා පාහුනෙ වා?ති"

"භොජෙය්‍යුං භො ගොතම."

"අපි නු තං බ්‍රාහ්මණා මන්තෙ වාචෙය්‍යුං වා නො වා?"ති

"වාචෙය්‍යුං භො ගොතම."

"අපි නු'ස්ස ඉත්ථිසු ආවටං වා අස්ස අනාවටං වා?"ති

"අනාවටං හි'ස්ස ගො ගොතම."

"එත්තාවතා ඛො අම්බට්ඨ ඛත්තියො පරමනිහීනතං පත්තො හොති, යදෙව නං ඛත්තියා බ්‍රහ්මුණ්ඩං කරිත්වා අස්සපුට්ඨෙන වධිත්වා රට්ඨා වා නගරා වා පබ්බාජෙන්ති. ඉති ඛො අම්බට්ඨ යදා ඛත්තියො පරමනිහීනතං පත්තො හොති, තදාපි ඛත්තියා'ව සෙට්ඨා හීනා බ්‍රාහ්මණා.

30. බ්‍රහ්මුනා'පි අම්බට්ඨ සනඞ්කුමාරෙන ගාථා භාසිතා:

'ඛත්තියො සෙට්ඨො ජනෙතසම්මිං
යෙ ගොත්තපටිසාරිනො,
විජ්ජාචරණසම්පන්නො
සො සෙට්ඨො දෙවමානුසෙ'ති

සා ඛො පනෙසා අම්බට්ඨ බ්‍රහ්මුනා සනඞ්කුමාරෙන ගාථා සුගීතා නො දුග්ගීතා, සුභාසිතා නො දුබ්භාසිතා, අත්ථසංහිතා නො අනත්ථසංහිතා, අනුමතා මයා. අහම්පි[1] අම්බට්ඨ එවං වදාමි:

'ඛත්තියො සෙට්ඨො ජනෙතසම්මිං
යෙ ගොත්තපටිසාරිනො,
විජ්ජාචරණසම්පන්නො
සො සෙට්ඨො දෙවමානුසෙ'ති.

භාණවාරො පඤ්චමො.

---

1. අහම්පිහි, මජ්ඣ.

[අම:] "භවද් ගෞතමයිනි, මෙය, නො වන්නේ යැ"

[භා:] "බමුණෝ ශ්‍රාද්ධයෙහි (මතක බතෙහි) හෝ මඟුල් බතෙහි හෝ යාග බතෙහි හෝ අමුතු බතෙහි ඔහු වළඳවන්නෝ ද ?"

[අම:] "නො වළඳවන්නෝ ය, භවද් ගෞතමයිනි"

[භා:] "බමුණෝ ඔහුට වේදයන් කියවන්නෝ ද ?"

[අම:] "නො කියවන්නෝ ය, භවද් ගෞතමයිනි"

[භා:] "ඔහුට ස්ත්‍රීන් අතුරෙහි ආවරණයෙක් හෝ අනාවරණයෙක් වන්නේ ද ?"

[අම:] "භවද් ගෞතමයිනි, ආවරණයෙක් ම වන්නේ ය.

29. [භා:] "අම්බට්ඨය, ඒ කිමැ යි සිතහි ද ? මෙහි ක්ෂත්‍රියයෝ ක්ෂත්‍රියයකු කිසි කරුණෙක්හි කරයෙන් හිස මුඛ කොට හිසැ අළු වගුරුවා රවින් හෝ තුවරින් තෙරපන්නෝ නම්, හේ බමුණන් මැද අග්‍රාසනය හෝ අග්‍රොදකය හෝ ලබන්නේ ද ?"

[අ:] "ලබන්නේ ය, භවද් ගෞතමයිනි."

[භා:] "බමුණෝ ශ්‍රාද්ධයෙහි හෝ මඟුල් බතෙහි හෝ යාග බතෙහි හෝ අමුතු බතෙහි හෝ ඔහු වළඳවන්නෝ ද ?"

[අම:] "වළඳවන්නෝ ය, භවද් ගෞතමයිනි."

[භා:] "බමුණෝ ඔහුට වේදයන් කියවන්නෝ ද ? නැත හොත් නො කියවන්නෝ ද ?"

[අම:] "කියවන්නෝ ය, භවද් ගෞතමයිනි".

[භා:] "ඔහුට බමුණු දැරියන් විෂයෙහි ආවරණයෙක් වන්නේ ද ? නැත හොත් නො වන්නේ ද ?"

[අම:] "ආවරණයෙක් නො වන්නේ ය, භවද් ගෞතමයිනි."

[භා:] "අම්බට්ඨය, යම් කලෙක ක්ෂත්‍රියයෝ ක්ෂත්‍රියයකු කරමුඛ කොට (හිසකේ බා දමා) අළු පොදියෙන් ගසා (=හිසැ අළු වගුරුවා) රවින් හෝ තුවරින් හෝ තෙරපන්නෝ නම්, මෙතෙකින් ම ක්ෂත්‍රිය තෙමේ (ක්ෂත්‍රියයන් අතුරෙහි) පහත් ම බවට පැමිණියේ වෙයි. (එහෙත් එසේ වූ ක්ෂත්‍රියයා බමුණෝ උසස් කොට පිළිගනිත්.) අම්බට්ඨය, මෙසේ යම් විටෙක ක්ෂත්‍රියයා පහත් ම බවට පැමිණියේ නම්, එ කල්හිත් බමුණන් අතුරෙහි කැත්තු උසස් හ. බමුණෝ හීනය හ.

30. අම්බට්ඨය, සනත්කුමාර බඹුහු විසිනුත් මෙහි ලා මේ ගය ගැයිණ. (ගයේ අදහස:)

"සිය පරපුර අනු ව පෙරළා අතීතයට ගොස් විමසන ජනයා අතුරෙහි ක්ෂත්‍රියයා ශ්‍රෙෂ්ඨ ය. විද්‍යා චරණ දෙකින් යුත් යමෙක් වේ නම් හේ දෙවිමිනිසුන් අතුරෙහි ශ්‍රෙෂ්ඨ ය."

"අම්බට්ඨය, සනත්කුමාර බඹුහු විසින් ඒ ගය මැනැවින් ගයන ලද්දේ වේ. නොමනා වැ ගයන ලද්දේ නො වේ. මැනැවින් කියන ලද්දේ වේ. නොමනා වැ කියන ලද්දේ නො වේ. ඒ අර්ථ නිශ්‍රිත ය, අනර්ථනිශ්‍රිත නො වේ. මා විසින් අනුදත්තා ලද්දේ ය. අම්බට්ඨය, මම ද මෙසේ කියමි:

"ගෝත්‍රය ඔස්සේ පෙරළා ගොස් විමසන ජනයා අතුරෙහි ක්ෂත්‍රියයා ශ්‍රෙෂ්ඨ ය. විද්‍යා චරණ දෙකින් යුත් යමෙක් වේ නම්, හේ දෙව් මිනිසුන් අතුරෙහි ශ්‍රෙෂ්ඨ ය" යනු යි.

පළමු බණවර යි.

31. "කතමං පන තං භො ගොතම චරණං, කතමා ච පන සා විජ්ජා ?"ති. "න ඛො අම්බට්ඨ අඤ්ඤතරාය විජ්ජාචරණසම්පදාය ජාතිවාදෙ වා වුච්චති ගොත්තවාදෙ වා වුච්චති මානවාදෙ වා වුච්චති: 'අරහසි වා මං භවං න වා මං භවං අරහසී'ති. යත්ථ ඛො අම්බට්ඨ ආචාරො වා හොති, විචාරො වා හොති, ආචාරවිචාරො වා හොති, එත්තෙතං වුච්චති ජාතිවාදෙ වා ඉතිපි, ගොත්තවාදෙ වා ඉතිපි, මානවාදෙ වා ඉතිපි: 'අරහසි වා මං භවං න වා මං භවං අරහසී'ති. යෙ හි කෙචි අම්බට්ඨ ජාතිවාදවිනිබන්ධා වා ගොත්තවාදවිනිබන්ධා වා මානවාදවිනිබන්ධා වා ආචාරවිචාරවිනිබන්ධා වා, ආරකා තෙ අඤ්ඤතරාය විජ්ජාචරණසම්පදාය. පහාය ඛො අම්බට්ඨ ජාතිවාදවිනිබන්ධඤ්ච ගොත්තවාදවිනිබන්ධඤ්ච මානවාද-විනිබන්ධඤ්ච ආචාරවිචාරවිනිබන්ධඤ්ච අඤ්ඤතරාය විජ්ජාචරණසම්පදාය සච්ඡිකිරියා හොතී"ති.

32. "කතමං පන තං භො ගොතම චරණං ? කතමා ච සා විජ්ජා ?"ති "ඉධ අම්බට්ඨ තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා. සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති.

33. තං ධම්මං සුණාති ගහපති වා ගහපතිපුත්තො වා අඤ්ඤතරස්මිං වා කුලෙ පච්චාජාතො. සො තං ධම්මං සුත්වා තථාගතෙ සද්ධං පටිලභති. සො තෙන සද්ධාපටිලාභෙන සමන්නාගතො ඉති පටිසංචික්ඛති: "සම්බාධො ඝරාවාසො රජාපථො අබ්භොකාසො පබ්බජ්ජා. නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්තපරිසුද්ධං සංඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං, යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය"නති.

සො අපරෙන සමයෙන අප්පං වා භොගක්ඛන්ධං පහාය මහන්තං වා භොගක්ඛන්ධං පහාය අප්පං වා ඤාතිපරිවට්ටං පහාය මහන්තං වා ඤාතිපරිවට්ටං පහාය කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජති. සො එවං පබ්බජිතො සමානො පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී. සමාදාය සික්ඛති සික්ඛාපදෙසු කායකම්මවචීකම්මෙන සමන්නාගතො කුසලෙන, පරිසුද්ධාජීවො සීල-සම්පන්නො ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො භොජනෙ මත්තඤ්ඤූ සතිසම්ප-ජඤ්ඤෙන සමන්නාගතො සන්තුට්ඨො.

31. [අම්.] "භවද් ගෞතමයිනි, ඒ චරණය කවර ද? ඒ විද්‍යාව කවර ද?"

[භා.] "අම්බට්ඨය, නිරුත්තර විද්‍යාචරණසම්පන්න 'තෝ මට පුදුපු වෙහි යැ'යි කියා හෝ 'තෝ මට නුසුදුපු වෙහි යැ'යි කියා හෝ ජාතිවාදයෙක් කියනු නො ලැබේ. ගෝත්‍රවාදයෙක් හෝ කියනු නො ලැබේ. මානවාදයෙක් හෝ කියනු නො ලැබේ. අම්බට්ඨය, යම් තැනෙක වූ කලි ආවාහයෙක් හෝ වේ ද, විවාහයෙක් හෝ වේ ද, ආවාහවිවාහයෙක් හෝ වේ ද, මෙහි 'තෝ මට තරම් යැ' යි (පුදුස්සෙහි යැ යි) කියා හෝ 'තෝ මට නොතරම් යැ' යි (නොපුදුස්සෙහි යැ යි) කියා හෝ යම් වචනයෙක් ලබ්ධියෙක් වේ ද, මේය ජාතිවාද යැ යි ද, ගෝත්‍රවාද යැ යි ද, මානවාද යැ යි ද කියනු ලැබේ. අම්බට්ඨය, යම් කෙනෙක් තුමූ ජාතිවාදයෙහි බැඳුණෝ හෝ ගෝත්‍රවාදයෙහි බැඳුණෝ හෝ මානවාදයෙහි බැඳුණෝ හෝ ආවාහවිවාහ-යෙහි බැඳුණෝ හෝ වෙත් ද, ඔහු නිරුත්තර විද්‍යාචරණ සම්පත්තියෙන් ඇත්හි වූවෝ ය. අම්බට්ඨය, ජාතිවාදයෙන් බැඳීම ද ගෝත්‍රවාදයෙන් බැඳීම ද මානවාදයෙන් බැඳීම ද ආවාහවිවාහයෙන් බැඳීම ද හැර දැමීමෙන් ම නිරුත්තර විද්‍යාචරණසම්පත්තියගේ පැසක් කිරීම වේ."

32. [අම්.] "භවද් ගෞතමයිනි, ඒ චරණය කවර ද? ඒ විද්‍යාව කවර ද?"

[භා] "අම්බට්ඨය, අතීත් වූ සම්‍යක්සම්බුද්ධ වූ විද්‍යාචරණ දෙකින් සම්පූර්ණ වූ, මනා ගමන් හා මනා වචන ඇති, ලෝකය දන්නා, නිරුත්තර පුරුෂදම්‍යසාරථි වූ, දෙවිමිනිස්නට ශාස්තෘ වූ, සිවු සත් දත්, භගවත් වූ තථාගත තෙමේ මේ ලොව පහළ වෙයි. හේ ආදිකල්‍යාණ වූ මධ්‍යකල්‍යාණ වූ, පර්යවසාන කල්‍යාණ වූ, මනා අරුත් ඇති, ව්‍යංජනයෙන් මනා ව සම්පූර්ණ, හැම ලෙසින් ම පිරිපුන් දහම් දෙසයි. පිරිසිදු වූ මාර්ගබ්‍රහ්මචර්‍යය ප්‍රකාශ කෙරෙයි.

33. කිසි යම් කුලයෙක උපන් ගෘහපතියෙක් හෝ ගෘහපිපුතෙක් හෝ එක්තරා කුලයෙක උපන්නෙක් හෝ ඒ දහම් අසයි. හේ ඒ දහම් අසා, තථාගතයන් කෙරෙහි සැදැහැ ලබයි (පහළ කෙරෙයි). හේ ඒ සැදැහැ ලැබීමෙන් යුක්ත වූයේ, "ගිහිගෙහි පිසීම අවහිර ඇති එකෙක. රජස් පථයෙක. පැවිද්ද එළිමහනෙක. ගිහිගෙහි වසන්නහු විසින් එකැතින් පිරිපුන් කොට, එකැතින් පිරිසිදු කොට, ශංඛලිඛිතයක් සේ කොට මෙ බඹසර කරන්නට පහසු නො වේ. මා කෙහෙ රවුලු බා දමා කසාවත් හැඳ ගිහිගෙන් පැවිද්දට වදිතොත් ඒ යෙහෙකැ"යි මේසේ සලකයි.

හේ පසු කාලෙක මඳ වූ හෝ බොහෝ වූ හෝ වස්තුසම්පත් රාශිය හැර දමා, මඳ වූ හෝ බොහෝ වූ හෝ තැ පිරිස හැර දමා, කෙහෙ රවුලු බා දමා, කසාවත් හැඳ ගිහිගෙන් පැවිද්දට වදී. මේසේ පැවිදි වූ ම හේ පාතිමොක්ඛසංවරයෙන් හැවුරුණේ, ආචාරයෙන් ගෝචරයෙන් සම්පූර්ණ වැ, සුවල්ප වූ ද වරදෙහි බිය දක්නා සුලු වැ වෙසෙයි. සික්ඛාපද සමාදන් වැ ගෙන, කුසල් වූ කා විසි කමින් යුත් වැ, පිරිසිදු දිවෙල ඇති වැ, සිල්වත් වැ, ඉඳුරන්හි වැසූ දොරැති වැ, බොජුන්හි පමණ දන්නේ, සිහිනුවණින් යුත් වැ (සිවු පසයෙහි) ලද පමණින් සතුටු වැ වෙසේ.

34. කථඤ්ච අම්බට්ඨ භික්ඛු සීලසම්පන්නො හොති ?

ඉධ අම්බට්ඨ භික්ඛු පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති නිහිතදණ්ඩො නිහිතසත්තො ලජ්ජී දයාපන්නො සබ්බපාණභූතහිතානුකම්පී විහරති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො හොති. දින්නාදායී දින්නපාටිකඞ්ඛී අථේනෙන සුචිභූතෙන අත්තනා විහරති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී හොති ආරාචාරී විරතො මෙථුනා ගාමධම්මා. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො හොති සච්චවාදී සච්චසන්ධො ථෙතො පච්චයිකො අවිසංවාදකො ලොකස්ස. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

පිසුණං වාචං පහාය පිසුණාය වාචාය පටිවිරතො හොති, ඉතො සුත්වා න අමුත්‍ර අක්ඛාතා ඉමේසං භෙදාය. අමුත්‍ර වා සුත්වා න ඉමේසං අක්ඛාතා අමූසං භෙදාය. ඉති භින්නානං වා සන්ධාතා සංහිතානං වා අනුප්පදාතා සමග්ගාරාමො සමග්ගරතො සමග්ගනන්දී සමග්ගකරණිං වාචං භාසිතා හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

ඵරුසං වාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතො හොති. යා සා වාචා නෙලා කණ්ණසුඛා පෙමනීයා හදයඞ්ගමා පොරී බහුජනකන්තා බහුජනමනාපා තථාරූපිං වාචං භාසිතා හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතො හොති කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී නිධානවතිං වාචං භාසිතා හොති කාලෙන සාපදෙසං පරියන්තවතිං අත්ථසංහිතං ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

35. බීජගාමභූතගාමසමාරම්භා පටිවිරතො හොති. එකභත්තිකො හොති රත්තූපරතො පටිවිරතො විකාලභොජනා. නච්චගීතවාදිතවිසූකදස්සනා පටිවිරතො හොති. මාලාගන්ධවිලෙපනධාරණමණ්ඩනවිභූසනට්ඨානා පටිවිරතො හොති. උච්චාසයනමහාසයනා පටිවිරතො හොති. ජාතරූපරජතපටිග්ගහණා පටිවිරතො හොති. ආමකධඤ්ඤපටිග්ගහණා පටිවිරතො හොති. ආමකමංසපටිග්ගහණා පටිවිරතො හොති. ඉත්ථිකුමාරිකපටිග්ගහණා පටිවිරතො හොති. දාසිදාසපටිග්ගහණා පටිවිරතො හොති. අජෙළකපටිග්ගහණා පටිවිරතො හොති. කුක්කුටසූකරපටිග්ගහණා පටිවිරතො හොති. හත්ථිගවාස්සවළවපටිග්ගහණා පටිවිරතො හොති. ඛෙත්තවත්ථුපටිග්ගහණා පටිවිරතො හොති. දූතෙය්‍යපහිණගමනානුයොගා පටිවිරතො හොති. කයවික්කයා පටිවිරතො හොති. තුලාකූටකංසකූටමානකූටා පටිවිරතො හොති. උක්කොටනවඤ්චනනිකතිසාදියොගා පටිවිරතො හොති. ඡේදනවධබන්ධනවිපරාමෝසආලොපසහසාකාරා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

34. අම්බට්ඨය, මහණ තෙමේ කෙසේ නම් සිල්වත් වේ ද?

අම්බට්ඨය, මෙහි මහණ තෙමේ පණිවා හැර පණිවායෙන් තොර වැ බහා තැබූ දඬු ඇත්තේ, බහා තැබූ අවි ඇත්තේ, පවෙහි ලජ්ජා ඇතියේ, කුළුණෙන් යුත් වූයේ, හැම දිවි ඇති සත් වග කෙරෙහි හිතානුකම්පා ඇති වැ වෙසේ. මේ ද ඔහු ගේ සිල් වේ.

ගේ අයිතාදත් හැර අයිතාදනින් තොර වූයේ වේ. දුන් දෑය ම ගන්නා සුලු වූයේ, දුන් දෑය ම අවෙක්සනුයේ, නොසොර වූ පිරිසිදු වූ සිතින් වෙසේ. මේ ද ඔහු ගේ සිල් වේ.

අබ්‍රම්සර හැර ගැමි දහම් වූ මෙවුන්දමින් දුරු වැ හැසිරෙනුයේ, එයින් වැළැක්කේ, බඹසර රක්නේ වේ. මේ ද ඔහු ගේ සිල් වේ.

මුසවා හැරැ සබවස් ඇත්තේ, ඇත්තෙන් ඇත්ත ගළපා කියනුයේ, තහවුරු බස් ඇත්තේ, හැදුණියැ යුතු බස් ඇත්තේ, ලොව නොරවටනුයේ, මුසවායෙන් වැළැක්කේ වේ. මේ ද ඔහු ගේ සිල් වේ.

පිසුණු බස් හැරැ පිසුණු බසින් වැළැක්කේ වේ. මෙ තැනින් අසා ගෙන, මොවුන් ගේ බිඳීම පිණිස එ තන්හි නො කියන්නේ වේ. එ තැනින් හෝ අසා ගෙන ඔවුන් ගේ බිඳීම පිණිස මොවුනට කියන්නේ නො වේ. මෙසේ බිඳුණවුන් එකට ගළපන, එකට ගැළැපුණවුන් ගේ සමගියට අනුබල දෙන, සමගියෙන් වසනවුන් හා වසනු රිසි, සමගිය ඇතියනට ඇලුණු, සමගිය ඇතියවුනට සතුටු, සමගිය ඇත්තවුන් කරන බස් නෙපලන්නේ වේ. මේ ද ඔහු ගේ සිල් වේ.

පරොස් බස් හැරැ පරොස් බසින් වැළැක්කේ වෙයි. යම් බසෙක් තිවැරැදි ද, කන්කලු ද, පෙම් කවයුතු ද, සිතැ කාවදනේ ද, නියැරියන් ගේ බස සේ සිලුටු ද, බොහෝ දෙනාට පිය ද, බොහෝ දෙනා මත වඩනේ ද, එ බඳු වූ බස් නෙපලනුයේ වේ. මේ ද ඔහු ගේ සිල් වේ.

බොල් බස් හැරැ දමා සුදුසු කල් වේලා බලා ම කතා කරනුයේ, ඇත්ත ම කියනුයේ, වැඩක් ම කියනුයේ, දහමක් ම කියනුයේ, හික්මෙනුවට සුදුසු බසක් ම කියනුයේ, බොල් දෙබැවිල්ලෙන් වැළැක්කේ වේ. සුදුසු කාලයෙහි කරුණු සහිත, ඉමක් කෙළවරක් ඇති, අරුත් සහිත, සිතැ තබා ගත යුතු බස් නෙපලනුයේ වෙයි. මේ ද ඔහු ගේ සිල් වේ.

35. ගේ පැල වන දැ පැල වුණු දැ කැඩීමෙන් බිඳීමෙන් වැළැක්කේ වේ. රැ බොජුනෙන් වැළැක්කේ, නොකල්හි අහර ගැන්මෙන් වැළැක්කේ, එක් බත් ඇත්තේ වේ. නටනු ගනු වයනු විසුළු දස්නෙන් වැළැක්කේ වේ. අඹු තැන් පිරීමටත් සැරැසුමටත් කරුණු වූ මල් ගඳ විලෙවුන් දරුමෙන් වැළැක්කේ වේ. උසසුත් මහස්නෙන් වැළැක්කේ වේ. රන් රිදී මසු කහවණු පිළිගැන්මෙන් වැළැක්කේ වේ. අඹු ධාන්‍ය පිළිගැන්මෙන් වැළැක්කේ වේ. අඹුමස් පිළිගැන්මෙන්...ස්ත්‍රීන් කුමාරිකාවන් පිළිගැන්මෙන්... දැසිදසුන් පිළිගැන්මෙන්...එළුවන් තිරෙළුවන් පිළිගැන්මෙන්...කුකුළන් සූරන් පිළිගැන්මෙන්...ඇතුන් ගොරන් අසුන් වෙළඹුන් පිළිගැන්මෙන්... කෙත්වත් පිළිගැන්මෙන්...හිඟියනට ලොකු කුඩා දූත මෙහෙවර කැරැමෙන්...ගනු දෙනු කැරැමෙන්...තුලාකූට කංසකූට මානකූටයෙන්... උකොට්ටන වංචන නිකති සාචියෝග යන මෙයින්...ඡේදන වධ බන්ධන විපරාමෝස ආලෝප සහසාකාර යන මෙයින් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ සිල් වේ.

36. යථා වා පනෙකෙ හොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං බීජගාමභූතගාමසමාරම්භං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: මූලබීජං ඛන්ධබීජං ඵළුබීජං අග්ගබීජං බීජබීජමෙව පඤ්චමං. ඉති එවරූපා බීජගාමභූතගාමසමාරම්භා පටිවිරතො හොති ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

37. යථා වා පනෙකෙ හොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං සන්නිධිකාරපරිභොගං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: අන්නසන්නිධිං පානසන්නිධිං වත්ථසන්නිධිං යානසන්නිධිං සයනසන්නිධිං ගන්ධසන්නිධිං ආමිසසන්නිධිං. ඉති වා ඉති එවරූපා සන්නිධිකාරපරිභොගා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

38. යථා වා පනෙකෙ හොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විසූකදස්සනං අනුයුත්තා විහරන්ති සෙය්‍යථිදං: නච්චං ගීතං වාදිතං පෙක්ඛං අක්ඛානං පාණිස්සරං වෙතාලං කුම්භථූනං සොභනගරකං චණ්ඩාලං වංසං ධොවනං හත්ථියුද්ධං අස්සයුද්ධං මහිසයුද්ධං උසභයුද්ධං අජයුද්ධං මෙණ්ඩයුද්ධං කුක්කුටයුද්ධං වට්ටකයුද්ධං දණ්ඩයුද්ධං මුට්ඨියුද්ධං නිබ්බුද්ධං උය්‍යොධිකං බලග්ගං සෙනාබ්‍යූහං අනීකදස්සනං. ඉති වා ඉති එවරූපා විසූකදස්සනා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

39. යථා වා පනෙකෙ හොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං ද්‍යූතපමාදට්ඨානානුයොගං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථිදං: අට්ඨපදං දසපදං ආකාසං පරිහාරපථං සන්තිකං ඛලිකං ඝටිකං සලාකහත්थං අක්ඛං පඬගචීරං වඩ්ඩකං මොක්ඛචිකං චිඞ්ගුලකං පත්තාළ්හකං රථකං ධනුකං අක්ඛරිකං මනෙසිකං යථාවජ්ජං ඉති වා ඉති එවරූපා ද්‍යූතපමාදට්ඨානානුයොගා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

40. යථා වා පනෙකෙ හොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං උච්චාසයනමහාසයනං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: ආසන්දිං පල්ලඞ්කං ගොනකං චිත්තකං පටිකං පටලිකං තූලිකං විකතිකං උද්දලොමිං එකන්තලොමිං කට්ටිස්සං කොසෙය්‍යං කුත්තකං හත්थත්थරං අස්සත්थරං රථත්थරං අජිනප්පවෙණිං කදලිමිග-පවරපච්චත්थරණං සඋත්තරච්ඡදං උභතොලොහිතකූපධානං-ඉති වා ඉති එවරූපා උච්චාසයනමහාසයනා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

36. යම්සේ වනාහි ඇතැම් භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, මුලින් පැල වන ද, කඳින් පැල වන ද, පුරුකින් පැල වන ද, කොළිසෙන් පැල වන ද, පස් වනු ඇටින් පැල වන ද යන පැල වන ද ද පැල වුණු ද ද සිදුම් කිඳුමහි ගෙදුණෝ වෙසෙත් ද, හේ මේබඳු පැලවන ද ද පැලවුණු ද ද කැඩුමෙන් කිඳුමෙන් වැළැක්කේ වේ. මේ ද ඔහුගේ සිල් වේ.

යම්සේ ම ඇතැම් භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ ආහාර රැස් කොට තබා ගැන්ම, බොන ද රැස් කොට තබා ගැන්ම, වස්ත්‍ර රැස් කොට තබා ගැන්ම, යාන රැස්කොට තබා ගැන්ම, යහන් රැස් කොට තබා ගැන්ම, සුවඳ රැස් කොට තබා ගැන්ම, ආමිෂ රැස් කොට තබා ගැන්ම යන මේ හෝ මෙබඳු වූ පසය රැස් කොට තබා ගෙන වැළඳීමේ යෙදී වෙසෙත් ද, හේ මේ හෝ මෙ බඳු වූ සන්නිධිකාර පරිභෝගයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ සිල් වේ.

38. යම්සේ ම ඇතැම් භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, නැටුම්, ගැයුම්, වැයුම්, නටසමජජා, ආඛ්‍යාන, පාණිඝර, වේතාල, කුම්භථූන, ශෝභනක, සණහැවුන් කෙළිය, උණගස් ඔසොවා කරන ක්‍රීඩාව, අසිඩාවනය, ඇත් පොර, අස් පොර, මිසුපොර, ගොන් පොර, එළු පොර, බැටළු පොර, කුකුළු පොර, වටු පොර, පොලු හරඹ, මිටුයුද, මල්ල පොර, යුද පවත්නා තැන් දක්නට යෑම, බල සෙන් ගණිනා තැන් දක්නට යෑම, බලසෙන් බෙදනා තැනට යෑම, බලඇණි දක්නට යෑම යන පිසුළු දස්තෙහි යෙදී වේසෙත් ද, හෙ තෙමේ මේ ආදී වූ හෝ මෙ බඳු වූ පිසුළු දස්තෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහු ගේ සිල් වේ.

39. යම්සේ වනාහි සමහර භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, අවපාකෙළිය, දසපාකෙළිය, අඟස් දූකෙළිය, මඬුලු පැනුම්, සන්තිකා ක්‍රීඩාව, දඳු කෙළිය, කල්ලි ගැසුම්, සලා අත් කෙළිය, ගුල කෙළිය, කොළනලා පිඹීම, කෙළි තඹුලින් හැම, කරණම ගැසුම්, කන්තංගුරුවා කෙළිය, කොළ තැළියෙන් වැලි මැනීම, ක්‍රීඩා රථ පැදවීම, කුඩා දුන්නෙන් විදීම, ඇකිරි කෙළිය; සිතු දෑ කීමේ ක්‍රීඩාව, විකලාංගානුකරණය යන මේ ආදි වූ හෝ මේබඳු වූ, පමාවට කරුණු වූ දූකෙළියෙහි යෙදී වේසෙත් ද, හෙ තෙමේ මේ හෝ මෙ බඳු වූ, පමාවට කරුණු වූ දූකෙළියෙහි යෙදීමෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහු ගේ සිල් වේ.

40. යම්සේ වනාහි ඇතැම් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, දික්සඟළාපුටුය, පළඟය, මහ කොදුපළසය, වියමනෙන් විසිතුරු කළ එළුලොම්මුවා ඇතිරිය, එළුලොම්මුවා සුදු ඇතිරිය, ගන මල් යෙදූ සුදු ලොම් ඇතිරිය, තිලිය, සිංහාදිරූපවලින් විසිතුරු කළ එළුලොම්මුවා ඇතිරිය, දෙපැත්තේ ම ලොම් ඇති එළුලොම්මුවා ඇතිරිය, එක් පැත්තේ පමණක් ලොම් ඇති එළුලොම්මුවා ඇතිරිය, රත්කසුකම් කළ පසතුරුණ, ඡෝසෙය්‍ය ඡුයින් මිසු ඇතිරිය, අපි පිට එළන ඇතිරිය, රියැ එළන ඇතිරිය, ඇඳට සරි ලන සේ අඳුන්-දිවිසමින් මසා කළ ඇතිරිය, කෙහෙල්මුවසමින් කළ මහතු පසතුරුණ, ඉස්දෙරැ පාමුලැ රතු කොළිට තැබූ රතු උඩුමියන් සහිත මහතු යහන යන මේ ආදි හෝ මෙ බඳු වූ උස් යහන් මහ යහන් පරිහරණය කිරීමෙහි යෙදී වෙසෙද්ද, හෙ තෙමේ මේ ආදී වූ හෝ මෙ බඳු වූ උස්යහන් මහ යහන් පරිභෝගයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ සිල් වේ.

41. යථා වා පනෙකෙ හොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං මණ්ඩනවිභූසනට්ඨානානුයොගං අනුයුත්තා විහරන්ති සෙය්‍යථිදං: උච්ඡාදනං පරිමද්දනං නහාපනං සම්බාහනං ආදාසං අඤ්ජනං මාලාවිලෙපනං මුඛචූණ්ණකං මුඛාලෙපනං හත්ථබන්ධං සිඛාබන්ධං දණ්ඩකං නාළිකං ඛග්ගං ඡත්තං චිත්‍රුපාහනං උණ්හීසං මණිං වාලවීජනිං ඔදාතානි වත්ථානි දීඝදසානි. ඉති වා ඉතිත්වරූපා මණ්ඩනවිභූසනට්ඨානා-නුයොගා පටිවිරතො හොති. ඉදමපි'ස්ස හොති සීලස්මිං.

42. යථා වා පනෙකෙ හොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං තිරච්ඡානකථං අනුයුත්තා විහරන්ති සෙය්‍යථිදං: රාජකථං චොරකථං මහාමත්තකථං සෙනාකථං භයකථං යුද්ධකථං අන්නකථං පානකථං වත්ථකථං සයනකථං මාලාකථං ගන්ධකථං ඤාතිකථං යානකථං ගාමකථං නිගමකථං නගරකථං ජනපදකථං ඉත්ථිකථං පුරිසකථං කුම්භට්ඨානකථං කුම්භදාසීකථං සූරකථං විසිඛාකථං කුම්භට්ඨානකථං පුබ්බපෙතකථං නානත්තකථං ලොකක්ඛායිකං සමුද්දක්ඛායිකං ඉතිභවා-භවකථං. ඉති වා ඉතිත්වරූපාය තිරච්ඡානකථාය පටිවිරතො හොති. ඉදමපි'ස්ස හොති සීලස්මිං.

43. යථා වා පනෙකෙ හොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විග්ගාහිකකථං අනුයුත්තා විහරන්ති සෙය්‍යථිදං: න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි. අහං ඉමං ධම්මවිනයං ආජානාමි. කිං ත්වං ඉමං ධම්මවිනයං ආජානිස්සසි? මිච්ඡාපටිපන්නො ත්වමසි, අහමස්මි සම්මාපටිපන්නො. සහිතමෙම[1] අසහිතන්තො. පුරෙ වචනීයං පච්ඡා අවච, පච්ඡාවචනීයං පුරෙ අවච. ආචිණ්ණං තෙ විපරාවත්තං. ආරොපිතො තෙ වාදො නිග්ගහිතො'සි. චර වාදප්පමොක්ඛාය. නිබ්බෙඨෙහි වා සචෙ පහොසි. ඉති වා ඉතිත්වරූපාය විග්ගාහිකකථාය පටිවිරතො හොති. ඉදමපි'ස්ස හොති සීලස්මිං.

44. යථා වා පනෙකෙ හොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං දූතෙය්‍යපහිණගමනානුයොගමනුයුත්තා විහරන්ති සෙය්‍යථිදං: රාජූනං රාජමහාමත්තානං ඛත්තියානං බ්‍රාහ්මණානං ගහපතිකානං කුමාරානං: ඉධ ගච්ඡ, අමුත්‍රාගච්ඡ, ඉදං හර, අමුත්‍ර ඉදං ආහරාති. ඉති වා ඉතිත්වරූපං දූතෙය්‍යපහිණගමනානුයොගා පටිවිරතො හොති. ඉදමපි'ස්ස හොති සීලස්මිං.

---

1. සංහිතමෙම අසංහිතං තෙ. කොසුවි.

41. යම්සේ වනාහි සමිහර භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, සුවඳ සුණුයෙන් ඇඟ ඉලීම, අත් පා ඇඟි මනා සටහන් ගත්වනුවට තෙල් ගා මැඩීම, සුවඳ දියෙන් නෑවීම, උරහිස් ඇඟි මස් වැඩෙනුවට මුතුරින් තැලීම, කැඩපතින් මුහුන බැලීම, අලංකාර පිණිස අඳුන් ගෑම, මල් පැළැඳීම හා විලෙවුන් දැරීම, මුවසුණු මුවවිලෙවුන් දැරීම, හසාභරණ දැරීම, හිසැ කුඩුම්බිය බැඳීම, විසිතුරු සැරයපි දැරීම, විසිතුරු බෙහෙත් නළ දැරීම, කඩු දැරීම, විසිතුරු කුඩ දැරීම, විසිතුරු පාවහන් දැරීම, නළල්පට බැඳීම, මිණි දැරීම, විසිතුරු සෙමෙර වල්පිදුනා දැරීම, දික් දැවලු ඇති සුදුරෙදි හැඳීම යන ආදින් ඇඟැ අඩු තැන් පිරවීමටත් ඇඟ සැරැසීමටත් කරුණු වන දෑ පරිභෝග කිරීමෙහි යෙදී වෙසෙත් ද, හේ මහණ තෙමේ එබඳු දෑ පරිභෝග කිරීමෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහු ගේ ශීලය වේ.

42. යම්සේ වනාහි සමිහර භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, රාජකථා, චෝරකථා, මහාමාත්‍රකථා, සේනාකථා, භයකථා, යුද්ධකථා, ආහාරකථා, පානකථා, වස්ත්‍රකථා, ශයනකථා, මාලාකථා, ගන්ධකථා, ඥාතිකථා, යානකථා, ග්‍රාමකථා, නිගමකථා, නගරකථා, ජනපදකථා, ස්ත්‍රීකථා, පුරුෂකථා, කුමාරකථා, කුමාරීකථා, ශූරකථා, විථිකථා, කුම්භට්ඨානකථා, පුබ්බේතකථා, නානත්තකථා, ලෝකාඛ්‍යායිකකථා, සමුද්දාඛ්‍යායිකකථා, ඉතිභවාභවකථා යන මේබඳු වූ තිරශ්චීනකථාවල යෙදී වෙසෙත් ද, ඒ මහණ තෙමේ මෙකී හෝ මෙසින් අන්‍ය වූ හෝ මෙබඳු කථාවලින් වැළැක්කේ වෙයි. මේ ද ඔහු ගේ ශීලය වේ.

43. යම්සේ වනාහි ඇතැම් භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, "තෝ මේ දහම් විනය නො දනිහි, මම ම මේ දහම් විනය දනිමි, මේ දහම් විනය කිමැ යි තෝ දනී ද? තෝ වරදවා පිළිපන්නෙහි, මම මැනැවින් පිළිපන්නෙමි වෙමි. මා බස කරුණු සහිත ය. තා බස කරුණු රහිත ය. තෝ පළමුවෙන් කියැ යුත්ත පසු වැ කියෙහි ය. පසු වැ කියැ යුත්ත පළමුවෙන් කියෙහි ය. තා කලක් මි පුහුණු කළ දෑ මගේ එක් වචනයෙන් ම පෙරැළී ගියේ ය. මා විසින් තව දොස් තැබිණ. මා විසින් නිගන්තා ලද්දෙහි. මා තැගු දෙසින් මිදෙන්නට හැකිරෙව. හැකි නම් එය විසඳව" යි යන ආදින් මේ බඳු වූ උතුන් බැණ දෙඩාහැනුම්හි යෙදෙත් ද, ඒ මහණ තෙමේ මෙකී හෝ අන් මේ බඳු වූ හෝ බැණුම්දෙඩුම්වලින් වැළැක්කේ වෙයි. මේ ද ඔහු ගේ ශීලය වේ.

44. යම්සේ වනාහි සමිහර භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, "මෙහි යන්නැ, අසෝ තැනට එන්නැ, මෙය ගෙන යන්නැ, අසෝ තැනට මෙය ගෙනෙන්නැ"යි කළ නියොග පිළිගෙන, රජුන්ගේ රජමහමැතියන්ගේ ක්ෂත්‍රියයන්ගේ බමුණන්ගේ ගෘහපතියන්ගේ රජකුමරුවන් ගේ මේබඳු දූත මෙහෙවරෙහි, පණිවුඩ ගෙනැ යෑමෙහි යෙදී වෙසෙත් ද, ඒ මහණ තෙමේ මෙකී හෝ අන් මේබඳු හෝ දූත මෙහෙවරින්, පණිවුඩ ගෙන යෑමෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහු ගේ ශීලය වේ.

45. යථා වා පනෙකෙ හොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ කුහකා ච හොන්ති ලපකා ච නෙමිත්තිකා ච නිප්පෙසිකා ච ලාභෙන ලාභං නිජිගිංසිතාරො ච. ඉති වා ඉතිඑවරූපා කුහනලපනා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

46. යථා වා පනෙකෙ හොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති සෙය්‍යථිදං: අඞ්ගං නිමිත්තං උප්පාදං සුපිනං ලක්ඛණං මූසිකවඩ්ඪනං අග්ගිහොමං දබ්බිහොමං ථුසහොමං කණහොමං තණ්ඩුලහොමං සප්පිහොමං තෙලහොමං මුඛහොමං ලොහිතහොමං අඞ්ගවිජ්ජා වත්ථුවිජ්ජා ඛත්තවිජ්ජා සිවවිජ්ජා භූතවිජ්ජා භූරිවිජ්ජා අහිවිජ්ජා විසවිජ්ජා විච්ඡිකවිජ්ජා මූසිකවිජ්ජා සකුණවිජ්ජා වායසවිජ්ජා පක්කජ්ඣානං සරපරිත්තාණං මිගචක්කං. ඉති වා ඉතිඑවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

47. යථා වා පනෙකෙ හොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති සෙය්‍යථිදං: මණිලක්ඛණං වත්ථුලක්ඛණං දණ්ඩලක්ඛණං අසිලක්ඛණං උසුලක්ඛණං ධනුලක්ඛණං ආවුධලක්ඛණං ඉත්ථිලක්ඛණං පුරිසලක්ඛණං කුමාරලක්ඛණං කුමාරිලක්ඛණං දාසලක්ඛණං දාසිලක්ඛණං හත්ථිලක්ඛණං අස්සලක්ඛණං මහිංසලක්ඛණං උසභලක්ඛණං ගොලක්ඛණං අජලක්ඛණං මෙණ්ඩලක්ඛණං කුක්කුටලක්ඛණං වට්ටකලක්ඛණං ගොධා-ලක්ඛණං කණ්ණිකාලක්ඛණං කච්ඡපලක්ඛණං මිගලක්ඛණං. ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

48. යථා වා පනෙකෙ හොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති සෙය්‍යථිදං: රඤ්ඤං නිය්‍යානං භවිස්සති, රඤ්ඤං අනිය්‍යානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං උපයානං භවිස්සති, බාහිරානං රඤ්ඤං අපයානං භවිස්සති. බාහිරානං රඤ්ඤං උපයානං භවිස්සති, අබ්භන්තරානං රඤ්ඤං අපයානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං ජයො භවිස්සති, බාහිරානං රඤ්ඤං පරාජයො භවිස්සති. බාහිරානං රඤ්ඤං ජයො භවිස්සති, අබ්භන්තරානං රඤ්ඤං පරාජයො භවිස්සති. ඉති ඉමස්ස ජයො භවිස්සති, ඉමස්ස පරාජයො භවිස්සති. ඉති වා ඉතිඑවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

45. යම්සේ වනාහි ඇතැම් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, කුහක කම් කරන්නෝ වෙත් ද, ලාභ සත්කාර පතා අනුන් සිත් ඇදෙන සේ වූ වාචු බස් පෙළන්නෝ වෙත් ද, සිවු පසය ලබනු සඳහා කයින් හෝ බසින් සෝ ඇඟැවීම් කරන්නෝ වෙත් ද, ලාභාපේක්ෂායෙන් අනුනට ගරහන්නෝ වෙත් ද, ලාභයෙන් ලාභය සොයන්නෝ වෙත් ද, ඒ මහණ තෙමේ මෙකී හෝ මෙබඳු වූ කුහනලපනවලින් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ සීලය වේ.

46. යම්සේ ඇතැම් භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ අංග, නිමිත්ත, උත්පාත, සුවප්න, පුරුෂලක්ෂණ යන ශාස්ත්‍ර ද, මුඛසාමුද්‍රිකාවිද්‍ය, අග්නිහෝම, දර්වීහෝම, තුෂහෝම කණහෝම, තණ්ඩුලහෝම, සර්පිර්හෝම, තෛලහෝම, මුඛහෝම, ලෝහිතහෝම, අංගවිද්‍ය, වාස්තුවිද්‍ය, ක්ෂත්‍රවිද්‍ය, ශිවවිද්‍ය, භූතවිද්‍ය, භූරිවිද්‍ය, අහිවිද්‍ය, විෂවිද්‍ය, වෘශ්චිකවිද්‍ය, මූෂකවිද්‍ය, ශකුනවිද්‍ය, වායසවිද්‍ය, පක්වඛ්‍යාන, ශරපරිත්‍රාණ, මෘගපක්ෂ යන මෙකී හෝ මෙබඳු වූ හෝ තිරශ්චීනවිද්‍යයෙන් මිථ්‍යාජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ තෙමේ මෙකී හෝ මෙබඳු වූ තිරශ්චීනවිද්‍යයෙන්, මෙබඳු මිථ්‍යාජීවයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ සීලය වේ.

47. යම්සේ ඇතැම් භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, මණිලක්ෂණ, වස්ත්‍රලක්ෂණ, දණ්ඩලක්ෂණ, ඛඩ්ගලක්ෂණ, ඊලක්ෂණ, දුනුලක්ෂණ, අවිලක්ෂණ, ඉතිරිලක්ෂණ, පිරිමිලක්ෂණ, කුමරලක්ෂණ, කුමරිලක්ෂණ, දස්ලක්ෂණ, දසිලක්ෂණ, ඇස්ලක්ෂණ, අස්ලක්ෂණ, ඕසුලක්ෂණ, වැහැප්ලක්ෂණ, ගොස්ලක්ෂණ, එළුලක්ෂණ, බැටෙළුලක්ෂණ, වවුලක්ෂණ, ගොස්ලක්ෂණ, කැණිලක්ෂණ, සතුබුලක්ෂණ, මුවලක්ෂණ යන ආදී මෙබඳු තිරශ්චීනවිද්‍යයෙන් මිථ්‍යාජීවිකාවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ තෙමේ එයින් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ සීලය වේ.

48. යම්සේ ඇතැම් භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, "අසෝ දිනැ අසෝ නැකැතින් අසෝ රජුන් (ශුද්‍ර සඳහා) සිය නුවරින් නික්මීම වන්නේ ය, අසෝ නැකැතින් පෙරළා සිය නුවරට ඒම වන්නේ ය, අසෝ නැකැතින් රට තුළ උත් රජුන් පිටතැ සිටින සතුරු රජුන් හමු වන්නට යෑම වන්නේ ය, අසෝ නැකැතින් පිටතැ සිටින සතුරු රජුන් ඉවත් වීම වන්නේ ය, අසෝ නැකැතින් පිටතැ සිටින සතුරු රජුන් රට තුළැ සිටින රජුන් කරා පැමිණීම වන්නේ ය, අසෝ නැකැතින් ඇතුළත සිටින රජුන් ගේ ඉවත් වැ යෑම වන්නේ ය,...රට ඇතුළත සිටින රජුට ජය වන්නේ ය, පිටතැ සිටින සතුරු රජුනට පරාජය වන්නේ ය,...පිටත සිටින සතුරු රජුනට ජය වන්නේ ය, රට තුළැ සිටින රජුනට පරාජය වන්නේ යැ"යි මෙසේ 'මොහුට ජය වන්නේ ය, මොහුට පරාජය වන්නේ යැ' යි කියමින් මෙබඳු වූ තිරශ්චීන විද්‍යයෙන්, මෙබඳු වූ මිථ්‍යාජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ තෙමේ මේ හෝ මේ බඳු වූ තිරශ්චීනවිද්‍යයෙන් මිථ්‍යාජීවයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ සීලය වේ.

49. යථා වා පනෙකෙ භොතො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති සෙය්‍යථිදං: චන්දග්ගාහො භවිස්සති සූරියග්ගාහො භවිස්සති නක්ඛත්තග්ගාහො භවිස්සති. චන්දිමසූරියානං පථගමනං භවිස්සති චන්දිමසූරියානං උප්පථගමනං භවිස්සති නක්ඛත්තානං පථගමනං භවිස්සති නක්ඛත්තානං උප්පථගමනං භවිස්සති. උක්කාපාතො භවිස්සති. දිසාඩාහො භවිස්සති. භූමිචාලො භවිස්සති. එවංවිපාකො දෙවදුන්දුභි භවිස්සති. එවංවිපාකං චන්දිමසූරියනක්ඛත්තානං උග්ගමනං ඔගමනං සංකිලෙසං වොදානං භවිස්සති. එවංවිපාකො චන්දග්ගාහො භවිස්සති. එවංවිපාකො සූරියග්ගාහො භවිස්සති. එවංවිපාකො නක්ඛත්තග්ගාහො භවිස්සති. එවංවිපාකං චන්දිමසූරියානං පථගමනං භවිස්සති. එවංවිපාකං චන්දිමසූරියානං උප්පථගමනං භවිස්සති. එවංවිපාකං නක්ඛත්තානං පථගමනං භවිස්සති. එවංවිපාකො උක්කාපාතො භවිස්සති. එවංවිපාකො දිසාඩාහො භවිස්සති. එවංවිපාකො භූමිචාලො භවිස්සති. එවංවිපාකො දෙවදුන්දුභි භවිස්සති. එවංවිපාකං චන්දිමසූරියනක්ඛත්තානං උග්ගමනං ඔගමනං සඞ්කිලෙසො වොදානං භවිස්සති. ඉති වා ඉතිඑවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

50. යථා වා පනෙකෙ භොතො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති සෙය්‍යථිදං: සුබ්බුට්ඨිකා භවිස්සති දුබ්බුට්ඨිකා භවිස්සති. සුභික්ඛං භවිස්සති දුබ්භික්ඛං භවිස්සති. ඛෙමං භවිස්සති භයං භවිස්සති. රොගො භවිස්සති ආරොග්‍යං භවිස්සති. මුද්දා ගණනා සංඛානං කාවෙය්‍යං ලොකායතං. ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

51. යථා වා පනෙකෙ භොතො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති සෙය්‍යථිදං: ආවාහනං විවාහනං සංවදනං විවදනං සංකිරණං විකිරණං සුභගකරණං දුබ්භගකරණං විරුද්ධගබ්භකරණං ජිව්හානිජ්ජොඤ්ජනං හනුසංහනනං හත්ථාභිජප්පනං හනුජප්පනං කණ්ණජප්පනං ආදාසපඤ්හං කුමාරිපඤ්හං දෙවපඤ්හං ආදිච්චුපට්ඨානං මහතුපට්ඨානං අබ්භුජ්ජලනං සිරිවිහායනං. ඉති වා ඉතිඑවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

49. යම්සේ ඇතැම් භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, 'අසෝ දිනැ චන්ද්‍රග්‍රහණය වන්නේ ය, අසෝ දිනැ සූර්‍යග්‍රහණය වන්නේ ය, අසෝ දිනැ නක්ෂත්‍රග්‍රහණය වන්නේ ය, අසෝ දිනැ සඳ හිරු දෙදෙනා තිසි මඟින් යැම වන්නේ ය, අසෝ දිනැ ඔවුන් නොමඟින් යැම වන්නේ ය, අසෝ දිනැ තරුත් තරුන් තිසි මඟින් යැම වන්නේ ය, අසෝ දිනැ ඔවුන් නොමඟින් යැම වන්නේ ය, අසෝ දිනැ උල්කාපතනය වන්නේ ය, දිග්දාහය වන්නේ ය, භූමිකම්පනය වන්නේ ය, වැසි නැති වැ අහස් ගෙරැවුම් වන්නේ ය, සඳහිරුන් ද තරුත් තරුන් ද උදුව, බැසීම, කෙලෙසීම, පිරිසිදුව වන්නේ ය, චන්ද්‍රග්‍රහණය ලොවට මෙබඳු පල ගෙනැ දෙන්නේ ය, සූර්‍යග්‍රහණය මෙබඳු පල ගෙනැ දෙන්නේ ය, නක්ෂත්‍රග්‍රහණය මෙබඳු පල ගෙනැ දෙන්නේය. සඳහිරු දෙදෙනාගේ මඟින් යැම මෙබඳු පල ගෙනැ දෙන්නේය. සඳහිරු දෙදෙනාගේ නොමඟින් යැම මෙබඳු පල ගෙනැ දෙන්නේ ය, තරුත් තරුවල පථගමනය මෙබඳු පල ගෙනැ දෙන්නේ ය, ඔවුන්ගේ උත්පථගමනය මෙබඳු පල ගෙනැ දෙන්නේ ය, උල්කාපතනය මෙබඳු පල ගෙනැ දෙන්නේ ය, දිග්දාහය මේ බඳු පල ගෙනැ දෙන්නේ ය, භූමිකම්පනය මෙබඳු පල ගෙනැ දෙන්නේ ය, වැසි නැති වැ අහස් ගෙරැවුම මෙබඳු පල ගෙනැ දෙන්නේ ය, සඳ හිරුන්ගේ ද තරුත් තරුවල ද උදුවත් බැසීමත් කෙලෙසීමත් පිරිසිදු වීමත් මෙබඳු මෙබඳු පල ගෙනැ දෙන්නේ යැ "යි කියනුවෝ, මෙබඳු තිරශ්චීන විද්‍යයෙන්, මෙබඳු මිථ්‍යාජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ තෙමේ මේ හෝ මෙබඳු වූ තිරශ්චීනවිද්‍යයෙන් මිථ්‍යාජීවිකායෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහු ගේ ශීලය වේ.

50 යම්සේ ඇතැම් භවත් මහණ බමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, 'මෙ සමයෙහි වැසි වස්නේ ය, මෙ සමයෙහි නියඟ වන්නේ ය, මෙ සමයෙහි රට සුභික්ෂ වන්නේ ය, මෙ සමයෙහි රට දුර්භික්ෂ වන්නේ ය, මෙ සමයෙහි රටට උවදුරු නැති වන්නේ ය, මෙ සමයෙහි රටට උවදුරු ඇති වන්නේ ය, මෙ කලැ රෝග වන්නේ ය, මෙ කලැ රෝග නැති බව වන්නේ යැ' යි පලාපල කීම ද, මුද්‍රා, ගණනා, සංඛ්‍යාන, කාව්‍යශාස්ත්‍ර, ලෝකායතශාස්ත්‍ර යන මේ හෝ මෙබඳු තිරශ්චීන විද්‍යයෙන්, මිථ්‍යාජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ තෙමේ මේ හෝ අන් මෙබඳු වූ හෝ තිරශ්චීනවිද්‍යයෙන්, මිථ්‍යාජීවයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහු ගේ ශීලය වේ.

51. යම්සේ ඇතැම් භවත් මහණ බමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, ආවාහ සඳහා නකත් කීම, විවාහ සඳහා නකත් කීම, වෙන් වූ අඹු සැමියන් එක් වන්නට නකත් කීම, දුන් ණය රැස් කිරීමට නකත් කීම, මුදල් ණයට පොලියට දීමට නකත් කීම, සෞභාග්‍යය ඇති කිරීමට යන්ත්‍රමන්ත්‍රාදිය කැරැ දීම, කිමි පාලු කරන හැදි ඛුනියම් කිරීම, තැසෙන්නට යන දරැගබ් රැකෙන්නට පිළිගම් කිරීම, දිවගුළු බැඳීම, මන්ත්‍රාදි බලයෙන් හඬ තද කිරීම, අත් පෙරැළෙන්නට මතුරැ දැපීම, කන් අඟුළු වැටෙන්නට මතුරැ දැපීම, කැඩපතෙහි දේවතාවෙශය කොට ප්‍රශ්න ඇසීම, කුමරියක ලවා පේන කියැවීම, දෙවදැස්සක ලවා පේන කියැවීම, ජීවිකා පිණිස හිරු පිදීම, මහබඹු පිදීම, මතුරැ දපා මුවෙන් ගිනි ජල් විහිදුවීම, මතුරැ දපා සිරිකත කැඳවීම යන මෙබඳු වූ තිරශ්චීන විද්‍යවෙන්, මිථ්‍යාජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ තෙමේ මේ ද අන් මෙබඳු වූ ද තිරශ්චීනවිද්‍යයෙන්, මිථ්‍යාජීවයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලය වෙයි.

52. යථා වා පනෙකෙ හොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති – සෙය්‍යථිදං: සන්තිකම්මං පණිධිකම්මං භූරිකම්මං වස්සකම්මං වොස්සකම්මං වත්ථුකම්මං වත්ථුපරිකිරණං ආචමනං නහාපනං ජ්‍රහනං වමනං විරෙචනං උද්ධවිරෙචනං අධොවිරෙචනං සීසවිරෙචනං කණ්ණතෙලං නෙත්තපත්තපානං නත්ථුකම්මං අඤ්ජනං පච්චඤ්ජනං සාලාකියං සල්ලකත්තියං දාරකත්තිකිච්ඡා මූලභෙසජ්ජානං අනුප්පදානං ඔසධීනං පටිමොක්ඛො. ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

53. අථ ඛො සො අම්බට්ඨ භික්ඛු එවං සීලසම්පන්නො න කුතොචි භයං සම්නුපස්සති යදිදං සීලසංවරතො. සෙය්‍යථාපි අම්බට්ඨ ඛත්තියො මුද්ධාවසිත්තො හතපච්චාමිත්තො න කුතොචි භයං සම්නුපස්සති යදිදං පච්චත්තිකතො, එවමෙව ඛො අම්බට්ඨ භික්ඛු එවං සීලසම්පන්නො න කුතොචි භයං සම්නුපස්සති යදිදං සීලසංවරතො. සො ඉමිනා අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො අජ්ඣත්තං අනවජ්ජසුඛං පටිසංවෙදෙති. එවං ඛො අම්බට්ඨ භික්ඛු සීලසම්පන්නො හොති.

54. කථඤ්ච අම්බට්ඨ භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති? ඉධ අම්බට්ඨ භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං චක්ඛින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා – දෙමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං තස්ස සංවරාය පටිපජ්ජති රක්ඛති චක්ඛින්ද්‍රියං, චක්ඛින්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සොතෙන සද්දං සුත්වා –පෙ– ඝානෙන ගන්ධං ඝායිත්වා –පෙ– ජිව්හාය රසං සායිත්වා –පෙ– කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා –පෙ– මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදෙමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති රක්ඛති මනින්ද්‍රියං. මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සො ඉමිනා අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො අජ්ඣත්තං අබ්‍යාසෙකසුඛං පටිසංවෙදෙති. එවං ඛො අම්බට්ඨ භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති.

52. යම්සේ ඇතැම් හවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, ශාන්තිකම්, ප්‍රණීතිකම්, හුරිකම්, පණ්ඩිකයා පිරිමියකු කිරීම, පිරිමියා පණ්ඩිකයකු කිරීම, වාස්තුකම්, වාස්තුපරිකිරණ, මතුරු දපා බුව දෙවීම, මතුරු දපා අනුත් නැවීම, අනුනට සෙත් පතා ගිනි පිදීම, ගිහියනට වමිත කරවීම, ඛඩ විරේක කරවීම, ලය විරේක කරවීම, වස්ති කිරීම, ශීර්ෂ විරේචන බේත් දීම, කන් ලෙඩට තෙල් පිසැ දීම, ඇසැ සිසිල ගන්වන බේත් තෙල් පිසීම, ගිහියනට නස්‍ය කිරීම, ඇස පවලයට කාරම් අඳුන් සාදා දීම, ඇසැ සිසිල ගන්වන අඳුන් සාදා දීම, ඇසැ උල්ඇණ ලෙඩට බේත් දීම, ශල්‍යකම් කිරීම, ලදරුවන්ගේ ලෙඩවලට පිළියම් කිරීම, මුල්බෙහෙත් දීම, කාරම්බේත් බැඳ වණ සුව වූ පසු ඒ වා ගලවා දැමීම" යැ සි මේ ආදි වූ තිරශ්චීනවිද්‍යයෙන්, මිථ්‍යාජීවයෙන් දිවි පවත්වන්ද, ඒ මහණ තෙමේ ඒ සියල්ලෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලය වේ.

53. අම්බට්ඨය, ඉක්බිති ඒ මහණ තෙමේ මෙසේ සිල්වත් වූයේ, ශීලසංවර හේතුයෙන්, කිසි ම එක ද අසංවරයෙකින් පහළ වියැ හැකි බියක් නො දකී. අම්බට්ඨය, ක්ෂත්‍රියාභිෂේකයෙන් බුදුනැ අභිෂේක ලත්, වැනැසුණු සතුරන් ඇති, ක්ෂත්‍රියයෙක් කිසි ම එක ද සතුරකුගෙන් වියැ හැකි මෙන ම බියකුත් යම්සේ නො දක්නේ ද, අම්බට්ඨය, එසේ ම මහණ තෙමේ මෙ පරිද්දෙන් සිල්වත් වූයේ, (තමාගේ ඒ) ශීල-සංවර හේතුයෙන් කිසි එක ද අසංවරයකින් ඉපැදියැ හැකි බියක් නො දකී. හේ මේ ආදී ශීලස්කන්ධයෙන් සමන්විත වූයේ, සිය සතන්හි නිරෝග වූ කායික මානසික සුවය විඳී. අම්බට්ඨය, මහණ තෙමේ මෙසේ සිල්වත් වෙයි.

54. අම්බට්ඨය, මහණ තෙමේ කෙසේ නම් ඉඳුරන්හි වැසූ දොර ඇත්තේ වේ ද? යත්: අම්බට්ඨය, මෙ සස්නෙහි මහණ තෙමේ ඇසින් රූපයක් දැක, ශුභාදි වශයෙන් එහි ලකුණු නො ගන්නේ වේ. ශුභාදි වශයෙන් අත්-පා ඇ අවයවවල අගුරු සිතට නො ගන්නේ වේ. යම් කරුණෙකින් චක්ෂුරිඳ්‍රියය වසා නො ගෙන වසන්නහු ගේ චිත්තසන්තානයට විෂම ලෝභ දෙම්නස් ආදි ලාමක අකුශල ස්වභාවයෝ නැවැත නැවැත වැස්සෙන්නාහු ද, එහි සංවරය පිණිස හේ පිළිපදී. ඒ චක්ෂුරිඳ්‍රියය හේ රකී. ඒ චක්ෂුරිඳ්‍රියයෙහි සංවරයට පැමිණේ. කනින් ශබ්ද අසා...නැහැයෙන් ගඳ ආඝ්‍රාණය කොට...දිවෙන් රස ආස්වාදය කොට...කයින් ස්ප්‍රෂ්ටව්‍ය ස්පර්ශ කොට...සිතින් දහම් අරමුණු දැන, ශුභාදි වශයෙන් එහි ලකුණු ගන්නේ නො වේ. යම් කරුණෙකින් ශ්‍රෝත්‍රේන්ද්‍රියය...ඝ්‍රාණේන්ද්‍රියය... ජිහ්වේන්ද්‍රියය...කායේන්ද්‍රියය...මනඉන්ද්‍රියය සංවර කොට නොගෙන වසන්නහු ගේ චිත්තසන්තානයට විෂම ලෝභය දෙම්නස ආදි ලාමක අකුශල ධර්මයෝ නැවත නැවත වැස්සෙන්නෝ ද, ඒ ශ්‍රෝත්‍රේන්ද්‍රියයාගේ...ඝ්‍රාණේ-න්ද්‍රියයාගේ...ජිහ්වේන්ද්‍රියයාගේ...මන ඉන්ද්‍රියයාගේ සංවරය පිණිස පිළිපදී. ශ්‍රෝත්‍ර...ඝ්‍රාණ...ජිහ්වා...කාය...මනඉන්ද්‍රියය රකී. එහි සංවරයට පැමිණේ. හේ මේ ආදී වූ ඉන්ද්‍රියසංවරයෙන් සමන්විත වූයේ සිය සතන්හි අව්‍යාසේක සුඛය විඳී. අම්බට්ඨය, මෙසේ මහණ තෙමේ ඉන්ද්‍රියයන්හි වැසූ දොර ඇත්තේ වේ.

55. කථඤ්ච අම්බට්ඨ භික්ඛු සතිසම්පජඤ්ඤේන සමන්නාගතො හොති? ඉධ අම්බට්ඨ භික්ඛු අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී හොති, ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති, සමිඤ්ජිතෙ පසාරිතෙ සම්පජානකාරී හොති, සඞ්ඝාටිපත්තචීවරධාරණෙ සම්පජානකාරී හොති, අසිතෙ පීතෙ ඛායිතෙ සායිතෙ සම්පජානකාරී හොති, උච්චාර-පස්සාවකම්මෙ සම්පජානකාරී හොති, ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ සම්පජානකාරී හොති. එවං ඛො අම්බට්ඨ භික්ඛු සතිසම්පජඤ්ඤේන සමන්නාගතො හොති.

56. කථඤ්ච අම්බට්ඨ භික්ඛු සන්තුට්ඨො හොති?

ඉධ අම්බට්ඨ භික්ඛු සන්තුට්ඨො හොති කායපරිහාරිකෙන චීවරෙන කුච්ඡිපරිහාරිකෙන පිණ්ඩපාතෙන. සො යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති. සෙය්‍යථාපි අම්බට්ඨ පක්ඛී සකුණො යෙන යෙනෙව ඩෙති සපත්තභාරොව ඩෙති, එවමෙව ඛො අම්බට්ඨ භික්ඛු සන්තුට්ඨො හොති කායපරිහාරිකෙන චීවරෙන කුච්ඡිපරිහාරිකෙන පිණ්ඩපාතෙන. සො යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති. එවං ඛො අම්බට්ඨ භික්ඛු සන්තුට්ඨො හොති.

57. සො ඉමිනා ච අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො ඉමිනා ච අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො ඉමිනා ච අරියෙන සති-සම්පජඤ්ඤේන සමන්නාගතො ඉමාය ච අරියාය සන්තුට්ඨියා සමන්නාගතො විවිත්තං සෙනාසනං භජති අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං. සො පච්ඡාභත්තං පිණ්ඩපාත-පටික්කන්තො නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා.

58. සො අභිජ්ඣං ලොකෙ පහාය විගතාභිජ්ඣෙන චෙතසා විහරති අභිජ්ඣාය චිත්තං පරිසොධෙති. බ්‍යාපාදපදොසං පහාය අබ්‍යාපන්නචිත්තො විහරති සබ්බපාණභූතහිතානුකම්පී, බ්‍යාපාදපදොසා චිත්තං පරිසොධෙති. ථීනමිද්ධං පහාය විගතථීනමිද්ධො විහරති ආලොකසඤ්ඤී සතො සම්පජානො, ථීනමිද්ධා චිත්තං පරිසොධෙති. උද්ධච්චකුක්කුච්චං පහාය අනුද්ධතො විහරති අජ්ඣත්තං වූපසන්තචිත්තො, උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසොධෙති. විචිකිච්ඡං පහාය තිණ්ණවිචිකිච්ඡො විහරති අකථංකථී කුසලෙසු ධම්මෙසු, විචිකිච්ඡාය චිත්තං පරිසොධෙති.

55. අම්බට්ඨය, මහණ තෙමේ කෙසේ නම් සිහිනුවණින් යුත් වේ ද? යත්: අම්බට්ඨය, මෙ සස්නෙහි මහණ තෙමේ ඉදිරියට යෑමෙහි, පෙරළා නැවැත්මෙහි (ආපසු හැරීමෙහි) මනා නුවණින් දැන ම (එය) කරනුයේ වෙයි. ඉදිරි බැලීමෙහි, අනුදික් බැලීමෙහි මනා නුවණින් දැන ම කරනුයේ වෙයි. අත් පා ආදිය හැකිළීමෙහි දිගු කිරීමෙහි නුවණින් දැන ම කරනුයේ වෙයි. සඟළ සිවුර ද පාත්‍රය ද සෙසු සිවුරු ද දැරීමෙහි නුවණින් දැන ම කරන්නේ වෙයි. අහර ගැන්මෙහි පැන් පීමෙහි පිපිකැවිලි ආදිය කෑමෙහි, මිපැණි ආදිය රස විඳීමෙහි, නුවණින් දැන ම කරනුයේ වෙයි. මල මූ පහ කිරීමෙහි නුවණින් දැන ම කරනුයේ වෙයි. ගමනෙහි සිටුමෙහි හිඳුමෙහි නිදුමෙහි පිබිදුමෙහි කිණුමෙහි නොකිණුමෙහි නුවණින් දැන ම කරනුයේ වෙයි. අම්බට්ඨය, මෙසේ වනාහි මහණ තෙමේ සිහි නුවණින් යුත් වෙයි.

56. අම්බට්ඨය, මහණ තෙමේ කෙසේ නම් ලද පමණින් සතුටු වේ ද? යත්: අම්බට්ඨය, මෙ සස්නෙහි මහණ තෙමේ කායපරිහරණයට ප්‍රමාණ වූ සිවුරෙන් ද, කුක්ෂිපරිහරණයට ප්‍රමාණ වූ ආහාරයෙන් ද තෘප්ත වෙයි. හේ යම් යම් තැනකට නික්මෑ යේ ද, අවපිරිකර පමණක් ම ගෙන නික්ම යෙයි. අම්බට්ඨය, අත්තටු ඇති කුරුළු තෙමේ තමා පියා හඹා යන හැම තැනට ම පියාපත් බර සහිත ව ම යම්සේ පියාඹා ද, එසේ ම ඒ මහණ තෙමේ කායපරිහරණයට ප්‍රමාණ වූ සිවුරිනුත් කුක්ෂිපරිහරණයට ප්‍රමාණ වූ අහරිනුත් තෘප්ත වෙයි. හේ තමා යන යන තැනට පා සිවුරු ආදී අව පිරිකර පමණක් ම රැගෙන යෙයි. අම්බට්ඨය, මහණ තෙමේ මෙසේ තමා ලත් පසයෙහි (ලද පමණින්) සතුටු වෙයි.

57. අම්බට්ඨය, ඒ මහණ මේ ආර්‍ය ශීලසකාඛයෙන් සමන්විත වූයේ, මේ ආර්‍ය ඉන්ද්‍රියසංවරයෙන් ද...මේ ආර්‍ය සමෘතිසම්ප්‍රජන්‍යයෙන් ද...මේ ආර්‍ය සන්තුෂ්ටියෙන් ද සමන්විත වූයේ, අරණ්‍ය වෘක්ෂමූල පර්වත කන්දරැලි ගිරිගුහා සොහොන් වනපෙත් එළිමහන් පිදුරැලෙන් යන මෙ කී කිසි ජනශූන්‍ය සෙනස්තක් භජනය කෙරෙයි. හේ පිඬු සෙවීමට ගොස් පෙරළා ආයේ, පසුබත්හි පලක් බැඳ, උඩුකය කෙළින් තබා ගෙන, කමටහනට යොමු කොට සිහිය එළඹවා හිඳී.

58. හේ ලෝව කෙරෙහි අභිජ්ඣාව (ඇල්ම) හැර, ඇලුම් හළ සිතින් වෙසෙයි. ඇල්ම කෙරෙන් සිත පිරිසුදු කෙරෙයි. ව්‍යාපාද දෝෂය (තරහ) බැහැර කොට ව්‍යාපාදය රහිත සිතැත්තේ හැම පණ ඇති සතුන් කෙරේ හිතානුකම්පී වැ වෙසේ. ව්‍යාපාද දෝෂය කෙරෙන් සිත පිරිසිදු කෙරෙයි. ස්ත්‍යානමිද්ධය (තැතමිදුව) බැහැරැ කොට, පහ වූ ස්ත්‍යාන-මිද්ධය ඇත්තේ, දව රැ දෙක්හි ම දුටු එළිය හඳුනනු හැකි පිරිසිදු සංඥාව ඇත්තේ, සිහියෙනුත් නුවණිනුත් යුක්ත වැ වෙසෙයි. උද්ධච්චත් කුකුසත් සිතින් බැහැරැ ලා අනුද්ධත වැ සංහුන් සිත් සතන් ඇතියේ, උද්ධච්චත් කුකුස් දෙක කෙරෙන් සිත පිරිසිදු කෙරෙයි. සැකය බැහැරැ කොට, පහ වූ සැක ඇත්තේ, කුසල් දහමෙහි සැක නොකරනුයේ, සැකය කෙරෙන් සිත පිරිසිදු කෙරෙයි.

59. සෙය්‍යථාපි අම්බට්ඨ පුරිසො ඉණං ආදාය කම්මන්තෙ පයොජෙය්‍ය තස්ස තෙ කම්මන්තා සමිජ්ඣෙය්‍යුං, සො යානි ච පොරාණානි ඉණමූලානි තානි ච ඛ්‍යන්තීකරෙය්‍ය, සියා චස්ස උත්තරිං අවසිට්ඨං දාරභරණාය, තස්ස එවමස්ස: 'අහං ඛො පුබ්බෙ ඉණං ආදාය කම්මන්තෙ පයොජෙසිං තස්ස මෙ තෙ කම්මන්තා සමිජ්ඣිංසු සොඅහං යානි ච පොරාණානි ඉණමූලානි තානි ච ඛ්‍යන්තීඅකාසිං. අත්ථි ච මෙ උත්තරිං අවසිට්ඨං දාරභරණාය'ති. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං, අධිගච්ඡෙය්‍ය සොමනස්සං.

60. සෙය්‍යථාපි අම්බට්ඨ පුරිසො ආබාධිකො අස්ස දුක්ඛිතො බාළ්හ-ගිලානො, භත්තං චස්ස නච්ඡාදෙය්‍ය, න චස්ස කායෙ බලමත්ථා. සො අපරෙන සමයෙන තම්හා ආබාධා මුච්චෙය්‍ය භත්තඤ්චස්ස ඡාදෙය්‍ය සියා චස්ස කායෙ බලමත්ථා. තස්ස එවමස්ස: 'අහං ඛො පුබ්බෙ ආබාධිකො අහොසිං දුක්ඛිතො බාළ්හගිලානො භත්තං මෙ නච්ඡාදෙසි න චස්ස මෙ ආසි කායෙ බලමත්ථා. සොඅහි එතරහි තම්හා ආබාධා මුත්තො භත්තඤ්ච මෙ ඡාදෙති අත්ථි ච මෙ කායෙ බලමත්ථා'ති, සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං අධිගච්ඡෙය්‍ය සොමනස්සං.

61. සෙය්‍යථාපි අම්බට්ඨ පුරිසො බන්ධනාගාරෙ බද්ධො අස්ස, සො අපරෙන සමයෙන තම්හා බන්ධනාගාරා මුච්චෙය්‍ය සොත්ථිනා අබ්භයෙන, න චස්ස කිඤ්චි භොගානං වදෙය්‍ය. තස්ස එවමස්ස: 'අහං ඛො පුබ්බෙ බන්ධනාගාරෙ බද්ධො අහොසිං. සොඅහි එතරහි තම්හා බන්ධනාගාරා මුත්තො සොත්ථිනා අබ්භයෙන. නත්ථි ච මෙ කිඤ්චි භොගානං වදෙය්‍ය'ති. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං අධිගච්ඡෙය්‍ය සොමනස්සං.

62. සෙය්‍යථාපි අම්බට්ඨ පුරිසො දාසො අස්ස අනත්තාධීනො පරාධීනො න යෙනකාමඞ්ගමො. සො අපරෙන සමයෙන තම්හා දාසබ්‍යා මුච්චෙය්‍ය අත්තාධීනො අපරාධීනො භුජිස්සො යෙනකාමඞ්ගමො. තස්ස එවමස්ස: 'අහං ඛො පුබ්බෙ දාසො අහොසිං අනත්තාධීනො පරාධීනො න යෙන-කාමඞ්ගමො. සොඅහි එතරහි තම්හා දාසබ්‍යා මුත්තො අත්තාධීනො අපරාධීනො භුජිස්සො යෙනකාමඞ්ගමො'ති. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං, අධිගච්ඡෙය්‍ය සොමනස්සං.

59. අම්බට්ඨය, යම්සේ පුරුෂයෙක් ණය ගෙන කර්මාන්ත කරන්නේ ද, ඔහු ගේ කර්මාන්ත සමෘද්ධ වන්නේ නම්, යම් පරණ ණයක් ඇතොත් ඒ හැම ගෙවා නිම කරන්නේ ද, මත්තෙහි ඉතිරි යමක් ඇතොත් එය අඹුදරුවන් රකිනු පිණිස වන්නේ ද, එසේ වූ ඔහුට "මම මුල දී ණයට මුදල් ගෙන කර්මාන්ත කෙළෙමි. ඒ මගේ කර්මාන්ත සමෘද්ධ විය. ඒ මම, පරණ ණයක් වී නම්, ඒ හැම ගෙවා අවසන් කෙළෙමි. මත්තෙහිත් අඹුදරුවන් රක්නට ඉතිරි වූ මුදලෙක් මට ඇතැ"යි මෙසේ සිතෙක් වන්නේ ද, ඒ ණයෙන් මිදීම කරණ කොට ගෙන හෝ සතුට ලබන්නේ ය, සෞමනසට පැමිණෙන්නේ ය.

60. අම්බට්ඨය, යම්සේ මිනිසෙක් රෝගී වූයේ දුකට පැමිණියේ, දැඩි ලෙස ගිලන් වූයේ ද, ඔහුට ආහාරත් නො රිසියේ ද, ඔහු ගේ ඇඟ පතහි වාරු පමණකුත් නො වූයේ ද, ගේ මෑත කාලයෙහි ඒ ලෙඩින් මිදේ නම්, ඔහුට අහරත් රිසියේ නම්, ඔහු ඇඟපත වාරුත් ඇති වේ නම්, "මම වූ කලි පෙර දුකට පත්, දැඩි ගිලන් ලෙඩෙක් විමි. මට අහරත් නො රිසි විය. ඇඟපත වාරුත් නැති විය. ඒ මම දැන් ඒ ලෙඩින් මිදුණෙමි වෙමි. ඒ මට අහරත් රිසියෙයි. ඇඟපතත් වාරු ඇත්තේ යැ"යි මෙසේ සිතෙක් ඔහුට වන්නේ ද, ගේ ඒ කරුණින් සතුට ලබන්නේ ය, සෞමනසට පැමිණෙන්නේ ය.

61. අම්බට්ඨය, යම්සේ මිනිසෙක් හිර ගෙහි බැඳුණේ වන්නේ ද, ගේ පසු කලෙක ධන නො විසඳ පහසුවෙන් ඒ හිර ගෙන් මිදෙන්නේ ද, ඒ හෙයින් ඔහු ගේ කිසි භෝගවිනාශයෙක් නො වන්නේ ද, "මම වූ කලි පෙර හිර ගෙහි බැඳුණෙමි විමි, ඒ මම දැන් ධනය නොවිසඳ ලෙහෙසියෙන් ම එයින් මිදුණෙමි, මගේ භෝගයනට ද කිසි හානියෙක් නැතැ" යි ඔහුට මෙසේ සිතෙක් වන්නේ ද, ගේ ඒ කරුණින් සතුට ලබන්නේ ය, සෞමනසට පැමිණෙන්නේ ය.

62. අම්බට්ඨය, යම්සේ තමා අයත් පැවැතුම් නැති, පරා අයත් පැවැතුම් ඇති, කැමැති අතෙක යන්නට අවසර නැති දාස පුරුෂයෙක් වන්නේ ද, ගේ මෑත භාගයෙහි තමා අයත් පැවැතුම් ඇතිසේ, පරා අයත් පැවැතුම් නැත්තේ, නිදහස් වූයේ, කැමැති අතෙක යෑ හැකි වූයේ, ඒ දාසභාවයෙන් මිදෙන්නේ ද, එසේ වූ ඔහුට "මම වූ කලි පෙර තමා අයත් පැවැතුම් නැති, පරා අයත් පැවැතුම් ඇති, කැමැති අතෙක යෑ නො හැකි දාසයෙක් විමි. ඒ මම දැන් ඒ දාසභාවයෙන් මිදුණෙමි, තමා අයත් පැවැතුම් ඇත්තෙමි, පරා අයත් පැවැතුම් නැත්තෙමි නිදහස් වූයෙමි, කැමැති අතෙක යෑ හැකියෙමි වෙමි"යි මෙසේ සිතෙක් වන්නේ ද, ගේ ඒ කරුණින් සතුට ලබන්නේ ය, සෞමනසට පැමිණෙන්නේ ය.

63. සෙය්‍යථාපි අම්බට්ඨ පුරිසො සඩ්ඪතො සභොගො කන්තාරද්ධානමග්ගං පටිපජ්ජෙය්‍ය දුබ්භික්ඛං සප්පටිභයං. සො අපරෙන සමයෙන තං කන්තාරං නිත්ථරෙය්‍ය සොත්ථිතා ගාමන්තං අනුප්පාපුණෙය්‍ය ඛෙමං අප්පටිභයං. තස්ස එවමස්ස: 'අහං ඛො පුබ්බෙ සඩ්ඪතො සභොගො කන්තාරද්ධානමග්ගං පටිපජ්ජිං දුබ්භික්ඛං සප්පටිභයං. සො'මහි එතරහි තං කන්තාරං තිණ්ණො සොත්ථිනා ගාමන්තං අනුප්පත්තො ඛෙමං අප්පටිභය'න්ති. සො තතො නිදානං ලභෙථ පාමොජ්ජං අධිගච්ඡෙය්‍ය සොමනස්සං.

එවමෙව ඛො අම්බට්ඨ භික්ඛු යථා ඉණං යථා රොගං යථා බන්ධනාගාරං යථා දාසබ්‍යං යථා කන්තාරද්ධානමග්ගං එවං ඉමෙ පඤ්චනීවරණෙ අප්පහීනෙ අත්තනි සමනුපස්සති. සෙය්‍යථාපි අම්බට්ඨ ආනණ්‍යං යථා ආරොග්‍යං යථා බන්ධනා මොක්ඛං යථා භුජිස්සං යථා ඛෙමන්තභූමිං එවමෙව ඛො අම්බට්ඨ භික්ඛු ඉමෙ පඤ්චනීවරණෙ පහීනෙ අත්තනි සමනුපස්සති.

64. තස්සිමෙ පඤ්චනීවරණෙ පහීණෙ අත්තනි සමනුපස්සතො පාමොජ්ජං ජායති, පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායො පස්සම්භති, පස්සද්ධකායො සුඛං වෙදෙති, සුඛිනො චිත්තං සමාධියති.

65. සො විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්නෙති පරිසන්නෙති පරිපූරෙති පරිඵරති. නත්ථි කිඤ්චි සබ්බාවතො කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අඵුටං හොති.

66. සෙය්‍යථාපි අම්බට්ඨ දක්ඛො න්හාපකො වා න්හාපකන්තෙවාසී වා කංසථාලෙ න්හානීයචූණ්ණානි ආකිරිත්වා උදකෙන පරිප්පොසකං පරිප්පොසකං සන්නෙය්‍ය, සායං න්හානීයපිණ්ඩි සෙනෙහානුගතා සෙනෙහපරෙතා සන්තරබාහිරා ඵුටා සියා සෙනෙහෙන, න ච පග්ඝරිණී,

එවමෙව ඛො අම්බට්ඨ භික්ඛු ඉමමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්නෙති පරිසන්නෙති පරිපූරෙති පරිඵරති. නත්ථි කිඤ්චි සබ්බාවතො කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අඵුටං හොති. ඉදම්පි'ස්ස හොති චරණස්මිං.

67. පුනච පරං අම්බට්ඨ භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං සමාධිජෙන පීතිසුඛෙන අභිසන්නෙති පරිසන්නෙති පරිපූරෙති පරිඵරති නත්ථි කිඤ්චි සබ්බාවතො කායස්ස සමාධිජෙන පීතිසුඛෙන අඵුටං හොති,

63. අම්බට්ඨය, යම්සේ ධනවත් භෝගසම්පත් ඇති මිනිසෙක් කැම කිහ, උවදුරු ඇති, දියනැති, දික් මඟකට බස්නේ ද, හේ මඳ කලකට පසු යම්සේ ඒ දිය නැති පෙදෙස ඉක්මැ යත්නේ ද, උවදුරු නැති විපත් නැති ගමකට බස්නේ ද, එසේ වූ ඔහුට "මම් වූ කලි පෙර ධන ඇතියෙම්, භෝග සම්පත් ඇතියෙම්, දිය නැති කැම කිහ උවදුරු ඇති දික් මඟකට බවුයෙම්. ඒ මම දැන් සුවසේ ඒ කතර ඉක්මැවීම්. උවදුරු නැති බිය නැති ගමකට බවුයෙම් වෙම්"යි මේසේ සිතෙක් වත්නේ නම්, හේ එ කරුණින් සතුට ලබත්නේ ය, සොම්නසට පැමිණෙන්නේ ය. අම්බට්ඨය, එසේ ම මහණ තෙමේ ණයක් මෙන්, ලෙඩක් මෙන්, හිරගෙයක් මෙන්, කතරමඟක් මෙන් (පිළිවෙළින්) මේ පස නොවූ නීවරණ පස තමා කෙරෙහි දකී. ණයෙන් මිදුණු බව සේ, ලෙඩින් මිදුණු බව සේ, හිරගෙන් මිදුණු බව සේ, නිවහල් බව සේ, උවදුරු නැති තිම සේ පිළිවෙළින් මේ නීවරණ පස දුරු වීම තමා කෙරෙහි දකී.

64. මේ නීවරණ පස පහ වූවත් තමා කෙරෙහි දක්නා ඔහුට සතුට උපදී. සතුටු වූවාහට ප්‍රීතිය උපදී. සිතැ ප්‍රීතිය ඇත්තහුගේ නාම කය සන්හිඳේ. සන්හුත් නාම කය ඇත්තේ සුව විඳී. සුවැතියහු සිත එකඟ වේ.

65. හේ කාමයන්ගෙන් වෙන් වැ ම, සෙසු අකුසල් දහමුත් ගෙන් වෙන් වැ ම, විතර්කසහිත විචාරසහිත විවේකයෙන් උපන්, ප්‍රීතියත් සුවයත් ඇති පළමු වන ධ්‍යානය ලැබැ වෙසේ.

හේ මේ කය ම විවේකයෙන් උපන් පිති සුවයෙන් තෙමයි, හාත් පසින් තෙමයි, පුරා ලයි, හාත්පසින් සපයී කෙරෙයි. සියලු අඟ පසඟ ඇති ඔහුගේ ඒ මුළු කයෙහි ඒ විවේකයෙන් පිති සුවයෙන් පැතිරී නොගත් (සපයී නො කැරුණු) කිසි ද තැනෙක් නො වෙයි.

66. අම්බට්ඨය, යම්සේ දක්ෂ කිලිඟක් හෝ කිලිඟකු ගේ අතැවැස්සෙක් හෝ ලොහොතලියෙක නානසුණු බහා දිය ඉස ඉස පිඬු කරන්නේ ද, ඒ නාන සුණුපිඬ කාවැදුණු දිය ඇත්තේ, හැම තැන ම දියෙන් යුත් වූයේ, ඇතුළත පිටත සහිත වැ මුළුල්ල ම දියෙන් පැතිරී ගියේ, දියත් නො වගුරුවන්නේ වේ ද, අම්බට්ඨය, එසේම මහණ තෙමේ මේ කය ම විවේකයෙන් උපන් පිතිසුවයෙන් තෙමයි, හාත්පසින් තෙමයි, පුරා ලයි, හාත්පසින් සපයී කෙරෙයි. ඔහුගේ සියලු අඟ පසඟ ඇති මුළු කයෙහි විවේකජ ප්‍රීතිසුඛයෙන් පැතිරී වැද නොගත් කිසි ද තැනෙක් නො වෙයි. අම්බට්ඨය, මේ ද ඔහු ගේ චරණ ධර්මයෙක් වෙයි.

67. අම්බට්ඨය, තව ද මහණ තෙමේ විතර්ක විචාර සන්හිඳීමෙන් සිය සතන්හි උපන්, සිය සතන් පහදවන, සිතැ එකඟ බව ඇති, විතර්ක නැති, විචාරය නැති, සමාධියෙන් උපන්, පිතියත් සුවයත් ඇති, දෙවෙනි ධ්‍යානයට පැමිණ වෙසෙයි. හේ මේ කය ම සමාධියෙන් උපන් පිති සුවයෙන් තෙමයි, හාත්පසින් තෙත් කෙරෙයි, පුරාලයි, හැම තැන ම ස්පර්ශ කෙරෙයි. විවේකජ ප්‍රීතිසුඛයෙන් පැතිරී නොගත් කිසි ද තැනෙක් ඔහුගේ කයෙහි නො වෙයි.

68. සෙය්‍යථාපි අම්බට්ඨ උදකරහදෙ ගම්භීරෙ උබ්භිදෙදකෙ, තස්ස නෙවස්ස පුරත්ථිමාය දිසාය උදකස්ස ආයමුඛං, න දක්ඛිණාය දිසාය උදකස්ස ආයමුඛං, න පච්ඡිමාය දිසාය උදකස්ස ආයමුඛං, න උත්තරාය දිසාය උදකස්ස ආයමුඛං, දෙවො ච න කාලෙන කාලං සම්මා ධාරං අනුප්පවෙච්ඡෙය්‍ය, අථ ඛො තම්හා ච උදකරහදා සීතා වාරිධාරා උබ්භිජ්ජිත්වා තෙනෙව උදකරහදං සීතෙන වාරිනා අභිසන්දෙය්‍ය[1] පරිසන්දෙය්‍ය[2] පරිපූරෙය්‍ය පරිප්පූරෙය්‍ය, තස්ස කිඤ්චි සබ්බාවතො උදකරහදස්ස සීතෙන වාරිනා අප්පුටං අස්ස,

එවමෙව ඛො අම්බට්ඨ භික්ඛු ඉමිනෙව කායං සමාධිජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්පූරෙති. නත්ථි කිඤ්චි සබ්බාවතො කායස්ස සමාධිජෙන පීතිසුඛෙන අප්පුටං හොති. ඉදම්පි'ස්ස හොති චරණස්මිං.

69. පුනච්චපරං අම්බට්ඨ භික්ඛු පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති සතො සම්පජානො, සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති, යන්තං අරියා ආචික්ඛන්ති: උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති තං තතියං ඣානං උපසම්පජ්ජ විහරති.

සො ඉමිනෙව කායං නිප්පීතිකෙන සුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්පූරෙති, නත්ථි කිඤ්චි සබ්බාවතො කායස්ස නිප්පීතිකෙන සුඛෙන අප්පුටං හොති.

සෙය්‍යථාපි අම්බට්ඨ උප්පලිනියං වා පදුමිනියං වා පුණ්ඩරීකිනියං වා අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවද්ධානි උදකානුග්ගතානි අන්තොනිමුග්ගපොසීනි තානි යාව චග්ගා යාව ච මූලා සීතෙන වාරිනා අභිසන්නානි පරිසන්නානි[3] පරිපූරානි පරිප්පූටානි තස්ස කිඤ්චි සබ්බාවතො උප්පලානං වා පදුමානං වා පුණ්ඩරීකානං වා සීතෙන වාරිනා අප්පුටං අස්ස,

එවමෙව ඛො අම්බට්ඨ භික්ඛු ඉමිනෙව කායං නිප්පීතිකෙන සුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්පූරෙති නත්ථි කිඤ්චි සබ්බාවතො කායස්ස නිප්පීතිකෙන සුඛෙන අප්පුටං හොති. ඉදම්පි'ස්ස හොති චරණස්මිං.

70. පුනච්චපරං අම්බට්ඨ භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමිනෙව කායං පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන ඵරිත්වා නිසින්නො හොති නත්ථි කිඤ්චි සබ්බාවතො කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අප්පුටං හොති.

සෙය්‍යථාපි අම්බට්ඨ පුරිසො ඔදාතෙන වත්ථෙන සසීසං පාරුපිත්වා නිසින්නො අස්ස, නත්ථි කිඤ්චි සබ්බාවතො කායස්ස ඔදාතෙන වත්ථෙන අප්පුටං අස්ස, එවමෙව ඛො අම්බට්ඨ භික්ඛු ඉමිනෙව කායං පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන ඵරිත්වා නිසින්නො හොති නත්ථි කිඤ්චි සබ්බාවතො කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අප්පුටං හොති. ඉදම්පි'ස්ස හොති චරණස්මිං.

ඉදං ඛො තං අම්බට්ඨ චරණං.

---

1. අභිසඤ්ඤෙය්‍ය, මජ්ඣං. 2. පරිසඤ්ඤෙය්‍ය, මජ්ඣං.
3. අභිසන්නානි පරිසන්නානි, මජ්ඣං අභිසන්දිතානි පරිසන්දිතානි?

68. අම්බට්ඨය, යම්සේ යටැ උල්පතින් මතු වන දිය ඇති ගැඹුරු විලෙක් වේ ද, එයට පෙර දෙසින් දිය වදනා මඟෙක් නො වන්නේ ද, දකුණු දෙසින්...පැසිම් දෙසින්...උතුරු දෙසින් දිය වදනා මඟෙක් නො වන්නේ ද, වැස්ස ද කලින් කල නිසි පරිදි නො වස්නේ ද, එතෙකුදු වුවත් ඒ දියවිලෙන් සිසිල් දිය දහර මතු වී ඒ දිය විල ම සිසිල් දියෙන් තෙමන්නේ ද, හාත්පසින් තෙමන්නේ ද, පුරා ලන්නේ ද, හැම තැන ම වැද ගෙන පැතිරී සිටින්නේ ද, ඒ මුළු දිය-විලෙහි සිසිල් දියෙන් නො පැතුරුණු කිසි ද තැනෙක් නො මැත්තේ ද, අම්බට්ඨය, එසේ ම මහණ තෙමේ මේ කය ම සමාධියෙන් උපන් පිති-සුවයෙන් තෙමයි. හැම තැන ම තෙත් කෙරෙයි. පුරා ලයි. පිති සුවයෙන් හැම තැන ම ස්පර්ශ කෙරෙයි. ඔහුගේ ඒ සියලු කයේ සමාධියෙන් උපන් පිතිසුවයෙන් නො පැතිර ගිය කිසි ද තැනෙක් නො වෙයි. මේ ද ඔහුගේ චරණධර්මයක් වේ.

69. අම්බට්ඨය, තව ද මහණ තෙමේ ප්‍රීතිය ද සංහිදීමෙන් උපේක්ෂා-යෙන් ද සුක්ත වැ සිහියෙන් හා නුවණින් හා සුතු වැ වෙසෙයි. සුවය ද කයින් විඳී. ආර්‍යයෝ යම් ඒ ධ්‍යානයක් කරණ කොට ගෙන ධ්‍යානලාභියා ඇරැබැ 'උපේක්ෂාව ඇත්තේ ය, සිහි ඇත්තේ ය, සුව වුසුම් ඇත්තේ යැ'යි කියත් ද, එසේ වූ තෙවැනි ධ්‍යානය ලැබ හේ වෙසේ.

හේ මේ කය ම නිරාප්‍රීතික සුඛයෙන් තෙමයි, හාත්පසින් තෙත් කෙරෙයි, පුරා ලයි, හැම තැන ම ස්පර්ශ කෙරෙයි. ඔහුගේ කයෙහි ඒ නිරාප්‍රීතික සුඛයෙන් පැතිර නොගිය කිසි ද තැනෙක් නො වෙයි.

අම්බට්ඨය, යම්සේ උපුල්විලෙක හෝ පියුම්විලෙක හෝ පඬෙර විලෙක හෝ ඇතැම් උපුල් හෝ පියුම් හෝ පඬෙර හෝ දියෙහි උපන්නේ, දියෙහි වැඩුණේ, දියෙන් නො නැඟුණේ, දිය තුළැ ම ගිලී වැඩෙනුයේ ද, ඒ හැම අග දක්වාත් මූල දක්වාත් සිසිල් දියෙන් තෙමුණේ හාත්-පසින් තෙත් වූයේ, පිරී ගියේ, හැම තැන් ම වැදගත්තේ වේ ද, ඒ විලෙහි සියලු උපුල්වලැ හෝ පියුම්වලැ හෝ පඬෙරවලැ හෝ සිසිල් දියෙන් වැද නොගත් තැනෙක් නොමැත්තේ ද, අම්බට්ඨය, එ සේ ම මහණ තෙමේ මේ කය ම නිර්ප්‍රීතික සුඛයෙන් තෙමයි, හාත්පසින් තෙමයි, පුරාලයි, ඔහු සියලු කයෙහි එයින් හාත්පසින් පැතිරී වැද නොගත් කිසි ද තැනෙක් නො වෙයි. මේ ද ඔහුගේ චරණධර්මයක් වෙයි.

70. තව ද අම්බට්ඨය, මහණ තෙමේ සුඛවේදනාවත් දුරු කිරීමෙන් දුඃඛ වේදනාවත් දුරු කිරීමෙන් පළමු කොට ම සොම්නස් දොම්නස් දෙක පහ වීමෙන්, දුක් ද නොවූ, සුව ද නොවූ, උපේක්ෂා සමෘති යන මොවුන් හේ පිරිසිදු බව ඇති සිවු වන ධ්‍යානය ලැබ වෙසෙයි. හේ මේ කය ම පිරිසිදු පැහැසර සිතින් පැතිරී වැද ගෙන හුන්නේ වෙයි.

ඔහු මුළු කයෙහි පිරිසිදු පැහැසර සිතින් පැතිරී වැද නොගෙන සිටි කිසි ද තැනෙක් නො වෙයි.

යම්සේ පුරුෂයෙක් සුදු වතින් හිස සහිත වැ වසා ගෙන හුන්නේ වේ නම්, ඔහුගේ සියලු කයෙහි සුදු වතින් නො වැසුණු කිසිදු තැනෙක් නො වන්නේ ද, අම්බට්ඨය, එසේ ම මහණ තෙමේ මේ කය ම පිරිසිදු පැහැසර සිතින් පැතිරී වැද ගෙන නොසිටි කිසි ද තැනෙක් නො වෙයි. මේ ද ඔහුගේ චරණධර්මයක් වේ.

71. [පුන ච පරං අම්බට්ඨ] සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ඤාණදස්සනාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො එවං පජානාති: අයං ඛො මෙ කායො රූපී චාතුම්මහාභූතිකො මාතාපෙත්තිකසම්භවො ඔදනකුම්මාසූපචයො අනිච්චුච්ඡාදනපරිමද්දන-භෙදනවිද්ධංසනධම්මො. ඉදං ච පන මෙ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධන්ති.

සෙය්‍යථාපි අම්බට්ඨ මණි වෙළුරියො සුභො ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො අවෙජ්ඣ විප්පසන්නො අනාවිලො සබ්බාකාරසම්පන්නො, තත්‍රස්ස සුත්තං ආවුතං නීලං වා පීතං වා ලොහිතං වා ඔදාතං වා පණ්ඩුසුත්තං වා. තමෙනං චක්ඛුමා පුරිසො හත්ථෙ කරිත්වා පච්චවෙක්ඛෙය්‍ය: අයං ඛො මණි වෙළුරියො සුභො ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො අවෙජ්ඣ විප්පසන්නො අනාවිලො සබ්බාකාරසම්පන්නො. තත්‍රිදං සුත්තං ආවුතං නීලං වා පීතං වා ලොහිතං වා ඔදාතං වා පණ්ඩුසුත්තං වා'ති.

එවමෙව ඛො අම්බට්ඨ භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ඤාණදස්සනාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො එවං පජානාති: අයං ඛො මෙ කායො රූපී චාතුම්මහාභූතිකො මාතාපෙත්තිකසම්භවො ඔදනකුම්මාසූපචයො අනිච්චුච්ඡාදනපරිමද්දන-භෙදනවිද්ධංසනධම්මො. ඉදං ච පන මෙ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධන්ති. ඉදම්පි'ස්ස හොති විජ්ජාය.

72. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ මනොමයං කායං අභිනිම්මිනනාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනොමයං සබ්බඞ්ගපච්චඞ්ගිං අහීනින්ද්‍රියං.

71. තව ද අම්බට්ඨය, මහණ තෙමේ මෙසේ එකඟ සිත පිරිසිදු වූ කල්හි, පැහැසර වූ කල්හි, අඛණ්ඩ රහිත කල්හි, විත්තෝපක්ලේශ දුරු වැ ගිය කල්හි, මොළොක් වූ කල්හි, විවසුන් බවුනට සුදුසු වූ කල්හි, සිත කල්හි, නිසල වූ කල්හි, විවසුන් නුවණ පිණිස සිත ඒ අතට යොමු කෙරෙයි. ඒ අතට නමා හරි. ගේ "මගේ කය වූ කලි රූපී ය, මහාභූත සතරින් නිපන්නේ ය, මාපියන්ගේ ශුක්‍රශෝණිතයෙන් පහළ වූයේ ය, බත් කොමු අහරින් වැඩුණේ ය, අනිසබව ද දුගඳ හරනුවට සුවඳ විලෙවුන් ඉළියැ සුතු බව ද, ලෙඩ දුරු ලනුවට පිරිමැදුම් කළ සුතු බව ද, එසේ කළ ද කිඳෙන බව ද විසිරෙන බව ද යන මේ ද සභාව කොටැත්තේ ය. මගේ මේ සිත ද මෙහි ලැග්ගේ ය, මෙහි බැඳුණේ යැ"යි මෙසේ දැනැ ගනී.

අම්බට්ඨය, යම්සේ සොඳුරු වූ පිරිසිදු ආකරයෙක පහළ වූ, අටැස් වූ, මොනොවට පිරියම් කරණ ලද, සිසුම් වූ, වෙසෙසින් පහත් වූ, පිරිසිදු වූ බෝවනාදි හැම අසුරින් සම්පූර්ණ වූ වෛඩූර්ය මණියක් වන්නේ ද, එහි නිල් වූ, රත් පැහැ වූ, රත් පැහැ වූ, සුදු පැහැ වූ හෝ පඬු පැහැ වූ හුයෙක් අවුනන ලදුයේ වන්නේ ද, එය ඇස් ඇති පුරුෂයෙක් අතෙහි තබා ගෙන "මේ වූ කලි සොඳුරු වූ, පිරිසිදු ආකරයෙහි උපන්, අටැස්, මොනොවට පිරියම් කැරුණු, සිසුම්, වෙසෙසින් පහත්, පිරිසිදු, බෝවනාදි හැම අසුරින් සම්පූර්ණ වූ වෛඩූර්ය මණියක. මෙහි නිල්වත් රත්වත්, සුදුවත්, රත්වත් වූ මේ හුයෙක් අවුනන ලදුයේ වේ" යැ යි සලකා බලන්නේ ද, අම්බට්ඨය, එ පරිද්දෙන් ම මහණ තෙමේ මෙසේ සමාධිගත සිත පිරිසිදු වූ කල්හි, පැහැසර වූ කල්හි, කෙලෙස් යට පත් කල්හි, උපක්ලේශ පත වූ කල්හි, මොළොක් වූ කල්හි, කර්මණ්‍යත්ව කල්හි, සිත කල්හි, නිසල වූ කල්හි, විවසුන් නුවණ පිණිස සිත යොමු කෙරෙයි, එය අතට නමා හරියි. එසේ වූ හෙ තෙම "මගේ මේ කය වූ කලි රූපී ය, සතර මහාභූතයන්ගෙන් හැදුණේ ය, මාපියන්ගේ ශුක්‍ර ශෝණිතයෙන් උපන්නේ ය, බත් කොමු ඇ අහරින් වැඩුණේ ය, අනිස බව ද දුගඳ හරනට සුවඳ විලෙවුන් ඉළියැ සුතු බව ද, ලෙඩ දුරු ලනුවට පිරිමැදුම් ඇ කළ සුතු බව ද, එය කලත් කිඳෙන බව ද, විසිරෙන බව ද යන මේ ද සභාවය කොට ඇත්තේ ය, මගේ මේ සිත ද මෙහි ලැග ගත්තේ ය, මෙහි බැඳුණේ යැ "යි මෙසේ දැන ගනී. මේ ද ඔහුගේ විදැවෙක් වෙයි.

72. ගේ මෙසේ සමාහිත සිත පිරිසිදු කල්හි, දීප්ත කල්හි, අංගණ (කෙලෙස්) රහිත කල්හි, උපක්ලේශ විගත කල්හි, මෘදු වූ කල්හි, සෘද්ධි ඉපැදවීමට යෝග්‍ය කල්හි, සිටි කල්හි, නිශ්චල බවට පත් කල්හි මනෝමය ශරීරයක් මවා පානු පිණිස සිත යොමු කෙරෙයි, නැඹුරු කෙරෙයි. ගේ මේ සිරිරෙන් රූපී වූ, හැම අඟපසඟින් යුත්, අවිකල ඉඳුරන් ඇති මනෝමය ශරීරයක් මවා පායි.

සෙය්‍යථාපි අම්බට්ඨ පුරිසො මුඤ්ජමහා ඊසිකං පබ්බාහෙය්‍ය. තස්ස එවමස්ස: අයං මුඤ්ජෝ, අයං ඊසිකා, අඤ්ඤො මුඤ්ජෝ, අඤ්ඤා ඊසිකා, මුඤ්ජමහාතෙව ඊසිකා පබ්බාළ්හා'ති. සෙය්‍යථා වා පන අම්බට්ඨ පුරිසො අසිං කොසියා පබ්බාහෙය්‍ය, තස්ස එවමස්ස: අයං අසි, අයං කොසි, අඤ්ඤො අසි, අඤ්ඤා කොසි, කොසියා තෙව අසි පබ්බාළ්හා'ති. සෙය්‍යථා වා පන අම්බට්ඨ පුරිසො අහිං කරණ්ඩා උද්ධරෙය්‍ය, තස්ස එවමස්ස: අයං අහි, අයං කරණ්ඩො, අඤ්ඤො අහි, අඤ්ඤා කරණ්ඩො, කරණ්ඩාතෙව අහි උබ්භතො'ති. එවමෙව ඛො අම්බට්ඨ භික්ඛු එවංසමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ මනොමයං කායං අභිනිම්මිනනාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො ඉම්මහා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනොමයං සබ්බඞ්ගපච්චඞ්ගිං අහීනින්ද්‍රියං. ඉදම්පි'ස්ස හොති විජ්ජාය.

73. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති, අභිනින්නාමෙති. සො අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති: එකො'පි හුත්වා බහුධා හොති, බහුධාපි හුත්වා එකො හොති, ආවිභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡති සෙය්‍යථාපි ආකාසෙ. පඨවියා පි උම්මුජ්ජනිමුජ්ජං කරොති සෙය්‍යථාපි උදකෙ. උදකෙ'පි අභිජ්ජමානෙ ගච්ඡති සෙය්‍යථාපි පඨවියං. ආකාසෙ'පි පල්ලඞ්කෙන කමති සෙය්‍යථාපි පක්ඛි සකුණො. ඉමෙ'පි චන්දිමසූරියෙ එවංමහිද්ධිකෙ එවංමහානුභාවෙ පාණිනා පරිමසති පරිමජ්ජති. යාව බ්‍රහ්මලොකා'පි කායෙන වසං වත්තෙති.

සෙය්‍යථාපි අම්බට්ඨ දක්ඛො කුම්භකාරො වා කුම්භකාරන්තෙවාසී වා සුපරිකම්මකතාය මත්තිකාය යං යදෙව භාජනවිකතිං ආකඞ්ඛෙය්‍ය තං තදෙව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය. සෙය්‍යථා වා පන අම්බට්ඨ දක්ඛො දන්තකාරො වා දන්තකාරන්තෙවාසී වා සුපරිකම්මකතස්මිං දන්තස්මිං යං යදෙව දන්තවිකතිං ආකඞ්ඛෙය්‍ය තං තදෙව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය. සෙය්‍යථා වා පන අම්බට්ඨ දක්ඛො සුවණ්ණකාරො වා සුවණ්ණකාරන්තෙවාසී වා සුපරිකම්මකතස්මිං සුවණ්ණස්මිං යං යදෙව සුවණ්ණවිකතිං ආකඞ්ඛෙය්‍ය තං තදෙව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය, එවමෙව ඛො අම්බට්ඨ භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති.

අම්බට්ඨය, යම්සේ පුරුෂයෙක් මුදු තණ ගසෙකින් තණ කුර (=තණ ගොබය) ඇද මෑත් කරන්නේ ද, ඔහුට 'මේ මුදු තණ ගස ය, මේ එහි තණ ගොබ ය, තණ ගස එකෙකි, එහි ගොබය අනෙකෙකි, මුදු තණ ගසෙන් ම එහි ගොබය මෑත් කරන ලද'යි මේසේ සිතෙක් වන්නේ ද, අම්බට්ඨය, යම්සේ වූ කලි පුරුෂයෙක් කඩුවක් කොපුවෙන් ඇද මෑත් කරන්නේ ද, ඔහුට "මේ කඩුව ය, මේ කොපුව ය, කඩුව එකෙක, කොපුව අනෙකෙක, කොපුයෙන් ම කඩුව ඇද මෑත් කරණ ලද"යි මෙසේ සිතෙක් වන්නේ ද, අම්බට්ඨය, යම්සේ වනාහි පුරුෂයෙක් තයකු සැවයෙන් ඇද වෙන් කරන්නේ ද, ඔහුට 'මේ නයා ය, මේ සැවය ය, නයා එකෙක, සැවය අනෙකෙක, සැවයෙන් ම නයා ඇද වෙන් කරණ ලද'යි මේසේ සිතෙක් වන්නේ ද, අම්බට්ඨය, එසේ ම මහණ තෙමේ මෙ පරිද්දෙන් සමාධිගත සිත පිරිසිදු වූ කල්හි, දීප්තිමත් කල්හි, කෙලෙස් පහ වූ කල්හි, උපක්ලේශ දුරු වූ කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍යතා කල්හි, සිටි කල්හි, නිශ්චලබවට පත් කල්හි, මනෝමය කයක් මවනු පිණිස සිත නොමු කෙරෙයි, නැඹුරු කෙරෙයි. එසේ වූ හේ මේ සිරිරෙන් රූපී වූ, මනෝමය වූ, සියලු අඟපසඟින් යුත්, අවිකල ඉඳුරන් ඇති අන් සිරුරක් මවා පායි. මේ ද ඔහුගේ විදූවෙක් වෙයි.

73. හේ මෙසේ සමාහිත සිත පිරිසිදු වූ කල්හි, දීප්තිමත් කල්හි, කෙලෙස් රහිත වූ කල්හි, උපක්ලේශ පහ වැ ගිය කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍යතා කල්හි, ස්ථිත කල්හි, නිශ්චල බවට පත් කල්හි, ඍද්ධිවිධඥානය පිණිස (අභිඥාදක) පරිකර්ම සිත මෙහෙයයි, නැඹුරු කෙරෙයි. එසේ වූ හේ නොයෙක් වැදැරුම් ඍද්ධිවිධ යලි යලිත් පසක් කෙරෙයි (ලබයි). පියෙවියෙන් එකෙක් ව ම සිට බහුප්‍රකාර ද වී යලි එකෙක් වෙයි. තෙමේ පෙනී සිටී, නොපෙනී සිටී. බිත්තියෙන්, පවුරෙන්, පර්වතයෙන් පිටතට අහසෙහි මෙන් කිසිවෙකැ නො ගැටී විනිවිද යෙයි. දියෙහි මෙන් පොළොවෙහිත් මතු වීමත් හිලීමත් කෙරෙයි. නොබිඳෙන දියෙහි පොළොවෙහි සේ යෙයි. පියාපත් ඇති සකුණියකු සේ අහසෙහි ද පලක් බැඳ යෙයි. ඒ සා මහර්ධි ඇති මහානුභාව ඇති සඳහිරුන් ද අල්ලයි, අතින් පිරිමදී, බඹලොව දක්වාත් කයින් සිය වශයෙහි පවත්වයි.

අම්බට්ඨය, යම්සේ දක්ෂ කුඹලෙක් හෝ කුඹලන්හු අතැවැසියෙක් හෝ මෙතෙවට සකස් කළ මැටිවෙන් තමා රිසි පරිදි වූ ඒ ඒ බඳුන් කරන්නේ ද, මෙතෙවට නිපදවන්නේ ද, යම්සේ දක්ෂ දන්ත-කාරයෙක් හෝ දන්තකාරයකුගේ අතැවැස්සෙක් හෝ මෙතෙවට සකස් කළ දතෙක්හි තමා රිසි රූපාදියක් කරන්නේ ද, මෙතෙවට නිපදවන්නේ ද, යම්සේ දක්ෂ රන්කරුවෙක් හෝ රන්කරුවන්හුගේ අතැවැස්සෙක් මෙතෙවට සකස් කළ රනින් තමා රිසි රිසි ආභරණා-දියක් කරන්නේ ද, නිපදවන්නේ ද, අම්බට්ඨය, එ පරිද්දෙන් ම මහණ තෙමේ මෙසේ සමාහිත සිත පිරිසිදු වූ කල්හි, දීප්තිමත් වූ කල්හි, කෙලෙස් රහිත වූ කල්හි, උපක්ලේශ පහ වැ ගිය කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍යතා කල්හි, ස්ථිත කල්හි, නිශ්චල බවට පැමිණි කල්හි, ඍද්ධිවිධඥානය පිණිස සිත මෙහෙයයි, සිත නැඹුරු කෙරෙයි.

සො අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති එකො'පි හුත්වා බහුධා හොති බහුධාපි හුත්වා එකො හොති. ආවිභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡති සෙය්‍යථාපි ආකාසෙ. පඨවියාපි උම්මුජ්ජනිමුජ්ජං කරොති සෙය්‍යථාපි උදකෙ. උදකෙ'පි අභිජ්ජමානෙ ගච්ඡති සෙය්‍යථාපි පඨවියං. ආකාසෙ'පි පල්ලඞ්කෙන කමති සෙය්‍යථාපි පක්ඛි සකුණො. ඉමෙ'පි චන්දිමසූරියෙ එවංමහිද්ධිකෙ එවං-මහානුභාවෙ පාණිනා පරිමසති. පරිමජ්ජති. යාව බ්‍රහ්මලොකා'පි කායෙන වසං වත්තෙති. ඉදම්පි'ස්ස හොති විජ්ජාය.

74. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[1] දිබ්බාය සොතධාතුයා චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය උභො සද්දෙ සුණාති දිබ්බෙ ච මානුසෙ ච යෙ දූරෙ සන්තිකෙ ච.

සෙය්‍යථාපි අම්බට්ඨ පුරිසො අද්ධානමග්ගපටිපන්නො සො සුණෙය්‍ය භෙරිසද්දම්පි මුදිඞ්ගසද්දම්පි සඞ්ඛපණවදෙණ්ඩිමසද්දම්පි. තස්ස එවමස්ස: භෙරිසද්දො ඉතිපි මුදිඞ්ගසද්දො ඉතිපි සඞ්ඛපණවදෙණ්ඩිමසද්දො ඉතිපි. එවමෙව ඛො අම්බට්ඨ භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ දිබ්බාය සොතධාතුයා චිත්තං අභිනීහරති අභිනින්නාමෙති.

සො දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය උභො සද්දෙ සුණාති දිබ්බෙ ච මානුසෙ ච යෙ දූරෙ සන්තිකෙ ච. ඉදම්පි'ස්ස හොති විජ්ජාය.

75. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ ආනෙඤ්ජ-ප්පත්තෙ චෙතොපරියඤ්ඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො පරසත්තානං පුරග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාති:

සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති,
වීතරාගං වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාති,
සදොසං වා චිත්තං සදොසං චිත්තන්ති පජානාති,
වීතදොසං වා චිත්තං වීතදොසං චිත්තන්ති පජානාති,
සමොහං වා චිත්තං සමොහං චිත්තන්ති පජානාති,
වීතමොහං වා චිත්තං වීතමොහං චිත්තන්ති පජානාති,
සඞ්ඛිත්තං වා චිත්තං සඞ්ඛිත්තං චිත්තන්ති පජානාති,
වික්ඛිත්තං වා චිත්තං වික්ඛිත්තං චිත්තන්ති පජානාති,
මහග්ගතං වා චිත්තං මහග්ගතං චිත්තන්ති පජානාති,
අමහග්ගතං වා චිත්තං අමහග්ගතං චිත්තන්ති පජානාති,
සඋත්තරං වා චිත්තං සඋත්තරං චිත්තන්ති පජානාති,
අනුත්තරං වා චිත්තං අනුත්තරං චිත්තන්ති පජානාති,
සමාහිතං වා චිත්තං සමාහිතං චිත්තන්ති පජානාති,
අසමාහිතං වා චිත්තං අසමාහිතං චිත්තන්ති පජානාති,
විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානාති,
අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති.

---

1. ආනෙඤ්ජප්පත්තෙ (කෙසුචි පොත්තකෙසු)

හේ තොයෙක් වැදැරුම් ඉදු කොටස් යලි යලි ලබයි: පියෙපියෙන් එකෙක් වැ සිට, (ඉදු බෙලෙන්) බොහෝ දෙනෙක් වෙයි, එසේ බොහෝ දෙනෙක් වැ යලි එකෙක් වෙයි. තෙමේ පෙනී සිටී, නොපෙනී ද සිටී. බිත්තිය සරසින් පවුර සරසින් පළිව සරසින් විනිවිදා අහසෙහි මෙන් කිසිවෙකත් නො ගැටී යෙයි. දියෙහි සේ පොළොවෙහි ද මතු වෙයි, හිලෙයි. පොළොවැ මතු පිට සේ නොබිඳී සිටි දියෙහි (දියෙහි එරා නොබැස) යෙයි. පක්ෂියකු සේ අහසෙහි පළඟින් යෙයි. මේ සා මහර්ද්ධිමත් මහානුභාව ඇති සඳහිරුනුදු අල්ලයි, අතින් පිරිමදී. බඹලොව දක්වා ද කයින් තමා වශයෙහි පවත්වයි. මේ ද ඔහුගේ විද්‍යාවෙක් වෙයි.

74. හේ මෙසේ සමාහිත සිත පිරිසිදු කල්හි, කෙලෙස් රහිත කල්හි, උපක්ලේශ පහ වැ ගිය කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍ය වූ කල්හි, සිටි කල්හි, නිසල බවට පත් කල්හි, දිව කත් නුවණ පිණිස සිත මෙහෙයයි, නැඹුරු කෙරෙයි. හේ පිරිසිදු වූ, මිනිසුන්ගේ ඇසෙන තෙක් මාත්‍ර ඉක්මැ සිටි දිවකත් නුවණින් දෙවියන් අයත් වූ ද මිනිසුන් අයත් වූ ද දුරු වූ ද ළඟැ වූ ද සි යන දෙහඬ ම අසයි.

අම්බට්ඨය, යම්සේ පුරුෂයෙක් දික් මඟකට පිළිපන්නේ, හේ බෙර හඬත් මිහිගුබෙරහඬත් සක්හඬත් පණාබෙරහඬත් ගැටබෙරහඬත් අසන්නේ ද, ඒවා අසන ඔහුට 'මේ බෙරහඬැ' යිත් 'මේ මිහිගුබෙර හඬැ' යිත්, 'මේ සක් හඬැ' යිත් 'මේ ගැටබෙර හඬැ' යිත් 'මේ පණාබෙර හඬැ' යිත් කියා මෙසේ සිතෙක් වන්නේ ද, අම්බට්ඨය, එසේ ම මහණ තෙමේ සමාහිත සිත පිරිසිදු වූ කල්හි, දීප්තිමත් වූ කල්හි, කෙලෙස් රහිත වූ කල්හි, උපක්ලේශ පහ වූ කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍ය වූ කල්හි, සිටි කල්හි, නිසලබවට පත් කල්හි, දිව කත් නුවණ ලබනු පිණිස තම සිත යොමු කෙරෙයි, තම සිත නැඹුරු කෙරෙයි.

හේ පිරිසිදු වූ, මිනිස්නට ඇසෙන තෙක් මාත්‍ර ඉක්මැ පැවැති දිවකත්නුවණින් දුරු වූ ද ළඟැ වූ ද දෙව්හඬත් මිනිස්හඬත් යන දෙහඬ ම අසයි. මේ ද ඔහු ගේ විද්‍යාවෙකි.

75. හේ මෙසේ සමාහිත සිත පිරිසිදු වූ කල්හි, කෙලෙස් රහිත කල්හි, උපක්ලේශ පහ වූ කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍ය වූ කල්හි, සිටි කල්හි, නිසල බවට පත් කල්හි, පරසිත් දන්නා නුවණ පිණිස සිත මෙහෙයයි, නැඹුරු කෙරෙයි. හේ අන් සතුන්ගේ අන් පුගුලන්ගේ සිත තමා සිතින් පිරිසිඳ දැනැ ගනී: හේ සරාග සිත සරාග සිතැ යි කියා දැන ගනී. වීතරාග සිත වීතරාග සිතැ යි කියා ද දැනැ ගනී. සදොෂ සිත සදොෂ සිතැ යි කියා ද...වීතදොෂ සිත වීතදොෂ සිතැ යි කියා ද... සමෝහ සිත සමෝහ සිතැ යි කියා ද...වීතමෝහ සිත වීතමෝහ සිතැ යි කියා ද...සංක්ෂිප්ත සිත සංක්ෂිප්ත සිතැ යි කියා ද...වික්ෂිප්ත සිත වික්ෂිප්ත සිතැ යි කියා ද...මහද්ගත සිත මහද්ගත සිතැ යි...අමහද්ගත සිත අමහද්ගත සිතැ යි...සඋත්තර සිත සඋත්තර සිතැ යි...අනුත්තර සිත අනුත්තර සිතැ යි...සමාහිත සිත සමාහිත සිතැ යි ...අසමාහිත සිත අසමාහිත සිතැ යි...විමුක්ත සිත විමුක්ත සිතැ යි ද...අවිමුක්ත සිත අවිමුක්ත සිතැ යි ද දැනැ ගනී.

සෙය්‍යථාපි අම්බට්ඨ ඉත්ථී වා පුරිසො වා දහරො වා යුවා මණ්ඩන-ජාතිකො ආදාසෙ වා පරිසුද්ධෙ පරියොදාතෙ අච්ඡෙ වා උදකපත්තෙ සකං මුඛනිමිත්තං පච්චවෙක්ඛමානො සඛණිකං වා සඛණිකන්ති ජානෙය්‍ය, අඛණිකං වා අඛණිකන්ති ජානෙය්‍ය, එවමෙව ඛො අම්බට්ඨ භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ වෙතොපරියඤ්ඤාණාය චිත්තං අභිනීහරති අභිනිත්නාමෙති.

සො පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාති:

"සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති,
වීතරාගං වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාති,
සදොසං වා චිත්තං සදොසං චිත්තන්ති පජානාති,
වීතදොසං වා චිත්තං වීතදොසං චිත්තන්ති පජානාති,
සමොහං වා චිත්තං සමොහං චිත්තන්ති පජානාති,
වීතමොහං වා චිත්තං වීතමොහං චිත්තන්ති පජානාති,
සඛිත්තං වා චිත්තං සඛිත්තං චිත්තන්ති පජානාති,
වික්ඛිත්තං වා චිත්තං වික්ඛිත්තං චිත්තන්ති පජානාති,
මහග්ගතං වා චිත්තං මහග්ගතං චිත්තන්ති පජානාති,
අමහග්ගතං වා චිත්තං අමහග්ගතං චිත්තන්ති පජානාති,
සඋත්තරං වා චිත්තං සඋත්තරං චිත්තන්ති පජානාති,
අනුත්තරං වා චිත්තං අනුත්තරං චිත්තන්ති පජානාති,
සමාහිතං වා චිත්තං සමාහිතං චිත්තන්ති පජානාති,
අසමාහිතං වා චිත්තං අසමාහිතං චිත්තන්ති පජානාති,
විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානාති,
අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති."
ඉදමපි'ස්ස හොති විජ්ජාය.

76. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ පුබ්බෙ-නිවාසානුස්සතිඤ්ඤාණාය චිත්තං අභිනීහරති අභිනිත්නාමෙති. සො අනෙක-විහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථිදං: එකම්පි ජාතිං ද්වෙ'පි ජාතියො තිස්සො'පි ජාතියො චතස්සො'පි ජාතියො පඤ්ච'පි ජාතියො දස'පි ජාතියො වීසම්පි ජාතියො තිංසම්පි ජාතියො චත්තාරීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි අනෙකෙ'පි සංවට්ටකප්පෙ අනෙකෙ'පි විවට්ටකප්පෙ අනෙකෙ'පි සංවට්ටවිවට්ටකප්පෙ "අමුත්‍රාසිං එවන්නාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො අමුත්‍ර උපපාදිං. තත්‍රාපාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො ඉධූපපන්නො" ති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

අම්බට්ඨය, යම්සේ සැරැසෙන සුළු සත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ ලදරුවෙක් හෝ තරුණයෙක් හෝ පිරිසිදු දීප්තිමත් කැඩපතෙක හෝ පහන් දියබඳුනෙක හෝ සිය මුවසටහණ පිරික්සා බලන්නේ තල කැලැල් ඇ සඳෙස් තැන සඳෙස් තැනැ යි දන්නේ ද, දෙස් නැති තැන දෙස් නැති තැනැ යි දන්නේ ද, එසේ ම අම්බට්ඨය, මහණ තෙමේ තම සමාහිත සිත පිරිසිදු වූ කල්හි, දීප්තිමත් වූ කල්හි, නිකෙලෙස් වූ කල්හි, උපක්ලේශ පහ වැ ගිය කල්හි, මොළොක් වූ කල්හි, කම්සුළුම වූ කල්හි, සිටි කල්හි, නිශ්චල බවට පත් කල්හි, පර සිත් දන්නා ඥාණ පිණිස සිත මෙහෙයයි, නැඹුරු කෙරෙයි.

එසේ වූ හේ අන් සතුන්ගේ අන් පුගුලන්ගේ සිත් තම සිතින් පිරිසිඳ දැන ගනී:

"සරාග සිත සරාග සිතැ යි ද...වීතරාග සිත වීතරාග සිතැ යි ද... සදෝෂ සිත සදෝෂ සිතැ යි ද...වීතදෝෂ සිත වීතදෝෂ සිතැ යි ද සමෝහ සිත සමෝහ සිතැ යි ද...වීතමෝහ සිත ...වීතමෝහ සිතැ යි ද...සංක්ෂිප්ත සිත සංක්ෂිප්ත සිතැ යි ද වික්ෂිප්ත සිත වික්ෂිප්ත සිතැ යි ද...මහද්ගත සිත මහද්ගත සිතැ යි ද.... අමහද්ගත සිත අමහද්ගත සිතැ යි ද...සඋත්තර සිත සඋත්තර සිතැ යි ද... අනුත්තර සිත අනුත්තර සිතැ යි ද...සමාහිත සිත සමාහිත සිතැ යි ද...අසමාහිත සිත අසමාහිත සිතැ යි ද...විමුක්ත සිත විමුක්ත සිතැ යි ද...අවිමුක්ත සිත අවිමුක්ත සිතැ යි ද දැන ගනී. මේ ද ඔහුගේ විද්‍යාවෙකි.

76. හෙ තෙමේ මෙසේ සමාහිත සිත පිරිසිදු වූ කල්හි, දීප්ත වූ කල්හි, කෙලෙස් නැති වූ කල්හි, උපක්ලේශ පහ වැ ගිය කල්හි, මෘදු වූ කල්හි, කම්සුළුම වූ කල්හි, සිටි කල්හි. නිසල බවට පත් කල්හි, පෙරැ වුසු කඳපිළිවෙල දන්නා ඥාණ පිණිස සිත යොමු කෙරෙයි, නැඹුරු කෙරෙයි. හේ එක් ජාතියක් ද, ජාති දෙකක් ද, ජාති තුනක් ද, ජාති සතරක් ද, ජාති පසක් ද, ජාති දශයක් ද, ජාති විස්සක් ද, ජාති තිසක් ද, ජාති සතළිසක් ද, ජාති පනසක් ද, ජාති සියක් ද, ජාති දහසක් ද, ජාති සුවහසක් ද, බොහෝ සංවර්ත කල්ප ද, බොහෝ විවර්ත කල්ප ද, බොහෝ සංවර්ත විවර්ත කල්ප ද, 'අසෝ තන්හි "මෙ නම් ඇතියෙම් වීමි, මෙ ගොත් ඇතියෙම් වීමි, මෙ බඳු පැහැ සටහන් ඇතියෙම් වීමි, මෙ බඳු අහර ඇතියෙම් වීමි, මෙ බඳු සුව දුක් විඳින්නෙකිමි වීමි, මෙතෙක් ආයු කෙළෙවරක් ඇතියෙම් වීමි. ඒ මම එසින් සැවැ අසෝ තැන උපතිමි. එහි ද මෙ නම් ඇතියෙම් වීමි, මෙ ගොත් ඇතියෙම් වීමි, මෙබඳු පැහැ සටහන් ඇතියෙම් වීමි, මෙබඳු ආහාර ඇතියෙම් වීමි, මෙබඳු සුව දුක් විඳින්නෙම් වීමි, මෙ තෙක් ආයු සීමා ඇතියෙම් වීමි. ඒ මම එසින් සැව මෙහි උපතිමි" යි මෙසේ අනේකවිධ වූ පෙරැ වුසු කඳපිළිවෙල සිහි කෙරෙයි. මෙසේ (වර්ණාදි වශයෙන්) ආකාර සහිත වූ, (නාම ගෝත්‍ර වශයෙන්) උද්දේශ සහිත වූ, බහුවිධ වූ පූර්වනිවාසය සිහි කෙරෙයි.

සෙය්‍යථාපි අම්බට්ඨ පුරිසො සකම්හා ගාමා අඤ්ඤං ගාමං ගච්ඡෙය්‍ය, තම්හාපි ගාමා අඤ්ඤං ගාමං ගච්ඡෙය්‍ය, සො තම්හා ගාමා සකඤ්ඤංව ගාමං පච්චාගච්ඡෙය්‍ය, තස්ස එවමස්ස: අහං ඛො සකම්හා ගාමා අමුං ගාමං අගච්ඡිං. තත්‍ර එවං අට්ඨාසිං එවං නිසීදිං එවං අභාසිං එවං තුණ්හී අහොසිං. තම්හාපි ගාමා අමුං ගාමං අගච්ඡිං. තත්‍රාපි එවං අට්ඨාසිං එවං නිසීදිං එවං අභාසිං එවං තුණ්හී අහොසිං. සො'මහි තම්හා ගාමා සකඤ්ඤංව ගාමං පච්චාගතො'ති,

එවමෙව ඛො අම්බට්ඨ භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ පුබ්බෙනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනීහරති අභිනිත්තාමෙති. සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති: සෙය්‍යථිදං එකම්පි ජාතිං දෙ'පි ජාතියො තිස්සො'පි ජාතියො චතස්සො'පි ජාතියො පඤ්ච'පි ජාතියො දසපි ජාතියො වීසම්පි ජාතියො තිංසම්පි ජාතියො චත්තාරීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි අනෙකෙ'පි සංවට්ටකප්පෙ අනෙකෙ'පි විවට්ටකප්පෙ අනෙකෙ'පි සංවට්ටවිවට්ටකප්පෙ: අමුත්‍රාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො අමුත්‍ර උපපාදිං. තත්‍රාපාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එමායුපරියන්තො. සො තතො චුතො ඉධූපපන්නො'ති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. ඉදම්පි'ස්ස හොති විජ්ජාය.

77. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනීහරති අභිනිත්තාමෙති. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති: ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා'ති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති.

අම්බට්ඨය, යම්සේ පුරුෂයෙක් සිය ගමෙන් අන් ගමකට යන්නේ ද, (නැවැත) ඒ ගමෙන් සිය ගමට ම පෙරළා එන්නේ ද, එසේ වූ ඔහුට "මම වූ කලි සිය ගමෙන් අසෝ ගමට ගියෙමි, එහි මෙසේ සිටියෙමි, මෙසේ උනිමි, මෙසේ කීමි, මෙසේ නිහඬ වීමි, ඒ ගමෙනුත් අසෝ ගමට ගියෙමි, එහි ද මෙසේ සිටියෙමි, මෙසේ උනිමි, මෙසේ කීමි, මෙසේ නිහඬ වීමි. ඒ මම ඒ ගමෙන් සිය ගමට පෙරළා ආයෙමි වෙමි"යි මෙසේ සිතෙක් ඔහුට වන්නේ ද,

අම්බට්ඨය, එසේ ම මහණ තෙමේ මේ පරිද්දෙන් සමාහිත සිත පිරිසිදු වූ කල්හි, දීප්ත වූ කල්හි, උපක්ලේශ පහ වූ කල්හි, මෘදු වූ කල්හි කර්ම්ක්ෂම වූ කල්හි, ඝිත කල්හි, නිසල බවට පැමිණි කල්හි, පෙරැ වුසු, කඳපිළිවෙල සිහි කරන නුවණ පිණිස සිත යොමු කෙරෙයි, නැඹුරු කෙරෙයි. එසේ වූ හේ "අසෝ තන්හි මෙ තම් ඇතියෙමි වීමි, මෙසේ වූ ශොත් ඇතියෙමි...මෙබඳු පැහැ ඇතියෙමි...මෙබඳු අහර ඇතියෙමි... මෙබඳු සුවදුක් විඳින්නෙමි...මෙබඳු ආයු සීමා ඇතියෙමි වීමි. ඒ මම එයින් සැව අසෝ තැනැ උපනිමි. එහි ද මෙබඳු නම්...ශොත්...පැහැසටහන් ආහාර...ආයුසීමා ඇතියෙමි වීමි. ඒ මම එයින් සැව මෙහි උපනිමි"යි මෙසේ ජාති එකක් ද,...දෙකක් ද,...තුනක් ද,...සතරක් ද, ...පසක් ද, ...දසයක් ද...විස්සක් ද...තිසක් ද...සතළිසක් ද,..පනසක් ද...සියක් ද... දහසක් ද...සුවහසක් ද, බොහෝ සංවර්ත කල්ප ද බොහෝ විවර්ත කල්ප ද බොහෝ සංවර්ත විවර්ත කල්ප ද යයි මෙසේ නොයෙක්වැදැරුම් පෙරැ වුසු කඳපිළිවෙල සිහි කෙරෙයි. මෙ පරිද්දෙන් ආකාර සහිත උද්දේශ සහිත නොයෙක්වැදැරුම් පෙරැ වුසු කඳපිළිවෙල සිහි කෙරෙයි. අම්බට්ඨය, මේ ද ඒ මහණහුගේ විද්‍යාවෙකි.

77. හේ මෙසේ සමාහිත සිත පිරිසිදු වැ දීප්ත වැ නිරුපක්ලේශ වැ මෘදු වැ කර්ම්යෝග්‍ය වැ ඝිත වැ නිශ්චලතාවයට පැමිණි කල්හි, සත්ත්වයන්ගේ ච්‍යුති උපපත්ති දක්නා නුවණ පිණිස සිත යොමු කෙරෙයි, නැඹුරු කෙරෙයි. හේ පිරිසිදු වූ, මිනිසුන්ගේ දර්ශනෝපචාරය ඉක්මැ දැක්ක හැකි වූ දිව්‍යයින් "අහෝ! මේ භවත් සත්ත්වයෝ කායදුශ්චරිතයෙන් සමන්විත හ, වාග්දුශ්චරිතයෙන් සමන්විත හ, මනෝදුශ්චරිතයෙන් සමන්විත හ, ආර්යෝපවාද කලෝ ය, මිසදිටු ගතුවෝ ය, මිසදිටු විසින් ගත් මිථ්‍යාව්‍රත ඇතියෝ ය. ඔහු කරජ කය බිඳී යැමෙන් මරණින් මතු සැපයෙන් පහ වූ, දුර්ගතිගමී හේතුයෙන් ප්‍රාදුර්භූත ගතිය වූ, (කර්මයට තමන් වශග බැවින්) තමනට අවශග වැ තමන් වැටෙන තැන වූ නිරයට වන්නා හ. (එහෙත්) මේ භවත් සත්ත්වයෝ වූ කලි කායසුචරිතයෙන් සමන්විත හ, වාක්සුචරිතයෙන් සමන්විත හ, මනස්සුචරිතයෙන් සමන්විත හ. ආර්යයනට උපවාද නො කලෝ ය, සම්දිටු ගතුවෝ ය, සම්දිටු විසින් ගත් ශීලාදිය ඇතියෝ ය, ඔහු කා බුන් මරණින් මතු මනා ගති ඇති සග ලෝ වන්නාහ"යි මරණාසන්න වූ ද, එ කෙණෙහි පිළිසඳ ගත්තන් වූ ද, උසස් වූ ද, මනා පැහැ සටහන් ඇති වූ ද, නොමනා පැහැ සටහන් ඇති වූ ද, සුගතියට පැමිණියන් වූ ද, දුගතියට පැමිණියන් වූ ද, කම් වූ පරිදි ඒ ඒ භවයට ගිය සත්ත්වයන් දකී. මෙසේ හේ පිරිසිදු වූ, මිනිසුන්ගේ දැකුම් ඉම ඉක්මැ පැවැති දිව්‍යයින් උස් පහත්, මනා පැහැති, නොමනා පැහැති, සුගතියට වන්, දුගතියට වන් සත්ත්වයන් දකී. කම් වූ පරිදි ඒ ඒ භවයක් කරා එළඹැ සිටි සතුන් දකී.

සෙය්‍යථාපි අම්බට්ඨ මණ්ඩූකිකා සිංඝාටකෙ පඤ්ඤායෙථ, තත්‍රාපි වක්ඛුමා පුරිසො සීතෙ පඤ්ඤායෙ මනුස්සෙ ගෙහං පවිසන්තෙ'පි නික්ඛමන්තෙ'පි රථියා වීතිසඤ්චරන්තෙ'පි මණ්ඩූකිකා සිංඝාටකෙ නිසින්නෙ'පි. තස්ස එවමස්ස: එතෙ මනුස්සා ගෙහං පවිසන්ති. එතෙ නික්ඛමන්ති. එතෙ රථියා වීතිසඤ්චරන්ති. එතෙ මණ්ඩූකිකා සිංඝාටකෙ නිසින්නා'ති.

එවමෙව ඛො අම්බට්ඨ භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති: ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා'ති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති. ඉදම්පි'ස්ස හොති විජ්ජාය.

78. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති.

සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති.
අයං දුක්ඛසමුදයො'ති යථාභූතං පජානාති.
අයං දුක්ඛනිරොධො'ති යථාභූතං පජානාති.
අයං දුක්ඛනිරොධගාමිනීපටිපදා'ති යථාභූතං පජානාති.
ඉමෙ ආසවා'ති යථාභූතං පජානාති.
අයං ආසවසමුදයො'ති යථාභූතං පජානාති.
අයං ආසවනිරොධො'ති යථාභූතං පජානාති.
අයං ආසවනිරොධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති.

තස්ස එවං ජානතො එවං පස්සතො කාමාසවා'පි චිත්තං විමුච්චති, භවාසවා'පි චිත්තං විමුච්චති, අවිජ්ජාසවා'පි චිත්තං විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති.

'ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායා'ති පජානාති.

අම්බට්ඨය, යම්සේ සිවුමංහන්දියෙක මහල් ඇති ගෙයක් වතොත්, යම්සේ එහි උඩුමහලහි සිටි ඇස් ඇති මිනිසෙක් ඒ ගෙට පිවිසෙනවුනුත් ගෙන් නික්මෙනවුනුත් විටියෙහි ඇත මැත යන එනවුනුත් සිවුමංහන්දිය මැද හුන්නවුනුත් දක්නේ ද, ඒ දක්නා ඔහුට "මේ මිනිස්සු ගෙට පිවිසෙත්, මේ මිනිස්සු ගෙන් නික්මෙත්, මේ මිනිස්සු විටියෙහි ඇත මැත යෙන්, මොහු සිවුමංහන්දිය මැද උන්නෝ වෙත් යැ"යි මෙසේ සිතක් වන්නේ ද,

එසේ ම අම්බට්ඨය, මහණ තෙමේ උක්ත පරිදි සමාහිත සිත පිරිසිදු, කල්හි, දීප්තිමත්...නිකෙලෙස්....උපක්ලේශ පහ වූ...මෘදු වූ...නිසලබවට පත් කල්හි, සත්ත්වයන් ගේ ව්‍යුති උපපත්ති දක්නා නුවණ ලබනු පිණිස සිත යොමු කෙරෙයි, නැඹුරු කෙරෙයි. හේ මිනිසුන් ගේ දුකුම් ඉම් ඉක්මැ දක්නට සමත්, පිරිසිදු දිවැසින්, "අහෝ මේ සත්හු කායදුශ්චරිතයෙන් ...වාග්දුශ්චරිතයෙන්. . .මනෝදුශ්චරිතයෙන් සමන්විත හ. ආර්‍යාපවාද කලෝ ය. මිසදිටු හ, මිසදිටු විසින් ගත් මිථ්‍යා වූත ඇතියහ, ඒ මොහු කා බුන් මරණින් මතු, සැපයෙන් පහ වූ, දුඃඛකර්මයෙන් උපන් ගතිය වූ, තමනට තමන් අවශ්‍ය වැ වැවෙන තැන වූ නිරයට වන්නෝ ය. එහෙත් මේ අන් පින්වත් සත්හු වූ කලි කායය...වාක්... මනඃසුචරිතයෙන් සමන්විත හ, ආර්‍යාපවාද නොකොලෝ ය, සම්දිටු විසින් ගත් ශීලාදිය ඇත්තෝ ය, ඒ මොහු කාබුන් මරණින් මතු මනා ගති ඇති සඟලෝ වන්නෝ යැ"යි මෙසේ මරණාසන්න වූ ද, එ කෙණෙහි පිළිසඳගත්තන් වූ ද, පහත් වූ ද, උසස් වූ ද, මනා පැහැ සටහන් ඇති වූ ද, නොමනා පැහැසටහන් ඇති වූ ද, සුගති පත් වූ ද, දුගති පත් වූ ද, කම් වූ පරිදි ඒ ඒ භවයට ගිය සතුන් දකී. මෙසේ හේ පිරිසිදු වූ, මිනිසුන් ගේ දුකුම් ඉම් ඉක්මැ දක්කැ හැකි දිවැසින් උස් පහත්, මනා නොමනා පැහැති, සුගති පත් දුගති පත් සතුන් දකී. කම් වූ පරිදි ඒ ඒ භවය කර එළැඹැ සිටි සතුන් දකී. අම්බට්ඨය, මේ ද ඔහුගේ විද්‍යාවෙකි.

78. හේ මෙසේ සමාහිත සිත පිරිසිදු වූ...දීප්තිමත් වූ... කෙලෙස් රහිත වූ...උපක්ලේශ පහ වැ සිටි...මෘදු වූ...කර්මක්ෂම වූ... සිත වූ නිසල බවට පත් වූ කල්හි ආශ්‍රවක්ෂයය පිණිස සිත යොමු කෙරෙයි, නැඹුරු කෙරෙයි. එසේ වූ හේ 'මේ දුකැ'යි ඇති සැටියෙන් දැන ගනී. 'මේ දුක් ඉපැත්මට කරුණැ'යි ඇති සැටියෙන් දැන ගනී. 'මේ දුක් වැනැස්මැ' යි ඇති සැටියෙන් දැන ගනී. 'මේ දුක් වැනැස්මට පමුණුවන පිළිවෙතැ' යි ඇති සැටියෙන් දැන ගනී. 'මොහු ආස්‍රවයෝ'යි ඇති සැටියෙන් දැනගනී. මේ ආස්‍රව ඉපැත්මට කරුණැ' යි ඇති සැටියෙන් දැන ගනී, 'මේ ආස්‍රවනිරෝධ-යැ' යි ඇති සැටියෙන් දැන ගනී. 'මේ ආස්‍රවනිරෝධගාමිනී ප්‍රතිපත්ති යැ' යි ඇති සැටි ලෙස දැනගනී. මෙසේ දන්නා, මෙසේ දක්නා ඔහුගේ සිත කාමාස්‍රවය කෙරෙන් ද මිදේ. ඔහු සිත භවාස්‍රවය කෙරෙන් ද මිදේ. ඔහු සිත අවිද්‍යාස්‍රවය කෙරෙන් ද මිදේ. සිත මිදුණු කල්හි, "මං සිත ආස්‍රව කෙරෙන් මිදුණේ යැ' යි ප්‍රත්‍යවේක්ෂාඥානය වේ. භවෝත්පත්තිය ක්ෂීණ වීගැ යි, මහබඹසර වැස නිමැවිණැ යි, සිවුමඟින් කළ යුතු සොළොස් වැදැරුම් කිස කොටැ නිමැවිණැ යි, මේ කෙලෙස් වැනැස්ම පිණිස තවත් කළ යුතු දෙයක් නැතැයි හේ දනී.

සෙය්‍යථාපි අම්බට්ඨ පබ්බතාසන්නෙ පදකරහදෙ අවෙජ්ජෝ විප්පසන්නො අනාවිලො, තත්‍ර චක්ඛුමා පුරිසො තීරෙ ඨිතො පස්සෙය්‍ය සිප්පිසම්බුකම්පි සක්ඛරකඨලම්පි මච්ඡගුම්බම්පි චරන්තම්පි තිට්ඨන්තම්පි. තස්ස එවමස්ස: අයං ඛො උදකරහදෙ අවෙජ්ජෝ විප්පසන්නො අනාවිලො. තත්‍රිමෙ සිප්පිසම්බුකා'පි සක්ඛරකඨලා'පි මච්ඡගුම්බා'පි චරන්ති'පි තිට්ඨන්ති'පීති. එවමෙව ඛො අම්බට්ඨ භික්ඛු සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති.

සො 'ඉදං දුක්ඛන්ති' යථාභූතං පජානාති. 'අයං දුක්ඛසමුදයො'ති යථාභූතං පජානාති.

'අයං දුක්ඛනිරොධො'ති යථාභූතං පජානාති. 'අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති.

'ඉමෙ ආසවා'ති යථාභූතං පජානාති. 'අයං ආසවසමුදයො'ති යථාභූතං පජානාති.

'අයං ආසවනිරොධො'ති යථාභූතං පජානාති. 'අයං ආසවනිරොධගාමිනී-පටිපදා'ති යථාභූතං පජානාති.

තස්ස එවං ජානතො එවං පස්සතො කාමාසවා'පි චිත්තං විමුච්චති, භවාසවා'පි චිත්තං විමුච්චති, අවිජ්ජාසවා'පි චිත්තං විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති.

'ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායා'ති පජානාති. අයං ඛො සා අම්බට්ඨ විජ්ජා.

79. අයං වුච්චති අම්බට්ඨ භික්ඛු විජ්ජාසම්පන්නො ඉතිපි, චරණසම්පන්නො ඉතිපි, විජ්ජාචරණසම්පන්නො ඉතිපි. ඉමාය ච අම්බට්ඨ විජ්ජාසම්පදාය චරණසම්පදාය ච අඤ්ඤා විජ්ජාසම්පදා ච චරණසම්පදා ච උත්තරිතරා වා පණීතතරා වා නත්ථි.

80. ඉමාය ඛො අම්බට්ඨ අනුත්තරාය විජ්ජාචරණසම්පදාය චත්තාරි අපායමුඛානි භවන්ති. කතමානි චත්තාරි ? ඉධ අම්බට්ඨ එකච්චො සමණො වා බ්‍රාහ්මණො වා ඉමස්සෙව අනුත්තරං විජ්ජාචරණසම්පදං අනභිසම්භුණමානො ඛාරිවිවධමාදාය අරඤ්ඤායතනං අජ්ඣොගාහති පවත්තඵලභොජනො භවිස්සාමීති. සො අඤ්ඤදත්ථු විජ්ජාචරණසම්පන්නස්සෙව පරිචාරකො සම්පජ්ජති. ඉමාය ඛො අම්බට්ඨ අනුත්තරාය විජ්ජාචරණසම්පදාය ඉදං පඨමං අපායමුඛං භවති.

81. පුන ච පරං අම්බට්ඨ ඉධෙකච්චෙ සමණා වා බ්‍රාහ්මණා වා ඉමස්සෙව අනුත්තරං විජ්ජාචරණසම්පදං අනභිසම්භුණමානා පවත්තඵලභොජනතඤ්ච අනභිසම්භුණමානා කුද්දාලපිටකං ආදාය අරඤ්ඤායතනමජ්ඣොගාහති කන්දමූලඵලභොජනා භවිස්සාමීති. සො අඤ්ඤදත්ථු විජ්ජාචරණසම්පන්නස්සෙව පරිචාරකො සම්පජ්ජති. ඉමාය ච ඛො අම්බට්ඨ අනුත්තරාය විජ්ජාචරණසම්පදාය ඉදං දුතියං අපායමුඛං භවති.

අම්බට්ඨය, යම්සේ කඳුමුදුනෙකැ වූ, පහත්, වෙසෙසින් පහත්, බොර නොවූ දිය විලක් වනොත්, එහි ඉවුරෙහි සිටි ඇස් ඇති පුරුෂයෙක් ඒ විල තුළැ හැසිරෙන ද සිටුනා ද සිප්පි බෙල්ලනුත් සක් බෙල්ලනුත් කැටකැබැලිතිත් මත්ස්‍යසමූහයනුත් දක්නේ ද, එසේ දක්නා ඔහුට "මේ දියවිල පහත් ය, වෙසෙසින් පහත් ය, නොබොර ය. මෙහි මේ සිප්පිහුත් කැටකැබැලිතිත් මත්ස්‍යසමූහයෝත් හැසිරෙන්නෝ ද සිටින්නෝ ද වෙති"යි මෙසේ සිතක් වන්නේ ද, එ පරිද්දෙන් ම මහණ තෙමේ සමාහිත වූ සිත පිරිසිදු වූ... දීප්තිමත් වූ... කෙලෙස් රහිත වූ... උපක්ලේශ පහ වූ... මෘදු වූ .. කර්මණ්‍යෝග්‍ය වූ... ස්ථිත වූ.... නිසල බවට පැමිණියා වූ කල්හි ආස්‍රවක්ෂයඥානය පිණිස සිත යොමු කෙරෙයි, නැඹුරු කෙරෙයි.

හේ 'මේ දුකැ' යි... 'මේ දුකට කරුණැ' යි... 'මේ දුක් වැනැස්මට අරමුණු වන නිවනැ' යි... මේ දුක් වැනැස්මට පමුණුවන පිළිවෙතැ' යි ඇති සැටියෙන් දැන ගනී. 'මේ ආස්‍රවයෝ යැ'යි... 'මේ ආස්‍රවසමුදය යැ'යි .. 'මේ ආස්‍රවනිරෝධය යැ' යි... මේ ආස්‍රවනිරෝධ ගාමිනී ප්‍රතිපත්තිය යැ' යි ඇති සැටියෙන් දැන ගනී. මෙසේ දන්නා, මෙසේ දක්නා ඔහුගේ සිත කාමාස්‍රවයෙනුත් මිදේ. ඔහු සිත භවාස්‍රවයෙනුත් මිදේ. ඔහු සිත අවිද්‍යාස්‍රවයෙනුත් මිදේ. මිදුණු කල්හි, 'මිදුණේ'යැ යි දැන්ම වේ. හේ "භවෝත්පත්තිය ක්ෂීණ විය, මාර්ගබ්‍රහ්මචර්යය වැස නිමවන ලද්දේ ය, සිවු සස්හි සිවු මඟින් කළ යුතු සොළොස් වැදැරුම් කිස කොට නිමැවිණ, මේ සත්‍යාවබෝධය පිණිස කළ යුතු තව කිසිත් නැතැ" යි දැන ගනී. අම්බට්ඨය, මේ වූ කලි ඒ විද්‍යාව ය.

79. අම්බට්ඨය, මේ මහණ තෙමේ විද්‍යයෙන් යුක්ත යැ යි ද, චරණයෙන් යුක්ත යැ යි ද, විද්‍යාචරණයෙන් යුක්ත යැ යි ද කියනු ලැබේ. අම්බට්ඨය, තව ද මේ විද්‍යාසම්පත්තිනුත් අන්‍ය වූ මෙයට වඩා උසස් වූ හෝ මනෝඥ වූ හෝ අන් විද්‍යාසම්පතෙක් ද චරණසම්පතෙක් ද නැත.

80. අම්බට්ඨය, මේ නිරුත්තර විද්‍යාචරණසම්පතට විනාශමුඛ සතරෙක් වෙති. කවර සතරෙක් ද? යත්: අම්බට්ඨය මෙහි එක්තරා මහණෙක් හෝ බමුණෙක් හෝ මේ නිරුත්තර විද්‍යාචරණසම්පතට නො පැමිණෙනුයේ, (හෝ වැර වඩා එය ලබන්නට නොසමත් වනුයේ), තවුස් පිරිකර කඳ ගෙන 'පවත්තඵලභෝජී වන්නෙමි' (=වැටුන ගෙඩි වළඳ දිවි රකින්නෙක් වන්නෙමි)යි සිතා වන පෙදෙසකට බැස ගනී. හෙ තෙමේ ඒකාන්තයෙන් විද්‍යා චරණ දෙකින් යුක්තයන්හුගේ සේවකයෙක් වේ. අම්බට්ඨය, මෙ කී නිරුත්තර විද්‍යාචරණසම්පතට මේ පළමු වන විනාශමුඛය වේ.

81. අම්බට්ඨය, තව ද මෙහි ඇතැම් මහණෙක් හෝ බමුණෙක් හෝ මේ නිරුත්තර විද්‍යාචරණසම්පතටත් නො පැමිණෙනුයේ, පවත්තඵලභෝජී බවටත් නො පැමිණෙනුයේ, උදුල්ලකුත් පැසකුත් ගෙන 'අල මුල් ගෙඩි වළඳන්නෙක් වන්නෙමි' යි සිතා වනපෙදෙසකට බැස ගනී.

හේ ඒකාන්තයෙන් විද්‍යා චරණ දෙකින් යුක්තයාගේ සේවකයෙක් ම වේ. අම්බට්ඨය, මෙ කී නිරුත්තර විද්‍යාචරණසම්පත්හුගේ මේ දෙවෙනි විනාශමුඛය වේ.

82. පුන ච පරං අම්බට්ඨ ඉධෙකච්චො සමණො වා බ්‍රාහ්මණො වා ඉමස්සෙව අනුත්තරං විජ්ජාචරණසම්පදං අනභිසම්භුණමානො පවත්තඵලභොජනතඤ්ච අනභිසම්භුණමානො කන්දමූලඵලභොජනතඤ්ච අනභිසම්භුණමානො ගාමසාමන්තං වා නිගමසාමන්තං වා අග්‍යාගාරං කරිත්වා අග්ගිං පරිචරන්තො අච්ඡති. සො අඤ්ඤදත්ථු විජ්ජාචරණසම්පන්නස්සෙව පරිචාරකො සම්පජ්ජති. ඉමාය ඛො අම්බට්ඨ අනුත්තරාය විජ්ජාචරණසම්පදාය ඉදං තතියං අපායමුඛං හවති.

83. පුන ච පරං අම්බට්ඨ ඉධෙකච්චො සමණො වා බ්‍රාහ්මණො වා ඉමස්සෙව අනුත්තරං විජ්ජාචරණසම්පදං අනභිසම්භුණමානො පවත්තඵලභොජනතඤ්ච අනභිසම්භුණමානො කන්දමූලඵලභොජනතඤ්ච අනභිසම්භුණමානො අග්ගිපරිචරියඤ්ච අනභිසම්භුණමානො චාතුම්මහාපථෙ චතුද්වාරං අගාරං කරිත්වා අච්ඡති: යො ඉමාහි චතූහි දිසාහි ආගමිස්සති සමණො වා බ්‍රාහ්මණො වා තමහං යථාසත්ති යථාබලං පටිපූජෙස්සාමීති. සො අඤ්ඤදත්ථු විජ්ජාචරණසම්පන්නස්සෙව පරිචාරකො සම්පජ්ජති. ඉමාය ඛො අම්බට්ඨ අනුත්තරාය විජ්ජාචරණසම්පදාය ඉදං චතුත්থං අපායමුඛං හවති.

ඉමාය ඛො අම්බට්ඨ අනුත්තරාය විජ්ජාචරණසම්පදාය ඉමානි චත්තාරි අපායමුඛානි හවන්ති.

84. තං කිම්මඤ්ඤසි අම්බට්ඨ? අපි නු තං ඉමාය අනුත්තරාය විජ්ජාචරණසම්පදාය සන්දිස්සසි සාවරියකො?'ති

"නො හිදං භො ගොතම. කො චාහං භො ගොතම සාවරියකො? කා ච අනුත්තරා විජ්ජාචරණසම්පදා? ආරකා'හං භො ගොතම අනුත්තරාය විජ්ජාචරණසම්පදාය සාවරියකො"ති.

"තං කිම්මඤ්ඤසි අම්බට්ඨ? අපි නු තං ඉමස්සෙව අනුත්තරං විජ්ජාචරණසම්පදං අනභිසම්භුණමානො ධාරිවිවධමාදාය අරඤ්ඤවනමෙක්ඛාගාහසි සාවරියකො පවත්තඵලභොජනො භවිස්සාමීති?"

"නො හිදං භො ගොතම."

"තං කිම්මඤ්ඤසි අම්බට්ඨ? අපි නු තං ඉමස්සෙව අනුත්තරං විජ්ජාචරණසම්පදං අනභිසම්භුණමානො පවත්තඵලභොජනතඤ්ච අනභිසම්භුණමානො කුද්දාලපිටකං ආදාය අරඤ්ඤවනමෙක්ඛාගාහසි සාවරියකො කන්දමූලඵලභොජනො භවිස්සාමීති?"

"නො හිදං භො ගොතම."

"තං කිම්මඤ්ඤසි අම්බට්ඨ? අපි නු තං ඉමස්සෙව අනුත්තරං විජ්ජාචරණසම්පදං අනභිසම්භුණමානො පවත්තඵලභොජනතඤ්ච අනභිසම්භුණමානො කන්දමූලඵලභොජනතඤ්ච අනභිසම්භුණමානො ගාමසාමන්තං වා නිගමසාමන්තං වා අග්‍යාගාරං කරිත්වා අග්ගිං පරිචරන්තො අච්ඡසි සාවරියකො?"ති

"නො හිදං භො ගොතම."

82. තව ද අම්බට්ඨය, මෙහි කිසි යම් මහණෙක් හෝ බමුණෙක් හෝ මේ නිරුත්තර විදුරුවරණසම්පත්තියටද නො පැමිණෙනුයේ, පවත්තඵලභෝජනයට ද නො පැමිණෙනුයේ, අල මුල් පල බොජුන් කොට ඇති බවට ද නො පැමිණෙනුයේ, ගමක් සම්පයේ හෝ නියම-ගමක් සම්පයේ හෝ ගිනි පුදනා ගෙයක් කොට, ගිනි පුදමින් හිඳී. හේ ඒකාන්තයෙන් විදුරුවරණ දෙකින් යුක්තයන්හුගේ සේවකයෙක් ම වේ. අම්බට්ඨය, මේ නිරුත්තර විදුරුවරණසම්පන්නුගේ තෙවෙනි විනාශමුඛය වේ.

83. තව ද අම්බට්ඨය, මෙහි ඇතැම් මහණෙක් හෝ බමුණෙක් හෝ මේ නිරුත්තර විදුරුවරණසම්පතටත් නො පැමිණෙනුයේ, පවත්තඵලභෝජී බවටත් නො පැමිණෙනුයේ, අල මුල් පල බොජුන් කොට ඇති බවටත් නොපැමිණෙනුයේ, ගිනි පිදීමට ද නොබස්නේ, 'යම් මහණෙක් හෝ බමුණෙක් හෝ මේ සිවු දිසාවෙන් එන්නේ ද, ඔහු මම හැකි සේ පිළිවන් සේ පුදන්නෙමි'යි සිවුමංහන්දියෙක දෙර සතරක් ඇති (සිවුදිගට දෙර ඇති) දන්ශලක් කොට හිඳී. හේ ඒකාන්තයෙන් විදුරුවරණ දෙකින් යුක්තයන්හුගේ සේවකයෙක් ම වේ. අම්බට්ඨය, මේ විදුරුවරණසම්පන්නුගේ සතරවන විනාශමුඛය වේ.

අම්බට්ඨය, මොහු මේ විදුරුවරණසම්පන්නුගේ සතර විනාශමුඛයෝ වෙත්.

84. ඒ කිමැ යි සිතයි ද අම්බට්ඨය, මේ නිරුත්තර විදුරුවරණ-සම්පත්හි තෝ සිය ඇදුරා සහිත වැ දක්නා ලැබෙහි (පෙනෙහි) ද ?

"භවද්ගෞතමයිනි, මෙය නො වේ ම ය. භවද් ගෞතමයිනි, ඇදුරා සහිත මම කවරෙකිම් වෙම් ද ? නිරුත්තර විදුරුවරණසම්පත් කවරේ ද ? භවද් ගෞතමයාණනි, ඇදුරා සහිත මම විදුරුවරණ සම්පත කෙරෙන් දුරින් ම ගිලිසෙම් වෙමි"යි (අම්බට්ඨයා කී ය.)

[භාග්‍යවත්හු:] "අම්බට්ඨය, එය කිමැයි සිතයි ද ? තෝ මේ විදුරුවරණ සම්පතට නො පැමිණියෙක් වනුයෙහි, තවුස්පිරිකර – කඳ ගෙන, පවත්තඵලභෝජී වන්නෙමි'යි සිය ඇදුරා සහිත වැ වන පෙදෙසකට බට කැනැත්තෙහි වත් වෙහි ද ?"

[අම්බට්ඨ:] "මෙය නො වේ ම ය, භවද්ගෞතමයාණනි."

[භාග්‍යවත්හු:] "අම්බට්ඨය, එය කිමැ යි සිතහි ද ? ඇදුරා සහිත තෝ මේ නිරුත්තර විදුරුවරණසම්පතටත් නො පැමිණෙනුයෙහි, පවත්තඵල-භෝජී බවට ද නො පැමිණෙන්නෙහි, 'අල මුල් පල බොජුන් කොටැත්තෙම් වන්නෙමි' යි උදුල්ලකුත් පැසකුත් ගෙන වන පෙදෙසකට බවුයෙහි හෝ වෙහි ද ?"

[අම්බට්ඨ:] "භවද් ගෞතමයිනි, මෙත් නො වේ ම ය."

[භාග්‍යවත්හු:] "අම්බට්ඨය, ඒ කිමැ යි සිතහි ද ? ඇදුරා සහිත තෝ මේ නිරුත්තර විදුරුවරණ සම්පතටත් නො පැමිණෙනුයෙහි, පවත්තඵල-භෝජී බවට ද නො පැමිණෙනුයෙහි, අල මුල් පල බොජුන් කොටැති බවට ද නො පැමිණෙනුයෙහි, ගමක් අසල හෝ නියම්ගමක් අසල හෝ ගිනි පුදනා ගෙයක් කොට ගිනි පුදමින් හෝ ඉඳිතෙහි ද ?"

[අම්බට්ඨ:] "භවද්ගෞතමයිනි, මෙත් නො වේ ම ය."

"තං කිම්මඤ්ඤසි අම්බට්ඨ අපි නු ත්වං ඉමෙඤ්චව අනුත්තරං විජ්ජාචරණසම්පදං අනභිසම්භුණමානො පවත්තඵලභොජනතඤ්ච අනභිසම්භුණමානො කන්දමූලඵලභොජනතඤ්ච අනභිසම්භුණමානො අග්ගිපරිචරියඤ්ච අනභිසම්භුණමානො චාතුම්මහාපථෙ චතුද්වාරං අගාරං කරිත්වා අච්ඡසි සාචරියකො, යො ඉමාහි චතූහි දිසාහි ආගමිස්සති සමණො වා බ්‍රාහ්මණො වා තං මයං යථාසත්ති යථාබලං පටිපූජෙස්සාමාති ?"

"නො හිදං භො ගොතම."

85. ඉති ඛො අම්බට්ඨ ඉමායෙ ච ත්වං අනුත්තරාය විජ්ජාචරණසම්පදාය පරිහීනො සාචරියකො. යෙ ච්චිමෙ අනුත්තරාය විජ්ජාචරණසම්පදාය චත්තාරි අපායමුඛානි භවන්ති, තත්‍රතා ච ත්වං පරිහීනො සාචරියකො. භාසිතා ඛො පන තෙ එසා අම්බට්ඨ ආචරියෙන බ්‍රාහ්මණෙන පොක්ඛරසාදිනා වාචා "කෙ ච මුණ්ඩකා සමණකා ඉබ්භා කණ්හා බන්ධුපාදාපච්චා, කා ච තෙවිජ්ජානං බ්‍රාහ්මණානං සාකච්ඡා" ති, අත්තනා ආපායිකො'පි අපරිපූරයමානො. පස්ස අම්බට්ඨ යාව අපරද්ධඤ්ච තෙ ඉදං ආචරියස්ස බ්‍රාහ්මණස්ස පොක්ඛරසාදිස්ස.

86. බ්‍රාහ්මණො ඛො පන අම්බට්ඨ පොක්ඛරසාදි රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස දත්තිකං භුඤ්ජති. තස්ස රාජා පසෙනදි කොසලො සම්මුඛීභාවම්පි න දදති. යදිපි තෙන මිනෙතති තිරොදුස්සෙන මිනෙතති. යස්ස ඛො පන අම්බට්ඨ ධම්මිකං පඨතං භික්ඛං පටිගණ්හෙය්‍ය, කථං තස්ස රාජා පසෙනදි කොසලො සම්මුඛීභාවම්පි න දදෙය්‍ය ? පස්ස අම්බට්ඨ යාව-අපරද්ධඤ්ච තෙ ඉදං ආචරියස්ස බ්‍රාහ්මණස්ස පොක්ඛරසාදිස්ස.

තං කිම්මඤ්ඤසි අම්බට්ඨ ? රාජා පසෙනදි කොසලො හත්ථිගීවාය වා නිසින්නො අස්සපිට්ඨෙ වා නිසින්නො රථූපත්ථරෙ වා ඨිතො උග්ගහි වා රාජඤ්ඤහි වා කිඤ්චිදෙව මන්තනං මන්තෙය්‍ය, සො තමහා පදෙසා අපක්කම්ම එකමන්තං තිට්ඨෙය්‍ය. අථ ආගච්ඡෙය්‍ය සුද්දො වා සුද්දදාසො වා, සො තස්මිං පදෙසෙ ඨිතො තදෙව මන්තනං මන්තෙය්‍ය: එවම්පි රාජා පසෙනදි කොසලො ආහ එවම්පි රාජා පසෙනදි කොසලො ආහාති. අපි නු සො රාජහණ්ඩිතං වා හණති රාජමන්තං වා මිනෙතති, එත්තාවතා සො අස්ස රාජා වා රාජමහාමත්තො වාති ?"

"නො හිදං භො ගොතම."

87. එවමෙව ඛො ත්වං අම්බට්ඨ, යෙ තෙ අහෙසුං බ්‍රාහ්මණානං පුබ්බකා ඉසයො මන්තානං කත්තාරො මන්තානං පවත්තාරො, යෙසමිදං එතරහි බ්‍රාහ්මණා පොරාණං මන්තපදං ගීතං පවුත්තං සම්මිතං තදනුගායන්ති තදනුභාසන්ති භාසිතමනුභාසන්ති වාචිතමනුවාචෙන්ති, සෙය්‍යථිදං: අට්ඨකො වාමකො වාමදෙවො වෙස්සාමිත්තො යමතග්ගි අඞ්ගිරසො භාරද්වාජො වාසෙට්ඨො කස්සපො භගු, තෙසාහං මන්තෙ අධ්‍යාමි සාචරියකො'ති තාවතා ත්වං භවිස්සසි ඉසි වා ඉසිත්තායෙ වා පටිපන්නො'ති තෙතං ඨානං විජ්ජති.

[භාග්‍යවත්හු:] "අම්බට්ඨය, එය කිමැ යි සිතහි ද? මේ නිරුත්තර විද්‍යාචරණසම්පතටත් නො පැමිණෙන්නෙහි, පවත්තඵලභොජීත් නො වන්නෙහි, අල මුල් පල බොජුන් කොටැති බවට ද නොපැමිණෙන්නෙහි, ගිනි පිදීම ද නොකරන්නෙහි, සිවුමංහන්දියෙක දෙර සතරක් ඇති දත්හලක් කොට මේ සිවු දෙසින් එන තාක් මහණබමුණන් හැකි පරිදි පිළිවත් පරිදි පුදන්නෙමි යි සිතා හෝ ඇදුරා සහිත වැ ඉඳිනෙහි ද?"

[අම්බට්ඨ:] "භවද් ගෞතමයිනි, මෙය නැත්තේ ම ය"

85. [භාග්‍යවත්හු:] "අම්බට්ඨය, ඇදුරා සහිත හෝ මේ නිරුත්තර විද්‍යාචරණසම්පතිහුත් පරිහුණෙහි ය, මේ නිරුත්තර විද්‍යාචරණසම්පතට විනාශමුඛ වූ යම් තපශ්චර්‍යා කෙනෙක් වෙත් නම් එයිහුත් පිරිහුණෙහි ය. එහෙත් අම්බට්ඨය, තමගේ ඇදුරු වූ පොක්ඛරසාදි බමුණා විසින් තමා විද්‍යාචරණසම්පතට විනාශමුඛ වූ දහම් පමණකුත් නොපුරන්නකු වැ හිඳ, "බමුණතට මෙහෙකරු වූ, කළු වූ, බමුහුගේ පයින් උපන්, ගර්භිත මුඛ මහණහු කවුරු ද? එවැන්නත් හා ත්‍රෛවිද්‍යක බමුණන්ගේ කවර සාකච්ඡා ද?"යි මේ වචනය කියන ලද්දේ ම ය. බලව, අම්බට්ඨය, තමගේ ආචාර්‍ය වූ පොක්ඛරසාදි බමුණු විසින් කොතරම් මහත් වරදෙක් කරන ලද්දේ ද?

86. අම්බට්ඨය, පොක්ඛරසාදි බමුණු තෙමේ වූ කලි පසේනදි කොසොල් රජුහු විසින් දුත් ද බුත්ති විදි. කොසොල් රජ ඔහුට මුහුන පෑම ද නො කෙරෙයි. යම් විටෙක ඔහු හා සාකච්ඡා කෙරේ නම් කඩතුරාවෙකින් මුවහ වී හිඳ කථා කෙරෙයි. අම්බට්ඨය, යම්කු විසින් තමහට එළැවූ දැහැමි බොජුන් (පොක්ඛරසාදි තෙමේ) පිළිගන්නේ නම්, ඒ පසේනදි කොසොල් රජ ඔහුට තමා මුහුන පෑම පවා කෙසේ නම් නො කරන්නේ ද? අම්බට්ඨය, බලව, මේ තමගේ ඇදුරු වූ පොක්ඛරසාදි බමුණා විසින් කොතරම් මහත් වරදෙක් කරන ලද ද?

අම්බට්ඨය, එය කිමැ යි සිතන්නෙහි ද? මෙහි පසේනදි කොසොල් රජ තෙම ඇතු ගෙල මතුයෙහි හෝ හුන්නේ, අසු පිටැ හෝ හුන්නේ, රිය තුළ ඇතිරිය මතැ හෝ සිටියේ, උසස් ඇමැතියන් හෝ අභිෂෙක නොලත් රජදරුවන් හෝ සමග කිසි යම් මන්ත්‍රණයක් කරන්නේ නම්, හේ ඒ රජු සිටි තැනින් ඉවත් වැ එක් පසෙක සිටින්නේ ය. එකල්හි ශූද්‍රයෙක් හෝ ශූද්‍රයකුගේ පුතයෙක් හෝ එන්නේ නම්, හේ ඒ පෙදෙසෙහි සිටියේ, 'පසේනදි කොසොල් රජ මෙසේත් කියේ ය, පසේනදි කොසොල් රජ මෙසේත් කියේ යැ'යි ඒ මන්ත්‍රණය ම කියන්නේ නම්, හේ රාජවචනය කියන්නේ ද? රාජමන්ත්‍රණය කරන්නේ ද? මෙතෙකින් හේ රජ හෝ රජමහඇමැතියෙක් හෝ වන්නේ ද?

[අම්බට්ඨ:] "භවද්ගෞතමයිනි, මෙය නො වේ ම ය."

87. [භාග්‍යවත්හු] "අම්බට්ඨය, එපරිද්දෙන් ම වෙදකතා වූ වෙද පැවැත්වූ, බ්‍රාහ්මණයන්ගේ පූර්වපුරුෂ වූ අවටක (ආත්‍රෙය), වාමක, වාමදෙව, වෙස්සාමිත්‍ර (විශ්වාමිත්‍ර), යමතග්ගි (ජමදග්නි), අංගිරස, භාරද්වාජ, වාසෙට්ඨ (වාසිෂ්ඨ), කස්සප (කාශ්‍යප), භගු (භෘගු) යන යම් ඍෂි කෙනෙක් වූහු ද, යම් කෙනකුන් විසින් ගයන ලද (=සජ්ඣායනා කරන ලද), කියවන ලද, රැස් කොට තබන ලද මේ මන්ත්‍රපද (වෙදයෙහි) මේ කල බමුණෝ ඔවුන් අනුවැ ගයත් ද, කියැවූ දය අනුවැ කියවත් ද 'ඇදුරාණන් සහිත මම ඒ වෙද හදාරමි'යි යන මෙපමණෙකින් හෝ ඍෂිවරයෙක් හෝ ඍෂි බවට පිළිපන්නෙක් හෝ වන්නෙහි ය යන මේ කාරණය විද්‍යමාන නො වේ.

88. තං කිඤ්ඤදෙව අම්බට්ඨ කිත්තති තෙ සුතං බ්‍රාහ්මණානං වුද්ධානං මහල්ලකානං ආචරියපාචරියානං භාසමානානං: "ඉධ තෙ අහෙසුං බ්‍රාහ්මණානං පුබ්බකා ඉසයො මන්තානං කත්තාරො මන්තානං පවත්තාරො, යෙසමිදං එතරහි බ්‍රාහ්මණා පොරාණං මන්තපදං ගීතං පවුත්තං සමිහිතං තදනුගායන්ති තදනුභාසන්ති භාසිතමනුභාසන්ති වාචිතමනුවාචෙන්ති සෙය්‍යථිදං: අට්ඨකො, වාමකො, වාමදෙවො, වෙස්සාමිත්තො, යමතග්ගි, අඞ්ගිරසො, භාරද්වාජො, වාසෙට්ඨො, කස්සපො, භගු- එවං සු තෙ සුතඤ්ඤතා සුපිලිත්තා කපිත්තමක්ඛිසුණ්ඩිකාහරණ ඕදත්තවත්ථවසනා පඤ්චහි කාමගුණෙහි සමප්පිතා සමඞ්ගීභූතා පරිචාරෙන්ති, සෙය්‍යථාපි නං එතරහි ආචරියකො ?"ති.

"තථා හිදං භො ගොතම."

89. "එවං සු තෙ සාලීනං ඕදනං සුවිමංසූපසෙචනං විවිත්තකාලකං අනෙකසූපං අනෙකබ්‍යඤ්ජනං පරිභුඤ්ජන්ති, සෙය්‍යථාපි නං එතරහි ආචරියකො ?"ති.

"තථා හිදං භො ගොතම."

"එවං සු තෙ වෙඨනකපක්ඛෙහි තාරෙහි පරිචාරෙන්ති සෙය්‍යථාපි නං එතරහි ආචරියකො ?"ති.

"තථා හිදං භො ගොතම."

"එවං සු තෙ කුත්තවාලෙහි වළවාරථෙහි දීඝෙහි පතොදලට්ඨිහි වාහනෙ විතුදෙන්තා විපරියායන්ති සෙය්‍යථාපි නං එතරහි ආචරියකො ?"ති

"තථා හිදං භො ගොතම."

"එවං සු තෙ උක්කිණ්ණපරිඛාසු ඔක්ඛිත්තපලිඝාසු නගරූපකාරිකාසු දීඝාඝිඛඩෙහි පුරිසෙහි රක්ඛාපෙන්ති සෙය්‍යථාපි නං එතරහි ආචරියකො ?"ති

"තථා හිදං භො ගොතම."

ඉති ඛො අම්බට්ඨ තෙව නං ඉසි, න ඉසිත්තාය පටිපන්නො ආචරියකො. යස්ස ඛො පන අම්බට්ඨ මයි කඞ්ඛා වා විමති වා, සො මං පඤ්හෙන, අහං වෙය්‍යාකරණෙන සොධෙස්සාමි"ති.

90. අථ ඛො භගවා විහාරා නික්ඛම්ම චඞ්කමං අභිරුට්ඨාසි. අම්බට්ඨොපි මාණවො විහාරා නික්ඛම්ම චඞ්කමං අභිරුට්ඨාසි. අථ ඛො අම්බට්ඨො මාණවො භගවන්තං චඞ්කමන්තං අනුචඞ්කමමානො කායෙ ද්වත්තිංස-මහාපුරිසලක්ඛණානි සමන්නෙසි. අද්දස ඛො අම්බට්ඨො මාණවො භගවතො කායෙ ද්වත්තිංසමහාපුරිසලක්ඛණානි යෙභුය්‍යෙන ඨපෙත්වා දෙව. ද්වීසු මහාපුරිසලක්ඛණෙසු කඞ්ඛති විචිකිච්ඡති නාභිමුච්චති න සම්පසීදති කොසොහිතෙ ච වත්ථගුය්හෙ[1] පහූතජිව්හතාය. ච.

1. කොසොහිත වත්ථගුය්හ. (මහායානිකාදීසං ගණ්ඨිසු)

88. අම්බට්ඨය, ඒ කිමෑ සි සිතහි ද? ඒ ඍෂීන් ගැන කියන වෘද්ධ වූ මහලු වූ තමගේ ආචාර්‍ය ප්‍රාචාර්‍ය වූ බමුණන්ගේ වචනය තා විසින් කෙසේ අසන ලද ද? වේද කර්තෘ වූ, වේද පැවැත්වූ, බමුණන්ගේ පූර්වජරුඟ වූ, අවිටක වාමක වාමදේව වෙස්සාමිත්‍ර යමතග්නි අංගිරස භාරද්වාජ වාසෙට්ඨ කශ්‍යප භගු යන යම් ඍෂි කෙනෙකුන් විසින් ගයන ලද, රැස් කොට තබන ලද, මේ මන්ත්‍රපද දැන් සිටිනා බමුණෝ ඔවුන් අනුවැ ගයත් නම්, ඔවුන් අනුවැ කියත් නම්, ඔවුන් කී වචන අනුවැ කියත් නම්, කියැවූ වචන අනුවැ කියවත් නම්, මේ කල්හි වූ ඇදුරු සඟිත තා සේ ඒ ඍෂිවරුන් මොනතාවට නා ගත්තෝ වැ, මොනොවට සුවඳ පිළෙවුන් ගල්වා ගත්තෝ වැ, අත්දම් තබා කැපූ කෙහෙ රවුළු ඇත්තෝ වැ, පැලැඳ ගත් මිණිකොඩොල් අබරණ ඇත්තෝ වැ, සුදු වස්ත්‍ර හඳින්නෝ වැ පස් කම් සුවෙන් ඇලී යෙදී එහි ඉඳුරන් මෙහෙයවන්නෝ වූහු ද?"

[අම්බට්ඨ:] "භවද්ගෞතමයිනි, මෙය නොවූයෙකි."

89. [භාග්‍යවත්හු:] "දැන් ඇදුරු සඟිත තා කරන්නා සේ, ඒ ඍෂිහු අවුලා ඉවත් කළ කළු සහල් ඇති, බොහෝ සූප ඇති, බොහෝ ව්‍යංජන ඇති, මසවුළු ඇති, පිරිසිදු හැල් බත් වළඳන්නෝ වූහු ද?

[අම්බට්ඨ:] "භවද්ගෞතමයිනි, මෙය නො වී ය."

[භාග්‍යවත්හු:] "දැන් ඇදුරු සඟිත තා කරන පරිදි ඔහු වෙළුම් පටින් බැඳ සිඟින් කළ ඉඟ ඇති ස්ත්‍රීන් ලවා මෙහෙ කරවා ගත්තෝ වූහු ද?"

[අම්බට්ඨ:] "මෙ නො වී ය භවද්ගෞතමයිනි."

[භාග්‍යවත්හු:] "දැන් ඇදුරු සඟිත තා කරන්නා සේ ඔහු සැරැස්ස වලග ඇති වෙළෙඹුන් යෙදූ රියවලින්, දික් කැවිටි ලිවලින් එය අදනා සත්තට අතින්නාහු, ඔබ මෙබ ගියෝ ද?"

[අම්බට්ඨ:] "භවද්ගෞතමයිනි, මෙය නො වී ය."

[භාග්‍යවත්හු:] "දැන් ඇදුරු සඟිත තා කරන සේ, ඒ ඍෂිහු කැණු අගල් ඇති, තැලූ කණයම් ඇති, උපකාරිකාවන්ගෙන් යුත් සුවරවලැ දික් කඩු ගත් පුරුෂයන් ලවා රකවල් කැරැවූහු ද?"

[අම්බට්ඨ:] "මෙය නො වී ය, භවද්ගෞතමයිනි."

[භාග්‍යවත්හු:] "අම්බට්ඨය, මෙසේ ඇදුරු සඟිත තෝ ඍෂියෙකුත් නො ම වෙහි ය. ඍෂි බව සඳහා පිළිපන්නෙකුත් නො ම වෙහි ය. අම්බට්ඨය, යමකුට මා කෙරෙහි සැකයෙක් විමතියෙක් වේ නම්, හේ ප්‍රශ්නයෙන් මා විචාරා වා. මම ඔහුගේ ප්‍රශ්න විසැඳීමෙන් ඔහු සැක දුරු ලත්තෙමි."

90. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ වෙහෙරින් නික්මැ, සක්මන් මලුවට නැංග සේක. අම්බට්ඨ මාණවක ද වෙහෙරින් නික්මැ සක්මන් මලුවට නැංගේ ය. ඉන් පසු අම්බට්ඨ මාණවක තෙමේ සක්මන් කරන භාග්‍යවතුන් වහන්සේ අනුවැ සක්මන් කරනුයේ, භාග්‍යවතුන් වහන්සේ ගේ කයෙහි දෙතිස් මහපුරිස්ලකුණු සෙවී ය. අම්බට්ඨ මාණවක තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ කයෙහි බෙහෙවින් දෙකක් හැර දෙතිස් මහපුරිස් ලකුණු දිටි ය. හේ කොශාවගිත අංගජාතයෙහි ද ප්‍රළුල් දිව ඇතිබවහි ද යන මහා පුරුෂලක්ෂණ දෙක්හි සැක කෙරෙයි. එහින් සතිවුහනකට නො බහී. 'මේ තෙමේ පිරිපුන් මහපුරිස්ලකුණු ඇත්තෙකැ'හි පැහැදීමට නො පැමිණේ.

91 අථ ඛො භගවතො එතදහොසි: පස්සති ඛො මෙ අයං අම්බට්ඨො මාණවො ද්වත්තිංසමහාපුරිසලක්ඛණානි යෙභුය්‍යෙන ඨානපත්තානි දෙව. ද්වීසු මහාපුරිසලක්ඛණෙසු කඞ්ඛති විචිකිච්ඡති නාභිමුච්චති න සම්පසීදති කොසොහිතෙ ච වත්ථුස්මිං පඤ්ඤත්තිමත්තාය චරති.

අථ ඛො භගවා තථාරූපං ඉද්ධාභිසඞ්ඛාරං අභිසඞ්ඛාසි යථා අද්දස අම්බට්ඨො මාණවො භගවතො කොසොහිතං වත්ථුස්මිං. අථ ඛො භගවා ජිව්හං නික්ඛාමෙත්වා උභො'පි කණ්ණසොතානි අනුමසි පරිමසි. උභො'පි නාසිකාසොතානි අනුමසි පරිමසි. කෙවලම්පි නලාටමණ්ඩලං ජිව්හාය ඡාදෙසි.

අථ ඛො අම්බට්ඨස්ස මාණවස්ස එතදහොසි: සමන්නාගතො ඛො සමණො ගොතමො ද්වත්තිංසමහාපුරිසලක්ඛණෙහි පරිපුණ්ණෙහි නො අපරිපුණ්ණෙහීති භගවන්තං එතදවොච: "හන්ද ච'දානි මයං භො ගොතම ගච්ඡාම. බහුකිච්චා මයං බහුකරණීයා"ති.

"යස්ස'දානි තුම්හෙ අම්බට්ඨ කාලං මඤ්ඤසීති".

අථ ඛො අම්බට්ඨො මාණවො වළවාරථමාරුය්හ පක්කාමි.

92. තෙන ඛො පන සමයෙන බ්‍රාහ්මණො පොක්ඛරසාදි උක්කට්ඨාය නික්ඛමිත්වා මගධෙසු බ්‍රාහ්මණගණෙන සද්ධිං සකෙ ආරාමෙ නිසින්නො හොති අම්බට්ඨං යෙව මාණවං පතිමානෙන්තො. අථ ඛො අම්බට්ඨො මාණවො යෙන සකො ආරාමො තෙන පායාසි. යාවතිකා යානස්ස භූමි යානෙන ගන්ත්වා යානා පච්චොරොහිත්වා පත්තිකො'ව යෙන බ්‍රාහ්මණො පොක්ඛරසාදි තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා බ්‍රාහ්මණං පොක්ඛරසාදිං අභිවාදෙත්වා එකමන්තං නිසීදි.

93. එකමන්තං නිසින්නං ඛො අම්බට්ඨං මාණවං බ්‍රාහ්මණො පොක්ඛරසාදි එතදවොච: කච්චි තාත අම්බට්ඨ අද්දස තං භවන්තං ගොතමන්ති ?.

"අද්දසාම ඛො මයං භො තං භවන්තං ගොතමන්ති."

"කච්චි තාත අම්බට්ඨ තං භවන්තං ගොතමං තථා සන්තං යෙව සද්දො අභිඤ්ඤාතො නො අඤ්ඤථා ? කච්චි පන භො සො භවං ගොතමො තාදිසො නො අඤ්ඤාදිසො ?"ති.

"තථා සන්තො යෙව භො තං භවන්තං ගොතමං සද්දො අභිඤ්ඤාතො නො අඤ්ඤථා. තාදිසො'ව භො සො භවං ගොතමො නො අඤ්ඤාදිසො. සමන්නාගතො ච භො සො භවං ගොතමො ද්වත්තිංසමහාපුරිසලක්ඛණෙහි පරිපුණ්ණෙහි නො අපරිපුණ්ණෙහි"ති.

91. එ කල්හි "මේ අම්බට්ඨ මාණවක තෙමේ මා සිරුරෙහි බෙහෙවින් දෙකක් හැර දෙතිස් මහපුරිස් ලකුණු දකී ම ය. කොශාවගිත අංගජාතයත් පුළුල් දිවත් යන මහපුරිස් ලකුණු දෙක්හි සැක කෙරෙයි, සතිටුහනට නො ඛයී. නො පැහැදෙයි. (එ බැවින් මොහුට ඒ මහපුරිස් ලකුණු දෙක පෙන්විමි නම් යෙහෙකැ.)"යි භාග්‍යවතුන් වහන්සේට මේ සිත වී ය.

ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ තමන්ගේ කොශාවගිත අංගජාතය යම්සේ අම්බට්ඨ මාණවකයා දක්නේ ද, එසේ වූ සෘද්ධ්‍යභිසංස්කාරයක් කළ සේක. එයින් පසු දිව නිකුත් කොට දෙ කන් සිදුරු සපයී කළ සේක. දෙනාස්පුඩු පිරිමැදිද සේක. සියලු තලල් මඬල දිවෙන් වැසූ සේක.

එවිට 'ශ්‍රමණ ගෞතම තෙමේ නොඅඩු පිරිපුන් දෙතිස් මහපුරිස් ලකුණින් සමන්විත යැ 'යි අම්බට්ඨ මාණවකයාට මේ සිත වී ය.

ඉක්බිති ඒ භාග්‍යවතුන් වහන්සේට, "භවද් ගෞතමයිනි, දැන් අපි යමිහ. අපි බොහෝ කෘත්‍ය ඇත්තමෝ, බොහෝ කටයුතු ඇත්තමෝ වමිහ"යි කී ය.

"අම්බට්ඨය, යම් ගමනකට තෝ කාලය සිතහි නම්, ඒ ගමන කරන්නැ"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

ඉක්බිති අම්බට්ඨ මාණවක තෙමේ වෙළෙඹුන් යෙදූ රියෙක නැග නික්මුණේ ය.

92. එ සමයෙහි වූ කලි පොක්ඛරසාදි බමුණු තෙමේ උක්කට්ඨා නුවරින් නික්මැ, අම්බට්ඨ මාණවකයා (ගේ ඊම) බලා පොරොත්තු වනුයේ, මහත් බමුණුමුළුවක් හා සිය අරමෙහි හුන්නේ වෙයි. එ කල්හි අම්බට්ඨ මාණවක තෙමේ සිය අරම කරා එළැඹියේ ය. රියෙන් යැ හැකි තාක් රියෙන් ගොස් එයින් බැස, පා ගමන් ඇත්තේ ම පොක්ඛරසාදි බමුණා වෙත එළැඹියේ ය. එළැඹ ඔහු වැඳ පසෙක හිඳ ගත්තේ ය.

93. පසෙක හුන් අම්බට්ඨ මාණවකයාගෙන් පොක්ඛරසාදි බමුණු තෙමේ "කිමෙක් ද? දරුව අම්බට්ඨය, ඒ භවද්ගෞතමයන් දුටු ද?"යි විමසූ ලේ ය.

"භවතාණනි, ඒ භවද්ගෞතමයන් අපි දුටුමිහ"යි අම්බට්ඨ කී ය.

[පොක්ඛරසාදි:] "කිමෙක් ද? දරුව අම්බට්ඨය, ඒ භවත් ගෞතමයන්ගේ එසේ ඇත්තාවූ ම ගුණ පිළිබඳ වූ කීර්තිශබ්දයෙක් නැඟුණේ ද? අන් පරිද්දෙකින් නො වේ ද? (තැති ගුණ පිළිබඳ ශබ්ක් නො නැඟුණේ ද?) භවත, ඒ භවද්ගෞතම තෙමේ එබඳුම ද? අන් සැටි නො වේ ද?"

[අම්බට්ඨ:] "භවතාණනි, ඒ භවද්ගෞතමයන්ගේ එසේ ඇත්තාවූ ම ගුණ පිළිබඳ වූ කීර්තිශෝෂයෙක් නැඟිණ. අන් පරිදි වූ (තැති ගුණ පිළිබඳ වූ ශෝෂ)යෙක් නො වේ. භවතාණනි, ඒ භවද්ගෞතම තෙමේ එබඳු ම ය. අන් සැටි නො වේ. භවතාණනි, ඒ භවද්ගෞතම තෙමේ අඩු නොවූ පිරිපුන් දෙතිස් මහපුරිස්ලකුණින් යුතු වේ."

"අහු පන තෙ තාත අම්බට්ඨ සමණෙන ගොතමෙන සද්ධිං කොචිදෙව කථාසල්ලාපො?"ති.

"අහු ඛො යෙව හො සමණෙන ගොතමෙන සද්ධිං කොචිදෙව කථාසල්ලාපො ?"ති.

"යථාකථං පන තෙ තාත අම්බට්ඨ අහු සමණෙන ගොතමෙන සද්ධිං කොචිදෙව කථාසල්ලාපො ?"ති.

අථ ඛො අම්බට්ඨො මාණවො යාවතකො අහොසි භගවතා සද්ධිං කථාසල්ලාපො තං සබ්බං බ්‍රාහ්මණස්ස පොක්ඛරසාදිස්ස ආරොචෙසි.

94. එවං වුත්තෙ බ්‍රාහ්මණො පොක්ඛරසාදි අම්බට්ඨං මාණවං එතදවොච: "අහො වත රෙ, අම්හාකං පණ්ඩිතකා! අහො වත රෙ අම්හාකං බහුස්සුතකා! අහො වත රෙ, අම්හාකං තෙවිජ්ජකා! එවරූපෙන කිර හො පුරිසො අත්ථවරකෙන කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජය්‍ය. යදෙව ඛො ත්වං අම්බට්ඨ තං භවන්තං ගොතමං එවං ආසජ්ජ ආසජ්ජ අවචාසි. අථ ඛො භවං ගොතමො අමෙහ'පි එවං උපනෙය්‍ය උපනෙය්‍ය අවච. අහො වත රෙ, අම්හාකං පණ්ඩිතකා! අහො වත රෙ, අම්හාකං බහුස්සුතකා! අහො වත රෙ, අම්හාකං තෙවිජ්ජකා! එවරූපෙන කිර හො පුරිසො අත්ථවරකෙන කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජය්‍යා"ති කුපිතො අනත්තමනො අම්බට්ඨං මාණවං පදසා යෙව පවත්තෙසි. ඉච්ඡති ච තාවදෙව භගවන්තං දස්සනාය උපසඞ්කමිතුං.

95. අථ ඛො තෙ බ්‍රාහ්මණා බ්‍රාහ්මණං පොක්ඛරසාදිං එතදවොචුං: අතිවිකාලො ඛො හො අජ්ජ සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිතුං. සෙවදානි භවං පොක්ඛරසාති සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිස්සති"ති.

අථ ඛො බ්‍රාහ්මණො සකෙ නිවෙසනෙ පණීතං ඛාදනීයං භොජනීයං පටියාදාපෙත්වා යානෙසු ආරොපෙත්වා උක්කාසු ඛාරියමානාසු උක්කාවත්‍යා නික්ඛමි. යෙන ඉච්ඡානඞ්ගලවනසණ්ඩො තෙන පායාසි. යාවතිකා යානස්ස භූමි යානෙන ගන්ත්වා යානා පච්චොරොහිත්වා පත්තිකො'ව යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදනීයං කථං සාරණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො බ්‍රාහ්මණො පොක්ඛරසාදි භගවන්තං එතදවොච: "ආගමිංසු ඛ්විධ හො ගොතම අම්හාකං අන්තෙවාසී අම්බට්ඨො මාණවො ?"ති.

[පොක්ඛරසාදි:] "දරුව, අම්බට්ඨය, ශ්‍රමණ ගෞතමයන් හා තෙමේ කිසියම් කතාබහෙක් වී ද ?"

[අම්බට්ඨ] "භවතාණනි, ශ්‍රමණ ගෞතමයන් හා මිමේ කිසි යම් කතාබහෙක් වී ය."

[පොක්ඛරසාදි:] "අම්බට්ඨය, ශ්‍රමණ ගෞතමයන් හ තෙමේ ඒ සල්ප කථාසංලාපය කෙසේ වූ එකෙක් ද ?"

ඉක්බිති අම්බට්ඨ මාණවකයා භාග්‍යවතුන් වහන්සේ හා යම් පමණ තමාගේ කථාසංලාපයෙක් වී ද ඒ සියල්ල පොක්ඛරසාදි බමුණාට සැළ කෙළේ ය.

94. එසේ සැළ කළ කල්හි, පොක්ඛරසාදි තෙමේ අම්බට්ඨ මාණවකයා අමතා, "යහහා, කොළ, අප ඊතියා පණ්ඩිතය! යහහා, කොළ, අප ඊතියා මහ උගත! යහහා, කොළ, අප ඊතියා ත්‍රිවිද්‍ය දතුව! එම්බල, මෙබඳු තා වැනි ඊතියා වැඩ සලසන්නකු කරණ කොට ගෙන (තා වැන්නකු ඇති කල්හි ඇසුරු කරන) මිනිසා කායිත් මරණින් මතු සැප නැති දුර්ගති වූ තමාට අවනත වැ වැටෙන තැන වූ නිරයට පැමිණෙන්නේ ම ය. යම් හෙයකින් ම, අම්බට්ඨය, තෝ මෙසේ ඒ භවදී ගෞතමයනට ගට ගටා කියෙහි ද, එ හෙයින් ම භවදී ගෞතමයෝ මෙසේ අපටත් සැඟෙවුණු දැ මතු කොට ශුද්‍රාදි බව නහා නහා මෙසේ කීහ. යහහා, කොළ, අප ඊතියා පණ්ඩිතය! යහහා, කොළ, අප ඊතියා මහ උගත! යහහා, කොළ, අප තෙවිදු දතුව! භවත්නි, මෙ වැනි වැඩ සලසන්නකු කරණ කොට ගෙන මිනිසා කායිත් මරණින් මතු සැප නැති, දුර්ගති වූ, විනිපාතයක් වූ නිරයට පැමිණෙන්නේ ම යැ!" යි මේ බස් කී ය. මේසේ කියා, කිපුණේ, නොසතුටු සිතැත්තේ, පයින් පැහැරැ ඔහු බිමැ පෙරැළී ය. එ කෙණෙහි ම භාග්‍යවතුන් වහන්සේ දක්නට යහු කැමැති ද වී ය.

95. එවිටැ ඒ බමුණෝ පොක්ඛරසාදි බමුණුට "භවත, අද (දැන්) ශ්‍රමණ ගෞතමයන් දක්නට යන්නට ඉතා නොකල් වෙයි. භවත් පොක්ඛරසාදි තෙමේ හෙට දිනැ ශ්‍රමණ ගෞතමයන් දක්නට එළැඹියැ හැකි වන්නේ යැ"යි කීහ.

ඉක්බිති පොක්ඛරසාදි බමුණු තෙමේ සිය නිවසෙහි මිහිරි වූ කෑ සුතු බුදින සුතු දැ පිළියෙල කරවා, යානයන්හි තංවා දඹුවැට පහන් දරනු ලබන කල්හි උක්කට්ඨා නුවරින් නික්මුණේ ය. ඉවජානංගල වන ලැහැබ කරා එළැඹියේ ය. යානයෙන් යැ හැකි තෑක් දුර යානයෙන් ගොස්, එයින් බැස, පයින් ම භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ ය. එළැඹැ භාග්‍යවතුන් වහන්සේ හා සතුටු විය. සතුටට කරුණු වූ සිතැ රැඳවියැ සුතු වූ (සිහි කටයුතු වූ) කථාව නිමවා පසෙක හිඳ ගත්තේ ය, පසෙක සුන්නේ ම පොක්ඛරසාදි බමුණු තෙමේ "භවද්ගෞතමයිනි, අප අතැවැසි අම්බට්ඨ මාණවකයා මෙහි ආයේ දැ ?"යි භාග්‍යවතුන් වහන්සේගෙන් ඇසී ය.

"ආගමා ඛො තෙ බ්‍රාහ්මණ අත්තවාසී අම්බට්ඨො මාණවො"ති.

"අත්‍ථි පන තෙ හො ගොතම අම්බට්ඨෙන මාණවෙන සද්ධිං කොචිදෙව කථාසල්ලාපො ?"ති.

"අත්‍ථි ඛො මෙ බ්‍රාහ්මණ අම්බට්ඨෙන මාණවෙන සද්ධිං කොචිදෙව කථාසල්ලාපො"ති.

"යථාකථං පන තෙ හො ගොතම අත්‍ථි අම්බට්ඨෙන මාණවෙන සද්ධිං කොචිදෙව කථාසල්ලාපො ?"ති.

අථ ඛො භගවා යාවතිකො අහොසි අම්බට්ඨෙන මාණවෙන සද්ධිං කථාසල්ලාපො, තං සබ්බං බ්‍රාහ්මණස්ස පොක්ඛරසාදිස්ස ආරොචෙසි.

"එවං වුත්තෙ බ්‍රාහ්මණො පොක්ඛරසාදී භගවන්තං එතදවොච: බාලො හො ගොතම අම්බට්ඨො මාණවො. ඛමතු භවං ගොතමො අම්බට්ඨස්ස මාණවස්සා"ති.

"සුඛි හොතු බ්‍රාහ්මණ අම්බට්ඨො මාණවො"ති.

96. අථ ඛො බ්‍රාහ්මණො පොක්ඛරසාදී භගවතො කායෙ ද්වත්තිංස-මහාපුරිසලක්ඛණානි සමන්වෙසි. අද්දස ඛො බ්‍රාහ්මණො පොක්ඛරසාදී භගවතො කායෙ ද්වත්තිංසමහාපුරිසලක්ඛණානි යෙභුය්‍යෙන ඨපෙත්වා ද්වෙ. ද්වීසු මහාපුරිසලක්ඛණෙසු කඞ්ඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති කොසොහිතෙ ච වත්ථගුය්හෙ පඤ්ඤත්තිඡත්තෙ ච.

97. අථ ඛො භගවතො එතදහොසි: පස්සති ඛො මෙ අයං බ්‍රාහ්මණො පොක්ඛරසාදී ද්වත්තිංසමහාපුරිසලක්ඛණානි යෙභුය්‍යෙන ඨපෙත්වා ද්වෙ. ද්වීසු මහාපුරිසලක්ඛණෙසු කඞ්ඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති කොසොහිතෙ ච වත්ථගුය්හෙ පඤ්ඤත්තිඡත්තෙ චාති.

අථ ඛො භගවා තථාරූපං ඉද්ධාභිසඞ්ඛාරං අභිසඞ්ඛාසි යථා අද්දස බ්‍රාහ්මණො පොක්ඛරසාදී භගවතො කොසොහිතං වත්ථගුය්හං. අථ ඛො භගවා ජිව්හං නික්ඛාමෙත්වා උභො'පි කණ්ණසොතානි අනුමසි, පරිමසි, උභො'පි නාසිකාසොතානි අනුමසි, පරිමසි. කෙවලම්පි නලාටමණ්ඩලං ජිව්හාය ඡාදෙසි.

98. අථ ඛො බ්‍රාහ්මණස්ස පොක්ඛරසාදිස්ස එතදහොසි: "සම්පන්නාගතො ඛො සමණො ගොතමො ද්වත්තිංසමහාපුරිසලක්ඛණෙහි පරිපුණ්ණෙහි නො අපරිපුණ්ණෙහි"ති භගවන්තං එතදවොච: අධිවාසෙතු මෙ භවං ගොතමො අජ්ජතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනා"ති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන.

99. අථ ඛො බ්‍රාහ්මණො පොක්ඛරසාදී භගවතො, අධිවාසනං විදිත්වා' භගවතො කාලං ආරොචෙසි: ,කාලො හො ගොතම, නිට්ඨිතං භත්තන්ති.'

[භාග්‍යවත්හු:] "බමුණ, තා අතැවැසි අම්බට්ඨමාණවකයා මෙහි ආයේ ම ය."

[පොක්ඛරසාදි:] "භවද්ගෞතමයිනි, අම්බට්ඨමාණවකයා හා ඔබේ කිසි කථාසංලාපයෙක් වූයේ ද ?"

[භාග්‍යවත්හු:] "බමුණ, අම්බට්ඨමාණවකයා හා මගේ කිසි (සවල්ප) කථාසංලාපයෙක් වූයේ ම ය."

[පොක්ඛරසාදි:] "භවද්ගෞතමයිනි, අම්බට්ඨ මාණවකයා හා ඔබගේ කෙබඳු වූ කිසි කථාසංලාපයෙක් වූයේ ද ?"

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අම්බට්ඨ මාණවකයා හා යම් පමණ කථා සංලාපය වී ද, ඒ සියල්ල පොක්ඛරසාදි බමුණාට වදාළ සේක.

මෙසේ වදාළ කල්හි පොක්ඛරසාදි බමුණු තෙම, "භවද්ගෞතමයිනි, අම්බට්ඨ මාණවකයා ලාමක ය. භවද්ගෞතමයෝ අම්බට්ඨ මාණවකයාට ක්ෂමා කෙරෙත් වා"යි කී ය.

"බමුණ, අම්බට්ඨ මාණවක තෙමේ සුව පත් වේ වා"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

96. ඉක්බිති පොක්ඛරසාදි බමුණු තෙම භාග්‍යවතුන් වහන්සේගේ සිරුරෙහි දෙතිස් මහපුරිස්ලකුණු පිරික්සී ය. පොක්ඛරසාදි බමුණු වනාහි භාග්‍යවතුන් වහන්සේගේ සිරුරෙහි දෙතිස් මහපුරිස් ලකුණු අතුරෙන් දෙකක් හැර සෙස්ස බෙහෙවින් දිටි ය. හේ කොශාවහිත අංගජාත ලක්ෂණයෙහිත් ප්‍රභූතජිහ්වාලක්ෂණයෙහිත් දැ යි මේ මහපුරිස්-ලකුණු දෙක්හි සැක කෙරෙයි, තීරණයකට නො බසී. එ හෙයින් ම නො පැහැදෙයි.

97. එවිට භාග්‍යවතුන් වහන්සේට "මේ පොක්ඛරසාදි බමුණු තෙමේ දෙතිස් මහපුරිස්ලකුණුවලින් දෙකක් හැර සෙස්ස බෙහෙවින් දකී ම ය. කොශාවහිත අංගජාතලක්ෂණයෙහිත් ප්‍රභූතජිහ්වාලක්ෂණයෙහිත් යන මහපුරිස්ලකුණු දෙක්හි සැක කෙරෙයි, තීරණයට නො බසී, නො පැහැදෙයි. (ඒ දෙ ලකුණු මොහුට දක්වන්නෙමි නම් යෙහෙකැ) "යි මේ සිත වී ය.

ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ තමන් වහන්සේගේ කොශාවහිත අංගජාතය පොක්ඛරසාදි බමුණාට පැනෙන සේ වූ සෘද්ධාභිසංස්කාරයක් කළ සේක. ඉන් පසු දිව තික්මවා දෙකන් සිදුරු ස්පර්ශ කළ සේක, පිරිමැද්ද සේක, දෙ නාස්පුඩු ස්පර්ශ කළ සේක, පිරිමැද්ද සේක, මුළු තලල් තලය ම දිවෙන් වැසූ සේක.

98. එවිටැ පොක්ඛරසාදි බමුණාට "ශ්‍රමණ ගෞතම තෙමේ අඩු නොවූ පිරිපුන් දෙතිස් මහපුරිස්ලකුණින් සමන්විත යැ"යි මේ සිත විය. හේ "භවද් ගෞතම තෙමේ බික්සඟත හා අදට මගේ බත ඉවසා වා'යි කී ය. භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම්භාවයෙන් එය ඉවැසූ සේක.

99. ඉක්බිති පොක්ඛරසාදි බමුණු තෙම භාග්‍යවතුන් වහන්සේගේ ඉවැසීම (සිතින් පිළිගැන්ම) දැන, භාග්‍යවතුන් වහන්සේට "භවද් ගෞතමයිනි, දැන් කල් පැමිණියේ ය, බත පිළියෙල කොට නිමැවිණැ"යි කල් දැන්වී ය.

අථ ඛො භගවා පුබ්බන්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සද්ධිං භික්ඛුසඞ්ඝෙන යෙන බ්‍රාහ්මණස්ස පොක්ඛරසාදිස්ස පරිවෙසනා තෙනුප-සඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. අථ ඛො බ්‍රාහ්මණො පොක්ඛරසාති භගවන්තං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්থං සන්තප්පෙසි සම්පවාරෙසි. මාණවකා'පි භික්ඛුසඞ්ඝං. අථ ඛො බ්‍රාහ්මණො පොක්ඛරසාති භගවන්තං භුත්තාවිං ඔනීතපත්තපාණිං අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා එකමන්තං නිසීදි.

100. එකමන්තං නිසින්නස්ස ඛො බ්‍රාහ්මණස්ස පොක්ඛරසාදිස්ස භගවා ආනුපුබ්බිකථං කථෙසි, සෙය්‍යථිදං: දානකථං සීලකථං සග්ගකථං කාමානං ආදීනවං ඔකාරං සංකිලෙසං නෙක්ඛම්මෙ ච ආනිසංසං පකාසෙසි. යදා භගවා අඤ්ඤාසි බ්‍රාහ්මණං පොක්ඛරසාතිං කල්ලචිත්තං මුදුචිත්තං විනීවරණචිත්තං උදග්ගචිත්තං පසන්නචිත්තං, අථ යා බුද්ධානං සාමුක්කංසිකා ධම්මදෙසනා තං පකාසෙසි: දුක්ඛං සමුදයං නිරොධං මග්ගං.

සෙය්‍යථාපි නාම සුද්ධං වත්ථං අපගතකාළකං සම්මදෙව රජනං පටිග්ගණ්හෙය්‍ය, එවමෙව බ්‍රාහ්මණස්ස පොක්ඛරසාදිස්ස තස්මිං යෙව ආසනෙ විරජං විතමලං ධම්මචක්ඛුං උදපාදි යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මන්ති.

101. අථ ඛො බ්‍රාහ්මණො පොක්ඛරසාදී දිට්ඨධම්මො පත්තධම්මො විදිතධම්මො පරියොගාළ්හධම්මො තිණ්ණවිචිකිච්ඡො විගතකථංකථො වෙසාරජ්ජප්පත්තො අපරප්පච්චයො සත්ථුසාසනෙ භගවන්තං එතදවොච: "අභික්කන්තං භො ගොතම අභික්කන්තං භො ගොතම. සෙය්‍යථාපි භො ගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නං වා විවරෙය්‍ය මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛු-මන්තො රූපානි දක්ඛන්තීති, එවමෙව භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භො ගොතම සපුත්තො සභරියො සපරිසො සාමච්චො භවන්තං ගොතමං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතං. යථා ච භවං ගොතමො උක්කට්ඨාය අඤ්ඤෙ උපාසකකුලානි උපසඞ්කමති එවමෙව භවං ගොතමො පොක්ඛරසාදිකුලං උපසඞ්කමතු. තත්ථ යෙ තෙ මාණවකා වා මාණවිකා වා භවන්තං ගොතමං අභිවා-දෙස්සන්ති වා පච්චුට්ඨෙස්සන්ති වා ආසනං වා උදකං වා දස්සන්ති චිත්තං වා පසාදෙස්සන්ති, තෙසං තං භවිස්සති දීඝරත්තං හිතාය සුඛාය"ති. "කල්‍යාණං වුච්චති බ්‍රාහ්මණ"ති.

අම්බට්ඨසුත්තං තතියං.

එවිට භාග්‍යවතුන් වහන්සේ (ඒ) පෙරවරුයෙහි සිවුරු හැඳ පෙරෙවැ පාත්‍රිවුරු ගෙන බික්ෂාහන සමග පොක්කරසාදී බමුණාගේ පිරිවෙස්න (=බොජුන් වළඳනා තැන) කරා වැඩි සේක. වැඩ, පැණවුණු අස්තෙහි හුන් සේක. ඉක්බිති පොක්කරසාදි බමුණු තෙම මිහිරි වූ කැපුතු බුදිය පුතු දැසින් සිසතින් භාග්‍යවතුන් වහන්සේ ඇතැප්වි ය. මෑතැමින් පැවැරැවි ය. මාණවකයෝ ද බික්ෂාහන සැතැප්වූහ, මෑතැමින් පැවැරැවූහ..

එසින් පසු පොක්කරසාදි බමුණා භාග්‍යවතුන් වහන්සේ, වළඳ පාත්‍රයෙන් ඉවත් කළ අත ඇත්තවුන් දැන, එක්තරා මිටි අස්නක් ගෙන පසෙක හුන්නේ ය.

101. එකත්පස්හි හුන් පොක්කරසාදි බමුණහුට භාග්‍යවතුන් වහන්සේ දානකථා, ශීලකථා, සවර්ගකථා, කාමදීනව, කාමයන්ගේ ලාමක බව, කාමයන්ගේ කෙලෙසීම, නෙක්කම්මයෙහි (කාමයන්ගෙන් නික්මුණු-බවිහි)අනුසස් පැවැසූ සේක. භාග්‍යවතුන් වහන්සේ යම් විටෙක පොක්කරසාදි බමුණහු (ඒ බණ ඇසීමෙන්) නිරෝධ සිතැති වූවහු, මොළොක් සිතැති වූවහු, නීවරණ කෙරෙන් පහ වූ සිත්තැත්තහු, ඔද වැඩි හිය සිතැත්තහු, පහත් සිතැත්තහු දත් සේක් ද, එ කල්හි දුඃඛ සමුදය නිරෝධ මාර්ග යන බුදුවරුන්ගේ යම් සාමුත්කර්ෂිකී ධර්මදේශනාවෙක් වේ තම් එය පැවැසූ සේක.

යම්සේ පහ වූ කළුබව ඇති, පිරිසිදු වතෙක් මොනොවට රජත් (පඬු) උරා ගන්නේ ද, එසේ ම පොක්කරසාදි බමුණාට එ අස්තෙහි ම 'යමක් උපදනා සුලු නම් ඒ සියල්ල නැසෙන සුලු යැ' සි කෙලෙස් රජස් නැති, පහ වූ කෙලෙස්මල ඇති, දහම් ඇස පහළ විය.

ඉක්බිති පොක්කරසාදි බමුණු තෙම දුටු ආර්‍යසත්‍ය ධර්ම ඇත්තේ, ලැබූ ආර්‍යසත්‍යාවබෝධය ඇත්තේ, දැන ගත් ආර්‍යසත්‍ය ධර්ම ඇත්තේ, බැසැ ගත් ආර්‍යසත්‍ය ධර්ම ඇත්තේ, ඉක්මැවූ සැක ඇත්තේ, පහ වූ සැක ඇත්තේ, බුදු සස්නැ විසාරද බවට පැමිණියේ, තමාම පසක් කළ බැවින් හැදැහිය පුතු අනෙකක්හු නැත්තේ, භාග්‍යවතුන් වහන්සේට මෙය කී ය:

"භවද්ගෞතමයිනි, අභික්‍රාන්ත ය (විශෙසින් සිත්කලු ය). භවද් ගෞතමයිනි, අභික්‍රාන්ත ය. භවද් ගෞතමයිනි, මුනින් නමා තැබූ දැයක් උඩුකුරු කරන්නේ යම් සේ ද, වැසුණු දැයක් විවෘත කරනුයේ යම්සේ ද, මං මුළා වූවකුට මඟ කියන්නේ යම්සේ ද, ඇස් ඇත්තෝ රූප දක්නාඟ යි සිතා තෙල් පහනක් දල්වන්නේ යම් සේ ද, එසේ ම, භවද් ගෞතමයන් විසින් නොයෙක් කරුණින් ධර්ම ය පැවැසිණ. භවද්ගෞතමයිනි, ඒ මම භාග්‍යව සරණ වැ, පිරිස් සරණ වැ, මෙහෙකරුවන් සරණ වැ භවද්ගෞතමයන් ද ධර්ම ය ද භික්ෂුසංඝයා ද සරණ යෙමි. අද පටන් දිවි හිමි කොට සරණ ගිය උවසකු කොට භවද්ගෞතම තෙමේ මා සලකා වා. යම්සේ භවද්ගෞතම තෙමේ උක්කට්ඨා නුවරෙහි අන් උපාසකකුලයන් කරා එළැඹේ ද, එසේ ම පොක්කරසාදිකුලයට ද එළැඹේ වා. එහි යම් මාණවක කෙනෙක් හෝ මාණවිකා කෙනෙක් හෝ භවද් ගෞතමයන් ආදරයෙන් වඳින්නෝ ද, දැක හුනස්නෙන් නැගී හෝ සිටින්නෝ ද, අසුන් හෝ දිය හෝ දෙන්නෝ ද, සිත හෝ පහදවන්නෝ ද, එය ඔවුනට දික් කලක් වැඩ පිණිස, සුව පිණිස වන්නේ ය".

මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ "බ්‍රාහ්මණය, මනා දැයෙක් සොප කී සේ මැනැවැ"යි වදාළ සේක.

අම්බට්ඨ සූත්‍රය නිමිසේ ය.

4

සොණදණ්ඩසුත්තං

1. එවං මේ සුතං. එකං සමයං භගවා අඞ්ගේසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝේන සද්ධිං පඤ්චමත්තේහි භික්ඛුසතේහි යේන චම්පා තදවසරි. තත්‍ර සුදං භගවා චම්පායං විහරති ගග්ගරායා පොක්ඛරණියා තීරේ.

තේන ඛො පන සමයේන සොණදණ්ඩො බ්‍රාහ්මණො චම්පං අජ්ඣාවසති සත්තුස්සදං සතිණකට්ඨොදකං සධඤ්ඤං රාජභොග්ගං රඤ්ඤා මාගධේන සේනියේන බිම්බිසාරේන දින්නං රාජදායං බ්‍රහ්මදෙය්‍යං.

2. අස්සොසුං ඛො චම්පෙය්‍යකා බ්‍රාහ්මණගහපතිකා "සමණො ඛලු භො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො අඞ්ගේසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝේන සද්ධිං පඤ්චමත්තේහි භික්ඛුසතේහි චම්පං අනුප්පත්තො, චම්පායං විහරති ගග්ගරාය පොක්ඛරණියා තීරේ. තං ඛො පන භවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො: "ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දේවමනුස්සානං බුද්ධො භගවා'ති. සො ඉමං ලොකං සදේවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදේවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවේදෙති. සො ධම්මං දේසෙති ආදිකල්‍යාණං මජ්ඣේකල්‍යාණං පරියොසානකල්‍යාණං සත්ථං සබ්‍යඤ්ජනං කේවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති. සාධු ඛො පන තථාරූපානං අරහතං දස්සනං හොතී"ති.

3. අථ ඛො චම්පෙය්‍යකා බ්‍රාහ්මණගහපතිකා චම්පාය නික්ඛමිත්වා සඞ්ඝසඞ්ඝී ගණීභූතා යේන ගග්ගරා පොක්ඛරණී තේනුපසඞ්කමන්ති.

4. තේන ඛො පන සමයේන සොණදණ්ඩො බ්‍රාහ්මණො උපරිපාසාදේ දිවාසෙය්‍යං උපගතො හොති. අද්දස්සා ඛො සොණදණ්ඩො බ්‍රාහ්මණො චම්පෙය්‍යකේ බ්‍රාහ්මණගහපතිකේ චම්පාය නික්ඛමිත්වා සඞ්ඝසඞ්ඝී ගණීභූතේ යේන ගග්ගරා පොක්ඛරණී තේනුපසඞ්කමන්තේ. දිස්වා ඛත්තං ආමන්තේසි: "කිඤ්චාපි ඛො භො ඛත්තේ චම්පෙය්‍යකා බ්‍රාහ්මණගහපතිකා චම්පාය නික්ඛමිත්වා සඞ්ඝසඞ්ඝී ගණීභූතා යේන ගග්ගරා පොක්ඛරණී තේනු-පසඞ්කමන්ති ?"ති

4

සොණදණ්ඩ සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදි: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් පන්සියක් පමණ වූ මහත් පැවිදි මුළුවක් හා අංග රටෙහි සැරිසරන සේක්, චම්පා නුවරට වැඩි සේක. භාග්‍යවතුන් වහන්සේ එහි ඒ චම්පා නුවර සමීපයෙහි ගඟීරා පොකුණු තෙරැ වසන සේක.

එ සමයෙහි සොණදණ්ඩ බමුණු තෙමේ බහුජනාකීර්ණ වූ, තණ දඬු දිය සුලභ වූ, බොහෝ ධන ධාන්‍ය ඇති, රජුහුගෙන් ලත් නින්දගම් වූ (රාජභෝග්‍ය රූපයෙන් පරිභෝග කට සුදු වූ), මගධ රටට අධිපති සේනිය බිම්බිසාර රජු විසින් දුන් රාජදායාද්‍ය වූ, ශ්‍රෙෂ්ඨ ත්‍යාගය වූ චම්පා නුවරැ වෙසෙයි.

2. චම්පා නුවරැ වැසි බමුණුගැහැවියෝ (රටෙහි පැතිරැ පැවැති) මතු දැක්වෙන කථාව ඇසූහ: "භවත්නි, ශාක්‍යපුත්‍ර වූ, ශාක්‍යකුලයෙන් නික්මැ පැවිදි වූ, ශ්‍රමණ ගෞතම තෙමේ වූ කලි භික්ෂූන් පන්සියක් පමණ වූ මහපැවිදිමුළුවක් හා අඟුරවැ සැරි සරනුයේ, චම්පාවට පැමිණියේ, එය අසලැ ගඟීරා පොකුණ තෙරැ වෙසෙයි. ඒ භගවත් තෙමේ මේ මේ කරුණින් අර්හත් ය, සම්‍යක්සම්බුද්ධ ය, විද්‍යාචරණසම්පන්න ය, සුගත ය, ලෝකවිත් ය, නිරුත්තර පුරුෂදම්‍යසාරථි ය, දෙවිමිනිසුනට ශාස්තෘ ය, බුද්ධ ය, භගවත් ය. හේ දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත මේ ලොව, මහණබමුණන් සහිත දෙවි මිනිසුන් සහිත මේ සත්ත්වවර්ගයා, තමා ම සිය විශිෂ්ට නුවණින් දැන පසක් කොට ලොවට දන්වයි. ආදිකල්‍යාණ මධ්‍යකල්‍යාණ පර්යවසානකල්‍යාණ වූ (සතිපට්ඨානාදි) මනා අර්ථ ඇති, මනා (සම්පූර්ණ) ව්‍යංජන ඇති, සවිශේෂ පරිපූර්ණ, පිරිසිදු දහමක් දෙසයි. එසේ දෙසනුයේ ද, සියලු සසුන්බඹසර පවසයි. එබඳු රහතුන් දැක්ම වූ කලි හිත වැඩ ගෙනැ දෙන්නෙකැ'යි ඒ භවද් ගෞතමයන් වහන්සේ පිළිබඳ මෙසේ උතුම් වූ කීර්ත්තිශබ්දයෙක් උස් වැ නැංගේ ය" යනු යි.

3. ඉක්බිති චම්පාපුර වැසි බමුණෝත් ගැහැවියෝත් චම්පායෙන් නික්මැ බොහෝ බොහෝ වැ රැස් වූවෝ, එකි එකි පැත්තෙහි මුළු මුළු වැ නුවරින් පිටතැ දී මහ මුළුවෙක් වැ එකතු වූවෝ, ගඟීරා පොකුණ අතට යෙති.

4. එ සමයෙහි සොණදණ්ඩ බමුණු තෙමේ තමා පහයැ උඩු මහලෙහි දවසහතට පැමිණියේ වෙයි. හේ (කවළියෙන් බලනුයේ) චම්පායෙන් නික්මැ බොහෝ බොහෝ වී රැස් වැ, එක් එක් පසැ මුළු මුළු වැ, නුවරින් පිටතැ දී මහ මුළුවක් වැ එකතු වැ ගඟීරා පොකුණ අතට යන චම්පාවාසී බමුණන් ද ගැහැවියන් ද දැක්කේ ය. දැක ක්ෂත්තෘහු බණවා "භවත් ක්ෂත්තෘව, කවර හෙයින් චම්පාවාසී බමුණෝත් ගැහැවියෝත් චම්පායෙන් නික්මැ බොහෝ බොහෝ වී රැස් වැ එකි එකි පසැ මුළු මුළු වැ නුවරින් පිටතැ දී මහ මුළුවෙක් වැ එකතු වැ ගඟීරා පොකුණ කරා යෙත් ද?"සි විචාළේ ය.

"අත්ථි ඛො භො සමණො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො අඞ්ගෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි චම්පං අනුප්පත්තො චම්පායං විහරති ගග්ගරාය පොක්ඛරණියා තීරෙ. තං ඛො පන භවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අභිඤ්ඤාතො: 'ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණ-සම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා'ති. තමෙත භවන්තං ගොතමං දස්සනාය උපසඞ්කමිතබ්බ"න්ති.

5. තෙන ඛො පන සමයෙන සෙත වමෙපය්‍යකා බ්‍රාහ්මණගහපතිකා තෙනුපසඞ්කම්. උපසඞ්කමිත්වා වමෙපය්‍යකෙ බ්‍රාහ්මණගහපතිකෙ එවං වදෙහි: "සොණදණ්ඩො භො බ්‍රාහ්මණො එවමාහ: 'ආගමෙතු කිර භවන්තො සොණදණ්ඩො'පි බ්‍රාහ්මණො සමණං ගොතමං දස්සනාය උපසඞ්ක-මිස්සතී"ති.

'එවං භො'ති ඛො සෙ ඛත්තා සොණදණ්ඩස්ස බ්‍රාහ්මණස්ස පටිස්සුත්වා යෙන වමෙපය්‍යකා බ්‍රාහ්මණගහපතිකා තෙනුපසඞ්කම්. උපසඞ්කමිත්වා වමෙපය්‍යකෙ බ්‍රාහ්මණගහපතිකෙ එතදවොච්: "සොණදණ්ඩො භො බ්‍රාහ්මණො එමාහ: "ආගමෙතු කිර භවන්තො. සොණදණ්ඩො'පි බ්‍රාහ්මණො සමණං ගොතමං දස්සනායඋපසඞ්කමිස්සතී"ති.

6. තෙන ඛො පන සමයෙන තානාවෙරජ්ජකානං බ්‍රාහ්මණානං පඤ්චමත්තානි බ්‍රාහ්මණසතානි චම්පායං පටිවසන්ති කොකනදෙව කරණීයෙන. අස්සොසුං ඛො තෙ බ්‍රාහ්මණා: 'සොණදණ්ඩො කිර බ්‍රාහ්මණො සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිස්සතී'ති. අථ ඛො තෙ බ්‍රාහ්මණා යෙන සොණදණ්ඩො බ්‍රාහ්මණො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා සොණදණ්ඩං බ්‍රාහ්මණං එතදවොචුං: 'සච්චං කිර භවං සොණදණ්ඩො සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිස්සතී' ?"ති

"එවං ඛො මෙ භො හොති අහම්පි සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිස්සාමි"ති.

7. "මා භවං සොණදණ්ඩො සමණං ගොතමං දස්සනාය උපසඞ්කමි. න අරහති භවං සොණදණ්ඩො සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිතුං. සචෙ භවං සොණදණ්ඩො සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිස්සති, භොතො සොණදණ්ඩස්ස යසො හායිස්සති සමණස්ස ගොතමස්ස යසො අභිවඩ්ඪිස්සති. යම්පි භොතො සොණදණ්ඩස්ස යසො හායිස්සති සමණස්ස ගොතමස්ස යසො අභිවඩ්ඪිස්සති, ඉමිනා පඨමෙන න අරහති භවං සොණ-දණ්ඩො සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිතුං. සමණො නෙව ගොතමො අරහති භවන්තං සොණදණ්ඩං දස්සනාය උපසඞ්කමිතුං.

"භවත, කාරණයෙක් ඇත: ශාක්‍යපුත්‍ර වූ, ශාක්‍යකුලයෙන් නික්මැ පැවැදි වූ ශ්‍රමණ ගෞතම තෙමේ අංග රටැ සැරි සරනුයේ, භික්ෂූන් පන්සියක් පමණ වූ මහත් මහණමුළුවක් හා චම්පාවට පැමිණියේ, චම්පා පුර සමීපයේ වූ ගගීරා නම් පොකුණ අද්දරැ වෙසෙයි. 'ඒ භගවත් තෙමේ මේ මේ කරුණින් අර්හත් ය, සම්‍යක්සම්බුද්ධ ය, විද්‍යාචරණ සම්පන්න ය, සුගත ය, ලෝකවිත් ය, නිරුත්තර පුරුෂදම්‍යසාරථි ය, දෙවිමිනිසුනට ශාස්තෘ ය, බුද්ධ ය, භගවත් යැ යි මෙසේ ඒ භවද් ගෞතමයා පිළිබඳ හඳ වූ ගුණකථනයක් උස් වැ නැංගේ ය. මොහු ඒ භවද්ගෞතමයා දක්නා පිණිස එහි යෙත්" යැ යි සෞත්තෘ තෙම කී ය.

5. "භවත් සෞත්තෘව, එසේ වි නම්, ඒ චම්පාවාසී බමුණු ගැහැවියන් වෙත එළැඹ ඔවුනට "භවත්නු (මොහොතක්) බලා පොරොත්තු වෙත්වා. සොණදණ්ඩ බමුණාත් ශ්‍රමණ ගෞතමයන් දක්නට එහි යත්තේයැ' යි සැළ කරව"යි කී ය. 'එසේ ය භවතැ'යි කියා සෞත්තෘ තෙමේ සොණදණ්ඩ බමුණාට පිළිවදන් දී, චම්පාවාසී ඒ බමුණු ගැහැවියන් කරා එළැඹ "භවත්නි, භවත්නු බලා පොරොත්තු වෙත් වා. සොණදණ්ඩ බමුණු ද ශ්‍රමණ ගෞතමයා දක්නට එහි යත්තේ" යැ යි දැන්වී ය.

6. එ සමයෙහි වනාහි තොයෙක් විදෙසින් පැමිණි පන්සියක් පමණ බමුණෝ කිසි කටයුත්තක් පිණිස චම්පා නුවරැ වෙසෙත්. ඒ බමුණෝ 'සොණදණ්ඩ බමුණා මහණ ගොයුම්හු දක්නට යෙත් ලු'යි ඇසූහ. ඉක්බිති ඔහු සොණදණ්ඩ බමුණා කරා ගියහ. ගොස් "භවත් සොණදණ්ඩ තෙමේ මහණ ගොයුමත් දක්නට යත්තේ ලැ යනු සැබැ දැ?"යි විචාළහ.

"භවත්නි, (සැබැ ය) 'මමත් මහණ ගොයුමන් දක්නට යත්නෙමි'යි මට මෙසේ සිතෙක් වේ"යැ යි සොණදණ්ඩ තෙමේ කී ය.

7. එ ඛස් අසා ඔහු කියත්තෝ, "භවත් සොණදණ්ඩ තෙමේ මහණ ගොයුමන් දක්නට නො යේ වා. භවත් සොණදණ්ඩ තෙමේ මහණ ගොයුමන් දක්නට නො නිසි වේ. ඉදින් භවත් සොණදණ්ඩ තෙමේ මහණ ගොයුමන් දක්නට යත්තේ නම්, භවත් සොණදණ්ඩයාගේ යශස් පිරිහෙත්තේ ය, මහණ ගොයුමන්ගේ යශස් වැඩෙත්තේ ය. 'භවත් සොණදණ්ඩයාගේ යශස් පිරිහෙත්තේ ය, මහණ ගොයුමන්ගේ යශස් වැඩෙත්තේ ය, යන යමෙක් ඇද්ද මේ කරුණින් භවත් සොණදණ්ඩ තෙමේ මහණ ගොයුම්හු දක්නා පිණිස එහි යත්නට නො නිසි ය. මහණ ගොයුම්ණන් ම භවත් සොණදණ්ඩයන් දකින්නට එනු නිසි ය.

භවං හි සොණදණ්ඩො උභතො සුජාතො මාතිතො ච පිතිතො ච, සංසුද්ධගහණිකො යාව සත්තමා පිතාමහයුගා, අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන.

යම්පි භවං සොණදණ්ඩො උභතො සුජාතො මාතිතො ච පිතිතො ච, සංසුද්ධගහණිකො යාව සත්තමා පිතාමහයුගා, අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන. ඉමිනා පඨෙන න අරහති භවං සොණ-දණ්ඩො සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිතුං. සමණො පෙව ගොතමො අරහති භවන්තං සොණදණ්ඩං දස්සනාය උපසඞ්කමිතුං.

භවං හි සොණදණ්ඩො අඩ්ඪො මහද්ධනො මහාභොගො-පෙ-.

භවං හි සොණදණ්ඩො අජ්ඣායකො මන්තධරො තිණ්ණං වෙදානං පාරගූ සනිඝණ්ඩුකෙටුභානං සාක්ඛරප්පභෙදානං ඉතිහාසපඤ්චමානං, පදකො, වෙය්‍යාකරණො, ලොකායතමහාපුරිසලක්ඛණෙසු අනවයො-පෙ-.

භවං හි සොණදණ්ඩො අභිරූපො දස්සනීයො පාසාදිකො පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතො බ්‍රහ්මවණ්ණී බ්‍රහ්මවච්චසී, අක්ඛුද්ද-වක්ඛුසො දස්සනාය-පෙ-.

භවං හි සොණදණ්ඩො සීලවා වුද්ධසීලී වුද්ධසීලෙන සමන්නාගතො-පෙ-. භවං හි සොණදණ්ඩො කල්‍යාණවාචො කල්‍යාණවාක්කරණො, පොරියා වාචාය සමන්නාගතො විස්සට්ඨාය අනෙලගලාය අත්ථස්ස විඤ්ඤාපනියා-පෙ-.

භවං හි සොණදණ්ඩො බහූනං ආචරියපාචරියො, තීණි මාණ-වකසතානි මන්තෙ වාචෙති. බහූ ඛො පන තානාදිසා තානාජනපද මාණවකා ආගච්ඡන්ති හොතො සොණදණ්ඩස්ස සන්තිකෙ මන්තත්ථිකා මන්තෙ අධීයිතුකාමා-පෙ-.

භවං හි සොණදණ්ඩො ජිණ්ණො වුද්ධො මහල්ලකො අද්ධගතො වයො අනුප්පත්තො. සමණො ගොතමො තරුණො චෙව තරුණපබ්බජිතො ච-පෙ-.

භවං හි සොණදණ්ඩො රඤ්ඤො මාගධස්ස සෙනියස්ස බිම්බිසාරස්ස සක්කතො ගරුකතො මානිතො පූජිතො අපචිතො-පෙ-.

භවං හි සොණදණ්ඩො බ්‍රාහ්මණස්ස පොක්ඛරසාතිස්ස සක්කතො ගරුකතො මානිතො පූජිතො අපචිතො-පෙ-.

'භවත් සොණදණ්ඩ තෙමේ මවුපසින් ද පියපසින් ද යන දෙපසින් මැ අභිජාත ය. සත්වන මිමුතු ශුවල තෙක් පිරිසිදු මවුකුස ඇත්තේ ය. ජාතිවාදයෙන් (කුල පිළිබඳ තෙප්ලෙන්) නොහෙළන ලද්දේ ය. නො ගරහන ලද්දේ ය.

භවත් සොණදණ්ඩ තෙමේ මවුපසින් ද පියපසින් ද යන දෙ පසින් මැ අභිජාත ය. සත්වන මිමුතු ශුවල තෙක් පිරිසිදු මවුකුස ඇතියේ ය, 'ජාතිවාදයෙන් ඉවත නො හෙළන ලද්දේ ය, නො ගරහන ලද්දේ ය, යන යමෙක් ඇද්ද, මේ කරුණෙනුත් භවත් සොණදණ්ඩ තෙමේ මහණ ගොයුම්හු දක්නට යනු නො වටී. මහණ ගොයුම්න් ම භවත් සොණදණ්ඩයා දක්නට එනු වටී.

තව ද භවත් සොණදණ්ඩ තෙමේ වූ කලි ආඪ්‍ය ය, මහත් ධන ඇත්තේ ය, මහද්භෝග ඇත්තේ ය...

භවත් සොණදණ්ඩ තෙමේ වූ කලි වේද හදාරන්නෙක. වෙදයන් සිසැ ලා දරන්නෙක. නිඝණ්ටු කෙටුභශාස්ත්‍ර සහිත, අක්ෂරප්‍රභේද (ශික්ෂා හා නිරුක්ති) සහිත, ඉතිහාසය පස්වනු කොටැති ත්‍රිවෙදයන් ගේ පරතෙර පැමිණියෙක, පදපාඨ දන්නෙක. එසින් අන්‍ය සියලු ව්‍යාකරණ විති ද දන්නෙක. ලෝකායත ශාස්ත්‍රයෙහිත් මහාපුරුෂලක්ෂණ-ශාස්ත්‍රයෙහිත් නිපුණයෙක....භවත් සොණදණ්ඩ තෙමේ වූ කලි විශිෂ්ට රූපශොභා ඇත්තෙක, දකුම් කටයුතු ය, ප්‍රසාද ඵලවන සුලු ය, උතුම් වර්ණසෞන්දර්යයෙන් සමන්විත ය, උතුම් රත්වන් පැහැත්තෙක, උතුම් ශරීරප්‍රභා ඇත්තෙක. (ආරෝහපරිණාහසම්පත්තියෙන් ද අවයවයන්ගේ පරිපූර්ණත්වයෙන් ද) සිරුරෙහි දැක්වට නොමඳ වූ අවකාශ ඇත්තෙක...

භවත් සොණදණ්ඩ තෙමේ සිල්වත් ය, වැඩුණු සිල් ඇත්තේ ය, වැඩුණු ශීලයෙන් යුක්ත ය..

භවත් සොණදණ්ඩ තෙමේ කලණ තෙපුල් ඇත්තේ, කලණ මිහිරි බස් කියන්නේ, නිතොස් වූ කෙලකොලු නොවූ, කි අරුත අඟවනු සමත් සිලිටි බසින් සමන්විත ය...

භවත් සොණදණ්ඩ තෙමේ බොහෝ දෙනාට ආවාසී ද ප්‍රාවාසී ද වූයේ, තුන්සියක් මාණවකයනට වෙදයන් කියවයි. වෙදයන් ප්‍රයෝජන කොටැති, වෙද හදාරනු කැමැති බොහෝ මාණවකයෝ නන් දෙසින් නන්රටින් භවත් සොණදණ්ඩයා වෙත එත්...

භවත් සොණදණ්ඩ තෙමේ වූ කලි ජරාජීර්ණ ය, වයොවෘද්ධ ය, මහලු ය, බොහෝ කල් ඉක්මැවූයෙක, පැසිම් වයසට පැමිණියෙක. මහණ ගොයුම් තෙමේ තරුණ ද වේ. තරුණ පැවිද්දෙක් ද වේ...

භවත් සොණදණ්ඩ තෙමේ වූ කලි මගධාධිපති සෙනිය බිම්බිසාර රජහු විසින් සත්කාර කරන ලද්දෙක, ගුරුකාර කරන ලද්දෙක, බුහුමන් කරන ලද්දෙක, පුදන ලද්දෙක, යටත් පැවැතුම් දක්වන ලද්දෙක...

භවත් සොණදණ්ඩ තෙමේ වූ කලි පොකුරුසාත් බමුණා විසින් සත්කෘත ද ගුරුකෘත ද මානිත ද පූජිත ද අපචිත ද වේ...

භවං හි සොණදණ්ඩො චම්පං අජ්ඣාවසති සත්තුස්සදං සත්තිණ-කටෝදකං සඛඤ්ඤං රාජභොග්ගං රඤ්ඤා මාගධෙන සෙනියෙන බිම්බිසාරෙන දින්නං රාජදායං බ්‍රහ්මදෙය්‍යං.

යම්පි භවං සොණදණ්ඩො චම්පං අජ්ඣාවසති සත්තුස්සදං සත්තිණ-කටෝදකං සඛඤ්ඤං රාජභොග්ගං රඤ්ඤා මාගධෙන සෙනියෙන බිම්බි-සාරෙන දින්නං රාජදායං බ්‍රහ්මදෙය්‍යං, ඉමිනාපඩිගත්ත න අරහති භවං සොණදණ්ඩො සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිතුං. සමණො පෙව ගොතමො අරහති භවන්තං සොණදණ්ඩං දස්සනාය උපසඞ්කමිතුන්ති.

8. එවං වුත්තෙ සොණදණ්ඩො බ්‍රාහ්මණො තෙ බ්‍රාහ්මණෙ එතදවොච: තෙන හි භො මම්පි සුණාථ, යථා මයමෙව අරහාම තං භවන්තං ගොතමං දස්සනාය උපසඞ්කමිතුං තත්‍රෙව අරහති සො භවං ගොතමො අම්හාකං දස්සනාය උපසඞ්කමිතුං. සමණො ඛලු භො ගොතමො උභතො සුජාතො මාතිතො ච පිතිතො ච, සංසුද්ධගහණිකො යාව සත්තමා පිතාමහයුගා, අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන.

යම්පි භො සමණො ගොතමො උභතො සුජාතො මාතිතො ච පිතිතො ච, සංසුද්ධගහණිකො යාව සත්තමා පිතාමහයුගා, අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන, ඉමිනාපඩිගත්ත න අරහති සො භවං ගොතමො අම්හාකං දස්සනාය උපසඞ්කමිතුං. අථ ඛො මයමෙව අරහාම තං භවන්තං ගොතමං දස්සනාය උපසඞ්කමිතුං.

සමණො ඛලු භො ගොතමො මහන්තං ඤාතිසඞ්ඝං ඔහාය පබ්බජිතො.... සමණො ඛලු භො ගොතමො පහූතං හිරඤ්ඤසුවණ්ණං ඔහාය පබ්බජිතො භූමිගතඤ්ච වෙහාසට්ඨඤ්ච...

සමණො ඛලු භො ගොතමො දහරො'ව සමානො සුවා සුසු කාළ-කෙසො භද්‍රෙන යොබ්බනෙන සමන්නාගතො පඨමෙන වයසා අගාරස්මා අනගාරියං පබ්බජිතො...

සමණො ඛලු භො ගොතමො අකාමකානං මාතාපිතූනං අස්සුමුඛානං රුදන්තානං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතො...

සමණො ඛලු භො ගොතමො අභිරූපො දස්සනීයො පාසාදිකො පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතො බ්‍රහ්මවණ්ණී බ්‍රහ්මවච්චසී අක්ඛුද්ද-වකාසො දස්සනාය...

සමණො ඛලු භො ගොතමො සීලවා අරියසීලී කුසලසීලී කුසලසීලෙන සමන්නාගතො...

භවත් සොණදණ්ඩ තෙමේ වූ කලි බහුජනාකීර්ණ, තණ දඹු දිය යන මෙයින් යුක්ත, බොහෝ ධාන්‍ය ඇති, රජුගෙන් ලත් සවකීය පරිභෝග වස්තු වූ, රජුගේ ඌයාදාය වූ, සෙනිය බිම්බිසාර මහරජුහු දුන් ශ්‍රෙෂ්ඨ ත්‍යාගය වූ චම්පානුවරට අධිපති වැ වෙසෙයි.

භවත් සොණදණ්ඩ තෙමේ බහුජනාකීර්ණ...චම්පානුවරට අධිපති වැ වෙසේ ය යන යම් කරුණෙක් ඇද්ද, මේ කරුණිත්‍රුත් භවත් සොණදණ්ඩ තෙම මහණ ගොයුම්හු දක්නට යනු නොනිසි ය. මහණ ගොයුම් තෙමේ ම භවත් සොණදණ්ඩයා දක්නට එනු සුදුසු ය."යි කීහ.

8. මෙසේ කී කල්හි සොණදණ්ඩ බමුණු තෙමේ ඒ බමුණනට කියනුයේ, "භවත්නි, එසේ වී නම් ඒ භවද්ගෞතමයන් අප දක්නට ඊම නොවැ අප ම ඔබ දක්නට යනු සුදුසු බවට මා කියන බස් ද අසවු: 'භවත්නි, මහණ ගොයුම්හු වූ කලි මවුපසින් ද පියපසින් ද යන දෙපසින් මැ අභිජාතයහ, සත් වන මිමුතු යුවල තෙක් පිරිසිදු මවුකුස ඇත්තෝ ය. ජාතිවාදයෙන් නො හෙළන ලද්දේ ය, නො ගරහන ලද්දේ ය.

'මහණ ගොයුම්හු මවුපසින් ද පියපසින් ද යන දෙපසින් ම අභිජාතයහ...නොගරහන ලද්දේ ය' යන යමෙක් ඇද්ද, මේ කරුණිත්‍රුදු ඒ භවද්ගෞතමයෝ අප දක්නට එන්නට නො නිස්සහ. වැළි අපි ම ඔබ දක්නට යනු නිස්සමිත.

භවත්නි, මහණ ගොයුම්හු වූ කලි මහත් නැමුළුව පියා පැවිදි වූවෝ ය...

භවත්නි, මහණ ගොයුම්හු වූ කලි පොළොව යට ද පොළොව මත්තෙහි ද වූ මහත් හිරණ්‍යසඛණි හැරැ පියා පැවිදි වූවෝ ය...

භවත්නි, මහණ ගොයුම්හු වූ කලි සොඳුරු යොවුනෙන්, (තුන් වයසින්) පළමු වයසින් යුත් වූවෝ ම, තරුණ වූවෝ ම, මතා කළු කෙහෙ ඇති වැ යොවුන් වියෙහි සිටියෝ ම ගිහි ගෙන් නික්මැ පැවිදි බිමට වන්නෝ ය...

භවත්නි, මහණ ගොයුම්හු වූ කලි මවුපියන් ඔබ පැවිදි වනුවට නොකැමැති වැ කඳුළු පිරැණු මුහුනු ඇති වැ හඬද්දී එය නොතකා කෙහෙ රවුළු බා දමා කසා වත් හැඳ ගිහි ගෙන් නික්මැ පැවිද්දට වන්නෝ ය...

භවත්නි, මහණ ගොයුම්හු වූ කලි විශිෂ්ට රූප සම්පත් ඇත්තෝ ය, දැකුම් කවයුතු හ, ප්‍රසාදජනක හ, උතුම් වර්ණසෞන්දර්යයෙන් සමන්විත හ, බඹහු සේ උතුම් රන් පැහැ ඇත්තෝ ය, උත්තම ශරීරප්‍රභා ඇත්තෝ ය, සිය සිරුරෙහි දැක්මට නොමඳ වූ අවකාශ ඇත්තෝ ය...

භවත්නි, මහණ ගොයුම්හු වූ කලි සිල්වත් හ, පිරිසිදු සිල් ඇත්තෝ ය, නිදොස් සිල් ඇත්තෝ ය, නිදොස් ශීලයෙන් සමන්විත හ...

සමණො ඛලු හො ගොතමො කල්‍යාණවාචො කල්‍යාණවාක්කරණො පොරියා වාචාය සමන්නාගතො විස්සට්ඨාය අනෙලගලාය අත්ථස්ස විඤ්ඤාපනියා.-පෙ-

සමණො ඛලු හො ගොතමො බහුජනං ආචරියපාචරියො.-පෙ-

සමණො ඛලු හො ගොතමො තිණ්ණකාමරාගො විගතබ්‍යාපාදෙලො.-පෙ-

සමණො ඛලු හො ගොතමො සම්මවාදී කිරියවාදී අපාපපුරෙක්ඛාරො බ්‍රහ්මඤ්ඤස්ස පජාය.-පෙ-

සමණො ඛලු හො ගොතමො උච්චා කුලා පබ්බජිතො අසමභින්න-ඛත්තියකුලා.-පෙ-

සමණො ඛලු හො ගොතමො අඩ්ඪා කුලා පබ්බජිතො මහද්ධනා මහාභොගා.-පෙ-

සමණං ඛලු හො ගොතමං තිරොරට්ඨා තිරොජනපදා සම්පූජිතුං ආගච්ඡන්ති.-පෙ-

සමණං ඛලු හො ගොතමං අනෙකානි දෙවතාසහස්සානි පාණෙහි සරණං ගතානි.-පෙ-

සමණං ඛලු හො ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො 'ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා'ති.-පෙ-

සමණො ඛලු හො ගොතමො ද්වත්තිංසමහාපුරිසලක්ඛණෙහි සමන්නා-ගතො.-පෙ-

සමණො ඛලු හො ගොතමො එහිසාගතවාදී සඛිලො සම්මොදකො අබ්භාකුටිකො උත්තානමුඛො පුබ්බභාසී.-පෙ-

සමණො ඛලු හො ගොතමො චතුන්නං පරිසානං සක්කතො ගරුකතො මානිතො පූජිතො අපචිතො.-පෙ-

සමණෙ ඛලු හො ගොතමෙ බහූ දෙවා මනුස්සා ච අභිප්පසන්නා.-පෙ-

මහණ ගොයුම්හු වූ කලි කලණ තෙපුල් ඇත්තෝ ය, කලණ මිහිරි බස් කියන්නෝ ය, නිදොස් වූ, කෙලතොලු නොවූ, කී අරුත හඟවනු සමත් සිලිටි බසින් සමන්විතයෝ ය...

භවත්නි, මහණ ගොයුම්හු වූ කලි බොහෝ දෙනාට ආචාරී ද ප්‍රාචාරී ද වෙති...

භවත්නි, මහණ ගොයුම්හු වූ කලි පහ වූ කාමරාග ඇත්තෝ ය, පහ වූ චපල බව ඇත්තෝ ය...

භවත්නි,මහණ ගොයුම්හු වූ කලි කම්වාදී ද ක්‍රියාවාදී ද වෙති. ලොවුතුරා දහම් පුරුසර කොට පවතිති. සැරියුත් මුගලන් ඇ බමුණු පිරිසට නායක වැ හැසිරෙති (නොහොත් තමනට විරුද්ධ වූ බමුණු පිරිසට පවා අහිතක් නොසිතා හිත සුව ම පතත්තෝ හැසිරෙති)...

භවත්නි,මහණ ගොයුම්හු වූ කලි අමිශ්‍ර (පිරිසිදු) කැත්කුලය වූ උසස් කුලයෙන් නික්මැ පැවිදි වූවෝ ය..

භවත්නි, මහණ ගොයුම්හු වූ කලි මහත් ධන ඇති මහත් භොග ඇති සමෘද්ධ කුලයෙන් නික්මැ පැවිදි වූවෝ ය...

භවත්නි, මහණ ගොයුමන් කරා පිව රජින් පිට දනවුයෙන් පැණ පුළුවුස්නට එති...

භවත්නි, නොයෙක් දහස් ගණන් දෙවියෝ මහණ ගොයුමන් දිවිහිමියෙන් සරණ ගියහ...

භවත්නි, 'මේ මේ කරුණින් ඒ භගවත් තෙමේ අර්හත් ය, සම්‍යක්-සම්බුද්ධ ය, විද්‍යාචරණසම්පන්න ය, සුගත ය, ලොකවිත් ය, නිරුත්තර පුරුෂදම්‍යසාරථි ය, දෙවිමිනිසුන්හට ශාස්තෘ ය, බුද්ධ ය, භගවත් යැ' යි මහණ ගොයුමාණන් පිළිබඳ වැ මෙසේ වූ යහපත් ගුණඝොෂයෙක් ඉතා උස් වැ නැංගේ ය...

භවත්නි, මහණ ගොයුම්හු වූ කලි දෙතිස් මහපුරිස්ලකුණුවලින් සමන්විත හ...

භවත්නි, මහණ ගොයුම්හු වූ කලි තමන් වෙත පැමිණෙන්නවුන් 'එන්න, මෙහි ආ සේ මැනැවැ'යි කියා පිළිගන්නා සුලු හ, කතට සුව එළවන තෙපුල් බණන්නෝ ය, පිළිසඳරෙහි දක්ෂ හ, බැම තො හකුළුවන්නෝ ය, සුලභ කථා ඇත්තෝ ය, පැමිණියවුනට තුළු පළමුයෙන් කථා කරන සුලු හ...

භවත්නි, මහණ ගොයුම්හු වූ කලි (මහණ මෙහෙණි උවසු උවැසි යන) සිවු පිරිස් විසින් සත්කාර කරන ලදු හ, ගුරුකාර කරන ලදු හ, බුහුමන් කරන ලදු හ, පුදන ලදු හ, යටත් පැවැතුම් දක්වන ලදු හ...

භවත්නි, මහණ ගොයුමන් කෙරෙහි වනාහි බොහෝ දෙවියෝත් මිනිස්සුත් වෙසෙසින් පහත් හ...

සමණො ඛලු නො ගොතමො යස්මිං ගාමෙ වා නිගමෙ වා පටිවසති, ත තස්මිං ගාමෙ වා නිගමෙ වා අමනුස්සා මනුස්සෙ විහෙඨෙන්ති-පෙ-.

සමණො ඛලු නො ගොතමො සඞ්ඝී ගණී ගණාචරියො පුථුතිත්ථකරානං අග්ගමක්ඛායති-පෙ-.

යථා ඛො පන හො එකෙසං සමණබ්‍රාහ්මණානං යථා වා තථා වා යසො සමුදාගච්ඡති න හෙවං සමණස්ස ගොතමස්ස යසො සමුදාගතො. අථ ඛො අනුත්තරාය විජ්ජාචරණසම්පදාය සමණස්ස ගොතමස්ස යසො සමුදාගතො...

සමණං ඛලු හො ගොතමං රාජා මාගධො සෙනියො බිම්බිසාරො සපුත්තො සභරියො සපරිසො සාමච්චො පාණෙහි සරණං ගතො-පෙ-.

සමණං ඛලු හො ගොතමං රාජා පසෙනදි කොසලො සපුත්තො සභරියො සපරිසො සාමච්චො පාණෙහි සරණං ගතො-පෙ-.

සමණං ඛලු හො ගොතමං බ්‍රාහ්මණො පොක්ඛරසාති සපුත්තො සභරියො සපරිසො සාමච්චො පාණෙහි සරණං ගතො-පෙ-.

සමණො ඛලු හො ගොතමො රඤ්ඤො මාගධස්ස සෙනියස්ස බිම්බිසාරස්ස සක්කතො ගරුකතො මානිතො පූජිතො අපචිතො -පෙ-.

සමණො ඛලු හො ගොතමො රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස සක්කතො ගරුකතො මානිතො පූජිතො අපචිතො-පෙ-.

සමණො ඛලු හො ගොතමො බ්‍රාහ්මණස්ස පොක්ඛරසාතිස්ස සක්කතො ගරුකතො මානිතො පූජිතො අපචිතො-පෙ-.

සමණො ඛලු හො ගොතමො චම්පං අනුප්පත්තො චම්පායං විහරති ගග්ගරාය පොක්ඛරණියා තීරෙ. සො ඛො පන හො කෙචි සමණා වා බ්‍රාහ්මණා වා අම්හාකං ගාමක්ඛෙත්තං ආගච්ඡන්ති, අතිථි තො තෙ හොන්ති. අතිථි ඛො පනමෙහි සක්කාතබ්බා ගරුකාතබ්බා මානෙතබ්බා පූජෙතබ්බා අපචෙතබ්බා. යම්පි හො සමණො ගොතමො චම්පං අනුප්පත්තො චම්පායං විහරති ගග්ගරාය පොක්ඛරණියා තීරෙ. අතිත්ථම්හාකං සමණො ගොතමො. අතිථි ඛො පනමෙහි සක්කාතබ්බා ගරුකාතබ්බා මානෙතබ්බා පූජෙතබ්බා අපචෙතබ්බා. ඉමිනාපඛෙන න අරහති සො භවං ගොතමො අම්හාකං දස්සනාය උපසඞ්කමිතුං. අථ ඛො පන මයමෙව අරහාම් තං භවන්තං ගොතමං දස්සනාය උපසඞ්කමිතුං.

එත්තකෙ ඛො අහං හො තස්ස භොතො ගොතමස්ස ගුණෙ පරියාපුණාමි. තො ච ඛො සො භවං ගොතමො එත්තකවණ්ණො, අපරිමාණවණ්ණො හි සො භවං ගොතමො"ති.

භවත්නි, මහණ ගොයුම්හු තුමූ යම් ගමෙක නියම්ගමෙක හෝ වෙසෙත් නම්, එ ගමැ හෝ නියම්ගමැ හෝ වසන මිනිස්සුට යක්කු පීඩා නො කෙරෙත්...

භවත්නි, මහණ ගොයුම්හු වූ කලි මහ සඟපිරිස් ඇත්තෝ ය, ගණාචාර්ය ක හ, ගණාවාසී හ, බොහෝ තීර්ථකරයන් අතුරෙහි අග්‍ර හ සි කියනු ලැබෙති...

යම් සේ වතාහි ඇතැම් මහණබමුණන්ගේ යශස අවේලකතා ආදි පිටතට පෙන්වන යම්තම් ව්‍රතමාත්‍රයෙකින් වැඩෙතත් මහණ ගොයුමන් ගේ වූ කලි යශස එසේ වැඩුණෙක් නො වේ. වැලි තමන් තුළැ ම වූ නිරුත්තර විද්‍යාචරණසම්පතින් වැඩුණේ වෙයි...

භවත්නි, මහණ ගොයුමන් වූ කලි මගධාධිපති සෙනිය බිම්බිසාර රජ තෙමේ දරුවන් හා බිරියන් හා පිරිස් හා ඇමැත්තන් හා සමග. දිවි හිමි කොට සරණ ගියේ ය...

භවත්නි, මහණ ගොයුමන් වූ කලි කොශලාධිපති පසේනදී රජ තෙමේ දරුවන් හා බිරියන් හා පිරිස් හා ඇමැත්තන් හා සමග දිවි හිමියෙන් සරණ ගියේ ය...

භවත්නි, මහණ ගොයුම්හු වූ කලි පොකුරුසැත් බමුණු තෙමේ දරුවන් හා බිරියන් හා පිරිස් හා ඇමැත්තන් හා සමග දිවිහිමියෙන් සරණ ගියේ ය...

භවත්නි, මහණ ගොයුම්හු වූ කලි මගධාධිපති සෙනිය බිම්සර මහරජ්හු විසින් සත්කෘත ද ගුරුකෘත ද මානිත ද පූජිත ද අපචිත ද වෙති...

භවත්නි, මහණ ගොයුම්හු වූ කලි කොශලාධිපති පසෙනදී රජ්හු විසින් සත්කෘත ද ගුරුකෘත ද අපචිත ද වෙති...

භවත්නි, මහණ ගොයුම්හු වූ කලි පොකුරුසැත් බමුණුහු විසින් සත්කෘත ද ගුරුකෘත ද මානිත ද පූජිත ද අපචිත ද වෙති...

භවත්නි, මහණ ගොයුම්හු වනාහි (දැන්) චම්පාවට පැමිණියෝ චම්පාවට තොදුරු තන්හි වූ ගගීරා පොකුණ තෙරැ වෙසෙති. භවත්නි, යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ අපේ ගම්කෙනට එත් නම් උහු අපට අමුත්තෝ වෙත්. අමුත්තෝ වනාහි අප විසින් සත්කාර කළ යුත්තෝ ය, ගුරුකාර කළ යුත්තෝ ය, බුහුමන් කළ යුත්තෝ ය, පිදියැ යුත්තෝ ය, යටත් පැවැතුම් දැක්වියැ යුත්තෝ ය. යම් හෙයෙකින් මහණ ගොයුම්හු චම්පාවට පැමිණියෝ චම්පාව සමීපයේ ගගීරා පොකුණ තෙරැ වෙසෙත් ද, එ හෙයින් ඔබ අපේ අමුත්තෝ ය. ඒ අමුත්තෝ වනාහි අප විසින් සත්කාර කටයුතු හ, ගරු කටයුතු හ, බුහුමන් කටයුතු හ, පිදියැ යුතු හ, යටත් පැවැතුම් දැක්වියැ යුතු හ. මේ කරුණිනුත් ඒ භවද්ගෞතමයන් අප දක්නට එහු නො වටී. වැලි අපි ම ඔබ දක්නට යැ යුතු වමු

භවත්නි, ඒ භවද්ගෞතමයන් පිළිබඳ වූ මෙ පමණක් ගුණ මම දනිමි. එහෙත් ඒ භවත් ගෞතමයෝ නම් මෙ පමණක් ම ගුණ ඇත්තෝ නො වෙති. වැලි දු ඔබ පමණ කට නොහැකි ගුණ ඇත්තෝ ය''යනු සි.

9. එවං වුත්තෙ තෙ බ්‍රාහ්මණා සොණදණ්ඩං බ්‍රාහ්මණං එතදවොචුං: 'යථා ඛො භවං සොණදණ්ඩො සමණස්ස ගොතමස්ස වණ්ණං භාසති ඉතො වෙ'පි සො භවං ගොතමො යොජනසතෙ විහරති, අලමෙව සද්ධින කුලපුත්තෙන දස්සනාය උපසඞ්කමිතුං අපි පුට්ඨොසෙත[1]. තෙන හි භො සඞ්ඛව මයං සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිස්සාමා''ති.

අථ ඛො සොණදණ්ඩො බ්‍රාහ්මණො මහතා බ්‍රාහ්මණගණෙන සද්ධිං යෙන ගග්ගරා පොක්ඛරණී තෙනුපසඞ්කමි.

10. අථ ඛො සොණදණ්ඩස්ස බ්‍රාහ්මණස්ස තිරොවනසණ්ඩගතස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: ''අහඤ්චෙව ඛො පන සමණං ගොතමං පඤ්හං පුච්ඡෙය්‍යං, තත්‍ර චෙ මං සමණො ගොතමො එවං වදෙය්‍ය: 'න ඛො එස බ්‍රාහ්මණ පඤ්හො එවං පුච්ඡිතබ්බො, එවං නාමෙස බ්‍රාහ්මණ පඤ්හො පුච්ඡිතබ්බො'ති. තෙන මං අයං පරිසා පරිභවෙය්‍ය: 'බාලො සොණදණ්ඩො බ්‍රාහ්මණො අබ්‍යත්තො, කාසක්කි සමණං ගොතමං යොනිසො පඤ්හං පුච්ඡිතුන්ති'. යං ඛො පනායං පරිසා පරිභවෙය්‍ය, යසො'පි තස්ස හායෙථ, යස්ස ඛො පන යසො හායෙථ භොගා'පි තස්ස හායෙය්‍යුං. යසොලද්ධා ඛො පනම්හාකං භොගා. මඤ්චෙව ඛො පන සමණො ගොතමො පඤ්හං පුච්ඡෙය්‍ය, තස්ස චාහං පඤ්හස්ස වෙය්‍යාකරණෙන චිත්තං න ආරාධෙය්‍යං, තත්‍ර චෙ මං සමණො ගොතමො එවං වදෙය්‍ය: 'න ඛො එස බ්‍රාහ්මණ පඤ්හො එවං ව්‍යාකාතබ්බො. එවං නාමෙස බ්‍රාහ්මණ පඤ්හො ව්‍යාකාතබ්බො'ති, තෙන මං අයං පරිසා පරිභවෙය්‍ය: 'බාලො සොණදණ්ඩො බ්‍රාහ්මණො, අබ්‍යත්තො කාසක්කි සමණස්ස ගොතමස්ස පඤ්හස්ස වෙය්‍යාකරණෙන චිත්තං ආරාධෙතුන්ති. යං ඛො පනායං පරිසා පරිභවෙය්‍ය, යසො'පි තස්ස හායෙථ. යස්ස ඛො පන යසො හායෙථ භොගාපි තස්ස හායෙය්‍යුං. යසොලද්ධා ඛො පනම්හාකං භොගා. අහං චෙව ඛො පන එවං සමීපගතො සමානො අදිස්වා'ව සමණං ගොතමං නිවත්තෙය්‍යං, තෙන මං අයං පරිසා පරිභවෙය්‍ය: 'බාලො සොණදණ්ඩො බ්‍රාහ්මණො අබ්‍යත්තො මාතරඤ්ඤො භීතො ව. නො විසහි සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිතුං. කථං හි නාම සමීපගතො සමානො අදිස්වා සමණං ගොතමං නිවත්තිස්සති?' ති. යං ඛො පනායං පරිසා පරිභවෙය්‍ය යසො'පි තස්ස හායෙථ. යස්ස ඛො පන යසො හායෙථ, භොගා'පි තස්ස හායෙය්‍යුං. යසොලද්ධා ඛො පනම්හාකං භොගා''ති.

11. අථ ඛො සොණදණ්ඩො බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. වමෙපය්‍යකාපි ඛො බ්‍රාහ්මණගහපතිකා අපෙක්ඛකෙව භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. අපෙක්ඛකෙව භගවතා සද්ධිං සම්මොදිංසු. සම්මොදනීයං කථං සාරණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. අපෙක්ඛකෙව යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා එකමන්තං නිසීදිංසු. අපෙක්ඛකෙව නාමගොත්තං සාවෙත්වා එකමන්තං නිසීදිංසු. අපෙක්ඛකෙව තුණ්හීභූතා එකමන්තං නිසීදිංසු.

---

1. පුවංසෙනාති'පි පාඨො කෙසුචි පොත්තකෙසු.

9. මෙසේ කී කල්හි ඒ බමුණෝ සොණදණ්ඩ බමුණා බණවා, "භවත් සොණදණ්ඩ ය, භවත් සොණදණ්ඩයා මහණ ගොයුමන්ගේ ගුණ කියන සැටියෙන් ඒ හවද් ගෞතමයන් මෙයින් යොදුන් සියක් දුර වසතත්, සැදැහැති කුලපුතුහු විසින් පාථෙය (මග වියදම්) ගෙන ද ඔබ දක්නට එළැඹෙනු වටි ම ය එ බැවින් භවත්නි, අපි සියල්ලෝ ම ඒ මහණ ගොයුමන් දක්නට යන්නමු"යි කීහ.

ඉක්බිති සොණදණ්ඩ බමුණු තෙමේ මහත් බමුණු ගණයා හා ගඹීර පොකුණ අතට ගියේ ය

10 එ කල්හි වනාහි වතලැහැබ තුළට පිවිසි සොණදණ්ඩ බමුණාට මෙසේ විතතසංකල්පනාවෙක් පහළ විය:

"ඉදින් මම මහණ ගොයුමන් අතින් ප්‍රශ්නයක් විචාරන්නෙම් නම්, (එ විට) 'බමුණ, මේ පැණය මෙසේ නොවිචාළ මනා යැ'යි මහණ ගොයුම්හු මට කියන්නෝ නම්, එයින් මේ පිරිස 'සොණදණ්ඩයා අනුවණ ය, නොවියත් ය, මහණ ගොයුමන් අතින් නුවණින් පැණ විචාරන්නට නො හැකි වියැ'යි මා නිගන්නාහ. මේ පිරිස යමකු නිගන්නාහු නම්, ඔහුගේ යශස් ද පිරිහෙන්නේ ය. යමක්හුගේ යශස් පිරිහෙන්නේ නම්, ඔහුගේ භෝග සම්පත් ද පිරිහෙන්නේ ය. අපේ භෝගයෝ වනාහි යශස් හෙතුවෙන් ලැබුණෝ ය. තව ද මහණ ගොයුම්හු මා අතින් පැණ විචාරන්නෝ නම්, ඒ පැණ විසැඳීමෙන් මම ඔවුන්ගේ සිත් තො ගත්තෙම් නම්, එහි දී මහණ ගොයුම්හු 'බමුණ, මේ පැණය මෙසේ විසඳියැ යුතු නො වේ. බමුණ, මෙය විසැඳියැ යුත්තේ මෙසේ ම යැ'යි මට කියන්නෝ නම්, එයින් මේ පිරිස මට 'සොණදණ්ඩ බමුණා අනුවණ ය, නොවියත් ය, පැණ විසැඳීමෙන් මහණ ගොයුමන්ගේ සිත ගන්නට නො හැකි වි ය යි නිගා කරන්නාහ. මේ පිරිස යමක්හට නිගා කරන්නාහු නම්, ඔහු යශස් ද පිරිහෙන්නේ ය. යමකු ගේ යශස පිරිහෙන්නේ නම්, ඔහු ගේ භෝග ද පිරිහෙන්නේ ය. අපේ භෝගසම්පත් වනාහි යශස් හෙතුයෙන් ලැබුණු දෑ ය. මමත් මෙසේ ළඟට පැමිණියෙමි ම මහණ ගොයුමන් නොදැක පෙරළා යන්නෙම් නම්, එයින් මේ පිරිස 'සොණදණ්ඩ බමුණා අනුවණ ය, නොවිසත් ය, දැඩි මන් ඇත්තේ ය, ඛිය ගත්තේ ද වේ, මහණ ගොයුමන් දකිනු පිණිස එළැඹෙන්නට නො හැකි විය. මෙසේ ළඟට පැමිණියේ ම මහණ ගොයුමන් නොදැක කෙසේ නම් පෙරළා යැ හැකි වන්නේ ද?"යි මට පරිභව කරන්නාහ. මේ පිරිස යමකුට පරිභව කරන්නාහු නම් ඔහු ගේ යශස ද පිරිහෙන්නේ ය. යමකුගේ යශස පිරිහෙන්නේ නම්, ඔහුගේ භෝගයෝ ද පිරිහෙන්නාහ. අපේ භෝගයෝ යශස්හෙතුවෙන් ලද්දේ ය (එ බැවිනි)"යනු යි.

11. ඉක්බිති සොණදණ්ඩ බමුණ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ ය. එළැඹ, භාග්‍යවතුන් වහන්සේ හා පිළිසඳර කතා කෙළේ ය. සිතැ රැඳවිය යුතු වූ පිළිසඳර කතා අවසන් කොට පසෙක ඉඳගත්තේ ය. චම්පානගරවාසී බමුණෝත් ගෘහපතියෝත් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ ආදරයෙන් වැඳ පසෙක ඉඳගත්හ. කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ හා පිළිසඳර කතා කළහ. සිතැ රැඳවියැ යුතු පිළිසඳර කොට නිමවා පසෙක හිඳගත්හ. කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ දෙසට ඇඳිලි තමා වැඳ පසෙක ඉඳගත්හ. කෙනෙක් නම් ගොත් අස්වා පසෙක ඉඳගත්හ. කෙනෙක් නිහඬ වැ පසෙක ඉඳගත්හ.

12. තත්‍රපි සුදං සොණදණ්ඩො බ්‍රාහ්මණො එකදෙව බහුලමනුවිත-සොකතෙතා නිසින්නො හොති: "අහං චෙව ඛො පන සමණං ගොතමං පඤ්හං පුච්ඡෙය්‍යං තත්‍ර චෙ මං සමණො ගොතමො එවං වදෙය්‍ය 'න ඛො එස බ්‍රාහ්මණ පඤ්හො පුච්ඡිතබ්බො'ති, තෙන මං අයං පරිසා පරිභවෙය්‍ය 'බාලො සොණදණ්ඩො බ්‍රාහ්මණො අබ්‍යත්තො, නාසක්ඛි සමණං ගොතමං යොනිසො පඤ්හං පුච්ඡිතුන්ති' යං ඛො පනායං පරිසා පරිභවෙය්‍ය යසො'පි තස්ස හායෙථ. යස්ස ඛො පන යසො හායෙථ භොගාපි තස්ස හායෙය්‍යුං. යසොලද්ධා ඛො පනම්හාකං භොගා. මඤ්චෙව ඛො පන සමණො ගොතමො පඤ්හං පුච්ඡෙය්‍ය, තස්ස චාහං පඤ්හස්ස වෙය්‍යාකරණෙන චිත්තං න ආරාධෙය්‍යං, තත්‍ර චෙ මං සමණො ගොතමො එවං වදෙය්‍ය 'න ඛො එස බ්‍රාහ්මණ, පඤ්හො එවං ව්‍යාකාතබ්බො, එවං තාමෙස බ්‍රාහ්මණ පඤ්හො ව්‍යාකාතබ්බො'ති, තෙන මං අයං පරිසා පරිභවෙය්‍ය: 'බාලො සොණදණ්ඩො බ්‍රාහ්මණො අබ්‍යත්තො, නාසක්ඛි සමණස්ස ගොතමස්ස පඤ්හස්ස වෙය්‍යාකරණෙන චිත්තං ආරාධෙතුන්ති.' යං ඛො පනායං පරිසා පරිභවෙය්‍ය යසො'පි තස්ස හායෙථ යස්ස ඛො පන යසො හායෙථ භොගාපි තස්ස හායෙය්‍යුං. යසොලද්ධා ඛො පනම්හාකං භොගා. අහො වත මං සමණො ගොතමො සකෙ ආවරියකෙ තෙවිජ්ජකෙ පඤ්හං පුච්ඡෙය්‍ය. අද්ධාවතස්සාහං චිත්තං ආරාධෙය්‍යං පඤ්හස්ස වෙය්‍යාකරණෙනා"ති.

13. අථ ඛො භගවතො සොණදණ්ඩස්ස බ්‍රාහ්මණස්ස චෙතසා චෙතො-පරිවිතක්කමඤ්ඤාය එතදහොසි: "ඉහඤ්ඤදති ඛො අයං සොණදණ්ඩො බ්‍රාහ්මණො ඇකෙන චිත්තෙන. යන්නූනාහං සොණදණ්ඩං බ්‍රාහ්මණං සකෙ ආවරියකෙ තෙවිජ්ජකෙ පඤ්හං පුච්ඡෙය්‍යන්ති.''

අථ ඛො භගවා සොණදණ්ඩං බ්‍රාහ්මණං එතදවොච: "කතිහි පන බ්‍රාහ්මණ අඞ්ගෙහි සමන්නාගතං බ්‍රාහ්මණො බ්‍රාහ්මණං පඤ්ඤපෙති බ්‍රාහ්ම-ණො'සමිති ච වදමානො සම්මා වදෙය්‍ය න ච පන මුසාවාදං ආපජ්ජෙය්‍ය ?"ති

14. අථ ඛො සොණදණ්ඩස්ස බ්‍රාහ්මණස්ස එතදහොසි: යං වත තො අහොසි ඉච්ඡිතං, යං ආකඞ්ඛිතං, යං අභිපෙතං, යං අභිපත්තං 'අහො වත මං සමණො ගොතමො සකෙ ආවරියකෙ තෙවිජ්ජකෙ පඤ්හං පුච්ඡෙය්‍ය, අද්ධා වතස්සාහං චිත්තං ආරාධෙය්‍යං පඤ්හස්ස වෙය්‍යාකර-ණෙනා'ති, තත්‍ර මං සමණො ගොතමො සකෙ ආවරියකෙ තෙවිජ්ජකෙ පඤ්හං පුච්ඡති. අද්ධා වතස්සාහං චිත්තං ආරාධෙස්සාමි පඤ්හස්ස වෙය්‍යාකරණෙනා'ති.

15, අථ ඛො සොණදණ්ඩො බ්‍රාහ්මණො අඛිත්තාමෙව කායං අනුවිලොකෙත්වා පරිසං භගවන්තං එතදවොච: "පඤ්චහි භො ගොතම අඞ්ගෙහි සමන්නාගතං බ්‍රාහ්මණො බ්‍රාහ්මණං පඤ්ඤපෙති 'බ්‍රාහ්මණො'සමිති ච වදමානො සම්මා වදෙය්‍ය න ච පන මුසාවාදං ආපජ්ජෙය්‍ය. කතමෙහි පඤ්චහි ? ඉධ භො ගොතම බ්‍රාහ්මණො උභතො සුජාතො හොති මාතිතො ච පිතිතො ච, සංසුද්ධගහණිකො යාව සත්තමා පිතාමහයුගා, අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන. අජ්ඣායකො හොති මන්තධරො තිණ්ණං වෙදානං පාරගූ සනිඝණ්ඩුකෙටුභානං සාක්ඛරප්පභෙදානං ඉතිහාසපඤ්චමානං, පදකො වෙය්‍යාකරණො ලොකායතමහාපුරිසලක්ඛණෙසු අනවයො:

12. එහි ද සොණදණ්ඩ තෙමේ "මම් මහණ ගොයුමන් අතින් ප්‍රශ්න විචාරන් නෙම් නම්, (එ විටැ)) 'බමුණ, මේ පැණය මෙසේ නො විචාළ මනා යැ'යි මහණ ගොයුමිනු මට කියන්නෝ නම්, එසින් මේ පිරිස 'සොණදණ්ඩයා අනුවණ ය, නොවියත් යැ' යි මට පරිභව කරන්නාහ. මේ පිරිස යමකුට පරිභව කරන්නාහු නම් ඔහුගේ යශස ද පිරිහෙන්නේ ය. යමකුගේ යශස පිරිහෙන්නේ නම්, ඔහුගේ භොගයෝ ද පිරිහෙන්නාහ. අපේ භොගයෝ යශස්හෙතුයෙන් ලද්දේ ය. (එ බැවිනි.) මහණ ගොයුමන් සවකීය ආවාසීවාදය වූ ත්‍රිවිද්‍යාවිෂයයෙහි පැණ විචාරනොත් යෙහෙක. එසේ කලැ පැණ විසැදීමෙන් ඒකාන්තයෙන් ම ඔබ සිත් ගත හැකි වන්නෙමි"යි මේ සිතිවිල්ල ම බෙහෙවින් සිතමින් හුන්නේ වෙයි.

13. එ කලැ වතාහි භාග්‍යවතුන් වහන්සේට සිය සිතින් සොණදණ්ඩ බමුණාගේ සිත දැක්මෙන් "මේ සොණදණ්ඩ බමුණා සිය සිතිවිල්ලෙන් වෙහසෙයි. මම් මොහුගෙන් සිය ආවාසීවාද වූ ත්‍රිවිද්‍යාවිෂයයෙහි ප්‍රශ්නයක් විචාරන්නෙමි නම් යෙහෙකැ"යි මේ සිත වී ය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සොණදණ්ඩ බමුණා අමතා, "බමුණ, අංග කීයෙකින් සමන්විතයහු බමුණකු කොට බමුණෝ පණවත් ද? (අංග කීයෙකින් සමන්විතයා) 'මම් බමුණෙකිමි'යි කියන්නේ ද? බොරු කීමකට නො පැමිණෙන්නේ ද?"යි මෙය අසා වදාළ සේක.

14. එ විටැ සොණදණ්ඩ බමුණාට "මහණ ගොයුමන් මගෙන් සිය ආවාසීවාදය වූ ත්‍රිවිද්‍යාවිෂයයෙහි පැණ විචාළොත් යෙහෙක, පැණ විසැදීමෙන් ඒකාන්තයෙන් ඔවුන් සිත ගත හෙන්නෙමි'යි යමක් අප විසින් රැස්නා ලද ද, යමක් ඇවෙක්සිණි ද, යමක් අදහස් කරණලද ද, යමක් වෙසෙසින් පැතිණි ද, එහි ලා ඔබ මෙගත් සිය ඇදුරන් ඉගැන්වූ ත්‍රිවිද්‍යාවිෂයයෙහි ප්‍රශ්න විචාරති. ඒකාන්තයෙන් මම් පැණ විසැදීමෙන් ඔබ සිත සතුටු කරන්නෙමි"යි මේ සිත වී ය.

15. ඉක්බිති සොණදණ්ඩ බමුණු තෙමේ කය සෘජු කොට, භාග්‍යවතුන් වහන්සේට මෙය කී ය: "භවත් ගෞතමයිනි, බමුණෝ අංග පසෙකින් යුත්තහු බමුණකු කොට පණවත්. හේ 'මම් බමුණුමි'යි කියනුයේ (එය) මැනැවින් ම කියන්නේ ය. බොරු කීමකට නො පැමිණෙන්නේ ය. කවර අංග පසෙකින් ද? යත්:

"භවද්ගෞතමයිනි, මෙහි බමුණු තෙමේ මවු පසින් ද පිය පසින් ද යන දෙපසින් මැ අභිජාත ය, සත්වන මිමුතු ශුවල තෙක් පිරිසිදු මවු කුස ඇතිගේ ය, ජාතිවාදයෙන් නො හෙළන ලද්දේ ය, නො ගරහන ලද්දේ ය. වේද කදරන්නෙක් වෙයි, වේදයන් සිතැ ලා දරන්නෙක් වෙයි, නිඝණ්ඩු ද කෙටභශාස්ත්‍ර ද සහිත, ශික්ෂා හා නිරුක්ති සහිත, ඉතිහාසය පස්වනු කොටැති, ත්‍රිවේදයන්ගේ පර තෙරට පැමිණියෙක් වෙයි. පදපාඨ දන්නෙක් වෙයි සියලු ව්‍යාකරණ විධි ද දන්නෙක් වෙයි ලෝකායත ශාස්ත්‍රයෙහිත් මහාපුරුෂලක්ෂණ ශාස්ත්‍රයෙහිත් නිපුණයෙක් වෙයි.

අභිරූපො හොති දස්සනීයො පාසාදිකො පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතො, බ්‍රහ්මවණ්ණී බ්‍රහ්මවච්චසී අක්ඛුද්දවිත්තො දස්සනාය. සීලවා හොති වුද්ධසීලී වුද්ධසීලෙන සමන්නාගතො, පණ්ඩිතො ච හොති මෙධාවී, පඨමො වා දුතියො වා සුජං පඤ්ඤාණත්තානං. ඉමෙහි ඛො හො ගොතම පඤ්චහි අඞ්ගෙහි සමන්නාගතො බ්‍රාහ්මණො බ්‍රාහ්මණං පඤ්ඤපෙති. බ්‍රාහ්මණො'ස්මීති ච වදමානො සම්මා වදෙය්‍ය න ච පන මුසාවාදං ආපජ්ජෙය්‍යාති.

16. "ඉමෙසං පන බ්‍රාහ්මණ පඤ්චන්නං අඞ්ගානං සක්කා එකං අඞ්ගං ඨපෙත්වා චතූහි අඞ්ගෙහි සමන්නාගතං බ්‍රාහ්මණං පඤ්ඤපෙතුං බ්‍රාහ්මණො'ස්මීති ච වදමානො සම්මා වදෙය්‍ය න ච පන මුසාවාදං ආපජ්ජෙය්‍ය ?"ති

17. "සක්කා හො ගොතම. ඉමෙසං හි හො ගොතම පඤ්චන්නං අඞ්ගානං වණ්ණං ඨපයාම. කිං හි වණ්ණො කරිස්සති ? යතො ඛො හො ගොතම බ්‍රාහ්මණො උභතො සුජාතො හොති මාතිතො ච පිතිතො ච, සංසුද්ධ-ගහණිකො යාව සත්තමා පිතාමහයුගා, අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන. අජ්ඣායකො ච හොති මන්තධරො, තිණ්ණං වෙදානං පාරගූ සනිඝණ්ඩුකෙටුභානං සාක්ඛරප්පභෙදානං ඉතිහාසපඤ්චමානං, පදකො, වෙය්‍යාකරණො, ලොකායතමහාපුරිසලක්ඛණෙසු අනවයො. සීලවා ච හොති වුද්ධසීලී වුද්ධසීලෙන සමන්නාගතො, පණ්ඩිතො ච හොති මෙධාවී පඨමො වා දුතියො වා සුජං පඤ්ඤාණත්තානං. ඉමෙහි ඛො හො ගොතම චතූහඞ්ගෙහි සමන්නාගතං බ්‍රාහ්මණං බ්‍රාහ්මණො පඤ්ඤපෙති බ්‍රාහ්මණො'ස්මීති ච වදමානො සම්මා වදෙය්‍ය, න ච පන මුසාවාදං ආපජ්ජෙය්‍ය"ති.

18. "ඉමෙසං පන බ්‍රාහ්මණ චතුන්නං අඞ්ගානං සක්කා එකං අඞ්ගං ඨපෙත්වා තීහි අඞ්ගෙහි සමන්නාගතං බ්‍රාහ්මණං පඤ්ඤපෙතුං බ්‍රාහ්මණො-ස්මීති ච වදමානො සම්මා වදෙය්‍ය න ච පන මුසාවාදං ආපජ්ජෙය්‍ය ?"ති.

19. "සක්කා හො ගොතම. ඉමෙසං හි හො ගොතම චතුන්නං අඞ්ගානං මන්තො ඨපයාම. කිං හි මන්තා කරිස්සන්ති ? යතො ඛො හො ගොතම බ්‍රාහ්මණො උභතො සුජාතො හොති මාතිතො ච පිතිතො ච, සංසුද්ධ-ගහණිකො යාව සත්තමා පිතාමහයුගා, අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන, සීලවා ච හොති වුද්ධසීලී වුද්ධසීලෙන සමන්නාගතො, පණ්ඩිතො ච හොති මෙධාවී, පඨමො වා දුතියො වා සුජං පඤ්ඤාණත්තානං. ඉමෙහි ඛො හො ගොතම චතූහඞ්ගෙහි සමන්නාගතං බ්‍රාහ්මණං බ්‍රාහ්මණං පඤ්ඤ-පෙති බ්‍රාහ්මණො'ස්මීති ච වදමානො සම්මා වදෙය්‍ය න ච පන මුසාවාදං ආපජ්ජෙය්‍ය"ති.

විශිෂ්ට රූපශෝභා ඇත්තේ, දකුම් කටයුත්තේ, ප්‍රසාද එළවන සුලු වූයේ, උතුම් වර්ණසෞන්දර්යයෙන් සමන්විත වූයේ වෙයි. උතුම් රත්වන් පැහැ ඇතිකේ ය. උතුම් ශරීරප්‍රභා ඇතිකේ ය. ආරෝහ පරිණාහ සම්පත්තියෙන් හා අවයවයන් ගේ පරිපූර්ණත්වයෙන් හා සිරුරෙහි දැකීමට නොමඳ වූ අවකාශ ඇතිකේ වෙයි. වැඩුණු සිල් ඇත්තේ, වැඩුණු ශීලයෙන් සමන්විත වූයේ, සිල්වත් වෙයි. පණ්ඩිත ද නුවණැත්තේ ද එහෙයින් ම යාග සැන්ද ඔසොවන්නවුන් අතුරෙහි පළමු වැන්නා හෝ දෙවැන්නා වෙයි. භවද්-ගෞතමයිනි, මේ අංග පසින් සමන්විතයා බමුණකු කොට බමුණෝ පණවත් හේ 'මම බමුණෙකිමි'යි කියන්නේ මොනොවට කියන්නේ ය, බොරු කීමට නො වැටෙන්නේ ය යනු යි.

16. [භාග්‍යවතුන් වහන්සේ:] "බමුණ, මේ අංග පස අතුරෙන් එක් අංගයක් හැර අංග සතරකින් සමන්විතයක්හු බමුණකු කොට පණවන්නට හැක්කක් ද? (එසේ පැණැවිමෙන්) 'මම බමුණෙකිමි'යි කියන්නේ නො වැරැදිලෙස කිය හැකි වන්නේ ද? බොරු කීමකට නො පැමිණෙන්නේ ද?"

17. [සොණදණ්ඩ:] "හැකි ය, භවද් ගෞතමයිනි. භවද් ගෞතමයිනි, මේ අංග පස අතුරෙන් වර්ණසෞන්දර්ය හැර ලබමි. වර්ණය කුමක් කරන්නේ ද? භවද් ගෞතමයිනි, යම් හෙයකින් බමුණු තෙමේ මව්පියදෙපසින් අභිජාත වේ නම්, සත්වන මිමුතු යුවල තෙක් පිරිසිදු මව්කුස ඇතිකේ නම් ජාතිවාදයෙන් නො හෙළන ලද්දේ නම්, නො ගරහන ලද්දේ නම්, වේද හදාරන්නෙක්, වේද සිතැ ලා දරන්නෙක්, නිඝණ්ඩු කෛටභ-ශාස්ත්‍ර ද සහිත, ශික්ෂා හා නිරුක්ති සහිත, ඉතිහාසය පස්වනු කොටැති, තුන් වේදයන්ගේ පරතෙර පැමිණියෙක් වේ නම්, පදපාඨ ද සියලු ව්‍යාකරණ විධි ද දන්නෙක්, ලෝකායත ශාස්ත්‍රයෙහිත් මහාපුරුෂ-ලක්ෂණවිදුයෙහිත් නිපුණයෙක් වේ නම්; වැඩුණු සිල් ඇත්තේ, වැඩුණු ශීලයෙන් යුක්ත වූයේ සිල්වත් වේ නම්; පණ්ඩිතත් නුවණැත්-තේත්, එ හෙයින් ම යාග සැන්ද ඔසොවන්නත් අතුරෙහි පළමු හෝ දෙවෙනිත් වේ නම්, භවද් ගෞතමයිනි, මෙ කී අංග සතරින් සමන්විතයා බමුණකු කොට බමුණෝ පණවත්. හේ 'බමුණෙකිමි'යි කියන්නේ ද මොනොවට ම කියන්නේ ය, බොරු කීමටකට නො වැටෙන්නේ ය."

18. [භාග්‍යවතුන් වහන්සේ:] 'බමුණ, මේ අංග සතරින් එකක් හැර අංග තුනෙකින් යුක්තයක්හු බමුණකු කොට පණවන්නට හැක්කේ ද? හේ 'මම බමුණෙකිමි'යි කියන්නේ නොවැරැදි ලෙස කියැ හැකි වන්නේ ද? බොරු කීමකට නො වැටෙන්නේ ද?"

19. [සොණදණ්ඩ:] "භවද් ගෞතමයිනි, හැක්කේ ය. භවද්-ගෞතමයිනි, මේ අංග සතරින් වෙදයන් හැර දමමි. වෙදයෝ කුමක් කරන්නෝ ද? භවද් ගෞතමයිනි, යම් හෙයකින් බමුණු තෙමේ මාපිය දෙපසින් අභිජාත වේ නම්, සත්වන මිමුතු යුවල තෙක් පිරිසිදු මව්කුස ඇතිකේ නම්, ජාතිවාදයෙන් නො හෙළන ලදුයේ නොගරහන ලදුයේ නම්; වැඩුණු සිල් ඇති වැඩුණු සිලින් යුත් සිල්වතෙක් වේ නම්; පණ්ඩිතත් නුවණැතින් එ හෙයින් ම යාග සැන්ද ඔසොවන්නත් අතුරෙහි පළමු හෝ දෙවෙනිත් වේ නම්, භවද් ගෞතමයිනි, මේ අංග තුනින් සමන්විතයා බමුණකු කොට බමුණෝ පණවත්. හේ 'මම බමුණුමි'යි කියනුයේ ද කරුණු සහිත වැ ම කියන්නේ ය, බොරු කීමකට ද නො පැමිණෙන්නේ ය".

20. "ඉමෙසං පන බ්‍රාහ්මණ තිණ්ණං අඞ්ගානං සක්කා එකං අඞ්ගං උපපත්තිං දිස්වා දිස්සඞ්ගෙන සමන්නාගතං බ්‍රාහ්මණං පඤ්ඤපෙතුං, බ්‍රාහ්මණොසමිති ච වදමානො සම්මා වදෙය්‍ය න ච පන මුසාවාදං ආපජ්ජෙය්‍යා ?"ති.

21. "සක්කා හො ගොතම. ඉමෙසං හි හො ගොතම තිණ්ණං අඞ්ගානං ජාතිං උපයාම. කිං හි ජාති කරිස්සති ? යතො ඛො හො ගොතම බ්‍රාහ්මණො සීලවා ච හොති වුද්ධසීලී වුද්ධසීලෙන සමන්නාගතො, පණ්ඩිතො ච හොති මෙධාවී පඨමෙ වා දුතියෙ වා ඤාණෙ පඤ්ඤාය සමන්නාගතො. ඉමෙහි ඛො හො ගොතම දස්සඞ්ගෙහි සමන්නාගතං බ්‍රාහ්මණො බ්‍රාහ්මණං පඤ්ඤපෙතෙ. බ්‍රාහ්මණොස්මිති ච වදමානො සම්මා වදෙය්‍ය න ච පන මුසාවාදං ආපජ්ජෙය්‍යා"ති.

22. එවං වුත්තෙ තෙ බ්‍රාහ්මණා සොණදණ්ඩං බ්‍රාහ්මණං එතදවොචුං: "මා භවං සොණදණ්ඩො එවං අවච. මා භවං සොණදණ්ඩො එවං අවච. අපවදතෙව භවං සොණදණ්ඩො වණ්ණං, අපවදති මන්තෙ, අපවදති ජාතිං. එකංසෙන භවං සොණදණ්ඩො සමණස්සෙව ගොතමස්ස වාදං අනුපක්ඛන්දති"ති.

23. අථ ඛො භගවා තෙ බ්‍රාහ්මණෙ එතදවොච: "සචෙ ඛො තුම්හාකං බ්‍රාහ්මණා එවං හොති, 'අප්පස්සුතො ච සොණදණ්ඩො බ්‍රාහ්මණො, අකල්‍යාණවාක්කරණො ච සොණදණ්ඩො බ්‍රාහ්මණො, දුප්පඤ්ඤ ච සොණදණ්ඩො බ්‍රාහ්මණො, න ච පහොති සොණදණ්ඩො බ්‍රාහ්මණො සමණෙන ගොතමෙන සද්ධිං අස්සිං වචනෙ පටිමන්තෙතුන්ති, තිට්ඨතු සොණදණ්ඩො බ්‍රාහ්මණො, තුම්හෙ මයා සද්ධිං මන්තෙථ. සචෙ පන තුම්හාකං බ්‍රාහ්මණා එවං හොති: "බහුස්සුතො ච සොණදණ්ඩො බ්‍රාහ්මණො, කල්‍යාණවාක්කරණො ච සොණදණ්ඩො බ්‍රාහ්මණො, පණ්ඩිතො ච සොණදණ්ඩො බ්‍රාහ්මණො, පහොති ච සොණදණ්ඩො බ්‍රාහ්මණො සමණෙන ගොතමෙන සද්ධිං අස්සිං වචනෙ පටිමන්තෙතුන්ති' තිට්ඨථ තුම්හෙ, සොණදණ්ඩො බ්‍රාහ්මණො මයා සද්ධිං පටිමන්තෙතූ"ති.

24. එවං වුත්තෙ සොණදණ්ඩො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: "තිට්ඨතු භවං ගොතමො. තුණ්හී භවං ගොතමො හොතු. අහමෙව තෙසං සඞ්ඛමෙමෙන පටිවචනං කරිස්සාමි"ති.

අථ ඛො සොණදණ්ඩො බ්‍රාහ්මණො තෙ බ්‍රාහ්මණෙ එතදවොච: "මා භවන්තො එවං අවචුත්ථ, මා භවන්තො එවං අවචුත්ථ: 'අපවදතෙව භවං සොණදණ්ඩො වණ්ණං, අපවදති මන්තෙ, අපවදති ජාතිං, එකංසෙන භවං සොණදණ්ඩො සමණස්සෙව ගොතමස්ස වාදං අනුපක්ඛන්දති'ති නාහං හො අපවදාමි වණ්ණං වා මන්තෙ වා ජාතිං වා"ති.

20. [භාග්‍යවතුන් වහන්සේ:] "බමුණ, මේ අංග තුනින් එක් අංගයක් හැරැ දමා අංග දෙකෙකින් සමන්විතයහු බමුණකු කොට පැණැවියැ හැක්කේ ද? හේ 'මම බමුණෙකිමි'සිත් කියනුයේ, කරුණු සහිත වැ කියැ හැකි වන්නේ ද? බොරු කීමකට නො පැමිණෙන්නේ ද?"

21. [සොණදණ්ඩ:] "භවද්ගෞතමයිනි, හැක්කේ ය. භවද්-ගෞතමයිනි, මේ අංග තුනෙන් ජාතිය හැරැ දමමු. ජාතිය කුමක් කරන්නේ ද? භවද්ගෞතමයිනි, යම් හෙයකින් බමුණු තෙමේ වැඩුණු සිල් ඇත්තේ, වැඩුණු සිලින් යුත් වූයේ සිල්වත් වේ ද, පණ්ඩිතත් නුවණැත්තේත් එහෙයින් ම යාග සැන්ද ඔසොවන්නත් අතුරෙහි පළමු හෝ දෙවෙනින් වේ ද, භවද්ගෞතමයිනි, මේ අංග දෙකින් සමන්විතයක්හු බමුණකු කොට බමුණෝ පණවත්. හේ ද 'මම බමුණුමි' සිත් කියනුයේ කරුණු සහිත වැ කියන්නේ ය, බොරු කීමකට නො පැමිණෙන්නේ ය."

22. මෙසේ කී කල්හි ඒ බමුණෝ සොණදණ්ඩ බමුණහුට "භවත් සොණදණ්ඩ තෙමේ මෙසේ නො කියා වා. භවත් සොණදණ්ඩ තෙමේ මෙසේ නො කියා වා. භවත් සොණදණ්ඩ තෙමේ වර්ණසෞන්දර්යය බැහැර කෙරේ ම ය, භවත් සොණදණ්ඩ තෙමේ වේදයත් බැහැර කෙරේ ම ය, ජාතිය බැහැරැ කෙරේ ම ය. භවත් සොණදණ්ඩ තෙමේ එකාන්තයෙන් ශ්‍රමණ ගෞතමයන්ගේ සමයයට වැද ගනී" යැ යි මේ වචන කීහ.

23. එ විට භාග්‍යවතුන් වහන්සේ ඒ බමුණනට වදාරන සේක්: "බමුණනි, ඉදින් සොණදණ්ඩ බමුණා අල්පශ්‍රැත යැ යි ද නොමනා බස් දෙඩන්නෙකැ යි ද නුවණ නැත්තෙකැ යි ද, මේ වචනයෙහි ශ්‍රමණ ගෞතමයන් හා සාකච්ඡා කරන්නට සමත් නො වෙතැ'යි ද කියා නොපට මෙසේ සිතෙක් වේ නම්, සොණදණ්ඩ බමුණු තෙමේ සිටි වා. තෙපි මා හා සාකච්ඡා කරවු. බමුණනි, ඉදින් සොණදණ්ඩ බමුණු තෙමේ බහුශ්‍රැත යැ යි ද, මනා වචන කියන්නෙකැ යි ද, පණ්ඩිත යැ යි ද, මේ වචනයෙහි ශ්‍රමණගෞතමයන් හා සාකච්ඡා කරන්නට සමත් වෙතැ යි ද කියා මෙසේ නොපට සිතෙක් වේ නම්, තෙපි සිටිවු. සොණදණ්ඩ බමුණු තෙමේ ම මා හා සාකච්ඡා කෙරේ වා" යි මෙය වදාළ සේක.

24. මෙසේ වදාළ කල්හි, සොණදණ්ඩ බමුණු තෙම "භවද්ගෞතම තෙමේ සිටි වා, භවද්ගෞතම තෙමේ නිහඬ වේ වා. මම ම ඔවුනට කරුණු සහිත වැ උත්තර දෙන්නෙමි"යි භාග්‍යවතුන් වහන්සේට කී ය.

ඉක්බිති සොණදණ්ඩ බමුණු ඒ බමුණන් බණවා "භවත්හු 'භවත් සොණදණ්ඩයා වර්ණ බැහැර කෙරෙයි, වේදයත් බැහැර කෙරෙයි, ජාතිය බැහැර කෙරෙයි, එකාන්තයෙන් භවත් සොණදණ්ඩ තෙමේ ශ්‍රමණ ගෞතමයන්ගේ සමයයට වැද ගනී' යැ යි මෙසේ නො කියත් වා. මම වර්ණ හෝ වේදයත් හෝ ජාතිය හෝ බැහැර නො කරමි"යි කී ය.

25. තෙන ඛො පන සමයෙන සොණදණ්ඩස්ස බ්‍රාහ්මණස්ස හත්ථිනෙය්‍යො අඩ්ඪකාසො නාම මාණවකො තස්සං පරිසායං නිසින්නො හොති. අථ ඛො සොණදණ්ඩො බ්‍රාහ්මණො තෙ බ්‍රාහ්මණෙ එතදවොච: "පස්සන්ති තො හොන්තො ඉමං අඩ්ඪකං මාණවකං අමත්තකං හත්ථිනෙය්‍යන්ති ?"

"එවං හො."

"අඩ්ඪකො ඛො හො මාණවකො අභිරූපො දස්සනීයො පාසාදිකො පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතො බ්‍රහ්මවණ්ණී බ්‍රහ්මවච්චසී අක්ඛුද්දවිත්තො දස්සනාය. තස්ස ඉමස්සං පරිසායං සම්භමො අත්ථි වණ්ණෙන, ඨපෙත්වා සමණං ගොතමං.

අඩ්ඪකො ඛො හො මාණවකො අජ්ඣායකො මන්තධරො, තිණ්ණං වෙදානං පාරගූ සනිඝණ්ඩුකෙටුභානං සාක්ඛරප්පභෙදානං ඉතිහාසපඤ්චමානං. පදකො වෙය්‍යාකරණො ලොකායතමහාපුරිසලක්ඛණෙසු අනවයො. අහමස්ස මන්තෙ වාචෙතා.

අඩ්ඪකො ඛො හො මාණවකො උභතො සුජාතො මාතිතො ච පිතිතො ච, සංසුද්ධගහණිකො යාව සත්තමා පිතාමහයුගා, අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන. අහමස්ස මාතාපිතරො ජානාමි.

අඩ්ඪකො ඛො හො මාණවකො පාණම්පි හනෙය්‍ය අදින්නම්පි ආදියෙය්‍ය පරදාරම්පි ගච්ඡෙය්‍ය මුසාපි භණෙය්‍ය මජ්ජම්පි පිවෙය්‍ය, එත්තදපි හො කිං වණ්ණො කරිස්සති, කිං මන්තා, කිං ජාති. ?

යතො ඛො හො බ්‍රාහ්මණො සීලවා ච හොති වුද්ධසීලී වුද්ධසීලෙන සමන්නාගතො, පණ්ඩිතො ච හොති මෙධාවී පඨමෙන වා දුතියෙන වා ඤාණෙන සමන්නාගතො. ඉමෙහි ඛො හො දීඝභෙගහි සමන්නාගතං බ්‍රාහ්මණං බ්‍රාහ්මණං පඤ්ඤපෙන්ති. බ්‍රාහ්මණො'ස්මීති ච වදමානො සම්මා වදෙය්‍ය, න ච පන මුසාවාදං ආපජ්ජෙය්‍ය"න්ති.

26. "ඉමෙසං පන බ්‍රාහ්මණ දීඝානං අඩ්ඪානං සක්කා එකං අඩ්ඪං ඨපෙත්වා එකෙන අඩ්ඪෙන සමන්නාගතං බ්‍රාහ්මණං පඤ්ඤපෙතුං, බ්‍රාහ්මණො'ස්මීති ච වදමානො සම්මා වදෙය්‍ය. න ච පන මුසාවාදං ආපජ්ජෙය්‍ය ?"න්ති

"නො හිදං හො ගොතම. සීලපරිඩොතා හි හො ගොතම පඤ්ඤා. පඤ්ඤාපරිඩොතං සීලං. යත්ථ සීලං තත්ථ පඤ්ඤා. යත්ථ පඤ්ඤා තත්ථ සීලං. සීලවතො පඤ්ඤා, පඤ්ඤාවතො සීලං. සීලපඤ්ඤාණං ච පන ලොකස්මිං අග්ගමක්ඛායති. සෙය්‍යථාපි හො ගොතම හත්ථෙන වා හත්ථං ධොවෙය්‍ය පාදෙන වා පාදං ධොවෙය්‍ය, එවමෙව ඛො හො ගොතම සීලපරිඩොතා පඤ්ඤා, පඤ්ඤාපරිඩොතං සීලං. යත්ථ සීලං තත්ථ පඤ්ඤා, යත්ථ පඤ්ඤා තත්ථ සීලං. සීලවතො පඤ්ඤා, පඤ්ඤාවතො සීලං. සීලපඤ්ඤාණඤ්ච පන ලොකස්මිං අග්ගමක්ඛායති.

25. එ වේලෙහි සෝණදණ්ඩ බමුණාගේ බැතිණු වූ අඩහක මාණවක තමේ ඒ පිරිසෙහි හුන්නේ වෙයි. ඉක්බිති සෝණදණ්ඩ බමුණු "භවත්හු අප බැතිණු වූ මේ අඩහක මාණවකයා දකිත් ද ?"යි කී ය.

"භවත, එසේ යැ" යි බමුණෝ කීහ.

(එ විට සෝණදණ්ඩ බමුණු මෙසේ කී ය:)

"භවත්නි, අඩහක මාණවක තෙමේ විශිෂ්ට රූපය ඇත්තේ ය, දැකුම් කටයුතු ය, උතුම් වර්ණසෞන්දර්යයෙන් යුක්ත ය, උතුම් රත් පැහැ ඇත්තේ ය, උතුම් සිරුරුපැහැ ඇත්තේ ය, සිය සිරුර දක්මට තොමඳ අවකාශ ඇත්තේ ය. ශ්‍රමණ ගෞතමයන් හැර මේ පිරිසෙහි හැම අයුරින් ම ඔහුට සම එකෙක් නැත.

භවත්නි, අඩහක මාණවක තෙමේ වේද හතරත්තෙක, වේදමන්ත්‍රයන් සිත්හි ලා දරත්තෙක, නිඝණ්ඩු ද කෙටභශාස්ත්‍ර ද සහිත අක්ෂරප්‍රභේද සහිත ත්‍රිවේදයෙහි පාරප්‍රාප්තයෙක. පදපාඨ දත්තෙක, සියලු ව්‍යාකරණ විධිත් දත්තෙක, ලෝකායතශාස්ත්‍රයෙහි ද මහාපුරුෂලක්ෂණවිද්‍යයෙහි ද නිපුණයෙක. මෙහුට වේද කියැවූ තැනැත්තේ මේ ය.

භවත්නි, අඩහක මාණවක තෙමේ මව පිය යන දෙ පසින් ම අභිජාත ය, සත් වන මිමුතු පුවල තෙක් පිරිසිදු මවුකුස ඇත්තෙක, ජාතිවාදයෙන් නොගෙලන ලද්දෙක, නොගරහන ලද්දෙක. මම මෙහුගේ මව පියන් දනිමි.

භවත්නි, අඩහක මාණවකයා වනාහි ප්‍රාණඝාත ද කරන්නේ නම්, නොදුන් දෑත් ගන්නේ නම්, පරඹුවන් කරුත් යන්නේ නම්, බොරුත් කියන්නේ නම්, මත්පැනුත් බොන්නේ නම්, භවත්නි, මෙහි වර්ණ-සෞන්දර්ය කුමක් කරන්නේ ද (බමුණු බව රක්නට සමත් වන්නේ ද) ? වේදයෝ කුමක් කරන්නෝ ද ? ජාතිය කුමක් කරන්නේ ද ?

භවත්නි, යම් හෙයකින් බමුණු තෙමේ වැඩුණු සිල් ඇත්තේ, වැඩුණු සිලින් යුත් වූයේ, සිල්වත් වේ ද; පණ්ඩිත වේ ද, නුවණැති වේ ද, යාග සැන්ද ඔසොවන්නන් අතුරෙහි පළමු හෝ දෙවෙනි වේ ද, භවත්නි, මේ අඩහ දෙකින් සමන්විතයා වූ කලි බමුණකු කොට බමුණෝ පණවත්. හේ 'මම බමුණුම්'යි කියන්නේ ද කරුණු සහිත වැ කියන්නේ ය, බොරු කීමකට නො පැමිණෙන්නේ ය."

26. [භාග්‍යවතුන් වහන්සේ:] බ්‍රාහ්මණය, මේ අඩහ දෙකින් එක් අඩහයක් හැරැ දමා එක් අඩහයෙකින් සමන්විතයා බමුණකු කොට පණවන්නට හැක්කේ ද ? හේ 'බමුණෙකිමි'යි කියන්නේ, කරුණු සහිත වැ කියන්නේ ද ? බොරු කීමකට නො පැමිණෙන්නේ ද ?"

[සෝණදණ්ඩ:] භවද්ගෞතමයිනි, මෙය නො වේ ම ය. භවද් ගෞතමයිනි, ප්‍රඥාව ශීලයෙන් පිරිසිදු වෙයි. ශීලය ප්‍රඥයෙන් පිරිසිදු වෙයි. යම් තැනෙක ශීලය වේ නම්, එහි ප්‍රඥාව වේ. යම් තැනෙක ප්‍රඥාව වේ නම් එහි ශීලය වේ. සිල්වත්හට නුවණ වේ. නුවණැත්තාට සිල් ඇති වේ. ශීල ප්‍රඥා දෙක වූ කලි ලෝවැ අග්‍ර යැ යි කියනු ලැබේ. භවද් ගෞතමයිනි, යම් සේ අතින් අත හෝ පයින් පය හෝ සෝදන්නේ ද, එසේ ම ප්‍රඥාව ශීලයෙන් පරිශෝධිත වේ. ශීලය ප්‍රඥයෙන් පරිශෝධිත වේ. යම් තැනෙක ශීලය වේ නම්,... ශීල ප්‍රඥා දෙක වූ කලි ලෝවැ අග්‍ර යැ යි කියනු ලැබේ.

"එවමේතං බ්‍රාහ්මණ. සීලපරිඛෙතා හි බ්‍රාහ්මණ පඤ්ඤා, පඤ්ඤාපරිඛෙතං සීලං. යත්ථ සීලං තත්ථ පඤ්ඤා, යත්ථ පඤ්ඤා තත්ථ සීලං. සීලවතො පඤ්ඤා, පඤ්ඤාවතො සීලං. සීලපඤ්ඤාණඤ්ච පන ලෝකස්මිං අග්ගමක්ඛායති.

"කතමං පන තං බ්‍රාහ්මණ සීලං? කතමා සා පඤ්ඤා"?ති

"එත්තකපරමා'ව මයං භො ගොතම එතස්මිං අත්ථෙ. සාධු වත භවන්තංයෙව ගොතමං පටිභාතු එතස්ස භාසිතස්ස අත්ථො"ති.

"තෙන හි බ්‍රාහ්මණ සුණාහි, සාධුකං මනසි කරොහි, භාසිස්සාමි"ති.

'එවං භො'ති ඛො සොණදණ්ඩො බ්‍රාහ්මණො භගවතො පච්චස්සොසි. භගවා එතදවොච:

25. "ඉධ බ්‍රාහ්මණ තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මා-සම්බුද්ධො-පෙ-.

(යථා සාමඤ්ඤඵලෙ එවං විත්ථාරෙතබ්බං.) එවං ඛො බ්‍රාහ්මණ භික්ඛු සීලසම්පන්නො හොති ඉදං ඛො තං බ්‍රාහ්මණ සීලං-පෙ-. පඨමං ඣානං උපසම්පජ්ජ විහරති...දුතියං ඣානං උපසම්පජ්ජ විහරති -පෙ- තතියං ඣානං උපසම්පජ්ජ විහරති -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති -පෙ- අයං ඛො සො බ්‍රාහ්මණ සමාධි -පෙ- ආසවානං ඛයඤාණාය චිත්තං අභිනීහරති, අභිනීහරාමෙති -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාති. ඉදම්පි'ස්ස හොති පඤ්ඤාය. අයං ඛො සා බ්‍රාහ්මණ පඤ්ඤා"ති.

26. එවං වුත්තෙ සොණදණ්ඩො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: "අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම. සෙය්‍යථාපි භො ගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නං වා විවරෙය්‍ය මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති, එවමෙව භොතා ගොතමෙන අනෙකපරියා-යෙන ධම්මො පකාසිතො. එසාහං භවන්තං ගොතමං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතං. අධිවාසෙතු ච මෙ භවං ගොතමො ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙන"ති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන.

[භාග්‍යවතුන් වහන්සේ:] බ්‍රාහ්මණය, මෙය එසේ ය. බ්‍රාහ්මණය, ප්‍රඥාව ශීලයෙන් පිරිසිදු වේ. ශීලය ප්‍රඥායෙන් පිරිසිදු වේ. සිල් ඇති තැන ප්‍රඥාව වේ. ප්‍රඥාව ඇති තැන සිල් වේ. සිල්ඇත්තනුට ප්‍රඥාව ඇත. ප්‍රඥාව ඇත්තනුට සිල් ඇත. ශීල ප්‍රඥා දෙක වතාහි ලොවැ අග්‍ර යැ යි කියනු ලැබේ. බ්‍රාහ්මණය, ඒ ශීලය කවර යැ? ඒ ප්‍රඥාව කවර යැ?

[සෝණදණ්ඩ:] භවද් ගෞතමයිනි, මේ කරුණෙහි මේ ශීල ප්‍රඥා යන වචන දෙක දැනීම ම පරම කොවැත්තමු. (මේ වචන දනු විනා එහි අර්ථාදි වශයෙන් මෙයින් වැඩියක් නො දනිමු.) යාවිඤ්ඤ කරම්හ. භවද් ගෞතමයනට ම මේ වචනයේ අර්ථ වැටහේ වා (භවද්ගෞතමයෝ ම මෙහි අර්ථ වදාරත් වා).

[භාග්‍යවතුන් වහන්සේ:] "බමුණ, එසේ නම් අසන්නැ. මොනොවට මෙනෙහි කරන්නැ. එය කියන්නෙමි.

සෝණදණ්ඩ තෙමේ 'භවත, එසේ යැ'යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ මතු දැක්වෙන ධර්මය වදාළ සේක:

25. "බමුණ, අර්හත් වූ සම්‍යක්සම්බුද්ධ වූ ....තථාගත තෙමේ මෙ ලොවැ පහළ වෙයි...

(සාමඤ්ඤඵලසූත්‍රයෙහි ආ සේ විස්තර කළ යුතු.) ...බමුණ, මෙසේ මහණ තෙමේ ශීලසම්පන්න වෙයි. බමුණ, මේ ඒ ශීලය යි. ..පළමු ධ්‍යානය ලැබ වෙසෙයි...දෙවෙනි ධ්‍යානය ලැබ වෙසෙයි ... තෙවෙනි ධ්‍යානය ලැබ වෙසෙයි...සිවු වන ධ්‍යානය ලැබ වෙසෙයි... බමුණ, මේ ඒ සමාධියයි. ආශ්‍රවක්ෂයඥානය පිණිස සිත යොමු කෙරෙයි, නැඹුරු කෙරෙයි. 'මේ කෙලෙශක්ෂයය පිණිස කළ යුතු අන් කිසිත් නැතැ'යි දැනැ ගනී. මේ ඔහුගේ ප්‍රඥාව වේ. බමුණ, මේ ඒ ප්‍රඥාව ය."

26. මෙසේ වදාළ කල්හි සෝණදණ්ඩ බ්‍රාහ්මණ තෙම, "භවද් ගෞතමයිනි, ධර්මදේශනාව අභිකාන්ත ය. භවද් ගෞතමයිනි, ධර්මදේශනාව අභිකාන්ත ය. භවද් ගෞතමයිනි, යම්සේ යැටිකුරු කොට තැබූ බඳුනක් උඩුකුරු කරන්නේ හෝ වේ ද, වැසුණු දෙයක් විවෘත කරන්නේ හෝ වේ ද, මංමුලා වූවකුට මඟ හෝ කියන්නේ වේ ද, 'ඇස් ඇතියන් රූප දකිතැ'යි අඳුරෙහි තෙල්පහනක් දල්වන්නේ හෝ වේ ද, භවද්ගෞතමයිනි, එ පරිදෙන් ම, භවද්ගෞතමයන් විසින් මට නොයෙක් අයුරින් ධර්මය පැවැසිණ. භවද්ගෞතමයිනි, ඒ මම භවද් ගෞතමයන් වහන්සේ ද ධර්මය ද භික්ෂුසංඝයා ද සරණ යෙමි. භවද් ගෞතමයන් වහන්සේ අද පටන් මා දිවි තිමි කොට සරණ ගිය උපාසකයකු කොට සලකන සේක් වා. භවද්ගෞතමයන් වහන්සේ භික්ෂුසංඝයා හා සෙට් දවසට මගේ බත ඉවසන සේක් වා"යි කීයේ ය. භාග්‍යවතුන් වහන්සේ නිහඬ බැවින් එය ඉවසූ සේක.

27. අථ ඛො සොණදණ්ඩො බ්‍රාහ්මණො භගවතො අධිවාසනං විදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි. අථ ඛො සොණදණ්ඩො බ්‍රාහ්මණො තස්සා රත්තියා අච්චයෙන සකෙ නිවෙසනෙ පණීතං ඛාදනීයං භොජනීයං පටියාදාපෙත්වා භගවතො කාලං ආරොචාපෙසි: කාලො හො ගොතම, නිට්ඨිතං භත්තන්ති.

28. අථ ඛො භගවා පුබ්බන්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සද්ධිං භික්ඛුසඞ්ඝෙන යෙන සොණදණ්ඩස්ස බ්‍රාහ්මණස්ස නිවෙසනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. අථ ඛො සොණදණ්ඩො බ්‍රාහ්මණො බුද්ධප්පමුඛං භික්ඛුසඞ්ඝං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්থා සන්තප්පෙසි සම්පවාරෙසි.

29. අථ ඛො සොණදණ්ඩො බ්‍රාහ්මණො භගවන්තං භුත්තාවිං ඔනීතපත්තපාණිං අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සොණදණ්ඩො බ්‍රාහ්මණො භගවන්තං එතද-වොච: "අහඤ්චෙව ඛො පන හො ගොතම පරිසගතො සමානො ආසත්‍ය වුට්ඨහිත්වා භවන්තං ගොතමං අභිවාදෙය්‍යං, තෙන මං සා පරිසා පරිහවෙය්‍ය. යං ඛො පන සා පරිසා පරිහවෙය්‍ය යසො'පි තස්ස හායෙථ. යස්ස ඛො පන යසො හායෙථ භොගාපි තස්ස හායෙය්‍යුං. යසොලද්ධා ඛො පනම්හාකං භොගා.

අහඤ්චෙව ඛො පන හො ගොතම පරිසගතො සමානො අඤ්ජලිං පණාමෙත්වා, ආසනා මෙ තං භවං ගොතමො පවුට්ඨිතං ධාරෙතු.

අහඤ්චෙව ඛො පන හො ගොතම පරිසගතො සමානො වෙළනං ඔමුඤ්චෙය්‍යං, සිරසා මෙ තං භවං ගොතමො අභිවාදනං ධාරෙතු.

අහඤ්චෙව ඛො පන හො ගොතම යානගතො සමානො යානා පච්චොරොහිත්වා භවන්තං ගොතමං අභිවාදෙය්‍යං, තෙන මං සා පරිසා පරිහවෙය්‍ය. යං ඛො පන සා පරිසා පරිහවෙය්‍ය යසො'පි තස්ස හායෙථ. යස්ස ඛො පන යසො හායෙථ භොගාපි තස්ස හායෙය්‍යුං. යසොලද්ධා ඛො පනම්හාකං භොගා.

අහඤ්චෙව ඛො පන හො ගොතම යානගතො සමානො පතොදලට්ඨිං අභිනුත්‍යාමෙය්‍යං, යානා මෙ තං භවං ගොතමො පච්චොරොහනං ධාරෙතු.

අහඤ්චෙව ඛො පන හො ගොතම යානගතො සමානො ඡත්තං අපනාමෙය්‍යං, සිරසා මෙ තං භවං ගොතමො අභිවාදනං ධාරෙතු"න්ති.

අථ ඛො භගවා සොණදණ්ඩං බ්‍රාහ්මණං ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා උට්ඨායාසනා පක්කාමි.

සොණදණ්ඩසුත්තං නිට්ඨිතං චතුත්थං

27. ඉක්බිත්තෙන් සොණදණ්ඩ බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේ ගේ ඉවැසීම දැන, හුනස්නෙන් නැගී සිට, භාග්‍යවතුන් වහන්සේ ආදරයෙන් වැඳ පැදකුණු කොට නික්මැ ගියේ ය. ඉන් පසු සොණදණ්ඩ බමුණු තෙම ඒ රැය ඇවැමෙන් සිය ගෙහි ප්‍රණීත ඛාද්‍ය භෝජ්‍ය පිළියෙල කරවා 'භවද්ගෞතමයන් වහන්ස, බත පිළියෙල කොට තිබේ ය. දැන් වඩින්නට කාලය වේ යැ' යි භාග්‍යවතුන් වහන්සේට කල් දන්වා යැවී ය.

28. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ පෙරවරු හැඳ පෙරෙවැ පාසිවුරු ගෙන භික්ෂුසඟන හා සොණදණ්ඩ බමුණුගේ ගෙට එළැඹි සේක. එළැඹ පණවා තුබුණු අස්නෙහි වැඩ හුන් සේක. එ කල්හි සොණදණ්ඩ බමුණු තෙමේ බුදුපාමොක් සඟන ප්‍රණීත ඛාද්‍යභෝජ්‍යයෙන් සියතින් සැතැප්වී ය, පැවැරැවී ය.

29. එයට පසු සොණදණ්ඩ බමුණු තෙම වළඳ අවසන් කළ, පාත්‍රයෙන් ඉවතට ගත් අතැති භාග්‍යවතුන් වහන්සේට එක් පසෙක එක්තරා මිටි අස්නක් ගෙන හිඳ ගත්තේ ය. එකත්පසෙක හුන් සොණදණ්ඩ තෙම භාග්‍යවතුන් වහන්සේට මේ බස් පැවැසී ය:

"භවද්ගෞතමයිනි, මම වූ කලි පිරිස් මැදට පැමිණියෙම් ම අස්නෙන් නැගී සිට භවත් ගෞතමයන් වැන්දෙම් වීම් නම්, එයින් ඒ පිරිස මට බැණ වදිති. යම්කුට ඒ පිරිස බැණ වදිත් නම් ඔහුගේ යශස් ද පිරිහෙන්නේ ය. යම්කුගේ යශස් පිරිහෙන්නේ ද, ඔහුගේ භෝග සම්පත් ද පිරිහෙන්නේ ය. අපේ භෝගසම්පත් වූ කලි යශසින් ලබන ලද්දේ ය.

තව ද භවද්ගෞතමයිනි, මම පිරිසට පැමිණියෙම් ම දෙහොත් බුදුන් තැබූයෙම් වීම් නම්, එය මා හුනස්නෙන් නැගී සිටීම කොට භවද්ගෞතමයන් වහන්සේ සලකන සේක් වා.

තව ද භවද් ගෞතමයෙනි, මම පිරිස් මැදට ගියෙම් ම හිස්වෙළුම මුදා ගෙළැයෙම් වීම් නම්, භවද්ගෞතමයන් වහන්සේ එය මා හිස නමා කළ වැඳීමක් කොට සලකන සේක් වා.

තව ද භවද්ගෞතමයිනි, මම යානයක් නැඟ උන්නෙම් ම එයින් බැස, භවද්ගෞතමයන් වහන්සේ වැන්දෙම් නම්, එයින් ඒ පිරිස මට පරිභව කරති. එසේ පරිභව ලද්දහුගේ යශස් ද පිරිහේ. යශසින් පිරිහුණහුගේ භෝග ද පිරිහෙන්නේ ය. අපේ භෝගයෝ යශසින් ලබන ලද්දේ ය. (එ බැවිනි.)

භවද්ගෞතමයිනි, මම වතාහි යානයක් නැඟ උන්නෙම් ම කෙවිට ඉදිරියට නමා ලීම් නම්, එය මා යානයෙන් බැසීම කොට භවද්ගෞතමයන් වහන්සේ සලකන සේක් වා.

තව ද මම යානයෙක උන්නෙම් ම ඡත්‍රය ඉවතට නමා හෙළීම් නම්, එය මා හිස නමා කළ වැඳීමක් කොට භවද්ගෞතමයන් වහන්සේ සලකන සේක් වා."

ඉන් පසු භාග්‍යවතුන් වහන්සේ සොණදණ්ඩ බමුණාට දහැමි කතායෙන් දෙලෝ වැඩ දක්වා, කුසල් දහම් ගන්වා, කුසල් වැඩුමහි උත්සාහවත් කොට, ඔහු තුළ වූ ගුණ දක්වා සතුටු කොට, හුනස්නෙන් නැගී නික්මැ ගිය සේක.

සිඹුවන සොණදණ්ඩ සූත්‍රය නිමියේ ය.

5

කූටදන්තසුත්තං

1. එවං මේ සුතං. එකං සමයං භගවා මගධේසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝේන සද්ධිං පඤ්චමත්තේහි භික්ඛුසතේහි, යේන ඛාණුමතං නාම මගධානං බ්‍රාහ්මණගාමො තදවසරි. තත්‍ර සුදං භගවා ඛාණුමතෙ විහරති අම්බලට්ඨිකායං.

තේන ඛො පන සමයේන කූටදන්තො බ්‍රාහ්මණො ඛාණුමතං අජ්ඣාවසති සත්තුස්සදං සත්තිණකට්ඨෝදකං සධඤ්ඤං රාජභොග්ගං රඤ්ඤා මගධේන සෙනියේන බිම්බිසාරේන දින්නං රාජදායං බ්‍රහ්මදෙය්‍යං.

තේන ඛො පන සමයේන කූටදන්තස්ස බ්‍රාහ්මණස්ස මහායඥෙසු උපක්ඛලෙටා හොති. සත්ත ච උසභසතානි සත්ත ච වච්ඡතරසතානි සත්ත ච වච්ඡතරීසතානි සත්ත ච අජසතානි සත්ත ච උරබ්භසතානි යූපූපනීතානි හොන්ති යඤ්ඤත්ථාය.

2. අස්සොස්සුං ඛො ඛාණුමතකා බ්‍රාහ්මණගහපතිකා: "සමණො ඛලු නො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො මගධේසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝේන සද්ධිං පඤ්චමත්තේහි භික්ඛුසතේහි ඛාණුමතං අනුප්පත්තො ඛාණුමතෙ විහරති අම්බලට්ඨිකායං.

'තං ඛො පන භවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො': ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා'ති. සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති. සාධු ඛො පන තථාරූපානං අරහතං දස්සනං හොතී"ති.

අථ ඛො ඛාණුමතකා බ්‍රාහ්මණගහපතිකා ඛාණුමතා නික්ඛමිත්වා සඞ්ඝසඞ්ඝී ගණීභූතා යේන අම්බලට්ඨිකා තේනුපඤ්කමිංසු.

5

කූටදන්ත සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදි. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ පන්සියක් භික්ෂූන් පමණ වූ මහත් පැවිදිබුළුවක් හා මගධ රටැ සැරි සරන සේක්, මගධ රටැ ඛාණුමත නම් බමුණු ගමට වැඩි සේක. භාග්‍යවතුන් වහන්සේ ඒ ඛාණුමත ගමැ අඹයැටිලයන්හි වැඩ වසන සේක.

එ සමයෙහි වනාහි කූළුදන් (කූටදන්ත) බමුණු තෙමේ මගධාධිපති ශ්‍රේණිය බිම්බිසාර රජුහු විසින් දුන් රාජදායාදය වූ, ශ්‍රේෂ්ඨ ත්‍යාගය වූ, බහුජනාකීර්ණ වූ, තණ දඹු දිය සුලභ වූ, බොහෝ ධන ධාන්‍ය ඇති, රාජසවරූපයෙන් පරිභෝග කටයුතු වූ ඛාණුමත ගමැ වේසෙහි.

එ සමයෙහි කූළුදන් බමුණුනුගේ මහායාගයෙක් පිළියෙල කැරුණේ වෙයි. සත්සියක් ගොන් ද, සත්සියක් නාඹුවස්සෝ ද, සත්සියක් නාඹුවැස්සියෝ ද, සත්සියක් එළුවෝ ද, සත්සියක් තරුණ ඛැටෙළුවෝ ද (පොරගසන එළුවෝ ද තවත් සත්සියක් ඛැඟින් බොහෝ මාගපක්ෂීහු ද) යාග පිණිස යාග වැඩ වෙතට පමුණුවන ලදහ.

2. ඛාණුමත ගමැ වැසි බමුණෝ ද ගෘහපතියෝ ද රථෙහි පැතිරැ පැවැති භාග්‍යවතුන් වහන්සේ පිළිබඳ මතු දැක්වෙන යස ගී ඇසූහ: "භවත්නි, ශාක්‍යපුත්‍ර වූ, ශාක්‍ය කුලයෙන් නික්මැ පැවිදි වූ මහණ ගොතමීහු භික්ෂූන් පන්සියක් පමණ වූ මහත් පැවිදිබුළුවක් හා මගධ රටැ සැරි සරනුහුවෝ ඛාණුමතයට පැමිණියෝ ඛාණුමතයට සමීපයෙහි වූ අඹයැටි වෙතෙහි වෙසෙති.

'ඒ භගවත් තෙමේ මේ මේ කරුණින් අර්හත් ය, සම්‍යක්සම්බුද්ධ ය, විද්‍යාචරණසම්පන්න ය, සුගත ය, ලෝකවිත් ය, නිරුත්තර පුරුෂදම්‍යසාරථි ය, දෙවමිනිස්නට ශාස්තෘ ය, බුද්ධ ය, භගවත් ය. හේ දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත මේ ලොව, අවශෙෂ මහණ-බමුණන් සහිත දෙවමිනිසුන් සහිත මේ සත්ත්වයන් තෙමේ ම සිය විශිෂ්ට ඥානයින් දැන ප්‍රකට කොට ලොවට දන්වයි. ආදිකල්‍යාණ මධ්‍යකල්‍යාණ පර්යවසානකල්‍යාණ වූ, (සතිපට්ඨානාදි) මනා අරුත් ඇති, සම්පූර්ණ ව්‍යඤ්ජන ඇති, හැම අතුරින් පිරිපුන්, පිරිසිදු දහම දෙසයි. එසේ දෙසනුයේ සියලු සසුන් බඹසර පවසයි. එබඳු රහතුන් දැක්ම වූ කලි කිත වැඩ සලසන්නෙකැ' යි ඒ භවද්ගෞතමයන් පිළිබඳ මෙසේ වූ උතුම් යසගීයක් උස් වැ තැංගේ ය" යනු යි.

ඉක්බිති ඛාණුමත ගමැ වැසි බමුණෝ ද ගෘහපතියෝ ද ඛාණුමතයෙන් නික්මැ බොහෝ බොහෝ වැ ඔළු ඔළු වූවෝ, එකි එකි පැත්තෙහි ඔළු දුන්නෝ, ගමින් පිටතැ දී මග ඔළුවෙක් වැ එකතු වූවෝ අඹයැටි උයන අතට යෙති.

3. තෙන ඛො පන සමයෙන කූටදන්තො බ්‍රාහ්මණො උපරිපාසාදෙ දිවාසෙය්‍යං උපගතො හොති. අද්දසා ඛො කූටදන්තො බ්‍රාහ්මණො ඛාණුමතකෙ බ්‍රාහ්මණගහපතිකෙ ඛාණුමතා නික්ඛමිත්වා සඞ්ඝසඞ්ගී ගණීභූතෙ යෙන අම්බලට්ඨිකා තෙනුපසඞ්කමන්තෙ. දිස්වා ඛත්තං ආමන්තෙසි: "කින්නු ඛො හො ඛත්තෙ ඛාණුමතකා බ්‍රාහ්මණගහපතිකා ඛාණුමතා නික්ඛමිත්වා සඞ්ඝසඞ්ගී ගණීභූතා යෙන අම්බලට්ඨිකා තෙනුපසඞ්කමන්තී" ? ති.

"අත්ථි ඛො හො සමණො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො මගධෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි ඛාණුමතං අනුප්පත්තො ඛාණුමතෙ විහරති අම්බලට්ඨිකායං. තං ඛො පන භවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අභිඋග්ගතො: ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා'ති. තමෙතෙ භවන්තං ගොතමං දස්සනාය උපසඞ්කමන්තී"ති.

4. අථ ඛො කූටදන්තස්ස බ්‍රාහ්මණස්ස එතදහොසි" සුතං ඛො පන මෙ තං: සමණො ගොතමො තිවිධං යඤ්ඤසම්පදං සොළසපරික්ඛාරං ජානාතීති. න ඛො පනාහං ජානාමි තිවිධං යඤ්ඤසම්පදං සොළසපරික්ඛාරං. ඉච්ඡාමි චාහං මහායඤ්ඤං යජිතුං. යන්නූනාහං සමණං ගොතමං උපසඞ්කමිත්වා තිවිධං යඤ්ඤසම්පදං සොළසපරික්ඛාරං පුච්ඡෙය්‍යන්ති".

අථ ඛො කූටදන්තො බ්‍රාහ්මණො ඛත්තං ආමන්තෙසි "තෙන හි හො ඛත්තෙ යෙන ඛාණුමතකා බ්‍රාහ්මණගහපතිකා තෙනුපසඞ්කම. උපසඞ්කමිත්වා ඛාණුමතකෙ බ්‍රාහ්මණගහපතිකෙ එවං වදෙහි "කූටදන්තො හො බ්‍රාහ්මණො එවමාහ: ආගමෙන්තු කිර භවන්තො. කූටදන්තො'පි බ්‍රාහ්මණො සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිස්සතී"ති.

'එවං හො'ති ඛො සො ඛත්තා කූටදන්තස්ස බ්‍රාහ්මණස්ස පටිස්සුත්වා යෙන ඛාණුමතකා බ්‍රාහ්මණගහපතිකා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ඛාණුමතකෙ බ්‍රාහ්මණගහපතිකෙ එතදවොච "කූටදන්තො හො බ්‍රාහ්මණො එවමාහ: ආගමෙන්තු කිර හොන්තො. කූටදන්තො'පි බ්‍රාහ්මණො සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිස්සතී"ති.

5. තෙන ඛො පන සමයෙන අනෙකානි බ්‍රාහ්මණසතානි ඛාණුමතෙ පටිවසන්ති 'කූටදන්තස්ස බ්‍රාහ්මණස්ස මහායඤ්ඤං අනුභවිස්සාමා'ති. අස්සොස්සුං ඛො තෙ බ්‍රාහ්මණා 'කූටදන්තො කිර බ්‍රාහ්මණො සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිස්සතී'ති. අථ ඛො තෙ බ්‍රාහ්මණා යෙන කූටදන්තො බ්‍රාහ්මණො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා කූටදන්තං බ්‍රාහ්මණං එතදවොචුං 'සච්චං කිර භවං කූටදන්තො සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිස්සති ?'ති

3. එ සමයෙහි කූළුදත් බමුණු තෙමේ තමා පහයැ උඩු මහලෙහි දවයහත් පැමිණියේ වේ. සේ (කවළියෙන් බලනුයේ) බාණුමතයෙන් නික්මැ බොහො බොහෝ රැස් වැ එකි එකි පසැ මුළු මුළු වැ, ගමින් පිටතැ දී මහමුළුවෙක් වැ එකතු වැ, අඹයැටිය කරා යන බාණුමත ගමැ වැසි බමුණන් ද ගැහැටියන් ද දිටි ය. දැක බත්තුහු (අසන තැන් බණුවා) බණවා "භවත් බත්තුව, කවර හෙයින් බාණුමත ගමැ වැසි බමුණෝත් ගැහැටියෝත් බාණුමතයෙන් නික්මැ බොහො බොහෝ වැ රැස් වී තැනින් තැන මුළු මුළු වැ, ගමින් පිටතැ දී මහමුළුවක් වැ එකතු වැ අඹයැටිය දෙසට යෙත් ද?"යි විචාළේ ය.

"භවත, කරුණෙක් ඇත. සැහැපුත් වූ, සැහැකුලෙන් නික්මැ පැවිදි වූ, මහණ ගොයුම්හු භික්ෂූන් පන්සියක් පමණ වූ මහ පැවිදි මුළුවක් හා මගද රටැ සැරි සරනුවෝ බාණුමත ගමට පැමිණියෝ එය අසලැ අඹයැටි උයන්හි වෙසෙති. ඒ පින්වත් ගොයුම් තෙමේ මේ මේ කරුණින් රහත් ය, සම්මාසම්බුදු ය, විදුසරණ දෙකින් යුතු ය, සුගත ය, ලොව දන්නේ යැ, නොදැමුණන් දමනුයෙහි හැමට ම වැඩි සැරි දැ ය, දෙවිමිනිස්නට සසු ය, බුදු ය, භගවත් යැ'යි මෙසේ ඔබ පිළිබඳ උතුම් යසගීයෙක් උස් වැ තැංගේ ය. මොහු පින්වත් ගොයුමාණන් දක්නට එහි යෙත් "යැ යි බත්තු තෙමේ කී ය.

4. එ විටැ, කූළුදත් බමුණාට, "මහණ ගොයුම්හු තුන් යාගසම්පත් හා සොළොස් පිරිකර දනිතැ යි මා විසින් ඇසිණ. මම වූ කලි තෙවැදැරැම් යාගසම්පතත් සොළොස් පිරිකරත් නො දනිමි. වැලි දු මහායාගයක් යදනට මම රිසියෙමි. මහණ ගොයුමාණන් කරා එළැඹ තෙවැදැරැම් යාගසම්පතත් සොළොස් පිරිකරත් විචාළෙම් නම් යෙහෙකැ" යි මේ සිත වී ය.

ඉක්බිති කූළුදත් බමුණා බත්තුහු බණවා, "භවත් බත්තුව, එසේ වී නම් බාණුමත ගමැ වැසි ඒ බමුණු ගැහැටියන් වෙත එළැඹෙන්න. එළැඹ 'භවත්නි, භවත්හු කුඩා තමක් බලා පොරොත්තු වෙත් වා. කූළුදත් බමුණා ද මහණ ගොයුමාණන් දක්නට එන්නේ යැ යි මෙසේ කියේ යැ ' යි මේ පරිදි සැළ කරන්නැ"යි කී ය.

'භවත, එසේ යැ'යි කියා ඒ බත්තු තෙම කූළුදත් බමුණාට පිළිවදන් දී බාණුමත ගමැ වැසි බමුණන් ද ගැහැටියන් ද කරා එළැඹියේ ය. එළැඹ, ඔවුනට "භවත්නි, භවත්හු කුඩා තමක් බලා පොරොත්තු වෙත් වා. කූළුදත් බමුණා ද මහණ ගොයුමාණන් දක්නට එන්නේ යැ'යි කූළුදත් බමුණු මෙසේ කීහ"යි මේ පවත් සැළ කෙළේ ය.

5. එ සමයෙහි වනාහි බොහෝ සිය ගණන් බමුණෝ 'කූළුදත් බමුණාගේ මහා යාගය වළඳන්නමු'යි බාණුමතයෙහි වෙසෙත්. ඒ බමුණෝ 'කූළුදත් බමුණා මහණ ගොයුමාණන් දක්නට ඔබ කරා යෙතැ'යි ඇසූහ. ඉක්බිති ඔහු කූළුදත් බමුණු කරා එළැඹුණහ. එළැඹ 'පින්වත් කූළුදත් තෙමේ මහණ ගොයුමාණන් දක්නට යන්නේ ල. ඒ සැබෑ දැ?'යි ඇසූහ.

"එවං ඛො මෙ හො හොති: අහම්පි සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිස්සාමි"ති.

6. "මා භවං කූටදන්තො සමණං ගොතමං දස්සනාය උපසඞ්කමි. න අරහති භවං කූටදන්තො සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිතුං. සචෙ භවං කූටදන්තො සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිස්සති හොතො කූටදන්තස්ස යසො හායිස්සති. සමණස්ස ගොතමස්ස යසො අභිවඩ්ඪිස්සති. යම්පි හොතො කූටදන්තස්ස යසො හායිස්සති සමණස්ස ගොතමස්ස යසො අභිවඩ්ඪිස්සති, ඉමිනාපඩ්ඨෙන න අරහති භවං කූටදන්තො සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිතුං, සමණො චෙව ගොතමො අරහති භවන්තං කූටදන්තං දස්සනාය උපසඞ්කමිතුං.

භවං හි කූටදන්තො උභතො සුජාතො මාතිතො ච පිතිතො ච, සංසුද්ධගහණිකො යාව සත්තමා පිතාමහයුගා, අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන. යම්පි භවං කූටදන්තො උභතො සුජාතො මාතිතො ච පිතිතො ච සංසුද්ධගහණිකො යාව සත්තමා පිතාමහයුගා, අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන, ඉමිනාපඩ්ඨෙන න අරහති භවං කූටදන්තො සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිතුං. සමණො චෙව ගොතමො අරහති භවන්තං කූටදන්තං දස්සනාය උපසඞ්කමිතුං.

භවං හි කූටදන්තො අඩ්ඩො මහද්ධනො මහාභොගො. -පෙ-.

භවං හි කූටදන්තො අජ්ඣායකො මන්තධරො තිණ්ණං වෙදානං පාරගූ සනිඝණ්ඩුකෙටුභානං සාක්ඛරප්පභෙදානං ඉතිහාසපඤ්චමානං, පදකො වෙය්‍යාකරණො ලොකායතමහාපුරිසලක්ඛණෙසු අනවයො -ප-.

භවං හි කූටදන්තො අභිරූපො දස්සනීයො පාසාදිකො පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතො, බ්‍රහ්මවණ්ණී බ්‍රහ්මවච්චසී අක්ඛුද්දාවකාසො දස්සනාය -පෙ-.

භවං හි කූටදන්තො සීලවා හොති වුද්ධසීලී වුද්ධසීලෙන සමන්නාගතො -පෙ-.

භවං හි කූටදන්තො කල්‍යාණවාචො කල්‍යාණවාක්කරණො පොරියා වාචාය සමන්නාගතො විස්සට්ඨාය අනෙලගලාය අත්ථස්ස විඤ්ඤාපනියා -පෙ-.

භවං හි කූටදන්තො බහූනං ආචරියපාචරියො. තීණි මාණවකසතානි මන්තෙ වාචෙති. බහූ ඛො පන තාතාදිසා තාතාජනපදා මාණවකා ආගච්ඡන්ති හොතො කූටදන්තස්ස සන්තිකෙ මන්තත්ථිකා මන්තෙ අධීයිතුකාමා.

"භවත්නි, මමත් මහණ ගොයුමාණන් දක්නට ඔබ වෙත් යන්නෙමැ යි මට මෙසේ සිතෙක් වේ ම යැ"යි කූළුදත් පැවැසී ය.

6. [එ බස් අසා එ බමුණෝ කූළුදතුට මෙසේ කීහු:]

"පින්වත් කූළුදත් තෙමේ මහණ ගොයුමත් දක්නට නො යේ වා. පින්වත් කූළුදත් තෙමේ මහණ ගොයුමාණන් දක්නට යන්නට නො නිස්සේ ය. ඉදින් පින්වත් කූළුදත් තෙමේ මහණ ගොයුමාණන් දක්නට යන්නේ නම්, පින්වත් කූළුදතුගේ යශස් පිරිහෙන්නේ ය, මහණ ගොයුමා-ණන්ගේ යශස් වැඩෙන්නේ ය. 'පින්වත් කූළුදතුගේ යශස් පිරිහෙන්නේ ය, මහණ ගොයුමාණන්ගේ යශස් වැඩෙන්නේ' ය යන යමෙක් ඇද්ද, මේ කරුණිනුත් පින්වත් කූළුදත් තෙමේ මහණ ගොයුමාණන් දක්නට යනුවට නො නිස්සේ ය. මහණ ගොයුම්හු ම පින්වත් කූළුදතු දක්නට එනුවට නිස්සෝ ය.

පින්වත් කූළුදත් තෙමේ මවු පිය දෙපසින් ම අභිජාත ය. සත්වන මිමුතු යුවල තෙක් පිරිසිදු මවුකුස ඇත්තේ ය. කුල පිළිබඳ තෙප්ලෙන් නො හෙලන ලද්දේ ය, නො ගරහන ලද්දේ ය. පින්වත් කූළුදත් තෙමේ මවු පිය දෙපසින් ම අභිජාත ය...නො ගරහන ලද්දේ ය යන යමෙක් ඇද්ද, මේ කරුණිනුත් පින්වත් කූළුදත් තෙමේ මහණ ගොයුමන් දක්නට යන්නට නො නිස්සේ ය. මහණ ගොයුම්හු ම පින්වත් කූළුදතු දක්නට එන්නට නිස්සෝ ය.

පින්වත් කූළුදත් තෙමේ ඉසුරුමත් ය, මහත් ධන ඇත්තේ ය, මහත් භෝග ඇත්තේ ය...

පින්වත් කූළුදත් තෙමේ වේද හදාරන්නේ ය, වේදමන්ත්‍රයන් සිත්හි ලා දරන්නේ ය, නිඝණ්ඩු ද කෛටභශාස්ත්‍ර ද සහිත, ශික්ෂා හා නිරුක්ති සහිත, ඉතිහාසය පස්වනු කොටැති තුන් වේදයන්ගේ පර තෙර පත්තේ ය, පදපාඨ දන්නේය, සෙසු සියලු වියරණ විදි ද දන්නේ ය, ලොකායතශාස්ත්‍රයෙහිත් මහාපුරුෂලක්ෂණවිද්‍යයෙහිත් නිපුණ ය...

පින්වත් කූළුදත් තෙමේ අත්තට වැඩි තරම් වූ රූ සපුව ඇත්තේ ය, දකුම් කටයුතු ය, දක්නනුට ප්‍රසාද එළවන සුලු ය, උතුම් පැහැසපුයෙන් යුතු ය, උතුම් රත්වන් පැහැ ඇත්තේ ය, උතුම් සිරුරු පැහැ ඇත්තේ ය, සිය සිරුරු සෙස්සන් විසින් දක්නට නොමඳ අවකාශ ඇත්තේ ය...

පින්වත් කූළුදත් තෙමේ සිල්වත් ය, වැඩුණු සිල් ඇත්තේ ය, වැඩුණු ශීලයෙන් යුක්ත ය...

පින්වත් කූළුදත් තෙමේ කලණ තෙපුල් ඇත්තේ ය, කලණ මිහිරි බස් කියන්නේ ය, නිදොස්, නොකෙලතොලු, කි දැ හඟවනු හැකි සිලිටි බසින් සමන්විත ය...

පින්වත් කූළුදත් තෙමේ බොහෝ දෙනාට ආචාර්ය ද ප්‍රාචාර්ය ද වෙයි. තුන්සියක් බමුණු දරුවනට වේදයන් කියවයි. නන් දෙසින් නන් දනවුවෙන් බොහෝ බමුණු දරුවෝ වේදය ඉගැන්ම පතනුවෝ, වේදයන් උගනු කැමැත්තෝ පින්වත් කූළුදත්හු වෙත එති...

භවං හි කූටදන්තො ජිණ්ණො වුද්ධො මහල්ලකො අද්ධගතො වයො අනුප්පත්තො. සමණො ගොතමො තරුණො චෙව තරුණපබ්බජිතො ච -පෙ-.

භවං හි කූටදන්තො රඤ්ඤො මාගධස්ස සෙනියස්ස බිම්බිසාරස්ස සක්කතො ගරුකතො මානිතො පූජිතො අපචිතො -පෙ-.

භවං හි කූටදන්තො බ්‍රාහ්මණස්ස පොක්ඛරසාතිස්ස සක්කතො ගරුකතො මානිතො පූජිතො අපචිතො -පෙ-.

භවං හි කූටදන්තො ඛාණුමතං අජ්ඣාවසති සත්තුස්සදං සතිණ-කට්ඨොදකං සඛඤ්ඤං රාජභොග්ගං රඤ්ඤා මාගධෙන සෙනියෙන බිම්බිසාරෙන දින්නං රාජදායං බ්‍රහ්මදෙය්‍යං. යම්පි භවං කූටදන්තො ඛාණුමතං අජ්ඣාවසති සත්තුස්සදං සතිණකට්ඨොදකං සඛඤ්ඤං රාජභොග්ගං රඤ්ඤා මාගධෙන සෙනියෙන බිම්බිසාරෙන දින්නං රාජදායං බ්‍රහ්මදෙය්‍යං. ඉමිනාපඩිඛෙන න අරහති භවං කූටදන්තො සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිතුං. සමණො චෙව ගොතමො අරහති භවන්තං කූටදන්තං දස්සනාය උපසඞ්කමිතුන්ති.

7. එවං වුත්තෙ කූටදන්තො බ්‍රාහ්මණො තෙ බ්‍රාහ්මණෙ එතදවොච: "තෙන හි භො මම්පි සුණාථ යථා මයමෙව අරහාම තං භවන්තං ගොතමං දස්සනාය උපසඞ්කමිතුං, නත්වෙව අරහති සො භවං ගොතමො අම්හාකං දස්සනාය උපසඞ්කමිතුං.

"සමණො ඛලු භො ගොතමො උභතො සුජාතො මාතිතො ච පිතිතො ච, සංසුද්ධගහණිකො යාව සත්තමා පිතාමහයුගා, අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන. යම්පි භො සමණො ගොතමො උභතො සුජාතො මාතිතො ච පිතිතො ච, සංසුද්ධගහණිකො යාව සත්තමා පිතාමහයුගා, අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන. ඉමිනාපඩිඛෙන න අරහති සො භවං ගොතමො අම්හාකං දස්සනාය උපසඞ්කමිතුං. අථ ඛො මයමෙව අරහාම තං භවන්තං ගොතමං දස්සනාය උපසඞ්කමිතුං.

සමණො ඛලු භො ගොතමො මහන්තං ඤාතිසඞ්ඝං ඕහාය පබ්බ-ජිතො -පෙ-.

සමණො ඛලු භො ගොතමො පහූතං හිරඤ්ඤසුවණ්ණං ඕහාය පබ්බජිතො භූමිගතඤ්ච වෙහාසට්ඨඤ්ච -පෙ-.

සමණො ඛලු භො ගොතමො දහරො'ව සමානො යුවා සුසු කාළ-කෙසො භද්‍රෙන යොබ්බනෙන සමන්නාගතො පඨමෙන වයසා අගාරස්මා අනගාරියං පබ්බජිතො-පෙ-.

පින්වත් කූළුදත් තෙමේ ජරායෙන් දුදුරු ය, වයසින් වැඩුණේ ය, මහලු ය, බොහෝ කල් ඉක්මැවූයෙක, පැසිම් වියට පැමිණියෙක. මහණ ගොයුම්හු වූ කලි ලදරුත් ලදරු පැවිද්දෙකුත් වේ...

පින්වත් කූළුදත් තෙමේ මගධාධිපති සේනිය බිම්බිසාර රජහු විසින් සත්කාර කරන ලද්දෙක, ගරු කරන ලද්දෙක, බුහුමන් කරන ලද්දෙක, පුදන ලද්දෙක, යටත් පැවැතුම් දක්වන ලද්දෙක...

පින්වත් කූළුදත් තෙමේ පොකුරුසැත් බමුණහු විසින් සත්කාර කැරුණෙක, ගරු කැරුණෙක, බුහුමන් කැරුණෙක, පිදුණෙක, යටත් පැවැතුම් දැක්වුණෙක...

පින්වත් කූළුදත් තෙමේ බොහෝ ජනයා ගැවැසුණු, තණ දඬු දිය ඇති, බොහෝ ධන ධාන්‍ය ඇති, රජුගෙන් ලත් තිත්දගම වූ රජු ගේ ත්‍යාගය වූ, සේනිය බිම්බිසාර රජු දුන් උතුම් දානවස්තු වූ ඛාණුමත ගමට ඉසුරු වැ වෙසේ පින්වත් කූළුදත් තෙමේ බොහෝ ජනයා ගැවැසුණු... ඛාණුමත ගමට ඉසුරු වැ වෙසේ ය යන යමෙක් ඇද්ද, මේ කරුණිනුත් පින්වත් කූළුදත් තෙමේ මහණ ගොයුමන් දක්නට යන්නට නො නිස්සේ ය. මහණ ගොයුම්හු ම පින්වත් කූළුදතු දක්නට නිසි හ" යනු යි.

7. මෙසේ (ඔවුන්) කී කලැ කූළුදත් බමුණා ඒ බමුණනට මේ බස් කී ය:

"භවත්නි, එසේ වී නම්, මහණ ගොයුමාණන් අප දක්නට එනුවට වඩා අප ඔබ දක්නට යැමෙහි සුදුසු වන සැටි දක්වන මා බස් ද අසවු.

"භවත්නි, මහණ ගොයුම්හු වූ කලි මවු පිය දෙ පසින් ම අභිජාත ය, සත් වන මිඹුතු යුවල තෙක් පිරිසිදු මවුකුස ඇත්තෝ ය. ජාතිවාදයෙන් නො හෙළන ලද්දේ ය, නො ගරහන ලද්දේ ය. ...මහණ ගොයුම්හු මවුපිය දෙපසින් ම අභිජාතයහ...නො හෙළන ලද්දේ ය, නො ගරහන ලද්දේ ය යන යමක් ඇද්ද, මේ කරුණිනුදු ඒ පින්වත් ගොයුම්හු අප දක්නට එන්නට නො නිස්සහ. වැළි අපි ම ඔබ දක්නට යන්නට නිස්සම්හ.

භවත්නි, මහණ ගොයුම්හු වූ කලි මහත් නැමුළුව පියා පැවිදි වූවෝ ය...

භවත්නි, මහණ ගොයුම්හු වූ කලි පොළෝ යව ද පොළෝ මතු පිට ද වූ මහත් රන් අමුරන් හැරැ පියා පැවිදි වූවෝ ය...

භවත්නි, මහණ ගොයුම්හු වූ කලි සොඳුරු යොවුනෙන්, (වයස් තුන අතුරෙන්) පළමු වයසින් යුත් වූවෝ ම, තරුණ වූවෝ ම, මහා කළු කෙහෙ ඇති වැ යොවුන් වියැ සිටියෝ ම ගිහි ගෙන් නික්මැ පැවිදි බිමට වන්නෝ ය...

සමණො ඛලු භො ගොතමො අකාමකානං මාතාපිතූනං අස්සුමුඛානං රුදන්තානං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතො-පෙ-

සමණො ඛලු භො ගොතමො අභිරූපො දස්සනීයො පාසාදිකො පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතො බ්‍රහ්මවණ්ණී බ්‍රහ්මවච්චසී අක්ඛුද්දවිත්තො දස්සනාය-පෙ-

සමණො ඛලු භො ගොතමො සීලවා අරියසීලී කුසලසීලී කුසලසීලෙන සමන්නාගතො-පෙ-

සමණො ඛලු භො ගොතමො කල්‍යාණවාචො කල්‍යාණවාක්කරණො පොරියා වාචාය සමන්නාගතො විස්සට්ඨාය අනෙලගලාය අත්ථස්ස විඤ්ඤාපනියා-පෙ-

සමණො ඛලු භො ගොතමො බහූනං ආචරියපාචරියො-පෙ-

සමණො ඛලු භො ගොතමො ඛීණකාමරාගො විගතචාපල්ලො-පෙ-

සමණො ඛලු භො ගොතමො කම්මවාදී කිරියවාදී අපාපපුරෙක්ඛාරො බ්‍රහ්මඤ්ඤස්ස පජාය-පෙ-

සමණො ඛලු භො ගොතමො උච්චාකුලා පබ්බජිතො අසම්භින්න-ඛත්තියකුලා-පෙ-

සමණො ඛලු භො ගොතමො අඩ්ඪා කුලා පබ්බජිතො මහද්ධනා මහාභොගා-පෙ-

සමණං ඛලු භො ගොතමං තිරොරට්ඨා තිරොජනපදා සම්පූජිතුං ආගච්ඡන්ති-පෙ-

සමණං ඛලු භො ගොතමං අනෙකානි දෙවතාසහස්සානි පාණෙහි සරණං ගතානි-පෙ-

සමණං ඛලු භො ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අභිඋග්ගතො 'ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා'ති-පෙ-

සමණො ඛලු භො ගොතමො ද්වත්තිංසමහාපුරිසලක්ඛණෙහි සමන්නා-ගතො-පෙ-

සමණො ඛලු භො ගොතමො එකන්තවාදී සකිලෙසො සමෙමාදකො අබ්භාකුටිකො උත්තානමුඛො පුබ්බභාසී-පෙ-

භවත්නි, මහණ ගොයුම්හු වූ කලි ඔබ පැවිදි වන්නා නො කැමැති මාපියන් කඳුළු පිරි මුහුණ ඇති වැ හඬද්දී එය නොතකා කෙහෙ රවුළු ඛා පියා කසා වත් හැඳ ගිහි ගෙන් නික්මැ පැවිද්දට බවුවෝ ය...

භවත්නි, මහණ ගොයුම්හු වූ කලි හැමට වැඩි තරම් රූ සිරි ඇත්තෝ ය, දන්නවුන් සිතැ පැහැදීම් පහළ කරවන සුලුහ, උතුම් පැහැ සපුයෙන් යුතුහ. උතුම් රන් පැහැ ඇත්තෝ ය, උතුම් සිරුරු පබ ඇත්තෝ ය. සිය සිරුරු දැක්මට නොමඳ ඔවස් ඇත්තෝ ය...

භවත්නි, මහණ ගොයුම්හු වූ කලි සිල්වත්හ, පිරිසිදු සිල් ඇත්තෝ ය, නිදොස් ශීලයෙන් යුත්හ...

මහණ ගොයුම්හු වූ කලි කලණ තෙපුල් ඇත්තෝ ය, කලණ මිහිරි බස් තෙපලන්නෝ ය, නිදොස් වූ නොකෙලතොලු වූ කි දැ හඟවනු සමත් සිලිටි බසින් සමන්විතයෝ ය...

භවත්නි, මහණ ගොයුම්හු වූ කලි බොහෝ දෙනාට ආවාසී ද ප්‍රාවාසී ද වෙති...

භවත්නි, මහණ ගොයුම්හු වූ කලි පහ වූ කාමරාග ඇත්තෝ ය, පහ වූ වපල බව ඇත්තෝ ය...

භවත්නි, මහණ ගොයුම්හු වූ කලි කම්වාදිත් ක්‍රියාවාදිත් වෙති. තව ලොවුතුරා දහම් පුරස්සර කොට වැටෙති. සැරියුත් මුගලන් ඇ බමුණ පිරිසට ද නායක වැ හැසිරෙති...

භවත්නි, මහණ ගොයුම්හු වූ කලි පිරිසිදු කැත් කුල වූ උසස් කුලයෙන් නික්මැ පැවිදි වූවෝ ය...

භවත්නි, මහණ ගොයුම්හු වූ කලි මහත් ධන ඇති මහත් භෝග ඇති ඉසුරුමත් කුලයෙන් නික්මැ පැවිදි වූවෝ ය...

භවත්නි, මහණ ගොයුමන් කරා පිට රටින් පිට දනවුයෙන් පැණ පුළුවුස්නට එති...

භවත්නි, තොයෙක් දහස් ගණන් දෙවියෝ මහණ ගොයුමන් දිවිහිමියෙන් සරණ ගියහ...

භවත්නි, මහණ ගොයුමාණන්ගේ වූ කලි "මේ මේ කරුණින් ඒ බගවත් තෙමේ රහත් ය, සම්මාසම්බුදු ය, විදු සරණින් යුතු ය, සුගත ය, ලොව දන්නේ ය, ලොවුතුරා තරදම්සැරි ය, දෙවිමිනිස්නට සසු ය, සිවු සස් දතුයේ ය, බගවත් යැ" යි මෙසේ වූ උතුම් යසඟි උස් වැ නැංගේ ය...

භවත්නි, මහණ ගොයුම්හු වූ කලි දෙතිස් මහ පුරිස්ලකුණින් යුතු ය ..

භවත්නි, මහණ ගොයුම්හු වූ කලි තමන් වෙත එන්නවුන් 'එන්න, මෙඟි ආ සේ මැනැවැ'යි පිළිගන්නා සුලු හ, කණට සුව එළවන තෙපුල් තෙපලන්නෝ ය, පිළිසඳරෙඟි දක්ෂය හ, ඔබ නොහකුළුවන්නෝ ය, සුලභ කථා ඇත්තෝ ය, පැමිණියනට තුමු පළමුයෙන් කථා කරන සුලුහ...

සමණො ඛලු භො ගොතමො චතුන්නං පරිසානං සක්කතො ගරුකතො මානිතො පූජිතො අපචිතො-පෙ-.

සමණෙ ඛලු භො ගොතමෙ බහූ දෙවා ච මනුස්සා ච අභිප්පසන්නා-පෙ-.

සමණො ඛලු භො ගොතමො යස්මිං ගාමෙ වා නිගමෙ වා පටිවසති, න තස්මිං ගාමෙ වා නිගමෙ වා අමනුස්සා මනුස්සෙ විහෙඨෙන්ති-පෙ-.

සමණො ඛලු භො ගොතමො සඞ්ඝී ගණී ගණාචරියො ප්‍රථුත්තිත්ථ-කරානං අග්ගමක්ඛායති. යථා ඛො පන භො ඉමෙසං සමණබ්‍රාහ්මණානං යථා වා තථා වා යසො සමුද්ගච්ඡති, න හෙවං සමණස්ස ගොතමස්ස යසො සමුද්ගතො. අථ ඛො අනුත්තරාය විජ්ජාචරණසම්පදාය සමණස්ස ගොතමස්ස යසො සමුද්ගතො-පෙ-.

සමණං ඛලු භො ගොතමං රාජා මාගධො සෙනියො බිම්බිසාරො සපුත්තො සභරියො සපරිසො සාමච්චො පාණෙහි සරණං ගතො. සමණං ඛලු භො ගොතමං රාජා පසෙනදී කොසලො සපුත්තො සභරියො සපරිසො සාමච්චො පාණෙහි සරණං ගතො. සමණං ඛලු භො ගොතමං බ්‍රාහ්මණො පොක්ඛරසාති සපුත්තො සභරියො සපරිසො සාමච්චො පාණෙහි සරණං ගතො. සමණො ඛලු භො ගොතමො රඤ්ඤො මාගධස්ස සෙනියස්ස බිම්බිසාරස්ස සක්කතො ගරුකතො මානිතො පූජිතො අපචිතො. සමණො ඛලු භො ගොතමො රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස සක්කතො ගරුකතො මානිතො පූජිතො අපචිතො. සමණො ඛලු භො ගොතමො බ්‍රාහ්මණස්ස පොක්ඛරසාතිස්ස සක්කතො ගරුකතො මානිතො පූජිතො අපචිතො.

සමණො ඛලු භො ගොතමො ඛාණුමතං අනුප්පත්තො, ඛාණුමතෙ විහරති අම්බලට්ඨිකායං. යෙ ඛො පන කෙචි සමණා වා බ්‍රාහ්මණා වා අමහාකං ගාමක්ඛෙත්තං ආගච්ඡන්ති, අත්ථි නො තෙ හොන්ති. අත්ථි ඛො පනමෙහි සක්කාතබ්බා ගරුකාතබ්බා මානෙතබ්බා පූජෙතබ්බා අපචෙතබ්බා. යම්පි භො සමණො ගොතමො ඛාණුමතං අනුප්පත්තො ඛාණුමතෙ විහරති අම්බලට්ඨිකායං. අත්ථිමහාකං සමණො ගොතමො, අත්ථි ඛො පනමෙහි සක්කාතබ්බා ගරුකාතබ්බා මානෙතබ්බා පූජෙතබ්බා අපචෙතබ්බා.

භවත්නි, මහණ ගොයුම්හු වූ කලි සිවු පිරිස් විසින් සත්කාර කරන ලදුහ, ගුරුකාර කරන ලදුහ, බුහුමන් කරන ලදුහ, පුදන ලදුහ, යටත් පැවැතුම් දක්වන ලදුහ...

භවත්නි, මහණ ගොයුමාණන් කෙරෙහි බොහෝ දෙවිමිනිස්සු වෙසෙසින් පහන්හ...

භවත්නි, මහණ ගොයුම්හු වූ කලි යම් ගමෙක හෝ නියම් ගමෙක වෙසෙත් නම්, එ ගමැ හෝ නියම් ගමැ වැසි මිනිස්නට යක්කු පීඩා නො කෙරෙත්...

භවත්නි, මහණ ගොයුම්හු වූ කලි මහ සඟපිරිස් ඇත්තෝ ය, ගණ නායකයහ, ගණාචාර්ය හ. බොහෝ තීර්ථංකරයන් අතුරෙහි අග්ග හි කියනු ලැබෙති...

යම්සේ වනාහි ඇතැම් මහණබමුණන්ගේ යශස අවෙලකතාදි පිටතට පෙනෙන යම්තම් ව්‍රතමාත්‍රයෙකින් වැඩෙතත් මහණ ගොයුමන් ගේ යශස වූ කලි එසේ වැඩුණේ නො වේ. වැලි තමන් තුළැ ම වූ නිරුත්තර විද්‍යාචරණසම්පතින් වැඩුණේ වේ....

භවත්නි, මහණ ගොයුමන් වූ කලි මගධාධිපති සේනිය බිම්බිසාර රජ තෙමේ දරුවන් බිරියන් සහිත වැ පිරිස් හා ඇමැත්තන් හා සමග දිවි හිමි කොට සරණ ගියේ ය..

භවත්නි, මහණ ගොයුමන් වූ කලි කොශලාධිපති පසේනදි රජ තෙමේ දරුවන් හා බිරියන් හා පිරිස් හා ඇමැත්තන් හා සහිත වැ දිවි හිමි කොට සරණ ගියේ ය...

භවත්නි, මහණ ගොයුමන් වූ කලි පොකුරුසැත් බමුණු තෙමේ දරුවන් බිරියන් පිරිස් හා ඇමැත්තන් සහිත වැ දිවි හිමි කොට සරණ ගියේ ය...

භවත්නි, මහණ ගොයුම්හු වූ කලි මගධ රටට අධිපති සේනිය බිම්බිසාර රජහු විසින් සත්කෘත ද ගුරුකෘත ද මානිත ද පූජිත ද අපචිත ද වෙති...

භවත්නි, මහණ ගොයුම්හු වූ කලි කොශලාධිපති පසේනදී රජුහු විසින් සත්කෘත ද ගුරුකෘත ද මානිත ද පූජිත ද අපචිත ද වෙති...

භවත්නි, මහණ ගොයුම්හු වූ කලි පොකුරුසැත් බමුණා විසින් සත්කෘත ද ගුරුකෘත ද මානිත ද පූජිත ද අපචිත ද වෙති...

භවත්නි, මහණ ගොයුම්හු වූ කලි දැන් බාණුමතයට පැමිණියෝ බාණුමතය සමීපයෙහි අඹයැටි වෙනෙහි (අම්බලට්ඨිකා වනයෙහි) වෙසෙති. භවත්නි, යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ අප ගම් කෙතට එන් නම්, ඔහු අපට අමුතු වෙති. අමුත්තෝ වනාහි අප විසින් සත්කාර කටයුතුහ, ගුරුකාර කටයුතුහ, මානනීයහ, පූජනීයහ, අපචය-නීයහ. භවත්නි, යම් හෙයකින් මහණ ගොයුම්හු බාණුමතයට පැමිණියෝ, බාණුමතය සමීපයෙහි අඹයැටියෙහි වෙසෙත් ද, එහෙයින් ඔබ අප අමුත්තෝ ය. අමුත්තෝ වනාහි අප විසින් සත්කාර කටයුතුහ, ගුරු-කාර කටයුතුහ, බුහුමන් කටයුතුහ. පිදියැ යුතුහ, යටත් පැවැතුම් දැක්වියැ යුතුහ.

ඉමිනාපඛ්ඛත්ත නාරහති සො භවං ගොතමො අම්හාකං දස්සනාය උපසඞ්කමිතුං. අථ ඛො මයමෙව අරහාම තං භවන්තං ගොතමං දස්සනාය උපසඞ්කමිතුං.

එත්තකෙ ඛො අහං හො තස්ස භොතො ගොතමස්ස වණ්ණෙ පරියාපුණාමි. නො ච ඛො සො භවං ගොතමො එත්තකවණ්ණො. අපරිමාණවණ්ණො හි සො භවං ගොතමො'ති.

8. එවං වුත්තෙ තෙ බ්‍රාහ්මණා කූටදන්තං බ්‍රාහ්මණං එතදවොචුං: "යථා ඛො භවං කූටදන්තො සමණස්ස ගොතමස්ස වණ්ණං භාසති ඉතො වෙ'පි සො භවං ගොතමො යොජනසතෙ විහරති, අලමෙව සද්ධින කුලපුත්තෙන දස්සනාය උපසඞ්කමිතුං අපි පුවංසෙනාපි[1]. තෙන හි හො සබ්බෙව මයං සමණං ගොතමං දස්සනාය උපසඞ්ක-මිස්සාමා"ති.

9. අථ ඛො කූටදන්තො බ්‍රාහ්මණො මහතා බ්‍රාහ්මණගණෙන සද්ධිං යෙන අම්බලට්ඨිකා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. බ්‍රාහ්මණගහපතිකා'පි ඛො බ්‍රාහ්මණගහපතිකා අප්පෙකච්චෙ භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු, අප්පෙකච්චෙ භගවතා සද්ධිං සම්මොදිංසු. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා එකමන්තං නිසීදිංසු අප්පෙකච්චෙ නාමගොත්තං සාවෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ තුණ්හීභූතා එකමන්තං නිසීදිංසු.

10. එකමන්තං නිසින්නො ඛො කූටදන්තො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: "සුතං මෙතං භො ගොතම සමණො ගොතමො තිවිධං යඤ්ඤසම්පදං සොළසපරික්ඛාරං ජානාතීති. න ඛො පනාහං ජානාමි තිවිධං යඤ්ඤසම්පදං සොළසපරික්ඛාරං. ඉච්ඡාමි චාහං මහායඤ්ඤං යජිතුං. සාධු මෙ භවං ගොතමො තිවිධං යඤ්ඤසම්පදං සොළසපරික්ඛාරං දෙසෙතූ"ති.

"තෙන හි බ්‍රාහ්මණ සුණොහි සාධුකං මනසිකරොහි භාසිස්සාමි"ති.

'එවං භො'ති ඛො කූටදන්තො බ්‍රාහ්මණො භගවතො පච්චස්සොසි. භගවා එතදවොච:

11. "භූතපුබ්බං බ්‍රාහ්මණ රාජා මහාවිජිතො නාම අහොසි, අඩ්ඩො මහද්ධනො මහාභොගො පහූතජාතරූපරජතො පහූතවිත්තූපකරණො පහූතධනධඤ්ඤො පරිපුණ්ණකොසකොට්ඨාගාරො. අථ ඛො බ්‍රාහ්මණ රඤ්ඤො මහාවිජිතස්ස රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: "අධිගතා ඛො මෙ විපුලා මානුසකා භොගා. මහන්තං පඨවිමණ්ඩලං අභිවිජිය අජ්ඣාවසාමි. යන්නූනාහං මහායඤ්ඤං යජෙය්‍යං, යං මම'ස්ස දීඝරත්තං හිතාය සුඛාය"ති.

1. පුවංසෙනාපි (කොසුම් පොත්තකෙසු)

මේ කරුණිස්සුත් ඒ පින්වත් ගොයුම්හු අප දක්නට එන්නට නො නිස්සහ. වැලි ඇපි ම ඒ භවද්ගෞතමයන් දක්නා පිණිස එළැඹෙන්නට නිසි වම්හ.

භවත්නි, ඒ භවද් ගෞතමයන් පිළිබඳ වූ මෙතෙක් ගුණ මම දනිමි. එහෙත් පින්වත් ගොයුම්හු මේ පමණක් ම ගුණ ඇත්තෝ නො වෙති. "ඔබ වූ කලි නො මිනියැ හැකි ගුණ ඇතියහ" යනු සි.

8. මෙසේ කී කල්හි ඒ බමුණෝ කූටදන්ත බමුණා බණවා, "පින්වත් කූටදන්ත මහණ ගොයුමන්ගේ ගුණ වනන සැටියෙන්, ඒ පින්වත් ගොයුමන් මෙසින් සිය යොදුනක් දුරැ වසතත්, සැදැහැති කුලපුත්‍රහු විසින් පාථෙය රැගෙන ද ඔබ දකිනු පිණිස එන්නට නිසි ම ය. එ බැවින්, භවත්නි, ඇපි සියල්ලමෝ මහණ ගොයුමන් දක්නට ඔබ වෙත එළැඹෙන්නමහ"සි කීහ.

9. ඉක්බිත්තෙන් කූටදන්ත බමුණා මහත් බමුණුගණයා හා අඹයැපියට භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේ ය. එළැඹැ භාග්‍යවතුන් වහන්සේ හා සතුටු විය. සතුටට කරුණු වූ, සිතැ රැඳැවිය යුතු වූ කථාව කැරැ නිමවා, පසෙක ඉඳ ගත්තේ ය. බාහ්‍යමත ගමැ වැසි බමුණෝ ද ගැහැවියෝ ද කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ ආදරයෙන් වැඳ පසෙක ඉඳ ගත්හ. කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ හා සතුටු වූහ. සතුටු වියැ යුතු සිතැ රැඳැවිය යුතු වූ කථා නිමවා පසෙක ඉඳ ගත්හ. කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ දසෑවට ඇඳිලි බැඳගෙන පසෙක හුන්හ. කෙනෙක් නම්ගෙන් අස්වා පසෙක ඉඳ ගත්හ. කෙනෙක් නිහඬ වැ පසෙක ඉඳ ගත්හ.

10. එක් පසෙකැ හුන්නා වූ ම කූටදන්ත බමුණා, "පින්වත් ගොයුමාණනි, 'මහණ ගොයුම්හු තෙවැදැරැම් යාග සම්පතත් සොළොස් පිරිකරත් දනිති' සි මෙය මා විසින් අසන ලදි. මම වූ කලි තෙවැදැරැම් යාග සම්පතත් සොළොස් පිරිකරත් නො ම දනිමි. වැලි දු මහායාගයක් යජනට මම කැමැතියෙමි. යාවිඤ්ඤ කරමි. මට පින්වත් ගොයුම්හු තෙවැදැරැම් යාග සම්පතුත් සොළොස් පිරිකරත් දෙසත් වා" සි භාග්‍යවතුන් වහන්සේට කී ය.

"බමුණ, එසේ වී නම් අසන්නැ. මොනොවට මෙනෙහි කරන්නැ. කියන්නෙමි"සි (භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක).

'එසේ ය, පින්වතැ'සි කූටදන්ත බමුණු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වී ය. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

11. "පෙර වූවක් කියමි. බමුණ, ආඪ්‍ය වූ, මහත් ධන ඇති, මහත් භොග ඇති, බොහෝ රත් රිදී ඇති, බොහෝ වස්තුපකරණ ඇති, බොහෝ ධන ධාන්‍ය ඇති, පිරිපුත් ගබඩා කොටුගුල් ඇති මහාවිජිත නම් රජෙක් විය. බමුණ, එ කලැ හුදෙකලා වැ චින්තාවිවේකයෙන් හුන් මහාවිජිත රජුට "මානුෂක වූ මහත් භොගසම්පත්හු මා විසින් ලබන ලද්දේ ම ය. ඒ මම මහත් පොළොම්බුල්ල වෙසෙසින් දිනා හැමට අධිපති වැ වෙසෙමි. මට දික් කලක් හිත සුව පිණිස පවත්නා මහා යඥයක් යදින්නෙමි නම් මැනැවැ"සි මෙසේ චින්තා සඞ්කල්පනාවෙක් පහළ විය.

අථ ඛො බ්‍රාහ්මණ රාජා මහාවිජිතො පුරොහිතං බ්‍රාහ්මණං ආමන්තෙත්වා එතදවොච: 'ඉධ මය්හං බ්‍රාහ්මණ රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: "අධිගතා ඛො මෙ විපුලා මානුසකා භොගා. මහන්තං පඨවිමණ්ඩලං අභිවිජිය අජ්ඣාවසාමි. යන්නූනාහං මහායඤ්ඤං යජෙය්‍යං, යං මම'ස්ස දීඝරත්තං හිතාය සුඛාය'න්ති. ඉච්ඡාමහං බ්‍රාහ්මණ මහායඤ්ඤං යජිතුං. අනුසාසතු මං භවං, යං මම'ස්ස දීඝරත්තං හිතාය සුඛාය''න්ති.

12. එවං වුත්තෙ බ්‍රාහ්මණ පුරොහිතො බ්‍රාහ්මණො රාජානං මහාවිජිතං එතදවොච: 'හොතො ඛො රඤ්ඤෙ ජනපදෙ සකණ්ටකො සඋපද්දවො. ගාමඝාතා'පි දිස්සන්ති, නිගමඝාතා'පි දිස්සන්ති, පන්ථදූහනා'පි දිස්සන්ති. භවං චෙ ඛො පන රාජා එවං සකණ්ටකෙ ජනපදෙ සඋපද්දවෙ බලිමුද්ධරෙය්‍ය, අකිච්චකාරී අස්ස තෙන භවං රාජා. සියා ඛො පන හොතො රඤ්ඤෙ එවමස්ස: 'අහමෙතං දස්සුබිලං වධෙන වා බන්ධෙන වා ජානියා වා ගරහාය වා පබ්බාජනාය වා සමූහනිස්සාමි'ති. න ඛො පනෙතස්ස දස්සුබිලස්ස එවං සම්මා සමුග්ඝාතො හොති. යෙ තෙ හතාවසෙසකා භවිස්සන්ති, තෙ පච්ඡා රඤ්ඤෙ ජනපදං විහෙඨෙස්සන්ති. අපි ච ඛො ඉදං සංවිධානං ආගම්ම එවමෙතස්ස දස්සුබිලස්ස සම්මා සමුග්ඝාතො හොති. තෙන හි භවං රාජා යෙ හොතො රඤ්ඤෙ ජනපදෙ උස්සහන්ති කසිගොරක්ඛෙ, තෙසං භවං රාජා බීජභත්තං අනුප්පදෙතු. යෙ හොතො රඤ්ඤෙ ජනපදෙ උස්සහන්ති වණිජ්ජාය, තෙසං භවං රාජා පාභතං අනුප්පදෙතු. යෙ හොතො රඤ්ඤෙ ජනපදෙ උස්සහන්ති රාජපොරිසෙ, තෙසං භවං රාජා භත්තවෙතනං පකප්පෙතු. තෙ ච මනුස්සා සකම්මපසුතා රඤ්ඤෙ ජනපදං න විහෙඨෙස්සන්ති. මහා ච රඤ්ඤෙ රාසිකො භවිස්සති, ඛෙමට්ඨිතා ජනපදා අකණ්ටකා අනුපද්දවා. මනුස්සා ච මුදා මොදමානා උරෙ පුත්තෙ නච්චෙන්තා අපාරුතඝරා මඤ්ඤෙ විහරිස්සන්ති''න්ති.

13. 'එවං හො'ති ඛො බ්‍රාහ්මණ රාජා මහාවිජිතො පුරොහිතස්ස බ්‍රාහ්මණස්ස පටිස්සුත්වා යෙ රඤ්ඤෙ ජනපදෙ උස්සහිංසු කසිගොරක්ඛෙ, තෙසං රාජා මහාවිජිතො බීජභත්තං අනුප්පාදෙසි.[1] යෙ රඤ්ඤෙ ජනපදෙ උස්සහිංසු වණිජ්ජාය, තෙසං රාජා මහාවිජිතො පාභතං අනුප්පාදෙසි. යෙ රඤ්ඤෙ ජනපදෙ උස්සහිංසු රාජපොරිසෙ, තෙසං රාජා මහාවිජිතො භත්තවෙතනං පකප්පෙසි. තෙ ච මනුස්සා සකම්මපසුතා රඤ්ඤෙ ජනපදං න විහෙඨෙසුං. මහා ච රඤ්ඤෙ රාසිකො අහොසි, ඛෙමට්ඨිතා ජනපදා අකණ්ටකා අනුපද්දවා. මනුස්සා මුදා මොදමානා උරෙ පුත්තෙ නච්චෙන්තා අපාරුතඝරා මඤ්ඤෙ විහරිංසු.

---

1. අනුප්පාදෙසි. (කෙසු චි පොත්තකෙසු)

බමුණ, ඉක්බිත්තෙන් මහාවිජිත රජ තෙමේ පෙරෙවියා අමතා, "බමුණ, මෙහි හුදෙකලා වැ චිත්තවිවේකයෙන් හුන් මට 'මාතෘඝාතක වූ මහත් භෝගයෝ මා විසින් ලදහ. ඒ මම මහත් මිහිමඬල දිනා එයට අධිපති වැ වෙසෙමි. මට දික් කලක් හිත සුව පිණිස පවත්නා මහා යඥයක් කලොත් මැනැවැ යි මෙසේ චිත්තසංකල්පතාවෙක් උපන. බමුණ, මහා යඥයක් කරන්නට කැමැත්තෙමි. එහි ලා භවත් තෙමේ මට දික් කලක් හිත සුව පිණිස අනුශාසන කෙරේ වා" යි මේ බස් පැවැසී ය.

12. බමුණ, මෙසේ කී කල්හි පෙරෙවි බමුණා මහාවිජිත රජුට මෙය කී ය: "භවත් රජුහුගේ රට කවු සහිත (සොරඋවදුරු සහිත) වෙයි, සොර උවදුරින් මිරිකුණේ වෙයි. ගම් පැහැරුම් දක්නා ලැබේ. නිගම-ගම් පැහැරුම් දක්නා ලැබේ. නුවර පැහැරුම් දක්නා ලැබේ. මං පැහැරුම් දක්නා ලැබේ. භවත් රජ තෙමේ ඉදින් මෙසේ සොර උවදුරු ඇති සොර උවදුරින් මිරිකුණු රටෙහි බදු කරවුවර ගත්තේ නම්, එයින් තොකටයුත්තක් කරන්නෙක් වන්නේ ය. 'වධ කිරීමෙන් හෝ බැඳ ලීමෙන් හෝ දඬ ගැසීමෙන් හෝ හිස මුඩු කැරවීම් ආදි ගැරහුමෙන් හෝ රවින් තෙරපීමෙන් හෝ මේ දශ්‍යකිලය (සොර හුල) මුලින් ම උදුරා ලන්නෙමි' යි පින්වත් රජුට මෙසේ සිතක් විය හැක්ක. මෙසේ මේ සොර හුල මැනැවින් ඉදිරීමෙක් නො වේ ම ය. කසන ලද්දවුන් ගෙන් ඉතිරි වූ යම් සොරසතුරු කෙනෙක් වන්නෝ ද, ඔහු පසු වැ රජුගේ රට පෙළන්නාහ. එතෙකුදු වුවත් මේ මතු දුක්වෙන සංවිධා-නයට පැමිණ (මතු දුක්වෙන සේ පිළිපැදීමෙන්) මෙසේ මේ සොර හුල මොනොවට ඉදිරී යෑම වේ. එ බැවින් සිය රටෙහි යම් කෙනෙක් ගොවිතැන්හි ගෙරි රැකුම්හි උත්සාහ කෙරෙත් නම්, පින්වත් රජ තෙමේ ඔවුනට ධාන්‍ය බිජුවට ද බත් ද දේ වා. යම් කෙනෙක් පින්වත් රජුහු ගේ රටෙහි වෙළෙඳම පිණිස උත්සාහ කෙරෙත් ද, ඔවුනට රජ තෙමේ බඩු මිල දේ වා. පින්වත් රජුහුගේ රටෙහි යම් කෙනෙක් රාජකාර්යයෙහි උත්සාහ කෙරෙත් ද, ඔවුනට පින්වත් රජ තෙමේ බත් වැටුප් දේ වා. ඒ මිනිස්සුත් තමන්ගේ වැඩපලෙහි යෙදුණේ රජුගේ රට නො පෙළන්නෝ ය. රජුගේ ධනධාන්‍ය රාශි ද මහත් වන්නේ ය. ජනපදයෝ සොර උවදුරු නැත්තෝ, නොමිරිකුණේ, නිරුපද්‍රැතභාවයේ සිටියෝ වන්නාහ. මිනිස්සු ද උනුත් කෙරෙහි සතුටු වන්නෝ, ඔරෙහි දරුවන් නටවන්නෝ, දොර නොවැසූ ගෙවල් ඇත්තවුන් මෙන් (බිය සැක නැති ව) වසන්නෝ ය."

13. බමුණ, 'භවත, එසේ යැ' යි කියා ම ඒ මහාවිජිත රජ පිළිවදන් දී, රජුගේ රටෙහි ගොවිතැන්හි ගෙරිරැකුම්හි උත්සුක වූවනට බිජු ද බත් ද දෙවී ය. වෙළෙඳමෙහි උත්සුක වූවනට බඩුමිල දෙවී ය. රාජකාර්යයෙහි යෙදුණවුනට බත්වැටුප් දෙවී ය. ඒ මිනිස්සු ද මෙසේ රජුගේ රට නො පෙළූහ. රජුගේ ද ධනධාන්‍ය රාශිය මහත් විය. ජනපදයෝ සොරසතුරු උවදුරින් මිදුණේ නොමිරිකුණේ නිරුපද්‍රැත බවහි සිටියෝ වූහ. මිනිස්සු ඔවුනොවුන් හා සතුටු වන්නෝ දරුවන් ඔරෙහි නටවත්තුමේ දොර නොවැසූ ගෙවල් ඇතියන් සේ (බිය සැක නැති වැ) වූහුහ.

14. අථ ඛො බ්‍රාහ්මණ රාජා මහාවිජිතො පුරොහිතං බ්‍රාහ්මණං ආමන්තෙත්වා එතදවොච: "සමිද්ධතො ඛො මෙ භො සො දස්සුඛීලො හොතො සංවිධානං ආගම්ම. මහා ච මෙ රාසිකො. ඛෙමවසිතා ජනපදා අකණ්ටකා අනුපපීළා. මනුස්සා මුදා මොදමානා උරෙ පුත්තෙ නච්චෙන්තා අපාරුතඝරා මඤ්ඤෙ විහරන්ති. ඉච්ඡාමහං බ්‍රාහ්මණ මහායඤ්ඤං යජිතුං. අනුසාසතු මං භවං, යං මම'ස්ස දීඝරත්තං හිතාය සුඛාය"ති.

"තෙන හි භවං රාජා යෙ භොතො රඤ්ඤො ජනපදෙ ඛත්තියා අනුයුත්තා නෙගමා චෙව ජානපදා ච, තෙ භවං රාජා ආමන්තයතං, 'ඉච්ඡාමහං භො මහායඤ්ඤං යජිතුං. අනුජානන්තු මෙ භොන්තො යං මම'ස්ස දීඝරත්තං හිතාය සුඛාය'ති. යෙ භොතො රඤ්ඤො ජනපදෙ අම්බට්ඨා පාරිසජ්ජා නෙගමා චෙව ජානපදා ච -පෙ- බ්‍රාහ්මණමහාසාලා නෙගමා චෙව ජානපදා ච, තෙ භවං රාජා ආමන්තයතං: 'ඉච්ඡාමහං භො මහායඤ්ඤං යජිතුං. අනුජානන්තු මෙ භවන්තො යං මම'ස්ස දීඝරත්තං හිතාය සුඛාය'ති.

'එවං භො'ති ඛො බ්‍රාහ්මණ රාජා මහාවිජිතො පුරොහිතස්ස බ්‍රාහ්ම-ණස්ස පටිස්සුත්වා යෙ රඤ්ඤො ජනපදෙ ඛත්තියා අනුයුත්තා නෙගමා චෙව ජානපදා ච, තෙ රාජා මහාවිජිතො ආමන්තෙසි: "ඉච්ඡාමහං භො මහායඤ්ඤං යජිතුං. අනුජානන්තු මෙ භොන්තො, යං මම'ස්ස දීඝරත්තං හිතාය සුඛාය"ති.

"යජතං භවං රාජා යඤ්ඤං. යඤ්ඤකාලො මහාරාජ"ති.

යෙ රඤ්ඤො ජනපදෙ අම්බට්ඨා පාරිසජ්ජා නෙගමා චෙව ජානපදා ච -පෙ- බ්‍රාහ්මණමහාසාලා නෙගමා චෙව ජානපදා ච -පෙ- ගහපතිනෙවසිකා නෙගමා චෙව ජානපදා ච, තෙ රාජා මහාවිජිතො ආමන්තෙසි: "ඉච්ඡාමහං භො මහායඤ්ඤං යජිතුං. අනුජානන්තු මෙ භවන්තො, යං මම'ස්ස දීඝරත්තං හිතාය සුඛාය"ති.

"යජතං භවං රාජා යඤ්ඤං. යඤ්ඤකාලො මහාරාජ"ති.

ඉතිමෙ චත්තාරො අනුමතිපක්ඛා තස්සෙව යඤ්ඤස්ස පරික්ඛාරා භවන්ති.

15. රාජා මහාවිජිතො අවඤ්ඤි අඤ්ඤෙ සමත්තානගතො:

ඊහතො යුජ්ජතො මාතිතො ච පිතිතො ච, සංසුද්ධගහණිකො යාව සත්තමා පිතාමහයුගා,

14. බමුණ, ඉක්බිත්තෙන් මහාවිජිත රජ තෙමේ පෙරෙවියා අමතා, "භවත, මා විසින් භවත්හුගේ සංවිධානය පිළිපැද ඒ චෞරසතුරු හුල මුලින් උදුරන ලද්දේ ය. මගේ ධන ධාන්‍ය රැස ද මහත් ම ය. ජනපදයෝ අකණ්ටක වූවෝ, (චෞර සතුරු උවදුරු නැත්තෝ) උවදුරින් තොමිරිකුණෝ, උවදුරු නැති බව්හි සිටියෝ ය. මිනිස්සු ඔවුතොවුන් හා සතුටු වත්තෝ, ඔරෙහි දරුවන් නටවත්තෝ, දොර නොවැසූ ගෙවල් ඇත්තවුන් සේ වෙසෙත්. බමුණ, මට දික් කලක් හිත සුව පිණිස පවත්නා මහා යඥයක් යදනට (මහ දනක් දෙන්නට) මම් කැමැත්තෙමි. පින්වත් තෙමේ මට අනුශාසන කෙරේ වා" යි මෙ බස් කී ය.

එ විට පෙරෙවි තෙමේ මෙසේ රජුට අනුශාසන කෙළේ ය: "එසේ නම්, පින්වත් රජුගේ රටෙහි තමා අනුව පවත්නා නියම්ගම්වැසි වූත් දනවුවැසි වූත් යම් ක්ෂත්‍රිය කෙනෙක් වෙත් නම්, පින්වත් රජ තෙමේ ඔවුන් අමතා, 'භවත්නි, මට බොහෝ කල් හිත සුව පිණිස මම් මහ දනක් දෙනු කැමැත්තෙමි. භවත්හු එයට මට අනුදනිත් වා'යි කියා වා. පින්වත් වූ රජුගේ රටෙහි නියම්ගම්වැසි වූත් දනවුවැසි වූත් රාජසභාවට අයත් ඇමැතියෝ වෙත් ද,...නියම්ගම් වැසි දනවුවැසි බමුණු මහසල්හු වෙත් ද...නියම්ගම්වැසි දනවුවැසි මහ දනවත් ගැහැවි කෙනෙක් වෙත් ද, පින්වත් රජ තෙමේ ඔවුන් අමතා 'භවත්නි, මට බොහෝ කල් හිත සුව පිණිස මම් මහ දනක් දෙනු රිසියෙමි. භවත්හු එයට මට අනුදනිත්වා'යි කියා වා".

"බමුණ, 'එසේ ය පින්වතැ'යි කියා ම මහාවිජිත රජ තෙමේ පෙරෙවි බමුණාට පිළිවදන් දී, සිය රටෙහි නියම්ගම්වැසි වූත් දනවුවැසි වූත් තමා අනුව පවත්නා ක්ෂත්‍රිය කෙනෙක් වූහු නම්, ඔවුන් අමතා, 'පින්වත්නි, යමක් මට බොහෝ කල් හිත සුව පිණිස පවත්නේ ද, මම් එසේ වූ යඥයක් යජත්නට (මහ දනක් දෙන්නට) කැමැත්තෙමි. පින්වත්හු එයට මට අනුදනිත්වා'යි කී ය.

'පින්වත් රජ තුමෝ යඥය යජත් වා (මහ දන් දෙත් වා). මහ රජාණනි, මේ යඥයට කාලය වේ යැ"යි ඔහු කීහ. සිය රටෙහි නියම්ගම්වැසි වූත් දනවුවැසි වූත් රාජසභාසද ඇමැති කෙනෙක් වූහු ද... නියම්ගම්වැසි දනවුවැසි බමුණු මහසල් කුල කෙනෙක් වූහු ද,... නියම්ගම්වැසි වූත් දනවුවැසි වූත් දන රැස් කරන ගැහැවි මහසල් කුල කෙනෙක් වූහු ද, මහාවිජිත රජ තෙමේ ඔවුන් හැම අමතා, 'භවත්නි, යමක් මට බොහෝ කල් හිත සුව පිණිස පවත්නේ ද, එසේ වූ මහායඥයක් යජනු රිසියෙමි. පින්වත්හු මට එයට අනුදනිත් වා'යි දැන්වී ය.

'මහරජාණනි, මේ යඥයට කාලය ය. පින්වත් රජ තුමෝ යඥය කෙරෙත් වා'යි ඔහු කීහ.

මෙසේ මේ අනුමති පක්ෂ සතර (අවසරය දෙන්නන් සතර වගය) එ ම යඥයට පිරිවර වෙත්.

15. මහාවිජිත රජ තෙමේ අංග අටෙකින් සමන්විත ය. (කවර අටකින් ද? යත්:)

හේ මාපිය දෙපසින් ම අභිජාත ය, සත්වන මිමුතු පුවල තෙක් පිරිසිදු මවුකුස ඇත්තෙක.

අක්ඛිතෙනා අනුපක්කුට්ඨො ජාතිවාදෙන,

අභිරූපො දස්සනීයො පාසාදිකො, පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතො, බ්‍රහ්මවණ්ණී බ්‍රහ්මවච්ඡී අක්ඛුද්දවිත්තො දස්සනාය.

අඩ්ඪො මහද්ධනො මහාභොගො පහූතජාතරූපරජතො පහූතවිත්තූ-පකරණො පහූතධනධඤ්ඤ පරිපූණ්ණකොසකොට්ඨාගාරො.

බලවා චතුරඞ්ගිනියා සෙනාය සමන්නාගතො අස්සවාය ඔවාදපටිකරාය, පතිපති මඤ්ඤෙ පච්චත්තිකෙ යක්ඛෙ.

සද්ධො දායකො දානපති අනාවටද්වාරො, සමණබ්‍රාහ්මණකපණද්ධික-වණිබ්බකයාචකානං ඔපානභූතො, පුඤ්ඤානි කරොති.

බහුස්සුතො තස්ස තස්ස සුතජාතස්ස. තස්ස තස්සෙව ඛො පන භාසිතස්ස අත්ථං ජානාති: 'අයං ඉමස්ස භාසිතස්ස අත්ථො අයං ඉමස්ස භාසිතස්ස අත්ථො'ති.

පණ්ඩිතො වියත්තො මෙධාවී පටිබලො අතීතානාගතපච්චුප්පන්නෙ අත්ථෙ විනෙතුං.

රාජා මහාපිජිතො ඉමෙහි අට්ඨහි අඞ්ගෙහි සමන්නාගතො.

ඉති ඉමානි'පි අට්ඨඞ්ගානි තස්සෙව යඤ්ඤස්ස පරික්ඛාරා හවන්ති.

16. පුරොහිතො'පි බ්‍රාහ්මණො චතුහඞ්ගෙහි සමන්නාගතො:

උභතො සුජාතො මාතිතො ච පිතිතො ච, සංසුද්ධගහණිකො යාව සත්තමා පිතාමහයුගා. අක්ඛිතෙනා අනුපක්කුට්ඨො ජාතිවාදෙන,

අජ්ඣායකො මන්තධරො තිණ්ණං වෙදානං පාරගූ සනිඝණ්ඩුකෙටුභානං සාක්ඛරප්පභෙදානං ඉතිහාසපඤ්චමානං පදකො වෙය්‍යාකරණො ලොකායතමහාපුරිසලක්ඛණෙසු අනවයො.

සීලවා වුද්ධසීලී වුද්ධසීලෙන සමන්නාගතො.

පණ්ඩිතො වියත්තො මෙධාවී පඨමො වා දුතියො වා සුජං, පඤ්ඤාණ-සත්තානං.

පුරොහිතො බ්‍රාහ්මණො ඉමෙහි චතුහඞ්ගෙහි සමන්නාගතො. ඉති ඉමානි'පි චත්තාරි අඞ්ගානි තස්සෙව යඤ්ඤස්ස පරික්ඛාරා හවන්ති.

ජාතිවාදයෙන් නොහෙළන ලද්දෙක, ගැරහුම් නොලද්දෙක.

විශිෂ්ට රූප ශොභා ඇත්තෙක, දකුම් කටයුත්තෙක, ප්‍රසාද එළවන සුලු ය.

උතුම් වර්ණසෞන්දර්යයෙන් යුක්ත ය, උතුම් රත් පැහැ ඇත්තෙක, උතුම් සිරුරු පැහැ ඇත්තෙක, සිය සිරුර අනුන් විසින් දක්නට කොමඳ අවකාශ ඇත්තෙක.

ආඪ්‍ය ය, මහද් ධන ඇත්තේ ය, මහද්භෝග ඇත්තේ ය, බොහෝ රන් රිදී ඇත්තේ ය, වස්තූපකරණ ඇත්තේ ය, බොහෝ ධන ධාන්‍ය ඇත්තේ ය, පිරිපුන් ගබඩා කොටාර ඇත්තේ ය.

බලවත් වූයේ, අණට කන් දෙන, ඔවා පිළිපදනා සිවුරඟ සෙනඟින් සමන්විත වූයේ, පසමිතුරන් සිය යස තෙදින් තවාලන්නාක් මෙන් වේ.

සැදැහැත්තේ ය, දීමේහි තුරු ය, දානපති ය, මහණුනට බමුණනට දුගියනට මගියනට පුලහුනට යදියනට නොවැසූ දොර ඇත්තේ ය, සිවුමං හන්දියෙක කැණූ පොකුණක් මෙන් වැ දන් පින් කෙරෙයි.

ඒ ඒ ඇසූ දෑ පිළිබඳ වැ බහුශ්‍රැත ය, මේ මේබසෙහි අරුත ය, මේ මේබසෙහි අරුත ය යැ යි ඒ ඒ කී බසෙහි අරුත් දනී.

නුවණැත්තේ ය, වියත් ය, අයුතා වත්මන් අරුත්හි සමත් ය.

මහාවිජිත රජ තෙමේ මෙ අටගින් සමන්විත ය. මෙසේ මේ අංග අට ද එම යඥයට පිරිවර වෙත්.

16. පෙරෙව් බමුණු ද සතර අංගයෙකින් යුත් වෙයි.(කවර සතරෙකින් ද යත්:) මා පිය දෙපසින් ම අභිජාත ය, සතර වන මිමුතු යුවල තෙක් ම පිරිසිදු මවුකුස ඇත්තේ ය, ජාතිවාදයෙන් නො හෙළන ලද්දේ ය, නො ගරහන ලද්දේ ය. වේද හදාරන්නේ ය, නිඝණ්ඩු ද කෛටභශාස්ත්‍ර ද සහිත ශික්ෂා හා නිරුක්ති හා සහිත ඉතිහාසය පස්වනු කොටැති තුන් වේදයේ පර තෙරට පැමිණියේ ය, පදපාඨ දන්නේ ය, සෙසු සියලු වියරණ විදි ද දන්නේ ය, ලොකායත ශාස්ත්‍රයෙහිත් මහාපුරුෂ-ලක්ෂණ විද්‍යයෙහිත් නිපුණ ය. සිල්වත් ය, වැඩුණු සිල් ඇත්තේ ය, වැඩුණු ශීලයෙන් සමන්විත ය, පණ්ඩිත ය, ව්‍යක්ත ය, නුවණැත්තේ ය. යාග සැන්ද ඔසොවන්නවුන් අතුරෙහි පලමු හෝ දෙවෙනි තැනැත්තේ ය.

පෙරෙව් බමුණු තෙමේ මේ සතර අංගයෙන් සමන්විත වෙයි. මෙසේ මේ සතර අංගයෝ ද එ ම යාගයට පිරිවර වෙත්.

17. අථ ඛො බ්‍රාහ්මණ, පුරොහිතො බ්‍රාහ්මණො රඤ්ඤො මහාවිජිතස්ස පුබ්බෙව යඤ්ඤ තිස්සො විධා දෙසෙසි:

"සියා ඛො පන භොතො රඤ්ඤො මහායඤ්ඤං සිට්ඨුකාමස්ස කොචිදෙව විප්පටිසාරො 'මහා වත මෙ භොගක්ඛන්ධො විගච්ඡිස්සතී'ති, සො භොතො රඤ්ඤො විප්පටිසාරො න කරණීයො. සියා ඛො පන භොතො රඤ්ඤො මහායඤ්ඤං යජමානස්ස කොචිදෙව විප්පටිසාරො 'මහා වත මෙ භොගක්ඛන්ධො විගච්ඡතී'ති, සො භොතො රඤ්ඤො විප්පටිසාරො න කරණීයො සියා ඛො පන භොතො රඤ්ඤො මහායඤ්ඤං සිට්ඨස්ස කොචිදෙව විප්පටිසාරො 'මහා වත මෙ භොගක්ඛන්ධො විගතො'ති, සො භොතො රඤ්ඤො විප්පටිසාරො න කරණීයො"ති.

ඉමා ඛො පන බ්‍රාහ්මණ පුරොහිතො බ්‍රාහ්මණො රඤ්ඤො මහාවිජිතස්ස පුබ්බෙව යඤ්ඤ තිස්සො විධා දෙසෙසි.

18. අථ ඛො බ්‍රාහ්මණ, පුරොහිතො බ්‍රාහ්මණො රඤ්ඤො මහාවිජිතස්ස පුබ්බෙව යඤ්ඤ දසහාකාරෙහි පරිගාහකෙසු විප්පටිසාරං පටිවිනොදෙසි: "ආගමිස්සන්ති ඛො භොතො යඤ්ඤං පාණාතිපාතිනො'පි පාණාතිපාතා පටිවිරතා'පි. යෙ තත්ථ පාණාතිපාතිනො තෙසඤ්ඤෙව තෙන. යෙ තත්ථ පාණාතිපාතා පටිවිරතා තෙ ආරබ්ඛ යජතං භවං, සජ්ජතං භවං, මොදතං භවං, විත්තමෙව භවං අන්තරං පසාදෙතු. ආගමිස්සන්ති ඛො භොතො යඤ්ඤං අදින්නාදායිනො'පි අදින්නාදානා පටිවිරතා'පි -පෙ- කාමෙසු මිච්ඡාචාරිනො'පි කාමෙසු මිච්ඡාචාරා පටිවිරතා'පි -පෙ- මුසාවාදිනො'පි මුසාවාදා පටිවිරතා'පි -පෙ- පිසුණවාචිනො'පි පිසුණාය වාචාය පටිවිරතා'පි -පෙ- ඵරුසවාචිනො'පි ඵරුසාය වාචාය පටිවිරතා'පි -පෙ- සම්ඵප්පලාපිනො'පි සම්ඵප්පලාපා පටිවිරතා'පි -පෙ- අභිජ්ඣාලුනො'පි අනභිජ්ඣාලුනො'පි -පෙ-බ්‍යාපන්නචිත්තා'පි අබ්‍යාපන්නචිත්තා' පි-පෙ- මිච්ඡාදිට්ඨිකා'පි සම්මාදිට්ඨිකා'පි. යෙ තත්ථ මිච්ඡාදිට්ඨිකා තෙසඤ්ඤෙව තෙන. යෙ තත්ථ සම්මාදිට්ඨිකා තෙ යජතං භවං, සජ්ජතං භවං, මොදතං භවං. විත්තමෙව භවං අන්තරං පසාදෙතූ"ති.

ඉමෙහි ඛො බ්‍රාහ්මණ පුරොහිතො බ්‍රාහ්මණො රඤ්ඤො මහාවිජිතස්ස පුබ්බෙව යඤ්ඤ දසහාකාරෙහි පරිගාහකෙසු විප්පටිසාරං පටිවිනොදෙසි.

19. අථ ඛො බ්‍රාහ්මණ, පුරොහිතො බ්‍රාහ්මණො රඤ්ඤො මහාවිජිතස්ස මහායඤ්ඤං යජමානස්ස සොළසහාකාරෙහි චිත්තං සන්දසෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි: සියා ඛො පන භොතො රඤ්ඤො මහායඤ්ඤං යජමානස්ස කොචිදෙව වත්තා: "රාජා ඛො මහාවිජිතො මහායඤ්ඤං යජති. තො ච ඛො තස්ස ආමන්තිතා ඛත්තියා අනුයුත්තා නෙගමා චෙව ජානපදා ච. අථ ච පන භවං රාජා එවරූපං මහායඤ්ඤං යජති"ති. එවමපි භොතො රඤ්ඤො වත්තා ධම්මතො නත්ථි. භොතා ඛො පන රඤ්ඤා ආමන්තිතා ඛත්තියා අනුයුත්තා නෙගමා චෙව ජානපදා ච.

17. බමුණ, ඉක්බිත්තෙන් පෙරෙවි බමුණු තෙමේ යඥයෙන් පෙරාතු ව ම මහාවිජිත රජුට තුන් විධාවන් දැක්වී ය: "මහා යාගයක් යජනු කැමැති පින්වත් රජහට "අහෝ! මා සතු භෝග රැසක් මතු නැසෙතැ'යි කිසි විපිළිසරක් විය හැක්ක. පින්වත් රජුහු විසින් එසේ වූ විපිළිසරක් නො කටයුතු ය. මහා යාගයක් යජන පින්වත් රජුට 'අහෝ මා සතු මහත් භෝග රැසක් දැන් නැසෙතැ'යි කිසි විපිළිසරක් වියැ හැක්ක. පින්වත් රජු විසින් එසේ වූ විපිළිසරක් නො කටයුත්තේ ය. මහායාගය යැදූ පින්වත් රජුට 'අහෝ මා සතු මහත් භෝග රැසක් නැසී ගියේ වනැ'යි විපිළිසරක් වියැ හැක්ක. පින්වත් රජුහු විසින් එසේ වූ විපිළිසරක් නොකටයුත්තේ ය".

බමුණ, පෙරෙවි බමුණු තෙමේ යඥයෙන් පෙරාතු ව ම මහාවිජිත රජුට මේ තුන් විධාවන් දෙසී ය.

18. බමුණ, ඉක්බිත්තෙන් පෙරෙවි බමුණු තෙම මහාවිජිත රජුට යඥයෙන් පෙරාතු ව ම දන් පිළිගන්නවුන් කෙරෙහි විපිළිසර දස අයුරෙකින් දුරු ලී ය. (ඒ මෙසේ ය:) "පින්වත්හුගේ යඥයට පණිවා කරන්නෝ ද පණිවායෙන් වැළැකුණෝ ද එන්නාහු ම ය. ඔවුන් අතුරෙහි යම් කෙනෙක් පණිවා කරන්නෝ නම් එයින් වරද ඔවුහට ම ය. ඔවුන් අතුරෙහි යම් කෙනෙක් පණිවායෙන් වැළැක්කෝ නම් භවත් තෙමේ ඔවුන් ඇරැබැ යජා වා. භවත් තෙමේ ඔවුන් ඇරැබැ පරිත්‍යාග කෙරේවා. භවත් තෙමේ සතුටු වේ වා. භවත් තෙමේ ඇතුළත සිත ම පහදා වා. පින්වත්හුගේ යඥයට අයිනාදන් කරන්නෝ ද අයිනාදනින් වැළැක්කෝ ද,...කාමයන්හි වරදවා හැසිරෙන්නෝ ද එයින් වැළැක්කෝ ද...මුසවා කියන්නෝ ද එයින් වැළැක්කෝ ද...පෙළෙහුන් තෙපලන්නෝ ද එයින් වැළැක්කෝ ද ...පරොස්-බස් බණින්නෝ ද එයින් වැළැක්කෝ ද...බොල් බස් දොඩන්නෝ ද එයින් වැළැක්කෝ ද...දැඩි ලොභාභිභූයෝ ද දැඩිලොභාභි නොවන්නෝ ද...ද්වේෂ සහිත සිතැත්තෝ ද එබඳු සිත් නැත්තෝ ද...මිසදිටුවෝ ද සම්දිටුවෝ ද එන්නාහු ම ය. ඔවුනතුරෙහි යම් කෙනෙක් මිසදිටු ගතුවෝ නම් එයින් අවැඩ ඔවුනට ම ය. ඔවුනතුරෙහි යම් කෙනෙක් සම්දිටුහු නම් ඔවුන් අරමුණු කොට පින්වත් තෙමේ යාගය කෙරේ වා. පින්වත් තෙමේ සතුටු වේ වා. ඇතුළත සිත ම පින්වත් තෙමේ පහදා වා"යනු යි.

බමුණ, පෙරෙවි බමුණු තෙමේ මහාවිජිත රජුට යාගයෙන් පෙරාතු ව ම මේ දසඅයුරින් යාග පිළිගන්නවුන් කෙරේ (වියැ හැකි) විපිළිසර දුරු ලී ය.

19. බමුණ, ඉක්බිති පෙරෙවි බමුණු තෙම මහායඥය යජන මහාවිජිත රජුගේ සිතට සොළොස් අයුරෙකින් කරුණු දක්වී ය, කරුණු ගැන්වී ය, එහි සිත තියුණු කෙළේ ය, එහි සිත තුටුපහටු කෙළේ ය. (ඒ මෙසේ ය:) "මහායඥයක් යජන පින්වත් රජහට 'මහා විජිත රජ වනාහි මහායඥයක් යජයි. එහෙත් ඔහු විසින් නියම්ගම්වැසි වූ ද දනවුවැසි වූ ද අනුයුක්ත ක්ෂත්‍රියයෝ නො ම කැඳවන ලද්දහ. එතෙකුදු වුවත් රජ තෙමේ මෙ බඳු මහායඥයක් යජා'යැ යි මෙසේ කියන්නකු ඇති වියැ හැකි ද, පින්වත් රජුට දහම් නසින් එසේ කියන්නෙක් නම් නැත. (කවර හෙයින ? යත්:) පින්වත් රජුහු විසින් නියම්ගම් වැසි වූ ද දනවුවැසි වූ ද අනුයුක්ත ක්ෂත්‍රියයෝ කැඳවන ලද්දහ. (එ හෙයිනි).

ඉමිනාපෙතං භවං රාජා ජානාතු. යජතං භවං, සජ්ජතං භවං, මෝදතං භවං, චිත්තමෙව භවං අන්තරං පසාදෙතු.

20. සියා ඛො පන භොතො රඤ්ඤො මහායඤ්ඤං යජමානස්ස කොචිදෙව වත්තා 'රාජා ඛො මහාවිජිතො මහායඤ්ඤං යජති, නො ච ඛො තස්ස ආමන්තිතා අමච්චා පාරිසජ්ජා නෙගමා චෙව ජානපදා ච-පෙ- බ්‍රාහ්මණමහාසාලා නෙගමා චෙව ජානපදා ච-පෙ- ගහපතිනෙවසිකා නෙගමා චෙව ජානපදා ච. අථ ච පන භවං රාජා එවරූපං මහායඤ්ඤං යජති'ති. එවම්පි භොතො රඤ්ඤො වත්තා ධම්මතො නත්ථි. භොතා ඛො පන රඤ්ඤා ආමන්තිතා ගහපතිනෙවසිකා නෙගමා චෙව ජානපදා ච. ඉමිනාපෙතං භවං රාජා ජානාතු. යජතං භවං, සජ්ජතං භවං, මෝදතං භවං. චිත්තමෙව භවං අන්තරං පසාදෙතු.

21. සියා ඛො පන භොතො රඤ්ඤො මහායඤ්ඤං යජමානස්ස කොචිදෙව වත්තා 'රාජා ඛො මහාවිජිතො මහායඤ්ඤං යජති. නො ච ඛො උභතො සුජාතො මාතිතො ච පිතිතො ච, සංසුද්ධගහණිකො යාව සත්තමා පිතාමහයුගා, අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන. අථ ච පන භවං රාජා එවරූපං මහායඤ්ඤං යජති'ති. එවම්පි භොතො රඤ්ඤො වත්තා ධම්මතො නත්ථි. භවං ඛො පන රාජා උභතො සුජාතො මාතිතො ච පිතිතො ච, සංසුද්ධගහණිකො යාව සත්තමා පිතාමහයුගා, අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන. ඉමිනාපෙතං භවං රාජා ජානාතු. යජතං භවං, සජ්ජතං භවං, මෝදතං භවං, චිත්තමෙව භවං අන්තරං පසාදෙතු.

22. සියා ඛො පන භොතො රඤ්ඤො මහායඤ්ඤං යජමානස්ස කොචිදෙව වත්තා 'රාජා ඛො මහාවිජිතො මහායඤ්ඤං යජති. නො ච ඛො අභිරූපො දස්සනීයො පාසාදිකො පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතො බ්‍රහ්මවණ්ණී බ්‍රහ්මවච්චසී අක්ඛුද්දවිත්තො දස්සනාය-පෙ- නො ච ඛො අඩ්ඪො මහද්ධනො මහාභොගො පහූතජාතරූපරජතො පහූතවිත්තූපකරණො පහූතධනධඤ්ඤො පරිපූණ්ණකොසකොට්ඨාගාරො -පෙ- නො ච ඛො බලවා චතුරඞ්ගිනියා සෙනාය සමන්නාගතො අස්සවාය ඔවාදපටිකරාය පතිපත්ති මඤ්ඤෙ පච්චත්තිකෙ යසසා-පෙ-නො ච ඛො සද්ධො දායකො දානපති අනාවටද්වාරො සමණබ්‍රාහ්මණකපණද්ධිකවණ්ණිඛ-කයාචකානං ඔපානභූතො පුඤ්ඤානි කරොති -පෙ- නො ච ඛො බහුස්සුතො තස්ස තස්ස සුතජාතස්ස -පෙ- නො ච ඛො තස්ස තස්සෙව ඛො පන භාසිතස්ස අත්ථං ජානාති.

මේ කරුණින් ද, මෙය පින්වත් රජ තෙමේ දැන ගනී වා. පින්වත් තෙමේ යාගය කෙරේ වා, පින්වත් තෙමේ දන් දේ වා, පින්වත් තෙමේ යාගයට සතුටු වේ වා, පින්වත් තෙමේ ඇතුලත සිත පහදා වා.

20. "මහාවිජිත රජ මහායාගයක් කරයි. එහෙත් ඔහු විසින් නියම්-ගම්වැසි, දනවුවැසි පොහොසත් බමුණෝත් නො දන්වන ලදහ. නියම්ගම්වැසි දනවුවැසි පොහොසත් ගැහැවියෝත් නො දන්වන ලදහ. එතෙකුදු වුවත් 'පින්වත් රජු මේ බඳු මහා යාගයක් කරතැ යි මහා යාගයක් කරනු කැමැති පින්වත් රජුට කියන කිසිවෙක් ඇති විය හැක්කේ ද, පින්වත් රජුට කරුණු සහිත ව එසේ කියන්නෙක් නැත. පින්වත් රජුහු විසින් වනාහි නියම්ගම්වැසි දනවුවැසි සිය යහළුවෝත් අණ පිළිපදනා සෙස්සෝත් දන්වන ලදහ...පොහොසත් බමුණෝත් ...පොහොසත් ගැහැවියෝත් දන්වන ලදහ. මේ කාරණයෙනුත්, මෙය භවත් මහරජ තෙමේ දැනැ ගනී වා. පින්වත් තෙමේ යාගය කෙරේ වා, පින්වත් තෙමේ දනය දේ වා, පින්වත් තෙමේ සතුටු වේ වා, පින්වත් තෙමේ ඇතුළත සිත ම පහදා වා.

21. 'මහාවිජිත රජ තෙමේ මහායාගයක් කරයි. එහෙත් හේ මාපිය දෙපසින් අභිජාත නො වේ. සත් වන මිමුතු ශුවල තෙක් පිරිසිදු මවු කුස ඇත්තේ නො වේ. ජාතිවාදයෙන් නො හෙළන ලද්දේ නො වේ. නො ගරහන ලද්දේ නො වේ. එහෙත් භවත් රජු මේ බඳු මහායාගයක් කරතැ, යි මහායාගය කරන භවත් රජුට කියන කිසිවෙක් ඇති විය හැක්ක. එහෙත් භවත් රජහට කරුණු සහිත වැ එසේත් කියන්නෙක් නැත. පින්වත් රජ තෙමේ වූ කලි මා පිය දෙ පසින් අභිජාත ය, සත් වන මිමුතු ශුවල තෙක් පිරිසිදු මවු කුස ඇත්තේ ය, ජාතිවාදයෙන් නො හෙළන ලද්දේ ය, නො ගරහන ලද්දේ ය. මේ කරුණිනුත් මෙය භවත් රජ තෙමේ දැනගනී වා. භවත් තෙමේ යාගය කෙරේ වා, භවත් තෙමේ දනය දේ වා, භවත් තෙමේ සතුටු වේ වා, භවත් තෙමේ ඇතුළත සිත ම පහදා වා.

22. මහා යාගයක් යජනා පින්වත් රජහට "මහාවිජිත රජ වූ කලි මහා යාගයක් යදී. එහෙත් හේ මනා රූ ඇත්තේ නො වේ, දැකුම්කලු නො වේ. උතුම් පැහැ සපුයෙන් ශුත් නො වේ. උතුම් පැහැ ඇත්තේ නො වේ. බඹහු වැනි කය ඇත්තේ නො වේ. දැක්මට මහත් ඔවස් ඇත්තේ නො වේ...ආඪ්‍ය ද නො වේ. මහත් ධන ඇත්තේ නො වේ. මහත් භොග ඇත්තේ නො වේ. බොහෝ රන් රිදී ඇත්තේ නො වේ. බොහෝ වස්තූපකරණ ඇත්තේ නො වේ. බොහෝ ධනධාන්‍ය ඇත්තේ නො වේ. පිරිපුත් බවුගුල් හා කොටුගුල් ඇත්තේ නො වේ. ...බසට කන් දෙන, ඔවා පිළිපදනා, බලවත් සිවුරඟ සෙනඟින් සමන්විත නො වේ. සතුරන් සිය යසසින් තවතැ යි නො සිතමි...සැදැහැවත් ගෘහපතියෙක් ගෘහපතියෙක් ගල ගෙරෙන්නෙක් නො වෙයි. මහණ බමුණනට දුගියනට මගියනට යදිනට පුලනුනට සිවුමංහන්දියෙකැ පිහිටි ළිඳක් මෙන් වැ දන් පින් නො කෙරෙයි...ඒ ඒ ඇසූ දැ පිළිබඳ ඇසූ පිරූ තැන් ඇත්තේ නො වෙයි...මේ මේ කියන ලද්දෙහි අරුත් ය, මේ මේ කියන ලද්දෙහි

'අයං ඉමිස්ස භාසිතස්ස අත්ථො අයං ඉමිස්ස භාසිතස්ස අත්ථො'ති. -පෙ- තො ච ඛො පණ්ඩිතො වියත්තො මෙධාවී පටිබලො අතීතානාගතපච්චුප්පන්නෙ අත්ථෙ විනෙතුං. -පෙ- අථ ච පන භවං රාජා එවරූපං මහායඤ්ඤං යජතී'ති.

එවම්පි හොතො රඤ්ඤෙ වත්තා ධම්මතො නත්ථි. භවං ඛො පන රාජා -පෙ- පණ්ඩිතො වියත්තො මෙධාවී පටිබලො අතීතානාගතපච්චුප්පන්නෙ අත්ථෙ විනෙතුං. ඉමිනාපෙතං භවං රාජා ජානාතු. යජතං භවං, සජ්ජතං භවං, මොදතං භවං, විත්තමෙව භවං අන්තරං පසාදෙතු.

23. සියා ඛො පන හොතො රඤ්ඤෙ මහායඤ්ඤං යජමානස්ස කොචිදෙව වත්තා: 'රජා ඛො මහාවිජිතො මහායඤ්ඤං යජති. නො ච ඛවස්ස පුරොහිතො බ්‍රාහ්මණො උභතො සුජාතො මාතිතො ච පිතිතො ච. සංසුද්ධගහණිකො යාව සත්තමා පිතාමහයුගා. අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන. අථ ච පන භවං රාජා එවරූපං මහායඤ්ඤං යජතී'ති. එවම්පි හොතො රඤ්ඤෙ වත්තා ධම්මතො නත්ථි. හොතො ඛො පන රඤ්ඤෙ පුරොහිතො බ්‍රාහ්මණො උභතො සුජාතො මාතිතො ච පිතිතො ච සංසුද්ධගහණිකො යාව සත්තමා පිතාමහයුගා, අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන. ඉමිනාපෙතං භවං රාජා ජානාතු. යජතං භවං, සජ්ජතං භවං, මොදතං භවං. විත්තමෙව භවං අන්තරං පසාදෙතු.

24. සියා ඛො පන හොතො රඤ්ඤෙ මහායඤ්ඤං යජමානස්ස කොචිදෙව වත්තා 'රාජා ඛො මහාවිජිතො මහායඤ්ඤං යජති. නො ච ඛවස්ස පුරොහිතො බ්‍රාහ්මණො අජ්ඣායකො මන්තධරො තිණ්ණං වෙදානං පාරගූ සනිඝණ්ඩුකෙටුභානං සාක්ඛරප්පභෙදානං ඉතිහාසපඤ්චමානං පදකො වෙය්‍යාකරණො ලොකායතමහාපුරිසලක්ඛණෙසු අනවයො -පෙ- නො ච ඛවස්ස පුරොහිතො බ්‍රාහ්මණො සීලවා වුද්ධසීලී වුද්ධසීලෙන සමන්නාගතො -පෙ- නො ච ඛවස්ස පුරොහිතො බ්‍රාහ්මණො පණ්ඩිතො වියත්තො මෙධාවී පඨමෙ වා දුතියෙ වා ඝස්සං පහාණාය තත්තාය. අථ ච පන භවං රාජා එවරූපං මහායඤ්ඤං යජතී'ති. එවම්පි හොතො රඤ්ඤෙ වත්තා ධම්මතො නත්ථි.

අරුත් යැ යි ඒ ඒ භාෂිතයේ අරුත් නො දනී...පණ්ඩිත ද ව්‍යක්ත ද නුවණැති ද අශ්‍රුතාවත්මන් ද සිතනු සමත් ද නො වේ...එහෙත් භවත් රජු මේ බඳු මහා යඥයක් යජතැ''යි මෙසේ දෙස් කියන්නකු වියැ හැක්කේ ද, පින්වත් රජුහට එසේ කරුණු සහිත වැ කියන්නෙක් නම් නැත.

පින්වත් රජ තෙමේ වනාහි...පණ්ඩිත ය, ව්‍යක්ත ය, නුවණැත්තේ ය. අශ්‍රුතාවත්මන්හි අරුත් සිතන්නට සමත් ය. මෙ කරුණින් ද පින්වත් රජ තෙමේ (යඥයට කලැ යි) මෙය දනී වා. පින්වත් තෙමේ යඥය කෙරේ වා. පින්වත් තෙමේ දානය දේ වා. පින්වත් තෙමේ (ස්වකීය යඥයෙහි) සතුටු වේ වා, පින්වත් තෙමේ සිත ඇතුළත පැහැදුවීම ම කෙරේ වා.

23. මහා යඥයක් යජතා පින්වත් රජුට ''මහාවිජිත රජ වනාහි මහා යඥයක් කරයි. එහෙත් ඔහු පෙරෙව් බමුණු තෙමේ මාපිය දෙපසින් පිරිසිදු උපත ඇතියෙක් නො වේ. සත් වන මිමුතු ගුවල තෙක් පිරිසිදු මවුකුස ඇතියෙක් නො වේ. ජාතිවාදයෙන් බැහැර නොකරන ලදුයෙක්, නොගරහන ලදුයෙක් නො වේ. එතෙකුදු වුවත් පින්වත් රජු මේ බඳු මහායඥයක් කරතැ''යි කියන කිසිවකු ඇති වියැ හැකි වතොත්, පින්වත් රජුට කරුණු සහිත වැ එසේ කියන්නෙක් නම් නැත. පින්වත් රජුහුගේ පෙරෙව් බමුණු තෙමේ මවු පසින් ද පිය පසින් ද යන දෙ පසින් ම පිරිසිදු උපත ඇතියෙක් ය. සත්වන මිමුතු ගුවල තෙක් පිරිසිදු මවු කුස ඇතියෙක් ය. ජාතිවාදයෙන් බැහැරැ නො කැරුණෙක් ය. ගැරහුම් නොලදුයෙක් ය. මෙ කරුණින් ද පින්වත් රජ තෙමේ (යඥයට කලැ යි) මෙය දනී වා. පින්වත් තෙමේ යඥය කෙරේ වා. පින්වත් තෙමේ යාගය කෙරේ වා. පින්වත් තෙමේ ස්වකීය යඥයෙහි සතුටු වේ වා පින්වත් තෙමේ සිත ඇතුළත පැහැදීම ම කෙරේ වා.

24. මහා යඥයක් කරන පින්වත් රජුට, "මහාවිජිත රජ වනාහි මහා යඥයක් කෙරෙයි. එහෙත් ඔහු පෙරෙව් බමුණු තෙමේ වේද හදාරන්නෙක්, වේදය සිතැ දරන්නෙක්, නිඝණ්ටු කෙටුභශාස්ත්‍ර සහිත, අක්ෂරප්‍රභේද සහිත, ඉතිහාසය පස්වනු කොටැති තුන් වේදයන්හි පරතෙරට ගියෙක් නො වේ යැ යි ද, පද දන්නෙක්, වියරණෙහි නිපුනයෙක්, ලෝකායත ශාස්ත්‍ර-යෙහිත් මහාපුරුෂලක්ෂණ ශාස්ත්‍රයෙහිත් අනූනයෙක් නො වේ යැ යි ද...

ඔහු පෙරෙව් බමුණා සිල්වතෙක්, වැඩුණු සිල් ඇත්තෙක්, වැඩුණු ශීලයෙන් සමන්විතයෙක් නො වේ යැ යි ද...

ඔහු පෙරෙව් බමුණා පණ්ඩිත ද නො වේ යැ යි, ව්‍යක්ත ද නො වේ යැ යි, නුවණැති ද නො වේ යැ යි, ගෝම සැන්ද ඔසොවන්නවුන් ගෙන් පළමු වැන්නා හෝ දෙවැන්නා හෝ නො වේ යැ යි, එතෙකුදු වුවත් පින්වත් මගරජ මෙ බඳු මහා යඥයක් කෙරේ යැ' යි ද කියන කිසිවකු ඇති වියැ හැක්ක. එහෙත් කරුණු සහිත වැ එසේ කියන්නෙක් නම් නැත.

හොතො ඛො පන රඤ්ඤො පුරොහිතො බ්‍රාහ්මණො පණ්ඩිතො වියත්තො මෙධාවී පඨමො වා දුතියො වා සුජම්පඤ්ඤත්තාතං. ඉමිනා පෙතං භවං රාජා ජානාතු. යජතං භවං, සජ්ජතං භවං, මොදතං භවං, චිත්තමෙව භවං අන්තරං පසාදෙතු'ති.

ඉමෙහි ඛො බ්‍රාහ්මණ, පුරොහිතො බ්‍රාහ්මණො රඤ්ඤො මහාවිජිතස්ස මහායඤ්ඤං යජ්මානස්ස සොළසහි ආකාරෙහි චිත්තං සන්දස්සෙසි, සමාදපෙසි, සමුත්තෙජෙසි, සම්පහංසෙසි.

25. තස්මිං ඛො බ්‍රාහ්මණ යඤ්ඤෙ නෙව ගාවො හඤ්ඤිංසු, න අජෙළකා හඤ්ඤිංසු, න කුක්කුටසූකරා හඤ්ඤිංසු, න විවිධා පාණා සංඝාතං ආපජ්ජිංසු, න රුක්ඛා ඡින්දිංසු[1] යූපත්ථාය, න දබ්බා ලූසිංසු බරිහිසත්ථාය.[2] යෙ'පි'ස්ස අහෙසුං දාසා'ති වා පෙස්සා'ති වා කම්මකරා'ති වා, තෙ'පි න දණ්ඩතජ්ජිතා න භයතජ්ජිතා න අස්සුමුඛා රුදමානා පරිකම්මානි අකංසු. අථ ඛො යෙ ඉච්ඡිංසු තෙ අකංසු. යෙ න ඉච්ඡිංසු න තෙ අකංසු. යං ඉච්ඡිංසු තං අකංසු. යං න ඉච්ඡිංසු න තං අකංසු. සපිතෙලනවනීත-දධිමධුඵාණිතෙන වෙව සො යඤ්ඤෙ නිට්ඨානමගමාසි.

26. අථ ඛො බ්‍රාහ්මණ ඛත්තියා අනුයන්තා නෙගමා වෙව ජානපදා ච අම්චචා පාරිසජ්ජා නෙගමා වෙව ජානපදා ච, බ්‍රාහ්මණමහාසාලා නෙගමා-චෙව ජානපදා ච, ගහපතිනෙචයිකා නෙගමා වෙව ජානපදා ච පහූතං සාපතෙය්‍යං ආදාය රාජානං මහාවිජිතං උපසඞ්කමිත්වා එවමාහංසු: "ඉදං දෙව පහූතං සාපතෙය්‍යං දෙවඤ්ඤෙව උද්දිස්ස ආහතං. තං දෙවො පතිගණ්හාතු"'ති.

"අලං හො. මම්පි ඉදං පහූතං සාපතෙය්‍යං ධම්මිකෙන බලිනා අභිසඞ්ඛතං. තඤ්ච වො හොතු ඉතො ච භිය්‍යො හරථා"'ති.

27. තෙ රඤ්ඤා පටික්ඛිත්තා එකමන්තං අපක්කමිම එවං සම්මන්තෙසුං: "න ඛො එතං අම්හාකං පතිරූපං යං මයං ඉමානි සාපතෙය්‍යානි පුනදෙව සකානි ඝරානි පටිහරෙය්‍යාම. රාජා ඛො මහාවිජිතො මහායඤ්ඤං යජති. හන්දස්ස මයං අනුයාගිනො හොමා"'ති.

---

1. රුක්ඛෙ ඡින්දිංසු, (ක්‍රළුවි.) 2. පරිහිංසත්ථාය, (ක්‍රළුවි.)

පින්වත් රජුගේ පෙරෙවි බමුණා වනාහි පණ්ඩිත ය, ව්‍යක්ත ය, නුවණැත්තේ ය. හෝම සැන්ද ඔසොවන්නත් අතුරෙහි පළමු වැන්නා හෝ දෙවැන්නා ය. පින්වත් රජ තෙමේ මෙසිනුත් (යඥයට කාලය යැ සි) මෙය දනී වා. පින්වත් තෙමේ යාගය කෙරේ වා. පින්වත් තෙමේ යාගයෙහි සතුටු වේ වා. පින්වත් තෙමේ සිත ඇතුළත පැහැදීම ම කෙරේ වා".

බමුණ, ඒ පෙරෙවි බමුණා මහා යාගයක් කරන්නට සැරැසෙන මහාවිජිත රජුහුගේ සිත මේ සොළොස් අයුරින් කරුණු දක්වා මෙහෙයි ය, සිතට ගැන්වී ය, සිත උනන්දු කෙළේ ය, පැසැසීමෙන් සිත සතුටු කෙළේ ය.

25. ඒ යාගයෙහි වූ කලි ගෙරිහු නො මරන ලදහ. එළුකිරෙළුවෝ නො මරන ලදහ. කුකුළෝ හූරෝ නො මරන ලදහ. නොයෙක් ලිහිණි ඇ සත්තු වතසට නො පැමිණියහ. යාග කණු පිණිස රුක්හු නො සිඳින ලදහ. යාගශාලාව පිරිකෙළීම පිණිස හෝ යාග බිමැ ඇතිරීම පිණිස කුස තණ නො සිඳින ලද්දේ ය. ඔහුගේ දාසයෝ සී හෝ මෙහෙකරුවෝ සී හෝ කම්කරුවෝ සී කියන ලද යම් කෙනෙක් වූහු නම්, ඔහුත් දඬු ගැන්මෙන් නො තෙජනු ලදුවෝ, බිය දැනැවීමෙන් නො තෙජනු ලදුවෝ, කඳුලෙන් තෙමුණු මුහුනු ඇති වැ නො ම හඬනුවෝ, (පිය බසින් ම මෙහෙයුණෝ) කටයුතු දැ කළහ. වැලි දු යම් කෙනෙක් කැමැත්තෝ නම්, ඔහු එහි කටයුතු දැය කළහ. යම් කෙනෙක් නොකැමැත්තෝ නම්, ඔහු එය නො කළහ... ගිතෙල් තලතෙල් වෙඬරු දිහි මී සකුරින් මුසු වූ කැඳ බත් ආදියෙන් ම ඒ යඥය නිමාවට පැමිණියේ ය.

26. එ කල්හි නියම්ගම්වැසි වූත් දනවුවැසි වූත් එ රජු ගේ කටයුතුවලැ යෙදී වසන බමුණෝ ද ක්ෂත්‍රියයෝ ද, නියම්ගම්වැසි වූත් දනවුවැසි වූත් ඇමැත්තෝ ද පිරිස්වැස්සෝ ද, නියම්ගම්වැසි වූත් දනවුවැසි වූත් බමුණු මහසල්කුල වැස්සෝ ද, නියම්ගම්වැසි වූත් දනවුවැසි වූත් ගැහැවි මහසල්කුල වැස්සෝ ද බොහෝ ධනය (ගැල් පුරා) නඟා ගෙන මහාවිජිත රජු කරා එළැඹැ, "දේවයන් වහන්ස, මේ බොහෝ ධනය දේවයන් වහන්සේ ම උදෙසා ගෙනෙන ලද්දේ ය. එය දේවයන් වහන්සේ පිළිගන්නා සේක් වා" සී මෙසේ කීහ.

(එයසා,) "පින්වන්නි, (තොප ධනයෙන්) කම් නැත. මගේ ද දැහැමි කරවුවරින් රැස් කළ මේ බොහෝ ධනය ඇත්තේ ය. (එ බැවින් තොප ගෙනා) ඒ ධනයත් තොපට ම වේ වා. මොබිනුත් තවත් ගෙන යවු"සී රජ කී ය.

27. ඔහු රජු විසින් නොගිවිස්නා ලද්දේ එක් පැත්තකට ගොස්, "මේ ධන නැවැත අප ගෙවලට ගෙනැ යැම අපට නො හොබනේ ය. මහාවිජිත රජු වූ කලි මහා යාගයක් කෙරෙයි. එ බැවින් අපි ඔහුට අනුයාග කරන්නමෝ වමු"සී මෙසේ කතා කැරැ ගත්හ.

අථ ඛො බ්‍රාහ්මණ පුරත්ථිමෙන යඤ්ඤවාටස්ස ඛත්තියා අනුයුත්තා නෙගමා වෙව ජානපදා ච දූතානි පටිඨපෙසුං. දක්ඛිණෙන යඤ්ඤවාටස්ස අම්බට්ඨා පාරිසජ්ජා නෙගමා වෙව ජානපදා ච දූතානි පටිඨපෙසුං. පච්ඡිමෙන යඤ්ඤවාටස්ස බ්‍රාහ්මණමහාසාලා නෙගමා වෙව ජානපදා ච දූතානි පටිඨපෙසුං. උත්තරෙන යඤ්ඤවාටස්ස ගහපතිනෙවසිකා නෙගමා වෙව ජානපදා ච දූතානි පටිඨපෙසුං. තෙසු'පි ඛො බ්‍රාහ්මණ යඤ්ඤස්ස නෙව ගාවො හඤ්ඤිංසු, න අජෙළකා හඤ්ඤිංසු, න කුක්කුටසූකරා හඤ්ඤිංසු, න විවිධා පාණා සංඝාතං ආපජ්ජිංසු, න රුක්ඛා ඡිජ්ජිංසු යූපත්ථාය, න දබ්බා ලූයිංසු බරිහිසත්ථාය. යෙ'පි තෙසං අහෙසුං දාසා'ති වා පෙස්සා'ති වා කම්මකරා'ති වා තෙ'පි න දණ්ඩතජ්ජිතා න භයතජ්ජිතා න අස්සුමුඛා රුදමානා පරිකම්මානි අකංසු. අථ ඛො යෙ ඉච්ඡිංසු තෙ අකංසු. යෙ න ඉච්ඡිංසු න තෙ අකංසු. යං ඉච්ඡිංසු, තං අකංසු. යං න ඉච්ඡිංසු, න තං අකංසු. සපිතෙලනවනීතදධිමධුඵාණිතෙන වෙව තෙ යඤ්ඤං නිට්ඨාන-මගමංසු.

28. ඉති චත්තාරො ච අනුමතිපක්ඛා, රාජා මහාවිජිතො අට්ඨහඞ්ගෙහි සමන්නාගතො, පුරොහිතො බ්‍රාහ්මණො චතුහඞ්ගෙහි සමන්නාගතො, තිස්සො ච විධා. අයං වුච්චති බ්‍රාහ්මණ තිවිධා යඤ්ඤසම්පදා සොළස-පරික්ඛාරා'ති.

29. එවං වුත්තෙ තෙ බ්‍රාහ්මණා උන්නාදිනො උච්චාසද්දමහාසද්දං අකංසු: "අහො යඤ්ඤං අහො යඤ්ඤසම්පදා"ති. කූටදන්තො පන බ්‍රාහ්මණො තුණ්හීභූතො' ව නිසින්නො හොති. අථ ඛො තෙ බ්‍රාහ්මණා කූටදන්තං බ්‍රාහ්මණං එතදවොචුං: කස්මා පන භවං කූටදන්තො සමණස්ස ගොතමස්ස සුභාසිතං සුභාසිතතො නාභිනන්දති? තී.

"නාහං හො සමණස්ස ගොතමස්ස සුභාසිතං සුභාසිතතො නාභිනන්දිං. මුද්ධාපි තස්ස විපතෙය්‍ය යො සමණස්ස ගොතමස්ස සුභාසිතං සුභාසිතතො නාභිනන්දෙය්‍ය. අපි ච මෙ හො එවං හොති: න සමණො ගොතමො එවමාහ: 'එවං මෙ සුතන්ති වා එවං අරහති භවිතුන්ති' වා. අපි ච සමණො ගොතමො: 'එවං තදා ආසි ඉත්ථං තදා ආසි'ත්තෙව භාසති. තස්ස මියාහං හො එවං හොති: "අද්ධා සමණො ගොතමො තෙන සමයෙන රාජා වා අහොසි මහාවිජිතො යඤ්ඤස්සාමි, පුරොහිතො වා බ්‍රාහ්මණො තස්ස යඤ්ඤස්ස යාජෙතා'ති. අභිජානාති පන භවං ගොතමො එවරූපං යඤ්ඤං යජිත්වා වා යාජෙත්වා වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජිතා?" තී.

බමුණ, ඉක්බිති (රජුගේ) දන්හලට පැදුම් දිගැ නිගම්වැසි වූත් දනවුවැසි වූත් රාජසේවක ක්ෂත්‍රියයෝ දන් (හල්) පිහිටුවූහ. රජුගේ දන්හලට දකුණු දිගැ නිගම්වැසි වූත් ජනවුවැසි වූත් ඇමැත්තෝත් පිරිස්වැස්සෝත් දන් (හල්) පිහිටුවූහ. (රජුගේ) දන්හලට බැසිම් දිගැ නිගම්වැසි වූත් ජනවුවැසි වූත් බමුණුමහසල්වැසියෝ දන් (හල්) පිහිටුවූහ. (රජුගේ) දන්හලට උතුරු දිගැ නිගම්වැසිවූත් ජනවුවැසි වූත් ගැහැවි මහසල් වැසියෝ දන් (හල්) පිහිටුවූහ.

බමුණ, ඒ යාගයන්හි (දානයන්හි) ද ගෙරිහු නො ම මරන ලදහ. එළුතිරෙළුවෝ නො ම මරණ ලදහ. කුකුළෝත් නො ම මරණ ලදහ. නත් සත්තු මරණයට නො පැමිණියහ. යාග සඳහා රුක්හු නො ම සිඳුනා ලදහ. වනමල් අවුණා මල් දම් කොටැ දන්හල වටා ලනු පිණිසත් කිඳ ගන්නට යාග කිමැ අතුරනු පිණිසත් කුස තණ නො ම සිඳුනා ලද්දේ ය. ඔවුන්ගේ දාසයෝ සී හෝ මෙහෙකරුවෝ සී හෝ කම්කරුවෝ සී කියන ලද යම් කෙනෙක් වූනු නම්, ඔහු දු දඬුයෙන් තෙජනා ලදුවෝ නෝ බිය දැනැවීමෙන් තෙජනා ලදුවෝ හෝ කඳුළු මුසු මුහුනැති වැ හඬන්නෝ හෝ එකි කටයුතු නො කළහ. වැලි කටයුතු කරනු කැමැතියෝ ම කටයුතු කළහ. නොකැමැතියෝ නො ම කළහ. ඒ යඥයෝ (දානයෝ) ගිතෙල් තලතෙල් වෙඬරු දිගි මී සකුරෙත් හා කැඳ බත් ආදියෙන් ම නිමාවට ගියහ.

28. බමුණ, මෙසේ යාගය කිරීමට අනුමතිය දුන් පසු සතර ද, අටගින් යුත් මහාවිජිත රජ ද, සිවුරගින් යුත් පෙරෙවි බමුණා ද, තර ව පිහිටියැ යුතු තුන් තැන් ද යන මොනු තුන් වැදැරුම් යාග සම්පතුන් සොළොස් යාග පිරිකරත් ය.

29. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ කල්හි, ඒ බමුණෝ "යාග නම් මෙසේ වුව මැනව, යාගසම්පත් නම් මේ මැ යැ" සී ගුගුරන්නෝ උස් හඬ ඇත්තෝ, මහහඬ ඇත්තෝ වූහ. කූළුදත් බමුණු වනාහි නිහඬ ව ම උන්නේ වෙයි. එ කලැ ඒ බමුණෝ කූළුදත් බමුණාට "පින්වත් කූළුදත් තෙමේ කවර හෙයින් මහණ ගොයුමාණන්ගේ සුබැසිය සුබැසි විසින් නො අනුමොවී ද?" සී කීහ.

"මම් මහණ ගොයුමන් වහන්සේගේ සුබැසිය සුබැසි විසින් නො-අනුමෙවුනෙමි නො වෙමි. යමෙක් මහණ ගොයුමන් වහන්සේගේ සුබැසිය සුබැසි විසින් නො අනුමෙවුනේ වී නම්, ඔහු හිස ගිලි හෙන්නේ ය. වැලි 'මා විසින් මෙය ඇසිණැ' සී හෝ 'මෙසේ වියැ යුතු යැ' සී හෝ මහණ ගොයුමන් වහන්සේ මෙසේ නො වදාළ සේක. එහෙත් උන් වහන්සේ 'එහු මෙසේ වී ය. එදා මෙ පරිද්දෙන් වී යැ' සී ම වදාරන සේක. හවත්නි, ඒ මට 'ඒකාන්තයෙන් මහණ ගොයුමන් වහන්සේ එ කලැ යාගස්වාමි වූ මහාවිජිත රජ හෝ වුව මැනැව, ඔහු යාගය කැරැවූ පෙරෙවි බමුණා හෝ වුව මැනැවැ'සී මෙසේ සිතෙක් වෙයි. පින්වත් ගොයුමාණන් වහන්සේ 'මෙ බඳු යඥයක් යැදූ හෝ යදවා (දානක් දී හෝ දෙවා) කාබුන් මරණින් මතු මනා ගති ඇති සග ලොවට පැමිණෙන්නේ යැ'සී පිළිනන කරන සේක් ද?" සී කූළුදත් බමුණු කී ය.

"අභිජානාමහං බ්‍රාහ්මණ එවරූපං යඤ්ඤං යජිත්වා වා යාජෙත්වා වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජිතා. අහං තෙන සමයෙන පුරොහිතො බ්‍රාහ්මණො අහොසිං තස්ස යඤ්ඤස්ස යාජෙතා"ති.

30. "අත්ථි පන භො ගොතම අඤ්ඤෙ යඤ්ඤෙ ඉමාය තිවිධාය යඤ්ඤසම්පදාය සොළසපරික්ඛාරාය අප්පඵලතරො ච අප්පසමාරම්භතරො ච මහප්ඵලතරො ච මහානිසංසතරො චා ?" ති

"අත්ථි ඛො බ්‍රාහ්මණ අඤ්ඤෙ යඤ්ඤෙ ඉමාය තිවිධාය යඤ්ඤසම්පදාය සොළසපරික්ඛාරාය අප්පඵලතරො ච අප්පසමාරම්භතරො ච මහප්ඵලතරො ච මහානිසංසතරො චා"ති.

31. කතමො පන සො භො ගොතම යඤ්ඤෙ ඉමාය තිවිධාය යඤ්ඤසම්පදාය සොළස පරික්ඛාරාය අප්පඵලතරො ච අප්පසමාරම්භතරො ච මහප්ඵලතරො ච මහානිසංසතරො චා ?" ති.

"යානි ඛො පන තානි බ්‍රාහ්මණ නිච්චදානානි අනුකූලයඤ්ඤානි සීලවන්තෙ පබ්බජිතෙ උද්දිස්ස දීයන්ති, අයං ඛො බ්‍රාහ්මණ යඤ්ඤෙ ඉමාය තිවිධාය යඤ්ඤසම්පදාය සොළසපරික්ඛාරාය අප්පඵලතරො[1] ච අප්පසමාරම්භතරො ච මහප්ඵලතරො ච මහානිසංසතරො චා"ති.

32. කො නු ඛො භො ගොතම හෙතු කො පච්චයො යෙන තං නිච්චදානං අනුකූලයඤ්ඤං ඉමාය තිවිධාය යඤ්ඤසම්පදාය සොළසපරික්ඛාරාය අප්පඵලතරඤ්ච අප්පසමාරම්භතරඤ්ච මහප්ඵලතරඤ්ච මහානිසංසතරඤ්චා ?"ති

න ඛො බ්‍රාහ්මණ එවරූපං යඤ්ඤං උපසඞ්කමන්ති අරහන්තො වා අරහත්තමග්ගං වා සමාපන්නා. තං කිස්ස හෙතු ? දිස්සන්ති හෙත්ථ බ්‍රාහ්මණ දණ්ඩප්පහාරා'පි ගලග්ගාහා'පි. තස්මා එවරූපං යඤ්ඤං න උපසඞ්කමන්ති අරහන්තො වා අරහත්තමග්ගං වා සමාපන්නා. යානි ඛො පන තානි බ්‍රාහ්මණ නිච්චදානානි අනුකූලයඤ්ඤානි සීලවන්තෙ පබ්බජිතෙ උද්දිස්ස දීයන්ති, එවරූපං ඛො බ්‍රාහ්මණ යඤ්ඤං උපසඞ්කමන්ති අරහන්තො වා අරහත්තමග්ගං වා සමාපන්නා. තං කිස්ස හෙතු ? න හෙත්ථ බ්‍රාහ්මණ දිස්සන්ති දණ්ඩප්පහාරාපි ගලග්ගාහාපි. තස්මා එවරූපං යඤ්ඤං උපසඞ්කමන්ති අරහන්තො වා අරහත්තමග්ගං වා සමාපන්නා. අයං ඛො බ්‍රාහ්මණ හෙතු අයං පච්චයො යෙන තං නිච්චදානං අනුකූලයඤ්ඤං ඉමාය තිවිධාය යඤ්ඤසම්පදාය සොළස පරික්ඛාරාය අප්පඵලතරඤ්ච අප්පසමාරම්භතරඤ්ච මහප්ඵලතරඤ්ච මහානිසංසතරඤ්චා"ති.

---

1. අප්පඵතරො (සමර)

"බමුණ මේ බදු යාගයක් කොට හෝ කරවා කාබුත්මරණින් මතු මතා ගති ඇති සග ලොවට පැමිණෙන්නේ යැ'යි පිළිත කෙරෙමි. එ සමයෙහි ඒ යාගය කරවූ පෙරෙවි බමුණා මම වීමි"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

30. "පින්වත් ගෞතමයන් වහන්ස, සොළොස් පිරිකරක් ඇති මේ තුන් වැදෑරුම් යාග සම්පතට වඩා අල්ප කටයුතු ඇති, අල්ප උත්සාහයෙන් සිදු කට හැකි (එහෙත්) වඩා මහත් පල ඇති, වඩා මහත් අනුසස් ඇති අන් යාගයෙක් ඇත්තේ ද?"යි කූළුදන් බමුණා විචාළේ ය.

"බමුණ, සොළොස් පිරිකරක් ඇති මේ තුන් යාග සම්පතට වඩා අල්ප කටයුතු ඇති, අල්ප උත්සාහයෙන් සිදු කට හැකි, වඩා මහත් පල ඇති, වඩා මහත් අනුසස් ඇති අන් යාගයෙක් ඇත්තේ යැ"යි (භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.)

31. "පින්වත් ගෞතමයන් වහන්ස, සොළොස් පිරිකරක් ඇති මේ තුන් යාග සම්පතට වඩා අල්ප කෘත්‍ය ඇති, වඩා අල්ප උත්සාහයෙන් සිදු කට හැකි, එහෙත් එයට වඩා මහත් පල ඇති, වඩා මහත් අනුසස් ඇති ඒ යාගය කවරේ ද?"යි (කූළුදන් ඇසී ය.)

"බමුණ, සිල්වත් පැවිද්දන් උදෙසා කුලපරපුරෙහි දෙන යම් නිති දන් (හැම දා ම දෙන දන්) කෙනෙක් වෙත් නම්, බමුණ, ඒ මේ යාගය මෙ කී සොළොස් පිරිකරක් ඇති තුන් යාග සම්පතට වඩා අල්ප කෘත්‍ය ඇති අල්ප උත්සාහයෙන් සිදු කට හැකි, එහෙත් එයට වඩා මහත් පලත් මහත් අනුසසුත් ඇති එකෙකැ"යි (භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.)

32. "පින්වත් ගෞතමයන් වහන්ස, ඒ නිති දෙන අනුකූල යඥය යමෙකින් සොළොස් පිරිකරක් ඇති මේ ත්‍රිවිධ යඥසම්පතට වඩා අල්ප කෘත්‍ය ඇතියෙක්, වඩා අල්පොත්සාහයෙන් සිදු කට හැකියෙක්, එහෙත් එයට වඩා මහත් පලක් මහත් අනුසසුත් ඇතියෙක් වන්නේ නම්, ඒ හේතුව ඒ ප්‍රත්‍යයය කවරේ ද?" (යි කූළුදන් පුළුවුන.)

"බමුණ, එ බදු යාගයකට (දානයකට) රහත්හු හෝ රහත්මඟ පිළිපන්නෝ හෝ නො ම එළැඹෙත්. ඒ කවර හෙයින් ද? යත්: බමුණ, එ බදු මහා යඥයෙහි 'පිළිවෙළින් සිටිවු' යන ආදීන් කියා දන් ලබන්නවුනට දඬුයෙන් පැහැරුම් ද ගෙල ගැනුම් ද දක්නා ලැබේ. එහෙයින් එබදු යඥයට රහත්හු හෝ රහත්මඟට පිළිපන්නෝ හෝ නො එළැඹෙත්. බමුණ, සිල්වත් පැවිද්දන් උදෙසා කුලපරපුරෙහි දෙන යම් නිතිදන් කෙනෙක් වෙත් නම්, එබදු යඥයට රහත්හු ද රහත්මඟට පිළිපන්නෝ ද එළැඹෙත්. ඒ කවර හෙයින? යත්: බමුණ, මෙ බදු යඥයෙහි දඬුයෙන් පැහැරුම් හෝ ගෙල ගැනුම් හෝ දක්නා නො ලැබේ එහෙයින් මෙබදු යඥයට රහත්හු ද රහත්මඟ වන්නෝ ද එළැඹෙත්. බමුණ, ඒ කුලපරපුරු දෙන නිති දන යමෙකින් මෙ කී සොළොස් පිරිකරක් ඇති ත්‍රිවිධ යඥසම්පතට, වඩා අල්ප කටයුතු ඇති, අල්ප උත්සාහයෙන් සිදු කට හැකි, එහෙත් වඩා මහත්පල ද මහත් අනුසස් ද ඇති එකෙක් වේ නම්, මේ එයට හේතුව ය, මේ ප්‍රත්‍යය ය.'

33. "අත්ථි පන භො ගොතම අඤ්ඤෙ යඤ්ඤෙ ඉමායෙ ච තිවිධායෙ යඤ්ඤසම්පදායෙ සොළසපරික්ඛාරායෙ ඉමිනා ච නිච්චදානෙන අනුකූලයඤ්ඤෙන අප්පවත්තරො ච අප්පසමාරම්භතරො ච මහප්ඵලතරො ච මහානිසංසතරො චා" ? ති.

"අත්ථි ඛො බ්‍රාහ්මණ අඤ්ඤෙ යඤ්ඤෙ ඉමායෙ ච තිවිධායෙ යඤ්ඤසම්පදායෙ සොළසපරික්ඛාරායෙ ඉමිනා ච නිච්චදානෙන අනුකූලයඤ්ඤෙන අප්පවත්තරො ච අප්පසමාරම්භතරො ච මහප්ඵලතරො මහානිසංසතරො චා"ති.

"කතමො පන සො භො ගොතම යඤ්ඤෙ ඉමායෙ ච තිවිධායෙ යඤ්ඤසම්පදායෙ සොළසපරික්ඛාරායෙ ඉමිනා ච නිච්චදානෙන අනුකූලයඤ්ඤෙන අප්පවත්තරො ච අප්පසමාරම්භතරො ච මහප්ඵලතරො ච මහානිසංසතරො චා" ? ති.

"යො ඛො බ්‍රාහ්මණ චාතුද්දිසං සඞ්ඝං උද්දිස්ස විහාරං කරොති, අයං ඛො බ්‍රාහ්මණ යඤ්ඤෙ ඉමායෙ ච තිවිධායෙ යඤ්ඤසම්පදායෙ සොළසපරික්ඛාරායෙ ඉමිනා ච නිච්චදානෙන අනුකූලයඤ්ඤෙන අප්පවත්තරො ච අප්පසමා-රම්භතරො ච මහප්ඵලතරො ච මහානිසංසතරො චා" ති.

34. "අත්ථි පන භො ගොතම අඤ්ඤෙ යඤ්ඤෙ ඉමායෙ ච තිවිධායෙ යඤ්ඤසම්පදායෙ සොළසපරික්ඛාරායෙ ඉමිනා ච නිච්චදානෙන අනුකූලයඤ්ඤෙන ඉමිනා ච විහාරදානෙන අප්පවත්තරො ච අප්පසමාරම්භතරො ච මහප්ඵල-තරො ච මහානිසංසතරො චා" ? ති

"අත්ථි ඛො බ්‍රාහ්මණ අඤ්ඤෙ යඤ්ඤෙ ඉමායෙ ච තිවිධායෙ යඤ්ඤසම්පදායෙ සොළසපරික්ඛාරායෙ ඉමිනා ච නිච්චදානෙන අනුකූලයඤ්ඤෙන ඉමිනා ච විහාරදානෙන අප්පවත්තරො ච අප්පසමාරම්භතරො ච මහප්ඵලතරො ච මහානිසංසතරො චා" ති.

"කතමො පන සො භො ගොතම අඤ්ඤෙ යඤ්ඤෙ ඉමායෙ ච තිවිධායෙ යඤ්ඤසම්පදායෙ සොළසපරික්ඛාරායෙ ඉමිනා ච නිච්චදානෙන අනුකූලයඤ්ඤෙන ඉමිනා ච විහාරදානෙන අප්පවත්තරො ච මහප්ඵලතරො ච මහානිසංස-තරො චා" ? ති.

"යො ඛො බ්‍රාහ්මණ පසන්නාචිත්තො බුද්ධං සරණං ගච්ඡති, ධම්මං සරණං ගච්ඡති, සඞ්ඝං සරණං ගච්ඡති, අයං ඛො බ්‍රාහ්මණ යඤ්ඤෙ ඉමායෙ ච තිවිධායෙ යඤ්ඤසම්පදායෙ සොළසපරික්ඛාරායෙ ඉමිනා ච නිච්චදානෙන අනුකූලයඤ්ඤෙන ඉමිනා ච විහාරදානෙන අප්පවත්තරො ච අප්පසමා-රම්භතරො ච මහප්ඵලතරො ච මහානිසංසතරො චා" ති.

35. "අත්ථි පන භො ගොතම අඤ්ඤෙ යඤ්ඤෙ ඉමායෙ ච තිවිධායෙ යඤ්ඤසම්පදායෙ සොළසපරික්ඛාරායෙ ඉමිනා ච නිච්චදානෙන අනුකූලයඤ්ඤෙන ඉමිනා ච විහාරදානෙන ඉමෙහි ච සරණගමනෙහි අප්පවත්තරො ච අප්පසමාරම්භතරො ච මහප්ඵලතරො ච මහානිසංසතරො චා" ?ති.

33. (කූළුදත්:) "පින්වත් ගෞතමයන් වහන්ස, මේ සොළොස් පිරිකරක් ඇති තුන් වැදැරුම් යාගසම්පතටත් මේ කුලපරපුරෙහි දෙන නිති දනටත් වඩා මද කටයුතු ඇති, වඩා මද උත්සාහයෙකින් සිදු කට හැකි, එහෙත් මේ හැමට වඩා මහත් පලත් මහත් අනුසසුත් ඇති අන් යඥයෙක් ඇත් ද ?"

(භාග්‍යවතුන් වහන්සේ:) "බමුණ, මේ සොළොස් පිරිකරක් තුන්-වැදැරුම් යාගසම්පතටත් කුලපරපුරෙහි දෙන නිති දනටත් වඩා මද කටයුතු ඇති, වඩා මද උත්සාහයෙකින් සිදු කට හැකි, එහෙත් ඒ හැමට වඩා මහත් පලත් මහත් අනුසසුත් ඇති අන් යඥයෙක් ඇත."

(කූළුදත්:) "පින්වත් ගෞතමයන් වහන්ස, මේ සොළොස් පිරිකරක් ඇති තුන්වැදැරුම් යාගසම්පතටත්...නිති දනටත් වඩා මද කටයුතු ඇති...වඩා මහත් අනුසස් ඇති ඒ යඥය කවරේ ද ?"

(භාග්‍යවතුන් වහන්සේ:) "බමුණ, යමෙක් වනාහි සතර දිගින් වඩනා භික්ෂුසංඝයා උදෙසා වෙහෙරක් කෙරේ නම්, ඒ මේ යඥය මෙහි පළමු කි... තුන්වැදැරුම්යාග සම්පතටත්...නිති දනටත් වඩා මද කටයුතු ඇති, වඩා මද උත්සාහයෙකින් සිදු කට හැකි, එහෙත් වඩා මහත් පල හා අනුසස් හා ඇති යඥයෙකි."

34. (කූළුදත්:) "පින්වත් ගෞතමයන් වහන්ස, මේ...ත්‍රිවිධ යඥ-සම්පතටත්...මේ විහාරදානයටත් වඩා මද කටයුතු ඇති...වඩා මහත් පල හා අනුසස් හා ඇති අන් යඥයෙක් ඇත් ද ?"

(භාග්‍යවතුන් වහන්සේ:) "බමුණ, මේ...ත්‍රිවිධ යඥසම්පතටත්...මේ විහාරදානයටත් වඩා මද කටයුතු ඇති...වඩා මහත්ඵල හා අනුසස් හා ඇති අන් යඥයෙක් ඇත."

(කූළුදත්:) "පින්වත් ගෞතමයන් වහන්ස, මේ...ත්‍රිවිධ යඥසම්පතටත් ...මේ විහාරදානයටත් වඩා මද කටයුතු ඇති...වඩා මහත් පල හා අනුසස් හා ඇති ඒ අන් යඥය කවරේ ද ?"

(භාග්‍යවතුන් වහන්සේ:) "බමුණ, යමෙක් පහන් සිතැත්තේ බුදුන් සරණ යේ ද, දහම් සරණ යේ ද, සඟ සරණ යේ ද, බමුණ, ඒ මේ යඥය වූ කලී මේ පළමු කි...ත්‍රිවිධ යඥසම්පතටත්...විහාරදානයටත් වඩා මද කටයුතු ඇති...වඩා මහත් පල හා අනුසස් හා ඇති එකෙකි."

35. (කූළුදත්:) "පින්වත් ගෞතමයන් වහන්ස, මේ...ත්‍රිවිධ යඥ-සම්පතටත්...මේ සරණ ගමනයටත් වඩා මද කටයුතු ඇති...වඩා මහත් පල හා අනුසස් හා ඇති අන් යඥයෙක් ඇත්තේ ද ?"

(භාග්‍යවතුන් වහන්සේ:) "බමුණ, මේ...ත්‍රිවිධ යඥසම්පතටත්...මේ සරණගමනයටත් වඩා මද කටයුතු ඇති...වඩා මහත් පල හා අනුසස් හා ඇති අන් යඥයෙක් ඇත."

"අත්ථි ඛො බ්‍රාහ්මණ අඤ්ඤෙ යඤ්ඤෙ ඉමාය ච තිවිධාය යඤ්ඤසම්පදාය සොළසපරික්ඛාරාය ඉමිනා ච නිච්චදානෙන අනුකූලයඤ්ඤෙන ඉමිනා ච විහාරදානෙන ඉමෙහි ච සරණගමනෙහි අප්පටිවානරො ච අප්පසමාරම්භතරො ච මහප්ඵලතරො ච මහානිසංසතරො චා"ති.

කතමො පන සො හො ගොතම අඤ්ඤෙ යඤ්ඤෙ ඉමාය ච තිවිධාය යඤ්ඤසම්පදාය සොළසපරික්ඛාරාය ඉමිනා ච නිච්චදානෙන අනුකූලයඤ්ඤෙන ඉමිනා ච විහාරදානෙන ඉමෙහි ච සරණගමනෙහි අප්පටිවානරො ච අප්පසමාරම්භතරො ච මහප්ඵලතරො ච මහානිසංසතරො චා"? ති.

"යො ඛො බ්‍රාහ්මණ පසන්නචිත්තො සික්ඛාපදානි සමාදියති පාණාතිපාතා වෙරමණිං අදින්නාදානා වෙරමණිං කාමෙසු මිච්ඡාචාරා වෙරමණිං මුසාවාදා වෙරමණිං සුරාමෙරයමජ්ජපමාදට්ඨානා වෙරමණිං, අයං ඛො බ්‍රාහ්මණ යඤ්ඤෙ ඉමාය ච තිවිධාය යඤ්ඤසම්පදාය සොළසපරික්ඛාරාය ඉමිනා ච නිච්චදානෙන අනුකූලයඤ්ඤෙන ඉමිනා ච විහාරදානෙන ඉමෙහි ච සරණගමනෙහි අප්පටිවානරො ච අප්පසමාරම්භතරො ච මහප්ඵලතරො ච මහානිසංසතරො චා"ති.

36. "අත්ථි පන හො ගොතම අඤ්ඤෙ යඤ්ඤෙ ඉමාය ච තිවිධාය යඤ්ඤසම්පදාය සොළසපරික්ඛාරාය ඉමිනා ච නිච්චදානෙන අනුකූලයඤ්ඤෙන ඉමිනා ච විහාරදානෙන ඉමෙහි ච සරණගමනෙහි ඉමෙහි ච සික්ඛාපදෙහි අප්පටිවානරො ච අප්පසමාරම්භතරො ච මහප්ඵලතරො ච මහානිසංසතරො චා"? ති.

"අත්ථි ඛො බ්‍රාහ්මණ අඤ්ඤෙ යඤ්ඤෙ ඉමාය ච තිවිධාය යඤ්ඤසම්පදාය සොළසපරික්ඛාරාය ඉමිනා ච නිච්චදානෙන අනුකූලයඤ්ඤෙන ඉමිනා ච විහාරදානෙන ඉමෙහි ච සරණගමනෙහි ඉමෙහි ච සික්ඛාපදෙහි අප්පටිවානරො ච අප්පසමාරම්භතරො ච මහප්ඵලතරො ච මහානිසංසතරො චා"? ති.

"කතමො පන සො ගොතම යඤ්ඤෙ ඉමාය ච තිවිධාය යඤ්ඤසම්පදාය සොළසපරික්ඛාරාය ඉමිනා ච නිච්චදානෙන අනුකූලයඤ්ඤෙන ඉමිනා ච විහාරදානෙන ඉමෙහි ච සරණගමනෙහි ඉමෙහි ච සික්ඛාපදෙහි අප්පටිවානරො ච අප්පසමාරම්භතරො ච මහප්ඵලතරො ච මහානිසංසතරො චා?" ති.

37. "ඉධ බ්‍රාහ්මණ තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා. සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති.

38. තං ධම්මං සුණාති ගහපති වා ගහපතිපුත්තො වා අඤ්ඤතරස්මිං වා කුලෙ පච්චාජාතො. සො තං ධම්මං සුත්වා තථාගතෙ සද්ධං පටිලභති. සො තෙන සද්ධාපටිලාභෙන සමන්නාගතො ඉති පටිසංචික්ඛති: 'සම්බාධො ඝරාවාසො රජොපථො අබ්භොකාසො පබ්බජා. නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං සඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං. යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍යන්ති.

(කූළුදත්:) "පින්වත් ගෞතමයන් වහන්ස, මේ...ත්‍රිවිධ යඥසම්පතටත් ...මේ සරණගමනයටත් වඩා මඳ කටයුතු ඇති...වඩා මහත් පල හා අනුසස් හා ඇති ඒ අන් යඥය කවරේ ද?"

(භාග්‍යවතුන් වහන්සේ:) "බමුණ, යමෙක් පහන් සිතැති වැ (ත්‍රිසරණයෙහි පිහිටා) පණිවායෙන් වැළැක්ම, අදින්නාදානයින් වැළැක්ම, කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළැක්ම, මුසවායෙන් වැළැක්ම, මදට පමාවට කරුණු වූ රහමෙරින් වැළැක්ම යන මේ සික කොටස් සමාදන් කොට ගන්නේ නම්, බමුණ මෙය මේ පළමු කී ත්‍රිවිධ යඥසම්පතටත්...මේ සරණගමනයටත් වඩා මඳ කටයුතු ඇති,..වඩා මහත් පල හා අනුසස් හා ඇති යඥයෙක."

36. (කූළුදත්:) "පින්වත් ගෞතමයන් වහන්ස, මේ...ත්‍රිවිධ යඥ-සම්පතටත් මේ සික කොටස් සමාදන් කොට ගැන්මටත් වඩා මඳ කටයුතු ඇති...වඩා මහත්පල හා අනුසස් හා ඇති අන් යඥයෙක් ඇත් ද?"

(භාග්‍යවතුන් වහන්සේ:) "බමුණ, මේ...ත්‍රිවිධ යඥසම්පතටත්...මේ සිල් කොටස් සමාදන් කොට ගැන්මටත් වඩා මඳ කටයුතු ඇති. .මහත් පල හා අනුසස් හා ඇති අන් යඥයෙක් ඇත."

(කූළුදත්:) "පින්වත් ගෞතමයන් වහන්ස, මේ ත්‍රිවිධ යඥසම්පතටත් ...මේ සිල්කොටස් සමාදන් කොට ගැන්මටත් වඩා මඳ කටයුත් ඇති...වඩා මහත් පල හා අනුසස් හා ඇති ඒ අන් යඥය කවරේ ද?"

37. (භාග්‍යවතුන් වහන්සේ) "බමුණ, අර්හත් වූ සම්‍යක්සම්බුද්ධ වූ විද්‍යාචරණසම්පන්න වූ, සුගත වූ, ලෝකවිත් වූ, තිරුඇතර පුරුෂදම්‍යසාරථි වූ, දෙව්මිනිසුන්හට ශාස්තෘ වූ, සිවුසස් අවබෝධ කළ, භාග්‍යවත් වූ, තථාගත තෙමේ මෙ ලොවැ උපදී. හේ දෙවියන් සහිත, මරුන් සහිත, බඹුන් සහිත මේ ලොව, - මහණබමුණන් සහිත, දෙව්මිනිසුන් සහිත සත්ත්‍වප්‍රජාව - තෙමේ ම විශිෂ්ට නුවණින් දැනැ පසක් කොට (ලොවට) දන්වයි. හේ මුල යහපත් මැද යහපත් අග යහපත්, අරුත් සහිත, ව්‍යංජනයෙන් නොඇඩු, හැම අතින් ම පිරිපුත් දහම් දෙසයි. පිරිසිදු සසුන් බඹසර හෙළි කෙරෙයි.

38. ගැහැවියෙක් හෝ ගැහැවිපුතෙක් හෝ අන් එක්තරා කුලයෙකැ උපන්තෙක් හෝ ඒ දහම අසයි. හේ එ දහම අසා තථාගතයන් කෙරෙහි සැදැහැව ලබයි. හේ ඒ සැදැහැ ලැබීමෙන් යුත් වැ "ගිහි ගෙයි විසීම හිරහැර සහිත ය. කෙලෙස් දූලි ගැවැසි මගෙක. පැවිද්ද වූ කලී (කිසි අවහිර නැති) එළි මහතෙක. ගිහි ගෙහි වසන්නහු විසින් ඒකාන්තයෙන් පිරිපුත් කොට, ඒකාන්තයෙන් පිරිසිදු කොට, මේ සංඛලිඛිතක බ්‍රහ්මචරියය පුරන්නට පහසු නො වේ. එ බැවින් මම් කෙසහ රවුලු බහා කාසාවත් හැඳ, ගිහි ගෙන් නික්ම පැවිද්දට වදනෙම් නම් යෙහෙකැ"යි මෙසේ නුවණින් සලකයි.

සො අපරෙන සමයෙන අප්පං වා භොගක්ඛන්ධං පහාය මහන්තං වා භොගක්ඛන්ධං පහාය අප්පං වා ඤාතිපරිවට්ටං පහාය මහන්තං වා ඤාතිපරිවට්ටං පහාය කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජති. සො එවං පබ්බජිතො සමානො පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො, අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී. සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. කායකම්මවචීකම්මෙන සමන්නාගතො කුසලෙන, පරිසුද්ධාජීවො සීලසම්පන්නො ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො භොජනෙ මත්තඤ්ඤූ සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො සන්තුට්ඨො.

39. කථඤ්ච බ්‍රාහ්මණ භික්ඛු සීලසම්පන්නො හොති? ඉධ බ්‍රාහ්මණ භික්ඛු පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණභූතහිතානුකම්පී විහරති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො හොති දින්නාදායී දින්නපාටිකඞ්ඛී. අථේනෙන සුචිභූතෙන අත්තනා විහරති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී හොති ආරාචාරී විරතො මෙථුනා ගාමධම්මා. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො හොති සච්චවාදී සච්චසන්ධො ථෙතො පච්චයිකො අවිසංවාදකො ලොකස්ස. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

පිසුණං වාචං පහාය පිසුණාය වාචාය පටිවිරතො හොති. ඉතො සුත්වා න අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය. අමුත්‍ර වා සුත්වා න ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය. ඉති භින්නානං වා සන්ධාතා සංහිතානං වා අනුප්පදාතා සමග්ගාරාමො සමග්ගරතො සමග්ගනන්දී සමග්ගකරණිං වාචං භාසිතා හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

ඵරුසං වාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතො හොති. යා සා වාචා නෙලා කණ්ණසුඛා පෙමනියා හදයඞ්ගමා පොරී බහුජනකන්තා බහුජනමනාපා, තථාරූපිං වාචං භාසිතා හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතො හොති. කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී. නිධානවතිං වාචං භාසිතා කාලෙන සාපදෙසං පරියන්තවතිං අත්ථසංහිතං. ඉදම්පි'ස්ස හොති සීලස්මිං

හේ පසු කලෙකැ මඳ වූ හෝ ධනසම්පත් හැරැ, බහොත් වූ හෝ ධනසම්පත් හැරැ, මඳ වූ හෝ නෑපිරිස හැරැ, මහත් වූ හෝ නෑ පිරිස හැරැ, කෙස රවුලු බා, කසාවත් හැඳ, ගිහි ගෙන් පැවිදි කිමට වදී. හේ මෙසේ පැවිදි වූයේ ම, පාතිමොක්ඛසංවරයෙන් ඇවුරුණේ, ආචාරයෙන් හා ගෝචරයෙන් හා සම්පූර්ණ වූයේ, මඳ වූ ද වරදෙහි බිය දක්නා සුලු වූයේ, සික්ඛාපදයන්හි සමාදන් කොටැ ගෙන හික්මෙයි. නිවැරැදි වූ කායික කර්මයන් යුත් වෙයි. පිරිසිදු දිවෙල ඇත්තේ වෙයි. සිල්වත් වෙයි. ඉඳුරන්හි වැසූ දොරැත්තේ වෙයි. බොජුනෙහි පමණ දන්නේ වෙයි. සිහිනුවණින් යුත් වෙයි. ලද පමණින් සතුටු වෙයි.

39. බමුණ, කෙසේ නම් මහණ තෙමේ ශීලසම්පන්න වේ ද ? යත්: බමුණ, මෙහි මහණ තෙමේ ප්‍රාණිවධ හැරැ ප්‍රාණිවධයෙන් වැළැක්කේ, ඉවතැ ලූ දඬු ඇත්තේ, ඉවතැ ලූ අවි ඇත්තේ, ලජ්ජා ඇත්තේ, මෙත් සිතින් යුත් වූයේ, සියලු සතුන් කෙරෙහි ඉත සිතැති වැ වෙසෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වෙයි.

අදින්නාදාන් හැරැ අදින්නාදානයින් වැළැක්කේ වෙයි. දුන් දෑය ම ගන්නේ, දුන් දෑය ම කැමැති වන්නේ, නොසොර වූ පිරිසිදු වූ සිතින් වෙසෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වෙයි.

නොබඹසර හැරැ බඹසර රක්නේ, නොබඹසරින් දුරැ වැ වසනුයේ, ගැමිදහම් වූ මෙවුන්දමින් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙකි.

මුසවා හැරැ මුසවායෙන් වැළැක්කේ, ඇත්ත කියන සුලු වූයේ, ඇත්තෙන් ඇත්ත ගළපනුයේ, තහවුරු කතා ඇත්තේ, හැඳුනියැ යුතු බස් ඇත්තේ, ලොව තො රවටනුයේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වෙයි.

පෙහෙසුන් බස් හැරැ, පෙහෙසුන් බසින් වැළැක්කේ වෙයි. මොවුන් ඔවුන්ගෙන් බිඳෙනු පිණිස මොවුන් අසා ඔබ්බෙහි නො කියන්නේ වෙයි. ඔවුන් මොවුන්ගෙන් බිඳෙනු පිණිස ඔබින් අසා මොබ්බෙහි කියන්නේ හෝ නො වෙයි. මෙසේ බිඳුණවුන් ගළපන්නේ ද ගැළැපුණවුනට අනුබල දෙන්නේ ද වෙයි. සමඟියෙන් වසන්නවුන් කෙරෙහි වසන්නට කැමැත්තේ, සමඟියෙන් වසන්නවුන් කෙරෙහි ඇලුණේ, සමඟියෙන් වසන්නවුනට සතුටු වූයේ, සමඟියේ ගුණ දක්වන වචන කියන්නේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වෙයි.

පරොස් බස් හැරැ, පරොස් බසින් වැළැක්කේ වෙයි. යම් බසෙක් නිදොස් ද, කන්කලු ද, පෙම් උපදවා ද, සුවසේ ලෙහි වදනේ ද, සියුමැලි ද, බොහෝ දෙනාට ප්‍රිය ද, බොහෝ දෙනාට මනාප ද, එ බඳු බස් තෙපලන්නේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වෙයි.

බොල් දෙඬැවිලි හැරැ, බොල් දෙඬැවිල්ලෙන් වැළැක්කේ වෙයි. කල් දැනැ කියනුයේ, සත වස් ම කියනුයේ, වැඩ ඇති බස් ම කියනුයේ, දහම් අසල බස් ම කියනුයේ, විනය අසල බස් ම කියනුයේ, සුදුසු කලැ කරුණු සහිත, සීමා සහිත, අරුත් සහිත, සිතැ ලා දැරියැ යුතු බස් කියන්නේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වෙයි.

40. බීජගාමභූතගාමසමාරම්භා පටිවිරතො හොති. එකභත්තිකො හොති රත්තූපරතො විරතො විකාලභොජනා. නච්චගීතවාදිතවිසූකදස්සනා පටිවිරතො හොති. මාලාගන්ධවිලෙපනධාරණමණ්ඩනවිභූසනට්ඨානා පටිවිරතො හොති. උච්චාසයනමහාසයනා පටිවිරතො හොති. ජාතරූපරජතපටිග්ගහණා පටිවිරතො හොති. ආමකධඤ්ඤපටිග්ගහණා පටිවිරතො හොති. ආමකමංසපටිග්ගහණා පටිවිරතො හොති. ඉත්ථිකුමාරිකපටිග්ගහණා පටිවිරතො හොති. දාසිදාසපටිග්ගහණා පටිවිරතො හොති. අජෙළකපටිග්ගහණා පටිවිරතො හොති. කුක්කුටසූකරපටිග්ගහණා පටිවිරතො හොති. හත්ථිගවාස්සවළවාපටිග්ගහණා පටිවිරතො හොති. ඛෙත්තවත්ථුපටිග්ගහණා පටිවිරතො හොති. දූතෙය්‍යපහිණගමණානුයොගා පටිවිරතො හොති. කයවික්කයා පටිවිරතො හොති. තුලාකූටකංසකූටමානකූටා පටිවිරතො හොති. උක්කොටනවඤ්චනනිකතිසාදියොගා පටිවිරතො හොති. ඡේදනවධබන්ධනවිපරාමොසආලොපසහසාකාරා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

(චුල්ලසීලං නිට්ඨිතං.)

41. යථා වා පනෙකෙ හොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං බීජගාමභූතගාමසමාරම්භං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: මූලබීජං ඛන්ධබීජං ඵළුබීජං අග්ගබීජං බීජබීජමෙව පඤ්චමං. ඉති වා ඉතිඵවරූපා බීජගාමභූතගාමසමාරම්භා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

42. යථා වා පනෙකෙ හොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං සන්නිධිකාරපරිභොගං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං අන්නසන්නිධිං පානසන්නිධිං වත්ථසන්නිධිං යානසන්නිධිං සයනසන්නිධිං ගන්ධසන්නිධිං ආමිසසන්නිධිං. ඉති වා ඉතිඵවරූපා සන්නිධිකාරපරිභොගා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

43. යථා වා පනෙකෙ හොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විසූකදස්සනං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: නච්චං ගීතං වාදිතං පෙක්ඛං අක්ඛානං පාණිස්සරං වෙතාලං කුම්භථූනං සොභනගරකං චණ්ඩාලං වංසං ධොපනං හත්ථියුද්ධං අස්සයුද්ධං මහිංසයුද්ධං උසභයුද්ධං අජයුද්ධං මෙණ්ඩකයුද්ධං කුක්කුටයුද්ධං වට්ටකයුද්ධං දණ්ඩයුද්ධං මුට්ඨියුද්ධං නිබ්බුද්ධං උය්‍යොධිකං බලග්ගං සෙනාබ්‍යූහං අනීකදස්සනං. ඉති වා ඉතිඵවරූපා විසූකදස්සනා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

40. හේ පැල වන දැ ද පැල වුණු දැ ද සිදුම් ඇ විකොවුනෙන් වැළැක්කේ වෙයි. රැ බොජුනෙන් වැළැක්කේ, විකල් බොජුනෙන් වෙන් වූයේ, එක් බතක් ඇත්තේ වෙයි. නටනු ගනු වයනු විසුළුදස්නෙන් වැළැක්කේ වෙයි. සැරැසීමටත් උනු තැන් පිරැවුමටත් කරුණු වූ මල් ගඳ විලෙවුන් දැරැමෙන් වැළැක්කේ වෙයි. උසස්නෙන් මහ අස්නෙන් වැළැක්කේ වෙයි. රන් රිදී පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. අමු ධාන්‍ය පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. අමු මස් පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. ගැහැණුන් දැරියන් පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. දාසිදාසන් පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. එළුවන් කිරෙළුවන් පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. කුකුළන් හූරන් පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. ඇතුන් ගෙරින් අසුන් වෙළෙඹුන් පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. කෙත් වත් පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. කිසිනට දූත මෙහෙවර කිරීමෙන්, ගෙන් ගෙට යන කුඩා මෙහෙවරින් යන දෙකෙන් ම වැළැක්කේ වෙයි. ගනුදෙනුයෙන් වැළැක්කේ වෙයි. තුලාකූට කංසකූට මානකූටයෙන් වැළැක්කේ වෙයි. උකෙකාටන වංචන නිකති සාවියොගයෙන් වැළැක්කේ වෙයි. ඡේදන වධ බන්ධන විපරාමොස ආලොප සහසාකාර යන මෙයින් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වෙයි.

(සුළු ශීල් නිමියේ ය.)

41. යම්සේ වනාහි ඇතැම් භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, පැල වන මුල්, පැල වන කඳ, පැල වන පුරැක්, පැල වන ඛොළිස්, පස් වනු පැල වන ඇට යන මෙබඳු පැල වන දැයත් පැල වුණු දැයත් සිදුම් බිඳුම් ආදියෙහි යෙදී වෙසෙත් ද, මෙසේ මේ හෝ මෙබඳු වූ පැල වන දැය පැල වුණු දැය සිදුම් බිඳුම් ඇ විකොපනයෙන් හේ වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

42. යම්සේ වනාහි ඇතැම් භවත් මහණ බමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, අන්නසන්නිධි පානසන්නිධි වස්ත්‍රසන්නිධි යානසන්නිධි ශයනසන්නිධි ගන්ධසන්නිධි ආමිෂසන්නිධි යන මෙබඳු වූ සන්නිධිකාර පරිභොගයෙහි යෙදුණෝ වෙසෙත් ද, හේ මේ ආදි වූ හෝ අන් මෙබඳු වූ හෝ සන්නිධිකාර පරිභොගයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වෙයි.

43. යම්සේ වනාහි ඇතැම් භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, නැටුම් ගැයුම්, නට සමජ්ජා, ආඛ්‍යාන, පාණිස්වර, වෙතාල, කුම්භථූන, ශොභනක, සණදෙවුන්කෙළි, උන ගස් ඔසාවා ගෙන කැරෙන ක්‍රීඩා, අස්පිඨාවන, ඇත්පොර, අස්පොර, මිගුපොර, ගොන්පොර, එළුපොර, බැටළුපොර, කුකුළුපොර, වටුපොර, පොලුහරඹ, මිටුයුද, මල්ල පොර, යුද පවත්නා තැන් දක්නට යෑම, බලසෙන් ගණිනා තැන් දක්නට යෑම, බලසෙන් බෙදන තැනට යෑම, බල ඇණි දක්නට යෑම යන විසුළු දසුන්හි යෙදී වෙසෙත් ද, හෙ තෙමේ මේ ආදි වූ හෝ මෙබඳු වූ විසුළු දස්නෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වෙයි.

44. යථා වා පනෙකෙ හොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි හොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං ද්‍යූතප්පමාදට්ඨානානුයොගං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: අට්ඨපදං දසපදං ආකාසං පරිහාරපථං සන්තිකං ඛලිකං ඝටිකං සලාකහත්थං අක්ඛං පඞ්ගචීරං වඞ්කකං මොක්ඛචිකං චිඞ්ගුලකං පත්තාළ්හකං රථකං ධනුකං අක්ඛරිකං මනෙසිකං යථාවජ්ජං. ඉති වා ඉතිඑවරූපා ද්‍යූතප්පමාදට්ඨානානුයොගා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

45. යථා වා පනෙකෙ හොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි හොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං උච්චාසයනමහාසයනං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: ආසන්දිං පල්ලඞ්කං ගොනකං චිත්තකං පටිකං පටලිකං තූලිකං විකතිකං උද්දලොමිං එකන්තලොමිං කට්ඨිස්සං කොසෙය්‍යං කුත්තකං හත්थත්थරං අස්සත්थරං රථත්थරං අජිනප්පවෙණිං කාදලිමිග-පවරපච්චත්थරණං සඋත්තරච්ඡදං උභතොලොහිතකූපධානං. ඉති වා ඉති එවරූපා උච්චාසයනමහාසයනා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

46. යථා වා පනෙකෙ හොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි හොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං මණ්ඩනවිභූසනට්ඨානානුයොගං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: උච්ඡාදනං පරිමද්දනං නහාපනං සම්බාහනං ආදාසං අඤ්ජනං මාලාවිලෙපනං මුඛචූණ්ණකං මුඛලෙපනං හත්थබන්ධං සිඛාබන්ධං දණ්ඩකං නාළිකං ඛග්ගං ඡත්තං චිත්‍රූපාහනං උණ්හීසං මණිං වාලවීජනිං ඔදාතානි වත්थානි දීඝදසානි. ඉති වා ඉතිඑවරූපා මණ්ඩනවිභූසනට්ඨානානුයොගා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

47. යථා වා පනෙකෙ හොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි හොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං තිරච්ඡානකථං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: රාජකථං චොරකථං මහාමත්තකථං සෙනාකථං භයකථං යුද්ධකථං අන්නකථං පානකථං වත්थකථං සයනකථං මාලාකථං ගන්ධකථං ඤාතිකථං යානකථං ගාමකථං නිගමකථං නගරකථං ජනපදකථං ඉත්थිකථං පුරිසකථං [කුමාරකථං කුමාරිකථං] සූරකථං විසිඛාකථං කුම්භට්ඨානකථං පුබ්බපෙතකථං නානත්තකථං ලොකක්ඛායිකං සමුද්ද-ක්ඛායිකං ඉතිභවාභවකථං. ඉති වා ඉතිඑවරූපාය තිරච්ඡානකථාය පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

44. යම් සේ වනාහි ඇතැම් භවත් මහණ බමුණෝ සැදැහෙන් දුන් බොජුන් වළඳ, අවපාකෙළිය, දසපාකෙළිය, අහස් දැකෙළිය, මඩුලු පැනුම්, සන්තිකාක්‍රීඩාව, ගුඩු කෙළිය, කල්ලි ගෑසුම්, සලාඅත්කෙළිය, ගුලකෙළිය, කොළනලා පිඹීම්, කෙළිතගුලින් හෑම්, කරනම් ගෑසුම්, කත්තන්ගුරුවා කෙළිය, කොළනැලියෙන් වැලි ඇ මැනුම්, කෙළිරිය පැදවීම්, කුඩා දුන්නෙන් පිදීම්, ඇකිරිකෙළිය, සිතු දැ කීමේ ක්‍රීඩාව, විකලාංගානුකරණය යන මේ ආදි වූ හෝ මෙබඳු වූ, පමාවට කරුණු වූ දැකෙළියෙහි යෙදී වෙසෙන් ද, හෙ තෙමේ මේ ආදි හෝ මෙබඳු වූ දැකෙළියෙහි යෙදීමෙන් වැළැකියේ වෙයි.

මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

45. යම් සේ වනාහි ඇතැම් භවත් මහණ බමුණෝ සැදැහෙන් දුන් බොජුන් වළඳ, දික්සඟලාපුවු ය, පළඟ ය, මහකොදුපලස ය, වියමනෙන් විසිතුරු කළ එළුලොම්මුවා ඇතිරිය, රන්කසුකම් කළ පසතුරුණය, කෞශෙය්‍ය හුසින් විසූ ඇතිරිය, අසු පිටැ එළන ඇතිරිය, රියැ එළන ඇතිරිය, ඇඳට සරි ලන සේ අඳුන් දිවිසමින් මසා කළ ඇතිරිය, කෙහෙල්මුවසමින් කළ මහඟු පසතුරුණ, ඉස්රෙරැ පාමුලැ රතු කොවට තබා ඇති රතු උඩු වියන් සහිත මහඟු යහන යන මේ ආදි වූ හෝ මෙබඳු වූ උස්යහන් මහයහන් පරිහරණය කැරුමෙහි යෙදී වෙසෙද්ද හෙ තෙමේ මේ ආදි වූ හෝ මේ බඳු වූ උස් යහන් මහ යහන් පරිභෝගයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වෙයි.

46. යම්සේ වනාහි ඇතැම් භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, කුඩා දරුවන් කිරි සුවඳ හරනට සුවඳ සුණුයෙන් ඉළීම්, මඩා සටහන් ගත්වනුවට අත් පා ඇති තෙල් ගා මැඬීම්, සුවඳ දියෙන් නෑවීම්, මස් වැඩෙනුවට මුගුරින් තැළීම්, කැඩපතින් මුහුණ බැලීම්, සැරැසුම් විසින් අඳුන් ගෑම්, මල් හා පිලෙවුන් හා දැරීම්, මුව සුණු හා මුවවිලෙවුන් හා දැරීම්, අත්බරණ දැරීම්, හිසැ කුඩුම්බිය බැඳීම්, විසිතුරු සැරසැපි දැරීම්, විසිතුරු බෙහෙත් තළ දැරීම්, කඩු දැරීම්, විසිතුරු කුඩ දැරීම්, විසිතුරු පාවහන් දැරීම්, තලල්පට බැඳීම්, සිළුමිණි පැලැඳීම්, විසිතුරු සෙමෙර වල්විදුනා දැරීම්, දික් දවලු ඇති සුදු රෙදි හැඳීම් යන ආදි ඇඟ අඩු තැන් පිරවීමටත් ඇඟ සැරැසීමටත් කරුණු වූ දැ පරිභෝග කැරැමෙහි යෙදී වෙසෙද්ද, හේ මහණ එබඳු දැය පරිභෝග කිරීමෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

47. යම්සේ වනාහි ඇතැම් භවත් මහණබමුණෝ සැදැහෙන් දුන් බොජුන් වළඳ, රාජකථා චෝරකථා මහාමාත්‍රකථා සෙනාකථා භයකථා යුද්ධකථා ආහාරකථා පානකථා වස්ත්‍රකථා ශයනකථා ගන්ධකථා ඥාතිකථා යානකථා ග්‍රාමකථා නිගමකථා නගරකථා ජනපදකථා ස්ත්‍රීකථා පුරුෂකථා කුමාරකථා කුමාරිකථා ශූරකථා කුම්භස්ථානකථා පූර්වප්‍රේතකථා නානාත්ව-කථා ලෝකාඛ්‍යායිකාකථා සමුද්‍රාඛ්‍යායිකාකථා ඉතිභවාභවකථා යන මේ හෝ මෙබඳු වූ තිරිසන් කතාවලැ යෙදී වෙසෙන් ද, ඒ මහණ මේ ආදි හෝ මෙයින් අන්‍ය වූ හෝ මෙ බඳු කථාවලින් වැළැක්වෝ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වෙයි.

48. යථා වා පනෙකෙ භොතො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විග්ගාහිකකථං අනුයුත්තා විහරන්ති: සෙය්‍යථිදං: 'න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි, අහං ඉමං ධම්මවිනයං ආජානාමි. කිං ත්වං ඉමං ධම්මවිනයං ආජානිස්සසි? මිච්ඡාපටිපන්නො ත්වමසි, අහමස්මි සම්මාපටිපන්නො. සහිතං මෙ අසහිතං තෙ. පුරෙ වචනීයං පච්ඡා අවච. පච්ඡා වචනීයං පුරෙ අවච. අවිචිණ්ණං තෙ විපරාවත්තං. ආරොපිතො තෙ වාදො. නිග්ගහිතො'සි. චර වාදප්පමොක්ඛාය, නිබ්බෙඨෙහි වා සචෙ පහොසි'ති. ඉති වා ඉතිඑවරූපාය විග්ගාහිකකථාය පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

49. යථා වා පනෙකෙ භොතො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං දූතෙය්‍යපහිණගමනානුයොගමනුයුත්තා විහරන්ති. සෙය්‍යථිදං: රාජූනං රාජමහාමත්තානං ඛත්තියානං බ්‍රාහ්මණානං ගහපතිකානං කුමාරානං: ඉධ ගච්ඡ, අමුත්‍රාගච්ඡ, ඉදං හර, අමුත්‍ර ඉදං ආහරාති. ඉති වා ඉතිඑවරූපා දූතෙය්‍යපහිණගමනානුයොගා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

50. යථා වා පනෙකෙ භොතො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ කුහකා ච හොන්ති ලපකා ච නෙමිත්තිකා ච නිප්පෙසිකා ච ලාභෙන ලාභං නිජිගිංසිතාරො ච. ඉති වා ඉතිඑවරූපා කුහනලපනා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

(මජ්ඣිමසීලං නිට්ඨිතං.)

51. යථා වා පනෙකෙ භොතො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති. සෙය්‍යථිදං: අඞ්ගං නිමිත්තං උප්පාදං සුපිණං ලක්ඛණං මූසිකවස්සිකං අග්ගිහොමං දබ්බිහොමං තුසහොමං කණහොමං තණ්ඩුලහොමං සප්පිහොමං තෙලහොමං මුඛහොමං ලොහිතහොමං අඞ්ගවිජ්ජා වත්‍රුවිජ්ජා ඛත්තවිජ්ජා සිවවිජ්ජා භූතවිජ්ජා භූරිවිජ්ජා අහිවිජ්ජා විසවිජ්ජා විච්ඡිකවිජ්ජා මූසිකවිජ්ජා සකුණවිජ්ජා වායසවිජ්ජා පක්කජ්ඣානං සරපරිත්තානං මිගචක්කං. ඉති වා ඉතිඑවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

48. යම්සේ වනාහි ඇතැම් භවත් මහණ බමුණෝ සැදැහෙන් දුන් බොජුන් වළඳ, "තෝ මේ දහම් විනය නො දනිහි. මම ම මේ දහම් විනය දනිමි. 'කිමැ යි මේ දහම් විනය තෝ දනිහි ද? තෝ වරදවා පිළිපන්නෙහි. මම මැනැවින් පිළිපන්නෙමි වෙමි. මා බස කරුණු සහිත ය. තා බස කරුණු රහිත ය. තෝ පළමුයෙන් කියැ යුත්ත පසු වැ කියයි ය. පසු වැ කියැ යුත්ත පළමුයෙන් කියයි ය. තා කලක් ම පුහුණු කළ දෑය මගේ එක් වචනයෙන් ම පෙරැළී ගියේ ය. මා විසින් තට දොස් නැගිණ. මා විසින් තෝ නිගැනුණෙහි. මා නැඟ දෙසින් මිදෙන්නට හැසිරෙව. හැකි නම් එය විසඳව" යන ආදීන් මේ බඳු වූ ඊනුත් බැණ දෙඩා ගැනුම්හි යෙදී වෙසෙත් ද, ඒ මහණ තෙමේ මේ කී හෝ අන් මේබඳු වූ හෝ බැණ දෙඩා ගැනුම්වලින් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලය වෙයි.

49. යම්සේ වනාහි ඇතැම් භවත් මහණබමුණෝ සැදැහෙන් දුන් බොජුන් වළඳ, "මෙහි යන්නැ, අසෝ තැනට එන්නැ. මෙය ගෙන යන්නැ. අසෝ තැනට මෙය ගෙනෙන්නැ" යි කල තියාග පිළිගෙන, රජුන්ගේ රජමහමැතියන්ගේ ක්ෂත්‍රියයන්ගේ බමුණන්ගේ ගැහැවියන්ගේ රජකුමරුවන්ගේ මේබඳු දූත මෙහෙවරෙහි පණිවුඩ ගෙනැ යැමෙහි යෙදී වෙසෙත් ද, ඒ මහණ තෙමේ මේ කී හෝ අන් මෙ වැනි හෝ දූත මෙහෙවරින් පණිවුඩ ගෙනැ යැමෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලය වේ.

50. යම්සේ වනාහි ඇතැම් භවත් මහණබමුණෝ සැදැහෙන් දුන් බොජුන් වළඳ කුහක කම් කරන්නෝ වෙත් ද, ලාභ සත්කාර පතා අනුන් සිත් ඇදෙන සේ වූ වාදු බස් දෙඩන්නෝ වෙත් ද, සිවු පසය ලබනු සඳහා කයින් හෝ බසින් ඇඟැවීම් කරන්නෝ වෙත් ද, ලාභාපෙක්ෂායෙන් අනුනට ගරහන්නෝ වෙත් ද, ලාභයෙන් ලාභය සොයන්නෝ වෙත් ද, ඒ මහණ තෙමේ මේ කී හෝ මේබඳු වූ හෝ කුහනලපනවලින් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලය වේ.

(මැදුම් සිල් නිමිසේ ය.)

51. යම්සේ වනාහි සමහර මහණ බමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ අංගශාස්ත්‍රය, නිමිත්ත ශාස්ත්‍රය, උත්පාතලක්ෂණය, සුවප්නශාස්ත්‍රය, පුරුෂලක්ෂණශාස්ත්‍රය, මූෂිකවික්‍රාන්තවිද්‍යාව, අග්නිහෝමය, දර්වීහෝමය, තුෂහෝමය, කණහෝමය, තණ්ඩුලහෝමය, සර්පිර්හෝමය, තෛලහෝමය, මුඛහෝමය, ලෝහිතහෝමය, අංගවිද්‍යාව, වාස්තුවිද්‍යාව, ක්ෂත්‍රවිද්‍යාව, ශිවවිද්‍යාව, භූතවිද්‍යාව, භූරිවිද්‍යාව, අහිවිද්‍යාව, විෂවිද්‍යාව, වෘශ්චිකවිද්‍යාව, මූෂිකවිද්‍යාව, ශාකුනවිද්‍යාව, වායසවිද්‍යාව, පක්වඛ්‍යානය, ශරපරිත්‍රාණය, මෘගපක්ෂය යන මෙකී හෝ මේබඳු වූ හෝ තිරශ්චීනවිද්‍යයෙන් මිථ්‍යාආජීවයෙන් දිවි පවත්වන් ද, ඒ මහණ තෙමේ මෙකී හෝ මේබඳු තිරශ්චීන විද්‍යයෙන් මිථ්‍යා-ජීවයෙන් වැළැක්කේ වේ. මේ ද ඔහුගේ ශීලය වේ.

52. යථා වා පනෙකෙ භොතො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති. සෙය්‍යථිදං: මණිලක්ඛණං වත්ථලක්ඛණං දණ්ඩලක්ඛණං අසිලක්ඛණං උසුලක්ඛණං ධනුලක්ඛණං ආවුධලක්ඛණං ඉත්ථිලක්ඛණං පුරිසලක්ඛණං කුමාරලක්ඛණං කුමාරිලක්ඛණං දාසලක්ඛණං දාසිලක්ඛණං හත්ථිලක්ඛණං අස්සලක්ඛණං මහිසලක්ඛණං උසභලක්ඛණං ගොලක්ඛණං අජලක්ඛණං මෙණ්ඩලක්ඛණං කුක්කුටලක්ඛණං වට්ටකලක්ඛණං ගෝධා-ලක්ඛණං කණ්ණිකාලක්ඛණං කච්ඡපලක්ඛණං මිගලක්ඛණං. ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

53. යථා වා පනෙකෙ භොතො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථිදං: රඤ්ඤං නිය්‍යානං භවිස්සති, රඤ්ඤං අනිය්‍යානං භවිස්සති, අබ්භන්තරානං රඤ්ඤං උපයානං භවිස්සති, බාහිරානං රඤ්ඤං අපයානං භවිස්සති, බාහිරානං රඤ්ඤං උපයානං භවිස්සති, අබ්භන්තරානං රඤ්ඤං අපයානං භවිස්සති, අබ්භන්තරානං රඤ්ඤං ජයො භවිස්සති, බාහිරානං රඤ්ඤං පරාජයො භවිස්සති, බාහිරානං රඤ්ඤං ජයො භවිස්සති, අබ්භන්තරානං රඤ්ඤං පරාජයො භවිස්සති, ඉති ඉමස්ස ජයො භවිස්සති, ඉමස්ස පරාජයො භවිස්සති. ඉති වා ඉතිඑවරූපාය තිරච්ඡාන-විජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

54. යථා වා පනෙකෙ භොතො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථිදං: චන්දග්ගාහො භවිස්සති, සුරියග්ගාහො භවිස්සති, නක්ඛත්තග්ගාහො භවිස්සති, චන්දිමසුරියානං පථගමනං භවිස්සති, චන්දිමසුරියානං උපපථගමනං භවිස්සති, නක්ඛත්තානං පථගමනං භවිස්සති, නක්ඛත්තානං උපපථගමනං භවිස්සති, උක්කාපාතො භවිස්සති, දිසාඩාහො භවිස්සති, භූමිචාලො භවිස්සති, දෙවදුන්දුභි භවිස්සති, චන්දිමසුරියනක්ඛත්තානං උග්ගමනං ඔගමනං සංකිලෙසං වොදානං භවිස්සති, එවංවිපාකො චන්දග්ගාහො භවිස්සති, එවංවිපාකො සුරියග්ගාහො භවිස්සති, එවංවිපාකො නක්ඛත්තග්ගාහො භවිස්සති, එවංවිපාකං චන්දිමසුරියානං පථගමනං භවිස්සති, එවංවිපාකං චන්දිමසුරියානං උපපථගමනං භවිස්සති, එවංවිපාකං නක්ඛත්තානං පථගමනං භවිස්සති, එවංවිපාකං නක්ඛත්තානං උපපථගමනං භවිස්සති, එවංවිපාකො උක්කාපාතො භවිස්සති, එවංවිපාකො දිසාඩාහො භවිස්සති, එවංවිපාකො භූමිචාලො භවිස්සති, එවංවිපාකො දෙවදුන්දුභි භවිස්සති, එවංවිපාකං චන්දිමසුරියනක්ඛත්තානං උග්ගමනං ඔගමනං සඞ්කිලෙසං වොදානං භවිස්සති, ඉති වා ඉතිඑවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

52. යම්සේ වනාහි ඇතැම් පින්වත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, මිණිලකුණුය, දඬුලකුණුය, වත්ලකුණුය, කඩුලකුණුය, ඊලකුණුය, දුනුලකුණුය, අවිලකුණුය, ඉතිරිලකුණුය, පුරිස්ලකුණුය, කුමරලකුණුය, කුමරිලකුණුය, දස්ලකුණුය, දැසිලකුණුය, ඇත්ලකුණුය, අස්ලකුණුය, මිසුලකුණුය, වහප්ලකුණුය, ගොන්ලකුණුය, එළුලකුණුය, බැටළුලකුණුය, කුකුළුලකුණුය, වටුලකුණුය, ගොස්ලකුණුය, කැණිලකුණුය, කසුබුලකුණුය, මුවලකුණුය යන ආදි මෙබඳු තිරශ්චීන විද්‍යයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ තෙමේ මේ කී හෝ මෙබඳු දැසින් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

53. යම්සේ වනාහි ඇතැම් පින්වත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, 'අසෝ දිනැ අසෝ නැකැතින් අසෝ රජුන් (ශුද්‍ර සඳහා) සිය නුවරින් නික්මීම වන්නේ ය, අසෝ නැකැතින් පෙරළා සිය නුවරට ඒම වන්නේ ය. අසෝ නැකැතින් රට තුළැ හුන් රජුන් පිටතැ සිටින සතුරු රජුන් හමු වන්නට යෑම වන්නේ ය. අසෝ නැකැතින් පිටතැ සිටින සතුරු රජුන් ඉවත් වැ යෑම වන්නේ ය. අසෝ නැකැතින් පිටතැ සිටින සතුරු රජුන් රට තුළැ සිටින රජුන් කරා පැමිණීම වන්නේ ය. අසෝ නැකැතින් ඇතුළතැ සිටින රජුන්ගේ ඉවත් වැ යෑම වන්නේ ය...රට තුළැ රජුනට ජය වන්නේ ය. පිටතැ සිටින සතුරු රජුනට පරාජය වන්නේ ය. පිටතැ සිටින සතුරු රජුනට ජය වන්නේ ය. ඇතුළතැ සිටින රජුනට පරාජය වන්නේ යැ''යි මෙසේ 'මොහුට ජය වන්නේ ය, මොහුට පරාජය වන්නේයැ' යි කියමින් මෙබඳු තිරශ්චීනවිද්‍යයෙන්, මෙබඳු මිථ්‍යාආජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ තෙමේ මේ හෝ මෙබඳු වූ තිරශ්චීන විද්‍යයෙන් මිථ්‍යාආජීවයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලය වේ.

54. යම්සේ වනාහි ඇතැම් පින්වත් මහණබමුණෝ සැදැහෙන් දුන් බොජුන් වළඳ, ''අසෝ දිනැ චන්ද්‍රග්‍රහණය වන්නේ ය, අසෝ දිනැ සූර්‍යග්‍රහණය වන්නේ ය, අසෝ දිනැ නක්ෂත්‍රග්‍රහණය වන්නේ ය, අසෝ දිනැ සඳහිරුන් නිසි මඟින් යෑම වන්නේ ය, අසෝ දිනැ ඔවුන් නො-මඟින් යෑම වන්නේ ය, අසෝ දිනැ නකත්තරුන් සුමඟින් යෑම වන්නේ ය, අසෝ දිනැ ඔවුන් නොමඟින් යෑම වන්නේ ය, අසෝ දිනැ උල්කාපතනය වන්නේ ය,...දිග්දහය වන්නේ ය,...භූමිකම්පා වන්නේ ය,... වැසි නැති වැ අහස් ගෙරැවුම් වන්නේ ය,...සඳහිරුන් නකත්තරුන් උදුව, බැසීම, කෙලෙසීම, පිරිසිදු බව වන්නේ ය, සූර්‍යග්‍රහණය ලොවට මෙබඳු පල දෙන්නේ ය, චන්ද්‍රග්‍රහණය මෙබඳු පල දෙන්නේ ය, සඳුහිරුන් සුමඟින් යෑම මෙබඳු පල ගෙනැ දෙන්නේ ය, ඔවුන් නොමඟින් යෑම මෙබඳු පල ගෙනැ දෙන්නේ ය, නකත්තරුන් නිසි මඟින් යෑම මෙබඳු පල ගෙනැ දෙන්නේ ය, ඔවුන් නොමඟින් යෑම මෙබඳු පල ගෙනැ දෙන්නේ ය, උල්කාපතනය මෙබඳු පල ගෙනැ දෙන්නේ ය, දිග්දහය මෙබඳු පල ගෙනැ දෙන්නේ ය, භූමිකම්පනය මෙබඳු පල ගෙනැ දෙන්නේ ය, වැසි නැති වැ අහස් ගෙරැවුම් මෙබඳු පල ගෙන දෙන්නේ ය, සඳහිරුන්ගේ ද නකත්තරුන්ගේ ද උදුවත් බැසීමත් කෙලෙසීමත් පිරිසිදු වීමත් මෙබඳු මෙබඳු පල ගෙන දෙන්නේ යැ''යි කියනුවෝ, මෙබඳු තිරශ්චීන විද්‍යයෙන් මෙබඳු මිථ්‍යා ආජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ තෙමේ මේ හෝ මෙබඳු තිරශ්චීනවිද්‍යයෙන් මිථ්‍යා ආජීවයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලය වේ.

55. යථා වා පනෙකෙ හොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි හොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති: සෙය්‍යථිදං: සුබ්බුට්ඨිකා භවිස්සති, දුබ්බුට්ඨිකා භවිස්සති, සුභික්ඛං භවිස්සති, දුබ්භික්ඛං භවිස්සති, ඛෙමං භවිස්සති, භයං භවිස්සති, රොගො භවිස්සති, ආරොග්‍යං භවිස්සති. මුද්දා ගණනා සංඛානං කාවෙය්‍යං ලොකායතං, ඉති වා ඉතිඑවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

56. යථා වා පනෙකෙ හොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි හොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථිදං: ආවාහනං විවාහනං සාවදනං විවදනං සංකිරණං විකිරණං සුභගකරණං දුබ්භගකරණං විරුද්ධගබ්භකරණං ජිව්හානිත්ථම්භනං හනුසංහනනං හත්ථාභිජප්පනං කණ්ණජප්පනං ආදාසපඤ්හං කුමාරිපඤ්හං දෙවපඤ්හං ආදිච්චුපට්ඨානං මහතුපට්ඨානං අබ්භුජ්ජලනං සිරවිරෙචනං. ඉති වා ඉතිඑවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

57. යථා වා පනෙකෙ හොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි හොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථිදං: සන්තිකම්මං පණිධිකම්මං [භූතකම්මං] භූරිකම්මං වස්සකම්මං වොස්සකම්මං වත්ථුකම්මං වත්ථුපරිකිරණං ආචමනං නහාපනං පුඤ්ඤං වමනං විරෙචනං උද්ධවිරෙචනං අධොවිරෙචනං සීසවිරෙචනං කණ්ණතෙලං තෙත්තතපනං නත්ථුකම්මං අඤ්ජනං පච්චඤ්ජනං සාලාකියං සල්ලකත්තියං දාරකතිකිච්ඡා මූලභෙසජ්ජානං අනුප්පදානං ඔසධීනං පටිමොක්ඛා. ඉති වා ඉතිඑවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

55. යම්සේ වනාහි ඇතැම් පින්වත් මහණබමුණෝ සැදැහෙන් දුන් බොජුන් වළඳ, "මෙ සමයෙහි වැසි වස්නේ ය, මෙ සමයෙහි නියං වන්නේ ය, මෙ සමයෙහි රට සුභික්ෂ වන්නේ ය, මෙ සමයෙහි රට දුර්භික්ෂ වන්නේ ය, මෙ සමයෙහි රටට උවදුරු නැති වන්නේ ය, මෙ සමයෙහි රටට උවදුරු ඇති වන්නේ ය, මෙ කලැ රොග වන්නේ ය, මෙ කලැ රොග නැති බව වන්නේ ය' යි පලාපල කීම ද, මුද්‍රාව (ඇඟිලි පුරැක්හි සංඛ්‍යා තබා ගිණීම) ද, ගණනාව (එක දෙක යන ආදීන් ගණන් කිරීම) ද, සංඛ්‍යානය (පිණ්ඩගණනාව) ද, කව් සතර ද, ලොකායත ශාස්ත්‍රය ද යන මේ හෝ අන් මෙ බඳු වූ තිරශ්චීන විද්‍යයෙන්, මිථ්‍යා ආජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ තෙමේ මේ ආදි වූ හෝ අන් මෙබඳු වූ තිරශ්චීනවිද්‍යයෙන්, මිථ්‍යාආජීවයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහු-ගේ ශීලය වේ.

56. යම්සේ වනාහි ඇතැම් භවත් මහණබමුණෝ සැදැහෙන් දුන් බොජුන් වළඳ, ආවාහ සඳහා නකත් කීම, විවාහ සඳහා නකත් කීම, වෙන් වූ අඹු සැමියන් එක් වන්නට නකත් කීම, දුන් ණය රැස් කිරීමට නකත් කීම, මුදල් ණයට පොලියට දීමට නකත් කීම, සෞභාග්‍යය ඇති වනුවට යන්ත්‍රාදිය කැරැ දීම, බිම් පාලු වන්නට හදි භූතියම් කිරීම, නැසෙන්නට යන දරැ ගබ් රැකෙන්නට පිළියම් කිරීම, දිවගුළු බැඳීම, මන්ත්‍රාදි බලයෙන් හනු තද කිරීම, අත් පෙරැලෙන්නට මතුරැ දැපීම, කන් අගුළු වැටෙන්නට මතුරැ දැපීම, කැඹපතැ දෙවතාවෙශය කොටැ ප්‍රශන ඇසීම, කුමරියක ලවා පේන කියැවීම, දෙවිදැස්සක ලවා පේන කියවීම, ජීවිකා පිණිස ගිරැ පිදීම, මහබඹු පිදීම, මතුරැ දපා මුවින් ගිනි ජල් විහිදුවීම, මතුරැ දපා සිරිකත කැඳැවීම යන මේ හෝ අන් මෙ බඳු වූ හෝ තිරශ්චීන විද්‍යයෙන් මිථ්‍යාආජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ තෙමේ මේ ආදි වූ ද, අන් මෙබඳු වූ ද ඒ තිරශ්චීන විද්‍යයෙන් මිථ්‍යාආජීවයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලය වේ.

57. යම්සේ වනාහි ඇතැම් භවත් මහණබමුණෝ සැදැහෙන් දුන් බොජුන් වළඳ ශාන්තිකර්ම, වාස්තුපරිකිරණ, මතුරැ දපා අනුන් නැවීම, සෙත් පතා ගිනි පිදීම, ගිහියනට වමන කැරැවීම, ලය විරේක කැරැවීම, වස්ති කිරීම, ශීර්ෂ විරෙචන බේත් දීම, කන් ලෙඩට තෙල් පිසැ දීම, ගිහිනට ඇසැ සිසිල ගන්වන බේත් තෙල් පිසීම, ගිහියනට නශ්‍ය දීම, ගිහියනට ඇස පටලයට කාරම් අඳුන් සාදැ දීම, ඇසට සිසිල ගන්වන අඳුන් සාදැ දීම, ගිහියන්ගේ ඇසැ උල්ඇත ලෙඩට බේත් දීම, ගිහියනට ශල්‍යකර්ම කිරීම, ළදරැවන්ගේ ලෙඩවලට පිළියම් කිරීම, මුල් බෙහෙත් දීම, කාරම් බෙහෙත් දීම, කාරම් බේත් බැඳ වණ සුව වූ පසු ඒවා ගලවා දැමීම යැ' යි මේ ආදි අන් හෝ මෙබඳු තිරශ්චීන විද්‍යයෙන් මිථ්‍යාආජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ තෙමේ ඒ සියල්ලෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලය වේ.

58. අථ ඛො බ්‍රාහ්මණ, භික්ඛු එවං සීලසම්පන්නො න කුතොචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතො. සෙය්‍යථාපි බ්‍රාහ්මණ, ඛත්තියො මුද්ධාවසිත්තො[1] නිහතපච්චාමිත්තො න කුතොචි භයං සමනුපස්සති යදිදං පච්චත්ථිකතො. එවමෙව ඛො බ්‍රාහ්මණ, භික්ඛු එවං සීලසම්පන්නො න කුතොචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතො. සො ඉමිනා අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො අජ්ඣත්තං අනවජ්ජසුඛං පටිසංවෙදෙති. එවං ඛො බ්‍රාහ්මණ භික්ඛු සීලසම්පන්නො හොති.

(මහාසීලං නිට්ඨිතං)

59. කථඤ්ච බ්‍රාහ්මණ, භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති ? ඉධ බ්‍රාහ්මණ, භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දෙමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති. රක්ඛති චක්ඛුන්ද්‍රියං, චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සොතෙන සද්දං සුත්වා-පෙ-ඝාණෙන ගන්ධං ඝායිත්වා-පෙ-ජිව්හාය රසං සායිත්වා-පෙ-කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා-පෙ-මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දෙමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති, රක්ඛති මනින්ද්‍රියං, මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සො ඉමිනා අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො අජ්ඣත්තං අබ්‍යාසෙකසුඛං පටිසංවෙදෙති. එවං ඛො බ්‍රාහ්මණ භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති.

60. කථඤ්ච බ්‍රාහ්මණ, භික්ඛු සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො හොති ? ඉධ බ්‍රාහ්මණ, භික්ඛු අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී හොති, ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති, සම්මිඤ්ජිතෙ පසාරිතෙ සම්පජානකාරී හොති, සඞ්ඝාටිපත්තචීවරධාරණෙ සම්පජානකාරී හොති, අසිතෙ පීතෙ ඛායිතෙ සායිතෙ සම්පජානකාරී හොති. උච්චාරපස්සාවකම්මෙ සම්පජානකාරී හොති. ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ සම්පජානකාරී හොති. එවං ඛො බ්‍රාහ්මණ භික්ඛු සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො හොති.

---

1. මුද්ධාභිසිත්තො. බො. ස. ස.

58. බමුණ, මහණ තෙමේ මෙසේ ශීලසම්පන්න වූයේ, ශීලසංවර හෙතුයෙන් කිසි ම එක ද අසංවරතායෙකින් ඇති වියැ හැකි බියක් නො දකී. බමුණ, කෑත් අඛිසෙස්තෙන් මුදුනැ අඛිසෙස් ලත්, වැනැසූ සතුරන් ඇති කෑත් රජෙක් කිසි ම එක ද සතුරකුගෙන් වියැ හැකි මොන ම බියකුත් යම් සේ නො දක්නේ ද, බමුණ, එසේ ම මහණ තෙමේ මෙ පරිද්දෙන් ශීල සම්පන්න වූයේ, ශීලසංවර හෙතුයෙන් කිසි ම එක ද අසංවරයෙකින් ඉපැදියැ හැකි බියක් නො දකී. හේ මේ ආදී ශීලසකඛියෙන් සමන්විත වූයේ, සිය සතන්හි නිදොස් වූ කායික චෛතසික සුව විඳී. බමුණ, මෙසේ වනාහි මහණ තෙමේ ශීල සම්පන්න වේ.

(මහ සිල් නිමිසේ ය.)

59. බමුණ, මහණ තෙමේ කෙසේ නම් ඉඳුරන්හි වැසූ දොරක්තේ වේ ද? යත්: බමුණ, මෙ සස්නැ මහණ තෙමේ ඇසින් රූපක් දැක සුඛ ඇ විසින් එහි ලකුණු නොගන්නේ වේ. සුඛ ඇ විසින් අත් පා ඇ අවයවවල අසුරු සිතට නො ගන්නේ වේ. යම් කරුණෙකින් චක්ෂුරිඳ්‍රියය නොවසාගෙන වසන්නහුගේ සිත්සතනට විසම ලොබ දෙම්නස් ඇ ලාමක අකුසල් දහම්හු පුන පුනා වැස්සෙත් ද, එහි ඒ චක්ෂුරිඳ්‍රියයාගේ සංවරය පිණිස හේ පිළිපදී. එය රැක ගනී එහි සංවරයට පැමිණේ. කනින් හඬ අසා...නැහැයෙන් ගඳ ආඝ්‍රාණය කොට...දිවෙන් රස ආස්වාද කොට...කයින් ස්ප්‍රෂ්ටව්‍ය ස්පර්ශ කොට...සිතින් දහම් අරමුණු දැන...සුඛ ඇ විසින් එහි ලකුණු ගන්නේ නො වේ, සුඛ ඇ විසින් අත් පා ඇ අවයවවල අසුරු සිතට ගන්නේ නො වේ. යම් කරුණෙකින් ශ්‍රොත්‍රෙන්ද්‍රියය...ඝ්‍රාණේන්ද්‍රියය. . .ජිහ්වේන්ද්‍රියය. . . කායෙන්ද්‍රියය... මනඉන්ද්‍රියය සංවර කොට නොගෙන වසන්නහුගේ සිත්සතනට විසම ලොබ දෙම්නස ආදි ලාමක අකුසල්දහම්හු පුන පුනා වැස්සෙත්නෝ ද, ඒ ඉන්ද්‍රියයන්ගේ සංවරය පිණිස පිළිපදී. ශ්‍රොත්‍ර ...ඝ්‍රාණ ජිහ්වා...කාය...මන ඉන්ද්‍රියයාගේ සංවරය පිණිස පිළිපදී...ඒ මනින්ද්‍රියය රැකැ ගනී. එහි සංවරයට පැමිණේ. හේ මේ ආදී වූ ඉන්ද්‍රියසංවරයෙන් සමන්විත වූයේ සිය සතන්හි කෙලෙසුන්ගෙන් තෙත් නොවීමෙන් වූ පිරිසිදු අධිචිත්තසුඛය විඳී. බමුණ, මෙසේ වනාහි මහණ තෙම ඉන්ද්‍රියයන්හි වැසූ දොරක්තේ වේ.

60. බමුණ, මහණ තෙම කෙසේ නම් සතිසම්පජඤ්ඤයෙන් සමන්විත වේ ද? යත්: බමුණ, මෙ සස්නැ මහණ ඉදිරි ගමනෙහි, පෙරලා ඊමෙහි, අත්පා ඇ හැකිළීමෙහි, දික් කිරීමෙහි, නුවණින් දැන ම එය කරනුයේ වෙයි. සඟල සිවුර ද පාත්‍රය ද සෙසු සිවුරු ද දැරීමෙහි නුවණින් දැන ම කරන්නේ වෙයි. අහර ගැන්මෙහි, පැන් පීමෙහි, පිපි කැවිලි ඇ කැමෙහි, රස විඳීමෙහි, මල මූ පහ කිරීමෙහි, යැමෙහි, සිටුමෙහි, හිඳුමෙහි, පිබිදුමෙහි, බිණුමෙහි, නොබිණුමෙහි නුවණින් දැන කරනුයේ වෙයි. බමුණ, මෙසේ වනාහි මහණ තෙම සිහි නුවණින් සමන්විත වෙයි.

61. කථඤ්ච බ්‍රාහ්මණ භික්ඛු සන්තුට්ඨො හොති? ඉධ බ්‍රාහ්මණ භික්ඛු සන්තුට්ඨො හොති කායපරිහාරිකෙන චීවරෙන කුච්ඡිපරිහාරිකෙන පිණ්ඩපාතෙන. සො යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති. සෙය්‍යථාපි බ්‍රාහ්මණ පක්ඛී සකුණො යෙන යෙනෙව ඩෙති සපත්තභාරොව ඩෙති, එවමෙව ඛො බ්‍රාහ්මණ භික්ඛු සන්තුට්ඨො හොති කායපරිහාරිකෙන චීවරෙන කුච්ඡිපරිහාරිකෙන පිණ්ඩපාතෙන. සො යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති. එවං ඛො බ්‍රාහ්මණ භික්ඛු සන්තුට්ඨො හොති.

62. සො ඉමිනා ච අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො, ඉමිනා ච අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො, ඉමිනා ච අරියෙන සති-සම්පජඤ්ඤෙන සමන්නාගතො, ඉමාය ච අරියාය සන්තුට්ඨියා සමන්නා-ගතො, විවිත්තං සෙනාසනං භජති අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං. සො පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා.

63. සො අභිජ්ඣං ලොකෙ පහාය විගතාභිජ්ඣෙන චෙතසා විහරති අභිජ්ඣාය චිත්තං පරිසොධෙති. බ්‍යාපාදපදොසං පහාය අබ්‍යාපන්නචිත්තො විහරති සබ්බපාණභූතහිතානුකම්පී. බ්‍යාපාදපදොසා චිත්තං පරිසොධෙති. ථීනමිද්ධං පහාය විගතථීනමිද්ධො විහරති ආලොකසඤ්ඤී. සතො සම්ප-ජානො. ථීනමිද්ධා චිත්තං පරිසොධෙති. උද්ධච්චකුක්කුච්චං පහාය අනුද්ධතො විහරති අජ්ඣත්තං වූපසන්තචිත්තො උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසොධෙති. විචිකිච්ඡං පහාය තිණ්ණවිචිකිච්ඡො විහරති. අකථංකථී කුසලෙසු ධම්මෙසු. විචිකිච්ඡාය චිත්තං පරිසොධෙති.

64. සෙය්‍යථාපි බ්‍රාහ්මණ පුරිසො ඉණං ආදාය කම්මන්තෙ පයො-ජෙය්‍ය, තස්ස තෙ කම්මන්තා සම්ජ්ජෙය්‍යුං, සො යානි ච පොරාණානි ඉණමූලානි තානි ච ඛ්‍යන්තීකරෙය්‍ය. සියා චස්ස උත්තරිං අවසිට්ඨං දාරභරණාය. තස්ස එවමස්ස: 'අහං ඛො පුබ්බෙ ඉණං ආදාය කම්මන්තෙ පයොජෙසිං. තස්ස මෙ තෙ කම්මන්තා සම්ජ්ජිංසු. සො'හං යානි ච පොරාණානි ඉණමූලානි තානි ච ඛ්‍යන්තීඅකාසිං. අත්ථි ච මෙ උත්තරිං අවසිට්ඨං දාරභරණාය'ති. සො තතො නිදානං ලභෙථ පාමොජ්ජං. අධිගච්ඡෙය්‍ය සොමනස්සං.

61. බමුණ, කෙසේ නම් මහණ තෙමේ ලද පමණෙහි සතුටු වේ ද? බමුණ, මෙහි මහණ තෙමේ කය වසා රක්නට පමණ වූ සිවුරෙන් ද, කුස හිනි නිවන්නට පමණ වූ අහරින් ද සතුටු වෙයි. හේ යන යන අතැ අටපිරිකර පමණක් ගෙන ම නික්මෙයි. බමුණ, යම් සේ පියා හඔත කුරුළු තෙමේ යන යන තැනට පියාපත් බර ඇති ව ම පියා හඔා ද, එසේ ම මහණ තෙමේ කය වසා රක්නට පමණ වූ සිවුරින් ද කුස හිනි නිවන්නට පමණ වූ අහරින් ද සතුටු වෙයි. හේ තමා යන තැනට පාසිවුරු ඇ අටපිරිකර පමණක් ගෙන ම යෙයි. බමුණ, මෙසේ මහණ තෙමේ ලත් පසයෙහි සතුටු වේ.

62. බමුණ, ඒ මහණ මේ ආර්‍ය ශීලස්කන්ධයෙන් ද සමන්විත වූයේ, මේ ආර්‍ය ඉන්ද්‍රියසංවරයෙන් ද...මේ ආර්‍යසමෘතිසම්ප්‍රජන්‍යයෙන් ද...මේ ආර්‍ය සන්තුෂ්ටියෙන් ද සමන්විත වූයේ, අරන් පවු කඳුරැලි ගිරිගුහා සොහොන් වනපෙත් එළිමහන් පිදුරුලෙන් යන මෙකී මිනිසුන්ගෙන් හිස් කිසි සෙනස්නක් බජයි. හේ පිඬු සෙවීමෙන් පෙරළා ඇයේ පසුබතැ පලක් බැඳ උඩු කය කෙළින් තබා සිහිය කමටහනට යොමු කොට එළවා හිඳී.

63. හේ ලොවැ ඇල්ම හැර, පහ වූ අභිජ්ඣායෙන් යුත් සිතින් වෙසෙයි. අභිජ්ඣාව කෙරෙන් සිත පිරිසිදු කෙරෙයි. ප්‍රදෝෂය හැර, ව්‍යාපාද රහිත සිතැත්තේ හැම පණ ඇති සතුන් කෙරේ හිතානුකම්පා ඇති වැ වෙසෙයි. ක්‍රෝධය කෙරෙන් සිත පිරිසිදු කෙරෙයි. ස්ත්‍යානමිද්ධය හැර, පහ වූ ස්ත්‍යානමිද්ධය ඇත්තේ, දව රැ දෙක්හි ම දුටු එළිය අඳුනනු හැකි පිරිසිදු සංඥව ඇත්තේ සිහියෙනුත් යුතු ව වෙසෙයි. මිද්ධය කෙරෙන් සිත පිරිසිදු කෙරෙයි. උද්ධච්චයත් කුකුස්සයත් සිතින් දුරු ලා, නො උද්ධච්ච ව, සංහුන් සිය සිත් සතන් ඇත්තේ, උද්ධච්ච කුකුස්ස දෙක කෙරෙන් සිත පිරිසිදු කෙරෙයි. සැකය දුරු ලා, පහ වූ සැක ඇත්තේ, කුසල් දහම්හි සැක නොකරනුයේ, සැකය කෙරෙන් සිත පිරිසිදු කෙරෙයි.

64. බමුණ, යම්සේ මිනිසෙක් පොලියට ණය මුදලක් ගෙන කර්මාන්ත කරන්නේ ද, ඔහු ගේ ඒ කර්මාන්තය සමෘද්ධ වන්නේ නම් හේ වූ තාක් හැම පරණ ණය ගෙවා අවසන් කරන්නේ ද, මත්තෙහි ඉතිරි වූ යමක් ඇතොත් එය අඹුදරුවන් රක්නා පිණිස වන්නේ ද, එසේ වූ ඔහුට "මම් පළමුවෙන් ණයට මුදල් ගෙන කර්මාන්ත කෙළෙමි. ඒ මාගේ කර්මාන්ත සමෘද්ධ විය. ඒ මම් වූ තාක් සියලු පරණ ණය ගෙවා අවසන් කෙළෙමි. අඹුදරුවන් රක්නා පිණිස ඉතිරි වූ මුදලෙක් ද මට ඇත්තේ යැ"යි මෙසේ සිතෙක් වන්නේ ය. හේ ඒ කරුණින් සතුට ලබන්නේ ය, සොම්නසට පැමිණෙන්නේ ය.

65. සෙය්‍යථාපි බ්‍රාහ්මණ පුරිසො ආබාධිකො අස්ස දුක්ඛිතො බාළ්හගිලානො, භත්තං චස්ස නච්ඡාදෙය්‍ය, න චස්ස කායෙ බලමත්තා. සො අපරෙන සමයෙන තම්හා ආබාධා මුච්චෙය්‍ය, භත්තඤ්චස්ස ඡාදෙය්‍ය, සියා චස්ස කායෙ බලමත්තා. තස්ස එවමස්ස: අහං ඛො පුබ්බෙ ආබාධිකො අහොසිං, දුක්ඛිතො බාළ්හගිලානො, භත්තං ච මෙ නච්ඡාදෙසි. න චස්ස මෙ ආසි කායෙ බලමත්තා. සො'මහි එතරහි තම්හා ආබාධා මුත්තො භත්තඤ්ච මෙ ඡාදෙති, අත්ථි ච මෙ කායෙ බලමත්තා'ති. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං අධිගච්ඡෙය්‍ය සොමනස්සං.

66. සෙය්‍යථාපි බ්‍රාහ්මණ පුරිසො බන්ධනාගාරෙ බද්ධො අස්ස. සො අපරෙන සමයෙන තම්හා බන්ධනා මුච්චෙය්‍ය සොත්ථිනා අබ්භයෙන. න චස්ස කිඤ්චි භොගානං වයො. තස්ස එවමස්ස: 'අහං ඛො පුබ්බෙ බන්ධනාගාරෙ බද්ධො අහොසිං. සොම්හි එතරහි තම්හා බන්ධනා මුත්තො සොත්ථිනා අබ්භයෙන. නත්ථි ච මෙ කිඤ්චි භොගානං වයො'ති. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං, අධිගච්ඡෙය්‍ය සොමනස්සං.

67. සෙය්‍යථාපි බ්‍රාහ්මණ පුරිසො දාසො අස්ස අනත්තාධීනො පරාධීනො න යෙනකාමඞ්ගමො. සො අපරෙන සමයෙන තම්හා දාසබ්‍යා මුච්චෙය්‍ය, අත්තාධීනො අපරාධීනො භුජිස්සො යෙනකාමඞ්ගමො. තස්ස එවමස්ස: 'අහං ඛො පුබ්බ දාසො අහොසිං අනත්තාධීනො පරාධීනො න යෙනකාමඞ්ගමො. සො'මහි එතරහි තම්හා දාසබ්‍යා මුත්තො අත්තාධීනො අපරාධීනො භුජිස්සො යෙනකාමඞ්ගමො'ති. සො තතො නිදානං ලභෙථ පාමොජ්ජං අධිගච්ඡෙය්‍ය සොමනස්සං.

68. සෙය්‍යථාපි බ්‍රාහ්මණ පුරිසො සඛෙතො සභොගො කන්තාරද්ධානමග්ගං පටිපජ්ජෙය්‍ය දුබ්භික්ඛං සප්පටිභයං. සො අපරෙන සමයෙන තං කන්තාරං නිත්ථරෙය්‍ය, සොත්ථිනා ගාමන්තං අනුපාපුණෙය්‍ය ඛෙමං අප්පටිභයං. තස්ස එවමස්ස: 'අහං ඛො පුබ්බ සඛෙතො සභොගො කන්තාරද්ධානමග්ගං පටිපජ්ජිං දුබ්භික්ඛං සප්පටිභයං. සො'මහි එතරහි තං කන්තාරං නිත්ථිණ්ණො සොත්ථිනා ගාමන්තං අනුප්පත්තො ඛෙමං අප්පටිභයන්ති. සො තතො නිදානං ලභෙථ පාමොජ්ජං අධිගච්ඡෙය්‍ය සොමනස්සං.

69. එවමෙව ඛො බ්‍රාහ්මණ භික්ඛු යථා ඉණං යථා රොගං යථා බන්ධනාගාරං යථා දාසබ්‍යං යථා කන්තාරද්ධානමග්ගං. එවං ඉමෙ පඤ්ච-නීවරණෙ අප්පහීනෙ අත්තනි සමනුපස්සති. සෙය්‍යථාපි බ්‍රාහ්මණ ආනණ්‍යං යථා ආරොග්‍යං යථා බන්ධනා මොක්ඛං යථා භුජිස්සං යථා ඛෙමන්තභූමිං, එවමෙව ඛො බ්‍රාහ්මණ භික්ඛු ඉමෙ පඤ්චනීවරණෙ පහීනෙ අත්තනි සමනුපස්සති.

65. බමුණ, යම්සේ මිනිසෙක් රෝගී වූයේ, දුකට පැමිණියේ, දැඩි ගිලන් වන්නේ ද, ඔහුට බතුත් නො රිසියෙන්නේ ද, ඔහුගේ ඇඟපත සවි පමණකුත් නො වන්නේ ද, හේ මැත කලැ ඒ ලෙඩින් මිදෙන්නේ නම්, ඔහුට බතුත් රිසියේ නම්, ඔහු ඇඟ පත සවිය ද වන්නේ නම්, ඔහුට "මම් වූ කලි පෙරැ දුකට පත්, දැඩි ගිලන් ලෙඩෙක් වීමි. මට අහරත් නො රිසි වී ය. ඇඟපතත් සවිය නො වී ය. ඒ මම දැන් ඒ ලෙඩින් මිදුණෙමි වෙමි. ඒ මට අහරත් රිසියෙයි. ඇඟපතැ සවියත් ඇත්තේ යැ"යි මෙසේ සිතක් වන්නාත්, හේ එ කරුණින් සතුට ලබන්නේ ය, සොම්නසට පැමිණෙන්නේ ය.

66. බමුණ, යම්සේ මිනිසෙක් හිරගෙහි බැඳුණේ වන්නේ ද, හේ පසු කලෙක ධනය නො විසඳ පහසුයෙන් එයින් මිදෙන්නේ ද, එයින් ඔහුගේ කිසි භොග විනාශයක් නො වන්නේ ද, ඔහුට "මම් වූ කලි පෙරැ හිර ගෙහි බැඳුණෙමි වීමි. ඒ මම දැන් ධන නො විසඳ පහසුයෙන් එයින් මිදුණෙමි වෙමි. මාගේ භොගයනට කිසි විනාශයකුත් නැතැ' යි මෙසේ සිතෙක් වන්නේ ද, හේ එ කරුණින් සතුට ලබන්නේ ය, සොම්නසට පැමිණෙන්නේ ය.

67. බමුණ, තමා අයත් පැවැතුම් නැති, මෙරමා අයත් පැවැතුම් ඇති, කාමැති අතෙක යන්නට අවසර නැති, දාස පුරුෂයෙක් යම්සේ වන්නේ ද, හේ පසු කලෙක තමා අයත් පැවැතුම් ඇතියේ, මෙරමා අයත් පැවැතුම් නැතියේ, නිදහස් වූයේ, කාමැති අතෙකැ යැ හැකි වූයේ, ඒ දාසභාවයෙන් මිදෙන්නේ ද, එසේ වූ ඔහුට "මම් වූ කලි පෙරැ තමා අයත් පැවැතුම් නැති, මෙරමා අයත් පැවැතුම් ඇති, කාමැති අතෙක යැ නොහැකි, දාසයෙකිම් වීමි. ඒ මම් දැන් ඒ දාස භාවයෙන් මිදුණෙමි, තමා අයත් පැවැතුම් ඇතියෙමි, මෙරමා අයත් පැවැතුම් නැතියෙමි, නිදහස් වූයෙමි, කාමැති අතෙක යැ හැකියෙමි වෙමි"යි මෙසේ සිතෙක් වන්නේ ද, හේ එ කරුණින් සතුට ලබන්නේ ය, සොම්නසට පැමි-ණෙන්නේ ය.

68. බමුණ, යම්සේ ධනවත් භොගසම්පත් ඇති පුරුෂයෙක් අහර හිග, උවදුරැති, දිය නැති දික් මඟකට බස්නේ ද, හේ පසු කලෙක සුව සේ ඒ නිරුදක පෙදෙස ඉක්මැ යන්නේ ද, උවදුරැ නැති ගම්මානකට බස්නේ ද, එසේ වූ ඔහුට "මම් වූ කලි පෙරැ ධන ඇතියෙමි, භොග-සම්පත් ඇතියෙමි, දිය නැති අහර හිග බිය ඇති දික් මඟකට බටිමි. ඒ මම් දැන් සුවසේ ඒ කතර තිණුයෙමි. උවදුරැ නැති බිය නැති ගමකට බවුයෙමි වෙමි'යි මෙසේ සිතෙක් වන්නේ ද, හේ එ කරුණින් සතුට ලබන්නේ ය, සොම්නසට පැමිණෙන්නේ ය.

69. බමුණ, එසේ ම මහණ තෙමේ ණයක් මෙන්, ලෙඩක් මෙන්, හිර ගෙයක් මෙන්, වගල් බවක් මෙන්, දිය නැති දික් මඟක් මෙන් (පිළිවෙළින්) මේ නොපහවූ නීවරණ පස තමා කෙරෙහි දකී. ණය නැති බව සේ, නො ලෙඩ බව සේ, හිරෙන් මිදුණු බව සේ, උවදුරැ නැති සේ (පිළිවෙළින්) මේ පහ වූ නීවරණ පස (හෙවත් මේ නීවරණ පසේ දුරැ වූ අවස්ථාව) තමා කෙරෙහි දකී.

70. තස්සිමෙ පඤ්චනීවරණෙ පහීනෙ අත්තනි සමනුපස්සතො පාමොජ්ජං[1] ජායති. පමුදිතස්ස පීති ජායති පීතිමනස්ස කායො පස්සම්භති. පස්සද්ධකායො සුඛං වෙදෙති. සුඛිනො චිත්තං සමාධියති.

71. සො විවිච්චෙව කාමෙහි, විවිච්ච අකුසලෙහි ධම්මෙහි, සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්නෙති පරිසන්නෙති පරිපූරෙති පරිපඵරති. තස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අඵුටං හොති.

72. සෙය්‍යථාපි බ්‍රාහ්මණ දක්ඛො නහාපකො වා නහාපකන්තෙවාසී වා කංසථාලෙ නහානියචූණ්ණානි ආකිරිත්වා උදකෙන පරිපෙථාසකං පරිපෙථාසකං සන්නෙය්‍ය, සායං නහානීයපිණ්ඩි සෙනහාභිගතා සෙනහ-පරෙතා සන්තරබාහිරා ඵුටා සෙනහෙන, න ච පග්ඝරණී.

එවමෙව ඛො බ්‍රාහ්මණ භික්ඛු ඉමමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්නෙති පරිසන්නෙති පරිපූරෙති පරිපඵරති. තස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අඵුටං හොති.

අයං ඛො බ්‍රාහ්මණ යඤ්ඤෙසු පුරිමෙහි යඤ්ඤෙහි අප්පඨ්ඨතරො ච අප්පසමාරම්භතරො ච මහප්ඵලතරො ච මහානිසංසතරො ච.

73. පුන ච පරං බ්‍රාහ්මණ භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියජ්ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං සමාධිජෙන පීතිසුඛෙන අභිසන්නෙති පරිසන්නෙති පරිපූරෙති පරිපඵරති. තස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස සමාධිජෙන පීතිසුඛෙන අඵුටං හොති.

74. සෙය්‍යථාපි බ්‍රාහ්මණ උදකරහදො ගම්භීරො උබ්භිදෙදකො, තස්ස නෙවස්ස පුරත්ථිමාය දිසාය උදකස්ස ආයමුඛං, න දක්ඛිණාය දිසාය උදකස්ස ආයමුඛං, න පච්ඡිමාය දිසාය උදකස්ස ආයමුඛං, න උත්තරාය දිසාය උදකස්ස ආයමුඛං, දෙවො ච න කාලෙන කාලං සම්මා ධාරං අනුප්පවෙජ්ජෙය්‍ය, අථ ඛො තම්හා ච උදකරහදා සීතා වාරිධාරා උබ්භිජ්ජිත්වා තමෙව උදකරහදං සීතෙන වාරිනා අභිසන්නෙය්‍ය පරිසන්නෙය්‍ය පරිපූරෙය්‍ය පරිපඵරෙය්‍ය. තස්ස කිඤ්චි සබ්බාවතො උදකරහදස්ස සීතෙන වාරිනා අඵුටං අස්ස. එවමෙව ඛො බ්‍රාහ්මණ භික්ඛු ඉමමෙව කායං සමාධිජෙන පීතිසුඛෙන අභිසන්නෙති පරිසන්නෙති පරිපූරෙති පරිපඵරති. තස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස සමාධිජෙන පීතිසුඛෙන අඵුටං හොති.

70. මේ නීවරණ පස තමා කෙරෙහි පහ වූවා දක්නා ඔහුට සතුට උපදී. සතුටු වූවහුට ප්‍රීතිය උපදී. ප්‍රීතිය සිතැ ඇත්තහුගේ තම්කය සංහිඳේ. සංහුන් නම්කය ඇත්තේ සුව විඳී. සුවැත්තහු සිත අරමුණෙහි එකඟ වේ.

71. හේ කාමයන්ගෙන් වෙන් ව ම සෙසු අකුසල් දහමුන්ගෙන් ද වෙන් ව ම, විතර්කසහිත, විචාරසහිත, විවෙකයෙන් (නීවරණ පහ වීමෙන්) ප්‍රීතියත් සුවයත් ඇති, පළමු දහන ලැබ වෙසෙයි. හේ මේ කරජ කය ම විවෙකයෙන් උපන් පිති සුවයෙන් තෙමයි, මුළුල්ල ම තෙමයි. පුරා ලයි, මුළුල්ල ම ස්පර්ශ කෙරෙයි. සියලු අඟ පසඟ ඇති ඔහු මුළු කයෙහි (ඒ පිති සුවයෙන් පැතිර නොගත් කිසි ද තැනෙක් නො වෙයි.

72. බමුණ, යම්සේ දක්ෂ කිලිඟෙක් හෝ කිලිඟකුගේ අතැවැස්සෙක් හෝ ලොහො තලියෙක තාන සුණු බහා දිය ඉස ඉස පිඬු කරන්නේ ද, ඒ තාන සුණු පිඬ කාවැදුණු දියැත්තේ, හැම තැන ම දියෙන් යුත් වූයේ, ඇතුළත පිටත සහිත ව මුළුල්ල ම දියෙන් පැතිරී ගියේ, දියත් නො වගුරුවන්නේ වේ ද,

බමුණ, එසේ ම මහණ තෙමේ මේ කරජ කය ම විවෙකයෙන් උපන් පිතිසුවයෙන් තෙමයි, මුළුල්ල ම තෙමයි, පුරා ලයි, මුළුල්ල ම ස්පර්ශ කෙරෙයි. ඔහුගේ සියලු අඟ පසඟ ඇති කයෙහි විවෙකජ ප්‍රීතිසුඛයෙන් පැතිරී වැද නොගත් කිසි ද තැනෙක් නො වෙයි. බමුණ, මේ වූ කලි පළමු දැක්වුණු ශ්‍රාවකයනට වඩා මඳ කටයුතු ඇති, වඩා මඳ තැතින් සිදු කට හැකි, එහෙත් වඩා මහත් පල ඇති වූත් වඩා මහත් අනුශස් ඇති වූත් ශ්‍රාවකයෙකි.

73. බමුණ, තැවැත ද (අතෙකක් කියමි.) මහණ තෙමේ විතර්ක විචාර දෙකේ සංහිඳීමෙන් සිය සතන්හි උපන්, සිය සතන් පහදවන, සිතැ එකඟ බව ඇති, විතර්ක නැති, විචාරය නැති, සමාධියෙන් උපන්, ප්‍රීතියත් සුවයත් ඇති දෙවෙනි දහනට පැමිණ වෙසෙයි. හේ මේ කරජ කය ම සමාධියෙන් උපන් ප්‍රීතිසුඛයෙන් තෙමයි, මුළුල්ල ම තෙත් කෙරෙයි, පුරා ලයි, හැම තැන ම පහයි. විවෙකයෙන් උපන් ප්‍රීතිසුඛයෙන් පැතිරී නොගත් ඔහු සියලු කයේ කිසි ද තැනෙක් නො වෙයි.

74. බමුණ, යම් සේ උල්පතින් මතු වන දිය ඇති විලෙක් වේ ද, එයට පෙර දිගින් දිය ඇතුළු වන මඟක් නොවතත්, දකුණු දිගිනුත් දිය වදිනා මඟක් නොවතත්, පැසිම් දිගිනුත් දිය වදිනා මඟක් නොවතත්, උතුරු දිගිනුත් දිය වදිනා මඟක් නොවතත්, වැස්සත් කලින් කලැ සුදුසු පරිදි නො වසිතත්, එහෙත් ඒ විලෙන් සිසිල් දිය දහර මතු වී ඒ විල ම සිසිල් දියෙන් තෙමන්නේ ද, මුළුල්ල තෙමන්නේ ද, පුරා ලන්නේ ද, හැම තැන ම වැද ගෙන සිටී ද, එයින් පැතිරී වැද නොගත් තැනෙක් නො වන්නේ ද, එසේ ම, බමුණ, මහණ තෙමේ මේ කරජ කය ම සමාධියෙන් උපන් පිතිසුවයෙන් තෙමයි. හැම තැන ම තෙත් කෙරෙයි, පුරා ලයි, හැම තැන ම පැතිරී වැද ගනී. ඔහුගේ කයේ සමාධියෙන් උපන් පිති සුවය පැතිරී වැද නොගත් කිසි ද තැනෙක් නො වෙයි.

අයං ඛො බ්‍රාහ්මණ යඤ්ඤානි පුරිමෙහි යඤ්ඤෙහි අප්පටිඨතරො ච අප්පසමාරම්භතරො ච මහප්ඵලතරො ච මහානිසංසතරො ච.

75. පුන ච පරං බ්‍රාහ්මණ භික්ඛු පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති සතො සම්පජානො, සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති. යන්තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති. තං තතියං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමෙනෙව කායං නිප්පීතිකෙන සුඛෙන අභිසන්නෙනති පරිසන්නෙනති පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස නිප්පීතිකෙන සුඛෙන අප්ඵුටං හොති.

76. සෙය්‍යථාපි බ්‍රාහ්මණ උප්පලිනියං වා පදුමිනියං වා පුණ්ඩරීකිනියං වා අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවද්ධානි[1] උදකානුග්ගතානි අන්තොනිමුග්ගපොසීනි, තානි යාව චග්ගා යාව ච මූලා සීතෙන වාරිනා අභිසන්නානි[2] පරිසන්නානි පරිපූරානි පරිප්ඵුටානි. නාස්ස කිඤ්චි සබ්බාවතං උප්පලානං වා පදුමානං වා පුණ්ඩරීකානං වා සීතෙන වාරිනා අප්ඵුටං අස්ස. එවමෙව ඛො බ්‍රාහ්මණ භික්ඛු ඉමෙනෙව කායං නිප්පීතිකෙන සුඛෙන අභිසන්නෙනති පරිසන්නෙනති පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස නිප්පීතිකෙන සුඛෙන අප්ඵුටං හොති.

අයං ඛො බ්‍රාහ්මණ යඤ්ඤානි පුරිමෙහි යඤ්ඤෙහි අප්පටිඨතරො ච අප්ප-සමාරම්භතරො ච මහප්ඵලතරො ච මහානිසංසතරො ච.

77. පුන ච පරං බ්‍රාහ්මණ භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමෙනෙව කායං පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන ඵරිත්වා නිසින්නො හොති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අප්ඵුටං හොති.

78. සෙය්‍යථාපි බ්‍රාහ්මණ පුරිසො ඔදාතෙන වත්ථෙන සසීසං පාරුපිත්වා නිසින්නො අස්ස, නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස ඔදාතෙන වත්ථෙන අප්ඵුටං අස්ස. එවමෙව ඛො බ්‍රාහ්මණ භික්ඛු ඉමෙනෙව කායං පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන ඵරිත්වා නිසින්නො හොති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අප්ඵුටං හොති.

අයං ඛො බ්‍රාහ්මණ යඤ්ඤානි පුරිමෙහි යඤ්ඤෙහි අප්පටිඨතරො ච අප්පසමාරම්භතරො ච මහප්ඵලතරො ච මහානිසංසතරො ච.

---

1. සංවුද්ධානි. (සබ්බත්ථපි පොත්ථකෙසු). 2. අභිසන්නානි පරිසන්නානි. එවමෙව. PTS.

බමුණ, මේ වූ කලී පළමු දුක්වුණු යඥයනට වඩා මඳ කටයුතු ඇති, වඩා මඳ තැතින් සිදු කට හැකි, එහෙත් එ හැමට වඩා මහත් පල ද මහත් අනුශස් ද ඇති යඥයෙක.

75. තව ද බමුණ, මහණ තෙමේ ප්‍රීතිය සංහිඳීමෙන් උපෙක්ෂාවෙන් යුතු ව, සිහියෙන් හා නුවණින් හා යුතු වැ වෙසෙයි. සුවය ද කයින් විඳී. අරී පුතුලෝ යම් දහනක් හෙතු කොට ගෙන දහන් ලැබුවහු ඇරිබ 'මෙ තෙමේ උපෙක්ෂාව ඇත්තේ ය, සිහි ඇත්තේ ය, සුව විසුම් ඇත්තේ ය' යි කියත් ද. හේ (එසේ වූ) ඒ තෙවෙනි දහන් පැමිණ (ලැබ) වෙසෙයි. හේ මේ කය ම ප්‍රීති රහිත සුවයෙන් තෙමයි, මුළුල්ල ම තෙත් කෙරෙයි, පුරා ලයි, හැම තැන ම පැතිර වැද ගනී. ඔහුගේ කයෙහි ඒ ප්‍රීතිරහිත සුවයෙන් පැතිරී වැද නොගත් කිසි ද තැනෙක් නො වෙයි.

76. බමුණ, යම් සේ උපුල් විලෙක හෝ පියුම් විලෙක හෝ පඬෙර විලෙක හෝ ඇතැම් උපුල් හෝ පියුම් හෝ පඬෙර හෝ දියෙහි වැඩුණේ දියෙන් නොතැගුණේ, දිය තුළ ම ගිලී වැඩෙනුයේ ද, ඒ සියල්ල අග තෙක් ද මුල් තෙක් ද සිසිල් දියෙන් තෙමුණේ, මුළුල්ල ම තෙමුණේ පිරී ගියේ, හැම තැන ම පැතිරී වැද ගත්තේ වේ ද, ඒ විලෙහි සියලු උපුල්වලැ හෝ පියුම්වලැ හෝ පඬෙරවලැ හෝ සිසිල් දිය පැතිරී වැදී නොගත් තැනෙක් නො වන්නේ ද, බමුණ, මහණ තෙමේ එ සේ ම මේ කය ම නිෂ්ප්‍රීතික සුඛයෙන් තෙමයි, හාත්පසින් තෙමයි, පුරා ලයි, මුළුල්ල ම පැතිරී වැදී ගනී. ඔහුගේ සියලු කයෙහි ඒ නිෂ්ප්‍රීතික සුඛයෙන් පැතිරී වැදී නොගත් කිසි ද තැනෙක් නො වන්නේ ය.

බමුණ, මේ වනාහි පළමු දුක්වුණු යඥයනට වඩා මඳ කටයුතු ඇති, වඩා මඳ තැතින් සිදු කට හැකි, එහෙත් ඒ හැමට වඩා මහත් පල ද මහත් අනුශස් ද ඇති යඥයෙක.

77. තව ද බමුණ, මහණ තෙමේ සුව විඳුමත් දුරුලීමෙන්, දුක් විඳුමත් දුරු ලීමෙන්, පළමු කොට ම සොම්නස් දොම්නස් දෙක දුරු වීමෙන්, නොදුක් ද නොසුව ද වූ, උපෙක්ෂා සමෘති දෙකේ පිරිසිදු බව ඇති, සිවුවන දහන ලැබ වෙසෙයි. හේ මේ කය ම පිරිසිදු පබසර සිතින් පැතිරී වැද ගෙන හුන්නේ වෙයි. ඔහුගේ සියලු කයෙහි පිරිසිදු පබසර සිතින් පැතිරී වැදී නොගත් කිසි ද තැනෙක් නො වෙයි.

78. යම්සේ, බමුණ, මිනිසෙක් හිස සඟිත මුළු කය ම සුදු වතින් වසා ගෙන හුන්නේ වී නම්, ඔහුගේ ඒ මුළු කයෙහි සුදු වතින් වැදී නොගත් (නොවැසුණු) කිසිදු තැනෙක් නො වන්නේ ද, බමුණ, එසේ ම මහණ තෙම මේ කය ම පිරිසිදු පබසර සිතින් පැතිරී වැදී ගෙන නොසිටි කිසි දු තැනෙක් නො වෙයි.

බමුණ, මේ වූ කලී පළමු කී යඥයනට වඩා මඳ කටයුතු ඇති, වඩා මඳ තැතින් සිදු කට හැකි, එහෙත් එ හැමට වඩා මහත් පල ද මහත් අනුශස් ද ඇති යඥයෙක.

79. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[1] ඤාණ-දස්සනාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො එවං පජානාති: 'අයං ඛො මෙ කායො රූපී චාතුම්මහාභූතිකො මාතාපෙත්තිකසම්භවො ඔදනකුම්මාසූපචයො අනිච්චුච්ඡාදනපරිමද්දනභෙදනවිද්ධංසනධම්මො, ඉදං ච පන මෙ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධ'න්ති.

80. සෙය්‍යථාපි බ්‍රාහ්මණ, මණි වෙළුරියො සුභො ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො අවෙජ්ජ විප්පසන්නො අනාවිලො සබ්බාකාරසම්පන්නො, තත්‍රස්ස සුත්තං ආවුතං නීලං වා පීතං වා ලොහිතං වා ඔදාතං වා පණ්ඩුසුත්තං[2] වා. තමෙනං චක්ඛුමා පුරිසො හත්ථෙ කරිත්වා පච්චවෙක්ඛෙය්‍ය, 'අයං ඛො මණි වෙළුරියො සුභො ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො අවෙජ්ජ විප්පසන්නො අනාවිලො සබ්බාකාරසම්පන්නො. තත්‍රිදං සුත්තං ආවුතං නීලං වා පීතං වා ලොහිතං වා ඔදාතං වා පණ්ඩුසුත්තං වා'ති.

එවමෙව ඛො බ්‍රාහ්මණ, භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ඤාණදස්සනාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො එවං පජානාති: 'අයං ඛො මෙ කායො රූපී චාතුම්මහාභූතිකො මාතාපෙත්තිකසම්භවො, ඔදනකුම්මාසූපචයො, අනිච්චුච්ඡාදනපරිමද්දන-භෙදනවිද්ධංසනධම්මො. ඉදං ච පන මෙ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධන්ති.

අයං ඛො බ්‍රාහ්මණ, යඤ්ඤදත්ථි අප්පටිත්තරො ච අප්පසමාරම්භතරො ච මහප්ඵලතරො ච මහානිසංසතරො ච.

81. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ මනොමයං කායං අභිනිම්මිනනාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනොමයං සබ්බඞ්ගපච්චඞ්ගිං අහීනින්ද්‍රියං.

---

1. ආනෙජ්ජප්පත්තෙ, කත්ථචි.
2. පණ්ඩුරසුත්තං, කත්ථචි.

79. (බමුණ,) ඒ මහණ තෙමේ මෙසේ සිත එකඟ වූ කල්හි, පිරිසිදු වූ කල්හි, දීප්ත වූ කල්හි, කිලිටි පහ වූ කල්හි, පහ වැ ගිය චිත්තෝපක්ලේශ ඇති කල්හි, මොළොක් වූ කල්හි, විවසුත් වඩනුවට සුදු වැ සිටි කල්හි, නිසල බවට පැමිණි කල්හි, විවසුත් නුවණ පිණිස (පිරියම්) සිත එයට යොමු කෙරෙයි, එයට නතු කෙරෙයි. (එසේ වූ) හේ 'මා කය වූ කලි රූපවත් ය, සිවු මහාභූතයන්ගෙන් නිපන්නේ ය, මාපියන්ගේ ශුක්‍රශෝණිතයෙන් උපන්නේ ය. බත් කොමු ඇ අහරින් වැඩුණේ ය. අනිසබව ද දුගඳ හරනුවට සුවඳ විලෙවුන් ඉළියැ සුදු බව ද, ලෙඩ දුරු ලනුවට පිරිමැදුම් ඇ කළ සුදු බව ද, එසේ කළත් බිඳෙන බව ද, විසිරෙන බව ද යන මෙකී දැය සභාව කොට ඇත්තේ ය. මා සිත ද මේ කයෙහි ලැග්ගේ ය. මෙහි බැඳුණේ ය"යි මෙසේ දැනැ ගනී.

80. බමුණ, යම්සේ සොඳුරු පිරිසිදු ඇකරයෙක පහළ වූ, අවැස් වූ, මොනොවට පිරියම් කළ, සිසුම් වූ, වෙසෙසින් පහත් වූ, පිළිතුරු වූ, දෙවුම් විදුම් ඇ හැම අසුරින් සුත් වෙරළුමිණෙක් වත්තේ ද, එහි නිල්වත් හෝ රත්වත් හෝ රත්වත් හෝ සුදුවත් හෝ පඬුවත් හෝ සුයෙක් අවුනන ලද්දේ වත්තේ නම් ඇස් ඇති පුරුෂයෙක් එය අතෙහි කොට, "මේ වූ කලි සොඳුරු, පිරිසිදු ඇරෙක උපන්, අවැස්, මොනොවට පිරියම් කළ, සිසුම්, වෙසෙසින් පහත්, පිළිතුරු, දෙවුම් විදුම් ඇ සියලු අසුරින් සුත් වෙරළු මිණෙක. මෙහි නිල්වත් හෝ රත්වත් හෝ රත්වත් හෝ සුදුවත් හෝ පඬුවත් හෝ මේ සුයෙක් අවුනන ලදුයේ වේ" ය යි සලකා බලන්නේ ද,

බමුණ, එසේ ම මහණ තෙමේ මෙසේ සිත එකඟ වූ කල්හි, පිරිසිදු වූ කල්හි, දීප්ත වූ කල්හි, කෙලෙස් යට පත් වූ කල්හි, උපක්ලේශ පහ වූ කල්හි, මොළොක් වූ කල්හි, (විවසුත් බවුනට) සුදු වැ සිටි කල්හි, නිසල බවට පැමිණි කල්හි, විවසුත් නුවණ පිණිස සිත යොමු කෙරෙයි. එයට නතු කෙරෙයි. (එසේ වූ) හෙ තෙම 'මේ මා කය වූ කලි රූපවත් ය, සිවු මහාභූතයන්ගෙන් නිපන්නේ ය, මා පියන්ගේ ශුක්‍රශෝණිතයෙන් උපන්නේ ය, බත් කොමු අහරින් වැඩුණේ ය, අනිසබව ද, දුගඳ හරනට සුවඳ විලෙවුන් ඉළිය සුදු බව ද, ලෙඩ දුරු ලනුවට පිරිමැදුම් ඇ කළ සුදු බව ද, එය කළත් බිඳෙන බව ද, විසිරෙන බව ද යන මෙකී දැ සභාව කොටැත්තේ ය. මා සිත ද මේ කයෙහි ලැග්ගේ ය. මෙහි බැඳුණේ යැ'යි දැන ගනී.

බමුණ, මේ වූ කලි පළමු කී යඥයනට වඩා මඳ කටයුතු ඇති, වඩා මඳ තැතින් සිදු කට හැකි, (එහෙත්) වඩා මහත් පල හා අනුසස් හා ඇති යඥයෙක.

81. හේ මෙසේ සිත එකඟ වූ කල්හි, පිරිසිදු වූ කල්හි, දීප්ත වූ කල්හි, කෙලෙස් රහිත කල්හි, දුරු වූ උපක්ලේශ ඇති කල්හි, මොළොක් වූ කල්හි, ඉදුහු ඉපැදවීමට සුදු වැ සිටි කල්හි, නිසල බව් පත් කල්හි, මන්මුවා (මනොමය) සිරිරක් මවා පාදු පිණිස සිත යොමු කෙරෙයි, නතු කෙරෙයි. හේ (මෙසේ) මේ සිරිරින් රූමත්, හැම අඟ පසඟ ඇති, නොමිකළ ඉඳුරන් ඇති මන්මුවා සිරුරක් මවා පියයි.

සෙය්‍යථාපි බ්‍රාහ්මණ, පුරිසො මුඤ්ජමහා ඊසිකං[1] පබ්බාහෙය්‍ය, තස්ස එවමස්ස "අයං මුඤ්ජා, අයං ඊසිකා. අඤ්ඤං මුඤ්ජා, අඤ්ඤං ඊසිකා. මුඤ්ජමහා තෙව ඊසිකා පබ්බාළ්හා"ති.

සෙය්‍යථා වා පන බ්‍රාහ්මණ, පුරිසො අසිං කොසියා පබ්බාහෙය්‍ය, තස්ස එවමස්ස "අයං අසි, අයං කොසි, අඤ්ඤං අසි, අඤ්ඤං කොසි, කොසියාතෙව අසි පබ්බාළ්හො"ති.

සෙය්‍යථා වා පන බ්‍රාහ්මණ, පුරිසො අහිං කරණ්ඩා උද්ධරෙය්‍ය, තස්ස එවමස්ස "අයං අහි, අයං කරණ්ඩො, අඤ්ඤං අහි, අඤ්ඤං කරණ්ඩො, කරණ්ඩා තෙව අහි උබ්භතො"ති.

එවමෙව ඛො බ්‍රාහ්මණ, භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ මනොමයං කායං අභිනිම්මිනනාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනොමයං සබ්බඞ්ගපච්චඞ්ගිං අහීනින්ද්‍රියං.

අයං ඛො බ්‍රාහ්මණ, යඤ්ඤං පුරිමෙහි යඤ්ඤෙහි අප්පවත්තරො ච අප්පසමාරම්භතරො ච මහප්ඵලතරො ච මහානිසංසතරො ච.

82. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති එකොපි හුත්වා බහුධා හොති, බහුධාපි හුත්වා එකො හොති, ආවිභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡති සෙය්‍යථාපි ආකාසෙ. පඨවියාපි උම්මුජ්ජනිමුජ්ජං කරොති සෙය්‍යථාපි උදකෙ. උදකෙපි අභිජ්ජමානෙ ගච්ඡති සෙය්‍යථාපි පඨවියං. ආකාසෙපි පල්ලඞ්කෙන කමති සෙය්‍යථාපි පක්ඛී සකුණො. ඉමෙපි චන්දිමසූරියෙ එවං මහිද්ධිකෙ එවං මහානුභාවෙ පාණිනා පරිමසති පරිමජ්ජති යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති.

සෙය්‍යථාපි බ්‍රාහ්මණ, දක්ඛො කුම්භකාරො වා කුම්භකාරන්තෙවාසි වා සුපරිකම්මකතාය මත්තිකාය යං යදෙව භාජනවිකතිං ආකඞ්ඛෙය්‍ය තං තදෙව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය;

සෙය්‍යථා වා පන බ්‍රාහ්මණ, දක්ඛො දන්තකාරො වා දන්තකාරන්තෙවාසී වා සුපරිකම්මකතස්මිං දන්තස්මිං යං යදෙව දන්තවිකතිං ආකඞ්ඛෙය්‍ය තං තදෙව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය;

---

1. ඉසිකං PTS.

බමුණ, යම්සේ පුරුෂයෙක් මුදුතණ ගසෙකින් මුදුකිලිල ඇද මෑත් කරන්නේ නම්, ඔහුට "මේ මුදුතණ ගස ය, මේ එහි මුදුකිලිල ය, තණ ගස එකෙක, එහි මුදුකිලිල අනෙකෙක, මුදු තණ ගසින් එහි කිලිල මෑත් කරනලදැ"යි මෙසේ සිතෙක් වන්නේ ද,

බමුණ, යම්සේ හෝ පුරුෂයෙක් කඩුවක් කොපුවෙන් ඇද මෑත් කරන්නේ නම්, ඔහුට "මේ කඩුව ය, මේ කොපුව ය, කඩුව එකෙක, කොපුව අනෙකෙක, කොපුයෙන් ම කඩුව ඇද මෑත් කරනලදැ"යි මෙසේ සිතෙක් වන්නේ ද,

බමුණ, යම්සේ වතාහි පුරුෂයෙක් නයකු සැවෙන් (සිතින්) ඇදැ නඟා ගන්නේ ද, ඔහුට "මේ නයා ය, මේ සැව ය, නයා එකෙක, සැවය අනෙකෙක, සැවයෙන් ම නයා ඉදිරිණැ"යි මෙසේ සිතෙක් වන්නේ ද,

බමුණ, එසේ ම මහණ තෙමේ මේ උඩ කී පරිදි සිත එකඟ වූ කල්හි, පිරිසිදු වූ කල්හි, දීප්ත වූ කල්හි, කෙලෙස් රහිත කල්හි, පහ වූ උපක්ලෙශ ඇති කල්හි, මෝලෙක් වූ කල්හි, ඉදුහු වඩනුවට සුහු වැ සිටි කල්හි, නිසල බව පත් කල්හි මන්මුවා සිරුරක් මවා පාතුවට සිත යොමු කෙරෙයි, නමා හරියි. (එසේ වූ) හේ මේ සිරිරින් රූපවත් වූ, සියලු අඟපසඟින් යුත්, නොවිකල ඉඳුරන් ඇති, මන්මුවා අත් සිරුරක් මවා පියයි.

බමුණ, මේ වතාහි උඩ දැක්වුණු යඥයතව වඩා මඳ කටයුතු ඇති, වඩා මඳ තැතින් සිදු කට හැකි, (එහෙත්) එයට වඩා මහත් පල ද වඩා මහත් අනුසස් ද ඇති යඥයෙක.

82. හේ උඩ කී පරිදි සිත එකඟ වූ කල්හි, පිරිසිදු වූ කල්හි, දිමුත් වූ කල්හි, නිකෙලෙස් වූ කල්හි, උපක්ලෙශ පහ වැ ගිය කල්හි, මෝලෙක් වූ කල්හි, (ඉදුහු වඩනුවට) සුහු වැ සිටි කල්හි, නිසල බව පත් කල්හි, ඉඳුවිද නුවණ පිණිස පිරියම් සිත මෙහෙයයි, නතු කෙරෙයි. (එසේ) හේ නොයෙක් වැදැරුම් ඉඳු කොටස් පුන පුනා පසක් කෙරෙයි. පියෙවියෙන් එකෙක් වැ සිට ද ඉඳුබෙලෙන් බොහෝ වැදැරුම් වෙයි. බොහෝ වැදැරුම් වීත් යලි එකෙක් ම වෙයි. තමාගේ පෙහෙළි බව කෙරෙයි, යලි නොපෙහෙළි බව කෙරෙයි. බිතුයෙන් පිටතට පවුරින් පිටතට පවිවෙන් පිටතට අහසෙහි මෙන් කිසිවෙකත් නොගැටෙනුයේ විනිවිදැ ගෙන යෙයි. දියෙහි මෙන් පොළොවිහි ද ගිලීම ද මතු වීම ද කෙරෙයි. නොකිඳෙන දියෙහි පොළොවිහි සේ යෙයි. පියාපත් ඇති සකුනයකු සේ අහස්හි ද පලඟින් යෙයි. මෙසඟ මහත් ඉඳු ඇති, මහත් තෙද ඇති මේ සඳ හිරු දෙදෙනා ද අල්ලයි. අත යවා ඔබ මොබ පිරිමදී. බඹලොව දක්වා ද (මුළු ලොව) කයින්. විසි කෙරෙයි.

බමුණ, යම් සේ කුඹලෙක් හෝ කුඹලක්හු අතැවැස්සෙක් හෝ මොනොවට පිරියම් කළ මැටියෙන් යම් යම් බඳුන් වෙසෙසක් තෙමේ කැමැත්තේ නම් එය එය ම කරන්නේ ද, මොනොවට නිපදවන්නේ ද;

බමුණ, යම් සේ හෝ සමත් දන්වඩුවෙක් හෝ ඔහු අතැවැස්සෙක් හෝ මොනොවට සකස් කළ දතෙක්හි යම් යම් විසිතුරු රූපාදියක් (දන්තවිකෘතියක්) කැමැත්තේ නම් එය එය ම කරන්නේ ද, මොනොවට නිපදවන්නේ ද;

සෙය්‍යථා වා පන බ්‍රාහ්මණ, දක්ඛො සුවණ්ණකාරො වා සුවණ්ණකාරන්තෙවාසී වා සුපරිකම්මකතස්මිං සුවණ්ණස්මිං යං යදෙව සුවණ්ණවිකතිං ආකඞ්ඛෙය්‍ය, තං තදෙව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය;

එවමෙව ඛො බ්‍රාහ්මණ, භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති එකො'පි හුත්වා බහුධා හොති බහුධා'පි හුත්වා එකො හොති. ආවිභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡති සෙය්‍යථා'පි ආකාසෙ. පඨවියා'පි උම්මුජ්ජනිමුජ්ජං කරොති සෙය්‍යථා'පි උදකෙ. උදකෙ'පි අභිජ්ජමානෙ ගච්ඡති සෙය්‍යථා'පි පඨවියං. ආකාසෙ'පි පල්ලඞ්කෙන කමති සෙය්‍යථාපි පක්ඛී සකුණො. ඉමෙ'පි චන්දිමසූරියෙ එවංමහිද්ධිකෙ එවංමහානුභාවෙ පාණිනා පරිමසති පරිමජ්ජති. යාව බ්‍රහ්මලොකා'පි කායෙන වසං වත්තෙති.

අයං ඛො බ්‍රාහ්මණ යක්ඛො පුරිමෙහි යක්ඛෙහි අප්පඨ්ඨතරො ච අප්පසමාරම්භතරො ච මහප්ඵලතරො ච මහානිසංසතරො ච.

83. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ දිබ්බාය සොතධාතුයා චිත්තං අභිනීහරති, අභිනින්නාමෙති. සො දිබ්බාය සොත-ධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය උභො සද්දෙ සුණාති දිබ්බෙ ච මානුසෙ ච යෙ දූරෙ සන්තිකෙ ච.

84. සෙය්‍යථා'පි බ්‍රාහ්මණ, පුරිසො අද්ධානමග්ගපටිපන්නො, සො සුණෙය්‍ය භෙරිසද්දම්පි මුදිඞ්ගසද්දම්පි සඞ්ඛපණවදෙණ්ඩිමසද්දම්පි. තස්ස එවමස්ස 'භෙරිසද්දො ඉති'පි මුදිඞ්ගසද්දො ඉති'පි සඞ්ඛපණවදෙණ්ඩිමසද්දො ඉති'පි. එවමෙව ඛො බ්‍රාහ්මණ, භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ දිබ්බාය සොතධාතුයා චිත්තං අභිනීහරති, අභිනින්නාමෙති. සො දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය උභො සද්දෙ සුණාති දිබ්බෙ ච මානුසෙ ච යෙ දූරෙ සන්තිකෙ ච.

අයං ඛො බ්‍රාහ්මණ, යක්ඛො පුරිමෙහි යක්ඛෙහි අප්පඨ්ඨතරො ච අප්පසමාරම්භතරො ච මහප්ඵලතරො ච මහානිසංසතරො ච.

බමුණ, යම්සේ හෝ සමත් රන්කරුවෙක් හෝ ඔහු අතැවැස්සෙක් හෝ මොනොවට සකස් කළ රනෙහි යම් යම් අබරණ ආදියක් (සවණී-විකෘතියක්) කැමැත්තේ නම් එය එය ම කරන්නේ ද, නිපදවන්නේ ද;

බමුණ, එ පරිද්දෙන් ම මෙසේ (උඩ කී පරිදි) සිත එකඟ වූ කල්හි, පිරිසිදු වූ කල්හි, පබසර වූ කල්හි, නිකෙලෙස් වූ කල්හි, පහ වූ උපක්ලෙශ ඇති කල්හි, මොළොක් වූ කල්හි, ඉදුහ වඩනුවට සුදු වූ කල්හි, ස්ථිතකල්හි, නිසලබව් පත් කල්හි ඉදුවිද නුවණ පිණිස සිත මෙහෙයයි, මොනොවට නතු කෙරෙයි. (එසේ වූ) හේ නොයෙක් වැදැරුම් ඉදු කොටස් පුන පුනා විදී (ලබයි, පසක් කෙරෙයි). පියෙවියෙන් එකක් වැ ම සිට බොහෝ දෙනෙක් වෙයි. බොහෝ දෙනක් වැ යළි එකෙක් ම වෙයි. තෙමේ පෙනී සිටී, නොපෙනී ද සිටී. බිතුයෙන් පිටතට පවුරින් පිටතට පව්වෙන් පිටතට විනිවිද කිසිවෙක නොලැගී අහසෙහි සෙයින් යෙයි. පොළොව්හි ද දියෙහි මෙන් ගිලීමත් මතු වීමත් කෙරෙයි. පොළොව මතු පිටැ සේ නොබිඳෙන දියෙහි යෙයි. ඉඟිලෙන පක්ෂියකු සේ පලඟින් අහසැ යෙයි. මේ සා මහත් ඉදුහ ඇති මේසා මහත් තෙද ඇති සඳ හිරුන් පවා අල්ලයි, පිරිමදියි. බඹලොව දක්වා ද කයින් තමා වසයෙහි පවත්වයි.

බමුණ, මේ වකාහි මෙයින් පළමු කී සියලු යඥයනට වඩා මඳ කටයුතු ඇති ද වඩා මඳ තැතින් සිදු කට හැකි ද වූ, එහෙත් ඒ හැමට වඩා මහ පල ද වඩා මහ අනුසස් ද ඇති යඥයෙක.

83. හේ මෙසේ සිත එකඟ වූ කල්හි, පිරිසිදු වූ කල්හි, දීප්තිමත් වූ කල්හි, නිකෙලෙස් වූ කල්හි, උපක්ලෙශ පහ වැ ගිය කල්හි, මොළොක් වූ කල්හි, (දිවකත් නුවණ වඩනුවට) සුදු වූ කල්හි, ස්ථිත කල්හි, නිසල බව් පත් කල්හි, දිවකත් නුවණ පිණිස සිත යොමු කෙරෙයි, නැඹුරු කෙරෙයි. (එසේ වූ) හේ පිරිසිදු වූ මිනිසුන් ගේ ඇසුම් ඉම ඉක්මැ සිටි දිවකනින් දෙවියන් අයත් වූ ද මිනිසුන් අයත් වූ ද දුරැ වූ ද ළඟැ වූ ද යන දෙවැදැරුම් හැම හඬ ම අසයි.

84. බමුණ, යම්සේ මිනිසෙක් දික් මඟකට පිළිපන්නේ නම්, හේ බෙර හඬත් මිහිඟු බෙර හඬත් සක් පණා ගැටබෙර හඬත් අසන්නේ නම්, එය අසන ඔහුට 'මේ බෙර හඬැ' යීත් 'මේ මිහිඟු බෙර හඬැ' යි ත් මේ සක් පණා ගැටබෙර හඬැ'යීත් මෙසේ සිතෙක් වන්නේ නම්, බමුණ, එ පරිද්දෙන් ම මහණ තෙමේ මෙ ලෙස සිත එකඟ වූ කල්හි, පිරිසිදු වූ කල්හි, දීප්තිමත් වූ කල්හි, නිකෙලෙස් වූ කල්හි, උපක්ලෙශ පහ වැ ගිය කල්හි, මොළොක් වූ කල්හි, කර්ම්ණ්‍ය වැ සිටි කල්හි, නිසල බව් පත් කල්හි, දිවකත් නුවණ පිණිස සිත යොමු කෙරෙයි. හේ පිරිසිදු වූ, මිනිසුන්ගේ දැකුම් ඉම ඉක්මැ වූ දිවකත් නුවණින් දිව්‍ය වූත් මානුෂ වූත් දුරැ වූත් ළඟැ වූත් ද යි මෙසේ දෙවැදැරුම් වූ සියලු හඬ අසයි.

බමුණ, මෙය පළමු දැක්වුණු යඥයනට වඩා මඳ කටයුතු ඇති, වඩා මඳ තැතෙකින් සිදු කට හැකි, ඒ හැමට වඩා මහත් පල ද ඇති මහත් අනුසස් ද ඇති යාගයෙකි.

85. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ චෙතො-පරියඤ්ඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාති. සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති, වීතරාගං වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාති, සදොසං වා චිත්තං සදොසං චිත්තන්ති පජානාති, වීතදොසං වා චිත්තං වීතදොසං චිත්තන්ති පජානාති, සමොහං වා චිත්තං සමොහං චිත්තන්ති පජානාති, වීතමොහං වා චිත්තං වීතමොහං චිත්තන්ති පජානාති, සඞ්ඛිත්තං වා චිත්තං සඞ්ඛිත්තං චිත්තන්ති පජානාති, වික්ඛිත්තං වා චිත්තං වික්ඛිත්තං චිත්තන්ති පජානාති, මහග්ගතං වා චිත්තං මහග්ගතං චිත්තන්ති පජානාති, අමහග්ගතං වා චිත්තං අමහග්ගතං චිත්තන්ති පජානාති, සඋත්තරං වා චිත්තං සඋත්තරං චිත්තන්ති පජානාති, අනුත්තරං වා චිත්තං අනුත්තරං චිත්තන්ති පජානාති, සමාහිතං වා චිත්තං සමාහිතං චිත්තන්ති පජානාති, අසමාහිතං වා චිත්තං අසමාහිතං චිත්තන්ති පජානාති, විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානාති, අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති.

86. සෙය්‍යථා'පි බ්‍රාහ්මණ, ඉත්ථී වා පුරිසො වා දහරො වා යුවා මණ්ඩනජාතිකො ආදාසෙ වා පරිසුද්ධෙ පරියොදාතෙ අච්ඡෙ වා උදකපත්තෙ සකං මුඛනිමිත්තං පච්චවෙක්ඛමානො සකණ්ටකං වා සකණ්ටකන්ති ජානෙය්‍ය අකණ්ටකං වා අකණ්ටකන්ති ජානෙය්‍ය.

එවමෙව ඛො බ්‍රාහ්මණ, භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ චෙතොපරියඤ්ඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති.

සො පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාති: සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති. වීතරාගං වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාති. සදොසං වා චිත්තං සදොසං චිත්තන්ති පජානාති. වීතදොසං වා චිත්තං වීතදොසං චිත්තන්ති පජානාති. සමොහං වා චිත්තං සමොහං චිත්තන්ති පජානාති. වීතමොහං වා චිත්තං වීතමොහං චිත්තන්ති පජානාති. සඞ්ඛිත්තං වා චිත්තං-පෙ-වික්ඛිත්තං වා චිත්තං-පෙ-මහග්ගතං වා චිත්තං-පෙ-අමහග්ගතං වා චිත්තං-පෙ-සඋත්තරං වා චිත්තං-පෙ-අනුත්තරං වා චිත්තං-පෙ-සමාහිතං වා චිත්තං-පෙ-අසමාහිතං වා චිත්තං-පෙ-විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානාති අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති.

අයං ඛො බ්‍රාහ්මණ, යඤ්ඤෙ පුරිමෙහි යඤ්ඤෙහි අපපධානතරො ච අපසමාරම්භතරො ච මහප්ඵලතරො ච මහානිසංසතරො ච.

85. හේ මෙසේ සිත එකඟ වූ කල්හි, පිරිසිදු වූ කල්හි, දීප්තිමත් වූ කල්හි, නිකෙලෙස් වූ කල්හි, උපක්ලේශ පහ වූ කල්හි, මොළොක් වූ කල්හි, කම්කළම කල්හි, සිත කල්හි, නිසල බව් පත් කල්හි, පර සිත් දන්නා නුවණ පිණිස සිත යොමු කෙරෙයි. නැඹුරු කෙරෙයි. (එසේ වූ) හේ අන් සතුන්ගේ අන් පුගුලන්ගේ සිත සිය සිතින් පිරිසිදැ දනියි. සරාග සිත සරාග සිතැ යි දනී. රාගරහිත සිත රාගරහිත සිතැ යි ද දනියි. සදෙවෂ සිත සදෙවෂ සිතැ යි ද දනී. දෙවෂ රහිත සිත දෙවෂ රහිත සිතැ යි ද දනියි. සමෝහ සිත සමෝහ සිතැ යි දනී. මෝහරහිත සිත මෝහරහිත සිතැ යි ද දනියි. හැකුළුණු සිත හැකුළුණු සිතැ යි ද දනියි. විසුරුණු සිත විසුරුණු සිතැ යි ද දනියි. මහද්ගත සිත මහද්ගත සිතැ යි ද දනියි. අමහද්ගත සිත අමහද්ගත සිතැ යි ද දනියි. සෞත්තර සිත සෞත්තර සිතැ යි ද දනියි. නිරුත්තර සිත නිරුත්තර සිතැ යි ද දනියි. එකඟ සිත එකඟ සිතැ යි ද දනී. නොඑකඟ සිත නොඑකඟ සිතැ යි ද දනියි. මිදුණු සිත මිදුණු සිතැ යි ද දනී. නොමිදුණු සිත නොමිදුණු සිතැ යි ද දනියි.

86. බමුණ, ළදරු වේවයි තරුණ වේවයි සැරැසෙන පුළු ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ පිරිසිදු පිවිතුරු කැඩපතෙක හෝ පහන් දියැති බඳුනෙක හෝ සිය මුව සටහන පිරික්සා බලන්නේ තලකැලැල් ඇ දෙස් ඇති තැන් දෙස් ඇති තැනැ යි දන්නේ ද, ඒ දෙස් නැති තැන් දෙස් නැති තැනැ යි දන්නේ ද,

බමුණ, එ පරිද්දෙන් ම මහණ තෙමේ මෙසේ (උඩ කී පරිදි) සිත එකඟ වූ කල්හි, පිරිසිදු වූ කල්හි, නිකෙලෙස් වූ කල්හි, උපක්ලේශ පහ වැ ගිය කල්හි, මොළොක් වූ කල්හි, කම්කළම කල්හි, සිත කල්හි, නිසලබව් පත් කල්හි, පරසිත් දන්නා නුවණ පිණිස සිත මොනොවට යොමු කෙරෙයි, මොනොවට නතු කෙරෙයි.

හේ අන් සතුන්ගේ අන් පුගුලන්ගේ සිත සිය සිතින් පිරිසිදැ දනී: සරාග සිත සරාග සිතැ යි ද දනී. විතරාග සිත විතරාග සිතැ යි ද දනී. සදෙවෂ සිත සදෙවෂ සිතැ යි ද...විතදෙවෂ සිත විතදෙවෂ සිතැ යි ද...සමෝහ සිත සමෝහ සිතැ යි ද...විතමෝහ සිත විතමෝහ සිතැ යි ද...සංක්ෂිප්ත සිත සංක්ෂිප්ත සිතැ යි ද...වික්ෂිප්ත සිත වික්ෂිප්ත සිතැ යි ද...මහද්ගත සිතැ මහද්ගත සිත යි ද...අමහද්ගත සිත අමහද්ගත සිතැ යි ද...සෞත්තර සිත සෞත්තර සිතැ යි ද...නිරුත්තර සිත නිරුත්තර සිතැ යි ද...සමාහිත සිත සමාහිත සිතැ යි ද...;අසමාහිත සිත අසමාහිත සිතැ යි ද...,විමුක්ත සිත විමුක්ත සිතැ යි ද...,අවිමුක්ත සිත අවිමුක්ත සිතැ යි ද දනී.

බමුණ, මේ වනාහි පළමු කී යඥයට වඩා මද කටයුතු ඇති, වඩා මද තැනෙකින් සිදු කට හැකි ඒ හැමට වඩා මහත් පල ද ඇති, වඩා මහත් අනුහස් ද ඇති යාගයෙක.

87. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ පුබ්බෙ-නිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො අනෙක-විහිතං පුබ්බෙනිවාසං අනුස්සරති සෙය්‍යථිදං: එකම්පි ජාතිං දෙ'පි ජාතියො තිස්සො'පි ජාතියො චතස්සො'පි ජාතියො පඤ්චපි ජාතියො දසපි ජාතියො වීසම්පි ජාතියො තිංසම්පි ජාතියො චත්තාරීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි අනෙකෙ'පි සංවට්ටකප්පෙ අනෙකෙ'පි විවට්ටකප්පෙ අනෙකෙ'පි සංවට්ට-විවට්ටකප්පෙ: "අමුත්‍රාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො අමුත්‍ර උපපාදිං. තත්‍රාපාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො ඉධූපපන්නො"ති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

88. සෙය්‍යථා'පි බ්‍රාහ්මණ, පුරිසො සකම්හා ගාමා අඤ්ඤං ගාමං ගච්ඡෙය්‍ය, තම්හාපි ගාමා අඤ්ඤං ගාමං ගච්ඡෙය්‍ය. සො තම්හා ගාමා සකඤ්ඤදව ගාමං පච්චාගච්ඡෙය්‍ය, තස්ස එවමස්ස: "අහං ඛො සකම්හා ගාමා අමුං ගාමං අගච්ඡිං, තත්‍ර එවං අට්ඨාසිං එවං නිසීදිං එවං අභාසිං එවං තුණ්හී අහොසිං. තම්හාපි ගාමා අමුං ගාමං අගච්ඡිං. තත්‍රාපි එවං අට්ඨාසිං එවං නිසීදිං එවං තුණ්හී අහොසිං. සො'ම්හි තම්හා ගාමා සකඤ්ඤදව ගාමං පච්චාගතො"ති.

එවමෙව ඛො බ්‍රාහ්මණ, භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ පුබ්බෙනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති සෙය්‍යදං: එකම්පි ජාතිං දෙවිපි ජාතියො තිස්සොපි ජාතියො චතස්සොපි ජාතියො පඤ්චපි ජාතියො දසපි ජාතියො වීසම්පි ජාතියො තිංසම්පි ජාතියො චත්තාරීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි අනෙකෙපි සංවට්ටකප්පෙ අනෙකෙපි විවට්ටකප්පෙ අනෙකෙපි සංවට්ටවිවට්ටකප්පෙ අමුත්‍රාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො අමුත්‍ර උපපාදිං. තත්‍රාපාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො ඉධූපපන්නො"ති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

87. හේ මෙසේ සිත එකඟ වූ කල පිරිසිදු වැ දීප්ත වැ නිකෙලෙස් වැ, උපක්ලේශ පහ වැ මෘදු වැ කර්ම්‍යම වැ නිසලබව් පත් වැ තහවුරු වැ සිටි කලැ පෙරැ වුසු කඳපිළිවෙළ දක්නා ඥාන පිණිස සිත මොනොවට යොමු කෙරෙයි, මොනොවට නතු කෙරෙයි. (එසේ වූ) හේ "අසෝ තැනැ මෙ නම් ඇතියෙම් වීම්, මෙ ගොත් ඇතියෙම් වීම්, මෙබඳු පැහැසටහන් ඇතියෙම් වීම්, මෙබඳු අහරැතියෙම් වීම්, මෙබඳු සුව දුක් විඳිනුයෙම් වීම්, මෙබඳු ආයු කෙළවර ඇතියෙම් වීම්, ඒ මම එයින් සැවැ අසෝ තැනැ උපතිම්. එහි දු මෙ නම් ඇතියෙම් වීම්, මෙ ගොත් ඇතියෙම් වීම්. මෙබඳු පැහැ සටහන් ඇතියෙම් වීම්, මෙ බඳු අහරැතියෙම් වීම්, මෙ බඳු සුව දුක් විඳිනු-යෙම් වීම්. මෙබඳු ආයු සීමා ඇතියෙම් වීම්. ඒ මම එයින් සැවැ මෙහි උපතිම්" යි මෙසේ එක් ජාතියක් ද ජාති දෙකක් ද ජාති තුනක් ද ජාති සතරක් ද ජාති පසක් ද ජාති දසයක් ද ජාති විස්සක් ද ජාති තිසක් ද ජාති සතළිසක් ද ජාති පනසක් ද ජාති සියක් ද ජාති දහසක් ද ජාති සුවහසක් ද, බොහෝ සංවර්ත කල්ප ද බොහෝ විවර්ත කල්ප ද බොහෝ සංවර්ත විවර්ත කල්ප ද මෙසේ නොයෙක් වැදැරුම් කඳපිළිවෙළ සිහි කෙරෙයි. මෙසේ පැහැ සටහන් ඇ පිසින් අයුරැ සහිත, නම් ගොත් විසින් උදෙසුම් සහිත බොහෝ වැදැරුම් පෙර වුසු කඳපිළිවෙළ සිහි කෙරෙයි.

88. බමුණ, යම්සේ පුරුෂයෙක් සිය ගමින් අන් ගමකට යන්නේ ද, එ ගමිනුත් අන් ගමකට යන්නේ ද, යළි ඒ ගමින් සිය ගමට පෙරළා එන්නේ ද, එසේ වූ ඔහුට "මම වූ කලි සිය ගමින් අසෝ ගමට ගියෙම්, එහි මෙසේ සිටියෙම්, මෙසේ හුන්නෙම්, මෙසේ කීම්, මෙසේ නිහඬ වීම්. එ ගමිනුත් අසෝ ගමට ගියෙම්, එහි දු මෙසේ සිටියෙම්, මෙසේ හුන්නෙම්, මෙසේ කීම්, මෙසේ නිහඬ වීම්, ඒ මම එ ගමින් සිය ගමට ම පෙරළා ආයෙම් වෙම්"යි ඔහුට මෙබඳු සිතෙක් වන්නේ ද,

බමුණ, එ පරිද්දෙන් ම මහණ තෙමේ මෙසේ සිත සමාහිත වැ පිරිසිදු වැ දීප්ත වැ නිකෙලෙස් වැ උපක්ලේශ පහ වැ මොළොක් වැ කර්ම්‍යම වැ නිසල බව් පත් වැ තහවුරු වැ සිටි කල්හි පෙරැ වුසු කඳපිළිවෙළ සිහි කරන ඥාන පිණිස සිත මොනොවට යොමු කෙරෙයි. මොනොවට නතු කෙරෙයි. හේ "අසෝ තැනැ මෙ බඳු නම් ඇතියෙම් වීම්, මෙ බඳු ගොත් ඇතියෙම් වීම්, මෙ බඳු පැහැ සටහන් ඇතියෙම් වීම්, මෙ බඳු අහර ඇතියෙම් වීම්, මෙ බඳු සුව දුක් විඳුනෙම් වීම්, මෙ බඳු ආයු සීමා ඇතියෙම් වීම්. ඒ මම එයින් සැවැ අසෝ තැනැ උපතිම්, එහි ද මෙබඳු නම් ඇතියෙම් වීම්, මෙබඳු ගොත් ඇතියෙම් වීම්, මෙබඳු පැහැ සටහන් ඇතියෙම් වීම්, මෙ බඳු අහර ඇතියෙම් වීම්, මෙ බඳු සුවදුක් විඳුනෙම් වීම්. මෙතෙක් ආයු සීමා ඇතියෙම් වීම්. ඒ මම එයින් සැවැ මෙහි උපතිම්"යි මෙසේ එක් දයක් ද දෙ දයක් ද තෙ දයක් ද සිවු දයක් ද පස් දයක් ද දස දයක් ද විසි දයක් ද තිස් දයක් ද සාළිස් දයක් ද පනස් දයක් ද සිය දයක් ද දහස් දයක් ද සුවහස් දයක් ද බොහෝ පිරිහෙන කප් ද බොහෝ වැඩෙන කප් ද බොහෝ පිරිහෙන වැඩෙන කප් ද යි මෙසේ නොයෙක් වැදැරුම් පෙරැ වුසු කඳපිළිවෙළ සිහි කෙරෙයි. මෙ පරිද්දෙන් අයුරැ සහිත උදෙසුම් සහිත පෙරැ වුසු නොයෙක් වැදැරුම් කඳපිළිවෙළ සිහි කෙරෙයි.

අයං ඛො බ්‍රාහ්මණ, යඤ්ඤෙසු පුරිමෙහි යඤ්ඤෙහි අපපටිකතරො ච අපපසමාරම්භතරො ච මහප්ඵලතරො ච මහානිසංසතරො ච.

89. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති: ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා'ති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්ත-මානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති.

90. සෙය්‍යථාපි බ්‍රාහ්මණ, මජ්ඣෙ සිංඝාටකෙ[1] පාසාදො. තත්ථ චක්ඛුමා පුරිසො ඨිතො පස්සෙය්‍ය මනුස්සෙ ගෙහං පවිසන්තෙ'පි නික්ඛමන්තෙ'පි රථියා විතිසඤ්චරන්තෙ'පි මජ්ඣෙ සිංඝාටකෙ[1] නිසින්නො'පි. තස්ස එවමස්ස, එතෙ මනුස්සා ගෙහං පවිසන්ති, එතෙ නික්ඛමන්ති, එතෙ රථියා විතිසඤ්චරන්ති, එතෙ මජ්ඣෙ සිංඝාටකෙ[1] නිසින්නා'ති;

එවමෙව ඛො බ්‍රාහ්මණ, භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්ත-මානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති: ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡා-දිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. –

1. මජ්ඣෙ සිංඝාටකං

බමුණ, මේ පළමු දක්වුණු යඥයනට වඩා මඳ කටයුතු ඇති වඩා මඳ තැතින් සිදු කට හැකි, වඩා මහත් පල ද වඩා මහත් අනුශස් ද ඇති යඥයෙක.

89. ඒ මහණ මෙසේ සිත සමාහිත වැ පිරිසිදු වැ දීප්ත වැ කෙලෙස් නැති වැ උපක්ලේශ පහ වැ මෘදු වැ කර්ම්ක්ෂම වැ නිසල බව් පත් වැ තහවුරු වැ සිටි කල්හි සත්වයන්ගේ චුතු උපපත්ති දක්නා නුවණ පිණිස සිත මොනොවට යොමු කෙරෙයි, මොනොවට තැබුරු කෙරෙයි. හේ පිරිසිදු වූ, මිනිසුන්ගේ දැකුම් ඉම ඉක්මැ දැක්කැ හැකි දිවැසින්, 'අහෝ මේ භවත් සත්වයෝ කායදුශ්චරිතයෙන් සමන්විතයහ, වාග්දුශ්චරිතයෙන් සමන්විතයහ, මනොදුශ්චරිතයෙන් සමන්විතයහ, ආර්‍යෝපවාද කළෝ ය. මිසදිටු ගතුවහ, මිසදිටු විසින් ගත් මිථ්‍යාවිත ඇතියහ. ඔහු කා බුන් මරණින් මතු සුවින් තොර, නපුරු කමින් උපන් ගති වූ (කර්‍යයට තමන් යටත් බැවින්) තමනට අවශ්‍ය වැ වැටෙන තැන් වූ නිරයට වන්නෝ ය. මේ භවත් සත්වයෝ වූ කලි කායසුචරිතයෙන් වාක්-සුචරිතයෙන් මනසුචරිතයෙන් සමන්විතයහ. ආර්‍යයනට උපවාද නො කොළෝ ය. සම්දිටු ගතුවහ. සම්දිටු විසින් ගත් සිල් ඇ ඇතියහ. ඔහු කාබුන් මරණින් මතු හොබනා ගති ඇති සග ලොව් වන්නෝ යැ''යි මරණාසන්න වූ ද එ කෙණෙහි පිළිසඳ ගතුවන් වූ ද හීන වූ ද උසස් වූ ද මනා පැහැසටහන් ඇති වූ ද නොමනා පැහැසටහන් ඇති වූ ද සුගතියට පැමිණි ද දුගතියට පැමිණි ද කම් වූ පරිදි ඒ ඒ භවයට ගිය සතුන් දකී. මෙසේ හේ පිරිසිදු වූ, මිනිස් විසා ඉක්මැ සිටි දිවැසින් පහත් උසස් සුවන් දුවන් සුගී දුගී සතුන් දකී. කම් වූ පරිදි ඒ ඒ බව කරා එළැඹැ සිටි සතුන් දකී.

90. බමුණ, යම් සේ සිවුමං හන්දියෙකැ මහල් ඇති ගෙයෙක් වන්නේ ද. එහි උඩු මහලෙහි ඇස් ඇති පුරුෂයෙක් සිටියේ, ගෙ වදිනාවුනුත් ගෙන් නික්මෙනවුනුත් වීදියෙහි ඇත මැත යන එනවුනුත් සිවුමංහන්දිය මැද හුන්නවුනුත් දක්නේ ද, ඒ දක්නා ඔහුට "මේ මිනිස්සු ගෙ වදිත්, මොහු ගෙන් නික්මෙත්. මොහු වෙයෙහි ඇත මැත යෙත්. මොහු සිවුමං-හන්දිය මැද හුන්නාහැ'යි මෙසේ සිතෙක් වන්නේ ද,

බමුණ, එසේ ම මහණ තෙමේ සිත මෙ පරිද්දෙන් එකග වැ පිරිසිදු වැ දිමුත් වැ නිකෙලෙස් වැ උපක්ලේශ නැති වැ මොළොක් වැ කර්ම්ක්ෂම වැ නිසල බව් පත් වැ තහවුරු වැ සිටි කල්හි, සතුන් ගේ මැරුම් දිනුම් දක්නා නුවණ ලබනුවට සිත මොනොවට යොමු කෙරෙයි, මොනොවට නැඹුරු කෙරෙයි. හේ මිනිස් විසා ඉක්මැවූ පිරිසිදු දිවැසින් 'අහෝ මේ භවත් සත්වයෝ කායසිරියෙන් විසීදුසිරියෙන් මන්දුසිරියෙන් යුතුහ. අරිපුතුලනට දෙස් තැඹුහ. මිසදිටු ගතුවහ. මිසදිටු විසින් ගත් සදෙස් වත් ඇතියහ. ඒ මොහු කාබුන් මරණින් මතු සුවෙන් පහ වූ නපුරු කමින් උපන් තමනට තමන් අවශ්‍ය වැ වැටෙන තැන් වූ නිරා වන්නහ. -

ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා 'ති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති.

අයං ඛො බ්‍රාහ්මණ, යඤ්ඤ පුරිමෙහි යඤ්ඤෙහි අප්පටිඨතරො ච අප්පසමාරම්භතරො ච මහප්ඵලතරො ච මහානිසංසතරො ච.

91. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති. 'අයං දුක්ඛසමුදයො' ති යථාභූතං පජානාති. 'අයං දුක්ඛනිරොධො ති යථාභූතං පජානාති. 'අයං දුක්ඛනිරොධගාමිනීපටිපදා' ති යථාභූතං පජානාති. 'ඉමෙ ආසවා' ති යථාභූතං පජානාති. 'අයං ආසවසමුදයො ' ති යථාභූතං පජානාති. 'අයං ආසවනිරොධො' ති යථාභූතං පජානාති. 'අයං ආසවනිරොධගාමිනීපටිපදා' ති යථාභූතං පජානාති. තස්ස එවං ජානතො එවං පස්සතො කාමාසවා' පි චිත්තං විමුච්චති. භවාසවා'පි චිත්තං විමුච්චති. අවිජ්ජාසවා'පි චිත්තං විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායා' ති පජානාති.

92. සෙය්‍යථාපි බ්‍රාහ්මණ, පබ්බතසඤ්ඤෙ උදකරහදෙ අච්ඡෝ විප්පසන්නො අනාවිලො, තත්ථ චක්ඛුමා පුරිසො තීරෙ ඨිතො පස්සෙය්‍ය සිප්පිසම්බුකම්පි සක්ඛරකඨලම්පි මච්ඡගුම්බම්පි චරන්තම්පි තිට්ඨන්තම්පි. තස්ස එවමස්ස: අයං ඛො උදකරහදො අච්ඡො විප්පසන්නො අනාවිලො. තත්‍රිමෙ සිප්පිසම්බුකා'පි සක්ඛරකඨලා'පි මච්ඡගුම්බා'පි චරන්ති' පි තිට්ඨන්ති පි'ති;

එවමෙව ඛො බ්‍රාහ්මණ, භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. 'සො ඉදං දුක්ඛන්ති' යථාභූතං පජානාති. 'අයං දුක්ඛසමුදයො'ති යථාභූතං පජානාති. 'අයං දුක්ඛනිරොධො' ති යථාභූතං පජානාති. 'අයං දුක්ඛනිරොධගාමිනීපටිපදා' ති යථාභූතං පජානාති. 'ඉමෙ ආසවා'ති යථාභූතං පජානාති. 'අයං ආසවසමුදයො' ති යථාභූතං පජානාති. 'අයං ආසවනිරොධො' ති යථාභූතං පජානාති. අයං ආසවනිරොධගාමිනීපටිපදා' ති යථාභූතං පජානාති.

එහෙත් මේ භවත් සත්ත්වයෝ වූ කලි කාසුසිරියෙන් විසිසුසිරියෙන් මන්සුසිරියෙන් යුතුවහ, අරීනට දෙස් නොනැඟුවහ, සම්දිටුහ, සම්දිටු විසින් ගත් සිල් ඇ ඇතියහ. මොහු කා බුත් මරණින් මතු මනා ගති ඇති සග ලොව් වන්නහැ'සි මෙසේ මැරෙනු ලං වූ ද, පිළිසඳ ගත් කෙණෙහි වූ ද, පහත් වූ ද, උසස් වූ ද, මනා පැහැ සටහන් ඇති වූ ද, නොමනා පැහැ සටහන් ඇති වූ ද, සුගති පැමිණි ද, දුගති පැමිණි ද, කම් වූ පරිදි ඒ ඒ භවයට ගිය සතුන් දකී. මෙසේ පිරිසිදු වූ මිනිස් විසා ඉක්මැ පැවැති දිවැසින් උස් පහත් මනා පැහැති නොමනා පැහැති සුගී දුගී සතුන් දකී. කම් වූ පරිදි ඒ ඒ භවය කරා එළැඹැ සිටි සතුන් දකී.

බමුණ, මේ වූ කලි පළමු දුක්වුණු යඥයනට වඩා මඳ කටයුතු ඇති, වඩා මඳ තැතින් සිදු කට හැකි, එහෙත් වඩා මහත් පල ද ඇති වඩා අනුහස් ද ඇති යඥයෙක.

91. හේ මෙසේ සිත එකඟ වැ පිරිසිදු වැ දිමුත් වැ නිකෙලෙස් වැ උපක්ලෙශ පහ වැ මොළොක් වැ කම්ක්ෂම වැ නිසලබව් පත් වැ තහවුරු වැ සිටි කල්හි, ආස්‍රවයන්ගේ වැනැස්ම පිණිස සිත මොනොවට යොමු කෙරෙයි, මොනොවට නතු කෙරෙයි. එසේ වූ හෙ තෙමේ 'මේ දුකැ'යි ඇති සැටියෙන් දනී. 'මේ දුක් උපදනා කරුණු යැ' යි ඇති සැටියෙන් දනී. 'මේ (දුක් වැනැස්මට අරමුණු වන) නිවනැ' යි ඇති සැටියෙන් දනී. 'මේ දුක් වැනැස්මට පමුණුවන පිළිවෙතැ' යි ඇති සැටියෙන් දනී. මොහු ආස්‍රවහ යි ඇති සැටියෙන් දනී, මේ ආස්‍රව ඉපැත්මට කරුණු යැ යි ඇති සැටියෙන් දනී. මේ ආස්‍රවනිරොධයට අරමුණු වන නිවනැ යි ඇති සැටියෙන් දනී. මේ ආස්‍රවනිරොධයට පමුණුවන පිළිවෙතැ යි ඇති සැටියෙන් දනියි. මෙසේ දන්නා මෙසේ දක්නා ඔහු හේ සිත කාමාස්‍රවය කෙරෙන් ද මිදේ, භවාස්‍රවය කෙරෙන් ද මිදේ, අවිද්‍යාස්‍රවය කෙරෙන් ද මිදේ. එසේ මිදුණු කල්හි 'මා සිත ආස්‍රව කෙරෙන් මිදිණැ'යි පස්පිකුම් නුවණ වේ. බව උපත නැවැතිණ. මඟ බඹසර වැසැ නිමැවිණ. සිවු සස්හි සිවු මඟින් කල යුතු සොළොස් වැදැරුම් කිස කොටැ නිමැවිණ. මේ කෙලෙස් නසනු පිණිස තවත් කල යුතු දෑයෙක් නැතැ'යි හේ දනී.

92. බමුණ, යම්සේ කදු මුදුනෙක වූ, පහත්, වෙසෙසින් පහත්, නොබොර විලෙක් වන්නේ නම්, එහි ඉවුරු ඇස් ඇති මිනිසෙක් සිටියේ, එය තුළැ හැසිරෙන ද සිටුනා ද සිප්පිබෙල්ලනුත් සක්බෙල්ලනුත් කැට කැබැලිතිත් මස්කැලත් දක්නේ ද, (එසේ දක්නා) ඔහුට මේ විල පහත් ය, වෙසෙසින් පහත් ය, නොබොර ය. මෙහි "මේ සිප්පිහුත් සක්බෙලේලෝත් කැටකැබැලිතිත් මස් කැලත් හැසිරෙන්නෝත් සිටින්නෝත් වෙති"යි මෙසේ සිතෙක් වන්නේ ද,

බමුණ, එසේ ම මහණ තෙමේ මෙසේ සිත එකඟ වැ පිරිසිදු වැ දිමුත් වැ නිකෙලෙස් වැ උපක්ලෙශ පහ වැ මොළොක් වැ කම්ක්ෂම වැ නිසලබව් පත් වැ තහවුරු වැ සිටි කල්හි ආස්‍රවක්ෂයඥනය පිණිස සිත මොනොවට යොමු කෙරෙයි, මොනොවට නැඹුරු කෙරෙයි. හේ 'මේ දුකැ'යි ඇති සැටියෙන් දනී. 'මේ දුකට කරුණැ' යි ඇති සැටියෙන් දනී. 'මේ දුක් වැනැස්මැ'යි ඇති සැටියෙන් දනී. 'මේ දුක්වැනැස්මට පමුණුවන පිළිවෙතැ'යි ඇති සැටියෙන් දනී. 'මේ ආස්‍රවහ' යි ඇති සැටියෙන් දනී. 'මේ ආස්‍රවසමුදය යැ'යි ඇති සැටියෙන් දනී. 'මේ ආස්‍රවනිරොධය යැ' යි ඇති සැටියෙන් දනී. 'මේ ආස්‍රවනිරොධගාමිනී පිළිවෙතැ'යි ඇති සැටියෙන් දනී.

තස්ස එවං ජානතො එවං පස්සතො කාමාසවා' පි චිත්තං විමුච්චති. භවාසවා' පි චිත්තං විමුච්චති. අවිජ්ජාසවා' පි චිත්තං විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති.

අයම්පි ඛො බ්‍රාහ්මණ, යඤ්ඤෙ පුරිමෙහි යඤ්ඤෙහි අප්පටිත්තරො ච අප්පසමාරම්භතරො ච මහානිසංසතරො ච. ඉමායෙ ච බ්‍රාහ්මණ යඤ්ඤ-සම්පදායෙ අඤ්ඤ යඤ්ඤසම්පදා උත්තරිතරා වා පණීතතරා වා නත්ථී"ති.

93. එවං වුත්තෙ කූටදන්තො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: අභික්කන්තං භො ගොතම්, අභික්කන්තං භො ගොතම්. සෙය්‍යථාපි භො ගොතම් නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නං වා විවරෙය්‍ය මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය: චක්ඛු-මන්තො රූපානි දක්ඛින්තීති. එවමෙව භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භවන්තං ගොතමං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝං ච. උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතං. එසාහං භො ගොතම සත්ත ච උසභසතානි සත්ත ච වච්ඡතරසතානි, සත්ත ච වච්ඡතරීසතානි, සත්ත ච අජ්ජසතානි සත්ත ච උරබ්භසතානි මුඤ්චාමි, ජීවිතං දෙමි. හරිතානි චෙව තිණානි ඛාදන්තු සීතානි ච පානීයානි පිවන්තු සීතො ච නෙසං වාතො උපවායතූති.

94. අථ ඛො භගවා කූටදන්තස්ස බ්‍රාහ්මණස්ස ආනුපුබ්බිකථං කථෙසි සෙය්‍යථීදං ? දානකථං සීලකථං සග්ගකථං කාමානං ආදීනවං ඔකාරං සංකිලෙසං නෙක්ඛම්මෙ ච ආනිසංසං පකාසෙසි. යදා භගවා අඤ්ඤාසි කූටදන්තං බ්‍රාහ්මණං කල්ලචිත්තං මුදුචිත්තං විනීවරණචිත්තං උදග්ග-චිත්තං පසන්නචිත්තං. අථ යා බුද්ධානං සාමුක්කංසිකා ධම්මදෙසනා, තං පකාසෙසි: දුක්ඛං සමුදයං නිරොධං මග්ගං.

සෙය්‍යථාපි නාම සුද්ධං වත්ථං අපගතකාළකං සම්මදෙව රජනං පටිග්ග-ණ්හෙය්‍ය, එවමෙවං කූටදන්තස්ස බ්‍රාහ්මණස්ස තස්මිං යෙව ආසනෙ විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි: යං කිඤ්චි සමුදයධම්මං සබ්බන්තං නිරොධධම්මන්ති

95. අථ ඛො කූටදන්තො බ්‍රාහ්මණො දිට්ඨධම්මො පත්තධම්මො විදිතධම්මො පරියොගාළ්හධම්මො තිණ්ණවිචිකිච්ඡො විගතකථංකථො වෙසාරජ්ජප්පත්තො අපරප්පච්චයො සත්ථුසාසනෙ භගවන්තං එතදවොච: අධිවාසෙතු මෙ භවං ගොතමො ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනාති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන.

මෙසේ දන්නා මෙසේ දක්නා බහු සිත කාමාස්‍රවයෙන් ද මිදෙයි. භවාස්‍රවයෙන් ද මිදෙයි. අවිද්‍යාස්‍රවයෙන් ද මිදෙයි. මිදුණු කල්හි 'මිදුණේ ය'යි දැනීම වේ. "භවෝත්පත්තිය ක්ෂීණ විය. මගබඹසර වැස නිමැවිණ. සිවුමඟින් කළ යුතු සොළොස් කිස කොටැ නිමැවිණ. මෙ බව් පිණිස කළ යුතු තව කිසිත් නැතැ" යි හේ දනී.

"බමුණ, මේ පළමු දැක්වුණු (සියලු) යඥයනට වඩා මඳ කටයුතු ඇති, වඩා මඳ තැතින් සිදු කටහැකි, (එහෙත්) වඩා මහත් පල ද ඇති, වඩා මහත් අනුසස් ද ඇති යඥය ය. බමුණ, මේ යාග සම්පතට වඩා මනොඥවූ උතුම් වූ අන් යාගසම්පතෙක් නැත."

93. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ කල්හි කූළුදන් බමුණු තෙමේ, "වහන්ස, දෙසුම මනා ම ය. වහන්ස, දෙසුම මනා ම ය. වහන්ස, යම්සේ යැපිකුරු කොට තැබුණු බඳුනක් උඩුකුරු කරන්නේ හෝ වේ ද, වැසුණු යමක් වැසුම් හැර දක්වන්නේ හෝ වේ ද, මං මුලාවූවකුට මඟ කියන්නේ හෝ වේ ද, 'ඇස් ඇතියන් රූප දකිතැ'යි අඳුරෙහි තෙල් පහනක් දල්වන්නේ හෝ වේ ද, වහන්ස, එසේ ම භාග්‍යවතුන් වහන්සේ විසින් මට නොයෙක් අයුරින් දහම පැවැසිණ, වහන්ස, ඒ මම භාග්‍යවත් ගෞතමයන් වහන්සේ ද දහම ද බික් සඟන ද සරණ යෙමි. වහන්ස, අද පටන් දිවිහිමි කොට සරණ ගිය උපාසකයකු කොට භවද් ගෞතමයන් වහන්සේ මා දැන වදාරණ සේක් වා. භවද් ගෞතමයන් වහන්ස, ඒ මම සත්සියක් ගොනුන් ද සත්සියක් නාඹු වස්සන් ද සත්සියක් නාඹු වැස්සියන් ද සත් සියක් එළුවන් ද සත්සියක් තරුණ බැටළුවන් ද මුදා ලමි. ඔවුනට දිවි දෙමි. නිල්තණ බුදින්ව යි ද, සිහිල් පැන් බොන්ව යි ද, ඔවුනට සිහිල් පවන ද හමන්ව'යි කියයි.

94. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ කූළුදන් බමුණුහට දැනකථා, ශීලකථා, සවර්ගකථා, කාමාදීනව, කාමයන්ගේ ලාමකබව, කාමයන්ගේ කෙලෙසීම, නෙක්ඛම්මයෙහි අනුසස් පැවසූ සේක. භාග්‍යවතුන් වහන්සේ යම් විටක කූළුදන් බමුණහු (ඒ දහම් ඇසීමෙන්) නීරෝග සිතැති වූවහු, මොළොක් සිතැති වූවහු, නීවරණයන්ගෙන් පහවූ සිතැත්තහු, ඔදවැසිගිය පහන් සිතැත්තහු දත් සේක් ද, එකල්හි දුඃඛ සමුදය නිරෝධ මාර්ග යන බුදුවරුන්ගේ යම් සාමුක්කංසිකී ධර්මදෙශනාවක් වේ නම් එය පැවසූ සේක.

යම් සේ පිරිසිදු වූ පහ වූ කළු බව් ඇති වතෙක් මොනොවට ම රදන් පිළිගන්නේ ද, එසේ ම කූළුදන් බමුණුහට එ අස්නෙහි ම, යමෙක් උපදනා සුලු නම් ඒ සියල්ල නැසෙන සුලු වේ යැ යි කෙලෙස් රජස් රහිත, කෙලෙස් මල රහිත දහම් ඇස පහළ විය.

95. ඉක්බිති (මෙසේ) දුටු අරිසස් දහම් ඇති, පැමිණි අරිසස් දහම් ඇති, ප්‍රකට වූ අරිසස් දහම් ඇති, බැසැ ගත් අරිසස් දහම් ඇති, නිඝ්‍ණ විසිකිස් ඇති, පහ වූ සැක ඇති, බුදුසස්තැ විසාරද බවට පැමිණි, පරප්‍රත්‍යය රහිත වූ කූළුදන් බමුණු තෙමේ 'පින්වත් ගෞතම තෙමේ සෙට දිනට මගේ බත බික් සඟන හා ඉවසා වා'යි භාග්‍යවතුන් වහන්සේට කී ය. භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම්භාවයෙන් එය ඉවැසූ සේක.

97. අථ ඛො කූටදන්තො බ්‍රාහ්මණො භගවතො අධිවාසනං විදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි. අථ ඛො කූටදන්තො බ්‍රාහ්මණො තස්සා රත්තියා අච්චයෙන සකෙ යඤ්ඤවාටෙ පණීතං ඛාදනීයං භොජනීයං පටියාදාපෙත්වා භගවතො කාලං ආරොචාපෙසි: කාලො භො ගොතම, නිට්ඨිතං භත්තන්ති.

98. අථ ඛො භගවා පුබ්බන්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය සද්ධිං භික්ඛුසඞ්ඝෙන යෙන කූටදන්තස්ස බ්‍රාහ්මණස්ස යඤ්ඤවාටො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. අථ ඛො කූටදන්තො බ්‍රාහ්මණො බුද්ධපමුඛං භික්ඛුසඞ්ඝං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්থා සන්තප්පෙසි සම්පවාරෙසි. අථ ඛො කූටදන්තො බ්‍රාහ්මණො භගවන්තං භුත්තාවිං ඔනීතපත්තපාණිං අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො කූටදන්තං බ්‍රාහ්මණං භගවා ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා උට්ඨායාසනා පක්කාමීති.

කූටදන්තසුත්තං නිට්ඨිතං පඤ්චමං.

97. ඉක්බිති කූළුදත් බමුණු භාග්‍යවතුන් වහන්සේ ඉවැසූ නියා දැනැ හුනස්නෙන් නැගී ඔබ වැඳැ පැදකුණු කොට නික්මුණේ ය. ඉන් පසු කූළුදත් බමුණු ඒ රැය ඇවැමෙන් සිය යාගශාලායෙහි ප්‍රණීත ඛාද්‍ය භෝජ්‍ය පිළියෙල කරවා, 'පින්වත් ගෞතමයිනි, දැන් කල් ය. බත නිමියේ යැ''යි භාග්‍යවතුන් වහන්සේට කල් දැන්වී ය.

98. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරැයෙහි හැඳැ පෙරෙවැ පාත්‍රිවුරු ගෙනැ බික් සඟන කැටුව කූළුදත් බමුණුගේ යාගාවාටය කරා එළැඹි සේක. එළැඹැ පැතැවූ අස්නැ වැඩැහුන් සේක. එ කල්හි කූළුදත් බමුණු බුදුපාමොක් බික්සඟන ප්‍රණීත ඛාද්‍ය භෝජ්‍යයෙන් සියතින් සැතැප්වී ය. පැවැරැවී ය. ඉන් පසු කූළුදත් බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේ වළඳ පාත්‍රයෙන් ඉවතට ගත් අත්ඇත්තවුන් දැනැ, මිටි අස්නක් ගෙන එක් පසෙක හිඳැගත්තේ ය. එසේ හුන් කූළුදත් බමුණුට භාග්‍යවතුන් වහන්සේ දැහැමි කතායෙන් කරැණු දක්වා ගුණදහම් ගන්වා ගුණදහම් වැඩිමෙහි උනන්දු කොට ගුණ වදරා සිත සතුටු කොට හුනස්නෙන් නැගී නික්මි සේක.

පස්වනු කූළුදත් සූතුර නිමියේ ය.

6. මහාලිසුත්තං

1. එවං මේ සුතං: එකං සමයං භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං.

තෙන ඛො පන සමයෙන සම්බහුලා කොසලකා ච බ්‍රාහ්මණදූතා මාගධකා ච බ්‍රාහ්මණදූතා වෙසාලියං පටිවසන්ති කෙනචිදෙව කරණීයෙන. අස්සොසුං ඛො තෙ කොසලකා ච බ්‍රාහ්මණදූතා මාගධකා ච බ්‍රාහ්මණදූතා, "සමණො ඛලු භො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො වෙසාලියං විහරති කූටාගාරසාලායං. තං ඛො පන භවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො: 'ඉති'පි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා'ති. සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති. සාධු ඛො පන තථාරූපානං අරහතං දස්සනං හොති"ති.

2. අථ ඛො තෙ කොසලකා ච බ්‍රාහ්මණදූතා මාගධකා ච බ්‍රාහ්මණදූතා යෙන මහාවනං කූටාගාරසාලා තෙනුපසඞ්කමිංසු. තෙන ඛො පන සමයෙන ආයස්මා නාගිතො භගවතො උපට්ඨාකො හොති. අථ ඛො තෙ කොසලකා ච බ්‍රාහ්මණදූතා මාගධකා ච බ්‍රාහ්මණදූතා යෙනායස්මා නාගිතො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ආයස්මන්තං නාගිතං එතදවොචුං: "කහං නු ඛො භො නාගිත, එතරහි සො භවං ගොතමො විහරති? දස්සනකාමා හි මයං තං භවන්තං ගොතමන්ති."

"අකාලො ඛො ආවුසො භගවන්තං දස්සනාය. පටිසල්ලීනො භගවා"ති.

අථ ඛො තෙ කොසලකා ච බ්‍රාහ්මණදූතා මාගධකා ච බ්‍රාහ්මණදූතා තත්‍රෙව එකමන්තං නිසීදිංසු: "දිස්වා'ව මයං තං භවන්තං ගොතමං ගමිස්සාමා"ති.

3. ඔට්ඨද්ධො'පි ලිච්ඡවී මහතියා ලිච්ඡවිපරිසාය සද්ධිං යෙන මහාවනං කූටාගාරසාලා යෙනායස්මා නාගිතො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං නාගිතං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො ඔට්ඨද්ධො'පි ලිච්ඡවී ආයස්මන්තං නාගිතං එතදවොච: "කහං නු ඛො භන්තෙ නාගිත, එතරහි සො භගවා විහරති අරහං සම්මාසම්බුද්ධො? දස්සනකාමා හි මයං තං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධන්ති."

6. මහාලි සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදි: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ විසල්පුර අසල මහවෙනෙහි කූලාරහල් මහ වෙහෙරෙහි වැඩ වසන සේක.

එ සමයෙහි වූ කලි කොසොල් රට වැසි බොහෝ බමුණු දූතයෝ ද මගද රට වැසි බොහෝ බමුණු දූතයෝ ද කිසි යම් ඇවැසි කටයුත්තෙකින් විසල් පුරේ (අවුත්) වෙසෙති. කොසොල් රටින් පැමිණි ද මගදරටින් පැමිණි ද එ බමුණු දූතයෝ රටේ පැතිරී පැවැති මේ කතාව ඇසූහ: (මෙ බදු කතාවෙක් ඔවුන් කතා වැටිණ.) "සැහැකුලෙන් නික් මැ පැවිදි වූ සැහැපුත් මහණ ගොයුම් තෙමේ වනාහි (මේ සමයෙහි) විසල්-පුරේ මහවෙනෙහි කූලාරහල් වෙහෙරේ වෙසෙයි. 'ඒ භගවත් තෙමේ මේ මේ කරුණිනුත් රහත් ය, සම්මාසම්බුදු ය, විද්‍යාචරණ සම්පන්න ය, සුගත ය, ලෝකවිත් ය, නිරුත්තර පුරුෂදම්‍යසාරථි ය, දෙවිමිනිස්නට ශාස්තා ය, බුදු ය, භගවත් ය' යි ඒ පින්වත් ගොයුම්හු පිළිබඳ කලණ කිත් හඬ උස් වැ නැංගේ ය. ඒ පින්වත් ගොයුම් තෙමේ දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත මේ ලොව, මහණ බමුණන් සහිත දෙව් මිනිසුන් සහිත සත් වග තෙමේ ම වෙසෙසින් දැන පසක් කොට (ලොවට) දන්වයි. හේ මුල කලණ වූ මැද කලණ වූ අග කලණ වූ අරුත් සහිත අකුරු සපුව සහිත හැම ලෙසින් පිරිපුන් දහම් දෙසයි. පිරිසිදු බඹසර පවසයි. එ බඳු වූ රහතුන් දැක්ම වූ කලි කිත වැඩ එළවනුයේ වෙයි"යනු යි.

2. ඉක්බිති, කොසොල් රටින් ද මගද රටින් ද පැමිණි ඒ බමුණු-දූතයෝ මහවෙනෙහි කූලාරහල් වෙහෙරට එළැඹියහ. එ සමයෙහි නාගිත තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේගේ උවටැන් වෙති. ඉක්බිති ඒ දෙරටින් ම ආ බමුණු දූතයෝ නාගිත තෙරුන් කරා ගියහ. ගොස්, 'පින්වත් නාගිත-යිනි, දැන් ඒ පින්වත් ගොයුමාණෝ කොහි වෙසෙත් ද? ඇපි වනාහි ඒ භවත් ගොයුමාණන් දක්නා රිසියම්හ'යි කීහ.

"ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ දක්නට (දැන්) කල් නො වේ ම ය. භාග්‍යවතුන් වහන්සේ (දැන්) පිළිසලනෙහි යෙදුණු සේක් වෙති"යි (නාගිත තෙරණුවෝ වදාළහ.)

එ විටැ ඒ බමුණු දූතයෝ 'අපි ඒ පින්වත් ගොයුමාණන් දැකැ ම යන්නම්හ' යි එහි ම එක් පසෙකැ හිඳ ගත්හ.

3. ඔටඨඩ්ඩ ලිච්ඡවි තෙමේ ද මහත් ලිච්ඡවි පිරිසක් හා මහවනයට කූලාරහලට, එහි නාගිත තෙරුන් වෙත එළැඹියේ ය. එළඹැ නාගිත තෙරුන් වැඳ පසෙකැ සිටියේ ය. පසෙකැ සිටි ඔටඨඩ්ඩ ලිච්ඡවි තෙමේ ද නාගිත තෙරුනට "වහන්ස, දැන් ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක්සම්බුදුයන් වහන්සේ කොහි වසන සේක් ද? අපි ඒ භගවත් රහත් සම්මාසම්බුදුන් දක්නා රිස්සමෝ"යි මෙ බස් කී ය.

"අකාලො ඛො මහාලි භගවන්තං දස්සනාය. පටිසල්ලීනො භගවා"ති. ඔට්ඨද්ධො'පි ලිච්ඡවි තත්‍රෙව එකමන්තං නිසීදි. "දිස්වා ච අහං තං භගවන්තං ගමිස්සාමි අරහන්තං සම්මාසම්බුද්ධන්ති."

4. අථ ඛො සීහො සමණුද්දෙසො යෙනායස්මා නාගිතො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං නාගිතං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. 'එකමන්තං ඨිතො ඛො සීහො සමණුද්දෙසො ආයස්මන්තං නාගිතං එතදවොච: එතෙ භන්තෙ කස්සප, සම්බහුලා කොසලකා ච බ්‍රාහ්මණදූතා මාගධකා ච බ්‍රාහ්මණදූතා ඉඬ්ඝපසඞ්කන්තා භගවන්තං දස්සනාය. ඔට්ඨද්ධො'පි ලිච්ඡවි මහතියා ලිච්ඡවිපරිසාය සද්ධිං ඉඬ්ඝපසඞ්කන්තො භගවන්තං දස්සනාය. සාධු භන්තෙ කස්සප ලභතං එසා ජනතා භගවන්තං දස්සනාය'ති.

'තෙන හි සීහ, තත්‍රෙවේදානි භගවතො ආරොචෙහීති'. 'එවං භන්තෙ'ති ඛො සීහො සමණුද්දෙසො ආයස්මතො නාගිතස්ස පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො සීහො සමණුද්දෙසො භගවන්තං එතදවොච: "එතෙ භන්තෙ සම්බහුලා කොසලකා ච බ්‍රාහ්මණදූතා මාගධකා ච බ්‍රාහ්මණදූතා ඉඬ්ඝප-සඞ්කන්තා භගවන්තං දස්සනාය, ඔට්ඨද්ධො'පි ලිච්ඡවි මහතියා ලිච්ඡවිපරිසාය සද්ධිං ඉඬ්ඝපසඞ්කන්තො භගවන්තං දස්සනාය. සාධු භන්තෙ ලභතං එසා ජනතා භගවන්තං දස්සනාය"ති.

"තෙන හි සීහ විහාරපච්ඡායායං ආසනං පඤ්ඤපෙහි"ති.

"එවං භන්තෙ'ති ඛො සීහො සමණුද්දෙසො භගවතො පටිස්සුත්වා විහාරපච්ඡායායං ආසනං පඤ්ඤපෙසි. අථ ඛො භගවා විහාරා නික්ඛම්ම විහාරපච්ඡායායං පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි.

5. අථ ඛො තෙ කොසලකා ච බ්‍රාහ්මණදූතා මාගධකා ච බ්‍රාහ්මණදූතා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදිංසු. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. ඔට්ඨද්ධො'පි ලිච්ඡවි මහතියා ලිච්ඡවිපරිසාය සද්ධිං යෙන භගවා තෙනු-පසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ඔට්ඨද්ධො ලිච්ඡවි භගවන්තං එතදවොච:

"පුරිමානි භන්තෙ දිවසානි පුරිමතරානි සුතක්ඛත්තෙතා ලිච්ඡවිපුත්තෙතා යෙනාහං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මං එතදවොච: 'යදග්ගෙ අහං මහාලි, භගවන්තං උපනිස්සාය විහරාමි න චිරං තීණි වස්සානි, දිබ්බානි ඛො රූපානි පස්සාමි පියරූපානි කාමූපසංහිතානි රජනීයානි. තො ච ඛො දිබ්බානි සද්දානි සුණාමි පියරූපානි කාමූපසංහිතානි රජනීයානි"ති. සන්තා-නෙව නු ඛො භන්තෙ සුතක්ඛත්තෙතා ලිච්ඡවිපුත්තෙතා දිබ්බානි සද්දානි නාස්සොසි පියරූපානි කාමූපසංහිතානි රජනීයානි උදහු අසන්තානී"? ති.

"මහාලිය, භාග්‍යවතුන් වහන්සේ දක්නට දැන් නොකල් ය. භාග්‍යවතුන් වහන්සේ දැන් පිළිසලතෙහි යෙදී හිඳිනා සේකැ"යි තෙරණුවෝ වදාළහ. ඔක්ඛලි ලිච්ඡවී තෙමෙත් "ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ දැකැ ම යත්නෙම්"යි එහි ම එක් පසෙකැ හිඳැ ගත්තේ ය.

4. එකල්හි වතාහි සිංහ නම් හෙරණ නාගිත තෙරුන් කරා ගියේ ය. ගොස් තෙරුන් වැඳ, පසෙකැ සිටියේ ය. පසෙකැ සිටි හෙරණ තෙම කාශ්‍යපයන් වහන්ස, මේ කොසොල් රටින් ද මගද රටින් ද පැමිණැ සිටින බමුණු දූතයෝ භාග්‍යවතුන් වහන්සේ දක්නට මෙහි එළැඹියාහ. ඔක්ඛලි ලිච්ඡවී ද මහත් ලිච්ඡවී පිරිසක් හා කැටුව භාග්‍යවතුන් වහන්සේ දකිනු පිණිස මෙහි එළැඹියේ වෙයි. කාශ්‍යපයන් වහන්ස, මේ ජනමුළුව භාග්‍යවතුන් වහන්සේ දක්නට ලබතොත් මැනැවැ"යි සැළ කෙළේ ය.

"සිංහය, එසේ වී නම්, තෙපි ම භාග්‍යවතුන් වහන්සේට සැළ කරව"යි (තෙරණුවෝ වදාළහ.) "එසේ ය, වහන්සැ' යි ම සිංහ හෙරණ තෙම නාගිත තෙරුනට පිළිවදන් දී භාග්‍යවතුන් වහන්සේ කරා ගියේ ය, ගොස්, භාග්‍යවතුන් වහන්සේ වැඳැ පසෙක සිටියේ ය. එසේ සිටැ "වහන්ස. කොසොල් මගද යන දෙ රටින් පැමිණි මේ බොහෝ වූ බමුණු දූතයෝ භාග්‍යවතුන් වහන්සේ දක්නා පිණිස මෙහි එළැඹියෝ වෙති. ඔක්ඛලි ලිච්ඡවී ද මහත් ලිච්ඡවි පිරිසක් කැටුව භාග්‍යවතුන් වහන්සේ දක්නා පිණිස මෙහි එළැඹියේ වෙයි. වහන්ස, මේ ජනමුළුව භාග්‍යවතුන් වහන්සේ දක්නට ලබතොත් මැනැවැ"යි කී ය.

"සිංහය, එසේ නම් විහාරප්‍රාක්ජායායෙහි (වෙහෙර ඉදිරි පසැ සෙවණෙහි) අස්නක් පණවව"යි (භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක).

"එසේ ය වහන්සැ"යි ම සිංහ හෙරණ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී වෙහෙර ඉදිරියේ සෙවණෙහි අස්නක් පැණැවී ය. එ විටැ භාග්‍යවතුන් වහන්සේ වෙහෙරින් නික්මැ වෙහෙර ඉදිරි පසැ සෙවණෙහි පැණැවුණු අස්නැ වැඩැහුන් සේක.

5. ඉක්බිති ඒ කොසොල් මගද දෙ රටින් ආ බමුණු දූතයෝ භාග්‍යවතුන් වෙත එළැඹියාහ, එළැඹැ ඔබ හා සතුටු වූහ. සතුටු වියැ යුතු සිහි කටයුතු (සිතැ රැඳැවියැ යුතු) කතා නිමවා පසෙකැ හිඳ ගත්හ. ඔක්ඛලි ලිච්ඡවි ද මහත් ලිච්ඡවි පිරිස හා භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේ ය. එළැඹැ ඔබ වැඳැ පසෙක හිඳැ ගත්තේ ය. එසේ පසෙකැ හිඳැ ගත් ම ඔක්ඛලි ලිච්ඡවී තෙම භාග්‍යවතුන් වහන්සේට මෙස් කී ය:

"වහන්ස, ඊයේ දවසැ ද එයිනුත් පෙර දිනවල ද ලිච්ඡවී පුත්‍ර සුනක්ඛත්තයා තෙමේ මා වෙත ආයේ ය. අවුත් මට 'මහාලිය, යම් දිනෙක පටන් තුන් හවුරුදු පමණ වූ නොබෝ කලක් මම භාග්‍යවතුන් වහන්සේ ඇසුරු කොටැ විසිමි ද, ඒ කාලය තුළැ කම්රස යුත් මිහිරි වූ, සිත් අලවන දෙව රැ වූ කලි දිටිමි. වැලි කම්රස ඇති, මිහිරි වූ, සිත් අලවන දෙව් හඬ නො ම ඇසීමි. යි කී ය. වහන්ස, ලිච්ඡවිපුත්‍ර සුනක්ඛත්තයා ඇත්තා වූ ම මිහිරි කම්රස ඇති සිත් අලවන දෙව් හඬ නො ඇසී ද? නැත හොත් නැත්තාවූ ම එසේ වූ දෙව්හඬ නො ඇසී ද?" (යනු යි).

"සන්තානෙව ඛො මහාලි සුනක්ඛත්තෙතා ලිච්ඡවිපුත්තෙතා දිබ්බානි සද්දානි නාසෙසාසි පියරූපානි කාමූපසංහිතානි රජනීයානි නො අසන්තානී"ති.

6. "කො නු ඛො භන්තෙ හෙතු කො පච්චයො, යෙන සන්තානෙව සුනක්ඛත්තෙතා ලිච්ඡවිපුත්තෙතා දිබ්බානි සද්දානි නාසෙසාසි පියරූපානි කාමූපසංහිතානි රජනීයානි නො අසන්තානී?"ති.

"ඉධ මහාලි භික්ඛුනො පුරත්ථිමාය දිසාය එකංසභාවිතො සමාධි හොති දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, නො ච ඛො දිබ්බානං සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං. සො පුරත්ථිමාය දිසාය එකංසභාවිතෙ සමාධිමහි දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, නො ච ඛො දිබ්බානං සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං. පුරත්ථිමාය දිසාය දිබ්බානි රූපානි පස්සති පියරූපානි කාමූපසංහිතානි රජනීයානි, නො ච ඛො දිබ්බානි සද්දානි සුණාති පියරූපානි කාමූපසංහිතානි රජනීයානි. තං කිස්ස හෙතු: එවං හෙතං මහාලි හොති භික්ඛුනො පුරත්ථිමාය දිසාය එකංසභාවිතෙ සමාධිමහි දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, නො ච ඛො දිබ්බානං සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං.

7. පුන චපරං මහාලි භික්ඛුනො දක්ඛිණාය දිසාය-පෙ-පච්ඡිමාය දිසාය-පෙ- උත්තරාය දිසාය-පෙ- උද්ධමධො තිරියං එකංසභාවිතො සමාධි හොති දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, නො ච ඛො දිබ්බානං සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං. සො උද්ධමධො තිරියං එකංසභාවිතෙ සමාධිමහි දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, නො ච ඛො දිබ්බානං සද්දානං සවණාය පියරූපානං කාමූ-පසංහිතානං රජනීයානං, උද්ධමධො තිරියං දිබ්බානි රූපානි පස්සති පියරූපානි කාමූපසංහිතානි රජනීයානි නො ච ඛො දිබ්බානි සද්දානි සුණාති පියරූපානි කාමූපසංහිතානි රජනීයානි. තං කිස්ස හෙතු? එවං හෙතං මහාලි හොති භික්ඛුනො දක්ඛිණාය දිසාය-පෙ-උද්ධමධො තිරියං එකංසභාවිතෙ සමාධිමහි දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූප-සංහිතානං රජනීයානං, නො ච ඛො දිබ්බානං සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං.

8. ඉධ මහාලි භික්ඛුනො පුරත්ථිමාය දිසාය එකංසභාවිතො සමාධි හොති දිබ්බානං සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, නො ච ඛො දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං. සො පුරත්ථිමාය දිසාය එකංසභාවිතෙ සමාධිමහි දිබ්බානං සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, නො ච ඛො දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං. පුරත්ථිමාය දිසාය දිබ්බානි සද්දානි සුණාති පියරූපානි කාමූපසංහිතානි රජනීයානි, නො ච ඛො දිබ්බානි රූපානි පස්සති කාමූපසංහිතානි රජනී-යානි. තං කිස්ස හෙතු: එවං හෙතං මහාලි හොති භික්ඛුනො පුරත්ථිමාය දිසාය එකංසභාවිතෙ සමාධිමහි දිබ්බානං සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, නො ච ඛො දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං.

"මහාලිය, නැත්තා වූ දෙව් හඬ නො ව ඇත්තා වූ ම මිහිරි වූ, කම්රස යුත් සිත් අදනා දෙව්හඬ ලිච්ඡවිපුත්‍ර සුනක්ඛත්ත තෙම නො ඇසී යැ"සි (භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.)

6. "වහන්ස, යම් හෙයෙකින් ලිච්ඡවිපුත්‍ර සුනක්ඛත්තයා නැත්තා වූ හඬක් නො ව ඇත්තා වූ ම, මිහිරි වූ, කම්රස යුත්, සිත් අදනා දෙව්-හඬ නො ඇසී නම්, එයට හෙතු කවර යැ? ප්‍රත්‍යයය කවරයැ?" (යි මහාලී පුළුවුත).

"මහාලිය, මෙහි මහණක්හු විසින් මිහිරි වූ, කම් රසයෙන් යුත්, සිත් අලවන දෙව් රෑ දක්නා පිණිස පෙර දිගට සමාධිය එක්කොටසක් වඩන ලද්දේ වෙයි ද, මිහිරි වූ කම්රසයෙන් යුත්, සිත් අලවන දෙව්හඬ අසනු පිණිස සමාධිය වඩන ලද්දේ නො වෙයි ද, හේ එසේ මිහිරි වූ...දෙව්හඬ අසනු පිණිස නො වැ දෙව් රෑ දක්නා පිණිස පෙර දිගට සමාධිය එක් කොටසක් වඩනා ලද කල්හි පෙර දිගැ වූ මිහිරි...දෙව්රෑ දකී. එහෙත් මිහිරි...දෙව්හඬ නො අසයි. ඒ කවර හෙයින යත්: මහාලිය, මහණ විසින් මිහිරි වූ...දෙව් හඬ අසනු පිණිස නො වැ මිහිරි වූ... දෙව් රෑ පිළිබඳ එක් කොටසක් ම පිණිස පෙර දිගට සමාධිය වඩන ලද කල්හි මෙය මෙසේ වෙයි. එහෙයිනි.

7. තවද මහාලිය, මහණහු විසින් මිහිරි වූ කම්රසයෙන් යුත්, සිත් අලවන දෙව්හඬ අසනු පිණිස නොවැ, මිහිරි වූ...දෙව්රෑ දක්නා පිණිස දකුණු දෙසට,...පැසිම් දෙසට,...උතුරු දෙසට,...උඩ දෙසට,...යට දෙසට,... සරසට සමාධිය එක් කොටසක් වඩන ලද්දේ වෙයි ද, හේ මිහිරි වූ... දෙව්හඬ අසනු පිණිස නොවැ, මිහිරි වූ...දෙව් රෑ දක්නා පිණිස දකුණු දෙසට...උඩ දෙසට යට දෙසට...සරසට සමාධිය එක් කොටසක් වඩන ලද කල්හි, මිහිරි වූ ...දෙව් රෑ දකී, එහෙත් මිහිරි වූ...දෙව්හඬ නො අසයි. ඒ කවර හෙයින යත්: මහාලිය, එ මහණහු විසින් මිහිරි වූ ... දෙව්හඬ අසනු පිණිස නොවැ, මිහිරි වූ දෙව් රෑ දක්නා පිණිස දකුණු දෙසට...උඩ දෙසට...යට දෙසට...සරසට සමාධිය එක් කොටසක් වඩනා ලද කල්හි මෙය මෙසේ ම වෙයි.

8. මහාලිය, මෙහි මහණහු විසින් මිහිරි වූ කම්රසයෙන් යුත් සිත් අලවන දෙව්රෑ දක්නා පිණිස නොවැ මිහිරි වූ...දෙව්හඬ අසනු පිණිස පෙර දිගට සමාධිය එක් කොටසක් වඩන ලද්දේ වෙයි නම්, එසේ හෙ තෙම, මිහිරි වූ ...දෙව්රෑ දක්නා පිණිස නොවැ මිහිරි...දෙව්හඬ අසනු පිණිස පෙරදිගට එක් කොටසක් සමාධිය වැඩූ කල්හි, පෙර දිගැ මිහිරි...දෙව්හඬ අසයි. මිහිරි...දෙව් රෑ නො ම දකී. ඒ කවර හෙයින යත්: මහාලිය, මහණහු විසින් මිහිරි වූ ...දෙව් රෑ දක්නා පිණිස නොවැ, මිහිරි වූ...දෙව් හඬ අසනු පිණිස පෙර දිගට සමාධිය එක් කොටසක් වැඩූ කල්හි මෙය මෙසේ වෙයි. එ හෙයිනි.

9. පුන ච පරං මහාලි භික්ඛුනො දක්ඛිණාය දිසාය-පෙ-පච්ඡිමාය දිසාය-පෙ-උත්තරාය දිසාය-පෙ-උද්ධමධො තිරියං එකංසභාවිතො සමාධි හොති දිබ්බානං සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, නො ච ඛො දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං. සො දක්ඛිණාය දිසාය-පෙ-තිරියං එකංසභාවිතෙ සමාධිම්හි දිබ්බානං සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, නො ච ඛො දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජ-නීයානං. උද්ධමධො තිරියං දිබ්බානි සද්දානි සුණාති පියරූපානි කාමූ-පසංහිතානි රජනීයානි, නො ච ඛො දිබ්බානි රූපානි පස්සති පියරූපානි කාමූපසංහිතානි රජනීයානි. තං කිස්ස හෙතු? එවං හෙතං මහාලි හොති භික්ඛුනො දක්ඛිණාය දිසාය-පෙ-තිරියං එකංසභාවිතෙ සමාධිම්හි දිබ්බානං සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, නො ච ඛො දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං.

10. ඉධ මහාලි භික්ඛුනො පුරත්ථිමාය දිසාය උභයංසභාවිතො සමාධි හොති දිබ්බානඤ්ච රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, දිබ්බානඤ්ච සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං. සො පුරත්ථිමාය දිසාය උභයංසභාවිතෙ සමාධිම්හි දිබ්බානඤ්ච රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, දිබ්බානඤ්ච සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, පුරත්ථිමාය දිසාය දිබ්බානි ච රූපානි පස්සති පියරූපානි කාමූපසංහිතානි රජනීයානි, දිබ්බානි ච සද්දානි සුණාති පියරූපානි කාමූපසංහිතානි රජනීයානි. තං කිස්ස හෙතු? එවං හෙතං මහාලි හොති භික්ඛුනො පුරත්ථිමාය දිසාය උභයංසභාවිතෙ සමාධිම්හි දිබ්බානඤ්ච රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, දිබ්බානඤ්ච සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං.

11. පුන ච පරං මහාලි භික්ඛුනො දක්ඛිණාය දිසාය-පෙ-පච්ඡිමාය දිසාය-පෙ-උත්තරාය දිසාය-පෙ-උද්ධමධො තිරියං උභයංසභාවිතො සමාධි හොති දිබ්බානඤ්ච රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, දිබ්බානඤ්ච සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං. සො දක්ඛිණාය දිසාය-පෙ-උද්ධමධො තිරියං උභයංසභාවිතෙ සමාධිම්හි දිබ්බානඤ්ච රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං. දිබ්බානඤ්ච සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං. උද්ධමධො තිරියං දිබ්බානි රූපානි පස්සති පියරූපානි කාමූප-සංහිතානි රජනීයානි, දිබ්බානි ච සද්දානි සුණාති පියරූපානි කාමූපසංහිතානි රජනීයානි. තං කිස්ස හෙතු? එවං හෙතං මහාලි හොති භික්ඛුනො උද්ධමධො තිරියං උභයංසභාවිතෙ සමාධිම්හි දිබ්බානඤ්ච රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, දිබ්බානඤ්ච සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං.

අයං ඛො මහාලි හෙතු අයං පච්චයො, යෙන සන්තානෙව සුතක්ඛන්ධෙසු ලිච්ඡවිපුත්තෙසු දිබ්බානි සද්දානි තායෙසාසි පියරූපානි කාමූපසංහිතානි රජනීයානි නො අසන්තානී"ති.

12. "එතාසං නූන හනෙන සමාධිභාවනානං සච්ඡිකිරියාහෙතු භික්ඛු භගවති බ්‍රහ්මචරියං චරන්තී"ති.

9. තව ද මහාලිය, මහණහු විසින් මිහිරි වූ කම්රසයෙන් යුත් සිත් අලවන දෙව්රෑ දක්නා පිණිස නොවෑ මිහිරි වූ...දෙව් හඬ අසනු පිණිස දකුණු දිගට...පැසිම් දිගට...උතුරු දිගට...උඩට...යටට...සරසට සමාධිය එක් කොටසක් වඩන ලද්දේ වෙයි ද, හේ මිහිරි වූ...දෙව් රෑ දක්නා පිණිස නොවෑ මිහිරි වූ...දෙව්හඬ අසනු පිණිස දකුණු දිගට...උඩට යටට සරසට වඩන ලද සමාධිය ඇති කල්හි මිහිරි වූ ...දෙව් රෑ නො දකී, (එහෙත්) මිහිරි වූ...දෙව්හඬ අසයි. ඒ කවර හෙයින ? යත්: මහාලිය, මිහිරි වූ...දෙව් රෑ දක්නට නොවෑ, මිහිරි වූ...දෙව් හඬ අසනුවට දකුණු දිගට...උඩට...යටට සරසට සමාධිය එක් කොටසක් වැඩූ කල්හි මෙය මෙසේ වෙයි. එහෙයිනි.

10. මහාලිය, මෙහි මහණක්හු විසින් මිහිරි වූ කම්රසයෙන් යුත් සිත් අලවන දෙව්රෑ දක්නා පිණිස ද, මිහිරි වූ...දෙව්හඬ අසනු පිණිස ද යන දෙ කොටස ම පිණිස පෙර දිගට සමාධිය වඩන ලද්දේ වෙයි. ද, හේ මිහිරි වූ...දෙව් රෑ දක්නා පිණිස ද මිහිරි වූ...දෙව් හඬ අසනු පිණිස දැ යි මෙසේ දෙ කොටස ම පිණිස (තමා විසින්) වඩනා ලද සමාධිය ඇති කල්හි මිහිරි වූ...පෙර දිගැ දෙව් රෑ ද දකී, මිහිරි වූ ..පෙර දිගැ දෙව් හඬ ද අසයි. ඒ කවර හෙයින ? යත්: මහාලිය, මහණහු විසින් මිහිරි වූ...දෙව් රෑ දක්නට ද, මිහිරි වූ...දෙව් හඬ අසනුවට දැ යි මෙසේ මේ දෙ කොටස ම පිණිස පෙර දිගට වඩන ලද සමාධිය ඇති කල්හි මෙය මෙසේ වෙයි. එහෙයිනි.

11. තව ද මහාලිය, මහණහු විසින් මිහිරි වූ... දෙව් රෑ දක්නා පිණිස ද, මිහිරි වූ...දෙව් හඬ අසනු පිණිස දැ යි මේ දෙ කොටස ම පිණිස දකුණු දිගට...උඩ දෙසට, යට දෙසට, සරසට සමාධිය වඩන ලද්දේ වෙයි ද, හේ එසේ...දෙව් රෑ දක්නා පිණිස ද දෙව් හඬ අසනු පිණිස දැයි මෙ පරිද්දෙන් මේ දෙ කොටස ම පිණිස දකුණු දිගට...උඩ දෙසට, යට දෙසට, සරසට (තමා විසින්) වඩනා ලද සමාධිය ඇති කල්හි, ...දෙව් රෑ ද දකී,...දෙව් හඬ ද අසයි. ඒ කවර හෙයින ? යත්: මහාලිය, මහණහු විසින් මිහිරි වූ ...දෙව් රෑ දක්නා පිණිස ද...දෙව් හඬ අසනු පිණිස දැ යි (මෙසේ) මේ දෙකොටස ම පිණිස දකුණු දිගට... උඩ දෙසට, යට දෙසට, සරසට වඩන ලද සමාධිය ඇති කල්හි මෙය මෙසේ වෙයි. එහෙයිනි.

මහාලිය, යම් හෙයෙකින් ලිච්ඡවිපුත්‍ර සුනක්ඛත්තයා තෑත්තා වූ නොවෑ ඇත්තා වූ ම මිහිරි, කම්රෙසෙන් යුත් සිත් අදනා දෙව් හඬ නො ඇසී ද, මේ එයට හෙතුව යැ, මේ එයට ප්‍රත්‍යය යැ"(යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.)

12. "වහන්ස, භික්ෂූහු මෙසේ මේ සමාධීන් පසක් කරනු පිණිස භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර රකිත් යැ යි සිතමි" යි (මහාලි කී ය.)

13. න ඛො මහාලි, එතාසං සමාධිභාවනානං සච්ඡිකිරියාහෙතු භික්ඛු මයි බ්‍රහ්මචරියං චරතති. අත්ථි ඛො මහාලි, අඤ්ඤ' ච ධම්මා උත්තරිතරා ච පණීතතරා ච යෙසං සච්ඡිකිරියාහෙතු භික්ඛු මයි බ්‍රහ්මචරියං චරතීති.

14. කතමෙ පන තෙ භන්තෙ ධම්මා උත්තරිතරා ච පණීතතරා ච, යෙසං සච්ඡිකිරියාහෙතු භික්ඛු භගවති බ්‍රහ්මචරියං චරතීති.

15. ඉධ මහාලි, භික්ඛු තිණ්ණං සංයොජනානං පරික්ඛයා සොතාපන්නො හොති අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණො. අයං'පි ඛො මහාලි, ධම්මො උත්තරිතරො ච පණීතතරො ච යස්ස සච්ඡිකිරියාහෙතු භික්ඛු මයි බ්‍රහ්මචරියං චරතති.

පුන ච'පරං මහාලි, භික්ඛු තිණ්ණං සංයොජනානං පරික්ඛයා රාගදොසමොහානං තනුත්තා සකදාගාමී හොති සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරොති. අයම්පි ඛො මහාලි, ධම්මො උත්තරිතරො ච පණීතතරො ච යස්ස සච්ඡිකිරියාහෙතු භික්ඛු මයි බ්‍රහ්මචරියං චරතති.

පුන ච'පරං මහාලි, භික්ඛු ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකා. අයම්පි ඛො මහාලි, ධම්මො උත්තරිතරො ච පණීතතරො ච යස්ස සච්ඡිකිරියාහෙතු මයි බ්‍රහ්මචරියං චරතති.

පුන ච'පරං මහාලි, භික්ඛු අසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. අයම්පි ඛො මහාලි, ධම්මො උත්තරිතරො ච පණීතතරො ච යස්ස සච්ඡිකිරියාහෙතු භික්ඛු මයි බ්‍රහ්මචරියං චරතති.

ඉමෙ ඛො තෙ මහාලි ධම්මා උත්තරිතරා ච පණීතතරා ච යෙසං සච්ඡිකිරියාහෙතු භික්ඛු මයි බ්‍රහ්මචරියං චරතීති"ති.

16. "අත්ථි පන භන්තෙ මග්ගො, අත්ථි පටිපදා එතෙසං ධම්මානං සච්ඡිකිරියාය ?"ති.

"අත්ථි ඛො මහාලි, මග්ගො, අත්ථි පටිපදා, එතෙසං ධම්මානං සච්ඡිකිරියාය"ති.

13. "මහාලිය, මහණහු මේ සමාධීන් පසක් කරනු පිණිස මා කෙරෙහි බඹසර නො රකිත්. මහාලිය, යම් දැ පසක් කරනු පිණිස මහණහු මා වෙත බඹසර රකිත් නම්, ඒ වඩා උසස් වූ වඩා උතුම් වූ අන්‍ය වූ ම දහම් කෙතෙක් ඇතියහ" (සි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.)

14. වහන්ස, යමක් පසක් කරනු පිණිස භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ කෙරේ බඹසර රකිත් නම් ඒ වඩා උසස් වූ වඩා උතුම් අන් දහම්හු කවුරු දැ?" (සි මහාලි පුළුවුත.)

15. "මහාලිය, මෙ සත්නැ මහණ තෙමේ තුන් සංයොජනයන් (සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාස යන තුන) නැසීමෙන් අපායතට නොවැටෙන සුලු, මාර්ගධර්මතියාමයෙන් නිශ්චිත ගති ඇති, සම්බොධිය (මතු තුන් මඟ) පරම ගතිය කොටැති, සෝවාන් පුද්ගලෙක් වේ ද, මහාලිය, යම් දහමක් පසක් කරනු පිණිස මහණහු මා කෙරෙහි බඹසර සරත් නම්, ඒ මේ දහම ද (සෝවාන් මඟ ද) යට කී සමාධීන්ට වඩා උසස් ය, වඩා උතුම් ය.

තව ද මහාලිය, මහණ තෙමේ තුන් සංයොජනයන් නැසී යෑමෙන් රා දෙස් මොහො තුන තුනී වීමෙන් සෙදගැමි වේ. එක් වරක් ම මෙ ලොවට අවුත් දුක් කෙළවර කෙරෙයි. මහාලිය, යම් දහමක් පසක් කරනු පිණිස මහණහු මා වෙතැ බඹසර සරත් නම්, මේ දහම ද යට කී සමාධීන්ට වඩා උසස් ය, වඩා උතුම් ය.

තව ද මහාලිය, මහණ තෙමේ ඔරම්භාගිය (කාමභවය භජනය කරන) සංයොජන පස මුළුල්ල ම නැසීමෙන් ඔපපාතික අත්බව ලබන්නෙක් වෙයි. (ශුද්ධාවාස බඹලොවැ උපදින්නේ වෙයි.) එ බඹලොව්හි ම පිරිනිවෙන සුලු වෙයි. එ ලොවින් (නැවැත පිළිසඳ ගැනුම් විසින්) මෙහි නොඑන සුලු වෙයි. මහාලිය, යම් දහමක් පසක් කරනු පිණිස මහණහු මා වෙතැ බඹසර සරත් නම්, මෙය ද උඩ කී සමාධීන්ට වඩා උසස්ය, වඩා උතුම් ය.

තව ද මහාලිය, මහණ තෙමේ ආස්‍රවයන් ක්ෂීණවීමෙන් ආස්‍රව රහිත වූ අර්හත්ඵලසමාධිය ද අර්හත්ඵල ඥානය ද මෙ අත්බවහි ම තෙමේ විශිෂ්ටඥානයෙන් පසක් කොටැ ලැබ ගෙන වෙසෙයි. මහාලිය, යමක් පසක් කරනු පිණිස මහණහු මා වෙතැ බඹසර සරත් නම්, මෙය ද යට කී සමාධීන්ට වඩා උසස් ය, වඩා උතුම් ය.

මහාලිය, මහණහු යම් දහම් කෙනකුත් පසක් කරන කරුණින් (පසක් කරනු පිණිස) මා වෙතැ බඹසර සෙරෙත් නම්, මේ යට කී සමාධීන්ට වඩා උසස් වූ, වඩා උතුම් වූ ඒ දහම්හු"යැ සි (වදාළ සේක.)

16. (එ විටැ මහාලි තෙම) 'වහන්ස, (ඔබ වදාළ) මෙකී දහඹුන් පසක් කරනුවට මඟෙක් ඇත්තේ ද? පිළිපැදීමෙක් ඇත්තේ ද?" සි විමසේ ය.)

"මහාලිය, මේ දහම් පසක් කරනුවට මඟෙක් ඇත්තේ ය, පිළි-පැදීමෙක් ඇත්තේ යැ" සි (භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.)

17. "කතමෙ පන භන්තෙ භගවා, කතමා පටිපදා, එතෙසං ධම්මානං සච්ඡිකිරියායා ?"ති.

"අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො, සෙය්‍යථිදං ? සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි. අයං ඛො මහාලි භගවා අයං පටිපදා, එතෙසං සච්ඡිකිරියාය.

18. එකදාහං මහාලි සමයං **ඛොසම්බියං** විහරාමි **ඝොසිතාරාමෙ**. අථ ඛො දෙව පබ්බජිතා **මණ්ඩිස්සො** ච පරිබ්බාජකො **ජාලියො** ච දරුපත්ත-කන්තෙවාසී යෙනාහං තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා මම සද්ධිං සම්මොදිංසු, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා ඛො තෙ දෙව පබ්බජිතා මං එතදවොචුං. "කිත්නු ඛො ආවුසො ගොතම, තං ජීවං තං සරීරං ? උදාහු අඤ්ඤං ජීවං අඤ්ඤං සරීර ?"න්ති.

"තෙන හාවුසො සුණාථ සාධුකං මනසි කරොථ භාසිස්සාමි"ති.

"එවමාවුසො"ති ඛො තෙ දෙව පබ්බජිතා මම පච්චස්සොස්සුං. අහං එතදවොචං:

19. ඉධාවුසො තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධො [යථා සාමඤ්ඤඵලෙ එවං විත්ථාරෙතබ්බං] -පෙ-

තස්සිමෙ පඤ්චනීවරණෙ පහීනෙ අත්තනි සමනුපස්සතො පාමොජ්ජං ජායති. පමුදිතස්ස පීති ජායති. පීතිමනස්ස කායො පස්සම්භති. පස්සද්ධ-කායො සුඛං වෙදෙති සුඛිනො චිත්තං සමාධියති.

20. සො විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අඵුටං හොති.

සෙය්‍යථාපි ආවුසො දක්ඛො නහාපකො වා නහාපකන්තෙවාසී වා කංසථාලෙ නහානියචූණ්ණානි ආකිරිත්වා උදකෙන පරිපොථෙන්තො පරිපොථ-යන්තො සන්දෙය්‍ය. සායං නහානියපිණ්ඩි සෙහාභානුගතා සෙහාභිපරෙතා සන්තරබාහිරා ඵුටා සෙහෙන, න ච පග්ඝරණී.

එවමෙව ඛො ආවුසො භික්ඛු ඉමමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අඵුටං හොති.

17. "වහන්ස, මේ දහම් පසක් කරනුවට ඇති ඒ මඟ, ඒ පිළිපැදීම කවරේ ද?" (යි මහාලි පුළුවුත.)

එ විට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක:)

"ඒ මේ අරි අටැඟි මඟ ම ය. එ නම්: සම්‍යග්දෘෂ්ටිය, සම්‍යක්සංකල්පය, සම්‍යග්වචනය, සම්‍යක්කර්මාන්තය, සම්‍යගාජීවය, සම්‍යග්ව්‍යායාමය, සම්‍යක්-සමෘතිය, සම්‍යක්සමාධිය යන අට ය. මහාලිය, එකී දහම් පසක් කරනුවට මේ ම මඟ ය, මේ ම පිළිපැදීම ය.

18. මහාලිය, මමු එක් කලෙක කොසොඹෑ නුවරට තොදුරෙහි වූ ශෝසිතාරාමයෙහි වෙසෙමි. එ කලැ මණ්ඩිකා නම් පිරිවැජි ද, ලීමුවා පයක් දරන පිරිවැජ්ජක්හු අතැවැසි ජාලිය නම් පිරිවැජි දැ යි මේ දෙ පැවිද්දෝ මා වෙත එළැඹැ මා හා සතුටු වූහ. සතුටු වියැ යුතු සිතැ රැඳැවියැ යුතු කතා කිමවා පසෙකැ සිටියහ. පසෙකැ සිටි ඒ දෙ පැවිද්දෝ "කිමෙක් ද ඇවැත්නි, ගොයම් තෙමේ 'ජීවයත් හේ ම ද? ශරීරයත් හේ ම ද? (ජීවයත් ශරීරයත් දෙක ම එකක් ද?) නො හොත් ජීවය එකෙකුත් ශරීරය අනෙකෙකුත් වේ ද?"යි විචාළහ.

"ඇවැත්නි, එසේ වී නම් අසවු. මොනොවට මෙනෙහි කරවු. කියන්නෙමි"යි (මම කීමි.) 'එසේ ය. ඇවැත්නි'යි ඒ දෙ පැවිද්දෝ මට පිළිවදන් දුන්හ. මම මතු දැක්වෙන මේ දැ කීයෙමි.

19. "ඇවැත්නි, රහත් වූ සම්මාසම්බුදු වූ...තථාගත තෙම ලොවැ පහළ වෙයි [ගටැ සාමඤ්ඤඵලසූත්‍රයෙහි ආ පරිදි ම විස්තර කළ යුතු.]

තමා කෙරෙහි මේ නීවරණ පස නැසුණවුන් දක්නා ඔහුට සතුට උපදී. සතුටු වූවහුට ප්‍රීතිය උපදී. ප්‍රීත සිතැත්තහුගේ කය සංසිඳෙයි. සංසුන් කයැත්තේ සුව විඳී. සුවැත්තහු ගේ සිත එකඟ වේ.

20. හේ කාමයන් ගෙන් වෙන් වැ ම සෙසු අකුසල් දහමුන් ගෙන් (ද) වෙන් වැ ම, විතර්ක සහිත විචාර සහිත, විවේකයෙන් උපන්, ප්‍රීතියත් සුවයත් ඇති පළමු දහන් ලැබැ වෙසේ. හේ මේ කය ම විවේකයෙන් උපන් පීති සුවයෙන් තෙමයි, භාත්පසින් තෙමයි, පුරා ලයි, භාත්පසින් ස්පර්ශ කෙරෙයි. ඔහුගේ සියලු අඟ පසඟින් යුත් මුළු-කයෙහි විවේකජ පීති සුවය පැතිරැ වැදැ නොගත් කිසි ද තැනෙක් නො වෙයි.

ඇවැත්නි, යම් සේ සමත් කිලිඟෙක් හෝ කිලිඟකුගේ අතැවැස්සෙක් හෝ ලොහොතලියෙක නානසුණු බහා දිය ඉස ඉස පිඬු කරන්නේ ද, ඒ නානසුණු පිඬ කා වැදුණු දිය ඇත්තේ හැම තැන ම දියෙන් යුක්ත වූයේ, ඇතුළතත් පිටතත් සහිත වැ හැමතැන ම දියෙන් පැතිරැ ගියේ, දියත් නො වගුරුවන්නේ වේ ද,

ඇවැත්නි, එසේ ම මහණ තෙමේ මේ කරජ කය ම විවේකජ ප්‍රීතිසුඛයෙන් තෙමයි, භාත්පසින් තෙමයි, පුරා ලයි භාත්පසින් ස්පර්ශ කෙරෙයි. සියලු අඟ පසඟ ඇති ඔහුගේ මුළුකයෙහි විවේකජ ප්‍රීතිසුඛයෙන් පැතිරැ වැදැ නොගත් කිසි ද තැනෙක් නො වෙයි.

යො නු ඛො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති, කල්ලං නු ඛො තස්සෙතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා ?ති.

යො සො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති, කල්ලං තස්සෙතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

අහං ඛො පනෙතං ආවුසො එවං ජානාමි එවං පස්සාමි. අථ ච පනාහං න වදාමි තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

21. පුන චපරං ආවුසො භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියජ්ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං සමාධිජෙන පීති-සුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස සමාධිජෙන පීතිසුඛෙන අඵුටං හොති.

22. සෙය්‍යථාපි ආවුසො උදකරහදෙ ගම්භීරෙ ඌබ්භිදෙදකො – [යථා සාමඤ්ඤඵලෙ එවං විත්ථාරෙතබ්බං.]

නාස්ස කිඤ්චි සබ්බාවතො උදකරහදස්ස සීතෙන වාරිනා අඵුටං අස්ස, එවමෙව ඛො ආවුසො භික්ඛු ඉමමෙව කායං සමාධිජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිඵරති නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස සමාධිජෙන පීතිසුඛෙන අඵුටං හොති.

23. පුන ච පරං ආවුසො භික්ඛු පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති සතො සම්පජානො, සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති, යං තං අරියා ආචික්ඛන්ති: උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති තතියජ්ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං නිප්පීතිකෙන සුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස නිප්පීතිකෙන සුඛෙන අඵුටං හොති.

24. සෙය්‍යථා'පි ආවුසො උප්පලිනියං වා පදුමිනියං වා –පෙ–. පුණ්ඩරීකානං වා සීතෙන වාරිනා අඵුටං අස්ස.

ඇවැත්නි, යම් මහණෙක් මෙසේ දනී නම්, මෙසේ දකී නම්, 'ඒ ම ජීව යැ ඒ මැ ශරීරයැ' යි හෝ 'ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැ' යි හෝ ඔහු විසින් කියන්නට යුතු දැ?" යි මම් ඇසීමි.

"ඇවැත්නි, යම් මහණෙක් මෙසේ දනී නම්, මෙසේ දකී නම්, 'ජීවයත් ශරීරයත් එකක් මැ යැ' යි හෝ 'ඒ වෙන වෙන දෙකෙකැ' යි හෝ කියනු ඔහුට යුතු යැ" යි (දෙ පැවිද්දේ කීහ.)

ඇවැත්නි, මම් වූ කලි මෙසේ දනිමි මෙසේ දකිමි. එහෙත් මම් 'හේ ම ජීව යැ, හේ ම ශරීර යැ' යි හෝ 'ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැ' යි හෝ නො කියමි යි (මම් කීමි.)

21. ඇවැත්නි, තව ද මහණ තෙමේ විතර්ක විචාර සංඝිඳීමෙන් සිය සතන්හි උපන්, සිය සතන් පහද වන සිත එකඟ බව ඇති, විතර්කය නැති විචාරය නැති, සමාධියෙන් උපන් ප්‍රීතියත් සුවයත් ඇති, දෙවෙනි දහනට පැමිණැ වෙසෙයි. හේ මේ කරජ කය ම සමාධියෙන් උපන් ප්‍රීතිසුඛයෙන් තෙමයි. හාත්පසින් තෙමයි, පුරා ලයි. හැම තැන ම ස්පර්ශ කෙරෙයි. ඔහු කයැ විවෙකජ ප්‍රීතිසුඛයෙන් පැතිරැ නොගත් කිසි ද තැනෙක් නො වෙයි.

22. ඇවැත්නි, යම් සේ යටැ උල්පතින් මතු වන දිය ඇති ගැඹුරැ විලෙක් වේ ද, [යටැ සාමඤ්ඤඵල සූත්‍රයෙහි ආ පරිදි මේ තැන විස්තර කළ යුතු.]

ඒ මුළු විලෙහි ශීතල ජලය පැතිරැ වැදැ නොගත් කිසි ද තැනෙක් නො මැත්තේ ද, ඇවැත්නි, එසේ ම මහණ තෙමේ මේ කරජ කය ම සමාධියෙන් උපන් ප්‍රීතිසුඛයෙන් තෙමයි. හැම තැන ම තෙත් කෙරෙයි, පුරා ලයි. හැම තැන ම පැතිරැ ගනී. ඔහුගේ ඒ සියලු කයෙහි සමාධියෙන් උපන් ප්‍රීතිසුඛයෙන් පැතිරැ නොගත් කිසි ද තැනෙක් නො වෙයි.

23. තව ද ඇවැත්නි, මහණ තෙම ප්‍රීතියගේ ද සංඝිඳීමෙන් උපෙක්ෂායෙන් ද යුතු වැ, සිහියෙන් හා නුවණින් හා යුතු වැ වෙසෙයි. සුවය ද කයින් විඳී. ආර්‍යයෝ යම් ධ්‍යානයක් හෙතු කොට ගෙන ධ්‍යාන-ලාභියා ඇරැබැ 'උපෙක්ෂාව ඇත්තේ ය, සිහි ඇත්තේ ය, සුඛවිහරණ ඇත්තේ යැ'යි කියත් ද, හේ එසේ වූ ඒ තෙවෙනි දහනට පැමිණැ වෙසෙයි. හේ මේ කය ම නිර්ප්‍රීතික සුඛයෙන් තෙමයි. මුළුල්ල ම තෙත් කෙරෙයි, පුරාලයි. හැම තැන ම ස්පර්ශ කෙරෙයි. ඔහුගේ කයෙහි ඒ නිර්ප්‍රීතික සුඛයෙන් පැතිරැ නොගත් කිසි ද තැනෙක් නො වෙයි.

24. ඇවැත්නි, යම් සේ උපුල් විලෙක හෝ පියුම් විලෙක හෝ... පඬෙරවලැ හෝ සිහිල් දියෙන් පැතිරැ නොගත් තැනෙක් නො වන්නේ ද,

එවමේව ඛො ආවුසො භික්ඛු ඉමමේව කායං නිපීතිකෙන සුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස නිපීතිකෙන සුඛෙන අඵුටං හොති.

යො නු ඛො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති, කල්ලං නු ඛො තස්සෙතං වචනාය 'තං ජීවං තං සරීරන්ති' වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති' වා ?ති.

"යො සො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති, කල්ලං තස්සෙතං වචනාය 'තං ජීවං සරීරන්ති' වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති' වා"ති.

අහං ඛො පනෙතං ආවුසො එවං ජානාමි, එවං පස්සාමි. අථ ච පනාහං න වදාමි 'තං ජීවං තං සරීරන්ති' වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

25. පුන ච පරං ආවුසො භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඟමා අදුක්ඛමසුඛං උපෙක්ඛා-සතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමේව කායං පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන ඵරිත්වා නිසින්නො හොති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අඵුටං හොති.

සෙය්‍යථාපි ආවුසො පුරිසො ඔදාතෙන වත්ථෙන සීසං පාරුපිත්වා නිසින්නො අස්ස, නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස ඔදාතෙන වත්ථෙන අඵුටං අස්ස, එවමේව ඛො ආවුසො භික්ඛු ඉමමේව කායං පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන ඵරිත්වා නිසින්නො හොති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අඵුටං හොති.

යො නු ඛො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති, කල්ලං නු ඛො තස්සෙතං වචනාය 'තං ජීවං තං සරීරන්ති' වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති' වා ?ති.

"යො සො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති, කල්ලං තස්සෙතං වචනාය 'තං ජීවං තං සරීරන්ති' වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති' වා"ති.

අහං ඛො පනෙතං ආවුසො එවං ජානාමි එවං පස්සාමි. අථ ච පනාහං න වදාමි 'තං ජීවං තං සරීරන්ති' වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති' වාති.

එසේ ම, ඇවැත්නි, මහණ තෙම මේ කය ම නිෂ්ප්‍රතික සුඛයෙන් තෙමයි, හාත්පසින් තෙමයි, පුරා ලයි, මුළුල්ල ම සපයි කෙරෙයි. ඔහු මුළු කයෙහි නිෂ්ප්‍රතික සුඛයෙන් පැතිරී වැද නොගත් කිසි ද තැනෙක් නො වෙයි.

ඇවැත්නි, යමෙක් මෙසේ දනී නම්, මෙසේ දකී නම්, 'ජීවයත් හේ ම යැ, ශරීරයත් හේ මැ යැ' යි හෝ 'ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැ'යි ඔහු විසින් කියන්නට සුතු වේ ද?යි [මම ඇසීමි.]

"ඇවැත්නි, යම් මහණෙක් මෙසේ දන්නේ නම්, මෙසේ දක්නේ නම්, 'ජීවයත් හේ මැ යැ, ශරීරයත් හේ මැ යැ'යි හෝ 'ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැ' යි හෝ මෙය කියන්නට ඔහුට සුතු යැ" යි [දෙ පිරිවැජියෝ කීහ.]

ඇවැත්නි, මම වූ කලි මෙය මෙසේ දනිමි, මෙසේ දකිමි. එහෙත් මම 'ජීවයත් හේ ම ය, ශරීරයත් හේ මැ යැ' යි හෝ 'ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැ' යි හෝ නො කියමි.

25. තව ද ඇවැත්නි, මහණ තෙම සුඛ වේදනාව ද දුක් වේදනාව ද දුරු ලීමෙන්, පළමු කොට ම සොම්නස් ගෙම්නස් දෙක පහ වීමෙන්, දුක් නොවූ සුඛ ද නොවූ, උපේක්ෂාස්මෘතියෙන් පිරිසිදු වූ සිවු වන දාන ලැබැ වෙසෙයි. හේ මේ කය ම පිරිසිදු පබසර සිතින් පැතිරී ගත හුන්නේ වෙයි. ඔහු සියලු කයැ පිරිසිදු පබසර සිතින් නොපහස්නා ලද කිසි ද තැනෙක් නො වෙයි.

ඇවැත්නි, යම්සේ පුරුෂයෙක් සුදු වතින් හිස ඇතුළු මුළු කය ම වසා ගෙන හුන්නේ වේ නම්, ඔහු මුළු කයෙහි සුදු වතින් වැදී නොගත් (නොවැසුණු) කිසි ද තැනෙක් නො වන්නේ ද, ඇවැත්නි, එසේ ම මහණතෙම මේ කය ම පිරිසිදු පබසර සිතින් පැතිරී ගෙන හුන්නේ වෙයි. ඔහු මුළු කය පිරිසිදු පබසර සිතින් නොපහස්නා ලද කිසි ද තැනෙක් නො වෙයි.

ඇවැත්නි, යම් මහණෙක් මෙසේ දනී නම්, මෙසේ දකී නම්, 'ජීවයත් හේ මැ යැ, ශරීරයත් හේ මැ' යැ යි හෝ 'ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැ' යි හෝ මෙය කියන්නට ඔහුට සුතු ද?යි [මම ඇසීමි.]

"ඇවැත්නි, යම් මහණෙක් මෙසේ දනී නම්, මෙසේ දකී නම්, 'ජීවයත් හේ මැ යැ, ශරීරයත් හේ මැ යැ'යි හෝ 'ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැ'යි හෝ මෙය කියන්නට ඔහුට සුතු යැ" යි [දෙ පිරිවැජියෝ කීහ.]

ඇවැත්නි, මම වූ කලි මෙය මෙසේ දනිමි, මෙසේ දකිමි. එතෙකුදු වුවත් 'ජීවයත් හේ මැ යැ, ශරීරයත් හේ මැ යැ' යි හෝ 'ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැ'යි හෝ මම නො කියමි යි [මම කීමි]

26. පුන ච පරං ආවුසො භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ඤාණදස්සනාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො එවං පජානාති 'අයං ඛො මෙ කායො රූපී චාතුම්මහාභූතිකො මාතාපෙත්තිකසම්භවො ඔදනකුම්මාසූපචයො අනිච්චුච්ඡාදනපරිමද්දන-භෙදනවිද්ධංසනධම්මො. ඉදඤ්ච පන මෙ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධන්ති. සෙය්‍යථාපි ආවුසො මණි වෙළුරියො -පෙ- සබ්බාකාර-සම්පන්නො, තත්‍ර සුත්තං ආවුතං නීලං වා -පෙ- පණ්ඩුසුත්තං වා, තමෙනං චක්ඛුමා පුරිසො හත්ථෙ කරිත්වා පච්චවෙක්ඛෙය්‍ය 'අයං ඛො මණි වෙළුරියො -පෙ- සබ්බාකාරසම්පන්නො, තත්‍ර සුත්තං ආවුතං නීලං වා -පෙ- පණ්ඩු-සුත්තං වා'ති. එවමෙව ඛො ආවුසො භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ -පෙ- ඤාණදස්සනාය චිත්තං අභිනීහරති -පෙ- සො එවං පජානාති 'අයං ඛො මෙ කායො රූපී -පෙ- ඉදං ච පන මෙ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධන්ති'.

යො නු ඛො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති, කල්ලන්නු ඛො තස්සෙතං වචනාය 'තං ජීවං තං සරීරන්ති' වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති' වා" ? ති.

"යො සො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති, කල්ලං තස්සෙතං වචනාය 'තං ජීවං තං සරීරන්ති' වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති' වා"ති.

අහං ඛො පනෙතං ආවුසො එවං ජානාමි එවං පස්සාමි. අථ ච පනාහං න වදාමි 'තං ජීවං තං සරීරන්ති' වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති' වාති.

27. පුන ච පරං ආවුසො භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ -පෙ- මනොමයං කායං අභිනිම්මිනනාය චිත්තං අභිනීහරති -පෙ- සෙය්‍යථාපි ආවුසො පුරිසො මුඤ්ජම්හා ඊසිකං පබ්බාහෙය්‍ය -පෙ- එවමෙව ඛො ආවුසො භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ -පෙ- මනොමයං කායං අභිනිම්මිනනාය චිත්තං අභිනීහරති -පෙ- සො ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති -පෙ- අභිනිජ්ඣායං.

යො නු ඛො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති, කල්ලන්නු ඛො තස්සෙතං වචනාය 'තං ජීවං තං සරීරන්ති' වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති' වා ?"ති.

"යො සො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති, කල්ලං තස්සෙතං වචනාය 'තං ජීවං තං සරීරන්ති' වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති' වා"ති.

26. ඇවැත්නි, තව ද ඒ මහණ තෙම මෙසේ සිත සමාධිගත කල්හි, පිරිසිදු වූ කල්හි, දීප්තිමත් වූ කල්හි, කිලිටි පහ වැ ගිය කල්හි, පහ වූ විතෙකාපක්ලෙශ ඇති කල්හි, මොලොක් වූ කල්හි, පිදශීනා-භාවතාවට යොග්‍ය වූ කල්හි, ස්ථිත කල්හි, නිසලබවට පැමිණි කල්හි, විවසුන්නුවණ පිණිස සිත අභිමුඛ කෙරෙයි. එය අතට නමා හරී. හෙ තෙම 'මගේ මේ කය වූ කලි රූපවත් ය. සිවු මහාභූතයන්ගෙන් සැදුණේ ය. මාපියන්ගේ ශුක්‍රශොණිතයෙන් උපන්නේ ය. බත් කොමු ඇ අහරින් වැඩුණේ ය. අනිස බව ද, දුගඳ හරනුවට සුවඳවිලෙවුන් ඉලියැ සුතු බව ද, ලෙඩ දුරුලනුවට පිරිමැදුම් ඇ කල සුතු බව ද, එසේ කල ද බිඳෙන බව ද, විසිරෙන බව ද යන මේ දැ සභාවය කොටැත්-තේ ය. මගේ මේ සිත ද මෙහි ලැග්ගේ ය. මෙහි බැඳුණේ යැ'යි මෙසේ දැන ගනී. ඇවැත්නි,... සියලු අසුරින් පිරිපුන් වෙරෙළඹිණෙක් යම් සේ ද එහි නිල් හුයෙක්... පඬුවන් හුයෙක් හෝ අවුතන ලද්දේ වේ ද, ඇස් ඇති පුරුෂයෙක් එය අතෙහි කොට 'මේ... සියලු අසුරින් පිරිපුන් වෙරෙළ ඹිණෙක. මෙහි නිල් පැහැ හුයෙක් හෝ... පඬුවන් හුයෙක් හෝ අවුතන ලදැ යි සලකා බලන්නේ ද, ඇවැත්නි, එ පරිද්දෙන් ම මහණ තෙම මෙසේ සිත සමාහිත කල්හි... විවසුන්නුවණ පිණිස සිත යොමු කෙරෙයි... හේ 'මගේ මේ කය වනාහි රූපවත් ය... මගේ මේ සිත ද මෙහි ලැග්ගේ ය, මෙහි බැඳුණේ යැ'යි මෙසේ දැන ගනී.

ඇවැත්නි, යම් මහණෙක් මෙසේ දන්නේ නම් මෙසේ දක්නේ නම්, 'එය ම ජීව යැ, එය ම ශරීර යැ' යි හෝ 'අනෙකෙක් ජීව යැ අනෙකෙක් ශරීර යැ'යි හෝ මෙය කියන්නට සුතු ද? [යි මම ඇසීමි.]

"ඇවැත්නි, යම් මහණෙක් මෙසේ දනී නම්, මෙසේ දකී නම්, ඔහු විසින් 'ජීවයත් හේ මැ යැ ශරීරයත් හේ මැ යැ' යි හෝ 'ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැ'යි හෝ කියන්නට සුතු යැ"යි [පිරිවැජියෝ කීහ.]

ඇවැත්නි, මම වූ කලි මෙය දනිමි, මෙය දකිමි. එහෙත් 'ජීවයත් හේ මැ යැ, ශරීරයත් හේ මැ යැ'යි හෝ 'ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැ'යි හෝ නො කියමි.

27. ඇවැත්නි, තව ද මහණ තෙම මෙසේ සිත සමාහිත කල්හි... මනොමය ශරීරයක් මවනු පිණිස සිත යොමු කෙරෙයි... ඇවැත්නි, යම්සේ මිනිසෙක් මුදු තණ ගසකින් තණබඩය බැහැරැ කරන්නේ ද, ඇවැත්නි, එ පරිද්දෙන් ම මහණ තෙම සිත මෙසේ සමාහිත කල්හි... මනොමය ශරීරයක් මවන්නට සිත යොමු කෙරෙයි... හේ මේ කයින්... නො පිරිහුණු ඉඳුරන් ඇති අන් කයක් මවයි.

ඇවැත්නි, යම් මහණෙක් මෙසේ දනී නම්, මෙසේ දකී නම්, 'ජීවයත් හේ මැ යැ, ශරීරයත් හේ මැ' යි හෝ 'ජීවය අනෙකෙක, ශරීරය අනෙ-කෙකැ'යි හෝ මෙය කියන්නට සුතු ද? යි [මම ඇසීමි].

"ඇවැත්නි, යම් මහණෙක් මෙසේ දනී නම්, මෙසේ දකී නම්, ඔහු විසින් 'ජීවයත් හේ මැ යැ, ශරීරයත් හේ මැ යැ'යි හෝ 'ජීවය අනෙ-කෙක ශරීරය අනෙකෙකැ'යි හෝ කියන්නට සුතු යැ"යි [පිරිවැජියෝ කීහ.]

අහං ඛො පනෙතං ආවුසො එවං ජානාමි එවං පස්සාමි. අථ ච පනාහං, න වදාමි 'තං ජීවං තං සරීරන්ති' වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති' වාති.

28. පුන ච පරං ආවුසො භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ -පෙ- ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති -පෙ- සෙය්‍යථාපි ආවුසො දක්ඛො කුම්භකාරො වා කුම්භකාරන්තෙවාසී වා සුපරිකම්මකතාය මත්තිකාය යං යදෙව භාජනවිකතිං ආකඞ්ඛෙය්‍ය තං තදෙව කරෙය්‍ය -පෙ- එවමෙව ඛො ආවුසො භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ -පෙ- ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති -පෙ- සො අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති -පෙ- යාවබ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති.

යො නු ඛො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති, කල්ලන්නු ඛො තස්සෙතං වචනාය 'තං ජීවං තං සරීරන්ති' වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති' වා ?ති.

"යො සො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති, කල්ලං තස්සෙතං වචනාය 'තං ජීවං තං සරීරන්ති' වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති' වා"ති.

අහං ඛො පනෙතං ආවුසො එවං ජානාමි එවං පස්සාමි. අථ ච පනාහං න වදාමි 'තං ජීවං තං සරීරන්ති' වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති' වාති.

29. පුන ච පරං ආවුසො භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ -පෙ- දිබ්බාය සොතධාතුයා චිත්තං අභිනීහරති -පෙ- සො දිබ්බාය සොතධාතුයා -පෙ- උභො සද්දෙ සුණාති දිබ්බෙ ච මානුසෙ ච -පෙ- සෙය්‍යථාපි ආවුසො පුරිසො අද්ධානමග්ගපටිපන්නො, සො සුණෙය්‍ය භෙරිසද්දම්පි -පෙ- තස්ස එවමස්ස භෙරිසද්දො ඉතිපි -පෙ- එවමෙව ඛො ආවුසො භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ -පෙ- දිබ්බාය සොතධාතුයා චිත්තං අභිනීහරති -පෙ- සො දිබ්බාය සොතධාතුයා -පෙ- උභො සද්දෙ සුණාති දිබ්බෙ ච මානුසෙ ච යෙ දූරෙ සන්තිකෙ ච.

යො නු ඛො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති, කල්ලන්නු ඛො තස්සෙතං වචනාය 'තං ජීවං තං සරීරන්ති' වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති' වාති.

"යො සො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති, කල්ලං තස්සෙතං වචනාය 'තං ජීවං තං සරීරන්ති' වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති' වා"ති.

අහං පනෙතං ආවුසො එවං ජානාමි එවං පස්සාමි. අථ ච පනාහං න වදාමි 'තං ජීවං තං සරීරන්ති' වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති' වාති.

ඇවැත්නි, මම වූ කලි මෙය දනිමි, මෙය දකිමි. එහෙත් 'ජීවයත් හේ මැ යැ, ශරීරයත් හේ මැ යැ'යි හෝ 'ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැ'යි හෝ නො කියමි.

28. ඇවැත්නි, තව ද මහණ තෙම මෙසේ සිත සමාහිත කල්හි... සෘද්ධි කොටස් ලබනු පිණිස සිත යොමු කෙරෙයි... ඇවැත්නි, යම්සේ දක්ෂ වූ කුඹලෙක් හෝ කුඹලක්හු අතැවැස්සෙක් මොනොවට සකස් කළ මැටියෙන් යම් යම් ම බඳුන් වෙසෙසක් කැමැති වන්නේ නම්, එය එය ම කරන්නේ ද,... ඇවැත්නි, එසේ ම මහණ තෙම මෙසේ සිත සමාහිත කල්හි... සෘද්ධි කොටස් ලබනු පිණිස සිත යොමු කෙරෙයි... හේ අනෙකවිධ වූ සෘද්ධි කොටස් පසක් කෙරෙයි (ලබයි)... බඹලොව දක්වාත් කයින් වශයෙහි පවත්වයි.

ඇවැත්නි, යම් මහණෙක් මෙසේ දනී නම්, මෙසේ දකී නම්, 'ජීවයත් හේ මැ යැ ශරීරයත් හේ මැ යැ' යි හෝ 'ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැ'යි හෝ ඔහු විසින් මෙය කියන්නට යුතු ද? යි [මම ඇසිමි.]

"ඇවැත්නි, යම් මහණෙක් මෙසේ දනී නම්, මෙසේ දකී නම්, ඔහු විසින් 'ජීවයත් හේ මැ යැ, ශරීරයත් හේ මැ යැ'යි හෝ 'ජීවය අනෙ-කෙක ශරීරය අනෙකෙකැ'යි හෝ කියන්නට යුතු යැ"යි [පිරිවැජියෝ කීහ.]

ඇවැත්නි, මම වූ කලි මෙය දනිමි, මෙය දකිමි. එහෙත් 'ජීවයත් හේ මැ යැ, ශරීරයත් හේ මැ යැ'යි හෝ 'ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැ'යි හෝ නො කියමි.

29. ඇවැත්නි, තව ද මහණ තෙම මෙසේ සිත සමාහිත කල්හි... දිවකත් නුවණ පිණිස සිත යොමු කෙරෙයි... හේ දිවකතින්... දිව්‍ය වූ ද මානුෂක වූ ද උභය ශබ්ද ම අසයි... ඇවැත්නි, යම්සේ මිනිසෙක් දික් මඟකට පිළිපන්නේ නම්, හේ බෙරහඬත්... අසන්නේ ද, 'මේ බෙරහඬැ'යි... ඔහුට මෙසේ සිතෙක් වන්නේ ද, ඇවැත්නි, ඒ පරිද්දෙන් ම මහණ තෙම මෙසේ සිත සමාහිත කල්හි... දිවකත් නුවණ පිණිස සිත යොමු කෙරෙයි... හේ දිවකතින් දිව්‍ය වූ ද මානුෂක වූ ද දුරැ වූ ද ළඟැ වූ ද උභය ශබ්ද ම අසයි

ඇවැත්නි, යම් මහණෙක් මෙසේ දනී නම්, මෙසේ දකී නම්, ඔහු විසින් 'ජීවයත් හේ මැ යැ, ශරීරයත් හේ මැ යැ'යි හෝ 'ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැ'යි හෝ කියන්නට යුතු ද?"යි [මම ඇසිමි.]

"ඇවැත්නි, යම් මහණෙක් මෙසේ දනී නම්, මෙසේ දකී නම්, ඔහු විසින් 'ජීවයත් හේ මැ යැ, ශරීරයත් හේ මැ යැ'යි හෝ 'ජීවය අනෙ-කෙක, ශරීරය අනෙකෙකැ'යි හෝ කියන්නට යුතු යැ"යි [පිරිවැජියෝ කීහ.]

ඇවැත්නි, මම වූ කලි මෙය දනිමි මෙය දකිමි. එහෙත් 'ජීවයත් හේ මැ යැ ශරීරයත් හේ මැ යැ'යි හෝ 'ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැ'යි හෝ නො කියමි.

30. පුන ච පරං ආවුසො භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ -පෙ- චෙතොපරියඤ්ඤාණාය චිත්තං අභිනීහරති -පෙ- සො පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාති. සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති -පෙ- අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති. සෙය්‍යථාපි ආවුසො ඉත්ථී වා පුරිසො වා -පෙ- ආදාසෙ වා -පෙ- උදකපත්තෙ සකං මුඛනිමිත්තං පච්චවෙක්ඛමානො සකණිකං වා සකණිකන්ති ජානෙය්‍ය, අකණිකං වා අකණිකන්ති ජානෙය්‍ය, එවමෙව ඛො ආවුසො භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ -පෙ- චෙතොපරියඤ්ඤාණාය චිත්තං අභිනීහරති -පෙ- සො පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාති, සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති -පෙ- අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති.

යො නු ඛො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති, කල්ලන්නු ඛො තස්සෙතං වචනාය 'තං ජීවං තං සරීරන්ති' වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති' වා ?ති.

"යො සො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති, කල්ලං තස්සෙතං වචනාය 'තං ජීවං තං සරීරන්ති' වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති' වා"ති.

අහං පනෙතං ආවුසො එවං ජානාමි එවං පස්සාමි. අථ ච පනාහං න වදාමි 'තං ජීවං තං සරීරන්ති' වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති' වාති.

31. පුන ච පරං ආවුසො භික්ඛු එවං සමාහිතෙ -පෙ- පුබ්බෙනිවාසානුස්සතිඤ්ඤාණාය චිත්තං අභිනීහරති -පෙ- සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති, සෙය්‍යථීදං එකම්පි ජාතිං -පෙ- අනෙකෙ'පි සංවට්ටවිවට්ටකප්පෙ: අමුත්‍රාසිං එවන්නාමො එවංගොත්තො -පෙ- ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

යො නු ඛො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති, කල්ලන්නු ඛො තස්සෙතං වචනාය 'තං ජීවං තං සරීරන්ති' වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති' වා ?ති.

"යො සො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති, කල්ලං තස්සෙතං වචනාය 'තං ජීවං තං සරීරන්ති' වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති' වා"ති.

අහං පනෙතං ආවුසො එවං ජානාමි එවං පස්සාමි. අථ ච පනාහං න වදාමි 'තං ජීවං තං සරීරන්ති' වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති' වාති.

32. පුන ච පරං ආවුසො භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ -පෙ- සත්තානං චුතූපපාතඤ්ඤාණාය චිත්තං අභිනීහරති -පෙ- සො දිබ්බෙන චක්ඛුනා -පෙ- සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ -පෙ- සුග්ගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති.

30. ඇවැත්නි, තව ද මහණ තෙම මෙසේ සිත සමාහිත කල්හි... පරසිත් දන්නා නුවණ පිණිස සිත යොමු කෙරෙයි... හේ අන් සතුන්ගේ අන් පුඟුලන්ගේ සිත් තම සිතින් පිරිසිඳ දනී. හේ සරාග සිත සරාග සිතැ යි ද දනී.. නොමිදුණු සිත නොමිදුණු සිතැ යි ද දනී. ඇවැත්නි,... ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ යම්සේ කැවපතෙක හෝ... දිය බඳුනෙක හෝ මුවසටහන පිරික්සා බලනුයේ තලකැලැල් සහිත වූවක් තලකැලැල් සහිත යැ යි දැන ගන්නේ ද, තලකැලැල් රහිත වූවක් තලකැලැල් රහිත යැ යි දැන ගන්නේ ද, ඇවැත්නි, එ පරිද්දෙන් ම මහණ තෙම මෙසේ සිත සමාහිත කල්හි... පරසිත් දන්නා නුවණ පිණිස සිත යොමු කෙරෙයි... හේ අන් සතුන්ගේ අන් පුඟුලන්ගේ සිත තම සිතින් පිරිසිඳ දැන ගනී. හේ සරාග සිත සරාග සිතැ යි ද... නොමිදුණු සිත නොමිදුණු සිතැ යි ද දැන ගනී.

ඇවැත්නි, යම් මහණෙක් මෙසේ දනී නම්, මෙසේ දකී නම්, ඔහු විසින් 'ජීවයත් හේ මැ යැ ශරීරයත් හේ මැ යැ'යි හෝ 'ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැ'යි හෝ කියන්නට සුතු ද ?යි [මම ඇසීමි.]

"ඇවැත්නි, යම් මහණෙක් මෙසේ දනී නම්, මෙසේ දකී නම්, ඔහු විසින් 'ජීවයත් හේ මැ යැ, ශරීරයත් හේ මැ යැ'යි හෝ 'ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැ'යි හෝ කියන්නට සුතු යැ''යි [පිරිවැජියෝ කීහ.]

ඇවැත්නි, මම වූ කලි මෙය දනිමි, මෙය දකිමි. එහෙත් 'ජීවයත් හේ මැ යැ ශරීරයත් හේ මැ යැ'යි හෝ 'ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැ'යි හෝ නො කියමි.

31. ඇවැත්නි, තව ද මහණ තෙම මෙසේ සිත සමාහිත කල්හි... පෙරැ වූසු කඳ පිළිවෙළ දන්නා නුවණ පිණිස සිත යොමු කෙරෙයි... හේ එක් ජාතියක් ද... නොයෙක් සංවර්තවිවර්ත කල්ප ද යන අනෙකවිධ පූර්වනිවාසය සිහි කරයි. 'අසෝ තැන මෙතැම් ඇත්තෙම් මෙබඳු ගොත් ඇත්තෙම් වීමි... මෙසේ ආකාරසහිත උද්දෙශ සහිත නොයෙක් වැදැරැම් පෙරැ වූසු කඳපිළිවෙළ සිහි කෙරෙයි.

ඇවැත්නි, යම් මහණෙක් මෙසේ දනී නම්, මෙසේ දකී නම්, ඔහු විසින් 'ජීවයත් හේ මැ යැ ශරීරයත් හේ මැ යැ'යි හෝ 'ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැ'යි හෝ මෙය කියන්නට සුතු ද ?යි [මම ඇසීමි.]

"ඇවැත්නි, යම් මහණෙක් මෙසේ දනී නම්, මෙසේ දකී නම්, ඔහු විසින් 'ජීවයත් හේ මැ යැ, ශරීරයත් හේ මැ යැ'යි හෝ 'ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැ'යි හෝ කියන්නට සුතු යැ''යි [පිරිවැජියෝ කීහ.]

ඇවැත්නි, මම වූ කලි මෙසේ දනිමි, මෙසේ දකිමි. එහෙත් 'ජීවයත් හේ මැ යැ ශරීරයත් හේ මැ යැ'යි හෝ 'ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැ'යි හෝ මම නො කියමි.

32. ඇවැත්නි, තව ද මහණ තෙම මෙසේ සිත සමාහිත කල්හි... සත්ත්වයන්ගේ චුතිය උපපත්තිය දන්නා නුවණ පිණිස සිත මෙහෙයයි... හේ... දිවැසින් මැරෙන මැරී උපදනා... කම් වූ පරිදි සුගතියට දුගතියට පැමිණි සත්ත්වයන් දැන ගනී.

සෙය්‍යථාපි ආවුසො පබ්බතසඤ්ඛෙපෙ උදකරහදෙ අවෙජ්ජ විප්පසන්නෙ අනාවිලෙ, තත්‍ර චක්ඛුමා පුරිසො තීරෙ ඨිතො පස්සෙය්‍ය සිප්පිසම්බුකම්පි සක්ඛරකඨලම්පි මච්ඡගුම්බම්පි චරන්තම්පි තිට්ඨන්තම්පි, තස්ස එවමස්ස: අයං ඛො උදකරහදෙ අවෙජ්ජ විප්පසන්නො අනාවිලො, තත්‍රිමෙ සිප්පිසම්බුකා'පි සක්ඛරකඨලා'පි මච්ඡගුම්බා'පි චරන්ති'පි තිට්ඨන්ති'පිති, එවමෙව ඛො ආවුසො භික්ඛු සමාහිතෙ චිත්තෙ-පෙ-ආසවානං ඛයඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති -පෙ- අයං ආසවනිරොධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති.

තස්ස එවං ජානතො එවං පස්සතො කාමාසවා'පි චිත්තං විමුච්චති. භවාසවා'පි චිත්තං විමුච්චති. අවිජ්ජාසවා'පි චිත්තං විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. 'ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති.

33. යො ඛො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති, කල්ලං නු ඛො තස්සෙතං වචනාය 'තං ජීවං තං සරීරන්ති' වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා' ?ති.

"යො සො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති, න කල්ලං තස්සෙතං වචනාය 'තං ජීවං තං සරීරන්ති' වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා"ති.

අහං ඛො පනෙතං ආවුසො එවං ජානාමි එවං පස්සාමි. අථ ච පනාහං න වදාමි 'තං ජීවං තං සරීරන්ති' වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති' වාති.

34. ඉදමවොච භගවා. අත්තමනො ඔට්ඨදධො ලිච්ඡවී භගවතො භාසිතං අභිනන්දීති.

මහාලිසුත්තං නිට්ඨිතං ඡට්ඨං.

ඇවැත්නි, යම්සේ කඳුමුදුනෙක වූ, පහත් වූ, වෙසෙසින් පැදුණු, ඛොර නොවූ දිය විලෙක් වන්නේ ද, එහි ඉවුරු ඇස් ඇති මිනිසෙක් සිටියේ එය තුලැ හැසිරෙන ද සිටුනා ද සිප්පි බෙල්ලනුත් සක්බෙල්ලනුත් කැටකැබිලිතිත් මත්ස්‍යසමූහත් දක්නේ ද, එසේ දක්නා ඔහුට 'මේ දිය විල පහත් ය. වෙසෙසින් පැහැදුණේ ය. නො කැලැඹුණේ ය. මෙහි මේ සිප්පිනුත් සක්බෙල්ලෝත් කැටකැබිලිතිත් මත්ස්‍ය සමූහයෝත් හැසිරෙත්තෝ ද සිටින්නෝ ද වෙති'යි මෙසේ සිතෙක් වන්නේ ද, ඇවැත්නි, එ පරිද්දෙන් ම මහණ තෙමේ මෙසේ සිත සමාහිත කල්හි ආස්‍රවක්ෂයඥානය පිණිස සිත යොමු කෙරෙයි, නැඹුරු කෙරෙයි. ඔහු 'මේ දුකැ'යි ඇසැවියෙන් දනී...මේ ආස්‍රව නිරොධගාමිනී ප්‍රතිපත්තිය යැ' යි ඇති සැවියෙන් දනී. මෙසේ දන්නා මෙසේ දක්නා ඔහු සිත කාමාස්‍රවය කෙරෙන් ද මිදේ. සිත භවාස්‍රවය කෙරෙන් ද මිදේ. සිත අවිද්‍යාස්‍රවය කෙරෙන් ද මිදේ. මිදුණු කල්හි මිදුණේ යැ යි දැනීම වේ. 'භවෝත්පත්තිය ක්ෂීණ විය. මඟ බඹසර වැස නිමැවිණ. කළයුතු දැ කරණ ලදී. මේ රහත් බව පිණිස අන් කටයුත්තෙක් නැතැ 'යි ඔහු දනී.

33. ඇවැත්නි, යම් මහණෙක් මෙසේ දනී නම්, මෙසේ දකී නම්, 'ජීවයත් හේ මැ යැ, ශරීරයත් හේ මැ යැ'යි හෝ 'ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැ'යි මෙය කියන්නට ඔහුට යුතු දැ?යි [මම් ඇසීමි]

"ඇවැත්නි, යම් මහණෙක් මෙසේ දනී නම්, මෙසේ දකී නම්, 'ජීවයත් හේ මැ යැ, ශරීරයත් හේ මැ' යි හෝ 'ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැ' යි හෝ කියන්නට ඔහුට යුතු නො වේ" [යැ යි දෙ පිරිවැජියෝ කීහ.]

ඇවැත්නි, මම වූ කලී මෙය මෙසේ දනිමි, මෙසේ දකිමි. එහෙත් 'ජීවයත් හේ මැ යැ, ශරීරයත් හේ මැ යැ'යි හෝ 'ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැ'යි කියා හෝ මම නො කියමි. [මෙසේ ඒ දෙපිරිවැජියනට මම කීමි.]

34. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. ඔවාදාධි ලිච්ඡවී තෙමේ සතුටු සිතැත්තේ භාග්‍යවතුන් වහන්සේගේ වචනය පිළිගත්තේ ය.

සවන මහාලි සූත්‍රය නිමියේ ය.

7. ජාලිය සුත්තං

1. එවං මේ සුතං: එකං සමයං භගවා සක්කෙසු විහරති කපිලවත්ථුස්මිං. තේන ඛෝ පන සමයේන දේව පබ්බජිතා මණ්ඩිස්සො ච පරිබ්බාජකෝ ජාලියො ච දරුපත්තිකනිවාසී යේන භගවා තේනුප-සඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මෝදිංසු. සම්මෝදනීයං කථං සාරාණීයං වීතිසාරේත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා ඛෝ තේ දේව පබ්බජිතා භගවන්තං එතදවෝචුං: "කිත්තු ඛෝ ආවුසො ගෝතම තං ජීවං තං සරීරං? උදාහු අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං?"ති.

2. තේන හාවුසො සුණාථ. සාධුකං මනසි කරෝථ. භාසිස්සාමි'ති. 'එවමාවුසො'ති ඛෝ තේ දේව පබ්බජිතා භගවතො පච්චස්සොසුං. භගවා එතදවෝච:

3. ඉධාවුසො තථාගතො ලෝකේ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධො -පෙ- (යථා සාමඤ්ඤඵලේ එවං විත්ථාරේතබ්බං). එවං ඛෝ ආවුසො භික්ඛු සීලසම්පන්නො හොති.

4. කථං ච ආවුසො භික්ඛු ඉන්ද්‍රියේසු ගුත්තද්වාරෝ හෝති ? ඉධාවුසො භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති -පෙ- එවං ඛෝ ආවුසො භික්ඛු ඉන්ද්‍රියේසු ගුත්තද්වාරෝ හොති.

5. කථං ච ආවුසො භික්ඛු සතිසම්පජඤ්ඤේන සමන්නාගතො හොති ? ඉධාවුසො භික්ඛු අභික්කන්තේ පටික්කන්තේ සම්පජානකාරී හොති. ආලොකිතේ විලොකිතේ -පෙ- එවං ඛෝ ආවුසො භික්ඛු සතිසම්ප-ජඤ්ඤේන සමන්නාගතො හොති.

6. කථඤ්ච ආවුසො භික්ඛු සන්තුට්ඨො හොති ? ඉධාවුසො භික්ඛු සන්තුට්ඨො හොති කායපරිහාරිකේන චීවරේන -පෙ- එවං ඛෝ ආවුසො භික්ඛු සන්තුට්ඨො හොති.

7. සො ඉමිනා ච අරියේන සීලක්ඛන්ධේන සමන්නාගතො -පෙ- පරිමුඛං සතිං උපට්ඨපෙත්වා, -පෙ- සො අභිජ්ඣං ලෝකේ පහාය -පෙ- විචිකිච්ඡාය චිත්තං පරිසොධෙති.

7. ජාලිය සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ කොසොඹෑ නුවර ඝෝෂිතාරාමයෙහි වැඩ වසන සේක. එසමයෙහි මණ්ඩිකා නම් පිරිවැජියෙක් ද දඬුමුවා පාත්‍රයක් දරන පැවිද්දක්හුගේ අතවැසි ජාලිය නම් පිරිවැජියෙක් ද යන දෙ පැවිදි කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ හා සතුටු වූහ. සතුටට සුදුසු වූ, සිතැ රැඳැවිය යුතු වූ කථාව නිමවා පසෙක සිටැ ගත්හ. එ දෙ පැවිද්දේ එසේ පසෙකැ සිටියාහු ම "ඇවැත් ගොයුමාණනි, කිමෙක් ද? හේ ම ජීවයත් හේ ම ශරීරයත් වේ ද? (ජීවයත් ශරීරයත් එකෙක් ම ද?) නො හොත් ජීවය අනෙකෙ-කුත් ශරීරය අනෙකෙකුත් වේ ද? (ජීවයත් ශරීරයත් දෙකෙක් ද?)" යි මෙය කීහ.

2. ඇවැත්නි, එසේ වී නම් අසවු. මොනොවට සිත්හි කරවු, කියත්-තෙම් යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. 'ඇවැත්නි, එසේ යැ' කියා ඒ දෙ පැවිද්දේ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

3. ඇවැත්නි, තථාගත අර්හත් සම්‍යක්සම්බුද්ධ තෙමේ මේ ලොවැ උපදී... (සාමඤ්ඤඵල සූත්‍රයෙහි දැක්වුණ පරිදි විස්තර කටයුතු.)... ඇවැත්නි, මෙසේ මහණ තෙම සිල්වත් වෙයි.

4. ඇවැත්නි, කෙසේ නම් මහණ ඉඳුරන්හි වැසූ දොරක්තේ වේ ද? ඇවැත්නි, මෙහි මහණතෙම ඇසින් රූවක් දැක නිමිති ගන්නා සුලු නො වේ ද,... ඇවැත්නි, මෙසේ මහණ තෙම ඉඳුරන්හි වැසූ දොරක්තේ වෙයි.

5. ඇවැත්නි, කෙසේ නම් මහණ සිහිනුවණින් යුත් වේ ද? ඇවැත්නි, මෙහි මහණ තෙම ඉදිරියට යැමෙහි පෙරලා ඒමෙහි ඉදිරි බැලීමෙහි දෙ පස බැලීමෙහි... නුවණින් දැන කරන සුලු වේ ද, ඇවැත්නි, මෙසේ ම මහණ තෙම සිහිනුවණින් යුත් වෙයි.

6. ඇවැත්නි, කෙසේ නම් මහණ සතුටු වේ ද? ඇවැත්නි, මෙහි මහණ තෙම කයැ පරිහරණයට පමණ වූ සිවුරින් සතුටු වේ ද,... ඇවැත්නි, මෙසේ මහණ තෙම සතුටු වෙයි.

7. හේ මේ ආර්‍ය ශීලසතුටෙන් ද සමන්විත වූයේ,... සිහිය අරමුණට යොමු කොට එළවා, ලොව කෙරෙහි අභිධ්‍යාව පහ කොට.... විචිකිච්ඡාව කෙරෙන් සිත පිරිසිදු කෙරෙයි.

සෙය්‍යථාපි ආවුසො පුරිසො ඉණං ආදාය කම්මන්තෙ පයොජෙය්‍ය -පෙ- සෙය්‍යථාපි ආවුසො පුරිසො ආබාධිකො අස්ස -පෙ- සෙය්‍යථාපි ආවුසො පුරිසො බන්ධනාගාරෙ බද්ධො අස්ස -පෙ- සෙය්‍යථාපි ආවුසො පුරිසො දාසො අස්ස අත්තත්තාධීනො -පෙ- සෙය්‍යථාපි ආවුසො පුරිසො සධනො සභොගො කන්තාරද්ධානමග්ගං පටිපජ්ජෙය්‍ය -පෙ- ඉමෙ පංචනීවරණෙ අප්පහීණෙ අත්තනි සමනුපස්සෙය්‍ය -පෙ- සො අපරෙන සමයෙන තං කන්තාරං නිත්ථරෙය්‍ය -පෙ- එවමෙව ඛො භික්ඛු ඉමෙ පංචනීවරණෙ පහීණෙ අත්තනි සමනුපස්සති -පෙ-.

තස්සිමෙ පංචනීවරණෙ පහීණෙ අත්තනි සමනුපස්සතො -පෙ- චිත්තං සමාධියති.

සො විවිච්චෙව කාමෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. -පෙ- තස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අප්පුටං හොති.

යො නු ඛො ආවුසො එවං ජානාති එවං පස්සති, කල්ලන්නු ඛො තස්සෙතං වචනාය 'තං ජීවං තං සරීරන්ති' වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති' වා ?ති.

"යො සො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති, කල්ලං තස්සෙතං වචනාය 'තං ජීවං තං සරීරන්ති' වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති' වා"ති.

අහං ඛො පනෙතං ආවුසො එවං ජානාමි එවං පස්සාමි. අථ ච පනාහං න වදාමි 'තං ජීවං තං සරීරන්ති' වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති' වාති.

8. පුන ච පරං ආවුසො භික්ඛු විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. -පෙ- තස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස සමාධිජෙන පීතිසුඛෙන අප්පුටං හොති.

යො නු ඛො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති, කල්ලං තස්සෙතං වචනාය 'තං ජීවං තං සරීරන්ති' වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති' වා ?ති.

"යො සො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති, කල්ලං තස්සෙතං වචනාය 'තං ජීවං තං සරීරන්ති' වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති' වා"ති.

අහං ඛො පනෙතං ආවුසො එවං ජානාමි එවං පස්සාමි. අථ ච පනාහං න වදාමි 'තං ජීවං තං සරීරන්ති' වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති' වාති.

පුන ච පරං ආවුසො භික්ඛු පීතියා ච විරාගා -පෙ- තතියං ඣානං උපසම්පජ්ජ විහරති. -පෙ- තස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස නිප්පීතිකෙන සුඛෙන අප්පුටං හොති.

ඇවැත්නි, යම්සේ පුරුෂයෙක් ණයක් ගෙන කර්මාන්තයන් යොදන්නේ ද,... යම්සේ පුරුෂයෙක් ගිලන් වන්නේ ද,.... යම්සේ පුරුෂයෙක් සිරගෙහි බඳනා ලද්දේ වන්නේ ද,... යම්සේ පුරුෂයෙක් අනුකට යටත් වූසයෙක් වන්නේ ද,.. යම්සේ ධන ඇති භෝග ඇති පුරුෂයෙක් කතරමඟකට බස්නේ ද,.. හේ පසු කලෙක ඒ කතර තරණය කරන්නේ ද... එ පරිද්දෙන්, ඇවැත්නි, මහණ තෙම තමා කෙරෙහි පහ වූ නීවරණ පස දකී...

තමා කෙරෙහි ප්‍රහීණ වූ මේ නීවරණ පස දක්නා ඔහු සිත අර-මුණෙහි එකඟ වෙයි.

හේ කාමයන්ගෙන් වෙන් ව ම... පළමු දහන් ලැබ වෙසෙයි... ඔහු සියලු කය විවේකයෙන් උපන් පිති සුවයෙන්... පැතිරී වැද නො ගත් කිසි ද තැනෙක් නො වෙයි.

ඇවැත්නි, යමෙක් මෙසේ දන්නේ නම්, මෙසේ දක්නේ නම්, ඔහු 'ජීවයත් ශරීරයත් එකෙක් ම යැ' යි හෝ 'ජීවයත් ශරීරයත් දෙකෙක් ම යැ'යි හෝ මෙය කීමට සුතු ද? (ඔහු විසින් කිය හැකි දැ යි අසා වදාළ සේක.)

[පිරිවැජියෝ:] "ඇවැත්නි, යම් මහණෙක් මෙසේ දනී නම්, මෙසේ දකී නම්, ඔහු විසින් 'ජීවයත් ශරීරයත් එකෙක් ම යැ' යි හෝ 'වෙන වෙන දෙකෙකැ' යි කියා හෝ කියනු සුතු ය".

[භාග්‍යවත්හු:] ඇවැත්නි, මම් වූ කලි මෙය මෙසේ දනිමි, දකිමි. වැලි දු මම් 'ජීවයත් ශරීරයත් එකෙක් මැ යැ' යි හෝ 'වෙන වෙන දෙකෙකැ'යි කියා හෝ නො කියමි.

8. තව ද ඇවැත්නි, මහණ තෙම විතර්ක විචාර සංසිඳීමෙන්... දෙවෙනි දහන් ලැබ වෙසෙයි... ඔහු කය සමාධියෙන් උපන් පිති සුවයෙන්... නො පැතිරුණත් කිසිදු තැනෙක් නො වෙයි.

ඇවැත්නි, යම් මහණෙක් මෙසේ දන්නේ නම්, දක්නේ නම්, 'ජීවයත් ශරීරයත් එකෙක් ම යැ' යි හෝ 'වෙන වෙන දෙකෙකැ' යි හෝ ඔහු මෙය කියනුවට සුතු ද?"

[පිරිවැජියෝ:] "ඇවැත්නි, යම් මහණෙක් මෙසේ දන්නේ නම්, මෙසේ දක්නේ නම්, ඔහු විසින් 'ජීවයත් ශරීරයත් එකෙක් ම යැ'යි හෝ 'වෙන වෙන දෙකක් ම යැ'යි හෝ මෙය කියනු සුතු ය".

[භාග්‍යවත්හු:] ඇවැත්නි, මම් වූ කලි මෙය මෙසේ දනිමි, දකිමි. වැලි දු මම් 'ජීවයත් ශරීරයත් එකෙක් ම යැ' යි හෝ 'වෙන වෙන දෙකෙකැ' යි හෝ නො කියමි".

ඇවැත්නි, තව ද මහණ තෙම ප්‍රීතිය ද දුරු ලීමෙන්... තෙවෙනි දහන් ලැබ වෙසෙයි. ඔහු විසින් නිෂ්ප්‍රීතික සුඛයෙන් සියලු කයැ පැතිර නොගන්නා ලද කිසි ද තැනෙක් නො වෙයි.

යො නු ඛො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති, කල්ලං නු ඛො තස්සෙතං වචනාය 'තං ජීවං තං සරීරන්ති' වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති' වා ?ති.

''යො සො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති, කල්ලං තස්ස තං වචනාය 'තංජීවං තං සරීරන්ති' වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති' වා''ති.

අහං ඛො පනෙතං ආවුසො එවං ජානාමි එවං පස්සාමි. අථ ච පනාහං න වදාමි 'තං ජීවං තං සරීරන්ති' වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති' වාති.

9. පුන ච පරං ආවුසො භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. -පෙ- තස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අඵුටං හොති.

යො නු ඛො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති, කල්ලං නු ඛො තස්සෙතං වචනාය 'තං ජීවං තං සරීරන්ති' වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති' වා ?ති.

''යො සො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති, කල්ලං තස්සෙතං වචනාය 'තං ජීවං තං සරීරන්ති' වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති' වා''ති.

අහං ඛො පනෙතං ආවුසො එවං ජානාමි එවං පස්සාමි. අථ ච පනාහං න වදාමි 'තං ජීවං තං සරීරන්ති' වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති' වාති.

10. පුන ච පරං ආවුසො භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ -පෙ- ඤාණදස්සනාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො එවං පජානාති 'අයං ඛො මෙ කායො රූපී චාතුම්මහාභූතිකො -පෙ- භෙදනවිද්ධංසන-ධම්මො. ඉදං ච පන මෙ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධන්ති. සෙය්‍යථාපි ආවුසො මණි වෙළුරියො -පෙ- තත්‍රස්ස සුත්තං 'අයං ඛො මණි වෙළුරියො -පෙ- තත්‍රිදං සුත්තං ආවුතං නීලං වා -පෙ- පණ්ඩු-සුත්තං වා'ති. එවමෙව ඛො ආවුසො භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ -පෙ- ඤාණදස්සනාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො එවං පජානාති. අයං ඛො මෙ කායො රූපී -පෙ- ඉදං ච පන මෙ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධන්ති. -පෙ- [යථා පුබ්බෙ එවං විත්ථාරෙ තබ්බං.]

11. පුනචපරං ආවුසො -පෙ- එවං සමාහිතෙ චිත්තෙ -පෙ- මනොමයං කායං අභිනිම්මිනනාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති -පෙ-

ඇවැත්නි, යම් මහණෙක් මෙසේ දන්නේ නම්, මෙසේ දක්නේ නම් 'ජීවයත් ශරීරයත් එකෙක් ම යැ' යි හෝ 'දෙකෙකැ' යි හෝ ඔහු කියනු යුතු ද?

[පිරිවැජියෝ:] "ඇවැත්නි, යම් මහණෙක් මෙසේ දන්නේ නම්, මෙසේ දක්නේ නම්, ඔහු විසින් 'ජීවයත් ශරීරයත් එකෙක් ම යැ' යි හෝ 'වෙන වෙන දෙකෙක් ම යැ' යි මෙය කියනු යුතු ය".

[භාග්‍යවත්හු:] ඇවැත්නි, මම වූ කලි මෙය මෙසේ දනිමි. මෙසේ දකිමි. වැලි දූ මම 'ජීවයත් ශරීරයත් එකෙක් ම යැ' යි හෝ වෙන 'වෙන දෙකෙකැ' යි හෝ නො කියමි.

9. තව ද ඇවැත්නි, මහණ තෙම සුඛවේදනාවගේ ප්‍රහාණයෙන් දුඃඛ වේදනාවගේ ද ප්‍රහාණයෙන්... සතරවන ධ්‍යාන ලැබ වෙසෙයි... ඔහු විසින් සියලු කයැ පිරිසිදු පැහැසර සිතින් පැතිරී නො ගත්තා ලද කිසිදු තැනෙක් නො වෙයි.

ඇවැත්නි, යම් මහණෙක් මෙසේ දනී නම්, මෙසේ දකී නම් ඔහු 'ජීවයත් ශරීරයත් එකෙක් ම යැ' යි හෝ 'වෙන වෙන දෙකෙකැ' යි හෝ කියනු යුතු ද?

[පිරිවැජියෝ:] "ඇවැත්නි, යම් මහණෙක් මෙසේ දන්නේ නම්, මෙසේ දක්නේ නම්, ඔහු 'ජීවයත් ශරීරයත් එකෙක් ම යැ' යි හෝ 'වෙන වෙන දෙකෙකැ' යි හෝ කියනු යුතු ය".

[භාග්‍යවත්හු:] ඇවැත්නි, මම වූ කලි මෙය මෙසේ දනිමි, මෙසේ දකිමි. වැලි දූ මම 'ජීවයත් ශරීරයත් එකෙක් ම යැ' යි හෝ 'වෙන වෙන දෙකෙකැ' යි හෝ නො කියමි.

10. තව ද ඇවැත්නි, මහණ තෙම මෙසේ සිත එකඟ වූ කල්හි... ඥානදර්ශනය පිණිස සිත යොමු කරයි, එළවා තබයි. 'මගේ මේ කය රූපී ය. සතර මහාභූතයන්ගෙන් සෑදුණේ ය... බිඳෙන තැසෙන සුලු ය. මගේ මේ සිත ද මෙහි ලැග්ගේ ය. මෙහි බැඳුණේ ය. යම්සේ... වෛඩූර්‍ය මිණෙක් වේ ද, එහි හුයෙක් අවුතන ලද්දේ වේ ද,... එය ඇස් ඇති පුරුෂයෙක් අතෙහි කොට 'මේ වෛඩූර්‍ය මිණෙක.... එහි මේ නිල් හෝ... පඬු පැහැ හුයෙක් අවුතන ලදැ' යි හේ මෙ පරිද්දෙන් දන්නේ ද, එසේ ම මහණතෙම සිත සමාහිත කල්හි... දර්ශනඥානය පිණිස සිත එළවා තබයි, යොමු කෙරෙයි. හේ 'මගේ මේ කය රූපී ය... මගේ මේ සිත මෙහි ලැග්ගේ ය, මෙහි බැඳුණේ යැ'යි දනී... [පෙර මෙන් විස්තර කටයුතු.]

11. තව ද ඇවැත්නි, මහණ තෙම මෙසේ සිත සමාහිත කල්හි... මනොමය කයක් මවනු පිණිස සිත යොමු කෙරෙයි, එළවා තබයි...

12. පුනචපරං ආවුසො භික්ඛු -පෙ- එවං සමාහිතෙ චිත්තෙ -පෙ- ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති -පෙ- යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති. -පෙ-

13. පුනචපරං ආවුසො භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ -පෙ- දිබ්බාය සොතධාතුයා -පෙ- චෙතොපරියඤ්ඤාණාය -පෙ- පුබ්බෙනිවාසානුස්සතිඤ්ඤාණාය -පෙ- [යථා මහාලිසුත්තෙ එවං විත්ථාරෙතබ්බං].

14. පුනචපරං ආවුසො භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ -පෙ- සත්තානං චුතූපපාතඤ්ඤාණාය චිත්තං අභිනීහරති -පෙ- යථාකම්මූපගෙ සත්තෙ පජානාති.

යො බො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති, කල්ලං නු බො තස්සෙතං වචනාය 'තං ජීවං තං සරීරන්ති' වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති' වා ?''ති

''යො සො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති, කල්ලං තස්සෙතං වචනාය 'තං ජීවං තං සරීරන්ති' වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති' වා''ති.

අහං බො පනෙතං ආවුසො එවං ජානාමි එවං පස්සාමි. අථ ච පනාහං න වදාමි 'තං ජීවං තං සරීරන්ති' වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති' වාති.

15. පුනචපරං ආවුසො භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ -පෙ- ආසවානං ඛයඤ්ඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති. -පෙ- ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාති.

යො නු බො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති, කල්ලං නු බො තස්සෙතං වචනාය 'තං ජීවං තං සරීරන්ති' වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති' වා ?ති

''යො සො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති, න කල්ලං තස්සෙතං වචනාය 'තං ජීවං තං සරීරන්ති' වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති' වා''ති.

අහං බො පනෙතං ආවුසො එවං ජානාමි එවං පස්සාමි. අථ ච පනාහං න වදාමි 'තං ජීවං තං සරීරන්ති' වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති' වා'ති.

16. ඉදමවොච භගවා. අත්තමනා තෙ දෙව පබ්බජිතා භගවතො භාසිතං අභිනන්දුන්ති.

ජාලියසුත්තං නිට්ඨිතං.

12. තවද ඇවැත්නි, මහණ තෙම මෙසේ සිත සමාහිත කල්හි... ඍද්ධිවිධඥානය පිණිස සිත එළවයි.... බඹලොව දක්වාත් කයින් වශයෙහි පවත්වයි...

13. තවද ඇවැත්නි, මහණ තෙම මෙසේ සිත සමාහිත කල්හි... දිවකන් නුවණ පිණිස.... පරසිත් දන්නා නුවණ පිණිස.... පෙරැ වුසු කඳපිළිවෙල සිහි කරන නුවණ පිණිස.... [මහාලි සූත්‍රයෙහි මෙන් විස්තර කටයුතු.]

14. නැවත ද ඇවැත්නි, මහණ තෙම මෙසේ සිත සමාහිත කල්හි... සත්ත්වයන්ගේ චුති උපපත්ති දක්නා නුවණ පිණිස සිත එළවා තබයි... කම් වූ පරිදි පරලොව යන සතුන් දනී.

ඇවැත්නි, යම් මහණෙක් මෙසේ දනී නම්, මෙසේ දකී නම්, ඔහු 'ජීවයත් ශරීරයත් එකක් ම යැ' යි හෝ 'වෙන වෙන දෙකෙකැ'යි හෝ කියනු යුතු ද?

[පිරිවැජියෝ] "ඇවැත්නි, යම් මහණෙක් මෙසේ දනී නම්, මෙසේ දකී නම්, ඔහු 'ජීවයත් ශරීරයත් එකෙක් මැ යැ' යි හෝ 'වෙන වෙන දෙකෙකැ' යි හෝ කියනු යුතු ය".

[භාග්‍යවත්හු] ඇවැත්නි, මම් වූ කලි මෙය මෙසේ දනිමි, මෙසේ දකිමි. වැලි දු මම් 'ජීවයත් ශරීරයත් එකෙක් ම යැ' යි හෝ 'වෙන වෙන දෙකෙක් යැ'යි හෝ නො කියමි.

15. නැවත ද ඇවැත්නි, මහණ තෙම මෙසේ සිත සමාහිත කල්හි... ආස්‍රවක්ෂයකරඥානය පිණිස සිත එළවයි, යොමු කරයි. හේ 'මේ දුකැ යි තත් වූ පරිදි දැන ගනියි... පුනර්ජන්මය ක්ෂීණ ය, බඹසර වැස නිමැවිණ, කටයුතු දැ කරන ලදි. මෙය පිණිස තව ද කටයුත්තෙක් නැතැ'යි හේ දැන ගනී.

ඇවැත්නි, යම් මහණෙක් වනාහි මෙසේ දනී නම්, මෙසේ දකී නම්, ඔහු 'ජීවයත් ශරීරයත් එකෙක් මැ යැ' යි හෝ 'වෙන වෙන දෙකෙක් යැ' යි මෙය කියනු යුතු ද?

[පිරිවැජියෝ] "ඇවැත්නි, යම් මහණෙක් මෙසේ දනී නම්, මෙසේ දකී නම්, ඔහු 'ජීවයත් ශරීරයත් එකෙක් මැ යැ' යි හෝ 'වෙන වෙන දෙකෙක් යැ' යි හෝ කියනු යුතු නො වේ".

[භාග්‍යවත්හු] ඇවැත්නි, මම් වූ කලි මෙය දනිමි, මෙය දකිමි. එසෙකුදු වුවත් 'එය ම ජීවය ය, එය ම ශරීරය යැ'යි හෝ 'ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැ'යි හෝ මම් නො කියමි.

16. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. ඒ දෙපැවිද්දෝ සතුටු සිතැත්තාහු භාග්‍යවතුන් වහන්සේගේ වචනය පිළිගත්හ.

ජාලියසූත්‍රය නිමියේ ය.

8. සීහනාදසුත්තං*

1. එවං මේ සුතං: එකං සමයං භගවා උජ්ජුඤ්ඤායං[1] විහරති කණ්ණකත්ථලේ[2] මිගදායේ. අථ ඛො අචේලො කස්සපො යේන භගවා තේනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මෝදි. සම්මෝදනීයං[3] කථං සාරණීයං[4] වීතිසාරේත්වා එකමන්තං අට්ඨාසි.

2. එකමන්තං ඨිතො ඛො අචේලො කස්සපො භගවන්තං එතදවොච: "සුතමේතං[5] හො ගොතම, 'සමණො ගොතමො සබ්බං තපං ගරහති. සබ්බං තපස්සිං ලූඛාජීවිං එකංසේන උපක්කොසති උපවදතී'ති. යේ තේ හො ගොතම එවමාහංසු 'සමණො ගොතමො සබ්බං තපං ගරහති, සබ්බං තපස්සිං ලූඛාජීවිං එකංසේන උපක්කොසති උපවදතී'ති. කච්චි තේ භොතො ගොතමස්ස වුත්තවාදිනො? න ච භවන්තං ගොතමං අභූතේන අබ්භාචික්ඛන්ති? ධම්මස්ස චානුධම්මං ව්‍යාකරොන්ති? න ච කොචි සහධම්මිකො වාදානුවාදෙ ගාරය්හං ඨානං ආගච්ඡති? අනබ්භක්ඛාතුකාමා හි මයං භවන්තං ගොතම"න්ති.

3. යේ තේ කස්සප එවමාහංසු: 'සමණො ගොතමො සබ්බං තපං ගරහති. සබ්බං තපස්සිං ලූඛාජීවිං එකංසේන උපක්කොසති උපවදතී'ති න මේ තේ වුත්තවාදිනො. අබ්භාචික්ඛන්ති ච පන මං තේ අසතා අභූතේන.

ඉධාහං කස්සප එකච්චං තපස්සිං ලූඛාජීවිං පස්සාමි දිබ්බේන චක්ඛුනා විසුද්ධේන අතික්කන්තමානුසකේන කායස්ස භේදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නං. ඉධ පනාහං කස්සප එකච්චං තපස්සිං ලූඛාජීවිං පස්සාමි දිබ්බේන චක්ඛුනා විසුද්ධේන අතික්කන්තමානුසකේන කායස්ස භේදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නං.

ඉදානං[6] කස්සප එකච්චං තපස්සිං අප්පදුක්ඛවිහාරිං පස්සාමි දිබ්බේන චක්ඛුනා විසුද්ධේන අතික්කන්තමානුසකේන කායස්ස භේදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නං.

---

*. කස්සප සීහනාද සුත්තං, කෙසුචි. බුද්ධසීහනාදසුත්තන්තන්තිපි. අට්ඨකථා. මහාසීහනාදසුත්තං, මජ්ඣං.

1. උරුඤ්ඤායං සීමු. 2. කණ්ණත්ථලෙ. සීමු. 3. සම්මෝදනියං. මජ්ඣං. 4. සාරණීයං මජ්ඣං. 5 සුතමේතං. සීමු. 6. ඉධපනාහං, ස්‍යා.

8. සිංහනාදසූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ උක්කණ්ඨා නුවර නිසා කණ්ණකත්ථල නම් මුවලැව්හි වැඩ වසන සේක. එ කලැ අචෙල කාශ්‍යප තෙම භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේ ය. එළැඹැ ඔබ හා සතුටු විය. සතුටට කරුණු වූ සිතැ රැඳැවියැ යුතු වූ කථා කොට නිමවා එකත්පසැ සිටියේ ය.

2. එකත්පසැ සිටියා වූ ම අචෙලකාශ්‍යප තෙම භාග්‍යවතුන් වහන්සේට "භවද් ගෞතමයිනි, 'මහණ ගොයුම්හු සියලු තපස ගරහති'යි, 'රළු දිවිපෙවෙත් ඇති හැම තවුසාට එකාන්තයෙන් ආක්‍රෝශ කෙරෙති' යි, 'පිරිහෙලා බෙණෙති'යි මෙ පවත් මා විසින් අසන ලද. භවද් ගෞතමයිනි, යම් කෙනෙක් 'මහණ ගොයුම්හු සියලු තපස ගරහති'යි, 'රළු දිවි-පෙවෙත් ඇති හැම තවුසාට ඒකාන්තයෙන් ආක්‍රෝශ කෙරෙති'යි, 'පිරිහෙලා බෙණෙති'යි මෙසේ කීහු නම්, කිමෙක් ද, ඔහු භවද් ගෞතමයන් කී දැ ම කියත් ද? භවද්ගෞතමයනට අභූතයෙන් (නොවූ දැයින්) දෙස් නො කියත් ද? භවද් ගෞතමයන් කී දැ අනුව ම කරුණු කියත් ද? ඔබේ කිසි වාදයෙක් (ඔබේ වචනයෙක්) හෝ අනුවාදයෙක් (ඔබ කී බස අනුව අනුන් කී වචනයෙක්) හෝ කරුණු සහිත වැ නුවණැත්තන් විසින් ගැරැහිය යුතු තැනට නො පැමිණේ ද? (කිම, හැම අයුරින් ම ඔබගේ වාදයෙහි ගැරැහියැ යුතු කාරණයෙක් නැද්ද?) අපි භවද් ගෞතමයනට අභූතයෙන් දෙස් තහනු නො කැමැත්තමිහ"යි මෙය කී ය.

3. "කාශ්‍යපය, 'මහණ ගොයුම්හු සියලු තපසට ගරහති'යි, 'රළු දිවිපෙවෙත් ඇති හැම තවුසාට ඒකාන්තයෙන් ආක්‍රෝශ කෙරෙති' යි. 'පිරිහෙලා බෙණෙති'යි, යම් කෙනෙක් කියත් නම්, ඔහු මා කී දැ කියන්නෝ නො වෙති. ඔහු මට නැති දැයින් බොරුවෙන් දෙස් තගන්නාහු ද වෙති.

කාශ්‍යපය, මෙහි මිනිසුන්ගේ දශනොපවාරය ඉක්මැ දැක්කැ හැකි පිරිසිදු දිවැසින් කාබුන් මරණින් මතු, සැපයෙන් පහ වූ, දුකට පිහිටි, විවශ ව වැටෙන තැන වූ නිරයට පැමිණි, කටුක දිවි පෙවෙත් ඇති වැ සිටි එක්තරා තවුසකු මම දකිමි. කාශ්‍යපය, මෙහි මිනිසුන්ගේ දශනොපවාරය ඉක්මැ දැක්කැ හැකි, පිරිසිදු දිවැසින් කාබුන් මරණින් මතු, මනා ගති ඇති සග ලොවට පැමිණි, කටුක දිවිපෙවෙත් ඇති වැ සිටි එක්තරා තවුසකු ද මම දකිමි.

කාශ්‍යපය, මෙහි මිනිසුන්ගේ දැකුම් ඉම ඉක්මැ දැක්කැ හැකි පිරිසිදු දිවැසින්, කාබුන් මරණින් මතු, සැප නැති, නපුරු ගති ඇති, විවශ ව පතිත වන තැන වූ නිරයට පැමිණි, මද වූ දුක් විහරණ ඇති වැ සිටි එක්තරා තවුසකු මම දකිමි.

ඉධපනාහං කස්සප එකච්චං තපස්සිං අපඳුක්කවිහාරිං පස්සාමි දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නං.

යො'හං කස්සප ඉමෙසං තපස්සීනං එවං ආගතිඤ්ච ගතිඤ්ච චුතිඤ්ච උපපත්තිඤ්ච යථාභූතං පජානාමි. සො'හං කිං සබ්බං තපං ගරහිස්සාමි, සබ්බං වා තපස්සිං ලූඛාජීවිං එකංසෙන උපක්කොසිස්සාමි උපවදිස්සාමි ?

4. සන්ති කස්සප එකෙ සමණබ්‍රාහ්මණා පණ්ඩිතා නිපුණා කතපරප්පවාදා වාලවෙධිරූපා වොභින්දන්තා[1] මඤ්ඤෙ චරන්ති පඤ්ඤා-ගතෙන දිට්ඨිගතානි. තෙඝි'පි මෙ සද්ධිං එකච්චෙසු ඨානෙසු සමෙති[2] එකච්චෙසු ඨානෙසු න සමෙති[2]. යතෙත එකච්චං වදෙන්ති සාධු'ති, මයම්පි තං එකච්චං වදෙම සාධු'ති. යතෙත එකච්චං වදෙන්ති න සාධු'ති, මයම්පි තං එකච්චං වදෙම න සාධු'ති. යතෙත එකච්චං වදෙන්ති සාධු'ති, මයං තං එකච්චං වදෙම න සාධු'ති. යතෙත එකච්චං වදෙන්ති න සාධු'ති, මයං තං එකච්චං වදෙම සාධු'ති. යං මයං එකච්චං වදෙම සාධු'ති, පරෙ'පි තං එකච්චං වදෙන්ති සාධු'ති. යං මයං එකච්චං වදෙම න සාධු'ති, පරෙ'පි තං එකච්චං වදෙන්ති න සාධු'ති. යං මයං එකච්චං වදෙම න සාධු'ති, පරෙ'පි තං එකච්චං වදෙන්ති සාධු'ති. යං මයං එකච්චං වදෙම සාධු'ති, පරෙ'පි තං එකච්චං වදෙන්ති න සාධු'ති.

තත්‍රාහං උපසඞ්කමිත්වා එවං වදාමි: යෙසු තො ආවුසො ඨානෙසු න සමෙති, තිට්ඨන්තු තානි ඨානානි. යෙසු ඨානෙසු සමෙති, තත්‍ර විඤ්ඤූ සම්පුග්ගණ්හන්තං සම්පුගාහන්තං සම්පුහාසන්තං සත්ථාරා වා සත්ථාරං සඞ්ඛෙන වා සඞ්ඛං: "යෙ ඉමෙසං භවතං ධම්මා අකුසලා අකුසල-සඞ්ඛාතා සාවජ්ජා සාවජ්ජසඞ්ඛාතා අසෙවිතබ්බා අසෙවිතබ්බසඞ්ඛාතා න අලමරියා න අලමරියසඞ්ඛාතා කණ්හා කණ්හසඞ්ඛාතා, සො ඉමෙ ධම්මෙ අනවසෙසං පහාය වත්තති, සමණො වා ගොතමො පරෙ වා පන භොතො තෙසං ගණාචරියා ?" ති.

1. තෙ ඛිඤ්ඤන්තා. මජ්ජං. 2. සමෙන්ති. සක්‍ය.

කාශ්‍යපය, මෙහි මිනිසුන්ගේ දැකුම් ඉම ඉක්මැ දැක්කැ හැකි පිරිසිදු දිවැසින්, කාබුන් මරණින් මතු මනා ගති ඇති සග ලොවට පැමිණි, මඳ දුක් විහරණ ඇති වැ සිටි එක්තරා තවුසකු මම දකිමි.

කාශ්‍යපය, යම්බඳු වූ මම් මේ තවුසන්ගේ ආගතියක් (පෙරැ භවයෙහි යම් තැනෙකින් සැව මෙහි උපන්නෝ නම් එ තැනත්), ගතියත් (මෙසින් සැව යැ යුතු තැනත්), ච්‍යුතියත් (ඒ මතු භවයෙන් ච්‍යුත වීමත්), උපපත්තියත් (ඒ ච්‍යුතියෙන් පසු ව උපදනා තැනත්) මෙසේ තත් වූ පරිදි දනිමි ද, ඒ මම් කුමට සියලු තපසට හෝ ගරහමි ද? කවුක දිවිපෙවෙත් ඇති හැම තවුසාට හෝ එකාන්තයෙන් පරිභව කෙරෙමි ද? අවඥ කෙරෙමි ද?

4. කාශ්‍යපය, පණ්ඩිත වූ, තියුණු නුවණැති, මෙරමා හා කළ වාද ඇති, වාලවෙධි ධනුර්ධරයන් බඳු වූ ඇතැම් මහණ බමුණු කෙනෙක් තමන් ප්‍රඥයෙන් අනුන්ගේ දෘෂ්ටීන් බිඳැ ගෙලන්නන් මෙන් වැ හැසිරෙත්. ඔවුන් හා ද ඇතැම් තන්හි මගේ දහම හම වෙයි. ඇතැම් තන්හි සම නො වෙයි. ඔහු යම් එක්තරා දැයක් 'මැනැවැ'යි කියත් ද, අපි දු ඒ එක්තරා දැය 'මැනැවැ'යි කියමු. යම් එක්තරා දැයක් නො මැනැවැ යි ඔහු කියත් ද, අපි දු ඒ එක්තරා දැය 'නොමැනැවැ'යි කියමු. යම් එක්තරා දැයක් 'මැනැවැ'යි ඔහු කියත් ද, ඒ එක්තරා දැය 'නො මැනැවැ'යි අපි කියමු. යම් එක්තරා දැයක් 'නො මැනැවැ'යි ඔහු කියත් ද, ඒ එක්තරා දැය 'මැනැවැ'යි අපි කියමු. යම් එක්තරා දැයක් 'මැනැවැ'යි අපි කියමු ද, අන්හු ද ඒ එක්තරා දැය 'මැනැවැ'යි කියත්. යම් එක්තරා දැයක් 'නො මැනැවැ'යි අපි කියමු ද, අන්හු ද ඒ එක්තරා දැය 'නො මැනැවැ'යි කියත්. යම් එක්තරා දැයක් 'නො මැනැවැ'යි අපි කියමු ද, අන්හු ද ඒ එක්තරා දැය 'මැනැවැ'යි කියත්. යම් එක්තරා දැයක් 'මැනැවැ'යි අපි කියමු ද, ඒ එක්තරා දැය 'නො මැනැවැ'යි අන්හු කියත්.

මම ඔවුන් කරා එළැඹ මෙසේ කියමි: "ඇවැත්නි, අප දහම යම් තන්හි සම නො වේ ද, ඒ තන්හු සිරිත් වා. යම් තන්හි සම වේ නම් ඒ තන්හි ලා නුවණැත්තෝ 'අකුසල් වූත් අකුශලසඛ්‍යාත වූත් (අකුසල් යැ යි වෙන් කරන ලද්ද වූත්), සාවද්‍ය (සදෙස්) වූත් සාවද්‍යසඛ්‍යාත වූත් (සදෙස් යැ යි වෙන් කරන ලද්ද වූත්), අසෙවිතව්‍ය (නො සෙවියැ යුතු) වූත්, අසෙවිතව්‍ය සඛ්‍යාත වූත් (නො සෙවිය යුතු යැ යි වෙන් කොට තබන ලද්ද වූත්), ආර්‍යභාවයට නොසමත් වූත්, ආර්‍යභාවයට නො සමත් සේ වෙන් කොට තබන ලද්ද වූත්, කෘෂ්ණ වූත්, කෘෂ්ණසඛ්‍යාත වූත් (කළු යැ යි වෙන් කොට තබන ලද්ද වූත්) මේ භවතුන්ගේ යම් ධර්ම කෙනෙක් වෙත් නම්, කවර කෙනෙක් මෙකී දහම් තිරවශෙෂයෙන් බැහැරැ කොට පවත්නෝ ද? ශ්‍රමණ ගෞතමයෝ ද නැත හොත් අන් භවදී ගණාවාර්‍යයෝ ද?"යි එක් ශාස්තෘවරයකු හා තවත් ශාස්තෘවරයකු ද එක් ශ්‍රාවකගණයක් හා තවත් ශ්‍රාවකගණයක් ද සසඳ ලබ්ධිය විචාරත් වා. කරුණු විචාරත් වා. ලබ්ධියත් කරුණුත් දෙක ම විචාරත් වා.

ඨානං ඛො පනෙතං කස්සප විජ්ජති යං විඤ්ඤූ සමනුයුඤ්ජන්තා සමනුගාහන්තා සමනුභාසන්තා එවං වදෙය්‍යුං: "යෙ ඉමෙසං භවතං ධම්මා අකුසලා අකුසලසඛ්‍යාතා සාවජ්ජා සාවජ්ජසඛ්‍යාතා අසෙවිතබ්බා අසෙවිතබ්බසඛ්‍යාතා න අලමරියා න අලමරියසඛ්‍යාතා කණ්හා කණ්හ-සඛ්‍යාතා, සමණො ගොතමො ඉමෙ ධම්මෙ අනවසෙසං පහාය වත්තති, යං වා පන භොතො පරෙ ගණාචරියා"ති.

ඉතීහ කස්සප විඤ්ඤූ සමනුයුඤ්ජන්තා සමනුගාහන්තා සමනුභාසන්තා අමෙහව තත්ථ යෙභුය්‍යෙන පසංසෙය්‍යුං.

5. අපරම්පි තො කස්සප විඤ්ඤූ සමනුයුඤ්ජන්තං සමනුගාහන්තං සමනුභාසන්තං සත්ථාරා වා සත්ථාරං සඞ්ඝතො වා සඞ්ඝං: "යෙ ඉමෙසං භවතං ධම්මා කුසලා කුසලසඛ්‍යාතා අනවජ්ජා අනවජ්ජසඛ්‍යාතා සෙවිතබ්බා සෙවිතබ්බසඛ්‍යාතා අලමරියා අලමරියසඛ්‍යාතා සුක්කා සුක්ක-සඛ්‍යාතා, කො ඉමෙ ධම්මෙ අනවසෙසං සමාදාය වත්තති සමණො වා ගොතමො පරෙ වා පන භොතො ගණාචරියා ?"ති.

ඨානං ඛො පනෙතං කස්සප විජ්ජති යං විඤ්ඤූ සමනුයුඤ්ජන්තා සමනුගාහන්තා සමනුභාසන්තා එවං වදෙය්‍යුං: "යෙ ඉමෙසං භවතං ධම්මා කුසලා කුසලසඛ්‍යාතා අනවජ්ජා අනවජ්ජසඛ්‍යාතා සෙවිතබ්බා සෙවිතබ්බසඛ්‍යාතා අලමරියා අලමරියසඛ්‍යාතා සුක්කා සුක්කසඛ්‍යාතා, සමණො ගොතමො ඉමෙ ධම්මෙ අනවසෙසං සමාදාය වත්තති යං වා පන භොතො පරෙ ගණාචරියා"ති.

ඉතීහ කස්සප විඤ්ඤූ සමනුයුඤ්ජන්තා සමනුගාහන්තා සමනුභාසන්තා අමෙහව තත්ථ යෙභුය්‍යෙන පසංසෙය්‍යුං.

6. අපරම්පි තො කස්සප විඤ්ඤූ සමනුයුඤ්ජන්තං සමනුගාහන්තං සමනුභාසන්තං සත්ථාරා වා සත්ථාරං සඞ්ඝතො වා සඞ්ඝං: "යෙ ඉමෙසං භවතං ධම්මා අකුසලා අකුසලසඛ්‍යාතා සාවජ්ජා සාවජ්ජසඛ්‍යාතා අසෙවිතබ්බා අසෙවිතබ්බසඛ්‍යාතා න අලමරියා න අලමරියසඛ්‍යාතා කණ්හා කණ්හසඛ්‍යාතා කො ඉමෙ ධම්මෙ අනවසෙසං පහාය වත්තති ගොතම-සාවකසඞ්ඝො වා පරෙ වා පන භොතො ගණාචරියසාවකසඞ්ඝං ?"ති.

කාශ්‍යපය, නුවණැත්තෝ ලබ්ධි විචාරන්නාහු, කරුණු විචාරන්නාහු, ලබ්ධිත් කරුණුත් දෙක ම විචාරන්නාහු, "මේ භවතුන්ගේ අකුශල වූත් අකුශලසඛ්‍යාත වූත්, සාවද්‍ය වූත්, සාවද්‍යසඛ්‍යාත වූත්, අසෙවිතව්‍ය වූත්, අසෙවිතව්‍යසඛ්‍යාත වූත්, ආර්‍යභාවයට නොසමත් වූත්, ආර්‍යභාවයට නොසමත් යැ යි වෙන් කොට තබන ලද්ද වූත්, කෘෂ්ණ වූත්, කෘෂ්ණ-සඛ්‍යාත වූත් යම් දහම් කෙනෙක් වෙත් නම්, ශ්‍රමණගෞතමයෝ මේ හැම දහම් නිරවශෙෂයෙන් බැහැරැ කොට පවතිත්. අන් භවද් ගණාවාර්‍යයෝ වනාහි යම් තමක් (අල්පමාත්‍රයක්)ම බැහැරැ කොට පවතිත්" යැ යි මෙසේ කියන්නාහුය යන මේ කාරණය ඇත්තේ ම ය.

කාශ්‍යපය, මෙසේ නුවණැත්තෝ ලබ්ධි විචාරන්නාහු කරුණු විචාරන්නාහු ලබ්ධිත් කරුණුත් විචාරන්නාහු අප ම එහි ලා බෙහෙවින් පසස්නාහ.

5. අනෙකෙක් ද ඇත. කාශ්‍යපය; 'මේ භවතුන්ගේ කුශල වූත් කුශලසඛ්‍යාත වූත්, අනවද්‍ය වූත් අනවද්‍යසඛ්‍යාත වූත්, සෙවිතව්‍ය වූත් සෙවිතව්‍යසඛ්‍යාත වූත්, අලමාර්‍ය (ආර්‍යභාවයට සමත්) වූත් අලමාර්‍ය-සඛ්‍යාත වූත්, ශුක්ල වූත් ශුක්ලසඛ්‍යාත වූත් යම් ධර්ම කෙනෙක් වෙත් ද, කවරෙක් නම් මේ දහම් නිරවශෙෂයෙන් සමාදන් කොට ගෙන පවත්නෝ ද? මහණ ගොයුම්හු ද? නැත හොත් අන් භවත් ගණා-වාර්‍යයෝ ද?"යි නුවණැත්තෝ ලබ්ධි විචාරත් වා. කරුණු විචාරත් වා. ලබ්ධිත් කරුණුත් දෙක ම විචාරත් වා.

කාශ්‍යපය, නුවණැත්තෝ ලබ්ධි විචාරන්නාහු, කරුණු විචාරන්නාහු, ලබ්ධිත් කරුණුත් දෙක ම විචාරන්නාහු, "මේ භවතුන්ගේ කුශල වූත් කුශලසඛ්‍යාත වූත් අනවද්‍ය වූත් අනවද්‍යසඛ්‍යාත වූත් සෙවිතව්‍ය වූත් සෙවිතව්‍යසඛ්‍යාත වූත් අලමාර්‍ය වූත් අලමාර්‍යසඛ්‍යාත වූත් ශුක්ල වූත් ශුක්ලසඛ්‍යාත වූත් යම් දහම් කෙනෙක් වෙත් නම්, මහණ ගොයුම්හු මේ දහම් නිරවශෙෂයෙන් සමාදන් කොට ගෙන පවතිති. අන්‍ය භවත් ගණාවාර්‍යයෝ වූ කලි යම් තමක් ම හෝ සමාදන් කොට පවතිත් යැ යි මෙසේ කියන්නාහ යන මේ කාරණය ඇත්තේ ම ය.

කාශ්‍යපය, මෙසේ නුවණැත්තෝ ලබ්ධි විචාරන්නාහු කරුණු විචාරන්-නාහු ලබ්ධිත් කරුණුත් විචාරන්නාහු අප ම එහි ලා බෙහෙවින් පසස්නාහ.

6. අනෙකෙක් ද ඇත. කාශ්‍යපය, 'මේ භවතුන්ගේ අකුශල වූත් අකුශලසඛ්‍යාත වූත්, සාවද්‍ය වූත් සාවද්‍යසඛ්‍යාත වූත්, අසෙවිතව්‍ය වූත් අසෙවිතව්‍යසඛ්‍යාත වූත්, ආර්‍යභාවයට නොසමත් වූත් ආර්‍යභාවයට නොසමත් යැ යි කියන ලද්ද වූත්, කෘෂ්ණ වූත් කෘෂ්ණසඛ්‍යාත වූත් යම් ධර්ම කෙනෙක් වෙත් නම්, කවරෙක් මෙකී ද නිරවශෙෂයෙන් පහ කොට පවතී ද? ගෞතමශ්‍රාවක සඞ්ඝයා ද නැත හොත් අන් භවත් ගණාවාර්‍යශ්‍රාවක සමූහයෝ ද? යි නුවණැත්තෝ ශාස්තෘවරයා හා ශාස්තෘ-වරයා හෝ ශ්‍රාවකගණයා හා ශ්‍රාවකගණයා හෝ සසඳ ලබ්ධි විචාරත් වා. කරුණු විචාරත් වා. ලබ්ධිත් කරුණුත් විචාරත් වා.

ඨානං ඛො පනෙතං කස්සප විජ්ජති යං විඤ්ඤූ සමනුඤ්ඤන්තා සමනුගාහන්තා සමනුභාසන්තා එවං වදෙය්‍යුං: "යෙ ඉමෙසං භවතං ධම්මා අකුසලා අකුසලසඛ්ඛාතා සාවජ්ජා සාවජ්ජසඛ්ඛාතා අසෙවිතබ්බා අසෙවිතබ්බසඛ්ඛාතා න අලම්මරියා න අලම්මරියසඛ්ඛාතා කණ්හා කණ්හ-සඛ්ඛාතා, ගොතමසාවකසඞ්ඝා ඉමෙ ධම්මෙ අනවසෙසං පහාය වත්තන්ති, යං වා පන හොන්තො පරෙ ගණාචරියසාවකසඞ්ඝා"ති.

ඉතිහ කස්සප විඤ්ඤූ සමනුඤ්ඤන්තා සමනුගාහන්තා සමනුභාසන්තා අම්හෙව තත්ථ ඝෙත්තුකෙ පසංසෙය්‍යුං.

7. අපරම්පි ඛො කස්සප විඤ්ඤූ සමනුඤ්ඤන්තං සමනුගාහන්තං සමනුභාසන්තං සත්ථාරා වා සත්ථාරං සඞ්ඝෙන වා සඞ්ඝං: "යෙ ඉමෙසං භවතං ධම්මා කුසලා කුසලසඛ්ඛාතා අනවජ්ජා අනවජ්ජසඛ්ඛාතා සෙවිතබ්බා සෙවිතබ්බසඛ්ඛාතා අලම්මරියා අලම්මරියසඛ්ඛාතා සුක්කා සුක්ක-සඛ්ඛාතා, කො ඉමෙ ධම්මෙ අනවසෙසං සමාදාය වත්තන්ති? ගොතම-සාවකසඞ්ඝා වා, පරෙ වා පන හොන්තො ගණාචරියසාවකසඞ්ඝා?"ති.

ඨානං ඛො පනෙතං කස්සප විජ්ජති යං විඤ්ඤූ සමනුඤ්ඤන්තා සමනුගාහන්තා සමනුභාසන්තා එවං වදෙය්‍යුං "යෙ ඉමෙසං භවතං ධම්මා කුසලා කුසලසඛ්ඛාතා අනවජ්ජා අනවජ්ජසඛ්ඛාතා සෙවිතබ්බා සෙවිතබ්බසඛ්ඛාතා අලම්මරියා අලම්මරියසඛ්ඛාතා සුක්කා සුක්කසඛ්ඛාතා, ගොතමසාවකසඞ්ඝා ඉමෙ ධම්මෙ අනවසෙසං සමාදාය වත්තන්ති, යං වා පන හොන්තො පරෙ ගණාචරියසාවකසඞ්ඝා"ති.

ඉතිහ කස්සප විඤ්ඤූ සමනුඤ්ඤන්තා සමනුගාහන්තා සමනුභාසන්තා අම්හෙව තත්ථ ඝෙත්තුකෙ පසංසෙය්‍යුං.

8. අත්ථි කස්සප මග්ගො අත්ථි පටිපදා යථා පටිපන්නො සාමඤ්ඤෙව ඤස්සති සාමං දක්ඛිති "සම්මණ්ණ'ව ගොතමො කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී"ති.

කතමො ච කස්සප මග්ගො කතමා පටිපදා යථා පටිපන්නො සාමඤ්ඤෙව ඤස්සති සාමං දක්ඛිති "සම්මණ්ණ'ව ගොතමො කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී?"ති.

කාශ්‍යපය, නුවණැත්තෝ ලබ්ධි විචාරන්නාහු, කරුණු විචාරන්නාහු, ලබ්ධිත් කරුණුත් දෙක ම විචාරන්නාහු, 'මේ භවතුන්ගේ අකුසල් වූත් අකුසල් යි දන්නා ලද්ද වූත්, සදෙස් වූත් සදෙස් යි දන්නා ලද්ද වූත්, නොසෙවියැ යුතු වූත් නොසෙවියැ යුතු හ යි දන්නා ලද්ද වූත් අරියබව් ලබනුවට නොසමත් වූත්, අරියබව් ලබනුවට නොසමත් හ යි දන්නා ලද්ද වූත්, කළු වූත්, කළු යැ යි දන්නා ලද්ද වූත් යම් දහම් කෙනෙක් වෙත් නම්, ගොයුම්සවුමුළුව ම මෙකී දැ නොඉතිරි කොට දුරුලා සිටි. අත් ගණැදුරන්ගේ සවුමුළුහු යම්තමක් ම දුරු ලා සිටිත්' යැ යි මෙසේ කියන්නාහ යන මේ කරුණ ඇත්තේ ම ය.

කාශ්‍යපය, මෙසේ නුවණැත්තෝ ලබ්ධි විචාරන්නාහු කරුණු විචාරන්නාහු ලබ්ධිත් කරුණුත් විචාරන්නාහු අප ම එහි බෙහෙවින් පසස්නාහ.

7. කාශ්‍යපය, අසෙකෙක් ද ඇත. මේ භවතුන්ගේ කුසල් වූත් කුසල් යි දන්නා ලද්දවූත්, නිදෙස් වූත් නිදෙස් යි දන්නා ලද්දවූත්, සෙවියැ යුතු වූත් සෙවියැ යුතු හ යි දන්නා ලද්දවූත්, අරියබව් ලබනුවට සමත් වූත් අරියබව් ලබනුවට සමත්හ යි දන්නා ලද්දවූත්, සුදු වූත් සුදු යැ යි දන්නා ලද්දවූත් යම් දහම් කෙනෙක් වෙත් නම්, කවරෙක් මේ දැ මුළුල්ල ම සමාදන් කොට ගෙන පවතී ද? ගොයුම්සවුමුළුව ද නැත හොත් අන් භවත් සවුමුළුහු ද? යි ශාස්තෘහු හා ශාස්තෘහු ද, සවුමුළුව හා සවුමුළුව ද සසඳ නුවණැත්තෝ අප ලබ්ධිය විචාරත් වා, කරුණු විචාරත් වා, ලබ්ධිත් කරුණුත් දෙක ම විචාරත් වා.

කාශ්‍යපය, නුවණැත්තෝ ලබ්ධි විචාරන්නාහු, කරුණු විචාරන්නාහු, ලබ්ධිත් කරුණුත් විචාරන්නාහු, 'මේ භවතුන්ගේ කුසල් වූත් කුසල් යි දන්නා ලද්දවූත්, නිදෙස් වූත් නිදෙස් යි දන්නා ලද්දවූත්, සෙවියැ යුතු වූත් සෙවියැ යුතු යැ යි දන්නා ලද්දවූත්, අරියබවට සමත් වූත් අරියබවට සමත්හ යි දන්නා ලද්දවූත්, සුදු වූත් සුදුහ යි දන්නා ලද්දවූත් යම් දහම් කෙනෙක් වෙත් නම්, ගොයුම්සවුමුළුව ම මේ දහම් මුළුල්ල සමාදන් කොට ගෙන පවතී. භවත් අන් ගණැදුරුමුළුහු යම්තමක් ම සමාදන් කොට ගෙන පවතිත් යැ'යි මෙසේ කියන්නාහ යන මේ කරුණ විද්‍යමාන ම ය.

කාශ්‍යපය, මෙසේ නුවණැත්තෝ ලබ්ධි විචාරන්නාහු කරුණු විචාරන්නාහු, ලබ්ධිත් කරුණුත් විචාරන්නාහු, අප ම එහි බෙහෙවින් පසස්නාහ.

8. කාශ්‍යපය, යම්සේ පිළිපන් තැනැත්තේ "මහණ ගොයුම්හු ම කල් සලකා කථා කරන සුල්ලෝ ය, ඇත්ත ම කියන සුල්ලෝ ය, දෙලෝ වැඩ ඇසිරූ කොට ම කියන සුල්ලෝ ය, නවලොවුතුරාදහම් ඇසිරූ කොට කියන සුල්ලෝ ය, විනය ඇසිරූ කොට ම කියන සුල්ලෝ යැ" යි තෙමේ ම දන්නේ නම්, තෙමේ ම දක්නේ නම්, ඒ මඟ ඇත. ඒ පිළිවෙත ඇත.

කාශ්‍යපය, යම්සේ පිළිපන් තැනැත්තේ... තෙමේ ම දන්නේ නම්, තෙමේ ම දක්නේ නම්, ඒ මඟ කවරේ ද? ඒ පිළිවෙත කවරේ ද?

අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො. සෙය්‍යථිදං: සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි.

අයං ඛො කස්සප මග්ගො අයං පටිපදා, යථා පටිපන්නො සාමඤ්ඤව ඤස්සති සාමං දක්ඛිති 'සමණො'ව ගොතමො කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී'ති.

9. එවං වුත්තෙ අචෙලො කස්සපො භගවන්තං එතදවොච:

"ඉමෙ'පි ඛො ආවුසො ගොතම තපොජිගුඤ්ඡකා එකෙසං සමණ-බ්‍රාහ්මණානං සාමඤ්ඤසඞ්ඛාතා ච බ්‍රහ්මඤ්ඤසඞ්ඛාතා ච: අචෙලකො හොති මුත්තාචාරො, හත්ථාපලෙඛනො, න එහිභද්දන්තිකො, න තිට්ඨභද්දන්තිකො, නාභිහටං, න උද්දිස්සකටං, න නිමන්තනං සාදියති. සො න කුම්භිමුඛා පටිග්ගණ්හාති, න කළොපිමුඛා පටිග්ගණ්හාති, න එළකමන්තරං, න දණ්ඩමන්තරං, න මුසලමන්තරං, න ද්වින්නං භුඤ්ජමානානං, න ගබ්භිනියා, න පායමානාය, න පුරිසන්තරගතාය, න සංකිත්තීසු, න යත්ථ සා උපට්ඨිතො හොති, න යත්ථ මක්ඛිකා සණ්ඩසණ්ඩචාරිනී, න මච්ඡං න මංසං. න සුරං න මෙරයං න ථුසොදකං පිවති. සො එකාගාරිකො වා හොති එකාලොපිකො, ද්වාගාරිකො වා හොති ද්වාලොපිකො, සත්තාගාරිකො වා හොති සත්තාලොපිකො, එකිස්සාපි දත්තියා යාපෙති, දසහිපි දත්තිහි යාපෙති, සත්තහිපි දත්තිහි යාපෙති, එකාහිකම්පි ආහාරං ආහාරෙති, ද්වාහිකම්පි ආහාරං ආහාරෙති, සත්තාහිකම්පි ආහාරං ආහාරෙති. ඉති එවරූපං අද්ධමාසිකම්පි පරියායභත්තභොජනානුයොගමනුයුත්තො විහරති.

සම්මාදිට්ඨි සම්මාසඞ්කප්ප සම්මාවාචා සම්මාකම්මන්ත සම්මාආජීව සම්මාවායාම සම්මාසති සම්මාසමාධි යන මේ අරි අටැඟි මඟ ම ය.

කාශ්‍යපය, යම්සේ පිළිපන් තැනැත්තේ "මහණ ගොයුම්හු ම කල් සලකා කියන සුලුහ, ඇත්ත ම කියන සුලුහ, වැඩ ඇසිරි ම කියන සුලුහ, විනය ඇසිරි ම කියන සුලුහ"යි තෙමේ ම දන්නේ නම් තෙමේ ම දක්නේ නම් මේ ඒ මඟය, මේ ඒ පිළිවෙත ය."

9. මෙසේ වදාළ කල්හි අවෙලකාශ්‍යප තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කී ය:

"ඇවැත් ගොයුමාණනි, ඇතැම් මහණ බමුණන්ගේ මහණකමැ යි කියන ලද, බමුණුකමැ යි කියන ලද මේ තවකම් (තවුස්දම්) සෙනෙක් ඇත්හ: අවෙලක (බහාලූ පිළි ඇතිගේ) වෙයි. මුක්තාචාර (හරනා ලද ආචාර ඇතිගේ) වෙයි. හස්තාවලෙඛනක (බොජුන් කිස නිමි කලැ අත ලෝනේ) වෙයි. න එහිභදන්තික (වඩින්නැ වහන්සැ යි කැඳවන ලදුයේ නො එන්නේ) වෙයි. න තිට්ඨභදන්තික (වැඩ සිටින්නැ යි කියන ලදුයේ නො සිටුනේ) වෙයි. අභිහට භොජනය (තමා එන්නට පලමු ගෙනා බොජුන්) නො ඉවසයි. උද්දිස්සකට භොජනය (තමා උදෙසා පිළියෙල කළ බොජුන්) නො ඉවසයි. නිමන්ත්‍රණය (බොජුන් සඳහා අසෝ තැනට වඩින්නැ යි කළ නිමැතුම) නො ඉවසයි. කුම්භිමුඛයෙන් (කුඹුමුවින් - පිසූ බත් ලූ බඳුනින්) නහා දුන් අහර නො පිළිගනී. කලොපිමුඛයෙන් (ඉකිළි පැස්මුවින්)[1] නහා දුන් අහර නො පිළිගනී. එළිපත අතරැ කොට දුන් අහර නො පිළිගනී. දංඩක් අතරැ කොටැ දුන් අහර නො පිළිගනී. මොළහාලක් අතරැ කොට දුන් අහර නො පිළිගනී. වළඳන දෙදෙනකුන්ගෙන් එකකු නැඟී සිටැ දුන් අහර නො පිළිගනී. ගැබිත්තක දුන් අහර, (දරුවාට) කිරි පොවන්නියක දුන් අහර, සැමියා අතරට ගිය සත්‍රියක දුන් අහර නො පිළිගනී. දුබික්ඛෙමෙහි (සමාදන් කොට පිළියෙල කළ බොජුන් අතුරෙන් ගෙන) දුන් අහර නො පිළිගනී. යම් තැනෙක බල්ලෙක් එළැඹ සිටියේ නම් ඊට නොදී ගෙනවුත් දුන් අහර, යම් තැනෙක මැස්සෝ රැස් රැස් වැ හැසිරෙන්නාහු නම් එ තැනින් දුන් අහර නො පිළිගනී. දියමස් ගොඩමස් නො පිළිගනී. රහමේර නො බොයි. සෞවීරකය (සියලු ශාක්‍යසම්භාරයෙන් කළ කාඩිය) නො බොයි. හේ එකාගාරික (එක් ගෙයෙකින් ම අහර ලැබ නවත්නේ) හෝ එකාලොපික (එක් බත් පිඬෙකින් ම යැපෙන්නේ) වෙයි. ද්වාගාරික (දෙගෙයෙකින් අහර ලැබ නවත්නේ) හෝ ද්වාලොපික (දෙබත් පිඬුයෙකින් ම යැපෙන්නේ) වෙයි. සත්තාගාරික (සත් ගෙයෙකින් අහර ලැබ නවත්නේ) හෝ සත්තාලොපික (සත් අහරපිඬෙකින් ම යැපෙන්නේ) වෙයි. එක් දත්තියක (කුඩා තලියෙක) බතින් ද යැපෙයි, දත්ති දෙකෙක බතින් ද යැපෙයි. දත්ති සතෙක බතින් ද යැපෙයි. දවසක් හැර දවසක් ද අහර ගනී. දෙදවසක් හැර දවසක් ද අහර ගනී. සත් දවසක් හැර දවසක් ද අහර ගනී. මෙසේ මෙබඳු වූ අඩමසක් හැර දවසක් ද වාර බත් වැළැඳීමේ වුතයේ යෙදුණේ වෙසෙයි.

---

1 ඉකිළි (උක්කළි) නම් බත් පිසන වළඳකි. පැස නම් බත් ලන පැසකි.

10. ඉමෙ'පි ඛො ආවුසො ගොතම තපොජිගුච්ඡකා එකෙසං සමණබ්‍රාහ්මණානං සාමඤ්ඤසම්මතා ච බ්‍රහ්මඤ්ඤසම්මතා ච: සාකහාරකා වා හොති, සාමාකහාරකා වා හොති, නීවාරහාරකා වා හොති, දද්දුලහාරකා වා හොති, හටහාරකා වා හොති, කණහාරකා වා හොති, ආචාමහාරකා වා හොති, පිඤ්ඤාකහාරකා වා හොති, තිණහාරකා වා හොති, ගොමයහාරකා වා හොති, වනමූලඵලාහාරො යාපෙති පවත්තඵලභොජී.

11. ඉමෙ'පි ඛො ආවුසො ගොතම තපොජිගුච්ඡකා එකෙසං සමණබ්‍රාහ්මණානං සාමඤ්ඤසම්මතා ච බ්‍රහ්මඤ්ඤසම්මතා ච: සාණානි පි ධාරෙති, මසාණානි පි ධාරෙයි, ඡවදුස්සානි පි ධාරෙති, පංසුකූලානි පි ධාරෙති, තිරීටානි පි ධාරෙති, අජිනම්පි ධාරෙති, අජිනක්ඛිපම්පි ධාරෙති, කුසචීරම්පි ධාරෙති, වාකචීරම්පි ධාරෙති, ඵලකචීරම්පි ධාරෙති, කෙසකම්බලම්පි ධාරෙති, වාලකම්බලම්පි ධාරෙති, උලූකපක්ඛිකම්පි ධාරෙති, කෙසමස්සුලොචකො'පි හොති කෙසමස්සුලොචනානුයොගමනුයුත්තො, උබ්භට්ඨකො'පි හොති ආසනපටික්ඛිත්තො, උක්කුටිකො'පි හොති උක්කුටිකප්පධානමනුයුත්තො, කණ්ටකාපස්සයිකො'පි හොති, කණ්ටකාපස්සයෙ සෙය්‍යං කප්පෙති, ඵලකසෙය්‍යම්පි කප්පෙති, ඨණ්ඩිලසෙය්‍යම්පි කප්පෙති, එකපස්සසයිකො'පි හොති, රජොජල්ලධරො අබ්භොකාසිකො'පි හොති යථාසන්තිකො, වෙකටිකො'පි හොති විකටභොජනානුයොගමනුයුත්තො, අපානකො'පි හොති අපානකත්තමනුයුත්තො, සායතතියකම්පි[1] උදකොරොහණානුයොගමනුයුත්තො විහරතී''ති.

12. "අචෙලකො වෙ'පි කස්සප හොති මුත්තාචාරො හත්ථාපලෙඛනො -පෙ- සත්තාහිකම්පි ආහාරං ආහාරෙති. ඉති එවරූපං අද්ධමාසිකම්පි පරියායභත්තභොජනානුයොගමනුයුත්තො විහරති. තස්ස චායං සීලසමාධි විත්තසමාධි පඤ්ඤාසමාධි අභාවිතා හොති අසච්ඡිකතා. අථ ඛො සො ආරකා'ව සාමඤ්ඤා, ආරකා'ව බ්‍රහ්මඤ්ඤා.

යතො ඛො කස්සප භික්ඛු අවෙරං අබ්‍යාපජ්ජං මෙත්තාචිත්තං භාවෙති, ආසවානඤ්ච ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. අයං වුච්චති කස්සප භික්ඛු සමණො ඉති'පි බ්‍රාහ්මණො ඉති'පි.

---

1. සායතතියකම්පි පාළි.

10. ඇවැත් ගොතුමාණනි, ඇතැම් මහණබමුණන්ගේ 'මහණකම්' යැ යි කියන ලද, 'බමුණුකම්' යැ යි කියන ලද මේ තවකම් (තවුස්-දම්) කෙනෙක් වෙති: අමුපලා බුදිනේ හෝ වෙයි. බොඩහමු බුදිනේ හෝ වෙයි. සියතු ඒ (හුරු හැල්) බුදිනේ හෝ වෙයි. සම් ලියා ලූ කසට බුදිනේ හෝ වෙයි. ලහටු ද දිය සෙවෙල් ද බුදිනේ හෝ වෙයි. සහල් කුඩු කන්නේ හෝ වෙයි. දඹුබත් කන්නේ හෝ වෙයි. මුරුවට කන්නේ හෝ වෙයි. තණකොල කන්නේ හෝ වෙයි. ගොම කන්නේ හෝ වෙයි. වන මුල් පල අහර කොටැත්තේ තමා ම වැටුණු පල වළඳනුයේ හෝ යැපෙයි.

11. ඇවැත් ගොතුමාණනි, ඇතැම් මහණබමුණන්ගේ 'මහණුවම්' යැ යි කියන ලද, 'බමුණුවම්' යැ යි කියන ලද මේ තවකම් කෙනෙක් වෙති: හණවැහැරි ද දරයි. අන් හු හා ගන නූල් මුසු කොට වියූ වස්ත්‍ර දරයි. මිනියෙන් බැහැර කොට ලූ වස්ත්‍ර දරයි. ඉවතැ ලූ කඩමාලු රෙදි දරයි. රිපිසුඹුළුයෙන් වියූ වස්ත්‍ර දරයි. අඳුත්මුවසම් දරයි. මැදින් පැළැ අඳුත්මුව සම් දරයි. කුසතණ ගොතා කළ වැහැරි ද දරයි. නියඳවැහැරි ද දරයි. මිනිස් කෙහෙයෙන් කළ කම්බිලි ද දරයි. අස්වලග ලොමින් කළ කම්බිලි දරයි. මහමුහුණු පියාපත් ගොතා කළ වස්ත්‍ර දරයි. කෙහෙ රවුලු ඉදිරිමෙහි යෙදුණේ කෙසමස්සුලොවක ද වෙයි පිළිකෙවු කළ අසුන් ඇත්තේ නැගී සිටුනේ වෙයි. උත්කුටුක වූයේ ද උත්කුටුකව්‍යායමයෙහි යෙදුණේ උත්කුටුක (වැ පැන පැන යන්නේ)ද වෙයි. කණ්ටකාපස්සයික (කිමැ කටු ගසා ඊ මතැ සමක් අතුරා එහි ඉඳුම් හිටුම් ඇ කරනුයේ) ද වෙයි. කිමැ කටු ගසා ඊ මතැ ලූ ඇතිරියෙහි ශයනය කෙරෙයි. ප්‍රවරුයෙහි ශයනය කරන්නේ ද වෙයි. ඵලකිලසෙය්‍යාව (පිල්කඩෙහි ශයනය) කරන්නේ ද වෙයි. එකපස්සයික (එක් ඇලයෙකින් හෝනේ) ද වෙයි. රජස්දැලි දරනුයේ එළිමහනැ වසනුයේ ද වෙයි. අතුරන ලද පරිදි වූ (වෙනස් නොකොට) අස්නැ හිඳුනේ ද වෙයි. විකාලභෝජනයෙහි (ගුළුනුවයෙහි) යෙදුණේ වෛකාලික ද වෙයි. අපානකව්‍යයෙහි (සිහිල් දිය නොපිමෙහි) යෙදුණේ සිහිල් දිය නො බොන්නේ ද වෙයි. සවස තෙවැනි කොට (උදේ මද්දහන සවස යන තුන් වේලෙහි පව් සෝදා හරිනු පිණිස) දියට බැස්මෙහි යෙදුණේ වෙසෙයි යනු යි.

12. "කාශ්‍යපය, ඉදින් අවෙලකත් වේ ද, මුක්තාවාරත් (හරන ලද ආචාර ඇත්තේත්) වේ ද, හස්තාවලේඛනවුත ඇතියේත් වේ ද .... සත් දවසකට වරක් අහර ගනී ද, මෙසේ මේ බඳු වූ අඩමසක් හැර දවසක් ද වාරබත් වැළැඳීමේ වුතයේ යෙදුණේ වෙසේ ද, එහෙත් ඔහු විසින් මේ ශීලසම්පත්තියත් චිත්තසම්පත්තියත් ප්‍රඥාසම්පත්තියත් නො වඩන ලදුයේ පසක් නො කරන ලදුයේ වේ නම්, එසේ කලැ හේ මහණුවම් කෙරෙන් දුරැ ම සිටියේ වෙයි, බමුණුවම් කෙරෙන් දුරැ ම සිටියේ වෙයි.

කාශ්‍යපය, යම් හෙයෙකින් ම භික්ෂු තෙම දොස වෛර රහිත, දෞර්මනස් ව්‍යාපාද රහිත මෙත් සිත වඩා ද, ආස්‍රවයන්ගේ ක්ෂයයෙන් අනාස්‍රව වූ චිත්තවිමුක්තියත් (ඵලසමාධියත්) ප්‍රඥාවිමුක්තියත් (ඵලඥානයත්) මෙ අත්බව්හි ම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන, පසක් කොට, ලැබැ වෙසේ ද, කාශ්‍යපය, මේ භික්ෂු තෙම මහණ නමුදු බමුණු නමුදු වේ යැ යි කියනු ලැබේ.

13 සාකභක්ඛො වෙ'පි කස්සප හොති සාමාකභක්ඛො වෙ'පි කස්සප හොති -පෙ- වනමූලඵලාහාරො යාපෙති පවත්තඵලභොජී. තස්ස චායං සීලසම්පදා චිත්තසම්පදා පඤ්ඤාසම්පදා අභාවිතා හොති අසච්ඡිකතා. අථ ඛො සො ආරකා'ව සාමඤ්ඤා ආරකා'ව බ්‍රහ්මඤ්ඤා.

යතො ඛො කස්සප භික්ඛු අවෙරං අබ්‍යාපජ්ජං මෙත්තචිත්තං භාවෙති, ආසවානඤ්ච ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති, අයං වුච්චති කස්සප භික්ඛු සමණො ඉති'පි බ්‍රාහ්මණො ඉති'පි.

14. සාණානි වෙ'පි කස්සප ධාරෙති මසාණානි'පි ධාරෙති -පෙ- සාගතතියකෙ'පි උදකොරොහණානුයොගමනුයුත්තො විහරති, තස්ස චායං සීලසම්පදා චිත්තසම්පදා පඤ්ඤාසම්පදා අභාවිතා හොති අසච්ඡිකතා, අථ ඛො සො ආරකා'ව සාමඤ්ඤා ආරකා'ව බ්‍රහ්මඤ්ඤා.

යතො ඛො කස්සප භික්ඛු අවෙරං අබ්‍යාපජ්ජං මෙත්තචිත්තං භාවෙති ආසවානඤ්ච ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. අයං වුච්චති කස්සප භික්ඛු සමණො ඉතිපි බ්‍රාහ්මණො ඉතිපිති.

15. එවං වුත්තෙ අචෙලා කස්සපො භගවන්තං එතදවොච: දුක්කරං භො ගොතම සාමඤ්ඤං දුක්කරං බ්‍රහ්මඤ්ඤන්ති.

"පකති ඛො එසා කස්සප ලොකස්මිං දුක්කරං සාමඤ්ඤං දුක්කරං බ්‍රහ්මඤ්ඤන්ති."

අචෙලකො වෙ'පි කස්සප හොති මුත්තාචාරො -පෙ- ඉති එවරූපං අඩ්ඩමාසිකම්පි පරියාගතත්තභොජනානුයොගමනුයුත්තො විහරති, ඉමාය ච කස්සප මත්තාය ඉමිනා ච තපොපක්කමෙන සාමඤ්ඤං වා අභිසස බ්‍රහ්මඤ්ඤං වා දුක්කරං සුදුක්කරං, තෙතං අභිසස කල්ලං වචනාය දුක්කරං සාමඤ්ඤං දුක්කරං බ්‍රහ්මඤ්ඤ"නති.

16. සක්කා ච පනෙතං අභිසස කාතුං ගහපතිතො වා ගහපති-පුත්තතො වා අත්තමනො කුම්භදාසියා'පි: "හන්දාහං අචෙලකො භොමි මුත්තාචාරො -පෙ- ඉති එවරූපං අඩ්ඩමාසිකම්පි පරියාගතත්තභොජ-නානුයොගමනුයුත්තො විහරාමි"ති. යස්මා ච ඛො කස්සප අඤ්ඤත්‍රෙව ඉමාය මත්තාය අඤ්ඤත්‍ර ඉමිනා තපොපක්කමෙන සාමඤ්ඤං වා හොති. බ්‍රහ්මඤ්ඤං වා දුක්කරං සුදුක්කරං, තස්මා එතං කල්ලං වචනාය දුක්කරං සාමඤ්ඤං දුක්කරං බ්‍රහ්මඤ්ඤන්ති.

13. කාශ්‍යපය, තවුස් තෙමේ ඉඳින් අමුපලා බුදිනුයේ වේ ද, බොඛහමු බුදිනුයේ වේ ද,... තමන් ම වැටුණු ඵල බුදින සුලු වූයේ වන මුල් පල අහර කොටැත්තේ යැපේ ද, ඔහු විසින් මේ ශීලසමපත්තියත් චිත්තසමපත්තියත් ප්‍රඥාසමපත්තියත් නො වඩන ලදුයේ පසක් නො කරන ලදුයේ වේ නම්, එසේ කලැ හේ මහණකමින් දුරෙහි ම බමුණුකමින් දුරෙහි ම සිටියේ වෙයි.

කාශ්‍යපය, යම් හෙයෙකින් ම භික්ෂු තෙම දොෂරහිත ව්‍යාපාදරහිත මෙත්සිත වඩා ද, ආස්‍රවයන්ගේ ද ක්ෂයයෙන් අනාස්‍රව වූ ඵලසමාධියත් ඵලඥානයත් තෙමේ ම මෙ අත්බව්හි ම වෙසෙසි නුවණින් දැන, පසක් කොට ලැබ වෙසේ ද, කාශ්‍යපය, මේ භික්ෂු තෙම මහණ නමුදු බමුණු නමුදු වේ යැ සි කියනු ලැබේ.

14. කාශ්‍යපය, තවුස් තෙමේ ඉඳින් හණවැහැරියත් දරා ද හණනූල් අත් හු හා මුහු කොට විහු වස්ත්‍රත් දරා ද... සවස තෙවැනි කොට දියට බැසීමෙහි යෙදුණේ වෙසේ ද, ඔහු විසින් මේ ශීලසමපත්තියත් චිත්තසමපත්තියත් ප්‍රඥාසමපත්තියත් නො වඩනා ලදුයේ පසක් නො කරන ලදුයේ වේ නම්, එසේ කලැ හේ මහණකමින් දුරෙහි ම බමුණුකමින් දුරෙහි ම සිටියේ වෙයි.

කාශ්‍යපය, යම් හෙයෙකින් ම භික්ෂු තෙම දොෂ රහිත ව්‍යාපාද රහිත මෙත් සිත වඩා ද, ආස්‍රවයන්ගේ ද ක්ෂයයෙන් අනාස්‍රව වූ ඵල-සමාධියත් ඵලඥානයත් තෙමේ ම මෙ අත්බව්හි ම වෙසෙසි නුවණින් දැන පසක් කොට ලැබ වෙසේ ද, කාශ්‍යපය, මේ භික්ෂු තෙම මහණ නමුදු බමුණු නමුදු වේ යැ සි කියනු ලැබේ".

15. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ කල්හි, කාශ්‍යප තෙම "භවද් ගෞතමයිනි, මහණකම දුෂ්කර ය. බමුණුකම දුෂ්කර යැ"යි භාග්‍යවතුන් වහන්සේට කී ය.

"කාශ්‍යපය, 'මහණකම දුෂ්කර ය, බමුණුකම දුෂ්කර යැ' යන මෙය ලොවැ ප්‍රකෘති කථාව ය."

16. කාශ්‍යපය, තවුස් තෙම අවෙලකත් වේ ද, මුක්තාවාරත් වේ ද... මෙසේ අඩමසකට වරක් (අඩමසක් හැර දවසක්) මෙබඳු වාර බත් වැළැඳීමේ යෙදුණේ වෙසේ ද, කාශ්‍යපය, මෙ පමණින් ම මේ (සුළු තවකමින් ම) මහණකම හෝ බමුණුකම දුෂ්කරත් ඉතා දුෂ්කරත් වන්නේ නම්, 'මහණකම දුෂ්කර යැ සි, බමුණුකම දුෂ්කර යැ' යන්න කීමට යොග්‍ය නො වන්නේ ය.

කාශ්‍යපය, ගැහැටියක්හු විසින් හෝ ගැහැටිපුතක්හු විසින් හෝ යටත් පිරිසෙසින් කළදැස්සක විසින් නුමුදු "මම දැන් අවෙලක වෙමි, මුක්තාවාර වෙමි... මෙසේ අඩමසක් හැර දවසක් ද යි මෙබඳු වාර බත් වැළැඳීමේ යෙදුණෙමි වෙසෙමි"යි මේ තවකම් කරන්නට හැක්කේ වන්නේය. කාශ්‍යපය, යම් හෙයෙකින් මෙ පමණින් (මේ මද පිළිවෙතින්) වෙන් ව ම, මේ තවකමින් වෙන් ව ම මහණකම හෝ බමුණුකම දුෂ්කරත් සුදුස්කරත් වේ නම්, එහෙයින් 'මහණකම දුෂ්කර ය, බමුණුකම දුෂ්කර යැ' යි මෙය කියන්නට යොග්‍ය ය.

යතො ඛො කස්සප භික්ඛු අවෙරං අබ්‍යාපජ්ජං මෙත්තචිත්තං භාවෙති, ආසවානඤ්ච ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති, අයං වුච්චති කස්සප භික්ඛු සමණො ඉති'පි බ්‍රාහ්මණො ඉති'පි.

17. සාකහක්ඛො වෙ'පි කස්සප හොති -පෙ- වනමූලඵලාහාරො යාපෙති පවත්තඵලභොජී. ඉමායෙව කස්සප මත්තායෙව ඉමිනා තපොපක්කමෙන සාමඤ්ඤං වා අභවිස්ස බ්‍රහ්මඤ්ඤං වා දුක්කරං සුදුක්කරං, නෙතං අභවිස්ස කල්ලං වචනාය 'දුක්කරං සාමඤ්ඤං දුක්කරං බ්‍රහ්මඤ්ඤන්ති'.

සක්කා ච පනෙතං අභවිස්ස කාතුං ගහපතිනා වා ගහපතිපුත්තෙන වා අත්තමනසා කුම්භදාසියාපි: 'හන්දාහං සාකහක්ඛො වා හොමි, -පෙ- වනමූලඵලාහාරො යාපෙමි පවත්තඵලභොජී'ති. යස්මා ච ඛො කස්සප අඤ්ඤත්‍රෙව ඉමායෙව මත්තායෙව අඤ්ඤත්‍ර ඉමිනා තපොපක්කමෙන සාමඤ්ඤං වා හොති බ්‍රහ්මඤ්ඤං වා දුක්කරං සුදුක්කරං, තස්මා එතං කල්ලං වචනාය 'දුක්කරං සාමඤ්ඤං දුක්කරං බ්‍රහ්මඤ්ඤන්ති'.

යතො ඛො කස්සප භික්ඛු අවෙරං අබ්‍යාපජ්ජං මෙත්තචිත්තං භාවෙති, ආසවානඤ්ච ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති, අයං වුච්චති කස්සප භික්ඛු සමණො ඉති'පි බ්‍රාහ්මණො ඉති'පි.

18. සාණානි වෙ'පි කස්සප ධාරෙති මසාණානි'පි ධාරෙති -පෙ- සායතතියකම්පි උදකොරොහණානුයොගමනුයුත්තො විහරති. ඉමායෙව කස්සප මත්තායෙව ඉමිනා තපොපක්කමෙන සාමඤ්ඤං වා අභවිස්ස බ්‍රහ්මඤ්ඤං වා දුක්කරං සුදුක්කරං, නෙතං අභවිස්ස කල්ලං වචනාය 'දුක්කරං සාමඤ්ඤං දුක්කරං බ්‍රහ්මඤ්ඤන්ති'.

සක්කා ච පනෙතං අභවිස්ස කාතුං ගහපතිනා වා ගහපතිපුත්තෙන වා අත්තමනසා කුම්භදාසියාපි: 'හන්දාහං සාණානිපි ධාරෙමි, මසාණානිපි ධාරෙමි, -පෙ- සායතතියකම්පි උදකොරොහණානුයොගමනුයුත්තො විහරාමි'ති. යස්මා ච ඛො කස්සප අඤ්ඤත්‍රෙව ඉමායෙව මත්තායෙව අඤ්ඤත්‍ර ඉමිනා තපොපක්කමෙන සාමඤ්ඤං වා හොති බ්‍රහ්මඤ්ඤං වා දුක්කරං සුදුක්කරං, තස්මා එතං කල්ලං වචනාය 'දුක්කරං සාමඤ්ඤං දුක්කරං බ්‍රහ්මඤ්ඤන්ති'.

යතො ඛො කස්සප භික්ඛු අවෙරං අබ්‍යාපජ්ජං මෙත්තචිත්තං භාවෙති, ආසවානඤ්ච ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති, අයං වුච්චති කස්සප භික්ඛු සමණො ඉති'පි බ්‍රාහ්මණො ඉති'පිති.

කාශ්‍යපය, යම් කලෙක පටන් භික්ෂු තෙම වෛර නැති ව්‍යාපාද නැති මෙත්සිත වඩා නම් ආස්‍රවයන්ගේ ක්ෂයයෙන් අනාස්‍රව වූ ඵල-සමාධියත් ඵලඥානයත් මේ අත්බව්හි ම තෙමේ වෙසෙසි නුවණින් දැන පසක් කොට ලැබ වෙසේ නම්, කාශ්‍යපය, මේ භික්ෂුතෙම මහණ යැ සි දු බමුණු යැ සි දු කියනු ලැබේ.

17. කාශ්‍යපය, ඉඳින් තවුස් තෙම අමු පලා කන්නේ වේ ද... තමන් ම වැටුණු පල බුදින සුලු වූයේ වෙතෙහි මුල් පල අහර කොට යැපේ ද, කාශ්‍යපය, මේ පමණින් ම මේ තවකමින් ම මහණකම හෝ බමුණුකම දුෂ්කරත් සුදුෂ්කරත් වන්නේ නම් 'මහණකම දුෂ්කර යැ, බමුණුකම දුෂ්කර යැ' සි කියන්නට යොග්‍ය නො වන්නේ ය.

කාශ්‍යපය, ගැහැවියකු විසින් හෝ ගැහැවිපුතක්හු විසින් හෝ යටත් පිරිසෙසින් කලදැස්සක විසින් නමුදු "මම දැන් අමුපලා කන්නෙම් වෙමි... ස්වයම්පතිත ඵලභෝජී ව වනමුලඵලාහාර ඇත්තෙම් යැපෙමි'සි මේ තවකම් කරන්නට හැකි වන්නේ ය. කාශ්‍යපය, යම් හෙයෙකින් ම මේ මද පිළිවෙතින් වෙන් ව ම මේ තවකමින් වෙන් ව ම මහණකම හෝ බමුණුකම දුෂ්කරත් සුදුෂ්කරත් වේ ද, එ හෙයින් 'මහණකම දුෂ්කර ය, බමුණුකම දුෂ්කර යැ'සි මෙය කියනුවට යොග්‍ය ය.

කාශ්‍යපය, යම් කලෙක පටන් භික්ෂු තෙම වෛර නැති ව්‍යාපාද නැති මෙත්සිත වඩා නම් ආස්‍රවයන්ගේ ක්ෂයයෙන් අනාස්‍රව වූ ඵල-සමාධියත් ඵලඥානයත් මේ අත්බව්හි ම තෙමේ වෙසෙසි නුවණින් දැන පසක් කොට ලැබ වෙසේ නම්, කාශ්‍යපය, මේ භික්ෂු තෙම මහණ නමුදු බමුණු නමුදු වේ යැ සි කියනු ලැබේ.

18. කාශ්‍යපය, ඉඳින් තවුස් තෙම හණවැහැරි දරා ද, හණනූල් මුසු අත්හුසින් විසූ වස්ත්‍ර දරා ද... සවස තෙවෙති කොට දිගේ බැසීමෙහි යෙදුණේ වෙසේ ද, කාශ්‍යපය, මේ මද පිළිවෙතින් මේ තවකමින් දුෂ්කරත් සුදුෂ්කරත් වූ මහණකමෙක් බමුණුකමෙක් වන්නේ නම් 'මහණකම දුෂ්කර යැ බමුණුකම දුෂ්කර යැ'සි මෙය කියන්නට යොග්‍ය නො වන්නේ ය.

'මම දැන් හණවැහැරි දරමි, හණනූල් අත්නූල් හා මුසු කොට විසූ වස්ත්‍ර දරමි... සවස තෙවෙති කොටැති ව දිගෙහි ගැලීමෙහි යෙදුණෙමි වෙසෙමි'සි ගැහැවියකු විසින් හෝ ගැහැවිපුතක්හු විසින් හෝ යටත් පිරිසෙසින් කලදැස්සක විසිනුදු මෙය කරන්නට හැකි වන්නේ ය. කාශ්‍යපය, යම් හෙයෙකින් මේ මද පිළිවෙත හැර ම මේ තවකම් හැර ම, මහණකම හෝ බමුණුකම දුෂ්කරත් සුදුෂ්කරත් වේ ද, එහෙයින් 'මහණකම දුෂ්කර ය, බමුණුකම දුෂ්කර යැ' සි මෙය කියන්නට යොග්‍ය ය.

කාශ්‍යපය, යම් කලෙක පටන් භික්ෂු තෙම වෛර නැති ව්‍යාපාද නැති මෙත්සිත වඩා ද ආස්‍රවයන්ගේ ක්ෂයයෙන් අනාස්‍රව වූ ඵල-සමාධියත් ඵලඥානයත් මේ අත්බව්හි ම තෙමේ වෙසෙසි නුවණින් දැන, පසක් කොට ලැබ වෙසේ ද, කාශ්‍යපය, මේ භික්ෂු තෙම මහණ නමුදු බමුණු නමුදු වේ යැ සි කියනු ලැබේ.

19. එවං වුත්තෙ අචෙලො කස්සපො භගවන්තං එතදවොච: ''දුජ්ජානො හො ගොතම සමණො දුජ්ජානො බ්‍රාහ්මණො''ති.

''පකති ඛො එසා කස්සප ලොකස්මිං 'දුජ්ජානො සමණො දුජ්ජානො බ්‍රාහ්මණො''ති.

20 අචෙලකො වෙ'පි කස්සප හොති -පෙ- ඉති එවරූපං අද්ධමාසිකම්පි පරියායභත්තභොජනානුයොගමනුයුත්තො විහරති, ඉමාය කස්සප මත්තාය ඉමිනා තපොපක්කමෙන සමණො වා අභවිස්ස බ්‍රාහ්මණො වා දුජ්ජානො සුදුජ්ජානො, තෙතං අභවිස්ස කල්ලං වචනාය 'දුජ්ජානො සමණො දුජ්ජානො බ්‍රාහ්මණො'ති.

සක්කා ච පනෙසො අභවිස්ස ඤාතුං ගහපතිනා වා ගහපතිපුත්තෙන වා අන්තමසො කුම්භදාසියාපි: අයං අචෙලකො නොති මුත්තාචාරො -පෙ- ඉති එවරූපං අද්ධමාසිකම්පි පරියායභත්තභොජනානුයොගමනුයුත්තො විහරතීති. යස්මා ච ඛො කස්සප අඤ්ඤත්‍රෙව ඉමාය මත්තාය අඤ්ඤත්‍ර ඉමිනා තපොපක්කමෙන සමණො වා හොති බ්‍රාහ්මණො වා දුජ්ජානො සුදුජ්ජානො, තස්මා එතං කල්ලං වචනාය දුජ්ජානො සමණො දුජ්ජානො බ්‍රාහ්මණො'ති.

යතො ච ඛො කස්සප භික්ඛු අවෙරං අබ්‍යාපජ්ජං මෙත්තචිත්තං භාවෙති, ආසවානඤ්ච ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති, අයං වුච්චති කස්සප භික්ඛු සමණො ඉති'පි බ්‍රාහ්මණො ඉති'පීති.

21. සාකභක්ඛො වෙ'පි කස්සප හොති සාමාකභක්ඛො වෙ'පි කස්සප හොති -පෙ- වනමූලඵලාහාරො යාපෙති පවත්තඵලභොජී. ඉමාය ච කස්සප මත්තාය ඉමිනා තපොපක්කමෙන සමණො වා අභවිස්ස බ්‍රාහ්මණො වා දුජ්ජානො සුදුජ්ජානො, තෙතං අභවිස්ස කල්ලං වචනාය 'දුජ්ජානො සමණො දුජ්ජානො බ්‍රාහ්මණො'ති.

සක්කා ච පනෙසො අභවිස්ස ඤාතුං ගහපතිනා වා ගහපතිපුත්තෙන වා අන්තමසො කුම්භදාසියාපි: 'අයං සාකභක්ඛො වා හොති සාමාක-භක්ඛො වා -පෙ- වනමූලඵලාහාරො යාපෙති පවත්තඵලභොජී'ති. යස්මා ච ඛො කස්සප අඤ්ඤත්‍රෙව ඉමාය මත්තාය අඤ්ඤත්‍ර ඉමිනා තපොපක්කමෙන සමණො වා හොති බ්‍රාහ්මණො වා දුජ්ජානො සුදුජ්ජානො, තස්මා එතං කල්ලං වචනාය 'දුජ්ජානො සමණො දුජ්ජානො බ්‍රාහ්මණො'ති.

19. මෙසේ වදාළ කල්හි අවෙලකාශ්‍යප තෙම භාග්‍යවතුන් වහන්සේට, "භවද් ගෞතමයිනි, මහණ තෙම දුකසේ දත යුතු ය, බමුණු තෙම දුකසේ දත යුතු යැ"යි මේ වචන කීය.

"කාශ්‍යපය, 'මහණ තෙමේ දුකසේ දත යුතු ය, බමුණු තෙම දුකසේ දත යුතු ය' යන මෙය ලොවැ ප්‍රකෘති කථාව ම ය."

20. කාශ්‍යපය, ඉදින් තවුස් තෙම අවෙලක වේ ද,... මෙසේ මෙබඳු වූ අධිමාසික පර්‍යාය භක්ත භෝජනව්‍රතයෙහි යෙදුණේ වෙසේ ද, කාශ්‍යපය, මේ මඳ පිළිවෙතින්, මේ තවකමින් දුකසේ දත යුතු ඉතා දුකසේ දත යුතු මහණෙක් බමුණෙක් වන්නේ නම්, 'මහණ තෙම දුකසේ දත යුත්තේ ය, බමුණු තෙම දුකසේ දත යුත්තේ යැ' යන මෙය කියන්නට යෝග්‍ය නො වන්නේ ය.

ගෘහපතියකු හෝ ගෘහපිපුතක්හු හෝ යටත් පිරිසෙසින් කළදැස්සක හෝ විසිනුදු 'මේ තෙමේ අවෙලක වෙයි, මුක්තාචාර වෙයි... මෙසේ මෙබඳු ආධිමාසික වූ ද පර්‍යාය භක්ත භෝජනව්‍රතයෙහි යෙදුණේ වෙසේ යැ' යි ඔහු දත හැකි වන්නේ ය. කාශ්‍යපය, යම් හෙයෙකින් මේ මඳ පිළිවෙත හැර ම මේ තවකම් හැර ම මහණ තෙමේ හෝ බමුණු තෙමේ හෝ දුකසේ දත යුතු වේ ද, ඉතා දුකසේ දත යුතු වේ ද, එහෙයින් 'මහණ තෙම දුකසේ දත යුතු ය, බමුණු තෙම දුකසේ දත යුතු යැ'යි මෙය කියන්නට යෝග්‍ය ය.

කාශ්‍යපය, යම් කලෙක පටන් භික්ෂු තෙම වෛර නැති, ව්‍යාපාද නැති, මෙත්සිත වඩා ද, ආස්‍රවයන්ගේ ක්ෂයයෙන් අනාස්‍රව වූ චේතොවිමුක්තිය ද ප්‍රඥාවිමුක්තිය ද මෙ අත්බවහි ම තෙමේ වෙසෙසි නුවණින් දැන පසක් කොට ලැබ වෙසේ ද, කාශ්‍යපය, මෙ භික්ෂු තෙම මහණ යැ යි ද බමුණු යැ යි ද කියනු ලැබේ.

21. කාශ්‍යපය, තවුස් තෙම ඉදින් අඹු පලා කන්නේ වේ ද, බොඩ-හමු කන්නේ වේ ද,... ස්වයංපතිතඵල වළඳන සුළු වූයේ වනමුල් පල ආහාර කොටැත්තේ යැපේ ද, කාශ්‍යපය, මේ මඳ පිළිවෙතින් මේ තවකමින් දුකසේ දත යුතු ඉතා දුකසේ දත යුතු මහණෙක් හෝ බමුණෙක් වන්නේ නම්, 'මහණ දුකසේ දත යුතු ය, බමුණ දුකසේ දත යුතු ය' යන මෙය කියන්නට යෝග්‍ය නො වන්නේ ය.

මෙ තෙම අඹුපලා කන්නේ හෝ වෙයි, බොඩහමු කන්නේ හෝ වෙයි... ස්වයංපතිතඵලභෝජී වූයේ වනමුල් පල ආහාර කොටැත්තේ යැපේ යැ' යි ගෘහපතියකු විසිනුදු ගෘහපිපුතකු විසිනුදු යටත් පිරිසෙසින් කළදැස්සක විසිනුදු ඔහු දත හැකි වන්නේ ය. (එහෙයිනි.) කාශ්‍යපය, යම් හෙයෙකින් මේ මඳ පිළිවෙතින් අන් තන්හි ම, මේ තවකමින් අන් තන්හි ම, දුකසේ දත යුතු වූ ඉතා දුකසේ දත යුතු වූ මහණ තෙමේ හෝ බමුණු තෙමේ වේ ද, එහෙයින් මහණ දුකසේ දත යුතු ය, බමුණ දුකසේ දත යුතු ය යන මෙය කියන්නට යෝග්‍ය ය.

යතො ඛො කස්සප භික්ඛු අවෙරං අබ්‍යාපජ්ජං මෙත්තාචිත්තං භාවෙති, ආසවානඤ්ච ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති, අයං වුච්චති කස්සප භික්ඛු සමණො ඉති'පි බ්‍රාහ්මණො ඉති'පි.

22. සාණානි වෙ'පි කස්සප ධාරෙති, මිසාණානි'පි ධාරෙති -පෙ- සායතතියකම්පි උදකොරොහණානුයොගමනුයුත්තො විහරති, ඉමායපි කස්සප මත්තාය ඉමිනා තපොපක්කමෙන සමණො වා අභවිස්ස බ්‍රාහ්මණො වා දුජ්ජානො සුදුජ්ජානො, තෙතං අභවිස්ස කල්ලං වචනාය 'දුජ්ජානො සමණො දුජ්ජානො බ්‍රාහ්මණො'ති.

සක්කා ච පනෙසො අභවිස්ස ඤාතුං ගහපතිනා වා ගහපතිපුත්තෙන වා අත්තමනො කුම්භදාසියාපි: 'අයං සාණානි'පි ධාරෙති මිසාණානි'පි ධාරෙති -පෙ- සායතතියකම්පි උදකොරොහණානුයොගමනුයුත්තො විහරති'ති. යස්මා ච ඛො කස්සප අඤ්ඤත්‍රෙව ඉමාය මත්තාය අඤ්ඤත්‍ර ඉමිනා තපොපක්කමෙන සමණො වා හොති බ්‍රාහ්මණො වා දුජ්ජානො සුදුජ්ජානො, තස්මා එතං කල්ලං වචනාය 'දුජ්ජානො සමණො දුජ්ජානො බ්‍රාහ්මණො'ති.

යතො ඛො කස්සප භික්ඛු අවෙරං අබ්‍යාපජ්ජං මෙත්තාචිත්තං භාවෙති, ආසවානඤ්ච ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති, අයං වුච්චති කස්සප භික්ඛු සමණො ඉති'පි බ්‍රාහ්මණො ඉති'පි.

23. එවං වුත්තෙ අචෙලො කස්සපො භගවන්තං එතදවොච: "කතමා පන සා භො ගොතම සීලසම්පදා, කතමා චිත්තසම්පදා, කතමා පඤ්ඤාසම්පදා ?"ති.

ඉධ කස්සප තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං -පෙ- භගවා. සො ඉමං ලොකං -පෙ- සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති -පෙ- බ්‍රහ්මචරියං පකාසෙති. තං ධම්මං සුණාති ගහපති වා -පෙ- සො තං ධම්මං සුත්වා තථාගතෙ සද්ධං පටිලභති. සො තෙන සද්ධාපටිලාභෙන සමන්නාගතො ඉති පටිසඤ්චික්ඛති: සම්බාධො ඝරාවාසො -පෙ- 'යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍යන්ති'.

කාශ්‍යපය, යම් කාලෙක පටන් වනාහි භික්ෂු තෙම වෛර නැති ව්‍යාපාද නැති මෙත්සිත වඩා ද, ආස්‍රවයන්ගේ ක්ෂයයෙන් අනාස්‍රව වූ ඵලසමාධියත් ඵලඥානයත් මේ අත්බව්හි ම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන පසක් කොට ලැබ වෙසේ ද, කාශ්‍යපය, මේ භික්ෂු තෙම මහණ යැ යි ද බමුණු යැ යි ද කියනු ලැබේ.

22. කාශ්‍යපය, තවුස් තෙම ඉදින් හණවැහැරි දරා ද, හණතුල් මුසු හුගින් විලූ වස්ත්‍ර දරා ද,... සවස තෙවෙනි කොට දියේ ගැලීමේ යෙදුණේ වෙසේ ද, කාශ්‍යපය, මේ මද පිළිවෙතිනුත් මේ තවකමිනුත් දුකසේ දතයුතු, ඉතා දුකසේ දතයුතු මහණෙක් හෝ බමුණෙක් වන්නේ නම්' 'මහණා දුකසේ දත යුතු ය, බමුණා දුකසේ දත යුතු යැ' යන මෙය කියන්නට නො නිසි වන්නේ ය.

'මේ තෙම හණවැහැරි ද දරයි, මිශ්‍රක වස්ත්‍ර ද දරයි... සවස තෙවෙනි කොට ද (ත්‍රිසන්ධ්‍යායෙහි ද) දියේ ගැලීමේ යෙදුණේ වෙසේ' යැ යි ගැහැවියකු විසිනුදු ගැහැවිපුතක්හු විසිනුදු යටත් පිරිසෙසින් කළදැස්සක විසිනුදු මොහු දත හැකි ද වන්නේ ය. කාශ්‍යපය, යම් හෙයෙකින් ම මේ මද පිළිවෙතින් අත් තන්හි ම, මේ තවකමින් අත් තන්හි ම, දුකසේ දැන ගත යුතු, ඉතා දුකසේ දැන ගත යුතු මහණ තෙමේ හෝ බමුණු තෙමේ වේ ද, එහෙයින් 'මහණා දුකසේ දැන ගත යුතු ය, බමුණා දුකසේ දැන ගත යුතු ය' යන මෙය කියන්නට නිසි ය.

කාශ්‍යපය, යම් කලෙක පටන් භික්ෂු තෙම දෙවන නැතිවැ ව්‍යාපාද නැති වැ මෙත්සිත වඩා ද, ආස්‍රවයන්ගේ ක්ෂයයෙන් ආස්‍රව නැති ඵල සමාධියත් ඵලඥානයත් මේ අත්බව්හි ම තෙමේ විශිෂ්ට නුවණින් දැන පසක් කොට ලැබ වෙසේ ද, කාශ්‍යපය, මේ භික්ෂු තෙම ශ්‍රමණ නමුදු බ්‍රාහ්මණ නමුදු වේ යැ යි කියනු ලැබේ.

23. මෙසේ වදාළ කල්හි අවෙලකාශ්‍යප තෙම "භවද් ගෞතමයිනි, ඒ ශීලසම්පත් කවරේ ද? ඒ චිත්තසම්පත් කවරේ ද? ඒ ප්‍රඥාසම්පත් කවරේ ද?"යි මෙය භාග්‍යවතුන් වහන්සේ වෙතින් විමසේ ය. (භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:)

කාශ්‍යපය, මේ ලොවැ අර්හත් වූ... භාග්‍යවත් තථාගත තෙම පහළ වෙයි. හේ මේ ලෝකය... තෙමේ ම දැන පසක් කොට පවසයි. හේ දහම් දෙසයි... බඹසර පවසයි. ඒ දහම් ගැහැවියෙක් හෝ... අසයි. හේ ඒ දහම් අසා තථාගත බුදුහු කෙරෙහි සැදැහැ පිළිලබයි (උපදවයි) හේ ඒ සැදැහැ ලැබීමෙන් යුත් වූයේ, ගිහිගෙය සම්බාධ ඇත්තේ ය... 'මම කෙහෙ රවුළු බා හැර කසාවත් හැඳ ගිහිගෙන් නික්මැ සසුන් වන්නෙම් නම් යෙහෙකැ'යි හේ සලකයි.

සො අපරෙන සමයෙන -පෙ- අනගාරියං පබ්බජති. සො එවං පබ්බජිතො සමානො පාතිමොක්ඛසංවරසංවුතො විහරති -පෙ- සමාදාය සික්ඛති සික්ඛාපදෙසු -පෙ-

24. කථඤ්ච කස්සප භික්ඛු සීලසම්පන්නො හොති ? ඉධ කස්සප භික්ඛු පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති -පෙ- ඉදම්පි'ස්ස හොති සීලසම්පදාය.- පෙ- [යථා සාමඤ්ඤඵලෙ එවං විත්ථාරෙතබ්බං.]

යථා වා පනෙකෙ හොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථිදං: සන්තිකම්මං -පෙ- ඔසධීනං පටිමොක්ඛා ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලසම්පදාය.

ස ඛො සො කස්සප භික්ඛු එවං සීලසම්පන්නො න කුතොචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතො. සෙය්‍යථාපි කස්සප රාජා ඛත්තියො මුද්ධාවසිත්තො නිහතපච්චාමිත්තො න කුතොචි භයං සමනුපස්සති යදිදං පච්චත්තිකතො, එවමෙව ඛො කස්සප භික්ඛු එවං සීලසම්පන්නො න කුතොචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතො.

සො ඉමිනා අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො, අජ්ඣත්තං අනවජ්ජසුඛං පටිසංවෙදෙති. එවං ඛො කස්සප භික්ඛු සීලසම්පන්නො හොති. අයං ඛො කස්සප සීලසම්පදා -පෙ-

25. කථඤ්ච කස්සප භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති ? ඉධ කස්සප භික්ඛු චක්ඛුනා රූපං දිස්වා නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී -පෙ- චක්ඛින්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝාණෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී -පෙ- මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සො ඉමිනා අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො අජ්ඣත්තං අබ්‍යාසෙකසුඛං පටිසංවෙදෙති. එවං ඛො කස්සප භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති.

26. කථඤ්ච කස්සප භික්ඛු සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො හොති ? ඉධ කස්සප භික්ඛු අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී හොති. -පෙ- ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ සම්පජානකාරී හොති. එවං ඛො කස්සප භික්ඛු සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො හොති.

හේ මෑත කලෑ... සසුන් වදී. හේ මෙසේ පැවිදි වූයේ ම ප්‍රාතිමෝක්ෂසංවරයෙන් සංවෘතව වෙසෙයි... සමාදන් කොට ගෙන සිකපදන්හි හික්මෙයි

24. කාශ්‍යපය, කෙසේ නම් මහණ සිල්වත් වේ ද? කාශ්‍යපය, මෙහි මහණ තෙම පණිවා හැර පණිවායෙන් වැළැක්කේ වෙයි... මේ ඔහුගේ ශීලසම්පත් වේ. [යට සාමඤ්ඤඵල සූත්‍රයෙහි දැක්වුණු පරිදි විස්තර කටයුතු.]

යම්සේ වනාහි ඇතැම් භවද් මහණ බමුණෝ සැදහැයෙන් දුන් බොජුන් වළඳ, ශාන්තිකර්මය... මුල් බෙහෙත් බැහැර කිරීම යන මෙබඳු වූ තිරශ්චීනවිද්‍යයෙන් මිථ්‍යාආජීවයෙන් ජීවිකා කෙරෙත් ද, මේ ආදි වූ හෝ මෙබඳු වූ තිරශ්චීනවිද්‍යයෙන් මිථ්‍යාආජීවයෙන් හේ වැළැක්කේ වේ. මේ ඔහුගේ ශීලසම්පත් වේ.

කාශ්‍යපය, හේ මහණ මෙසේ සිල්වත් වූයේ, ශීලසංවරයෙන් කොසිඳුදු කියක් නො දකී. මුදුතැ අභිසෙස් ලත්, නැසූ පසමිතුරන් ඇති, කැත් රජෙක් පසමිතුරකුගෙන් කොසිඳුදු කියක් නො දකී ද, එසේ ම මහණ තෙම ශීලසංවරයෙන් (අසංවර නැති බැවින්) කොසිඳුදු කියක් නො දකී.

හේ මේ ආර්‍යශීලස්කන්ධයෙන් සමන්විත වූයේ තමා කෙරෙහි වූ නිදොස්බව් සුවය විඳී. කාශ්‍යපය, මෙසේ මහණ සිල්වත් වෙයි. කාශ්‍යපය, මේ ඒ ශීලසම්පත් ය...

25. කාශ්‍යපය, කෙසේ නම් මහණ තෙම ඉන්ද්‍රියයන්හි වැසූ දොර ඇත්තේ වේ ද? කාශ්‍යපය, මෙ සත්තැ මහණ තෙම ඇසින් රූපයක් දැක නිමිත්තග්‍රාහී නො වෙයි. අනුව්‍යඤ්ජනග්‍රාහී නො වෙයි.... චක්ෂුරින්ද්‍රිය-යෙහි සංවරයට පැමිණෙයි. කනින් හඬක් අසා .. නැහැයෙන් ගඳක් අසා.... දිවෙන් රසක් ආස්වාදන කොට... කයින් ස්ප්‍රෂ්ටව්‍යයක් ස්පර්ශ කොට.... මනසින් දහමක් දැන.... නිමිත්තග්‍රාහී නො වෙයි. අනුව්‍යඤ්ජන-ග්‍රාහී නො වෙයි... මනින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි. හේ මේ ආදී වූ ඉන්ද්‍රියසංවරයෙන් සමන්විත වූයේ, සිය සතන්හි නොකිලිටි අනවද්‍යසුඛය විඳී. කාශ්‍යපය, මහණ තෙම මෙසේ ඉඳුරන්හි වැසූ දොරන්තේ වෙයි.

26. කාශ්‍යපය, කෙසේ නම් මහණ තෙම සතිසම්පජඤ්ඤයෙන් යුක්ත වේ ද? ඇවැත්නි, මෙහි මහණ තෙම ඉදිරියට යෑමෙහි ද පෙරළා ඒමෙහි ද නුවණින් දැන (එය) කරන සුලු වෙයි... ගමනෙහි සිටීමෙහි හිඳීමෙහි නිදීමෙහි නිදි වැරීමෙහි කීමෙහි නිහඬ වීමෙහි නුවණින් දැන (එය) කරන සුලු වෙයි. කාශ්‍යපය, මහණ තෙමේ මෙසේ සතිසම්පජඤ්ඤ-යෙන් සමන්විත වෙයි.

27. කථඤ්ච ආවුසො භික්ඛු සන්තුට්ඨො හොති? ඉධාවුසො භික්ඛු සන්තුට්ඨො හොති චීවරෙන -පෙ- කුච්ඡිපරිහාරිකෙන පිණ්ඩපාතෙන. සො යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති. එවං ඛො ආවුසො භික්ඛු සන්තුට්ඨො හොති.

28. සො ඉමිනා අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො ඉමිනා'ව අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො ඉමිනා'ව අරියෙන සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො ඉමායෙව අරියාය සන්තුට්ඨියා සමන්නාගතො විවිත්තං සෙනාසනං භජති අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං. සො පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා.

29. සො ලොකෙ අභිජ්ඣං පහාය විගතාභිජ්ඣෙන චෙතසා විහරති. අභිජ්ඣාය චිත්තං පරිසොධෙති -පෙ- ව්‍යාපාදපදොසං පහාය අව්‍යාපන්නචිත්තො විහරති -පෙ- පීනමිද්ධං පහාය විගතපීනමිද්ධො විහරති -පෙ- උද්ධච්චකුක්කුච්චං පහාය අනුද්ධතො විහරති -පෙ- විචිකිච්ඡං පහාය තිණ්ණවිචිකිච්ඡො විහරති. අකථංකථී කුසලෙසු ධම්මෙසු, විචිකිච්ඡාය චිත්තං පරිසොධෙති.

සෙය්‍යථාපි ආවුසො පුරිසො ඉණං ආදාය කම්මන්තෙ පයොජෙය්‍ය. තස්ස තෙ කම්මන්තා සම්ඉජ්ඣෙය්‍යුං -පෙ- සො තතො නිදානං ලභෙථ පාමොජ්ජං, අධිගච්ඡෙය්‍ය සොමනස්සං. සෙය්‍යථාපි ආවුසො පුරිසො ආබාධිකො අස්ස දුක්ඛිතො -පෙ- සො අපරෙන සමයෙන තම්හා ආබාධා මුච්චෙය්‍ය -පෙ- සො තතො නිදානං ලභෙථ පාමොජ්ජං, අධිගච්ඡෙය්‍ය සොමනස්සං. සෙය්‍යථාපි ආවුසො පුරිසො බන්ධනාගාරෙ බද්ධො අස්ස, සො අපරෙන සමයෙන තම්හා බන්ධනා මුච්චෙය්‍ය -පෙ- සො තතො නිදානං ලභෙථ පාමොජ්ජං, අධිගච්ඡෙය්‍ය සොමනස්සං. සෙය්‍යථාපි ආවුසො පුරිසො දාසො අස්ස අනත්තාධීනො -පෙ- සො අපරෙන සමයෙන තම්හා දාසව්‍යා මුච්චෙය්‍ය -පෙ- සො තතො නිදානං ලභෙථ පාමොජ්ජං, අධිගච්ඡෙය්‍ය සොමනස්සං. සෙය්‍යථාපි ආවුසො පුරිසො සධනො සභොගො කන්තාරද්ධානමග්ගං පටිපජ්ජෙය්‍ය -පෙ- සො අපරෙන සමයෙන තං කන්තාරං නිත්ථරෙය්‍ය -පෙ- සො තතො නිදානං ලභෙථ පාමොජ්ජං, අධිගච්ඡෙය්‍ය සොමනස්සං. එවමෙව ඛො ආවුසො භික්ඛු යථා ඉණං යථා රොගං යථා බන්ධනාගාරං යථා දාසව්‍යං යථා කන්තාරද්ධානමග්ගං ඉමෙ පඤ්චනීවරණෙ අපහීණෙ අත්තනි සමනුපස්සති. සෙය්‍යථාපි ආවුසො ආනණ්‍යං යථා ආරොග්‍යං යථා බන්ධනමොක්ඛං යථා භුජිස්සං යථා ඛෙමභූමිං, එවමෙව ඛො ආවුසො භික්ඛු ඉමෙ පඤ්චනීවරණෙ පහීණෙ අත්තනි සමනුපස්සති.

27. ඇවැත්නි, කෙසේ නම් මහණ තෙම සතුටු සිතැත්තේ වේ ද? ඇවැත්නි, මේ සස්තෙහි මහණ තෙම කායපරිහරණයට ප්‍රමාණ වූ සිවුරෙන් ද... කුක්ෂිපරිහරණයට ප්‍රමාණ වූ පිණ්ඩපාතයෙන් ද සතුටු වෙයි. හේ යම් යම් තැනකට යේ ද තමා සතු අවපිරිකර පමණක් ගෙන ම යෙයි. ඇවැත්නි, මහණ තෙම මෙසේ ම සතුටු වෙයි.

28. හේ මේ ශ්‍රේෂ්ඨ ශීලස්කන්ධයෙන් සමන්විත වූයේ, මෙ ම ඉන්ද්‍රියසංවරයෙන් සමන්විත වූයේ, මෙම ශ්‍රේෂ්ඨ සතිසම්පජඤ්ඤයෙන් සමන්විත වූයේ, මේ ආර්‍ය සන්තුෂ්ටියෙන් ද සමන්විත වූයේ, අරණ්‍ය වෘක්ෂමූල පර්වත කඳුරැලි ගිරිගුහා සොහොන් වනප්‍රස්ථ අභ්‍යවකාශ පිදුරැරැසින් (ගිරිලෙන් පරිද්දෙන්) කළ ගුහා යන මේ ජනයාගෙන් හිස් වූ සෙනස්තක් භජනය කරයි. හේ පසුබත්හි පිණ්ඩපාතයෙන් පෙරළා ආයේ, පලක් බැඳ කය ඇද තැබී සේ පිහිටුවා, සිහිය කමටහන් අරමුණට යොමු කොට තබා හිඳියි.

29. හෙ තෙම ලොව කෙරෙහි අභිධ්‍යාව දුරු කොට, අභිධ්‍යාව පහ වූ සිතින් උපලක්ෂිත වැ වෙසෙයි. අභිධ්‍යාව කෙරෙන් සිත පිරිසිදු කෙරෙයි... ව්‍යාපාද දෙෂය දුරු ලා ව්‍යාපාද රහිත සිතැත්තේ වෙසෙයි... ස්ත්‍යානමිද්ධය දුරු ලා පහ වූ ස්ත්‍යානමිද්ධය ඇත්තේ වෙසෙයි... උද්ධච්චකුක්කුච්ච දෙක දුරු ලා අනුද්ධත වැ වෙසෙයි... විචිකිත්සාව දුරු ලා තරණය කළ විචිකිත්සා ඇත්තේ කුසල් දහමෙහි සැක නැත්තේ වෙසෙයි. විචිකිත්සාව කෙරෙන් සිත පිරිසිදු කෙරෙයි.

ඇවැත්නි, යම්සේ පුරුෂයෙක් ණයක් ගෙන කර්මාන්ත යොදන්නේ ද, ඔහුගේ ඒ කර්මාන්ත සමෘද්ධ වන්නේ ද... හේ ඒ කරුණින් සතුට ලබන්නේ ද, සොම්නසට පැමිණෙන්නේ ද, ඇවැත්නි, යම්සේ පුරුෂයෙක් ගිලන් වූයේ දුඃඛිත වන්නේ ද,... හේ මැත කාලෙක ඒ ගිලන් බැවින් මිදෙන්නේ ද,... හේ ඒ කරුණින් සතුට ලබන්නේ ද, සොම්නසට පැමිණෙන්නේ ද, ඇවැත්නි, යම්සේ පුරුෂයෙක් දඟගෙහි බඳනා ලද්දේ වන්නේ ද, හේ මැත කාලයෙහි ඒ බැඳුමෙන් මිදෙන්නේ ද,... හේ ඒ කරුණින් සතුට ලබන්නේ ද, සොම්නසට පැමිණෙන්නේ ද, ඇවැත්නි, යම්සේ පුරුෂයෙක් තමා අයත් පැවැතුම් තැති දාසයෙක් වන්නේ ද,... හේ මැත කලැ ඒ දාස බැවින් මිදෙන්නේ ද... හේ ඒ කරුණින් සතුට ලබන්නේ ද සොම්නසට පැමිණෙන්නේ ද, ඇවැත්නි, යම්සේ ධනය ඇති භෝග ඇති පුරුෂයෙක් දික් කතරමඟකට බස්නේ ද... හේ පසු කලැ ඒ කතර තරණය කොට එයින් නික්මැ යන්නේ ද, හේ ඒ කරුණින් සතුට ලබන්නේ ද සොම්නසට පැමිණෙන්නේ ද, ඇවැත්නි, එසේ ම මහණ තෙම ණයක් මෙන් ලෙඩක් මෙන් දඟගෙයක් මෙන් දාස බවක් මෙන් දුරු කතරමඟක් මෙන් තමා කෙරෙහි පහ නො වූ මේ නීවරණ පස දකී. ඇවැත්නි, ණය නැති බව යම්සේ ද, අරෝග බව යම්සේ ද, බැඳුමෙන් මිදීම යම්සේ ද, නිවහල් බව යම්සේ ද, උවදුරු නැති බිම යම්සේ ද, එසේ ම මහණ තෙම මේ පඤ්ච නීවරණයන් තමා කෙරෙහි ප්‍රහීණ වූවන් දකී.

30. තස්සිමෙ පඤ්චනීවරණෙ පහීණෙ අත්තනි සමනුපස්සතො පාමොජ්ජං ජායති. පමුදිතස්ස පීති ජායති. පීතිමනස්ස කායො පස්සම්භති. පස්සද්ධකායො සුඛං වෙදෙති. සුඛිනො චිත්තං සමාධියති. සො විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි -පෙ- පඨමං ඣානං උපසම්පජ්ජ විහරති -පෙ- දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. ඉදම්පි'ස්ස හොති චිත්තසම්පදා. අයං ඛො සා කස්සප චිත්තසම්පදා.

31. සො එවං සමාහිතෙ චිත්තෙ -පෙ- ඤාණදස්සනාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති -පෙ- ඉදම්පි'ස්ස හොති පඤ්ඤාසම්පදා. -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාති. ඉදම්පි'ස්ස හොති පඤ්ඤාසම්පදා. අයං ඛො සා කස්සප පඤ්ඤාසම්පදා.

32. ඉමායෙ ච කස්සප සීලසම්පදා ඉමායෙ ච චිත්තසම්පදා ඉමායෙ ච පඤ්ඤාසම්පදා අඤ්ඤා සීලසම්පදා චිත්තසම්පදා පඤ්ඤාසම්පදා උත්තරිතරා වා පණීතතරා වා නත්ථි.

33. සන්ති කස්සප එකෙ සමණබ්‍රාහ්මණා සීලවාදා. තෙ අනෙකපරියායෙන සීලස්ස වණ්ණං භාසන්ති. යාවතා කස්සප අරියං පරමං සීලං, නාහං තත්ථ අත්තනො සමසමං සමනුපස්සාමි. කුතො භියෝ‍යො? අථ ඛො අහමෙව තත්ථ භියෝ‍යො යදිදං අධිසීලං.

34. සන්ති කස්සප එකෙ සමණබ්‍රාහ්මණා තපොජිගුච්ඡාවාදා. තෙ අනෙකපරියායෙන තපොජිගුච්ඡාය වණ්ණං භාසන්ති. යාවතා කස්සප අරියා පරමා තපොජිගුච්ඡා, නාහං තත්ථ අත්තනො සමසමං සමනුපස්සාමි. කුතො භියෝ‍යො? අථ ඛො අහමෙව තත්ථ භියෝ‍යො යදිදං අධිජිගුච්ඡං.

35. සන්ති කස්සප එකෙ සමණබ්‍රාහ්මණා පඤ්ඤාවාදා. තෙ අනෙකපරියායෙන පඤ්ඤාය වණ්ණං භාසන්ති. යාවතා කස්සප අරියා පරමා පඤ්ඤා, නාහං තත්ථ අත්තනො සමසමං සමනුපස්සාමි. කුතො භියෝ‍යො? අථ ඛො අහමෙව තත්ථ භියෝ‍යො යදිදං අධිපඤ්ඤා.

36. සන්ති කස්සප එකෙ සමණබ්‍රාහ්මණා විමුත්තිවාදා. තෙ අනෙකපරියායෙන විමුත්තියා වණ්ණං භාසන්ති. යාවතා කස්සප අරියා පරමා විමුත්ති, නාහං තත්ථ අත්තනො සමසමං සමනුපස්සාමි. කුතො භියෝ‍යො? අථ ඛො අහමෙව තත්ථ භියෝ‍යො යදිදං අධිවිමුත්ති.

30. මේ පඤ්චනීවරණයන් තමා කෙරෙහි ප්‍රහීණ වූවන් දක්නා ඔහුට සතුට උපදී. සතුටු වූවහුට ප්‍රීතිය උපදී. සිතැ ප්‍රීතිය ඇත්තහුගේ කය සංහිඳෙයි. සංහුන් කයැත්තේ සුව විඳී. සුවැත්තහුගේ සිත සමාධිගත වෙයි. ඔහ් කාමයන් කෙරෙන් වෙන් ව ම, අකුසල් දහමුන් කෙරෙන් වෙන් ව ම .. පළමු ධ්‍යාන ලැබ වෙසෙයි... දෙවෙනි ධ්‍යාන ලැබ වෙසෙයි... තෙවෙනි ධ්‍යාන ලැබ වෙසෙයි... සිවුවන ධ්‍යාන ලැබ වෙසෙයි. මේ ඔහුගේ චිත්තසමපත් ය. කාශ්‍යපය, මේ ඒ චිත්තසමපත්තිය යි.

31. හෙතෙම මෙසේ සිත සමාධිගත කල්හි... දර්ශනඥානය පිණිස සිත එළවා තබයි, නැඹුරු කෙරෙයි... මේ ඔහුගේ ප්‍රඥාසමපත් වේ... 'මේ රහත්බව පිණිස කටයුතු වූ අතෙකෙක් නැතැ'යි දැන ගනී. මේ ද ඔහුගේ ප්‍රඥාසමපත් වේ. කාශ්‍යපය, මේ ඒ ප්‍රඥාසමපත්තිය යි.

32. කාශ්‍යපය, මේ ශීලසමපත්තියට, මේ චිත්තසමපත්තියට, මේ ප්‍රඥාසමපත්තියට වඩා උත්තරිතර වූ ප්‍රණීතතර වූ අන් ශීලසමපතෙක්, චිත්තසමපතෙක්, ප්‍රඥාසමපතෙක් නැත.

33. කාශ්‍යපය, ශීලවාදී වූ ඇතැම් මහණබමුණු කෙනෙක් ඇත. ඔහු නොයෙක් කරුණින් ශීලයේ ගුණ කියත්. කාශ්‍යපය, යම් පමණ ආයී වූ (නොකිලිටි) උතුම් ශීලයෙක් ඇද්ද, එහි තමාට සමසම වූ (මගේ ශීලයට සම ශීලයෙන් මා හා සම වූ) කිසිවකු මම් නො දකිමි. වැඩිතරම් එකකු කොයින් දකිම් ද? වැලි මම ම යම් උතුම් ශීලයෙක් වේ නම් එහි හැමට වැඩි තරම් (උතුම්) වෙමි.

34. කාශ්‍යපය, තපොජුගුප්සාවාදී වූ ඇතැම් මහණබමුණු කෙනෙක් ඇත. ඔහු නොයෙක් කරුණින් තපොජුගුප්සාවේ (කෙලෙසුන් තවන කෙලෙස්නට පිළිකුල් කරන වීර්යයේ) ගුණ කියත්. කාශ්‍යපය, යම් පමණ ආයී වූ පරම තපොජුගුප්සාවෙක් වේ ද, එහි මම් තමාට සමසමයකු නො දකිමි. වැඩිතරම් එකකු කොයින් දකිම් ද? වැලිදු යම් අතිජුගුප්සාවෙක් (මාර්ගඵලසම්ප්‍රයුක්ත වීර්යයෙක්) වේ නම් එහි මම ම හැමට වැඩිතරම් වෙමි.

35. කාශ්‍යපය, ප්‍රඥාවාදී වූ ඇතැම් මහණබමුණු කෙනෙක් ඇත. ඔහු නොයෙක් කරුණින් ප්‍රඥාවේ ගුණ කියත්. කාශ්‍යපය, යම් පමණ ආයී වූ පරම ප්‍රඥාවෙක් වේ ද, එහි මම් තමාට සමසමයකු නො දකිමි. වැඩිතරම් එකකු කොයින් දකිම් ද? වැලි දු යම් අතිප්‍රඥාවෙක් (මාර්ගඵලසම්ප්‍රයුක්ත ප්‍රඥාවෙක්) වේ ද මම ම එහි හැමට වැඩිතරම් වෙමි.

36. කාශ්‍යපය, විමුක්තිවාදී වූ ඇතැම් මහණබමුණු කෙනෙක් ඇත. ඔහු නොයෙක් කරුණින් විමුක්තියේ ගුණ කියත්. කාශ්‍යපය, යම් පමණ ආයී වූ පරම විමුක්තියෙක් වේද, එහි මම් තමාට සමසමයකු නො දකිමි. වැඩිතරම් එකකු කොයින් දකිම් ද? වැලි දු යම් අති-විමුක්තියෙක් (සමුච්ඡේද ප්‍රතිප්‍රශ්‍රබ්ධි නිඃසරණ යන ත්‍රිවිධ පරම විමුක්ති-යෙක්) වේ ද එහි මම ම හැමට වැඩිතරම් වෙමි.

37. ඨානං ඛො පනෙතං කස්සප විජ්ජති යං අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං වදෙය්‍යුං: "සීහනාදං ඛො සමණො ගොතමො නදති. තඤ්ච ඛො සුඤ්ඤාගාරෙ නදති නො පරිසාසු"ති. තෙ 'මා හෙවන්ති'ස්සු වචනීයා. "සීහනාදඤ්ච සමණො ගොතමො නදති, පරිසාසු ච නදති"ති එවමිස්සු කස්සප වචනීයා.

38. ඨානං ඛො පනෙතං කස්සප විජ්ජති යං අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං වදෙය්‍යුං: "සීහනාදඤ්ච සමණො ගොතමො නදති, පරිසාසු ච නදති. නො ච ඛො විසාරදෙ නදති"ති. තෙ 'මා හෙවන්ති'ස්සු වචනීයා. "සීහනාදඤ්ච සමණො ගොතමො නදති, පරිසාසු ච නදති, විසාරදෙ ච නදති"ති. එවමිස්සු කස්සප වචනීයා.

39. ඨානං ඛො පනෙතං කස්සප විජ්ජති යං අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං වදෙය්‍යුං: "සීහනාදඤ්ච සමණො ගොතමො නදති, පරිසාසු ච නදති, විසාරදෙ ච නදති, නො ච ඛො නං පඤ්හං පුච්ඡන්ති"ති. තෙ 'මා හෙවන්ති'ස්සු වචනීයා "සීහනාදං ච සමණො ගොතමො නදති. පරිසාසු ච නදති, විසාරදෙ ච නදති, පඤ්හඤ්ච නං පුච්ඡන්ති"ති. එවමස්සු කස්සප වචනීයා.

40. ඨානං ඛො පනෙතං කස්සප විජ්ජති යං අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං වදෙය්‍යුං: "සීහනාදං ච සමණො ගොතමො නදති, පරිසාසු ච නදති, විසාරදෙ ච නදති, පඤ්හං ච නං පුච්ඡන්ති, නො ච ඛො නෙසං පඤ්හං පුට්ඨො ඛ්‍යාකරොති"ති. තෙ 'මා හෙවන්ති'ස්සු වචනීයා. "සීහනාදඤ්ච සමණො ගොතමො නදති, පරිසාසු ච නදති, විසාරදෙ ච නදති, පඤ්හං ච නං පුච්ඡන්ති. පඤ්හඤ්ච නෙසං පුට්ඨො ඛ්‍යාකරොති"ති. එවමස්සු කස්සප වචනීයා.

41. ඨානං ඛො පනෙතං කස්සප විජ්ජති යං අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං වදෙය්‍යුං: "සීහනාදඤ්ච සමණො ගොතමො නදති, පරිසාසු ච නදති -පෙ- පඤ්හඤ්ච නෙසං පුට්ඨො ඛ්‍යාකරොති, නො ච ඛො පඤ්හස්ස වෙය්‍යාකරණෙන චිත්තං ආරාධෙති"ති. තෙ 'මා හෙවන්ති'ස්සු වචනීයා. "සීහනාදං ච සමණො ගොතමො නදති, -පෙ- පඤ්හස්ස ච වෙය්‍යාකරණෙන චිත්තං ආරාධෙති"ති, එවමස්සු කස්සප වචනීයා.

42. ඨානං ඛො පනෙතං කස්සප විජ්ජති යං අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං වදෙය්‍යුං: "සීහනාදඤ්ච සමණො ගොතමො නදති. පරිසාසු ච නදති -පෙ- පඤ්හස්ස ච වෙය්‍යාකරණෙන චිත්තං ආරාධෙති, නො ච ඛො සොතබ්බං මඤ්ඤතී"ති. තෙ 'මා හෙවන්ති'ස්සු වචනීයා: "සීහ-නාදඤ්ච සමණො ගොතමො නදති -පෙ- පඤ්හස්ස ච වෙය්‍යාකරණෙන චිත්තං ආරාධෙති. සොතබ්බඤ්චස්ස මඤ්ඤතී"ති. එවමස්සු කස්සප වචනීයා.

37. කාශ්‍යපය, "මහණ ගොයුම් වනාහි සිහනාද ද කෙරෙයි. එ ද වනාහි පිරිස්හි නො ව ශූන්‍යාගාරයෙක (හිස් ගෙයෙක හුදෙකලා වැ හිඳ) කෙරේ යැ"යි අන් තොටු පිරිවැජ්ජෝ මෙසේ කියන්නාහ" යන යමෙක් ඇද්ද, ඒ කාරණය විද්‍යමාන ම ය. "එසේ නො කියැ යුතු යැ"යි ඔහු කියැ යුතු වන්නාහ. "මහණ ගොයුම් සිංහනාද ද කෙරෙයි. එ ද පිරිස්හි කෙරේ" යැ යි කාශ්‍යපය, ඔහු මෙසේ කියැ යුතු වන්නාහ. (ඔවුනට මෙසේ කියැ යුතු).

38. කාශ්‍යපය, "මහණ ගොයුම් සිංහනාද ද කෙරෙයි. එ ද පිරිස්හි කෙරෙයි. එහෙත් විශාරද ව නො කෙරේ" යැ යි අන්තොටු පිරිවැජ්ජෝ මෙසේ කියන්නාහ" යන මේ කාරණය විද්‍යමාන ම ය. "එසේ නො කියැ යුතු" යැ යි ඔහු කියැ යුතු වන්නාහ. "මහණ ගොයුම් සිංහනාදත් කෙරේ. එ ද පිරිස්හි කෙරේ. විශාරද ව ද කෙරේ" යැ යි, කාශ්‍යපය, ඔහු මෙසේ කියැ යුතු වන්නාහ.

39. කාශ්‍යපය, "මහණ ගොයුම් සිංහනාද ද කෙරෙයි. එ ද පිරිස්හි කෙරෙයි. විශාරද ව ද කෙරෙයි. එහෙත් අන්හු ඔහු පැණ නො විචාරති"යි මෙසේ අන්තොටු පිරිවැජ්ජෝ කියන්නාහ" යන යමෙක් ඇද්ද, මේ කාරණය විද්‍යමාන ම ය. ඔහු "එසේ නොකියැ යුතු" යැ යි කියැ යුතු වන්නාහ. මහණ ගොයුම් සිංහනාද ද කෙරෙයි. පිරිස්හි ද එය කෙරෙයි. විශාරද ව ද කෙරෙයි. ප්‍රශ්න ද (ඔබෙන්) විචාරත් යැ යි මෙසේ ඔහු කියැ යුතු වන්නාහ.

40. කාශ්‍යපය, "මහණ ගොයුම් සිංහනාද ද කෙරෙයි. එය පිරිස්හි ද කෙරෙයි. විශාරද ව ද කෙරෙයි. ප්‍රශ්න ද ඔහු විචාරත්. එහෙත් ඔවුන්ගේ ප්‍රශ්න විචාරන ලද්දේ නො විසඳ යැ යි අන්තොටු පිරිවැජ්ජෝ මෙසේ කියන්නාහ" යන යමෙක් ඇද්ද, ඒ කාරණය විද්‍යමාන ම ය. "එසේ නො කියැ" යුතු යැ යි ඔහු කියැ යුතු වන්නාහ. "මහණ ගොයුම් සිංහ-නාද ද කෙරෙයි. එය පිරිස්හි ද කෙරෙයි. විශාරද ව ද කෙරෙයි. ප්‍රශ්න ද ඔහු විචාරත්. ඔහු විසින් පැණ විචාරන ලද්දේ විසඳ" යැ යි කාශ්‍යපය, මෙසේ ඔහු කියැ යුතු වන්නාහ.

41. කාශ්‍යපය, "මහණ ගොයුම් සිංහනාද ද කෙරෙයි. එය පිරිස්හි ද කෙරෙයි... ප්‍රශ්න ද ඔවුන් විසින් විචාරන ලදුයේ විසඳයි. එහෙත් පැණ විසැඳීමෙන් ඔවුන් සිත් නො ම ගනී යැයි මෙසේ අන්තොටු පිරිවැජ්ජෝ කියන්නාහු ය" යන යමෙක් ඇද්ද, මේ කරුණ විද්‍යමාන ය, "එසේ නො කියැ යුතු" යැ යි ඔහු කියැ යුතු වන්නාහ. "මහණ ගොයුම් සිංහනාද ද කෙරෙයි .. පැණ ද විසැඳීමෙන් ඔවුන් සිත් ගනී" යැ යි කාශ්‍යපය, මෙසේ කියැ යුතු වන්නාහ.

42. කාශ්‍යපය, "මහණ ගොයුම් සිංහනාද ද කෙරෙයි. එ ද පිරිස්හි කෙරෙයි... පැණ විසැඳීමෙන් ඔවුන්ගේ සිත් ද ගනී. එහෙත් අන්හු ඔහු බස් ඇසිය යුතු කොට නො සිතත්" යැ යි මෙසේ අන්තොටු පිරිවැජ්ජෝ කියන්නාහ" යන යමෙක් ඇද්ද, මේ කරුණ විද්‍යමාන ය. "එසේ නො කියැ යුතු" යැ යි ඔහු කියැ යුතු වන්නාහ. "මහණ ගොයුම් සිංහනාද ද කෙරෙයි... පැණ විසඳීමෙන් සිත් ද ගනී. ඔහු බස් ඇසිය යුතු කොට අන්හු ද සිතත්" යැ යි මෙසේ ඔහු කියැ යුතු වන්නාහ.

43. ඨානං ඛො පනෙතං කස්සප විජ්ජති යං අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං වදෙය්‍යුං: "සීහනාදඤ්ච සමණො ගොතමො නදති, පරිසාසු ච නදති -පෙ- සොතබ්බඤ්චස්ස මඤ්ඤතෙ. නො ච ඛො සුත්වා වස්ස පසීදන්ති"ති. තෙ 'මා හෙවන්ති'ස්සු වචනීයා. "සීහනාදඤ්ච සමණො ගොතමො නදති -පෙ- සොතබ්බඤ්චස්ස මඤ්ඤතෙ. සුත්වා වස්ස පසීදන්ති"ති එවමස්සු කස්සප වචනීයා.

44. ඨානං ඛො පනෙතං කස්සප විජ්ජති යං අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං වදෙය්‍යුං: "සීහනාදඤ්ච සමණො ගොතමො නදති, පරිසාසු ච නදති -පෙ- සුත්වා වස්ස පසීදන්ති, නො ච ඛො පස්සන්නා පස්සන්නාකාරං කරොන්ති"ති. තෙ 'මා හෙවන්ති'ස්සු වචනීයා. "සීහනාදං ච සමණො ගොතමො නදති -පෙ- සුත්වා වස්ස පසීදති, පස්සන්නා ච පස්සන්නාකාරං කරොන්ති" ති එවමස්සු කස්සප වචනීයා.

45. ඨානං ඛො පනෙතං කස්සප විජ්ජති යං අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං වදෙය්‍යුං: "සීහනාදං ච සමණො ගොතමො නදති, පරිසාසු ච නදති -පෙ- පස්සන්නා ච පස්සන්නාකාරං කරොති නො ච ඛො තථත්තාය පටිපජ්ජන්ති"ති. තෙ 'මා හෙවන්ති'ස්සු වචනීයා. "සීහනාදං ච සමණො ගොතමො නදති -පෙ- පස්සන්නා ච පස්සන්නාකාරං කරොන්ති. තථත්තාය ච පටිපජ්ජන්ති"ති එවමස්සු කස්සප වචනීයා.

46. ඨානං ඛො පනෙතං කස්සප විජ්ජති යං අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං වදෙය්‍යුං: "සීහනාදං ච සමණො ගොතමො නදති -පෙ- තථත්තාය ච පටිපජ්ජන්ති, නො ච ඛො පටිපන්නා ආරාධෙන්ති"ති. තෙ 'මා හෙවන්ති'ස්සු වචනීයා. "සීහනාදඤ්ච සමණො ගොතමො නදති, පරිසාසු ච නදති, විසාරදෙ ච නදති, පඤ්හඤ්ච තං පුච්ඡන්ති, පඤ්හඤ්ච නෙසං පුට්ඨො ව්‍යාකරොති, පඤ්හස්ස ච වෙය්‍යාකරණෙන චිත්තං ආරාධෙති, සොතබ්බඤ්චස්ස මඤ්ඤන්ති, සුත්වා වස්ස පසීදන්ති, පස්සන්නා ච පස්සන්නාකාරං කරොන්ති, තථත්තාය ච පටිපජ්ජන්ති පටිපන්නා ච ආරාධෙන්ති"ති එවමස්සු කස්සප වචනීයා

47. එකමිදාහං කස්සප සමයං රාජගහෙ විහරාමි ගිජ්ඣකූටෙ පබ්බතෙ. තත්‍ර මං අඤ්ඤතරො තපස්සිගම්භීරී නිග්‍රොධො නාම අධිජෙගුවෙජ පඤ්හං පුච්ඡි. තස්සාහං අධිජෙගුවෙජ පඤ්හං පුට්ඨො ව්‍යාකාසිං. ව්‍යාකතො ච පන මෙ අත්තමනො අහොසි පරං විය මත්තායාති.

43. කාශ්‍යපය, "මහණ ගොයුම් සිංහනාද ද කෙරෙයි. පිරිස්හි ද නද දෙයි... ඔහු බස් ඇසියැ යුතු කොට අන්හු ද සිතත්. එහෙත් ඔහු බස් අසා අන්හු නො පහදිත්" යැ යි අන්තොටු පිරිවැජියෝ මෙසේ කියන්නාහ, යන යමෙක් ඇද්ද, මේ කාරණය විද්‍යමාන ය. "එසේ නො කියැ යුතු" යැ යි ඔහු කියැ යුතු වන්නාහ. මහණ ගොයුම් සිංහනාද ද කෙරෙයි... අන්හු ද ඔහු බස් ඇසියැ යුතු කොට සිතත්. ඔහු බස් අසා ද පහදිති"යි. කාශ්‍යපය, මෙසේ ඔහු කියැ යුතු වන්නාහ.

44. කාශ්‍යපය, "මහණ ගොයුම් සිංහනාද ද කෙරෙයි. පිරිස්හි ද නද දෙයි... ඔහු බස් අසා ද පහදිත්. එහෙත් පැහැදුණෝ පැහැදුණු අයුරක් නො කෙරෙත් යැ යි මෙසේ අන්තොටු පිරිවැජියෝ කියන්නාහ" යන යමෙක් ඇද්ද, මේ කාරණය විද්‍යමාන ය. "එසේ නො කියැ යුතු" යැ යි ඔහු කියැ යුතු වන්නාහ "මහණ ගොයුම් සිංහනාද ද කෙරෙයි... ඔහු බස් අසා ද පහදිත්. පැහැදුණාහු ද පැහැදුණු අයුරක් කෙරෙත් යැ" යි කාශ්‍යපය, ඔහු මෙසේ කියැ යුතු වන්නාහ.

45. කාශ්‍යපය, "මහණ ගොයුම් සිංහනාද ද කෙරෙයි. පිරිස්හි ද නාද කෙරෙයි... පැහැදුණාහු ද පැහැදුණු අයුරක් කෙරෙත්. එහෙත් තථාභාවය පිණිස (ධර්මානුධර්මප්‍රතිපත්ති පුරනු පිණිස) නො ම පිළිපදිත් යැ යි අන්තොටු පිරිවැජියෝ මෙසේ කියන්නාහු" යන යමෙක් ඇද්ද මේ කාරණය විද්‍යමාන ය. "එසේ නො කියැ යුතු" යැ යි ඔහු කියැ යුතු වන්නාහ "මහණ ගොයුම් සිංහනාද ද කෙරෙයි... පැහැදුණෝ ද පැහැදුණු අයුරක් කෙරෙත්. ධර්මානුධර්මප්‍රතිපත්ති පුරනු පිණිස ද පිළිපදිතැ"යි කාශ්‍යපය, ඔහු මෙසේ කියැ යුතු වන්නාහ.

46. කාශ්‍යපය, "මහණ ගොයුම් සිංහනාද ද කෙරෙයි... ධර්මානුධර්ම-ප්‍රතිපත්ති පුරනු පිණිස ද පිළිපදිත්. එසේ පිළිපන්නෝ ද (එයින් ඒ ගොයුම්හුගේ) සිත් නො ගතිත්" යැ යි මෙසේ අන්තොටු පිරිවැජියෝ කියන්නාහ" යන යමෙක් ඇද්ද, කාශ්‍යපය, මේ කාරණය විද්‍යමාන ය. "එසේ නො කියැ යුතු" යැ යි ඔහු කියැ යුතු වන්නාහ. "මහණ ගොයුම් සිංහනාද ද කෙරෙයි. පිරිස්හි ද නාද කෙරෙයි. විශාරද ව ද නාද කෙරෙයි. අන්හු ප්‍රශ්න ද ඔහු පුළුවුසිත්. ඔවුන් විසින් පුළුවුස්නා ලද්දේ ප්‍රශ්න ද විසැඳීමෙන් ඔවුන් සිත් ගනී. ඔහු ද ඒ මහණ ගොයුම් බස් ඇසිය යුතු කොට ද සිතත්. ඔහු බස් අසා ද පහදිත්. පැහැදුණාහු ද පැහැදුණු අයුරක් කෙරෙත්. තථාභාවය පිණිස (ධර්මානුධර්ම ප්‍රතිපත්ති පුරනු පිණිස) ද පිළිපදිත්. (එසේ) පිළිපන්නාහු ද ඒ මහණ ගොයුම්හු සිත් ගතිත් යැ" යි කාශ්‍යපය, ඔහු මෙසේ කියැ යුතු වන්නාහ.

47. කාශ්‍යපය, මම් එක් සමයෙක රජගහ නුවර ගිජ්ඣකූට පර්වතයෙහි වෙසෙමි. එ සමයෙහි ඤාණශ්‍රොඩ නම් එක්තරා තපොබ්‍රහ්මචාරී (උතුම් තපස් කරන) පිරිවැජියෙක් අධිජ්ගුප්සායෙහි පැණයක් මා විචාළේ ය. අධිජ්ගුප්සායෙහි පැණ විචාරන ලද මම් ඔහුට එය විසඳ කීයෙමි. මා විසින් එසේ විසඳන ලද කල්හි ගේ ඉතා මහත් සේ සතුටු විය.

48 "කො හි භන්තෙ භගවතො ධම්මං සුත්වා න අත්තමනො අස්ස පරං විය මත්තායා? අහම්පි භන්තෙ භගවතො ධම්මං සුත්වා අත්තමනො පරං විය මත්තායා. අභික්කන්තං භන්තෙ, අභික්කන්තං භන්තෙ. සෙය්‍යථාපි භන්තෙ නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛන්තීති, එවමෙව භගවතා අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භන්තෙ භගවන්තං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. ලභෙය්‍යාහං භන්තෙ භගවතො සන්තිකෙ පබ්බජ්ජං, ලභෙය්‍යං උපසම්පදන්ති".

49. "යො ඛො කස්සප අඤ්ඤතිත්ථියපුබ්බො ඉමස්මිං ධම්මවිනයෙ ආකඞ්ඛති පබ්බජ්ජං, ආකඞ්ඛති උපසම්පදං, සො චත්තාරො මාසෙ පරිවසති. චතුන්නං මාසානං අච්චයෙන ආරද්ධචිත්තා භික්ඛූ තං පබ්බාජෙන්ති, උපසම්පාදෙන්ති භික්ඛුභාවාය. අපි ච මෙත්ථ පුග්ගලවෙමත්තතා විදිතා"ති.

50. "සචෙ භන්තෙ අඤ්ඤතිත්ථියපුබ්බා ඉමස්මිං ධම්මවිනයෙ ආකඞ්ඛන්තා පබ්බජ්ජං ආකඞ්ඛන්තා උපසම්පදං චත්තාරො මාසෙ පරිවසන්ති, චතුන්නං මාසානං අච්චයෙන ආරද්ධචිත්තා භික්ඛූ තං පබ්බාජෙන්ති, උපසම්පාදෙන්ති භික්ඛුභාවාය. අහං චත්තාරි වස්සානි පරිවසිස්සාමි. චතුන්නං වස්සානං අච්චයෙන ආරද්ධචිත්තා භික්ඛූ මං පබ්බාජෙන්තු, උපසම්පාදෙන්තු භික්ඛුභාවායා"ති.

51. අලත්ථ ඛො අචෙලො කස්සපො භගවතො සන්තිකෙ පබ්බජ්ජං අලත්ථුපසම්පදං. අචිරූපසම්පන්නො ඛො පනායස්මා කස්සපො එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො, න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි. "ඛීණා ජාති. වුසිතං බ්‍රහ්මචරියං. කතං කරණීයං. නාපරං ඉත්ථත්තායා"ති අබ්භඤ්ඤාසි.

අඤ්ඤතරො ච ඛො පනායස්මා කස්සපො අරහතං අහොසීති.

සීහනාදසුත්තං නිට්ඨිතං අට්ඨමං.

48. (එවිට අචෙලකාශ්‍යප මෙය කීය:) "වහන්ස, කවරෙක් නම් භාග්‍යවතුන් වහන්සේගේ දහම් අසා ඉතා මහත් සේ සතුටු නො වන්නේ ද, වහන්ස, දෙශනාව අභිඤානතය. වහන්ස, යම්සේ යටිකුරු කොට තැබූවක් උඩුකුරු කරන්නේ ද, පිළිසන් දැයක් හෝ විවෘත කරන්නේ ද, මංමුලා වූවකුට මඟ කියන්නේ ද, ඇස් ඇතියෝ රූප දක්නාහ යි අඳුරෙහි තෙල් පහනක් දරන්නේ ද, එ පරිද්දෙන් ම භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් කරුණින් දහම් පැවසිණ. වහන්ස, ඒ මම භාග්‍යවතුන් වහන්සේ ද ධර්මය ද භික්ෂුසඞ්ඝයා ද සරණ යෙමි. වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි පැවිද්ද ලබමි වා. උපසපුව ලබමි වා".

49. "කාශ්‍යපය, පෙරැ අන්තොටු වූ යමෙක් මෙ සස්නෙහි පැවිද්ද කැමැත්තේ නම්, උපසපුව කැමැත්තේ නම්, ඒ සිවු මසක් පිරිවෙස් වසයි. සිවු මස ඇවැමෙන් ආරාධිත සිතැති භික්ෂූහු ඔහු පැවිදි කෙරෙත්. භික්ෂුභාවය පිණිස උපසපන් කෙරෙත්. එහෙත් මෙහි මා විසින් පුද්ගලකාතාත්වය දත්තා ලදැ"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

50. එවිට පිරිවැජි තෙම "වහන්ස, ඉදින් පෙර අන්තොටු වූවෝ මෙ සස්නැ පැවිද්ද කැමැති වන්නාහු උපසපුව කැමැති වන්නාහු සිවු මසක් පිරිවෙස් වසත් නම්, සිවු මස ඇවැමෙන් ආරාධිත සිත් ඇති භික්ෂූහු ඔහු පැවිදි කෙරෙත් නම්, භික්ෂු බව පිණිස උපසපන් කෙරෙත් නම්, මම සිවු වසක් පිරිවෙස් වසන්නෙමි. සිවු වස ඇවැමෙන් සතුටු වූ සිතැති භික්ෂූහු මා පැවිදි කෙරෙත් වා. භික්ෂුභාවය පිණිස මා උපසපන් කෙරෙත් වා"යි කී ය.

51. අචෙලකාශ්‍යප තෙම භාග්‍යවතුන් වහන්සේ වෙතැ පැවිද්ද ලදුයේ ම ය, උපසපුව ද ලදුයේ ම ය. ආයුෂ්මත් කාශ්‍යප තෙමේ උපසපන් වූ නොබෝ කල් ඇතියේ ම හුදෙකලා වූයේ, විවික්ත වූයේ, නොපමා වූයේ, කෙලෙස් තවන වැර ඇතියේ, නිවන් කරා මෙහෙයූ සිතැති ව වසනුයේ, යමක් සඳහා කුලපුත්‍රයෝ මොනොවට ම ගිහිගෙන් නික්මැ සසුන් වදිත් ද, ඒ නිරුත්තර වූ බ්‍රහ්මචර්‍යාවසානය (රහත් පලය) නොබෝ කලෙකින් ම මෙ අත්බවහි ම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන, පසක් කොට, පැමිණ (ලැබ) විසී ය. (එසේ වසනුයේ) "භවොත්පත්තිය ක්ෂීණ විය, බ්‍රහ්මචර්‍යය වැසැ නිමැවිණ, එය සඳහා කටයුතු දැ කරන ලද, මෙ රහත්බව් පිණිස තවත් කටයුතු දැයෙක් නැතැ"යි (පස්වකුම් නුවණින්) දැනැ ගත්තේ ය.

ආයුෂ්මත් කාශ්‍යපයෝ රහතුන් අතුරෙහි එක්තරා කෙනෙක් වූහ.

අට වන සිංහනාදසූත්‍රය නිමියේ ය.

9. පොට්ඨපාදසුත්තං

1. එවං මේ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන පොට්ඨපාදො පරිබ්බාජකො සමයප්පවාදකෙ තින්දුකාචීරෙ එකසාලකෙ මල්ලිකාය ආරාමෙ පටිවසති මහතියා පරිබ්බාජකපරිසාය සද්ධිං තිංසමත්තෙහි පරිබ්බාජකසතෙහි.

2. අථ ඛො භගවා පුබ්බන්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සාවත්ථිං පිණ්ඩාය පාවිසි. අථ ඛො භගවතො එතදහොසි: අතිප්පගො ඛො තාව සාවත්ථියං පිණ්ඩාය චරිතුං, යන්නූනාහං යෙන සමයප්පවාදකො තින්දුකාචීරෙ එකසාලකො මල්ලිකාය ආරාමො, යෙන පොට්ඨපාදො පරිබ්බාජකො, තෙනුපසඞ්කමෙය්යන්ති. අථ ඛො භගවා යෙන සමයප්පවාදකො තින්දුකාචීරෙ එකසාලකො මල්ලිකාය ආරාමො තෙනුපසඞ්කමි.

3. තෙන ඛො පන සමයෙන පොට්ඨපාදො පරිබ්බාජකො මහතියා පරිබ්බාජකපරිසාය සද්ධිං නිසින්නො හොති උන්නාදිනියා උච්චාසද්දමහාසද්දාය අනෙකවිහිතං තිරච්ඡානකථං කථෙන්තියා – සෙය්යථීදං: රාජකථං චොරකථං මහාමත්තකථං සෙනාකථං භයකථං යුද්ධකථං අන්නකථං පානකථං වත්ථකථං සයනකථං ගන්ධකථං මාලාකථං ඤාතිකථං යානකථං ගාමකථං නිගමකථං නගරකථං ජනපදකථං ඉත්ථිකථං පුරිසකථං සූරකථං විසිඛාකථං කුම්භට්ඨානකථං පුබ්බපෙතකථං නානත්තකථං ලොකක්ඛායිකං සමුද්දක්ඛායිකං ඉතිභවාභවකථං, ඉති වා'ති.

4. අද්දසා ඛො පොට්ඨපාදො පරිබ්බාජකො භගවන්තං දූරතො'ව ආගච්ඡන්තං. දිස්වාන සකං පරිසං සණ්ඨපෙසි:[1] "අප්පසද්දා භොන්තො භොන්තො. මා භොන්තො සද්දමකත්ථ. අයං සමණො ගොතමො ආගච්ඡති. අප්පසද්දකාමො ඛො සො භගවා, අප්පසද්දස්ස වණ්ණවාදී. අප්පපච්චයං අප්පසද්දං පරිසං විදිත්වා උපසඞ්කමිතබ්බං මඤ්ඤෙය්ය"ති. එවං වුත්තෙ තෙ පරිබ්බාජකා තුණ්හී අහෙසුං. අථ ඛො භගවා යෙන පොට්ඨපාදො පරිබ්බාජකො තෙනුපසඞ්කමි. අථ ඛො පොට්ඨපාදො පරිබ්බාජකො භගවන්තං එතදවොච: එතු ඛො භන්තෙ භගවා. ස්වාගතං[2] භන්තෙ භගවතො. චිරස්සං ඛො භන්තෙ භගවා ඉමං පරියායමකාසි යදිදං ඉධාගමනාය. නිසීදතු භන්තෙ භගවා. ඉදමාසනං පඤ්ඤත්තන්ති. නිසීදි භගවා පඤ්ඤත්තෙ ආසනෙ. පොට්ඨපාදො'පි ඛො පරිබ්බාජකො අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො පොට්ඨපාදං පරිබ්බාජකං භගවා එතදවොච: "කාය නු'ත්ථ පොට්ඨපාද එතරහි කථාය සන්නිසින්නා? කා ච පන වො අන්තරා කථා විප්පකතා?"ති.

---

1. සණ්ඨාපෙසි, PTS. 2. සාගතං, PTS

9. පොට්ඨපාද සූත්‍රය

1 මා විසින් මෙසේ අසන ලදි: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර දෙවිරම් නම් වූ අනේපිඬුසිටුහු අරමැ වැඩ වසන සේක. එ සමයෙහි පොට්ඨපාද නම් පිරිවැජි තෙම, (බමුණුනිවටු ආදීන් රැස් වැ තමතමන් සමය පවසන හෙයින්) සමයප්‍රවාදක නම් වූ (තිඹිරිරුක්පෙලින් පිරිකෙවුණු හෙයින්) තිඳුකාමීර නම් වූ (පළමු එක් හලක් ම වූ තැන බැවින්) එකශාලක නම් වූ, මල්ලිකා දෙවියගේ උයනෙහි, පිරිවැජියන් තුන්දහසක් පමණ වූ මහ පිරිවැජි පිරිසක් හා වෙසෙයි.

2. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ පෙරවරු වේලෙහි හැඳැ පෙරෙවැ පිඬු පිණිස සැවැත් නුවර පිවිසි සේක. එ විටැ "සැවැතෙහි පිඬු පිණිස හැසිරෙනුවට තව මැ ඉතා උදසන යැ. ඉදින් මම් සමයප්‍රවාදක තිඳුකාමීර එකශාලක නම් වූ මල්ලිකාරාමය කරා, පොට්ඨපාද පිරිවැජි වෙත යියෙම් නම් යෙහෙකැ"යි භාග්‍යවතුන් වහන්සේට මේ සිත විය. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ... ඒ මල්ලිකාරාමය කරා වැඩි සේක.

3. එ සමයෙහි පොට්ඨපාද පිරිවැජි තෙම – රාජකථා චෝරකථා මහාමාත්‍රකථා සෙනාකථා භයකථා යුද්ධකථා අන්නකථා පානකථා වස්ත්‍රකථා ශයනකථා ගන්ධකථා මාලාකථා ඥාතිකථා යානකථා ග්‍රාමකථා නිගමකථා නගරකථා ජනපදකථා ස්ත්‍රීකථා පුරුෂකථා ශූරකථා විසිඛාකථා කුම්භට්ඨානකථා පූර්වප්‍රේතකථා ලෝකාඛ්‍යායිකා සමුද්‍රාඛ්‍යායිකා ඉතිභවා–භවකථා යන මේ හෝ මෙයින් අන්‍ය වූ මෙබඳු නොමයක් වැදැරුම් තිරිසන්කථා කියන, ඝෝෂවත් වූ, උස් හඬ ඕහඬ ඇති මහපිරිවැජි–පිරිස සහ හුන්නේ වෙයි.

4. පොට්ඨපාද පිරිවැජි තෙම දුරින් ම වඩනා භාග්‍යවතුන් වහන්සේ දුටුයේ ය. දැක, "භවත්හු නිහඬ වෙත් වා. භවත්නි, හඬ නො කරවු. මේ ඔහණ ගොයුම් එයි. ඒ ආයුෂ්මත් තෙම නිහඬබව කැමැත්තේ ය. නිහඬබවිහි ගුණ කියන පුලු ය. පිරිස නිහඬ සේ දැන එළැඹියැ යුතු කොට සිතුවොත් යෙහෙකැ"යි සිය පිරිස සංහුන් කෙළේ ය. මෙසේ ඔහු කී කලැ ඒ පිරිවැජියෝ නිහඬ වූහ. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ පොට්ඨපාද පිරිවැජියා කරා එළැඹි සේක. එ කල්හි පොට්ඨපාද පිරිවැජි තෙම භාග්‍යවතුන් වහන්සේට, "වහන්ස, භාග්‍යවතුන් වහන්සේ වඩනා සේක් වා. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ වැඩි සේ යහපත. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මෙහි වඩනට කාලකින් පසු මේ අවසථාව ලත් සේක් වත. වහන්ස, භාග්‍යවතුන් වහන්සේගේ ශුභාගමනයෙකි. මේ අස්තෙක් පනවන ලදැ"යි කී ය. පනවන ලද අස්තෙහි භාග්‍යවතුන් වහන්සේ වැඩ හුන් සේක. පොට්ඨපාද පිරිවැජි ද එක්තරා මිටි අස්තක් ගෙන එක් පසෙක හුන්නේ ය. එක් පසෙක හුන් පොට්ඨපාද පිරිවැජියාව "පොට්ඨපාදයිනි, මෙහි දැන් තෙපි කවර නම් කථායෙකින් හුන්නහු ද? මා එන්නාට පෙර මා එන තෙක් මේ අතර තොපගේ කිනම් කථාවෙක් අඩාළ වි ද?"යි අසාවදාළ සේක.

5. එවං වුත්තෙ පොට්ඨපාදො පරිබ්බාජකො භගවන්තං එතදවොච: තිට්ඨතෙසා භන්තෙ කථා, යාය මයං එතරහි කථාය සන්නිසින්නා. නෙසා භන්තෙ කථා භගවතො දුල්ලභා භවිස්සති පච්ඡාපි සවණාය. පුරිමානි භන්තෙ දිවසානි පුරිමතරානි නානාතිත්ථියානං සමණබ්‍රාහ්මණානං කුතූහලසාලාය සන්නිසින්නානං සන්නිපතිතානං අභිසඤ්ඤානිරොධෙ කථා උදපාදි "කථං නු ඛො හො අභිසඤ්ඤානිරොධො හොති?"ති.

(1) තත්‍රෙකච්චෙ එවමාහංසු: "අහෙතු අප්පච්චයා පුරිසස්ස සඤ්ඤා උප්පජ්ජන්ති'පි නිරුජ්ඣන්ති'පි. යස්මිං සමයෙ උප්පජ්ජන්ති, සඤ්ඤී තස්මිං සමයෙ හොති. යස්මිං සමයෙ නිරුජ්ඣන්ති, අසඤ්ඤී තස්මිං සමයෙ හොති"ති ඉත්ථෙකෙ අභිසඤ්ඤානිරොධං පඤ්ඤපෙන්ති.

(2) තම්පෙකෙ එවමාහ: "න ඛො පන මෙ'තං හො එවං භවිස්සති. සඤ්ඤා හි හො පුරිසස්ස අත්තා, සා ච ඛො උපෙති'පි අපෙති'පි. යස්මිං සමයෙ උපෙති, සඤ්ඤී තස්මිං සමයෙ හොති. යස්මිං සමයෙ අපෙති, අසඤ්ඤී තස්මිං සමයෙ හොති"ති ඉත්ථෙකෙ අභිසඤ්ඤානිරොධං පඤ්ඤපෙන්ති.

(3) තම්පෙකෙ එවමාහ: "න ඛො පන මෙ'තං හො එවං භවිස්සති. සන්ති හි හො සමණබ්‍රාහ්මණා මහිද්ධිකා මහානුභාවා. තෙ ඉමස්ස පුරිසස්ස සඤ්ඤං උපකඩ්ඪන්ති'පි අපකඩ්ඪන්ති'පි. යස්මිං සමයෙ උපකඩ්ඪන්ති, සඤ්ඤී තස්මිං සමයෙ හොති. යස්මිං සමයෙ අපකඩ්ඪන්ති, අසඤ්ඤී තස්මිං සමයෙ හොති"ති ඉත්ථෙකෙ අභිසඤ්ඤානිරොධං පඤ්ඤපෙන්ති.

(4) තම්පෙකෙ එවමාහ: "න ඛො පන මෙ'තං හො එවං භවිස්සති. සන්ති හි හො දෙවතා[3] මහිද්ධිකා මහානුභාවා. තා ඉමස්ස පුරිසස්ස සඤ්ඤං උපකඩ්ඪන්ති'පි අපකඩ්ඪන්ති'පි. යස්මිං සමයෙ උපකඩ්ඪන්ති, සඤ්ඤී තස්මිං සමයෙ හොති. යස්මිං සමයෙ අපකඩ්ඪන්ති, අසඤ්ඤී තස්මිං සමයෙ හොති"ති ඉත්ථෙකෙ අභිසඤ්ඤානිරොධං පඤ්ඤපෙන්ති.

6. තස්ස මය්හං භන්තෙ භගවන්තං යෙව ආරබ්භ සති උදපාදි: 'අහො නූන භගවා, අහො නූන සුගතො, යො ඉමෙසං ධම්මානං සුකුසලො'ති. භගවා භන්තෙ කුසලො භගවා පඤ්චසඤ්ඤී අභිසඤ්ඤානිරොධස්ස. කථං නු ඛො භන්තෙ අභිසඤ්ඤානිරොධො හොති?"ති.

---

1. පඤ්ඤපෙන්ති, PTS. 2. න ඛො පනාමෙතං, PTS.
3. දෙවා, ස්‍යාම. 4. තෙ, ස්‍යාම.

5. මෙසේ වදාළ කලෑ පොට්ඨපාද පිරිවැජි භාග්‍යවතුන් වහන්සේට මෙය කී ය: "වහන්ස, යම් කථාවෙකින් අපි මෙහි හුන්නමෝ නම්, ඒ කථාව තිබේවා. වහන්ස, ඒ කථාව පසු ව ද භාග්‍යවතුන් වහන්සේට අසන්නට දුලභ නො වෙයි. පුරිම පුරිමතර දවස්හි (බොහෝ කලකට පෙරැ) කුතූහලශාලාවෙහි එක් වැ හුන් එක් රැස් වූ මහණ බමුණන් අතරැ "භවත්නි, අභිසංඥානිරෝධය (විත්තනිරෝධය, ක්ෂණිකනිරෝධය) කෙසේ නම් වේ ද?"යි අභිසංඥානිරෝධයෙහි කථාවෙක් පහළ විය.

(1) එහි ඇතැම්හු "හෙතු කැති වැ ප්‍රත්‍යය නැති වැ පුරිස්හට සංඥාවෝ උපදනාහු ද නිරුද්ධ වන්නාහු ද වෙත්. යම් විටෙක ඔහු උපදනාහු ද, එ විටැ හේ සංඥී (සංඥා ඇත්තේ) වෙයි. යම් විටෙක සංඥාවෝ නිරුද්ධ වන්නාහු ද, එ විටැ හේ අසංඥී වේ" යැ යි මෙසේ කීහ. මෙසේ ඇතැම් කෙනෙක් අභිසංඥානිරෝධය (විත්තනිරෝධය) පණවත්.

(2) ඔහුට අනෙකෙක්, "භවත, මට මෙය මෙසේ නො වන්නේ ය. (මගේ දැනීම මෙසේ නො වන්නේ ය.) භවත, සංඥාව පුරුෂයාගේ ආත්මය ය. එ ද එළැඹෙන්නේත් වෙයි. ඉවැත් වැ යන්නේත් වෙයි. යම් කලෙක එය එළැඹේ ද, එ කලැ හේ සංඥී වෙයි. යම් කලෙක පහ වැ යේ ද, එ කලැ අසංඥී වේ යැ"යි මෙසේ කී ය. මෙසේ ඇතැම් කෙනෙක් අභිසංඥානිරෝධය පණවත්.

(3) ඔහුට අනෙකෙක් භවත, මට මෙය මෙසේ නො වන්නේ ය. භවත, මහත් සෘද්ධි ඇති මහත් අනුභාව ඇති මහණ බමුණු කෙනෙක් වෙත් ම ය. ඔහු මේ පුරුෂයාට සංඥාව පමුණු වන්නෝ ද වෙති. ඔහුගේ සංඥාව ඉවතට අදනෝ ද වෙති. යම් විටෙක ඔහු කරා සංඥාව පමුණුවත් නම්, එ විටැ හෙ තෙම සංඥී වෙයි. යම් විටෙක සංඥාව ඉවතට අදනාහු නම්, එ විටැ අසංඥී වේ" යැ යි කී ය. මෙසේ ඇතැම්හු අභිසංඥානිරෝධය පණවත්.

(4) ඔහුට අනෙකෙක්, "භවත, මෙය මට මෙසේ නො වන්නේ ය. භවත, මහත් සෘද්ධි ඇති, මහත් අනුභාව ඇති, දෙවතා කෙනෙක් ඇත. ඔහු මේ පුරුෂයා වෙතට සංඥාව පමුණුවන්නෝ ද, මොහුගෙන් ඉවතට අදනෝ ද වෙත්. යම් විටෙක සංඥාව මොහු වෙතට පමුණුවත් ද, එ විටැ මෙ තෙම සංඥී වෙයි. යම් විටෙක එය මොහුගෙන් ඉවතට අදිත් ද, එ විටැ අසංඥී වෙයි. මෙසේ ඇතැම්හු අභිසංඥානිරෝධය පණවත්" යැ යි කී ය. මෙසේ ඇතැම්හු අභිසංඥානිරෝධය පණවත්.

6. වහන්ස, "යම් කෙනෙක් මේ දහම්හි නිපුණ ද ඒ භාග්‍යවතුන් වහන්සේ අහෝ මෙය පවසන සේක් නම් ඉතා මැනැව නු. ඒ සුගතයන් වහන්සේ මෙය වදාරන සේක් නම් ඉතා මැනැව නො."යි (එ වේලෙහි) මට භාග්‍යවතුන් වහන්සේ ම ඇරැබ සිහිය උපන. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ අභිසංඥානිරෝධයෙහි නිපුණ සේක. ඇති සැටිය (ප්‍රකෘතිය) දන්නා සේක. වහන්ස, අභිසංඥානිරෝධය කෙසේ වේ ද?".

7. තත්‍ර පොට්ඨපාද යෙ තෙ සමණබ්‍රාහ්මණා එවමාහංසු: අහෙතු අපච්චයා පුරිසස්ස සඤ්ඤා උපජ්ජන්ති'පි නිරුජ්ඣන්ති'පි'ති. ආදිතො'ව තෙසං අපරද්ධං. තං කිස්ස හෙතු? සහෙතු හි පොට්ඨපාද සපච්චයා පුරිසස්ස සඤ්ඤා උපජ්ජන්ති'පි නිරුජ්ඣන්ති'පි. සික්ඛා එකා සඤ්ඤා උපජ්ජන්ති, සික්ඛා එකා සඤ්ඤා නිරුජ්ඣන්ති".

"කා ච සික්ඛා"ති භගවා අවොච:

ඉධ පොට්ඨපාද තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මා-සම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිස-දම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා. සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං, සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවල-පරිපුණ්ණං පරිසුද්ධං. බ්‍රහ්මචරියං පකාසෙති.

8. තං ධම්මං සුණාති ගහපති වා ගහපතිපුත්තො වා අඤ්ඤතරස්මිං වා කුලෙ පච්චාජාතො. සො තං ධම්මං සුත්වා තථාගතෙ සද්ධං පටිලභති. සො තෙන සද්ධාපටිලාභෙන සමන්නාගතො ඉති පටිසංචික්ඛති: "සම්බාධො ඝරාවාසො රජොපථො[1], අබ්භොකාසො-පබ්බජ්ජා. න ඉදං සුකරං අගාරං අජ්ඣාවසතා ඒකන්තපරිපුණ්ණං ඒකන්තපරිසුද්ධං සඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං. යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍යන්ති".

9. සො අපරෙන සමයෙන අප්පං වා භොගක්ඛන්ධං පහාය මහන්තං වා භොගක්ඛන්ධං පහාය අප්පං වා ඤාතිපරිවට්ටං පහාය මහන්තං වා ඤාති-පරිවට්ටං පහාය කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජති. සො එවං පබ්බජිතො සමානො පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී. සමාදාය සික්ඛති සික්ඛාපදෙසු, - කායකම්මවචී-කම්මෙන සමන්නාගතො කුසලෙන, පරිසුද්ධාජීවො සීලසම්පන්නො ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො භොජනෙ මත්තඤ්ඤූ සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො සන්තුට්ඨො.

10. කථඤ්ච පොට්ඨපාද භික්ඛු සීලසම්පන්නො හොති? ඉධ පොට්ඨපාද භික්ඛු පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති නිහිතදණ්ඩො නිහිතසත්තො -පෙ-

---

1. රජාපථො, සයම්.

7. පොට්ඨපාදය, එහි යම් මහණ බමුණු කෙනෙක් "හෙතු නැති වැ ප්‍රත්‍යය නැති ව පුරුෂයාට සංඥවෝ උපදිති සි ද නිරුද්ධ වෙති" සි ද මෙසේ කීහු නම්, මුලින් ම ඔවුනට වැරැදිණ. ඒ කවර හෙයින ? පොට්ඨ-පාදය, පුරිස්හට හෙතුසහිත ව ම ප්‍රත්‍යය සහිත ව ම (කරුණු සහිත ව ම) සංඥවෝ උපදනෝත් නිරුද්ධ වන්නෝත් වෙති. ශික්ෂායෙන් ඇතැම් සංඥවෝ උපදින්. ශික්ෂායෙන් ඇතැම් සංඥවෝ නිරුද්ධ වෙත්".

"ඒ කවර ශික්ෂාවෙක් ද ?"සි භාග්‍යවතුන් වහන්සේ ම (ප්‍රශ්න කොට එය විස්තර කරන සේක් මතු දැක්වෙන ධර්මකථාව) වදාළ සේක:

පොට්ඨපාදය, මෙහි රහත් වූ සම්මාසම්බුදු වූ විද්‍යාචරණසම්පන්න වූ සුගත වූ ලෝකඥ වූ නිරුත්තර පුරුෂදම්‍යසාරථි වූ දෙවිමිනිස්නට ශාස්තා වූ සිවුසත් අවබෝධ කළා වූ භගවත් වූ තථාගත තෙමේ ලොවැ පහළ වෙයි. හේ දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත මෙ ලොව ද, මහණ බමුණන් සහිත දෙව් මිනිසුන් සහිත සත්මුළුව ද තෙමේ විශිෂ්ට වූ නුවණින් දැන පසක් කොට ඔවුනට අවබෝධ කරවයි. හේ ආදියෙහි හද කොට මධ්‍යයෙහි හද කොට අවසන්හි හද කොට අර්ථ සහිත කොට ව්‍යංජන සහිත කොට සර්වප්‍රකාරයෙන් පරිපූර්ණ කොට පිරිසිදු කොට දහම් දෙසයි. (ඒ දෙසනුයේ ද) ශාස්තෘබ්‍රහ්මචර්‍යය හෙළි කෙරෙයි.

8. ගෘහපතියෙක් හෝ ගෘහපිත්‍රතෙක් හෝ අන් එක්තරා කුලයෙකැ උපන්නෙක් හෝ ඒ දහම් අසයි. හේ ඒ දහම් අසා තථාගත බුදුහු කෙරෙහි සැදැහැ පිළිලබයි (උපදවයි). හේ ඒ සැදැහැ පිළිලැබීමෙන් යුත් වූයේ, "ගෘහවාසය සම්බාධයෙකි රජස්පථයෙකි. පැවිද්ද අභ්‍යවකාශය වැන්න. ගිහිගෙයි වසන්නහු විසින් එකාන්තයෙන් පිරිපුන් කොට එකාන්තයෙන් පිරිසිදු කොට ශඛලිඛිතයක් සේ කොට මේ සසුන්-බඹසර පුරන්නට පහසු නොවේ. මම කෙහෙරවුලු බහවා කසාවත් හැඳ පෙරෙවැ ගිහිගෙන් පැවිද්බිම් වදනෙම් වීම් නම් යෙහෙකැ"සි මෙසේ නුවණින් සලකයි.

9. හේ පසු කලෙක මඳ වූ හෝ මහත් වූ හෝ සම්පත් රැස හැරැ, මඳ වූ හෝ මහත් වූ හෝ නැපිරිස හැරැ, කෙහෙරවුලු බහවා, කසාවත් හැඳ පෙරෙවැ ගිහිගෙන් පැවිද්බිම් වදී. හේ මෙසේ පැවිදි වූයේ මි ප්‍රාති-මෝක්ෂසංවරයෙන් සමන්විත වූයේ, ආචාරගොචර දෙකින් යුත් වූයේ, අණු පමණ වූ ද වරදෙහි බිය දක්නේ, නිවරද කායවාක්කර්මයෙන් යුක්ත වූයේ එහෙයින් ම පිරිසිදු ආජීවය ඇත්තේ, සිල්වත් වූයේ, ඉඳුරන්හි වැසූ දොරටුවේ, බොජුන්හි පමණ දන්නේ, ගිහිනුවණින් යුත් වූයේ, පසයෙහි තුන් සතුටින් සතුටු වූයේ, සිකපද සමාදන් කොට ගෙත භික්මෙයි.

10. පොට්ඨපාදය, මහණ තෙම කෙසේ නම් සිල්වත් වේ ද යත්: පොට්ඨපාදය, මෙහි මහණ තෙම පණිවා හැරැ පණිවාවෙන් වැළැක්කේ වෙයි. බහා තැබූ දඬුමුගුරු ඇත්තේ, බහා තැබූ අවි ඇත්තේ...

අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො හොති -පෙ- අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී හොති -පෙ- මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො හොති -පෙ- පිසුණං වාචං පහාය පිසුණාය වාචාය පටිවිරතො හොති -පෙ- ඵරුසං වාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතො හොති -පෙ-සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතො හොති -පෙ-. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

11. බීජගාමභූතගාමසමාරම්භා පටිවිරතො හොති -පෙ- ඡේදනවධ-බන්ධනවිපරාමෝසඅාලොපසහසාකාරා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

12. යථා වා පනෙකෙ හොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විසූකදස්සනං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: නච්චං ගීතං -පෙ- අණිකදස්සනං. ඉති වා ඉති එවරූපා විසූකදස්සනා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

13. යථා වා පනෙකෙ හොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං ද්‍යූතපමාදට්ඨානානුයොගං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: අට්ඨපදං දසපදං -පෙ- යථාවජ්ජං. ඉති වා ඉති එවරූපා ද්‍යූතපමාදට්ඨානානුයොගා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

14. යථා වා පනෙකෙ හොන්තො සමණබ්‍රාහ්මණා -පෙ- එවරූපං උච්චාසයනමහාසයනං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: ආසන්දිං පල්ලඞ්කං -පෙ- උභතොලොහිතකූපධානං. ඉති වා ඉති එවරූපා උච්චාසයනමහා-සයනා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

15. යථා වා පනෙකෙ හොන්තො සමණබ්‍රාහ්මණා -පෙ- මණ්ඩන-විභූසනට්ඨානානුයොගං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: උච්ඡාදනං පරිමද්දනං -පෙ- ඔදාතානි වත්ථානි දීඝදසානි. ඉති වා ඉති එවරූපා මණ්ඩනවිභූසනට්ඨානානුයොගා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

16. යථා වා පනෙකෙ හොන්තො සමණබ්‍රාහ්මණා -පෙ- එවරූපං තිරච්ඡානකථං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: රාජකථං චොරකථං -පෙ- ඉතිභවාභවකථං. ඉති වා ඉති එවරූපාය තිරච්ඡානකථාය පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

අසිනාදන් හැරි අසිනාදනින් වැළැක්කේ වෙයි... අඛ්‍රමිසර හැරි බඹසැරි වෙයි... මුසවා හැරි මුසවායෙන් වැළැක්කේ වෙයි... පිසුණුබස් හැරි පිසුණු බසින් වැළැක්කේ වෙයි... පරොස්බස් හැරි පරොස් බසින් වැළැක්කේ වෙයි... බොල් හිස් බස් කිණුම් හැරි බොල් බසින් වැළැක්කේ වෙයි... මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

11. බීජසමූහ භූතසමූහ සිදුමෙන් කිදුමෙන් වැළැක්කේ වෙයි... අත්පා ඇ සිඳීමෙන් ද මැරීමෙන් ද රැහැන් ආදියෙන් බැඳීමෙන් ද සැහැසිකම්වලින් ද වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

12. යම්සේ වනාහි ඇතැම් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ නැවුම් ගැහුම්... බලසෙන් ගණිනා තැන් දක්නට යැම් යන මෙබඳු විසුළු දස්නෙහි යෙදී වෙසෙත් ද, හෙ තෙමේ මේ හෝ මෙබඳු වූ විසුළුදස්නෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

13. යම්සේ ඇතැම් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ අවපාකෙළිය දසපාකෙළිය... විකලාඞ්ගානුකරණය යන මෙබඳු වූ පමාවට කරුණු වූ දූකෙළියෙහි යෙදී වෙසෙත් ද, හේ මේ හෝ මෙබඳු වූ දූකෙළියෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

14. යම්සේ ඇතැම් භවත් මහණබමුණෝ... දික්සඟළාපුටුව් ය පළඟ ය... ඉස්දෙරැ . පාමුලැ රතු කොළට තබා ඇති යහන ය යන මෙබඳු වූ උස්යහන් මහයහන් පරිහරණය කිරීමෙහි යෙදී වෙසෙත් ද, හෙ තෙමේ මේ හෝ මෙබඳු උස්යහන් මහයහන් පරිභෝගයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

15. යම්සේ ඇතැම් භවත් මහණබමුණෝ... සුවඳ සුණුයෙන් ඇඟ ඉළීම, මිනා සවඟන් ගන්වනුවට තෙල්ගා මැඩීම... දික් දඟවලු ඇති සුදු රෙදි හැඳීම යන ආදි ඇඟ අඩු තැන් පිරවීමටත් ඇඟ හැරැසීමටත් කරුණු වන දෑ පරිභොග කිරීමෙහි යෙදී වෙසෙත් ද, හේ මේ හෝ මෙබඳු දෑ පරිභොග කිරීමෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

16. යම්සේ ඇතැම් භවත් මහණබමුණෝ... රාජකථා චෝරකථා... ඉතිභවාභවකථා යන මෙබඳු වූ තිරිසන් කතාවලැ යෙදී වෙසෙත් ද, හේ මේ හෝ මේයින් අන්‍ය වූ හෝ මෙබඳු කතාවලින් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

17. යථා වා පනෙකෙ හොනෙතා සමණබ්‍රාහ්මණා -පෙ- එවරූපං විඤ්ඤාණකථං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථිදං: න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි -පෙ- නිබ්බෙඨෙහි වා සවෙ පහොසි'ති. ඉති වා ඉති එවරූපාය විඤ්ඤාණකථාය පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

18. යථා වා පනෙකෙ හොනෙතා සමණබ්‍රාහ්මණා -පෙ- එවරූපං දූතෙය්‍යපහිණගමනානුයොගමනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: රාජූනං රාජමහාමත්තානං -පෙ- අමුත්‍ර ඉදං ආහරා'ති. ඉති වා ඉති එවරූපා දූතෙය්‍යපහිණගමනානුයොගා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

19. යථා වා පනෙකෙ හොනෙතා සමණබ්‍රාහ්මණා -පෙ- කුහකා ච හොන්ති -පෙ- ලාභෙන ලාභං නිජිගිංසිතාරො. ඉති වා ඉති එවරූපා කුහනලපනා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

20. යථා වා පනෙකෙ හොනෙතා සමණබ්‍රාහ්මණා -පෙ- එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථිදං: අඞ්ගං නිමිත්තං -පෙ- මිගචක්කං. ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

21. යථා වා පනෙකෙ හොනෙතා සමණබ්‍රාහ්මණා -පෙ- එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථිදං: මණිලක්ඛණං වත්ථුලක්ඛණං -පෙ- මිගලක්ඛණං. ඉති වා ඉති එවරූපාය තිරච්ඡාන-විජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

22. යථා වා පනෙකෙ හොනෙතා සමණබ්‍රාහ්මණා -පෙ- එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථිදං: රඤ්ඤං නියාණං භවිස්සති -පෙ- ඉමස්ස පරාජයො භවිස්සති. ඉති වා ඉති-එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

23. යථා වා පනෙකෙ හොනෙතා සමණබ්‍රාහ්මණා -පෙ- එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථිදං: වස්සඤ්ඤානං භවිස්සති -පෙ- එවංවිපාකං වස්සිමසුරියගහණං චන්දිමසුරියගහණං උක්කාපාතං ඔගමනං සඞ්කිලෙසං වොදානං භවිස්සති. ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

24. යථා වා පනෙකෙ හොනෙතා සමණබ්‍රාහ්මණා -පෙ- එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථිදං: සුබ්බුට්ඨිකං භවිස්සති -පෙ- ලොකායතං. ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

17. යම්සේ ඇතැම් භවත් මහණබමුණෝ... 'තෝ මේ දහම්විනය නො දනී... ඉඳින් හැකි නම් එය විසඳව'යි යන මෙබඳු උනුත් බැණ දෙඩා ගැනුම්වලැ යෙදී වෙසෙත් ද, ඒ මහණ මේ හෝ අන් මෙබඳු වූ හෝ බැණුම්දෙඩුම්වලින් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

18. යම්සේ ඇතැම් භවත් මහණබමුණෝ... අසෝ තැනට මෙය ගෙනෙව'යි කල නියොග පිළිගෙන රජුන්ගේ රජමහමැතියන්ගේ... මෙබඳු දූත මෙහෙවරෙහි පණිවුඩ ගෙන යැමෙහි යෙදී වෙසෙත් ද, ඒ මහණ තෙම මේ හෝ අන් මේ වැනි වූ හෝ දූතමෙහෙවරින් පණිවුඩ ගෙනැ යැමෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

19. යම්සේ ඇතැම් භවත් මහණබමුණෝ... කුහක කම් කරන්නෝ වාටු බස් දෙඩන්නෝ... ලාභයෙන් ලාභය සොයන්නෝ වෙත් ද, ඒ මහණ මේ හෝ අන් මෙබඳු වූ කුහනලපන කෙරෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

20. යම්සේ ඇතැම් භවත් මහණබමුණෝ... අඞ්ගශාස්ත්‍රය නිමිත්ත-ශාස්ත්‍රය... මෘගපක්ෂය යන මේ හෝ මෙබඳු වූ හෝ තිරශ්චීනවිද්‍යයෙන් මිථ්‍යාජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ එයින් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

21. යම්සේ ඇතැම් භවත් මහණබමුණෝ... මිණිලකුණු කීම, වත් ලකුණු කීම... මුවලකුණු කීම ය යන මෙබඳු තිරශ්චීනවිද්‍යයෙන් මිථ්‍යා-ජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ මේ හෝ මෙබඳු හෝ තිරශ්චීන-විද්‍යව කෙරෙන් මිථ්‍යාජීවය කෙරන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වෙයි.

22. යම්සේ ඇතැම් භවත් මහණබමුණෝ... රජුන්ගේ සිය නුවරින් නික්මීම වන්නේ ය... මොනුට පරාජය වන්නේ යැ යි කියන්නෝ මෙබඳු තිරශ්චීනවිද්‍යයෙන් මිථ්‍යාජීවයෙන් දිවි පවත්වත් ද, හේ මේ හෝ මෙබඳු හෝ තිරශ්චීනවිද්‍යයෙන් මිථ්‍යාජීවයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වෙයි.

23. යම්සේ ඇතැම් භවත් මහණබමුණෝ... චන්ද්‍රග්‍රහණය වන්නේ ය... සඳහිරු නකත්තරුන්ගේ නැගීම බැසීම කෙලෙසීම පිරිසිදු වීම මෙබඳු විපාක දෙන්නේ යැ යි කියන්නාහු මෙබඳු තිරශ්චීනවිද්‍යයෙන් මිථ්‍යා-ජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ තෙම මේ හෝ මෙබඳු වූ හෝ තිරශ්චීන-විද්‍ය කෙරෙන් මිථ්‍යාජීව කෙරෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

24. යම්සේ ඇතැම් භවත් මහණබමුණෝ... මේ සමයෙහි මනා වැසි වන්නේ යැ යි කීම... ලොකායතශාස්ත්‍ර හැදෑරීම් යන මෙබඳු තිරශ්චීනවිද්‍යයෙන් මිථ්‍යාජීවයෙන් දිවි පවත්වත් ද, හේ මේ හෝ මෙබඳු හෝ තිරශ්චීනවිද්‍යයෙන් මිථ්‍යාජීවයෙන් වැළැක්කේ වෙයි මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

25. යථා වා පනෙකෙ භොතො සමණබ්‍රාහ්මණා -පෙ- එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති. සෙය්‍යථිදං: ආවාහනං -පෙ- සිරිවහනං. ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

26. යථා වා පනෙකෙ භොතො සමණබ්‍රාහ්මණා -පෙ- එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති. සෙය්‍යථිදං: සන්තිකම්මං පණිධිකම්මං -පෙ- ඕසධීනං පටිමොක්ඛො. ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

27. ස ඛො සො පොට්ඨපාද භික්ඛු එවං සීලසම්පන්නො න කුතොචි භයං පස්සති යදිදං සීලසංවරතො -පෙ- සො ඉමිනා අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො අජ්ඣත්තං අනවජ්ජසුඛං පටිසංවෙදෙති. එවං ඛො පොට්ඨපාද භික්ඛු සීලසම්පන්නො හොති.

28. කථඤ්ච පොට්ඨපාද භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති? ඉධ පොට්ඨපාද භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී -පෙ- මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සො ඉමිනා අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො අජ්ඣත්තං අබ්‍යාසෙකසුඛං පටිසංවෙදෙති. එවං ඛො පොට්ඨපාද භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති.

29. කථඤ්ච පොට්ඨපාද භික්ඛු සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො හොති. ඉධ පොට්ඨපාද භික්ඛු අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී හොති -පෙ- තුණ්හීභාවෙ සම්පජානකාරී හොති. එවං ඛො පොට්ඨපාද භික්ඛු සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො හොති.

30. කථඤ්ච පොට්ඨපාද භික්ඛු සන්තුට්ඨො හොති? ඉධ පොට්ඨපාද භික්ඛු සන්තුට්ඨො හොති කායපරිහාරියෙන චීවරෙන -පෙ- සෙය්‍යථාපි පොට්ඨපාද පක්ඛී සකුණො යෙන යෙනෙව ඩෙති සපත්තභාරො'ව ඩෙති. එවමෙව ඛො පොට්ඨපාද භික්ඛු -පෙ- යෙන යෙනෙව පක්කමති සමාදයෙව පක්කමති. එවං ඛො පොට්ඨපාද භික්ඛු සන්තුට්ඨො හොති.

31. සො ඉමිනා ච අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො ඉමිනා ච අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො ඉමිනා ච අරියෙන සති-සම්පජඤ්ඤෙන සමන්නාගතො ඉමාය ච අරියාය සන්තුට්ඨියා සමන්නාගතො විවිත්තං සෙනාසනං භජති අරඤ්ඤං -පෙ- පලාලපුඤ්ජං. සො පච්ඡා-භත්තං පිණ්ඩපාතපටික්කන්තො නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා.

25. යම්සේ ඇතැම් භවත් මහණබමුණෝ... ආවාහ සඳහා නකත් කීම, විවාහ සඳහා නකත් කීම... සිරිකඨ කැඳැවීම යන මේ හෝ අන් මෙබඳු වූ තිරශ්චීනවිද්‍යයෙන් මිථ්‍යාජීවයෙන් දිවි පවත්වන් ද, ඒ මහණ තෙම මේ ද අන් මෙබඳු වූ ද තිරශ්චීනවිද්‍යයෙන් මිථ්‍යාජීවයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

26. යම්සේ ඇතැම් භවත් මහණබමුණෝ... ශාන්තිකම් ප්‍රණීතිකම්... කාරම් බේත් බැඳ වණ සුව වූ පසු ඒ ගලවා දැමීම යන මේබඳු තිරශ්චීන-විද්‍යයෙන් මිථ්‍යාජීවයෙන් දිවි පවත්වන් ද, හේ මහණ මේ ද අන් මෙබඳු වූ ද තිරශ්චීනවිද්‍යයෙන් මිථ්‍යාජීවයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

27. පොට්ඨපාදය, ඒ මහණ මෙසේ ශීලසම්පන්න වූයේ, ශීලසංවරය හෙතු කොට නෙත කිසි ම එක ද අසංවරතායෙකින් ඇති විය හැකි බියක් නො දකී... හේ මේ ආර්‍ය්‍ය ශීලස්කන්ධයෙන් සමන්විත වූයේ සිය සතන්හි නිදොස් වූ කායික චෛතසික සුවය විඳී. පොට්ඨපාදය, මෙසේ වනාහි මහණ තෙම ශීලසම්පන්න වේ.

28 පොට්ඨපාදය, මහණ කෙසේ නම් ඉඳුරන්හි වැසූ දොරක්තේ වේ ද? පොට්ඨපාදය, මේ සත්තු මහණ තෙම ඇසින් රූපයක් දැක, එහි නිමිති නොගන්නේ වේ, අවයවයන්ගේ ආකාර සිතට නොගන්නේ වේ... මනඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. හේ මේ ආර්‍ය්‍ය වූ ඉන්ද්‍රියසංවරයෙන් යුක්ත වූයේ සිත්සතන්හි අව්‍යාසෙකසුඛය විඳී. පොට්ඨපාදය, මෙසේ වනාහි මහණ තෙම ඉඳුරන්හි වැසූ දොරක්තේ වෙයි.

29. පොට්ඨපාදය, කෙසේ නම් මහණ තෙම සිහිනුවණින් යුත් වේ ද? පොට්ඨපාදය, මෙහි මහණ ඉදිරියට යැමෙහි පෙරලා ඊමෙහි මනා නුවණින් දැන ම එය කරනුයේ වෙයි... නිශ්ශබ්දභාවයෙහි මනා නුවණින් දැන ම කරනුයේ වෙයි. පොට්ඨපාදය, මෙසේ වනාහි මහණ තෙම සිහිනුවණින් යුත් වෙයි.

30. පොට්ඨපාදය, මහණ තෙම කෙසේ නම් සතුටු වේ ද? පොට්ඨ-පාදය, මෙහි මහණ තෙම කායපරිහරණයට ප්‍රමාණ වූ සිවුරින්... සතුටු වූයේ වේ. පොට්ඨපාදය, යම්සේ පියා හඔනුවට තරම් අත්තටු ඇති කුරුළු තෙම යන යන තැන පියාපත් බර ඇති ව ම පියා හඔා ගේ ද, පොට්ඨපාදය, එසේ ම මහණ තෙම... තමා යන යන තැනට පාසිවුරු ඇ (පැවිදි අවපිරිකර) රැගෙන ම යෙයි. පොට්ඨපාදය, මෙසේ ම මහණ තෙම සතුටු වෙයි.

31. හේ මේ ආර්‍ය්‍ය ශීලස්කන්ධයෙන් ද... මේ ආර්‍ය්‍ය ඉන්ද්‍රියසංවරයෙන් ද... මේ ආර්‍ය්‍ය සතිසම්පජඤ්ඤයෙන් ද... මේ ආර්‍ය්‍ය සන්තුෂ්ටියෙන් ද සමන්විත වූයේ, අරණ්‍යය... පිදුරුළෙනය යන යම් කිසි ජනවාසිකන සෙනස්තක් බජසි. හේ පසුබත් සෙමෙහි පිණ්ඩපාතයෙන් පෙරලා ආයේ, පලක් බැඳ උඩුකය කෙළිත් පිහිටුවා, කමටහනට යොමු කොට සිහිය එළවා හිඳී.

32. සො අභිජ්ඣං ලොකෙ පහාය -පෙ- ඛ්‍යාපාදපදොසං පහාය -පෙ- පිනමිද්ධං පහාය -පෙ- උද්ධච්චකුක්කුච්චං පහාය -පෙ- විචිකිච්ඡං පහාය තිණ්ණවිචිකිච්ඡො විහරති අකථංකථී කුසලෙසු ධම්මෙසු. විචිකිච්ඡාය චිත්තං පරිසොධෙති.

සෙය්‍යථාපි පොට්ඨපාද පුරිසො ඉණං ආදාය කම්මන්තෙ පයොජෙය්‍ය, තස්ස තෙ කම්මන්තා සමිජ්ඣෙය්‍යුං -පෙ- සො තතො නිදානං ලභෙථ පාමොජ්ජං, අධිගච්ඡෙය්‍ය සොමනස්සං.

සෙය්‍යථාපි පොට්ඨපාද පුරිසො ආබාධිකො අස්ස -පෙ- සො අපරෙන සමයෙන තස්සා ආබාධා ඵුට්ඨෙය්‍ය -පෙ- සො තතො නිදානං ලභෙථ පාමොජ්ජං, අධිගච්ඡෙය්‍ය සොමනස්සං.

සෙය්‍යථාපි පොට්ඨපාද පුරිසො බන්ධනාගාරෙ බද්ධො අස්ස, සො අපරෙන සමයෙන තස්මා බන්ධනාගාරා මුච්චෙය්‍ය සොත්ථිනා අබ්භයෙන, -පෙ- සො තතො නිදානං ලභෙථ පාමොජ්ජං, අධිගච්ඡෙය්‍ය සොමනස්සං.

සෙය්‍යථාපි පොට්ඨපාද දාසො අස්ස -පෙ- සො අපරෙන සමයෙන තස්මා දාසබ්‍යා මුච්චෙය්‍ය -පෙ- සො තතො නිදානං ලභෙථ පාමොජ්ජං, අධිගච්ඡෙය්‍ය සොමනස්සං.

සෙය්‍යථාපි පොට්ඨපාද පුරිසො සධනො සභොගො කන්තාරද්ධානමග්ගං පටිපජ්ජෙය්‍ය දුබ්භික්ඛං සප්පටිභයං, සො අපරෙන සමයෙන තං කන්තාරං නිත්ථරෙය්‍ය -පෙ- සො තතො නිදානං ලභෙථ පාමොජ්ජං, අධිගච්ඡෙය්‍ය සොමනස්සං.

එවමෙව ඛො පොට්ඨපාද භික්ඛු යථා ඉණං යථා රොගං යථා බන්ධනාගාරං යථා දාසබ්‍යං යථා කන්තාරද්ධානමග්ගං, එවං ඉමෙ පඤ්ච නීවරණෙ ධම්මෙ අප්පහීණෙ අත්තනි සමනුපස්සති. සෙය්‍යථාපි පොට්ඨපාද ආනණ්‍යං යථා ආරොග්‍යං යථා බන්ධනා මොක්ඛං යථා භුජිස්සං යථා ඛෙමන්තභූමිං, එවමෙව ඛො පොට්ඨපාද භික්ඛු ඉමෙ පඤ්ච නීවරණෙ පහීණෙ අත්තනි සමනුපස්සති.

33. තස්සිමෙ පඤ්ච නීවරණෙ පහීණෙ අත්තනි සමනුපස්සතො පාමොජ්ජං[1] ජායති. පමුදිතස්ස පීති ජායති. පීතිමනස්ස කායො පස්සම්භති. පස්සද්ධකායො සුඛං වෙදෙති[2]. සුඛිනො චිත්තං සමාධියති. සො විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි, සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං[3] උපසම්පජ්ජ විහරති. තස්ස යා පුරිමා කාමසඤ්ඤා සා නිරුජ්ඣති. විවෙකජපීතිසුඛසුඛුමසච්චසඤ්ඤා තස්මිං සමයෙ හොති. විවෙකජපීතිසුඛසුඛුමසච්චසඤ්ඤී යෙව තස්මිං සමයෙ හොති. එවම්පි සික්ඛා එකා සඤ්ඤා උප්පජ්ජති.[4] සික්ඛා එකා සඤ්ඤා නිරුජ්ඣති.[5] 'අයං සික්ඛා'ති භගවා අවොච.

---

1. පාමුජ්ජං, PTS. 2 පටිසංවෙදෙති, සයා. 3 පඨමජ්ඣානං, සොසුම්.
4 උප්පජ්ජන්ති, PTS. 5 නිරුජ්ඣන්ති, PTS

32. හේ ලොවැ ඇල්ම හැරී... ක්‍රෝධය හැරී... පීනමිද්ධය හැර... උද්ධච්ච කුකුස් දෙක හැරී... සැකය හැර තිණු සැක ඇත්තේ, කුසල්-ධර්මයෙහි සැක නො කරනුයේ වෙසෙයි. සැකය කෙරෙන් සිත පිරිසිදු කෙරෙයි.

පොට්ඨපාදය, යම්සේ මිනිසෙක් ණයක් ගෙන කර්මාන්ත කරන්නේ ද, ඔහුගේ ඒ කර්මාන්ත සමෘද්ධ වී නම්... ඒ කරුණින් හේ සතුට ලබන්නේ ද, සොම්නසට පැමිණෙන්නේ ද,

පොට්ඨපාදය, යම්සේ මිනිසෙක් රෝගයක් වන්නේ ද... හේ පසු කාලෙක ඒ රෝග බැහැර වන්නේ ද... හේ ඒ කරුණින් සතුට ලබන්නේ ද, සොම්නසට පැමිණෙන්නේ ද,

පොට්ඨපාදය, යම්සේ මිනිසෙක් දඟරගෙහි බැඳුණේ වන්නේ ද, හේ පසු කාලෙක ඒ දඟරගෙයින් ධන නොවිනාශ සුවසේ මිදෙන්නේ ද... හේ ඒ කරුණින් සතුට ලබන්නේ ද, සොම්නසට පැමිණෙන්නේ ද,

පොට්ඨපාදය, යම්සේ දාසයෙක් වන්නේ ද... හේ පසු කාලෙක ඒ දාස බව කෙරෙන් මිදෙන්නේ ද... හේ ඒ කරුණින් සතුට ලබන්නේ ද, සොම්නසට පැමිණෙන්නේ ද,

පොට්ඨපාදය, යම්සේ ධනවත්, භෝග ඇති මිනිසෙක් ආහාර දුර්ලභ, උවදුරු ඇති, දිය නැති දික් කතරමඟකට බස්නේ ද, හේ මෑත භාග-යෙහි ඒ කතර ඉක්මැ යන්නේ ද... හේ ඒ කරුණින් සතුට ලබන්නේ ද, සොම්නසට පැමිණෙන්නේ ද,

පොට්ඨපාදය, එසේ ම මහණ තෙම ණයක් මෙන්, ලෙඩක් මෙන්, දඟරගයක් මෙන්, වහල්බවක් මෙන්, දුරු කතරමඟක් මෙන් ප්‍රහීණ නොවූ මේ නීවරණ පස තමා කෙරෙහි දකී. පොට්ඨපාදය, ණයින් මිදුණු බව, අරෝග බව, සිරබැඳුමෙන් මිදුණු බව, නිවහල් බව, උවදුරු නැති බිම යම්සේ ද, එසේ ම මහණ තෙම තමා කෙරෙහි ප්‍රහීණ වූ මේ නීවරණ පස දකී.

33. මේ නීවරණ පස තමා කෙරෙහි ප්‍රහීණ වූ තියා දක්නා ඔහුට සතුට උපදී. සතුටු වූවහුට ප්‍රීතිය උපදී. ප්‍රීති සිත් ඇත්තහුගේ නාම-රූප කය සංසිඳේ. සංසිඳුන් කයැත්තේ සුව විඳී. සුවපත්හුගේ සිත එකඟ වෙයි. හේ කාමයන්ගෙන් වෙන් ව ම, අකුසල් ධර්මයන්ගෙන් වෙන් ව ම, විතර්කසහිත විචාරසහිත, ප්‍රීතිය හා සුඛවේදනාව හා ඇති, විවේකයෙන් උපන් ප්‍රථමධ්‍යානය ලැබැ වෙසෙයි. ඔහුගේ යම් පළමු කාමසංඥාවෙක් වී ද, එය නිරුද්ධ වෙයි. එ කල්හි විවේකයෙන් හටගත් ප්‍රීතිසුඛ තැමැති සිසුම් වූ සංඥාව පහළ වූයේ වෙයි. එකල්හි හෙතෙම විවේකයෙන් හටගත් ප්‍රීතිසුඛසහගත සුඛුම වූ සංඥා ඇත්තේ ම වේ. මේසේ ශික්ෂාවෙන් (ප්‍රථමධ්‍යානයෙන්) එක් (ප්‍රථමධ්‍යාන) සංඥාව උපදී, ශික්ෂාවෙන් එක් (කාම) සංඥාව නිරුද්ධ වෙයි. 'මේ ශික්ෂා යැ'යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

"පුනචපරං පොට්ඨපාද භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං[1] උපසම්පජ්ජ විහරති. තස්ස යා පුරිමා විවෙකජ-පීතිසුඛසුඛුමසච්චසඤ්ඤා[2] සා නිරුජ්ඣති. සමාධිජපීතිසුඛසුඛුමසච්චසඤ්ඤා තස්මිං සමයෙ හොති. සමාධිජපීතිසුඛසුඛුමසච්චසඤ්ඤාදී යෙව තස්මිං සමයෙ හොති. එවම්පි සික්ඛා එකා සඤ්ඤා උප්පජ්ජති. සික්ඛා එකා සඤ්ඤා නිරුජ්ඣති. අයම්පි සික්ඛා"ති භගවා අවොච.

"පුනචපරං පොට්ඨපාද භික්ඛු පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති සතො ච සම්පජානො. සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති. යන්තං අරියා ආචික්ඛන්ති 'උපෙක්ඛකො සතිමා සුඛවිහාරී'ති තතියං-ඣානං[3] උපසම්පජ්ජ විහරති. තස්ස යා පුරිමා සමාධිජපීතිසුඛසුඛුමසච්ච-සඤ්ඤා සා නිරුජ්ඣති. උපෙක්ඛාසුඛසුඛුමසච්චසඤ්ඤා තස්මිං සමයෙ හොති. උපෙක්ඛාසුඛසුඛුමසච්චසඤ්ඤාදී යෙව තස්මිං සමයෙ හොති. එවම්පි සික්ඛා එකා සඤ්ඤා උප්පජ්ජති. සික්ඛා එකා සඤ්ඤා නිරුජ්ඣති. අයම්පි සික්ඛා"ති භගවා අවොච.

"පුනචපරං පොට්ඨපාද භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා, පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථගමා[4] අදුක්ඛමසුඛං උපෙක්ඛා-සතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං[5] උපසම්පජ්ජ විහරති. තස්ස යා පුරිමා උපෙක්ඛාසුඛසුඛුමසච්චසඤ්ඤා සා නිරුජ්ඣති. අදුක්ඛමසුඛසුඛුමසච්චසඤ්ඤා තස්මිං සමයෙ හොති. අදුක්ඛමසුඛසුඛුමසඤ්ඤාදී යෙව තස්මිං සමයෙ හොති. එවම්පි සික්ඛා එකා සඤ්ඤා උප්පජ්ජති. සික්ඛා එකා ,සඤ්ඤා නිරුජ්ඣති. අයම්පි සික්ඛා"ති භගවා අවොච.

"පුනචපරං පොට්ඨපාද භික්ඛු සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා 'අනන්තො ආකාසො'ති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති. තස්ස යා පුරිමා රූපසඤ්ඤා සා නිරුජ්ඣති. ආකාසානඤ්චායතනසුඛුමසච්චසඤ්ඤා තස්මිං සමයෙ හොති. ආකාසානඤ්චායතනසුඛුමසච්චසඤ්ඤාදී යෙව තස්මිං සමයෙ හොති. එවම්පි සික්ඛා එකා සඤ්ඤා උප්පජ්ජති. සික්ඛා එකා සඤ්ඤා නිරුජ්ඣති. අයම්පි සික්ඛා"ති භගවා අවොච.

---

1. දුතියජ්ඣානං, PTS. 2. විවෙකජ පීතිසුඛං සුඛුමසඤ්ඤා, PTS.
3. තතියජ්ඣානං, කොස්සුචි පොත්ථකෙසු. 4. අත්ථඞ්ගමා කොස්සුචි.
5. චතුත්ථජ්ඣානං, කොස්සුචි.

"තව ද අනෙකක් කියමි. පොට්ඨපාදය, මහණ තෙම විතර්කවිචාර-යන්ගේ සංසිඳීමෙන් තමා තුළ සිතැ පහන්බව කරන, සිතැ එකඟබව ඇති, විතර්ක නැති, විචාර නැති, සමාධියෙන් උපන් ප්‍රීතිසුඛ ඇති, දෙවෙනි ධ්‍යානය ලැබ වෙසෙයි. ඔහුගේ විවේකයෙන් උපන් ප්‍රීතිසුඛ සඛ්‍යාත සත්‍ය වූ යම් පළමු සංඥාවෙක් වී ද, එය නිරුද්ධ වෙයි. එ සමයෙහි සමාධියෙන් උපන් ප්‍රීතිසුඛසංඛ්‍යාත සියුම් වූ සත්‍ය සංඥාව වෙයි. හෙ තෙම එ කල්හි සමාධියෙන් උපන් ප්‍රීතිසුඛසංඛ්‍යාත සියුම් සත්‍ය සංඥා ඇත්තේ ම වෙයි. මේසේ ශික්ෂායෙන් (ද්විතීයධ්‍යානයෙන්) එක් සංඥාවෙක් උපදී. එක් සංඥාවෙක් (හෙවත් ප්‍රථමධ්‍යාන සංඥාව) නිරුද්ධ වෙයි. මේ ද ශික්ෂාවෙකැ"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

"තව ද පොට්ඨපාදය, මහණ තෙම ප්‍රීතිය ද දුරු කිරීමෙන් උපෙක්ෂක ද වූයේ, සිහි ඇත්තේ, නුවණ ඇත්තේ වෙසෙයි. සුවය ද නාමකයින් විඳී. 'උපෙක්ෂා ඇති සිහි ඇති සුව විසුම් ඇත්තේ' යැ යි (යමක් කරණ කොට ගෙන) ආර්‍යයෝ යම් පුගුලක්හු පවසත් ද, ඒ තුන්වන ධ්‍යානයට පැමිණ වෙසෙයි. ඔහුට සමාධියෙන් උපන් ප්‍රීතිසුඛ ඇති සියුම් වූ යම් පළමු සත්‍යසංඥාවෙක් වී නම්, එය නිරුද්ධ වෙයි. ධ්‍යානෝපෙක්ෂා සුඛය ඇති (ඕදාරිකාඛ්‍ය ප්‍රහීණ වූ බැවින්) සියුම් වූ සත්‍ය සංඥාව එ සමයෙහි වෙයි. එ කල්හි හේ උපෙක්ෂාසුඛය ඇති සියුම් වූ සත්‍යසංඥා ඇත්තෙක් ම වෙයි. මේසේත් ශික්ෂායෙන් එක් සංඥාවෙක් උපදී. ශික්ෂායෙන් එක් සංඥාවෙක් නිරුද්ධ වෙයි. මේ ද ශික්ෂාවෙකැ"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

"තව ද පොට්ඨපාදය, මහණ තෙම කායික සුඛයාගේ ද ප්‍රහාණයෙන්, කායික දුඃඛයාගේ ද ප්‍රහාණයෙන්, පෙර ම (පළමු දෙවෙනි තෙවෙනි ධ්‍යානයන්හි උපචාර අවස්ථායෙහි ම) සොම්නස් දොම්නස් දෙදෙනාගේ, දුරු වීමෙන්, දුක් නොවූ, සුව ද නොවූ, උපෙක්ෂායෙන් උපන් සිහියේ පිරිසිදු බව ඇති සතරවන ධ්‍යානයට පැමිණ වෙසේ. ඔහුට උපෙක්ෂා-සුඛය ඇති සියුම් වූ යම් පළමු සංඥාවෙක් වී ද, එය නිරුද්ධ වෙයි. දුක් ද නො වූ සුව ද නොවූ සියුම් වූ සත්‍යසංඥාව එ කල්හි වෙයි. එසමයෙහි හේ අදුඃඛ අසුඛ සූක්ෂ්මසත්‍යසංඥී ම වෙයි. මේසේ ද ශික්ෂායෙන් එක් සංඥාවෙක් උපදී. ශික්ෂායෙන් එක් සංඥාවෙක් නිරුද්ධ වෙයි. මේ ද ශික්ෂාවෙකැ"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

"තව ද පොට්ඨපාදය, මහණ තෙම හැම අයුරින් ම රූපසංඥා ඉක්මීමෙන්, ප්‍රතිඝසංඥා දුරු වීමෙන්, නානාත්වසංඥා නොමෙනෙහි කිරීමෙන්, අහස අනන්ත යැ යි (කමටහන් වඩා) ආකාශානන්ත්‍යායතන-ධ්‍යානය ලැබ වෙසෙයි. ඔහුගේ යම් පළමු රූපසංඥාවෙක් වී නම්, එය නිරුද්ධ වෙයි. ආකාශානන්ත්‍යායතනධ්‍යාන සඛ්‍යාත සියුම් සත්‍යසංඥාව එ සමයෙහි ඔහුට වෙයි. එකල්හි හේ ආකාශානන්ත්‍යායතන සුඛසඛ්‍යාත සියුම් සංඥා ඇත්තෙක් ම වෙයි. මේසේත් ශික්ෂායෙන් එක් සංඥාවෙක් උපදී. ශික්ෂායෙන් එක් සංඥාවෙක් නිරුද්ධ වෙයි. මේ ද ශික්ෂාවෙකැ"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

"පුන ච පරං පොට්ඨපාද භික්ඛු සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම, 'අනන්තං විඤ්ඤාණ'න්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති. තස්ස යා පුරිමා ආකාසානඤ්චායතනසුඛුමසඤ්ඤා සා නිරුජ්ඣති. විඤ්ඤාණඤ්චායතනසුඛුමසඤ්ඤා තස්මිං සමයෙ හොති. විඤ්ඤාණඤ්චායතනසුඛුමසඤ්ඤායෙව තස්මිං සමයෙ හොති. එවම්පි සික්ඛා එකා සඤ්ඤා උපජ්ජති.[1] සික්ඛා එකා සඤ්ඤා නිරුජ්ඣති. අයම්පි සික්ඛා"ති භගවා අවොච.

"පුන ච පරං පොට්ඨපාද භික්ඛු සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම 'නත්ථි කිඤ්චි'ති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. තස්ස යා පුරිමා විඤ්ඤාණඤ්චායතනසුඛුමසඤ්ඤා සා නිරුජ්ඣති. ආකිඤ්චඤ්ඤායතනසුඛුමසඤ්ඤා තස්මිං සමයෙ හොති. ආකිඤ්චඤ්ඤායතනසුඛුමසඤ්ඤායෙව තස්මිං සමයෙ හොති. එවම්පි සික්ඛා එකා සඤ්ඤා උපජ්ජති. සික්ඛා එකා සඤ්ඤා නිරුජ්ඣති. අයම්පි සික්ඛා"ති භගවා අවොච.

"යතො ඛො පොට්ඨපාද භික්ඛු ඉධ සකසඤ්ඤී හොති, සො තතො අමුත්‍රා තතො අමුත්‍රා අනුපුබ්බෙන සඤ්ඤුග්ගං ඵුසති. තස්ස සඤ්ඤග්ගෙ ඨිතස්ස එවං හොති: 'චෙතයමානස්ස මෙ පාපියො[2] අචෙතයමානස්ස මෙ භද්දකං. අහඤ්චෙව ඛො පන චෙතෙය්‍යං අභිසඞ්ඛරෙය්‍යං, ඉමා ච මෙ සඤ්ඤා නිරුජ්ඣෙය්‍යුං, අඤ්ඤා ච ඔළාරිකා සඤ්ඤා උප්පජ්ජෙය්‍යුං. යන්නූනාහං 'න චෙව[3] චෙතෙය්‍යං න චාභිසඞ්ඛරෙය්‍ය'න්ති. සො න චෙව චෙතෙති න චාභිසඞ්ඛරොති. තස්ස අචෙතයතො අනභිසඞ්ඛරොතො තා චෙව සඤ්ඤා නිරුජ්ඣන්ති, අඤ්ඤා ච ඔළාරිකා සඤ්ඤා න උප්පජ්ජන්ති. සො නිරොධං ඵුසති. එවං ඛො පොට්ඨපාද අනුපුබ්බාභිසඤ්ඤානිරොධසමාපජ්ජනසමාපත්ති හොති.

තං කිම්මඤ්ඤසි පොට්ඨපාද? අපි නු[4] තෙ ඉතො පුබ්බෙ එවරූපං අනුපුබ්බාභිසඤ්ඤානිරොධසමාපජ්ජනසමාපත්ති සුතපුබ්බා?"ති.

---

1. උපජ්ජති කෙසුචි.
2. පාපියො, කෙසුචිපි පොත්ථකෙසු.
3. න ච, සී.
4. නු ඛො, සී.

"තව ද පොට්ඨපාදය, මහණ තෙම හැම අයුරින් ම ආකාසානඤ්චායතනය ඉක්මැ, 'විඤ්ඤාණය අනන්ත යැ' යි (කමටහන් වඩා) විඤ්ඤාණඤ්චායතන ධ්‍යානය ලැබ වෙසෙයි. ඔහුගේ යම් පළමු ආකාසානඤ්චායතන ධ්‍යානයෙන් යුක්ත සිත්‍රුම් වූ සත්‍ය සංඥාවෙක් වී ද, එය නිරුද්ධ වෙයි. විඤ්ඤාණඤ්චායතන ධ්‍යානයෙන් යුක්ත සිත්‍රුම් වූ සත්‍යසංඥාව එ සමයෙහි වෙයි. එ කල්හි ගේ විඤ්ඤාණඤ්චායතන ධ්‍යාන යුක්ත සිත්‍රුම් සංඥා ඇත්තෙක් ම වෙයි. මෙසේ ද ශික්ෂායෙන් එක් සංඥාවෙක් උපදී. ශික්ෂායෙන් එක් සංඥාවෙක් නිරුද්ධ වෙයි. මේ ද ශික්ෂාවෙකැ"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

"තව ද පොට්ඨපාදය, මහණ තෙම හැම අයුරින් විඤ්ඤාණඤ්චායතනය ඉක්මැ, 'කිසිත් නැතැ'යි (කමටහන් වඩා) ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානයට පැමිණ වෙසෙයි. පළමු යම් විඤ්ඤාණඤ්චායතන සූක්ෂම සත්‍යසංඥාවෙක් වී ද, එය නිරුද්ධ වෙයි. එ කල්හි ඔහුට ආකිඤ්චඤ්ඤායතන යුක්ත සූක්ෂම සත්‍ය සංඥාව වෙයි. ගේ එ කලෑ ආකිඤ්චඤ්ඤායතන සූක්ෂම සත්‍යසංඥී ම වෙයි. මෙසේ ද ශික්ෂායෙන් එක් සංඥාවෙක් උපදී. ශික්ෂායෙන් එක් සංඥාවෙක් නිරුද්ධ වෙයි. මේ ද ශික්ෂාවෙකැ"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

"පොට්ඨපාදය, යම් මහණෙක් මෙහි සවකසංඥාව ඇත්තේ (තමාගේ ප්‍රථමධ්‍යාන සංඥයෙන් සංඥාවත්) වේ ද, ගේ එසිත් ඔබිබෙහි දෙවෙනි ධ්‍යානයට ද, එසිනුත් ඔබිබෙහි තෙවෙනි ධ්‍යානයට ද යි මෙසේ පිළිවෙළින් (ගොස්) කෙළවරැ සංඥාග්‍රය (ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය) ස්පර්ශ කෙරෙයි (ලබයි). සංඥාග්‍රයෙහි සිටි ඔහුට "සිතන (දහන් සමවදන) මාගේ ඒ ක්‍රියාව ලාමක ය. නොසිතන (දහන් නොසමවදන) මාගේ ඒ නොසමවැදීම උතුම්. මම වූ කලි සිතන්නෙම් නම් (පුන පුනා දහන් සමවදනෙම් නම්), මතු සමවත් පිණිස අභිසංඛාර කරන්නෙම් නම් (කමටහන් වඩන්නෙම් නම්), මාගේ මේ සංඥාවෝත් නිරුද්ධ වන්නාහු ය. අන් ඕදාරික (හවාඞ්ග) සංඥාවෝත් උපදනාහු ය. එබැවින් 'මම නො සිතන්නෙම් වීම් නම්, අභිසංඛාර නො කරන්නෙම් වීම් නම් යෙහෙකැ'යි මෙසේ සිතෙක් වෙයි. ගේ නො ද සිතයි. (දහන් නො සමවදී). අභිසංඛාර නො කෙරෙයි. (මතු සමවත් පිණිස කමටහන් නො වඩයි). නො සිතන, අභිසංඛාර නො කරන ඔහුගේ ඒ සංඥාවෝ ද නිරුද්ධ වෙත්. අන් ඕදාරික සංඥාවෝ ද නො උපදිත්. (එසේ වූ ගේ නිරෝධය ස්පර්ශ කෙරෙයි (සංඥාවේදයිත නිරෝධය ලබයි). පොට්ඨපාදය, මෙසේ වනාහි අනුපුබ්බාභිසඤ්ඤානිරෝධසම්පජ්ජන සමාපත්තිය (දන්නහුගේ පිළිවෙළින් සංඥානිරෝධයට සමවැදීම) වෙයි.

පොට්ඨපාදය, එය කිමැ යි සිතහි ද? තා පිසින් පෙරැ මෙබඳු වූ පිළිවෙළින් සංඥානිරෝධයට සමවැදීම ඇසූ විරු ද?"යි (භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.)

"තෙන හෙතුනාපි. එවං ඛො අහං භන්තෙ භගවතො භාසිතං ආජානාමි[1]: යතො ඛො පොට්ඨපාද භික්ඛු ඉධ සඤ්ඤාසීසී හොති, සො තතො අමුත්‍ර තතො අමුත්‍ර අනුපුබ්බෙන සඤ්ඤාගග්ගං ඵුසති. තස්ස සඤ්ඤාගග්ගෙ ඨිතස්ස එවං හොති: 'චෙතයමානස්ස මෙ පාපියො, අචෙතයමානස්ස මෙ සෙය්‍යො. අහඤ්චෙව ඛො පන චෙතෙය්‍යං අභිසඞ්ඛරෙය්‍යං, ඉමා ච මෙ සඤ්ඤා නිරුජ්ඣෙය්‍යුං, අඤ්ඤා ච ඔළාරිකා සඤ්ඤා උප්පජ්ජෙය්‍යුං. යන්නූනාහං න චෙව චෙතෙය්‍යං න ච අභිසඞ්ඛරෙය්‍ය'න්ති. සො න චෙව චෙතෙති. න ච අභිසඞ්ඛරොති. තස්ස අචෙතයතො අනභිසඞ්ඛරොතො[2] තා චෙව සඤ්ඤා නිරුජ්ඣන්ති. අඤ්ඤා ච ඔළාරිකා සඤ්ඤා න උප්පජ්ජන්ති. සො නිරොධං ඵුසති. එවං ඛො පොට්ඨපාද අනුපුබ්බාභිසඤ්ඤානිරොධසමාපජ්ජනසමාපත්ති හොතී"ති.

"එවං ඛො පොට්ඨපාද"ති.

"එකඤ්ඤෙව[3] නු ඛො භන්තෙ භගවා සඤ්ඤාගග්ගං පඤ්ඤපෙති උදාහු පුථු'පි සඤ්ඤාගග්ගෙ පඤ්ඤපෙති ?"ති.

"එකම්පි ඛො අහං පොට්ඨපාද[4] සඤ්ඤාගග්ගං පඤ්ඤපෙමි. පුථු'පි සඤ්ඤාගග්ගෙ පඤ්ඤපෙමි"ති.

"යථාකථං පන භන්තෙ භගවා එකම්පි සඤ්ඤාගග්ගං පඤ්ඤපෙති ? පුථුපි සඤ්ඤාගග්ගෙ පඤ්ඤපෙති ?"ති.

"යථා යථා ඛො පොට්ඨපාද නිරොධං ඵුසති, තථා තථා'ගං[5] සඤ්ඤාගග්ගං පඤ්ඤපෙමි. එවං ඛො අහං පොට්ඨපාද එකම්පි සඤ්ඤාගග්ගං පඤ්ඤපෙමි, පුථු'පි සඤ්ඤාගග්ගෙ පඤ්ඤපෙමි"ති.

"සඤ්ඤා නු ඛො භන්තෙ පඨමං උප්පජ්ජති, පච්ඡා ඤාණං ? උදාහු ඤාණං පඨමං උප්පජ්ජති, පච්ඡා සඤ්ඤා ? උදාහු සඤ්ඤා ච ඤාණඤ්ච අපුබ්බං අචරිමං උප්පජ්ජන්ති ?"ති.

---

1. භගවතා ධම්මං දෙසිතං අනුජානාමීති, ස්‍යා. 2. නාභිසඞ්ඛරොතො, මජ්ඣං.
3. එකං යෙව (කෙසුචි පොත්තකෙසු) 4. පොට්ඨපාද අහං, ස්‍යා.
5. තථා අහං, ස්‍යා.

"වහන්ස, මේය නැත් ම ය. (නො ඇසූ විරු ම ය). පොට්ඨපාදය, යම් මහණෙක් මේහි සඤ්ඤකසංඥ ඇත්තේ (තමාගේ ප්‍රථමධ්‍යාන සංඥයෙන් සංඥවත්) වේ ද, හේ එයින් මතුමත්තෙහි දෙවෙනි ධ්‍යානයට ද, එයිනුත් මත්තෙහි තෙවෙනි ධ්‍යානයට ද යි මේසේ පිළිවෙළින් (ගොස්) කෙළවරැ සංඥාග්‍රය (ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය) ලබයි. සංඥාග්‍රයෙහි සිටි ඔහුට 'සිතන්නා වූ (=දහන් සම්වදනා වූ) මාගේ ඒ ක්‍රියාව ලාමක ය. නො සිතන (දහන් නොසම්වදන) මාගේ ඒ නොසම්වැදීම උතුම්. මම වූ කලි සිතන්නෙම් නම් (පුන පුනා දහන් සම්වදින්නෙම නම්), මතු සම්වත් පිණිස අභිසංඛාර කරන්නෙම් නම් (කම්වහන් වඩන්නෙම් නම්), මාගේ මේ සංඥවෝත් නිරුද්ධ වන්නාහ. අන් ඕදාරික (ගවාඛක) සංඥවෝත් උපදනාහ. එබැවින් මම නො සිතන්නෙම් වීම් නම්, අභිසංඛාර නො කරන්නෙම් වීම් නම්, යෙහෙකැ'යි මේසේ සිතෙක් වෙයි. හේ නො ද සිතයි (දහන් නො සම්වදී). අභිසංඛාර නො කෙරෙයි. (මතු සම්වත් පිණිස කම්වහන් නො වඩයි). නො සිතන අභිසංඛාර නො කරන ඔහුගේ ඒ සංඥවෝ ද නිරුද්ධ වෙත්. අන් ඕදාරික සංඥවෝ ද පහළ නො වෙත්. එසේ වූ හේ නිරෝධය ස්පර්ශ කෙරෙයි. (සංඥාවේදයිතනිරෝධය ලබයි). පොට්ඨපාදය, මේසේ වනාහි අනුපුබ්බාභිසඤ්ඤානිරෝධසමාපජ්ජනසමාපත්තිය (පිළිවෙළින් සංඥානිරෝධයට සම්වැදීම) වේ' යැ යි වහන්ස, මෙසේ ම මම භාග්‍යවතුන් වහන්සේ වදාළ දනිමි"යි පොට්ඨපාද තෙම කී ය.

"පොට්ඨපාදය, එසේ ම යැ"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

[පොට්ඨපාද:] "වහන්ස, භාග්‍යවතුන් වහන්සේ එක ම සංඥාග්‍රයක් පණවන සේක් ද? නැතහොත් බොහෝ සංඥාග්‍රයනුත් පණවන සේක් ද?".

[භාග්‍යවතුන් වහන්සේ:] "පොට්ඨපාදය, මම එක් සංඥාග්‍රයකුත් පණවමි. බොහෝ සංඥාග්‍රත් පණවමි".

[පොට්ඨපාද:] "වහන්ස, භාග්‍යවතුන් වහන්සේ කෙසේ නම් එක ම සංඥාග්‍රයකුත් පණවන සේක් ද? බොහෝ සංඥාග්‍රත් පණවන සේක් ද?".

[භාග්‍යවතුන් වහන්සේ:] "පොට්ඨපාදය, යම් යම් පරිද්දෙකින් (යම් යම් කසිණාදි අරමුණෙකින් හෝ යම් යම් ප්‍රථමධ්‍යානාදි ධ්‍යානයෙකින්) මහණ තෙම නිරෝධය ස්පර්ශ කෙරේ ද, එසේ එසේ (ඒ ඒ කසිණාදියෙන් ඒ ඒ ධ්‍යානයෙන් මම එක් සංඥාග්‍රයක් පණවමි. බොහෝ සංඥාග්‍රත් පණවමි."

[පොට්ඨපාද:] "වහන්ස, (නිරෝධයෙන් නැගී සිටුනාහට අර්හත්ඵලසංඥාව පළමු වත් ප්‍රත්‍යවේක්ෂණය පසු වත් උපදී ද? නැත හොත් ප්‍රත්‍යවේක්ෂණය පළමු වත් අර්හත්ඵලසංඥාව පසු වත් උපදී ද? නොහොත් අර්හත්ඵලසංඥාවත් ප්‍රත්‍යවේක්ෂණයත් යන දෙක ම ඉදිරි පසු නො ව එක්විට ම උපදී ද?".

"සඤ්ඤී ඛො පොට්ඨපාද පඨමං උපපජ්ජති පච්ඡා ඤාණං. සඤ්ඤුප්පාදා ච පන ඤාණුප්පාදො හොති. සො එවං පජානාති: ඉදපච්චයා කිර මෙ ඤාණං උදපාදීති. ඉමිනා[1] ඛො එතං පොට්ඨපාද පරියායෙන වෙදිතබ්බං, යථා සඤ්ඤී පඨමං උපපජ්ජති පච්ඡා ඤාණං, සඤ්ඤුප්පාදා ච පන ඤාණුප්පාදො හොතී"ති.

"සඤ්ඤී නු ඛො භන්තෙ පුරිසස්ස අත්තා? උදාහු අඤ්ඤො සඤ්ඤී, අඤ්ඤො අත්තා?"ති.

"කිං පන[2] ත්වං පොට්ඨපාද අත්තානං පච්චෙසි?"ති.

"ඔළාරිකං ඛො අහං භන්තෙ අත්තානං පච්චෙමි රූපිං චාතුම්මහාභූතිකං[3] කබළීකාරාහාරභක්ඛන්ති"[4].

"ඔළාරිකො ච හි තෙ පොට්ඨපාද අත්තා අභවිස්ස රූපි චාතුම්මහාභූතිකො[3] කබළීකාරාහාරභක්ඛො,[4] එවං සන්තං ඛො තෙ පොට්ඨපාද අඤ්ඤො'ව[5] සඤ්ඤී භවිස්සති,[6] අඤ්ඤො අත්තා[7]. තදමිනාපෙතං[8] පොට්ඨපාද පරියායෙන වෙදිතබ්බං, යථා අඤ්ඤො'ව සඤ්ඤී භවිස්සති, අඤ්ඤො අත්තා.

තිට්ඨතෙවායං[9] පොට්ඨපාද ඔළාරිකො අත්තා රූපි චාතුම්මහාභූතිකො කබළීකාරාහාරභක්ඛො. අථ ඉමස්ස පුරිසස්ස අඤ්ඤො'ව සඤ්ඤී උපපජ්ජති[10] අඤ්ඤො'ව සඤ්ඤී නිරුජ්ඣති[11]. ඉමිනා[12] ඛො එතං පොට්ඨපාද පරියායෙන වෙදිතබ්බං, යථා අඤ්ඤො'ව සඤ්ඤී භවිස්සති, අඤ්ඤො අත්තා"ති.

"මනොමයං ඛො අහං භන්තෙ අත්තානං පච්චෙමි සබ්බඞ්ගපච්චඞ්ගිං[13] අහීනින්ද්‍රියන්ති".

"මනොමයො ච හි තෙ පොට්ඨපාද අත්තා අභවිස්ස සබ්බඞ්ගපච්චඞ්ගී අහීනින්ද්‍රියො, එවං සන්තම්පි ඛො තෙ පොට්ඨපාද අඤ්ඤො'ව සඤ්ඤී භවිස්සති, අඤ්ඤො අත්තා. තදමිනාපෙතං පොට්ඨපාද පරියායෙන වෙදිතබ්බං, යථා අඤ්ඤො'ව සඤ්ඤී භවිස්සති, අඤ්ඤො අත්තා".

"තිට්ඨතෙවායං පොට්ඨපාද මනොමයො අත්තා සබ්බඞ්ගපච්චඞ්ගී අහීනින්ද්‍රියො. අථ ඉමස්ස පුරිසස්ස අඤ්ඤො'ව සඤ්ඤී උපපජ්ජති, අඤ්ඤො'ව සඤ්ඤී නිරුජ්ඣති. ඉමිනාපි ඛො එතං පොට්ඨපාද පරියායෙන වෙදිතබ්බං, යථා අඤ්ඤො'ව සඤ්ඤී භවිස්සති, අඤ්ඤො අත්තා'ති".

---

1. ඉමිනා ච ඛො එතං, මජ්ඣං. ඉමිනාපෙතං, PTS. 2. කිං, සීමු.
3. චාතුම්මහාභූතිකං, මජ්ඣං. 4. කබළීකාරාහාරං, සයා. 5. ච, සයා.
6. අභවිස්ස, සීමු. 7. අත්තානි, සීමු. 8. තදමිනා, PTS.
9. තිට්ඨතෙ ච, අයං. 10. උපපජ්ජති, සයා. 11. නිරුජ්ඣති, සයා.
12. ඉමිනාපි ඛො, PTS. 13. පච්චඞ්ගං, සයා.

[භාග්‍යවත්හු:] "පොට්ඨපාදය, අර්හත්ඵලසංඥාව වනාහි පළමු ව උපදී. ප්‍රත්‍යවේක්ෂාඥානය පසු ව උපදී. අර්හත්ඵලසංඥාවගේ ද ඉපැද්මෙන් ප්‍රත්‍යවේක්ෂාඥානයාගේ ඉපැද්ම වේ. හෙ තෙම මේ අර්හත්ඵලසමාධිසංඥා හෙතුයෙන් 'මට ප්‍රත්‍යවේක්ෂාඥානය උපනැ'සි දැන ගනී. පොට්ඨපාදය, 'සංඥාව පළමු ව ද ඥානය පසු ව ද උපදී. සංඥාවගේ ඉපැද්මෙන් වනාහි ඥානයාගේ ඉපැද්ම වේ' ය යනු මෙසේ මේ කරුණින් දත යුතු".

[පොට්ඨපාද:] "වහන්ස, සංඥාව පුරුෂයාගේ ආත්මය ද? නැතහොත් සංඥාව අනෙකෙකුත් ආත්මය වෙන එකෙකුත් වේ ද?".

[භාග්‍යවත්හු:] "පොට්ඨපාදය, තෝ කුමක් නම් ආත්මය කොට සලකයි ද?".

[පොට්ඨපාද:] "වහන්ස, සතර මහාභූතයන්ගෙන් නිපන් කබලීකාර ආහාරය බුදිනා රූපවත් වූ ඖදාරික දෙයක් ආත්ම කොට සලකමි".

[භාග්‍යවත්හු:] "පොට්ඨපාදය, තෑගේ ආත්මය සතර මහාභූතයන්ගෙන් නිපන් කබලීකාර ආහාරය බුදිනා රූපවත් ඖදාරික දෙයෙක් වන්නේ නම්, මෙසේ ඇති කල්හි තොපට සංඥාව අනෙකෙකුත් ආත්මය වෙන එකෙකුත් වන්නේ ය. පොට්ඨපාදය, මේ කරුණිනුත් 'සංඥාව අනෙකෙකුත් ආත්මය වෙන එකෙකුත් වන්නේ ය' යන මෙය දත යුතු".

පොට්ඨපාදය, සතර මහාභූතයන්ගෙන් උපන් රූපවත් වූ කබලීකාර ආහාර බුදිනා ඒ මේ ආත්මය සිටිමා. වැලි පුරුෂයාට අන්‍ය වූ ම සංඥාවෝ උපදිත්. අන්‍ය වූ ම සංඥාවෝ නිරුද්ධ වෙත්. පොට්ඨපාදයෙනි, 'සංඥාව අනෙකෙක් ම වන්නේ ය, ආත්මය වෙන එකෙක් ම වන්නේ ය' යන මෙය මේ කරුණිනුත් දත යුතු".

[පොට්ඨපාද:] "වහන්ස, මම ආත්මය සියලු අඟපසඟ ඇති, නො පිරිහුණු ඉඳුරන් ඇති මනොමය දෙයක් කොට සලකමි".

[භාග්‍යවත්හු:] "පොට්ඨපාදය, තෑගේ ආත්මය සියලු අඟපසඟ ඇති, නොපිරිහුණු ඉඳුරන් ඇති මනොමය දෙයෙක් වන්නේ නම්, එසේ ඇති කල්හි ද තොපට සංඥාව අනෙකෙක් ම ආත්මය වෙන එකෙක් ම වන්නේ ය. පොට්ඨපාදය, මේ කරුණිනුත් 'සංඥාව අනෙකෙකුත් ආත්මය වෙන එකෙකුත් වන්නේ ය' යන මෙය දත යුතු".

පොට්ඨපාදය, සියලු අඟපසඟ ඇති, නොපිරිහුණු ඉඳුරන් ඇති මේ මනොමය ආත්මය සිටිමා. වැලි මේ පුරුෂයාට අන්‍ය වූ ම සංඥාවෝ උපදිත්. අන්‍ය වූ ම සංඥාවෝ නිරුද්ධ වෙත්. පොට්ඨපාදයෙනි, 'සංඥාව අනෙකෙක් ම ද ආත්මය වෙන එකෙක් ම ද වන්නේ ය' යන මෙය මේ කරුණිනුත් දත යුතු".

"අරූපිං ඛො අහං භන්තෙ අත්තානං පඤ්ඤපෙමි සඤ්ඤීමයන්ති"

"අරූපි ච තෙ පොට්ඨපාද අත්තා අභවිස්ස සඤ්ඤීමයො, එවං සන්තම්පි ඛො තෙ පොට්ඨපාද අඤ්ඤ'ව සඤ්ඤී භවිස්සති. අඤ්ඤො අත්තා. තදමිනාපෙතං පොට්ඨපාද පරියායෙන වෙදිතබ්බං යථා අඤ්ඤ'ව සඤ්ඤී භවිස්සති, අඤ්ඤො අත්තා. තිට්ඨතෙවායං පොට්ඨපාද අරූපි අත්තා සඤ්ඤීමයො. අථ ඉමස්ස පුරිසස්ස අඤ්ඤ'ව සඤ්ඤී උප්පජ්ජන්ති, අඤ්ඤ'ව සඤ්ඤී නිරුජ්ඣන්ති. ඉමිනාපි ඛො එතං පොට්ඨපාද පරියායෙන වෙදිතබ්බං යථා අඤ්ඤ'ව සඤ්ඤී භවිස්සති, අඤ්ඤො අත්තා'ති".

"සක්කා පන භන්තෙ මයා ඤාතුං සඤ්ඤී පුරිසස්ස අත්තා'ති වා, අඤ්ඤො සඤ්ඤී, අඤ්ඤො[1] අත්තා'ති ?".

"දුජ්ජානං ඛො එතං පොට්ඨපාද තයා අඤ්ඤදිට්ඨිකෙන අඤ්ඤ-ඛන්තිකෙන අඤ්ඤරුචිකෙන අඤ්ඤත්‍රායොගෙන[3] අඤ්ඤත්‍රාචරියකෙන[4] සඤ්ඤී පුරිසස්ස අත්තා'ති වා, අඤ්ඤො සඤ්ඤී, අඤ්ඤො අත්තා'ති වා"ති.

"සචෙ තං භන්තෙ මයා දුජ්ජානං අඤ්ඤදිට්ඨිකෙන අඤ්ඤඛන්ති-කෙන අඤ්ඤරුචිකෙන අඤ්ඤත්‍රායොගෙන අඤ්ඤත්‍රාචරියකෙන 'සඤ්ඤී පුරිසස්ස අත්තා'ති වා, 'අඤ්ඤො සඤ්ඤී, අඤ්ඤො අත්තා'ති වා. 'කිං පන භන්තෙ සස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති ?".

"අබ්‍යාකතං[5] ඛො එතං පොට්ඨපාද මයා: සස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති".

"කිං පන භන්තෙ අසස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝ-මඤ්ඤන්ති ?".

"එතම්පි ඛො පොට්ඨපාද මයා අබ්‍යාකතං 'අසස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති".

"කිං පන භන්තෙ අන්තවා ලොකො. ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති ?".

"එතම්පි ඛො පොට්ඨපාද මයා අබ්‍යාකතං 'අන්තවා ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති ?".

"කිං පන භන්තෙ අනන්තවා ලොකො. ඉදමෙව සච්චං මොඝ-මඤ්ඤන්ති ?".

"එතම්පි ඛො පොට්ඨපාද මයා අබ්‍යාකතං 'අනන්තවා ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති ?".

---

1. අඤ්ඤ ච, සී. 2. අඤ්ඤ ච, සී. 3. අඤ්ඤඤ්ඤ ආලයොගෙන, සී.
4. අඤ්ඤඤ්ඤාචරියකෙන, සී. 5. අව්‍යාකතං, සබ්බත්ථ.

[පොට්ඨපාද:] "වහන්ස, මම ආත්මය සංඥමය වූ අරූපී දෙයක් කොට සලකමි".

[භාග්‍යවත්හු:] "පොට්ඨපාදය, තාහට ආත්මය සංඥමය අරූපී දෙයක් වන්නේ නම්, මෙසේ ඇති කල්හි ද සංඥව අනෙකෙක් ම ද, ආත්මය වෙත එකෙක් ම ද වන්නේ ය. පොට්ඨපාදය, 'සංඥව අනෙකෙක් ම වන්නේ ය, ආත්මය වෙත එකෙක් ම වන්නේ ය' යන මෙය මේ කරුණිනුත් දත යුතු. පොට්ඨපාදය, මේ සංඥමය වූ අරූපී ආත්මය සිටිවා. එසේ කලෑ මේ පුරුෂයාට අන්‍ය ම සංඥවෝ උපදිත්. අන්‍ය ම සංඥවෝ නිරුද්ධ වෙත්. පොට්ඨපාදය, 'සංඥව අන් එකෙක් ම ද ආත්මය වෙත එකෙක් ම ද වන්නේය' යන මෙය මේ කාරණ-යෙනුත් මෙසේ දත යුතු".

[පොට්ඨපාද:] "වහන්ස, 'සංඥව පුරුෂයාගේ ආත්මය ද, නොහොත් සංඥව එකෙකුත් ආත්මය අනෙකෙකුත් වේ ද' යන මෙය මා විසින් දත ගන්නට හැකි ද?".

[භාග්‍යවත්හු:] "පොට්ඨපාදය, අන්‍යදෘෂ්ටික වූ අන්‍යලබ්ධික වූ අන්‍ය රුචික වූ, අන්‍ය ප්‍රතිපත්තියෙක යෙදුණු අන්‍ය තීර්ථායතනයෙක ආචාර්‍යවූ තා විසින් 'සංඥව පුරුෂයාගේ ආත්මය ද'යි හෝ 'සංඥව අනෙකෙක, ආත්මය අනෙකෙකැ'යි හෝ මෙය දත නො හැක්ක".

[පොට්ඨපාද:] 'වහන්ස, ඉඳින් අන්‍යදෘෂ්ටික වූ අන්‍යලබ්ධික වූ අන්‍යරුචික වූ, අන්‍ය ප්‍රතිපත්තියෙක යෙදුණු අන්‍ය තීර්ථායතනයෙක ආචාර්‍යවූ මා විසින් 'සංඥව පුරුෂයාගේ ආත්මය ද? නැත හොත් සංඥව අනෙකෙකුත් ආත්මය වෙත එකෙකුත් වේද' යි හෝ මෙය නො දත හැකි නම්, කිමෙක් ද වහන්ස, 'ලෝකය (ආත්මය) ශාශ්වතය' යන මේ කිම සත්‍ය ද (මෙයට වෙතත්) සෙසු කිම් හිස් (අසත්‍ය) ද?".

[භාග්‍යවත්හු:] පොට්ඨපාදය, 'ලෝකය ශාශ්වත ය' යන මෙය ම සත්‍ය ය, 'සෙස්ස හිස් යැ'යි මෙය මා විසින් නො පවසන ලදි.

[පොට්ඨපාද:] "වහන්ස, කිම? 'ලෝකය (ආත්මය) අශාශ්වත ය' යන මෙය ම සත්‍ය ද? මෙයින් අන්‍ය සෙසු කිම් හිස් ද?".

[භාග්‍යවත්හු:] "පොට්ඨපාදය, ලෝකය අශාශ්වත ය, මෙය ම සත්‍ය ය. සෙස්ස හිස් යැ'යි මෙය ද මා විසින් නො පවසන ලදි.

[පොට්ඨපාද] "වහන්ස, කිමෙක් ද? ලෝව (ආත්මය) අන්තවත් ද? මෙය ම සත්‍ය ද? සෙස්ස හිස් ද?".

[භාග්‍යවත්හු:] පොට්ඨපාදය, ලෝව (ආත්මය) අන්තවත් ය, මෙය ම සත්‍ය ය, සෙස්ස හිස් යැ'යි මෙය ද මා විසින් නො පවසන ලදි",

[පොට්ඨපාද:] "වහන්ස, කිම ලෝව (ආත්මය) අනන්ත ද? මෙය ම (මේ ලෝව අනන්තය යන්න ම) සත්‍ය ද? සෙස්ස හිස් ද?".

[භාග්‍යවත්හු:] "පොට්ඨපාදය, 'ලෝව අනන්ත ය, මෙය ම සත්‍ය ය. සෙස්ස හිස් යැ' යන මෙය ද මා විසින් නො පවසන ලදි".

"කිං පන භන්තෙ තං ජීවං තං සරීරං. ඉදමේව සච්චං මොඝ-මඤ්ඤන්තී ?".

"එතම්පි ඛො පොට්ඨපාද මයා අබ්‍යාකතං 'තං ජීවං තං සරීරං ඉදමේව සච්චං මොඝමඤ්ඤන්තී".

"කිං පන භන්තෙ අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං. ඉදමේව සච්චං මොඝමඤ්ඤන්තී?".

"එතම්පි ඛො පොට්ඨපාද මයා අබ්‍යාකතං 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං. ඉදමේව සච්චං මොඝමඤ්ඤන්තී".

"කිං පන භන්තෙ හොති තථාගතො පරම්මරණා. ඉදමේව සච්චං මොඝමඤ්ඤන්තී ?".

"එතම්පි ඛො පොට්ඨපාද මයා අබ්‍යාකතං. 'හොති තථාගතො පරම්මරණා. ඉදමේව සච්චං මොඝමඤ්ඤන්තී".

"කිං පන භන්තෙ න හොති තථාගතො පරම්මරණා. ඉදමේව සච්චං මොඝමඤ්ඤන්තී ?".

"එතම්පි ඛො පොට්ඨපාද මයා අබ්‍යාකතං 'න හොති තථාගතො පරම්මරණා. ඉදමේව සච්චං මොඝමඤ්ඤන්තී".

"කිං පන භන්තෙ හොති ච න හොති ච තථාගතො පරම්මරණා. ඉදමේව සච්චං මොඝමඤ්ඤන්තී ?".

"එතම්පි ඛො පොට්ඨපාද මයා අබ්‍යාකතං 'හොති ච න හොති ච තථාගතො පරම්මරණා. ඉදමේව සච්චං මොඝමඤ්ඤන්තී".

"කිං පන භන්තෙ නෙව හොති න න හොති තථාගතො පරම්මරණා. 'ඉදමේව සච්චං මොඝමඤ්ඤන්තී ?".

"එතම්පි ඛො පොට්ඨපාද මයා අබ්‍යාකතං 'නෙව හොති න න හොති තථාගතො පරම්මරණා. ඉදමේව සච්චං මොඝමඤ්ඤන්තී".

[පොට්ඨපාද:] "වහන්ස, කිමෙක් ද? ජීවයත් ශරීරයත් එකෙක් ම ද? මෙය ම සත්‍ය ද? සෙස්ස මිථ්‍යා ද?".

[භාග්‍යවත්හු:] "පොට්ඨපාදය, 'ජීවයත් ශරීරයත් එකෙක් ම ය, මෙය ම සත්‍ය ය, සෙසු සියල්ල මිථ්‍යා ය' යන මෙය ද මා විසින් නො-පවසන ලදි".

[පොට්ඨපාද:] "වහන්ස, කිමෙක් ද? ජීවයත් ශරීරයත් වෙන් වෙන් වූ දෙදෙනෙක් ද? මෙය ම සත්‍ය ද? සෙසු සියල්ල මිථ්‍යා ද?".

[භාග්‍යවත්හු:] "පොට්ඨපාදය, 'ජීවයත් ශරීරයත් වෙන් වෙන් වූ දෙදෙනෙකැ යි, මෙය ම සත්‍ය යැ යි, අන් සියල්ල මිථ්‍යා යැ' යි මෙය ද මා විසින් නො පවසන ලදි'.

[පොට්ඨපාද:] "වහන්ස, සත්ත්ව (ආත්ම) තෙම මරණින් මත්තෙහි වේ ද? මෙය ම සත්‍ය ද? (මෙයට විරුද්ධ) සෙසු සියල්ල මිථ්‍යා ද?".

[භාග්‍යවත්හු:] "පොට්ඨපාදය, සත්ත්ව (ආත්ම) තෙම මරණින් මත්තෙහි වේ යැ යි, මෙය ම සත්‍ය යැ යි, සෙසු සියල්ල මිථ්‍යා'යි මෙය ද මා විසින් නො පවසන ලදි".

[පොට්ඨපාද:] "වහන්ස, කිමෙක් ද? සත්ත්ව (ආත්ම) තෙම මරණින් මතු නො වේ ද? මෙය ම සත්‍ය ද? සෙසු සියල්ල මිථ්‍යා ද?".

[භාග්‍යවත්හු:] පොට්ඨපාදය, 'සත්ත්ව (ආත්ම) තෙම මරණින් මතු නො වේ ය, මෙය ම සත්‍ය ය, සෙසු සියල්ල මිථ්‍යා ය' යන මෙය ද මා විසින් නො පවසන ලදි".

[පොට්ඨපාද:] "වහන්ස, කිම, තථාගත (සත්ත්ව) තෙම මරණින් මතු වන්නේත් නොවන්නේත් වේ ද? මෙය ම සත්‍ය ද? සෙස්ස මිථ්‍යා ද?".

[භාග්‍යවත්හු:] "පොට්ඨපාදය, 'තථාගත (සත්ත්ව) තෙම මරණින් මතු වන්නන්ත් නො වන්නේත් වේ. මෙය ම සත්‍ය ය, සෙස්ස මිථ්‍යා ය' යන මෙය ද මා විසින් නො පවසන ලදි".

[පොට්ඨපාද:] "වහන්ස, කිමෙක් ද? තථාගත (සත්ත්ව) තෙම මරණින් මතු නො ම වන්නේත් නො ම නොවන්නේත් වේ ද? මෙය ම සත්‍ය ද? සෙස්ස මිථ්‍යා ද?".

[භාග්‍යවත්හු:] "පොට්ඨපාදය, තථාගත තෙම මරණින් මතු නො ම වන්නේත් නො ම නොවන්නේත් වේ යැ යි ද, මෙය ම සත්‍ය යැ යි සෙස්ස මිථ්‍යා යැ යි ද යන මෙයත් මා විසින් නො පවසන ලදි".

කස්මා පනෙතං භගෙන භගවතා අබ්‍යාකතන්ති ?

න හෙතං පොට්ඨපාද අත්ථසංහිතං න ධම්මසංහිතං නාදිබ්‍රහ්මචරියකං න නිබ්බිදාය න විරාගාය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බානාය සංවත්තති. තස්මා තං මයා අබ්‍යාකතන්ති.

"ඉදං දුක්ඛන්ති' ඛො පොට්ඨපාද මයා බ්‍යාකතං. 'අයං දුක්ඛ-සමුදයො'ති ඛො පොට්ඨපාද මයා බ්‍යාකතං. 'අයං දුක්ඛනිරොධො'ති ඛො පොට්ඨපාද මයා බ්‍යාකතං. 'අයං දුක්ඛනිරොධගාමිනීපටිපදා'ති ඛො පොට්ඨපාද මයා බ්‍යාකතන්ති".

"කස්මා පනෙතං භගෙන භගවතා බ්‍යාකතන්ති ?".

"එතං හි ඛො පොට්ඨපාද අත්ථසංහිතං එතං ධම්මසංහිතං එතං ආදිබ්‍රහ්මචරියකං. එතං නිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති. තස්මා එතං මයා බ්‍යාකතන්ති".

"එවමෙතං භගවං, එවමෙතං සුගත, යස්සදානි භගෙන භගවා කාලං මඤ්ඤති"ති.

අථ ඛො භගවා උට්ඨායාසනා පක්කාමි.

අථ ඛො තෙ පරිබ්බාජකා අචිරපක්කන්තස්ස භගවතො පොට්ඨපාදං පරිබ්බාජකං සම්පත්තතො වාචාසත්තිතොදකෙන[1] සඤ්ඡම්භරිං[2] අකංසු: "එවමෙව පනායං භවං පොට්ඨපාදො යඤ්ඤදෙව සමණො ගොතමො භාසති තං තදෙවස්ස අබ්භනුමොදති. 'එවමෙතං භගවං, එවමෙතං සුගතා'ති. න ඛො පන මයං කිඤ්චි සමණස්ස ගොතමස්ස එකංසිකං, ධම්මං දෙසිතං ආජානාම: සස්සතො ලොකො'ති වා අසස්සතො ලොකො'ති වා, අන්තවා ලොකො'ති වා, අනන්තවා ලොකො'ති වා, තං ජීවං තං සරීරන්ති වා, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා, හොති තථාගතො පරම්මරණා'ති වා, න හොති තථාගතො පරම්මරණා'ති වා, හොති ච න ච හොති තථාගතො පරම්මරණා'ති වා, නෙව හොති න න හොති තථාගතො පරම්මරණා'ති වා"ති.

---

1. වාචාසත්තිතොදකෙති, (ක්‍රස්ථ්.) වාචාය සත්තිතොදකෙන, සීමු.
2. සඤ්ඡම්භරිං. මිජසං

[පොට්ඨපාද:] "වහන්ස, කවර හෙයින් භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය නො පවසන ලද ද?".

[භාග්‍යවත්හු:] "පොට්ඨපාදයෙනි, මේ (ලොව ශාශ්වතය යන ආදී) දෘෂ්ටි දෙලෝවැඩ හෝ අත්වැඩ පරවැඩ අසළේ නො වෙයි. ලොවුතුරු දහම් අසළේ නො වෙයි. සසුන් බඹසරෙහි ආදිය වූ අධිශීල ශික්ෂා මාත්‍රයෙකුත් නො වෙයි. සසරැ කලකිරෙනු පිණිස, සසරැ නො ඇලෙනු පිණිස, සසර ගමන නවත්වනු පිණිස, සසරවට සංහිඳුවනු පිණිස, සසරවට පසක් කරනු පිණිස, සසරවට අවබොධ කරනු පිණිස, අමා මහනිවන් පසක් කරනු පිණිස නො පවතී. එහෙයින් එය මා විසින් නො පවසන ලදි

[භාග්‍යවත්හු:] "පොට්ඨපාදයෙනි, දුක් නම් මේ මැ යි මා විසින් කියන ලදි. දුඃඛසමුදය නම් මේ මැ යි, දුඃඛනිරෝධය නම් මේ මැ යි, දුඃඛනිරෝධයට යන පිළිවෙත නම් මේ මැ යි මා විසින් කියන ලදි.

[පොට්ඨපාද:] "වහන්ස, කවර හෙයින් භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදරන ලද ද?"

[භාග්‍යවත්හු:] "පොට්ඨපාදයෙනි, මෙය ම දෙලෝ වැඩ ද අත්වැඩ පරවැඩ ද අසළේ වෙයි. මේ ම ලොවුතුරු දහම් අසළේ වෙයි. මෙය (දැනුම) සසුන්බඹසරට ආදි වූ අධිශීලශික්ෂාව වැඩීම පිණිස පවත්නේ වෙයි. මෙය ම සසරැ කලකිරීම පිණිස, සසරැ නොඇල්ම පිණිස, දුක් නසනු පිණිස, දුක් සංහිඳුවනු පිණිස, දුක් පසක් කරනු පිණිස, සසරවට දැන ගනු පිණිස, අමා මහ නිවන් පසක් කරනු පිණිස පවතී. එහෙයින් මෙය මා විසින් කියන ලදි."

[පොට්ඨපාද:] "භාග්‍යවතුන් වහන්ස, ඒ එසේ ය. සුගතයන් වහන්ස, ඒ එසේ ය. භාග්‍යවතුන් වහන්සේ යම් පිණ්ඩපාත ගමනකට කලෑ යි හඟිතා සේක් ද, දැන් එයට කාලය ය."

ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ හුනස්නෙන් නැගී නික්ම සේක.

එකල්හි ඒ පිරිවැජියෝ භාග්‍යවතුන් වහන්සේ නික්මෑ වැඩි නොබෝ වේලායෙහි පොට්ඨපාද පිරිවැජියාට හාත්පසින් වටන කැමැති අඩයපියෙන් මතුමත්තෙහි අනින්නාහු 'මහණ ගොයුම් යමක් කියා නම්, 'ඒ එසේ ය, භාග්‍යවතුන් වහන්ස, ඒ එසේ ය, සුගතයන් වහන්සැ' යි ඔහුගේ ඒ ඒ හැම වචනයක් ම සතුටින් පිළිගනී. 'ලොකය (ආත්මය) ශාශ්වත යැ' යි කියා හෝ, 'ලොකය අශාශ්වතයැ' යි කියා හෝ' ලොකය (ආත්මය) අන්තවත් යැ'යි කියා හෝ 'ලොකය අනන්ත යැ' යි කියා හෝ, ශරීරයත් ජීවයත් එකෙක් මැ යැ' යි කියා හෝ, 'ඒ වෙන් වෙන් දෙකෙක් මැ යැ' යි කියා හෝ, සත්ත්වයා (ආත්මය) මරණින් මතු වෙතැ' යි කියා හෝ 'නො වෙතැ යි' කියා හෝ 'වන්නේත් නොවන්නේත් ඇතැ' යි කියා හෝ 'නොම වන්නේත් නො ම නොවන්නේත් ඇතැ' යි කියා හෝ මහණ ගොයුම්හු එකාන්ත කොට දෙසූ කිසි දහමක් අපි නො දනිමු"යි කීහ.

එවං වුත්තෙ පොට්ඨපාදො පරිබ්බාජකො තෙ පරිබ්බාජකෙ එතදවොච: "අහම්පි ඛො භො න කිඤ්චි සමණස්ස ගොතමස්ස එකංසිකං ධම්මං දෙසිතං ආජානාමි: 'සස්සතො ලොකො'ති වා 'අසස්සතො ලොකො'ති වා -පෙ- 'නෙව හොති න න හොති තථාගතො පරම්මරණා'ති වා. අපි ච සමණො ගොතමො භූතං තච්ඡං තථං පටිපදං පඤ්ඤපෙති[1] ධම්මට්ඨිතං[2] ධම්මනියාමකං[3]. භූතං ඛො පන තච්ඡං තථං පටිපදං පඤ්ඤපෙන්තස්ස ධම්මට්ඨිතං ධම්මනියාමකං. කථං හි නාම මාදිසො විඤ්ඤූ සමණස්ස ගොතමස්ස සුභාසිතං සුභාසිතතො නාභිනන්දෙය්‍යා'? ති.

අථ ඛො දීඝතපස්ස අච්චයෙන විත්තො ච ගහපතිසාරිපුත්තො පොට්ඨපාදො ච පරිබ්බාජකො යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා විත්තො ගහපතිසාරිපුත්තො භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. පොට්ඨපාදො පන පරිබ්බාජකො භගවතා සද්ධිං සම්මොදි සම්මොදනීයං කථං සාරණීයං[4] වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො පොට්ඨපාදො පරිබ්බාජකො භගවන්තං එතදවොච: තදා මං භන්තෙ තෙ පරිබ්බාජකා අච්චිරපක්කන්තස්ස භගවතො සම්මුඛතො වාචාසත්තිතොදකෙන සඤ්ජම්භරිං අකංසු: එවමෙව පනායං භවං පොට්ඨපාදො යඤ්ඤදෙව සමණො ගොතමො භාසති, තං තදෙවස්ස අභිනන්දති 'එවමෙතං භගවා, එවමෙතං සුගතා'ති. න ඛො පන මයං කිඤ්චි සමණස්ස ගොතමස්ස එකංසිකං ධම්මං දෙසිතං ආජානාම: 'සස්සතො ලොකො'ති වා 'අසස්සතො ලොකො'ති වා, 'අන්තවා ලොකො'ති වා, 'අනන්තවා ලොකො'ති වා, 'තං ජීවං තං සරීරන්ති'වා 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති' වා, 'හොති තථාගතො පරම්මරණා'ති වා, 'න හොති තථාගතො පරම්මරණා'ති වා, 'හොති ච න හොති ච තථාගතො පරම්මරණා'ති වා, 'නෙව හොති න න හොති තථාගතො පරම්මරණා'ති'වා ති. එවං වුත්තො'හං භන්තෙ තෙ පරිබ්බාජකෙ එතදවොචං: "අහම්පි ඛො භො න කිඤ්චි සමණස්ස ගොතමස්ස එකංසිකං ධම්මං දෙසිතං ආජානාමි 'සස්සතො ලොකො'ති වා, 'අසස්සතො ලොකො'ති වා -පෙ- 'නෙව හොති න න හොති තථාගතො පරම්මරණා'ති වා. අපි ච සමණො ගොතමො භූතං තච්ඡං තථං පටිපදං පඤ්ඤපෙති[1] ධම්මට්ඨිතං[5] ධම්මනියාමකං[6] භූතං ඛො පන තච්ඡං තථං පටිපදං පඤ්ඤපෙන්තස්ස ධම්මට්ඨිතං[5] ධම්මනියාමකං[6]. කථං හි නාම මාදිසො විඤ්ඤූ සමණස්ස ගොතමස්ස සුභාසිතං සුභාසිතතො නාභිනන්දෙය්‍යා?" ති.

---

1. පඤ්ඤපෙති, සොළස්. 2 ධම්මට්ඨිතතං, සීමු 3 ධම්මනියාමතං, සීමු.
4 සාරණීයං, මජ්ඣ. සංරඤ්ජනීයං (මහායාන පොත්හි)
5. ධම්මට්ඨිතං, PTS. ධම්මට්ඨිතතං, සීමු.
6. ධම්මනියාමතං, සීමු. ධම්මනියාමකං PTS. (හඳුපාදකං, ටීකා.)

මෙසේ කී කල්හි පොට්ඨපාද පිරිව්‍රාජ තෙම "භවත්නි, ලෝකය ශාශ්වත යැ' යි හෝ 'ලෝකය අශාශ්වත යැ' යි හෝ... 'සත්ත්ව (ආත්ම) තෙම මරණින් මතු නො ම වන්නේත් වේ, නො ම නොවන්නේත් වේ යැ'යි හෝ මහණ ගොයුම් වහන්සේ විසින් එකාන්ත කොට දෙසන ලද කිසි දහමක් මමත් නො දනිමි. එතෙකුදු වුවත් මහණ ගොයුම් වහන්සේ ධර්මයිත වූ ලොවුතුරු දහම් (උපදවන,) එකාන්තයෙන් ලොවුතුරු දහම් සපයන, එකාන්ත යෙන් විද්‍යමාන, සත්‍ය වූ අවිපරීත පිළිවෙතක් (මඟක්) පණවන සේක, ලොවුතුරු දහම් උපදවන, එකාන්තයෙන් ලොවුතුරු දහම් සපයන, එකාන්ත යෙන් විද්‍යමාන සත්‍ය සැබෑ පිළිවෙතක් පණවන මහණ ගොයුම් වහන්සේගේ සුභාෂිත වචනය සුභාෂිත විසින් මා වැනි සිහිනුවණැතියෙක් කෙසේ නම් සතුටින් පිළිගන නො හෙන්නේ දැ?" යි ඒ පිරිව්‍රාජයනට කී ය.

ඉක්බිත්තෙන් දෙතුන් දිනක් ඇවැමෙන් ඇත්සැරිපුත් මිත්‍ර තමැත්තෙක් ද පොට්ඨපාද පරිව්‍රාජක ද භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹුණහ. එළැඹ ඇත්සැරිපුත් මිත්‍ර තෙම භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් වැ හුන්නේ ය. පොට්ඨපාද පිරිව්‍රාජ තෙම භාග්‍යවතුන් වහන්සේ හා සතුටු විය. සතුටට කරුණු වූ සිතැ රැදැවියැ යුතු වූ (සිහි කටයුතු වූ) කථාව කොට නිමවා, එකත්පස් වැ හුන්නේ ය. එකත්පස් වැ හුන් පොට්ඨපාද පිරිව්‍රාජ තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය. "වහන්ස, එදා භාග්‍යවතුන් වහන්සේ නික්ම වැඩි නොබෝ වේලායෙකි ඒ පිරිව්‍රාජයෝ මට "මේ භවත් පොට්ඨපාද තෙම මහණගොයුමින් කියන කියන දෑය එසේ ය, භාග්‍යවතුන් වහන්ස, එසේ ය, සුගතයන් වහන්සැ' යි කියමින් සතුටින් පිළිගනිති: 'ලොව (ආත්මය) ශාශ්වත යැ යි හෝ ලොව අශාශ්වත යැ' යි හෝ 'ලොව අන්තවත් යැ' යි හෝ අනන්ත යැ' යි හෝ ජීවයත් ශරීරයත් එකෙක් ම යැ යි හෝ ජීවයත් ශරීරයත් වෙන් වෙන් දෙකෙකැ යි හෝ ආත්මය මරණින් මතු වෙතැ යි හෝ සත්ත්වයා (ආත්මය) මරණින් මතු නො වෙතැ යි හෝ ආත්මය මරණින් මතු වන්නේත් නොවන්නේත් වේ යැ යි හෝ ආත්මය මරණින් මතු නො ම වන්නේත් නො ම නොවන්නේත් වෙයි හෝ මහණ ගොයුම්හු එකාන්ත කොට දෙසූ කිසි දහමක් අපි නො දනුම්හ' යි කියමින් වචන තැඹැති අඛ්‍යපියෙන් භාත්පසින් මට පුත පුතා ඇන්තාහ. වහන්ස, ඔවුන් විසින් එසේ කියනු ලැබූ මම් ඒ පිරිව්‍රාජයනට 'භවත්නි, ලොව ශාශ්වත යැ යි හෝ ... ආත්මය මරණින් මතු නො ම වන්නේත් නො ම නොවන්නේත් වේ යැ යි හෝ මහණ ගොයුමන් වහන්සේ එකාන්ත කොට දෙසූ කිසි දහමක් මමත් නො දනිමි. එහෙත් මහණ ගොයුමන් වහන්සේ ලොවුතුරු දහම් උපදවන, එකාන්ත යෙන් ලොවුතුරු දහම් සපයන, එකාන්ත යෙන් විද්‍යමාන, සත්‍ය වූ අවිපරීත පිළිවෙතක් පණවන සේක. එකාන්ත යෙන් ලොවුතුරු දහම් උපදවන එකාන්ත යෙන් ලොවුතුරු දහම් සපයන, එකාන්ත යෙන් විද්‍යමාන, සත්‍ය වූ අවිපරීත පිළිවෙතක් පණවන මහණ ගොයුමන් වහන්සේගේ සුභාෂිත වචනය සුභාෂිත විසින් සිහි නුවණැති මා වැන්නෙක් කෙසේ නම් සතුටින් නොපිළිගනු හැකි වන්නේ ද!' යි කීමි."

සඞ්ඛෙව ඛො එතෙ පොට්ඨපාද පරිබ්බාජකා අඤ්ඤා අවක්ඛුකා. ඉමං යෙව නො සං එකො වක්ඛුමි. එකංසිකා'පි හි ඛො පොට්ඨපාද මයා ධම්මා දෙසිතා පඤ්ඤත්තා. අනෙකංසිකා' පි හි ඛො පොට්ඨපාද මයා ධම්මා දෙසිතා පඤ්ඤත්තා.

කතමෙ ච තෙ පොට්ඨපාද මයා අනෙකංසිකා ධම්මා දෙසිතා පඤ්ඤත්තා? 'සස්සතො ලොකො'ති වා ඛො පොට්ඨපාද මයා අනෙකංසිකො ධම්මො දෙසිතො පඤ්ඤත්තො. 'අසස්සතො ලොකො' ති වා ඛො පොට්ඨපාද මයා අනෙකංසිකො ධම්මො දෙසිතො පඤ්ඤත්තො. 'අන්තවා ලොකො'ති වා ඛො පොට්ඨපාද -පෙ- 'අනන්තවා ලොකො'ති වා ඛො පොට්ඨපාද -පෙ- 'තං ජීවං තං සරීරන්ති' වා ඛො පොට්ඨපාද -පෙ- 'අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති' වා ඛො පොට්ඨපාද -පෙ- 'හොති තථාගතො පරම්මරණා'ති වා ඛො පොට්ඨපාද -පෙ- 'න හොති තථාගතො පරම්මරණා'ති වා ඛො පොට්ඨපාද -පෙ- 'හොති ච න ච හොති තථාගතො පරම්මරණා'ති වා ඛො පොට්ඨපාද -පෙ- 'නෙව හොති න න හොති තථාගතො පරම්මරණා'ති වා ඛො පොට්ඨපාද මයා අනෙකංසිකො ධම්මො දෙසිතො පඤ්ඤත්තො.

කස්මා ච තෙ පොට්ඨපාද මයා අනෙකංසිකා ධම්මා දෙසිතා පඤ්ඤත්තා? න ඛො තෙ පොට්ඨපාද අත්ථසංහිතා න ධම්මසංහිතා න ආදිබ්‍රහ්මචරියකා න නිබ්බිදාය න විරාගාය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බානාය සංවත්තන්ති. තස්මා තෙ මයා අනෙකංසිකා ධම්මා දෙසිතා පඤ්ඤත්තා.

කතමෙ ච තෙ පොට්ඨපාද මයා එකංසිකා ධම්මා දෙසිතා පඤ්ඤත්තා? 'ඉදං දුක්ඛ'න්ති ඛො පොට්ඨපාද මයා එකංසිකො ධම්මො දෙසිතො පඤ්ඤත්තො. 'අයං දුක්ඛසමුදයො'ති ඛො පොට්ඨපාද මයා එකංසිකො ධම්මො දෙසිතො පඤ්ඤත්තො. 'අයං දුක්ඛනිරොධො'ති ඛො පොට්ඨපාද මයා එකංසිකො ධම්මො දෙසිතො පඤ්ඤත්තො. 'අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා'ති ඛො පොට්ඨපාද මයා එකංසිකො ධම්මො දෙසිතො පඤ්ඤත්තො.

කස්මා ච තෙ පොට්ඨපාද මයා එකංසිකා ධම්මා දෙසිතා පඤ්ඤත්තා? එතෙ පොට්ඨපාද අත්ථසංහිතා, එතෙ ධම්මසංහිතා, එතෙ ආදිබ්‍රහ්මචරියකා, එතෙ නිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්ති. තස්මා තෙ මයා එකංසිකා ධම්මා දෙසිතා පඤ්ඤත්තා.

[එවිට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:]

"පොට්ඨපාදය, ඒ සියලු පිරිවැජියෝ නුවණැස් නැතියෝ ය, අක්ෂියෝ ය. ඔවුන් අතුරෙහි සුභාෂිත - දුර්භාෂිත දත්තා නුවණැස් ඇතිසේ තො ම ය. පොට්ඨපාදය, එකාන්ත කොට මා විසින් දෙසුණු පැණැවූ දහම් ද ඇත. පොට්ඨපාදය, එකාන්ත නො කොට මා විසින් දෙසුණු පැණැවූ දහම් ද ඇත.

පොට්ඨපාදය, මා විසින් එකාන්ත නොකොට දෙසුණු පැණැවූ ඒ දහම්හු කවරහු? පොට්ඨපාදය, ලොව (ආත්මය) ශාශ්වත යැ යි හෝ එකාන්ත නො කොට මා විසින් දහම් දෙසන ලදි, පණවන ලදි. පොට්ඨපාදය, ලොව (ආත්මය) අශාශ්වත යැ යි හෝ එකාන්ත නො කොට දහම් දෙසන ලදි, පණවන ලදි. පොට්ඨපාදය, ලොව (ආත්මය) අන්තවත් යැ යි කියා හෝ ... ජීවයත් ශරීරයත් එකෙක් මැ යැ යි කියා හෝ ... අනන්ත යැයි කියා හෝ ... ලොව (ආත්මය) ජීවයත් ශරීරයත් වෙන් වෙන් දෙකෙක් මැ යි කියා හෝ ... තථාගතයා (ආත්මය) මරණින් මතු වෙයි කියා හෝ ... තථාගතයා (ආත්මය) මරණින් මතු නො වෙයි කියා හෝ ... තථාගතයා (ආත්මය) මරණින් මතු වන්නේත් නො වන්නේත් වෙයි කියා හෝ ... තථාගතයා (ආත්මය) මරණින් මතු නො ම වන්නේත් නො ම නොවන්නේත් වෙයි කියා හෝ මා විසින් එකාන්ත නො කොට දහම් දෙසන ලද්දේ, පණවන ලද්දේ වෙයි.

පොට්ඨපාදය, කවර හෙයින් මා විසින් ඒ දහම්හු එකාන්ත කොට නො දෙසන ලද්දහු ද, නො පණවන ලද්දහු ද? යත්: පොට්ඨපාදය, මේ (ලොව ශාශ්වත ය යන ආදි වූ) දෘෂ්ටිහු දෙලෝවැඩ හෝ අත්වැඩ පර වැඩ හෝ අසලෝ නො වෙති. ලොවුතුරු දහම් අසලෝ නො වෙති. සසුන් බඹසරට ආදිය වූ අභිශීලශික්ෂාමාත්‍ර ද නො වෙති. සසරවටැ කලකිරෙනු පිණිස, සසරැ නො ඇලෙනු පිණිස, දුක් නසනු පිණිස, දුක් සංඥිඳුවනු පිණිස, සසරදුක් පහක් කරනු පිණිස, සසරවට අවබෝධ කරනු පිණිස, අමා මහනිවන් සාක්ෂාත් කරනු පිණිස නො පවත්නාහ. එ හෙයින් මා විසින් ඒ දහම්හු එකාන්ත කොට නො දෙසන ලදහ, නො පණවන ලදහ.

පොට්ඨපාදය, මා විසින් එකාන්ත කොට දෙසන ලද පණවන ලද ඒ දහම්හු කවරහු ද? පොට්ඨපාදය, 'මේ දුකැ'යි කියා ම මා විසින් එකාන්ත කොට ධර්ම දෙසන ලද්දේ ය, පණවන ලද්දේ ය. මේ දුක් හටගැන්මේ හේතු යැ' යි කියා ම මා විසින් එකාන්ත කොට ධර්ම දෙසන ලද්දේ ය, පණවන ලද්දේ ය. පොට්ඨපාදය, 'මේ දුක්නැස්ම යැ' යි කියා ම මා විසින් එකාන්ත කොට ධර්ම දෙසන ලද්දේ ය, පණවන ලද්දේ ය. පොට්ඨ-පාදය, 'මේ දුක් නැස්මට යන පිළිවෙතැ' යි කියා ම මා විසින් එකාන්ත කොට ධර්ම දෙසන ලද්දේ ය, පණවන ලද්දේ ය.

පොට්ඨපාදය, කවර හෙයින් මා විසින් ඒ ධර්මයෝ එකාන්ත කොට දෙසන ලදහු ද, පණවන ලදහු ද යත්: පොට්ඨපාදය, මොහු තමත් අනුන් දෙපසගේ ම අහිතවාදිය ඇසුරු කළාහු වෙත්. මොහු ලොවුතුරු දහම් ඇසුරු කළාහු වෙත්. මොහු ආදිබ්‍රහ්මචරියක (මාර්ගබ්‍රහ්මචරියාගේ පූර්ව භාගප්‍රතිපත්හු) වෙති. මොහු සසර කලකිරෙනු පිණිස, සසරැ නොඇල්ම පිණිස, සසර දුක් නසනු පිණිස, සසර දුක් සංඥිඳෙනු පිණිස, විශිෂ්ටඥානය පිණිස, සත්‍යාවබෝධය පිණිස නිවන් පහක් කරනු පිණිස පවතිත්. එහෙයින් මා විසින් ඒ ධර්මයෝ එකාන්ත කොට දෙසන ලදහ, පණවන ලදහ.

සන්ති ඛො පොට්ඨපාද එකෙ සමණබ්‍රාහ්මණා [එවංවාදිනො එවංදිට්ඨිනො: 'එකන්තසුඛී අත්තා හොති. අරොගො පරම්මරණා'ති. තස්සාහං උපසඞ්කමිත්වා එවං වදामි: 'සච්චං කිර තුම්හෙ ආයස්මන්තො එවංවාදිනො එවංදිට්ඨිනො 'එකන්තසුඛී අත්තා හොති, අරොගො පරම්මරණා'ති? තෙ චෙ මෙ එවං පුට්ඨා 'ආමා'ති[1] පටිජානන්ති, තස්සාහං එවං වදामි: 'අපි පන තුම්හෙ ආයස්මන්තො එකන්තසුඛං ලොකං ජානං පස්සං විහරථා'ති. ඉති පුට්ඨා 'නො'ති වදන්ති. තස්සාහං එවං වදामි 'අපි ච පන තුම්හෙ ආයස්ම-න්තො එකං වා රත්තිං එකං වා දිවසං උපඩ්ඩං වා රත්තිං උපඩ්ඩං වා දිවසං එකන්තසුඛිං අත්තානං සම්පජානාථ?' ති. ඉති පුට්ඨා 'නො'ති වදන්ති, තස්සාහං එවං වදामි 'අපි පන තුම්හෙ ආයස්මන්තො ජානාථ: 'අයං මග්ගො අයං පටිපදා එකන්තසුඛස්ස ලොකස්ස සච්ඡිකිරියායා?' ති. ඉති පුට්ඨා 'නො' ති වදන්ති. තස්සාහං එවං වදामි 'අපි පන තුම්හෙ ආයස්මන්තො යෙ තෙ දෙවතා එකන්තසුඛං ලොකං උපපන්නා, තෙසං භාසමානානං සද්දං සුණාථ: 'සුපටිපන්නාත්ථ මාරිසා, උජුපටිපන්නාත්ථ මාරිසා එකන්තසුඛස්ස ලොකස්ස සච්ඡිකිරියාය. මයම්පි හි මාරිසා එවම්පටිපන්නා එකන්තසුඛං ලොකං උපපන්නා'ති? ඉති පුට්ඨා 'නො' ති වදන්ති.

තං කිං මඤ්ඤසි පොට්ඨපාද, "නනු එවං සන්තෙ තෙසං සමණ-බ්‍රාහ්මණානං අපාටිහීරකතං භාසිතං සම්පජ්ජති?" ති.

"අද්ධා ඛො භන්තෙ එවං සන්තෙ තෙසං සමණබ්‍රාහ්මණානං අපා-ටිහීරකතං භාසිතං සම්පජ්ජති" ති.

"සෙය්‍යථාපි පොට්ඨපාද පුරිසො එවං වදෙය්‍ය: 'අහං යා ඉමස්මිං ජනපදෙ ජනපදකල්‍යාණී, තං ඉච්ඡාමි, තං කාමෙමි' ති. තමෙනං එවං වදෙය්‍යුං: අමෙහො පුරිස යං ත්වං ජනපදකල්‍යාණිං ඉච්ඡසි කාමෙසි, ජානාසි තං ජනපදකල්‍යාණිං ඛත්තියී වා බ්‍රාහ්මණී වා වෙස්සී වා සුද්දී වා? ති. ඉති පුට්ඨො 'නො'ති වදෙය්‍ය, තමෙනං එවං වදෙය්‍යුං: අමෙහො පුරිස යං ත්වං ජනපදකල්‍යාණිං ඉච්ඡසි කාමෙසි, ජානාසි තං ජනපදකල්‍යාණිං එවන්නාමා එවඛ්‍යාත්තා'ති වා, දීඝා වා රස්සා වා මජ්ඣිමා වා, කාළී වා සාමා වා මඤ්ඤුරච්ඡවී වා'ති, 'අමුකස්මිං ගාමෙ වා නිගමෙ වා නගරෙ වා'ති? ඉති පුට්ඨො 'නො'ති වදෙය්‍ය, තමෙනං එවං වදෙය්‍යුං: අමෙහො පුරිස යං ත්වං න ජානාසි න පස්සසි, තං ත්වං ඉච්ඡසි කාමෙසී?'ති. ඉති පුට්ඨො 'ආමා' ති වදෙය්‍ය.

තං කිං මඤ්ඤසි පොට්ඨපාද, නනු එවං සන්තෙ තස්ස පුරිසස්ස අපාටිහීරකතං භාසිතං සම්පජ්ජති?" ති.

"අද්ධා ඛො භන්තෙ එවං සන්තෙ තස්ස පුරිසස්ස අපාටිහීරකතං භාසිතං සම්පජ්ජති" ති.

---

1. ආමොති, PTS.

පොට්ඨපාදය, 'ආත්මය මරණින් මතු එකාන්තයෙන් සුවපත් වේ යැ යි, නිත්‍ය වේ යැ'යි මෙබඳු වාද ඇති, මෙබඳු දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත. මම ඔවුන් කරා එළැඹ, 'ආයුෂ්මත්නි, ආත්මය මරණින් මතු එකාන්තයෙන් සුවපත් වේ, නිත්‍ය වේ යැ'යි තෙපි මෙබඳු වාද ඇත්තෝ ය, මෙබඳු දෘෂ්ටි ඇත්තෝ ය යනු සැබෑ ද? යි මෙසේ විචාරමි. මෙසේ විචාරන ලද ඔහු මට 'එසේ යැ' යි පිළිණ කෙරෙත් නම්, 'ආයුෂ්මත්නි, තෙපි එකාන්ත සුව ඇති ලෝකය (අසෝ දෙසැ ඇතැ යි) දන්නාහු දක්නාහු වසවු ද?'යි ඔවුන් පිළිවිසිමි. මෙසේ පුළුවුස්නා ලද්දාහු 'නැතැ'යි කියත්. ඔවුනට මම 'ආයුෂ්මත්නි' තෙපි එක් රැයක් හෝ එක් දහවලක් හෝ අඩරැයක් හෝ අඩදහවලක් හෝ එකාන්තයෙන් සුවපත් වූ ආත්ම-යක් දනිවු ද?' යි මෙසේ කියමි. මෙසේ විචාරන ලද ඔහු 'නැතැ'යි කියත්. ඔවුනට මම 'ආයුෂ්මත්නි, එකාන්ත සුව ඇති ලොව පසක් කිරීමට මේ මඟ ය, මේ පිළිවෙත යැ යි තෙපි දනිවු ද?'යි මම කියමි. මෙසේ විචාරන ලද්දාහු 'නො දනිමු' යි ඔහු කියත්. ඔවුනට මම 'ආයුෂ්මත්නි, එකාන්ත සුව ඇති ලොවැ උපත් යම් දෙවතා කෙනෙක් වෙත් නම්, ඔවුන් 'නිදුකාණනි, එකාන්ත සුව ඇති ලොව පසක් කරනු පණිස, සුපිළිපන්නහු වවු. නිදුකාණනි, සාධු ව පිළිපන්නහු වවු. නිදුකාණනි, අපි දු මෙසේ පිළිපන්නමෝ එකාන්ත සුව ඇති ලොවට පැමිණියමිහ'යි කියන්නවුන්ගේ වචනය අසවු ද?' යි මෙසේ පිළිවිසිමි. මෙසේ මා විසින් විචාරන ලද ඔහු 'එ වැන්නක් නො ඇසුමු' යි කියත්.

[භාග්‍යවත්හු:] "පොට්ඨපාදය, ඒ කිමැ යි සිතයි ද? මෙසේ ඇති කල්හි ඒ මහණබමුණන්ගේ වචනය ප්‍රතිහරණ නැති එකෙක් (ප්‍රතිපක්ෂිකයන්ගේ නිග්‍රහයට හොඳුරු එකෙක්) නො වේ ද?"

[පොට්ඨපාද:] "වහන්ස, මෙසේ ඇති කල්හි එකාන්තයෙන් ඒ මහණබමුණන්ගේ වචනය ප්‍රතිහරණ නැති එකෙක් ය.

[භාග්‍යවත්හු:] "පොට්ඨපාදය, යම්සේ පුරුෂයෙක් 'මේ දනව්වෙහි යම් දනවුකැලණක් වේ නම් ඇය පතමි. ඇය කැමැත්තෙමි' යි කියන්නේ ද, ඔහුට අන්‍යයෝ 'එම්බා පුරුෂය, තෝ යම් දනවුකැලණක පතයි නම්, කැමැත්තෙහි නම්, ඔ කැත්කතක් නො හොත් බමුණුකතක් හෝ වෙස්කතක් හෝ සුදුරුකතක් යැ යි ඇය දන්නෙහි ද?" යි මෙසේ කියන්නාහු ද, මෙසේ පුළුවුස්නා ලැබූ හෙ තෙමේ 'නො දනිමි' යි කියන්නේ ය. අන්හු ඔහුට 'එම්බා පුරුෂය, තෝ යම් දනවුකැලණක පතයි නම්, කැමැත්තෙහි නම්, 'ඒ දනවුකැලණ මෙ නමැත්ති යැ යි මෙගොත් ඇත්ති යැ යි හෝ කළු හෝ හෙළලු හෝ පඬුවත් සිවිය ඇත්තියැයි හෝ, අසෝ ගමැ හෝ නියමගමැ හෝ නුවරැ හෝ වෙසෙන්නී යැ යි දනුදැ?' යි මෙසේ කියන්නාහු නම්, මෙසේ විචාරන ලද හේ 'එය නො දනිමි' යි කියන්නේ ය. ඔහුට අන්හු 'එම්බා පුරුෂය, යම් ක්ෂත්‍රියක තෝ නො දන්නෙහි නම්, නො දක්නෙහි නම්, තෝ ඇය පතයි ද? ඇය කැමැත්තෙහි ද?' යි කියන්නාහු නම්, මෙසේ විචාරන ලද්දේ 'එසේ' යැ යි හේ කියන්නේ ය.

"පොට්ඨපාදය, එය කිමැ යි සිතයි ද? මෙසේ ඇති කලැ ඒ පුරුෂයාගේ වචනය ප්‍රතිහරණ නැතියෙක් නො වන්නේ ද?"

[පොට්ඨපාද:] "වහන්ස, මෙසේ ඇති කලැ ඒ පුරුෂයාගේ වචනය එකාන්තයෙන් ප්‍රතිහරණ නැතියෙක් වෙයි."

"එවමෙව ඛො පොට්ඨපාද යෙ තෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො 'එකන්තසුඛී අත්තා හොති අරොගො පරම්මරණං' ති, තෙසාහං උපසඞ්කමිත්වා එවං වදෙමි: සච්චං කිර තුම්හෙ ආයස්මන්තො එවංවාදිනො එවංදිට්ඨිනො 'එකන්තසුඛී අත්තා හොති අරොගො පරම්ම-රණං'ති?" නෙ වෙ[1] මෙ එවං පුට්ඨා 'ආමා'ති පටිජානන්ති, තෙසාහං එවං වදාමි: අපි පන තුම්හෙ ආයස්මන්තො එකන්තසුඛං ලොකං ජානං පස්සං විහරථා"ති. ඉති පුට්ඨා 'නො'ති වදන්ති.

තෙසාහං එවං වදාමි: අපි පන තුම්හෙ ආයස්මන්තො එකං වා රත්තිං එකං වා දිවසං උපඩ්ඪං වා රත්තිං උපඩ්ඪං වා දිවසං එකන්තසුඛිං අත්තානං සම්පජානාථා'ති. ඉති පුට්ඨා 'නො'ති වදන්ති.

තෙසාහං එවං වදාමි: අපි පන තුම්හෙ ආයස්මන්තො ජානාථ 'අයං මග්ගො අයං පටිපදා එකන්තසුඛස්ස ලොකස්ස සච්ඡිකිරියායා' ති. ඉතිපුට්ඨා 'නො'ති වදන්ති.

තෙසාහං එවං වදාමි: අපි පන තුම්හෙ ආයස්මන්තො යා තා දෙවතා එකන්තසුඛං ලොකං උපපන්නා, තාසං භාසමානානං සද්දං සුණාථ: සුපටිපන්නාත්ථ මාරිසා, උජුපටිපන්නාත්ථ මාරිසා, එකන්තසුඛස්ස ලොකස්ස සච්ඡිකිරියාය. මයම්පි හි මාරිසා, එවං පටිපන්නා එකන්තසුඛං ලොකං උපපන්නා'ති. ඉති පුට්ඨා 'නො'ති වදන්ති.

තං කිං මඤ්ඤසි පොට්ඨපාද, නනු එවං සන්තෙ තෙසං සමණ-බ්‍රාහ්මණානං අපාටිහීරකතං භාසිතං සම්පජ්ජති?" ති.

"අද්ධා ඛො භන්තෙ තෙසං සමණබ්‍රාහ්මණානං අපාටිහීරකතං භාසිතං සම්පජ්ජති" ති.

සෙය්‍යථාපි පොට්ඨපාද පුරිසො චාතුම්මහාපථෙ නිස්සෙණිං කරෙය්‍ය පාසාදස්ස ආරොහණාය, තමෙනං එවං වදෙය්‍යුං: අම්භො පුරිස යස්ස ත්වං පාසාදස්ස ආරොහණාය නිස්සෙණිං කරොසි, ජානාසි තං පාසාදං පුරත්ථිමාය වා දිසාය දක්ඛිණාය වා දිසාය පච්ඡිමාය වා දිසාය උත්තරාය වා දිසාය, උච්චො වා නීචො වා මජ්ඣිමො වා?ති. ඉති පුට්ඨො 'නො'ති වදෙය්‍ය. තමෙනං එවං වදෙය්‍යුං: අම්භො පුරිස යං ත්වං න ජානාසි න පස්සසි, තස්ස ත්වං පාසාදස්ස ආරොහණාය නිස්සෙණිං කරොසී?"ති. ඉති පුට්ඨො 'ආමා'ති වදෙය්‍ය.

තං කිං මඤ්ඤසි පොට්ඨපාද, නනු එවං සන්තෙ තස්ස පුරිසස්ස අපාටිහීරකතං භාසිතං සම්පජ්ජති?" ති.

"අද්ධා ඛො භන්තෙ එවං සන්තෙ තස්ස පුරිසස්ස අපාටිහීරකතං භාසිතං සම්පජ්ජති" ති.

---

1. ම PTS.

[භාග්‍යවත්හු:] "පොට්ඨපාදය, එසේ ම යම් මහණ කෙනෙක් බමුණු කෙනෙක් ආත්මය මරණින් මත්තෙහි එකාන්ත සුව ඇත්තේ සදාභාවී වේ යැ යි මෙබඳු වාද ඇතියෝ මෙබඳු දෘෂ්ටි ඇතියෝ වෙත් ද, ඔම් ඔවුන් කරා එළැඹ, 'ආයුෂ්මත්නි, තෙපි ආත්මය මරණින් මත්තෙහි එකාන්ත සුව ඇත්තේ සදාභාවී වේ යැ යි මෙබඳු වාද ඇතියහු ද? මෙබඳු දෘෂ්ටි ඇතියහු ද?' යි මෙසේ අසමි. මා විසින් මෙසේ විචාරන ලද ඔහු 'එසේ යැ' යි ඉදින් පිළින කරන්නාහු නම්, 'ආයුෂ්මත්නි, තෙපි එකාන්ත සුව ඇති ලෝකයක් දන්නාහු දක්නාහු වසවු ද?' යි මම ඔවුන් පුළුවුසිමි. එසේ විචාරන ලද ඔහු 'නැතැ' යි කියත්.

"ආයුෂ්මත්නි, තෙපි එක් රැයක් හෝ අඩරැයක් හෝ අඩදහවලක් හෝ එකාන්තයෙන් සුව ඇති ආත්මයක් දනිවු ද?" යි මෙසේ ඔවුන් විචාරමි. මෙසේ විචාරන ලද ඔහු 'නො දනුමිහ' යි කියත්.

ආයුෂ්මත්නි, එකාන්ත සුව ඇති ලොව පසක් කරනුවට මඟ මේ යැ, පිළිවෙත මේ යැ'යි තෙපි දනිවු ද? යි මෙසේ ඔවුන් විචාරමි. මෙසේ විචාරන ලද ඔහු 'නො දනුමිහ' යි කියත්.

"ආයුෂ්මත්නි, එකාන්ත සුව ඇති ලොවට උත්පත්ති විසින් පැමිණි යම් දෙවතා කෙනෙක් වෙත් නම්, ඔවුන් 'නිදුකාණනි, එකාන්ත සුව ඇති ලොව පසක් කරනුවට සුපිළිපන්නහු වවු, සෘජු ව පිළිපන්නහු වවු. නිදුකාණනි, අපි ද මෙසේ පිළිපන්නමෝ එකාන්ත සුව ඇති ලොවට උත්පත්ති විසින් පැමිණියමිහ' යි කියන්නවුන්ගේ හඬ අසවු ද?"යි මෙසේ ඔවුන් විචාරමි. මෙසේ විචාරන ලද්දහු (එසේ වූ හඬක්) නො අසමිහ" යි ඔහු කියත්.

පොට්ඨපාදය, එය කිමැ යි සිතයි ද? ඒ මහණබමුණුවරුන්ගේ වචනය ප්‍රතිහරණ නැතියෙක් නො වෙයි ද?"

[පොට්ඨපාද:] "වහන්ස, මෙසේ ඇති කලැ ඒ මහණ බමුණන්ගේ වචනය එකාන්තයෙන් ප්‍රතිහරණ නැතියෙක් වෙයි."

[භාග්‍යවත්හු:] "පොට්ඨපාදය, යම්සේ පුරුෂයෙක් පහයකට නගිනු වස් සිවුමං හත්දියෙකැ ගිණක් බඳින්නේ ද, අන්හු ඔහුට 'එම්බා පුරුෂය, තෝ යම් පහයකට නගිනු වස් ගිණක් කෙරෙහි නම්, ඒ පහය පෙර දිගැ හෝ පැසිම් දිගැ හෝ දකුණු දිගැ හෝ උතුරු දිගැ හෝ වේ යැ යි දනිහි ද?' යි කියන්නාහු ද, මෙසේ විචාරන ලද හෙ තෙම නො දනිමි'යි කියන්නේ ය. (එ විට) ඔහු 'එම්බා පුරුෂය, තෝ යමක් නො දන්නෙහි නම්, නො දක්නෙහි නම්, එසේ වූ පහයකට නගිනුවට ගිණක් කෙරෙයි ද?' යි මෙසේ ඒ පුරුෂයා පුළුවුස්නාහ. මෙසේ විචාරන ලද හේ තෙමේ 'එසේ යැ' යි කියන්නේ ය.

පොට්ඨපාදය, එය කිමැ යි සිතයි ද? මෙසේ ඇති කලැ ඒ පුරුෂයාගේ වචනය ප්‍රතිහරණ නැතියෙක් නො වේ ද?"

[පොට්ඨපාද:] "වහන්ස, මෙසේ ඇති කල්හි ඒ පුරුෂයාගේ වචනය ප්‍රතිහරණ නැතියෙක් වෙයි."

"එවමේව ඛො පොට්ඨපාද යෙ තෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො 'එකන්තසුඛී අත්තා හොති අරොගො පරම්මරණා' ති. තස්සාහං උපසඞ්කමිත්වා එවං වදාමි: සච්චං කිර තුම්හෙ ආයස්මන්තො එවංවාදිනො එවංදිට්ඨිනො 'එකන්තසුඛී අත්තා හොති අරොගො පරම්මරණා'ති?' තෙ චෙ මෙ එවං පුට්ඨා 'ආමො'ති පටිජානන්ති, තස්සාහං එවං වදාමි: අපි පන තුම්හෙ ආයස්මන්තො එකන්තසුඛං ලොකං ජානං පස්සං විහරථ' ති ඉති පුට්ඨා 'නො'ති වදන්ති, තස්සාහං එවං වදාමි: අපි පන තුම්හෙ ආයස්මන්තො එකං වා රත්තිං එකං වා දිවසං උපඩ්ඩං වා රත්තිං උපඩ්ඩං වා දිවසං එකන්තසුඛිං අත්තානං සම්පජානාථ' ති ඉති පුට්ඨා 'නො'ති වදන්ති. තස්සාහං එවං වදාමි: අපි පන තුම්හෙ ආයස්මන්තො ජානාථ 'අයං මග්ගො අයං පටිපදා එකන්තසුඛස්ස ලොකස්ස සච්ඡිකිරියායා'ති?' ඉති පුට්ඨා 'නො'ති වදන්ති. තස්සාහං එවං වදාමි: අපි පන තුම්හෙ ආයස්මන්තො යා තා දෙවතා එකන්තසුඛං ලොකං උපපන්නා, තාසං දෙවතානං භාස-මානානං සද්දං සුණාථ 'සුපටිපන්නාත්ථ මාරිසා, උජුපටිපන්නාත්ථ මාරිසා, එකන්තසුඛස්ස ලොකස්ස සච්ඡිකිරියාය. මයඤ්ච හි මාරිසා එවං පටිපන්නා එකන්තසුඛං ලොකං උපපන්නා'ති ඉති පුට්ඨා 'නො'ති වදන්ති.

"තං කිම්මඤ්ඤසි පොට්ඨපාද, නනු එවං සන්තෙ තෙසං සමණ-බ්‍රාහ්මණානං අපාටිහීරකතං භාසිතං සම්පජ්ජති?" ති.

"අද්ධා ඛො භන්තෙ එවං සන්තෙ තෙසං සමණබ්‍රාහ්මණානං අපාටි-හීරකතං භාසිතං සම්පජ්ජති" ති.

"තයො ඛො'මෙ පොට්ඨපාද අත්තපටිලාභා: ඔළාරිකො අත්තපටිලාභො, මනොමයො අත්තපටිලාභො, අරූපො අත්තපටිලාභො' ති.

කතමො ච පොට්ඨපාද ඔළාරිකො අත්තපටිලාභො? රූපී චාතුම්මහා-භූතිකො කබළීකාරාහාරභක්ඛො, අයං ඔළාරිකො අත්තපටිලාභො.

කතමො මනොමයො අත්තපටිලාභො? රූපී මනොමයො සබ්බඞ්ග-පච්චඞ්ගී අහීනින්ද්‍රියො, අයං මනොමයො අත්තපටිලාභො.

කතමො ච අරූපො අත්තපටිලාභො? අරූපී සඤ්ඤාමයො, අයං අරූපො අත්තපටිලාභො.

[භාග්‍යවත්තුමා:] "පොට්ඨපාදය, එසේ ම 'ආත්මය මරණින් මත්තෙහි එකාන්ත සුව ඇත්තේ සදාකාලික වේ යැ' යි මෙබඳු වාද ඇති මෙබඳු දෘෂ්ටි ඇති යම් මහණබ්‍රාහ්මණ කෙනෙක් ඇත් ද, ඔවුන් කරා එළැඹ 'ආයුෂ්මත්නි, තෙපි ආත්මය මරණින් මතු එකාන්ත සුවැත්තේ සදාකාලික වේ යැ යි මෙබඳු වූ වාද ඇත්තහු ය, මෙබඳු දෘෂ්ටි ඇත්තහු ය යහු සැබැවෙක් ද?' යි මෙසේ විචාරමි. මෙසේ මා විසින් විචාරන ලද ඔහු 'එසේ යැ' යි පිළිතුරු දෙත්. 'ආයුෂ්මත්නි, තෙපි එකාන්ත සුව ඇති ලෝකයක් දන්නාහු දක්නාහු වෙසවු ද? යි මෙසේ ඔවුන් පුළුවුස්මි. මෙසේ පුළුවුස්නා ලද ඔහු 'එසේ දන්නමෝ දක්නමෝ නො වශමු' යි කියත්. 'ආයුෂ්මත්නි, තෙපි එක් රාත්‍රියක් හෝ එක් දවලක් හෝ අඩරාත්‍රියක් හෝ අඩ දවලක් හෝ එකාන්ත සුව ඇති ආත්මයක් දනිවු ද? යි මෙසේ ඔවුන් පුළුවුස්මි. මෙසේ පුළුවුස්නා ලද ඔහු 'නො දනුමිහ' යි කියත්. 'ආයුෂ්මත්නි, එකාන්ත සුව ඇති ලෝක පසක් කරනුවට මහ මේ යැ, පිළිවෙත මේ යැ යි තෙපි දනිවු ද?' යි මෙසේ ඔවුන් පුළුවුස්මි. මෙසේ පුළුවුස්නා ලද්දහු 'නො දනුමිහ' යි ඔහු කියත්. 'ආයුෂ්මත්නි, එකාන්ත සුව ඇති ලෝකයට උත්පත්ති වශයෙන් පැමිණි යම් දෙවතා කෙනෙක් වෙත් නම්, 'නිදුකාණනි, එකාන්ත සුව ඇති ලෝක පසක් කරනුවට සුපිළිපන්නහු වවු, සෘජු ව පිළිපන්නහු වවු. නිදුකාණනි, අපි දු මෙසේ පිළිපන්නමෝ එකාන්ත සුව ඇති ලෝකයට පැමිණියමිහ' යි මෙසේ කියන්නවුත් ගඬ අසවු ද?' යි මෙසේ ඔවුන් පුළුවුස්මි. මෙසේ මා විසින් පුළුවුස්නා ලද ඔහු 'එවැන්නක් නො අසමිහ' යි කියත්.

පොට්ඨපාදය, එය කිමැ යි සිතයි ද? මෙසේ ඇති කලැ ඒ මහණ-බ්‍රාහ්මණන්ගේ වචනය ප්‍රතිහරණ නැතියෙක් වනුයේ නො වේ ද?"

[පොට්ඨපාද:] "වහන්ස, මෙසේ ඇති කලැ එකාන්තයෙන් ඒ මහණ-බ්‍රාහ්මණන්ගේ වචනය ප්‍රතිහරණ නැතියෙක් වෙයි"

[භාග්‍යවත්තුමා:] "පොට්ඨපාදය, ඖදාරික වූ ආත්මප්‍රතිලාභය, මනෝ-මය වූ ආත්මප්‍රතිලාභය, අරූප ආත්මප්‍රතිලාභය යැ යි මේ ආත්මභාව-ප්‍රතිලාභ තුනෙකි.

පොට්ඨපාදය, ඖදාරික ආත්මප්‍රතිලාභය කවරේ යැ? රූපවත් වූ සතර මහාභූතයන්ගෙන් පහළ වූ, කබළීකාරාහාරය අනුභව කරන යමෙක් වේ ද, මෙය ඖදාරික ආත්මභාවප්‍රතිලාභ යැ.

මනෝමය ආත්මප්‍රතිලාභය කවරේ යැ? රූපවත් වූ' ධ්‍යාන සියින් නිපත්, සියලු අඟපසඟින් යුත්, නොපිරිහුණු ඉඳුරන් ඇති යමෙක්වේ ද, මෙය මනෝමය ආත්මප්‍රතිලාභ යැ.

අරූපාත්මප්‍රතිලාභය කවරේ යැ? රූපවත් නොවූ සංඥාමය වූ යම් අත්භවෙක් වේ ද, මේ අරූපාත්මප්‍රතිලාභ යැ.

ඔළාරිකස්සපි ඛො අහං පොට්ඨපාද අත්තපටිලාභස්ස පහානාය ධම්මං දෙසෙමි යථාපටිපන්නානං වො සඞ්කිලෙසිකා ධම්මා පහීයිස්සන්ති, වොදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති, පඤ්ඤාපාරිපූරිං වෙපුල්ලත්තඤ්ච[1] දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සන්ති[2] ති.

සියා ඛො පන තෙ පොට්ඨපාද එවමස්ස: සඞ්කිලෙසිකා ධම්මා පහීයිස්සන්ති, වොදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති, පඤ්ඤාපාරිපූරිං වෙපුල්ලත්තඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සාම. දුක්ඛො ච ඛො විහාරො' ති.

න ඛො පනෙතං පොට්ඨපාද එවං දට්ඨබ්බං. සඞ්කිලෙසිකා චෙව ධම්මා පහීයිස්සන්ති. වොදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති. පඤ්ඤාපාරිපූරිං වෙපුල්ලත්තඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සන්ති. පාමුජ්ජඤ්චෙව භවිස්සති පීති ච පස්සද්ධි ච සති ච සම්පජඤ්ඤඤ්ච සුඛො ච විහාරො.

මනොමයස්ස පි ඛො අහං පොට්ඨපාද අත්තපටිලාභස්ස පහානාය ධම්මං දෙසෙමි යථාපටිපන්නානං වො සඞ්කිලෙසිකා ධම්මා පහීයිස්සන්ති, වොදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති, පඤ්ඤාපාරිපූරිං වෙපුල්ලත්තඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සථාති.[3]

සියා ඛො පන තෙ පොට්ඨපාද එවමස්ස: සඞ්කිලෙසිකා ධම්මා පහීයිස්සන්ති, වොදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති, පඤ්ඤාපාරිපූරිං වෙපුල්ලත්තඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සාම. දුක්ඛො ච ඛො විහාරො'ති.

න ඛො පනෙතං පොට්ඨපාද එවං දට්ඨබ්බං. සඞ්කිලෙසිකා චෙව ධම්මා පහීයිස්සන්ති. වොදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති. පඤ්ඤාපාරිපූරිං වෙපුල්ලත්තඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සථ. පාමුජ්ජඤ්චෙව භවිස්සති පීති ච පස්සද්ධි ච සති සම්පජඤ්ඤඤ්ච සුඛො ච විහාරො.

අරූපස්සපි ඛො අහං පොට්ඨපාද අත්තපටිලාභස්ස පහානාය ධම්මං දෙසෙමි යථාපටිපන්නානං වො සඞ්කිලෙසිකා ධම්මා පහීයිස්සන්ති, වොදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති, පඤ්ඤාපාරිපූරිං වෙපුල්ලත්තඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සථාති.

සියා ඛො පන තෙ පොට්ඨපාද එවමස්ස: 'සඞ්කිලෙසිකා ධම්මා පහීයිස්සන්ති, වොදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති, පඤ්ඤාපාරිපූරිං වෙපුල්ලත්තඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සාම. දුක්ඛො ච ඛො විහාරො'ති.

න ඛො පනෙතං පොට්ඨපාද එවං දට්ඨබ්බං. සඞ්කිලෙසිකා චෙව ධම්මා පහීයිස්සන්ති. වොදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති. පඤ්ඤාපාරිපූරිං වෙපුල්ලත්තඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සථ. පාමුජ්ජඤ්චෙව භවිස්සති පීති ච පස්සද්ධි ච සති ච සම්පජඤ්ඤඤ්ච සුඛො ච විහාරො.

---

1. වෙපුල්ලතං, PTS 2. විහරිස්සති, (බහුපු)
3. විහරිස්සති, (බහුපු)

පොට්ඨපාදය, යම්සේ පිළිපන් තොපගේ සිත කෙලෙසන දහම්හු පහ වන්නාහු ද, සිත පිරිසිදු කරන දහම්හු වෙසෙසින් වැඩෙන්නාහු ද, මාර්ගඵලප්‍රඥාවන්ගේ පිරීමත් විපුල බවත් මෙ අත්බවහි ම නෙපි තුමු පසක් කොට ලැබ වසන්නහු ද, ඒ ඕදාරික ආත්මභාවප්‍රතිලාභයාගේ ද ප්‍රහාණය පිණිස දහම් දෙසමි.

පොට්ඨපාදය, 'සිත කෙලෙසන දහම්හු පහ වන්නාහ, සිත පිරිසිදු කරන දහම්හු වෙසෙසින් වැඩෙන්නාහ, ප්‍රඥාවගේ පිරීම ද විපුලබව ද තුමු ම මෙ අත්බවහි ම පසක් කොට ලැබ වසන්නමු. එහෙත් එසේ වූ (තොපගේ) විහරණය දුක් වේ' යැ යි කිසි විටෙක තට මෙ බඳු සිතෙක් විය හැකි ය.

පොට්ඨපාදය, මෙය වනාහි එසේ නො දත යුතු. සිත කෙලෙසන දහම්හු පහ වන්නාහ. සිත පිරිසිදු කරන දහම්හු වෙසෙසින් වැඩෙන්නාහ. ප්‍රඥාවගේ පිරිපුන්බව ද විපුල බව ද මෙ අත්බවහි ම තොපි තුමු වෙසෙසි නුවණින් දැන පසක් කොට ලැබ වසන්නහු. සිතැ සතුට ද වන්නේ ය. ප්‍රීතිය ද සංසුන්බව ද සිහිය ද නුවණ ද වන්නේ ය. විහරණය ද සැප වන්නේ ය.

පොට්ඨපාදය, යම්සේ පිළිපන්තවුන්ගේ සිත කෙලෙසන දහම්හු පහ වන්නාහු ද, සිත පිරිසිදු කරන දහම්හු වෙසෙසින් වැඩෙන්නාහු ද, ප්‍රඥාවගේ පිරීම ද විපුල බව ද මෙ අත්බවහි ම නෙපි තුමු ම වෙසෙසි නුවණින් දැන පසක් කොට වසන්නහු ද, එසේ වූ මනොමය ආත්මප්‍රතිලාභයාගේ ද ප්‍රහාණය පිණිස මම දහම් දෙසමි.

පොට්ඨපාදය, 'සිත කෙලෙසන දහම්හු පහ වන්නාහ, සිත පිරිසිදු කරන දහම්හු වෙසෙසින් වැඩෙන්නාහ, ප්‍රඥාවගේ පිරීම ද, විපුල බව ද මෙ අත්බවහි ම තුමු ම පසක් කොට ලැබ වසන්නමු, එහෙත් ඒ විහරණය වූ කලි දුක් සහිත යැ'යි තට මෙසේ සිතෙක් විය හැකි ය.

පොට්ඨපාදය, මෙය එසේ නො දත යුතු. සිත කෙලෙසන දහම්හු ද පහ වන්නාහ. සිත පිරිසිදු කරන දහම්හු ද වෙසෙසින් වැඩෙන්නාහ. ප්‍රඥාවගේ පිරීම ද විපුල බව ද මෙ අත්බවහි ම තුමු ම දැන පසක් කොට ලැබ වසන්නාහ. සතුට ද ප්‍රීතිය ද සිතැ සංසුන් බව ද සිහිය ද නුවණ ද වන්නේ ය. විහරණය ද සැප වන්නේ ය.

පොට්ඨපාදය, යම්සේ පිළිපන් තොපගේ සිත කෙලෙසන දහම්හු පහ වන්නාහු ද, සිත පිරිසිදු කරන දහම්හු වෙසෙසින් වැඩෙන්නාහු ද, ප්‍රඥාවගේ පිරීම ද විපුල බව ද මෙ අත්බවහි ම තුමු ම දැන වසන්නාහු ද, එසේ අරූප වූ ආත්මභාවප්‍රතිලාභයාගේ ප්‍රහාණය පිණිස දහම් දෙසමි.

පොට්ඨපාදය, 'සිත කෙලෙසන දහම්හු පහ වන්නාහ, සිත පිරිසිදු කරන දහම්හු වෙසෙසින් වැඩෙන්නාහ, ප්‍රඥාවගේ පිරීම ද විපුල බව ද මෙ අත්බවහි තුමු ම වෙසෙසින් දැන පසක් කොට ලැබ වසන්නමු. එහෙත් විහරණය දුක් සහිත යැ' යි තට මෙසේ සිතක් විය හැකි ය.

පොට්ඨපාදය, මෙය එසේ නො දත යුතු. සිත කෙලෙසන දහම්හු ද පහ වන්නාහ. සිත පිරිසිදු කරන දහම්හු වෙසෙසින් වැඩෙන්නාහ. ප්‍රඥාවගේ පිරීම ද විපුල බව ද මෙ අත්බවහි ම තුමු ම වෙසෙසින් දැන පසක් කොට ලැබ වසන්නහු. සතුට ද ප්‍රීතිය ද සංසුන් බව ද සිහිය ද නුවණ ද වන්නේ ය. විහරණය ද සැප වන්නේ ය.

පරෙ වෙ පොට්ඨපාද අමෙහ එවං පුච්ඡිස්සාමං: 'කතමො පන සො ආවුසො ඔළාරිකො අත්තපටිලාභො යස්ස තුමෙහ පහානාය ධම්මං දෙසෙථ යථාපටිපන්නානං වො සඞ්කිලෙසිකා ධම්මා පහීයිස්සන්ති, වොදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති, පඤ්ඤාපාරිපූරිං වෙපුල්ලත්තඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සථ[1]'ති. තෙසං මයං එවං පුට්ඨා එවං ව්‍යාකරෙය්‍යාම: "අයං වා සො ආවුසො ඔළාරිකො අත්තපටිලාභො යස්ස මයං පහානාය ධම්මං දෙසෙම යථාපටිපන්නානං වො සඞ්කිලෙසිකා ධම්මා පහීයිස්සන්ති, වොදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති, පඤ්ඤාපාරිපූරිං වෙපුල්ලත්තඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සථ" ති.

පරෙ වෙ පොට්ඨපාද අමෙහ එවං පුච්ඡිස්සාමං: 'කතමො පන සො ආවුසො මනොමයො අත්තපටිලාභො, යස්ස තුමෙහ පහානාය ධම්මං දෙසෙථ යථාපටිපන්නානං වො සඞ්කිලෙසිකා ධම්මා පහීයිස්සන්ති, වොදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති, පඤ්ඤාපාරිපූරිං වෙපුල්ලත්තඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සථ'ති. තෙසං මයං පුට්ඨා එවං ව්‍යාකරෙය්‍යාම: "අයං වා සො ආවුසො මනොමයො අත්තපටිලාභො යස්ස මයං පහානාය ධම්මං දෙසෙම යථාපටිපන්නානං වො සඞ්කිලෙසිකා ධම්මා පහීයිස්සන්ති, වොදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති, පඤ්ඤාපාරිපූරිං වෙපුල්ලත්තඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සථ" ති.

පරෙ වෙ පොට්ඨපාද අමෙහ එවං පුච්ඡිස්සාමං: 'කතමො පන සො ආවුසො අරූපො අත්තපටිලාභො යස්ස තුමෙහ පහානාය ධම්මං දෙසෙථ යථාපටිපන්නානං වො සඞ්කිලෙසිකා ධම්මා පහීයිස්සන්ති, වොදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති, පඤ්ඤාපාරිපූරිං වෙපුල්ලත්තඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සථ'ති. තෙසං මයං එවං පුට්ඨා එවං ව්‍යාකරෙය්‍යාම: අයං වා සො ආවුසො අරූපො අත්තපටිලාභො, යස්ස මයං පහානාය ධම්මං දෙසෙම යථාපටිපන්නානං වො සඞ්කිලෙසිකා ධම්මා පහීයිස්සන්ති, වොදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති, පඤ්ඤාපාරිපූරිං වෙපුල්ලත්තඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සථ' ති.

තං කිම්මඤ්ඤසි පොට්ඨපාද, නනු එවං සතෙන සපාටිහීරකතං හාසිතං සම්පජ්ජති? ති.

---

1. විහරිස්සතීති. සීමු. විහරිස්සථාති PTS.

පොට්ඨපාදය, 'යම්සේ පිළිපන්නාවූ තොපගේ සිත කෙලෙසන දහම්හු පහ වන්නාහු ද, සිත පිරිසිදු කරන දහම්හු වෙසෙසින් වැඩෙන්නාහු ද, ප්‍රඥාවගේ පිරීමත් විපුල බවත් මෙ අත්බව්හි ම තෙපි තුමූ ම වෙසෙසින් දැන පසක් කොට ලැබ වසන්නහු ද, එසේ යමක්හුගේ ප්‍රහාණය පිණිස භවත්හු දම් දෙසත් නම්, ඇවැත්නි, ඒ ඖදරික ආත්මප්‍රතිලාභය කවරේ ද?' යි අත්හු මෙසේ අප විචාරත්නාහු නම්, මෙසේ ඔවුන් විසින් විචාරන ලද අපි 'ඇවැත්නි, අපි යමක්හුගේ ප්‍රහාණය පිණිස දම් දෙසමෝ ද යම්සේ පිළිපන්නාවූ තොපගේ සිත කෙලෙසන දහම්හු පහ වන්නාහු ද, සිත පිරිසිදු කරන දහම්හු වෙසෙසින් වැඩෙන්නාහු ද, ප්‍රඥාවගේ පිරීමත් විපුල බවත් මෙ අත්බව්හි ම තෙපි තුමූ ම වෙසෙසින් දැන පසක් කොට ලැබ වසන්නහු ද, ඇවැත්නි, ඒ ඖදරික ආත්මප්‍රතිලාභය මේ යැ' යි මෙසේ හෙළි කොට කියන්නමු.

පොට්ඨපාදය, 'යම්සේ පිළිපන්නාවූ තොපගේ සිත කෙලෙසන දහම්හු පහ වන්නාහු ද, සිත පිරිසිදු කරන දහම්හු වෙසෙසින් වැඩෙන්නාහු ද, ප්‍රඥාවගේ පිරීමත් විපුල බවත් මෙ අත්බව්හි ම තුමූ ම වෙසෙසින් දැන පසක් කොට ලැබ වසන්නහු ද, ඇවැත්නි, එසේ යමක්හුගේ ප්‍රහාණය පිණිස භවත්හු දහම් දෙසත්නම්, ඒ මනොමය ආත්මප්‍රතිලාභය කවරේ ද? යි අත්හු මෙසේ අප විචාරත්නාහු නම්, එසේ ඔවුන් විසින් පුළුවුස්නා ලද අපි "ඇවැත්නි, අපි යමක්හුගේ ප්‍රහාණය පිණිස දහම් දෙසමෝ නම්, යම්සේ පිළිපන්නාවූ තොපගේ සිත කෙලෙසන දහම්හු ප්‍රහීණවන්නාහු නම්, සිත පිරිසිදු කරන දහම්හු වෙසෙසින් වැඩෙන්නාහු නම්, ප්‍රඥාවගේ පිරීමත් විපුල බවත් මෙ අත්බව්හි ම තුමූ ම වෙසෙසි නුවණින් දැන පසක් කොට ලැබ වසන්නාහු නම්, මේ ඒ මනොමයආත්මප්‍රතිලාභය වේ යැ" යි මෙසේ හෙළි කොට කියන්නමු.

ඉදින් පොට්ඨපාදය, 'යම්සේ පිළිපන්නාවූ තොපගේ සිත කෙලෙසන දහම්හු පහ වන්නාහු නම්, සිත පිරිසිදු කරන දහම්හු වෙසෙසින් වැඩෙන්නාහු නම්, ප්‍රඥාවගේ පිරීමත් විපුල බවත් මෙ අත්බව්හි ම තුමූ වෙසෙසි නුවණින් දැන පසක් කොට ලැබ වසන්නහු නම්, ඇවැත්නි, එසේ යමක්හුගේ ප්‍රහාණය පිණිස දහම් දෙසවු නම්, ඒ අරූප ආත්ම-ප්‍රතිලාභය කවරේ ද?' යි මෙසේ අත්හු අප විචාරත්නාහු නම්, එසේ ඔවුන් විසින් පුළුවුස්නා ලද අපි "ඇවැත්නි, යමක්හුගේ ප්‍රහාණය පිණිස අපි දහම් දෙසමෝ ද, යම් බඳු ව පිළිපන්නවුන්ගේ සිත කෙලෙසන දහම්හු පහ වන්නාහු නම්, සිත පිරිසිදු කරන දහම්හු වෙසෙසින් වැඩෙන්නාහු නම්, ප්‍රඥාවගේ පිරීමත් විපුල බවත් මෙ අත්බව්හි ම තුමූ ම වෙසෙසි නුවණින් දැන පසක් කොට ලැබ වසන්නහු ද, මේ ඒ අරූප ආත්මප්‍රතිලාභය වේ යැ" යි මෙසේ හෙළි කොට කියන්නමු.

පොට්ඨපාදය, එය කිමැයි සිතහි ද, මෙසේ ඇති කල්හි අප වචනය ප්‍රතිහරණ සහිතයෙක් වන්නේ නො වේ ද?

"අද්ධා ඛො භන්තෙ එවං සන්තෙ සප්පාටිහීරකතං භාසිතං සම්පජ්ජති" ති.

සෙය්‍යථාපි පොට්ඨපාද පුරිසො තිණ්හෙන අසිනා පාසාදස්ස ආරොහණාය තස්සස්ස පාසාදස්ස හෙට්ඨා. තමේනං එවං වදෙය්‍යුං: 'අම්භො පුරිස යස්ස ත්වං පාසාදස්ස ආරොහණාය තිණ්හෙන අසිනා කරොසි, ජානාසි තං පාසාදං පුරත්ථිමාය වා දිසාය දක්ඛිණාය වා දිසාය පච්ඡිමාය වා දිසාය උත්තරාය වා දිසාය උච්චො වා නීචො වා මජ්ඣිමො වා'ති? සො වෙ එවං වදෙය්‍ය: 'අයං සො ආවුසො පාසාදො, යස්සාහං ආරොහණාය තිණ්හෙන අසිනා කරොමි තස්සස්ස පාසාදස්ස හෙට්ඨා' ති.

තං කිං මඤ්ඤසි පොට්ඨපාද? නනු එවං සන්තෙ තස්ස පුරිසස්ස සප්පාටිහීරකතං භාසිතං සම්පජ්ජති? ති.

"අද්ධා ඛො භන්තෙ එවං සන්තෙ තස්ස පුරිසස්ස සප්පාටිහීරකතං භාසිතං සම්පජ්ජති" ති.

එවඤ්හි ඛො පොට්ඨපාද පරෙ වෙ අම්හෙ එවං පුච්ඡෙය්‍යුං: 'කතමො පන සො ආවුසො ඔළාරිකො අත්තපටිලාභො? -පෙ- කතමො පන සො ආවුසො මනොමයො අත්තපටිලාභො? -පෙ- කතමො පන සො ආවුසො අරූපො අත්තපටිලාභො, යස්ස තුම්හෙ පහානාය ධම්මං දෙසෙථ 'යථාපටිපන්නානං වො සඞ්කිලෙසිකා ධම්මා පහීයිස්සන්ති, වොදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති, පඤ්ඤාපාරිපූරිං වෙපුල්ලත්තඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සථා'ති, තෙසං මයං එවං පුට්ඨා එවං ව්‍යාකරෙය්‍යාම:

අයං වා සො ආවුසො ඔළාරිකො අත්තපටිලාභො -පෙ- මනොමයො අත්තපටිලාභො -පෙ- අරූපො අත්තපටිලාභො යස්ස මයං පහානාය ධම්මං දෙසෙම යථාපටිපන්නානං වො සඞ්කිලෙසිකා ධම්මා පහීයිස්සන්ති වොදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති, පඤ්ඤාපාරිපූරිං වෙපුල්ලත්තඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සථා'ති.

තං කිම්මඤ්ඤසි පොට්ඨපාද? නනු එවං සන්තෙ සප්පාටිහීරකතං භාසිතං සම්පජ්ජති? ති."

"අද්ධා ඛො භන්තෙ එවං සන්තෙ සප්පාටිහීරකතං භාසිතං සම්පජ්ජති"ති.

එවං වුත්තෙ විත්තො ගහපතිපුත්තො භගවන්තං එතදවොච: යස්මිං භන්තෙ සමයෙ ඔළාරිකො අත්තපටිලාභො හොති, මොඝස්ස තස්මිං සමයෙ මනොමයො අත්ත පටිලාභො හොති, මොඝො අරූපො අත්ත-පටිලාභො හොති. ඔළාරිකො වාස්ස අත්තපටිලාභො තස්මිං සමයෙ සච්චො හොති.

[පොට්ඨපාද:] වහන්ස, මෙසේ ඇති කල්හි ඔබ වචනය එකාන්තයෙන් ප්‍රතිහරණ සහිතයෙක් වේ

[භාග්‍යවත්හු:] පොට්ඨපාදය, යම්සේ පුරුෂයෙක් පහයකට නගිනුවට එම පහය යටැ හිණක් බඳතේ ද, එසේ වූ ඔහු බණවා අත්හු 'හෙම්බා පුරුෂය, තෝ යම් පහයකට නගිනුවට හිණක් කෙරෙහි නම්, ඒ පහය පෙර දිගැ හෝ දකුණු දිගැ හෝ පැසිම දිගැ හෝ උතුරු දිගැ හෝ ඇතැ යි දනු ද? උස් වූ හෝ මිටි වූ හෝ මැදුම් පමණ වූ හෝ එකෙකැ යි දනු ද?' යි විචාරන්නාහු නම්, ඒ පුරුෂ තෙම 'ඇවැත්නි, යම් පහයකට නගිනුවට ඒ පහය යට මම යම් හිණක් කෙරෙම් නම්, මේ ඒ පහය යැ'යි කියන්නේ ය.

පොට්ඨපාදය, මෙසේ ඇති කල්හි ඒ පුරුෂයාගේ වචනය ප්‍රතිහරණ සහිත වන්නේ නො වේ ද?"

[පොට්ඨපාද:] වහන්ස, මෙසේ ඇති කල්හි ඒ පුරුෂයාගේ වචනය ප්‍රතිහරණ සහිත වේ.

[භාග්‍යවත්හු:] පොට්ඨපාදය, යම්සේ (යමක් සඳහා) පිළිපන් තොපගේ සිත කෙලෙසන දහම්හු පහ වන්නාහු නම්, සිත පිරිසිදු කරන දහම්හු වෙසෙසින් වැඩෙන්නාහු නම්, ප්‍රඥාවගේ පිරිමත් විපුල බවත් මෙ අත්බවහි ම තුමූ ම දැන පසක් කොට ලැබ වසන්නහු නම්, ඇවැත්නි, ඒ ඔළුදරික ආත්මප්‍රතිලාභය කවරේ යැ? ... ඇවැත්නි, එසේ යමක්හුගේ ප්‍රහාණය පිණිස දහම් දෙසවූ නම්, ඒ මනොමය ආත්මප්‍රතිලාභය කවරේ යැ?... ඒ අරූප ආත්මප්‍රතිලාභය කවරේ යැ? යි අප විචාරන්නාහු ද, ඔවුන් විසින් මෙසේ විචාරන ලද අපි මේ (මතු දැක්වෙන) පරිදි විසඳන්නමු:

"ඇවැත්නි, යමක්හුගේ ප්‍රහාණය පිණිස දහම් දෙසවෝ නම්, යම්සේ (යමක් ප්‍රහීණ කරණු සඳහා) පිළිපන් තොපගේ සිත කෙලෙසන දහම්හු පහ වන්නාහු නම්, සිත පිරිසිදු කරන දහම්හු වැඩෙන්නාහු නම්, යමක ප්‍රහාණයෙන් ප්‍රඥාවගේ පිරිමත් විපුල බවත් මෙ අත්බවහි ම තුමූ ම වෙසෙසි නුවණින් දැන පසක් කොට ලැබ වසන්නහු නම්, මේ ඒ ඔළුදරික වූ ආත්ම ප්‍රතිලාභය ය... මේ ඒ මනොමය ආත්මප්‍රතිලාභය ය ... මේ ඒ අරූපආත්මප්‍රතිලාභය යැ" යනු යි.

පොට්ඨපාදය, ඒ කිමැ යි සිතසි ද? මෙසේ ඇති කලැ අප වචනය ප්‍රතිහරණ නැතියක් (ප්‍රතිවිරුද්ධ කථා ඉදිරිපත් නොකළ හැක්කක්) වනුයේ නො වේ ද?'

[පොට්ඨපාද] "වහන්ස, මෙසේ ඇති කලැ ඔබ වචනය ප්‍රතිහරණ නැතියෙක් වෙයි.

මෙසේ කී කල්හි ඇත්ගැමිපුත් විත්‍ර තෙම භාග්‍යවතුන් වහන්සේට මේ බස් පැවැසී ය "වහන්ස, යම් කලෙක්හි ඔළුදරික ආත්මප්‍රතිලාභය වේ නම්, එ සමයෙහි ඔහුගේ මනොමය ආත්මප්‍රතිලාභය හිස් වෙයි ද? (අභාවයට යෙයි ද?) ඔහුගේ අරූප ආත්මප්‍රතිලාභයත් හිස් වෙයි ද? එ කලැ ඔහුගේ ඔළුදරික ආත්මප්‍රතිලාභය ම සත්‍ය වෙයි ද?

යස්මිං භන්තෙ සමයෙ මනොමයො අත්තපටිලාභො හොති, මොඝස්ස තස්මිං සමයෙ ඔළාරිකො අත්තපටිලාභො හොති, මොඝො අරූපො අත්තපටිලාභො. මනොමයො ච අත්තපටිලාභො තස්මිං සමයෙ සච්චො හොති.

යස්මිං භන්තෙ සමයෙ අරූපො අත්තපටිලාභො හොති, මොඝස්ස තස්මිං සමයෙ ඔළාරිකො අත්තපටිලාභො හොති, මොඝො මනොමයො අත්තපටිලාභො අරූපො'ච්චස්ස අත්තපටිලාභො තස්මිං සමයෙ සච්චො හොතී" ති.

"යස්මිං චිත්ත සමයෙ ඔළාරිකො අත්තපටිලාභො හොති, නෙව තස්මිං සමයෙ මනොමයො අත්තපටිලාභො'ති සඤ්ඤං ගච්ඡති, න 'අරූපො අත්තපටිලාභො' ති සඤ්ඤං ගච්ඡති. ඔළාරිකො අත්තපටිලාභො' නෙව තස්මිං සමයෙ සඤ්ඤං ගච්ඡති.

යස්මිං චිත්ත සමයෙ මනොමයො අත්තපටිලාභො හොති, නෙව තස්මිං සමයෙ 'ඔළාරිකො අත්තපටිලාභො'ති සඤ්ඤං ගච්ඡති, න 'අරූපො අත්තපටිලාභො'ති සඤ්ඤං ගච්ඡති. මනොමයො අත්තපටිලාභො' නෙව තස්මිං සමයෙ සඤ්ඤං ගච්ඡති.

යස්මිං චිත්ත සමයෙ අරූපො අත්තපටිලාභො හොති, නෙව තස්මිං සමයෙ 'ඔළාරිකො අත්තපටිලාභො' ති සඤ්ඤං ගච්ඡති. න 'මනොමයො අත්තපටිලාභො' ති සඤ්ඤං ගච්ඡති. 'අරූපො අත්තපටිලාභො' නෙව තස්මිං සමයෙ සඤ්ඤං ගච්ඡති.

සචෙ තං චිත්ත එවං පුච්ඡෙය්‍යුං: අභොසි ත්වං අතීතමද්ධානං, න ත්වං භාභොසි? භවිස්සසි ත්වං අනාගතමද්ධානං, න ත්වං න භවිස්සසි? අත්ථි ත්වං එතරහි, න ත්වං තත්ථි එවං පුට්ඨො ත්වං චිත්ත කිනති ඛ්‍යාකරෙය්‍යාසි?" ති.

"සචෙ මං භන්තෙ එවං පුච්ඡෙය්‍යුං: අභොසි ත්වං අතීතමද්ධානං න ත්වං න භවිස්සසි? අත්ථි ත්වං එතරහි, න ත්වං තත්ථි?'ති එවං පුට්ඨො 'හං භන්තෙ එවං ඛ්‍යාකරෙය්‍යං: අභොසාහං[1] අතීතමද්ධානං, නාහං න අභොසිං. භවිස්සාමහං අනාගතමද්ධානං, නාහං න භවිස්සාමි. අත්ථාහං එතරහි, නාහං තත්ථි'ති. එවං පුට්ඨො 'හං භන්තෙ එවං ඛ්‍යාකරෙය්‍යන්ති."

සචෙ පන තං චිත්ත එවං පුච්ඡෙය්‍යුං: යො තෙ අභොසි අතීතො අත්තපටිලාභො සෙව[2] තෙ අත්තපටිලාභො සච්චො, මොඝො අනාගතො, මොඝො පච්චුප්පන්නො? යො තෙ[3] භවිස්සති අනාගතො අත්තපටිලාභො, සෙව තෙ අත්තපටිලභො සච්චො, මොඝො අතීතො, මොඝො පච්චුප්පන්නො අත්තපටිලාභො. සෙව තෙ අත්තපටිලාභො සච්චො, මොඝො අතීතො, මොඝො අනාගතො? ති එවං පුට්ඨො ත්වං චිත්ත කිනති ඛ්‍යාකරෙය්‍යාසි?" ති.

---

1. අභොසහං, 2. භොසෙව, (ස්‍යාම්) 3 යො වා තෙ, PTS

වහන්ස, යම් කාලෙක මනොමය ආත්මප්‍රතිලාභය වේ නම්, එ කලැ ඔහුගේ ඖදාරික ආත්මප්‍රතිලාභය නැති වෙයිද ? අරූපාත්මප්‍රතිලාභයත් නැති වෙයි ද? එ කල්හි ඔහුගේ මනොමය ආත්මප්‍රතිලාභය ම ඇති වෙයි ද?

වහන්ස, යම් කලෙක අරූප ආත්මප්‍රතිලාභය වේ නම්, එ කල්හි ඔහුගේ ඖදාරික ආත්මප්‍රතිලාභය හිස් වේ ද? මනොමය ආත්මප්‍රතිලාභයත් හිස් වේ ද? එ කල්හි ඔහුගේ අරූප ආත්මප්‍රතිලාභය ම ඇති වෙයි ද?

[භාග්‍යවත්හු:] "චිත්‍රය, යම් කලෙක ඖදාරික ආත්මප්‍රතිලාභයවේ ද, එ කල්හි 'මනොමය ආත්මප්‍රතිලාභය' යි ව්‍යවහාරයට නො යෙයි. 'අරූප ආත්මප්‍රතිලාභය' යි ද ව්‍යවහාරයට නො යෙයි. එ කල්හි 'මනොමය ආත්මප්‍රතිලාභය' යි ම ව්‍යවහාරයට යෙයි.

චිත්‍රය, යම් කලෙක මනොමය ආත්මප්‍රතිලාභය වේ ද, එ කලැ 'ඖදාරික ආත්මප්‍රතිලාභය' යි ව්‍යවහාරයට නො යෙයි. 'අරූප ආත්මප්‍රතිලාභය' යි ද ව්‍යවහාරයට නො යෙයි. එ කල්හි 'මනොමය ආත්මප්‍රතිලාභය' යි ම ව්‍යවහාරයට යෙයි.

චිත්‍රය, යම් කලෙක අරූප ආත්මප්‍රතිලාභය වේ ද, එ කලැ 'ඖදාරික ආත්මප්‍රතිලාභය' යි ව්‍යවහාරයට නො යෙයි. 'මනොමය ආත්මප්‍රතිලාභය' යි ව්‍යවහාරයට නො යෙයි. 'අරූප ආත්මප්‍රතිලාභය' යි ම එ කලැ ව්‍යවහාරයට යෙයි.

චිත්‍රය, 'තෝ අතීත කාලයෙහි වූයෙහි ද? තෝ නො ම නො වූයෙහි ද? තෝ අනාගත කාලයෙහි වන්නෙහි ද? තෝ නො ම නො වන්නෙහි ද? තෝ දැන් ඇත් ද? නො ම නැද්ද?' යි ඉදින් මෙසේ නා විචාරත්නාහු නම්, චිත්‍රය, මෙපරිද්දෙන් විචාරන ලද තෝ කෙසේ නම් විසඳන්නෙහි ද.?"

[චිත්‍ර:] "වහන්ස, ඉදින් අන්හු 'තෝ අතීත කාලයෙහි වූයෙහි ද? තෝ නො ම නො වූයෙහි ද? තෝ අනාගත කාලයෙහි වන්නෙහි ද? තෝ නො ම නො වන්නෙහි ද? තෝ දැන් ඇද්ද? තෝ නො ම නැද්ද?" යි මෙසේ විචාරත්නාහු නම්, මෙ පරිද්දෙන් විචාරන ලද මම මෙසේ විසඳන්නෙමි: "අතීත කාලයෙහි මම වීමි, නො ම නො වීමි. අනාගත කාලයෙහි වන්නෙමි, නො ම නො වන්නෙමි. දැන් මම ඇත. නො ම නැත." යි මෙසේ පුළුවුන්නා ලද මම මෙ පරිද්දෙන් විසඳන්නෙමි."

[භාග්‍යවත්හු:] "චිත්‍රය, තට යම් අතීත ආත්මප්‍රතිලාභයෙක් වී නම්, තගේ ඒ ආත්මප්‍රතිලාභය ම සත්‍ය ද? අනාගත ආත්මප්‍රතිලාභය අසත්‍ය (හිස්) ද? වර්තමාන ආත්මප්‍රතිලාභයත් අසත්‍ය ද? තට යම් අනාගත ආත්මප්‍රතිලාභයෙක් වන්නේ නම්, තගේ ඒ ආත්මප්‍රතිලාභය ම සත්‍ය ද? අතීත ආත්මප්‍රතිලාභය හිස් ද? වර්තමාන ආත්මප්‍රතිලාභයත් හිස් ද? තගේ දැන් යම් ආත්මප්‍රතිලාභයෙක් ඇත් නම්, තගේ ඒ ආත්මප්‍රතිලාභය ම සත්‍ය ද? අතීත ආත්මප්‍රතිලාභය හිස් ද? අනාගත ආත්මප්‍රතිලාභයත් හිස් ද?" යි මෙසේ අන්‍යයෝ නා විචාරත්නාහු නම්, මෙසේ පුළුවුන්නා ලද තෝ කෙසේ නම් විසඳන්නෙහි ද?".

සචෙ පන මං භගවන්ත එවං පුච්ඡෙය්‍යුං: යො තෙ අහොසි අතීතො අත්තපටිලාභො, සෙව තෙ අත්තපටිලාභො සචෙවා, මොඝො අනාගතො, මොඝො පච්චුප්පන්නො? යො තෙ භවිස්සති අනාගතො අත්තපටිලාභො, සෙව තෙ අත්තපටිලාභො සචෙවා, මොඝො අතීතො, මොඝො පච්චුප්පන්නො? යො තෙ එතරහි පච්චුප්පන්නො අත්තපටිලාභො, සෙව තෙ අත්තපටිලාභො සචෙවා, මොඝො අතීතො, මොඝො අනාගතො? ති. එවං පුට්ඨො අහං භගවන්ත එවං බ්‍යාකරෙය්‍යං: යො මෙ අහොසි අතීතො අත්ත-පටිලාභො, සෙව මෙ අත්තපටිලාභො තස්මිං සමයෙ සචෙවා අහොසි, මොඝො අනාගතො, මොඝො පච්චුප්පන්නො. යො[1] මෙ භවිස්සති අනාගතො අත්තපටිලාභො, සෙව මෙ අත්තපටිලාභො තස්මිං සමයෙ සචෙවා භවිස්සති, මොඝො පච්චුප්පන්නො. යො මෙ එතරහි පච්චුප්පන්නො අත්ත-පටිලාභො, සෙව මෙ අත්තපටිලාභො සචෙවා, මොඝො අතීතො, මොඝො අනාගතො? ති. එවං පුට්ඨො අහං භගවන්ත එවං බ්‍යාකරෙය්‍යන්ති.

"එවමෙව ඛො චිත්ත යස්මිං සමයෙ ඔළාරිකො අත්තපටිලාභො හොති, නෙව තස්මිං සමයෙ මනොමයො අත්තපටිලාභො'ති සඤ්ඤං ගච්ඡති. න අරූපො අත්තපටිලාභො' ති සඤ්ඤං ගච්ඡති. ඔළාරිකො අත්ත-පටිලාභො' නෙව තස්මිං සමයෙ සඤ්ඤං ගච්ඡති. යස්මිං චිත්ත සමයෙ මනොමයො අත්තපටිලාභො හොති, නෙව තස්මිං සමයෙ ඔළාරිකො අත්තපටිලාභො'ති සඤ්ඤං ගච්ඡති. න අරූපො අත්තපටිලාභො'ති සඤ්ඤං ගච්ඡති. මනොමයො අත්තපටිලාභො' නෙව තස්මිං සමයෙ සඤ්ඤං ගච්ඡති. යස්මිං චිත්ත සමයෙ අරූපො අත්තපටිලාභො හොති, නෙව තස්මිං සමයෙ ඔළාරිකො අත්තපටිලාභො'ති සඤ්ඤං ගච්ඡති, න මනොමයො අත්තපටිලා-භො'ති සඤ්ඤං ගච්ඡති. අරූපො අත්තපටිලාභො' නෙව තස්මිං සමයෙ සඤ්ඤං ගච්ඡති.

සෙය්‍යථාපි චිත්ත ගවා ඛීරං, ඛීරම්හා දධි, දධිම්හා නවනීතං, නවනී-තම්හා සප්පි, සප්පිම්හා සප්පිමණ්ඩො, යස්මිං සමයෙ ඛීරං හොති, නෙව තස්මිං සමයෙ දධීති සඤ්ඤං ගච්ඡති. න නවනීතන්ති සඤ්ඤං ගච්ඡති. න සප්පීති සඤ්ඤං ගච්ඡති, න සප්පිමණ්ඩොති සඤ්ඤං ගච්ඡති. ඛීරං නෙව තස්මිං සමයෙ සඤ්ඤං ගච්ඡති. යස්මිං සමයෙ දධි හොති -පෙ- නවනීතං හොති -පෙ- සප්පි හොති -පෙ- යස්මිං සමයෙ සප්පිමණ්ඩො හොති, නෙව තස්මිං සමයෙ ඛීරන්ති සඤ්ඤං ගච්ඡති. න දධීති සඤ්ඤං ගච්ඡති. න නවනීතන්ති සඤ්ඤං ගච්ඡති. 'සප්පිමණ්ඩො'නෙව තස්මිං සමයෙ සඤ්ඤං ගච්ඡති. එවමෙව ඛො චිත්ත යස්මිං සමයෙ ඔළාරිකො අත්තපටිලාභො හොති -පෙ- යස්මිං චිත්ත සමයෙ මනොමයො අත්ත-පටිලාභො හොති -පෙ- යස්මිං චිත්ත සමයෙ අරූපො අත්තපටිලාභො හොති, නෙව තස්මිං සමයෙ ඔළාරිකො අත්තපටිලාභො' ති සඤ්ඤං ගච්ඡති. න මනොමයො අත්තපටිලාභො' ති සඤ්ඤං ගච්ඡති. 'අරූපො අත්තපටිලභො' නෙව තස්මිං සමයෙ සඤ්ඤං ගච්ඡති.

---

1 යො ම, සත්ත යො වා, PTS.

[චිත්‍ර:] "වහන්ස, අන්‍යයෝ මා ඛණවා 'තව යම් අතීත ආත්මප්‍රතිලාභයෙක් වී නම්, තෙගේ ඒ ආත්මප්‍රතිලාභය ම සත්‍ය ද? අනාගත ආත්මප්‍රතිලාභය හිස් ද? වර්තමාන ආත්මප්‍රතිලාභයත් හිස් ද? තගේ යම් අනාගත ආත්මප්‍රතිලාභයෙක් වන්නේ නම්, තගේ ඒ අනාගත ආත්මප්‍රතිලාභය ම සත්‍ය ද? අතීත ආත්මප්‍රතිලාභය හිස් ද? වර්තමාන ආත්මප්‍රතිලාභයත් හිස් ද? තගේ දැන් යම් ආත්මප්‍රතිලාභයෙක් ඇත් නම් තගේ ඒ ආත්මප්‍රතිලාභය ම සත්‍ය ද? අතීත ආත්මප්‍රතිලාභය හිස් ද? අනාගත ආත්මප්‍රතිලාභයත් හිස් ද?' යි මෙසේ විචාරන්නාහු නම්, මෙසේ විචාරන ලද මම 'මගේ යම් අතීත ආත්මප්‍රතිලාභයෙක් වී නම් එය ම එ සමයෙහි සත්‍ය ය. අනාගත ආත්මප්‍රතිලාභය හිස් ය. වර්තමාන ආත්මප්‍රතිලාභය ද හිස් ය. මගේ යම් අනාගත ආත්මප්‍රතිලාභයෙක් වන්නත් නම්, එ කල්හි මගේ එ අත්බව ම සත්‍ය වන්නේ ය. අතීත ආත්මප්‍රතිලාභය හිස් වන්නේ ය. වර්තමාන ආත්මප්‍රතිලාභය ද හිස් වන්නේ ය. මගේ දැන් යම් වර්තමාන ආත්මප්‍රතිලාභයෙක් ඇද්ද, එය ම සත්‍ය ය අතීත ආත්මප්‍රතිලාභය හිස් ය. අනාගත ආත්මප්‍රතිලාභයත් හිස් යැ' යි මෙසේ විසඳන්නෙමි. වහන්ස, මේ යටකී පරිදි විචාරන ලදුයෙම් මේ පරිද්දෙන් විසඳන්නෙමි".

[භාග්‍යවත්හු:] "චිත්‍රය, එසේ ම යම් කලෙක ඔළුරික ආත්ම-ප්‍රතිලාභය වේ නම්, එකල්හි 'මනොමය ආත්මප්‍රතිලාභයැ' යි ව්‍යවහාරයට නො යෙයි. අරූප ආත්මප්‍රතිලාභයැ යි ද ව්‍යවහාරයට නො යෙයි. ඔළුරික ආත්මප්‍රතිලාභයැ යි ම එකල්හි ව්‍යවහාරයට යෙයි. චිත්‍රය, යම් කලෙක මනොමය ආත්මප්‍රතිලාභය වේ ද, ... චිත්‍රය, එ කල්හි ඔළුරික ආත්ම-ප්‍රතිලාභයැ යි ව්‍යවහාරයට නො යෙයි. අරූප ආත්මප්‍රතිලාභයැ යි ද ව්‍යවහාරයට නො යෙයි. මනොමය ආත්මප්‍රතිලාභයැ යි ම එ සමයෙහි ව්‍යවහාරයට යෙයි. චිත්‍රය, යම් කලෙක අරූප ආත්මප්‍රතිලාභය වේ ද, එ කලැ ඔළුරික ආත්මප්‍රතිලාභ යැ යි ව්‍යවහාරයට නො යෙයි. මනො-මය ආත්මප්‍රතිලාභයැ යි ද ව්‍යවහරයට නො යෙයි. අරූප ආත්මප්‍රති-ලාභයැ යි ම එ කලැ ව්‍යවහාරයට යෙයි.

චිත්‍රය, දෙත ගෙන් කිරිත්, කිරෙන් දිහිත්, දිහියෙන් වෙඬරුත්, වෙඬරුයෙන් ගිතෙලුත්, ගිතෙලින් ගීමඬත් යම්සේ වේ ද, යම් කලෙක කිරි වේ නම් එ කල්හි දිහි යැ යි ව්‍යවහාරයට නො යේ ද, වෙඬුරු යි ව්‍යවහාරයට නො යේ ද, ගිතෙලැ යි ව්‍යවහාරයට නො යේ ද, ගීමඬැ යි ව්‍යවහාරයට නො යේ ද, කිරි යැ යි ම එකලැ ව්‍යවහාරයට යේ ද; යම් කලෙක දිහි වේ නම්... වෙඬරු වේ නම්... ගිතෙල් වේ නම්... යම් කලෙක ගීමඬ වේ නම්, එ කලැ කිරි යි වහරට නො යේ ද, දිහි යැ යි වහරට නො යේ ද, වෙඬුරු යි වහරට නො යේ ද, ගිතෙලැ යි වහරට නො යේ ද, ගීමඬැ යි ම එ කලැ වහරට යේ ද, චිත්‍රය, එසේ ම යම් කලෙක ඔළුරික ආත්මප්‍රතිලාභය වේ ද... චිත්‍රය, යම් කලෙක මනොමය ආත්මප්‍රතිලාභය වේ ද... චිත්‍රය, යම් කලෙක අරූප ආත්ම-ප්‍රතිලාභය වේ ද, එ සමයෙහි ඔළුරික ආත්මප්‍රලාභයැ යි වහරට නො යෙයි. මනොමය ආත්මප්‍රතිලාභයැ' යි ද වහරට නො යෙයි. අරූප ආත්මප්‍රතිලාභයැ යි ම එකල්හි වහරට යෙයි.

ඉමං[1] ඛො චිත්ත ලොකසම්මුතිං ලොකනිරුත්තිං ලොකවොහාරං ලොකපඤ්ඤත්තිං යාහි තථාගතො වොහරති අපරාමසන්ති.

එවං වුත්තෙ පොට්ඨපාදො පරිබ්බාජකො භගවන්තං එතදවොච: අභික්කන්තං භන්තෙ. අභික්කන්තං භන්තෙ. සෙය්‍යථාපි භන්තෙ නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය 'චක්ඛුමන්තො රූපානි දක්ඛින්ති'ති, එවමෙව භන්තෙ භගවතා අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භන්තෙ භගවන්තං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භන්තෙ භගවා[2] ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

චිත්තො පන හත්ථිසාරිපුත්තො භගවන්තං එතදවොච: අභික්කන්තං භන්තෙ. අභික්කන්තං භන්තෙ. සෙය්‍යථාපි භන්තෙ නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය 'චක්ඛුමන්තො රූපානි දක්ඛින්ති'ති, එවමෙව භන්තෙ භගවතා අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භන්තෙ භගවන්තං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. ලභෙය්‍යාහං භන්තෙ භගවතො සන්තිකෙ පබ්බජ්ජං, ලභෙය්‍යං උපසම්පදන්ති.

අලත්ථ ඛො චිත්තො හත්ථිසාරිපුත්තො භගවතො සන්තිකෙ පබ්බජ්ජං. අලත්ථ උපසම්පදං. අචිරූපසම්පන්නො ඛො පනායස්මා චිත්තො හත්ථිසාරිපුත්තො එකො වූපකට්ඨො අප්පමත්තො විහරන්තො න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති තදනුත්තරං බ්‍රහ්මචරියපරිය්‍යොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායා'ති අබ්භඤ්ඤාසි. අඤ්ඤතරො ච ඛො පනායස්මා චිත්තො හත්ථිසාරිපුත්තො අරහතං අහොසීති.

පොට්ඨපාදසුත්තං නිට්ඨිතං නවමං.

1. ඉමිං, PTS. 2. භගවා. සයං, භවං ගොතමො, සීලු.

චිත්‍රය, තථාගත තෙමේ නාමරූපමාත්‍රයෙන් පරාමර්ශිත නො කරනුයේ "ඔළාරිකො අත්තපටිලාභො" යන ආදි යම් සංඥවශයෙන් ව්‍යවහාර කෙරේ ද, ඒ ඕදාරික ආත්මප්‍රතිලාභාදිකු ලොවැ සංඥමාත්‍රයෝ ය, ලොවැ වචනපථමාත්‍රයෝ ය, ලොවැ ව්‍යවහාර මාත්‍රයෝ ය, ලොවැ නාමප්‍රඥප්තිමාත්‍රයෝ ය.

65. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ කල්හි පොට්ඨපාද පිරිවැජි තෙම "වහන්ස, අභිකාන්ත යැ. වහන්ස, අභිකාන්ත යැ. වහන්ස, යම්සේ යැටිකුරු කොට තබන ලද්දක් උඩුකුරු කරන්නේ හෝ වේ ද, වැසුණු දෙයක් විවෘත කරන්නේ හෝ වේ ද, මංමුලා වූවකුට මඟ කියන්නේ හෝ වේ ද, 'ඇස් ඇතියන් රූප දකිති' යි අඳුරෙහි තෙල්පහනක් දරන්නේ හෝ වේ ද, එපරිද්දෙන් ම භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් කරුණින් දහම් පැවැසිණ. වහන්ස, ඒ මම භාග්‍යවතුන් වහන්සේ ද ධර්මය ද භික්ෂුසඞ්ඝයා ද සරණ යෙමි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මා අද පටන් කොට දිවිහිමියෙන් සරණ ගිය උවසකු කොට සලකන සේක් වා" යි භාග්‍යවතුන් වහන්සේට සැළ කෙළේ ය.

ඇත්සැරිපුත් චිත්‍ර වූ කලි 'වහන්ස, අභිකාන්ත යැ. වහන්ස, අභිකාන්ත යැ. වහන්ස, යම්සේ යැටිකුරු කොට තබන ලද්දක් උඩුකුරු කරන්නේ හෝ වේ ද, වැසුණු දෙයක් විවෘත කරන්නේ හෝ වේ ද, මංමුලා වූවකුට මඟ කියන්නේ හෝ වේ ද, 'ඇස් ඇතියන් රූප දකිති' යි අඳුරෙහි තෙල්පහනක් දරන්නේ හෝ වේ ද, එ පරිද්දෙන් ම භාග්‍ය-වතුන් වහන්සේ විසින් නොයෙක් කරුණින් දහම් පැවසිණ. වහන්ස, ඒ මම භාග්‍යවතුන් වහන්සේ ද ධර්මය ද භික්ෂුසඞ්ඝයා ද සරණ යෙමි. වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේ වෙතැ පැවිද්දත් උපසම්පදාවත් ලබමි වා" යි කී ය.

ඇත්සැරිපුත් චිත්‍ර තෙම භාග්‍යවතුන් වහන්සේ වෙතැ පැවිද්ද ලදුයේ ම ය, උපසම්පදාවත් ලදුයේ ම ය. ඇත්සැරිපුත් ආයුෂ්මත් , චිත්‍ර තෙම උපසම්පදාව ලත් නොබෝ කල් ඇත්තේ ම, එකලා වූයේ, ගණයා කෞසරත් වෙත් වූයේ, නො පමා වූයේ, කෙලෙස් තවන වැරයන්නේ, නිවන් කරා මෙහෙයූ සිතැති වැ වසනුයේ, යම්ක් පිණිස කුලපුත්‍රයෝ මෙහෙනොවට ම ගිහිගෙන් නික්මැ සඟුන් වදින් ද, ඒ නිරුත්තර වූ බ්‍රහ්මචර්යාවසානය (රහත්ඵලය) මේ අත්බවහි මැ තෙමේ ම වෙසෙසි නුවණින් දැන පසක් කොට ලැබැ විසී ය. 'පුනර්ජන්මය ක්ෂීණ විය, මඟබඹසර වැසැ නිමැවිණ, කටයුතු දැ කරනු ලැබී ය. මේ පිණිස තවත් කළ යුත්තෙක් නැතැ' යි වෙසෙසින් දැන ගත්තේය. ආයුෂ්මත් ඇත්සැරිපුත්‍ර චිත්‍ර ද රහතුන්ගෙන් එක්කරු තමෙක් වී ය.

නවවනු පොට්ඨපාද සූත්‍රය නිමියේ ය.

10

සුභසුත්තං

1. එවං මේ සුතං. එකං සමයං ආයස්මා ආනන්දො සාවත්ථියං විහරති **ජේතවනෙ** අනාථපිණ්ඩිකස්ස ආරාමෙ අචිරපරිනිබ්බුතෙ භගවති. තෙන ඛො පන සමයෙන සුභො මාණවො තොදෙය්‍යපුත්තො සාවත්ථියං පටිවසති කෙනච්දෙව කරණීයෙන.

2. අථ ඛො සුභො මාණවො තොදෙය්‍යපුත්තො අඤ්ඤතරං මාණවකං ආමන්තෙසි: එහි ත්වං මාණවක, යෙන සමණො ආනන්දො තෙනුපසඞ්කම. උපසඞ්කමිත්වා මම වචනෙන සමණං ආනන්දං අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡ "සුභො මාණවො තොදෙය්‍යපුත්තො භවන්තං ආනන්දං අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡති"ති. එවං ච වදෙහි "සාධු කිර භවං ආනන්දො යෙන සුභස්ස මාණවස්ස තොදෙය්‍යපුත්තස්ස නිවෙසනං තෙනුපසඞ්කමතු අනුකම්පං උපාදාය" ති.

3. 'එවං භො'ති ඛො සො මාණවකො සුභස්ස මාණවස්ස තොදෙය්‍යපුත්තස්ස පටිස්සුත්වා යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා ආනන්දෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරණීයං[1] වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො මාණවකො ආයස්මන්තං ආනන්දං එතදවොච: සුභො මාණවො තොදෙය්‍යපුත්තො භවන්තං ආනන්දං අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡති. එවං ච වදෙති "සාධු කිර භවං ආනන්දො යෙන සුභස්ස මාණවස්ස තොදෙය්‍යපුත්තස්ස නිවෙසනං තෙනුපසඞ්කමතු අනුකම්පං උපාදාය" ති.

4. එවං වුත්තෙ ආයස්මා ආනන්දො තං මාණවකං එතදවොච: අකාලො ඛො මාණවක. අත්ථි මෙ අජ්ජ භෙසජ්ජිතත්තා පිතා. අප්පෙව නාම සෙවපි උපසඞ්කමෙය්‍යාම කාලඤ්ච සමයඤ්ච උපාදාය. 'එවං භො'ති ඛො සො මාණවකො ආයස්මතො ආනන්දස්ස පටිස්සුත්වා උට්ඨායාසනා යෙන සුභො මාණවො තොදෙය්‍යපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා සුභං මාණවං තොදෙය්‍යපුත්තං එතදවොච: "අවොචුම්හ[2] ඛො මයං භොතො වචනෙන තං භවන්තං ආනන්දං: සුභො මාණවො තොදෙය්‍යපුත්තො භවන්තං ආනන්දං අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡති. එවං ච වදෙති 'සාධු කිර භවං ආනන්දො යෙන සුභස්ස මාණවස්ස තොදෙය්‍යපුත්තස්ස නිවෙසනං තෙනුපසඞ්කමතු අනුකම්පං උපාදාය' ති. එවං වුත්තෙ භො සමණො ආනන්දො මං එතදවොච: 'අකාලො ඛො මාණවක. අත්ථි මෙ අජ්ජ භෙසජ්ජිතත්තා පිතා. අප්පෙව නාම සෙවපි උපසඞ්කමෙය්‍යාම කාලඤ්ච සමයඤ්ච උපාදාය" ති. "එත්තාවතාපි ඛො භො කතමෙව එතං, යතො සො භො භවං[3] ආනන්දො ඔකාසමකාසි සචෙතනොපි උපසඞ්කමනාය" ති.

---

1. කථං සාරණීයං (මහායානගතෙසු)
2. අවොචුම්හා, සීමු. 3. ඛො සො භවං, PTS.

10

ශුභසූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදි. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි තොබෝ කල්හි අනඳ තෙරණුවෝ සැවැත්නුවර තිසා දෙව්රම් විහාරයෙහි වූ අනේපිඬුසිටුහු අරමෙහි වෙසෙති. එ සමයෙහි තොදෙය්‍ය බමුණහු පුත් වූ ශුභ මාණව තෙම කිසි කටයුත්තෙකින් සැවැත්නුවරැ වේසෙයි.

2. එකලැ තොදෙය්‍ය බමුණහු පුත් ශුභ මාණව තෙම එක්තරා මාණවකයකු බණවා, "මාණවකය, මෙහි එන්නැ. අනඳ මහණහු කරා එළැඹෙන්නැ. එළැඹැ "ශුභ මාණව තෙමේ පින්වත් අනඳ වහන්ද අල්පාබාධ නියා, නීරෝග නියා, හැල්ලු පැවැතුම් ඇති නියා, කාබල ඇති නියා, සුවපහසු විහරණ ඇති නියා විහරා" යි මා බසින් පින්වත් අනඳ වහන්ද අල්පාබාධ නියා... විහරන්නැ. "පින්වත් අනඳ තෙරණුවෝ අනුකම්පා සඳහා තොදෙය්‍ය බමුණහු පුත් ශුභමාණවයාගේ ගෙය කරා වඩිත් වා. එසේ වඩිතොත් ඒ ඉතා මැනැවැ" යි මෙසේත් කියන්නැ යි ඇණැවි ය.

3. 'එසේ යැ භවතැ' යි කියා ම ඒ මාණවක තෙම තොදෙය්‍ය බමුණහු පුත් ශුභ මාණවයාට පිළිවදන් දී අනඳ තෙරුන් කරා එළැඹියේ ය. එළැඹැ අනඳ තෙරුන් හා සතුටු විය. සතුටට කරුණු වූ සිතැ රැඳැවියැ සතු වූ කථා නිමවා පසෙකැ හිඳැ ගත. පසෙකැ හුන් ම ඒ මාණවක තෙම "තොදෙය්‍ය බමුණහු පුත් ශුභ මාණව භවත් අනඳ වහන්ද අල්පාබාධ නියා, නීරෝග නියා, හැල්ලු පැවැතුම් ඇති නියා, කාබල ඇති නියා, සුඛ විහරණ ඇති නියා විහරයි. 'පින්වත් අනඳ වහන්ද තොදෙය්‍ය බමුණහු පුත් ශුභ මාණවයාගේ ගෙය කරා එළැඹෙත් වා එසේ එළැඹෙතොත් ඒ ඉතා මැනැවැ යි මෙසේත් කියා" යැ යි අනඳ තෙරුනට සැළ කෙළේ ය.

4. මෙසේ කී කලැ අනඳ තෙරණුවෝ ඒ මාණවකයාට "මාණවකය, දැන් තොකල් ම ය. අද මා සඵල්ප බෙහෙදක් පිවා ඇත. කල් වේලා සලකා සෙට වත් එළැඹෙත්තමෝ වේ ද" යි වදාළහ. 'එසේ යැ පින්වතැ'යි කියා ම ඒ මාණවක තෙම අනඳ තෙරුනට පිළිවදන් දී හුනස්නෙන් නැගී තොදෙය්‍ය පුත් ශුභ මාණවයා වෙත ගියේ ය. ගොස් තොදෙය්‍ය පුත් ශුභ මාණවයාට 'තොදෙය්‍ය පුත් ශුභ මාණව තෙම පින්වත් අනඳ වහන්ද අල්පාබාධ නියා, නීරෝග නියා, හැල්ලු පැවැතුම් ඇති නියා, කාබල ඇති නියා, සුඛ විහරණ ඇති නියා, විහරයි. පින්වත් අනඳ වහන්ද අනුකම්පා කොට තොදෙය්‍ය බමුණු පුත් ශුභ මාණවයාගේ ගෙට වඩිත් වා. එසේ වඩිතොත් ඉතා මැනැවැයි මෙසේත් කියා"යැ යි භවත්හුගේ වචනයෙන් ඒ පින්වත් අනඳ වහන්දුට සැළ කළමිහ. භවත, අප එසේ සැළ කළ කල්හි අනඳ වහන්ද මට "මාණවකය, දැන් තොකල් ම ය. අද මා සඵල්ප බෙහෙදක් පිවා ඇත. කල් වේලා සලකා සෙට වත් එළැඹෙත්තමෝ වේ ද' යි වදාළහ" යි කීයේ ය. "භවත, යම් හෙයෙකින් පින්වත් අනඳ වහන්ද හෙට වත් මෙහි එළැඹෙන්නට අවකාශ කළෝ ද, මෙහෙයකින් මත් මේ (අප නිමන්ත්‍රණය පිළිගැන්ම) කරන ලද්දේ මැ යැ" යි ශුභ මාණව කී ය.

5. අථ ඛො ආයස්මා ආනන්දො තස්සා රත්තියා අච්චයෙන පුබ්බන්හ-සමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය චෙතකෙන භික්ඛුනා පච්ඡාසමණෙන යෙන සුභස්ස මාණවස්ස තොදෙය්‍යපුත්තස්ස නිවෙසනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. අථ ඛො සුභො මාණවො තොදෙය්‍යපුත්තො යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා ආනන්දෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි.

6. එකමන්තං නිසින්නො ඛො සුභො මාණවො තොදෙය්‍යපුත්තො ආයස්මන්තං ආනන්දං එතදවොච: "භවං හි ආනන්දො තස්ස භොතො ගොතමස්ස දීඝරත්තං උපට්ඨාකො සන්තිකාවචරො සමීපචාරී. භවං එතං ආනන්දො ජානෙය්‍ය යෙසං සො භවං ගොතමො ධම්මානං වණ්ණවාදී අහොසි, යථා ච ඉමං ජනතං සමාදපෙසි නිවෙසෙසි පතිට්ඨාපෙසි. කතමෙසානං ඛො භො ආනන්ද ධම්මානං සො භවං ගොතමො වණ්ණවාදී අහොසි? කථා ච ඉමං ජනතං සමාදපෙසි නිවෙසෙසි පතිට්ඨාපෙසි?" ති.

7. "තිණ්ණං ඛො මාණව ධම්මානං සො භගවා වණ්ණවාදී අහොසි. එවඤ්ච ඉමං ජනතං සමාදපෙසි නිවෙසෙසි පතිට්ඨාපෙසි. කතමෙසං තිණ්ණං? අරියස්ස සීලක්ඛන්ධස්ස අරියස්ස සමාධික්ඛන්ධස්ස අරියස්ස පඤ්ඤාක්ඛන්ධස්ස. ඉමෙසං ඛො මාණව තිණ්ණං ධම්මානං සො භගවා වණ්ණවාදී අහොසි. එවඤ්ච ඉමං ජනතං සමාදපෙසි නිවෙසෙසි පතිට්ඨාපෙසී" ති.

8. "කතමො පන සො භො ආනන්ද අරියො සීලක්ඛන්ධො යස්ස සො භවං ගොතමො වණ්ණවාදී අහොසි, යථා ච ඉමං ජනතං සමාදපෙසි නිවෙසෙසි පතිට්ඨාපෙසී?" ති.

9. "ඉධ මාණව තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා. සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං. පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති.

5. ඉක්බිත්තෙන් අනඳ තෙරණුවෝ එ රැය ඇවැමෙන් පෙරවරුයෙහි හැඳැ පෙරෙවැ පාත්‍රිවුරැ ගෙන පසුමහණකු වූ වෙතක භික්ෂුහු කැවුවැ තොදෙය්‍ය පුත් ශුභ මාණවයාගේ ගෙය කරා එළැඹියහ. එළැඹ පණවන ලද අස්නැ හිඳැ ගත්හ. එ කල්හි ම තොදෙය්‍ය පුත් ශුභ මාණව තෙම අනඳ තෙරුන් කරා එළැඹියේ ය. එළැඹැ අනඳ තෙරුන් හා සතුටු විය. සතුටට කරුණු වූ සිතැ රැඳැවියැ සුතු වූ කතා කොට නිමවා එක් පසෙක හිඳැ ගත.

6. එක් පසෙක හිඳැ ගත් ම තොදෙය්‍ය පුත් ශුභ මාණව තෙම අනඳ තෙරුනට මෙය කී ය: "පින්වත් අනඳ වහන්ද වූ කලි ඒ භවත් ගෞතමයන් වහන්සේට දික් කලක් උපස්ථායක වූ, වෙත ම ගැවැසුණු, ළඟ ම හැසුරැණු කෙනෙක. ඒ භවද්ගෞතමයන් වහන්සේ යම් දහම් කෙනෙ-කුන්ගේ ගුණ කියන සුලු වූ සේක් ද, යම් දහමෙක්හි මේ ජනයමුහයා ගැන්වූ සේක් ද, පිවිස්වූ සේක්ද, පිහිටුවූ සේක් ද, එය පින්වත් අනඳ වහන්ද දන්නාහ. පින්වත් අනඳ තෙරුනි, ඒ භවද් ගෞතමයන් වහන්සේ කවර නම් දහම් කෙනෙකුන්ගේ ගුණ කියන සුලු වූ සේක් ද? කවර නම් දහමෙක්හි මේ ජනමුළුව ගැන්වූ සේක් ද? පිවිස්වූ සේක් ද.?" පිහිටු වූ සේක්ද?

7. (එ විට අනඳ තෙරණුවෝ මෙසේ වදාළහ:) "මාණවය, ඒ භාග්‍ය වතුන් වහන්සේ සකඛ තුනෙක ගුණ වදාරන සුලු වූ සේක. එහි ම මේ දනමුළුව ගැන්වූ සේක, පිවිස්වූ සේක, පිහිටිවූ සේක. කවර සකඛ තුනෙක ද? යත්: ආයීශීලසකඛයත් ආයීසමාධිසකඛයත් ආයී ප්‍රඥාසකඛයත් යන තුනේ ය. මාණවය, ඒ භාග්‍යවතුන් වහන්සේ මේ තුන් සකඛයන්ගේ ගුණ වදාරන සුලු වූ සේක. මෙහි ම මේ දනමුළුව ගැන්වූ සේක, පිවිස්වූ සේක, පිහිටිවූ සේක."

8. [ශුභ මාණව:] "පින්වත් අනඳ තෙරුනි, ඒ භවද්ගෞතමයන් වහන්සේ යම් දහමක්හුගේ ගුණ වදාරන සුලු වූ සේක් නම්, යම් දහමෙක්හි මේ ජනතාව ගැන්වූ සේක් නම්, පිවිස්වූ සේක් නම්, පිහිටිවූ සේක් නම්, ඒ ආයී ශීලසකඛය කවරෙ යැ?"

9. [අනඳ තෙරණුවෝ:] "මාණවය, මෙහි අර්හත් වූ සම්‍යක්සම්බුද්ධ වූ විද්‍යාචරණසම්පන්න වූ සුගත වූ ලෝකවිත් වූ නිරුත්තර පුරුෂදම්‍යසාරථි වූ දෙවිමිනිස්නට ශාස්තා වූ බුද්ධ වූ භගවත් වූ තථාගත තෙමේ ලොවැ පහළ වෙයි. හේ දෙවියන් සහිත වූ මරුන් සහිත වූ බඹුන් සහිත වූ මේ ලෝකය ද, මහණ බමුණන් සහිත, සම්මත දෙවියන් (රජුන්) හා සෙසු මිනිසුන් හා සහිත සත්ත්වප්‍රජාව ද තෙමේ විශිෂ්ට නුවණින් දැන, ප්‍රත්‍යක්ෂ කොට, ඔවුනට අවබෝධ කරවයි. හේ දහම් දෙසනුයේ ආදියෙහි භද්‍රක (නිවරද) කොට, මධ්‍යයෙහි භද්‍රක (නිවරද) කොට, අවසානැ භද්‍රක (නිවරද) කොට, අර්ථ සහිත කොට, ව්‍යංජන සහිත කොට, සර්ප්‍රකාරයෙන් පරිපූර්ණ කොට, දහම් දෙසයි. (එසේ දෙසනුයේ ශික්ෂාත්‍රයයෙන් සංගෘහීත වූ) පරිශුද්ධ ශාසනබ්‍රහ්මචර්‍යය ප්‍රකාශ කෙරෙයි.

10. තං ධම්මං සුණාති ගහපති වා ගහපතිපුත්තො වා අඤ්ඤතරස්මිං වා කුලෙ පච්චාජාතො. සො තං ධම්මං සුත්වා තථාගතෙ සද්ධං පටිලභති. සො තෙන සද්ධාපටිලාභෙන සමන්නාගතො ඉති පටිසංචික්ඛති: 'සම්බාධො ඝරාවාසො රජාපථො[1]. අබ්භොකාසො පබ්බජා. නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්තපරිසුද්ධං සඛලිකිතං බ්‍රහ්මචරියං චරිතුං. යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය'න්ති.

11. සො අපරෙන සමයෙන අප්පං වා භොගක්ඛන්ධං පහාය මහන්තං වා භොගක්ඛන්ධං පහාය අප්පං වා ඤාතිපරිවට්ටං පහාය මහන්තං වා ඤාති-පරිවට්ටං පහාය කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජති. සො එවං පබ්බජිතො සමානො පාති-මොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී, සමාදාය රක්ඛති සික්ඛාපදෙසු කායකම්මෙන සමන්නාගතො කුසලෙන, පරිසුද්ධාජීවො සීලසම්පන්නො ඉන්ද්‍රියෙසු ගුත්ත-ද්වාරො භොජනෙ මත්තඤ්ඤූ සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො සන්තුට්ඨො.

12. කථඤ්ච මාණව භික්ඛු සීලසම්පන්නො හොති? ඉධ මාණව භික්ඛු පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො. සබ්බපාණභූතහිතානුකම්පී විහරති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

13. අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො හොති දින්නාදායී දින්නපාටිකඛී. අථෙනෙන සුචිභූතෙන අත්තනා විහරති. ඉදම්පි' ස්ස හොති සීලස්මිං.

14. අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී හොති ආරාචාරී[2] විරතො මෙථුනා ගාම්ධම්මා. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

15. මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො හොති සච්චවාදී සච්චසන්ධො ථෙතො[3] පච්චයිකො අවිසංවාදකො ලොකස්ස. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

---

1. රජාපථො, කත්ථචි. 2 අනාචාරී, මජ්ඣං
3. ථෙතො, ස්‍යා.

10 ගැහැවියෙක් හෝ ගැහැවිපුතෙක් හෝ අන් එක්තරා කුලයෙක උපන්නෙක් හෝ ඒ ධර්මය අසයි. හේ ඒ දහම් අසා තථාගත බුදුරජුහු කෙරෙහි සැදැහැ ඇති කෙරෙයි. හේ ඒ ශ්‍රද්ධාලාභයෙන් සමන්විත වූයේ, 'ගිහිගෙයි විසීම සම්බාධයෙකි (අවහිරයෙකි). රාගාදි රජස් නැගෙන රජස් පථයෙකි. පැවිද්ද (සම්බාධ නැති) අභ්‍යවකාශය (එළි මහත) වැන්න. ගිහිගෙයි වසන්නහු විසින් එකාන්තයෙන් පිරිපුන් කොට, එකාන්තයෙන් පිරිසිදු කොට, ශඛලිඛිතයක් සේ කොට මේ බඹසර සරන්නට පහසු නො වේ. (එබැවින්) මම කෙහෙරවුලු බහවා, කසාවත් හැඳ පෙරෙවා, ගිහිගෙන් පැවිදිබිමට වදනෙම් නම් යෙහෙකැ'යි මෙසේ නුවණින් සලකයි.

11. හේ පසු කාලෙක අල්ප වූ හෝ සම්පත් රැස හැරැ, මහත් වූ හෝ සම්පත් රැස හැරැ, මඳ වූ හෝ නැපිරිස හැරැ, මහත් වූ හෝ නැපිරිස හැරැ, කෙහෙරවුලු බහවා, කසාවත් හැඳ පෙරෙවා, ගිහිගෙන් පැවිදිබිමට වදී. හේ මෙසේ පැවිදි වූයේ ම ප්‍රාතිමෝක්ෂසංවරයෙන් සමන්විත වූයේ, ආචාරයෙන් හා ගෝචරයෙන් හා යුක්ත වූයේ, සුවල්පමාත්‍ර වූ ද වරදෙහි බිය දක්නේ, නිවරද වූ කායවාක්කර්මයෙන් සමන්විත වූයේ එහෙයින් ම පිරිසිදු ආජීව ඇතියේ, සිල්වත් වූයේ, ඉන්ද්‍රියයන්හි වැසූ දොර ඇතියේ, බොජ්-ජන්හි පමණ දන්නේ, (සිත් තන්හි) සිහියෙන් හා නුවණින් හා යුක්ත වූයේ, සිවුපසයෙහි තුන්වැදැරුම් සතුටින් සතුටු වූයේ, ශික්ෂාපදයන්හි සමාදන් වැ හික්මෙයි.

12. මාණවය, මහණ තෙමේ කෙසේ නම් සිල්වත් වේ ද යත්: මෙහි මහණ තෙමේ ප්‍රාණඝාතය හැරැ දමා, ප්‍රාණඝාතයෙන් වෙනසින් වැළැක්කේ වෙයි. බහා තැබූ දඬුමුගුරු ඇත්තේ (දඬුමුගුරු නො දරන්නේ), බහා තැබූ ආයුධ ඇත්තේ (ආයුධ නො දරන්නේ), පවට පිළිකුල් කරන්නේ, මෛත්‍රියට පැමිණියේ (මෛත්‍රියෙන් යුක්ත වූයේ), සියලු සතුන් කෙරෙහි හිතානුකම්පා ඇති වැ වෙසේ. මේ ද ඔහුගේ එක් ශීලයෙක් වේ.

13. හේ අදත්තාදානය හැරැ ලා, නොදුන් දෑය ගැන්මෙන් වැළැක්කේ වෙයි. දුන් දෑය ම පිළිගන්නාසුලු වූයේ, දුන් දෑය ම සිතිනුත් සැමැති වැ ඉවසන සුලු වූයේ, නොසොර වූ පිරිසිදු සිතින් යුතු වැ වෙසේ. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

14. හේ අබ්‍රහ්මචරිය දුරැ ලා බඹසර සරන්නේ වෙයි. ගැමිදහමක් වූ මෙවුන්දමින් දුරු වැ හැසිරෙන්නේ, එයින් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

15. හේ බොරු කීම දුරැ ලා, බොරු කීමෙන් වැළැක්කේ වෙයි. ඇත්ත කියනසුලු වූයේ, ඇත්තෙන් ඇත්ත ගළපා කියන්නේ, තහවුරු වැ පිහිටි කථා ඇත්තේ, ඇදහිය යුතු කථා ඇත්තේ, ලොව නො රවටන්නේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

16. පිසුණං වාචං[1] පහාය පිසුණාය වාචාය පටිවිරතො හොති. ඉතො සුත්වා න අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය. අමුත්‍ර වා සුත්වා න ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය. ඉති භින්නානං වා සන්ධාතා, සංහිතානං වා අනුප්පදාතා[2] සමග්ගාරාමො[3] සමග්ගරතො සමග්ගනන්දී සමග්ගකරණිං වාචං භාසිතා හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

17. ඵරුසං වාචං[4] පහාය ඵරුසාය වාචාය පටිවිරතො හොති. යා සා වාචා නෙලා කණ්ණසුඛා පෙමනීයා[5] හදයඞ්ගමා පොරී බහුජනකන්තා බහුජනමනාපා, තථාරූපං[6] වාචං භාසිතා හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

18. සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතො හොති කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී. නිධානවතිං වාචං භාසිතා හොති කාලෙන සාපදෙසං පරියන්තවතිං අත්ථසංහිතං. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

19. බීජගාමභූතගාමසමාරම්භා පටිවිරතො හොති. එකභත්තිකො හොති රත්තූපරතො පටිවිරතො විකාලභොජනා. නච්චගීතවාදිතවිසූක-දස්සනා පටිවිරතො හොති. මාලාගන්ධවිලෙපනධාරණමණ්ඩනවිභූසනට්ඨානා පටිවිරතො හොති. උච්චාසයනමහාසයනා පටිවිරතො හොති. ජාතරූප-රජතපටිග්ගහණා පටිවිරතො හොති. ආමකධඤ්ඤපටිග්ගහණා පටිවිරතො හොති. ආමකමංසපටිග්ගහණා පටිවිරතො හොති. ඉත්ථිකුමාරිකපටිග්ගහණා පටිවිරතො හොති. දාසිදාසපටිග්ගහණා පටිවිරතො හොති. අජෙළක-පටිග්ගහණා පටිවිරතො හොති. කුක්කුටසූකරපටිග්ගහණා පටිවිරතො හොති. හත්ථිගවස්සවළවාපටිග්ගහණා පටිවිරතො හොති. ඛෙත්තවත්ථුපටිග්ගහණා පටිවිරතො හොති. දූතෙය්‍යපහිණගමනානුයොගා පටිවිරතො හොති. කයවික්කයා පටිවිරතො හොති. තුලාකූටකංසකූටමානකූටා පටිවිරතො හොති. උක්කොටනවඤ්චනනිකතිසාචියොගා පටිවිරතො හොති. ඡේදනවධබන්ධනවිපරාමොසආලොපසහසාකාරා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

චුල්ලසීලං නිට්ඨිතං.

---

1. පිසුණාවාචං, PTS. 2 අපදදතා, PTS. 3. සමග්ගාරාමො, මජ්ඣං.
4. ඵරුසාවාචං, PTS. 5. පෙමනියා, මජ්ඣං.
6. එවරූපිං PTS.

16. හේ කේලාම් කීම දුරු ලා, කේලාම් කීමෙන් වැළැක්කේ වේ. මේ තැනින් අසා මොවුන් (ඔවුන්ගෙන්) බිඳුවනු පිණිස එතැන්හි නො කියනසුලු වූයේ, එ තැනින් අසා ඔවුන් (මොවුන්ගෙන්) බිඳුවනු පිණිස මේ තන්හි නො කියනසුලු වූයේ, මෙසේ බිඳුණවුන් ගළපන්නේ (සමග කරන්නේ) ද, එකට ගැළැපුණවුන් (සමඟියට පැමිණියවුන්) හට රුකුල් දෙන්නේ ද වෙයි. සමඟියෙන් සිටින්නවුන් හා වාසය කැමැත්තේ, සමඟියෙන් වසන්නවුනට කැමැත්තේ, සමග වැ සිටින්නවුනට සතුටු වනුයේ, සමඟිය ඇති කරන බස් කියන්නේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

17. හේ රළු බිණුම් දුරුලා, රළු බස් දෙඩුවමෙන් වැළැක්කේ වෙයි. නිදොස්, කන්කලු, පෙම් උපදවන, පහසුවෙන් සිතැ වැදගන්නා, නොගැමි, බොහෝ දෙනාට ප්‍රිය, බොහෝ දෙනාගේ මන වඩන යම් බසෙක් වේ ද, එබඳු වූ බස් කියන්නේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

18. හේ බොල් හිස් දෙඩැවිලි හැරුලා, බොල් දෙඩැවිල්ලෙන් වැළැක්කේ වෙයි. සුදුසු කාලවේලායෙහි කථා කරන සුලු වූයේ, ඇත්ත ම කියන සුලු වූයේ, වැඩ සලසන බසක් ම කියනසුලු වූයේ, තව ලොවුතුරුදහම් ඇසුරු කොට ම කියනසුලු වූයේ, හික්මීම ඇති කරන බසක් ම කියන සුලු වූයේ, සිතැ තබා ගන්නට සුදුසු වූ, කරුණු සහිත වූ, ඉමක් කොතක් ඇති (ප්‍රමාණවත් වූ), දෙලෝ වැඩ හා සම්බඳ වූ ම බසක් සුදුසු කාලයෙහි කියන්නේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

19. හේ බීජසමූහ (පැළ වන දැ) ද, භූතසමූහ (පැළ වුණු දැ) ද සිඳුමෙන් බිඳුමෙන් වැළැක්කේ වෙයි. රෑ බොජුනෙන් වැළැක්කේ, එක් වේලේ වළඳන බත් ඇත්තේ, නොකල්බොජුනෙන් වැළැක්කේ වෙයි. නටනු ගනු වයනු විසුළුදසුන් යන මෙයින් වැළැක්කේ වෙයි. ඇඟැ අඹු තැන් පිරුවීමට, ඇඟ සැරැසීමට කරුණු වන මල්ගඳවිලෙවුන් දැරීමෙන් වැළැක්කේ වෙයි. පමණ ඉක්ම උසසුන් ද, නොකැප වූ මහඅසුන්ද යන දෙකින් ම වැළැක්කේ වෙයි. රන් රිදී මිසු කහවණු පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. අඹු ධාන්‍ය පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. අඹු මස් පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. ස්ත්‍රීන් කුමාරිකාවන් පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. දූසිදසුන් පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. එළුවන් බැටළුවන් පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. කුකුළන් හූරන් පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. ඇතුන් අසුන් වෙළෙඹුන් ගෙරින් පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. කෙත්වතු පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. ගිහියනට දූත මෙහෙවර කිරීමෙහි ද ගෙන්ගෙට පණිවුඩ පණත් ගෙන යෑමෙහි ද යෙදීමෙන් වැළැක්කේ වෙයි. වෙළෙඳ ගනුදෙනුයෙන් වැළැක්කේ වෙයි. හොරතරුදියෙන් කිරුමෙන්, බොරු රන් පැමෙන්, හොර මිනුම්වලින් මිනුමෙන් වැළැක්කේ වෙයි. අල්ලස් ගෙන හිමියන් නොහිමි කිරීමෙන්, නානා උපායයෙන් අනුන් රැවැටුමෙන්, අගතා දූයට හුරු නො අගතා දූයක් පෙන්නා කරන මායායෙන්, මේ කී නොකී හැම කෙරුපික කම්වලින් ම වැළැක්කේ වෙයි. අත් පා ආදිය සිඳීමෙන් ද, මැරීමෙන් ද, රැඟැත් ආදියෙන් බැඳීමෙන් ද, සැහැසිකම් කිරීමෙන් ද වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වෙයි.

මුලශීලය නිමියේ ය.

20 යථා වා පනෙකෙ භොතො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං බීජගාමභූතගාමසමාරම්භං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: මූලබීජං ඛන්ධබීජං ඵලුබීජං අග්ගබීජං බීජබීජමෙව පඤ්චමං. ඉති වා ඉති එවරූපා බීජගාමභූතගාමසමාරම්භා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

21. යථා වා පනෙකෙ භොතො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං සන්නිධිකාරපරිභොගං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: අන්නසන්නිධිං පානසන්නිධිං වත්ථසන්නිධිං යාන-සන්නිධිං සයනසන්නිධිං ගන්ධසන්නිධිං ආමිසසන්නිධිං. ඉති වා ඉති එවරූපා සන්නිධිකාරපරිභොගා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

22. යථා වා පනෙකෙ භොතො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විසූකදස්සනං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: නච්චං ගීතං වාදිතං පෙක්ඛං අක්ඛානං පාණිස්සරං වෙතාලං කුම්භථූනං සොභනකං චණ්ඩාලං වංසං ඛොපනකං භත්තියුද්ධං අස්සයුද්ධං මහිසයුද්ධං උසභයුද්ධං අජයුද්ධං මෙණ්ඩයුද්ධං කුක්කුටයුද්ධං වට්ටකයුද්ධං දණ්ඩයුද්ධං මුට්ඨියුද්ධං නිබ්බුද්ධං උය්‍යොධිකං බලග්ගං සෙනාබ්‍යූහං අනීකදස්සනං. ඉති වා ඉති එවරූපා විසූකදස්සනා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

23. යථා වා පනෙකෙ භොතො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං ජූතපමාදට්ඨානානුයොගං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: අට්ඨපදං දසපදං ආකාසං පරිහාරපථං සන්තිකං ඛලිකං ඝටිකං සලාකහත්थං අක්ඛං පඬුවීරං වඩ්ඩකං මොක්ඛචිකං විඩුලකං පත්තාළ්හකං රථකං ධනුකං අක්ඛරිකං මනෙසිකං යථාවජ්ජං. ඉති වා ඉති එවරූපා ජූතපමාදට්ඨානානුයොගා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

20. යම්සේ සමහර භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, මූලබීජ ද (හිඟුරු ආදි පැළ වන මුල් ද), ඛන්ධ බීජ ද (නුග ආදි පැළ වන කඳ ද), පරුබීජ ද (උක් උණ බට ආදි පැළ වන පුරුක් ද), අග්‍රබීජ ද (ඉරිවේරිය ආදි පැළ වන දලු ද), පස් වනු බීජබීජ ද (වී ආදි පැළ වන ඇට ද) යන මේ කී බීජසමූහ ද (පැළ වන දෑ ද) භූතසමූහ ද (පැළ වුණු දෑ ද) පෙළීමෙහි (සිදුම් බිඳුම් තැළුම් යැ සි) කියන ලද සමාරම්භයෙහි යෙදුණෝ වෙසෙත් ද, හෙ තෙමේ මේ හෝ මේ බඳු වූ බීජ-ග්‍රාමභූතග්‍රාමසමාරම්භයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ සීලයෙක් වේ.

21. යම්සේ ඇතැම් භවත් මහණබමුණු කෙනෙක් සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, කැම රැස් කොට තබා ගැන්ම, බොන දෑ රැස් කොට තබා ගැන්ම, වස්ත්‍ර රැස් කොට තබා ගැන්ම, (රිය ගැල් ආදිය ද පාවහන් ආදිය ද යන) යාන රැස් කොට තබා ගැන්ම, ඉහතැ කී දෑ හැර (තවත් තල සහල් ඇ වුව මතා) පසය රැස් කොට තබා ගැන්ම යන මෙසේ වූ සන්නිධිකාරපරිභෝගයෙහි (පසය රැස් කොට තබා ගෙන වැළැඳීමෙහි) යෙදී වෙසෙත් ද, හෙ තෙමේ මේ හෝ මේබඳු වූ හෝ සන්නිධිකාර පරිභෝගයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ සීලයෙක් වේ.

22. යම්සේ සමහර භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, නැටුම් ගැයුම් වැයුම්, තථසමජ්ජා (තමවත් සමූහයක් එක් වැ ජනසමූහයා ඉදිරියේ දක්වන නැටුම්), ආඛ්‍යාන (මහාභාරතාදිය කීම හෝ ඇසීම), පාණිස්වර (අතින් ලොකොබෙර ගැසුම් හෝ අත්තල ගැසුම), වේතාල (දඬිමුවා තාළම්පට ගැසීම හෝ මිතුරු දපා මළසිරුරු නැගිටුවීම), කුම්භථූන (සිවුරස් බෙර වැයුම), ශෝභනක (රංගබලිකරණය හෙවත් රඟමඩුල්ලෙහි දී දේවතාවතට සෙනෙහි වශයෙන් නාදිගීත ගායනය හෝ ප්‍රතිභාතචිත්‍ර කිරීම), සණදෙවුන් කෙළිය (හෝ අයෝ-ගුඩක්‍රීඩාව), උණගස් ඔසොවා ගෙන කරන ක්‍රීඩාව, අසිධාවනය (මළවුන්ගේ ඇට සෝදා සුවඳ කවා තබා තකන්සෙමෙහි ඒ වටා සිට උත්සව කිරීම), ඇත්පෝර, අස්පෝර, මීයුපෝර, ගොන්පෝර, එළුපෝර, බැටළු-පෝර, කුකුළුපෝර, වටුපෝර, පොලුහරඹ, මිටුයුද, මල්ලපෝර, යුද පවත්නා තැන් දක්නට යැම, බළසෙන් ගණිනා තැන් දක්නට යැම යන මෙබඳු විසුළු දස්නෙහි යෙදී වෙසෙත් ද, හෙ තෙමේ මේ හෝ මේ බඳු වූ විසුළු දස්නෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ සීලයෙක් වේ.

23. යම්සේ සමහර භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, අවපාකෙළිය, දසපාකෙළිය, අහස්දුකෙළිය, මඩුලු පැනුම්, සන්තිකා ක්‍රීඩාව, දඳුකෙළිය, කල්ලි ගැසුම්, සලාඅත්කෙළිය, ගුළුකෙළිය, කොළ-නළා පිඹුම්, කෙළිතගුලින් හැම්, කරණම් ගැසුම්, කන්තංගුරුවා කෙළිය, කොළනැළියෙන් වැලි ඇ මැනුම්, ක්‍රීඩාරථ පැදවීම, කුඩා දුන්නෙන් විදීම, ඇකිරිකෙළිය (පිවේ හෝ අහසේ අකුරු ඇඳ ඒ කියැවීම), සිතු දෑය කීමේ ක්‍රීඩාව, විකලාංගානුකරණය (කනුත් කොරුත් යන ආදීන් සේ ඉරියවු පැවැත්වීම) යන මෙබඳු වූ පමාවට කරුණු වූ දුකෙළියෙහි යෙදී වෙසෙත් ද, හෙ තෙමේ මේ හෝ මෙ බඳු වූ පමාවට කරුණු වූ දුකෙළි-යෙහි යෙදීමෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ සීලයෙක් වේ.

24. යථා වා පනෙකෙ භොතො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං උච්චාසයනමහාසයනං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: ආසන්දිං පල්ලඞ්කං ගොනකං චිත්තකං පටිකං පටලිකං තූලිකං විකතිකං උද්දලොමිං එකන්තලොමිං කටිස්සං කොසෙය්‍යං කුත්තකං හත්ථත්ථරං අස්සත්ථරං රථත්ථරං අජිනප්පවෙණිං කදලිමිගපවර-පච්චත්ථරණං සඋත්තරච්ඡදං උභතොලොහිතකූපධානං. ඉති වා ඉති එවරූපා උච්චාසයනමහාසයනා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

25. යථා වා පනෙකෙ භොතො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජ-නානි භුඤ්ජිත්වා තෙ එවරූපං මණ්ඩනවිභූසනට්ඨානානුයොගං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: උච්ඡාදනං පරිමද්දනං නහාපනං සම්බාහනං ආදාසං අඤ්ජනං මාලාවිලෙපනං මුඛචූණ්ණකං මුඛලෙපනං හත්ථබන්ධං සිඛාබන්ධං දණ්ඩකං නාළිකං ඛග්ගං ඡත්තං චිත්‍රුපාහනං උණ්හීසං මණිං වාලව්ජනිං ඔදාතානි වත්ථානි දීඝදසානි. ඉති වා ඉතිඑවරූපා මණ්ඩනවිභූසනට්ඨානානු-යොගා පටිවිරතො හොති. ඉමම්පි'ස්ස හොති සීලස්මිං.

26. යථා වා පනෙකෙ භොතො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං තිරච්ඡානකථං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: රාජකථං චොරකථං මහාමත්තකථං සෙනාකථං භයකථං යුද්ධකථං අන්නකථං පානකථං වත්ථකථං සයනකථං මාලාකථං ගන්ධකථං ඤාතිකථං යානකථං ගාමකථං නිගමකථං නගරකථං ජනපදකථං ඉත්ථි-කථං පුරිසකථං [කුමාරකථං කුමාරිකථං] සූරකථං විසිඛාකථං කුම්භට්ඨාන-කථං පුබ්බපෙතකථං නානත්තකථං ලොකක්ඛායිකං සමුද්දක්ඛායිකං ඉතිභවාභවකථං. ඉති වා ඉතිඑවරූපාය තිරච්ඡානකථාය පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

27. යථා වා පනෙකෙ භොතො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විග්ගාහිකකථං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි. අහං ඉමං ධම්මවිනයං ආජානාමි. කිං ත්වං ඉමං ධම්මවිනයං ආජානිස්සසි? මිච්ඡාපටිපන්නො ත්වමසි. අහමස්මි සම්මාපටිපන්නො. සංහිතං මෙ, අසංහිතං තෙ. පුරෙ වචනීයං පච්ඡා අවච. පච්ඡා වචනීයං පුරෙ අවච. ආවිණ්ණං තෙ විපරාවත්තං. ආරොපිතො තෙ වාදො. නිග්ගහිතො ත්වමසි. චර වාදප්පමොක්ඛාය. නිබ්බෙ-ඨෙහි වා සචෙ පහොසි. ඉති වා ඉතිඑරූපාය විග්ගාහිකකථාය පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

24. යම්සේ ඇතැම් භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, දික්සඟළා පුටු ය, පළඟය, මහකොදුපලසය. වියමනෙන් විසිතුරු කළ එළුලොම්මුවා ඇතිරිය, එළුලොම්මුවා සුදු ඇතිරිය, ගතමල් යසදූ එළුලොම් ඇතිරිය, තිලිය (පුලුන් මෙත්තය), සිංහරූපාදිරූපාවලින් විසිතුරු කළ එළුලොම් ඇතිරිය, දෙපැත්තේ ම ලොම් ඇති එළුලොම්මුවා ඇතිරිය, එක් පැත්තේ පමණක් ලොම් ඇති එළුලොම්මුවා ඇතිරිය, රත්කසුකම් කළ පසතුරුණ, කොසෙය්‍ය සුසින් විසූ ඇතිරිය, අසු පිටැ එලන ඇතිරිය, රියැ එලන ඇතිරිය, ඇඳව සරි ලන සේ අඳන් දිවිසමින් මිසා කළ ඇතිරිය, කෙහෙල්මුවසමින් කළ මනඥ පසතුරුණ, ඉස්දෙර පාමුල රත්කන්වයින් තබා ඇති රතු උඩුවියන් සහිත මහඟු යහන යහ මෙබඳු වූ උස් යහන් මහ යහන් පරිහරණය කිරීමෙහි යෙදී වෙසෙද්ද, ඔහ තෙමේ මේ හෝ මේ බඳු වූ උස් යහන් මහ යහන් පරිභොගයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

25. යම්සේ වනාහි ඇතැම් භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, සුවඳසුණුයෙන් ඇඟ ඉලීම, අත්පාඇඟි මනා සටහන් ගන්වනුවට තෙල් ගා මැඩීම, සුවඳ දියෙන් නැවීම, උරහිස්ඇඟි මස් වැඹෙනුවට මුගුරින් තැළීම, කැඩපතින් මුහුණ බැලීම, අලංකාර වශයෙන් අඳුන් ගැම, මල් පැලැඳීම හා විලෙවුන් දැරීම, මුවසුණු මුව-විලෙවුන් දැරීම, හස්තාභරණ දැරීම, හිසැ කුඩුම්බිය බැඳීම, විසිතුරු සැරයපි දැරීම, විසිතුරු බෙහෙත්තළ දැරීම, කඩු දැරීම, විසිතුරු කුඩ දැරීම, විසිතුරු පාවහන් දැරීම, තලල්පව බැඳීම, සිළුමිණ පැලැඳීම, විසිතුරු සෙමර වල්විදුනා දැරීම, දික් දවලු ඇති සුදු රෙදි හැඳීම ආදි ඇඟ අඩු තැන් පිරවීමටත් ඇඟ සැරැසීමටත් කරුණු වන දෑ පරිභොග කිරීමෙහි යෙදී වෙසෙත් ද, ඒ මහණ තෙමේ මේ හෝ මෙ බඳු දෑ පරිභොග කිරීමෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

26. යම්සේ වනාහි ඇතැම් භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, රාජකථා, චෝරකථා, මහාමාත්‍යකථා, සෙනාකථා, භයකථා, යුද්ධකථා, ආහාරකථා, පානකථා, වස්ත්‍රකථා, ශයනකථා, මාලාකථා, ගන්ධකථා, ඥාතිකථා, යානකථා, ග්‍රාමකථා, නිගමකථා, නගරකථා, ජනපදකථා, ස්ත්‍රීකථා, පුරුෂකථා, කුමාරකථා, කුමාරිකථා, ශූරකථා, වීථිකථා, කුම්භඨානකථා, තාතාත්වකථා, ලෝකාඛ්‍යායිකා කථා, සමුද්‍රාඛ්‍යායිකාකථා, ඉතිභවාභවකථා යන මේ බඳු වූ තිරශ්චීන කථාවන්හි යෙදී වෙසෙත් ද, ඒ මහණ තෙමේ මෙ කී හෝ මෙයින් අන්‍ය වූ හෝ මේ බඳු කථාවලින් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

27. යම්සේ වනාහි ඇතැම් භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, "තෝ මේ දහම් විනය නො දනිහි. මම ම මේ දහම් විනය දනිමි. 'මේ දහම් විනය කිමැ'යි තෝ දනිහි ද? තෝ වරදවා පිළිපන්නෙහි. මම මැනැවින් පිළිපන්නෙමි වෙමි. මා බස කරුණු සහිත ය. තා බස කරුණු රහිත ය. තෝ පළමුයෙන් කියැ සුත්ත පසු වැ කියෙහි ය. පසු වැ කියැ සුත්ත පළමුයෙන් කියෙහි ය. තා කලක් ම පුහුණු කළ දෑය මගේ එක් වචනයෙන් ම පෙරැළී ගියේ ය. මා විසින් තව දොස් නැගිණ. මා විසින් නිගන්තා ලද්දෙහි. මා තැගු දොසින් මිදෙන්නට හැසිරෙව (ඒ ඒ තැන ගොස් උගනුව). හැකි නම් එය විසඳව" යන ආදීන් මෙ බඳු වූ උනුත් බැණ ගොඩා ගැනුම්හි යෙදෙත් ද, ඒ මහණ තෙමේ මෙ කී හෝ අන් මෙබඳු වූ හෝ බැණුම්දෙඩුම්වලින් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

28. යථා වා පනෙකෙ භොතො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං දූතෙය්‍යපහිණගමනානුයොගමනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: රාජූසු රාජමහාමත්තානං ඛත්තියානං බ්‍රාහ්මණානං ගහපතිකානං කුමාරානං "ඉධ ගච්ඡ අමුත්‍රාගච්ඡ. ඉදං හර. අමුත්‍ර ඉදං ආහරා"ති. ඉති වා ඉති එවරූපා දූතෙය්‍යපහිණගමනානුයොගා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

29. යථා වා පනෙකෙ භොතො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ කුහකා ච හොන්ති ලපකා ච නෙමිත්තිකා ච නිප්පෙසිකා ච ලාභෙන ච ලාභං නිජිගිංසිතාරො. ඉති වා ඉති එවරූපා කුහනලපනා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

මජ්ඣිමසීලං නිට්ඨිතං.

30. යථා වා පනෙකෙ භොතො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථිදං: අඞ්ගං නිමිත්තං උප්පාතං සුපිනං ලක්ඛණං මූසිකච්ඡින්නං අග්ගිහොමං දබ්බිහොමං ථුසහොමං තණ්ඩුලහොමං සප්පිහොමං තෙලහොමං මුඛහොමං ලොහිතහොමං අඞ්ගවිජ්ජා වත්ථුවිජ්ජා ඛත්තවිජ්ජා සිවවිජ්ජා භූතවිජ්ජා භූරිවිජ්ජා අහිවිජ්ජා විසවිජ්ජා විච්ඡිකවිජ්ජා මූසිකවිජ්ජා සකුණවිජ්ජා වායසවිජ්ජා පක්කජ්ඣානං සරපරිත්තානං මිගචක්කං. ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

31. යථා වා පනෙකෙ භොතො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථිදං: මණිලක්ඛණං වත්ථුලක්ඛණං දණ්ඩලක්ඛණං අසිලක්ඛණං උසුලක්ඛණං ධනුලක්ඛණං ඇත්තුලක්ඛණං ඉත්ථිලක්ඛණං පුරිසලක්ඛණං කුමාරලක්ඛණං කුමාරිලක්ඛණං දාසලක්ඛණං දාසිලක්ඛණං හත්ථිලක්ඛණං අස්සලක්ඛණං මහිංසලක්ඛණං උසභලක්ඛණං ගොලක්ඛණං අජලක්ඛණං මෙණ්ඩලක්ඛණං කුක්කුටලක්ඛණං වට්ටකලක්ඛණං ගොධාලක්ඛණං කණ්ණිකාලක්ඛණං කච්ඡපලක්ඛණං මිගලක්ඛණං. ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

28. යම්සේ සමහර භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ "මෙහි යන්නැ. අසෝ තැනට එන්නැ. මෙය ගෙනැ යන්නැ. අසෝ තැනට මෙය ගෙනෙන්නැ"යි කළ තියොග පිළිගත, රජුන්ගේ රජමහඇමැතියන්ගේ ක්ෂත්‍රියයන්ගේ බමුණන්ගේ ගෘහපතියන්ගේ රජ කුමරුවන්ගේ මේ බඳු දූත මෙහෙවරෙහි පණිවුඩ ගෙන යෑමෙහි යෙදී වෙසෙන් ද, ඒ මහණ තෙමේ මේ කී හෝ අන් මේ වැනි වූ හෝ දූත මෙහෙවරින් පණිවුඩ ගෙන යෑමෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

29. යම්සේ සමහර භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, කුහකකම් කරන්නෝ වෙත් ද, ලාභසත්කාර පතා අනුන් සිත් ඇදෙන සේ වූ වාචු බස් දෙඩන්නෝ වෙත් ද, සිවු පසය ලබනු සඳහා කයින් හෝ බසින් ඇඟැවීම් කරන්නෝ වෙත් ද, ලාභාපේක්ෂයෙන් අනුනට ගරහන්නෝ වෙත් ද, ලාභයෙන් ලාභය සොයන්නෝ වෙත් ද, ඒ මහණ තෙමේ මේ කී ද මේ බඳු වූ ද කුහනලපනවලින් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

මධ්‍යම ශීලය නිමියේ ය.

30. යම්සේ ඇතැම් භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, අංගශාස්ත්‍රය, නිමිත්තශාස්ත්‍රය, උත්පාතලක්ෂණය, සුප්තශාස්ත්‍රය, ලක්ෂණශාස්ත්‍රය, මූෂකවෘත්තවිද්‍යාව, අග්නිහෝමය, දර්වීහෝමය, තුෂහෝමය, කණහෝමය, තණ්ඩුලහෝමය, සර්පිර්හෝමය, තෛලහෝමය, මුඛහෝමය, ලෝහිතහෝමය, අංගවිද්‍යාව, වාස්තුවිද්‍යාව, ක්ෂත්‍රවිද්‍යාව, ශිවවිද්‍යාව, භූතවිද්‍යාව, භූරිවිද්‍යාව, අහිවිද්‍යාව, විෂවිද්‍යාව, වෘශ්චිකවිද්‍යාව, මූෂකවිද්‍යාව, ශාකුනවිද්‍යාව, වායසවිද්‍යාව, පක්වධ්‍යානය, ශරපරිත්‍රාණය, මෘගපක්ෂය යන මේ කී හෝ මේබඳු වූ හෝ තිරශ්චීනවිද්‍යයෙන්, මිථ්‍යාජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ තෙමේ මේ කී ද මේ බඳු වූ ද තිරශ්චීනවිද්‍යයෙන් මිථ්‍යාජීවයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වෙයි.

31. යම්සේ ඇතැම් භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, මිණිලකුණු, වත්ලකුණු, දඬුලකුණු, කඩුලකුණු, ඊලකුණු, දුනුලකුණු, අවිලකුණු, ඉසිරිලකුණු, පුරිස්ලකුණු, කුමරලකුණු, කුමරිලකුණු, දස්ලකුණු, දැසිලකුණු, ඇත්ලකුණු, අස්ලකුණු, මිගුලකුණු, වහස්ලකුණු, ගොන්ලකුණු, එළුලකුණු, බැටළුලකුණු, කුකුළුලකුණු, වවුලකුණු, ගොයිලකුණු, කැණිලකුණු, කපුබුලකුණු, මුවලකුණු යන ආදි මේ බඳු තිරශ්චීන විද්‍යයෙන්, මේ බඳු මිථ්‍යාජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ තෙමේ මේ කී ද මෙබඳු වූ ද තිරශ්චීන විද්‍යයෙන් මිථ්‍යජීවයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

32. යථා වා පනෙකෙ හොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථිදං: "රඤ්ඤං නිය්‍යානං භවිස්සති. රඤ්ඤං අනිය්‍යානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං උපයානං භවිස්සති. බාහිරානං රඤ්ඤං අපයානං භවිස්සති. බාහිරානං රඤ්ඤං උපයානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං අපයානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං ජයො භවිස්සති. බාහිරානං රඤ්ඤං පරාජයො භවිස්සති, බාහිරානං රඤ්ඤං ජයො භවිස්සති, අබ්භන්තරානං රඤ්ඤං පරාජයො භවිස්සති. ඉති ඉමස්ස ජයො භවිස්සති. ඉමස්ස පරාජයො භවිස්සති." ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

33. යථා වා පනෙකෙ හොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථිදං: "චන්දග්ගාහො භවිස්සති. සූරියග්ගාහො භවිස්සති. නක්ඛත්තග්ගාහො භවිස්සති. චන්දිමසූරියානං පථගමනං භවිස්සති. චන්දිමසූරියානං උප්පථගමනං භවිස්සති. නක්ඛත්තානං පථගමනං භවිස්සති. නක්ඛත්තානං උප්පථගමනං භවිස්සති. උක්කාපාතො භවිස්සති. දිසාඩාහො භවිස්සති භූමිචාලො භවිස්සති. දෙවදුන්දුභි භවිස්සති. චන්දිමසූරියනක්ඛත්තානං උග්ගමනං ඔත්තමනං සංකිලෙසං වොදානං භවිස්සති. එවංවිපාකො චන්දග්ගාහො භවිස්සති. එවංවිපාකො සූරියග්ගාහො භවිස්සති. එවංවිපාකං චන්දිමසූරියානං පථගමනං භවිස්සති, එවංවිපාකං චන්දිමසූරියානං උප්පථගමනං භවිස්සති. එවංවිපාකං නක්ඛත්තානං පථගමනං භවිස්සති. එවංවිපාකං නක්ඛත්තානං උප්පථගමනං භවිස්සති. එවංවිපාකො උක්කාපාතො භවිස්සති. එවංවිපාකො දිසාඩාහො භවිස්සති. එවංවිපාකො භූමිචාලො භවිස්සති. එවංවිපාකො දෙවදුන්දුභි භවිස්සති. එවංවිපාකං චන්දිමසූරිය නක්ඛත්තානං උග්ගමනං ඔත්තමනං සඞ්කිලෙසං වොදානං භවිස්සති". ඉතිවා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

34. යථා වා පනෙකෙ හොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථිදං: "සුබ්බුට්ඨිකා භවිස්සති. දුබ්බුට්ඨිකා භවිස්සති. සුභික්ඛං භවිස්සති. දුබ්භික්ඛං භවිස්සති. ඛෙමං භවිස්සති. භයං භවිස්සති. රොගො භවිස්සති. ආරොග්‍යං භවිස්සති. මුද්දා ගණනා සංඛානං කාවෙය්‍යං ලොකායතං." ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

32. යම්සේ වනාහි ඇතැම් පින්වත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, "අසෝ දිනැ අසෝ නැකැතින් (ශුද සඳහා) සිය නුවරින් අසෝ රජුන්ගේ නික්මීම වන්නේ ය. අසෝ නැකැතින් පෙරලා සිය නුවරට ඒම වන්නේ ය. අසෝ නැකැතින් පිටතැ සිටින සතුරු රජුන් හමු වන්නට රට තුළ උන් රජුන්ගේ යෑම වන්නේ ය. අසෝ නැකැතින් පිටතැ සිටින සතුරු රජුන්ගේ ඉවත් වැ යෑම වන්නේ ය. අසෝ නැකැතින් රට තුළැ සිටින රජුන් කරා පිටතැ සිටින සතුරු රජුන්ගේ පැමිණීම වන්නේ ය. අසෝ නැකැතින් අතුළතැ සිටින රජුන්ගේ ඉවත් වැ යෑම වන්නේ ය. රට ඇතුළතැ සිටින රජුනට ජය වන්නේ ය. පිටතැ සිටින සතුරු රජුනට පරාජය වන්නේ ය. පිටතැ සිටින සතුරු රජුනට ජය වන්නේ ය. රට තුළැ සිටින රජුනට පරාජය වන්නේ යැ" යි මෙසේ 'මෙහුට ජය වන්නේ ය. මෙහුට පරාජය වන්නේ යැ' යි කියමින් මෙ බඳු වූ තිරශ්චීනවිද්‍යයෙන්, මෙ බඳු වූ මිථ්‍යාජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ තෙමේ මේ හෝ මෙ බඳු වූ තිරශ්චීනවිද්‍යයෙන්, මිථ්‍යාජීවයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

33. යම්සේ වනාහි ඇතැම් පින්වත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, "අසෝ දිනැ චන්ද්‍රග්‍රහණය වන්නේ ය. අසෝ දිනැ සූර්‍යග්‍රහණය වන්නේ ය. අසෝ දිනැ සඳ හිරු දෙදෙනා නිසි මඟින් යෑම වන්නේ ය. අසෝ දිනැ ඔවුන් නොමඟින් යෑම වන්නේ ය. අසෝ දිනැ නකත්තරුන් නිසිමඟින් යෑම වන්නේය. අසෝ දිනැ ඔවුන් නොමඟින් යෑම වන්නේ ය. අසෝ දිනැ උල්කාපතනය වන්නේ ය. දිග්දහය වන්නේ ය. භූමිකම්පනය වන්නේ ය වැසි නැති වැ අහස් ගෙරැවුම් වන්නේ ය. සඳහිරුන්ගේ ද නකත් තරුන්ගේ ද උදව බැසීම කෙලෙසීම පිරිසිදුබව වන්නේ ය. චන්ද්‍රග්‍රහණය ලොවට මෙබඳු පල ගෙනැ දෙන්නේ ය. සූර්‍යග්‍රහණය මෙබඳු පල ගෙනැ දෙන්නේ ය. නක්ෂත්‍රග්‍රහණය මෙබඳු පල ගෙනැ දෙන්නේ ය. සඳ හිරුන් නිසි මඟින් යෑම මෙබඳු පල ගෙනැ දෙන්නේ ය. සඳ හිරුන් දෙදෙනාගේ නොමඟින් යෑම මෙ බඳු පල ගෙනැ දෙන්නේ ය. නකත්තරුවල පථගමනය මෙබඳු පල ගෙනැ දෙන්නේ ය. ඔවුන්ගේ උත්පථගමනය මෙ බඳු පල ගෙනැ දෙන්නේ ය. උල්කාපතනය මෙ බඳු පල ගෙනැ දෙන්නේ ය. දිග්දහය මෙ බඳු පල ගෙනැ දෙන්නේ ය. භූමිකම්පනය මෙබඳු පල ගෙනැ දෙන්නේ ය. වැසි නැති වැ අහස්ගෙරැවුම් මෙබඳු පල දෙන්නේ ය. සඳහිරුන්ගේ ද නකත් තරුවල ද උඟවත් බැසීමත් කෙලෙසීමත් පිරිසිදු වීමත් මෙ බඳු පල දෙන්නේ යැ" යි කියනුවෝ, මෙ බඳු තිරශ්චීන විද්‍යයෙන්, මෙ බඳු මිථ්‍යාජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ තෙමේ මේ හෝ මෙ බඳු වූ තිරශ්චීනවිද්‍යයෙන්, මිථ්‍යාජීවිකායෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

34 යම්සේ වනාහි ඇතැම් පින්වත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, "මෙ සමයෙහි වැසි වන්නේ ය. මෙ සමයෙහි නියං වන්නේ ය. මෙ සමයෙහි රට සුභික්ෂ වන්නේ ය. මෙ සමයෙහි රට දුර්භික්ෂ වන්නේ ය. මෙ සමයෙහි රටට උවදුරු වන්නේ ය. මෙ සමයෙහි රටට භය වන්නේ ය. මෙ කලැ රෝග වන්නේ ය. මෙ කලැ රෝග නැති බව වන්නේ යැ" යි පලංපල කීම ද, මුද්‍රාව (අඟිලි පුරැක්ගි සංඥ තබා ගිණීම) ද, ගණනාව (එක දෙක යන ආදීන් ගිණීම) ද, කාව්‍යශාස්ත්‍රය, ලෝකායතශාස්ත්‍රය යන මෙ හෝ මෙ බඳු තිරශ්චීන විද්‍යයෙන්, මිථ්‍යාආජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ තෙමේ මේ හෝ මෙ බඳු වූ තිරශ්චීනවිද්‍යයෙන්, මිථ්‍යාආජීවයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

35. යථා වා පනෙකෙ භොතො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථිදං: ආවාහනං විවාහනං සංවදනං විවදනං සංකිරණං විකිරණං සුභගකරණං දුබ්භගකරණං විරුද්ධගව්ඡකරණං ජිව්හානිජ්ජමනං හනුසංහනනං හත්ථාභිජ්ජපනං හනුජ්ජපනං කණ්ණ-ජ්ජපනං ආදාසපඤ්හං කුමාරිපඤ්හං දෙවපඤ්හං ආදිච්චුපට්ඨානං මහතු-පට්ඨානං අබ්භුජ්ජලනං සිරිභාගයනං. ඉති වා ඉති එවරූපාය තිරච්ඡාන-විජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

36. යථා වා පනෙකෙ භොතො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථිදං: සන්තිකම්මං පණිධිකම්මං භූතකම්මං භූරිකම්මං වස්සකම්මං වොස්සකම්මං වත්ථුකම්මං වත්ථුපරිකිරණං ඇවමතං නහාපනං ප්‍රුහනං වමනං විරෙචනං උද්ධවිරෙචනං අධොවිරෙචනං සීසවිරෙචනං කණ්ණතෙලං නෙත්තතප්පනං නත්තුකම්මං අඤ්ජනං පච්චඤ්ජනං සාලාකියං සල්ලකත්තියං දාරකතිකිච්ඡා මූලභෙසජ්ජානං අනුප්පදානං ඔසධීනං පටිමොක්ඛො. ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

37. ස ඛො සො මාණව භික්ඛු එවං සීලසම්පන්නො න කුතොචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතො. සෙය්‍යථාපි මාණව ඛත්තියො මුද්ධාවසිත්තො නිහතපච්චාමිත්තො න කුතොචි භයං සමනුපස්සති යදිදං පච්චත්තිකතො, එවමෙව ඛො මාණව භික්ඛු එවං සීලසම්පන්නො න කුතොචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතො. සො ඉමිනා අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො අජ්ඣත්තං අනවජ්ජසුඛං පටිසංවෙදෙති. එවං ඛො මාණව භික්ඛු සීලසම්පන්නො හොති.

38. අයං ඛො සො මාණව අරියො සීලක්ඛන්ධො යස්ස සො භගවා වණ්ණවාදී අහොසි යත්ථ ච ඉමං ජනතං සමාදපෙසි නිවෙසෙසි පතිට්ඨා-පෙසි. අත්ථි චෙවෙත්ථ උත්තරිං කරණීයන්ති."

35. යම්සේ ඇතැම් පින්වත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, ආවාහ සඳහා තකත් කිම, විවාහ සඳහා තකත් කිම, වෙන් වූ අඹුසැමියන් එක් වන්නට තකත් කිම, අඹුසැමියන් වෙන් වන්නට තකත් කිම, දුත් ණය රැස් කිරීමට තකත් කිම, මුදල් ණයට පොලියට දීමට තකත් කිම, සෞභාග්‍යය ඇති වනුවට යන්ත්‍ර මන්ත්‍රාදිය කැරැ දීම, බිම් පැලු වන්නට හදි ඛුනියම් කිරීම, තැනෙන්නට යන දරු ගබ් රැකෙන්නට පිළියම් කිරීම, දිවගුලු බැඳීම, මන්ත්‍රාදියේ බලයෙන් හනු තද කිරීම, අත් පෙරැලෙන්නට මතුරු දැමීම, හනු පෙරැලෙන්නට මතුරු දැමීම, කන් අගුලු වැටෙන්නට මතුරු දැමීම, කැඩපතෙහි දෙවතාවෙශය කොට ප්‍රශ්න ඇසීම, කුමරියක ලවා ජේන කියැවීම, දෙවිදැස්සක ලවා ජේන කියැවීම, ජීවිකා පිණිස හිරු පිදීම, මහබඹු පිදීම, මතුරු දපා මුවින් ගිනිජල් විසිදුවීම, මතුරු දපා සිරිකත කැඳැවීම යන මේ හෝ අන් මේ බඳු වූ තිරශ්චීන විද්‍යායෙන්, මිථ්‍යාජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ තෙමේ මේ හෝ මේ බඳු වූ තිරශ්චීනවිද්‍යයෙන්, මිථ්‍යාජීවයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

36. යම්සේ ඇතැම් පින්වත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, ශාන්තිකම්, ප්‍රණිධිකම්, භූරිකම්, පණ්ඩකයා පිරිමියකු කිරීම, පිරිමියා පණ්ඩකයකු කිරීම, වාස්තුකම්, වාස්තු පරිකිරණ, මතුරු දපා මුව දෙවුම්, මතුරු දපා අනුත් නැවීම්, සෙත් පතා ගිනි පිදීම, ගිහියනට වමන කැරැවීම, ඛඩ විරේක කැරැවීම, ළය විරේකයට බෙහෙත් දීම, වස්ති කිරීම ශීර්ෂවිරේචන බෙහෙත් දීම, කන් ලෙඩට තෙල් පිසැ දීම, ගිහියන් සඳහා ඇස පවලයට හිසිල ගත්වන තෙත්තෙල් පිසීම, ගිහියනට නස්‍ය දීම, කාරම් අඳුන් සාදා දීම, ඇස හිසිල ගත්වන අඳුන් සාදා දීම, ගිහියන්ගේ ඇසැ උල්ඇත ලෙඩට බෙහෙත් කිරීම, ගිහියනට ශල්‍ය කම් කිරීම, ළදරුවන්ගේ ලෙඩට පිළියම් කිරීම, මුල් බෙහෙත් දීම (කායචිකිත්සාව) කාරම් බෙහෙත් බැඳ වණ සුව වූ පසු ඒවා ගලවා දැමීම යැ" යි මේ ඇදි වූ හෝ මෙබඳු වූ තිරශ්චීනවිද්‍යයෙන්, මිථ්‍යාආජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ තෙමේ මේ හෝ මෙ බඳු වූ තිරශ්චීන විද්‍යයෙන්, මිථ්‍යාජීවයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

37. මාණවය, ඒ මහණ තෙමේ මෙසේ ශීලසම්පන්න වූයේ, ශීල-සංවරහේතුයෙන් කිසි ම එක ද අසංවරතායෙකින් පහළ වියැ හැකි ඛියක් නො දකී. මාතවය, ක්ෂත්‍රියාභිෂෙකයෙන් අභිෂෙක ලත්, වැනැසූ සතුරන් ඇති ක්ෂත්‍රියයෙක් කිසි ම එක ද සතුරකුගෙන් වියැ හැකි ඛියක් යම්සේ නො දක්නේ ද, එසේ ම මහණ තෙමේ මෙ පරිද්දෙන් ශීලසම්පන්න වූයේ, ශීලසංවරහේතුයෙන් කිසි ම එක ද අංසවරයෙකින් වියැ හැකි ඛියක් නො දකී. හේ මේ ඇසී ශීලසකඛියෙන් සමන්විත වූයේ සිය සතන්හි තිදෙස් වූ කායික චෛතසික සුවය විඳී. මාණවය මෙසේ මහණ තෙමේ ශීලසම්පන්න වේ.

38. මාණවය, ඒ භාග්‍යවතුන් වහන්සේ යමක්හුගේ ගුණ වදරන සුලු වූ සේක් ද, යමෙකැ මේ ජනතාව ගැන්වූ සේක් ද, පිවිස්වූ සේක් ද, පිහිටවූ සේක් ද, මේ ඒ ආසී ශීලසකඛිය යැ. වැලි මෙහි ඊමයින් මත්තෙහිත් කටයුතු ද ඇත්තේම ය."

39. "අච්ඡරියං හො ආනන්ද, අබ්භුතං හො ආනන්ද, යාවඤ්චිදං හො ආනන්ද අරියො සීලක්ඛන්ධො පරිපුණ්ණො නො අපරිපුණ්ණො. එවමපරිපුණ්ණසීලස්ස හි ආනන්ද අරියස්ස සීලක්ඛන්ධං ඉතො බහිද්ධා අඤ්ඤස්ස සමණබ්‍රාහ්මණස්ස න සමනුපස්සාමි. එවමපරිපුණ්ණසීලස්ස හො ආනන්ද අරියස්ස සීලක්ඛන්ධො ඉතො බහිද්ධා අඤ්ඤේ සමණබ්‍රාහ්මණා අත්තනි සමනුපස්සෙය්‍යුං, තෙ තාවතකෙනෙව අත්තමනා අස්සු 'අලමෙත්තාවතා, කතමෙත්තාවතා, අනුප්පත්තො නො සාමඤ්ඤත්ථො, තත්‍රපි නො කිඤ්චි උත්තරිං කරණීය'න්ති. අථ ච පන භවං ආනන්දො එවමාහ: අත්‍රපි වෙවෙත්ථ උත්තරිං කරණීය"න්ති.

පඨමඤාණවාරං.

40. "කතමො පන සො හො ආනන්ද අරියො සමාධික්ඛන්ධො යස්ස සො භවං ගොතමො වණ්ණවාදී අහොසි යත්ථ ච ඉමං ජනතං සමාදපෙසි නිවෙසෙසි පතිට්ඨාපෙසී?" ති.

41. කථඤ්ච මාණව භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති? ඉධ මාණව භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදෙමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති. රක්ඛති චක්ඛුන්ද්‍රියං. චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝාණෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදෙමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති. රක්ඛති මනින්ද්‍රියං. මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති සො ඉමිනා අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො අජ්ඣත්තං අබ්‍යාසෙකසුඛං පටිසංවෙදෙති. එවං ඛො මාණව භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති.

39. [ශුභ:] "පින්වත් අනද තෙරුනි, ආශ්චර්‍ය යැ, පින්වත් අනද තෙරුනි, අද්භුත යැ. පින්වත් අනද තෙරුනි, මේ ආර්‍යශීලසකඛිය ද පරිපූර්ණ යැ අපරිපූර්ණ නො වේ. පින්වත් අනද තෙරුනි, මෙසේ පිරිපුන් ආර්‍යශීලසකඛියක් මෙයින් බැහැර අන් මහණබමුණන් කෙරෙහි නො දකිමි. අනද තෙරුනි, මෙසේ පිරිපුන් ආර්‍ය ශීලසකඛියක් මෙයින් බැහැර අන් මහණබමුණෝ තමන් කෙරෙහි දක්නාහු නම්, ඔහු "මේ පමණකින් ම සැහෙයි. මේ පමණකින් ම කටයුතු සම්පූර්ණ විය. අප විසින් මහණදමේ ඵලය ලද්දේ ය. අප විසින් මත්තෙහි කටයුතු වූ කිසිත් ඉතිරි වැ නැත"යි එ තෙකින් ම සතුටු සිතැති වන්නාහ. එතෙකුදු වුවත් පින්වත් අනද තෙරණුවෝ 'මෙහි මෙයින් මත්තෙහිත් කටයුතු ද ඇත' යි මෙසේ වදාළහ."

පළමු ඛණ්ඩය.

40. [ශුභ:] පින්වත් අනද තෙරුනි, ඒ පින්වත් ගෞතමයන් වහන්සේ යමක්හුගේ ගුණ වදාරනසුලු වූ සේක් නම්, යමෙක්හි මේ ජනතාව ගැත්වූ සේක් නම්, පිවිත්වූ සේක් නම්, පිහිටවූ සේක් නම්, ඒ ආර්‍ය සමාධිසකඛිය කවරෙ යැ?"

41. [අනදතෙරහු:] "මාණවය මහණ තෙමේ කෙසේ නම් ඉඳුරන්හි වැසූ දොර ඇත්තේ වේ ද යත්: මාණවය මේ සත්තෙහි මහණ තෙමේ ඇසින් රූපයක් දැක ශුභාදිවශයෙන් එහි ලකුණු නො ගන්නේ වේ. ශුභාදිවශයෙන් අත්පා ආදී අවයවයන්ගේ ආකාර සිතට නො ගන්නේ වේ. යම් කරුණෙකින් චක්ෂුරින්ද්‍රිය වසා නොගෙන වසන්නහුගේ චිත්තසන්තානය විෂම ලෝභ දෞර්මනස් ආදි ලාමක අකුශල සභාවයෝ ලුහුබඳනාහු ද ඒ චක්ෂුරින්ද්‍රියයාගේ සංවරය පිණිස ගේ පිළිපදී. චක්ෂුරින්ද්‍රියය රකී. චක්ෂුරින්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. කනින් හඬ අසා ... නාසයෙන් ගඳ ආඝ්‍රාණය කොට ... දිවෙන් රස ආස්වාදය කොට... කයින් ස්ප්‍රෂ්ටව්‍යය (ඇඟට හැපෙන ද) ස්පර්ශ කොට ... සිතින් ධර්මාලම්බන දැන, ශුභාදිවශයෙන් එහි ලකුණු ගන්නේ නො වේ. ශුභාදිවශයෙන් අත් පා ආදි අවයවයන්ගේ ආකාර සිතට ගන්නේ නො වේ. යම් කරුණෙකින් ශ්‍රොත්‍රෙන්ද්‍රියය ... ඝ්‍රාණෙන්ද්‍රියය .... ජිහ්වෙන්ද්‍රියය ... කායෙන්ද්‍රියය ... මනඉන්ද්‍රියය සංවර කොට නොගෙන වසන්නහුගේ චිත්තසන්තානයට විෂමලෝභ දෞර්මනස් ආදි ලාමක අකුශල සභාවයෝ අනුබඳනාහු ද, ඒ ශ්‍රොත්‍රෙන්ද්‍රියයාගේ ... ඝ්‍රාණෙන්ද්‍රියයාගේ ... ජිහ්වෙන්ද්‍රියයාගේ කායෙන්ද්‍රියයාගේ ... මනඉන්ද්‍රියයාගේ සංවරය පිණිස පිළිපදී. ශ්‍රොත්‍ර ... ඝ්‍රාණ ... ජිහ්වා ... කාය ... මනඉන්ද්‍රියය රකී. එහි සංවරයට පැමිණේ. මේ මේ ආර්‍ය වූ ඉන්ද්‍රියසංවරයෙන් සමන්විත වූයේ සිය සතන්හි අව්‍යාපෙකසුඛය (කෙලෙසුන්ගෙන් මිශ්‍ර නොවීමෙන් වූ පිරිසිදු අභිචිත්තසුඛය) විඳී. මාණවය, මෙසේ වනාහි මහණ තෙමේ ඉන්ද්‍රියයන්හි වැසූ දොර ඇත්තේ වේ.

42. කථඤ්ච මාණව භික්ඛු සතිසම්පජඤ්ඤේන සමන්නාගතො හොති? ඉධ මාණව භික්ඛු අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී හොති. ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති. සම්මිඤ්ජිතෙ පසාරිතෙ සම්පජානකාරී හොති. සඞ්ඝාටිපත්තචීවරධාරණෙ සම්පජානකාරී හොති. අසිතෙ පීතෙ ඛායිතෙ සායිතෙ සම්පජානකාරී හොති. උච්චාරපස්සාවකම්මෙ සම්පජානකාරී හොති. ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ සම්පජානකාරී හොති. එවං ඛො මාණව භික්ඛු සතිසම්පජඤ්ඤේන සමන්නාගතො හොති.

43. කථඤ්ච මාණව භික්ඛු සන්තුට්ඨො හොති? ඉධ මාණව භික්ඛු සන්තුට්ඨො හොති කායපරිහාරියෙන චීවරෙන කුච්ඡිපරිහාරියෙන පිණ්ඩපාතෙන. සො යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති සෙය්‍යථාපි මාණව පක්ඛි සකුණො යෙන යෙනෙව ඩෙති සපත්තභාරො'ව ඩෙති, එවමෙව ඛො මාණව භික්ඛු සන්තුට්ඨො හොති කායපරිහාරියෙන චීවරෙන කුච්ඡිපරිහාරියෙන පිණ්ඩපාතෙන. සො යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති. එවං ඛො මාණව භික්ඛු සන්තුට්ඨො හොති.

44. සො ඉමිනා ච අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො ඉමිනා ච අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො ඉමිනා ච අරියෙන සතිසම්පජඤ්ඤේන සමන්නාගතො ඉමාය ච අරියාය සන්තුට්ඨියා සමන්නාගතො විවිත්තං සෙනාසනං භජති අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං. සො පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා.

45. සො අභිජ්ඣං ලොකෙ පහාය විගතාභිජ්ඣෙන චෙතසා විහරති. අභිජ්ඣාය චිත්තං පරිසොධෙති. ව්‍යාපාදපදොසං පහාය අව්‍යාපන්නචිත්තො විහරති සබ්බපාණභූතහිතානුකම්පී. ව්‍යාපාදපදොසා චිත්තං පරිසොධෙති. ථිනමිද්ධං පහාය විගතථිනමිද්ධො විහරති ආලොකසඤ්ඤී සතො සම්පජානො. ථිනමිද්ධා චිත්තං පරිසොධෙති. උද්ධච්චකුක්කුච්චං පහාය අනුද්ධතො විහරති අජ්ඣත්තං වූපසන්තචිත්තො. උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසොධෙති. විචිකිච්ඡං පහාය තිණ්ණවිචිකිච්ඡො විහරති අකථංකථී කුසලෙසු ධම්මෙසු. විචිකිච්ඡාය චිත්තං පරිසොධෙති.

42. මාණවය, මහණ තෙමේ කෙසේ නම් ස්මෘතිසම්ප්‍රජානතයෙන් (සිහි නුවණින්) සමන්විත වේ ද යත්: මාණවය, මේ සස්තෙහි මහණ තෙමේ ඉදිරියට යෑමෙහි පෙරලා ඊමෙහි මතා නුවණින් දැන ම (එය) කරනුයේ වෙයි ඉදිරි බැලීමෙහි, අනුදික් බැලීමෙහි (වට පිට බැලීමෙහි) මතා නුවණින් දැන ම (එය) කරනුයේ වෙයි. අත් පා ආදිය හැකිලීමෙහි, දිගු කිරීමෙහි නුවණින් දැන ම (එය) කරනුයේ වෙයි. සඟළසිවුර ද පාත්‍රය ද සෙසු සිවුරු ද දැරීමෙහි නුවණින් දැන ම කරන්නේ වෙයි. ආහාර ගැන්මෙහි, පෑන් පිමෙහි, පිපි කැවිලි ආදිය කෑමෙහි, මී ආදිය රස විඳීමෙහි නුවණින් දැන ම කරනුයේ වෙයි. මල මුත්‍ර පහ කිරීමෙහි නුවණින් දැන ම කරනුයේ වෙයි. ගමනෙහි සිටීමෙහි හිඳීමෙහි නිදිමෙහි කථා කිරීමෙහි නොකිණීමෙහි නුවණින් දැන ම කරනුයේ වෙයි. මාණවය, මේසේ වනාහි මහණ තෙම සිහි නුවණින් සමන්විත වෙයි.

43. මාණවය, කෙසේ නම් මහණ තෙමේ ලද පමණෙහි සතුටු වේ ද යත්: මාණවය, මේ සස්තෙහි මහණ තෙමේ කායපරිහරණයට ප්‍රමාණ වූ සිවුරින් ද කුක්ෂිපරිහරණයට ප්‍රමාණ වූ ආහාරයෙන් ද සතුටු වෙයි. හේ යම් යම් තැනකට නික්මෑ යේ ද, අට පිරිකර පමණක් ගෙන ම නික්මෙයි. මාණවය, (පියා හඹනුවට තරම්) අත්තවූ ඇති කුරුලු තෙමේ යම් යම් තැනක පියා හඹා යේ නම්, පියාපත් බර සහිත ව ම යම් සේ පියාහඹා ද, එසේ ම ඒ මහණ තෙමේ කායපරිහරණයට ප්‍රමාණ වූ සිවුරින් ද කුක්ෂිපරිහරණයට ප්‍රමාණ වූ ආහාරයෙන් ද සතුටු වෙයි. හේ යම් යම් තැනකට යේ ද, පා සිවුරු (ආදි අට පිරිකර පමණක්) රැගෙන ම යෙයි. මාණවය, මේසේ වනාහි මහණ තෙමේ ලද පසඟෙහි සතුටු වේ.

44. මාණවය, ඒ මහණ තෙමේ මේ ආර්‍ය ශීලසකඛියෙන් ද සමන්විත වූයේ, මේ ආර්‍ය ඉන්ද්‍රියසංවරයෙන් ද සමන්විත වූයේ, මේ ආර්‍ය සතිසම්ප්‍රජානතයෙන් ද සමන්විත වූයේ, මේ ආර්‍ය සන්තුෂ්ටියෙන් ද සමන්විත වූයේ, අරණ්‍ය වෘක්ෂමූල පර්වත කඳුරැලි ගිරිගුහා සොහොන් වනපෙත් (වනප්‍රස්ථ) අභ්‍යවකාශ (එළිමහන්) පිදුරැලෙන් යන මේ කී ජනශූන්‍ය කිසි සෙනස්තක් හජනය කෙරෙයි. හේ පිඬු සෙවීමෙන් පෙරලා ආයේ, පසුබත් සෙමෙහි පලක් බැඳ උඩු කය කෙළින් පිහිටුවා කම්වහවනට යොමු කොට සිහි එළවා හිඳී.

45. හේ ලොවෑ (පඤ්ච උපාදානස්කන්ධය කෙරෙහි) ඇල්ම හැර විෂමලොභප්‍රහාණයෙන් (යට පත් කිරීමෙන්) පහ වූ අභිජ්ඣායෙන් යුත් සිතින් වෙසෙයි. අභිජ්ඣාව කෙරෙන් සිත පිරිසිදු කෙරෙයි. ව්‍යාපාද ප්‍රදෝෂය (ක්‍රෝධය) හැර, ව්‍යාපාද රහිත සිතැත්තත්, සියලු පණ ඇති සතුන් කෙරේ හිතානුකම්පා ඇති වෑ වෙසෙයි. ක්‍රෝධය කෙරෙන් සිත පිරිසිදු කෙරෙයි. ස්ත්‍යානමිද්ධය හැර, පහ වූ ස්ත්‍යානමිද්ධය ඇත්තේ, දවල් දෙක්හි ම දුටු එළිය හඳුනනු හැකි පිරිසිදු සංඥ ඇත්තත්, සිහියෙනුත් නුවණිනුත් යුක්ත වූයේ වෙසෙයි. ස්ත්‍යානමිද්ධය කෙරෙන් සිත පිරිසිදු කෙරෙයි. උද්ධච්චත් (සිතෑ නොසංසුන්බවත්) කුක්කුච්චත් (කළ නො කළ දෙයෙහි පසුතැවිල්ලත්) සිතින් දුරු ලා, අනුද්ධත වෑ (නොසංසුන් බැවින් තොර වෑ), සංහිඳුණු සවකීය චිත්තසන්තානය ඇත්තේ, උද්ධච්ච කුක්කුච්ච දෙක කෙරෙන් සිත පිරිසිදු කෙරෙයි. සැකය දුරු ලා, පහ වූ සැක ඇත්තේ, කුසල් දහමෙහි සැක නො කරනුයේ, සැකය කෙරෙන් සිත පිරිසිදු කෙරෙයි.

46. සෙය්‍යථාපි මාණව පුරිසො ඉණං ආදාය කම්මන්තෙ පයොජෙය්‍ය, තස්ස තෙ කම්මන්තා සමිජ්ඣෙය්‍යුං, සො යානි ච පොරාණානි ඉණමූලානි තානි ච ව්‍යන්තීකරෙය්‍ය, සියා චස්ස උත්තරිං අවසිට්ඨං දාරභරණාය, තස්ස එවමස්ස: "අහං ඛො පුබ්බෙ ඉණං ආදාය කම්මන්තෙ පයොජෙසිං. තස්ස මෙ තෙ කම්මන්තා සමිජ්ඣිංසු. සො'හං යානි ච පොරාණානි ඉණමූලානි තානි ච ව්‍යන්තිං අකාසිං. අත්ථි ච මෙ උත්තරිං අවසිට්ඨං දාරභරණාය"න්ති. සො තතො නිදානං ලභෙථ පාමොජ්ජං, අධිගච්ඡෙය්‍ය සොමනස්සං-

47. සෙය්‍යථාපි මාණව පුරිසො ආබාධිකො අස්ස දුක්ඛිතො බාළ්හගිලානො, භත්තඤ්ච අස්ස නච්ඡාදෙය්‍ය, න චස්ස කායෙ බලමත්තා, සො අපරෙන සමයෙන තම්හා ආබාධා මුච්චෙය්‍ය, භත්තඤ්චස්ස ඡාදෙය්‍ය, සියා චස්ස කායෙ බලමත්තා, තස්ස එවමස්ස: "අහං ඛො පුබ්බෙ ආබාධිකො අහොසිං දුක්ඛිතො බාළ්හගිලානො. භත්තඤ්ච මෙ නච්ඡාදෙසි. න චස්ස මෙ ආසි කායෙ බලමත්තා. සො'හි එතරහි තම්හා ආබාධා මුත්තො. භත්තඤ්ච මෙ ඡාදෙති. අත්ථි ච මෙ කායෙ බලමත්තා"න්ති. සො තතො නිදානං ලභෙථ පාමොජ්ජං, අධිගච්ඡෙය්‍ය සොමනස්සං-

48. සෙය්‍යථාපි මාණව පුරිසො බන්ධනාගාරෙ බද්ධො අස්ස, සො අපරෙන සමයෙන තම්හා බන්ධනාගාරා මුච්චෙය්‍ය සොත්ථිනා අබ්භයෙන, න චස්ස කිඤ්චි භොගානං වයො, තස්ස එවමස්ස: "අහං ඛො පුබ්බෙ බන්ධනාගාරෙ බද්ධො අහොසිං. සො'හි එතරහි තම්හා බන්ධනාගාරා මුත්තො සොත්ථිනා අබ්භයෙන. නත්ථි ච මෙ කිඤ්චි භොගානං වයො" න්ති. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං, අධිගච්ඡෙය්‍ය සොමනස්සං-

49. සෙය්‍යථාපි මාණව පුරිසො දාසො අස්ස අනත්තාධීනො පරාධීනො න යෙනකාමඞ්ගමො, සො අපරෙන සමයෙන තම්හා දාසබ්‍යා මුච්චෙය්‍ය අත්තාධීනො අපරාධීනො භුජිස්සො යෙනකාමඞ්ගමො, තස්ස එවමස්ස: "අහං ඛො පුබ්බෙ දාසො අහොසිං අනත්තාධීනො පරාධීනො න යෙනකාමඞ්ගමො. සො'හි එතරහි තම්හා දාසබ්‍යා මුත්තො අත්තාධීනො අපරාධීනො භුජිස්සො යෙනකාමඞ්ගමො"න්ති. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං, අධිගච්ඡෙය්‍ය සොමනස්සං-

50. සෙය්‍යථාපි මාණව පුරිසො සධනො සභොගො කන්තාරද්ධානමග්ගං පටිපජ්ජෙය්‍ය දුබ්භික්ඛං සප්පටිභයං, සො අපරෙන සමයෙන තං කන්තාරං නිත්ථරෙය්‍ය, සොත්ථිනා ගාමන්තං අනුප්පාපුණෙය්‍ය ඛෙමං අප්පටිභයං, තස්ස එවමස්ස: "අහං ඛො පුබ්බෙ සධනො සභොගො කන්තාරද්ධානමග්ගං පටිපජ්ජිං දුබ්භික්ඛං සප්පටිභයං. සො'හි එතරහි තං කන්තාරං නිත්ථිණ්ණො සොත්ථිනා ගාමන්තං අනුප්පත්තො ඛෙමං අප්පටිභය"න්ති. සො තතො නිදානං ලභෙථ පාමොජ්ජං අධිගච්ඡෙය්‍ය සොමනස්සං-

46. මාණවය, යම්සේ පුරුෂයෙක් ණය මුදලක් ගෙන කර්මාන්ත කරන්නේ ද, ඔහුගේ ඒ කර්මාන්ත සමෘද්ධ වන්නේ නම්, හේ යම් පරණ ණය මුදල් වී නම්, ඒ සියල්ල ගෙවා අවසන් කරන්නේ ද, මත්තෙහි ඉතිරි වූ යමක් ඇත් නම් එය අඹුදරුවන් රක්නා පිණිස වන්නේ ද, එසේ වූ ඔහුට "මම් පළමුයෙන් ණයට මුදල් ගෙන කර්මාන්ත කෙළෙමි. ඒ මගේ කර්මාන්ත සමෘද්ධ විය. ඒ මම, යම් පරණ ණය මුදල් වී නම්. එය ගෙවා අවසන් කෙළෙමි. අඹුදරුවන් රක්නට වැඩිපුර ඉතිරි වූ මුදලෙක් ද මට ඇතැ" යි මෙසේ සිතෙක් වන්නේ ද, හේ ඒ ණයතැතිබව කරණ කොට ගෙන සතුට ලබන්නේ ද, සොම්නසට පැමිණෙන්නේ ද-

47. මාණවය, යම් සේ පුරුෂයෙක් රෝගී වූයේ, දුකට පැමිණියේ, දැඩි ලෙස ගිලන් වන්නේ ද, ඔහුට බතුත් නො රිසියෙන්නේ ද, ඔහුගේ ඇඟපත ශක්ති පමණකුත් නො වන්නේ ද, හේ මෑත කාලයෙහි ඒ ආබාධයෙන් මිදෙන්නේ නම්, ඔහුට බතුත් රිසියෙන්නේ නම්, ඔහු ඇඟපත ශක්තිය ද වන්නේ නම්, "මම් වූ කලි පෙරැ දුකට පත්, දැඩි ගිලන් බව් ඇති ලෙඩෙක් වීමි. මට අහර ද රිසි නො වී ය. මා ඇඟපත ශක්තිය ද නො වී ය. ඒ මම දැන් ඒ ලෙඩින් මිදුණෙමි වෙමි. ඒ මට අහර ද රිසියෙයි. මා ඇඟපත ශක්තිය ද ඇතැ" යි ඔහුට මෙසේ සිතෙක් වන්නේ නම්, හේ ඒ කරුණින් සතුට ලබන්නේ ද, සොම්නසට පැමිණෙන්නේ ද-

48. මාණවය, යම් සේ පුරුෂයෙක් හිරගෙහි බැඳුණේ වන්නේ ද, හේ පසු කලක ධනය වියදම් නො කොට පහසුවෙන් ඒ හිර ගෙන් මිදෙන්නේ ද, (ඒ හේතුයෙන්) ඔහුගේ කිසි භොගවිනාශයෙක් නො වන්නේ ද, "මම් වූ කලි පෙරැ හිර ගෙහි බැඳුණෙමි වීමි. ඒ මම දැන් ධන වියදම් නො කොට පහසුවෙන් ඒ හිර ගෙන් මිදුණෙමි වෙමි. මගේ භොගයනට කිසි විනාශයෙක් ද නැතැ" යි ඔහුට මෙසේ සිතෙක් වන්නේ ද, හේ ඒ කරුණින් සතුට ලබන්නේද, සොම්නසට පැමිණෙන්නේ ද -

49. මාණවය, යම්සේ තමා අයත් පැවැතුම් නැති, අනුන් අයත් පැවැතුම් ඇති, කැමැති අතෙක යන්නට අවසර නැති දාස පුරුෂයෙක් වන්නේ ද, හේ මෑත භාගයෙහි තමා අයත් පැවැතුම් ඇතියේ, පරා අයත් පැවැතුම් නැතියේ, නිදහස් වූයේ, කැමැති අතෙක යා හැකි වූයේ, ඒ දාසභාවයෙන් මිදෙන්නේ ද, එසේ වූ ඔහුට "මම් වූ කලි පෙරැ තමා අයත් පැවැතුම් නැති, පරා අයත් පැවැතුම් ඇති, කැමැති අතෙක යා නො හැකි දාසයෙක් වීමි. ඒ මම දැන් ඒ දාසභාවයෙන් මිදුණෙමි, තමා අයත් පැවැතුම් ඇතියෙමි, පරා අයත් පැවැතුම් නැතියෙමි, නිදහස් වූයෙමි කැමැති අතෙක යා හැකියෙමි වෙමි" යි මෙසේ සිතෙක් වන්නේ ද, හේ ඒ කරුණින් සතුට ලබන්නේ ද, සොම්නසට පැමිණෙන්නේ ද-

50. මාණවය, යම්සේ ධනවත් වූ භොගසම්පත් ඇති පුරුෂයෙක් දුර්ලභ ආහාර ඇති, උවදුරු ඇති, දිය නැති දික් මඟකට බස්නේ ද, හේ පසු කලෙක සුවසේ ඒ නිරුදක පෙදෙස ඉක්මැ යන්නේ ද, උවදුරු නැති විපත් නැති ගම්මානයකට බස්නේ ද, එසේ වූ ඔහුට "මම් වූ කලි පෙර ධන ඇතියෙමි, භොගසම්පත් ඇතියෙමි, දිය නැති, ආහාරදුර්ලභ, ප්‍රයිභය සහිත දික් මඟකට බවුණෙමි. ඒ මම දැන් සුවසේ ඒ කාන්තාරය තරණය කෙළෙමි. නිරුපද්‍රැත භයරහිත ගම්කට පැමිණියෙමි වෙමි"යි සිතෙක් වන්නේ ද, හේ ඒ කරුණින් සතුට ලබන්නේ ද, සොම්නසට පැමිණෙන්නේ ද-

51. එවමේව ඛො මාණව භික්ඛු යථා ඉණං යථා රොගං යථා බන්ධනාගාරං යථා දාසව්‍යං යථා කන්තාරද්ධානමග්ගං, එවං ඉමේ පඤ්ච නීවරණෙ අප්පහීණෙ අත්තනි සමනුපස්සති. සෙය්‍යථාපි මාණව ආනණ්‍යං, යථා ආරොග්‍යං, යථා බන්ධනා මොක්ඛං, යථා භුජිස්සං, යථා ඛෙමන්තභූමිං, එවමේව ඛො මාණව භික්ඛු ඉමේ පඤ්ච නීවරණෙ පහීණෙ අත්තනි සමනුපස්සති.

52. තස්සිමෙ පඤ්ච නීවරණෙ පහීණෙ අත්තනි සමනුපස්සතො පාමොජ්ජං ජායති. පමුදිතස්ස පීති ජායති. පීතිමනස්ස කායො පස්සම්භති. පස්සද්ධකායො සුඛං වෙදෙති. සුඛිනො චිත්තං සමාධියති.

53. සො විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමිමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අඵුටං හොති.

54. සෙය්‍යථාපි මාණව දක්ඛො න්හාපකො වා න්හාපකන්තෙවාසී වා කංසථාලෙ න්හානීයචූණ්ණානි ආකිරිත්වා උදකෙන පරිපොථෙසකං පරිපොථෙසකං සන්නෙය්‍ය, සායං න්හානීයපිණ්ඩි සෙහාභානුගතා සෙහාභපරෙතා සන්තරබාහිරා ඵුටා සෙහෙන න ච පග්ඝරණී, එවමේව ඛො මාණව භික්ඛු ඉමිමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අඵුටං හොති.

55. යම්පි මාණව භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති, සො ඉමිමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිඵරති, නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අඵුටං හොති, ඉදම්පි'ස්ස හොති සමාධිස්මිං.

56. පුන ච පරං මාණව භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමිමෙව කායං සමාධිජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස සමාධිජෙන පීතිසුඛෙන අඵුටං හොති.

51. මාණවය, එසේ ම මහණ තෙමේ ණයක් මෙන් ලෙඩක් මෙන් හිරගෙයක් මෙන් වහල්බවක් මෙන් දිය නැති දික්මඟක් මෙන් (පිළිවෙළින්) මේ පහ නොවූ නීවරණ පස තමා කෙරෙහි දකී. මාණවය, ණය නැති බව යම්සේ ද, ලෙඩ නැති බව යම්සේ ද, හිරගෙන් මිදුණුබව යම්සේ ද, නිවහල්බව යම්සේ ද, උවදුරු නැති තිම යම්සේ ද, එසේ ම (පිළිවෙළින්) මේ පහ වූ නීවරණ පස (ගෙවත් නීවරණ පසේ දුරු වීම) තමා කෙරෙහි දකී.

52. තමා කෙරෙහි පහ වූ මේ නීවරණ පස දක්නා ඔහුට සතුට උපදී. සතුටු වූවහුට ප්‍රීතිය උපදී. සිතැ ප්‍රීතිය ඇත්තහුගේ නාම කය සංහිඳේ. සංහුන් නාම කය ඇත්තේ සුව විඳී. සුවැතියහු සිත සමාධිගත වේ (එකඟ වේ)

53. හේ කාමයන්ගෙන් වෙන් ව ම, සෙසු අකුසල් දහමුන්ගෙන් ද වෙන් ව ම, විතර්කසහිත, විචාරසහිත, විවේකයෙන් (නීවරණ පහ වීමෙන්) උපන් ප්‍රීතියත් සුවයත් ඇති පළමු ධ්‍යානය ලැබ වෙසේ. හේ මේ කරජ කය ම විවේකයෙන් උපන් ප්‍රීතිසුඛයෙන් තෙමයි, මුළුල්ල ම තෙමයි, පුරා ලයි, මුළුල්ල ම ස්පර්ශ කෙරෙයි. සියලු අඟ පසඟ ඇති ඔහු මුළු කයෙහි ඒ විවේකයෙන් උපන් ප්‍රීතිසුඛයෙන් පැතිරී වැද නොගත් (නොපහස්නා ලද) කිසි ද තැනෙක් නො වෙයි.

54. මාණවය, යම්සේ කපුවෙක් (කිලිගෙක්) හෝ කපුවකුගේ (කිලිගකුගේ) අතැවැස්සෙක් හෝ ලොහොතලියෙක නාන සුණු ඛඩා දිය ඉස ඉස පිඬු කරන්නේ ද, ඒ නාන සුණුපිඬ කාවැදුණු දිය ඇත්තේ, හැම තැන ම දියෙන් යුක්ත වූයේ, ඇතුළත පිටත මුළුල්ල ම දියෙන් පැතිරී ගියේ, දිය නො වගුරුවන්නේත් වේ ද, මාණවය, එසේ ම මහණ තෙමේ මේ කරජ කය ම විවේකයෙන් උපන් ප්‍රීතිසුඛයෙන් තෙමයි, මුළුල්ල ම තෙමයි, පුරා ලයි, මුළුල්ල ම ස්පර්ශ කෙරෙයි. ඔහුගේ සියලු අඟ පසඟ ඇති මුළු කයෙහි විවේකජ ප්‍රීතිසුඛයෙන් පැතිර වැද නොගත් කිසි ද තැනෙක් නො වෙයි.

55. මාණවය, මහණ තෙම කාමයන්ගෙන් වෙන් ව ම, සෙසු අකුසල් දහමුන්ගෙන් ද වෙන් ව ම, විතර්කසහිත විචාරසහිත, විවේකයෙන් උපන් ප්‍රීතියත් සුවයත් ඇති යම් පළමු දහතක් ලැබ වෙසේ ද, හේ ඒ විවේකජ ප්‍රීතිසුඛයෙන් මේ කය ම තෙමයි, මුළුල්ල ම තෙත් කෙරෙයි, පුරා ලයි, හාත්පස පැතිරී ගනී. ඔහුගේ සියලු කයැ විවේකජ ප්‍රීතිසුඛයෙන් නො පැතිරුගත් කිසිදු තැනෙක් නො වෙයි. මේ ද ඔහුගේ සමාධියෙක් වෙයි.

56. මාණවය, නැවැත ද (අනෙකක් කියමි:) මහණ තෙමේ විතර්ක විචාරයන්ගේ සංහිඳීමෙන්, සිය සතන්හි උපන්, සිය සතන් පහදවන (ශ්‍රද්ධාව හා එක් වැ යෙදුණු), සිතැ එකඟ බව ඇති, විතර්ක නැති, විචාරය නැති, සමාධියෙන් උපන්, ප්‍රීතියත් සුවයත් ඇති, දෙවෙනි ධ්‍යානයට පැමිණ වෙසෙයි. හේ මේ කරජ කය ම සමාධියෙන් උපන් ප්‍රීතිසුඛයෙන් තෙමයි. මුළුල්ල ම තෙත් කෙරෙයි, පුරා ලයි, හැම තැන ම ස්පර්ශ කෙරෙයි. ඔහුගේ කයේ විවේකයෙන් උපන් පිති සුඛයෙන් පැතිරී නොගත් කිසි ද තැනෙක් නො වෙයි.

57. සෙය්‍යථාපි මාණව උදකරහදෙ උබ්භිදෙදකො, තස්ස නෙවස්ස පුරත්ථිමාය දිසාය උදකස්ස ආයමුඛං, න දක්ඛිණාය දිසාය උදකස්ස ආයමුඛං, න පච්ඡිමාය දිසාය උදකස්ස ආයමුඛං, න උත්තරාය දිසාය උදකස්ස ආයමුඛං, දෙවො ච න කාලෙන කාලං සම්මා ධාරං අනුප්පවෙච්ඡෙය්‍ය, අථ ඛො තම්හා ච උදකරහදා සීතා වාරිධාරා උබ්භිජ්ජිත්වා තමේව උදකරහදං සීතෙන වාරිනා අභිසන්දෙය්‍ය පරිසන්දෙය්‍ය පරිපූරෙය්‍ය පරිප්ඵරෙය්‍ය, නාස්ස කිඤ්චි සබ්බාවතො උදකරහදස්ස වාරිනා සීතෙන අප්ඵුටං අස්ස, එවමේව ඛො මාණව භික්ඛු ඉමමේව කායං සමාධිජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස සමාධිජෙන පීතිසුඛෙන අප්ඵුටං හොති.

58. යම්පි මාණව භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති, සො ඉමමේව කායං සමාධිජෙනපීති-සුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස සම්ම ධිජෙන පීතිසුඛෙන අප්ඵුටං හොති. ඉදම්පි'ස්ස හොති සමාධිස්මිං.

59. පුන ච පරං මාණව භික්ඛු පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති සතො සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති. යන්තං අරියා ආචික්ඛන්ති 'උපෙක්ඛකො සතිමා සුඛවිහාරී'ති', තං තතියං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමේව කායං නිප්පීතිකෙන සුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස නිප්පීතිකෙන සුඛෙන අප්ඵුටං හොති.

60. සෙය්‍යථාපි මාණව උප්පලිනියං වා පදුමිනියං වා පුණ්ඩරිකිනියං වා අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරිකානි වා උදකෙ ජාතානි උදකෙ සංවද්ධානි උදකානුග්ගතානි අන්තොනිමුග්ගපොසීනි, තානි යාව චග්ගා යාව ච මූලා සීතෙන වාරිනා අභිසන්නානි පරිසන්නානි පරිපූරානි පරිප්ඵුටානි, නාස්සා කිඤ්චි සබ්බාවතං උප්පලානං වා පදුමානං වා පුණ්ඩරිකානං වා සීතෙන වාරිනා අප්ඵුටං අස්ස, එවමේව ඛො මාණව භික්ඛු ඉමමේව කායං නිප්පීතිකෙන සුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරි-පූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස නිප්පීතිකෙන සුඛෙන අප්ඵුටං හොති.

57. මාණවය, යම්සේ යටැ උල්පතින් මතු වන දිය ඇති ගැඹුරු විලෙක් වේ ද, එයට පෙරදිගින් දිය ඇතුළු වන මඟෙක් නො වන්නේ ද, දකුණු දෙසින් ද දිය ඇතුළු වන මඟෙක් නොවන්නේ ද, පැසිම් දිගින් ද දිය ඇතුළු වන මඟෙක් නොවන්නේ ද, උතුරු දෙසින් ද දිය වැද ගන්නා මඟෙක් නො වන්නේ ද, වැස්ස ද කලින් කලැ සුදුසු පරිදි නො වසින්නේ ද, එතෙකුදු වුවත් ඒ විලෙන් සිසිල් දිය දහර මතු වී ඒ විල ම සිසිල් දියෙන් තෙමන්නේ ද, හැම පරිදි තෙමන්නේ ද, පුරා ලන්නේ ද, හැම තැන ම වැද ගෙන පැතිරී සිටින්නේ ද, ඒ මුළු විලෙහි සිසිල් දිය පැතිරී වැද නොගත් කිසි ද තැනෙක් නො මැත් ද, මාණවය, එසේ ම මහණ තෙමේ මේ කරජ කය ම සමාධියෙන් උපන් ප්‍රීති සුඛයෙන් තෙමයි, හැම තැන ම තෙත් කෙරෙයි, පුරා ලයි, හැම තැන ම පැතිරී වැද ගනී. ඔහුගේ ඒ සියලු කයේ සමාධියෙන් උපන් ප්‍රීතිසුඛය පැතිර වැද නොගත් කිසි ද තැනෙක් නො වෙයි.

58 මාණවය, මහණ තෙම විතර්කවිචාරයන් සංසිඳීමෙන් තමා කෙරෙහි පැහැදීම ඇති කරන, සිතැ එකඟ බව ඇති, විතර්කරහිත විචාරරහිත, සමාධියෙන් පහළ වූ, ප්‍රීතිය හා සුඛවෙදනාව හා ඇති යම් දෙවෙනි ධ්‍යානයකට පැමිණැ වෙසේ ද, හේ මේ කය ම සමාධියෙන් උපන් ප්‍රීතිසුඛයෙන් තෙමයි. හැම තැන ම තෙත් කෙරෙයි, පුරා ලයි. හැම තැන ම පැතිරී වැද ගනී. ඔහුගේ ඒ සියලු කයැ සමාධියෙන් උපන් ප්‍රීතිසුඛය පැතිරී වැද නොගත් කිසි ද තැනෙක් නො වෙයි. මේ ද ඔහුගේ සමාධියෙක් වෙයි.

59. තැවැත ද (අනෙකක් කියමි:) මාණවය, මහණ තෙමේ ප්‍රීතියගේ ද විරාගයෙන් (පහ වීමෙන්, සංසිඳීමෙන්), උපෙක්ෂක වැ, සිහියෙන් හා නුවණින් හා යුක්ත වැ වෙසෙයි. (දහත්) සුවය ද කයින් විඳී. ආර්යයෝ යම් ධ්‍යානයක් හෙතු කොට ගෙන ධ්‍යානලාභියා ඇරැඹැ 'උපේක්ෂාව ඇත්තේ, සිහි ඇත්තේ, සුඛවිහරණ ඇත්තේ යැ' යි කියත් ද, හේ (එසේ වූ) ඒ තෙවෙනි ධ්‍යානයට පැමිණ වෙසේ. හේ මේ කය ම නිර්ප්‍රීතික සුඛයෙන් තෙමයි, හැම පරිදි තෙත් කෙරෙයි, පුරා ලයි, හැම තැන ම පැතිර වැද ගනී. ඔහුගේ කයෙහි ඒ නිර්ප්‍රීතික සුඛයෙන් පැතිර නොගත් කිසි ද තැනෙක් නො වෙයි.

60. මාණවය, යම්සේ උපුල් විලෙක හෝ පියුම් විලෙක හෝ පඬෙර විලෙක හෝ ඇතැම් උපුල් හෝ පියුම් හෝ පඬෙර හෝ දියෙහි උපන්නේ, දියෙහි වැඩුණේ, දියෙන් නොනැගුණේ, දිය තුළැ ම ගිලී වැඩෙනුයේ ද, ඒ හැම අග දක්වාත් මුල් දක්වාත් සිසිල් දියෙන් තෙමුණේ, හැම පරිදි තෙත් වූයේ, පිරී ගියේ, හැම තැන් ම පැතිරී වැද ගත්තේ වේ ද, ඒ විලෙහි සියලු උපුල්වලැ හෝ පියුම්වලැ හෝ පඬෙරවලැ හෝ සිසිල් දිය පැතිරී නොගත් තැනෙක් නො වන්නේ ද, මාණවය, එසේ ම මහණ තෙමේ මේ කය ම නිර්ප්‍රීතික සුඛයෙන් තෙමයි, ඛාන්පසින් තෙමයි, පුරා ලයි, හැම පරිදි පැතිරී වැද ගනී. ඔහුගේ සියලු කයෙහි නිර්ප්‍රීතික සුඛයෙන් පැතිරී වැද නොගත් කිසි ද තැනෙක් නො වෙයි.

61. යම්පි මාණව භික්ඛු පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති සතො සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති, යං තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති තං තතියං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමිමෙව කායං නිප්පීතිකෙන සුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිඵරති, නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස නිප්පීතිකෙන සුඛෙන අඵුටං හොති, ඉදම්පි'ස්ස හොති සම්මාධිස්මිං.

62. පුන ච පරං මාණව භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛමසුඛං උපෙක්ඛා-සතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමිමෙව කායං පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන ඵරිත්වා නිසින්නො හොති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අඵුටං හොති. සෙය්‍යථාපි මාණව පුරිසො ඔදාතෙන වත්ථෙන සසීසං පාරුපිත්වා නිසින්නො අස්ස, නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස ඔදාතෙන වත්ථෙන අඵුටං අස්ස, එවමෙව ඛො මාණව භික්ඛු ඉමිමෙව කායං පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන ඵරිත්වා නිසින්නො හොති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අඵුටං හොති.

63. යම්පි මාණව භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති, සො ඉමිමෙව කායං පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන ඵරිත්වා නිසින්නො හොති, නාස්ස කිඤ්චි සබ්බා-වතො කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අඵුටං හොති, ඉදම්පි'ස්ස හොති සම්මාධිස්මිං. අයං ඛො සො මාණව අරියො සම්මාධික්ඛන්ධො යස්ස සො භගවා වණ්ණවාදී අහොසි, යත්ථ ච ඉමං ජනතං සමාදපෙසි නිවෙසෙසි පතිට්ඨාපෙසි. අත්ථි වෙවෙත්ථ උත්තරිං කරණීයන්ති.

64. "අච්ඡරියං හො ආනන්ද අබ්භුතං හො ආනන්ද. සො වායං හො ආනන්ද අරියො සම්මාධික්ඛන්ධො පරිපුණ්ණො නො අපරිපුණ්ණො. එවං පරිපුණ්ණඤ්චායං හො ආනන්ද අරියං සම්මාධික්ඛන්ධං ඉමතා බහිද්ධා අඤ්ඤෙසු සමණබ්‍රාහ්මණෙසු න සමනුපස්සාමි. එවං පරිපුණ්ණඤ්ච හො ආනන්ද අරියං සම්මාධික්ඛන්ධං ඉමතා බහිද්ධා අඤ්ඤෙසු සමණබ්‍රාහ්මණා අත්තනි සමනුපස්සෙය්‍යුං, තෙ තාවතකෙනෙව අත්තමනා අස්සු අලමෙත්තා-වතා, කතමෙත්තාවතා, අනුප්පත්තො නො සාමඤ්ඤත්ථො, නත්ථි නො කිඤ්චි උත්තරිං කරණීයන්ති.

61. මාණවය, මහණ තෙම ප්‍රීතිය ද හැරැ ලීමෙන් උපෙක්ෂාව ඇත්තේ සිහි ඇති වැ නුවණ ඇති වැ වෙසේ. සුවයත් තාම කයින් විඳි. 'උපෙක්ෂා ඇත්තේ සිහි ඇත්තේ සුව වුසුම් ඇත්තේ යැ' යි ආර්‍යයෝ 'යමක්හු දක්-වත් තම්, ඒ තෙවෙනි ධ්‍යානය ලැබ වෙසේ. හේ නිරාමිෂික සුඛයෙන් මේ කය ම තෙමෙයි, කය මුළුල්ල ම තෙත් කෙරෙයි, පුරා ලයි, පැතිරැ වැද ගනී. ඔහුගේ සියලු කයෙහි නිරාමිෂික සුඛයෙන් පැතිරැ වැද නො ගත් කිසි ද තැනෙක් නො වෙයි යන යමක් ඇද්ද, මේ ද ඔහුගේ සමාධියෙක් වෙයි.

62. තැවැත ද (අනෙකක් කියම්) මාණවය, මහණ තෙමේ සුඛ වේදනාව ද දුරැ ලීමෙන්, දුඃඛ වේදනාව ද දුරැ ලීමෙන්, පළමු කොට ම සොම්නස් දොම්නස් දෙදෙනාගේ පහ වීමෙන්, දුක් ද නොවූ, සුව ද නොවූ, උපෙක්ෂා සමෘති යන මොවුන්ගේ පිරිසිදු බව ඇති සතර වන ධ්‍යානය ලැබ වෙසෙයි. හේ මේ කය ම පිරිසිදු ප්‍රභාස්වර සිතින් පැතිරැ වැද ගෙන හුන්නේ වෙයි. ඔහුගේ සියලු කයෙහි පිරිසිදු වූ ප්‍රභාස්වර වූ සිතින් පැතිරැ වැද නො ගෙන සිටි කිසි ද තැනෙක් නො වෙයි. මාණවය, යම්සේ පුරුෂයෙක් සුදු වතින් හිසින් වටා පෙරෙවැ හුන්නේ වේ නම්, ඔහුගේ කයෙහි සුදු වතින් වැද නොගත් (තො වැසුණ) කිසි ද තැනෙක් නො වන්නේ ද, මාණවය, එසේ ම මහණ තෙම මේ කය ම පිරිසිදු වූ ප්‍රභාස්වර වූ සිතින් පැතිරැ වැද ගෙන හුන්නේ වෙයි. ඔහු කයැ පිරිසිදු පබසරසිතින් වැද ගෙන නොසිටි කිසි ද තැනෙක් නො වෙයි.

63. මාණවය, මහණ තෙම සුඛ වේදනාව ද දුක් වේදනාව ද පහ කිරීමෙන් පළමුවෙන් ම සොම්නස් දොම්නසුන් පහ වැ යෑමෙන්, දුක් ද නොවූ සුව ද නො වූ, උපෙක්ෂාවත් සමෘතියත් යන මොවුන්ගේ පිරිසිදු බව ඇති යම් සිවුවන දඹත් ලැබැ වෙසෙයි, එසින් හෙ තෙම මේ කය ම පිරිසිදු පබසර සිතින් පැතිරැ ගෙන හුන්නේ වෙයි, ඔහුගේ සියලු කයෙහි පිරිසිදු පබසර සිතින් පැතිරැ නොගත් කිසින් ද තැනෙක් නො වෙයි යන යමක් ඇද්ද, මේ ද ඔහුගේ සමාධියෙක් වෙයි. මාණවය, භාග්‍යවතුන් වහන්සේ යමක්හුගේ ගුණ වදරන සුලු වූ සේක් ද, යමෙක්හි මේ ජනතාව ගැන්වූ සේක් ද, පිවිස්වූ සේක් ද, පිහිටවූ සේක් ද, ඒකාන්තයෙන් මේ ඒ ආර්‍ය සමාධිස්කන්ධය යැ. වැලි මෙහි මෙසින් මත්තෙහි කටයුතු දැ ද ඇත."

64. [ගුහ] "භවත් අනද තෙරුනි, ආශ්චර්‍ය ය. භවත් අනද තෙරුනි, පුදුම ය. ඒ මේ සමාධිස්කන්ධය පරිපූර්ණ ය, අපරිපූර්ණ නො වේ. භවත් අනද තෙරුනි, මෙසේ පරිපූර්ණ වූ ආර්‍ය සමාධිස්කන්ධයක් මෙසින් පිටත්හි අන් මහණබමුණන් කෙරෙහි නො දකිමි. භවත් අනද තෙරුනි, මෙසේ පරිපූර්ණ ද වූ ආර්‍ය සමාධිස්කන්ධයක් මෙසින් පිටත්හි මහණ බමුණෝ තමන් කෙරෙහි දක්නාහු නම්, ඔහු එපමණෙකින් ම 'මේතෙකින් ගැහෙයි (මේ තෙක් ම ඇත), මෙතෙකින් සියලු කටයුතු දැ කොට නිමැවිණැ' යි සතුටු සිතැති වන්නාහ.

65. අථ ච පන භවං ආනන්දො එවමාහ: අත්ථි චෙවෙත්ථ උත්තරිං කරණීයන්ති. කතමො පන සො භො ආනන්ද අරියො පඤ්ඤක්ඛන්ධො, යස්ස සො භවං ගොතමො වණ්ණවාදී අහොසි යත්ථ ච ඉමං ජනතං සමාදපෙසි නිවෙසෙසි පතිට්ඨාපෙසි?"ති.

66. "පුන ච පරං මාණව සො භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ඤාණදස්සනාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො එවං පජානාති: අයං ඛො මෙ කායො රූපී චාතුම්මහාභූතිකො මාතාපෙත්තිකසම්භවො ඔදනකුම්මාසූපචයො අනිච්චුච්ඡාදනපරිමද්දනභෙදනවිද්ධංසනධම්මො. ඉදං ච පන මෙ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධන්ති.

67. සෙය්‍යථාපි මාණව මණි වෙළුරියො සුභො ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො අවෙජ්ඣ විප්පසන්නො අනාවිලො සබ්බාකාරසම්පන්නො තත්‍රස්ස සුත්තං ආවුතං නීලං වා පීතං වා ලොහිතං වා ඔදාතං වා පණ්ඩුසුත්තං වා. තමෙනං චක්ඛුමා පුරිසො හත්ථෙ කරිත්වා පච්චවෙක්ඛෙය්‍ය: අයං ඛො මණි වෙළුරියො සුභො ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො අවෙජ්ඣ විප්පසන්නො අනාවිලො සබ්බාකාරසම්පන්නො. තත්‍රිදං සුත්තං ආවුතං නීලං වා පීතං වා ලොහිතං වා ඔදාතං වා පණ්ඩුසුත්තං වා"ති. එවමෙව ඛො මාණව භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ඤාණදස්සනාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො එවං පජානාති: අයං ඛො මෙ කායො රූපී චාතුම්මහාභූතිකො මාතාපෙත්තිකසම්භවො ඔදනකුම්මාසූපචයො අනිච්චුච්ඡාදනපරිමද්දනභෙදනවිද්ධංසනධම්මො. ඉදං ච පන මෙ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධන්ති.

68. යම්පි මාණව භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ -පෙ- එවං පජානාති -පෙ- ඉදං ච පන මෙ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධන්ති, ඉදම්පි'ස්ස හොති පඤ්ඤාය.

65. එහෙත් භවත් අනඳ තෙරණුවෝ 'මෙහි මත්තෙහි ද කටයුතු දැ ඇතැ'යි මෙසේ වදාරති. භවත් අනඳ තෙරුනි, ඒ පින්වත් ගොයුම්රුජාණන් වහන්සේ යම්කිසිවකුගේ ගුණ වදාරන සුලු වූ සේක් නම්, යමෙකැ මේ ජනතාව මොනොවට ගැත්වූ සේක්, පිවිත්වූ සේක්, පිහිටුවූ සේක් වූහු නම් ඒ ආර්ය ප්‍රඥාස්කන්ධය කවරේ ද?"

66. [ආනන්දඃ] "තව ද (අනෙකක් කියම්) මාණවය, ඒ මහණ තෙමේ මෙසේ සිත එකඟ වූ කල්හි, පිරිසිදු වූ කල්හි, දීප්තිමත් වූ කල්හි, කිලිටි නැති වූ කල්හි, පහ වූ විත්තෝපක්ලේශ ඇති කල්හි, මෘදු වූ කල්හි, විදර්ශනාභාවනාවට යෝග්‍ය කල්හි, සිත කල්හි, නිශ්චල බවට පැමිණි කල්හි, විදර්ශනා ඥානය පිණිස, (පරිකම්) සිත එයම අභිමුඛ කෙරෙයි, ඒ අතම නමා හරියි. හේ "මාගේ මේ කය වූ කලි රූපවත් ය, සතර මහාභූතයන් ගෙන් හැදුණේ ය, මාපියන්ගේ ශුක්‍ර-ශෝණිතයෙන් උපන්නේ ය, බත් කොළු ආදි ආහාරින් වැඩුණේ ය, අනිත්‍ය බව ද දුගඳ හරනුවට සුවඳ විලෙවුන් ඉලියැ සුතු බව ද, ලෙඩ දුරලනුවට පිරිමැදුම් ඇ කළ සුතු බව ද, එසේ කළ ද බිඳෙන බව ද, විසිරෙන බව ද යන මේ දැ සභාව කොටැත්තේ ය. මගේ මේ සිත ද මෙහි ලැග්ගේ ය, මෙහි බැඳුණේ යැ" යි මෙසේ දැන ගනී.

67. මාණවය, යම්සේ සොඳුරු වූ, පිරිසිදු ආකරයෙක පහළ වූ, අවැස් වූ මොනොවට පිරියම් කළ, සිසුම් වූ වෙසෙසින් පහත් වූ, පිවිතුරු වූ, ඛොවනාදි සියලු ආකාරයෙන් යුත් වෙරළුමිණෙක් වන්නේ ද, එහි නිල්වන් වූ හෝ රත්වන් වූ හෝ රත්වන් වූ හෝ සුදුවන් වූ හෝ පඬුවන් හෝ හුයෙක් අවුතන ලද්දේ වන්නේ ද, එය ඇස් ඇති පුරුෂයක් අතෙහි කොට, "මේ වූ කලි සොඳුරු වූ, පිරිසිදු ආකරයෙහි උපන්, අවැස් වූ මොනොවට පිරියම් කළ, සිසුම් වූ, වෙසෙසින් පහත් වූ, පිවිතුරු වූ, සියලු ඛොවනාදි ආකාරයෙන් සම්පූර්ණ වූ වෙරළුමිණෙක. මෙහි නිල්වන් වූ හෝ රත්වන් වූ හෝ රත්වන් වූ හෝ සුදුවන් වූ හෝ මේ හුයෙක් අවුතන ලදුයේ වේ යැ"යි සලකා බලන්නේ ද, මාණවය, එපරිද්දෙන් ම මහණ තෙමේ මෙසේ සිත සමාධිගත කල්හි පිරිසිදු කල්හි, දීප්තිමත් වූ කල්හි, කෙලෙස් යවපත් වූ කල්හි, උපක්ලේශයන් පහ වූ කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍ය වූ කල්හි, සිත කල්හි, නිශ්චල බවට පැමිණි කල්හි, විදර්ශනාඥානය පිණිස සිත අභිමුඛ කෙරෙයි, ඒ අතම නමා හරියි. හෙ තෙම "මාගේ මේ කය වූ කලි රූපි ය, සතර මහාභූතයන්ගෙන් හැදුණේ ය, මාපියන්ගේ ශුක්‍රශෝණිතයෙන් නිපන්නේ ය. බත් කොළු ආදි ආහාරින් වැඩුණේ ය. අනිත්‍ය බව ද දුගඳ හරනම සුවඳ විලෙවුන් ඉලියැ සුතු බව ද ලෙඩ දුරලනුවට පිරිමැදුම් ඇ කළ සුතු බව ද ඒ කළත් බිඳෙන බව ද විසිරෙන බව ද යන මේ දැ සභාව කොටැත්තේ ය, මගේ මේ සිත ද මෙහි ලැග ගත්තේ ය, මෙහි බැඳුණේ යැ"යි මෙසේ දැන ගනී.

68. මාණවය, මහණ මෙසේ සිත සමාධිගත කල්හි... 'මගේ මේ සිත ද මෙහි ලැග ගත්තේ ය. මෙහි බැඳුණේ යැ' යි මෙසේ දැනී යන යම්ක් ඇද්ද, මෙ ද ඔහුගේ ප්‍රඥාවෙක් වෙයි.

69. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ මනොමයං කායං අභිනිම්මිනනාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනොමයං සබ්බඞ්ගපච්චඞ්ගිං අහීනින්ද්‍රියං.

70. සෙය්‍යථාපි මාණව පුරිසො මුඤ්ජම්හා ඉසිකං පවාහෙය්‍ය, තස්ස එවමස්ස: අයං මුඤ්ජො අයං ඉසිකා. අඤ්ඤො මුඤ්ජො අඤ්ඤා ඉසිකා. මුඤ්ජම්හා තෙව ඉසිකා පබාළ්හා'ති. සෙය්‍යථාපි වා පන මාණව පුරිසො අසිං කොසියා පවාහෙය්‍ය, තස්ස එවමස්ස: අයං අසි අයං කොසි, අඤ්ඤො අසි අඤ්ඤා කොසි, කොසියා තෙව අසි පබාළ්හා 'ති. සෙය්‍යථාපි වා පන මාණව පුරිසො අහිං කරණ්ඩා උද්ධරෙය්‍ය, තස්ස එවමස්ස: අයං අහි අයං කරණ්ඩො, අඤ්ඤො අහි අඤ්ඤො කරණ්ඩො. කරණ්ඩාතෙව අහි උබ්භතො'ති. එවමෙව ඛො මාණව භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ මනොමයං කායං අභිනිම්මිනනාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනොමයං සබ්බඞ්ගපච්චඞ්ගිං අහීනින්ද්‍රියං.

71. යම්පි මාණව භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ-පෙ-අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනොමයං සබ්බඞ්ගපච්චඞ්ගිං අහීනින්ද්‍රියං, ඉදම්පි'ස්ස හොති පඤ්ඤාය.

72. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො අනෙකවිහිතං ඉද්ධිවිධං පච්ච-නුභොති: එකො'පි හුත්වා බහුධා හොති බහුධාපි හුත්වා එකො හොති, ආවිභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජ-මානො ගච්ඡති සෙය්‍යථාපි ආකාසෙ. පඨවියා'පි උම්මුජ්ජනිමුජ්ජං කරොති, සෙය්‍යථාපි උදකෙ. උදකෙ'පි අභිජ්ජමානෙ ගච්ඡති සෙය්‍යථාපි පඨවියං. ආකාසෙ'පි පල්ලඞ්කෙන කමති සෙය්‍යථාපි පක්ඛී සකුණො. ඉමෙ'පි චන්දිමසූරියෙ එවංමහිද්ධිකෙ එවංමහානුභාවෙ පාණිනා පරාමසති පරිමජ්ජති. යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති.

69. හේ මෙසේ සිත සමාහිත වූ කල්හි, පිරිසිදු වූ කල්හි, දීප්තිමත් වූ කල්හි, කෙලෙස් නොමැති වූ කල්හි, උපක්ලේශ පහ වූ කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍ය වූ (සෘද්ධි ඉපැදීමට යෝග්‍ය වූ) කල්හි, සුස්ථිත කල්හි, නිශ්චල බවට පැමිණි කල්හි, මනොමය ශරීරයක් මවා පෘතු පිණිස සිත යොමු කෙරෙයි, නැඹුරු කෙරෙයි. හේ මේ සිරුරෙන් රූපී වූ, සියලු අඟපසඟින් යුත්, විකල නො වූ ඉඳුරන් ඇති මනොමය ශරීරයක් මවා පායි.

70. මාණවය, යම්සේ පුරුෂයෙක් මුදුතණගසෙකින් තණකූර (=තණ බඩය) ඇද මෑත් කරන්නේ ද, ඔහුට 'මේ මුදුතණගස ය, මේ එහි තණබඩ ය; තණගස එකෙකි, එහි බඩය අනෙකෙකි, මුදුතණ ගස කෙරෙන් ම එහි කූර (බඩය) මෑත් කරන ලද්දේ යැ' යි මෙසේ සිතෙක් වන්නේ ද- මාණවය, යම්සේ පුරුෂයෙක් කඩුවක් කොපුවෙන් ඇද මෑත් කරන්නේ ද, ඔහුට 'මේ කඩුව ය, මේ කොපුව ය; කඩුව එකෙක, කොපුව අනෙකෙක. කොපුයෙන් ම කඩුව ඇද මෑත් කරන ලද්දේ යැ'යි මෙසේ සිතෙක් වන්නේ ද- මාණවය, යම්සේ වනාහි පුරුෂයෙක් නයකු සැවයෙන් ඇද වෙන් කරන්නේ ද, ඔහුට 'මේ නයා ය, මේ සැව ය; නයා එකෙක, සැවය අනෙකෙක. සැවය කෙරෙන් ම නයා ඇද වෙන් කරන ලද්දේ යැ'යි මෙසේ සිතෙක් වන්නේ ද- මාණවය, එපරිදිදෙන් ම මහණ තෙම මෙසේ සිත සමාධිගතවැ පිරිසිදු වූ කල්හි, දීප්තිමත් වූ කල්හි, කෙලෙස් රහිත වූ කල්හි, උපක්ලේශයන් පහ වැ ගිය කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍ය වූ කල්හි, සුස්ථිත කල්හි, නිශ්චල බවට පත් කල්හි, මනොමය ශරීරයක් මවා පෘතු පිණිස සිත යොමු කෙරෙයි, නැඹුරු කෙරෙයි. හේ මේ ශරීරයෙන් රූපී වූ මනොමය වූ සියලු අඟපසඟින් යුත් වූ අවිකල ඉඳුරන් ඇති අන් සිරුරක් මවා පායි

71. මාණවය, මහණ තෙම මෙසේ සිත සමාධිගත කල්හි පිරිසිදු වූ කල්හි ... රූපී වූ මනොමය වූ සියලු අඟපසඟින් යුත් වූ අවිකල ඉඳුරන් ඇති අන් සිරුරක් මවා පායි යන යමක් ඇද්ද, මේ ද ඔහුගේ ප්‍රශ්නයෙක් වෙයි.

72. හේ මෙසේ සිත සමාහිත කල්හි, පිරිසිදු වූ කල්හි, දීප්තිමත් වූ කල්හි, කෙලෙස් රහිත වූ කල්හි, උපක්ලේශයන් පහ වැ ගිය කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍ය(=සෘද්ධියට යෝග්‍ය) කල්හි, සුස්ථිත කල්හි, නිශ්චලතියට පැමිණි කල්හි, සෘද්ධිවිධඥානය පිණිස (අභිඥාපාදක) පරිකර්ම සිත මෙහෙයයි, නැඹුරු කෙරෙයි. හේ අනෙකවිධ වූ සෘද්ධිවිධය (සෘද්ධි කොට්ඨාසය) නැවත නැවත අනුභව කෙරෙයි (හෙවත් තාම කයින් සපයී කෙරෙයි, ප්‍රත්‍යක්ෂ කෙරෙයි, ලබයි) පියෙවියෙන් එකෙක් වැ සිටැ ද (සෘද්ධි බලයෙන්) බහු ප්‍රකාර ද වී යළි දු එකෙක් වෙයි. තමාගේ ප්‍රකට බව කෙරෙයි. (පෙනීසිටී). අප්‍රකට බව කෙරෙයි (නොපෙනී සිටියි). බිත්තියෙන් පිටතට, පවුරෙන් පිටතට, පර්වතයෙන් පිටතට, අහසෙහි මෙන් කිසිවෙක නො ගැටෙනුයේ මැදින් විනිවිද ගෙන යෙයි. දියෙහි මෙන් පොළොවෙහි ද යටට ඛැසීම (ගිලී) උඩට නැගීම (මතු වීම) කෙරෙයි. නො බිඳෙන (යව නො බස්නා) දියෙහි පොළොවෙහි සේ යයි. පක්ෂ ඇති සකුණයකු මෙන් අහසෙහි ද පලඟින් (=ඌරුබඳ්ධාසනයෙන්) යෙයි. මෙසෙ මහර්ද්ධි ඇති මහත් අනුභාව ඇති මේ සඳ හිරු දෙදෙනා ද, අතින් පරාමර්ශන කෙරෙයි (=අල්ලයි), (ඔබමොබ අත යවා) පිරිමදියි, බඹලොව තෙක් ද (සියල්ල) කයින් වශයෙහි පවත්වයි.

73. සෙය්‍යථාපි මාණව දක්ඛො කුම්භකාරො වා කුම්භකාරන්තෙවාසී වා සුපරිකම්මකතාය මත්තිකාය යං යදෙව භාජනවිකතිං ආකඞ්ඛෙය්‍ය තං තදෙව කරෙය්‍ය අභිනිප්පාදෙය්‍ය-

74. සෙය්‍යථා වා පන මාණව දක්ඛො දන්තකාරො වා දන්තකාරන්තෙවාසී වා සුපරිකම්මකතස්මිං දන්තස්මිං යං යදෙව දන්තවිකතිං ආකඞ්ඛෙය්‍ය තං තදෙව කරෙය්‍ය අභිනිප්පාදෙය්‍ය-

75. සෙය්‍යථා වා පන මාණව දක්ඛො සුවණ්ණකාරො වා සුවණ්ණකාරන්තෙවාසී වා සුපරිකම්මකතස්මිං සුවණ්ණස්මිං යං යදෙව සුවණ්ණවිකතිං ආකඞ්ඛෙය්‍ය තං තදෙව කරෙය්‍ය අභිනිප්පාදෙය්‍ය-

76. එවමෙව ඛො මාණව භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති: එකො'පි හුත්වා බහුධා හොති -පෙ- යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති.

77. යම්පි මාණව භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ-පෙ-යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති, ඉදම්පි'ස්ස හොති පඤ්ඤාය.

78. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ දිබ්බාය සොතධාතුයා චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය උභො සද්දෙ සුණාති දිබ්බෙ ච මානුසෙ ච යෙ දූරෙ සන්තිකෙ ච.

79. සෙය්‍යථාපි මාණව පුරිසො අද්ධානමග්ගපටිපන්නො, සො සුණෙය්‍ය භෙරිසද්දම්පි මුදිඞ්ගසද්දම්පි සඞ්ඛපණවදෙණ්ඩිමසද්දම්පි, තස්ස එවමස්ස: භෙරිසද්දො ඉති'පි මුදිඞ්ගසද්දො ඉති'පි සඞ්ඛපණවදෙණ්ඩිමසද්දො ඉති'පි. එවමෙව ඛො මාණව භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ දිබ්බාය සොතධාතුයා චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය උභො සද්දෙ සුණාති දිබ්බෙ ච මානුසෙ ච යෙ දූරෙ සන්තිකෙ ච.

73. මාණවය, යම්සේ දක්ෂ කුඹලෙක් හෝ කුඹලක්හුගේ අතැවැස්සෙක් හෝ මොනොවට පිරියම් කළ (=සකස් කළ) මැටිවෙන් යම් යම් භාජන විශෙෂයක් කැමැත්තේ නම්, ඒ ඒ දෑය ම කරන්නේ ද, මොනොවට නිදවන්නේ ද-

74. මාණවය, යම්සේ දක්ෂ දන්තකාරයෙක් (ඇත් දතින් විසිතුරු රූ ඇ කරන්නෙක්) හෝ දන්තකාරයක්හු අතැවැස්සෙක් හෝ මොනොවට පිරියම් කළ දතෙහි යම් යම් දන්තවිකෘතියක් තමා කැමැති නම්, ඒ ඒ දෑ ම කරන්නේ ද නිපදවන්නේ ද -

75. මාණවය, යම්සේ දක්ෂ රත්කරුවෙක් හෝ රත්කරුවක්හු අතැවැස්සෙක් හෝ මොනොවට පිරියම් කළ රනෙහි යම් යම් සුවර්ණ විකෘතියක් තමා කැමැත්තේ නම්, එය එය ම කරන්නේ ද, නිපදවන්නේ ද -

76. එසේ ම මාණවය, මහණ මෙසේ සිත සමාහිත කල්හි පිරිසිදු කල්හි පසිවදත කල්හි අංගණ රහිත කල්හි උපක්ලේශ පහවූ කල්හි මෘදුවූ කල්හි කර්ම්ණ්‍ය කල්හි ස්ථිත කල්හි අචල බවට පැමිණෑ සිටි කල්හි ඍද්ධිවිධය පිණිස සිත යොමු කෙරෙයි, නමා ලයි. හේ 'එකෙක් වැ බොහෝ පරිදි වේ ... බඹ ලොව තෙක් ද කයින් වශය පවත්වයි යන අනෙකවිධ ඍද්ධිවිධ අනුභව කෙරෙයි.

77. මාණවය, මහණ මෙසේ සිත සමාහිත කල්හි ... බඹලොව දක්වා ද කයින් වශය පවත්වයි, අනෙකවිධ ඍද්ධිවිධ අනුභව කෙරේ යන යමක් ඇද්ද, මේ ද ඔහුගේ ප්‍රඥාවෙක් වේ.

78. හේ මෙසේ සිත සමාහිත කල්හි, පිරිසිදු වූ කල්හි, දීප්තිමත් වූ කල්හි, ක්ලේශ රහිත වූ කල්හි, උපක්ලේශ පහ වැ ගිය කල්හි, මෘදු වූ කල්හි, කර්ම්ණ්‍ය වූ කල්හි, ස්ථිත කල්හි, නිශ්චල බවට පැමිණි කල්හි, දිව්‍යශ්‍රෝත්‍ර-ධාතුව පිණිස (=දිවකන් තුවණ පිණිස) සිත යොමු කෙරෙයි, නැඹුරු කෙරෙයි, හේ පිරිසිදු වූ, මිනිසුන්ගේ ශ්‍රවණෝපචාරය ඉක්මවා සිටි දිව කනින් දිව්‍ය වූ ද මානුෂක වූ ද, දුරු වූ ද ළං වූ ද යන ද්විවිධ ශබ්ද ම අසයි.

79. මාණවය, යම්සේ මිනිසෙක් දික් මඟකට පිළිපන්නේ ද, හේ බෙර හඬත් මිහිඟුබෙර හඬත් පණාබෙර හඬත් ගැටබෙර හඬත් යම් සේ අසන්නේ ද, ඒ අසන ඔහුට 'මේ බෙර හඬැයි කියාත් මේ මිහිඟුබෙර හඬැ යි කියාත් මේ සක් හඬ යැ, මේ පණාබෙර හඬ යැ, මේ ගැටබෙර හඬ යැ යි කියාත් මෙසේ සිතෙක් වන්නේ ද, මාණවය, එපරිද්දෙන් ම මහණ තෙමේ මෙසේ සිත සමාහිත කල්හි, පිරිසිදු වූ කල්හි, දීප්තිමත් වූ කල්හි, ක්ලේශ රහිත වූ කල්හි, උපක්ලේශ පහ වැ ගිය කල්හි, මෘදු වූ කල්හි, කර්ම්ණ්‍ය (කර්ම්මම) වූ කල්හි, ස්ථිත කල්හි, නිශ්චල බවට පැමිණි කල්හි, දිව්‍ය-ශ්‍රෝත්‍රධාතුව පිණිස සිත යොමු කෙරෙයි, නැඹුරු කෙරෙයි. හේ පිරිසිදු වූ, මිනිසුන්ගේ ශ්‍රවණෝපචාරය ඉක්ම දිවකන්තුවණින් දිව්‍ය වූත් මානුෂක වූත් දුරු වූත් ළඟැ වූත් ද්විවිධ ශබ්ද අසයි.

80. යම්පි මාණව භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ -පෙ- උභො සද්දෙ සුණාති දිබ්බෙ ච මානුසෙ ච යෙ දූරෙ සන්තිකෙ ච, ඉදම්පි'ස්ස හොති පඤ්ඤෙය්‍ය.

81. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ චෙතොපරියඤ්ඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාති: සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති. වීතරාගං වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාති. සදොසං වා චිත්තං සදොසං චිත්තන්ති පජානාති. වීතදොසං වා චිත්තං වීතදොසං චිත්තන්ති පජානාති. සමොහං වා චිත්තං සමොහං චිත්තන්ති පජානාති. වීතමොහං වා චිත්තං වීතමොහං චිත්තන්ති පජානාති. සංඛිත්තං වා චිත්තං සංඛිත්තං චිත්තන්ති පජානාති. මහග්ගතං වා චිත්තං මහග්ගතං චිත්තන්ති පජානාති. අමහග්ගතං වා චිත්තං අමහග්ගතං චිත්තන්ති පජානාති. සඋත්තරං වා චිත්තං සඋත්තරං චිත්තන්ති පජානාති අනුත්තරං වා චිත්තං අනුත්තරං චිත්තන්ති පජානාති. සමාහිතං වා චිත්තං සමාහිතං චිත්තන්ති පජානාති. අසමාහිතං වා චිත්තං අසමාහිතං චිත්තන්ති පජානාති. විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානාති. අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති.

82. සෙය්‍යථාපි මාණව, ඉත්ථී වා පුරිසො වා දහරො වා සුවා මණ්ඩනකජාතිකො ආදාසෙ වා පරිසුද්ධෙ පරියොදාතෙ අච්ඡෙ වා උදකපත්තෙ සකං මුඛනිමිත්තං පච්චවෙක්ඛමානො සකණ්ටකං වා සකණ්ටකන්ති ජානෙය්‍ය, අකණ්ටකං වා අකණ්ටකන්ති ජානෙය්‍ය, එවමෙව ඛො මාණව භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ චෙතොපරියඤ්ඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාති: සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති. වීතරාගං වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාති. සදොසං වා චිත්තං සදොසං චිත්තන්ති පජානාති. වීතදොසං වා චිත්තං වීතදොසං චිත්තන්ති පජානාති. සමොහං වා චිත්තං සමොහං චිත්තන්ති පජානාති. වීතමොහං වා චිත්තං වීතමොහං චිත්තන්ති පජානාති. සංඛිත්තං වා චිත්තං -පෙ- වික්ඛිත්තං වා චිත්තං -පෙ- මහග්ගතං වා චිත්තං -පෙ- අමහග්ගතං වා චිත්තං -පෙ- සඋත්තරං වා චිත්තං -පෙ- අනුත්තරං වා චිත්තං -පෙ- සමාහිතං වා චිත්තං -පෙ- අසමාහිතං වා චිත්තං -පෙ- විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානාති. අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති.

80. මාණවය, ඒ මහණ මෙසේ සිත සමාධිගත වූ කල්හි, පිරිසිදු වූ කල්හි ... දිව්‍ය වූ ද මානුෂක වූ ද, දුරු වූ ද ළඟ වූ ද දිව්‍යධ ශබ්ද අසයි යන යමෙක් ඇද්ද, මේ ද ඔහුගේ ප්‍රඥාවෙක් වේ.

81. හේ මෙසේ සිත එකඟ වූ කල්හි, පිරිසිදු වූ කල්හි, දීප්තිමත් වූ කල්හි, කෙලෙස් රහිත වූ කල්හි, උපක්ලේශ පහ වැ ගිය කල්හි, මෘදු වූ කල්හි, කර්ම්ක්ෂම වූ කල්හි, ස්ථිත කල්හි, නිශ්චල බවට පැමිණි කල්හි, චේතස්පර්යඥානය පිණිස (=අනුන්ගේ සිත පිරිසිඳ දන්නා ඥාණ පිණිස) සිත යොමු කෙරෙයි, නැඹුරු කෙරෙයි. හේ අන් සත්ත්වයන්ගේ අන් පුද්ගලයන්ගේ සිත සියයිකින් පිරිසිඳැ දනියි. රාග සහිත සිත රාග සහිත සිතැ යි ද දනියි. රාග රහිත සිත රාග රහිත සිතැ යි ද දනියි. ද්වේෂ සහිත සිත ද්වේෂ සහිත සිතැයි ද දනී. ද්වේෂ රහිත සිත ද්වේෂරහිත සිතැ යි ද දනී. මෝහ සහිත සිත මෝහ සහිත සිතැ යි ද දනී. මෝහරහිත සිත මෝහරහිත සිතැ යි ද දනී. සංක්ෂිප්ත (=හැකුළුණු) සිත හැකුළුණු සිතැ යි ද දනී. වික්ෂිප්ත (=විසුරුණු) සිත විසුරුණු සිතැ යි ද දනී. මහද්ගත සිත මහද්ගත සිතැ යි ද දනී. අමහද්ගත සිත අමහද්ගත සිතැ යි ද දනී. සෝත්තර සිත සෝත්තර සිතැ යි ද දනී. අනුත්තර සිත අනුත්තර සිතැ යි ද දනී. සමාහිත සිත සමාහිත සිතැ යි ද දනී. අසමාහිත සිත අසමාහිත සිතැ යි ද දනී. විමුක්ත (=මිදුණු) සිත විමුක්ත සිතැ යි ද දනී. අවිමුක්ත (=නොමිදුණු) සිත අවිමුක්ත සිතැ යි ද දනී.

82. මාණවය, යම්සේ සැරැසෙන සුලු ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ ළදරුවෙක් හෝ තරුණයෙක් හෝ පිරිසිදු දීප්තිමත් කැඩපතෙක් හෝ පහත් දිය බඳුනෙක හෝ සිය මුවසටහන පිරික්සා බලන්නේ තල-කැලැල් ආදි දෙස් ඇති තැන් සඳෙස් තැතැ යි දන්නේ ද, එ කි දෙස් නැති තැන දෙස් තැතැ යි දන්නේ ද – මාණවය, එ පරිද්දෙන් ම මහණ තෙමේ මෙසේ සිත සමාහිත කල්හි, පිරිසිදු වූ කල්හි, දීප්ත වූ කල්හි, කෙලෙස් නැති කල්හි, උපක්ලේශ පහ වැ ගිය කල්හි, මෘදු වූ කල්හි, කර්ම්ක්ෂම වූ කල්හි, ස්ථිත කල්හි, නිශ්චල බවට පැමිණි කල්හි, පරසිත් දන්නා ඥාණ පිණිස සිත යොමු කෙරෙයි, නැඹුරු කෙරෙයි. හේ අන් සතුන්ගේ, අන් පුඟුලන්ගේ සිත සියයිකින් පිරිසිඳැ දනී. සරාග සිත සරාග සිතැ යි ද දනී. වීතරාග සිත වීතරාග සිතැ යි ද දනී. සද්වේෂ සිත සද්වේෂ සිතැ යි ද දනී. වීතද්වේෂ සිත වීතද්වේෂ සිතැ යි ද දනී. සමෝහ සිත සමෝහ සිතැ යි ද දනී, වීතමෝහ සිත වීතමෝහ සිතැ යි ද දනී. සංක්ෂිප්ත සිත සංක්ෂිප්ත සිතැ යි ද දනී. වික්ෂිප්ත සිත වික්ෂිප්ත සිතැ යි ද දනී. මහද්ගත සිත මහද්ගත සිතැ යි ද ... අමහද්ගත සිත අමහද්ගත සිතැ යි ද ... සෝත්තර සිත සෝත්තර සිතැ යි ද... අනුත්තර සිත අනුත්තර සිතැ යි ද ... සමාහිත සිත සමාහිත සිතැ යි ද... අසමාහිත සිත අසමාහිත සිතැ යි ද ... විමුක්ත සිත විමුක්ත සිතැ යි ද... අවිමුක්ත සිත අවිමුක්ත සිතැ යි ද දනී.

83. යම්පි මාණව භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ -පෙ- අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති, ඉදම්පි'ස්ස හොති පඤ්ඤාය.

84. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ පුබ්බෙනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති, සෙය්‍යථිදං: එකම්පි ජාතිං දෙ'පි ජාතියො තිස්සො'පි ජාතියො චතස්සො'පි ජාතියො පඤ්ච'පි ජාතියො දස'පි ජාතියො වීසම්පි ජාතියො තිංසම්පි ජාතියො චත්තාරීසම්පි ජාතියො ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි අනෙකෙ'පි සංවට්ටකප්පෙ අනෙකෙ'පි විවට්ටකප්පෙ අනෙකෙ'පි සංවට්ටවිවට්ටකප්පෙ 'අමුත්‍රාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවං සුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො අමුත්‍ර උපපාදිං. තත්‍රාපාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො ඉධූපපන්නො'ති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

85. සෙය්‍යථාපි මාණව පුරිසො සකම්හා ගාමා අඤ්ඤං ගාමං ගච්ඡෙය්‍ය තම්හා'පි ගාමා අඤ්ඤං ගාමං ගච්ඡෙය්‍ය. සො තම්හා ගාමා සකඤ්ඤෙව ගාමං පච්චාගච්ඡෙය්‍ය, තස්ස එවමස්ස: 'අහං ඛො සකම්හා ගාමා අමුං ගාමං අගච්ඡිං. තත්‍ර එවං අට්ඨාසිං එවං නිසීදිං එවං අභාසිං එවං තුණ්හී අහොසිං. තම්හාපි ගාමා අමුං ගාමං අගච්ඡිං. තත්‍රාපි එවං අට්ඨාසිං එවං නිසීදිං එවං අභාසිං එවං තුණ්හී අහොසිං. සො'මහි තම්හා ගාමා සකඤ්ඤෙව ගාමං පච්චාගතො'ති. එවමෙව ඛො මාණව භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ පුබ්බෙනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති, සෙය්‍යථිදං: එකම්පි ජාතිං දෙ'පි ජාතියො තිස්සො'පි ජාතියො චතස්සො'පි ජාතියො පඤ්චපි ජාතියො දස'පි ජාතියො වීසම්පි ජාතියො තිංසම්පි ජාතියො චත්තාරීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි අනෙකෙ'පි සංවට්ටකප්පෙ අනෙකෙ'පි විවට්ටකප්පෙ අනෙකෙ'පි සංවට්ටවිවට්ටකප්පෙ 'අමුත්‍රාසිං එවන්නාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො -

83. මාණවය, මහණ තෙම මෙසේ සිත සමාහිත කල්හි පිරිසිදු වූ කල්හි ... අවිමුක්ත සිත අවිමුක්ත සිතැ යි දනී යම් යමක් ඇද්ද, මේත් ඔහුගේ ප්‍රඥාවෙක් වෙයි.

84. හෙ තෙමේ මෙසේ සිත සමාහිත කල්හි, පිරිසිදු වූ කල්හි, දීප්ත වූ කල්හි, කෙලෙස් නැති වූ කල්හි, උපක්ලේශ පහ වැ ගිය කල්හි, මෘදු වූ කල්හි, කර්ම්‍යම වූ කල්හි, සථිත කල්හි, නිශ්චල බවට පත් කල්හි, පූර්වේ-නිවාසානුස්මෘති ඥානය (=පෙර වුසූ කඳ පිළිවෙල දක්නා ඥාන) ලබනු පිණිස සිත යොමු කෙරෙයි. හේ එක් ජාතියක් ද ජාති දෙකක් ද ජාති තුනක් ද ජාති සතරක් ද ජාති පසක් ද ජාති දසයක් ද ජාති විස්සක් ද ජාති තිසක් ද ජාති සතළිසක් ද ජාති පනසක් ද ජාති සියක් ද ජාති දහසක් ද ජාති සුවහසක් ද, බොහෝ සංවර්ත කල්ප ද, බොහෝ විවර්ත කල්ප ද, බොහෝ සංවර්ත විවර්ත කල්ප ද, "අසෝ තන්හි මේ නම් ඇතියෙම් වීමි. මේ ගොත් ඇතියෙම් වීමි. මේ බඳු පැහැ ඇතියෙම් වීමි. මේ බඳු ආහාර ඇතියෙම් වීමි. මේ බඳු සුව දුක් විඳින්නෙම් වීමි. මේ බඳු (මෙතෙක්) ආයු කෙළවර කොටැතියෙම් වීමි. ඒ මම එයින් සැවැ අසෝ තැන උපතිමි. එහි ද මේ නම් ඇතියෙම් වීමි. මේ ගොත් ඇතියෙම් වීමි. මේ බඳු පැහැ සටහන් ඇතියෙම් වීමි. මේ බඳු ආහාර ඇතියෙම් වීමි. මේ බඳු සුවදුක් විඳින්නෙම් වීමි. මෙතෙක් ආයු සීමාවක් ඇතියෙම් වීමි. ඒ මම එයින් සැව මෙහි උපතිමි"යි මෙසේ අනෙකවිධ වූ පෙරැ වුසූ කඳපිළිවෙල සිහි කෙරෙයි. මෙසේ වර්ණාදි වශයෙන් ආකාර සහිත වූ නම්ගොත් විසින් උද්දේශ සහිත වූ බහුවිධ වූ පූර්වේනිවාසය සිහි කෙරෙයි.

85. මාණවය, යම්සේ පුරුෂයෙක් සිය ගමින් අන් ගමකට යන්නේ ද, ඒ ගමිනුත් අන් ගමකට යන්නේ ද, (නැවත) හේ එ ගමින් සිය ගමට ම වටාලා එන්නේ ද, එසේ වූ ඔහුට "මම වූ කලි සිය ගමින් අසෝ ගමට ගියෙමි. එහි මෙසේ සිටියෙමි, මෙසේ උන්නෙමි, මෙසේ කීමි, මෙසේ නිහඬ වීමි. ඒ ගමිනුත් අසෝ ගමට ගියෙමි. එහි ද මෙසේ සිටියෙමි, මෙසේ උන්නෙමි, මෙසේ කීමි, මෙසේ නිහඬ වීමි. ඒ මම ඒ ගමින් සිය ගමට ම පෙරළා ආයෙම් වෙමි"යි ඔහුට මේ බඳු සිතෙක් වන්නේ ද – මාණවය, එ පරිද්දෙන් ම මහණ තෙමේ මෙසේ සිත සමාහිත කල්හි, පිරිසිදු කල්හි, දීප්ත කල්හි, කෙලෙස් රහිත කල්හි, උපක්ලේශ පහ වැ ගිය කල්හි, මෘදු වූ කල්හි, කර්ම්‍යම වූ කල්හි, සථිත කල්හි, නිශ්චල බවට පැමිණි කල්හි, පෙරැ වුසූ කඳ පිළිවෙල සිහි කරන ඥාන පිණිස සිත මොනොවට යොමු කෙරෙයි, මොනොවට තැබූරු කෙරෙයි හේ 'අසෝ තන්හි මේ නම් ඇතියෙම් වීමි, මේ බඳු ගොත් ඇතියෙම් වීමි, මේ බඳු පැහැ ඇතියෙම් වීමි, මේ බඳු ආහාර ඇතියෙම් වීමි, මේ බඳු සුවදුක් විඳිනෙම් වීමි, මේ බඳු ආයුෂීමා ඇතියෙම් වීමි, ඒ මම එයින් සැව අසෝ තැන උපතිමි. එහි ද මේ නම් ඇතියෙම්, මේ ගොත් ඇතියෙම්, මේ බඳු පැහැසටහන් ඇතියෙම්, මේ බඳු ආහාර ඇතියෙම්, මේ බඳු සුවදුක් විඳින්නෙම් වීමි, මෙතෙක් ආයු සීමා ඇතියෙම් වීමි. –

සො තතො චුතො අමුත්‍ර උපපාදිං. තත්‍රාපාසිං එවන්නාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදි එවමායුපරියන්තො සො තතො චුතො ඉධූපපන්නො'ති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිධිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

86. යම්පි මාණව භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ -පෙ- අනෙකවිධිතං පුබ්බෙනිවාසං අනුස්සරති, ඉදම්පි'ස්ස හොති පඨමං.

87. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති: 'ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා'ති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති.

88. සෙය්‍යථාපි මාණව මජ්ඣෙ සිංඝාටකෙ පාසාදො. තත්‍ර චක්ඛුමා පුරිසො ඨිතො පස්සෙය්‍ය මනුස්සෙ ගෙහං පවිසන්තො'පි රථියා විතිසඤ්චරන්තො'පි මජ්ඣෙ සිංඝාටකෙ නිසින්නො'පි, තස්ස එවමස්ස: එතෙ මනුස්සා ගෙහං පවිසන්ති. එතෙ නික්ඛමන්ති. එතෙ රථියා විතිසඤ්චරන්ති. එතෙ මජ්ඣෙ සිංඝාටකෙ නිසින්නා'ති.

ඒ මම එයින් සැවැ මෙහි උපතිම'යි මෙසේ එක් ජාතියක් ද, ජාති දෙකක් ද, ජාති තුනක් ද, ජාති සතරක් ද, ජාති පසක් ද, ජාති දසයක් ද, ජාති විස්සක්ද, ජාති තිහක් ද, ජාති සතළිසක් ද, ජාති පනසක් ද, ජාති සියයක් ද, ජාති දහසක් ද, ජාති ශ්‍රවහසක් ද, බොහෝ සංවර්ත කල්ප ද, බොහෝ විවර්ත කල්ප ද, බොහෝ සංවර්ත විවර්ත කල්ප දැයි මෙසේ අනෙකවිධ වූ පෙරැ වුසු කඳ පිළිවෙල සිහි කෙරෙයි. මේ පරිද්දෙන් ආකාර සහිත වූ උද්දේශ සහිත වූ පෙරැ වුසු නොයෙක් වැදැරුම් කඳපිළිවෙල සිහි කෙරෙයි.

86. මාණවය, මහණ තෙම මෙසේ සිත සමාහිත කල්හි ... අනෙකවිධ වූ පෙරැ වුසු කඳපිළිවෙල සිහි කෙරෙයි යන යමෙක් ඇද්ද, මේ ද ඔහුගේ ප්‍රශ්නයෙක් වේයි.

87. හේ මෙසේ සිත සමාහිත කල්හි, පිරිසිදු කල්හි, දීප්ත කල්හි කෙලෙස් නැති කල්හි, උපක්ලේශ පහ වූ කල්හි, මෘදු වූ කල්හි, කර්ම්ක්ෂම වූ කල්හි, සිත කල්හි, තිශවල බවට පැමිණි කල්හි, සත්ත්වයන්ගේ ච්‍යුති උපපත්ති දක්නා නුවණ පිණිස සිත යොමු කෙරෙයි, නැඹුරු කෙරෙයි. හේ පිරිසිදු වූ, මිනිසුන්ගේ දර්ශනෝපචාරය ඉක්මැ දැක්කැ හැකි දිව්‍ය-සින්, 'අහෝ! මේ භවත් සත්ත්වයෝ කායදුශ්චරිතයෙන් සමන්විතයහ, වාක්දුශ්චරිතයෙන් සමන්විතයහ, මනොදුශ්චරිතයෙන් සමන්විතයහ. ආර්‍යෝපවාද කළහ, මිසදිටු වශයෙන් ගත් මිථ්‍යාවූත ඇතියහ. ඒ මොහු කරජ කය බිඳීමෙන්, මරණින් මතු, සැපයෙන් පහ වූ, දුර්චකම් හෙතු-යෙන් හටගත් ගතිය වූ, (කර්ම්යට තමන් පරවශ බැවින්) තමනට අවශ වැ වැටෙන නැත වූ නිරයට වන්නාහ. මේ භවත් සත්ත්වයෝ වූ කලි කායසුචරිතයෙන් සමන්විතයහ, වාක්සුචරිතයෙන් සමන්විතයහ, මනඃ-සුචරිතයෙන් සමන්විතයහ, ආර්‍යයනට උපවාද නො කළහ, සම්දිටු ගත්තාහ, සම්දිටු වශයෙන් ගත් ශීලාදිය ඇත්තාහ. ඒ මොහු කාබුත් මරණින් මතු ශොභන වූ ගති ඇති සගලොවට වන්නාහ යි මරණ-සත්ත වූ ද, එකෙණෙහි පිළිසිඳ ගත්තා වූ ද, ශීත වූ ද, උසස් වූ ද, මනා පැහැ සටහන් ඇති වූ ද, නොමනා පැහැ සටහන් ඇති වූ ද, සුගතියට පැමිණියා වූ ද, දුගතියට පැමිණියා වූ ද, කර්ම්ය වූ පරිදි ඒ ඒ භවයට ගියා වූ ද සත්ත්වයන් දකී. මෙසේ හේ පිරිසිදු වූ මානුෂක විෂය ඉක්මැ පැවැති දිව්‍යයින් හීන ප්‍රණීත, සුවර්ණ දුර්වර්ණ, සුගත දුර්ගත සත්ත්වයන් දකී. කර්ම්ය වූ පරිදි ඒ ඒ භවය කරා එළැඹැ සිටි සත්ත්වයන් දකී.

88. මාණවය, යම්සේ සතර මං හන්දියෙක මහල් සහිත ගෙයෙක් වන්නේ ද, එහි උඩු මහලෙහි ඇස් ඇති පුරුෂයෙක් සිටියේ ගෙට පිවිසෙන-වුහුත් ගෙන් නික්මෙනවුහුත් වීථියෙහි ඇත මැත යන එනවුහුත්, සිවුමංහන්දිය මැද හුන්නවුහුත් දක්නේ ද, ඒ දක්නා ඔහුට "මේ මිනිස්සු ගෙට පිවිසත්, මේ මිනිස්සු ගෙන් නික්මෙත්, මේ මිනිස්සු වීදියෙහි ඇත මැත යෙත්, මොහු සිවුමංහන්දිය මැද උන්නෝ වෙත් යැ" යි මෙසේ සිතෙක් වන්නේ ද-

89. එවමෙව ඛො මාණව භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරි-යොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනීහරති අභිනිත්තානාමෙති. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුස-කෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති: ඉමෙ වත භොනෙතා සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡා-දිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමෙ වා පන භොනෙතා සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා' ති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති.

90. යම්පි මාණව භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ -පෙ- සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති, ඉදම්පි'ස්ස හොති පඤ්ඤාය

91. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනීහරති අභිනිත්තානාමෙති. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති. අයං දුක්ඛසමුදයො'ති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරොධො'ති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති. ඉමෙ ආසවා'ති යථාභූතං පජානාති. අයං ආසව-සමුදයො'ති යථාභූතං පජානාති. අයං ආසවනිරොධො'ති යථාභූතං පජානාති. අයං ආසවනිරොධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති. තස්ස එවං ජානතො එවං පස්සතො කාමාසවාපි චිත්තං විමුච්චති. භවාසවාපි චිත්තං විමුච්චති. අවිජ්ජාසවාපි චිත්තං විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති.

89. මාණවය, එ පරිදි ම එ මහණ තෙමේ මෙසේ සිත සමාහිත කල්හි පරිසිදු කල්හි දීප්තිමත් කල්හි කෙලෙස් නැති කල්හි උපකෙලශ පහ වූ කල්හි මෘදු කල්හි කම්ක්ෂම කල්හි සරිත කල්හි නිශ්චල බවට පැමිණි කල්හි, සත්ත්වයන්ගේ ච්‍යුති උත්පත්ති දක්නා නුවණ ලබනු පිණිස සිත යොමු කෙරෙය, නැඹුරු කෙරෙය. හේ මානුෂක විෂයය ඉක්මි පිරිසිදු වූ දිවැසින් ''අහෝ මේ භවත් සත්හු කායදුශ්චරිතයෙන් සමන්විතයහ, වාග්දුශ්චරිතයෙන් සමන්විතයහ, මනොදුශ්චරිතයෙන් සමන්විතයහ, ආර්‍යයනට උපවාද කළහ, මිසදිටුවහ, මිසදිටු වශයෙන් ගත් ව්‍රත ඇතියහ. ඒ මොහු කා බුන් මරණින් මතු, සැපයෙන් පහ වූ, දුෂට කර්මයෙන් උපන් ගතිය වූ, තමනට තමන් අවශග වැ වැටෙන තැන වූ නිරයට වන්හ. එහෙත් මේ භවත් සත්ත්වයෝ වූ කලි කායසුචරිතයෙන් සමන්විතයහ, වාක්සුචරිතයෙන් සමන්විතයහ, මනඃසුචරිතයෙන් සමන්විතයහ, ආර්‍යයනට උපවාද නො කළහ, සම්දිටු ගත්හ, සම්දිටු විසින් ගත් ශීලාදිය ඇත්හ. මොහු කබුන් මරණින් මතු ශොභන ගති ඇති සග ලොවට වන්නාහ''යි මෙසේ මරණාසන්න වූ ද, එකෙණෙහි පිළිසිඳ ගත්තාවූ ද, පහත්වූ ද, උසස්වූ ද, මනා පැහැ සටහන් ඇති වූ ද, නො මනා පැහැ සටහන් ඇති වූ ද, සුගතියට පැමිණියා වූ ද, දුගතියට පැමිණියා වූ ද, කර්මය වූ පරිදි ඒ ඒ භවයට ගිය සත්ත්වයන් දකී. මෙසේ පිරිසිදු වූ, මානුෂක විෂයය ඉක්මැ පැවැති දිවැසින්, හීන ප්‍රණීත, සුවර්ණ දුර්වර්ණ සුගත දුර්ගත සත්ත්වයන් දකී. කම් වූ පරිදි ඒ ඒ භවය කරා එළැඹැ සිටි සත්ත්වයන් දකී.

90. මාණවය, මහණ තෙම මෙසේ සිත සමාහිත කල්හි පිරිසිදු කල්හි... සුගත දුර්ගත වූ කම් වූ පරිදි ඒ ඒ භවය කරා එළැඹැ සිටි සතුන් දකී යන යමෙක් ඇද්ද, මේ ද ඔහුගේ ප්‍රඥාවෙක් වෙයි.

91. හේ මෙසේ සිත සමාහිත වැ පිරිසිදු වැ දීප්ත වැ නිකෙලෙස් වැ උපකෙලශ පහ වැ මෘදු වැ කම්ක්ෂම වැ සරිත වැ නිශ්චල බවට පැමිණැ සිටි කල්හි, ආස්‍රවයන්ගේ ක්ෂයය (විනාශය) පිණිස සිත මොනොවට යොමු කෙරෙයි. මෙනොවට නැඹුරු ද කෙරෙයි. (එසේ වූ) හෙ තෙමේ 'මේ දුකැ'යි ඇති සැටියෙන් දනී, 'මේ දුක් ඉපැද්මට කාරණයැ'යි ඇති සැටියෙන් දනී. 'මේ දුක් වැනැස්මැ'යි (නිවනැ'යි) ඇති සැටියෙන් දනී. 'මේ දුක් වැනැස්මට යන පිළිවෙතැ'යි ඇති සැටියෙන් දනී. 'මොහු ආස්‍රවයෝ යැ'යි ඇති සැටියෙන් දනී. 'මේ ආස්‍රවයන් ඉපැද්මට කරුණැ'යි ඇති සැටියෙන් දනී. 'මේ ආස්‍රවනිරොධයැ'යි ඇති සැටියෙන් දනී. 'මේ ආස්‍රවනිරොධගාමිනී ප්‍රතිපත්ති යැ'යි ඇති සැටියෙන් දනී. මෙසේ දන්නා මෙසේ දක්නා ඔහුගේ සිත කාමාස්‍රවය කෙරෙන් ද මිදේ. ඔහු සිත භවාස්‍රවය කෙරන් ද මිදේ, (ඔහු) සිත අවිද්‍යාස්‍රවය කෙරන් ද මිදේ. (එසේ සිත) මිදුණු කල්හි 'මා සිත ආස්‍රව කෙරෙන් මිදුණේ යැ'යි (ප්‍රත්‍යවෙක්ෂණ) ඥානය වේ. භවෝත්පත්තිය ක්ෂීණ විය (හෙවත් නැවැත භවයෙහි නොඋපදවනා ස්වභාවයට පැමිණියෙමි), 'මඟ බඹසර වැස නිමැවිණි. (සිවු සස්හි සතර මඟින් කළ යුතු සොළොස් වැදෑරුම්) කිස කොටැ නිමැවිණි. මේ බව පිණිස (මේ කෙලශක්ෂයය පිණිස) යලි දූ කටයුතු දයෙක් නැතැ'යි හේ දනී.

සෙය්‍යථාපි මාණව පබ්බතසඞ්ඛෙපෙ උදකරහදො අච්ඡො විප්පසන්නො අනාවිලො, තත්‍ථ චක්ඛුමා පුරිසො තීරෙ ඨිතො පස්සෙය්‍ය සිප්පිසම්බුකම්පි සක්ඛරකඨලම්පි මච්ඡගුම්බම්පි චරන්තම්පි තිට්ඨන්තම්පි, තස්ස එවමස්ස: අයං ඛො උදකරහදො අච්ඡො විප්පසන්නො අනාවිලො. තත්‍රිමෙ සිප්පිසම්බුකා'පි සක්ඛරකඨලා'පි මච්ඡගුම්බා'පි චරන්ති'පි තිට්ඨන්ති'පීති, එවමෙව ඛො මාණව භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනීහරති අභිනිනාමෙති. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති. අයං දුක්ඛසමුදයො'ති යථාභූතං පජානාති. අයං දුක්ඛ නිරොධො'ති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති. ඉමෙ ආසවා'ති යථාභූතං පජානාති. අයං ආසවසමුදයො'ති යථාභූතං පජානාති. අයං ආසවනිරොධො'ති යථාභූතං පජානාති. අයං ආසවනිරොධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති.

92. තස්ස එවං ජානතො එවං පස්සතො කාමාසවා'පි චිත්තං විමුච්චති. භවාසවා'පි චිත්තං විමුච්චති. අවිජ්ජාසවා'පි චිත්තං විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති. යම්පි මාණව භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ -පෙ- කතං කරණීයං නාපරං ඉත්ථත්තායා'ති පජානාති. ඉදම්පි'ස්ස හොති පඤ්ඤාය.

93. අයං ඛො මාණව සො අරියො පඤ්ඤාක්ඛන්ධො යස්ස සො භගවා වණ්ණවාදී අහොසි, යත්‍ථ ච ඉමං ජනතං සමාදපෙසි නිවෙසෙසි පතිට්ඨාපෙසි. නත්‍ථි චෙවෙත්‍ථ උත්තරිං කරණීයන්ති.

94. අච්ඡරියං භො ආනන්ද, අබ්භුතං භො ආනන්ද, සො චායං භො ආනන්ද අරියො පඤ්ඤාක්ඛන්ධො පරිපුණ්ණො. එවංපරිපුණ්ණඤ්චාහං භො ආනන්ද අරියං පඤ්ඤාක්ඛන්ධං ඉතො බහිද්ධා අඤ්ඤස්සු සමණබ්‍රාහ්මණෙසු න සමනුපස්සාමි. නත්‍ථි චෙත්‍ථ උත්තරිං කරණීයන්ති. අභික්කන්තං භො ආනන්ද, අභික්කන්තං භො ආනන්ද, සෙය්‍යථාපි භො ආනන්ද, නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති, එවමෙ ඛො භොතා ආනන්දෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භො ආනන්ද, භගවන්තං ගොතමං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භවං ආනන්දො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

සුභසුත්තං නිට්ඨිතං දසමං.

මාණවය, යම්සේ කඳු මුදුනෙකැ වූ, පහත් වූ, වෙසෙසින් පහත් වූ, නොකැලඹුණු (-බොර නො වූ) දිය විලෙක්වන්නේ ද, එහි ඉවුරෙහි ඇස් ඇති මිනිසෙක් සිටියේ, එහි තුළැ හැසිරෙන්නා වූත් සිටුනා වූත් සිප්පිබෙල්ලනුත් සක්බෙල්ලනුත් කැටකැබිලිතිත් මත්ස්‍යසමූහයාත් දක්නේ ද, (එසේ දක්නා) ඔහුට "මේ දියවිල පහත් ය, වෙසෙසින් පහත් ය, නො කැලඹුණේ ය. මෙහි මේ සිප්පිහුත් සක්බෙල්ලෝත් කැට කැබිලිතිත් මත්ස්‍යසමූහයෝත් හැසිරෙන්නෝත් සිටින්නෝත් වෙති"යි මෙසේ සිතෙක් වන්නේ ද, මාණවය, එපරිද්දෙන් ම මහණ තෙමේ මෙසේ සිත සමාහිත වැ පිරිසිදු වැ දීප්තිමත් වැ නිකෙලෙස් වැ උපකෙලශ පහ වැ මෘදු වැ කම්‍ය වැ සථිත වැ නිශ්චලතාවට පැමිණි කල්හි, ආස්‍රවක්ෂයඥානය පිණිස සිත යොමු කෙරෙයි. නැඹුරු කෙරෙයි. හේ 'මේ දුකැ'යි ඇති සැටියෙන් දනී, 'මේ දුකට කරුණැ'යි ඇති සැටියෙන් දනී. 'මේ දුක් වැනැස්මැ'යි ඇති සැටියෙන් දනී. 'මේ දුක් වැනැස්මට යන පිළිවෙතැයි'යි ඇති සැටියෙන් දනී. 'මොහු ආස්‍රවයහ'යි ඇති සැටියෙන් දනී. මේ ආස්‍රවසමුදය යැ (ආස්‍රව ඉපැද්මට කරුණැ)'යි ඇති සැටියෙන් දනී. 'මේ ආස්‍රවනිරොධයැ'යි ඇති සැටියෙන් දනී. 'මේ ආස්‍රවනිරොධයට පැමිණෙන පිළිවෙතැ'යි ඇති සැටියෙන් දනී.

92. මෙසේ දන්නා මෙසේ දක්නා ඔහුගේ සිත කාමාස්‍රවය කෙරෙන් ද මිදේ, භවාස්‍රවය කෙරෙන් ද මිදේ, අවිද්‍යාවස්‍රව්‍ය කෙරෙන් ද මිදේ. මිදුණු කල්හි 'මිදුණේ යැ'යි දනීම වේ. "භවොත්පත්තිය ක්ෂීණ විය. මාර්ගබ්‍රහ්මචර්‍යය වැස නිමවන ලද්දේ ය, (සිවු සස්හි සිවු මගින්) කළයුතු (සොළොස් වැදැරුම්) කෘත්‍යය කොටැ නිමැවිණ. මෙ රහත්බව පිණිස (-මේ කෙලශක්ෂයය පිණිස) කළ යුතු අන් කිසිත් නැතැ'යි හේ දනී. මාණවය, මහණ තෙම මෙසේ සිත සමාධිගත කල්හි ශුද්ධ වූ කල්හි... කළ යුතු දෑ කොට නිමැවිණ. මෙය පිණිස තවත් කටයුතු දෑයෙක් නැතැ යි දනී යන යමෙක් ඇද්ද, මෙය ද ඔහුගේ ප්‍රඥාවෙක් වෙයි.

93. මාණවය, ඒ භාග්‍යවතුන් වහන්සේ යමෙක ගුණ වදාරන සුලු වූ සේක් වූහු නම්, යමෙක මේ ජනතාව මොනොවට ගැන් වූ සේක් පිවිස්වූ සේක් වූහු නම්, මේ ඒ ප්‍රඥාස්කන්ධය යි. මෙහි ලා මෙයින් මත්තෙහි කටයුත්තෙක් නැත."

94. [ශුභ] "භවත් අනඳ තෙරුනි, ධර්ම දෙශනාව අභිකාන්ත ය. භවත් අනඳ තෙරුනි, ධර්ම දෙශනාව අභිකාන්ත ය. භවත් අනඳතෙරුනි, යම්සේ යැටිකුරු කොට තැබූ (මුහුණින් නැමූ) බඳුනක් උඩුකුරු කරන්නේ හෝ වේ ද, වැසුණු දෑයක් වැසුම් හැර දක්වන්නේ හෝ වේ ද, මං මුළා වූවකුට මඟ කියන්නේ හෝ වේ ද, 'ඇස් ඇතියන් රූප දකිතැ'යි අඳුරෙහි තෙල් පහනක් දල්වන්නේ හෝ වේ ද, වහන්ස, එපරිද්දෙන් ම භවත් අනඳ තෙරුන් විසින් මට නොයෙක් අයුරින් ධර්මය පවැසිණ. භවත් අනඳ තෙරුනි, ඒ මම් භාග්‍යවත් ගෞතමයන් වහන්සේ ද ධර්මය ද භික්ෂුසංඝයා ද සරණ යෙමි. අද පටන් දිවිහිමි කොට සරණ ගිය උවසක් හු කොට භවත් අනඳ තෙරණුවෝ මා සලකත් වා."

දසවනු ශුභසූත්‍රය නිමියේ ය.

11
කෙවඩ්ඩ සූත්‍රයං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා නාළන්දායං විහරති පාවාරිකම්බවනෙ. අථ ඛො කෙවඩ්ඩො ගහපතිපුත්තො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො කෙවඩ්ඩො ගහපතිපුත්තො භගවන්තං එතදවොච: 'අයං භන්තෙ නාළන්දා ඉද්ධා චෙව ඵීතා ච, බහුජන ආකිණ්ණමනුස්සා, භගවති අභිප්පසන්නා. සාධු භන්තෙ භගවා එකං භික්ඛුං සමාදිසතු යො උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං කරිස්සති. එවායං නාළන්දා භියොසොමත්තාය භගවති අභිප්පසීදිස්සතී'ති.

2. එවං වුත්තෙ භගවා කෙවඩ්ඩං ගහපතිපුත්තං එතදවොච: න ඛො අහං කෙවඩ්ඩ භික්ඛූනං එවං ධම්මං දෙසෙමි 'එථ තුම්හෙ භික්ඛවෙ ගිහීනං ඔදාතවසනානං උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං කරොථා'ති.

3. දුතියම්පි ඛො කෙවඩ්ඩො ගහපතිපුත්තො භගවන්තං එතදවොච: නාහං භන්තෙ භගවන්තං ධංසෙමි. අපි ච එවං වදාමි: 'අයං භන්තෙ නාළන්දා ඉද්ධා චෙව ඵීතා ච, බහුජනා ආකිණ්ණමනුස්සා, භගවති අභිප්පසන්නා. සාධු භන්තෙ භගවා එකං භික්ඛුං සමාදිසතු යො උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං කරිස්සති. එවායං නාළන්දා භියොසොමත්තාය භගවති අභිප්පසීදිස්සතී'ති. දුතියම්පි ඛො භගවා කෙවඩ්ඩං ගහපතිපුත්තං එතදවොච: න ඛො අහං කෙවඩ්ඩ භික්ඛූනං එවං ධම්මං දෙසෙමි 'එථ තුම්හෙ භික්ඛවෙ ගිහීනං ඔදාතවසනානං උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං කරොථා'ති.

4. තතියම්පි ඛො කෙවඩ්ඩො ගහපතිපුත්තො භගවන්තං එතදවොච: නාහං භන්තෙ භගවන්තං ධංසෙමි. අපි ච එවං වදාමි: 'අයං භන්තෙ නාළන්දා ඉද්ධා චෙව ඵීතා ච, බහුජනා ආකිණ්ණමනුස්සා, භගවති අභිප්පසන්නා, සාධු භන්තෙ භගවා එකං භික්ඛුං සමාදිසතු යො උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං කරිස්සති. එවායං නාළන්දා භියොසොමත්තාය භගවති අභිප්පසීදිස්සතී'ති.

---

1. කෙවට්ටො සීමු.

11
කෙවඩ්ඩ සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදි: එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ නාලන්දා නුවරට නොදුරු නොළං තන්හි වූ පාවාරික අඹවෙනෙහි වැඩ වසන සේක. එ කල්හි කෙවඩ්ඩ නම් ගෘහපතිපුත් භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සාදර ව වැඳ පසෙක හුන්නේ ය. පසෙක හුන්නා වූ ම කෙවඩ්ඩ ගෘහපතිපුත් තෙම "වහන්ස, මේ නාලන්දා නගරිය සමෘද්ධ ය, ස්ඵීත ය (නන් වැදෑරුම් භාණ්ඩයෙන් පිරුණේ ය), බොහෝ ජනයා ඇත්තේ ය, ගැවැසුණු මිනිසුන් ඇත්තේ ය, භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි වෙසෙසින් පැහැදුණේ ය. වහන්ස, යාචඤ්ඤා කරම්, යමෙක් උතුරුමිනිස්දහමින් ඉදුපෙළහර කරන්නේ නම්, එසේ වූ එක් මහණකුට භාග්‍යවතුන් වහන්සේ අණ කරන සේක් වා. මෙසේ මේ නාලන්දාව වඩාලාත් භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පහදින්නේ යැ"යි භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය.

2. මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ කෙවඩ්ඩ ගෘහපතිපුතු බණවා, "කෙවඩ්ඩය, 'මහනෙනි, තෙපි (මෙසේ) එවූ. සුදුවත් හඳින ගිහිනට උතුරුමිනිස්දහමින් පෙළහර කරවූ' යැ යි මහණුනට මෙසේ දහම් නො දෙසම්'යි වදාළ සේක.

3. දෙවෙනි වර ද කෙවඩ්ඩ ගෘහපතිපුත් තෙම "වහන්ස, මේ නාලන්දා න්ගරිය සමෘධ ය, ස්ඵීත ය. බොහෝ ජනයා ඇත්තේ ය. මිනිසුන්ගේ ගැවැසුණේ ය. භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි වෙසෙසින් පැහැදුණේ ය. වහන්ස, යාචඤ්ඤා කරම්, යමෙක් උතුරු මිනිස් දහමින් ඉදුපෙළහර කරන්නේ නම්, එසේ වූ එක් මහණකුට භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පහදින්නේ යැ යි භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය. දෙවෙනි වර ද භාග්‍යවතුන් වහන්සේ කෙවඩ්ඩ ගෘහපතිපුතුට, "කෙවඩ්ඩය, 'මහණෙනි, තෙපි (මෙසේ) එවූ. සුදුවත් හඳනා ගිහිනට උතුරුමිනිස් දහමින් පෙළහර කරවූ'යි මහණුනට මෙසේ දහම් නො දෙනම්"යි වදාළ සේක.

4. තෙවෙනි වර ද කෙවඩ්ඩ ගෘහපතිපුත්, වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේ (ගුණ නසා) පහත හෙළනුයෙම් නො වෙමි. වැලි දූ මේ නාලන්දා නුවර සමෘද්ධ ය, ස්ඵීත ය. බොහෝ ජනයා ඇත්තේ ය. මිනිසුන්ගේ ගැවැසුණේ ය. භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි වෙසෙසින් පැහැදුණේ ය. වහන්ස, යාචඤ්ඤා කරම්, යමෙක් උතුරුමිනිස්දහමින් ඉදුපෙළහර කරන්නේ නම්, එසේ වූ එක් මහණකුට භාග්‍යවතුන් වහන්සේ අණ කරන සේක් වා. මෙසේ මේ නාලන්දාව වඩාලාත් භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පහදින්නේ යැ යි සිතා ම මෙසේ කියමි"යි මේ වචන කී ය.

5. තීණි ඛො ඉමානි කෙවට්ට පාටිහාරියානි මයා සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදිතානි. කතමානි තීණි ? ඉද්ධිපාටිහාරියං ආදෙසනාපාටිහාරියං. අනුසාසනීපාටිහාරියන්ති. කතමඤ්ච කෙවට්ට ඉද්ධිපාටිහාරියං? ඉධ කෙවට්ට භික්ඛු අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති: එකො'පි හුත්වා බහුධා හොති. බහුධා පි හුත්වා එකො හොති. ආවිභාවං තිරොභාවං, තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡති සෙය්‍යථාපි ආකාසෙ. පඨවියාපි උම්මුජ්ජනිමුජ්ජං කරොති සෙය්‍යථාපි උදකෙ. උදෙක'පි අභිජ්ජමානෙ ගච්ඡති සෙය්‍යථාපි පඨවියං. ආකාසෙ'පි පල්ලඞ්කෙන කමති සෙය්‍යථාපි පක්ඛී සකුණො. ඉමෙ'පි චන්දිමසූරියෙ එවංමහිද්ධිකෙ එවංමහානුභාවෙ පාණිනා පරිමසති පරිමජ්ජති. යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති.

6. තමෙනං අඤ්ඤතරො සද්ධො පසන්නො පස්සති තං භික්ඛුං අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොන්තං: එකම්පි හුත්වා බහුධා හොන්තං, බහුධාපි හුත්වා එකං හොන්තං, ආවිභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමාන ගච්ඡන්තං සෙය්‍යථාපි ආකාසෙ, පඨවියාපි උම්මුජ්ජනිමුජ්ජං කරොන්තං සෙය්‍යථාපි උදකෙ, උදකෙ'පි අභිජ්ජමානෙ ගච්ඡන්තං සෙය්‍යථාපි පඨවියං, ආකාසෙ'පි පල්ලඞ්කෙන කමන්තං සෙය්‍යථාපි පක්ඛීසකුණො, ඉමෙ'පි චන්දිමසූරියෙ එවංමහිද්ධිකෙ එවංමහානුභාවෙ පාණිනා පරිමසන්තං පරිමජ්ජන්තං, යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙන්තන්තං.

7. තමෙනං සො සද්ධො පසන්නො අඤ්ඤතරස්ස අස්සද්ධස්ස අප්පසන්නස්ස අරොචෙති: අච්ඡරියං වත භො අබ්භුතං වත භො සමණස්ස මහිද්ධිකතා මහානුභාවතා. අමාහං භික්ඛුං අද්දසං අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොන්තං: එකම්පි හුත්වා බහුධා හොන්තං, බහුධාපි හුත්වා එකම්පි හොන්තං -පෙ- යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙන්තන්තන්ති. තමෙනං සො අස්සද්ධො අප්පසන්නො තං සද්ධං පසන්නං එවං වදෙය්‍ය: අත්ථි ඛො භො ගන්ධාරී නාම විජ්ජා. තාය සො භික්ඛු අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති: එකො'පි හුත්වා බහුධා හොති -පෙ- යාව බ්‍රහ්මලොකා'පි කායෙන වසං වත්තෙතීති. තං කිංමඤ්ඤසි කෙවට්ට? අපි නු සො අස්සද්ධො අප්පසන්නො තං සද්ධං පසන්නං එවං වදෙය්‍යා?''ති. ''වදෙය්‍ය භන්තෙ''ති. ''ඉමං ඛො අහං කෙවට්ට ඉද්ධිපාටිහාරියෙ ආදීනවං සම්පස්සමානො ඉද්ධිපාටිහාරියෙන අට්ටියාමි හරායාමි ජිගුච්ඡාමි.

---

1. එකො'පි (සීමු. PTS)

5. (එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක:) ''කෙවට්ටය, මා විසින් ම වෙසෙසින් දැන පසක් කොට දෙසන ලද මේ පාතිහාර්‍ය තුනෙකි. කවර තුනෙක් ද? යත්: ඍද්ධිප්‍රාතිහාර්‍යය, ආදේශනාප්‍රාතිහාර්‍යය, අනුශාසනප්‍රතිහාර්‍යය යන තුන ය. කෙවට්ටය, ඍද්ධිප්‍රාතිහාර්‍යය කවර යැ? කෙවට්ටය, මෙහි මහණ පියෙවියෙන් එකෙක් වැ ම සිටැ බොහෝ පරිදි වෙයි. එසේ බොහෝ වැ සිටැ යලි දැ එකෙක් වෙයි. පැනෙන බවට යෙයි. නොපැනෙන බවට ද යෙයි. බිත්තියෙන් පිටතට ද පවුරෙන් පිටතට ද පව්වෙන් පිටතට ද අහසෙහි මෙන් නොගැටෙනුයේ විනිවිද යෙයි. පොළොවෙහි ද දියෙහි මෙන් ගිලීම මතු වීම කෙරෙයි. පොළොවෙහි සේ නොබිඳෙන දියෙහි (දිය නොබිඳැ) යෙයි. අහසෙහි ද පියාපත් ඇති ලිහිණියකු මෙන් පලඟින් යෙයි. මේසා මහ ඉදුමත් මේසා මහ තෙදවත් සඳ හිරු දෙදෙනාපවා අත්ලෙන් සපඹ කෙරෙයි, පිරිමදයි. බඹලොව දක්වා ද කයින් වශය පවත්වයි. නොයෙක් වැදෑරුම් ඍද්ධිවිධ පසක් කෙරෙයි.

6. සැදැහැති පැහැදුණු එක්තරා පුරුෂයෙක්, පියෙවියෙන් එකකු ව සිට බොහෝ පරිදි වන, බොහෝ පරිදි වැ යලි දැ එකකු වන, පැනෙන බවට නොපැනෙන බවට යන, අහසෙහි මෙන් බිත්තියෙන්පිටතට ද පවුරෙන් පිටතට ද නොගැටෙමින් විනිවිද යන, පොළොවෙහි ද දියෙහි මෙන්ගිලීම මතු වීම කරන, පොළොවෙහි සේ නොබිඳෙන දියෙහි යන, අහසෙහි ද පියාපත් ඇති ලිහිණියකු මෙන් පලඟින් යන, මේසා මහ ඉදුමත් මේසා මහතෙදැති සඳහිරු දෙදෙනා අත ගාන, පිරිමදින, බඹලොව දක්වා ද කයින් වශය පවත්වන, මෙසේ නොයෙක් වැදෑරුම් ඉදුකොටස් පසක් කරන එ මහණහු දකී.

7. ඒ සැදැහැති පහන් පුරුෂයා සැදැහැ නැති නොපහන් පුරුෂයකුට 'භවත, මේ මහණහුගේ මහඉදුමත්බව මහතෙදවත්බව අසිරිමත් ය, පුදුම ය. පියෙවියෙන් එකකු වැ සිට බොහෝ පරිදි වැ යලි එකකු වන... බඹලොව දක්වාත් කයින් වශය පවත්වන, මෙසේ නොයෙක් වැදෑරුම් ඍද්ධිවිධ පසක් කරන අසෝ මහණහු මම දිටිමි'යි කියයි. එ විට ඒ සැදැහැ ඇති පහන් පුඟුලාට ඒ සැදැහැ නැති නොපහන් පුඟුල් තෙම ''භවත, ගාන්ධාරී නම් විද්‍යාවෙක් ඇත. ඒ මහණ ඒ විද්‍යයෙන් එකෙක් වැ සිට බොහෝ පරිදි වෙයි... බඹලොව තෙක් ද කයින් වශය පවත්වයි යන මෙසේ වූ නොයෙක් වැදෑරුම් ඍද්ධිවිධය පසක් කෙරේ යැ''යි කියන්නේ ය. කෙවට්ටය, ඒ කිමැ යි සිතහි ද? ඒ සැදැහැ නැති නොපහන් තැනැත්තේ ඒ සැදැහැ ඇති පහන් තැනැත්තහුට මෙසේ කියන්නේ ද?'' ''එසේ කියන්නේ ය වහන්සැ'' කෙවට්ට කී ය. ''කෙවට්ටය, මම ඉදුපෙළහරෙහි මේ දොස දක්නෙම් ඉදුපෙළහරින් පෙළුණකු බඳු වෙමි, ලජ්ජිත වෙමි, එයට පිළිකුල් කෙරෙමි.

8. කතමඤ්ච කෙවට්ටි ආදෙසනාපාටිහාරියං? ඉධ කෙවට්ටි භික්ඛු පරසත්තානං පරපුග්ගලානං චිත්තමපි ආදිසති චෙතසිකමපි ආදිසති විතක්කිතමපි ආදිසති විචාරිතමපි ආදිසතිඃ එවම්පි තෙ මනො, ඉත්ථම්පි තෙ මනො, ඉතිපි තෙ චිත්තන්ති. තමෙනං අඤ්ඤතරො සද්ධො පසන්නො පස්සති තං භික්ඛුං පරසත්තානං පරපුග්ගලානං චිත්තමපි ආදිසන්තං චෙතසිකම්පි ආදිසන්තං විතක්කිතම්පි ආදිසන්තං විචාරිතම්පි ආදිසන්තඃ එවම්පි තෙ මනො, ඉත්ථම්පි තෙ මනො, ඉති'පි තෙ චිත්තන්ති. තමෙනං සො සද්ධො පසන්නො අඤ්ඤතරස්ස අස්සද්ධස්ස අප්පසන්නස්ස අරොචෙතිඃ අච්ඡරියං වත භො අබ්භුතං වත භො සමණස්ස මහිද්ධිකතා මහානුභාවතා. අමාහං භික්ඛුං අඤ්ඤං පරසත්තානං පරපුග්ගලානං චිත්තමපි ආදිසන්තං චෙතසිකම්පි ආදිසන්තං විතක්කිතම්පි ආදිසන්තං විචාරිතම්පි ආදිසන්තඃ එවම්පි තෙ මනො, ඉත්ථම්පි තෙ මනො, ඉති'පි තෙ චිත්තන්ති. තමෙනං සො අස්සද්ධො අප්පසන්නො තං සද්ධං පසන්නං එවං වදෙය්‍යඃ අත්ථි බො භො මණිකා නාම විජ්ජා. තාය සො භික්ඛු පරසත්තානං පරපුග්ගලානං චිත්තමපි ආදිසති, චෙතසිකම්පි ආදිසති, විතක්කිතම්පි ආදිසති, විචාරිතම්පි ආදිසතිඃ එවම්පි තෙ මනො, ඉත්ථම්පි තෙ මනො, ඉතිපි තෙ චිත්තන්ති. තං කිං මඤ්ඤසි කෙවට්ටි? අපි නු සො අස්සද්ධො අප්පසන්නො සං තං සද්ධං පසන්නං එවං වදෙය්‍යා?''ති. ''වදෙය්‍ය භන්තෙ''ති. ඉමං බො අහං කෙවට්ටි ආදෙසනා පාටිහාරියෙ ආදීනවං සම්පස්සමානො ආදෙසනාපාටිහාරියෙන අට්ටියාමි හරායාමි ජිගුච්ඡාමි.

9. කතමඤ්ච කෙවට්ටි අනුසාසනීපාටිහාරියං? ඉධ කෙදවට්ටි භික්ඛු එවමනුසාසතිඃ එවං විතක්කෙථ, මා එවං විතක්කයිත්ථ, එවං මනසිකරොථ, මා එවං මනසාකත්ථ, ඉදං පජහථ, ඉදං උපසම්පජ්ජ විහරථාති. ඉදම්පි වුච්චති කෙවට්ටි අනුසාසනීපාටිහාරියං.

10. පුන ච පරං කෙවට්ටි ඉධ තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා. සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති.

8. 'කෙවට්ටය, ආදේශනාප්‍රාතිහාර්‍යය කවර යැ? කෙවට්ටය, මෙහි මහණ තෙම 'තා මනස මෙසේත් වෙයි, මෙබඳුත් වෙයි. තාගේ සිතිමත් මෙ බඳු වේ'යැ යි අන් සතුන්ගේ අන් පුඟුලන්ගේ සිත ද හෙළි කොට කියයි. චෛතසික (සිතැ සොම්නස හෝ දොම්නස) ද හෙළි කොට කියයි. (නෙකඛම්ම විතක්කාදි) කල්පනා කළ දෑ ද, (සිත මෙ නම් අරමුණෙහි හැසිරේ යැ යි) සිත හැසිරෙන අරමුණ ද හෙළි කොට කියයි. 'තා මනස මෙසේත් වෙයි. තා මනස මෙබඳුත් වෙයි. තගේ සිතත් මෙබඳු වේ'යැ යි මෙසේ අන් සතුන්ගේ අන් පුඟුලන්ගේ සිත ද හෙළි කොට කියන, චෛතසිකය ද හෙළි කොට කියන, සිත හැසිරීම ද හෙළි කොට කියන, ඒ මහණහු සැදැහැති පැහැදුණු එක්තරා පුඟුලෙක් දකී. ඒ සැදැහැති පැහැදුණු පුඟුල් තෙම එක්තරා සැදැහැ නැති නොපහන් පුඟුලකුට 'පින්වත, මහණ වහන්දෑගේ මහඉදුමත්බව මහතෙදැතිබව එකාන්තයෙන් අසිරිමත් ය. එකාන්තයෙන් පුදුම ය. 'තා මනස මෙසේත් වෙයි, තා මනස මෙබඳුත් වෙයි. තා සිත මෙබඳුත් වේ යැ'යි මෙසේ අසෝ මහණහු අන් සතුන් අන් පුඟුලන් සිත ද හෙළි කොට කියන්නහු, චෛතසිකය ද හෙළි කොට කියන්නහු, කල්පනාව ද හෙළි කොට කියන්නහු, සිතැ හැසිරීම ද හෙළි කොට කියන්නහු දිටිමි, යි සැළ කෙරෙයි. ඒ සැදැහැති පැහැදුණු පුඟුලාට ඒ සැදැහැ නැති නො පැහැදුණු පුඟුල් තෙම 'භවත, මණිකා (චින්තාමණි) නම් විද්‍යාවෙක් ඇත් ම ය. ඒ මහණ 'තා මනස මෙසේත් වෙයි, තා මනස මෙබඳුත් වෙයි. තා සිත මෙබඳුත් වේ' යැ යි මෙසේ ඒ විද්‍යායෙන් අන් සතුන්ගේ අන් පුඟුලන්ගේ සිත කියයි, චෛතසිකය ද කියයි, විතර්කය ද කියයි, විත්තවිචාරිතය ද කියා යැ යි මෙසේ කියන්නේ ය. ඒ කිමැ යි සිතහි ද? ඒ සැදැහැ නැති නොපැහැදුණු තැනැත්තේ ඒ සැදැහැති පහන් තැනැත්තහුට මෙසේ කියන්නේ ද?'' ''කියන්නේ ය, වහන්සැ''යි (කෙවට්ට කී ය.) 'කෙවට්ටය, මම් ආදේශනාප්‍රාතිහාර්‍යයාගේ මේ දොස දක්නෙම්, ආදේශනාප්‍රාතිහාර්‍යයෙන් පෙළුණකු බඳු වෙම්, ලජ්ජිත වෙම්, එයට පිළිකුල් කරමි.

9. කෙවට්ටය, අනුශාසනප්‍රාතිහාර්‍යය කවර යැ? කෙවට්ටය, මෙ සස්නැ මහණ තෙම 'මෙසේ කල්පනා කරවු, මෙසේ මෙනෙහි කරවු, මෙසේ නො මෙනෙහි කරවු, මෙය පහ කරවු, මෙය ලැබ වසවු'යි මෙසේ අනුශාසන කරයි. කෙවට්ටය, මේ අනුශාසනප්‍රතිහාර්‍යය යැ යි කියනු ලැබේ.

10. කෙවට්ටය, තව ද අනෙකක් කියමි. මෙහි අර්හත් වූ සම්‍යක් සම්බුද්ධ වූ විද්‍යාචරණසම්පන්න වූ සුගත වූ ලොකවිත් වූ නිරුත්තර පුරුෂදම්‍යසාරථි වූ දෙවිමිනිස්නට ශාස්තෘ වූ බුද්ධ වූ භගවත් වූ තථාගත තෙමේ ලොවැ පහළ වෙයි. හේ දෙවියන් සහිත වූ මරුන් සහිත වූ මේ ලොකය ද, මහණබමුණන් සහිත, සම්මත දෙවියන් (රජුන්) හා සෙසු මිනිසුන් හා සහිත සත්ත්වප්‍රජාව ද තෙමේ විශිෂ්ට නුවණින් දැන, ප්‍රත්‍යක්ෂ කොට, ඔවුනට අවබොධ කරවයි. හේ දහම් දෙසනුයේ ආදියෙහි භද්‍රක (නිවරද) කොට, මධ්‍යයෙහි භද්‍රක කොට, අර්ථ සහිත කොට, ව්‍යංජන සහිත කොට, සර්ව්‍රකාරයෙන් පරිපූර්ණ කොට, දහම් දෙසයි. (එසේ දෙසනුයේ ශික්ෂාත්‍රයයෙන් සංගෘහිත වූ) ශාසනබ්‍රහ්මචර්‍යය ප්‍රකාශ කෙරෙයි.

11. තං ධම්මං සුණාති ගහපති වා ගහපතිපුත්තො වා අඤ්ඤතරස්මිං වා කුලෙ පච්චාජාතො. සො තං ධම්මං සුත්වා තථාගතෙ සද්ධං පටිලභති. සො තෙන සද්ධාපටිලාභෙන සමන්නාගතො ඉති පටිසංචික්ඛති: 'සම්බාධො ඝරාවාසො රජාපථො.[1] අබ්භොකාසො පබ්බජ්ජා. නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්තපරිසුද්ධං සඞ්ඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං. යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය'න්ති. සො අපරෙන සමයෙන අප්පං වා භොගක්ඛන්ධං පහාය මහන්තං වා භොගක්ඛන්ධං පහාය අප්පං වා ඤාතිපරිවට්ටං පහයා මහන්තං වා ඤාතිපරිවට්ටං පහාය කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජති, සො එවං පබ්බජිතො සමානො පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො, අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී, සමාදාය සික්ඛති සික්ඛාපදෙසු කායකම්මෙන සමන්නාගතො කුසලෙන, පරිසුද්ධාජීවො සීලසම්පන්නො ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො භොජනෙ මත්තඤ්ඤූ සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො සන්තුට්ඨො.

12. කථඤ්ච කෙවට්ට භික්ඛු සීලසම්පන්නො හොති? ඉධ කෙවට්ට භික්ඛු පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො. සබ්බපාණභූතහිතානුකම්පී විහරති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං. අදින්නාදානං පහාය අදින්නාදාන පටිවිරතො හොති දින්නාදායී දින්නපාටිකඞ්ඛී අථෙනෙන සුචිභූතෙන අත්තනා විහරති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං. අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී හොති ආරාචාරී[2] විරතො මෙථුනා ගාමධම්මා. ඉදම්පි'ස්ස හොති සීලස්මිං. මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො හොති සච්චවාදී සච්චසන්ධො ථෙතො[3] පච්චයිකො අවිසංවාදකො ලොකස්ස. ඉදම්පි'ස්ස හොති සීලස්මිං. පිසුණං වාචං[4] පහාය පිසුණාය වාචාය පටිවිරතො හොති: ඉතො සුත්වා න අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය. අමුත්‍ර වා සුත්වා න ඉමෙසං අක්ඛාතා අමුසං භෙදාය. ඉති භින්නානං වා සන්ධාතා, සංහිතානං වා අනුප්පදාතා[5] සමග්ගරාමො[6] සමග්ගරතො සමග්ගනන්දී සමග්ගකරණිං වාචං භාසිතා හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං. ඵරුසං වාචං[7] පහාය ඵරුසාය වාචාය පටිවිරතො හොති.

---

1. රජොපථො, කත්ථචි. 2. අත්තාචාරි, මජ්ඣං 3. ථෙතො, සත්‍ය.
4. පිසුණාවාචං, PTS 5. අපපදාතා, PTS 6. සමග්ගාරාමො, මජ්ඣං
7. ඵරුසාවාචං, PTS

11. ගෘහපතියෙක් හෝ ගෘහපිපුතෙක් හෝ අන් එක්තරා කුලයෙක උපන්නෙක් හෝ ඒ ධර්මය අසයි. හේ ඒ දහම් අසා තථාගත බුදුරජුහු කෙරෙහි සැදැහැ ඇති කෙරෙයි. හේ ඒ ශ්‍රද්ධාලාභයෙන් සමන්විත වූයේ, 'ගිහිගෙයි විසීම සම්බාධයෙකි, රජස්පථයෙකි. පැවිද්ද (සම්බාධ නැති) අභ්‍යවකාශය (එළි මහන) වැන්න. ගිහිගෙයි වසන්නහු විසින් ඒකාන්තයෙන් පිරිසිදු කොට, ශඛලිඛිතයක් සේ කොටමේ බඹසර සරන්නට පහසු නොවේ. (එබැවින්) මම කෙහෙරවුලු බහවා, කසාවත් හැඳ පෙරෙවූ, ගිහිගෙන් පැවිදිබිමට වදනෙම් නම් යෙහෙකැ'යි මෙසේ නුවණින් සලකයි. හේ පසු කලෙක අල්ප වූ හෝ සම්පත් රැස හැරැ, මහත් වූ හෝ සම්පත් රැස හැරැ, මඳ වූ හෝ නෑපිරිස හැරැ, මහත් වූ හො නෑපිරිස හැර, කෙහෙරවුලු බහවා, කසාවත් හැඳ පෙරෙවූ, ගිහිගෙන් පැවිදිබිමට වදී. හේ මෙසේ පැවිදි වූයේ ම පාතිමොක්ඛසංවරයෙන් සමන්විත වූයේ, ආචාරයෙන් හා ගොචරයෙන් හා යුක්ත වූයේ. සවල්පමාත්‍ර වූ ද වරදෙහි බිය දක්නේ, නිවරද වූ කායවාක්කර්මයේ සමන්විත වූයේ, එහෙයින් ම පිරිසිදු ආජීව ඇතියේ. සිල්වත් වූයේ, ඉන්ද්‍රියයන්හි වැසූ දොර ඇතියේ, බොජුන් හි පමණ දන්නේ, (සත් තන්හි) සිහියෙන් හා නුවණින් හා යුක්ත වූයේ, සිවුපසයෙහි තුන්වැදෑරුම් සතුටින් සතුටු වූයේ, ශික්ෂාපදයන්හි සමාදන් වැ ගෙන හික්මෙයි.

12. මහණ තෙමේ කෙසේ නම් සිල්වත් වේ ද? යත්: කෙවට්ටය, මෙහි මහණ තෙමේ ප්‍රාණඝාතය හැරැ දමා, ප්‍රාණඝාතයෙන් වෙසෙසින් වැළැක්කේ වෙයි. බහා තැබූ දඬුමුගුරු ඇත්තේ (දඬුමුගුරු නො දරන්නේ), බහා තැබූ ආයුධ ඇත්තේ (ආයුධ නො දරන්නේ), පවට පිළිකුල් කරන්නේ, මෛත්‍රියට පැමිණියේ (මෛත්‍රියෙන් යුක්ත වූයේ), සියලු සතුන් කෙරෙහි හිතානුකම්පා ඇති වැ වෙසේ. මේ ද ඔහුගේ එක් ශීලයෙක් වේ. හේ අදත්තාදානය හැරැ ලා, නොදුන් දෑ ගැන්මෙන් වැළැක්කේ වෙයි. දුන් දය ම පිළිගන්නාසුලු වූයේ, දුන් දය ම කැමැති වැ ඉවසනසුලු වූයේ, නොසොර වූ පිරිසිදු සිතින් යුතු වැ වෙසේ. මේ ද ඔහුගේ ශීලයෙක් වේ. හේ අබ්‍රහ්මචර්යය දුරැ ලා බඹසර සරන්නේ වෙයි. ගැමිදහමක් වූ මෙවුන්දමින් දුරු වැ හැසිරෙන්නේ, එයින් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ. හේ බොරු කීම දුරැ ලා, බොරු කීමෙන් වැළැක්කේ වෙයි. ඇත්ත කියනසුලු වූයේ, ඇත්තෙන් ඇත්ත කළපා කියන්නේ, තහවුරු වැ පිහිටි කථා ඇත්තේ, ඇදහිය යුතු කථා ඇත්තේ. ලොව නො රවටන්නේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ. හේ කේලාම් කීම දුරැ ලා, කේලාම් කීමෙන් වැළැක්කේ වේ. මෙ තැනින් අසා මොවුන් (ඔවුන්ගෙන්) බිඳවනු පිණිස එතන්හි නොකියන සුලු වූයේ , එ තැනින් අසා ඔවුන් (මොවුන්ගෙන්) බිඳවනු පිණිස මෙ තන්හි නො කියනසුලු වූයේ, මෙසේ බිඳුණවුන් ගළපන්නේ (සමග කරන්නේ)ද, එකට ගැළැපුණවුන් (සමගියට පැමිණියවුන්) හට රුකුල් දෙන්නේ ද වෙයි. සමගියෙන් සිටින්නවුන් හා වාසය කැමැත්තේ, සමගියෙන් වසන්නවුනට කැමැත්තේ, සමග වැ සිටින්නවුනට සතුටු වනුයේ, සමගිය ඇති කරන බස් කියන්නේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ. හේ රළු බිණුම් දුරැ ලා, රළු බස් දෙඩුමෙන් වැළැක්කේ වෙයි.

යා සා වාචා නෙළා කණ්ණසුඛා පෙමනීයා[1] හදයඞ්ගමා පොරී බහුජනකන්තා බහුජනමනාපා, තථාරූපිං[2] වාචං භාසිතා හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං. සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතො හොති කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී. නිධානවතිනං වාචං භාසිතා හොති කාලෙන සාපදෙසං පරියන්තවතිං අත්ථසඤ්හිතං, ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

13. බීජගාමභූතගාමසමාරම්භා පටිවිරතො හොති. එකභත්තිකො හොති රත්තූපරතො පටිවිරතො විකාලභොජනා. නච්චගීතවාදිතවිසූකදස්සනා පටිවිරතො හොති. මාලාගන්ධවිලෙපනධාරණමණ්ඩනවිභූසනට්ඨානා පටිවිරතො හොති. උච්චාසයනමහාසයනා පටිවිරතො හොති. ජාතරූපරජතපටිග්ගහණා පටිවිරතො හොති. ආමකධඤ්ඤපටිග්ගහණා පටිවිරතො හොති. ආමකමංසපටිග්ගහණා පටිවිරතො හොති. ඉත්ථිකුමාරිකපටිග්ගහණා පටිවිරතො හොති. දාසිදාසපටිග්ගහණා පටිවිරතො හොති. අජෙළකපටිග්ගහණා පටිවිරතො හොති. කුක්කුටසූකරපටිග්ගහණා පටිවිරතො හොතිං හත්ථිගවාස්සවළවාපටිග්ගහණා පටිවිරතො හොති. ඛෙත්තවත්ථුපටිග්ගහණා පටිවිරතො හොති. දූතෙය්‍යපහිණගමනානුයොගා පටිවිරතො හොති. කයවික්කයා පටිවිරතො හොති. තුලාකූටකංසකූටමානකූටා පටිවිරතො හොති. උක්කොටනවඤ්චන නිකතිසාචියොගා පටිවිරතො හොති. ඡේදනවධබන්ධනවිපරාමොස ආලොපසහසාකාර පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

14. යථා වා පනෙකෙ භොතෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං බීජගාමභූතගාමසමාරම්භං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථීදං: මූලබීජං ඛන්ධබීජං ඵලුබීජං අග්ගබීජං බීජබීජමෙව පඤ්චමං. ඉති වා ඉති එවරූපා බීජගාමභූතගාමසමාරම්භා පටිවිරතො හොති ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

---

1. පෙමනියා, මජ්ජිමං 2. එවරූපිං, PTS

නිදොස්, කන්කලු, පෙම් උපදවන, පහසුවෙන් සිතැ වැදගන්නා, නොගැමි, බොහෝ දෙනාට ප්‍රිය, බොහෝ දෙනාගේ මන වඩන යම් බසෙක් වේ ද, එබඳු වූ බස් කියන්නේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ. හේ බොල් ගිස් දෙඩැවිලි හැරලා, බොල් දෙඩැවිල්ලෙන් වැළැක්කේ වෙයි. සුදුසු කාලවේලායෙහි කථා කරන සුලු වූයේ, ඇත්ත ම කියනසුලු වූයේ, වැඩ සලසන බසක් ම කියනසුලු වූයේ, නව ලොවුතුරුදහම් ඇසුරු කොට ම කියනසුලු වූයේ, හික්මීම ඇති කරන බසක් ම කියනසුලු වූයේ, සිතැ තබා ගන්නට සුදුසු වූ, කරුණු සහිත වූ, ඉමක් කොනක් ඇති (ප්‍රමාණවත් වූ), දෙලෝ වැඩ හා සම්බද්ධ වූ ම බසක් සුදුසු කාලයෙහි කියන්නේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

13. හේ බීජසමූහ (පැළ වන දෑ) ද, භූත සමූහ (පැළ වුණු දෑ) ද සිඳීමෙන් බිඳීමෙන් වැළැක්කේ වෙයි. රෑ බොජුනෙන් වැළැක්කේ, එක් වේලේ වළඳන බත් ඇත්තේ, නොකල්බොජුනෙන් වැළැක්කේ වෙයි. නටනු ගනු වයනු විසුළුදසුන් යන මෙයින් වැළැක්කේ වෙයි. ඇඟැ අඩු තැන් පිරවීමට, ඇඟ සැරැසීමට කරුණු වන මල්ගඳවිලෙවුන් දරීමෙන් වැළැක්කේ වෙයි. පමණ ඉක්මි උසසුන් ද, නොකැප වූ මහඅසුන් ද යන දෙකින් ම වැළැක්කේ වෙයි. රන් රිදී මසු කහවණු පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. අමු ධාන්‍ය පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. අමු මස් පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. ස්ත්‍රීන් කුමාරිකාවන් පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. දාසිදසුන් පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. එළුවන් බැටළුවන් පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. කුකුළන් හූරන් පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. ඇතුන් අසුන් වෙළෙඹුන් ගෙරින් පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. කෙත්වතු පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. ගිහියනට දූත මෙහෙවර කිරීමෙහි ද ගෙන් ගෙට පණිවුඩ පණත් ගෙන යෑමෙහි ද යෙදීමෙන් වැළැක්කේ වෙයි. වෙළෙඳ ගනුදෙනුයෙන් වැළැක්කේ වෙයි. හොරතරාදියෙන් කිරුමෙන්, බොරු රන් පෑමෙන්, හොර මිනුම්වලින් මිනුමෙන් වැළැක්කේ වෙයි. අල්ලස් ගෙන හිමියන් නොහිමි කිරීමෙන්, නානා උපායයෙන් අනුන් රැවැටීමෙන්, අගනා දයට හුරු නො අගනා දයක් පෙන්නා කරන මායායෙන්, මෙ කී නොකී හැම කෙරාටික කම්වලින් ම වැළැක්කේ වෙයි. අත් පා ආදිය සිඳීමෙන් ද, මැරීමෙන් ද, රැහැන් ආදියෙන් බැඳීමෙන් ද, සැහැසිකම් කිරීමෙන් ද වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වෙයි.

14. යම්සේ සමහර භවත් මහණබමුණෝ සැදහැයෙන් දුන් බොජුන් වළඳා, මූලවීජ ද (හිඟුරු ආදි පැළ වන මුල් ද), සකන්ධ වීජ ද (නුග ආදි පැළවන කඳ ද), පරුවීජ ද (උක් උණ බට ආදි පැළ වන පුරුක් ද), අග්‍රවීජ ද (ඉරිවේරිය ආදි පැළ වන දලු ද(, පස් වනු වීජවීජ ද (වී ආදී පැළ වන ඇට ද) යන මෙ කී වීජසමූහ ද (පැළ වන දෑ ද) භූතසමූහ ද (පැළ වුණු දෑ ද) පෙළීමෙහි (සිඳුම් බිඳුම් තැළුම් යැ යි) කියන ලද සමාරම්භයෙහි යෙදුණෝ වෙසෙත් ද, හෙ තෙමේ මේ හෝ මෙ බඳු වූ වීජග්‍රාමභූතග්‍රාම සමාරම්භයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

15. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහමණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං සන්නිධිකාරපරිභොගං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථීදං: අන්නසන්නිධිං පානසන්නිධිං වත්ථසන්නිධිං යානසන්නිධිං සයනසන්නිධිං ගන්ධසන්නිධිං ආමිසසන්නිධිං. ඉති වා ඉති එවරූපා සන්නිධිකාරපරිභොගා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

16. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහමණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විසූකදස්සනං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථීදං: නච්චං ගීතං වාදිතං පෙක්ඛං අක්ඛානං පාණිස්සරං වෙතාලං කුම්භථූනං සොභනකං චණ්ඩාලං වංසං ධොපනකං හත්ථියුද්ධං අස්සයුද්ධං මහිස්සයුද්ධං උසභයුද්ධං අජයුද්ධං මෙණ්ඩයුද්ධං කුක්කුටයුද්ධං වට්ටකයුද්ධං දණ්ඩයුද්ධං මුට්ඨියුද්ධං නිබ්බුද්ධං උය්‍යොධිකං බලග්ගං සෙනාබ්‍යූහං අණීකදස්සනං, ඉති වා ඉති එවරූපා විසූකදස්සනා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

17. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහමණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං ජූතපපමාදට්ඨානානුයොගං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථීදං: අට්ඨාපදං දසපදං ආකාසං පරිහාරපථං සන්තිකං බලිකං සටිකං සලාකහත්ථං අක්ඛං පඬ්ගචීරං වඩ්කකං මොක්ඛචිකං චිඞ්ගුලකං පත්තාළ්හකං රථකං ධනුකං අක්ඛරිකං මනෙසිකං යථාවජ්ජං. ඉති වා ඉති එවරූපා ජූතපපමාදට්ඨානානුයොගා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

18. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහමණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං උච්චාසයනමහාසයනං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථීදං: ආසන්දිං පල්ලඞ්කං ගොනකං චිත්තකං පටිකං පටලිකං තුලිකං විකතිකං උද්දලොමිං එකන්තලොමිං කට්ඨිස්සං කොසෙය්‍යං කුත්තකං හත්ථත්ථරං අස්සත්ථරං රථත්ථරං අජිනපපවෙණිං කාදලිමිගපවරප්පවත්ථරණං සඋත්තරච්ඡදං උභතොලොහිතකූපධානං. ඉති වා ඉති එවරූපා උච්චාසයනමහාසයනා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

15. යම්සේ ඇතැම් භවත් මහණ බමුණු කෙනෙක් සැදැහැයෙන් දුන් බොජුන් වළඳා, කන දෑ රැස් කොට තබා ගැන්ම, බොන දෑ රැස් කොට තබා ගැන්ම, වස්ත්‍ර රැස් කොට තබා ගැන්ම, (රිය ගැල් ආදිය ද පාවහන් ආදිය ද යන) යාන රැස් කොට තබා ගැන්ම, ඉහතැ කී දෑ හැර (තවත් තල සහල් ඈ වුව මනා) පසය රැස් කොට තබා ගැන්ම යන මෙසේ වූ සන්නිධිකාරපරිභොගයෙහි (පසය රැස් කොට තබා ගෙන වැළැඳීමෙහි) යෙදී වෙසෙත් ද, හෙ තෙමේ මේ හෝ මෙබඳු වූ හෝ සන්නිධිකාර පරිභොගයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

16. යම්සේ සමහර භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳා, නැටුම් ගැයුම් වැයුම්, නටසමජ්ජා (නළුවන් සමූහයක් එක් වැ ජනසමූහයා ඉදිරියේ දක්වන නැටුම්), ආඛ්‍යාන (මහාභාරතාදිය කීම හෝ ඇසීම), පාණිසවර (අතින් ලොහොබර ගැසුම හෝ අත්තල ගැසුම), වේතාල (දඬුමුවා තාළම්පට ගැසීම හෝ මතුරු දපා මළසිරුරු නැගිටුවීම), කුම්භථූන (සිවුරස් බෙර වැයුම), ශොභනක (රංගබලිකරණය හෙවත් රඟමඩුල්ලෙහි දී දෙවතාවනට සොත්‍රා වශයෙන් තාන්දිගීත ගායනය හෝ ප්‍රතිභානචිත්‍ර කිරීම), සණ දොවුන් කෙළිය (හෝ ආයොගුඩක්‍රීඩාව), උණගස් ඔසොවා ගෙන කරන ක්‍රීඩාව, අසරීධාවනය (මළවුන්ගේ ඇට සෝදා සුවඳ කවා තබා තකත්සෙමහි ඊ වටා සිට උත්සව කිරීම), ඇත්පොර, අස්පොර, මියුපොර, ගොන්පොර, එළුපොර, බැටෙළුපොර, කුකුළුපොර, වටුපොර, පොලුහරඹ, මිටුයුද, මල්ලපොර, යුද පවත්නා තැන් දක්නට යෑම, බළසෙන් ගණිනා තැන් දක්නට යෑම යන මෙබඳු විසුළු දස්නෙහි යෙදී වෙසෙත් ද, හෙ තෙමේ මේ හෝ මෙ බඳු වූ විසුළු දස්නෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

17. යම්සේ සමහර භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳා, අටපාකෙළිය, දසපාකෙළිය, අහස්දූකෙළිය, මඬුලු පැනුම, සනතිකා ක්‍රීඩාව, දාදුකෙළිය, කල්ලි ගැසුම, සලාඅත්කෙළිය, ගුළකෙළිය, කොළනලා පිඹුම, කෙළිනඟුලින් හෑම, කරණම් ගැසුම, කන්නංගුරුවා කෙළිය, කොළනැළියේනවැලි ඈ මැනුම, ක්‍රීඩාරථ පැදවීම, කුඩා දුන්නෙන් විදීම, ඇකිරිකෙළිය (පිටේ හෝ අහසේ අකුරු ඇඳ ඒ කියැවීම), සිතු දය කීමේ ක්‍රීඩාව, විකෘතංගානුකරණය (කනුන් කොරුන් යන ආදීන් සේ ඉරියවු පැවැත්වීම) යන මෙබඳු වූ පමාවට කරුණු වූ දූකෙළියෙහි යෙදී වෙසෙත් ද, හෙ තෙමේ මෙ හෝ මෙ බඳු වූ පමාවට කරුණු වූ දූකෙළියෙහි යෙදීමෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

18. යම්සේ ඇතැම් භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳා, දික්සඟළා පුටු ය, පළඟය, මහකොදුපලසය, වියමනෙන් විසිතුරු කළ එළුලොම්මුවා ඇතිරිය, එළුලොම්මුවා සුදු ඇතිරිය, ගනමල් යෙදූ එළුලොම් ඇතිරිය, තිලිය (පුලුන් මෙත්තය) සිංහරූපාදී රූපවලින් විසිතුරු කළ එළුලොම් ඇතිරිය, දෙපැත්තේ ම ලොම් ඇති එළුලොම්මුවා ඇතිරිය, එක් පැත්තේ පමණක් ලොම් ඇති එළුලොම්මුවා ඇතිරිය, රත්කසුකම් කළ පසතුරුණ, කොසෙය්‍ය හූයින් වියූ ඇතිරිය, ඇතු පිට එළන ඇතිරිය, අසු පිටැ එළන ඇතිරිය, රියැ එළන ඇතිරිය, ඇඳට සරිලන සේ අඳුන් දිවිසමින් මසා කළ ඇතිරිය, කෙහෙල්මුවසමින් කළ මහඟු පසතුරුණ, ඉස්දොර පාමුල රත්කන්වයින් තබා ඇති රතු උඩුවියන් සහිත මහඟු යහන යන මෙබඳු වූ උස්යහන් මහයහන් පරිහරණය කිරීමෙන් යෙදී වෙසෙද්ද, හෙ තෙමේ මේ හෝ මෙ බඳු වූ උස්යහන් මහයහන් පරිභොගයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

19. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහමණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං මණ්ඩනවිභූසනට්ඨානානුයොගං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථීදං: උච්ඡාදනං පරිමද්දනං නහාපනං සම්බාහනං ආදාසං අඤ්ජනං මාලාවිලෙපනං මුඛවුණ්ණකං මුඛලෙපනං හත්ථබන්ධං සිඛාබන්ධං දණ්ඩකං තාළිකං ඛග්ගං ඡත්තං චිත්‍රූපාහනං උණ්හීසං මණිං වාළවීජනිං ඔදාතානි වත්ථානි දීඝදසානි. ඉති වා ඉති එවරූපා මණ්ඩනවිභූසනට්ඨානානුයොගා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

20. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහමණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං තිරච්ඡානකථං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථීදං: රාජකථං චොරකථං මහාමත්තකථං සෙනාකථං භයකථං යුද්ධකථං අන්නකථං පානකථං වත්ථකථං සයනකථං මාලාකථං ගන්ධකථං ඤාතිකථං යානකථං ගාමකථං නිගමකථං නගරකථං ජනපදකථං ඉත්ථිකථං පුරිසකථං [කුමාරකථං කුමාරිකථං] සූරකථං විසිඛාකථං කුම්භට්ඨානකථං පුබ්බපෙතකථං නානත්තකථං ලොකක්ඛායිකං සමුද්දක්ඛායිකං ඉතිභවාභවකථං, ඉති වා ඉති එවරූපාය තිරච්ඡානකථාය පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

21. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහමණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විග්ගාහිකකථං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථීදං: න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි. අහං ඉමං ධම්මවිනයං ආජානාමි. කිං ත්වං ඉමං ධම්මවිනයං ආජානිස්සසි? මිච්ඡාපටිපන්නො ත්වමසි. අහමස්මි සම්මාපටිපන්නො. සංහිතං මෙ, අසංහිතං තෙ. පුරෙ වචනීයං පච්ඡා අවච. පච්ඡා වචනීයං පුරෙ අවච. ආවිණ්ණං තෙ විපරාවත්තං ආරොපිතො තෙ වාදො. නිග්ගහීතො ත්වමසි. චර වාදප්පමොක්ඛාය. නිබ්බෙඨෙහි වා සචෙ පහොසීති ඉති වා ඉතිඑවරූපාය විග්ගාහිකකථාය පටිවිරතො හොති ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

22. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහමණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං දූතෙය්‍යපහිණගමනානුයොගමනුයුත්තා විහරන්ති, සෙය්‍යථීදං: රඤ්ඤං රාජමහාමත්තානං ඛත්තියානං බ්‍රාහමණානං ගහපතිකානං කුමාරානං "ඉධ ගච්ඡ අමුත්‍රාගච්ඡ. ඉදං හර. අමුත්‍ර ඉදං ආහරා"ති. ඉති වා ඉති එවරූපා දූතෙය්‍යපහිණගමනානුයොගා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

19. යම්සේ වනාහි ඇතැම් භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳා, සුවඳසුණුයෙන් ඇඟ ඉළීම, අත්පාඇඟි මනා සටහන් ගන්වනුවට තෙල් ගා මැඩීම, සුවඳ දියෙන් නෑවීම, උරහිස්ඇඟි මස් වැඹෙනුවට මුගුරින් තැළීම, කැඩපතින් මුහුණ බැලීම, අලංකාර වස්ත්‍රයෙන් අඳුන් ගැම්, මල් පැළැඳීම හා විලෙවුන් දැරීම, මුවසුණු මුව-විලෙවුන් දැරීම, හස්තාභරණ දැරීම, හිසැ කුඩුම්බිය බැඳීම, විසිතුරු සැරයටි දැරීම, විසිතුරු බෙහෙත්තල දැරීම, කඩු දැරීම, විසිතුරු කුඩ දැරීම, විසිතුරු පාවහන් දැරීම, නලල්පට බැඳීම, සිළුමිණ පැළැඳීම, විසිතුරු සෙමෙර වල්විදුනා දැරීම, දික් දවලු ඇති සුදු රෙදි හැඳීම යන ආදි ඇඟ අඩු තැන් පිරවීමටත් ඇඟ සැරැසීමටත් කරුණු වන දෑ පරිභෝග කිරීමෙහි යෙදී වෙසෙත් ද, ඒ මහණ තෙමේ මේ හෝ මේ බඳු දෑ පරිභෝග කිරීමෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

20. යම්සේ වනාහි ඇතැම් භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳා රාජකථා චෞරකථා මහාමාත්‍යකථා සෙනාකථා භයකථා යුද්ධකථා ආහාරකථා පානකථා වස්ත්‍රකථා ශයනකථා මාලාකථා ගන්ධකථා ඥාතිකථා යානකථා ග්‍රාමකථා නිගමකථා නගරකථා ජනපදකථා ස්ත්‍රීකථා පුරුෂකථා කුමාරකථා කුමාරිකථා ශූරකථා විථිකථා කුම්භට්ඨානකථා තාතාවිකථා ලෝකාඛ්‍යායිකා කථා සමුද්‍රාඛ්‍යායිකාකථා ඉතිභවාභවකථා යන මේ බඳු වූ තිරශ්චීන කථාවන්හි යෙදී වෙසෙත් ද, ඒ මහණ තෙමේ මෙ කී හෝ මෙසින් අන්‍ය වූ හෝ මේ බඳු කථාවලින් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

21. යම්සේ වනාහි ඇතැම් භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳා, "තෝ මේ දහම් විනය නො දනිහි. මම ම මේ දහම් විනය දනිමි. මේ දහම් විනය කිමැ හි තෝ දනිහි ද? තෝ වරදවා පිළිපන්නෙහි. මම මැනැවින් පිළිපන්නෙමි වෙමි. මා බස කරුණු සහිත ය. තා බස කරුණු රහිත ය. තෝ පළමුයෙන් කියැ සුත්ත පසු වැ කියෙහි ය. පසු වැ කියැ සුත්ත පළමුයෙන් කියෙහි ය. තා කලක් ම පුහුණු කළ දෑ ය මගේ එක් වචනයෙන් ම පෙරැළී ගියේ ය. මා විසින් තව දොස් නැඟිණ. මා විසින් නිගන්තා ලද්දෙහි. මා තැනු දෙසින් මිදෙන්නට හැසිරෙව (ඒ ඒ තැන ගොස් උගනුව). හැකි නම් එය විසඳව" යන ආදීන් මේ බඳු වූ උනුන් බැණ දොඩා ගැනුම්හි යෙදෙත් ද, ඒ මහණ තෙමේ මෙ කී හෝ අන් මේබඳු වූ හෝ බැණදොඩාගැන්මෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

22. යම්සේ සමහර භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳා "මෙහි යන්නැ. අසෝ තැනට එන්නැ. මෙය ගෙනැ යන්නැ. අසෝ තැනට මෙය ගෙනෙන්නැ"හි කළ නියොග පිළිගෙන, රජුන්ගේ රජමහඇමැතියන්ගේ ක්ෂත්‍රියයන්ගේ බමුණන්ගේ ගෘහපතියන්ගේ රජ-කුමරුවන්ගේ මේ බඳු දූත මෙහෙවරෙහි පණිවුඩ ගෙන යෑමෙහි යෙදී වෙසෙත් ද, ඒ මහණ තෙමේ මෙ කී හෝ අන් මෙ වැනි වූ හෝ දූත මෙහෙවරින් පණිවුඩ ගෙන යෑමෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

23. යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ කුහකා ච හොන්ති ලපකා ච නෙමිත්තිකා ච නිප්පෙසිකා ච ලාභෙන ච ලාභං නිජිගිංසිතාරො. ඉති වා ඉති එවරූපා කුහනලපනා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

24. යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථිදං: අඞ්ගං නිමිත්තං උප්පාතං සුපිනං ලක්ඛණං මූසිකවඩ්ඩිකං අග්ගිහොමං දබ්බිහොමං ථුසහොමං තණ්ඩුලහොමං සප්පිහොමං තෙලහොමං මුඛහොමං ලොහිතහොමං අඞ්ගවිජ්ජා වත්ථුවිජ්ජා ඛත්තවිජ්ජා සිවවිජ්ජා භූතවිජ්ජා භූරිවිජ්ජා අග්ගිවිජ්ජා විසවිජ්ජා විච්ඡිකවිජ්ජා මූසිකවිජ්ජා සකුණවිජ්ජා වායසවිජ්ජා පක්කජ්ඣානං සරපරිත්තානං මිගචක්කං. ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

25. යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථිදං: මණිලක්ඛණං වත්ථුලක්ඛණං දණ්ඩලක්ඛණං අසිලක්ඛණං උසුලක්ඛණං ධනුලක්ඛණං ආවුධලක්ඛණං ඉත්ථිලක්ඛණං පුරිසලක්ඛණං කුමාරලක්ඛණං කුමාරිලක්ඛණං දාසලක්ඛණං දාසිලක්ඛණං හත්ථිලක්ඛණං අස්සලක්ඛණං මහිසලක්ඛණං උසභලක්ඛණං ගොලක්ඛණං අජලක්ඛණං මෙණ්ඩලක්ඛණං කුක්කුටලක්ඛණං වට්ටකලක්ඛණං ගොධාලක්ඛණං කණ්ණිකාලක්ඛණං කච්ඡපලක්ඛණං මිගලක්ඛණං. ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

26. යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථිදං: "රඤ්ඤං නියානං භවිස්සති. රඤ්ඤං අනියානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං උපයානං භවිස්සති. බාහිරානං රඤ්ඤං අපයානං භවිස්සති. බාහිරානං රඤ්ඤං උපයානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං අපයානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං ජයො භවිස්සති. බාහිරානං රඤ්ඤං පරාජයො භවිස්සති, බාහිරානං රඤ්ඤං ජයො භවිස්සති, අබ්භන්තරානං රඤ්ඤං පරාජයො භවිස්සති. ඉති ඉමස්ස ජයො භවිස්සති. ඉමස්ස පරාජයො භවිස්සති." ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

23. යම්සේ සමහර භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, කුහකකම් කරන්නෝ වෙත් ද, ලාභසත්කාර පතා අනුන් සිත් ඇදෙන සේ වූ වාචු බස් දෙඩන්නෝ වෙත් ද, සිවු පසය ලබනු සඳහා කයින් හෝ බසින් ඇඟැවීම් කරන්නෝ වෙත් ද, ලාභාපේක්ෂයෙන් අනුනට ගරහන්නෝ වෙත් ද, ලාභයෙන් ලාභය සොයන්නෝ වෙත් ද, ඒ මහණ තෙමේ මේ කී ද මේ බඳු වූ ද කුහනලපනවලින් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ සීලයෙක් වේ.

24. යම්සේ ඇතැම් භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, අංගශාස්ත්‍රය, නිමිත්තශාස්ත්‍රය, උත්පාතලක්ෂණය, සුවප්ත-ශාස්ත්‍රය, ලක්ෂණශාස්ත්‍රය, මූෂකවලිත්තවිද්‍යාව, අග්නිහෝමය, දර්වීහෝමය, තුෂහෝමය, කණහෝමය, තණ්ඩුලහෝමය, සර්පිර්හෝමය, තෛලහෝමය, මුඛහෝමය, ලෝහිතහෝමය, අංගවිද්‍යාව, වාස්තුවිද්‍යාව, ක්ෂත්‍රවිද්‍යාව, ශිවවිද්‍යාව, භූතවිද්‍යාව, භූරිවිද්‍යාව, අහිවිද්‍යාව, විෂවිද්‍යාව, වෘශ්චිකවිද්‍යාව, මූෂකවිද්‍යාව, ශාකුනවිද්‍යාව, වායසවිද්‍යාව, පක්ෂවධ්‍යානය, ශරපරිත්‍රාණය, මෘගලක්ෂය යන මේ කී හෝ මේබඳු වූ හෝ තිරශ්චීනවිද්‍යයෙන්, මිථ්‍යාජීවයෙන් දිවි පවත්-වත් ද, ඒ මහණ තෙමේ මේ කී ද මේ බඳු වූ ද තිරශ්චීනවිද්‍යයෙන් මිථ්‍යා-ජීවයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ සීලයෙක් වෙයි.

25. යම්සේ ඇතැම් භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, මිණිලකුණු, වත්ලකුණු, දඹුලකුණු, කඩුලකුණු, ඊලකුණු, දුනුලකුණු, අවිලකුණු, ඉසිරිලකුණු, පුරිස්ලකුණු. කුමරලකුණු, කුමරිලකුණු, දග්ලකුණු, දැසිලකුණු, ඇත්ලකුණු, අස්ලකුණු, මිගුලකුණු, වහල්ලකුණු, ගොන්ලකුණු, එළුලකුණු, බැටළුලකුණු, කුකුළුලකුණු, වවුලකුණු, ගොග්ලකුණු, කැණිලකුණු, කසුබුලකුණු, මුවලකුණු යන ආදි මේ බඳු තිරශ්චීන විද්‍යයෙන්, මේ බඳු මිථ්‍යාජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ තෙමේ මේ කී ද මෙබඳු වූ ද තිරශ්චීන විද්‍යයෙන් මිථ්‍යාජීවයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ සීලයෙක් වේ.

26. යම්සේ වතාහි ඇතැම් පින්වත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, "අසෝ දිනැ අසෝ නැකැතින් (යුද සඳහා) සිය නුවරින් අසෝ රජුන්ගේ තික්මීම වන්නේ ය. අසෝ නැකැතින් පෙරලා සිය නුවරට ඒම වන්නේ ය. අසෝ නැකැතින් පිටතැ සිටින සතුරු රජුන් හමු වන්නට රට තුළ හුන් රජුන්ගේ යෑම වන්නේ ය. අසෝ නැකැතින් පිටතැ සිටින සතුරු රජුන්ගේ ඉවත් වැ යෑම වන්නේ ය. අසෝ නැකැතින් රට තුළැ සිටින රජුන් කරා පිටතැ සිටින සතුරු රජුන්ගේ පැමිණීම වන්නේ ය. අසෝ නැකැතින් ඇතුලතැ සිටින රජුන්ගේ ඉවත් වැ යෑම වන්නේ ය. රට ඇතුලතැ සිටින රජුනට ජය වන්නේ ය. පිටතැ සිටින සතුරු රජුනට පරාජය වන්නේ ය. පිටතැ සිටින සතුරු රජුනට ජය වන්නේ ය. රට තුළැ සිටින රජුනට පරාජය වන්නේ යැ" යි මෙසේ 'මොහුට ජය වන්නේ ය. මොහුට පරාජය වන්නේ යැ' යි කියමින් මෙ බඳු වූ තිරශ්චීනවිද්‍යයෙන්, මේ බඳු වූ මිථ්‍යාජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ තෙමේ මේ හෝ මේ බඳු වූ තිරශ්චීනවිද්‍යයෙන්, මිථ්‍යාජීවයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ සීලයෙක් වේ.

27. යථා වා පනෙකෙ භොතො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථිදං: "චන්දග්ගාහො භවිස්සති. සූරියග්ගාහො භවිස්සති. නක්ඛත්තග්ගාහො භවිස්සති. චන්දිමසූරියානං පථගමනං භවිස්සති. චන්දිමසූරියානං උප්පථගමනං භවිස්සති. නක්ඛත්තානං පථගමනං භවිස්සති. නක්ඛත්තානං උප්පථගමනං භවිස්සති. උක්කාපාතො භවිස්සති. දිසාඩාහො භවිස්සති. භූමිචාලො භවිස්සති. දෙවදුන්දුභි භවිස්සති. චන්දිමසූරියනක්ඛත්තානං උග්ගමනං ඔගමනං සංකිලෙසං වොදානං භවිස්සති. එවංවිපාකො චන්දග්ගාහො භවිස්සති. එවංවිපාකො සූරියග්ගාහො භවිස්සති. එවංවිපාකං චන්දිමසූරියානං පථගමනං භවිස්සති. එවංවිපාකං චන්දිමසූරියානං උප්පථගමනං භවිස්සති. එවංවිපාකං නක්ඛත්තානං පථගමනං භවිස්සති. එවංවිපාකං නක්ඛත්තානං උප්පථගමනං භවිස්සති. එවංවිපාකො උක්කාපාතො භවිස්සති. එවංවිපාකො දිසාඩාහො භවිස්සති. එවංවිපාකො භූමිචාලො භවිස්සති. එවංවිපාකො දෙවදුන්දුභි භවිස්සති. එවංවිපාකං චන්දිමසූරියනක්ඛත්තානං උග්ගමනං ඔගමනං සඞ්කිලෙසං වොදානං භවිස්සති". ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

28. යථා වා පනෙකෙ භොතො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථිදං: "සුබ්බුට්ඨිකා භවිස්සති. දුබ්බුට්ඨිකා භවිස්සති. සුභික්ඛං භවිස්සති. දුබ්භික්ඛං භවිස්සති. ඛෙමං භවිස්සති. භයං භවිස්සති. රොගො භවිස්සති. අරොගත්තං භවිස්සති. මුද්දා ගණනා සංඛානං කාවෙය්‍යං ලොකායතං." ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

29. යථා වා පනෙකෙ භොතො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථිදං: අවාහනං විවාහනං සංවදනං විවදනං සංකිරණං විකිරණං සුභගකරණං දුබ්භගකරණං විරුද්ධගබ්භකරණං ජිව්හානිල්ලිඛනං හනුසංඛනනං හත්ථාභිජ්ජපනං හනුජ්ජපනං කණ්ණජ්ජපනං ආදාසපඤ්හං කුමාරිපඤ්හං දෙවපඤ්හං අග්ගිහොමං දත්තපුප්ඵානං මුඛතුපටානං අබ්භුජ්ජලනං සිරිභද්දිකා. ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

27. යම්සේ වනාහි ඇතැම් භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, "අසෝ දිනැ චන්ද්‍රග්‍රහණය වන්නේ ය. අසෝ දිනැ සූර්‍යග්‍රහණය වන්නේ ය. අසෝ දිනැ සඳ හිරු දෙදෙනා නිසි මඟින් යැම වන්නේ ය. අසෝ දිනැ ඔවුන් නොමඟින් යැම වන්නේ ය. අසෝ දිනැ නකත්තරුන් නිසිමඟින් යැම වන්නේය. අසෝ දිනැ ඔවුන් නොමඟින් යැම වන්නේ ය. අසෝ දිනැ උල්කාපතනය වන්නේ ය. දිග්දහය වන්නේ ය. භූමිකම්පනය වන්නේ ය වැසි නැති වැ අහස් ගෙරැවුම් වන්නේ ය. සඳහිරුන්ගේ ද නකත් තරුන්ගේ ද උදව බැසීම කෙලෙසීම පිරිසිදුබව වන්නේ ය. චන්ද්‍රග්‍රහණය ලොවට මෙබඳු පල ගෙනැ දෙන්නේ ය. සූර්‍යග්‍රහණය මෙබඳු පල ගෙනැ දෙන්නේ ය. නක්ෂත්‍රග්‍රහණය මෙබඳු පල ගෙනැ දෙන්නේ ය. සඳ හිරුන් නිසි මඟින් යැම මෙබඳු පල ගෙනැ දෙන්නේ ය. සඳ හිරුන් දෙදෙනාගේ නොමඟින් යැම මෙ බඳු පල ගෙනැ දෙන්නේ ය. නකත්තරුවල පථගමනය මෙබඳු පල ගෙනැ දෙන්නේ ය. ඔවුන්ගේ උත්පථගමනය මෙ බඳු පල ගෙනැ දෙන්නේ ය. උල්කාපතනය මෙ බඳු පල ගෙනැ දෙන්නේ ය. දිග්දහය මෙ බඳු පල ගෙනැ දෙන්නේ ය. භූමිකම්පනය මෙබඳු පල ගෙනැ දෙන්නේ ය. වැසි නැති වැ අහස්ගෙරැවුම් මෙබඳු පල දෙන්නේ ය. සඳහිරුන්ගේ ද නකත්තරුවල ද උදවත් බැසීමත් කෙලෙසීමත් පිරිසිදු වීමත් මේ බඳු පල දෙන්නේ යැ" යි කියනුවෝ, මේ බඳු තිරශ්චීනවිද්‍යයෙන්, මේ බඳු මිථ්‍යාජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ තෙමේ මේ හෝ මේ බඳු වූ තිරශ්චීනවිද්‍යයෙන්, මිථ්‍යාජීවිකායෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ සීලයෙක් වේ.

28. යම්සේ වනාහි ඇතැම් පින්වත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, "මේ සමයෙහි වැසි වස්නේ ය. මේ සමයෙහි නියං වන්නේ ය. මේ සමයෙහි රට සුභික්ෂ වන්නේ ය. මේ සමයෙහි රට දුර්භික්ෂ වන්නේ ය. මේ සමයෙහි රටට උවදුරු වන්නේ ය. මේ සමයෙහි රටට භය වන්නේ ය. මේ කලැ රෝග වන්නේ ය. මේ කලැ රෝග නැති බව වන්නේ යැ" යි පලාපල කීම ද, ඉදුංව (ඇඟිලි පුරුක්හි සංඥා තබා ගිණීම) ද, ගණනාව (එක දෙක යන ආදීන් ගිණීම) ද, කාව්‍යශාස්ත්‍රය, ලෝකායතශාස්ත්‍රය යන මේ හෝ මේ බඳු තිරශ්චීන විද්‍යයෙන්, මිථ්‍යාආජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ තෙමේ මේ හෝ මේ බඳු වූ තිරශ්චීනවිද්‍යයෙන්, මිථ්‍යාආජීවයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ සීලයෙක් වේ.

29. යම්සේ වනාහි ඇතැම් පින්වත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, ආවාහ සඳහා නකත් කීම, විවාහ සඳහා නකත් කීම, වෙන් වූ අඹුසැමියන් එක් වන්නට නකත් කීම, අඹුසැමියන් වෙන් වන්නට නකත් කීම, දුන් ණය රැස් කිරීමට නකත් කීම, ඉදල් ණයට පොලියට දීමට නකත් කීම, සෞභාග්‍යය ඇති වනුවට යන්ත්‍ර මන්ත්‍රාදිය කැරැ දීම, බිම් පාලු වන්නට හදි ගුණියම් කිරීම, නැසෙන්නට යන දරු ගබ් රැකෙන්නට පිළියම් කිරීම, දිවගුලු බැඳීම, මන්ත්‍රාදියේ බලයෙන් හනු තද කිරීම, අත් පෙරැළෙන්නට මතුරු දැපීම, හනු පෙරැළෙන්නට මතුරු දැපීම, කන් අඟුලු වැටෙන්නට මතුරු දැපීම, කැඩපතෙහි දෙවතාවේශය කොට ප්‍රශ්න ඇසීම, කුමාරියක ලවා ජෙන කියැවීම, දෙවිදැස්සක ලවා ජෙන කියැවීම, ජීවිකා පිණිස හිරු පිදීම, මහබඹු පිදීම, මතුරු දපා ඉවින් ගිනිජ්ල් විහිදුවීම, මතුරු දපා ශ්‍රීකඨ කැඳැවීම යන මේ හෝ අන් මේ බඳු වූ තිරශ්චීන විද්‍යයෙන්, මිථ්‍යාජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ තෙමේ මේ හෝ මේ බඳු වූ තිරශ්චීනවිද්‍යයෙන්, මිථ්‍යාජීවයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ සීලයෙක් වේ.

30. යථා වා පනෙකෙ භොතො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථිදං: සන්තිකම්මං පණිධිකම්මං භූතකම්මං භූරිකම්මං වස්සකම්මං වොස්සකම්මං වත්ථුකම්මං වත්ථුපරිකිරණං ආචමනං නහාපනං පුහනං වමනං විරෙචනං උද්ධවිරෙචනං අධොවිරෙචනං සීසවිරෙචනං කණ්ණතෙලං නෙත්තතප්පනං නත්ථුකම්මං අඤ්ජනං පච්චඤ්ජනං සාලාකියං සල්ලකත්තියං දරකතිකිච්ඡා මූලභෙසජ්ජානං අනුප්පදානං ඔසධීනං පටිමොක්ඛො. ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො භොති. ඉදම්පි'ස්ස භොති සීලස්මිං.

31. ස ඛො සො කෙවට්ට භික්ඛු එවං සීලසම්පන්නො න කුතොචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතො. සෙය්‍යථාපි මාණවි ඛත්තියො මුද්ධාවසිත්තො නිහතපච්චාමිත්තො න කුතොචි භයං සමනුපස්සති යදිදං පච්චත්තිකතො. එවමෙව ඛො කෙවට්ට භික්ඛු එවං සීලසම්පන්නො න කුතොචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතො. සො ඉමිනා අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො අජ්ඣත්තං අනවජ්ජසුඛං පටිසංවෙදෙති. එවං ඛො කෙවට්ට භික්ඛු සීලසම්පන්නො භොති.

32. කථඤ්ච කෙවට්ට භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො භොති? ඉධ කෙවට්ට භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී භොති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති. රක්ඛති චක්ඛුන්ද්‍රියං. චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝාණෙන ගන්ධං ඝායිත්වා- පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී භොති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති, රක්ඛති මනින්ද්‍රියං. මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සො ඉමිනා අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො අජ්ඣත්තං අබ්‍යාසෙකසුඛං පටිසංවෙදෙති. එවං ඛො කෙවට්ට භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො භොති.

30. යම්සේ ඇතැම් පින්වත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, ශාන්තිකම්, ප්‍රණීතිකම්, භූරිකම්, පණ්ඩිකයා පිරිමියකු කිරීම්, පිරිමියා පණ්ඩකයකු කිරීම්, වාස්තුකම්, වාස්තු පරිකිරණ, මිතුරු දපා මුව දෙවුම, මිතුරු දපා අනුත් නැවීම, සෙත් පතා හිති පිදීම, ගිහියනට වමන කරවීම, බඩ විරේක කරවීම, ළය විරේකයට බෙහෙත් දීම, වස්ති කිරීම ශීර්ෂවිරේචන බෙහෙත් දීම, කන් ලෙඩට තෙල් පිසැ දීම, ගිහියන් සඳහා ඇස පවලයට සිසිල ගන්වන තෙත්තෙල් පිසීම, ගිහියනට නස්‍ය දීම, කාරම් අඳුන් සෑදීම, ඇස සිසිල ගන්වන අඳුන් සෑදීම, ගිහියන්ගේ ඇසැ උල්ඇත ලෙඩට බෙහෙත් කිරීම, ගිහියනට ශල්‍ය කර්ම කිරීම, ළදරුවන්ගේ ලෙඩට පිළියම් කිරීම, මුල් බෙහෙත් දීම (කායචිකිත්සාව) කාරම් බෙහෙත් බැඳ වණ සුව වූ පසු ඒවා ගලවා දැමීම යැ" යි මේ ඇදි වූ හෝ මෙබඳු වූ තිරශ්චීනවිද්‍යයෙන්, මිථ්‍යාආජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ තෙමේ මේ හෝ මේ බඳු වූ තිරශ්චීන විද්‍යයෙන්, මිථ්‍යාජීවයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

31. කෙවට්ටය, ඒ මහණ තෙමේ මේසේ ශීලසම්පන්න වූයේ, ශීලසංවරහෙතුයෙන් කිසි ම එක ද අසංවරතායෙකින් පහළ වියැ හැකි බියක් නො දකී. කෙවට්ටය, ක්ෂත්‍රියාභිෂෙකයෙන් අභිෂෙක ලත්, වැනැසූ සතුරන් ඇති ක්ෂත්‍රියයෙක් කිසි ම එක ද සතුරකුගෙන් වියැ හැකි බියක් යම්සේ නො දක්නේ ද, එසේ ම මහණ තෙමේ මේ පරිදිදෙන් ශීලසම්පන්න වූයේ, ශීලසංවරහෙතුයෙන් කිසි ම එක ද අසංවරයෙකින් වියැ හැකි බියක් නො දකී. හේ මේ ආර්‍ය ශීලස්කන්ධයෙන් සමන්විත වූයේ සිය සතන්හි නිදොස් වූ කායික චෛතසික සුඛය විඳී. කෙවට්ටය, මෙසේ මහණ තෙමේ ශීලසම්පන්න වේ.

32. "කෙවට්ටය, මහණ තෙමේ කෙසේ නම් ඉඳුරන්හි වැසූ දොර ඇත්තේ වේ ද යත්: කෙවට්ටය, මේ සස්නෙහි මහණ තෙමේ ඇසින් රූපයක් දැක ශුභාදිවශයෙන් එහි ලකුණු නො ගන්නේ වේ. ශුභාදිවශයෙන් අත්පා ආදි අවයවයන්ගේ ආකාර සිතට නො ගන්නේ වේ. යම් කරුණෙකින් චක්ෂුරින්ද්‍රිය වසා නොගෙන වසන්නහුගේ චිත්තසන්තානය විෂමලෝභ දෙමනස් ආදි ලාමක අකුශල සභාවයෝ ලුහුබඳනාහු ද ඒ චක්ෂුරින්ද්‍රියයාගේ සංවරය පිණිස හේ පිළිපදී. චක්ෂුරින්ද්‍රියය රකී. චක්ෂුරින්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. කනින් හඬ අසා ... නාසයෙන් ගඳ ආඝ්‍රාණය කොට ... දිවෙන් රස ආස්වාදය කොට... කයින් ස්ප්‍රෂ්ටව්‍යය (ඇඟට හැපෙන ද) ස්පර්ශ කොට ... සිතින් ධර්මාලම්බන දැක, ශුභාදිවශයෙන් එහි ලකුණු ගන්නේ නො වේ. ශුභාදිවශයෙන් අත් පා ආදි අවයවයන්ගේ ආකාර සිතට ගන්නේ නො වේ. යම් කරුණෙකින් ශ්‍රෝත්‍රෙන්ද්‍රියය ... ඝ්‍රාණෙන්ද්‍රියය .... ජිහ්වෙන්ද්‍රියය ... කායෙන්ද්‍රියය ... මනඉන්ද්‍රියය සංවර කොට නොගෙන වසන්නහුගේ චිත්තසන්තානය විෂමලෝභ දෙමනස් ආදි ලාමක අකුශල සභාවයෝ ලුහුබඳනාහු ද, ඒ ශ්‍රෝත්‍රෙන්ද්‍රියයාගේ ... ඝ්‍රාණෙන්ද්‍රියයාගේ ... ජිහ්වෙන්ද්‍රියයාගේ කායෙන්ද්‍රියයාගේ ... මනඉන්ද්‍රියයාගේ සංවරය පිණිස පිළිපදී. ශ්‍රෝත්‍ර ... ඝ්‍රාණ ... ජිහ්වා ... කාය ... මනඉන්ද්‍රියය රකී. එහි සංවරයට පැමිණේ. හේ මේ ආර්‍ය වූ ඉන්ද්‍රියසංවරයෙන් සමන්විත වූයේ සිය සතන්හි අව්‍යාසෙකසුඛය (කෙලෙසුන්ගෙන් මිශ්‍ර නොවීමෙන් වූ පිරිසිදු අධිචිත්තසුඛය) විඳී. කෙවට්ටය, මේසේ වනාහි මහණ තෙමේ ඉන්ද්‍රියයන්හි වැසූ දොර ඇත්තේ වේ.

33. කථඤ්ච කෙවට්ට භික්ඛු සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො හොති? ඉධ කෙවට්ට භික්ඛු අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී හොති. ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති. සම්මිඤ්ජිතෙ පසාරිතෙ සම්පජානකාරී හොති. සඞ්ඝාටිපත්තචීවරධාරණෙ සම්පජානකාරී හොති. අසිතෙ පීතෙ ඛායිතෙ සායිතෙ සම්පජානකාරී හොති. උච්චාරපස්සාවකම්මෙ සම්පජානකාරී හොති. ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ සම්පජානකාරී හොති. එවං ඛො කෙවට්ට භික්ඛු සතිසම්පජ්ඤ්ඤෙන සමන්නාගතො හොති.

34. කථඤ්ච කෙවට්ට භික්ඛු සන්තුට්ඨො හොති? ඉධ කෙවට්ට භික්ඛු සන්තුට්ඨො හොති කායපරිහාරියෙන චීවරෙන කුච්ඡිපරිහාරියෙන පිණ්ඩපාතෙන. සො යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති. සෙය්‍යථාපි කෙවට්ට පක්ඛි සකුණො යෙන යෙනෙව ඩෙති සපත්තභාරො'ව ඩෙති, එවමෙව ඛො කෙවට්ට භික්ඛු සන්තුට්ඨො හොති කායපරිහාරියෙන චීවරෙන කුච්ඡිපරිහාරියෙන පිණ්ඩපාතෙන. සො යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති. එවං ඛො කෙවට්ට භික්ඛු සන්තුට්ඨො හොති.

35. සො ඉමිනා ච අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො ඉමිනා ච අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො ඉමිනා ච අරියෙන සතිසම්පජ්ඤ්ඤෙන සමන්නාගතො ඉමාය ච අරියාය සන්තුට්ඨියා සමන්නාගතො විවිත්තං සෙනාසනං භජති අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං. සො පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා.

36. සො අභිජ්ඣං ලොකෙ පහාය විගතාභිජ්ඣෙන චෙතසා විහරති. අභිජ්ඣාය චිත්තං පරිසොධෙති. බ්‍යාපාදපදොසං පහාය අබ්‍යාපන්නචිත්තො විහරති සබ්බපාණභූතහිතානුකම්පී. බ්‍යාපාදපදොසා චිත්තං පරිසොධෙති. ථීනමිද්ධං පහාය විගතථීනමිද්ධො විහරති ආලොකසඤ්ඤී සතො සම්පජානො. ථීනමිද්ධා චිත්තං පරිසොධෙති. උද්ධච්චකුක්කුච්චං පහාය අනුද්ධතො විහරති අජ්ඣත්තං වූපසන්තචිත්තො. උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසොධෙති. විචිකිච්ඡං පහාය තිණ්ණවිචිකිච්ඡො විහරති අකථංකථී කුසලෙසු ධම්මෙසු. විචිකිච්ඡාය චිත්තං පරිසොධෙති.

33. කෙවට්ටය, මහණ තෙමේ කෙසේ නම් ස්මෘතිසම්ප්‍රජ්ඤ්ඤයෙන් (සිහි නුවණින්) සමන්විත වේ ද යත්: කෙවට්ටය, මේ සස්නෙහි මහණ තෙමේ ඉදිරියට යෑමෙහි පෙරළා ඊමෙහි මනා නුවණින් දැන ම (එය) කරනුයේ වෙයි. ඉදිරි බැලීමෙහි, අනුදිස් බැලීමෙහි (වට පිට බැලීමෙහි) මනා නුවණින් දැන ම (එය) කරනුයේ වෙයි. අත් පා ආදිය හැකිලීමෙහි, දිගු කිරීමෙහි නුවණින් දැන ම (එය) කරනුයේ වෙයි. සඟළසිවුර ද පාත්‍රය ද සෙසු සිවුරු ද දැරීමෙහි නුවණින් දැන ම කරන්නේ වෙයි. ආහාර ගැන්මෙහි, පෑන් පිමෙහි, පිපිකැවිලි ආදිය කෑමෙහි, මී ආදිය රස විඳීමෙහි නුවණින් දැන ම කරනුයේ වෙයි. මල මුත්‍ර කිරීමෙහි නුවණින් දැන ම කරනුයේ වෙයි. ගමනෙහි සිටීමෙහි ගිඳීමෙහි නිදීමෙහි කථා කිරීමෙහි නොකිණීමෙහි නුවණින් දැන ම කරනුයේ වෙයි. කෙවට්ටය, මෙසේ එතෙහි මහණ තෙම සිහි නුවණින් සමන්විත වෙයි.

34. කෙවට්ටය, කෙසේ නම් මහණ තෙමේ ලද පමණෙහි සතුටු වේ ද යත්: කෙවට්ටය, මේ සස්නෙහි මහණ තෙමේ කායපරිහරණයට ප්‍රමාණ වූ සිවුරින් ද කුක්ෂිපරිහරණයට ප්‍රමාණ වූ ආහාරයෙන් ද සතුටු වෙයි. ගේ යම් යම් තැනකට නික්මෑ යේ ද, අට පිරිකර පමණක් ගෙන ම නික්මෙයි. කෙවට්ටය, (පියා හඹනුවට තරම්) අත්තවූ ඇති කුරුලු තෙමේ යම් යම් තැනක පියා හඹා යේ නම්, පියාපත් බර සහිත ව ම යම් සේ පියා හඹා ද, එසේ ම ඒ මහණ තෙමේ කායපරිහරණයට ප්‍රමාණ වූ සිවුරින් ද කුක්ෂිපරිහරණයට ප්‍රමාණ වූ ආහාරයෙන් ද සතුටු වෙයි. ගේ යම් යම් තැනකට යේ ද, පා සිවුරු (ආදි අට පිරිකර පමණක්) රැගෙන ම යෙයි. කෙවට්ටය, මෙසේ එතෙහි මහණ තෙමේ ලද පසයෙහි සතුටු වේ.

35. කෙවට්ටය, ඒ මහණ තෙමේ මේ ආර්‍ය ශීලස්කන්ධයෙන් ද සමන්විත වූයේ, මේ ආර්‍ය ඉන්ද්‍රියසංවරයෙන් ද සමන්විත වූයේ, මේ ආර්‍ය සතිසම්ප්‍රජ්ඤ්ඤයෙන් ද සමන්විත වූයේ, මේ ආර්‍ය සන්තුෂ්ටියෙන් ද සමන්විත වූයේ, අරණ්‍ය වෘක්ෂමූල පර්වත කඳුරැළි ගිරිගුහා සොහොන් වනපෙත් (වනප්‍රස්ථ) අභ්‍යවකාශ (එළිමහන්) පිදුරුමලින් යන මේ කී ජනශූන්‍ය කිසි සෙනස්නක් හජනය කෙරෙයි. ගේ පිඬු සෙවීමෙන් පෙරළා ආයේ, පසුබත් සෙමෙහි පලක් බැඳ උඩු කය කෙළින් පිහිටුවා කම්වහනට යොමු කොට සිහි එළවා හිඳී.

36. ගේ ලොවැ (පඤ්ච උපාදානස්කන්ධය කෙරෙහි) ඇල්ම හැර විෂමලොභප්‍රහාණයෙන් (යට පත් කිරීමෙන්) පහ වූ අභිජ්ඣායෙන් යුත් සිතින් වෙසෙයි. අභිජ්ඣාව කෙරෙන් සිත පිරිසිදු කෙරෙයි. ව්‍යාපාද ප්‍රදෝෂය (ක්‍රෝධය) හැර, ව්‍යාපාද රහිත සිතැත්තේ, සියලු පණ ඇති සතුන් කෙරේ හිතානුකම්පා ඇති වැ වෙසෙයි. ක්‍රෝධය කෙරෙන් සිත පිරිසිදු කෙරෙයි. ස්ත්‍යානමිද්ධය හැර, පහ වූ ස්ත්‍යානමිද්ධය ඇත්තේ, දවල් දෙක්හි ම දුඩු එළිය හඳුනනු හැකි පිරිසිදු සංඥ ඇත්තේ, සිහියෙනුත් නුවණිනුත් යුක්ත වූයේ වෙසෙයි. ස්ත්‍යානමිද්ධය කෙරෙන් සිත පිරිසිදු කෙරෙයි. උද්ධච්චත් (සිතැ නොසංසුන්බවත්) කුකුච්චත් (කළ නො කළ දෑයෙහි පසුතැවිල්ලත්) සිතින් දුරු ලා, අනුද්ධත වැ (නොසංසුන් බැවින් තොර වැ), සංඛිඳුණු සවකීය චිත්තසන්තානය ඇත්තේ, උද්ධච්ච කුකුච්ච දෙක කෙරෙන් සිත පිරිසිදු කෙරෙයි. සැකය දුරු ලා, පහ වූ සැක ඇත්තේ, කුසල් දහමෙහි සැක නො කරනුයේ, සැකය කෙරෙන් සිත පිරිසිදු කෙරෙයි.

37. සෙය්‍යථාපි කෙවට්ට පුරිසො ඉණං ආදාය කම්මන්තෙ පයොජෙය්‍ය, තස්ස තෙ කම්මන්තා සමිජ්ඣෙය්‍යුං, සො යානි ච පොරාණානි ඉණමූලානි තානි ච ව්‍යන්තීකරෙය්‍ය, සියා චස්ස උත්තරිං අවසිට්ඨං දාරභරණාය, තස්ස එවමස්ස: "අහං ඛො පුබ්බෙ ඉණං ආදාය කම්මන්තෙ පයොජෙසිං. තස්ස මෙ තෙ කම්මන්තා සමිජ්ඣිංසු. සො'හං යානි ච පොරාණානි ඉණමූලානි තානි ච ව්‍යන්තීඅකාසිං. අත්ථි ච මෙ උත්තරිං අවසිට්ඨං දාරභරණාය"ති. සො තතො නිදානං ලභෙථ පාමොජ්ජං, අධිගච්ඡෙය්‍ය සොමනස්සං-

38. සෙය්‍යථාපි කෙවට්ට පුරිසො ආබාධිකො අස්ස දුක්ඛිතො බාළ්හගිලානො, භත්තං චස්ස නච්ඡාදෙය්‍ය, න චස්ස කායෙ බලමත්තා, සො අපරෙන සමයෙන තම්හා ආබාධා මුච්චෙය්‍ය, භත්තඤ්චස්ස ඡාදෙය්‍ය, සියා චස්ස කායෙ බලමත්තා, තස්ස එවමස්ස: "අහං ඛො පුබ්බෙ ආබාධිකො අහොසිං දුක්ඛිතො බාළ්හගිලානො. භත්තං ච මෙ නච්ඡාදෙසි. න චස්ස මෙ ආසි කායෙ බලමත්තා. සො'මහි එතරහි තම්හා ආබාධා මුත්තො. භත්තඤ්ච මෙ ඡාදෙති. අත්ථි ච මෙ කායෙ බලමත්තා"ති. සො තතො නිදානං ලභෙථ පාමොජ්ජං, අධිගච්ඡෙය්‍ය සොමනස්සං-

39. සෙය්‍යථාපි කෙවට්ට පුරිසො බන්ධනාගාරෙ බද්ධො අස්ස, සො අපරෙන සමයෙන තම්හා බන්ධනාගාරා මුච්චෙය්‍ය සොත්ථිනා අබ්භයෙන, න චස්ස කිඤ්චි භොගානං වයො, තස්ස එවමස්ස: "අහං ඛො පුබ්බෙ බන්ධනාගාරෙ බද්ධො අහොසිං. සො'මහි එතරහි තම්හා බන්ධනාගාරා මුත්තො සොත්ථිනා අබ්භයෙන. නත්ථි ච මෙ කිඤ්චි භොගානං වයො" ති. සො තතො නිදානං ලභෙථ පාමොජ්ජං, අධිගච්ඡෙය්‍ය සොමනස්සං-

40. සෙය්‍යථාපි කෙවට්ට පුරිසො දාසො අස්ස අනත්තාධීනො පරාධීනො න යෙනකාමඞ්ගමො, සො අපරෙන සමයෙන තම්හා දාසබ්‍යා මුච්චෙය්‍ය අත්තාධීනො අපරාධීනො භුජිස්සො යෙනකාමඞ්ගමො, තස්ස එවමස්ස: "අහං ඛො පුබ්බෙ දාසො අහොසිං අනත්තාධීනො පරාධීනො න යෙනකාමඞ්ගමො. සො'මහි එතරහි තම්හා දාසබ්‍යා මුත්තො අත්තාධීනො අපරාධීනො භුජිස්සො යෙනකාමඞ්ගමො"ති. සො තතො නිදානං ලභෙථ පාමොජ්ජං, අධිගච්ඡෙය්‍ය සොමනස්සං-

37. කෙවඩ්ඩය, යම්සේ පුරුෂයෙක් ණය මුදලක් ගෙන කර්මාන්ත කරන්නේ ද, ඔහුගේ ඒ කර්මාන්ත සමෘද්ධ වන්නේ නම්, ඒ යම් පරණ ණය මුදල් වී නම්, ඒ සියල්ල ගෙවා අවසන් කරන්නේ ද, මත්තෙහි ඉතිරි වූ යමක් ඇත් නම්, එය අඹුදරුවන් රක්නා පිණිස වන්නේ ද, එසේ වූ ඔහුට "මම පළමුයෙන් ණයට මුදල් ගෙන කර්මාන්ත කෙළෙමි. ඒ මාගේ කර්මාන්ත සමෘද්ධ විය. ඒ මම, යම් පරණ ණය මුදල් වී නම්, එය ගෙවා අවසන් කෙළෙමි. අඹුදරුවන් රක්නට වැඩිපුර ඉතිරි වූ මුදලෙක් ද මට ඇතැ" යි මෙසේ සිතෙක් වන්නේ ද, ඒ ඒ ණය නැතිබව කරණ කොට ගෙන සතුට ලබන්නේ ද, සෞමනසට පැමිණෙන්නේ ද-

38. කෙවඩ්ඩය, යම් සේ පුරුෂයෙක් රෝගී වූයේ, දුකට පැමිණියේ, දැඩි ලෙස ගිලන් වන්නේ ද, ඔහුට බතුත් නො රිසියෙන්නේ ද, ඔහුගේ ඇඟපත ශක්ති පමණකුත් නො වන්නේ ද, ඒ මෑත කාලයෙහි ඒ ආබාධයෙන් මිදෙන්නේ නම්, ඔහුට බතුත් රිසියෙන්නේ නම්, ඔහු ඇඟපත ශක්තිය ද වන්නේ නම්, "මම වූ කලි පෙරැ දුකට පත්, දැඩි ගිලන්බව් ඇති ලෙඩෙක් වීමි. මට අහර ද රිසි නො වී ය. මා ඇඟපත ශක්තිය ද නො වී ය. ඒ මම දැන් ඒ ලෙඩින් මිදුණෙමි වෙමි. ඒ මට අහර ද රිසියෙයි. මා ඇඟපත ශක්තිය ද ඇතැ" යි ඔහුට මෙසේ සිතෙක් වන්නේ නම්, ඒ ඒ කරුණින් සතුට ලබන්නේ ද, සෞමනසට පැමිණෙන්නේ ද-

39. කෙවඩ්ඩය, යම් සේ පුරුෂයෙක් සිරගෙහි බැඳුණේ වන්නේ ද, ඒ පසු කාලෙක ධනය වියදම් නො කොට පහසුවෙන් ඒ සිර ගෙන් මිදෙන්නේ ද, (ඒ හෙතුයෙන්) ඔහුගේ කිසි භොගවිනාශයෙක් නො වන්නේ ද, "මම වූ කලි පෙරැ සිර ගෙහි බැඳුණෙමි වීමි. ඒ මම දැන් ධන වියදම් නො කොට පහසුවෙන් ඒ සිර ගෙන් මිදුණෙමි වෙමි. මාගේ භොගයනට කිසි විනාශයෙක් ද නැතැ" යි ඔහුට මෙසේ සිතෙක් වන්නේ ද, ඒ ඒ කරුණින් සතුට ලබන්නේ ද, සෞමනසට පැමිණෙන්නේ ද -

40. කෙවඩ්ඩය, යම්සේ තමා අයත් පැවැතුම් නැති, අනුන් අයත් පැවැතුම් ඇති, කැමැති අතෙක යන්නට අවසර නැති දාස පුරුෂයෙක් වන්නේ ද, ඒ මෑත භාගයෙහි තමා අයත් පැවැතුම් ඇතියේ, පරා අයත් පැවැතුම් නැතියේ, නිදහස් වූයේ, කැමැති අතෙක යෑ හැකි වූයේ, ඒ දාසභාවයෙන් මිදෙන්නේ ද, එසේ වූ ඔහුට "මම වූ කලි පෙරැ තමා අයත් පැවැතුම් නැති, පරා අයත් පැවැතුම් ඇති, කැමැති අතෙක යෑ නො හැකි දාසයෙක් වීමි. ඒ මම දැන් ඒ දාසභාවයෙන් මිදුණෙමි, තමා අයත් පැවැතුම් ඇතියෙමි, පරා අයත් පැවැතුම් නැතියෙමි, නිදහස් වූයෙමි කැමැති අතෙක යෑ හැකියෙමි වෙමි" යි මෙසේ සිතෙක් වන්නේ ද, ඒ ඒ කරුණින් සතුට ලබන්නේ ද, සෞමනසට පැමිණෙන්නේ ද-

41. සෙය්‍යථාපි කෙවට්ට පුරිසො සධනො සභොගො කන්තාරද්ධානමග්ගං පටිපජ්ජෙය්‍ය දුබ්භික්ඛං සප්පටිභයං, සො අපරෙන සමයෙන තං කන්තාරං නිත්ථරෙය්‍ය, සොත්ථිනා ගාමන්තං අනුප්පත්තුණෙය්‍ය ඛෙමං අප්පටිභයං, තස්ස එවමස්ස: "අහං ඛො පුබ්බෙ සධනො සභොගො කන්තාරද්ධානමග්ගං පටිපජ්ජිං දුබ්භික්ඛං සප්පටිභයං. සො'ම්හි එතරහි තං කන්තාරං තිණ්ණො සොත්ථිනා ගාමන්තං අනුප්පත්තො ඛෙමං අප්පටිභය"න්ති. සො තතො නිදානං ලභෙථ පාමොජ්ජං අධිගච්ඡෙය්‍ය සොමනස්සං-

42. එවමෙව ඛො කෙවට්ට භික්ඛු යථා ඉණං යථා රොගං යථා බන්ධනාගාරං යථා දාසබ්‍යං යථා කන්තාරද්ධානමග්ගං, එවං ඉමෙ පඤ්ච නීවරණෙ අප්පහීණෙ අත්තනි සමනුපස්සති. සෙය්‍යථාපි කෙවට්ට ආනණ්‍යං, යථා ආරොග්‍යං, යථා බන්ධනා මොක්ඛං, යථා භුජිස්සං, යථා ඛෙමන්තභූමිං, එවමෙව ඛො මාණව භික්ඛු ඉමෙ පඤ්ච නීවරණෙ පහීණෙ අත්තනි සමනුපස්සති.

43. තස්සිමෙ පඤ්ච නීවරණෙ පහීණෙ අත්තනි සමනුපස්සතො පාමොජ්ජං ජායති. පමුදිතස්ස පීති ජායති. පීතිමනස්ස කායො පස්සම්භති. පස්සද්ධකායො සුඛං වෙදෙති. සුඛිනො චිත්තං සමාධියති.

44. සො විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමිමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අඵුටං හොති.

45. සෙය්‍යථාපි කෙවට්ට දක්ඛො න්හාපකො වා න්හාපකන්තෙවාසී වා කංසථාලෙ න්හානීයචූණ්ණානි ආකිරිත්වා උදකෙන පරිපොථෙත්වා පරිපොථෙත්වා සන්නෙය්‍ය, සායං න්හානීයපිණ්ඩි සෙහාභානුගතා සෙහාභපරෙතා සන්තරබාහිරා ඵුටා සෙහාභෙන න ච පග්ඝරණී, එවමෙව ඛො කෙවට්ට භික්ඛු ඉමිමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අඵුටං හොති.

41 කෙවඩ්ඩය, යම්සේ ධනවත් වූ භෝගසම්පත් ඇති පුරුෂයෙක් දුර්ලභ ආහාර ඇති, උවදුරු ඇති, දිය නැති දික් මඟකට බස්නේ ද, හේ පසු කලෙක සුවසේ ඒ නිරුදක පෙදෙස ඉක්මැ යන්නේ ද, උවදුරු නැති විපත් නැති ගම්මානයකට බස්නේ ද, එසේ වූ ඔහුට "මම් වූ කලි පෙර ධන ඇතියෙම්, භෝගසම්පත් ඇතියෙම්, දිය නැති, ආහාරදුර්ලභ, ප්‍රතිභය සහිත දික් මඟකට බවුයෙම්. ඒ මම දැන් සුවසේ ඒ කාන්තාරය තරණය කෙළෙම්. නිරුපද්‍රැත භයරහිත ගම්කට පැමිණියෙම් වෙමි"යි සිතෙක් වන්නේ ද, හේ ඒ කරුණින් සතුට ලබන්නේ ද, සොම්නසට පැමිණෙන්නේ ද-

42. කෙවඩ්ඩය, එසේ ම මහණ තෙමේ ණයක් මෙන් ලෙඩක් මෙන් හිරගෙයක් මෙන් වහල්බවක් මෙන් දිය නැති දික්මඟක් මෙන් (පිළිවෙළින්) මේ පහ නොවූ නීවරණ පස තමා කෙරෙහි දකී. මෘණවය, ණය නැති බව යම්සේ ද, ලෙඩ නැති බව යම්සේ ද, හිරගෙන් මිදුණුබව යම්සේ ද, නිවහල්බව යම්සේ ද, උවදුරු නැති බිම යම්සේ ද, එසේ ම (පිළිවෙළින්) මේ පහ වූ නීවරණ පස (හෙවත් නීවරණ පසේ දුරු වීම) තමා කෙරෙහි දකී.

43. තමා කෙරෙහි පහ වූ මේ නීවරණ පස දක්නා ඔහුට සතුට උපදී. සතුටු වූවහුට ප්‍රීතිය උපදී. සිතැ ප්‍රීතිය ඇත්තහුගේ කායය සංසිඳේ. සංහුන් කායය ඇත්තේ සුව විඳී. සුවැතියහු සිත සමාධිගත වේ (එකඟ වේ).

44. හේ කාමයන්ගෙන් වෙන් ව ම, සෙසු අකුසල් දහමුන්ගෙන් ද වෙන් ව ම, විතර්කසහිත, විචාරසහිත, විවේකයෙන් (නීවරණ පහ වීමෙන්) උපන් ප්‍රීතියත් සුවයත් ඇති පළමු ධ්‍යානය ලැබ වෙසේ. හේ මේ කරජකය ම විවේකයෙන් උපන් ප්‍රීතිසුඛයෙන් තෙමයි, මුළුල්ල ම තෙමයි, පුරා ලයි, මුළුල්ල ම ස්පර්ශ කෙරෙයි. සියලු අඟ පසඟ ඇති ඔහු මුළු කයෙහි ඒ විවේකයෙන් උපන් ප්‍රීතිසුඛයෙන් පැතිරී වැද නොගත් (නොපහස්නා ලද) කිසි ද තැනෙක් නො වෙයි.

45. කෙවඩ්ඩය, යම්සේ කපුවෙක් (කිලිඟෙක්) හෝ කපුවකුගේ (කිලිඟකුගේ) අතැවැස්සෙක් හෝ ලොහොතලියක නාන සුණු බහා දිය ඉස ඉස පිඬු කරන්නේ ද, ඒ නාන සුණුපිඬ කාවැදුණු දිය ඇත්තේ, හැම තැන ම දියෙන් ශ්‍රක්ත වූයේ, ඇතුළත පිටත මුළුල්ල ම දියෙන් පැතිරී ගියේ, දිය නො වගුරුවන්නේත් වේ ද, කෙවඩ්ඩය, එසේ ම මහණ තෙමේ මේ කරජකය ම විවේකයෙන් උපන් ප්‍රීතිසුඛයෙන් තෙමයි, මුළුල්ල ම තෙමයි, පුරා ලයි, මුළුල්ල ම ස්පර්ශ කෙරෙයි. ඔහුගේ සියලු අඟ පසඟ ඇති මුළු කයෙහි විවේකජ ප්‍රීතිසුඛයෙන් පැතිර වැද නොගත් කිසි ද තැනෙක් නො වෙයි.

යම්පි කෙවට්ට භික්ඛු විවිච්චෙව කාමේහි විවිච්ච අකුසලේහි ධම්මේහි සවිතක්කං සවිචාරං විවේකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති, සො ඉමමේව කායං විවේකජේන පීතිසුඛේන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිපඵරති, නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස විවේකජේන පීතිසුඛේන අපඵුටං හොති. ඉදම්පි'ස්ස හොති සමාධිස්මිං.

46. පුන ච පරං කෙවට්ට භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමේව කායං සමාධිජේන පීතිසුඛේන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිපඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස සමාධිජේන පීතිසුඛේන අපඵුටං හොති.

47. සෙය්‍යථාපි කෙවට්ට උදකරහදෙ උබ්භිදෙදකො, තස්ස නෙවස්ස පුරත්ථිමාය දිසාය උදකස්ස ආයමුඛං, න දක්ඛිණාය දිසාය උදකස්ස ආයමුඛං, න පච්ඡිමාය දිසාය උදකස්ස ආයමුඛං, න උත්තරාය දිසාය උදකස්ස ආයමුඛං, දෙවො ච න කාලෙන කාලං සම්මා ධාරං අනුප්පවෙච්ඡෙය්‍ය, අථ ඛො තම්හා ච උදකරහා සීතා වාරිධාරා උබ්භිජ්ජිත්වා තමේව උදකරහදං සීතෙන වාරිනා අභිසන්දෙය්‍ය පරිසන්දෙය්‍ය පරිපූරෙය්‍ය පරිපඵරෙය්‍ය, නාස්ස කිඤ්චි සබ්බාවතො උදකරහදස්ස සීතෙන වාරිනා අපඵුටං අස්ස, එවමෙව ඛො කෙවට්ට භික්ඛු ඉමමේව කායං සමාධිජේන පීතිසුඛේන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිපඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස සමාධිජේන පීතිසුඛේන අපඵුටං හොති. යම්පි කෙවට්ට භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති, සො ඉමමේව කායං සමාධිජේන පීතිසුඛේන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිපඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස සමාධිජේන පීතිසුඛේන අපඵුටං හොති. ඉදම්පි'ස්ස හොති සමාධිස්මිං.

48. පුන ච පරං කෙවට්ට භික්ඛු පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති සතො සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති. යන්තං අරියා ආචික්ඛන්ති 'උපෙක්ඛකො සතිමා සුඛවිහාරී'ති, තං තතියං ඣානං උපසම්පජ්ජ විහරති.

කෙවට්ටය, මහණ තෙම කාමයන්ගෙන් වෙන් ව ම, සෙසු අකුසල් දහමුන්ගෙන් ද වෙන් ව ම, විතර්කසහිත, විචාරසහිත, විවේකයෙන් උපන් ප්‍රීතියත් සුවයත් ඇති යම් පළමු දහනක් ලැබ වෙසේ ද, හේ ඒ විවේකජ ප්‍රීතිසුඛයෙන් මේ කය ම තෙමයි, මුළුල්ල ම තෙත් කෙරෙයි, පුරා ලයි, භාත්පස පැතිරී ගනී. ඔහුගේ සියලු කයැ විවේකජ ප්‍රීතිසුඛයෙන් නො පැතිරී ගත් කිසිදු තැනෙක් නො වෙයි. මේ ද ඔහුගේ සමාධියෙක් වෙයි.

46. කෙවට්ටය, නැවැත ද (අනෙකක් කියමි:) මහණ තෙමේ විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන්, සිය සතන්හි උපන්, සිය සතන් පහදවන (ශ්‍රද්ධාව හා එක් වැ යෙදුණු), සිතැ එකඟ බව ඇති, විතර්ක නැති, විචාරය නැති, සමාධියෙන් උපන්, ප්‍රීතියත් සුවයත් ඇති, දෙවෙනි ධ්‍යානයට පැමිණ වෙසෙයි. හේ මේ කරජ කය ම සමාධියෙන් උපන් ප්‍රීතිසුඛයෙන් තෙමයි. මුළුල්ල ම තෙත් කෙරෙයි, පුරා ලයි, හැම තැන ම ස්පර්ශ කෙරෙයි. ඔහුගේ කයේ විවේකයෙන් උපන් ප්‍රීතිසුඛයෙන් පැතිරී නොගත් කිසි ද තැනෙක් නො වෙයි.

47. කෙවට්ටය, යම්සේ යටැ උල්පතින් මතු වන දිය ඇති ගැඹුරු විලෙක් වේ ද, එයට පෙරදිගින් දිය ඇතුළු වන මඟෙක් නො වන්නේ ද, දකුණු දෙසින් ද දිය ඇතුළු වන මඟෙක් නොවන්නේ ද, පැසිම් දිගින් ද දිය ඇතුළු වන මඟෙක් නොවන්නේ ද, උතුරු දෙසින් ද දිය වැද ගන්නා මඟෙක් නො වන්නේ ද, වැස්ස ද කලින් කලැ සුදුසු පරිදි නො වසින්නේ ද, එතෙකුදු වුවත් ඒ විලෙන් සිසිල් දියදහර මතු වී ඒ විල ම සිසිල් දියෙන් තෙමන්නේ ද, හැම පරිදි තෙමන්නේ ද, පුරා ලන්නේ ද, හැම තැන ම වැද ගෙන පැතිරී සිටින්නේ ද, ඒ මුළු විලෙහි සිසිල් දිය පැතිරී වැද නොගත් කිසි ද තැනෙක් නො මැත් ද, කෙවට්ටය, එසේ ම මහණ තෙමේ මේ කරජ කය ම සමාධියෙන් උපන් ප්‍රීතිසුඛයෙන් තෙමයි, හැම තැන ම තෙත් කෙරෙයි, පුරා ලයි, හැම තැන ම පැතිරී වැද ගනී. ඔහුගේ ඒ සියලු කයේ සමාධියෙන් උපන් ප්‍රීතිසුඛය පැතිර වැද නොගත් කිසි ද තැනෙක් නො වෙයි. කෙවට්ටය, මහණ තෙම විතර්ක-විචාරයන් සංසිඳීමෙන් තමා කෙරෙහි පැහැදීම ඇති කරන, සිතැ එකඟ බව ඇති, විතර්කරහිත, විචාරරහිත, සමාධියෙන් පහළ වූ, ප්‍රීතිය හා සුඛවෙදනාව හා ඇති යම් දෙවෙනි ධ්‍යානයට පැමිණැ වෙසේ ද, හේ මේ කය ම සමාධියෙන් උපන් ප්‍රීතිසුඛයෙන් තෙමයි. හැම තැන ම තෙත් කෙරෙයි, පුරා ලයි. හැම තැන ම පැතිරී වැද ගනී. ඔහුගේ ඒ සියලු කයැ සමාධියෙන් උපන් ප්‍රීතිසුඛය පැතිරී වැද නොගත් කිසි ද තැනෙක් නො වෙයි. මේ ද ඔහුගේ සමාධියෙක් වෙයි.

48. නැවැත ද (අනෙකක් කියමි:) කෙවට්ටය, මහණ තෙමේ ප්‍රීතිය ගේ ද විරාගයෙන් (පහ වීමෙන්, සංසිඳීමෙන්), උපෙක්ෂක වැ, සිහියෙන් හා නුවණින් හා යුක්ත වැ වෙසෙයි. (දහන්) සුවය ද කයින් විඳී. ආර්යයෝ යම් ධ්‍යානයක් හෙතු කොට ගෙන ධ්‍යානලාභියා ඇරබැ 'උපෙක්ෂාව ඇත්තේ, සිහි ඇත්තේ, සුඛවිහරණ ඇත්තේ යැ' යි කියත් ද, හේ (එසේ වූ) ඒ තෙවෙනි ධ්‍යානයට පැමිණ වෙසේ.

සො ඉමමෙව කායං නිප්පීතිකෙන සුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිපඵරති. තස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස නිප්පීතිකෙන සුඛෙන අඵුටං හොති.

49. සෙය්‍යථාපි කෙවට්ට උප්පලිනියං වා පදුමිනියං වා පුණ්ඩරීකිනියං වා අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවද්ධානි උදකානුග්ගතානි අන්තොනිමුග්ගපොසීනි, තානි යාව වග්ගා යාව ච මූලා සීතෙන වාරිනා අභිසන්නානි පරිසන්නානි පරිපූරානි පරිපඵුටානි, නත්ථි කිඤ්චි සබ්බාවතො උප්පලානං වා පදුමානං වා පුණ්ඩරීකානං වා සීතෙන වාරිනා අඵුටං අස්ස, එවමෙව ඛො කෙවට්ට භික්ඛු ඉමමෙව කායං නිප්පීතිකෙන සුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිපඵරති. තස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස නිප්පීතිකෙන සුඛෙන අඵුටං හොති.

50. පුන ච පරං කෙවට්ට භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛමසුඛං උපෙක්ඛා-සතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන ඵරිත්වා නිසින්නො හොති. තස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අඵුටං හොති. සෙය්‍යථාපි කෙවට්ට පුරිසො ඔදාතෙන වත්ථෙන සසීසං පාරුපිත්වා නිසින්නො අස්ස, තස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස ඔදාතෙන වත්ථෙන අඵුටං අස්ස, එවමෙව ඛො කෙවට්ට භික්ඛු ඉමමෙව කායං පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන ඵරිත්වා නිසින්නො හොති. තස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අඵුටං හොති. යම්පි කෙවට්ට භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති, සො ඉමමෙව කායං පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන ඵරිත්වා නිසින්නො හොති, තස්ස කිඤ්චි සබ්බා-වතො කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අඵුටං හොති· ඉදම්පි'ස්ස හොති සමාධිස්මිං.

හේ මේ කය ම නිර්ප්‍රීතික සුඛයෙන් තෙමයි. හැම පරිදි තෙත් කෙරෙයි. පුරා ලයි. හැම තැන ම පැතිර වැද ගනී. ඔහුගේ කයෙහි ඒ නිර්ප්‍රීතික සුඛයෙන් පැතිර නොගත් කිසි ද තැනෙක් නො වෙයි.

49. කෙවට්ටය, යම්සේ උපුල් විලෙක හෝ පියුම් විලෙක හෝ පඬෙර විලෙක හෝ ඇතැම් උපුල් හෝ පියුම් හෝ පඬෙර හෝ දියෙහි උපන්නේ, දියෙහි වැඩුණේ, දියෙන් නොතැගුණේ, දිය තුළ ම ගිලී වැඩෙනුයේ ද, ඒ හැම අක් දක්වාත් මුල් දක්වාත් සිසිල් දියෙන් තෙමුණේ, හැම පරිදි තෙත් වූයේ, පිරී ගියේ, හැම තැන් ම පැතිරී වැද ගත්තේ වේ ද, ඒ විලෙහි සියලු උපුල්වලැ හෝ පියුම්වලැ හෝ පඬෙරවලැ හෝ සිසිල් දිය පැතිරී නොගත් තැනෙක් නො වන්නේ ද, කෙවට්ටය, එසේ ම මහණ තෙමේ මේ කය ම නිර්ප්‍රීතික සුඛයෙන් තෙමයි. තාත්පසින් තෙමයි. පුරා ලයි. හැම පරිදි පැතිරී වැද ගනී. ඔහුගේ සියලු කයෙහි නිර්ප්‍රීතික සුඛයෙන් පැතිරී වැද නොගත් කිසි ද තැනෙක් නො වෙයි.

50. තැවැත ද (අනෙකක් කියම්.) කෙවට්ටය, මහණ තෙමේ සුඛ වෙදනාව ද දුරු ලීමෙන්, දුඃඛ වෙදනාව ද දුරු ලීමෙන්, පළමු කොට ම සොම්නස් දෙම්නස් දෙදෙනාගේ පහ වීමෙන්, දුක් ද නොවූ, සුව ද නොවූ, උපෙක්ෂා සමෘති යන මොවුන්ගේ පිරිසිදු බව ඇති සතර වන ධ්‍යානය ලැබ වෙසෙයි. හේ මේ කය ම පිරිසිදු ප්‍රභාස්වර සිතින් පැතිරී වැද ගෙන හුන්නේ වෙයි. ඔහුගේ සියලු කයෙහි පිරිසිදු ප්‍රභාස්වර සිතින් පැතිරී වැද නො ගෙන සිටි කිසි ද තැනෙක් නො වෙයි. කෙවට්ටය, යම්සේ පුරුෂයෙක් සුදු වතින් හිසින් වටා පෙරෙවැ හුන්නේ වේ නම්, ඔහුගේ කයෙහි සුදු වතින් වැද නොගත් (නො වැසුණ) කිසි ද තැනෙක් නො වන්නේ ද, කෙවට්ටය, එසේ ම මහණ තෙම මේ කය ම පිරිසිදු ප්‍රභාස්වර සිතින් පැතිරී වැද ගෙන හුන්නේ වෙයි. ඔහු කයැ පිරිසිදු පඬසර සිතින් වැද ගෙන නොසිටි කිසි ද තැනෙක් නො වෙයි. කෙවට්ටය, මහණ තෙම සුඛ වෙදනාව ද දුක් වෙදනාව ද පහ කිරීමෙන්, පළමුවෙන් ම සොම්නස් දෙම්නසුන් පහ වැ යෑමෙන්, දුක් ද නොවූ සුව ද නොවූ, උපෙක්ෂාවත් සමෘතියත් යන මොවුන්ගේ පිරිසිදු බව ඇති සිවුවන දඹත් ලැබැ වෙසෙයි. එසින් හෙ තෙම මේ කය ම පිරිසිදු පඬසර සිතින් පැතිරී ගෙන හුන්නේ වෙයි. ඔහුගේ සියලු කයෙහි පිරිසිදු පඬසර සිතින් පැතිරී නොගත් කිසි ද තැනෙක් නො වෙයි යන යමක් ඇද්ද, මේ ද ඔහුගේ සමාධියෙක් වෙයි.

51. පුන ච පරං කෙවට්ට සො භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ඤාණදස්සනාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො එවං පජානාති: අයං ඛො මෙ කායො රූපී චාතුම්මහාභූතිකො මාතාපෙත්තිකසම්භවො ඔදනකුම්මාසූපචයො අනිච්චුච්ඡාදනපරිමද්දන-භෙදනවිද්ධංසනධම්මො. ඉදං ච පන මෙ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධන්ති.

52. සෙය්‍යථාපි කෙවට්ට මණි වෙළුරියො සුභො ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො අවෙජ්ඣ විප්පසන්නො අනාවිලො සබ්බාකාරසම්පන්නො, තත්‍රස්ස සුත්තං ආවුතං නීලං වා පීතං වා ලොහිතං වා ඔදාතං වා පණ්ඩු-සුත්තං වා. තමෙනං චක්ඛුමා පුරිසො හත්ථෙ කරිත්වා පච්චවෙක්ඛෙය්‍ය: අයං ඛො මණි වෙළුරියො සුභො ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො අවෙජ්ඣ විප්පසන්නො අනාවිලො සබ්බාකාරසම්පන්නො. තත්‍රිදං සුත්තං ආවුතං නීලං වා පීතං වා ලොහිතං වා ඔදාතං වා පණ්ඩුසුත්තං වා'ති. එවමෙව ඛො කෙවට්ට භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ඤාණදස්සනාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො එවං පජානාති: අයං ඛො මෙ කායො රූපී චාතුම්මහාභූතිකො මාතාපෙත්තිකසම්භවො ඔදනකුම්මාසූපචයො අනිච්චුච්ඡාදනපරිමද්දනභෙදන-විද්ධංසනධම්මො. ඉදං ච පන මෙ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධන්ති.

53. යම්පි කෙවට්ට භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ -පෙ- එවං පජානාති -පෙ- ඉදං ච පන මෙ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධන්ති, ඉදම්පි'ස්ස හොති පඤ්ඤාය.

51. තව ද (අනෙකක් කියමි.) කෙවඩ්ඩය, ඒ මහණ තෙමේ මෙසේ එකඟ වූ සිත පිරිසිදු වූ කල්හි, දීප්තිමත් වූ කල්හි, කිලිටි නැති වූ කල්හි, පහ වූ විත්තෝපක්ලෙශ ඇති කල්හි, මෘදු වූ කල්හි, විදර්ශනාභාවනාවට යෝග්‍ය කල්හි, සිත කල්හි, නිශ්චල බවට පැමිණි කල්හි, විදර්ශනාඥානය පිණිස, (පරිකර්ම) සිත එයට අභිමුඛ කෙරෙයි. ඒ අතට නමා හරියි. හේ "මාගේ මේ කය වූ කලි රූපවත් ය, සතර මහාභූතයන්ගෙන් හැදුණේ ය, මාපියන්ගේ ශුක්‍රශෝණිතයෙන් උපන්නේ ය, බත් කොළු ආදි අහරින් වැඩුණේ ය, අනිත්‍ය බව ද දුගඳ හරනුවට සුවඳ විලෙවුන් ඉළියැ සුතු බව ද, ලෙඩ දුරලනුවට පිරිමැදුම් ඇ කළ සුතු බව ද, එසේ කළ ද බිඳෙන බව ද, විසිරෙන බව ද යන මේ දැ සභාව කොටැත්තේ ය. මගේ මේ සිත ද මෙහි ලැග්ගේ ය, මෙහි බැඳුණේ යැ" යි මෙසේ දැන ගනී.

52. කෙවඩ්ඩය, යම්කේ සොඳුරු වූ, පිරිසිදු ආකරයෙක පහළ වූ, අටැස් වූ මොනොවට පිරියම් කළ, සියුම් වූ වෙසෙසින් පහත් වූ, පිවිතුරු වූ, බොවනාදි සියලු ආකාරයෙන් යුත් වෙරළුමිණෙක් වන්නේ ද, එහි නිල්වන් වූ හෝ රත්වන් වූ හෝ රන්වන් වූ හෝ සුදුවන් වූ හෝ පඹුවන් වූ හෝ සුතයක් අවුනන ලද්දේ වන්නේ ද, එය ඇස් ඇති පුරුෂයෙක් අතහි කොට, "මේ වූ කලි සොඳුරු වූ, පිරිසිදු ආකරයෙහි උපන්, අටැස් වූ, මොනොවට පිරියම් කළ, සියුම් වූ, වෙසෙසින් පහත් වූ, පිවිතුරු වූ, සියලු බොවනාදි ආකාරයෙන් සම්පූර්ණ වූ වෙරළුමිණෙක. මෙහි නිල්වන් වූ හෝ රත්වන් වූ හෝ රන්වන් වූ හෝ සුදුවන් වූ හෝ මේ සුතයක් අවුනන ලදුයේ වේ යැ"යි සලකා බලන්නේ ද, කෙවඩ්ඩය, එපරිද්දෙන් ම මහණ තෙමේ මෙසේ සමාධිගත සිත පිරිසිදු කල්හි, දීප්තිමත් වූ කල්හි, කෙලෙස් යටපත් වූ කල්හි, උපක්ලෙශයන් පහ වූ කල්හි, මෘදු වූ කල්හි, කර්ම්‍ය වූ කල්හි, සිත කල්හි, නිශ්චල බවට පැමිණි කල්හි, විදර්ශනාඥානය පිණිස සිත අභිමුඛ කෙරෙයි. ඒ අතට නමා හරියි. හෙ තෙම "මාගේ මේ කය වූ කලි රූපි ය, සතර මහාභූතයන්ගෙන් හැදුණේ ය, මාපියන්ගේ ශුක්‍රශෝණිතයෙන් නිපන්නේ ය. බත් කොළු ආදි අහරින් වැඩුණේ ය. අනිත්‍ය බව ද, දුගඳ හරනට සුවඳ විලෙවුන් ඉළියැ සුතු බව ද, ලෙඩ දුරලනුවට පිරිමැදුම් ඇ කළ සුතු බව ද, ඒ කලත් බිඳෙන බව ද, විසිරෙන බව ද යන මේ දැ සභාව කොටැත්තේ ය. මාගේ මේ සිත ද මෙහි ලැග ගත්තේ ය, මෙහි බැඳුණේ යැ"යි මෙසේ දැන ගනී.

53. කෙවඩ්ඩය, මහණ මෙසේ සමාධිගත සිත ... මාගේ මේ සිත ද මෙහි ලැග ගත්තේ ය. මෙහි බැඳුණේ යැ' යි මෙසේ දැනී යන යමක් ඇද්ද, මේ ද ඔහුගේ ප්‍රඥාවෙක් වෙයි.

54. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ මනොමයං කායං අභිනිම්මිනනාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනොමයං සබ්බඞ්ගපච්චඞ්ගිං අහීනින්ද්‍රියං. සෙය්‍යථාපි කෙවට්ට පුරිසො මුඤ්ජම්හා ඉසිකං පවාහෙය්‍ය, තස්ස එවමස්ස: අයං මුඤ්ජා අයං ඉසිකා. අඤ්ඤා මුඤ්ජා අඤ්ඤා ඉසිකා. මුඤ්ජම්හා තෙව ඉසිකා පබාළ්හා'ති. සෙය්‍යථාපි වා පන කෙවට්ට පුරිසො අසිං කොසියා පවාහෙය්‍ය, තස්ස එවමස්ස: අයං අසි අයං කොසි, අඤ්ඤො අසි අඤ්ඤා කොසි, කොසියා තෙව අසි පබාළ්හො 'ති. සෙය්‍යථාපි වා පන කෙවට්ට පුරිසො අහිං කරණ්ඩා උද්ධරෙය්‍ය, තස්ස එවමස්ස: අයං අහි අයං කරණ්ඩො, අඤ්ඤො අහි අඤ්ඤො කරණ්ඩො. කරණ්ඩා තෙව අහි උබ්භතො'ති. එවමෙව ඛො කෙවට්ට භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ මනොමයං කායං අභිනිම්මිනනාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනොමයං සබ්බඞ්ගපච්චඞ්ගිං අහීනින්ද්‍රියං. යම්පි කෙවට්ට භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ-පෙ-අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනොමයං සබ්බඞ්ගපච්චඞ්ගිං අහීනින්ද්‍රියං, ඉදම්පි'ස්ස හොති පඤ්ඤාය.

55. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො අනෙකවිහිතං ඉද්ධිවිධං පච්ච-නුභොති: එකො'පි හුත්වා බහුධා හොති. බහුධාපි හුත්වා එකො හොති. ආවිභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජ-මානො ගච්ඡති සෙය්‍යථාපි ආකාසෙ. පඨවියා'පි උම්මුජ්ජනිමුජ්ජං කරොති සෙය්‍යථාපි උදකෙ. උදකෙ'පි අභිජ්ජමානෙ ගච්ඡති සෙය්‍යථාපි පඨවියං. ආකාසෙ'පි පල්ලඞ්කෙන කමති සෙය්‍යථාපි පක්ඛී සකුණො. ඉමෙ'පි චන්දිමසූරියෙ එවංමහිද්ධිකෙ එවංමහානුභාවෙ පාණිනා පරාමසති පරිමජ්ජති. යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති.

56. සෙය්‍යථාපි කෙවට්ට දක්ඛො කුම්භකාරො වා කුම්භකාරන්තෙවාසී වා සුපරිකම්මකතාය මත්තිකාය යං යදෙව භාජනවිකතිං ආකඞ්ඛෙය්‍ය තං තදෙව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය-

54. හේ මෙසේ සමාහිත සිත පිරිසිදු වූ කල්හි, දීප්තිමත් වූ කල්හි, කෙලෙස් නොමැති වූ කල්හි, උපක්ලේශ පහ වූ කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍ය වූ (ඍද්ධි ඉපැදවීමට යෝග්‍ය වූ) කල්හි, සුස්ථිත කල්හි, නිශ්චල බවට පැමිණි කල්හි, මනොමය ශරීරයක් මවා පෘතු පිණිස සිත යොමු කෙරෙයි, නැඹුරු කෙරෙයි. හේ මේ සිරුරෙන් රූපී වූ, සියලු අඟපසඟින් යුත්, විකල නො වූ ඉඳුරන් ඇති මනොමය ශරීරයක් මවා පායි. කෙවට්ටය, යම්සේ පුරුෂයෙක් මුදුතණගසෙකින් තණකූර (=තණ බඩය) ඇද මැත් කරන්නේ ද, ඔහුට 'මේ මුදුතණගස ය, මේ එහි තණබඩ ය, තණ ගස එකෙකි, එහි බඩය අනෙකෙකි, මුදුතණ ගසකෙරෙන් ම එහි කූර (බඩය) මැත් කරන ලද්දේ යැ' යි මෙසේ සිතෙක් වන්නේ ද, කෙවට්ටය, යම්සේ පුරුෂයෙක් කඩුවක් කොපුවෙන් ඇද මැත් කරන්නේ ද, ඔහුට 'මේ කඩුව ය, මේ කොපුව ය, කඩුව එකෙක, කොපුව අනෙකෙක, කොපුයෙන් ම කඩුව ඇද මැත් කරන ලද්දේ යැ'යි මෙසේ සිතෙක් වන්නේ ද, කෙවට්ටය, යම්සේ වනාහි පුරුෂයෙක් නයකු සැවියෙන් ඇද වෙන් කරන්නේ ද, ඔහුට 'මේ නයා ය, මේ සැව ය, නයා එකෙක, සැවය අනෙකෙක, සැවය කෙළරන් ම නයා ඇද වෙන් කරන ලද්දේ යැ'යි මෙසේ සිතෙක් වන්නේ ද, කෙවට්ටය, එපරිද්දෙන් ම මහණ තෙම මෙසේ සිත සමාධිගත වැ පිරිසිදු වූ කල්හි, දීප්තිමත් වූ කල්හි, කෙලෙස් රහිත වූ කල්හි, උපක්ලේශයන් පහ වැ ගිය කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍ය වූ කල්හි, සුස්ථිත කල්හි, නිශ්චල බවට පත් කල්හි, මනොමය ශරීරයක් මවා පෘතු පිණිස සිත යොමු කෙරෙයි, නැඹුරු කෙරෙයි. හේ මේ ශරීරයෙන් රූපී වූ මනොමය වූ සියලු අඟපසඟින් යුත් වූ අවිකල ඉඳුරන් ඇති අන් සිරුරක් මවා පායි. කෙවට්ටය, මහණ තෙම මෙසේ සමාධිගත සිත පිරිසිදු වූ කල්හි ... රූපී වූ මනොමය වූ සියලු අඟපසඟින් යුත් වූ අවිකල ඉඳුරන් ඇති අන් සිරුරක් මවා පායි යන යමක් ඇද්ද, මේ ද ඔහුගේ ප්‍රශ්නයෙක් වෙයි.

55. හේ මෙසේ සමාහිත සිත පිරිසිදු වූ කල්හි, දීප්තිමත් වූ කල්හි, කෙලෙස් රහිත වූ කල්හි, උපක්ලේශයන් පහ වැ ගිය කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍ය(=ඍද්ධියට යෝග්‍ය) කල්හි, සුස්ථිත කල්හි, නිශ්චලභාවයට පැමිණි කල්හි, ඍද්ධිවිධඥානය පිණිස (අභිඥාපාදක) පරිකර්ම සිත මෙහෙ-යයි, නැඹුරු කෙරෙයි. හේ අනෙකවිධ වූ ඍද්ධිවිධය (ඍද්ධි කොට්ඨාසය) නැවත නැවත අනුභව කෙරෙයි (දෙවත් තාම් කයින් සපර්ශ කෙරෙයි, ප්‍රත්‍යක්ෂ කෙරෙයි, ලබයි): පියෙවියෙන් එකෙක් වැ සිටැ ද (ඍද්ධි බලයෙන්) බහු ප්‍රකාර ද වී යලි දු එකෙක් වෙයි. තමාගේ ප්‍රකට බව කෙරෙයි (පෙනී සිටී). අප්‍රකට බව කෙරෙයි (නොපෙනී සිටියි). බිත්තියෙන් පිටතට, පවුරෙන් පිටතට, පර්වතයෙන් පිටතට, ආකාසයෙහි මෙන් කිසිවෙක නො ගැවෙනුයේ මැදින් පිනිවිද යෙයි. දියෙහි මෙන් පොළොවෙහි ද යටට කැසීම (ගිලීම), උඩට නැගීම (මතු වීම) කෙරෙයි. නො බිඳෙන (යව නො බස්නා) දියෙහි පොළොවෙහි සේ යෙයි. පක්ෂ ඇති සකුණයකු මෙන් අහසෙහි ද පලඟින් (=ඌරුබඳාසනයෙන්) යෙයි. මෙසෙ මහර්ද්ධි ඇති මහත් අනුභාව ඇති මේ සඳ හිරු දෙදෙනා ද අතින් පරාමර්ශන කෙරෙයි (=අල්ලයි), (ඔබමොබ අත යවා) පිරිමදියි. බඹලොව තෙක් ද (සියල්ල) කයින් වශයෙහි පවත්වයි.

56. කෙවට්ටය, යම්සේ දක්ෂ කුඹලෙක් හෝ කුඹලක්හුගේ අතැවැත්තෙක් හෝ මේනොවට පිරියම් කළ (=සකස් කළ) මැටිටෙන් යම් යම් භාජන විශේෂයක් කැමැත්තේ නම්, ඒ ඒ දැය ම කරන්නේ ද, මේනොවට නිපදවන්නේ ද-

සෙය්‍යථා වා පන කෙවට්ට දක්ඛො දන්තකාරො වා දන්ත-කාරන්තෙවාසී වා සුපරිකම්මකතස්මිං දන්තස්මිං යං යදෙව දන්තවිකතිං ආකඞ්ඛය්‍ය තං තදෙව කරෙය්‍ය අභිනිප්පාදෙය්‍ය, සෙය්‍යථා වා පන කෙවට්ට දක්ඛො සුවණ්ණකාරො වා සුවණ්ණකාරන්තෙවාසී වා සුපරි-කම්මකතස්මිං සුවණ්ණස්මිං යං යදෙව සුවණ්ණවිකතිං ආකඞ්ඛය්‍ය තං තදෙව කරෙය්‍ය අභිනිප්පාදෙය්‍ය, එවමෙව ඛො කෙවට්ට භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො අනෙකවිධිතං ඉද්ධිවිධං පච්චනුභොති: එකො'පි හුත්වා බහුධා හොති -පෙ- යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති. යම්පි කෙවට්ට භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ -පෙ-යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති, ඉදම්පි'ස්ස හොති පඤ්ඤාය.

57. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ දිබ්බාය සොතධාතුයා චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො දිබ්බාය සොත-ධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය උභො සද්දෙ සුණාති දිබ්බෙ ච මානුසෙ ච යෙ දූරෙ සන්තිකෙ ච. සෙය්‍යථාපි කෙවට්ට පුරිසො අද්ධාන-මග්ගපටිපන්නො, සො සුණෙය්‍ය භෙරිසද්දම්පි මුදිඞ්ගසද්දම්පි සඞ්ඛපණවද්දම්පි, තස්ස එවමස්ස: භෙරිසද්දො ඉති'පි මුදිඞ්ගසද්දො ඉති'පි සඞ්ඛපණවද්දො ඉති'පි, එවමෙව ඛො කෙවට්ට භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ දිබ්බාය සොතධාතුයා චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය උභො සද්දෙ සුණාති දිබ්බෙ ච මානුසෙ ච යෙ දූරෙ සන්තිකෙ ච.

58. යම්පි කෙවට්ට භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ -පෙ- උභො සද්දෙ සුණාති දිබ්බෙ ච මානුසෙ ච යෙ දූරෙ සන්තිකෙ ච, ඉදම්පි'ස්ස හොති පඤ්ඤාය.

කෙවට්ටය, යම්සේ දක්ෂ දන්තකාරයෙක් (ඇත්දළින් විසිතුරු රූ ඇ කරන්නෙක්) හෝ දන්තකාරයන්ගේ අතැවැස්සෙක් හෝ මොනොවට පිරියම් කළ දළෙහි යම් යම් දන්තවිකෘතියක් තමා කැමැති නම්, ඒ ඒ දෙය ම කරන්නේ ද නිපදවන්නේ ද, කෙවට්ටය, යම්සේ දක්ෂ රන්කරුවෙක් හෝ රන්කරුවන්ගේ අතැවැස්සෙක් හෝ මොනොවට පිරියම් කළ රනෙහි යම් යම් සුවර්ණවිකෘතියක් තමා කැමැත්තේ නම්, එය එය ම කරන්නේ ද, නිපදවන්නේ ද, එසේ ම කෙවට්ටය, මහණ මෙසේ සමාහිත සිත පිරිසිදු කළහි, පරිශුද්ධ කළහි, අංගණ රහිත කළහි, උපක්ලේශ පහ වූ කළහි, මෘදු වූ කළහි, කර්මණ්‍ය කළහි, ස්થිත කළහි, අචල බවට පැමිණෑ සිටි කළහි සෘද්ධිවිධය පිණිස සිත යොමු කෙරෙයි, නමා ලයි. හේ එකෙක් වැ බොහෝ පරිදි වේ ... බඹලොව තෙක් ද කයින් වශය පවත්වයි යන අනෙකවිධ සෘද්ධිවිධ අනුභව කෙරෙයි කෙවට්ටය, මහණ මෙසේ සමාහිත සිත පිරිසිදු වූ කළහි...බඹලොව දක්වා ද කයින් වශය පවත්වයි, අනෙකවිධ සෘද්ධිවිධ අනුභව කෙරේ යන යම්ක් ඇද්ද, මේ ද ඔහුගේ ප්‍රශ්නවෙක් වේ.

57. හේ මෙසේ සමාහිත සිත පිරිසිදු වූ කළහි, දීප්තිමත් වූ කළහි, කෙලෙස් රහිත වූ කළහි, උපක්ලේශ පහ වැ ගිය කළහි, මෘදු වූ කළහි, කර්මණ්‍ය වූ කළහි, ස්థිත කළහි, නිශ්චල බවට පැමිණි කළහි, දිව්‍යශ්‍රෝත්‍ර-ධාතුව පිණිස (=දිවකන් නුවණ පිණිස) සිත යොමු කෙරෙයි, නැඹුරු කෙරෙයි, හේ පිරිසිදු වූ, මිනිසුන්ගේ ශ්‍රවණෝපචාරය ඉක්ම සිටි දිව කනින් දිව්‍ය වූ ද මානුෂක වූ ද, දුරු වූ ද ළං වූ ද යන ද්විවිධ ශබ්ද ම අසයි. කෙවට්ටය, යම්සේ මිනිසෙක් දික් මඟකට පිළිපන්නේ ද, හේ බෙර හඬත් මිහිගුබෙර හඬත් පණාබෙර හඬත් ගැටබෙර හඬත් යම් සේ අසන්නේ ද, ඒ අසන ඔහුට මේ බෙර හඬැයි කියාත් මේ මිහිගුබෙර හඬැ යි කියාත් මේ සක් හඬ යැ, මේ පණාබෙර හඬ යැ, මේ ගැටබෙර හඬ යැ යි කියාත් මෙසේ සිතෙක් වන්නේ ද, කෙවට්ටය, එපරිද්දෙන් ම මහණ තෙමේ මෙසේ සමාහිත සිත පිරිසිදු වූ කළහි, දීප්තිමත් වූ කළහි, කෙලෙස් රහිත වූ කළහි, උපක්ලේශ පහ වැ ගිය කළහි, මෘදු වූ කළහි, කර්මණ්‍ය (කර්මක්ෂම) වූ කළහි, ස්థිත කළහි, නිශ්චල බවට පැමිණි කළහි, දිව්‍ය-ශ්‍රෝත්‍රධාතුව පිණිස සිත යොමු කෙරෙයි, නැඹුරු කෙරෙයි. හේ පිරිසිදු වූ, මිනිසුන්ගේ ශ්‍රවණෝපචාරය ඉක්ම දිවකන්නුවණින් දිව්‍ය වූත් මානුෂක වූත් දුරු වූත් ළඟැ වූත් ද්විවිධ ශබ්ද අසයි.

59. කෙවට්ටය, ඒ මහණ මෙසේ සමාධිගත වූ සිත පිරිසිදු වූ කළහි ... දිව්‍ය වූ ද මානුෂක වූ ද, දුරු වූ ද ළඟැ වූ ද ද්විවිධ ශබ්ද අසයි යන යමෙක් ඇද්ද, මේ ද ඔහුගේ ප්‍රශ්නවෙක් වේ.

59. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ චෙතොපරියඤ්ඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාති: සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති. වීතරාගං වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාති. සදොසං වා චිත්තං සදොසං චිත්තන්ති පජානාති. වීතදොසං වා චිත්තං වීතදොසං චිත්තන්ති පජානාති. සමොහං වා චිත්තං සමොහං චිත්තන්ති පජානාති. වීතමොහං වා චිත්තං වීතමොහං චිත්තන්ති පජානාති. සංඛිත්තං වා චිත්තං සංඛිත්තං චිත්තන්ති පජානාති. මහග්ගතං වා චිත්තං මහග්ගතං චිත්තන්ති පජානාති. අමහග්ගතං වා චිත්තං අමහග්ගතං චිත්තන්ති පජානාති. සඋත්තරං වා චිත්තං සඋත්තරං චිත්තන්ති පජානාති අනුත්තරං වා චිත්තං අනුත්තරං චිත්තන්ති පජානාති. සමාහිතං වා චිත්තං සමාහිතං චිත්තන්ති පජානාති. අසමාහිතං වා චිත්තං අසමාහිතං චිත්තන්ති පජානාති. විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානාති. අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති.

60. සෙය්‍යථාපි කෙවට්ට ඉත්ථී වා පුරිසො වා දහරො වා යුවා මණ්ඩනකජාතිකො ආදාසෙ වා පරිසුද්ධෙ පරියොදාතෙ අච්ඡෙ වා උදකපත්තෙ සකං මුඛනිමිත්තං පච්චවෙක්ඛමානො සකණ්ටකං වා සකණ්ටකන්ති ජානෙය්‍ය, අකණ්ටකං වා අකණ්ටකන්ති ජානෙය්‍ය, එවමෙව ඛො කෙවට්ට භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ චෙතොපරියඤ්ඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාති: සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති. වීතරාගං වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාති. සදොසං වා චිත්තං සදොසං චිත්තන්ති පජානාති. වීතදොසං වා චිත්තං වීතදොසං චිත්තන්ති පජානාති. සමොහං වා චිත්තං සමොහං චිත්තන්ති පජානාති. වීතමොහං වා චිත්තං වීතමොහං චිත්තන්ති පජානාති. සංඛිත්තං වා චිත්තං -පෙ- වික්ඛිත්තං වා චිත්තං -පෙ- මහග්ගතං වා චිත්තං -පෙ- අමහග්ගතං වා චිත්තං -පෙ- සඋත්තරං වා චිත්තං -පෙ- අනුත්තරං වා චිත්තං -පෙ- සමාහිතං වා චිත්තං -පෙ- අසමාහිතං වා චිත්තං -පෙ- විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානාති. අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති.

61. යම්පි කෙවට්ට භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ -පෙ- අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති, ඉදම්පි'ස්ස හොති පඤ්ඤාය.

59. හේ මෙසේ එකඟ වූ සිත පිරිසිදු වූ කල්හි, දීප්තිමත් වූ කල්හි, කෙලෙස් රහිත වූ කල්හි, උපක්ලේශ පහ වැ ගිය කල්හි, මෘදු වූ කල්හි, කර්ම්‍යම වූ කල්හි, ස්ථිත කල්හි, නිශ්චල බවට පැමිණි කල්හි, චෙතස්පර්‍යායඥානය පිණිස (=අනුත්තේ සිත පිරිසිඳ දන්නා ඥාන පිණිස) සිත යොමු කෙරෙයි, නැඹුරු කෙරෙයි. හේ අන් සත්ත්වයන්ගේ අන් පුද්ගලයන්ගේ සිත සියයිතින් පිරිසිඳැ දනියි. රාග සහිත සිත රාග සහිත සිතැ යි දනියි. රාග රහිත සිත රාග රහිත සිතැ යි දනියි. දෝෂ සහිත සිත දෝෂ සහිත සිතැයි දනී. දෝෂරහිත සිත දෝෂරහිත සිතැ යි දනී. මෝහසහිත සිත මෝහසහිත සිතැ යි දනී. මෝහරහිත සිත මෝහරහිත සිතැ යි දනී. සංක්ෂිප්ත (=හැකුළුණු) සිත හැකුළුණු සිතැ යි දනී. වික්ෂිප්ත (=විසුරුණු) සිත විසුරුණු සිතැ යි දනී. මහද්ගත සිත මහද්ගත සිතැ යි දනී. අමහද්ගත සිත අමහද්ගත සිතැ යි දනී. සෝත්තර සිත සෝත්තර සිතැ යි දනී. අනුත්තර සිත අනුත්තර සිතැ යි දනී. සමාහිත සිත සමාහිත සිතැ යි දනී. අසමාහිත සිත අසමාහිත සිතැ යි දනී. විමුක්ත (=මිදුණු) සිත විමුක්ත සිතැ යි දනී. අවිමුක්ත (=නොමිදුණු) සිත අවිමුක්ත සිතැ යි දනී.

60. කෙවඩ්ඩය, යම්සේ සැරැසෙනසුලු ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ ළදරුවෙක් හෝ තරුණයෙක් හෝ පිරිසිදු දීප්තිමත් කැඩපතෙක හෝ පහන් දියබඳුනෙක හෝ සිය මුවසටහන පිරික්සා බලන්නේ තල-කැලැල් ආදි දෙස් ඇති තැන් සඳහා දෙස් තැනැ යි දන්නේ ද, එ කී දෙස් නැති තැන දෙස් නැතැ යි දන්නේ ද, කෙවඩ්ඩය, එ පරිද්දෙන් ම මහණ තෙමේ මෙසේ සමාහිත වූ සිත පිරිසිදු වූ කල්හි, දීප්ත වූ කල්හි, කෙලෙස් නැති කල්හි, උපක්ලේශ පහ වැ ගිය කල්හි, මෘදු වූ කල්හි, කර්ම්‍යම වූ කල්හි; ස්ථිත කල්හි, නිශ්චල බවට පැමිණි කල්හි, පරසිත් දන්නා ඥාන පිණිස සිත යොමු කෙරෙයි, නැඹුරු කෙරෙයි. හේ අන් සතුන්ගේ, අන් පුඟුලන්ගේ සිත සියයිතින් පිරිසිඳැ දනී. සරාග සිත සරාග සිතැ යි දනී. වීතරාග සිත වීතරාග සිතැ යි දනී. සදෝෂ සිත සදෝෂ සිතැ යි දනී. වීතදෝෂ සිත වීතදෝෂ සිතැ යි දනී. සමෝහ සිත සමෝහ සිතැ යි දනී, වීතමෝහ සිත වීතමෝහ සිතැ යි දනී. සංක්ෂිප්ත සිත සංක්ෂිප්ත සිතැ යි දනී. වික්ෂිප්ත සිත වික්ෂිප්ත සිතැ යි දනී. මහද්ගත සිත මහද්ගත සිතැ යි ... අමහද්ගත සිත අමහද්ගත සිතැ යි ... සෝත්තර සිත සෝත්තර සිතැ යි ... අනුත්තර සිත අනුත්තර සිතැ යි ... සමාහිත සිත සමාහිත සිතැ යි ... අසමාහිත සිත අසමාහිත සිතැ යි ... විමුක්ත සිත විමුක්ත සිතැ යි ... අවිමුක්ත සිත අවිමුක්ත සිතැ යි දනී.

61. කෙවඩ්ඩය, මහණ තෙම මෙසේ සමාහිත සිත පිරිසිඳු වූ කල්හි ... අවිමුක්ත සිත අවිමුක්ත සිතැ යි දනී යන යමක් ඇද්ද, මේක් ඔහුගේ ප්‍රඥාවෙක් වෙයි.

62. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ පුබ්බෙ-නිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො අනෙක-විහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථීදං: එකම්පි ජාතිං දේවි'පි ජාතියො තිස්සො'පි ජාතියො චත්තස්සො'පි ජාතියො පඤ්ච'පි ජාතියො දස'පි ජාතියො වීසම්පි ජාතියො තිංසම්පි ජාතියො චත්තාරීසම්පි ජාතියො ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි අනෙකෙ'පි සංවට්ටකප්පෙ අනෙකෙ'පි විවට්ටකප්පෙ අනෙකෙ'පි සංවට්ටවිවට්ටකප්පෙ 'අමුත්‍රාසිං එවං-නාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවං සුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො අමුත්‍ර උපපාදිං. තත්‍රාපාසිං එවං-නාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො ඉධූපපන්නො'ති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

63. සෙය්‍යථාපි කෙවට්ට පුරිසො සකම්හා ගාමා අඤ්ඤං ගාමං ගච්ඡෙය්‍ය, තම්හා'පි ගාමා අඤ්ඤං ගාමං ගච්ඡෙය්‍ය, සො තම්හා ගාමා සකෙඤ්ඤව ගාමං පච්චාගච්ඡෙය්‍ය, තස්ස එවමස්ස: 'අහං ඛො සකම්හා ගාමා අමුං ගාමං අගච්ඡිං. තත්‍ර එවං අට්ඨාසිං එවං නිසීදිං එවං අභාසිං එවං තුණ්හී අහොසිං. තම්හාපි ගාමා අමුං ගාමං අගච්ඡිං. තත්‍රාපි එවං අට්ඨාසිං එවං නිසීදිං එවං අභාසිං එවං තුණ්හී අහොසිං. සො'හං තම්හා ගාමා සකෙඤ්ඤව ගාමං පච්චාගතො'ති, එවමෙව ඛො කෙවට්ට භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ පුබ්බෙනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථීදං: එකම්පි ජාතිං දේවි'පි ජාතියො තිස්සො'පි ජාතියො චත්තස්සො'පි ජාතියො පඤ්චපි ජාතියො දස'පි ජාතියො වීසම්පි ජාතියො තිංසම්පි ජාතියො චත්තාරීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාතිසතම්පි පඤ්ඤාසම්පි ජාතියො ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි අනෙකෙ'පි සංවට්ටකප්පෙ අනෙකෙ'පි විවට්ටකප්පෙ අනෙකෙ'පි සංවට්ටවිවට්ටකප්පෙ 'අමුත්‍රාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො අමුත්‍ර උපපාදිං. තත්‍රාපාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො සො තතො චුතො ඉධූපපන්නො'ති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙ-නිවාසං අනුස්සරති. යම්පි කෙවට්ට භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ -පෙ- අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති, ඉදම්පි'ස්ස හොති පඤ්ඤාය.

62. හෙ තෙමේ මෙසේ සමාහිත සිත පිරිසිදු වූ කල්හි, දීප්ත වූ කල්හි, කෙලෙස් තැති වූ කල්හි, උපක්ලේශ පහ වැ ගිය කල්හි, මෘදු වූ කල්හි, කර්ම්‍යම වූ කල්හි, ස්ථිත කල්හි, නිශ්චල බවට පත් කල්හි, පූර්වේ-නිවාසානුස්මෘති ඥානය (=පෙර වූසු කද පිළිවෙල දක්නා නුවණ) ලබනු පිණිස සිත යොමු කෙරෙයි. හේ එක් ජාතියක් ද ජාති දෙකක් ද ජාති තුනක් ද ජාති සතරක් ද ජාති පසක් ද ජාති දසයක් ද ජාති විස්සක් ද ජාති තිහක් ද ජාති සතළිසක් ද ජාති පනසක් ද ජාති සියක් ද ජාති දහසක් ද ජාති සුවහසක් ද, බොහෝ සංවර්ත කල්ප ද, බොහෝ විවර්ත කල්ප ද, බොහෝ සංවර්ත විවර්ත කල්ප ද, "අසෝ තන්හි මේ නම් ඇතියෙම් විමි. මේ ගොත් ඇතියෙම් විමි. මේ බඳු පැහැ ඇතියෙම් විමි. මේ බඳු ආහාර ඇතියෙම් විමි. මේ බඳු සුව දුක් විඳින්නෙම් විමි. මේ බඳු (මෙතෙක්) ආයු කෙළවර කොටැතියෙම් විමි. ඒ මම එයින් සැවැ අසෝ තැන උපතිමි. එහි ද මේ නම් ඇතියෙම් විමි. මේ ගොත් ඇතියෙම් විමි. මේ බඳු පැහැ සටහන් ඇතියෙම් විමි. මේ බඳු ආහාර ඇතියෙම් විමි. මේ බඳු සුවදුක් විඳින්නෙම් විමි. මෙතෙක් ආයු සීමාවක් ඇතියෙම් විමි. ඒ මම එයින් සැව මෙහි උපතිමි"යි මෙසේ අනෙකවිධ වූ පෙරැ වූසු කදපිළිවෙල සිහි කෙරෙයි. මෙසේ වර්ණාදි වශයෙන් ආකාර සහිත වූ නම්ගොත් විසින් උද්දේශ සහිත වූ බහුවිධ වූ පූර්වේනිවාසය සිහි කෙරෙයි.

63. කෙවට්ටය, යම්සේ පුරුෂයෙක් සිය ගමින් අන් ගමකට යන්නේ ද, ඒ ගමිනුත් අන් ගමකට යන්නේ ද, (නැවත) හේ ඒ ගමින් සිය ගමට ම වටාලා එන්නේ ද, එසේ වූ ඔහුම "මම වූ කලි සිය ගමින් අසෝ ගමට ගියෙමි. එහි මෙසේ සිටියෙමි, මෙසේ උන්නෙමි, මෙසේ කීමි, මෙසේ නිහඬ විමි. ඒ ගමිනුත් අසෝ ගමට ගියෙමි. එහි ද මෙසේ සිටියෙමි, මෙසේ උන්නෙමි, මෙසේ කීමි, මෙසේ නිහඬ විමි. ඒ මම ඒ ගමින් සිය ගමට ම පෙරලා ආයෙම් වෙමි"යි ඔහුට මේ බඳු සිතෙක් වන්නේ ද, කෙවට්ටය, එ පරිද්දෙන් ම මහණ තෙමේ මෙසේ සමාහිත සිත පිරිසිදු වූ කල්හි, දීප්ත කල්හි, කෙලෙස් රහිත කල්හි, උපක්ලේශ පහ වැ ගිය කල්හි, මෘදු වූ කල්හි, කර්ම්‍යම වූ කල්හි, ස්ථිත කල්හි, නිශ්චල බවට පැමිණි කල්හි, පෙරැ වූසු කද පිළිවෙල සිහි කරන නුවණ පිණිස සිත මොනොවට යොමු කෙරෙයි, මොනොවට තැබුරු කෙරෙයි. හේ 'අසෝ තන්හි මේ නම් ඇතියෙම් විමි, මේ බඳු ගොත ඇතියෙම් විමි, මේ බඳු පැහැ සටහන් ඇතියෙම් විමි, මේ බඳු ආහාර ඇතියෙම් විමි, මේ බඳු සුවදුක් විඳ-නෙම් විමි, මේ බඳු ආයුසීමා ඇතියෙම් විමි, ඒ මම එයින් සැව අසෝ තැන උපතිමි. එහි ද මේ නම් ඇතියෙම්, මේ ගොත් ඇතියෙම්, මේ බඳු පැහැසටහන් ඇතියෙම්, මේ බඳු ආහාර ඇතියෙම්, මේ බඳු සුවදුක් විඳින්නෙම් විමි, මෙතෙක් ආයු සීමා ඇතියෙම් විමි. ඒ මම එයින් සැවැ මෙහි උපතිමි'යි මෙසේ එක් ජාතියක් ද, ජාති දෙකක් ද, ජාති තුනක් ද, ජාති සතරක් ද, ජාති පසක් ද, ජාති දසයක් ද, ජාති විස්සක්ද, ජාති තිහක් ද, ජාති සතළිසක් ද, ජාති පනසක් ද, ජාති සියයක් ද, ජාති දහසක් ද, ජාති සුවහසක් ද, බොහෝ සංවර්ත කල්ප ද, බොහෝ විවර්ත කල්ප ද, බොහෝ සංවර්ත විවර්ත කල්ප දැයි මෙසේ අනෙකවිධ වූ පෙරැ වූසු කද පිළිවෙල සිහි කෙරෙයි. මේ පරිද්දෙන් ආකාර සහිත වූ උද්දේශ සහිත වූ පෙරැ වූසු නොයෙක් වැදැරුම් කදපිළිවෙල සිහි කෙරෙයි. කෙවට්ටය, මහණ තෙම මෙසේ සමාහිත සිත පිරිසිදු වූ කල්හි...අනෙකවිධ වූ පෙරැ වූසු කදපිළිවෙල සිහි කෙරෙයි යන යමෙක් ඇද්ද, මේ ද ඔහුගේ ප්‍රඥාවෙක් වෙයි.

64. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති: 'ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා'ති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති.

65. සෙය්‍යථාපි කෙවට්ට මහෙක්ඛ සිංඝාටකෙ පාසාදෙ. තත්ථ චක්ඛුමා පුරිසො ඨිතො පස්සෙය්‍ය මනුස්සෙ ගෙහං පවිසන්තෙ'පි රථියා විතිසඤ්චරන්තෙ'පි මහෙක්ඛ සිංඝාටකෙ නිසින්නෙ'පි. තස්ස එවමස්ස: එතෙ මනුස්සා ගෙහං පවිසන්ති. එතෙ නික්ඛමන්ති. එතෙ රථියා විතිසඤ්චරන්ති. එතෙ මහෙක්ඛ සිංඝාටකෙ නිසින්නා'ති. එවමෙව ඛො කෙවට්ට භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති: ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා' ති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති.

64. හේ මෙසේ සමාහිත වූ සිත පිරිසිදු කල්හි, දීප්ත කල්හි, කෙලෙස් නැති කල්හි, උපක්ලේශ පහ වූ කල්හි, මෘදු වූ කල්හි, කර්ම්ණ්‍ය වූ කල්හි, ස්ථිත කල්හි, නිශ්චල බවට පැමිණි කල්හි, සත්ත්වයන්ගේ ච්‍යුති උපපත්ති දක්නා ඥානය පිණිස සිත යොමු කෙරෙයි, නැඹුරු කෙරෙයි. හේ පිරිසිදු වූ, මිනිසුන්ගේ දර්ශනෝපචාරය ඉක්මැ දැක්කැ හැකි දිව්‍ය-සින්, 'අහෝ! මේ භවත් සත්ත්වයෝ කායදුශ්චරිතයෙන් සමන්විතයහ, වාග්දුශ්චරිතයෙන් සමන්විතයහ, මනොදුශ්චරිතයෙන් සමන්විතයහ, ආර්යයන්ට උපවාද කළහ, මිසදිටු වශයෙන් ගත් මිථ්‍යාවූත ඇතියහ. ඒ මොහු කරජකය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහ වූ, දුර්ගතියෙන් හටගත් ගතිය වූ, (කර්මයට තමන් පරවශ බැඳින්) තමනට අවශ්‍ය වැ වැටෙන තැන වූ නිරයට වන්නාහ. මේ භවත් සත්ත්වයෝ වූ කලි කායසුචරිතයෙන් සමන්විතයහ, වාක්සුචරිතයෙන් සමන්විතයහ, මනඃසුචරිතයෙන් සමන්විතයහ, ආර්යයන්ට උපවාද නො කළහ, සම්දිටු ගත්තාහ, සම්දිටු වශයෙන් ගත් ශීලාදිය ඇත්තාහ. ඒ මොහු කාබුත් මරණින් මතු ශෝභන වූ ගති ඇති සඟලොවට වන්නාහ' සි මරණාසන්න වූ ද, එකෙණෙහි පිළිසිඳ ගත්තා වූ ද, ඥාත වූ ද, උසස් වූ ද, මනා පැහැ සටහන් ඇති වූ ද, නොමනා පැහැ සටහන් ඇති වූ ද, සුගතියට පැමිණියා වූ ද, දුර්ගතියට පැමිණියා වූ ද, කර්මය වූ පරිදි ඒ ඒ භවයට ගියා වූ ද සත්ත්වයන් දකී. මෙසේ හේ පිරිසිදු වූ, මානුෂක විෂය ඉක්මැ පැවැති දිව්‍යසින් ඥාත ප්‍රණීත, සුවර්ණ දුර්වර්ණ, සුගත දුර්ගත සත්ත්වයන් දකී. කර්මය වූ පරිදි ඒ ඒ භවය කරා එළැඹැ සිටි සත්ත්වයන් දකී.

65. කෙවඩ්ඩය, යම්සේ සතර මං හන්දියෙක මහල් සහිත ගෙයෙක් වන්නේ ද, එහි උඩු මහලෙහි ඇස් ඇති පුරුෂයෙක් සිටියේ ගෙට පිවිසෙන්නවුන්ත් ගෙන් නික්මෙනවුන්ත් වීදියෙහි ඇත මැත යන එනවුන්ත්, සිවුමංහන්දිය මැද හුන්නවුන්ත් දක්නේ ද, ඒ දක්නා ඔහුට "මේ මිනිස්සු ගෙට පිවිසෙත්, මේ මිනිස්සු ගෙන් නික්මෙත්, මේ මිනිස්සු වීදියෙහි ඇත මැත යෙත්, මොහු සිවුමංහන්දිය මැද උන්නෝ වෙත් යැ" සි මෙසේ සිතෙක් වන්නේ ද, කෙවඩ්ඩය, එ පරිදි ම එ මහණ තෙමේ මෙසේ සමාහිත වූ සිත පිරිසිදු කල්හි දීප්තිමත් කල්හි කෙලෙස් නැති කල්හි උපක්ලේශ පහ වූ කල්හි මෘදු කල්හි කර්ම්ණ්‍ය කල්හි ස්ථිත කල්හි නිශ්චල බවට පැමිණි කල්හි, සත්ත්වයන්ගේ ච්‍යුති උපපත්ති දක්නා ඥාන ලබනු පිණිස සිත යොමු කෙරෙයි, නැඹුරු කෙරෙයි. හේ මානුෂක විෂයය ඉක්මැ පිරිසිදු වූ දිව්‍යසින් "අහෝ! මේ භවත් සත්හු කායදුශ්චරිතයෙන් සමන්විතයහ, වාග්දුශ්චරිතයෙන් සමන්විතයහ, මනොදුශ්චරිතයෙන් සමන්විතයහ, ආර්යයනට උපවාද කළහ, මිසදිටුවහ, මිසදිටු වශයෙන් ගත් වූත ඇතියහ. ඒ මොහු කා බුත් මරණින් මතු, සැපයෙන් පහ වූ, දුර්ගතියෙන් උපන් ගතිය වූ, තමනට තමන් අවශ්‍ය වැ වැටෙන තැන වූ නිරයට වන්හ. එහෙත් මේ භවත් සත්ත්වයෝ වූ කලි කායසුචරිතයෙන් සමන්විතයහ, වාක්සුචරිතයෙන් සමන්විතයහ, මනඃසුචරිතයෙන් සමන්විතයහ, ආර්යයනට උපවාද නො කළහ, සම්දිටු ගත්හ, සම්දිටු විසින් ගත් ශීලාදිය ඇත්තාහ. මොහු කා බුත් මරණින් මතු ශෝභන ගති ඇති සඟලොවට වන්නාහ"සි මෙසේ මරණාසන්න වූ ද, එකෙණෙහි පිළිසඳ ගත්තාවූ ද, පහත් වූ ද, උසස් වූ ද, මනා පැහැ සටහන් ඇති වූ ද, නො මනා පැහැ සටහන් ඇති වූ ද, සුගතියට පැමිණියා වූ ද, දුර්ගතියට පැමිණියා වූ ද කර්මය වූ පරිදි ඒ ඒ භවයට ගිය සත්ත්වයන් දකී. මෙසේ පිරිසිදු වූ, මානුෂක විෂයය ඉක්මැ පැවැති දිව්‍යසින් ඥාත ප්‍රණීත සුවර්ණ දුර්වර්ණ සුගත දුර්ගත සත්ත්වයන් දකී. කර්ම වූ පරිදි ඒ ඒ භවය කරා එළැඹැ සිටි සත්ත්වයන් දකී.

66. යම්පි කෙවට්ට භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ -පෙ- සුඛෙ දුක්ඛෙ යථාභූතං පජානාති, ඉදම්පි'ස්ස හොති පඤ්ඤාය.

67. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති. අයං දුක්ඛසමුදයො'ති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරොධො'ති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති. ඉමෙ ආසවා'ති යථාභූතා පජානාති. අයං ආසවසමුදයො'ති යථාභූතං පජානාති. අයං ආසවනිරොධො'ති යථාභූතං පජානාති. අයං ආසවනිරොධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති. තස්ස එවං ජානතො එවං පස්සතො කාමාසවාපි චිත්තං විමුච්චති. භවාසවාපි චිත්තං විමුච්චති. අවිජ්ජාසවාපි චිත්තං විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති.

68. ඉදං වුච්චති කෙවට්ට අනුසාසනීපාටිහාරියං. ඉමානි ඛො කෙවට්ට තීණි පාටිහාරියානි මයා සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදිතානි.

69 භූතපුබ්බං කෙවට්ට ඉමස්මිංයෙව භික්ඛුසඞ්ඝෙ අඤ්ඤතරස්ස භික්ඛුනො එවං වෙතසො පරිවිතක්කො උදපාදි: කත්ථ නු ඛො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු'ති. අථ ඛො සො කෙවට්ට භික්ඛු තථාරූපං සමාධිං සමාපජ්ජි, යථා සමාහිතෙ චිත්තෙ දෙවයානියා මග්ගා පාතුරහොසි. අථ ඛො සො කෙවට්ට භික්ඛු යෙන චාතුම්මහාරාජිකා දෙවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා චාතුම්මහාරාජිකෙ දෙවෙ එතදවොච: කත්ථ නු ඛො ආවුසො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු?'ති. එවං වුත්තෙ කෙවට්ට චාතුම්මහාරාජිකා දෙවා තං භික්ඛුං එතදවොචුං: මයම්පි ඛො භික්ඛු න ජානාම යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු'ති. අත්ථි ඛො භික්ඛු චත්තාරො මහාරාජානො අම්හෙහි අභික්කන්ততරා ච පණීතතරා ච. තෙ ඛො එතං ජානෙය්‍යුං යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු'ති.

66 කෙවඩ්ඩය, මහණ තෙම මෙසේ සමාහිත සිත පිරිසිදු කල්හි... සුගත දුර්ගත වූ කම් වූ පරිදි ඒ ඒ භවය කරා එළැඹැ සිටි සතුන් දකී යන යමෙක් ඇද්ද, මේ ද ඔහුගේ ප්‍රඥාවෙක් වෙයි.

67. හේ මෙසේ සමාහිත සිත පිරිසිදු වැ දීප්ත වැ නිරුපක්ලේශ වැ උපක්ලේශ පහ වැ මෘදු වැ කර්ම්ණ්‍ය වැ ස්ථිත වැ නිශ්චල බවට පැමිණැ සිටි කල්හි, ආස්‍රවයන්ගේ ක්ෂයය (විනාශය) පිණිස සිත මෝනොවට යොමු කෙරෙයි, මෝනොවට නැඹුරු කෙරෙයි. හෙ තෙමේ 'මේ දුකැ' යි ඇති සැටියෙන් දනී. 'මේ දුක් ඉපැද්මට කාරණයැ' යි ඇති සැටියෙන් දනී. 'මේ දුක් වැනැස්මැ' යි (නිවනැ' යි) ඇති සැටියෙන් දනී. 'මේ දුක් වැනැස්මට යන පිළිවතැ'යි ඇති සැටියෙන් දනී. 'මේහු ආස්‍රවයෝ යැ'යි ඇති සැටියෙන් දනී. 'මේ ආස්‍රවයන් ඉපැද්මට කරුණැ'යි ඇති සැටියෙන් දනී. 'මේ ආස්‍රවනිරෝධයැ' යි ඇති සැටියෙන් දනී. 'මේ ආස්‍රවනිරෝධගාමිනී ප්‍රතිපත්ති යැ'යි ඇති සැටියෙන් දනී. මෙසේ දන්නා මෙසේ දක්නා ඔහුගේ සිත කාමාස්‍රවය කෙරෙන් ද මිදේ. ඔහු සිත භවාස්‍රවය කෙරෙන් ද මිදේ, ඔහු සිත අවිද්‍යාස්‍රවය කෙරෙන් ද මිදේ. (එසේ සිත) මිදුණු කල්හි 'මිදී සිත ආස්‍රව කෙරෙන් මිදුණේ යැ' යි (ප්‍රත්‍යවේක්ෂණ) ඥානය වේ. 'භවොත්පත්තිය ක්ෂීණ විය (භවත් තැබීත භවයෙහි කොටුපදනා ස්වභාවයට පැමිණීයයි). 'මහබ්‍රහ්මචරිය වැස නිමැවිණි. (නිවූ සස්හි සතර මඟින් කළ යුතු සොළොස් වැදෑරුම්) කිස කොටැ නිමැවිණි. මේ බව පිණිස (=මේ ක්ලේශක්ෂයය පිණිස) යළි දු කටයුතු දැයෙක් නැතැ'යි හේ දනී.

68. කෙවඩ්ඩය, මෙය අනුශාසනිප්‍රාතිහාර්යයැ යි කියනු ලැබේ. කෙවඩ්ඩය, මේහු මා විසින් ම වෙළෙසින් දැන පසක් කොට පවසන ලද තුන් පෙළහරහු ය.

69. පෙරැ වූවක් කියමි. කෙවඩ්ඩය, මේ බික්සඟන අතුරෙහි ම වූ මහණක්හට "පඨවිධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු යන මේ සතර මහාභූතයෝ කොතන්හි දී නිරුද්ධ වෙත් දැ" යි මෙසේ සිතැ විතර්කයෙක් උපත. කෙවඩ්ඩය, ඉක්බිති ඒ මහණ යමසේ සිත සමාධිගත කල්හි දෙවයානික මාර්ගය (දෙව්බඹලෝ යන හැකි සෘද්ධිවිධඥානය) පහළ වී ද එසේ වූ සමාධියකට සම්වන. කෙවඩ්ඩය, ඉක්බිති ඒ මහණ සිවු මහාරජුගේ දෙවියන් කරා එළැඹියේ ය. එළැඹ 'ඇවැත්නි, පඨවිධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු යන මේ සතර මහාභූතයෝ කොතන්හි නො ඉතිරි වැ නිරුද්ධ වෙත් දැ?"යි සිවුමහරජුගේ දෙවියන් විමසේ ය. කෙවඩ්ඩය, ඔහු මෙසේ විමසූ කල්හි සිවුමහරජුගේ දෙවියෝ "මහණ, අපි දු පඨවිධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු යන මේ සතර මහාභූතයන් නො ඉතිරි ව නිරුද්ධ වන තැන නො දනුමිහ. මහණ, අපට වඩා පැහැසපුව ඇති, යස ඉපුරු ආදියෙන් අපට වඩා උසස් වූ සිවු වරම් රජුහු තම කෙනෙක් ඇත. පඨවිධාතු ආදි සතර මහාභූතයන් නො ඉතිරි වැ නිරුද්ධ වන තැන ඔහු දන්නාහ යි සිතමු' යි ඔහු ඒ මහණහට කීහ.

70. අථ ඛො සො කෙවට්ට භික්ඛු යෙන චත්තාරො මහාරාජානො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා චත්තාරො මහාරාජෙ එතදවොච: කත්ථ නු ඛො ආවුසො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පඨවිධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති?.

71. එවං වුත්තෙ තෙ කෙවට්ට චත්තාරො මහාරාජානො තං භික්ඛුං එතදවොචුං: මයම්පි ඛො භික්ඛු න ජානාම යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං? පඨවිධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති. අත්ථි ඛො භික්ඛු තාවතිංසා නාම දෙවා අමොහි අභික්කන්ततරා ච පණීततරා ච. තෙ ඛො එතං ජානෙය්‍යුං යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු'ති.

72. අථ ඛො සො කෙවට්ට භික්ඛු යෙන තාවතිංසා දෙවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තාවතිංසෙ දෙවෙ එතදවොච: කත්ථ නු ඛො ආවුසො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පඨවිධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු'ති? එවං වුත්තෙ තෙ කෙවට්ට තාවතිංසා දෙවා තං භික්ඛුං එතදවොචුං: මයම්පි ඛො භික්ඛු න ජානාම යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං: පඨවිධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු'ති. අත්ථි ඛො භික්ඛු සක්කො නාම දෙවානමින්දො අමොහි අභික්කන්ततරො ච පණීततරො ච. සො ඛො ජානෙය්‍ය යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු'ති.

73. අථ ඛො සො කෙවට්ට භික්ඛු යෙන සක්කො දෙවානමින්දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා සක්කං දෙවානමින්දං එතදවොච: කත්ථ නු ඛො ආවුසො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං: පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු'ති; එවං වුත්තෙ කෙවට්ට සක්කො දෙවානමින්දො තං භික්ඛුං එතදවොච: අහම්පි ඛො භික්ඛු න ජානාමි යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පඨවිධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු'ති. අත්ථි ඛො භික්ඛු යාමා නාම දෙවා අමොහි අභික්කන්ततරා ච පණීततරා ච. තෙ ඛො එතං ජානෙය්‍යුං යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පඨවිධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූ'ති.

74. අථ ඛො සො කෙවට්ට භික්ඛු යෙන යාමා දෙවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා යාමෙ දෙවෙ එතදවොච: කත්ථ නු ඛො ආවුසො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පඨවිධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු'ති?. එවං වුත්තෙ කෙවට්ට යාමා දෙවා තං භික්ඛුං එතදවොචුං: මයම්පි ඛො භික්ඛු න ජානාම යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පඨවිධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු'ති. අත්ථි ඛො භික්ඛු සුයාමෙ නාම දෙවපුත්තො අමොහි අභික්කන්ततරෙ ච පණීततරෙ ච. සො ඛො එතං ජානෙය්‍ය යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පඨවිධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු'ති.

70. කෙවට්ටය, ඉක්බිති ඒ මහණ සිවුවරම් රජුන් කරා එළැඹියේ ය. එළැඹ "ඇවැත්නි, පඨවී ආපො තෙජො වායො යන මේ සතර මහා-භූතයෝ කොතන්හි දී නො ඉතිරි වැ නිරුද්ධ වෙත් ද?" යි විචාළේ ය.

71. කෙවට්ටය, ඔහු මෙසේ විචාළ කල්හි සිවුවරම් රජදරුවෝ ඒ මහණහු බණවා, "මහණ, පඨවී ආපො තෙජො වායො යන මේ සතර මහාභූතයෝ කොතන්හි දී නො ඉතිරි ව නිරුද්ධ වෙද්ද'යි මේ කාරණය අපි දු නො දනුමහ. මහණ, අපට වඩා පැහැසපුව ඇති, අපට වඩා උසස් වූ තෙතිස් නම් දෙවි කෙනෙක් ඇත. 'පඨවී ආදි මේ සතර මහාභූතයෝ කොහි නිරුද්ධ වෙත් ද යන මෙය ඔහු නම් දන්නාහ යි සිතමු' යි කීහ.

72. කෙවට්ටය, ඉක්බිති ඒ මහණ තෙතිස් දෙවියන් කරා ගියේ ය. ගොස් 'ඇවැත්නි, පඨවී ආපො තෙජො වායො යන මේ මහාභූත සතර කොහි දී නොඉතිරි ව නිරුද්ධ වෙත් ද?' යි විචාළේ ය. කෙවට්ටය, ඔහු මෙසේ විචාළ කල්හි තෙතිස් දෙවියෝ එ මහණ බණවා, "මහණ, පඨවී ආපො තෙජො වායො යන සතර මහාභූතයෝ කොහි දී නො ඉතිරි වැ නිරුද්ධ වෙද්ද යන මෙය අපි දු නො දනුමහ. මහණ, අපට වඩා පැහැසපුව ඇති, අපට වඩා උතුම් වූ සක්දෙවිඳු නම් කෙනෙක් ඇත. ඔහු පඨවී ආදි මේ සතර මහාභූතයන් නො ඉතිරි ව නිරුද්ධ වන තැන දනිති යි සිතමහ'යි කිවු ය.

73. කෙවට්ටය, ඉක්බිති ඒ මහණ සක්දෙවිඳු කරා එළැඹියේ ය. එළැඹ 'ඇවැත්නි, පඨවී ආපො තෙජො වායො යන මේ සතර මහා-භූතයෝ කොහි දී නො ඉතිරි වැ නිරුද්ධ වෙත් ද?"යි විචාළේ ය කෙවට්ටය, ඔහු මෙසේ විචාළ කල්හි සක්දෙවිඳු ඒ මහණ බණවා, 'මහණ, පඨවී ආපො තෙජො වායො යන සතර මහාභූතයෝ නො ඉතිරි වැ කොහි නිරුද්ධ වෙද්ද' යි මම ද නො දනිමි. මහණ, අපට වඩා පැහැසපුව ද ඇති, අපට වඩා උතුම් ද වූ යාම නම් දෙව් කෙනෙක් ඇත. පඨවී ආපො තෙජො වායො යන මේ සතර මහා භූතයන් නො ඉතිරි ව නිරුද්ධ වන තැන ඔවුන් දනිතැ යි සිතම්" යි කී ය.

74. කෙවට්ටය, ඉක්බිති ඒ මහණ යාම දෙවියන් වෙත ගියේ ය. ගොස් 'ඇවැත්නි, පඨවී ආපො තෙජො වායො යන මේ සතර මහා-භූතයෝ නො ඉතිරි වැ කොහි දී නිරුද්ධ වෙත් ද?"යි මෙය විචාළේ ය. කෙවට්ටය, ඔහු මෙසේ විචාළ කල්හි යාම දෙවියෝ එ මහණ බණවා, "මහණ, පඨවී ආපො තෙජො වායො යන මේ සතර මහාභූතයෝ නොඉතිරි ව කොහි නිරුද්ධ වෙත් ද"යි මෙය අපි ද නො දනුමහ. මහණ, අපට වඩා පැහැසපුව ඇති, අපට වඩා උතුම් වූ සුයාම නම් දෙවිපුතෙක් ඇත. ඔහු පඨවී ආදි මේ සතර මහාභූතයන් නො ඉතිරි වැ නිරුද්ධ වන තැන දනිතැ'යි අපි සිතමහ'යි කිවු ය.

75. අථ ඛො සො කෙවට්ට, භික්ඛු යෙන සුයාමො දෙවපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා සුයාමං දෙවපුත්තං එතදවොච: කත්ථ නු ඛො ආවුසො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං: පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු'ති?. එවං වුත්තෙ කෙවට්ට, සුයාමො දෙවපුත්තො තං භික්ඛුං එතදවොච: අහම්පි ඛො භික්ඛු න ජානාමි යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං: පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු'ති. අත්ථි ඛො භික්ඛු තුසිතා නාම දෙවා අමෙහි අභික්කන්තතරා ච පණීතතරා ච. තෙ ඛො එතං ජානෙය්‍යුං යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං: පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු'ති.

76. අථ ඛො සො කෙවට්ට, භික්ඛු යෙන තුසිතා දෙවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තුසිතෙ දෙවෙ එතදවොච: කත්ථ නු ඛො ආවුසො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං: පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු'ති? එවං වුත්තෙ කෙවට්ට තුසිතා දෙවා තං භික්ඛුං එතදවොචුං: මයම්පි ඛො භික්ඛු න ජානාම යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං: පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු'ති. අත්ථි ඛො භික්ඛු සන්තුසිතො නාම දෙවපුත්තො අමෙහි අභික්කන්තතරො ච පණීතතරො ච. සො ඛො එතං ජානෙය්‍ය යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං: පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු'ති.

77. අථ ඛො සො කෙවට්ට, භික්ඛු යෙන සන්තුසිතො නාම දෙවපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා සන්තුසිතං දෙවපුත්තං එතදවොච: කත්ථ නු ඛො ආවුසො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං: පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු'ති?. එවං වුත්තෙ කෙවට්ට සන්තුසිතො දෙවපුත්තො තං භික්ඛුං එතදවොච: අහම්පි ඛො භික්ඛු න ජානාමි යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං: පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු'ති. අත්ථි ඛො භික්ඛු නිම්මානරතී නාම දෙවා අමෙහි අභික්කන්තතරා ච පණීතතරා ච. තෙ ඛො එතං ජානෙය්‍යුං යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං: පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු'ති.

78. අථ ඛො සො කෙවට්ට, භික්ඛු යෙන නිම්මානරතී දෙවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා නිම්මානරතී දෙවෙ එතදවොච: කත්ථ නු ඛො ආවුසො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං: පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු'ති? එවං වුත්තෙ කෙවට්ට නිම්මානරතී දෙවා තං භික්ඛුං එතදවොචුං: මයම්පි ඛො භික්ඛු න ජානාම යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං: පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු'ති. අත්ථි ඛො භික්ඛු සුනිම්මිතො නාම දෙවපුත්තො අමෙහි අභික්කන්තතරො ච පණීතතරො ච. සො ඛො එතං ජානෙය්‍ය යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථිදං: පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු'ති.

75. කෙවට්ටය, ඉක්බිති ඒ මහණ සුයාම දෙවිපුත් කරා ගියේ ය. ගොස් "ඇවැත්නි, පෘථිවි අප් තෙජස් වායු යන මේ සතර මහා-භූතයෝ කොතන්හි නම් නො ඉතිරි වැ නිරුද්ධ වෙත් ද?" යි මෙය විචාළේ ය. මෙසේ විචාළ කල්හි සුයාම දෙවිපුත් තෙම 'මහණ, පෘථිවි අප් තෙජස් වායු යන සතර මහාභූතයෝ කොහි නිරුද්ධ වෙද්ද යි මම ද නො දනිමි. මහණ, අපට වඩා පැහැසපුව ඇති, අපට වඩා උතුම් වූ තුෂිත නම් දෙව් කෙනෙක් ඇත. ඔවුන් පෘථිවි අප් තෙජස් වායු යන මේ සතර මහාභූතයන් නො ඉතිරි වැ නිරුද්ධ වන තැන දනිති යි සිතමිහ" යි කිවු ය.

76. කෙවට්ටය, ඉක්බිති ඒ මහණ තුෂිත දෙවියන් වෙත එළැඹියේ ය. එළැඹ "ඇවැත්නි, පෘථිවි අප් තෙජස් වායු යන සතර මහාභූතයෝ නො ඉතිරි වැ කොහි නිරුද්ධ වෙද් ද?"යි විචාළේ ය. මෙසේ කී කල්හි තුෂිත දෙවියෝ ඒ මහණ බණවා, "මහණ, පෘථිවි අප් තෙජස් වායු යන සතර මහාභූතයන් නො ඉතිරි වැ නිරුද්ධ වන තැන අපි ද නො දනුමිහ. මහණ, අපට වැඩි තරම් පැහැසපුව ඇති, අපට වඩා උතුම් වූ සනන්තුෂිත නම් දෙවිපුතෙක් ඇත. ඔහු පෘථිවි ආදි මේ සතර මහාභූතයන් නො ඉතිරි වැ නිරුද්ධ වන තැන දනිති'යි සිතමිහ" යි කිවු ය.

77. කෙවට්ටය, එ කල්හි ඒ මහණ සනන්තුෂිත දෙවිපුතු කරා එළැ-ඹියේ ය. එළැඹ, 'ඇවැත්නි, පෘථිවි අප් තෙජස් වායු යන මේ සතර මහාභූතයෝ කොහි දී නො ඉතිරි වැ නිරුද්ධ වෙත් ද?"යි විචාළේ ය. කෙවට්ටය, ඔහු මෙසේ විචාළ කල්හි සන්තුෂිත දෙවිපුත් "මහණ, පෘථිවි අප් තෙජස් වායු යන සතර මහාභූතයෝ නො ඉතිරි වැ කොහි දී නිරුද්ධ වෙද්ද"යි මම නො දනිමි. මහණ, මට වඩා පැහැසපුව ඇති, මට වඩා උතුම් වූ නිම්මාණරති නම් දෙව් කෙනෙක් ඇත. ඔවුන් මේ පෘථිවි ආදි සතර මහා භූතයන් නො ඉතිරි ව නිරුද්ධ වන තැන දනිති, යි සිතමි"යි කී ය.

78. කෙවට්ටය, එ කල්හි ඒ මහණ නිම්මාණරති දෙවියන් කරා එළැඹියේ ය. එළැඹ 'ඇවැත්නි, පෘථිවි අප් තෙජස් වායු යන මේ සතර මහා භූතයෝ නො ඉතිරි වැ කොහි දී නිරුද්ධ වෙත් ද?"යි විචාළේ ය කෙවට්ටය, ඔහු මෙසේ විචාළ කල්හි නිම්මාණරති දෙවියෝ ඒ මහණ බණවා, 'මහණ, පෘථිවි අප් තෙජස් වායු යන මේ සතර මහා භූතයන් නො ඉතිරි ව නිරුද්ධ වන තැන අපි ද නො දනුමිහ. අපට වඩා පැහැසපුව ඇති, අපට වඩා උතුම් වූ සුනිර්මිත නම් දෙවිපුතෙක් ඇත. ඔහු පෘථිවි ආදි මේ සතර මහාභූතයන් නො ඉතිරි ව නිරුද්ධ වන තැන දනිති'යි සිතමිහ"යි කිවු ය.

79. අථ ඛො සො කෙවට්ට, භික්ඛු යෙන සුනිමිත්තො දෙවපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා සුනිමිත්තං දෙවපුත්තං එතදවොච: කත්ථ නු ඛො ආවුසො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍ය-ථිදං: පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු'ති? එවං වුත්තෙ කෙවට්ට සුනිමිත්තො දෙවපුත්තො තං භික්ඛුං එතදවොච: අහම්පි ඛො භික්ඛු න ජානාමි යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං: පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු'ති. අත්ථි ඛො භික්ඛු පරනිමිත්තවසවත්තී නාම දෙවා අමෙහි අභික්කන්තතරා ච පණීත-තරා ච. තෙ ඛො එතං ජානෙය්‍යුං යත්ථිමෙ චත්තාරො මහාභූතා අප-රිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං: පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායො-ධාතු'ති.

80. අථ ඛො සො කෙවට්ට, භික්ඛු යෙන පරනිමිත්තවසවත්තී දෙවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පරනිමිත්තවසවත්තී දෙවෙ එතදවොච: කත්ථ නු ඛො ආවුසො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං: පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු'ති? එවං වුත්තෙ කෙවට්ට පරනිමිත්තවසවත්තී දෙවා තං භික්ඛුං එතදවොචුං: මයම්පි ඛො භික්ඛු න ජානාම යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං: පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායො-ධාතු'ති. අත්ථි ඛො භික්ඛු වසවත්තී නාම දෙවපුත්තා අමෙහි අභික්කන්තතරා ච පණීත-තරා ච. සො ඛො එතං ජානෙය්‍ය යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං: පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු'ති.

81. අථ ඛො සො කෙවට්ට, භික්ඛු යෙන වසවත්තී දෙවපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා වසවත්තිං දෙවපුත්තං එතදවොච: කත්ථ නු ඛො ආවුසො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං: පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු'ති?. එවං වුත්තෙ කෙවට්ට වසවත්තී දෙවපුත්තො තං භික්ඛුං එතදවොච: අහම්පි ඛො භික්ඛු න ජානාමි යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථිදං: පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු'ති. අත්ථි ඛො භික්ඛු බ්‍රහ්මකායිකා නාම දෙවා අමෙහි අභික්කන්තතරා ච පණීතතරා ච. තෙ ඛො එතං ජානෙය්‍යුං යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං: පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු'ති.

82. අථ ඛො සො කෙවට්ට, භික්ඛු තත්ථරූපං සමාධිං සමාපජ්ජි යථාසමාහිතෙ චිත්තෙ බ්‍රහ්මයානියා මඟ්ගො පාතුරහොසි. අථ ඛො සො කෙවට්ට භික්ඛු යෙන බ්‍රහ්මකායිකා දෙවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා බ්‍රහ්මකායිකෙ දෙවෙ එතදවොච: කත්ථ නු ඛො ආවුසො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං: පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු'ති? එවං වුත්තෙ කෙවට්ට බ්‍රහ්මකායිකා දෙවා තං භික්ඛුං එතදවොචුං: මයම්පි ඛො භික්ඛු න ජානාම යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං, පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු'ති. අත්ථි ඛො භික්ඛු බ්‍රහ්මා මහාබ්‍රහ්මා අභිභූ අනභිභූතො අඤ්ඤදත්ථුදසො වසවත්තී ඉස්සරො කත්තා නිම්මාතා සෙට්ඨො සජිතා[1] වසී පිතා භූතභව්‍යානං අමෙහි අභික්කන්තතරො ච පණීතතරො ච. සො ඛො එතං ජානෙය්‍ය යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං: පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු'ති.

---

1. සඤ්ජිතා, කත්ථචි.

79. කෙවට්ටය, එ කල්හි එ මඟණ සුනිර්මිත දෙවිපුත් කරා එළැඹි-යේ ය. එළැඹ, සුනිර්මිත දෙවිපුතුට 'ඇවැත්නි, පෘථිවි අප් තෙජස් වායු යන මේ සතර මහාභූතයෝ කොහි දී නොඉතිරි වැ නිරුද්ධ වෙද්දැ?'යි විචාළේ ය. කෙවට්ටය, මෙසේ විචාළ කල්හි සුනිර්මිත දෙවිපුත් තෙම ඒ මඟණහට 'මඟණ, පෘථිවි අප් තෙජස් වායු යන මේ සතර මහා භූතයන් නො ඉතිරි වැ නිරුද්ධ වන තැන මමත් නො දනිමි. මඟණ, අපම වඩා පැහැසපුව ඇති, අපට වඩා උතුම් වූ පරනිර්මිතවශවර්ති නම් දෙව් කෙනෙක් ඇත. ඔවුන් මේ පෘථිවි ආදි සතර මහාභූතයන් නො ඉතිරි වැ නිරුද්ධ වන තැන දනිති යි සිතමි'යි කී ය.

80. කෙවට්ටය, එ කල්හි ඒ මඟණ පරනිර්මිතවශවර්ති දෙවියන් කරා එළැඹියේ ය. එළැඹ, ඇවැත්නි, පෘථිවි අප් තෙජස් වායු යන සතර මහාභූතයෝ කොතන්හි නො ඉතිරි වැ නිරුද්ධ වෙත් දැ?" යි විචාළේ ය. එසේ විචාළ කල්හි පරනිර්මිතවශවර්ති දෙවියෝ ඒ මඟණහු බණවා, 'මඟණ, අපි දු පෘථිවි ආදි මේ සතර මහාභූතයන් නො ඉතිරි වැ නිරුද්ධ වන තැන නො දනිමු. මඟණ, අපට වඩා පැහැසපුව ඇති, අපට වඩා උතුම් වූ වශවර්ති නම් දෙවිපුතෙක් ඇත. පෘථිවිආදි සතර මහා-භූතයෝ නො ඉතිරි ව. කොහි නිරුද්ධ වෙත් දැයි ඔහු දනිති යි සිතමි'යි ඔහු කිවු ය.

81. කෙවට්ටය, එ කල්හි ඒ මඟණ වශවත් දෙවිපුතු කරා එළැඹි-යේ ය. එළැඹ, 'ඇවැත්නි, පෘථිවි අප් තෙජස් වායු යන සතර මහාභූතයෝ නො ඉතිරි වැ කොතන්හි නිරුද්ධ වෙත් දැ?'යි ඔහු විචාළේ ය. කෙවට්ටය, මෙසේ විචාළ කල්හි, වශවත් දෙවිපුත් ඒ මඟණහට 'මඟණ, පෘථිවි අප් තෙජස් වායු යන මේ සතර මහාභූතයෝ නො ඉතිරි වැ කොතන්හි නිරුද්ධ වෙත් දැ' යි මම ද නො දනිමි. මඟණ, අපට වඩා පැහැසපුව ඇති, අපම වඩා උතුම් බ්‍රහ්මකායික නම් දෙව් කෙනෙක් ඇත. ඔවුන් මේ පෘථිවි ආදි සතර මහාභූතයන් නො ඉතිරි ව නිරුද්ධ වන තැන දනිති යි සිතමි'යි කී ය.

82. කෙවට්ටය, එ කල්හි එ මඟණ යම්සේ සිත සමාහිත කල්හි බ්‍රහ්ම-යානික මාර්ගය (බඹලොව යන මග) පහළ වී ද, එසේ වූ සමාධියකට සම-වැදිණ. කෙවට්ටය, ඉක්බිති ඒ මඟණ බ්‍රහ්මකායික දෙවියන් කරා එළැඹියේ ය. එළැඹ බ්‍රහ්මකායික දෙවියන් බණවා 'ඇවැත්නි, යම් තැනෙක දී පෘථිවිධාතු අප්ධාතු තෙජස්ධාතු වායුධාතු යන සතර මහාභූතයෝ නො ඉතිරි වැ නිරුද්ධ වෙත් නම්, ඒ කොහි දැ? යි විචාළේ ය. කෙවට්ටය, එකල්හි බ්‍රහ්මකායික දෙවියෝ එ මඟණහට 'මඟණ, පෘථිවි අප් තෙජස් වායු යන සතර මහාභූතයෝ නො ඉතිරි වැ කොහි නිරුද්ධ වෙද්දැ'යි අපි දු නො දනුමිහ. මඟණ, අපට වඩා පැහැසපුව ඇති, අපට වඩා උතුම් වූ, මහාබ්‍රහ්ම වූ, සියල්ල මැඩ පවත්නා, කිසිවකු විසින් නො මඩනා ලද, එකාන්තයෙන් සියල්ල දක්නා, සියල්ල තමා වශයෙහි පවත්වන, සියල්ලට ඊශ්වර වූ, සියල්ලෙහි කර්තෘ වූ, සියල්-ලෙහි මැවුම්කරු වූ, සියල්ලනට ශ්‍රෙෂ්ඨ වූ, සියල්ල සකස් කරන, පුරුදු කල වශිතා ඇති, උපන් ද උපදනා ද සත්තට පිය වූ, බ්‍රහ්මයෙක් ඇත. 'මේ පෘථිවි අප් තෙජස් වායු යන සතර මහා භූතයන් ඉතිරි නො වැ නිරුද්ධ වන තැන ඔහු දනිති යි සිතමිහ' යි කී ය.

83. "කහං පනාවුසො එතරහි සො මහාබ්‍රහ්මා?" ති "මයම්පි ඛො භික්ඛු න ජානාම යත්ථ වා බ්‍රහ්මා යෙන වා බ්‍රහ්මා යහිං වා බ්‍රහ්මා'ති. අපි ච භික්ඛු යථා නිමිත්තා දිස්සන්ති ආලොකො සඤ්ජායති ඔභාසො පාතුභවති, බ්‍රහ්මා පාතුභවිස්සති. බ්‍රහ්මුනො හෙතං පුබ්බනිමිත්තං පාතුභාවාය යදිදං ආලොකො සඤ්ජායති ඔභාසො පාතුභවතීති. අථ ඛො සො කෙවට්ට මහාබ්‍රහ්මා න චිරස්සෙව පාතුරහොසි. අථ ඛො සො කෙවට්ට භික්ඛු යෙන මහාබ්‍රහ්මා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තං මහාබ්‍රහ්මානං එතදවොච: කත්ථ නු ඛො ආවුසො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං: පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු'ති?. එවං වුත්තෙ කෙවට්ට සො මහාබ්‍රහ්මා තං භික්ඛුං එතදවොච: අහමස්මි භික්ඛු බ්‍රහ්මා මහාබ්‍රහ්මා අභිභූ අනභිභූතො අඤ්ඤදත්ථුදසො වසවත්තී ඉස්සරො කත්තා නිම්මාතා සෙට්ඨො සජ්තා වසී පිතා භූතභව්‍යානන්ති.

84. දුතියම්පි ඛො සො කෙවට්ට, භික්ඛු තං මහාබ්‍රහ්මානං එතදවොච: න ඛො'හං තං ආවුසො එවං පුච්ඡාමි: කත්ථ නු ඛො ආවුසො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං: පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු'ති?. දුතියම්පි ඛො කෙවට්ට සො මහාබ්‍රහ්මා තං භික්ඛුං එතදවොච: අහමස්මි භික්ඛු බ්‍රහ්මා මහාබ්‍රහ්මා අභිභූ අනභිභූතො අඤ්ඤදත්ථුදසො වසවත්තී ඉස්සරො කත්තා නිම්මාතා සෙට්ඨො සජ්තා වසී පිතා භූතභව්‍යානන්ති.

85. තතියම්පි ඛො සො කෙවට්ට, භික්ඛු තං මහාබ්‍රහ්මානං එතදවොච: න ඛො'හං තං ආවුසො එවං පුච්ඡාමි: කත්ථ නු ඛො ආවුසො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං: පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු'ති?

83. "ඇවැත්නි, ඒ මහාබ්‍රහ්මයා දැන් කොහි වෙසේ ද?"සි. "මහණ, බ්‍රහ්මයා යම් පෙදෙසෙක හෝ යම් දෙසෙක හෝ යම් තැනෙක හෝ ඇතැ සි අපි දැ නො දනිමිහ. මහණ, එහෙත් යම් හෙයෙකින් පෙරනිමිති දක්නා ලැබේ ද: (ලොවැ) එළියෙක් හට ගනී ද, ආලෝකයෙක් පහළ වේ ද, එයින් බ්‍රහ්මයා පහළ වන්නේ ය. එළියෙක් හටගනී, ආලෝකයෙක් පහළ වෙයි යන යමක් වේ නම්, මේය බඹහුගේ පහළ වීමට පෙර නිමිත්ත යැ" සි බ්‍රහ්මකායික දෙවියෝ කිවු ගැ. කෙවට්ටය, එ කල්හි නොබෝ වේලාවෙකින් ම ඒ මහාබ්‍රහ්ම තෙම පහළ විය. කෙවට්ටය, එ කල්හි ඒ මහණ මහබඹුනු කරා එළැඹියේ ය. එළැඹ, "ඇවැත්නි, පඨවිධාතු අපෝධාතු තෙජෝධාතු වායෝධාතු යන සතර මහාභූතයෝ තො ඉතිරි වැ කොහි දී නිරුද්ධ වෙත් ද?"සි මෙ කාරණය ඒ මහබඹුනු විචාළේ ය. කෙවට්ටය, මෙසේ විචාළ කලැ ඒ මහබඹ තෙම, 'මහණ, මම බඹා වෙමි. මහබඹා වෙමි. සියල්ල මැඬ පවත්වන්නෙම් වෙමි කිසිවකු විසිනුදු නො මඩනා ලදුයෙමි වෙමි. එකාන්තයෙන් සියල්ල දක්නෙමි වෙමි. සියල්ල සිය වශයෙහි පවත්වන්-නෙමි වෙමි. හැමට ඊශ්වර වෙමි. සියල්ලෙහි කර්තෘ වෙමි. සියල්ල මවන්නා වෙමි. හැමට ශ්‍රෙෂ්ඨ වෙමි. ලොව සතුන් බෙදන්නා වෙමි. පුරුදු කළ වශිතා ඇතියෙමි වෙමි. උපන්නන්ගේ ද උපදින්නවුන්ගේ ද පියා වෙමි" සි ඒ මහණහට කී ය.

84. කෙවට්ටය, දෙවෙනි වර ද ඒ මහණ ඒ මහබඹහට, "ඇවැත්නි, තෙපි බඹ වහු ද? මහබඹ වහු ද? ලොව මැඬැ පවත්වන්නෝ වහු ද? කිසිවකු විසින් නො මැඬ ලන ලදුවෝ වහු ද? එකාන්තයෙන් සියල්ල දක්නෝ වහු ද? ලොව තමන් වශයෙහි පවත්වන්නෝ වහු ද? ඊශ්වර වහු ද? කර්තෘ වහු ද? නිර්මාතෘ වහු ද? ලොවට ශ්‍රෙෂ්ඨ වහු ද? ලොව බෙදන්නෝ වහු ද? පුරුදු වශිතා ඇතියෝ වහු ද? උපන්නවුන්ගේත් උපදනාවුන්ගේත් පියා වහු ද?"සි මෙසේ තොප නො විචාරමි. වැලි, ඇවැත්නි, පඨවිධාතු ආපෝධාතු තෙජෝධාතු වායෝධාතු යන සතර මහාභූතයෝ තො ඉතිරි වැ කොතන්හි නිරුද්ධ වෙද්ද? සි මෙ සෙයින් ම තොප විචාරමි"සි කී ය. කෙවට්ටය, දෙවෙනි වර ද ඒ මහබඹ තෙම එ මහණහට "මහණ, මම බඹා වෙමි. මහබඹා වෙමි. ලොව මැඬැ පවත්වනුයෙමි වෙමි. කිසිවකු විසිනුත් නො මඩනා ලදුයෙමි වෙමි. එකාන්තයෙන් සියල්ල දක්නෙමි වෙමි. ලොව සිය වශයෙහි පවත්වනු-යෙමි වෙමි. ඊශ්වර වෙමි. කර්තෘ වෙමි. නිර්මාතෘ වෙමි. ලොවට ශ්‍රෙෂ්ඨ වෙමි. ලොව බෙදන්නෙමි වෙමි. පුරුදු වශිතා ඇතියෙමි වෙමි. උපන් උපදනා හැමගේ පියා වෙමි" සි මේ බස් කී ය.

85. කෙවට්ටය, තෙවෙනි වර ද ඒ මහණ ඒ මහබඹහට "ඇවැත්නි, තෙපි බ්‍රහ්ම වහු ද? මහාබ්‍රහ්ම වහු ද? අභිභූ වහු ද? අනභිභූත වහු ද? සර්වදර්ශී වහු ද? වශවර්ති වහු ද? ඊශ්වර වහු ද? කර්තෘ වහු ද? ශ්‍රෙෂ්ඨ වහු ද? ලොව බෙදන්නෝ වහු ද? වශී වහු ද? භූතභව්‍යයන්ගේ පිතා වහු දැ'සි තො විචාරමි. වැලි, පෘථිවි අප් තෙජස් වායු යන මේ සතර මහා භූතයන් තො ඉතිරි ව නිරුද්ධ වන තැන විචාරමි"සි කී ය.

86 අථ ඛො සො කෙවට්ට මහාබ්‍රහ්මා තං භික්ඛුං බාහායං ගහෙත්වා එකමන්තං අපනෙත්වා තං භික්ඛුං එතදවොච: ඉමෙ ඛො මං භික්ඛු බ්‍රහ්ම-කායිකා දෙවා එවං ජානන්ති: නත්ථි කිඤ්චි බ්‍රහ්මුනො අදිට්ඨං, නත්ථි කිඤ්චි බ්‍රහ්මුනො අවිදිතං, නත්ථි කිඤ්චි බ්‍රහ්මුනො අසච්ඡිකතන්ති. තස්මාහං තෙසං සම්මුඛා න ඛ්‍යාකාසිං. අහම්පි ඛො භික්ඛු න ජානාමි යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං: පඨවිධාතු ආපො-ධාතු තෙජොධාතු වායොධාතු'ති. තස්මාතිහ භික්ඛු තුය්හෙවෙතං දුක්කටං තුය්හෙවෙතං අපරද්ධං යං ත්වං තං භගවන්තං අතිසිත්වා බහිද්ධා පරියෙට්ඨිං ආපජ්ජසි ඉමස්ස පඤ්හස්ස වෙය්‍යාකරණාය. ගච්ඡ ත්වං භික්ඛු තමෙව භගවන්තං උපසඞ්කමිත්වා ඉමං පඤ්හං පුච්ඡ. යථා ච තෙ භගවා ඛ්‍යාකරොති තථා නං ධාරෙය්‍යාසීති.

87. අථ ඛො සො කෙවට්ට, භික්ඛු සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය එව-මෙව ඛො බ්‍රහ්මලොකෙ අන්තරහිතො මම පුරතො පාතුරහොසි. අථ ඛො සො කෙවට්ට, භික්ඛු මං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො කෙවට්ට සො භික්ඛු මං එතදවොච: කත්ථ නු ඛො භන්තෙ ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථිදං: පඨවිධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු'ති?

88. එවං වුත්තෙ අහං කෙවට්ට තං භික්ඛුං එතදවොචං: භූතපුබ්බං භික්ඛු සාමුද්දිකා වාණිජා තීරදස්සිං සකුණං ගහෙත්වා නාවාය සමුද්දං අජ්ඣොගාහන්ති. තෙ අතීරදස්සිනියා නාවාය තීරදස්සිං සකුණං මුඤ්චන්ති. සො ගච්ඡතෙව පුරත්ථිමං දිසං, ගච්ඡති දක්ඛිණං දිසං, ගච්ඡති පච්ඡිමං දිසං, ගච්ඡති උත්තරං දිසං, ගච්ඡති උද්ධං, ගච්ඡති අනුදිසං. සචෙ සො සමන්තා තීරං පස්සති, තථාගතකො ව[1] හොති. සචෙ පන සො සමන්තා තීරං න පස්සති, තමෙව නාවං පච්චාගච්ඡති. එවමෙව ඛො ත්වං භික්ඛු යතො යාව බ්‍රහ්මලොකා පරියෙසමානො ඉමස්ස පඤ්හස්ස වෙය්‍යාකරණං නාජ්ඣගා, අථ මම්මෙසෙදව සන්තිකෙ පච්චාගතො. න ඛො එසො භික්ඛු පඤ්හො එවං පුච්ඡිතබ්බො: "කත්ථ නු ඛො භන්තෙ ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං: පඨවිධාතු ආපොධාතු තෙජො-ධාතු වායොධාතු' ති? එවඤ්ච ඛො එසො භික්ඛු පඤ්හො පුච්ඡිතබ්බො:

1. තථාපඤ්ඤාණෙන වා, ඉති.

86. කෙවඩ්ඩය, එ කලෑ ඒ මහබඹා ඒ මහණහු අතින් ගෙන එක් පසකට ඉවත් කොට, 'මහණ, බඹහු නොදත් කිසිත් නැතැ යි, බඹහු නොදුටු කිසිත් නැතැ යි, බඹහු පසක් නොකළ කිසිත් නැතැ' යි මේ බ්‍රහ්ම-කායික දෙවියෝ මෙසේ මා දනිත්. මහණ, එහෙයින් ඔවුන් හමුයෙහි මම හෙළි නො කෙළෙමි. මහණ, 'පඨවීධාතු ආපොධාතු තෙජෝධාතු වායොධාතු යන මේ සතර මහාභූතයෝ නොඉතිරි වැ කොහි දී නිරුද්ධ වෙත් ද'යි මෙය මමත් නො දනිමි. එහෙයින් මහණ, යම්බඳු වූ යුමත් ඒ භාග්‍යවතුන් වහන්සේ ම ඉක්මෑ ගොස් මේ පැණය විසඳ ගැන්ම පිණිස පිවත්හි සෙවීමට පැමිණෙහි ද, ඒ යුමත්හු විසින් ම කළ නොමිනෑ දැයෙකි. යුමත්හු විසින් ම කළ වරදෙකි. මහණ, යුමත් යන්නැ. ඒ භාග්‍යවතුන් වහන්සේ ම වෙත එළැඹ මේ පැණය විචාරන්නැ. යම්සේ භාග්‍යවතුන් වහන්සේ යුමත්හට එය විසඳන සේක් ද, එසේ ම එය පිළිගන්නැ"යි කී ය.

87. කෙවඩ්ඩය, එ කල්හි එ මහණ යම්සේ ශක්තිමත් මිනිසෙක් වක් කළ අත හෝ දික් කරන්නේ ද, දික් කළ අත හෝ වක් කරන්නේ ද, එසේ ම යුහු ව බඹලොවැ අතුරුදහන් වූයේ මා ඉදිරියේ පෙනී සිටියේ ය. කෙවඩ්ඩය, ඉක්බිති ඒ මහණ මා වැද පසෙක හිඳ ගත්තේ ය. කෙවඩ්ඩය, එ මහණ පසෙක හුන්නේ ම "වහන්ස, පඨවීධාතු ආපොධාතු තෙජෝ-ධාතු වායොධාතු යන මේ සතර මහාභූතයෝ කොතන්හි නොඉතිරි වැ නිරුද්ධ වෙත් ද?"යි මෙය විමැලේ ය.

88. කෙවඩ්ඩය, එ මහණ මෙසේ විමැල කලෑ මම එ මහණහට මෙය කිමි: "මහණ, පෙර වූවක් කියමි. මුහුදුවෙළෙන්දේ තෙර දක්නා ලිහිණියකු ගෙන නැවෙකින් මුහුදු වදිත්. නැව තෙරක් නො දක්නා කලෑ තෙර දක්නා ලිහිණියා මුදත්. හේ ද පෙර දිගට යේ ම ය. දකුණු දිගට ද යේම ය. පැලදිගට ද යේම ය. උතුරු දිගට ද යේ ම ය. උඩට ද යේ ම ය. අනුදිගට ද යේ ම ය. ඉදින් හේ හාත්පසැ තෙරක් දක්නේ නම්, එසේ කියේ ම වෙයි (යලි නො ම එයි). ඉදින් හේ හාත්පස තෙරක් නො දක්නේ ද, ඒ නැවට ම පෙරළා එයි. මහණ, එ පරිද්දෙන් ම තෝ බඹලොව දක්වාත් සොයනුයෙහි මේ පැණයේ විසැඳීමක් නො ලදුයෙහි ද, එහෙයින් යලි මා වෙත ම පෙරළා ආයෙහි. මහණ, පඨවීධාතු ආපොධාතු තෙජෝධාතු වායොධාතු යන මේ සතර මහාභූතයෝ කොතන්හි නොඉතිරි වැ නිරුද්ධ වෙත් ද?"යි මෙසේ මේ පැණය නො විමැල යුතු. මහණ, මේ පැණය මෙසේ (මේ මතු දක්වෙන පරිදි) ම විමැල යුතු:

කත්ථ ආපො ච පඨවී තෙජෝ වායො න ගාධති,
කත්ථ දීඝඤ්ච රස්සඤ්ච අණුං ථූලං සුභාසුභං,
කත්ථ නාමඤ්ච රූපඤ්ච අසෙසං උපරුජ්ඣතීති.

තත්‍ර වෙය්‍යාකරණං හවති:

විඤ්ඤාණං අනිදස්සනං අනන්තං සබ්බතො පභං
එත්ථ ආපො ච පඨවී තෙජෝ වායො න ගාධති
එත්ථ දීඝඤ්ච රස්සඤ්ච අණුං ථූලං සුභාසුභං
එත්ථ නාමඤ්ච රූපඤ්ච අසෙසං උපරුජ්ඣති.
විඤ්ඤාණස්ස නිරොධෙන එත්ථෙතං උපරුජ්ඣතීති.

ඉදමෙවාව භගවා. අත්තමනො කෙවට්ටො ගහපතිපුත්තො භගවතො භාසිතං අභිනන්දීති.

කෙවට්ටසුත්තං නිට්ඨිතං එකාදසමං.

පඨවීධාතු, ආපෝධාතු, තේජෝධාතු, වායෝධාතු සඛ්‍යාත උපාදින්න වූ හෙවත් කර්මදීන් හටගත් මේ ධර්ම සමූහය කොතන්හි නො පිහිටා ද? දික් ලුහුඬු කුදුම්හත් ඉටුඅනිටු (උපාදින්න) රූප කොතන්හි (කුමකට පැමිණ) නො පිහිටා ද? තමිරු දෙක කොතන්හි නො ඉතිරි ව නිරුද්ධ වේ ද?" (මහණ, මෙසේ මේ පැණය විචාල සුතු.)

එහි විසැඳීම මෙසේ වෙයි:

දතයුතු බැවින් විඥාණ තම් වූ නිවන අනිදර්ශන ය. (ඇසින් නො දැක්ක හැකි බැවින් නිදර්ශන රහිත ය). උපාදවය යන අන්ත නැති බැවින් අන්ත රහිත ය. හැම අතින් (ඛැස්ස හැකි කම්වහන්) නොට ඇත්තේ ය. මෙහි (මේ නිවනට පැමිණ) පෘථිවීධාතුව ද ආපෝධාතුව ද තේජෝධාතුව ද වායුධාතුව ද නො පිහිටයි. මෙහි දික්ලුහුඬු කුදුම්හත් ඉටුඅනිටු තාම් රූප නො ඉතිරි වැ නිරුද්ධ වෙයි. වරිම (අන්තිම) විඥානයේ නිරෝධයෙන් මේ නිවනෙහි (මේ නිවනට පැමිණ) මේ ධර්ම සමූහය නිරුද්ධ වෙයි.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. කෙවඩ්ඩ ගෘහපතුන් තෙම සතුටු සිතැතියේ භාග්‍යවතුන් වහන්සේගේ වචනය පිළිගත්තේ ය.

එකොළොස් වන කෙවඩ්ඩ සූත්‍රය නිමියේ ය.

12

ලොහිච්චසුත්තං

1. එවං මේ සුතං. එකං සමයං භගවා කොසලේසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝේන සද්ධිං පඤ්චමත්තේහි භික්ඛුසතේහි යේන සාලවතිකා තදවසරි. තේන ඛො පන සමයේන ලොහිච්චො බ්‍රාහ්මණො සාලවතිකං අජ්ඣාවසති සත්තුස්සදං සතිණකට්ඨාදකං සධඤ්ඤං රාජභොග්ගං රඤ්ඤා පසේනදිනා කොසලේන දින්නං රාජදායං බ්‍රහ්මදෙය්‍යං.

2. තේන ඛො පන සමයේන ලොහිච්චස්ස බ්‍රාහ්මණස්ස එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං හොති: ඉධ සමණො වා බ්‍රාහ්මණො වා කුසලං ධම්මං අධිගච්ඡෙය්‍ය, කුසලං ධම්මං අධිගන්ත්වා න පරස්ස ආරොචෙය්‍ය. කිං හි පරො පරස්ස කරිස්සති? සෙය්‍යථාපි නාම පුරිසො බන්ධනං ජින්දිත්වා අඤ්ඤං නවං බන්ධනං කරෙය්‍ය? එවං සම්පදමිදං පාපකං ලොහධම්මං වදාමි. කිං හි පරො පරස්ස කරිස්සතී'ති.

3. අස්සොසි ඛො ලොහිච්චො බ්‍රාහ්මණො: සමණො ඛලු භො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො කොසලේසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝේන සද්ධිං පඤ්චමත්තේහි භික්ඛුසතේහි සාලවතිකං අනුප්පත්තො. තං ඛො පන භවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො: ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා. සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං, සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කේවලපරිපුණ්ණං පරිසුද්ධං. බ්‍රහ්මචරියං පකාසෙති. සාධු ඛො පන තථාරූපානං අරහතං දස්සනං හොතීති.

4. අථ ඛො ලොහිච්චො බ්‍රාහ්මණො හෙසිකං නහාපිතං ආමන්තෙසි: එහි ත්වං සම්ම හෙසිකෙ, යේන සමණො ගොතමො තේනුපසඞ්කම. උපසඞ්කමිත්වා මම වචනේන සමණං ගොතමං අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡ: ලොහිච්චො හො ගොතම බ්‍රාහ්මණො භවන්තං ගොතමං අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡතීති. එවඤ්ච වදෙහි: අධිවාසෙතු කිර භවං ගොතමො ලොහිච්චස්ස බ්‍රාහ්මණස්ස ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝේනාති.

12

ලෝහිච්ච සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදි. එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් පන්සියක් පමණ වූ මහත් මහණමුළුවක් හා කොසොල් රටැ සැරි සරන සේක්, සාලවතිකා නම් ගමට බව සේක. එ සමයෙහි ලෝහිච්ච බමුණු තෙම (මිනිස් ගව මිසු ඇත් අස් ඇ) සතුන්ගෙන් ගැවැසුණු, තණ දඬු දිය ඇති, බොහෝ ධාන්‍ය ඇති, පසේනදී කොසොල් රජුහු විසින් බඹදෙයෙන් තමහට පමුණු කොට දුන් රාජභෝග්‍ය වූ රාජදය වූ සාලවතිකා ගමට අධිපති වැ වෙසෙයි

2. එ සමයෙහි ලෝහිච්ච බමුණහට "මෙහි මහණෙක් හෝ බමුණෙක් හෝ කුසල් දහම් ලබන්නේ නම්, කුසල් දහම් ලැබ එය මෙරමාට තො කියැ යුතු ය. (තමන් ලත් කුසල් දම් තෙමේ ම ගරු කොට විසිය යුතු.) අනෙකෙක් (අනුශාසිතයෙක් අනෙකකුට) (අනුශාසකයක් හට) කවර වැඩක් නම් කරන්නේ ද? තමාගේ පරණ බැඳුමක් සිඳ අන්අළුත් බැඳුමක් කරන්නේ යම්සේ ද, මෙ පරහට කීමේ රුචියත් එසේ ම ලාමක වූ ලොභ ධර්මයෙකැ යි කියමි. අනෙකෙක් අනෙකක්හට කුමක් නම් කරන්නේ ද?"යි මෙසේ වූ ලාමක මිසදිටෙක් උපන්නේ වෙයි.

3. ලෝහිච්ච බමුණු තෙම (රටෙහි පැතිරැ ගිය) මතු දුක්වෙන කථාව ඇසී ය: "භවත්නි, සැහැපුත් වූ, සැහැකුලෙන් නික්මැ පැවැදි වූ මහණගොයුම්හු වතාහි මහණුන් පන්සියක් පමණ වූ මහත් මහණමුළුවක් හා කොසොල්රටැ සැරි සරනුවෝ සාලවතිකාවට පැමිණියහ. ඒ භාග්‍ය-වත්හු මේ මේ කරුණින් රහත්හ, සම්මාසම්බුදුහ, විදුයෙන් හා සරණින් හා සුතුවහ, සුගතහ, ලොව දතුවහ, තමනට වැඩිතරම් එකක්හු නැති පුරිස්දම් සැරියහ, දෙවිමිනිස්නට සථරහ, බුදු හ, භගවත් හ. ඔබ දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත මේ ලොව - මහණ බමුණන් සහිත දෙවිමිනිසුන් සහිත මේ සත්මුළුව තුමූ ම සිය වෙසෙයි නුවණින් දැන පසක් කොට ලොවට දන්වති. ඔබ මුල කලණ මැද කලණ අග කලණ වූ, මතා අරුත් ඇති, පිරිපුන් වියඳුන් ඇති, හැම සැපියෙන් පිරිපුන්, පිරිසිදු දහම් දෙසති. එසේ දෙසනුවෝ සසුන්බඹසර පවසති. එබඳු රහතුන් දැක්ම වූ කැලි මතා එකෙකැ'යි ඒ භාග්‍යවත් ගෞතමයන් වහන්සේ පිළිබඳ මෙසේ වූ මතා කීතුහඬෙක් උස් වැ නැංගේ වේ" යනු යැ.

4. එක්කිති ලෝහිච්ච බමුණු හෙයිකා නම් තැහැටියා බණවා, "සගය, හෙයිකා, මහණ ගොයුම්න් වෙත යා. ගොස් 'පින්වත් ගොයුමාණනි, ලෝහිච්ච බමුණු පින්වත් ගොයුමාණන් ආබාධ නැති නියා, නීරෝග නියා, හැල්ලු පැවැතුම් ඇති නියා, කාබල ඇති නියා, සුව විහරණ ඇති නියා විචාරා'යි මා ඛයින් මහණ ගොයුමාණන් ආබාධ නැති නියා, රෝග නැති නියා, හැල්ලු පැවැතුම් ඇති නියා, කාබල ඇති නියා විචාරව. පින්වත් ගොයුමාණෝ මහණමුළුව හා සෙට දවසට ලෝහිච්ච බමුණාගේ බත ඉවසත් වා යි ද කියව"යි කී ය.

5. එවං භන්තෙති ඛො හෙසිකා නහාපිතො ලොහිච්චස්ස බ්‍රාහ්ම-ණස්ස පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො හෙසිකා නහාපිතො භගවන්තං එතදවොච: ලොහිච්චො භන්තෙ බ්‍රාහ්මණො භග-වන්තං අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡති. එවඤ්ච වදෙති. අධිවාසෙතු කිර භන්තෙ භගවා ලොහිච්චස්ස බ්‍රාහ්මණස්ස සඞ්ඝතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනාති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන.

6. අථ ඛො හෙසිකා නහාපිතො භගවතො අධිවාසනං විදිත්වා උට්ඨායා-සනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා යෙන ලොහිච්චො බ්‍රාහ්මණො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ලොහිච්චං බ්‍රාහ්මණං එතදවොච: අවො-චුම්හා ඛො මයං භන්තෙ තව වචනෙන තං භගවන්තං, ලොහිච්චො භන්තෙ බ්‍රාහ්මණො භගවන්තං අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡති. එවඤ්ච වදෙති: අධිවාසෙතු කිර භන්තෙ භගවා 'ලොහිච්චස්ස බ්‍රාහ්මණස්ස සඞ්ඝතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනා'ති. අධිවුත්ථඤ්ච පන තෙත භගවතාති.

7. අථ ඛො ලොහිච්චො බ්‍රාහ්මණො තස්සා රත්තියා අච්චයෙන සකෙ නිවෙසනෙ පණීතං ඛාදනීයං භොජනීයං පටියාදාපෙත්වා හෙසිකං නහාපිතං ආමන්තෙසි: එහි ත්වං සම්ම හෙසිකෙ යෙන සමණො ගොතමො තෙනුපසඞ්කම. උපසඞ්කමිත්වා සමණස්ස ගොතමස්ස කාලං ආරොචෙහි: කාලො භො ගොතම නිට්ඨිතං භත්තන්තති. එවං භන්තෙ'ති ඛො හෙසිකා නහාපිතො ලොහිච්චස්ස බ්‍රාහ්මණස්ස පටිස්සුත්වා යෙන භගවා තෙනුප-සඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එක-මන්තං ඨිතො ඛො හෙසිකා නහාපිතො භගවතො කාලං ආරොචෙසි: කාලො භන්තෙ. නිට්ඨිතං භත්තන්තති. අථ ඛො භගවා පුබ්බන්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සද්ධිං භික්ඛුසඞ්ඝෙන යෙන සාලවතිකා තෙනුපසඞ්කමි.

8. තෙන ඛො පන සමයෙන හෙසිකා නහාපිතො භගවන්තං පිට්ඨිතො පිට්ඨිතො අනුබන්ධො හොති. අථ ඛො හෙසිකා නහාපිතො භගවන්තං එතදවොච: "ලොහිච්චස්ස භන්තෙ බ්‍රාහ්මණස්ස එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං: ඉධ සමණො වා බ්‍රාහ්මණො වා කුසලං ධම්මං අභිභවෙය්‍ය, කුසලං ධම්මං අභිභවිත්වා න පරස්ස ආරොචෙය්‍ය. කිං හි පරො පරස්ස කරිස්සති. සෙය්‍යථාපි පුරාණං ඛණ්ඩිතං ජිත්වා අඤ්ඤං තවං ඛණ්ඩිතං කරෙය්‍ය, එවං සම්පදමිදං පාපකං ලොභධම්මං වදාමි. කිං හි පරො පරස්ස කරිස්සති"ති. සාධු භන්තෙ භගවා ලොහිච්චං බ්‍රාහ්මණං එතස්මා පාපකා දිට්ඨිගතා විවෙචෙතු"ති. "අපෙපවතාම සියා හෙසිකෙ අපෙපවතාම සියා හෙසිකෙ"ති.

5. "එසේ ය, ස්වාමිනි"යි හෙසිකා තැහැවි ලෝහිච්ච බමුණුට පිළිවදන් දී භාග්‍යවතුන් වහන්සේ වෙත ගියේ ය. ගොස් ඔබ වැඳ පසෙක හුන්නේ ය. පසෙක හුන් ම හෙසිකා තැහැවි "වහන්ස, ලෝහිච්ච බමුණු භාග්‍යවතුන් වහන්සේ නිරාබාධ නියා, නීරෝග නියා, හැල්ලු පැවැතුම් ඇති නියා, කාබල ඇති නියා, සැප විහරණ ඇති නියා විචාරයි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ බික්සඟත හා සෙට දවසට ලෝහිච්ච බමුණාගේ බත ඉවසන සේක් ව"යි මෙසේත් කියා යැ යි භාග්‍යවතුන් වහන්සේට මෙය කී ය. භාග්‍යවතුන් වහන්සේ නිහඬ බැවින් එය ඉවැසූ සේක.

6. ඉක්බිති හෙසිකා තැහැවි තෙම භාග්‍යවතුන් වහන්සේ ඉවැසූ නියා දැන, හුනස්නෙන් නැඟී, භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට, ලෝහිච්ච බමුණා කරා ගියේ ය. ගොස් "වහන්ස, ලෝහිච්ච බමුණු භාග්‍යවතුන් වහන්සේ නිරාබාධ නියා, නීරෝග නියා හැල්ලු පැවැතුම් ඇති නියා, කාබල ඇති නියා, සුව වූසුම් ඇති නියා විචාරයි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ බික්සඟත හා සෙට පිණිස ලෝහිච්ච බමුණුහුගේ බත ඉවසන සේක් ව යි මෙසේ ලෝහිච්ච බමුණු කියායැ යි ඒ භාග්‍යවතුන් වහන්සේට ඔබ වචනයෙන් සැළ කළමිහ"යි ලෝහිච්ච බමුණාට කී ය.

7. ඉක්බිත්තෙන් ලෝහිච්ච බමුණු එ රැය ඇවැමෙන් සිය නිවෙස්හි ප්‍රණීත ඛාද්‍ය භෝජ්‍ය පිළියෙල කරවා හෙසිකා තැහැවියා බණවා, "සගය, හෙසිකා, මෙහි එව, තෝ මහණගොයුමන් කරා යා. ගොස් 'පින්වත් ගොයුමාණනි, වඩිනුවට කල් යැ. බත පිළියෙල කොට නිම වී යැ'යි මහණ ගොයුමාණනව කල් දන්වව'යි කී ය. 'එසේ ය ස්වාමිනි' යි කියා ම හෙසිකා තැහැවි ලෝහිච්ච බමුණාට පිළිවදන් දී භාග්‍යවතුන් වහන්සේ කරා ගියේ ය. ගොස් භාග්‍යවතුන් වැඳ පසෙක සිටියේ ය. පසෙක සිටියාවූ හෙසිකා තැහැවි "වහන්ස, වඩිනුවට කල් ය. බත පිළියෙල කොට නිම වීයැ' යි සැළ කෙළේ ය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරුයෙහි හැඳ පෙරෙව පාසිවුරු ගෙන මහණගණයා හා ශාලවතිකා ගමට වැඩි සේක.

8. එ කල්හි හෙසිකා තැහැවි භාග්‍යවතුන් වහන්සේ පසුපසින් ඔබ හා ම ගියේ වෙයි. එ කලැ හෙසිකා තැහැවි "වහන්ස, මෙකි මහණෙක් හෝ බමුණෙක් හෝ කුසල්දහම් ලැබ ගන්නේ නම්, කුසල් දහම් ලැබැ එය පරහට නො කිය යුතු ය. අනෙකෙක් අනෙකකුට කවර වැඩක් නම් කරන්නේ ද? පැරැණි බැඳුම් සිඳ අන් අළුත් බැඳුමක් කරන්නේ යම්සේ ද, මෙද එසේම ලාමක ලොභධර්මයකැයි කියමි. අනෙකෙක් අනෙකකුට කවර වැඩක් කරන්නේ ද?' යි ලෝහිච්ච බමුණාට මෙබඳු ලාමක මිසදිටෙක් උපත. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ලෝහිච්ච බමුණහු මේ ලාමක මිසදිටෙන් මුදන සේක් වා" යි භාග්‍යවතුන් වහන්සේට කී ය. "හෙසිකා, මැනැව එය වනු ඇත. හෙසිකා, මැනැව. එය වනු ඇතැ" යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

9. අථ ඛො භගවා යෙන ලොහිච්චස්ස බ්‍රාහ්මණස්ස නිවෙසනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. අථ ඛො ලොහිච්චො බ්‍රාහ්මණො බුද්ධප්පමුඛං භික්ඛුසඞ්ඝං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙසි සම්පවාරෙසි. අථ ඛො ලොහිච්චො බ්‍රාහ්මණො භගවන්තං භුත්තාවිං ඔනීතපත්තපාණිං අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ලොහිච්චං බ්‍රාහ්මණං භගවා එතදවොච: "සච්චං කිර තෙ ලොහිච්ච එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං: ඉධ සමණො වා බ්‍රාහ්මණො වා කුසලං ධම්මං අධිගච්ඡෙය්‍ය, කුසලං ධම්මං අධිගන්ත්වා න පරස්ස ආරොචෙය්‍ය, කිං හි පරො පරස්ස කරිස්සති? සෙය්‍යථාපි තාම පුරාණං ඛණ්ඩං ජිත්වා අඤ්ඤං නවං ඛණ්ඩං කරෙය්‍ය, එවං සම්පදමිදං පාපකං ලොභධම්මං වදාමි. කිං හි පරො පරස්ස කරිස්සති?"ති.

"එවං භො ගොතම."

10. "තං කිං මඤ්ඤසි ලොහිච්ච? තත්‍ර ත්වං සාලවතිකං අජ්ඣාවසසී"?ති

"එවං භො ගොතම."

"යො නු ඛො ලොහිච්ච එවං වදෙය්‍ය 'ලොහිච්චො බ්‍රාහ්මණො සාලවතිකං අජ්ඣාවසති. යා සාලවතිකාය සමුදයසඤ්ඤා ලොහිච්චො'ව තං බ්‍රාහ්මණං එකකො පරිහරෙය්‍ය, න අඤ්ඤස්ස දදෙය්‍ය'ති එවංවාදි සො යෙ තං උපජීවන්ති තෙසං අන්තරායකරො වා හොති නො වා?"ති.

"අන්තරායකරො භො ගොතම."

"අන්තරායකරො සමානො ලොහිච්ච හිතානුකම්පි වා තෙසං හොති අහිතානුකම්පි වා?" ති.

"අහිතානුකම්පි භො ගොතම."

"අහිතානුකම්පිස්ස මෙත්තං වා තෙසු චිත්තං පච්චුපට්ඨිතං හොති සපත්තකං වා?" ති.

"සපත්තකං භො ගොතම"

"සපත්තකෙ චිත්තෙ පච්චුපට්ඨිතෙ මිච්ඡාදිට්ඨි වා හොති සම්මාදිට්ඨි වා?ති

"මිච්ඡාදිට්ඨි භො ගොතම."

"මිච්ඡාදිට්ඨිස්ස ඛො අහං ලොහිච්ච ද්වින්නං ගතීනං අඤ්ඤතරං ගතිං වදාමි: නිරයං වා තිරච්ඡානයොනිං වා."

9. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ ලොහිච්ච බමුණාගේ ගෙට එළැඹි සේක. එළැඹ පණවන ලද අස්තැ වැඩ හුන් සේක. එ කලැ ලොහිච්ච බමුණු බුදුපාමොක් බික්ෂාගත ප්‍රණීත.ඛාද්‍ය භෝජ්‍යයෙන් සියතින් සැතැප්වී ය, මොනොවට පැවැරී ය. එසිත් පසු ලොහිච්ච බමුණු දත් වැලැඳූ, පාත්‍රයත් ඉවතට ගත් අතැති භාග්‍යවතුන් වහන්සේට එක් පසෙක එක්තරා මිටි අස්තක් ගෙන හිඳ ගත්තේ ය. එක් පසෙක හිඳ ගත්තා වූ ම ලොහිච්ච බමුණා අමතා, "ලොහිච්චයෙනි, මෙහි මහණෙක් හෝ බමුණෙක් හෝ කුසල් දහම් ලැබ ගත්තේ නම්, කුසල් දහම් ලැබ එය මෙරමාහට නො කියැ ශුතු. අනෙකෙක් අනෙකකුට කවර වැඩක් නම් කරන්නෙන් ද? පරණ බැඳුම් හිඳ අත් අළුත් බැඳුමක් කරන්නේ යම්සේ ද, එසේ ම මෙ කරුණ ද ලාමක ලොභ ධර්මයෙකැ යි කියමි. අනෙකෙක් අනෙකකුට කවර වැඩක් නම් කරන්නේ ද?"යි මෙසේ ලාමක මිසදිටෙක් තොපට උපන්නේ ල. ඒ සැබෑ ද? යි භාග්‍යවතුන් වහන්සේ අසා වදාළ සේක.

[ලොහිච්ච:] "එසේ ය, පින්වත් ගොයුමාණනි."

10. [භාග්‍යවත්හු:] "ලොහිච්චයෙනි, ඒ කිමැ යි සිතවු ද? තෙපි සාලවතිකාවට අධිපති වැ වසනුවෝ නො වහු ද?"

[ලොහිච්ච:] "එසේ ය, පින්වත් ගොයුමාණනි."

[භාග්‍යවත්හු:] "ලොහිච්ච බමුණු සාලවතිකාවට අධිපති වැ වෙසෙයි. සාලවතිකා ගමෙහි උපන් යම් ධනධාන්‍යයෙක් ඇත් නම්, එය ලොහිච්ච බමුණා ම එකලා වැ වළඳන්නේ නම්, අනුනට නො දෙන්නේ නම් මැනැවැ'යි යමෙක් කියන්නේ ද, මෙසේ කියන හෙ තෙම තොප නිසා ජීවත් වන ශ්‍රුතිපරිජනාදිනට ලැබෙන දෑයට අන්තරාය කරන්නෙක් හෝ නො කරන්නෙක් වේ ද?"

[ලොහිච්ච:] "පින්වත් ගොයුමාණනි, හේ ඔවුන් ලබන ඒ දෑයට අනතුරු කරන්නෙක් ය."

[භාග්‍යවත්හු:] "ලොහිච්චය, ලාභයට අන්තරාය කරන්නේ ම හෙතෙම ඔවුනට හිතානුකම්පා ඇතියෙක් හෝ හිතානුකම්පා නැතියෙක් වේ ද?"

[ලොහිච්ච:] "පින්වත් ගොයුමාණනි, හිතානුකම්පා නැතියෙක් වේ."

[භාග්‍යවත්හු:] "හිතානුකම්පා නැතියහුට ඔවුන් කෙරෙහි එළැඹ සිරියේ මිතුරු සිත ද, නැත හොත් සතුරු සිත ද?"

[ලොහිච්ච:] "සතුරු සිත ය, පින්වත් ගොයුමාණනි."

[භාග්‍යවත්හු:] "සතුරු සිත එළැඹ සිටි කල්හි මිසදිටු හෝ වේ ද, නැත හොත් සම්දිටු වේ ද?

[ලොහිච්ච:] "පින්වත් ගොයුමාණනි, මිසදිටු වේ."

[භාග්‍යවත්හු:] "ලොහිච්චය, මිසදිටු ගතුවාහට දෙ ගති අතුරෙන් නිරය හෝ තිරිසන් යොනිය හෝ යන එක්තරා ගතියක් කියමි.

11. තං කිම්මඤ්ඤසි ලොහිච්ච, තත්‍ර රාජා පසෙනදී කොසලො කාසි-කොසලං අජ්ඣාවසති?" ති.

'එවං හො ගොතම."

"යො නු ඛො ලොහිච්ච එවං වදෙය්‍ය: 'රාජා පසෙනදී කොසලො කාසිකොසලං අජ්ඣාවසති. යා කාසිකොසලෙ සමුද්දගලඤ්ඤාති, රාජා'ව තං පසෙනදී කොසලො එකකො පරිභුඤ්ජෙය්‍ය, න අඤ්ඤස්ස දදෙය්‍යා'ති. එවංවාදී සො යෙ රාජානං පසෙනදිං කොසලං උපජීවන්ති තුමෙහ වෙව අඤ්ඤ ච, තෙසං අන්තරායකරො වා හොති, නො වා?" ති.

"අන්තරායකරො හො ගොතම."

"අන්තරායකරො සමානො හිතානුකම්පී වා තෙසං හොති අහිතානුකම්පී වා?" ති.

"අහිතානුකම්පී හො ගොතම."

"අහිතානුකම්පිස්ස ලොහිච්ච චෙතසො වා තෙසු චිත්තං පච්චුපට්ඨිතං සපත්තකං වා?" ති.

"සපත්තකං හො ගොතම."

"සපත්තකෙ චිත්තෙ පච්චුපට්ඨිතෙ මිච්ඡාදිට්ඨි වා හොති සම්මාදිට්ඨි වා?" ති.

"මිච්ඡාදිට්ඨි හො ගොතම."

"මිච්ඡාදිට්ඨිස්ස ඛො අහං ලොහිච්ච ද්වින්නං ගතීනං අඤ්ඤතරං ගතිං වදාමි නිරයං වා තිරච්ඡානයොනිං වා.

12. ඉති කිර 'ලොහිච්ච යො එවං වදෙය්‍ය: ලොහිච්චො බ්‍රාහ්මණො සාලවතිකං අජ්ඣාවසති. යා සාලවතිකායෙ සමුද්දගලඤ්ඤාති, ලොහිච්චො'ව තං බ්‍රාහ්මණො එකකො පරිභුඤ්ජෙය්‍ය, න ච අඤ්ඤස්ස දදෙය්‍යා'ති. එවංවාදී සො යෙ තං උපජීවන්ති, තෙසං අන්තරායකරො හොති. අන්තරායකරො සමානො අහිතානුකම්පී හොති. අහිතානුකම්පිස්ස සපත්තකං චිත්තං පච්චුපට්ඨිතං හොති. සපත්තකෙ චිත්තෙ පච්චුපට්ඨිතෙ මිච්ඡාදිට්ඨි හොති. එවමෙව ඛො ලොහිච්ච යො එවං වදෙය්‍ය: "ඉධ සමණො වා බ්‍රාහ්මණො වා කුසලං ධම්මං අධිගච්ඡෙය්‍ය, කුසලං ධම්මං අධිගන්ත්වා න පරස්ස ආරොචෙය්‍ය, කිං හි පරො පරස්ස කරිස්සති? සෙය්‍යථාපි නාම පුරාණං බන්ධනං ජිණ්ණං අඤ්ඤං නවං බන්ධනං කරෙය්‍ය, එවං සම්පදමිදං පාපකං ලොකධම්මං වදාමි. කිං හි පරො පරස්ස කරිස්සති" ති. එවංවාදී සො යෙ තෙ කුලපුත්තා තථාගතප්පවෙදිතං ධම්මවිනයං ආගම්ම එවරූපං උළාරං විසෙසං අධිගච්ඡන්ති: සොතාපත්තිඵලම්පි සච්ඡිකරොන්ති, සකදාගාමිඵලම්පි සච්ඡිකරොන්ති, අනාගාමිඵලම්පි සච්ඡිකරොන්ති, අරහත්තම්පි සච්ඡිකරොන්ති, යෙවිමෙ දිබ්බා ගබ්භා පරිපාචෙන්ති දිබ්බානං භවානං අභිනිබ්බත්තියා, තෙසං අන්තරායකරො හොති. අන්තරායකරො සමානො අහිතානුකම්පී හොති. අහිතානුකම්පිස්ස සපත්තකං චිත්තං පච්චුපට්ඨිතං හොති. සපත්තකෙ චිත්තෙ පච්චුපට්ඨිතෙ මිච්ඡාදිට්ඨි හොති. මිච්ඡාදිට්ඨිස්ස ඛො අහං ලොහිච්ච ද්වින්නං ගතීනං අඤ්ඤතරං ගතිං වදාමි නිරයං වා තිරච්ඡානයොනිං වා.

11. ලෝහිච්චය, ඒ කීමැ සි සිතහි ද 'පසේනදී කොසොල්රජ කසී කොසොල් දෙ රටට අධිපති වැ වෙසෙයි?.

[ලෝහිච්ච:] "එසේය පින්වත් ගොතමාණනි"

කසීකොසොල් දෙ රටැ යම් ධනධාන්‍යයෙක් උපදනේ නම් එය පසෙනදී කොසොල්රජ ම එකලා වැ වළඳන්නේ නම්, අනුනට නො දෙන්නේ නම් මැනැවැ යි යමෙක් මෙසේ කියන්නේ ද, මෙසේ කියන ඒ තැනැත්තේ පසෙනදී කොසොල් රජු නිසා ජීවත් වන තොප ද අනුන් ද ඒ හැම දෙනාගේ ලාභයට අන්තරාය කරන්නෙක් වේ ද, නැත හොත් අන්තරාය නොකරන්නෙක් වේ ද?"

[ලෝහිච්ච:] "පින්වත් ගොතමාණනි, ලාභයට අන්තරාය කරන්නෙක් වෙයි."

[භාග්‍යවත්හු:] "ලාභයට අන්තරාය කරන්නේ ම ඔවුනට හිතානුකම්පි වේ ද, නැත හොත් අහිතානුකම්පි වේ ද?"

[ලෝහිච්ච:] "පින්වත් ගොතමාණනි, අහිතානුකම්පි වේ."

[භාග්‍යවත්හු:] "අහිතානුකම්පිහට ඔවුන් කෙරෙහි එළැඹ සිටියේ මිතුරු සිත ද, නැත හොත් සතුරු සිත ද.?

[ලෝහිච්ච:] "සතුරු සිත ය, පින්වත් ගොතමාණනි."

[භාග්‍යවත්හු:] "සතුරු සිත එළැඹ සිටි කලැ හේ මිසදිටු වේ ද නැත හොත් සම්දිටු වේ ද?"

[ලෝහිච්ච:] "මිසදිටු වෙයි, පින්වත් ගොතමාණනි."

[භාග්‍යවත්හු:] "ලෝහිච්චය, මිසදිටුවාහට නිරය හෝ තිරිසන් යොන හෝ -මේ දෙගතියෙන් එක්තරා ගතියක් මම කියමි.

12. ලෝහිච්චය, 'ලෝහිච්ච බමුණා සාලවතිකාවට අධිපති වැ වෙසේ. සාලවතිකායෙහි උපදනා තාක් සියලු ධනධාන්‍ය ලෝහිච්ච බමුණා ම එකලා වැ වළඳන්නේ නම්, අනුනට නො දෙන්නේ නම් මැනැවැ'යි යමෙක් මෙසේ කියන්නේ ද, මෙසේ කියන හෙ තෙම තොප නිසා ජීවත් වන හැම දෙනාට ලාභාන්තරායකර වෙයි. ලාභාන්තරාය කරන්නේ ම අහිතානුකම්පි වේ. අහිතානුකම්පි තැනැත්තහුට සතුරු සිත එළැඹ සිටියේ වෙයි. සතුරු සිත එළැඹ සිටි කලැ මිසදිටු වෙයි. එ පරිද්දෙන් ම, ලෝහිච්චය, 'මේහි මහණෙක් හෝ බමුණෙක් හෝ කුසල් දහම් ලබන්නේ ය. කුසල් දහම් ලැබ මේරමාහට නො කියැ සුතු යැ'යි ද, 'අනෙකෙක් අනෙකකුට කවර වැඩක් කරන්නේ ද'යි ද, පරණ බැඳුම සිඳ අන් අළුත් බැඳුමක් කරන්නේ යම් සේ ද, එසේම මෙ කරුණ ලොභධර්මයෙකැ යි කියමි'යි ද, 'අනෙකෙක් අනෙකකුට කවර වැඩක් [කරන්නේ ද'යි ද යමෙක් මෙසේ කියන්නේ නම්, මෙසේ කියන හෙ තෙම - යම් කුලපුත් කෙනෙක් තථාගත බුදුහු දෙසූ දහම්විනය ඇති මේ සසුන් නිසා සෝවාන්-පල පසක් කෙරෙත් ද, සෙදාගැමිපල පසක් කෙරෙත් ද, අනාගැමිපල පසක් කෙරෙත් ද, රහත්පල පසක් කෙරෙත් ද, (එයට නො පොහොසත්) යම් කෙනෙක් දෙව්ලෝහි උපදිනු පිණිස දෙව්ගබ් මුහුකුරවත් ද (දෙව්ලෝ යන පිළිවෙත් පුරත් ද), හේ ඔවුනට ලාභාන්තරායකර වේ. ලාභාන්තරාය කරනුයේ ම අහිතානුකම්පි වෙයි. අහිතානුකම්පි පුඟුලාට සතුරු සිත එළැඹ සිටියේ වෙයි. සතුරු සිත එළැඹ සිටි කල්හි මිසදිටු වෙයි. ලෝහිච්චය, මම මිසදිටුහට (මතු) නිරාගතිය හෝ තිරිසන් යොන හෝ මේ දෙ-ගතියෙන් එක්තරා ගතියක් කියමි.

13. ඉති කිර ලොහිච්ච යො එවං වදෙය්‍ය: 'රාජා පසෙනදි කොසලො කාසිකොසලං අජ්ඣාවසති, යා කාසිකොසලෙ සමුදයසඤ්ඤාති, රාජා'ව තං පසෙනදී කොසලො එකකො පරිභුඤ්ජෙය්‍ය, න අඤ්ඤසං දදෙය්‍යා'ති එවං-වාදී සො යෙ රාජානං පසෙනදිං කොසලං උපජීවන්ති තුමෙහ චෙව අඤ්ඤෙ ච, තෙසං අන්තරායකරො හොති. අන්තරායකරො සමානො අභිනාන්‍යකම්පි හොති. අභිනාන්‍යකම්පිස්ස සපත්තකං චිත්තං පච්චුපට්ඨිතං හොති. සපත්තකෙ චිත්තෙ පච්චුපට්ඨිතෙ මිච්ඡාදිට්ඨි හොති. එවමෙව ඛො ලොහිච්ච යො එවං වදෙය්‍ය: 'ඉධ සමණො වා බ්‍රාහ්මණො වා කුසලං ධම්මං අධිගච්ඡෙය්‍ය, කුසලං ධම්මං අධිගන්ත්වා න පරස්ස ආරොචෙය්‍ය, කිං හි පරො පරස්ස කරිස්සති? සෙය්‍යථාපි නාම පුරාණං බන්ධනං ඡින්දිත්වා අඤ්ඤං නවං බන්ධනං කරෙය්‍ය, එවං සම්පදමිදං පාපකං ලොහධම්මං වදාමි. කිං හි පරො පරස්ස කරිස්සති'ති? එවංවාදී සො යෙ තෙ කුල-පුත්තා තථාගතප්පවෙදිතං ධම්මවිනයං ආගම්ම එවරූපං උළාරං විසෙසං අධිගච්ඡන්ති: සොතාපත්තිඵලම්පි සච්ඡිකරොන්ති, සකදාගාමිඵලම්පි සච්ඡි-කරොන්ති, අනාගාමිඵලම්පි සච්ඡිකරොන්ති, අරහත්තම්පි සච්ඡිකරොන්ති, යෙ විත්ථම දිබ්බා ගබ්භා පරිපාචෙන්ති දිබ්බානං භොගානං අභිනිබ්බත්තියා, තෙසං අන්තරායකරො හොති. අන්තරායකරො සමානො අභිනාන්‍යකම්පි හොති අභිනාන්‍යකම්පිස්ස සපත්තකං චිත්තං පච්චුපට්ඨිතං හොති. සපත්තකෙ චිත්තෙ පච්චුපට්ඨිතෙ මිච්ඡාදිට්ඨි හොති. මිච්ඡාදිට්ඨිස්ස ඛො අහං ලොහිච්ච ද්වින්නං ගතීනං අඤ්ඤතරං ගතිං වදාමි නිරයං වා තිරච්ඡානයොනිං වා.

14 තයො ඛො'මෙ ලොහිච්ච සත්ථාරො යෙ ලොකෙ චොදනාරහා, යො ච පනෙවරූපෙ සත්ථාරො චොදෙති, සා චොදනා භූතා තච්ඡා ධම්මිකා අනවජ්ජා. කතමෙ තයො? ඉධ ලොහිච්ච එකච්චො සත්ථා යස්සත්ථාය අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති, සචාස්ස සාමඤ්ඤත්ථෙ අනනුපපත්තො හොති, සො තං සාමඤ්ඤත්ථං අනනුපාපුණිත්වා සාවකානං ධම්මං දෙසෙති: ඉදං වො හිතාය 'ඉදං වො සුඛාය'ති. තස්ස සාවකා න සුස්සූසන්ති, න සොතං ඔදහන්ති, න අඤ්ඤා චිත්තං උපට්ඨපෙන්ති, වොක්කම්ම ච සත්ථුසාසනා වත්තන්ති. සො එවම්ස්ස චොදෙතබ්බො: "ආයස්මා ඛො යස්සත්ථාය අගාරස්මා අනගාරියං පබ්බජිතො, සො තෙ සාමඤ්ඤත්ථෙ අනනුපපත්තො. තං ත්වං සාමඤ්ඤත්ථං අනනුපාපුණිත්වා සාවකානං ධම්මං දෙසෙසි 'ඉදං වො හිතාය ඉදං වො සුඛාය'ති. තස්ස තෙ සාවකා න සුස්සූසන්ති. න සොතං ඔදහන්ති. න අඤ්ඤා චිත්තං උපට්ඨපෙන්ති වොක්කම්ම ච සත්ථුසාසනා වත්තන්ති"ති. සෙය්‍යථාපි නාම ඔස්සක්කනතියා වා උස්සක්කෙය්‍ය[1], පරමුක්කිං වා ආලිඛෙය්‍ය, එවං සම්පදමිදං පාපකං ලොහධම්මං වදාමි. කිං හි පරො පරස්ස කරිස්සති?" අයං ඛො ලොහිච්ච පඨමො සත්ථා යො ලොකෙ චොදනාරහො, යො ච පනෙවරූපං සත්ථාරං චොදෙති, සා චොදනා භූතා තච්ඡා ධම්මිකා අනවජ්ජා.

---

1. උස්සක්කෙය්‍ය, සොත්‍ය වි.

13. ලෝහිච්චය, 'පසෙනදී කොසොල්රජ කසී කොසොල් දෙරටට අධිපති ව වෙසෑසි. කසී කොසොල් දෙරටැ උපදනා යම් ධනධාන්‍ය රැසෙක් වේ නම්, එය පසෙනදී කොසොල්රජ ම එකලා වැ වළඳන්නේ නම්, අනුනට නො දෙන්නේ නම් මැනැවැයි යමෙක් මෙසේ කියන්නේ නම්, එසේ කියනසුලු හෙ තෙම පසෙනදී කොසොල්රජු තිසා යැපෙන තොපටත් අනුනටත් ලාභාන්තරායකර වෙයි. ලාභාන්තරාය කරන්නේ ම හිතානුකම්පා නැත්තේ වෙයි. හිතානුකම්පා නැතිගහුට සතුරු සිත එළැඹ සිටියේ වෙයි. සතුරු සිත එළැඹ සිටි කලැ මිසදිටු වෙයි. ලෝහිච්චය, එසේ ම 'මෙහි මහණෙක් හෝ බ්‍රාහ්මණෙක් හෝ කුසල් දහම් ලබන්නේ ය, කුසල් දහම් ලැබ, මෙරමාහට නො දෙසියැ ශ්‍රුතු යැයි ද අනෙකෙක් අනෙකකුට කවර වැඩක් කරන්නේ ද? පරණ බැඳුමක් සිඳ අන් අළුත් බැඳුමක් කරන්නේ යම්සේ ද, එසේ මේ කරුණ ලාමක ලොභධර්මයෙකැ යි කියමි. අනෙකෙක් අනෙකකුට කුමක් කරන්නේ ද?' යි යමෙක් මෙසේ කියන්නේ ද, මෙසේ කියන තෙ තෙම යම් කුලපුත් කෙනෙක් බුදුන් වදහළ දහම් විනය නිසා සෝවාන්පලයත් පසක් කෙරෙත් නම්, සෙදගැමි-පලයත් පසක් කෙරෙත් නම්, අනගැමිපලයත් පසක් කෙරෙත් නම්, රහත්පලයත් පසක් කෙරෙත් නම්, මෙසේ වූ මහත් ගුණ විශෙෂ ලබත් නම්, දිව්‍යභවයන්ගේ පහළ වීම පිණිස දෙවිගබ් මුහුකුරවත් නම්, ඔවුන් හැමට ලාභාන්තරායකර වෙයි. ලාභාන්තරාය කරන්නේ ම ඔවුනට හිතානුකම්පා නැත්තේ වෙයි. හිතානුකම්පා නැත්තහුව සතුරු සිත එළැඹ සිටි. සතුරු සිත එළැඹ සිටි කල්හි මිසදිටු වෙයි. මිසදිටුහට මතු නිරය හෝ තිරිසන් යොන හෝ මේ දෙ ගති අතුරෙන් එක්තරා ගතියක් මම කියමි.

14. ලෝහිච්චය, යම් ශාස්තා කෙනෙක් ලොවැ වොදනා ලැබියැ සුත්තෝ ද, යමෙකුත් මෙබඳු ශාස්තෘතට වොදනා කෙරේ ද, ඒ වොදනාව ඇත්තත් සත්‍යත් දැහැමිත් නොවැරැදිත් වේ ද, එසේ වූ මේ ශාස්තෘහු තිදෙනෙකි. කවර තිදෙනෙක් ද යත්: ලෝහිච්චය, මෙහි එක්තරා ශාස්තෘවරයෙක් යමක් පිණිස ගිහිගෙත් නික්මැ පැවිද්දට වත්තේ වේ ද, ඒ ශ්‍රාමණ්‍යාර්ථය (මහණදමේ ඵලය) ඔහු විසින් නො ලද්දේ වෙයි. හේ ඒ ශ්‍රාමණ්‍යාර්ථය නො ලැබ 'මෙය තොපට වැඩ පිණිස වේ. මෙය තොපට සුව පිණිස වේ' යැ යි සව්වනට දහම් දෙසයි. ඔහුගේ සව්වෝ ඔහු බස අසන්නට කැමැති නො වෙත්. ඔහුට කන් යොමු නො කෙරෙත්. දැන ගැන්ම පිණිස සිත නො එළවත්. ඒ ශාස්තෘහුගේ අනුශාසනයෙන් වෙන් ව ම පවතිත්. 'ආයුෂ්මත්හු වනාහි යමක් පිණිස ගිහිගෙත් නික්මැ පැවිදිබවට පැමිණියෝ ද, ඔබ විසින් ඒ ශ්‍රාමණ්‍යාර්ථය නො ලද්දේ වෙයි. ඔබ ඒ ශ්‍රාමණ්‍යාර්ථය නො ලැබ 'මෙය තොපට වැඩ පිණිස වේ. මෙය තොපට සුව පිණිස වේ' යැ යි සව්වනට දහම් දෙසයි. ඒ ඔබ බස සව්වෝ අසනු නො රිසියෙත්. එයට කන් යොමු නො කරත්. දැන ගැන්මෙහි සිත නො එළවත්. ශාස්තෘ වූ ඔබගේ අනුශාසනයෙන් වෙන් ව ද පවතිත්' යි ඒ ශාස්තෘ තෙම මෙසේ වොදනා කරනු ලැබියැ ශ්‍රුතු වන්නේ ය. යම්සේ ඉවත් වැ යන්තියක වෙනට යන්නේ ද, නොකැමැත්තෙන් පිටුපා සිටි තැනැත්තිය වැලැඳ ගන්නේ ද, මෙසේ මේ කරුණ ලාමක ලොභධර්මයක් කොට කියමි. එබඳු ශාස්තෘ වූ අන් තැනැත්තේ අනෙකකුට කවර වැඩක් නම් කරන්නේ ද? ලෝහිච්චය, යම් ශාස්තෘවරයෙක් ලොවැ වොදනා ලැබිය සුතු ද, මේ ඒ පළමු වන ශාස්තෘ ය. යමෙකුත් මෙබඳු ශාස්තෘහට වොදනා කෙරේ නම්, ඒ වොදනාව ඇත්ත ය, සත්‍ය ය, දැහැමි ය, නොවැරැදි ය.

15. පුනචපරං ලොහිච්ච ඉධෙකච්චො සත්ථා යස්සත්ථාය අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති, සච්චස්ස සාමඤ්ඤත්ථො අනුප්පත්තො හොති. සො තං සාමඤ්ඤත්ථං අනුපාපුණිත්වා සාවකානං ධම්මං දෙසෙති 'ඉදං වො හිතාය ඉදං වො සුඛාය'ති. තස්ස තෙ සාවකා සුස්සූසන්ති, සොතං ඔදහන්ති, අඤ්ඤා චිත්තං උපට්ඨපෙන්ති, න ච වොක්කම්ම සත්ථු-සාසනා වත්තන්ති. සො එවම්පස්ස වොදෙතබ්බො: "ආයස්මා ඛො යස්සත්ථාය අගාරස්මා අනගාරියං පබ්බජිතො, සො තෙ සාමඤ්ඤත්ථං අනුප්පත්තො. තං ත්වං සාමඤ්ඤත්ථං අනුපාපුණිත්වා සාවකානං ධම්මං දෙසෙසි 'ඉදං වො හිතාය, ඉදං වො සුඛාය'ති. තස්ස තෙ සාවකා සුස්සූසන්ති, සොතං ඔදහන්ති, අඤ්ඤා චිත්තං උපට්ඨපෙන්ති, න ච වොක්කම්ම සත්ථුසාසනා වත්තන්ති සෙය්‍යථාපි නාම සකං ඛෙත්තං ඔහාය පරඛෙත්තං නිඛ්ඛායි-තබ්බං[1] මඤ්ඤෙය්‍ය, එවං සම්පදමිදං පාපකං ලොභධම්මං වදමි. කිං හි පරො පරස්ස කරිස්සති" ති. අයං ඛො ලොහිච්ච දුතියො සත්ථා යො ලොකෙ වොදතාරහො, යො ච පනෙවරූපං සත්ථාරං වොදෙති, සා වොදනා භූතා තච්ඡා ධම්මිකා අනවජ්ජා

16. පුනචපරං ලොහිච්ච ඉධෙකච්චො සත්ථා යස්සත්ථාය අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති, සච්චස්ස සාමඤ්ඤත්ථො අනුප්පත්තො හොති. සො තං සාමඤ්ඤත්ථං අනුපාපුණිත්වා සාවකානං ධම්මං දෙසෙති 'ඉදං වො හිතාය ඉදං වො සුඛාය'ති. තස්ස සාවකා න සුස්සූසන්ති, න සොතං ඔදහන්ති, න අඤ්ඤා චිත්තං උපට්ඨපෙන්ති, වොක්කම්ම ච සත්ථුසාසනා වත්තන්ති. සො එවම්පස්ස වොදෙතබ්බො: "ආයස්මා ඛො යස්සත්ථාය අගාරස්මා අනගාරියං පබ්බජිතො, සො තෙ සාමඤ්ඤත්ථං අනුප්පත්තො. තං ත්වං සාම-ඤ්ඤත්ථං අනුපාපුණිත්වා සාවකානං ධම්මං දෙසෙසි 'ඉදං වො හිතාය ඉදං වො සුඛාය'ති. තස්ස තෙ සාවකා න සුස්සූසන්ති, න සොතං ඔදහන්ති, න අඤ්ඤා චිත්තං උපට්ඨපෙන්ති, වොක්කම්ම ච සත්ථුසාසනා වත්තන්ති. සෙය්‍යථාපි නාම පුරාණං බණ්ඩනං ඡින්දිත්වා අඤ්ඤං නවං බණ්ඩනං කරෙය්‍ය, එවං සම්පදමිදං පාපකං ලොභධම්මං වදමි. කිං හි පරො පරස්ස කරිස්ස-ති"ති අයං ඛො ලොහිච්ච තතියො සත්ථා යො ලොකෙ වොදතාරහො, යො ච පනෙවරූපං සත්ථාරං වොදෙති, සා වොදනා භූතා තච්ඡා ධම්මිකා අනවජ්ජා.

1. නිදස්සිතබ්බං. කොලා ච,

15. තව ද අනෙකක් කියමි. ලෝහිච්චය, මෙහි එක්තරා ශාස්තෘවරයෙක් යමක් පිණිස පැවිද්දට වන්නේ වේ ද, ඔහු විසින් ඒ ශ්‍රාමණ්‍යාර්ථය නො ලදුයේ වෙයි. හේ ඒ ශ්‍රාමණ්‍යාර්ථය නො ලැබ, 'මෙය තොපට වැඩ පිණිස වේ. මෙය තොපට සුව පිණිස වේ' යැ යි සව්වනට දහම් දෙසයි. ඒ සව්වෝ ඔහු බස් අසනු කැමැති වෙත්. කන් යොමු කෙරෙත්. දැන ගැන්ම පිණිස සිත එළවා තබත්. ඒ ශාස්තෘහුගේ අනුශාසනයෙන් ඉවත් ව නො පවතිත්. "ආයුෂ්මත් තෙමේ යමක් පිණිස ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණියේ ද, ඔබ විසින් ඒ ශ්‍රාමණ්‍යාර්ථය නො ලද්දේ ය. ඔබ ඒ ශ්‍රාමණ්‍යාර්ථය නො ලැබ 'මෙය තොපට වැඩ පිණිස වේ, මෙය තොපට සුව පිණිස වේ' යැ යි සව්වනට දහම් දෙසති. සව්වෝ ඒ ඔබගේ වචනය අසනු කැමැති වෙත්. කන් යොමු කෙරෙත්. දැන ගැන්ම පිණිස සිත එළවා තබත්. ශාස්තෘශාසනයෙන් ඉවත් වැ නො ද පවතිත්. සිය කෙත හැරැ දමා අනුන්ගේ කෙතක් (වල් පැලැවි උදුරා) ඉදුණ කල සුතු කොට සිතන්නේ යම්සේ ද, එසේ මේ කරුණ ලාමක වූ ලෝභධර්මයක් කොට කියමි. එබඳු ශාස්තෘ වූ අන් තැනැත්තේ අනෙකකුට කවර වැඩක් කරන්නේ ද"යි ඒ ශාස්තෘ තෙම චෝදනා ලැබිය සුතු වන්නේ ය. ලෝහිච්චය, ලොවැ යමෙක් චෝදනාර්හ නම්, මේ ඒ දෙවෙනි ශාස්තෘ ය. යමෙකුත් මේබඳු ශාස්තෘවරයකුට චෝදනා කෙරේ නම්, ඒ චෝදනාව භූත ය, සත්‍ය ය, දැහැමි ය, නො වැරැදි ය.

16. තව ද අනෙකක් කියමි. ලෝහිච්චය, මෙහි එක්තරා ශාස්තෘවරයෙක් යමක් පිණිස ගිහිගෙන් නික්ම පැවිද්දට වන්නේ වේ ද, ඔහු විසින් ඒ ශ්‍රාමණ්‍යාර්ථය ලදුයේ වෙයි. හේ ඒ ශ්‍රාමණ්‍යාර්ථය ලැබ, 'මෙය තොපට වැඩ පිණිස වෙයි. මෙය තොපට සුව පිණිස වේ' යැ යි සව්වනට දහම් දෙසයි. සව්වෝ ඔහු බස අසන්නට නො කැමති වෙත්, ඔහුට කන් යොමු නො-කෙරෙත්. දැන ගනු පිණිස සිත එළවා නො තබත්. ඒ ශාස්තෘහුගේ අනුශාසනයෙන් බැහැර ව ද පවතිත්. හෙ තෙම මෙසේ චෝදනා ලැබිය සුතු වන්නේ ය: "ආයුෂ්මත් වතාහි යමක් පිණිස ගිහිගෙන් පැවිද්දට වන්නේ වේ ද, ඔබ විසින් ඒ ශ්‍රාමණ්‍යාර්ථය ලද්දේ ය. ඔබ ඒ ශ්‍රාමණ්‍යාර්ථය ලැබ, 'මෙය තොපට වැඩ පිණිස වේ. මෙය තොපට හිත පිණිස වේ' යැ යි සව්වනට දහම් දෙසති. සව්වෝ ඒ ඔබේ බස් අසනු කැමැති නො වෙත්. ඔබ බසට කන් යොමු නො කෙරෙත්. දැන ගැන්මට සිත එළවා නො තබත්. ඔබ අනුශාසනයෙන් බැහැර ව ද පවතිත්. පරණ බැඳුමක් සිඳ අත් අළුත් බැඳුමක් කරන්නේ යම්සේ ද, මෙසේ මෙ කරුණ ලාමක ලෝභධර්මයක් කොට කියමි. එ බඳු ශාස්තෘ වූ අන් තැනැත්තේ අනෙකකුට කවර වැඩක් නම් කරන්නේ ද"යි ඒ ශාස්තෘ තෙම චෝදනා ලැබිය සුතු වන්නේ ය. ලෝහිච්චය, ලොවැ යමෙක් චෝදනා ලැබීමට සුදුසු ද, මේ ඒ තෙවෙනි ශාස්තෘ ය. යමෙකුත් මේබඳු ශාස්තෘ-හට චෝදනා කෙරේ නම්, ඒ චෝදනාව භූත ය, සත්‍ය ය, දැහැමි ය, නො-වැරැදි ය.

ඉමෙ ඛො ලොහිච්ච තයො සත්ථාරො යෙ ලොකෙ චොදනාරහා, යො ච පතෙවරූපෙ සත්ථාරො චොදෙති, සා චොදනා භූතා තච්ඡා ධම්මිකා අතච්ඡජ්ජා"ති.

17. එවං වුත්තෙ ලොහිච්චො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: "අත්ථි පන හො ගොතම කො චි සත්ථා යො ලොකෙ න චොදනාරහො?"ති.

"අත්ථි ඛො ලොහිච්ච සත්ථා යො ලොකෙ න චොදනාරහො" ති.

"කතමො පන සො හො ගොතම සත්ථා යො ලොකෙ න චොද-නාරහො" ති.

18. ඉධ ලොහිච්ච තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මා-සම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිස-දම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා. සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං, සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරි-පුණ්ණං පරිසුද්ධං. බ්‍රහ්මචරියං පකාසෙති. තං ධම්මං සුණාති ගහපති වා ගහපතිපුත්තො වා අඤ්ඤතරස්මිං වා කුලෙ පච්චාජාතො. සො තං ධම්මං සුත්වා තථාගතෙ සද්ධං පටිලභති. සො තෙන සද්ධාපටිලාභෙන සමන්නාගතො ඉති පටිසංචික්ඛති: "සම්බාධො ඝරාවාසො රජාපථො[1]. අබ්භොකාසො පබ්බජ්ජා. නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා එකන්ත-පරිපුණ්ණං එකන්තපරිසුද්ධං සඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං. යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය"න්ති.

19 සො අපරෙන සමයෙන අප්පං වා භොගක්ඛන්ධං පහාය මහන්තං වා භොගක්ඛන්ධං පහාය අප්පං වා ඤාතිපරිවට්ටං පහාය මහන්තං වා ඤාතිපරිවට්ටං පහාය කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජති. සො එවං පබ්බජිතො සමානො පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො, අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී, සමාදාය සික්ඛති සික්ඛාපදෙසු, කායකම්මෙන සමන්නාගතො කුසලෙන, පරිසුද්ධාජීවො සීලසම්පන්නො ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො භොජනෙ මත්තඤ්ඤූ සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො සන්තුට්ඨො.

---

1. රජොපථො, ඤත්වා.

ලොහිච්චය, ලොවැ යම් කෙනෙක් වොදනාගී ද, මේ ඒ තුන් ශාස්තෘහු ය. යමෙකුත් මේබඳු ශාස්තෘන්ට වොදනා කෙරේ ද, ඒ වොදනාව සැබැ ය, සත්‍ය ය, දැහැමි ය, නො වැරැදි ය."

17. මෙසේ වදාළ කල්හි ලොහිච්ච බමුණු "පින්වත් ගොයුමාණනි, යමෙක් ලොවැ වොදනා නො ලැබිසැ යුතු නම්, එසේ වූ කිසි ශාස්තෘවරයෙකුත් ඇද්ද?"යි භාග්‍යවතුන් වහන්සේ (අසන්) විචාළේ ය.

"ලොහිච්චය, යමෙක් ලොව වොදනා ලැබිය යුතු නො වේ ද, එසේ වූ ශාස්තෘවරයෙක් ඇත් ම යැ"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

"පින්වත් ගොයුමාණනි, යමෙක් ලොවැ වොදනාර්හ නො වේ නම්, ඒ ශාස්තෘ තෙම කවරේ ද?" යි ලොහිච්ච බමුණු පුළුවුන.

18. ලොහිච්චය, මෙහි අර්හත් වූ සම්‍යක්සම්බුද්ධ වූ විද්‍යාචරණ-සම්පන්න වූ සුගත වූ ලෝකවිත් වූ නිරුත්තර පුරුෂදම්‍යසාරථි වූ දෙව්-මිනිස්නට ශාස්තෘ වූ බුද්ධ වූ භගවත් වූ තථාගත තෙමේ ලොවැ පහළ වෙයි. හේ දෙවියන් සහිත වූ මරුන් සහිත වූ බඹුන් සහිත වූ මේ ලෝකය ද, මහණබමුණන් සහිත සමිමිත දෙවියන් (රජුන්) හා සෙසු මිනිසුන් හා සහිත සත්ත්වප්‍රජාව ද තෙමේ විශිෂ්ට නුවණින් දැන, ප්‍රත්‍යක්ෂ කොට, (ඔවුනට) අවබෝධ කරවයි. හේ දහම් දෙසනුයේ ආදියෙහි භද්‍රක (නිවරද) කොට, මධ්‍යයෙහි භද්‍රක කොට, අවසානැ භද්‍රක කොට, අර්ථ සහිත කොට, ව්‍යඤ්ජන සහිත කොට, සම්ප්‍රකාරයෙන් පරිපූර්ණ කොට පරිශුද්ධ කොට දහම් දෙසයි. (එසේ දෙසනුයේ ශික්ෂාත්‍රයයෙන් සංගෘහීත වූ) ශාසනබ්‍රහ්මචර්‍යය ප්‍රකාශ කෙරෙයි. ගෘහපතියෙක් හෝ ගෘහපුත්‍රයෙක් හෝ අන් එක්තරා කුලයෙක උපන්නෙක් හෝ ඒ ධර්මය අසයි. හේ ඒ දහම් අසා තථාගත බුදුරජුහු කෙරෙහි සැදහැ ඇති කෙරෙයි. හේ ඒ ශ්‍රද්ධාලාභයෙන් සමන්විත වූයේ, 'ගිහිගෙයි විසීම සම්බාධයෙකි, රජස්පථ යෙකි, පැවිද්ද (සම්බාධ නැති) අභ්‍යවකාශය (එළිමහන) වැන්න. ගිහිගෙයි වසන්නහු විසින් එකාන්තයෙන් පිරිසිදු කොට, ශඛ-ලිඛිතයක් සේ කොට මේ බඹසර සරන්නට පහසු නො වේ. (එබැවින්) මම කෙහෙරවුලු බහවා, කසාවත් හැඳ පෙරෙවැ, ගිහිගෙන් පැවිදිකිමට වදනෙම් නම් යෙහෙකැ"යි මෙසේ නුවණින් සලකයි.

19. හේ පසු කලෙක අල්ප වූ හෝ සම්පත් රැස හැරැ, මහත් වූ හෝ සම්පත් රැස හැරැ, මඳ වූ හෝ ඤාතිපරිවාර හැරැ, මහත් වූ හෝ ඤාතිපරිවාර හැරැ, කෙහෙරවුලු බහවා, කසාවත් හැඳ පෙරෙවැ, ගිහිගෙන් පැවිදිකිමට වදී හේ මෙසේ පැවිදි වූයේ ම ප්‍රාතිමෝක්ෂසංවරයෙන් සමන්විත වූයේ, ආචාරයෙන් හා ගොචරයෙන් හා යුක්ත වූයේ, සුල්පමාත්‍ර වූ ද වරදෙහි භිය දක්නේ, නොවැරැදි වූ කායවාක්කර්මයෙන් සමන්විත වූයේ, එහෙයින් ම පිරිසිදු ආජීව ඇතියේ, සිල්වත් වූයේ, ඉන්ද්‍රියයන්හි වැසූ දොර ඇතියේ, බොජ්ඣන්හි පමණ දන්නේ, (සත් තන්හි) සිහියෙන් හා නුවණින් හා යුක්ත වූයේ, සිවුපසයෙහි තුන් වැදැරුම් සතුටින් සතුටු වූයේ, ශික්ෂාපදයන්හි සමාදන් වැ ගෙන හික්මෙයි.

20. කථඤ්ච ලොකිකවග්ග භික්ඛු සීලසම්පන්නො හොති? ඉධ ලොකිකවග්ග භික්ඛු පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණභූතහිතානුකම්පී විහරති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං. අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො හොති දින්නාදායී දින්නපාටිකඞ්ඛී අථෙනෙන සුචිභූතෙන අත්තනා විහරති. ඉදම්පි' ස්ස හොති සීලස්මිං. අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී හොති ආරාචාරී[1] විරතො මෙථුනා ගාමධම්මා. ඉදම්පි'ස්ස හොති සීලස්මිං. මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො හොති සච්චවාදී සච්චසන්ධො ථෙතො[2] පච්චයිකො අවිසංවාදකො ලොකස්ස. ඉදම්පි'ස්ස හොති සීලස්මිං. පිසුණං වාචං පහාය පිසුණාය වාචාය පටිවිරතො හොති: ඉතො සුත්වා න අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය, අමුත්‍ර වා සුත්වා න ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය; ඉති භින්නානං වා සන්ධාතා, සංහිතානං වා අනුප්පදාතා, සමග්ගාරාමො සමග්ගරතො සමග්ගනන්දී සමග්ගකරණිං වාචං භාසිතා හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං. ඵරුසං වාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතො හොති. යා සා වාචා නෙලා කණ්ණසුඛා පෙමනීයා[3] හදයඞ්ගමා පොරී බහුජනකන්තා බහුජනමනාපා, තථාරූපිං[4] වාචං භාසිතා හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං. සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතො හොති කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී. නිධානවතිං වාචං භාසිතා හොති කාලෙන සාපදෙසං පරියන්තවතිං අත්ථසඤ්හිතං. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

21. සො බීජගාමභූතගාමසමාරම්භා පටිවිරතො හොති. එකභත්තිකො හොති රත්තූපරතො පටිවිරතො විකාලභොජනා. නච්චගීතවාදිතවිසූක-දස්සනා පටිවිරතො හොති. මාලාගන්ධවිලෙපනධාරණමණ්ඩනවිභූසනට්ඨානා පටිවිරතො හොති. උච්චාසයනමහාසයනා පටිවිරතො හොති. ජාතරූප-රජතපටිග්ගහණා පටිවිරතො හොති. ආමකධඤ්ඤපටිග්ගහණා පටිවිරතො හොති. ආමකමංසපටිග්ගහණා පටිවිරතො හොති. ඉත්ථිකුමාරිකාපටිග්ගහණා පටිවිරතො හොති දාසිදාසපටිග්ගහණා පටිවිරතො හොති.-

1. අනාචාරී, මජ්ඣං 2. ථෙතො, සයං. 3. පෙම්නියා, මජ්ඣං
4. එවරූපිං, කත්ථචි.

20. ලෝහිච්චය, මහණ තෙමේ කෙසේ නම් සිල්වත් වේ ද යත්: ලෝහිච්චය, මෙහි මහණ තෙමේ ප්‍රාණඝාතය හැරලා ප්‍රාණඝාතයෙන් වෙසෙයි. බහා තැබූ දඬුමුගුරු ඇත්තේ (දඬුමුගුරු නො දරන්නේ), බහා තැබූ ආයුධ ඇත්තේ (ආයුධ නො දරන්නේ), පවට පිළිකුල් කරන්නේ, මෛත්‍රියව පැමිණියේ (මෛත්‍රියෙන් යුක්ත වූයේ), සියලු සතුන් කෙරෙහි හිතානුකම්පා ඇති වැ වෙසේ. මේ ද ඔහුගේ සීලයෙක් වේ. හේ අදත්තාදානය හැරලා නොදුන් දෑ ගැන්මෙන් වැළැක්කේ වෙයි. දුන් දෑය ම පිළිගන්නාසුලු වූයේ, දුන් දෑය ම කැමැති වැ ඉවසනසුලු වූයේ, නොසොර වූ පිරිසිදු සිතින් යුතු වැ වෙසේ. මේ ද ඔහුගේ සීලයෙක් වේ. හේ අබ්‍රහ්මචරිය දුරු ලා බඹසර සරන්නේ වෙයි. ගැමිදහමක් වූ මෙවුන්දමින් දුරු වැ හැසිරෙන්නේ, එයින් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ සීලයෙක් වේ. හේ බොරු කීම දුරු ලා බොරු කීමෙන් වැළැක්කේ වෙයි. ඇත්ත කියනසුලු වූයේ, ඇත්තෙන් ඇත්ත ගළපා කියන්නේ, තහවුරු වැ පිහිටි කථා ඇත්තේ, ඇදහිය යුතු කථා ඇත්තේ, ලොව නො රවටන්නේ වෙයි. මේ ද ඔහුගේ සීලයෙක් වේ. හේ කේලාම් කීම දුරු ලා කේලාම් කීමෙන් වැළැක්කේ වේ: මේ තැනින් අසා මෙවුන් (ඔවුන්ගෙන්) බිඳුවනු පිණිස එතැන්හි නො කියනසුලු වූයේ, එ තැනින් අසා ඔවුන් (මෙවුන්ගෙන්) බිඳුවනු පිණිස මේ තන්හි නො කියනසුලු වූයේ, මෙසේ බිඳුණවුන් ගළපන්නේ (සමග කරන්නේ) ද, එකට ගැළැපුණවුන් (සමගියට පැමිණියවුන්) හට රුකුල් දෙන්නේ ද වෙයි. සමගියෙන් සිටින්නවුන් හා වාසය කැමැත්තේ, සමගියෙන් වසන්නවුනට කැමැත්තේ, සමග වැ සිටින්නවුනට සතුටු වනුයේ, සමගිය ඇති කරන බස් කියන්නේ වෙයි. මේ ද ඔහුගේ සීලයෙක් වේ. හේ රළු කිණුම් දුරු ලා රළු බස් දෙඩුමෙන් වැළැක්කේ වෙයි. නිදොස්, කන්කලු, පෙම් උපදවන, පහසුවෙන් සිතැ වැදගන්නා, නොගැමි, බොහෝ දෙනාට ප්‍රිය, බොහෝ දෙනාගේ මන වඩන යම් බසක් වේ ද, එබඳු වූ බස් කියන්නේ වෙයි. මේ ද ඔහුගේ සීලයෙක් වේ. හේ බොල් හිස් දෙඩැවිලි හැරලා බොල් දෙඩැවිල්ලෙන් වැළැක්කේ වෙයි. සුදුසු කාලවේලායෙහි කථා කරනසුලු වූයේ, ඇත්ත ම කියනසුලු වූයේ, එඩ සලසන බසක් ම කියනසුලු වූයේ, තව ලොවුතුරුදහම් ඇසුරු කොට ම කියනසුලු වූයේ, හික්මීම ඇති කරන බසක් ම කියනසුලු වූයේ, සිතැ තබා ගන්නට සුදුසු වූ, කරුණු සහිත වූ, ඉමක් කොනක් ඇති (ප්‍රමාණවත් වූ), දෙලෝ වැඩ හා සම්බඳ වූ ම බසක් සුදුසු කාලයෙහි කියන්නේ වෙයි. මේ ද ඔහුගේ සීලයෙක් වේ.

21. හේ බීජසමූහ (පැළ වන දෑ) ද, භූතසමූහ (පැළ වුණු දෑ) ද සිඳීමෙන් බිඳීමෙන් වැළැක්කේ වෙයි. රෑ බොජුනෙන් වැළැක්කේ, එක් වේලේ වළඳන බත් ඇත්තේ, නොකල්බොජුනෙන් වැළැක්කේ වෙයි. නටනු ගනු වයනු විසුළුදසුන් යන මෙයින් වැළැක්කේ වෙයි. ඇඟැ අඬු තැන් පිරුවීමට, ඇඟ සැරැසීමට කරුණු වන මල්ගඳවිලෙවුන් දැරීමෙන් වැළැක්කේ වෙයි. පමණ ඉක්මි උසසුන් ද, නොකැප වූ මහඅසුන් ද යන දෙකින් ම වැළැක්කේ වෙයි. රන් රිදී මසු කහවණු පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. අමු ධාන්‍ය පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. අමු මස් පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. ස්ත්‍රීන් කුමාරිකාවන් පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි දාසිදසුන් පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි.

අජෙළකපටිග්ගහණා පටිවිරතො හොති. කුක්කුටසූකරපටිග්ගහණා පටිවිරතො හොති. හත්ථිගවාස්සවළවාපටිග්ගහණා පටිවිරතො හොති. ඛෙත්තවත්ථුපටිග්ගහණා පටිවිරතො හොති. දූතෙය්‍යපහිණගමනානුයොගා පටිවිරතො හොති. කයවික්කයා පටිවිරතො හොති. තුලාකූටකංසකූටමානකූටා පටිවිරතො හොති. උක්කොටනවඤ්ඤනනිකතිසාවියොගා පටිවිරතො හොති. ඡේදනවධබන්ධනවිපරාමොසආලොපසහසාකාරා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

22 යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං බීජගාමභූතගාමසමාරම්භං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: මූලබීජං ඛන්ධබීජං ඵලුබීජං අග්ගබීජං බීජබීජමෙව පඤ්චමං. ඉති වා ඉති එවරූපා බීජගාමභූතගාමසමාරම්භා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

23. යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං සන්නිධිකාරපරිභොගං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: අන්නසන්නිධිං පානසන්නිධිං වත්ථසන්නිධිං යානසන්නිධිං සයනසන්නිධිං ගන්ධසන්නිධිං ආමිසසන්නිධිං. ඉති වා ඉති එවරූපා සන්නිධිකාරපරිභොගා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

24. යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විසූකදස්සනං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: නච්චං ගීතං වාදිතං පෙක්ඛං අක්ඛානං පාණිස්සරං වෙතාලං කුම්භථූනං සොභනකං චණ්ඩාලං වංසං ධොපනකං හත්ථියුද්ධං අස්සයුද්ධං මහිසයුද්ධං උසභයුද්ධං අජයුද්ධං මෙණ්ඩයුද්ධං කුක්කුටයුද්ධං වට්ටකයුද්ධං දණ්ඩයුද්ධං මුට්ඨියුද්ධං නිබ්බුද්ධං උය්‍යොධිකං බලග්ගං සෙනාබ්‍යූහං අනීකදස්සනං. ඉති වා ඉති එවරූපා විසූකදස්සනා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

එළුවන් බැටළුවන් පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. කුකුළන් හූරන් පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. ඇතුන් අශ්වයන් වෙළඹුන් ගෙරින් පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. කෙත්වතු පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. ගිහිකතට දූත මෙහෙවර කිරීමෙහි ද ගෙන් ගෙට පණිවුඩ පණන් නෙත යැමෙහි ද යෙදීමෙන් වැළැක්කේ වෙයි. වෙළඳ ගනුදෙනුවෙන් වැළැක්කේ වෙයි. හොරතරුදිවයෙන් කිරුවෙන්, බොරු රන් පැමෙන්, හොර මිනුම්වලින් මිනුමෙන් වැළැක්කේ වෙයි. අල්ලස් ගෙන හිමියන් නොහිමි කිරීමෙන්, තාතා උපායයෙන් අනුන් රැවැටීමෙන්, අගතා දයට හුරු නොඅගතා දයක් පෙන්නා කරන මායායෙන්, මෙ කී නොකී හැම කෙකරුවික කම්වලින් ම වැළැක්කේ වෙයි. අත් පා ආදිය සිඳීමෙන් ද, මැරීමෙන් ද, රැහැන් ආදියෙන් බැඳීමෙන් ද, සැහැසිකම් කිරීමෙන් ද වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වෙයි.

22. යම්සේ සමනර භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, මූලවිජ ද (ගිතුරු ආදි පැළ වන මුල් ද), සකඛ්‍ධ විජ ද (නුග ආදි පැළ වන කඳ ද), පරුවිජ ද (උක් උණ බට ආදි පැළ වන පුරුක් ද), අග්‍රවිජ ද (ඉරිවේරිය ආදි පැළ වන දලු ද), පස් වනු විජවිජ ද (වී ආදි පැළ වන ඇට ද) යන මෙ කී විජසමූහ ද (පැළ වන දෑ ද) භූතසමූහ ද (පැළ වූ දෑ ද) පෙළීමෙහි (සිදුම් බිඳුම් තැළුම් යැ සි) කියන ලද සමාරම්භයෙහි යෙදුණෝ වෙසෙත් ද, හෙ තෙමේ මේ හෝ මෙ බඳු වූ විජ-ග්‍රාමභූතග්‍රාමසමාරම්භයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

23. යම්සේ ඇතැම් භවත් මහණබමුණු කෙනෙක් සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, කත දෑ රැස් කොට තබා ගැන්ම, බොන දෑ රැස් කොට තබා ගැන්ම, වස්ත්‍ර රැස් කොට තබා ගැන්ම, (රිය ගැල් ආදිය ද පාවහන් ආදිය ද යන) යාන රැස් කොට තබා ගැන්ම, ඉහතැ කී දෑ හැර (තවත් තල සහල් ඇ වුවමනා) පසය රැස් කොට තබා ගැන්ම යන මෙසේ වූ සන්නිධිකාරපරිභෝගයෙහි (පසය රැස් කොට තබා ගෙන වැළඳීමෙහි) යෙදී වෙසෙත් ද, හෙ තෙමේ මේ හෝ මෙබඳු වූ හෝ සන්නිධිකාර පරිභෝගයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

24. යම්සේ සමනර භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, නැටුම් ගැයුම් වැයුම්, තවසමජජා (නළුවන් සමූහයක් එක් වැ ජනසමූහයා ඉදිරියේ දක්වන නැටුම්), ආඛ්‍යාන (මහාභාරතාදිය කීම් හෝ ඇසීම), පාණිඝර (අතින් ලොහොබෙර ගැසුම හෝ අත්තල ගැසුම), වේතාල (දඬුමුවා තාලම්පට ගැසීම හෝ මතුරු දපා මළසිරුරු නැගිටුවීම), කුම්භථූන (සිවුරස් බෙර වැයුම), ශොභනක (රංගබලිකරණය හෙවත් රඟමඩුල්ලෙහි දී දෙවතාවතට සෙනොත්‍ර වශයෙන් නානිගීත ගායනය හෝ ප්‍රතිභාතචිත්‍ර කිරීම), සණදවුන් කෙළිය (හෝ අයො-ගුඩක්‍රීඩාව), උණගස් ඔසොවා ගෙන කරන ක්‍රීඩාව, අසිධාවනය (මළවුන්ගේ ඇට සෝදා සුවඳ කවා තබා තකත්සෙමෙහි ඒ වටා සිට උත්සව කිරීම), ඇත්පෙරා, අස්පෙරා, මීයුපෙරා, ගොන්පෙරා, එළුපෙරා, බැටළු-පෙරා, කුකුළුපෙරා, වටුපෙරා, පොලුහරඹ, මිටුයුද, මල්ලපෙරා, යුද පවත්නා තැන් දක්නට යැම, බලසෙන් ගණිනා තැන් දක්නට යැම යන මෙබඳු විපුල දස්නෙහි යෙදී වෙසෙත් ද, හෙ තෙමේ මේ හෝ මේ බඳු වූ විපුල දස්නෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

25. යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපා ලුත්තපමාදට්ඨානානුයොගං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: අට්ඨපදං දසපදං ආකාසං පරිහාරපථං සන්තිකං ඛලිකං ඝටිකං සලාකහත්ථං අක්ඛං පඞ්ගචීරං වඩ්ඩකං මොක්ඛචිකං චිඞ්ගුලකං පත්තාළ්හකං රථකං ධනුකං අක්ඛරිකං මනෙසිකං යථාවජ්ජං. ඉති වා ඉති එවරූපා ලුත්තපමාදට්ඨානානුයොගා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

26. යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං උච්චාසයනමහාසයනං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: ආසන්දිං පල්ලඞ්කං ගොනකං චිත්තකං පටිකං පටලිකං තූලිකං විකතිකං උද්දලොමිං එකන්තලොමිං කට්ඨිස්සං කොසෙය්‍යං කුත්තක්කං හත්ථත්තරං අස්සත්තරං රථත්තරං අජිනපවෙණිං කදලිමිගපවර-පච්චත්ථරණං සඋත්තරච්ඡදං උභතොලොහිතකූපධානං. ඉති වා ඉති එවරූපා උච්චාසයනමහාසයනා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

27. යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජ-නානි භුඤ්ජිත්වා තෙ එවරූපං මණ්ඩනවිභූසනට්ඨානානුයොගං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: උච්ඡාදනං පරිමද්දනං නහාපනං සම්බාහනං ආදාසං අඤ්ජනං මාලාවිලෙපනං මුඛචූණ්ණකං මුඛලෙපනං හත්ථබන්ධං සිඛාබන්ධං දණ්ඩකං තාළිකං ඛග්ගං ඡත්තං චිත්‍රූපාහනං උණ්හීසං මණිං වාලවීජනිං ඔදාතානි වත්ථානි දීඝදසානි. ඉති වා ඉති එවරූපා මණ්ඩනවිභූසනට්ඨානානු-යොගා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

28. යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං තිරච්ඡානකථං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: රාජකථං චොරකථං මහාමත්තකථං සෙනාකථං භයකථං යුද්ධකථං අන්නකථං පානකථං වත්ථකථං සයනකථං මාලාකථං ගන්ධකථං ඤාතිකථං යානකථං ගාමකථං නිගමකථං නගරකථං ජනපදකථං ඉත්ථි-කථං පුරිසකථං [කුමාරකථං කුමාරිකථං] සූරකථං විසිඛාකථං කුම්භට්ඨාන-කථං පුබ්බපෙතකථං නානත්තකථං ලොකක්ඛායිකං සමුද්දක්ඛායිකං ඉතිභවාභවකථං. ඉති වා ඉති එවරූපාය තිරච්ඡානකථාය පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

25. යම්සේ සමහර භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, අවපාතකෙළිය, දසපාතකෙළිය, අහස්දූකෙළිය, මඩුලු පැනුම්, සතකිකා-ක්‍රීඩාව, දුදුකෙළිය, කල්ලි ගැසුම්, සලාඅත්කෙළිය, ගුලකෙළිය, කොළ-නලා පිඹුම්, කෙළිතහලින් හැම්, කරණම් ගැසුම්, කන්තංගුරුවා කෙළිය, කොළනැළියෙන් වැලි ඇ මැනුම්, ක්‍රීඩාරථ පැදවීම්, කුඩා දුන්නෙන් විදීම්, ඇතිරිකෙළිය (පිටේ හෝ අතයේ අකුරු ඇඳ ඒ කියැවීම), සිතු දය කීමේ ක්‍රීඩාව, විකලාංගානුකරණය (කනුන් කොරුන් යන ආදීන් සේ ඉරියවු පැවැත්වීම) යන මෙබඳු වූ පමාවට කරුණු වූ දූකෙළියෙහි යෙදී වෙසෙන් ද, හෙ තෙමේ මේ හෝ මේ බඳු වූ පමාවට කරුණු වූ දූකෙළි-යෙහි යෙදීමෙන් වැළැක්කේ වෙයි මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

26 යම්සේ ඇතැම් භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, දික්සඟළා පුටු ය, පළඟය, මහකොදුපලඟය, විශමනෙන් විසිතුරු කළ එළුලොම්මුවා ඇතිරිය, එළුලොම්මුවා සුදු ඇතිරිය, ගනමල් යෙදූ එළුලොම් ඇතිරිය, තිලිය (පුලුන් මෙන්තය), සිංහරූපාදි රූපවලින් විසිතුරු කළ එළුලොම් ඇතිරිය, දෙපැත්තේ ම ලොම් ඇති එළුලොම්මුවා ඇතිරිය, එක් පැත්තේ පමණක් ලොම් ඇති එළුලොම්මුවා ඇතිරිය, රන්කසුකම් කළ පසතුරුණ, කොසෙය්‍ය ගුණින් විශූ ඇතිරිය, ඇතු පිට එළන ඇතිරිය, අශු පිටැ එළන ඇතිරිය, රියැ එළන ඇතිරිය, ඇඳව සරි ලන සේ අඳුන් දිවිසමින් මසා කළ ඇතිරිය, කෙහෙල්මුවසමින් කළ මහඟු පසතුරුණ, ඉස්දෙර පාමුල රන්කන්වයින් තබා ඇති රතු උඩුවියන් සහිත මහඟු යහන යන මෙබඳු වූ උස්යහන් මහයහන් පරිහරණය කිරීමෙහි යෙදී වෙසෙද් ද, හෙ තෙමේ මේ හෝ මේ බඳු වූ උස්යහන් මහයහන් පරිභෝගයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

27. යම්සේ ඇතැම් භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, සුවඳසුණුයෙන් ඇඟ ඉළීම, අත්පාඇඟි මනා සටහන් ගන්වනුවට තෙල් ගා මැඩීම, සුවඳ දියෙන් නැවීම, උරහිස්ඇඟි මස් වැඩෙනුවට මුගුරින් තැළීම, කැඩපතින් මුහුණ බැලීම, අලංකාර වශයෙන් අඳුන් ගැම්, මල් පැලැඳීම හා විලෙවුන් දැරීම, මුවසුණු මුව-විලෙවුන් දැරීම, හසතාභරණ දැරීම, හිසැ කුඩුම්බිය බැඳීම, විසිතුරු සරයටි දැරීම, විසිතුරු බෙහෙත්තළ දැරීම, කඩු දැරීම, විසිතුරු කුඩ දැරීම, විසිතුරු පාවහන් දැරීම, නලල්පට බැඳීම, සිළුමිණ පැලැඳීම, විසිතුරු සෙමෙර වල්විදුනා දැරීම, දික් දවලු ඇති සුදු රෙදි හැඳීම යන ආදී ඇඟ අඩු තැන් පිරවීමටත් ඇඟ සැරැසීමටත් කරුණු වන ද පරිභෝග කිරීමෙහි යෙදී වෙසෙන් ද, ඒ මහණ තෙමේ මේ හෝ මේ බඳු ද පරිභෝග කිරීමෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

28. යම්සේ වනාහි ඇතැම් භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, රාජකථා චෝරකථා මහාමාත්‍යකථා සෙනාකථා භයකථා යුද්ධකථා ආහාරකථා පානකථා වස්ත්‍රකථා ශයනකථා මාලාකථා ගන්ධකථා ඥාතිකථා යානකථා ග්‍රාමකථා නිගමකථා නගරකථා ජනපදකථා ස්ත්‍රීකථා පුරුෂකථා (කුමාරකථා කුමාරිකථා) ශූරකථා විථිකථා කුම්භට්ඨානකථා තාතාවිකථා ලෝකාඛ්‍යායිකා කථා සමුද්‍රාඛ්‍යායිකාකථා ඉතිභවාභවකථා යන මේ බඳු වූ තිරශ්චීන කථාවන්හි යෙදී වෙසෙන් ද, ඒ මහණ තෙමේ මේ කී හෝ මෙයින් අන්‍ය වූ හෝ මේ බඳු කථාවලින් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

29. යථා වා පනෙකෙ හොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විඝාසාහිකකථං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි. අහං ඉමං ධම්මවිනයං ආජානාමි. කිං ත්වං ඉමං ධම්මවිනයං ආජානිස්සසි? මිච්ඡාපටිපන්නො ත්වමසි. අහමස්මි සම්මාපටිපන්නො, සහිතං මෙ, අසහිතං තෙ[1], පුරෙ වචනීයං පච්ඡා අවච. පච්ඡා වචනීයං පුරෙ අවච. ආවිණ්ණං තෙ විපරාවත්තං ආරොපිතො තෙ වාදො, නිග්ගහිතො ත්වමසි. චර වාදප්පමොක්ඛාය. නිබ්බෙඨෙහි වා සචෙ පහොසීති. ඉති වා ඉති එවරූපාය විඝාසාහිකකථාය පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

30. යථා වා පනෙකෙ හොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං දූතෙය්‍යපහිණගමනානුයොගමනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: රාජූනං රාජමහාමත්තානං ඛත්තියානං බ්‍රාහ්මණානං ගහපතිකානං කුමාරානං "ඉධ ගච්ඡ අමුත්‍රාගච්ඡ. ඉදං හර. අමුත්‍ර ඉදං ආහරා"ති. ඉති වා ඉති එවරූපා දූතෙය්‍යපහිණගමනානුයොගා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

31. යථා වා පනෙකෙ හොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ කුහකා ච හොන්ති ලපකා ච නෙමිත්තිකා ච නිප්පෙසිකා ච ලාභෙන ච ලාභං නිජිගිංසිතාරො. ඉති වා ඉති එවරූපා කුහනලපනා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

32. යථා වා පනෙකෙ හොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථිදං: අඞ්ගං නිමිත්තං උප්පාතං සුපිනං ලක්ඛණං මූසිකවස්සිතං අග්ගිහොමං දබ්බිහොමං ථුසහොමං තණ්ඩුලහොමං සප්පිහොමං තෙලහොමං මුඛහොමං ලොහිතහොමං අඞ්ගවිජ්ජා වත්ථුවිජ්ජා ඛත්තවිජ්ජා සිවවිජ්ජා භූතවිජ්ජා භූරිවිජ්ජා අග්ගිවිජ්ජා විසවිජ්ජා විච්ඡිකවිජ්ජා මූසිකවිජ්ජා සාකුණවිජ්ජා වායසවිජ්ජා පක්කජ්ඣානං සරපරිත්තානං මිගපක්ඛං. ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

---

1. සහිතං මෙ, අසහිතං තෙ?

29. යම්සේ ඇතැම් භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, "තෝ මේ දහම් විනය නො දනිහි. මම ම මේ දහම් විනය දනිමි. මේ දහම් විනය කිමැ හි තෝ දනිහි ද? තෝ වරදවා පිළිපන්නෙහි. මම මැනැවින් පිළිපන්නෙමි වෙමි. මා බස කරුණු සහිත ය. තා බස කරුණු රහිත ය. තෝ පළමුයෙන් කියැ යුත්ත පසු වැ කියෙහි ය. පසු වැ කියැ යුත්ත පළමුයෙන් කියෙහි ය. තා කලක් ම පුහුණු කළ දය මාගේ එක් වචනයෙන් ම පෙරැලී ගියේ ය. මා විසින් තව දොස් නැගිණ. මා විසින් නිගන්තා ලද්දෙහි. මා තැඹ දෙසින් මිදෙන්නව හැසිරෙව (ඒ ඒ තැන ගොස් උගනුව). හැකි නම් එය විසඳව" යන ආදීන් මෙබඳු වූ උනුන් බැණ දෙඩා ගැනුම්හි යෙදෙත් ද, ඒ මහණ තෙමේ මෙ කී හෝ අන් මෙබඳු වූ හෝ බැණ දෙඩා ගැන්මෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ සීලයෙක් වේ.

30. යම්සේ සමහර භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ "මෙහි යන්නැ. අසෝ තැනට එන්නැ. මෙය ගෙනැ යන්නැ. අසෝ තැනට මෙය ගෙනෙන්නැ"හි කළ නියොග පිළිගත, රජුන්ගේ රජමහඇමැතියන්ගේ ක්‍ෂත්‍රියයන්ගේ බමුණන්ගේ ගැහැටියන්ගේ රජ-කුමරුවන්ගේ මෙ බඳු දූත මෙහෙවරෙහි, පණිවුඩ ගෙන යැමෙහි යෙදී වෙසෙත් ද, ඒ මහණ තෙමේ මෙ කී හෝ අන් මෙ වැනි වූ හෝ දූත මෙහෙවරින්, පණිවුඩ ගෙන යැමෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ සීලයෙක් වේ.

31. යම්සේ සමහර භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, කුහකකම කරන්නෝ වෙත් ද, ලාභසත්කාර පතා අනුන් හිත් ඇදෙන සේ වූ වාටු බස් දෙඩන්නෝ වෙත් ද, හිවු පසය ලබනු සඳහා කහින් හෝ බහින් ඇඟැවීම් කරන්නෝ වෙත් ද, ලාභ-පෙක්‍ෂායෙන් අනුනට ගරහන්නෝ වෙත් ද, ලාභයෙන් ලාභය සොයන්නෝ වෙත් ද, ඒ මහණ තෙමේ මෙ කී ද මෙ බඳු වූ ද කුහනලපනවලින් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ සීලයෙක් වේ.

32. යම්සේ ඇතැම් භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, අංගශාස්ත්‍රය, නිමිත්තශාස්ත්‍රය, උත්පාතලක්‍ෂණය, සුපිනශාස්ත්‍රය, ලක්‍ෂණශාස්ත්‍රය, මූෂිකවෂිත්නවිද්‍යාව, අග්නිහොමය, දර්වීහොමය, තුෂහොමය, කණහොමය, තණ්ඩුලහොමය, සර්පිර්හොමය, තෛලහොමය, මුඛහොමය, ලොහිතහොමය, අංගවිද්‍යාව, වාස්තුවිද්‍යාව, ක්‍ෂත්‍රවිද්‍යාව, ශිවවිද්‍යාව, භූතවිද්‍යාව, භූරිවිද්‍යාව, අහිවිද්‍යාව, විෂවිද්‍යාව, වෘශ්චිකවිද්‍යාව, මූෂිකවිද්‍යාව, ශාකුනවිද්‍යාව, වායසවිද්‍යාව, පක්වඛ්‍යානය, ශරපරිත්‍රාණය, මෘගපක්‍ෂය යන මෙ කී හෝ මෙබඳු වූ හෝ තිරශ්චීනවිද්‍යයෙන්, මිථ්‍යාජීවයෙන් දිවි පවත්-වත් ද, ඒ මහණ තෙමේ මෙ කී ද මෙ බඳු වූ ද තිරශ්චීනවිද්‍යයෙන් මිථ්‍යා-ජීවයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ සීලයෙක් වෙයි.

33. යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙනති, සෙය්‍යථිදං: මණිලක්ඛණං වත්ථලක්ඛණං දණ්ඩලක්ඛණං අසිලක්ඛණං උසුලක්ඛණං ධනුලක්ඛණං ආවුධලක්ඛණං ඉත්ථිලක්ඛණං පුරිසලක්ඛණං කුමාරලක්ඛණං කුමාරිලක්ඛණං දාසලක්ඛණං දාසිලක්ඛණං හත්ථිලක්ඛණං අස්සලක්ඛණං මහිසලක්ඛණං උසභලක්ඛණං ගොලක්ඛණං අජලක්ඛණං මෙණ්ඩලක්ඛණං කුක්කුටලක්ඛණං වට්ටකලක්ඛණං ගොධා-ලක්ඛණං කණ්ණිකාලක්ඛණං කච්ඡපලක්ඛණං මිගලක්ඛණං. ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

34. යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙනති, සෙය්‍යථිදං: "රඤ්ඤං නියානං භවිස්සති. රඤ්ඤං අනියානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං උපයානං භවිස්සති. බාහිරානං රඤ්ඤං අපයානං භවිස්සති. බාහිරානං රඤ්ඤං උපයානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං අපයානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං ජයො භවිස්සති. බාහිරානං රඤ්ඤං පරාජයො භවිස්සති. බාහිරානං රඤ්ඤං ජයො භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං පරාජයො භවිස්සති. ඉති ඉමස්ස ජයො භවිස්සති. ඉමස්ස පරාජයො භවිස්සති." ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

35. යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙනති, සෙය්‍යථිදං: "චන්දග්ගාහො භවිස්සති. සූරියග්ගාහො භවිස්සති. නක්ඛත්තග්ගාහො භවිස්සති. චන්දිමසූරියානං පථගමනං භවි-ස්සති. චන්දිමසූරියානං උපපථගමනං භවිස්සති. නක්ඛත්තානං පථගමනං භවිස්සති. නක්ඛත්තානං උපපථගමනං භවිස්සති. උක්කාපාතො භවිස්සති. දිසාඩාහො භවිස්සති. භූමිචාලො භවිස්සති. දෙවදුන්දුභි භවිස්සති. චන්දිම-සූරියනක්ඛත්තානං උග්ගමනං ඔගමනං සංකිලෙසං වොදානං භවිස්සති. එවංවිපාකො චන්දග්ගාහො භවිස්සති. එවංවිපාකො සූරියග්ගාහො භවිස්සති. එවංවිපාකං චන්දිමසූරියානං පථගමනං භවිස්සති. එවංවිපාකං චන්දිමසූරියානං උපපථගමනං භවිස්සති. එවංවිපාකං නක්ඛත්තානං පථගමනං භවිස්සති. එවංවිපාකං නක්ඛත්තානං උපපථගමනං භවිස්සති. එවංවිපාකො උක්කා-පාතො භවිස්සති. එවංවිපාකො දිසාඩාහො භවිස්සති. එවංවිපාකො භූමිචාලො භවිස්සති. එවංවිපාකො දෙවදුන්දුභි භවිස්සති. එවංවිපාකං චන්දිමසූරිය-නක්ඛත්තානං උග්ගමනං ඔගමනං සඞ්කිලෙසං වොදානං භවිස්සති". ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

33. යම්සේ ඇතැම් භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, මිණිලකුණු, වත්ලකුණු, දඬුලකුණු, කඩුලකුණු, ඊලකුණු, දුනුලකුණු, අවිලකුණු, ඉසිරිලකුණු, පුරිස්ලකුණු, කුමරලකුණු, කුමරිලකුණු, දස්ලකුණු, දැසිලකුණු, ඇත්ලකුණු, අස්ලකුණු, මිසුලකුණු, වහප්ලකුණු, ගොත්ලකුණු, එළුලකුණු, බැටළුලකුණු, කුකුළුලකුණු, වටුලකුණු, ගොස්ලකුණු, කැණිලකුණු, කසුබුලකුණු, මුවලකුණු යන ආදි මෙ බඳු තිරශ්චීන විද්‍යයෙන්, මේ බඳු මිථ්‍යාජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ තෙමේ මේ කී ද මෙබඳු වූ ද තිරශ්චීන විද්‍යයෙන් මිථ්‍යාජීවයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

34. යම්සේ ඇතැම් පින්වත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, "අසෝ දිනැ අසෝ නැකැතින් (ශුද සඳහා) සිය නුවරින් අසෝ රජුන්ගේ නික්මීම වන්නේ ය. අසෝ නැකැතින් පෙරළා සිය නුවරට ඒම වන්නේ ය. අසෝ නැකැතින් පිටතැ සිටින සතුරු රජුන් හමු වන්නට රට තුළ හුන් රජුන්ගේ යැම වන්නේ ය. අසෝ නැකැතින් පිටතැ සිටින සතුරු රජුන්ගේ ඉවත් වැ යැම වන්නේ ය. අසෝ නැකැතින් රට තුළැ සිටින රජුන් කරා පිටතැ සිටින සතුරු රජුන්ගේ පැමිණීම වන්නේ ය අසෝ නැකැතින් ඇතුළතැ සිටින රජුන්ගේ ඉවත් වැ යැම වන්නේ ය. රට ඇතුළතැ සිටින රජුනට ජය වන්නේ ය. පිටතැ සිටින සතුරු රජුනට පරාජය වන්නේ ය. පිටතැ සිටින සතුරු රජුනට ජය වන්නේ ය. රට තුළැ සිටින රජුනට පරාජය වන්නේ යැ" යි මෙසේ 'මොහුට ජය වන්නේ ය. මොහුට පරාජය වන්නේ යැ' යි කියමින් මෙ බඳු වූ තිරශ්චීනවිද්‍යයෙන්, මේ බඳු වූ මිථ්‍යාජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ තෙමේ මේ හෝ මෙ බඳු වූ තිරශ්චීනවිද්‍යයෙන්, මිථ්‍යාජීවයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

35. යම්සේ වතාහි ඇතැම් භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, "අසෝ දිනැ චන්ද්‍රග්‍රහණය වන්නේ ය. අසෝ දිනැ සූර්‍යග්‍රහණය වන්නේ ය. අසෝ දිනැ සඳ හිරු දෙදෙනා නිසි මඟින් යැම වන්නේ ය. අසෝ දිනැ ඔවුන් නොමඟින් යැම වන්නේ ය. අසෝ දිනැ නකත්තරුන් නිසිමඟින් යැම වන්නේය. අසෝ දිනැ ඔවුන් නොමඟින් යැම වන්නේ ය. අසෝ දිනැ උල්කාපතනය වන්නේ ය. දිග්දහය වන්නේ ය. භූමිකම්පනය වන්නේ ය. වැසි නැති වැ අහස ගෙරැවුම් වන්නේ ය. සඳහිරුන්ගේ ද නකත් තරුන්ගේ ද උදාව බැසීම කෙලෙසීම පිරිසිදුබව වන්නේ ය. චන්ද්‍රග්‍රහණය ලොවට මෙබඳු පල ගෙනැ දෙන්නේ ය. සූර්‍යග්‍රහණය මෙබඳු පල ගෙනැ දෙන්නේ ය. නක්ෂත්‍රග්‍රහණය මෙබඳු පල ගෙනැ දෙන්නේ ය. සඳ හිරුන් නිසි මඟින් යැම මෙබඳු පල ගෙනැ දෙන්නේ ය. සඳ හිරුන් දෙදෙනාගේ නොමඟින් යැම මෙ බඳු පල ගෙනැ දෙන්නේ ය. නකත්තරුවල පථගමනය මෙබඳු පල ගෙනැ දෙන්නේ ය. ඔවුන්ගේ උත්පථගමනය මෙ බඳු පල ගෙනැ දෙන්නේ ය. උල්කාපතනය මෙ බඳු පල ගෙනැ දෙන්නේ ය. දිග්දහය මෙ බඳු පල ගෙනැ දෙන්නේ ය. භූමිකම්පනය මෙබඳු පල ගෙනැ දෙන්නේ ය. වැසි නැති වැ අහස්ගෙරැවුම් මෙබඳු පල දෙන්නේ ය. සඳහිරුන්ගේ ද නකත්තරුවල ද උදාවත් බැසීමත් කෙලෙසීමත් පිරිසිදු වීමත් මෙ බඳු පල දෙන්නේ යැ" යි කියනුවෝ, මෙ බඳු තිරශ්චීනවිද්‍යයෙන්, මෙ බඳු මිථ්‍යාජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ තෙමේ මේ හෝ මෙ බඳු වූ තිරශ්චීනවිද්‍යයෙන්, මිථ්‍යාජීවිකාවෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

36. යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කපෙපනති, සෙය්‍යථිදං: "සුබ්බුට්ඨිකා භවිස්සති. දුබ්බුට්ඨිකා භවිස්සති. සුභික්ඛං භවිස්සති. දුබ්භික්ඛං භවිස්සති. ඛෙමං භවිස්සති. භයං භවිස්සති. රොගො භවිස්සති. ආරොග්‍යං භවිස්සති. මුද්දා ගණනා සංඛානං කාවෙය්‍යං ලොකායතං" ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන පටිවිරතො භොති. ඉදම්පි'ස්ස භොති සීලස්මිං.

37. යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කපෙපනති, සෙය්‍යථිදං: ආවාහනං විවාහනං සංවදනං විවදනං සංකිරණං විකිරණං සුභගකරණං දුබ්භගකරණං විරුද්ධගබ්භකරණං ජිව්හානිජ්ජොහනං හනුසංහනනං හත්ථාභිජ්ජපනං භමුජ්ජපනං කණ්ණ-ජ්ජපනං ආදාසපඤ්හං කුමාරිපඤ්හං දෙවපඤ්හං ආදිච්චුපට්ඨානං මහතු-පට්ඨානං අබ්භුජ්ජලනං සිරිවහායනං. ඉති වා ඉති එවරූපාය තිරච්ඡාන-විජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො භොති. ඉදම්පි'ස්ස භොති සීලස්මිං.

38. යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කපෙපනති, සෙය්‍යථිදං: සන්තිකම්මං පණිධිකම්මං භූතකම්මං භූරිකම්මං වස්සකම්මං වොස්සකම්මං වත්ථුකම්මං වත්ථුපරිකිරණං ආචමනං නහාපනං ජුහනං වමනං විරෙචනං උද්ධවිරෙචනං අධොවිරෙචනං සීසවිරෙචනං කණ්ණතෙලං නෙත්තතපපනං තත්ථුකම්මං අඤ්ජනං පච්චඤ්ජනං සාලාකියං සල්ලකත්තියං දරකත්තිකිච්ඡා මූලභෙසජ්ජානං අනුපදානං ඔසධීනං පටිමොක්ඛං. ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො භොති. ඉදම්පි'ස්ස භොති සීලස්මිං.

36. යම්සේ ඇතැම් පින්වත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, "මේ සමයෙහි වැසි වස්නේ ය. මේ සමයෙහි නියං වන්නේ ය. මේ සමයෙහි රට සුභික්ෂ වන්නේ ය. මේ සමයෙහි රට දුර්භික්ෂ වන්නේ ය. මේ සමයෙහි රටට උවදුරු වන්නේ ය. මේ සමයෙහි රටට භය වන්නේ ය. මේ කලැ රෝග වන්නේ ය. මේ කලැ රෝග නැති බව වන්නේ යැ" යි පලාපල කීම ද, මුද්‍රාව (ඇඟිලි පුරුක්හි සංඥා තබා ගිණීම) ද, ගණනාව (එක දෙක යන ආදීන් ගිණීම) ද, කාව්‍යශාස්ත්‍රය, ලොකායතශාස්ත්‍රය යන මේ හෝ මේ බඳු තිරශ්චීන විද්‍යයෙන්, මිථ්‍යාආජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ තෙමේ මේ හෝ මේ බඳු වූ තිරශ්චීනවිද්‍යයෙන්, මිථ්‍යාආජීවයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

37. යම්සේ ඇතැම් පින්වත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, ආවාහ සඳහා තකත් කීම, විවාහ සඳහා තකත් කීම, වෙන් වූ අඹුසැමියන් එක් වන්නට තකත් කීම, අඹුසැමියන් වෙන් වන්නට තකත් කීම, දුන් ණය රැස් කිරීමට තකත් කීම, මුදල් ණයට පොලියට දීමට තකත් කීම, සෞභාග්‍යය ඇති වනුවට යන්ත්‍ර මන්ත්‍රාදිය කැරැ දීම, කිම් පාලු වන්නට හදි හුනියම් කිරීම, නැසෙන්නට යන දරුගබ් රැකෙන්නට පිළියම් කිරීම, දිවගුලු බැඳීම, මන්ත්‍රාදියේ බලයෙන් හනු තද කිරීම, අත් පෙරැළෙන්නට මතුරු දැපීම, හනු පෙරැළෙන්නට මතුරු දැපීම, කන් අගුලු වැටෙන්නට මතුරු දැපීම, කැඩපතෙහි දෙවතාවෙශය කොට ප්‍රශ්න ඇසීම, කුමරියක ලවා ජෙන කියැවීම, දෙවිදැස්සක ලවා ජෙන කියැවීම, ජීවිකා පිණිස හිරු පිදීම, මහබඹු පිදීම, මතුරු දපා මුවින් ගිනිජ්ල් විහිදුවීම, මතුරු දපා සිරිකත කැඳැවීම යන මේ හෝ අන් මේ බඳු වූ තිරශ්චීන විද්‍යයෙන්, මිථ්‍යාජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ තෙමේ මේ හෝ මේ බඳු වූ තිරශ්චීනවිද්‍යයෙන්, මිථ්‍යාජීවයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

38. යම්සේ ඇතැම් පින්වත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, ශාන්තිකම්, ප්‍රණිධිකම්, භූරිකම්, පණ්ඩකයා පිරිමියකු කිරීම, පිරිමියා පණ්ඩකයකු කිරීම, වාස්තුකම්, වාස්තු පරිකිරණ, මතුරු දපා මුව දෙවුම, මතුරු දපා අනුත් නැවීම, සෙත් පතා ගිනි පිදීම, ගිහියනට වමන කැරැවීම, බඩ විරේක කැරැවීම, ලය විරේකයට බෙහෙත් දීම, වස්ති කිරීම ශීර්ෂවිරේචන බෙහෙත් දීම, කන් ලෙඩට තෙල් පිසැ දීම, ගිහියන් සඳහා ඇස පවලයට සිසිල ගන්වන තෙත්තෙල් පිසීම, ගිහියනට නස්‍ය දීම, කාරම් අඳුන් සාදා දීම, ඇස සිසිල ගන්වන අඳුන් සාදා දීම, ගිහියන්ගේ ඇසැ උල්ඇත ලෙඩට බෙහෙත් කිරීම, ගිහියනට ශල්‍ය කම් කිරීම, ලදරුවන්ගේ ලෙඩට පිළියම් කිරීම, මුල් බෙහෙත් දීම (කායචිකිත්සාව) කාරම් බෙහෙත් බැඳ වණ සුව වූ පසු ඒවා ගලවා දැමීම යැ" යි මේ ආදි වූ හෝ මෙබඳු වූ තිරශ්චීනවිද්‍යයෙන්, මිථ්‍යාආජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ තෙමේ මේ හෝ මේ බඳු වූ තිරශ්චීන විද්‍යයෙන්, මිථ්‍යාජීවයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

39. ස ඛො සො ලොහිච්ච භික්ඛු එවං සීලසම්පන්නො න කුතොචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතො. සෙය්‍යථාපි මාණව ඛත්තියො මුද්ධාවසිත්තො නිහතපච්චාමිත්තො න කුතොචි භයං සමනුපස්සති යදිදං පච්චත්ථිකතො. එවමෙව ඛො ලොහිච්ච භික්ඛු එවං සීලසම්පන්නො න කුතොචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතො. සො ඉමිනා අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො අජ්ඣත්තං අනවජ්ජසුඛං පටිසංවෙදෙති. එවං ඛො ලොහිච්ච භික්ඛු සීලසම්පන්නො හොති.

40. කථඤ්ච ලොහිච්ච භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති? ඉධ ලොහිච්ච භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා-දෙමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති. රක්ඛති චක්ඛුන්ද්‍රියං. චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝාණෙන ගන්ධං ඝායිත්වා- පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදෙමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්ස-වෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති. රක්ඛති මනින්ද්‍රියං. මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සො ඉමිනා අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො අජ්ඣත්තං අබ්‍යාසෙකසුඛං පටිසංවෙදෙති. එවං ඛො ලොහිච්ච භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති.

41. කථඤ්ච ලොහිච්ච භික්ඛු සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො හොති? ඉධ ලොහිච්ච භික්ඛු අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී හොති. ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති. සම්මිඤ්ජිතෙ පසාරිතෙ සම්පජානකාරී හොති. සඞ්ඝාටිපත්තචීවරධාරණෙ සම්පජානකාරී හොති. අසිතෙ පීතෙ ඛායිතෙ සායිතෙ සම්පජානකාරී හොති. උච්චාරපස්සාවකම්මෙ සම්පජානකාරී හොති ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ සම්පජානකාරී හොති. එවං ඛො ලොහිච්ච භික්ඛු සතිසම්ප-ජඤ්ඤෙන සමන්නාගතො හොති.

39. ලෝහිච්චය, ඒ මහණ තෙමේ මෙසේ ශීලසම්පන්න වූයේ, ශීල-සංවරහෙතුයෙන් කිසි ම එක ද අසංවරතායෙකින් පහළ වියැ හැකි ඛියක් නො දකී. ලෝහිච්චය, ක්ෂත්‍රියාභිෂෙකයෙන් අභිෂෙක ලත්, වැනැසූ සතුරන් ඇති ක්ෂත්‍රියයෙක් කිසි ම එක ද සතුරකුගෙන් වියැ හැකි ඛියක් යම්සේ නො දක්නේ ද, එසේ ම මහණ තෙමේ මෙ පරිද්දෙන් ශීලසම්පන්න වූයේ, ශීලසංවරහෙතුයෙන් කිසි ම එක ද අසංවරයෙකින් වියැ හැකි ඛියක් නො දකී. හේ මේ ආර්‍ය ශීලසකඛියෙන් සමන්විත වූයේ සිය සතන්හි නිදොස් වූ කායික චෛතසික සුඛය විඳී. ලෝහිච්චය, මෙසේ මහණ තෙමේ ශීලසම්පන්න වේ.

40. ලෝහිච්චය, මහණ තෙමේ කෙසේ තම් ඉඳුරන්හි වැසූ දොර ඇත්තේ වේ ද යත්: ලෝහිච්චය, මෙ සස්නෙහි මහණ තෙමේ ඇසින් රූපයක් දැක ශුභාදිවශයෙන් එහි ලකුණු නො ගන්නේ වේ. ශුභාදිවශයෙන් අත්පා ආදි අවයවයන්ගේ ආකාර සිතට නො ගන්නේ වේ. යම් කරුණෙකින් චක්ෂුරිඳ්‍රියය වසා නොගෙන වසන්නහුගේ චිත්තසන්තානය විෂමලෝභ දෙමනස් ආදි ලාමක අකුශල සවභාවයෝ ලුහුබඳනාහු ද ඒ චක්ෂුරිඳ්‍රියයාගේ සංවරය පිණිස හේ පිළිපදී. චක්ෂුරිඳ්‍රියය රකී. චක්ෂුරිඳ්‍රියයෙහි සංවරයට පැමිණේ. කනින් හඬ අසා ... නාසයෙන් ගඳ ආඝ්‍රාණය කොට ... දිවෙන් රස ආස්වාදය කොට... කයින් ස්ප්‍රෂ්ටව්‍යය (ඇඟට හැපෙන දෑ) ස්පර්ශ කොට ... සිතින් ධර්මාලම්බන දැන ශුභාදිවශයෙන් එහි ලකුණු ගන්නේ නො වේ. ශුභාදිවශයෙන් ආකාර සිතට ගන්නේ නො වේ. යම් කරුණෙකින් ශ්‍රොත්‍රෙන්ද්‍රියය ... ඝ්‍රාණෙන්ද්‍රියය .... ජිහ්වෙන්ද්‍රියය ... කායෙන්ද්‍රියය ... මනඉන්ද්‍රියය සංවර කොට නොගෙන වසන්නහුගේ චිත්තසන්තානය විෂමලෝභ දෙමනස් ආදි ලාමක අකුශල සවභාවයෝ ලුහුබඳනාහු ද, ඒ ශ්‍රොත්‍රෙන්ද්‍රියයාගේ ... ඝ්‍රාණෙන්ද්‍රියයාගේ ... ජිහ්වෙන්ද්‍රියයාගේ කායෙන්ද්‍රියයාගේ ... මනඉන්ද්‍රියයාගේ සංවරය පිණිස පිළිපදී. ශ්‍රොත්‍ර ... ඝ්‍රාණ ... ජිහ්වා ... කාය ... මනඉන්ද්‍රියය රකී. එහි සංවරයට පැමිණේ. හේ මේ ආර්‍ය වූ ඉන්ද්‍රියසංවරයෙන් සමන්විත වූයේ සිය සතන්හි අව්‍යාසෙකසුඛය (කෙලෙසුන්ගෙන් මිශ්‍ර නොවීමෙන් වූ පිරිසිදු අකිලිත්තසුඛය) විඳී. ලෝහිච්චය, මෙසේ මහණ තෙමේ ඉන්ද්‍රියයන්හි වැසූ දොර ඇත්තේ වේ.

41. ලෝහිච්චය, මහණ තෙමේ කෙසේ තම් ස්මෘතිසම්ප්‍රජ්‍ඤතයෙන් (සිහි නුවණින්) සමන්විත වේ ද යත්: ලෝහිච්චය, මෙ සස්නෙහි මහණ තෙමේ ඉදිරියට යෑමෙහි ද පෙරළා ඒමෙහි ද මනා නුවණින් දැන ම (එය) කරනුයේ වෙයි. ඉදිරි බැලීමෙහි, අනුදික් බැලීමෙහි (වට පිට බැලීමෙහි) මනා නුවණින් දැන ම (එය) කරනුයේ වෙයි. අත් පා ආදිය හැකිළීමෙහි, දිගු කිරීමෙහි නුවණින් දැන ම (එය) කරනුයේ වෙයි. සඟළසිවුර ද පාත්‍රය ද සෙසු සිවුරු ද දැරීමෙහි නුවණින් දැන ම කරන්නේ වෙයි. ආහාර ගැන්මෙහි, පෑන් පීමෙහි, පිපිකැවිලි ආදිය කෑමෙහි, මී ආදිය රස විඳීමෙහි නුවණින් දැන ම කරනුයේ වෙයි. මල මූ පහ කිරීමෙහි නුවණින් දැන ම කරනුයේ වෙයි. ගමනෙහි සිටීමෙහි හිඳීමෙහි නිදීමෙහි කථා කිරීමෙහි නොබිණීමෙහි නුවණින් දැන ම කරනුයේ වෙයි. ලෝහිච්චය, මෙසේ මහණ තෙම සිහි නුවණින් සමන්විත වෙයි.

42. කථඤ්ච ලොහිච්ච භික්ඛු සන්තුට්ඨො හොති? ඉධ ලොහිච්ච භික්ඛු සන්තුට්ඨො හොති කායපරිහාරියෙන චීවරෙන කුච්ඡිපරිහාරියෙන පිණ්ඩ-පාතෙන. සො යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති. සෙය්‍යථාපි ලොහිච්ච පක්ඛී සකුණො යෙන යෙනෙව ඩෙති සපත්තභාරො'ව ඩෙති, එවමෙව ඛො ලොහිච්ච භික්ඛු සන්තුට්ඨො හොති කායපරිහාරියෙන චීවරෙන කුච්ඡිපරිහාරියෙන පිණ්ඩපාතෙන. සො යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති. එවං ඛො ලොහිච්ච භික්ඛු සන්තුට්ඨො හොති.

43. සො ඉමිනා ච අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො ඉමිනා ච අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො ඉමිනා ච අරියෙන සතිසම්පජ-ඤ්ඤෙන සමන්නාගතො ඉමාය ච අරියාය සන්තුට්ඨියා සමන්නාගතො විවිත්තං සෙනාසනං භජති අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං. සො පච්ඡාභත්තං පිණ්ඩ-පාතපටික්කන්තො නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා.

44. සො අභිජ්ඣං ලොකෙ පහාය විගතාභිජ්ඣෙන චෙතසා විහරති. අභිජ්ඣාය චිත්තං පරිසොධෙති. බ්‍යාපාදපදොසං පහාය අබ්‍යාපන්නචිත්තො විහරති සබ්බපාණභූතහිතානුකම්පී. බ්‍යාපාදපදොසා චිත්තං පරිසොධෙති. ථීනමිද්ධං පහාය විගතථීනමිද්ධො විහරති ආලොකසඤ්ඤී සතො සම්ප-ජානො ථීනමිද්ධා චිත්තං පරිසොධෙති. උද්ධච්චකුක්කුච්චං පහාය අනුද්ධතො විහරති අජ්ඣත්තං වූපසන්තචිත්තො. උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසොධෙති. විචිකිච්ඡං පහාය තිණ්ණවිචිකිච්ඡො විහරති අකථංකථී කුසලෙසු ධම්මෙසු. විචිකිච්ඡාය චිත්තං පරිසොධෙ ති

45. සෙය්‍යථාපි ලොහිච්ච පුරිසො ඉණං ආදාය කම්මන්තෙ පයො-ජෙය්‍ය, තස්ස තෙ කම්මන්තා සම්ඉජ්ඣෙය්‍යුං, සො යානි ච පොරාණානි ඉණමූලානි තානි ච ඛ්‍යන්තීකරෙය්‍ය, සියා චස්ස උත්තරිං අවසිට්ඨං දුරහරණාය, තස්ස එවමස්ස: "අහං ඛො පුබ්බෙ ඉණං ආදාය කම්මන්තෙ පයොජෙසිං. තස්ස මෙ තෙ කම්මන්තා සම්ඉජ්ඣිංසු. සොහං යානි ච පොරාණානි ඉණමූලානි තානි ච ඛ්‍යන්තීඅකාසිං. අත්ථි ච මෙ උත්තරිං අවසිට්ඨං දුරහරණාය"ති. සො තතො නිදානං ලභෙථ පාමොජ්ජං, අභි-ගවෙය්‍ය සොමනස්සං-

42. ලොහිචචය, කෙසේ නම් මහණ තෙමේ ලද පමණෙහි සතුටු වේ ද යත්: ලොහිචචය, මේ සස්නෙහි මහණ තෙමේ කායපරිහරණයට ප්‍රමාණ වූ සිවුරින් ද කුක්ෂිපරිහරණයට ප්‍රමාණ වූ ආහාරයෙන් ද සතුටු වෙයි. හේ යම් යම් තැනකට නික්මෑ යේ ද, අට පිරිකර පමණක් ගෙන ම නික්මෙයි. ලොහිචචය, (පියා හඹනුවට තරම්) අත්තටු ඇති කුරුළු තෙමේ යම් යම් තැනක ට පියා හඹා යේ නම්, පියාපත් බර සහිත ව ම යම් සේ පියා හඹා ද, එසේ ම ඒ මහණ තෙමේ කායපරිහරණයට ප්‍රමාණ වූ සිවුරින් ද කුක්ෂිපරිහරණයට ප්‍රමාණ වූ ආහාරයෙන් ද සතුටු වෙයි. හේ යම් යම් තැනකට යේ ද, පා සිවුරු (ආදි අට පිරිකර) රැගෙන ම යෙයි. ලොහිචචය, මෙසේ මහණ තෙමේ ලද පසයෙහි සතුටු වේ.

43. ලොහිචචය, ඒ මහණ තෙමේ මේ ආර්‍ය ශීලසකඛියෙන් ද සමන්විත වූයේ, මේ ආර්‍ය ඉන්ද්‍රියසංවරයෙන් ද සමන්විත වූයේ, මේ ආර්‍ය සතිසම්ප්‍රජාඤ්ඤයෙන් ද සමන්විත වූයේ, මේ ආර්‍ය සන්තුෂ්ටියෙන් ද සමන්විත වූයේ, අරණ්‍ය වෘක්ෂමූල පර්වත කඳුරැලි ගිරිගුහා සොහොන් වනපෙත් (වනප්‍රස්ථ) අභ්‍යවකාශ (එළිමහන්) පිදුරැලෙන් යන මේ කී ජනශූන්‍ය කිසි සෙනස්නක් හජනය කෙරෙයි. හේ පිඬු සෙවීමෙන් පෙරළා ආයේ, පසුබත් සෙමෙහි පලක් බැඳ උඩු කය කෙළින් පිහිටුවා කම්වහනට යොමු කොට සිහි එළවා හිඳී.

44. හේ ලොවැ (පඤ්ච උපාදානස්කන්ධය කෙරෙහි) ඇල්ම හැර, විගතාභිධ්‍යාණප්‍රහාණයෙන් (ගට පත් කිරීමෙන්) පහ වූ අභිධ්‍යායෙන් යුත් සිතින් වෙසෙයි. අභිධ්‍යාව කෙරෙන් සිත පිරිසිදු කෙරෙයි. ව්‍යාපාද ප්‍රදෝෂය (ක්‍රෝධය) හැර, ව්‍යාපාද රහිත සිතැත්තේ, සියලු පණ ඇති සතුන් කෙරේ හිතානුකම්පා ඇති වැ වෙසෙයි. ක්‍රෝධය කෙරෙන් සිත පිරිසිදු කෙරෙයි. ස්ත්‍යානමිද්ධය හැර, පහ වූ ස්ත්‍යානමිද්ධය ඇත්තේ, දවල් දෙක්හි ම දුටු එළිය හඳුනනු හැකි පිරිසිදු සංඥ ඇත්තේ, සිහියෙනුත් නුවණිනුත් යුක්ත වූයේ වෙසෙයි. ස්ත්‍යානමිද්ධය කෙරෙන් සිත පිරිසිදු කෙරෙයි. උද්ධච්චත් (සිතැ නොසංහුන්බවත්) කුකුච්චත් (කළ නො කළ දෑයෙහි පසුතැවිල්ලත්) සිතින් දුරු ලා, අනුද්ධත වැ (නොසංහුන් බැවින් තොර වැ), සංඛිදුණු සඛකිය චිත්තස්ස්‍ස්‍ස්‍

46. සෙය්‍යථාපි ලොහිච්ච පුරිසො ආබාධිකො අස්ස දුක්ඛිතො බාළ්හ-ගිලානො, භත්තං චස්ස නවජ්ජෙය්‍ය, න චස්ස කායෙ බලමත්තා, සො අපරෙන සමයෙන තමහා ආබාධා මුච්චෙය්‍ය, භත්තඤ්චස්ස ජීරෙය්‍ය, සියා චස්ස කායෙ බලමත්තා, තස්ස එවමස්ස: "අහං ඛො පුබ්බෙ ආබාධිකො අහොසිං දුක්ඛිතො බාළ්හගිලානො. භත්තං ච මෙ නවජ්ජෙසි. න චස්ස මෙ ආසි කායෙ බලමත්තා. සො'මහි එතරහි තමහා ආබාධා මුත්තො. භත්තඤ්ච මෙ ජීරෙති. අත්ථි ච මෙ කායෙ බලමත්තා"ති. සො තතො නිදානං ලභෙථ පාමොජ්ජං, අධිගච්ඡෙය්‍ය සොමනස්සං-

47. සෙය්‍යථාපි ලොහිච්ච පුරිසො බන්ධනාගාරෙ බද්ධො අස්ස, සො අපරෙන සමයෙන තමහා බන්ධනාගාරා මුච්චෙය්‍ය සොත්ථිනා අබ්භයෙන, න චස්ස කිඤ්චි භොගානං වයො, තස්ස එවමස්ස: "අහං ඛො පුබ්බෙ බන්ධනාගාරෙ බද්ධො අහොසිං. සො'මහි එතරහි තමහා බන්ධනාගාරා මුත්තො සොත්ථිනා අබ්භයෙන. නත්ථි ච මෙ කිඤ්චි භොගානං වයො" ති. සො තතො නිදානං ලභෙථ පාමොජ්ජං, අධිගච්ඡෙය්‍ය සොමනස්සං-

48. සෙය්‍යථාපි ලොහිච්ච පුරිසො දාසො අස්ස අනත්තාධීනො පරාධීනො න යෙනකාමඞ්ගමො, සො අපරෙන සමයෙන තමහා දාසබ්‍යා මුච්චෙය්‍ය අත්තාධීනො අපරාධීනො භුජිස්සො යෙනකාමඞ්ගමො, තස්ස එවමස්ස: "අහං ඛො පුබ්බෙ දාසො අහොසිං අනත්තාධීනො පරාධීනො න යෙනකාමඞ්ගමො. සො'මහි එතරහි තමහා දාසබ්‍යා මුත්තො අත්තාධීනො අපරාධීනො භුජිස්සො යෙනකාමඞ්ගමො"ති. සො තතො නිදානං ලභෙථ පාමොජ්ජං, අධිගච්ඡෙය්‍ය සොමනස්සං-

49. සෙය්‍යථාපි ලොහිච්ච පුරිසො ඝනතො සභොගො කන්තාරද්ධානමග්ගං පටිපජ්ජෙය්‍ය දුබ්භික්ඛං සප්පටිභයං, සො අපරෙන සමයෙන තං කන්තාරං නිත්ථරෙය්‍ය, සොත්ථිනා ගාමන්තං අනුපාපුණෙය්‍ය ඛෙමං අප්පටිභයං, තස්ස එවමස්ස: "අහං ඛො පුබ්බෙ ඝනතො සභොගො කන්තාරද්ධානමග්ගං පටිපජ්ජිං දුබ්භික්ඛං සප්පටිභයං. සො'මහි එතරහි තං කන්තාරං නිත්ථිණ්ණො සොත්ථිනා ගාමන්තං අනුප්පත්තො ඛෙමං අප්පටිභය"න්ති. සො තතො නිදානං ලභෙථ පාමොජ්ජං, අධිගච්ඡෙය්‍ය සොමනස්සං-

50. එවමෙව ඛො ලොහිච්ච භික්ඛු යථා ඉණං යථා රොගං යථා බන්ධනාගාරං යථා දාසබ්‍යං යථා කන්තාරද්ධානමග්ගං, එවං ඉමෙ පඤ්ච නීවරණෙ අප්පහීණෙ අත්තනි සමනුපස්සති. සෙය්‍යථාපි ලොහිච්ච ආනණ්‍යං, යථා ආරොග්‍යං, යථා බන්ධනා මොක්ඛං, යථා භුජිස්සං, යථා ඛෙමන්තභූමිං, එවමෙව ඛො ලොහිච්ච භික්ඛු ඉමෙ පඤ්ච නීවරණෙ පහීණෙ අත්තනි සමනුපස්සති.

46. ලොකිචවය, යම් සේ පුරුෂයෙක් රෝගී වූයේ, දුකට පැමිණියේ, දැඩි ලෙස ගිලන් වන්නේ ද, ඔහුට බතුත් නො රිසියෙන්නේ ද, ඔහුගේ ඇඟපත ශක්ති පමණකුත් නො වන්නේ ද, හේ මෑත කාලයෙහි ඒ ආබාධයෙන් මිදෙන්නේ නම්, ඔහුට බතුත් රිසියෙන්නේ නම්, ඔහු ඇඟපත ශක්තිය ද වන්නේ නම්, "මම් වූ කලි පෙරැ දුකට පත්, දැඩි ගිලන්බව් ඇති ලෙඩෙක් වීමි. මට අහර ද රිසි නො වී ය. මා ඇඟපත ශක්තිය ද නො වී ය. ඒ මම් දැන් ඒ ලෙඩින් මිදුණෙමි වෙමි. ඒ මට අහර ද රිසියෙයි. මා ඇඟපත ශක්තිය ද ඇතැ" යි ඔහුට මෙසේ සිතෙක් වන්නේ නම්, හේ ඒ කරුණින් සතුට ලබන්නේ ද, සොම්නසට පැමිණෙන්නේ ද -

47. ලොකිචවය, යම් සේ පුරුෂයෙක් සිරගෙහි බැඳුණේ වන්නේ ද, හේ පසු කලෙක ධනය වියදම් නො කොට පහසුවෙන් ඒ සිර ගෙන් මිදෙන්නේ ද, (ඒ හෙතුයෙන්) ඔහුගේ කිසි භොගවිනාශයෙක් නො වන්නේ ද, "මම් වූ කලි පෙරැ සිර ගෙහි බැඳුණෙමි වීමි. ඒ මම් දැන් ධන වියදම් නො කොට පහසුවෙන් ඒ සිර ගෙන් මිදුණෙමි වෙමි. මාගේ භොගයතට කිසි විනාශයෙක් ද නැතැ" යි ඔහුට මෙසේ සිතෙක් වන්නේ ද, හේ ඒ කරුණින් සතුට ලබන්නේ ද, සොම්නසට පැමිණෙන්නේ ද -

48. ලොකිචවය, යම්සේ තමා අයත් පැවැතුම් නැති, අනුන් අයත් පැවැතුම් ඇති, කැමැති අතෙක යන්නට අවසර නැති දාස පුරුෂයෙක් වන්නේ ද, හේ මෑත භාගයෙහි තමා අයත් පැවැතුම් ඇතියේ, පරා අයත් පැවැතුම් නැතියේ, නිදහස් වූයේ, කැමැති අතෙක යෑ හැකි වූයේ, ඒ දාසභාවයෙන් මිදෙන්නේ ද, එසේ වූ ඔහුට "මම් වූ කලි පෙරැ තමා අයත් පැවැතුම් නැති, පරා අයත් පැවැතුම් ඇති, කැමැති අතෙක යෑ නො හැකි දාසයෙක් වීමි. ඒ මම් දැන් ඒ දාසභාවයෙන් මිදුණෙමි, තමා අයත් පැවැතුම් ඇතියෙමි, පරා අයත් පැවැතුම් නැයියෙමි, නිදහස් වූයෙමි කැමැති අතෙක යෑ හැකියෙමි වෙමි" යි මෙසේ සිතෙක් වන්නේ ද, හේ ඒ කරුණින් සතුට ලබන්නේ ද, සොම්නසට පැමිණෙන්නේ ද-

49. ලොකිචවය, යම්සේ ධනවත් වූ භොගසම්පත් ඇති පුරුෂයෙක් දුර්ලභ ආහාර ඇති, උවදුරු ඇති, දිය නැති දික් මඟකට බස්නේ ද, හේ පසු කලෙක සුවසේ ඒ නිරුදක පෙදෙස ඉක්මැ යන්නේ ද, උවදුරු නැති විපත් නැති ගම්මානයකට බස්නේ ද, එසේ වූ ඔහුට "මම් වූ කලි පෙර ධන ඇතියෙමි, භොගසම්පත් ඇතියෙමි, දිය නැති, ආහාරදුර්ලභ, ප්‍රතිභය සහිත දික් මඟකට බටුයෙමි. ඒ මම් දැන් සුවසේ ඒ කාන්තාරය තරණය කෙළෙමි. නිරුපද්‍රැත භයරහිත ගමකට පැමිණියෙමි වෙමි"යි සිතෙක් වන්නේ ද, හේ ඒ කරුණින් සතුට ලබන්නේ ද, සොම්නසට පැමිණෙන්නේ ද-

50. ලොකිචවය, එසේ ම මහණ තෙමේ ණයක් මෙන් ලෙඩක් මෙන් සිරගෙයක් මෙන් වහල්බවක් මෙන් දිය නැති දික්මඟක් මෙන් (පිළිවෙළින්) මේ පඤ්ච නීවරණ පස තමා කෙරෙහි දකී. ලොකිචවය, ණය නැති බව යම්සේ ද, ලෙඩ නැති බව යම්සේ ද, සිරගෙන් මිදුණුබව යම්සේ ද, නිවහල්බව යම්සේ ද, උවදුරු නැති බිම යම්සේ ද, එසේ ම (පිළිවෙළින්) මේ පහ වූ නීවරණ පස (හෙවත් නීවරණ පසේ දුරු වීම) තමා කෙරෙහි දකී.

51. තස්සිමෙ පඤ්ච නීවරණෙ පහීණෙ අත්තනි සමනුපස්සතො පාමොජ්ජං ජායති. පමුදිතස්ස පීති ජායති. පීතිමනස්ස කායො පස්ස-ම්භති. පස්සද්ධකායො සුඛං වෙදෙති. සුඛිනො චිත්තං සමාධියති.

52. සො විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිඵරති. නත්ථි කිඤ්චි සබ්බාවතො කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අඵුටං හොති.

53. සෙය්‍යථාපි ලෝහිච්ච දක්ඛො න්හාපකො වා න්හාපකන්තෙවාසී වා කංසථාලෙ න්හානීයචූණ්ණානි ආකිරිත්වා උදකෙන පරිපෙළාසකං පරි-පෙළාසකං සන්නෙය්‍ය, සායං න්හානීයපිණ්ඩි සෙනහානුගතා සෙනහපරෙතා සන්තරබාහිරා ඵුටා සෙනහෙන න ච පග්ඝරණී, එවමෙව ඛො ලෝහිච්ච භික්ඛු ඉමමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිඵරති. නත්ථි කිඤ්චි සබ්බාවතො කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අඵුටං හොති.

54. යම්පි ලෝහිච්ච භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති, සො ඉමමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිඵරති, නත්ථි කිඤ්චි සබ්බාවතො කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අඵුටං හොති. ඉදම්පි'ස්ස හොති සමාධිස්මිං.

55. යස්මිං ඛො ලෝහිච්ච සත්ථරි සාවකො එවරූපං උළාරං විසෙසං අධිගච්ඡති අයම්පි ඛො ලෝහිච්ච සත්ථා යො ලොකෙ න වොදනාරහො යො ච පනෙවරූපං සත්ථාරං වොදෙති, සා වොදනා අභූතා අතච්ඡා අධම්මිකා සාවජ්ජා.

56. පුන ච පරං ලෝහිච්ච භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං සමාධිජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිඵරති. නත්ථි කිඤ්චි සබ්බාවතො කායස්ස සමාධිජෙන පීතිසුඛෙන අඵුටං හොති.

51. තමා කෙරෙහි පහ වූ මේ නීවරණ පස දක්නා ඔහුට සතුට උපදී. සතුටු වූවහුට ප්‍රීතිය උපදී. සිතැ ප්‍රීතිය ඇත්තහුගේ කායය සංසිඳේ. සංසුන් කායය ඇත්තේ සුව විඳී. සුවැතියහු සිත සමාධිගත වේ (එකඟ වේ).

52. හේ කාමයන්ගෙන් වෙන් ව ම, අකුසල් දහමුන්ගෙන් ද වෙන් ව ම, විතර්කසහිත, විචාරසහිත, විවේකයෙන් (නීවරණ පහ වීමෙන්) උපන් ප්‍රීතියත් සුවයත් ඇති පළමු ධ්‍යානය ලැබ වෙසේ. හේ මේ කරජකය ම විවේකයෙන් උපන් ප්‍රීතිසුඛයෙන් තෙමයි. සියල්ල ම තෙමයි, පුරා ලයි, සියල්ල ම ස්පර්ශ කෙරෙයි. සියලු අඟ පසඟ ඇති ඔහු මුළු කයෙහි ඒ විවේකයෙන් උපන් ප්‍රීතිසුඛයෙන් පැතිරී වැද නොගත් (නොපහස්නා ලද) කිසි ද තැනෙක් නො වෙයි.

53. ලොහිච්චය, යම්සේ කපුවෙක් (කිලිඟෙක්) හෝ කපුවකුගේ (කිලිඟකුගේ) අතැවැස්සෙක් හෝ ලොහොතලියෙක නාන සුණු බහා දිය ඉස ඉස පිඬු කරන්නේ ද, ඒ නාන සුණුපිඬ කාවැදුණු දිය ඇත්තේ, හැම තැන ම දියෙන් යුක්ත වූයේ, ඇතුළත පිටත සියල්ල ම දියෙන් පැතිරී ගියේ, දිය නො වගුරුවන්නේත් වේ ද, ලොහිච්චය, එසේ ම මහණ තෙමේ මේ කරජකය ම විවේකයෙන් උපන් ප්‍රීතිසුඛයෙන් තෙමයි, සියල්ල ම තෙමයි, පුරා ලයි, සියල්ල ම ස්පර්ශ කෙරෙයි. ඔහුගේ සියලු අඟ පසඟ ඇති මුළු කයෙහි විවේකජ ප්‍රීතිසුඛයෙන් පැතිර වැද නොගත් කිසි ද තැනෙක් නො වෙයි.

54. ලොහිච්චය, මහණ තෙම කාමයන්ගෙන් වෙන් ව ම, අකුසල් දහමුන්ගෙන් ද වෙන් ව ම, විතර්කසහිත, විචාරසහිත, විවේකයෙන් උපන් ප්‍රීතියත් සුවයත් ඇති යම් පළමු දහනක් ලැබ වෙසේ ද, හේ ඒ විවේකජ ප්‍රීතිසුඛයෙන් මේ කය ම තෙමයි, මුළුල්ල ම තෙත් කෙරෙයි, පුරා ලයි, හාත්පස පැතිරී ගනී. ඔහුගේ සියලු කයැ විවේකජ ප්‍රීතිසුඛයෙන් නො පැතිරී ගත් කිසිදු තැනෙක් නො වෙයි. මේ ද ඔහුගේ සමාධියෙක් වෙයි.

55. ලොහිච්චය, යම් ශාස්තෘවරයකු නිසා සවු තෙම මේබඳු මහත් ගුණ-විශෙෂයක් ලබා ද, ලොහිච්චය, මේ යමෙක් ලොවැ වොදනාවට නොසුදුසු නම් එසේ වූ ශාස්තෘවරයෙකි. යමෙක් මෙබඳු ශාස්තෘහට වොදනා කෙරේ නම්, ඒ වොදනාව අභූතය, අසත්‍ය ය, නො දැහැමි ය, වරද සහිත ය.

56. ලොහිච්චය, නැවැත ද (අනෙකක් කියමි:) මහණ තෙමේ විතර්ක-විචාරයන්ගේ සංසිඳීමෙන්, සිය සතන්හි උපන්, සිය සතන් පහදවන (ශ්‍රද්ධාව හා එක් වැ යෙදුණු), සිතැ එකඟ බව ඇති, විතර්කය නැති, විචාරය නැති, සමාධියෙන් උපන්, ප්‍රීතියත් සුවයත් ඇති, දෙවෙනි ධ්‍යානයට පැමිණ වෙසෙයි. හේ මේ කරජ කය ම සමාධියෙන් උපන් ප්‍රීතිසුඛයෙන් තෙමයි. සියල්ල ම තෙත් කෙරෙයි, පුරා ලයි, හැම තැන ම ස්පර්ශ කෙරෙයි. ඔහුගේ කයේ විවේකයෙන් උපන් ප්‍රීතිසුඛයෙන් පැතිරී නොගත් කිසි ද තැනෙක් නො වෙයි.

57. සෙය්‍යථාපි ලොහිච්ච උදකරහදෙ උබ්භිදෙදකො, තස්ස නෙවස්ස පුරත්ථිමාය දිසාය උදකස්ස ආයමුඛං, න දක්ඛිණාය දිසාය උදකස්ස ආයමුඛං, න පච්ඡිමාය දිසාය උදකස්ස ආයමුඛං, න උත්තරාය දිසාය උදකස්ස ආයමුඛං, දෙවො ච න කාලෙන කාලං සම්මා ධාරං අනුප්පවෙච්ඡෙය්‍ය, අථ ඛො තම්හා ච උදකරහදා සීතා වාරිධාරා උබ්භිජ්ජිත්වා තමෙව උදකරහදං සීතෙන වාරිනා අභිසන්දෙය්‍ය පරිසන්දෙය්‍ය පරිපූරෙය්‍ය පරිප්ඵරෙය්‍ය, නාස්ස කිඤ්චි සබ්බාවතො උදකරහදස්ස සීතෙන වාරිනා අප්ඵුටං අස්ස, එවමෙව ඛො ලොහිච්ච භික්ඛු ඉමිමෙව කායං සමාධිජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස සමාධිජෙන පීතිසුඛෙන අප්ඵුටං හොති.

58. යම්පි ලොහිච්ච භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති, සො ඉමිමෙව කායං සමාධිජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස සමාධිජෙන පීතිසුඛෙන අප්ඵුටං හොති. ඉදම්පි'ස්ස හොති සමාධිස්මිං.

59. යස්මිං ඛො ලොහිච්ච සත්ථරි සාවකො එවරූපං උළාරං විසෙසං අධිගච්ඡති, අයම්පි ඛො ලොහිච්ච සත්ථා යො ලොකෙ න චොදතාරහො. යො ච පනෙවරූපං සත්ථාරං චොදෙති සා චොදනා භූතා අතච්ඡා අධම්මිකා සාවජ්ජා.

60. පුන ච පරං ලොහිච්ච භික්ඛු පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති සතො සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති. යන්තං අරියා ආචික්ඛන්ති 'උපෙක්ඛකො සතිමා සුඛවිහාරී'ති තං තතියං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමිමෙව කායං නිප්පීතිකෙන සුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස නිප්පීතිකෙන සුඛෙන අප්ඵුටං හොති.

57. ලොහිච්චය, යම්සේ යටැ උල්පතින් මතු වන දිය ඇති ගැඹුරු විලෙක් වේ ද, එයට පෙරදිගින් දිය ඇතුළු වන මඟෙක් නො වන්නේ ද, දකුණු දෙසින් ද දිය ඇතුළු වන මඟෙක් නොවන්නේ ද, පැසිම් දිගින් ද දිය ඇතුළු වන මඟෙක් නොවන්නේ ද, උතුරු දෙසින් ද දිය වැද ගන්නා මඟෙක් නො වන්නේ ද, වැස්ස ද කලින් කලැ සුදුසු පරිදි නො වසින්නේ ද, එතෙකුදු වුවත් ඒ විලෙන් සිසිල් දියදහර මතු වී ඒ විල ම සිසිල් දියෙන් තෙමන්නේ ද, හැම පරිදි තෙමන්නේ ද, පුරා ලන්නේ ද, හැම තැන ම වැද ගෙන පැතිරී සිටින්නේ ද, ඒ මුළු විලෙහි සිසිල් දිය පැතිරී වැද නොගත් කිසි ද තැනෙක් නො මැත් ද, ලොහිච්චය, එසේ ම මහණ තෙමේ මේ කරජ කය ම සමාධියෙන් උපන් ප්‍රීතිසුඛයෙන් තෙමයි, හැම තැන ම තෙත් කෙරෙයි, පුරා ලයි, හැම තැන ම පැතිරී වැද ගනී. ඔහුගේ ඒ සියලු කයේ සමාධියෙන් උපන් ප්‍රීතිසුඛය පැතිර වැද නො ගත් කිසි ද තැනෙක් නො වෙයි.

58. ලොහිච්චය, මහණ තෙම විතර්කවිචාරයන් සංසිඳීමෙන් තමා කෙරෙහි පැහැදීම ඇති කරන, සිතැ එකඟ බව ඇති, විතර්කරහිත, විචාර රහිත, සමාධියෙන් පහළ වූ, ප්‍රීතිය හා සුඛවේදනාව හා ඇති යම් දෙවෙනි ධ්‍යානයකට පැමිණැ වෙසේ ද, හේ මේ කය ම සමාධියෙන් උපන් ප්‍රීතිසුඛයෙන් තෙමයි. හැම තැන ම තෙත් කෙරෙයි, පුරා ලයි. හැම තැන ම පැතිරී වැද ගනී. ඔහුගේ ඒ සියලු කයැ සමාධියෙන් උපන් ප්‍රීතිසුඛය පැතිරී වැද නොගත් කිසි ද තැනෙක් නො වෙයි. මේ ද ඔහුගේ සමාධියෙක් වෙයි.

59. ලොහිච්චය, යම් ශාස්තාවරයකු නිසා සවු තෙම මෙබඳු මහත් ගුණවෙසෙසක් ලබා ද ලොහිච්චය, මේත් ලොවැ වොදනාවට නොසුදුසු වූ ශාස්තාවරයෙකි. යමෙක් මෙබඳු ශාස්තෘහට වොදනා කෙරේ නම්, ඒ වොදනාව අභූතය, අතථ්‍ය ය, නො දැහැමි ය, වරද සහිත ය.

60. තැවැත ද (අතෙකක් කියමි:) ලොහිච්චය, මහණ තෙමේ ප්‍රීතියගේ ද විරාගයෙන් (පහ වීමෙන්, සංසිඳීමෙන්), උපෙක්ෂක වැ, සිහියෙන් හා නුවණින් හා යුක්ත වැ වෙසෙයි. (දහත්) සුවය ද කයින් විඳී. ආර්යයෝ යම් ධ්‍යානයක් හෙතු කොට ගෙන ධ්‍යානලාභීනා ඇරැබැ 'උපෙක්ෂාව ඇත්තේ, සිහි ඇත්තේ, සුඛවිහරණ ඇත්තේ යැ' යි කියත් ද, හේ (එසේ වූ) ඒ තෙවෙනි ධ්‍යානයට පැමිණ වෙසේ. හේ මේ කය ම නිර්ප්‍රීතික සුඛයෙන් තෙමයි. හැම පරිදි තෙත් කෙරෙයි. පුරා ලයි. හැම තැන ම පැතිර වැද ගනී. ඔහුගේ කයෙහි ඒ නිර්ප්‍රීතික සුඛයෙන් පැතිර නොගත් කිසි ද තැනෙක් නො වෙයි.

61. සෙය්‍යථාපි ලොහිච්ච උප්පලිනියං වා පදුමිනියං වා පුණ්ඩරීකිනියං වා අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවද්ධානි උදකානුග්ගතානි අන්තොනිමුග්ගපොසීනි, තානි යාවච්චඤ්ඤා යාව ච මූලා සීතෙන වාරිනා අභිසන්නානි පරිසන්නානි පරිපූරානි පරිපුණ්ණානි, නාස්සා කිඤ්චි සබ්බාවතං උප්පලානං වා පදුමානං වා පුණ්ඩරීකානං වා සීතෙන වාරිනා අප්පුට්ඨං අස්ස, එවමෙව ඛො ලොහිච්ච භික්ඛු ඉමමෙව කායං නිප්පීතිකෙන සුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිපඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස නිප්පීතිකෙන සුඛෙන අප්පුට්ඨං හොති.

62. යම්පි ලොහිච්ච භික්ඛු පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති සතො සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති, යං තං අරියා ආචික්ඛන්ති 'උපෙක්ඛකො සතිමා සුඛවිහාරී'ති තං තතියං ඣානං උපසම්පජ්ජ විහරති සො ඉමමෙව කායං නිප්පීතිකෙන සුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිපඵරති, නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස නිප්පීතිකෙන සුඛෙන අප්පුට්ඨං හොති, ඉදම්පි'ස්ස හොති සම්මාධිස්මිං.

63. යස්මිං ඛො ලොහිච්ච සත්ථරි සාවකො එවරූපං උළාරං විසෙසං අධිගච්ඡති, අයම්පි ඛො ලොහිච්ච සත්ථා යො ලොකෙ න වොදානාරහො. යො ච පනෙවරූපං සත්ථාරං වොදෙති සා වොදනා අභූතා අතච්ඡා අධම්මිකා සාවජ්ජා.

64. පුන ච පරං ලොහිච්ච භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛමසුඛං උපෙක්ඛා-සතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන ඵරිත්වා නිසින්නො හොති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අප්පුට්ඨං හොති.

65. සෙය්‍යථාපි ලොහිච්ච පුරිසො ඔදාතෙන වත්ථෙන සසීසං පාරුපිත්වා නිසින්නො අස්ස, නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස ඔදාතෙන වත්ථෙන අප්පුට්ඨං අස්ස, එවමෙව ඛො ලොහිච්ච භික්ඛු ඉමමෙව කායං පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන ඵරිත්වා නිසින්නො හොති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අප්පුට්ඨං හොති.

66. යම්පි ලොහිච්ච භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති, සො ඉමමෙව කායං පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන ඵරිත්වා නිසින්නො හොති, නාස්ස කිඤ්චි සබ්බා-වතො කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අප්පුට්ඨං හොති· ඉදම්පි'ස්ස හොති සම්මාධිස්මිං.

61. ලොහිච්චය, යම්සේ උපුල් විලෙක හෝ පියුම් විලෙක හෝ පඬෙර විලෙක හෝ ඇතැම් උපුල් හෝ පියුම් හෝ පඬෙර හෝ දියෙහි උපන්නේ, දියෙහි වැඩුණේ, දියෙන් නොනැගුණේ, දිය තුළ ම ගිලී වැඩෙනුයේ ද, ඒ හැම අක් දක්වාත් මුල් දක්වාත් සිසිල් දියෙන් තෙමුණේ, හැම පරිදි තෙත් වූයේ, පිරී ගියේ, හැම තැන් ම පැතිරී වැද ගත්තේ වේ ද, ඒ විලෙහි සියලු උපුල්වලැ හෝ පියුම්වලැ හෝ පඬෙරවලැ හෝ සිසිල් දිය පැතිරී නොගත් තැනෙක් නො වන්නේ ද, ලොහිච්චය, එසේ ම මහණ තෙමේ මේ කය ම නිෂ්ප්‍රීතික සුඛයෙන් තෙමයි. ඛාත්පසින් තෙමයි. පුරා ලයි. හැම පරිදි පැතිරී වැද ගනී. ඔහුගේ සියලු කයෙහි නිෂ්ප්‍රීතික සුඛයෙන් පැතිරී වැද නොගත් කිසි ද තැනෙක් නො වෙයි.

62. ලොහිච්චය, මහණ තෙම ප්‍රීතිය ද හැරී ලීමෙන් උපෙක්ෂාව ඇත්තේ සිහි ඇති වැ නුවණ ඇති වැ වෙසේ. සුවයත් නාමකයින් විඳී. 'උපෙක්ෂා ඇත්තේ සිහි ඇත්තේ සුව වුසුම් ඇත්තේයැ'යි ආර්‍යයෝ' යමක්හු දක්වත් නම්, ඒ තෙවෙනි ධ්‍යානය ලැබ වෙසේ. හේ නිෂ්ප්‍රීතික සුවයෙන් මේ කය ම තෙමයි. කය සියල්ල ම තෙත් කෙරෙයි. පුරා ලයි. පැතිරී වැදගනී. ඔහුගේ සියලු කයෙහි නිෂ්ප්‍රීතික සුඛයෙන් පැතිරී වැද නො ගත් කිසි ද තැනෙක් නොවෙයි යන යමක් ඇද් ද, මේ ද ඔහුගේ සමාධියෙක් වෙයි.

63. ලොහිච්චය, යම් ශාස්තෘවරයකු කෙරෙහි වැස සවු තෙම මෙබඳු මහත් ගුණ වෙසෙසක් ලබා නම්, මේත් ලොවැ වොදනාවට නො සුදුසු වූ ශාස්තෘවරයෙකි. යමෙක් මෙබඳු ශාස්තෘහට වොදනා කෙරේ නම්, ඒ වොදනාව අභූතය, අතථ්‍ය ය, නො දැහැමි ය, වරද සහිත ය.

64. තැවැත ද (අතෙකක් කියමි.) ලොහිච්චය, මහණ තෙමේ සුඛ වෙදනාව ද දුරු ලීමෙන්, දුඃඛ වෙදනාව ද දුරු ලීමෙන්, පළමු කොට ම සොම්නස් දෙම්නස් දෙදෙනාගේ පහ වීමෙන්, දුක් ද නොවූ, සුව ද නොවූ, උපෙක්ෂා සමාධි යන මොවුන්ගේ පිරිසිදු බව ඇති සතර වන ධ්‍යානය ලැබ වෙසෙයි. හේ මේ කය ම පිරිසිදු ප්‍රභාස්වර සිතින් පැතිරී වැද ගෙන හුන්නේ වෙයි. ඔහුගේ සියලු කයෙහි පිරිසිදු ප්‍රභාස්වර සිතින් පැතිරී වැද නො ගෙන සිටි කිසි ද තැනෙක් නො වෙයි.

65. ලොහිච්චය, යම්සේ පුරුෂයෙක් සුදු වතින් හිසින් වටා පෙරෙවැ හුන්නේ වේ නම්, ඔහුගේ කයෙහි සුදු වතින් වැද නොගත් (නො වැසුණ) කිසි ද තැනෙක් නො වන්නේ ද, ලොහිච්චය, එසේ ම මහණ තෙම මේ කය ම පිරිසිදු ප්‍රභාස්වර සිතින් පැතිරී වැද ගෙන හුන්නේ වෙයි. ඔහු කයැ පිරිසිදු පබසර සිතින් වැද ගෙන නොසිටි කිසි ද තැනෙක් නො වෙයි.

66. ලොහිච්චය, මහණ තෙම සුඛවෙදනාව ද දුක් වෙදනාව ද පහ කිරීමෙන්, පළමුවෙන් ම සොම්නස් දෙම්නසුන් පහ වැ යෑමෙන්, දුක් ද නොවූ සුව ද නො වූ, උපෙක්ෂාවත් සමාධියත් යන මොවුන්ගේ පිරිසිදු බව ඇති සිවුවන දහන් ලැබැ වෙසෙයි. එයින් හෙ තෙම මේ කය ම පිරිසිදු පබසර සිතින් පැතිරී ගෙන හුන්නේ වෙයි. ඔහුගේ සියලු කයෙහි පිරිසිදු පබසර සිතින් පැතිරී නොගත් කිසි ද තැනෙක් නො වෙයි.

67. යස්මිං ඛො ලොහිච්ච සත්ථරි සාවකො එවරූපං උළාරං විසෙසං අධිගච්ඡති, අයම්පි ඛො ලොහිච්ච සත්ථා යො ලොකෙ න වොදනාරහො. යො ච පනෙවරූපං සත්ථාරං වොදෙති, සා වොදනා අභූතා අතච්ඡා අධම්මිකා සාවජ්ජා.

68. පුන ච පරං ලොහිච්ච සො භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ඤාණදස්සනාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො එවං පජානාති: අයං ඛො මෙ කායො රූපී චාතුම්මහාභූතිකො මාතාපෙත්තිකසම්භවො ඔදනකුම්මාසූපචයො අනිච්චුච්ඡාදනපරිමද්දන-භෙදනවිද්ධංසනධම්මො ඉදං ච පන මෙ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධන්ති.

69. සෙය්‍යථාපි ලොහිච්ච මණි වෙළුරියො සුභො ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො අවෙජ්ඣ විප්පසන්නො අනාවිලො සබ්බාකාරසම්පන්නො, තත්‍රස්ස සුත්තං ආවුතං නීලං වා පීතං වා ලොහිතං වා ඔදාතං වා පණ්ඩු-සුත්තං වා. තමෙනං චක්ඛුමා පුරිසො හත්ථෙ කරිත්වා පච්චවෙක්ඛෙය්‍ය ''අයං ඛො මණි වෙළුරියො සුභො ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො අවෙජ්ඣ විප්පසන්නො අනාවිලො සබ්බාකාරසම්පන්නො. තත්‍රිදං සුත්තං ආවුතං නීලං වා පීතං වා ලොහිතං වා ඔදාතං වා පණ්ඩුසුත්තං වා''ති, එවමෙව ඛො ලොහිච්ච භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ඤාණදස්සනාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො එවං පජානාති: අයං ඛො මෙ කායො රූපී චාතුම්මහාභූතිකො මාතාපෙත්තිකසම්භවො ඔදනකුම්මාසූපචයො අනිච්චුච්ඡාදනපරිමද්දනභෙදන-විද්ධංසනධම්මො. ඉදං ච පන මෙ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධන්ති.

70. යම්පි ලොහිච්ච භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ -පෙ- එවං පජානාති -පෙ- ඉදං ච පන මෙ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධන්ති, ඉදම්පි'ස්ස හොති පඤ්ඤාය.

71. යස්මිං ඛො ලොහිච්ච සත්ථරි සාවකො එවරූපං උළාරං විසෙසං අධිගච්ඡති, අයම්පි ඛො ලොහිච්ච සත්ථා යො ලොකෙ න වොදනාරහො. යො ච පනෙවරූපං සත්ථාරං වොදෙති, සා වොදනා අභූතා අතච්ඡා අධම්මිකා සාවජ්ජා.

67. ලෝහිච්චය, යම් ශාස්තෘවරයකු කෙරෙහි සවු තෙම මෙබඳු උදාර ගුණ විශෙෂයක් ලබා නම්, මේ ද ලොවැ චෝදනාහී නොවූ ශාස්තෘවරයෙකි. යමෙක් මෙබඳු ශාස්තෘහට චෝදනා කෙරේ නම්, ඒ චෝදනාව අභූත ය, අතථ්‍ය ය, අධාර්මික ය, සාවද්‍ය ය.

68. තව ද (අනෙකක් කියමි.) ලෝහිච්චය, ඒ මහණ තෙමේ මෙසේ එකඟ වූ සිත පිරිසිදු වූ කල්හි, දීප්තිමත් වූ කල්හි, කිලිටි නැති වූ කල්හි, පහ වූ චිත්තෝපක්ලේශ ඇති කල්හි, මෘදු වූ කල්හි, විදර්ශනා භාවනාවට යෝග්‍ය කල්හි, සිත කල්හි, නිශ්චල බවට පැමිණි කල්හි, විදර්ශනාඥානය පිණිස (පරිකර්ම) සිත එයට අභිමුඛ කෙරෙහි, ඒ අතට නමා හරියි. හේ "මගේ මේ කය වූ කලි රූපවත් ය, සතර මහාභූතයන්-ගෙන් හැදුණේ ය. මාපියන්ගේ ශුක්‍රශෝණිතයෙන් උපන්නේ ය. බත් කොමු ආදි අහරින් වැඩුණේ ය. අනිත්‍ය බව ද, දුගඳ හරනුවට සුවඳ විලෙ-වුන් ගැල්වියැ යුතු බව ද, ලෙඩ දුරුලනුවට පිරිමැදුම් ඇ කළ යුතු බව ද, එසේ කළ ද බිඳෙන බව ද, විසිරෙන බව ද යන මේ දැ සභාවය කොටැත්තේ ය. මාගේ මේ සිත ද මෙහි ලැග්ගේ ය. මෙහි බැඳුණේ යැ" යි මෙසේ දැන ගනී.

69. ලෝහිච්චය, යම්සේ සොඳුරු වූ, පිරිසිදු ආකරයෙක පහළ වූ, අටැස් වූ, මොනොවට පිරියම් කළ, සියුම් වූ, වෙසෙසින් පහත් වූ, පිවිතුරු වූ, ධොවනාදි සියලු ආකාරයෙන් යුත් වෙරළුම්ණෙක් වන්නේ ද, එහි නිල් වූ හෝ රත්වන් වූ හෝ රත්වන් හෝ සුදුවන් හෝ පඬුවන් හෝ හුයෙක් අවුතන ලද්දේ වන්නේ ද, එය ඇස් ඇති පුරුෂයෙක් අතෙහි තොට, "මේ වූ කලි සොඳුරු වූ, පිරිසිදු ආකරයෙහි උපන්, ඇටැස් වූ, මොනොවට පිරියම් කළ, සියුම් වූ, වෙසෙසින් පහත් වූ, පිවිතුරු වූ, සියලු ධොවනාදි ආකාරයෙන් සම්පූර්ණ වූ වෙරළුම්ණෙක. මෙහි නිල් වූ හෝ රත්වන් වූ හෝ පඬුවන් වූ හෝ සුදුවන් වූ හෝ මේ හුයෙක් අවුතන ලදුයේ වේ යැ" යි සලකා බලන්නේ ද, ලෝහිච්චය, එපරිද්දෙන්ම මහණ තෙමේ මෙසේ සමාධිගත සිත පිරිසිදු කල්හි, දීප්තිමත් වූ කල්හි, කෙලෙස් යටපත් වූ කල්හි, උපක්ලේශයන් පහ වූ කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍ය වූ කල්හි, සිත කල්හි, නිශ්චල බවට පැමිණි කල්හි, විදර්ශනාඥානය පිණිස සිත අභිමුඛ කෙරෙහි, ඒ අතට නමා හරියි. හෙ තෙම "මාගේ මේ කය වූ කලි රූපී ය. සතර මහාභූතයන්ගෙන් හැදුණේ ය. මාපියන්ගේ ශුක්‍රශෝණිතයෙන් නිපන්නේ ය. බත් කොමු ආදි අහරින් වැඩුණේ ය. අනිත්‍ය බව ද, දුගඳ හරනට සුවඳ විලෙවුන් ඉලියැ යුතු බව ද, ලෙඩ දුරු ලනුවට පිරිමැදුම් ඇ කළ යුතු බව ද, ඒ කළත් බිඳෙන බව ද, විසිරෙන බව ද යන මේ දැ සභාවය කොටැත්තේ ය. මාගේ මේ සිත ද මෙහි ලැග ගත්තේ ය. මෙහි බැඳුණේ යැ"යි මෙසේ දැන ගනී.

70. ලෝහිච්චය, මහණ මෙසේ සමාධිගත සිත පිරිසිදු කල්හි ... මාගේ මේ සිත ද මෙහි ලැග ගත්තේ ය. මෙහි බැඳුණේ යැ'යි මෙසේ දනී යන යමක් ඇද්ද, මේ ද ඔහුගේ ප්‍රඥාවෙක් වෙයි.

71. ලෝහිච්චය, යම් ශාස්තෘවරයකු කෙරෙහි ශ්‍රාවක තෙම මෙබඳු උදාර ගුණවිශෙෂයක් ලබා නම්, ලෝහිච්චය, මේ ද ලොවැ චෝදනාහී නොවූ ශාස්තෘවරයෙකි. යමෙකුත් මෙබඳු ශාස්තෘහට චෝදනා කෙරේ නම්, ඒ චෝදනාව අභූත ය, අතථ්‍ය ය, අධාර්මික ය, සාවද්‍ය ය.

72. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ මනොමයං කායං අභිනිම්මිනාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනොමයං සබ්බඞ්ගපච්චඞ්ගිං අහීනින්ද්‍රියං.

73. සෙය්‍යථාපි ලොහිච්ච පුරිසො මුඤ්ජම්හා ඉසිකං පවාහෙය්‍ය, තස්ස එවමස්ස: 'අයං මුඤ්ජා, අයං ඉසිකා. අඤ්ඤං මුඤ්ජා, අඤ්ඤා ඉසිකා. මුඤ්ජම්හා චෙව ඉසිකා පබාළ්හා'ති. සෙය්‍යථාපි වා පන ලොහිච්ච පුරිසො අසිං කොසියා පවාහෙය්‍ය, තස්ස එවමස්ස: 'අයං අසි අයං කොසි. අඤ්ඤං අසි, අඤ්ඤා කොසි. කොසියා චෙව අසි පබාළ්හා'ති. සෙය්‍යථාපි වා පන ලොහිච්ච පුරිසො අහිං කරණ්ඩා උද්ධරෙය්‍ය, තස්ස එවමස්ස: 'අයං අහි, අයං කරණ්ඩො. අඤ්ඤං අහි, අඤ්ඤා කරණ්ඩො. කරණ්ඩා චෙව අහි උබ්භතො'ති. එවමෙව ඛො ලොහිච්ච භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ මනොමයං කායං අභිනිම්මිනාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනොමයං සබ්බඞ්ගපච්චඞ්ගිං අහීනින්ද්‍රියං.

74. යම්පි ලොහිච්ච භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ -පෙ- අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනොමයං සබ්බඞ්ගපච්චඞ්ගිං අහීනින්ද්‍රියං, ඉදම්පි'ස්ස හොති පඤ්ඤාය.

75. යස්මිං ඛො ලොහිච්ච සත්ථරි සාවකො එවරූපං උළාරං විසෙසං අධිගච්ඡති. අයම්පි ඛො ලොහිච්ච සත්ථා යො ලොකෙ න වොදානාරහො. යො ච පනෙවරූපං සත්තාරං වොදෙති, සා වොදානා අභූතා අතච්ඡා අධම්මිකා සාවජ්ජා.

76. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති: එකො'පි හුත්වා බහුධා හොති. බහුධාපි හුත්වා එකො හොති. ආවිභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡති සෙය්‍යථාපි ආකාසෙ. පඨවියා'පි උම්මුජ්ජනිමුජ්ජං කරොති සෙය්‍යථාපි උදකෙ. උදකෙ'පි අභිජ්ජමානෙ ගච්ඡති සෙය්‍යථාපි පඨවියං. ආකාසෙ'පි පල්ලඞ්කෙන කමති සෙය්‍යථාපි පක්ඛී සකුණො. ඉමෙ'පි චන්දිමසූරියෙ එවංමහිද්ධිකෙ එවංමහානුභාවෙ පාණිනා පරාමසති පරිමජ්ජති. යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති.

72. හේ මෙසේ සමාහිත වූ සිත පිරිසිදු වූ කල්හි, දීප්තිමත් වූ කල්හි, කෙලෙස් නොමැති වූ කල්හි, උපක්ලේශ පහ වූ කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍ය වූ (සෘද්ධි ඉපැදවීමට යෝග්‍ය වූ) කල්හි, සුස්ථිත කල්හි, නිශ්චල බවට පැමිණි කල්හි, මනොමය ශරීරයක් මවා පානු පිණිස සිත යොමු කෙරෙයි, නැඹුරු කෙරෙයි. හේ මේ සිරුරෙන් රූපී වූ, සියලු අඟපසඟින් යුත්, විකල නො වූ ඉඳුරන් ඇති මනොමය ශරීරයක් මවා පායි.

73. ලොහිච්චය, යම්සේ පුරුෂයෙක් මුදුතණගසෙකින් තණකූර (=තණ බඩය) ඇද මැත් කරන්නේ ද, ඔහුට 'මේ මුදුතණගස ය, මේ එහි තණකූරය. තණ ගස එකෙකි, එහි කූර අනෙකෙකි. මුදුතණ ගස කෙරෙන් ම එහි කූර මැත් කරන ලද්දේ යැ' යි මෙසේ සිතෙක් වන්නේ ද, ලොහිච්චය, යම්සේ පුරුෂයෙක් කඩුවක් කොපුවෙන් ඇද මැත් කරන්නේ ද, ඔහුට 'මේ කඩුව ය, මේ කොපුව ය. කඩුව එකෙක, කොපුව අනෙකෙක. කොපුයෙන් ම කඩුව ඇද මැත් කරන ලද්දේයැ'යි මෙසේ සිතෙක් වන්නේ ද, ලොහිච්චය, යම්සේ වතාහි පුරුෂයෙක් නයකු සැවයෙන් ඇද වෙන් කරන්නේ ද, ඔහුට 'මේ නයා ය, මේ සැව ය. නයා එකෙක, සැවය අනෙකෙක. සැවය කෙරෙන් ම නයා ඇද වෙන් කරන ලද්දේ යැ'යි මෙසේ සිතෙක් වන්නේ ද, ලොහිච්චය, එපරිද්දෙන් ම මහණ තෙම මෙසේ සමාධිගත සිත පිරිසිදු වූ කල්හි, දීප්තිමත් වූ කල්හි, කෙලෙස් රහිත වූ කල්හි, උපක්ලේශයන් පහ වැ ගිය කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍ය වූ කල්හි, සුස්ථිත කල්හි, නිශ්චල බවට පත් කල්හි, මනොමය ශරීරයක් මවා පානු පිණිස සිත යොමු කෙරෙයි, නැඹුරු කෙරෙයි. හේ මේ ශරීරයෙන් රූපී වූ මනොමය වූ සියලු අඟපසඟින් යුත් වූ අවිකල ඉඳුරන් ඇති අන් සිරුරක් මවා පායි.

74. ලොහිච්චය, මහණ තෙම මෙසේ සමාධිගත සිත පිරිසිදු වූ කල්හි ... රූපී වූ මනොමය වූ සියලු අඟපසඟින් යුත් වූ අවිකල ඉඳුරන් ඇති අන් සිරුරක් මවා පායි යන යමක් ඇද්ද, මේ ද ඔහුගේ ප්‍රඥාවෙක් වෙයි.

75. ලොහිච්චය, යම් ශාස්තෘවරයකු කෙරෙහි ශ්‍රාවක තෙම මෙබඳු මහත් ගුණ වෙසෙසකට පැමිණේ නම්, ලොහිච්චය, මේ ද ලොවැ වොදනාගී නොවූ ශාස්තෘවරයෙකි. යමෙකුත් මෙබඳු වූ ශාස්තෘකට වොදනා කෙරේ නම්, ඒ වොදනාව අභූත ය, අතථ්‍ය ය, අධාර්මික ය, සාවද්‍ය ය.

76. හේ මෙසේ සමාහිත සිත පිරිසිදු වූ කල්හි, දීප්තිමත් වූ කල්හි, කෙලෙස් රහිත වූ කල්හි, උපක්ලේශයන් පහ වැ ගිය කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍ය(=සෘද්ධියට යෝග්‍ය) කල්හි, සුස්ථිත කල්හි, නිශ්චලබවට පැමිණි කල්හි, සෘද්ධිවිධඥානය පිණිස (අභිඥාපාදක පරිකර්ම) සිත මෙහෙයයි, නැඹුරු කෙරෙයි. හේ අනෙකවිධ වූ සෘද්ධිවිධය (සෘද්ධි කොට්ඨාසය) නැවත නැවත අනුභව කෙරෙයි (ගෙවත් තාම කයින් සපයා කෙරෙයි, ප්‍රත්‍යක්ෂ කෙරෙයි, ලබයි): පියෙවියෙන් එකෙක් වැ සිටැ ද (සෘද්ධි බලයෙන්) බහු ප්‍රකාර ද වී යළි දු එකෙක් වෙයි. තමාගේ ප්‍රකට බව කෙරෙයි (පෙනී සිටී). අප්‍රකට බව කෙරෙයි (නොපෙනී සිටියි). බිත්තියෙන් පිටතට, පවුරෙන් පිටතට, පර්වතයෙන් පිටතට අහසෙහි මෙන් කිසිවෙක නො ගැටෙනුයේ මැදින් විනිවිද යෙයි. දියෙහි මෙන් පොළොවෙහි ද යටට බැසීම (කිලීම), උඩට නැගීම (මතු වීම) කෙරෙයි. නො කිඳෙන (යට නො බස්නා) දියෙහි පොළෙවෙහි සේ යෙයි. පක්ෂ ඇති සකුණයකු මෙන් අහසෙහි ද පලඟින් (=උරුබද්ධාසනයෙන්) යෙයි. මේසා මහර්ද්ධි ඇති මහත් අනුභාව ඇති මේ සඳ හිරු දෙදෙනා ද අතින් පරාමර්ශන කෙරෙයි (=අල්ලයි), (ඔබමොබ අත යවා) පිරිමදියි. බඹලොව තෙක් ද කයින් වශය පවත්වයි.

77. සෙය්‍යථාපි ලොහිච්ච දක්ඛො කුම්භකාරො වා කුම්භකාරන්තෙවාසී වා සුපරිකම්මකතාය මත්තිකාය යං යදෙව භාජනවිකතිං ආකඞ්ඛෙය්‍ය තං තදෙව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය, සෙය්‍යථා වා පන ලොහිච්ච දක්ඛො දන්තකාරො වා දන්තකාරන්තෙවාසී වා සුපරිකම්මකතසම්මිං දන්තසම්මිං යං යදෙව දන්තවිකතිං ආකඞ්ඛෙය්‍ය තං තදෙව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය, සෙය්‍යථා වා පන ලොහිච්ච දක්ඛො සුවණ්ණකාරො වා සුවණ්ණකාරන්තෙ-වාසී වා සුපරිකම්මකතසම්මිං සුවණ්ණසම්මිං යං යදෙව සුවණ්ණවිකතිං ආකඞ්ඛෙය්‍ය තං තදෙව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය, එවමෙව ඛො ලොහිච්ච භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති: එකො'පි හුත්වා බහුධා හොති –පෙ- යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති. යම්පි ලොහිච්ච භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ –පෙ- යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති, ඉදම්පි'ස්ස හොති පඤ්ඤය

78. යස්මිං ඛො ලොහිච්ච සත්ථරි සාවකො එවරූපං උළාරං විසෙසං අධිගච්ඡති, අයම්පි ඛො ලොහිච්ච සත්ථා යො ලොකෙ න චොදනාරහො. යො ච පනෙවරූපං සත්ථාරං චොදෙති, සා චොදනා අභූතා අතච්ඡා අධම්මිකා සාවජ්ජා.

79. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ දිබ්බාය සොතධාතුයා චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො දිබ්බාය සොත-ධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය උභො සද්දෙ සුණාති දිබ්බෙ ච මානුසෙ ච යෙ දූරෙ සන්තිකෙ ච. සෙය්‍යථාපි ලොහිච්ච පුරිසො අද්ධාන-මග්ගපටිපන්නො, සො සුණෙය්‍ය භෙරිසද්දම්පි මුදිඞ්ගසද්දම්පි සඞ්ඛපණව-දෙණ්ඩිමසද්දම්පි, තස්ස එවමස්ස: භෙරිසද්දො ඉති'පි මුදිඞ්ගසද්දො ඉති'පි සඞ්ඛපණවදෙණ්ඩිමසද්දො ඉති'පි. එවමෙව ඛො ලොහිච්ච භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ දිබ්බාය සොතධාතුයා චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය උභො සද්දෙ සුණාති දිබ්බෙ ච මානුසෙ ච යෙ දූරෙ සන්තිකෙ ච.

80. යම්පි ලොහිච්ච භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ –පෙ- උභො සද්දෙ සුණාති දිබ්බෙ ච මානුසෙ ච යෙ දූරෙ සන්තිකෙ ච, ඉදම්පි'ස්ස හොති පඤ්ඤය.

77. ලෝහිච්චය, යම්සේ දක්ෂ කුඹලෙක් හෝ කුඹලක්හුගේ අතැ-වැත්සෙක් හෝ මොනොවට පිරියම් කළ (=සකස් කළ) මැටිවෙන් යම් යම් භාජන විශෙෂයක් කැමැත්තේ නම්, ඒ ඒ දෑය ම කරන්නේ ද, මොනොවට නිපදවන්නේ ද- ලෝහිච්චය, යම්සේ දක්ෂ දන්තකාරයෙක් (ඇත්දතින් විසිතුරු රූ ඇ කරන්නෙක්) හෝ දන්තකාරයක්හු අතැවැත්සෙක් හෝ මොනොවට පිරියම් කළ දතෙහි යම් යම් දන්තවිකෘතියක් තමා කැමැති නම්, ඒ ඒ දෑය ම කරන්නේ ද නිපදවන්නේ ද- ලෝහිච්චය, යම්සේ දක්ෂ රන්කරුවෙක් හෝ රන්කරුවක්හු අතැවැත්සෙක් හෝ මොනොවට පිරියම් කළ රනෙහි යම් යම් සුවර්ණවිකෘතියක් තමා කැමැත්තේ නම්, එය එය ම කරන්නේ ද, නිපදවන්නේ ද- එසේ ම ලෝහිච්චය, මහණ තෙම මෙසේ සමාහිත සිත පිරිසිදු කල්හි, පරිශුද්ධ කල්හි, අංගණ රහිත කල්හි, උපක්ලෙශ පහ වූ කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍ය කල්හි, ස්ථිත කල්හි, අචල බවට පැමිණෑ සිටි කල්හි ඍද්ධිවිධය පිණිස සිත යොමු කෙරෙයි, තමා ලයි. හේ එකෙක් වැ බොහෝ පරිදි වේ ... බඹලොව තෙක් ද කයින් වශය පවත්වයි යන අනෙකවිධ ඍද්ධිවිධ අනුභව කෙරෙයි. ලෝහිච්චය, මහණ මෙසේ සිත සමාහිත වැ පිරිසිදු වූ කල්හි ...බඹලොව දක්වා ද කයින් වශය පවත්වයි, අනෙකවිධ ඍද්ධිවිධ අනුභව කෙරේ යන යමක් ඇද්ද, මේ ද ඔහුගේ ප්‍රඥාවෙක් වේ.

78. ලෝහිච්චය, යම් ශාස්තෘවරයකු කෙරෙහි සවු තෙම මෙබඳු මහත් ගුණවෙසෙසකට පැමිණේ නම්, මේ ද ලොවැ වොදනාහී නො වූ ශාස්තෘවරයෙකි. යමෙක් මෙබඳු ශාස්තෘහට වොදනා කෙරේ නම්, ඒ වොදනාව අභූත ය, අතථ්‍ය ය, අධර්මික ය, සාවද්‍ය ය.

79. හේ මෙසේ සිත සමාහිත වැ පිරිසිදු වූ කල්හි, දීප්තිමත් වූ කල්හි, කෙලෙස් රහිත වූ කල්හි, උපක්ලෙශ පහ වැ ගිය කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍ය වූ කල්හි, ස්ථිත කල්හි, නිශ්චල බවට පැමිණි කල්හි, දිව්‍යශ්‍රෝත්‍ර-ධාතුව පිණිස (=දිවකන් නුවණ පිණිස) සිත යොමු කෙරෙයි, නැඹුරු කෙරෙයි හේ පිරිසිදු වූ, මිනිසුන්ගේ ශ්‍රවණෝපචාරය ඉක්ම සිටි දිවකනින් දිව්‍ය වූ ද මානුෂක වූ ද දුරු වූ ද, ළඟැ වූ ද ද්විවිධ ශබ්ද ම අසයි. ලෝහිච්චය, යම්සේ මිනිසෙක් දික් මඟකට පිළිපන්නේ ද, හේ බෙර හඬත් මිහිඟුබෙර හඬත් පණාබෙර හඬත් ගැටබෙර හඬත් යම් සේ අසන්නේ ද, ඒ අසන ඔහුට මේ බෙර හඬැයි කියාත් මේ මිහිඟුබෙර හඬැ යි කියාත් මේ සක් හඬ යැ, මේ පණාබෙර හඬ යැ, මේ ගැටබෙර හඬ යැ යි කියාත් මෙසේ සිතෙක් වන්නේ ද, ලෝහිච්චය, එපරිද්දෙන් ම මහණ තෙමේ මෙසේ සිත සමාහිත වූ වැ පිරිසිදු වූ කල්හි, දීප්තිමත් වූ කල්හි, කෙලෙස් රහිත වූ කල්හි, උපක්ලෙශ පහ වැ ගිය කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍ය (කර්ම්මණ්‍ය) වූ කල්හි, ස්ථිත කල්හි, නිශ්චල බවට පැමිණි කල්හි, දිව්‍ය-ශ්‍රෝත්‍රධාතුව පිණිස සිත යොමු කෙරෙයි, නැඹුරු කෙරෙයි. හේ පිරිසිදු වූ, මිනිසුන්ගේ ශ්‍රවණෝපචාරය ඉක්ම දිවකන්නුවණින් දිව්‍ය වූත් මානුෂක වූත්, දුරු වූත් ළඟැ වූත් ද්විවිධ ශබ්ද අසයි.

80. ලෝහිච්චය, ඒ මහණ මෙසේ සිත සමාධිගත වැ පිරිසිදු වූ කල්හි ... දිව්‍ය වූ ද මානුෂක වූ ද, දුරු වූ ද ළඟැ වූ ද ද්විවිධ ශබ්ද අසයි යන යමෙක් ඇද්ද, මේ ද ඔහුගේ ප්‍රඥාවෙක් වේ.

81. යස්මිං ඛො ලොකිවජ්ජ සත්ථරි සාවකො එවරූපං උළාරං විසෙසං අධිගච්ඡති, අයම්පි ඛො ලොකිවජ්ජ සත්ථා යො ලොකෙ න වොදානාරහො. යො ච පනෙවරූපං සත්ථාරං වොදෙති, සා වොදානා අහුතා අතච්ඡා අධම්මිකා සාවජ්ජා.

82. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ චෙතොපරියඤ්ඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාති: සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති. විතරාගං වා චිත්තං විතරාගං චිත්තන්ති පජානාති. සදොසං වා චිත්තං සදොසං චිත්තන්ති පජානාති. විතදොසං වා චිත්තං විතදොසං චිත්තන්ති පජානාති. සමොහං වා චිත්තං සමොහං චිත්තන්ති පජානාති. විතමොහං වා චිත්තං විතමොහං චිත්තන්ති පජානාති. සඛිත්තං වා චිත්තං සඛිත්තං චිත්තන්ති පජානාති. වික්ඛිත්තං වා චිත්තං වික්ඛිත්තං චිත්තන්ති පජානාති. මහග්ගතං වා චිත්තං මහග්ගතං චිත්තන්ති පජානාති. අමහග්ගතං වා චිත්තං අමහග්ගතං චිත්තන්ති පජානාති. සඋත්තරං වා චිත්තං සඋත්තරං චිත්තන්ති පජානාති. අනුත්තරං වා චිත්තං අනුත්තරං චිත්තන්ති පජානාති. සමාහිතං වා චිත්තං සමාහිතං චිත්තන්ති පජානාති. අසමාහිතං වා චිත්තං අසමාහිතං චිත්තන්ති පජානාති. විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානාති. අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති.

83. සෙය්‍යථාපි ලොකිවජ්ජ ඉත්ථී වා පුරිසො වා දහරො වා යුවා මණ්ඩනකජාතිකො ආදාසෙ වා පරිසුද්ධෙ පරියොදාතෙ අච්ඡෙ වා උදකපත්තෙ සකං මුඛනිමිත්තං පච්චවෙක්ඛමානො සකණ්ඩිකං වා සකණ්ඩිකන්ති ජානෙය්‍ය, අකණ්ඩිකං වා අකණ්ඩිකන්ති ජානෙය්‍ය, එවමෙව ඛො ලොකිවජ්ජ භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ චෙතොපරියඤ්ඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාති: සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති. විතරාගං වා චිත්තං විතරාගං චිත්තන්ති පජානාති. සදොසං වා චිත්තං සදොසං චිත්තන්ති පජානාති. විතදොසං වා චිත්තං විතදොසං චිත්තන්ති පජානාති. සමොහං වා චිත්තං සමොහං චිත්තන්ති පජානාති. විතමොහං වා චිත්තං විතමොහං චිත්තන්ති පජානාති. සඛිත්තං වා චිත්තං -පෙ- වික්ඛිත්තං වා චිත්තං -පෙ- මහග්ගතං වා චිත්තං -පෙ- අමහග්ගතං වා චිත්තං -පෙ- සඋත්තරං වා චිත්තං -පෙ- අනුත්තරං වා චිත්තං -පෙ- සමාහිතං වා චිත්තං -පෙ- අසමාහිතං වා චිත්තං -පෙ- විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානාති. අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති

84. යම්පි ලොකිවජ්ජ භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ -පෙ- අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති, ඉදම්පි'ස්ස හොති පඤ්ඤාය

81. ලොහිචචය, යම් ශාස්තෘවරයකු කෙරෙහි සවු තෙම මෙබඳු මහත් ගුණ වෙසෙසකට පැමිණේ නම්, ලොහිචචය, මේ ද ලොවැ වොදනාහී නොවූ ශාස්තෘවරයෙකි. යමෙක් මෙබඳු ශාස්තෘහට වොදනා කෙරේ නම්, ඒ වොදනාව අභූතය, අතථ්‍ය ය, අධාර්මික ය, සාවද්‍ය ය.

82. හේ මෙසේ සිත එකඟ වැ පිරිසිදු වූ කල්හි; දිප්තිමත් වූ කල්හි, කෙලෙස් රහිත වූ කල්හි, උපක්ලේශ පහ වැ ගිය කල්හි, මෘදු වූ කල්හි, කර්ම්‍යක්ෂම වූ කල්හි, ස්ථිත කල්හි, නිශ්චල බවට පැමිණි කල්හි, චෙතස්පර්‍යායඥානය පිණිස (=අනුන්ගේ සිත පිරිසිඳ දන්නා නුවණ පිණිස) සිත යොමු කෙරෙයි, නැඹුරු කෙරෙයි. හේ අන් සත්වයන්ගේ අන් පුද්ගලයන්ගේ සිත සිය සිතින් පිරිසිඳැ දනියි: රාග සහිත සිත රාග සහිත සිතැ යි දනියි. රාග රහිත සිත රාග රහිත සිතැ යි දනියි. දෝෂ සහිත සිත දෝෂ සහිත සිතැයි දනී. දෝෂරහිත සිත දෝෂරහිත සිතැ යි දනී. මෝහසහිත සිත මෝහසහිත සිතැ යි දනී. මෝහරහිත සිත මෝහරහිත සිතැ යි දනී. සංක්ෂිප්ත (=හැකුළුණු) සිත හැකුළුණු සිතැ යි දනී. වික්ෂිප්ත (=විසුරුණු) සිත විසුරුණු සිතැ යි දනී. මහද්ගත සිත මහද්ගත සිතැ යි දනී. අමහද්ගත සිත අමහද්ගත සිතැ යි දනී. සෝත්තර සිත සෝත්තර සිතැ යි දනී. අනුත්තර සිත අනුත්තර සිතැ යි දනී. සමාහිත සිත සමාහිත සිතැ යි දනී. අසමාහිත සිත අසමාහිත සිතැ යි දනී. විමුක්ත (=මිදුණු) සිත විමුක්ත සිතැ යි දනී. අවිමුක්ත (=නොමිදුණු) සිත අවිමුක්ත සිතැ යි දනී.

83. ලොහිචචය, යම්සේ සැරැසෙනසුලු ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ ළදරුවෙක් හෝ තරුණයෙක් හෝ පිරිසිදු දීප්තිමත් කැඩපතෙක හෝ පහත් දියබඳුනෙක හෝ සිය මුහුණට පිරික්සා බලන්නේ තල-කැලැල් ආදි දෙස් ඇති තැන් සතෙස් තැතැ යි දන්නේ ද, එ කී දෙස් නැති තැන දෙස් තැතැ යි දන්නේ ද, ලොහිචචය, එ පරිද්දෙන් ම මහණ තෙමේ මෙසේ සිත සමාහිත වැ පිරිසිදු වූ කල්හි, දීප්ත වූ කල්හි, කෙලෙස් නැති වූ කල්හි, උපක්ලේශ පහ වැ ගිය කල්හි, මෘදු වූ කල්හි, කර්ම්‍යක්ෂම වූ කල්හි, ස්ථිත කල්හි, නිශ්චල බවට පැමිණි කල්හි, පරසිත් දන්නා නුවණ පිණිස සිත යොමු කෙරෙයි, නැඹුරු කෙරෙයි. හේ අන් සතුන්ගේ, අන් පුගුලන්ගේ සිත සිය සිතින් පිරිසිඳැ දනී. සරාග සිත සරාග සිතැ යි දනී. වීතරාග සිත වීතරාග සිතැ යි දනී. සදෝෂ සිත සදෝෂ සිතැ යි දනී. වීත දෝෂ සිත වීතදෝෂ සිතැ යි දනී. සමෝහ සිත සමෝහ සිතැ යි දනී. වීතමෝහ සිත වීතමෝහ සිතැ යි දනී. සංක්ෂිප්ත සිත සංක්ෂිප්ත සිතැ යි දනී. වික්ෂිප්ත සිත වික්ෂිප්ත සිතැයි දනී. මහද්ගත සිත මහද්ගත සිතැ යි ... අමහද්ගත සිත අමහද්ගත සිතැ යි ... සෝත්තර සිත සෝත්තර සිතැ යි ... අනුත්තර සිත අනුත්තර සිතැ යි ... සමාහිත සිත සමාහිත සිතැ යි ... අසමාහිත සිත අසමාහිත සිතැ යි ... විමුක්ත සිත විමුක්ත සිතැ යි ... අවිමුක්ත සිත අවිමුක්ත සිතැ යි දනී.

84. ලොහිචචය, මහණ තෙම මෙසේ සිත සමාහිත වැ පිරිසිදු වූ කල්හි ... අවිමුක්ත සිත අවිමුක්ත සිතැ යි දනී යන යමක් ඇද්ද, මේත් මහුගේ ප්‍රඥාවෙක් වෙයි.

85. යස්මිං ඛො ලෝකිවජ්ජ සත්ථරි සාවකො එවරූපං උළාරං විසෙසං අධිගච්ඡති, අයම්පි ඛො ලෝකිවජ්ජ සත්ථා යො ලොකෙ න වොදනාරහො. යො ච පනෙවරූපං සත්ථාරං වොදෙති, සා වොදනා අහුතා අතච්ඡා අධම්මිකා සාවජ්ජා.

86. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ පුබ්බෙ-නිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො අනෙක-විහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථීදං: එකම්පි ජාතිං දෙ'පි ජාතියො තිස්සො'පි ජාතියො චතස්සො'පි ජාතියො පඤ්ච'පි ජාතියො දස'පි ජාතියො වීසම්පි ජාතියො තිංසම්පි ජාතියො චත්තාරීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි-අනෙකෙ'පි සංවට්ටකප්පෙ අනෙකෙ'පි විවට්ටකප්පෙ අනෙකෙ'පි සංවට්ටවිවට්ටකප්පෙ 'අමුත්‍රාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවං සුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො අමුත්‍ර උපපාදිං. තත්‍රාපාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො ඉධූපපන්නො'ති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

87. සෙය්‍යථාපි ලෝකිවජ්ජ පුරිසො සකම්හා ගාමා අඤ්ඤං ගාමං ගච්ඡෙය්‍ය, තම්හා'පි ගාමා අඤ්ඤං ගාමං ගච්ඡෙය්‍ය, සො තම්හා ගාමා සකඤ්ඤෙව ගාමං පච්චාගච්ඡෙය්‍ය, තස්ස එවමස්ස: 'අහං ඛො සකම්හා ගාමා අමුං ගාමං අගච්ඡිං. තත්‍ර එවං අට්ඨාසිං එවං නිසීදිං එවං අභාසිං එවං තුණ්හී අහොසිං. තම්හාපි ගාමා අමුං ගාමං අගච්ඡිං. තත්‍රාපි එවං අට්ඨාසිං එවං නිසීදිං එවං අභාසිං එවං තුණ්හී අහොසිං. සො'මහි තම්හා ගාමා සකඤ්ඤෙව ගාමං පච්චාගතො'ති. එවමෙව ඛො ලෝකිවජ්ජ භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ පුබ්බෙනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථීදං: එකම්පි ජාතිං දෙ'පි ජාතියො තිස්සො'පි ජාතියො චතස්සො'පි ජාතියො පඤ්චපි ජාතියො දස'පි ජාතියො වීසම්පි ජාතියො තිංසම්පි ජාතියො චත්තාරීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි, අනෙකෙ'පි සංවට්ටකප්පෙ අනෙකෙ'පි විවට්ටකප්පෙ අනෙකෙ'පි සංවට්ටවිවට්ටකප්පෙ 'අමුත්‍රාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො අමුත්‍ර උපපාදිං. තත්‍රාපාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො සො තතො චුතො ඉධූපපන්නො'ති.

85. ලෝකිවවය, යම් ශාස්තෘවරයකු කෙරෙහි සවු තෙම මෙබඳු මහත් ගුණ වෙසෙසක් ලබා නම්, ලෝකිවවය, මේ ද ලොවැ වොදනාකී නොවූ ශාස්තෘවරයෙකි. යමෙක් මෙබඳු ශාස්තෘහට වොදනා කෙරේ නම්, ඒ වොදනාව අභූත ය, අතථ්‍ය ය, අධර්මික ය, සාවද්‍ය ය.

86. හෙ තෙමේ මෙසේ සිත සමාහිත වැ පිරිසිදු වූ කල්හි, දීප්ත වූ කල්හි, කෙලෙස් තැති වූ කල්හි, උපක්ලේශ පහ වැ ගිය කල්හි, මෘදු වූ කල්හි, කර්ම්ක්ෂම වූ කල්හි, ස්ථිත කල්හි, නිශ්චල බවට පත් කල්හි, පූර්වේ-නිවාසානුස්මෘති ඥානය (=පෙර වූසු කද පිළිවෙළ දක්නා නුවණ) ලබනු පිණිස සිත යොමු කෙරෙයි. හේ එක් ජාතියක් ද ජාති දෙකක් ද ජාති තුනක් ද ජාති සතරක් ද ජාති පසක් ද ජාති දසයක් ද ජාති විස්සක් ද ජාති තිසක් ද ජාති සතළිසක් ද ජාති පනසක් ද ජාති සියක් ද ජාති දහසක් ද ජාති සුවහසක් ද, බොහෝ සංවර්ත කල්ප ද, බොහෝ විවර්ත කල්ප ද, බොහෝ සංවර්ත විවර්ත කල්ප ද, "අසෝ තන්හි මේ නම් ඇතියෙම් වීමි. මෙ ගොත් ඇතියෙම් වීමි. මෙබඳු පැහැ ඇතියෙම් වීමි. මෙබඳු ආහාර ඇතියෙම් වීමි. මෙ බඳු සුව දුක් විඳින්නෙම් වීමි. මේ බඳු (මෙතෙක්) ආයු කෙළවර කොටැතියෙම් වීමි.ඒ මම එයින් සැවැ අසෝ තැන උපතිමි. එහි ද මෙ නම් ඇතියෙම් වීමි. මෙ ගොත් ඇතියෙම් වීමි, මෙ බඳු පැහැ සටහන් ඇතියෙම් වීමි. මෙ බඳු ආහාර ඇතියෙම් වීමි. මෙබඳු සුවදුක් විඳින්නෙම් වීමි. මෙතෙක් ආයු සීමාවක් ඇතියෙම් වීමි. ඒ මම එයින් සැව මෙහි උපතිමි"යි මෙසේ අනෙකවිධ වූ නම් ගොත් විසින් උද්දෙශ සහිත වූ බහුවිධ වූ පූර්වේනිවාසය සිහි කෙරෙයි.

87. ලෝකිවවය, යම්සේ පුරුෂයෙක් සිය ගමින් අන් ගමකට යන්නේ ද, ඒ ගම්නුත් අන් ගමකට යන්නේ ද, (නැවත) හේ එගමින් සිය ගමට ම වටාලා එන්නේ ද, එසේ වූ ඔහුට "මම වූ කලී සිය ගමින් අසෝ ගමට ගියෙමි. එහි මෙසේ සිටියෙමි, මෙසේ හුන්නෙමි, මෙසේ කීමි, මෙසේ නිහඬ වීමි. ඒ ගම්නුත් අසෝ ගමට ගියෙමි. එහි ද මෙසේ සිටියෙමි, මෙසේ උන්නෙමි, මෙසේ කීමි, මෙසේ නිහඬ වීමි. ඒ මම ඒ ගමින් සිය ගමට ම පෙරළා ආයෙමි වෙමි"යි ඔහුට මෙ බඳු සිතෙක් වන්නේ ද - ලෝකිවවය, එපරිද්දෙන් ම මහණ තෙමේ මෙසේ සිත සමාහිත වැ පිරිසිදු කල්හි, දීප්ත කල්හි, කෙලෙස් රහිත කල්හි, උපක්ලේශ පහ වැ ගිය කල්හි, මෘදු වූ කල්හි, කර්ම්ක්ෂම වූ කල්හි, ස්ථිත කල්හි, නිශ්චල බවට පැමිණි කල්හි, පෙරැ වූසු කද පිළිවෙළ සිහි කරන නුවණ පිණිස සිත මොනොවට යොමු කෙරෙයි, මොනොවට තැබුරු කෙරෙයි. හේ එක් ජාතියක් ද, ජාති දෙකක් ද, ජාති තුනක් ද,ජාති සතරක් ද, ජාති පසක් ද, ජාති දසයක් ද, ජාති විස්සක් ද, ජාති තිසක් ද, ජාති සතළිසක් ද ජාති පනසක් ද, ජාති සියයක් ද, ජාති දහසක් ද, ජාති සුවහසක් ද, බොහෝ සංවර්ත කල්ප ද, බොහෝ විවර්ත කල්ප ද, බොහෝ සංවර්ත විවර්ත කල්පද, "අසෝ තන්හි මෙ නම් ඇතියෙම් වීමි, මේ බඳු ගොත් ඇතියෙම් වීමි, මෙ බඳු පැහැ ඇතියෙම් වීමි, මෙ බඳු ආහාර ඇතියෙම් වීමි, මෙ බඳු සුවදුක් විඳුනෙම් වීමි, මේ බඳු ආයු සීමා ඇතියෙම් වීමි, ඒ මම එයින් සැව අසෝ තැන උපතිමි. එහි ද මෙ නම් ඇතියෙම්, මේ ගොත් ඇතියෙම්, මෙ බඳු පැහැසටහන් ඇතියෙම් මෙ බඳු ආහාර ඇතියෙම්, මේ බඳු සුවදුක් විඳින්නෙම් වීමි, මෙතෙක් ආයු සීමා ඇතියෙම් වීමි. ඒ මම එයින් සැවැ මෙහි උපතිමි'යි-

ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. යම්පි ලොහිච්ච භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ -පෙ- අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති, ඉදම්පි'ස්ස හොති පඤ්ඤාය.

88. යස්මිං ඛො ලොහිච්ච සත්ථරි සාවකො එවරූපං උළාරං විසෙසං අධිගච්ඡති, අයම්පි ඛො ලොහිච්ච සත්ථා යො ලොකෙ න වොදානාරහො. යො ච පනෙවරූපං සත්ථාරං වොදෙති, සා වොදානා අභූතා අතච්ඡා අධම්මිකා සාවජ්ජා.

89. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති: 'ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මා-දිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා'ති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්ත-මානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති.

90. සෙය්‍යථාපි ලොහිච්ච මජ්ඣෙ සිංඝාටකෙ පාසාදො. තත්ථ චක්ඛුමා පුරිසො ඨිතො පස්සෙය්‍ය මනුස්සෙ ගෙහං පවිසන්තො'පි නික්ඛමන්තො'පි රථියා වීතිසඤ්චරන්තො'පි මජ්ඣෙ සිංඝාටකෙ නිසින්නො'පි. තස්ස එවමස්ස: එතෙ මනුස්සා ගෙහං පවිසන්ති. එතෙ නික්ඛමන්ති. එතෙ රථියා වීති-සඤ්චරන්ති. එතෙ මජ්ඣෙ සිංඝාටකෙ නිසින්නා'ති. එවමෙව ඛො ලොහිච්ච භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති: ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා-

මෙ පරිද්දෙන් ආකාර සහිත වූ උද්දෙශ සහිත වූ පෙරැ වුසු නත් වැදැරුම් කඳපිළිවෙල සිහි කෙරෙයි. ලෝහිච්චය, මහණ තෙම මෙසේ සිත සමාහිත වැ පිරිසිදු කල්හි ...අනෙකවිධ වූ පෙරැ වුසු කඳපිළිවෙල සිහි කෙරෙයි යන යමෙක් ඇද්ද, මෙ ද ඔහුගේ ප්‍රඥාවෙක් වෙයි.

88. ලෝහිච්චය, යම් ශාස්තෘවරයකු කෙරෙහි සවු තෙම මෙබඳු මහත් ගුණ වෙසසක් ලබා නම්, ලෝහිච්චය, මේ ද ලොවැ වොදනාහී නො වූ ශාස්තෘවරයෙක් වේ. යමෙක් මෙබඳු ශාස්තෘවරයකුට වොදනා කෙරේ නම්. ඒ වොදනාව අභූත ය, අතථ්‍ය ය, අධාර්මික ය, නාවද්‍ය ය.

89. හේ මෙසේ සිත සමාහිත වැ පිරිසිදු කල්හි, දීප්ත කල්හි, කෙලෙස් නැති කල්හි, උපකෙලශ පහ වූ කල්හි, මෘදු වූ කල්හි, කර්ම්ණම වූ කල්හි, ස්ථිත කල්හි, නිශ්චල බවට පැමිණි කල්හි, සත්ත්වයන්ගේ ච්‍යුති උපපත්ති දක්නා ඥාන පිණිස සිත යොමු කෙරෙයි, නැඹුරු කෙරෙයි. හේ පිරිසිදු වූ, මිනිසුන්ගේ දර්ශනෝපචාරය ඉක්මැ දැක්කැ හැකි දිවැසින්, 'අහෝ! මේ භවත් සත්ත්වයෝ කායදුශ්චරිතයෙන් සමන්විතයහ, වාග්දුශ්චරිතයෙන් සමන්විතයහ, මනොදුශ්චරිතයෙන් සමන්විතයහ, ආර්‍යෝපවාද කළහ, මිසදිටු වශයෙන් ගත් මිථ්‍යාවෘත ඇතියහ. ඒ මොහු කරජකය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහ වූ, දුෂ්ටකර්ම හෙතු-යෙන් හටගත් ගතිය වූ, (කර්මයට තමන් පරවශ බැවින්) තමනට අවශ වැ වැටෙන තැන වූ නිරයට වන්නාහ. මේ භවත් සත්ත්වයෝ වූ කලි කායසුචරිතයෙන් සමන්විතයහ, වාක්සුචරිතයෙන් සමන්විතයහ, මනඃ-සුචරිතයෙන් සමන්විතයහ, ආර්‍යයනට උපවාද නො කළහ, සම්දිටු ගත්තාහ, සම්දිටු වශයෙන් ගත් ශීලාදිය ඇත්තාහ. ඒ මොහු කාබුත් මරණින් මතු ශොභන වූ ගති ඇති සඟලොවට වන්නාහ' යි මරණ-සන්න වූ ද, එකෙණෙහි පිළිසිඳ ගත්තා වූ ද, ගීත වූ ද, උසස් වූ ද, මනඃ පැතැ සටහන් ඇති වූ ද, තොමනා පැතැ සටහන් ඇති වූ ද, සුගතියට පැමිණියා වූ ද, දුගතියට පැමිණියා වූ ද, කර්ම වූ පරිදි ඒ ඒ භවයට ගියා වූ ද සත්ත්වයන් දකී. මෙසේ හේ පිරිසිදු වූ, මානුෂක විෂය ඉක්මැ පැවැති දිවැසින් හීන ප්‍රණීත, සුවර්ණ දුර්වර්ණ, සුගත දුර්ගත සත්ත්වයන් දකී. කර්ම වූ පරිදි ඒ ඒ භවය කරා එළැඹැ සිටි සත්ත්වයන් දකී.

90. ලෝහිච්චය, යම්සේ සතර මං හන්දියෙක මහල් සහිත ගෙයෙක් වන්නේ ද, එහි උඩු මහලෙහි ඇත් ඇති පුරුෂයෙක් සිටියේ ගෙට පිවිසෙන-වුනුත් ගෙන් නික්මෙනවුනුත් විදියෙහි ඇත මැත යන එනවුනුත්, සිවුමංහන්දිය මැද හුන්නවුනුත් දක්නේ ද, ඒ දක්නා ඔහුට "මේ මිනිස්සු ගෙට පිවිසෙත්. මේ මිනිස්සු ගෙන් නික්මෙත්. මේ මිනිස්සු විදියෙහි ඇත මැත යෙත්, මොහු සිවුමංහන්දිය මැද හුන්නෝ වෙත් යැ" යි මෙසේ සිතෙක් වන්නේ ද, ලෝහිච්චය, එ පරිදි ම එ මහණ තෙමේ මෙසේ සිත සමාහිත වැ පිරිසිදු කල්හි දීප්තිමත් කල්හි කෙලෙස් නැති කල්හි උපකෙලශ පහ වූ කල්හි මෘදු කල්හි කර්ම්ණම කල්හි ස්ථිත කල්හි නිශ්චල බවට පැමිණි කල්හි, සත්ත්වයන්ගේ ච්‍යුති උපපත්ති දක්නා ඥාන ලබනු පිණිස සිත යොමු කෙරෙයි, නැඹුරු කෙරෙයි. හේ මානුෂක විෂයය ඉක්මැ පිරිසිදු වූ දිවැසින් "අහෝ, මේ භවත් සත්ත්ව කායදුශ්චරිතයෙන් සමන්-විතයහ, වාග්දුශ්චරිතයෙන් සමන්විතයහ, මනොදුශ්චරිතයෙන් සමන්-විතයහ, ආර්‍යයනට උපවාද කළහ, මිසදිටුවහ, මිසදිටු වශයෙන් ගත් ව්‍රත ඇතියහ.-

තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා' ති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති. යම්පි ලොහිච්ච භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ -පෙ- සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති, ඉදම්පි'ස්ස හොති පඤ්ඤාය.

91. යස්මිං ඛො ලොහිච්ච සත්ථරි සාවකො එවරූපං උළාරං විසෙසං අධිගච්ඡති, අයම්පි ඛො ලොහිච්ච සත්ථා යො ලොකෙ න වොදානාරහො. යො ච පනෙවරූපං සත්ථාරං වොදෙති, සා වොදානා අභූතා අතච්ඡා අධම්මිකා සාවජ්ජා.

92. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති. අයං දුක්ඛසමුදයො'ති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරොධො'ති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති. ඉමෙ ආසවා'ති යථාභූතං පජානාති. අයං ආසවසමුදයො'ති යථාභූතං පජානාති. අයං ආසවනිරොධො'ති යථාභූතං පජානාති. අයං ආසවනිරොධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති. තස්ස එවං ජානතො එවං පස්සතො කාමාසවාපි චිත්තං විමුච්චති, භවාසවාපි චිත්තං විමුච්චති. අවිජ්ජාසවාපි චිත්තං විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති.

ඒ මොහු කා බුත් මරණින් මතු, සැපයෙන් පහ වූ, දුඃඛ කර්මයෙන් උපන් ගතිය වූ, තමනට තමන් අවශ්‍ය වැ වැටෙන තැන වූ නිරයට වන්හ. එහෙත් මේ භවත් සත්ත්වයෝ වූ කලි කායසුචරිතයෙන් සමන්විතයහ, වාක්සුචරිතයෙන් සමන්විතයහ, මනඃසුචරිතයෙන් සමන්විතයහ, ආර්යයනට උපවාද නො කළහ, සම්දිටු ගත්හ, සම්දිටු විසින් ගත් ශීලාදිය ඇත්තාහ. මොහු කා බුත් මරණින් මතු ශොභන ගති ඇති සගලොවට වන්නාහ''යි මෙසේ මරණාසන්න වූ ද, එකෙණෙහි පිළිසඳ ගත්තාවූ ද, පහත් වූ ද, උසස් වූ ද, මනා පැහැ සටහන් ඇති වූ ද, නො මනා පැහැ සටහන් ඇති වූ ද, සුගතියට පැමිණියා වූ ද, දුර්ගතියට පැමිණියා වූ ද, කර්ම වූ පරිදි ඒ ඒ භවයට ගිය සත්ත්වයන් දකී. මෙසේ පිරිසිදු වූ, මානුෂක විෂයය ඉක්මැ පැවැති දිවැසින් හීන ප්‍රණීත සුවර්ණ දුර්වර්ණ සුගත දුර්ගත සත්ත්වයන් දකී. කර්ම වූ පරිදි ඒ ඒ භවය කරා එළැඹැ සිටි සත්ත්වයන් දකී. ලොහිච්චය, මහණ තෙම මේසේ සිත සමාහිත වැ පිරිසිදු කල්හි... සුගත දුර්ගත වූ කර්ම වූ පරිදි ඒ ඒ භවය කරා එළැඹැ සිටි සතුන් දකී යන යමෙක් ඇද්ද, මේ ද ඔහුගේ ප්‍රඥාවෙක් වෙයි.

91. ලොහිච්චය, යම් ශාස්තෘවරයකු කෙරෙහි සවු තෙම මෙබඳු මහත් ගුණ වෙසෙසක් ලබා නම්, ලොහිච්චය, මේ ද ලොවැ වොදනාහි නොවූ ශාස්තෘවරයෙකි. යමෙක් මෙබඳු ශාස්තෘහට වොදනා කෙරේ නම්, ඒ වොදනාව අභූත ය, අතථ්‍යය, අධාර්මික ය, සාවද්‍ය ය.

92. හේ මෙසේ සමාහිත සිත පිරිසිදු වැ දීප්ත වැ නිකෙලෙස් වැ උපක්ලේශ පහ වැ මෘදු වැ කර්මක්ෂම වැ ස්ථිත වැ නිශ්චල බවට පැමිණැ සිටි කල්හි, ආස්‍රවයන්ගේ ක්ෂයය (විනාශය) පිණිස සිත මොනොවට යොමු කෙරෙයි, මොනොවට නැඹුරු කෙරෙයි. හෙ තෙමේ 'මේ දුකැ' යි ඇති සැටියෙන් දනී. 'මේ දුක් ඉපැද්මට කාරණයැ' යි ඇති සැටියෙන් දනී. 'මේ දුක් වැනැස්මැ' යි (නිවනැ' යි) ඇති සැටියෙන් දනී. 'මේ දුක් වැනැස්මට යන පිළිවෙතැ'යි ඇති සැටියෙන් දනී. 'මොහු ආස්‍රවයෝ යැ'යි ඇති සැටියෙන් දනී. 'මේ ආස්‍රවයන් ඉපැද්මට කරුණැ'යි ඇති සැටියෙන් දනී. 'මේ ආස්‍රවනිරෝධයැ' යි ඇති සැටියෙන් දනී. 'මේ ආස්‍රවනිරෝධගාමිනී ප්‍රතිපත්ති යැ'යි ඇති සැටියෙන් දනී. මෙසේ දන්නා මෙසේ දක්නා ඔහු සිත කාමාස්‍රවය කෙරෙන් ද මිදේ. ඔහු සිත භවාස්‍රවය කෙරෙන් ද මිදේ. ඔහු සිත අවිද්‍යාස්‍රවය කෙරෙන් ද මිදේ. (එසේ සිත) මිදුණු කල්හි 'මා සිත ආස්‍රව කෙරෙන් මිදුණේ යැ' යි (ප්‍රත්‍යවෙක්ෂණ) ඥානය වේ. 'භවෝත්පත්තිය ක්ෂීණ විය (භවත් තැවැත භවයෙහි නොඋපදනා සභාවයට පැමිණියෙමි). 'මහබඹසර වැස නිමැවිණි. (සිවු සස්හි සතර මඟින්) කළ යුතු සොළොස් වැදැරුම් කිය කොටැ නිමැවිණි. මේ බව පිණිස (=මේ ක්ලේශක්ෂයය පිණිස) යළි දු කටයුතු දෙයක් නැතැ'යි හේ දනී.

93. සෙය්‍යථාපි ලොකිවජ්ජ පබ්බතපාදෙ උදකරහදෙ අවෙජ්ජ විප්පසන්නො අනාවිලො. තත්‍ර චක්ඛුමා පුරිසො තීරෙ ඨිතො පස්සෙය්‍ය සිප්පිසම්බුකම්පි සක්ඛරකඨලම්පි මච්ඡගුම්බම්පි චරන්තම්පි තිට්ඨන්තම්පි. තස්ස එවමස්ස: අයං ඛො උදකරහදො අවෙජ්ජ විප්පසන්නො අනාවිලො. තත්‍රිමෙ සිප්පිසම්බුකා'පි සක්ඛරකඨලා'පි චරන්ති'පි තිට්ඨන්ති'පි ති.

94. එවමෙව ඛො ලොකිවජ්ජ භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනීහරති අභිනිප්පාමෙති. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති. අයං දුක්ඛසමුදයො'ති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරොධො'ති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති. ඉමෙ ආසවා'ති යථාභූතං පජානාති. අයං ආසවනිරොධො'ති යථාභූතං පජානාති. අයං ආසවනිරොධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති.

95. තස්ස එවං ජානතො එවං පස්සතො කාමාසවා'පි චිත්තං විමුච්චති. භවාසවා'පි චිත්තං විමුච්චති. අවිජ්ජාසවා'පි චිත්තං විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති.

96. යස්මිං ඛො ලොකිවජ්ජ සපරි සාවකො එවරූපං උළාරං විසෙසං අධිගච්ඡති, අයම්පි ඛො ලොකිවජ්ජ සත්ථා යො ලොකෙ න වොදතාරහො, යො ච පනෙවරූපං සත්ථාරං වොදෙති, සා වොදතා අභූතා අතච්ඡා අධම්මිකා සාවජ්ජාති.

97. එවං වුත්තෙ ලොකිවෙජ්ජො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: සෙය්‍යථාපි භො ගොතම පුරිසො පුරිසං තරකපපාතං පපතන්තං කෙසෙසු ගහෙත්වා උද්ධරිත්වා ථලෙ පතිට්ඨාපෙය්‍ය, එවමෙවාහං භොතා ගොතමෙන තරකපපාතං පපතන්තො උද්ධරිත්වා ථලෙ පතිට්ඨාපිතො. අභික්කන්තං භො ගොතම අභික්කන්තං භො ගොතම. සෙය්‍යථාපි භො ගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නං වා විවරෙය්‍ය මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛන්තීති, එවමෙව භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භවන්තං ගොතමං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

ලොකිවජ්ජසුත්තං නිට්ඨිතං දවාදසමං.

93. ලෝකිවවය, යම්සේ කඳු මුදුනෙකැ වූ, පහත් වූ, වෙසෙසින් පහත් වූ, නොකැලැඹුණු (=බොර නො වූ) දිය පිළිලක් වන්නේ ද, එහි ඉවුරෙහි ඇස් ඇති මිනිසෙක් සිටියේ, එහි තුලැ හැසිරෙන්නා වූත් සිටුනා වූත් සිප්පිබෙල්ලනුත් සක්බෙල්ලනුත් කැටකැබිලිතිත් මත්ස්‍ය-සමූහයාත් දක්නේ ද, (එසේ දක්නා) ඔහුට "මේ දියවිල පහත් ය. වෙසෙසින් පහත් ය, නො කැලැඹුණේ ය. මෙහි මේ සිප්පිහුත් සක්බෙල්ලෝත් කැට කැබලිතිත් මත්ස්‍ය සමූහයෝත් හැසිරෙන්නෝත් සිටින්නෝත් වෙති" යි මෙසේ සිතක් වන්නේ ද,

94. ලෝකිවවය, එපරිද්දෙන් ම මහණ තෙමේ මෙසේ සමාහිත සිත පිරිසිදු වැ දිප්තිමත් වැ, නිකෙලෙස් වැ උපකෙලෙශ පහ වැ, මෘදු වැ, කර්මණ්‍ය වැ, ඝජිත වැ, නිශ්චලතාවට පැමිණි කල්හි, ආස්‍රවක්ෂයඥානය පිණිස සිත යොමු කෙරෙයි, නැඹුරු කෙරෙයි. හේ 'මේ දුකැ'යි ඇති සැටියෙන් දනී. 'මේ දුකට කරුණැ'යි ඇති සැටියෙන් දනී 'මේ දුක් වැනැස්මැ'යි ඇති සැටියෙන් දනී. 'මේ දුක් වැනැස්මට පමුණුවන පිළිවෙතැ'යි ඇති සැටියෙන් දනී. 'මොහු ආස්‍රවයහ'යි ඇති සැටියෙන් දනී. මේ ආස්‍රව-සමුදය යැ (ඉපැදීමට කරුණැ)'යි ඇති සැටියෙන් දනී. 'මේ ආස්‍රව-නිරෝධයැ'යි ඇති සැටියෙන් දනී 'මේ ආස්‍රවනිරෝධයට පැමිණෙන පිළිවෙතැ'යි ඇති සැටියෙන් දනී

95. මෙසේ දන්නා, මෙසේ දක්නා, ඔහුගේ සිත කාමාස්‍රවය කෙරෙන් ද මිදේ, භවාස්‍රවය කෙරෙන් ද මිදේ, අවිද්‍යාස්‍රවය කෙරෙන් ද මිදේ, මිදුණු කල්හි 'මිදුණේ යැ'යි දැනීම වේ. භවෝත්පත්තිය ක්ෂීණ විය. බ්‍රහ්ම-චර්යය වැස නිමවන ලදේ ය. (සිවු සස්හි සිවු මගින්) කටයුතු (සොළොස් වැදැරුම්) කෘත්‍යය කොටැ නිමැවිණ. මෙබව පිණිස (=මේ කෙලෙශක්ෂයය පිණිස) කළ යුතු අන් කිසිත් නැතැ'යි හේ දනී.

96. ලෝකිවවය, යම් ශාස්තෘවරයකු කෙරෙහි සවු තෙම මෙබඳු උදාර ගුණ විශෙෂයට පැමිණි නම්, ලෝකිවවය, මේ ශාස්තෘ තෙමේ ද ලොවැ වොදනාහි නො වේ. යමෙක් මෙබඳු ශාස්තෘහට වොදනා කෙරේ නම්, ඒ වොදනාව අභූත ය, අතථ්‍ය ය, නොදැහැමි ය, වරද සහිත ය.

97 මෙසේ වදාළ කල්හි ලෝකිවව බමුණු තෙම, "භවද් ගෞතමයන් වහන්ස, යම්සේ පුරුෂයෙක් නරාවළක වැටෙන පුරුෂයකු හිසකෙසින් ගෙන ඔසොවා ගොඩැ සිටුවන්නේ ද, එසේ ම නිරාවළැ වැටෙන මම භවද් ගෞතමයන් වහන්සේ විසින් ඔසොවා ගොඩැ පිහිටුවන ලදිමි. භවද් ගෞතමයන් වහන්ස, අභිකාන්ත යැ. භවද් ගෞතමයන් වහන්ස, අභිකාන්ත යැ. වහන්ස, යම්සේ යැපිකුරැ කොට තබන ලද්දක් උඩුකුරැ කරන්නේ හෝ වේ ද, වැසුණු දෙයක් විවෘත කරන්නේ හෝ වේ ද, මංමුළා වූවකුට මඟ කියන්නේ හෝ වේ ද, 'ඇස් ඇතියන් රූප දකිති' යි අඳුරෙහි තෙල්පහනක් දරන්නේ හෝ වේ ද, එපරිද්දෙන් ම භවද් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් කරුණින් දහම් පැවැසිණ. වහන්ස, ඒ මම භවද් ගෞතමයන් වහන්සේ ද ධර්මය ද භික්ෂුසඞ්ඝයා ද සරණ යෙමි. වහන්ස, භවද් ගෞතමයන් වහන්සේ මා අද පටන් කොට දිවිහිමියෙන් සරණ ගිය උවසකු සේ සලකන සේක් වා" යි භාග්‍යවතුන් වහන්සේව සැළ කෙළේ ය.

දෙලොස්වන ලෝකිවව සූත්‍රය නිමියේ ය.

13

තෙවිජ්ජසුත්තං

1. එවමේමසුතං: එකං සමයං භගවා කොසලේසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝේන සද්ධිං පඤ්චමත්තේහි භික්ඛුසතේහි යේන මනසාකටං නාම කොසලානං බ්‍රාහ්මණගාමො තදවසරි. තත්‍ර සුදං භගවා මනසාකටේ විහරති උත්තරේන මනසාකටස්ස අචිරවතියා නදියා තීරේ අම්බවනේ

2. තේන ඛො පන සමයේන සම්බහුලා අභිඤ්ඤාතා අභිඤ්ඤාතා බ්‍රාහ්මණමහාසාලා මනසාකටේ පටිවසන්ති. සෙය්‍යථිදං: චඞ්කී බ්‍රාහ්මණො තාරුක්ඛො බ්‍රාහ්මණො පොක්ඛරසාති බ්‍රාහ්මණො ජාණුස්සෝණි බ්‍රාහ්මණො තෝදෙය්‍යො බ්‍රාහ්මණො, අඤ්ඤේ ච අභිඤ්ඤාතා අභිඤ්ඤාතා බ්‍රාහ්මණ-මහාසාලා.

3. අථ ඛො වාසෙට්ඨ-භාරද්වාජානං ජඞ්ඝාවිහාරං අනුචඞ්කමන්තානං අනුවිචරන්තානං මග්ගාමග්ගෙ කථා උදපාදි. අථ ඛො වාසෙට්ඨො මාණවො එවමාහ: 'අයමේව උජුමග්ගො අයමඤ්ජසායතො නිය්‍යාණිකො නියාති තක්කරස්ස බ්‍රහ්මසහව්‍යතාය යායං අක්ඛාතො බ්‍රාහ්මණේන තාරුක්ඛේනා'ති.

4. භාරද්වාජො මාණවො එවමාහ: අයමේව උජුමග්ගො අයමඤ්ජසා-යතො නියාණිකො නියාති තක්කරස්ස බ්‍රහ්මසහව්‍යතාය යායං අක්ඛාතො බ්‍රාහ්මණේන තාරුක්ඛේනා'ති. තෙව ඛ්වාසක්ති[1] වාසෙට්ඨො මාණවො භාරද්වාජං මාණවං සඤ්ඤාපෙතුං. න පනාසක්ති භාරද්වාජො මාණවො වාසෙට්ඨං මාණවං සඤ්ඤාපෙතුං.

5 අථ ඛො වාසෙට්ඨො මාණවො භාරද්වාජං මාණවං ආමන්තෙසි: අයං ඛො භාරද්වාජ, සමණො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බ-ජිතො මනසාකටේ විහරති උත්තරේන මනසාකටස්ස අචිරවතියා නදියා තීරේ අම්බවනේ. තං ඛො පන භවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අභිඤ්ඤාතො: ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජා-චරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා'ති. ආයාම හො භාරද්වාජ යේන සමණො ගොතමො තේනුපසඞ්කමිස්සාම. උපසඞ්කමිත්වා එතමත්ථං සමණං ගොතමං පුච්ඡිස්සාම. යථා නො සමණො ගොතමො ව්‍යාකරිස්සති තථා නං ධාරෙස්සාමාති. 'එවමෙතං'ති ඛො භාරද්වාජො මාණවො වාසෙට්ඨස්ස මාණවස්ස පච්චස්සොසි.

---

1 තෙව [ඛො අසක්ති. (කෙසුචි පොත්තකේසු, සිංහලක්ඛරමුද්දිතට්ඨකථාය ච.)

13

තෙවිජ්ජ සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදි: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් පන්සියක් පමණ වූ මහත් මහණබුළුවක් හා කොසොල් රටැ සැරි සරන සේක්, කොසොල්රටැ මනසාකට නම් බමුණුගම යම් තැනෙක ද, එහි වැඩි සේක. භාග්‍යවතුන් වහන්සේ ඒ මනසාකටයට උතුරුදිගැ අචිරවතී නදිය තෙරැ අඹවෙනෙහි වසන සේක.

2. එ සමයෙහි වඩකිබ්‍රාහ්මණ ය, තාරුක්ඛබ්‍රාහ්මණ ය, පොක්ඛරසාති බ්‍රාහ්මණය, ජාණුස්සෝණි බ්‍රාහ්මණය යන මොහු ද අන්‍යවූත් ඒ ඒ පෙදෙස්හි ප්‍රකට වූ බමුණු මහසල්හු ද සි අභිඥත අභිඥත වූ බොහෝ මහාසාරවංශික බ්‍රාහ්මණ කෙනෙක් මනසාකටයෙහි වෙසෙත්.

3 එ කල්හි ජඞ්ඝාවිහරණයෙහි ඔබ මොබ සක්මන් කරන ඔබ මොබ හැසිරෙන වාසෙට්ඨ-භාරද්වාජ යන දෙදෙනා අතරැ මඟ තොමඟ ඇරැබැ කථාවෙක් උපන. එ කලැ වාසෙට්ඨ මාණව තෙම "මේ යම් මඟෙක් පොක්ඛරසාති බමුණාණන් විසින් කියන ලද ද, මෙය ම සෘජු මඟ ය. මෙය ම ඉදුරා මඟ ය. මෙය ම තෛර්‍යාණික වනුයේ එය පිළිපදනාහු යේ බ්‍රහ්මසහභාවය පිණිස යේ" යැ සි මෙසේ කියයි.

4. 'මේ යම් මඟෙක් තාරුක්ඛ බමුණාණන් විසින් කියන ලද ද, මෙය ම සෘජු මඟ ය. මෙය ම ඉදුරා මඟ ය. මෙය ම තෛර්‍යාණික වනුයේ එය පිළිපදනාහුගේ බ්‍රහ්මසහභාවය පිණිස යේ" යැ සි මෙසේ භාරද්වාජ මාණව කියයි. වාසෙට්ඨ මාණව තෙම භාරද්වාජමාණවයාට හඟවනුවට (තමා බස පිළිගන්වනුවට) නො ම හැකි වී ය. භාරද්වාජ මාණව ද වාසෙට්ඨ මාණවයාට හඟවනුවට (තම බස පිළිගන්වනුවට) නො ම හැකි වී ය.

5. එකල්හි වාසෙට්ඨ මාණව තෙම භාරද්වාජමාණවයා බණවා, 'භාරද්වාජය, සැකැපුත් වූ, සැකැකුලයෙන් තික්මැ පැවැදි වූ, මේ මහණ-ගොයුම්හු මනසාකටයට නොදුරැ නොළං තන්හි මනසාකටයට උතුරු-දිගැ අචිරවතීනදිය තෙරැ අඹවෙනෙහි වැඩ වෙසෙති. ඒ පින්වත් ගොයුමන් පිළිබඳ වැ 'ඒ භගවන්හු රහත්හ, සම්මාසම්බුද්ධ හ, විද්‍යාචරණසම්පන්න හ, සුගත හ, ලෝකවිත් හ, නිරුත්තර පුරුෂදම්‍යසාරථි හ, දෙවිමිනිස්නට ශාස්තා හ, බුද්ධ හ, භාග්‍යවත්හ'සි මෙසේ කලණ කිත් හඬක් වෙසෙසින් උස් වැ නැංගේ වෙයි. භවත් භාරද්වාජය, යමු. එ මහණගොයුමන් කරා එළැඹෙන්නමු. එළැඹ මේ කරුණ ඒ මහණගොයුමන් විචාරන්නමු. අපට යම්සේ මහණගොයුම්හු එය විසඳන්නාහු ද, එසේ එය දරන්නමු" සි කී ය. 'එසේ ය, භවතැ' සි කියා ම භාරද්වාජමාණව තෙම වාසෙට්ඨ මාණවයාට පිළිවදන් දුන.

6. අථ ඛො වාසෙට්ඨභාරද්වාජා මාණවා යෙන භගවා තෙනුප-සඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදිංසු. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නො ඛො වාසෙට්ඨො මාණවො භගවන්තං එතදවොච: "ඉධ හො ගොතම අම්හාකං ජඞ්ඝාවිහාරං අනුවඞ්කමන්තානං අනුවිචරන්තානං මග්ගොමග්ගො කථා උදපාදි. අහං එවං වදාමි: 'අයමෙව උජුමග්ගො අයමඤ්ජසායනො නියාණිකො නියාති තක්කරස්ස බ්‍රහ්මසහව්‍යතාය යදිදං අක්ඛාතො බ්‍රාහ්මණෙන පොක්ඛරසාතිනා'ති. භාරද්වාජො මාණවො එවමාහ: 'අයමෙව උජුමග්ගො අයමඤ්ජසායනො නියාණිකො නියාති තක්කරස්ස බ්‍රහ්මසහව්‍යතාය යදිදං අක්ඛාතො බ්‍රාහ්මණෙන තාරුක්ඛතා'ති. එත්ථ හො ගොතම අත්ථෙව විග්ගහො අත්ථි විවාදො අත්ථි නානාවාදො"ති.

7. "ඉති කිර වාසෙට්ඨ තිං එවං වදෙසි: අයමෙව උජුමග්ගො අයමඤ්ජසායනො නියාණිකො නියාති තක්කරස්ස බ්‍රහ්මසහව්‍යතාය යදිදං අක්ඛාතො බ්‍රාහ්මණෙන පොක්ඛරසාතිනා'ති. භාරද්වාජො මාණවො එවමාහ: අයමෙව උජුමග්ගො අයමඤ්ජසායනො නියාණිකො නියාති තක්කරස්ස බ්‍රහ්මසහව්‍යතාය යදිදං අක්ඛාතො බ්‍රාහ්මණෙන තාරුක්ඛතා'ති. අථ කිස්මිං පන වො වාසෙට්ඨා විග්ගහො? කිස්මිං විවාදො? කිස්මිං නානාවාදො?" ති.

8. "මග්ගාමග්ගෙ හො ගොතම. කිඤ්චාපි හො ගොතම බ්‍රාහ්මණා නානාමග්ගෙ පඤ්ඤපෙන්ති අද්ධරියා බ්‍රාහ්මණා, තිත්තිරියා බ්‍රාහ්මණා. ජෙඤ්ඨකා බ්‍රාහ්මණා, බවහිරිවා[1] බ්‍රාහ්මණා, අථ ඛො සබ්බානි තානි නියාණිකානි නියාන්ති තක්කරස්ස බ්‍රහ්මසහව්‍යතාය. සෙය්‍යථාපි හො ගොතම ගාමස්ස වා නිගමස්ස වා අවිදූරෙ බහූනි වෙපි නානාමග්ගානි භවන්ති, අථ ඛො සබ්බානි තානි ගාමසමෙසරණානි භවන්ති. එවමෙව ඛො හො ගොතම කිඤ්චාපි බ්‍රාහ්මණා නානාමග්ගෙ පඤ්ඤපෙන්ති අද්ධරියා බ්‍රාහ්මණා, තිත්තිරියා බ්‍රාහ්මණා, ජෙඤ්ඨකා බ්‍රාහ්මණා, බවහිරිවා බ්‍රාහ්මණා, අථ ඛො සබ්බානි තානි නියාණිකානි නියාන්ති තක්කරස්ස බ්‍රහ්මසහව්‍යතාය"ති

9. "නියාන්තීති වාසෙට්ඨ වදෙසි?"

"නියාන්තීති හො ගොතම වදාමි".

"නියාන්තීති වාසෙට්ඨ වදෙසි?"

"නියාන්තීති හො ගොතම වදාමි."

---

1. බවහරිජා, බවහරිජක්ක, භවහරිජක්ක, බවහරියා, කොසුමි. බ්‍රහ්මචරියා PTS.

6. ඉක්බිත්තෙත් වාසෙට්ඨ - භාරද්වාජ යන මාණවයෝ දෙදෙන භාග්‍යවතුන් වහන්සේ වෙත ගියහ. ගොස් ඔබ හා සතුටු වූහ. සතුටට කරුණු වූ, සිතැ රැඳැවියැ යුතු වූ කථා නිමවා, පසෙක හිඳ ගත්හ. පසෙක හිඳැ ගත්තා වූ ම වාසෙට්ඨ මාණව තෙම "භවද් ගෞතමයිනි, ජඞ්ඝා විහාරයෙහි ඔබ මෙබ හැසිරෙත අප අතරැ මඟ-තොමඟ ඇරැබැ, කථාවෙක් උපන. "පොක්ඛරසාතී බමුණන් විසින් යම් මඟෙක් කියන ලද ද, එය පිළිපදනාහට බඹහු හා එක් වීමට 'මෙය ම නෛර්යාණික සෘජු මාවත ය, මෙය ම ඉදුරු මඟ යැ'යි මම මෙසේ කියමි. භාරද්වාජ මාණව තෙම 'තාරුක්ඛ බමුණන් විසින් යම් මඟෙක් කියන ලද ද, එය පිළිපදනාහට බඹහු හා එක් වීමට 'මෙය ම නෛර්යාණික සෘජු මාවත ය, මෙය ම ඉදුරු මඟ යැ'යි කියයි. භවද්ගෞතමයිනි, මෙහි අපගේ විග්‍රහයෙක් ඇත් ම ය. විවාදයෙක් ඇත් ම ය. නානාවාදයෙක් ඇත් ම ය."

7. [එවිට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:] "මෙසේ වාසෙට්ඨය, 'පොක්ඛරසාතී බමුණහු විසින් යම් මඟෙක් කියන ලද නම්, එය පිළිපදනාහට බඹහු හා එක් වීමට මෙය ම නෛර්යාණික සෘජු මාවත ය, මෙය ම ඉදුරු මඟ ය' යි තෝ කියෙහි ය. තාරුක්ඛ බමුණහු විසින් යම් මඟෙක් කියන ලද නම්, එය පිළිපදනාහට බඹහු හා එක් වීමට මෙය ම නෛර්යාණික සෘජු මාවත ය, මෙය ම ඉදුරු මඟ යැ' යි භාරවාජ මාණව කියයි. මෙසේ කලැ කවර කරුණෙකැ තොපගේ විග්‍රහයෙක් වේ ද? කවර කරුණෙකැ තොපගේ විවාදයෙක් වේද? කවර කරුණෙකැ තොපගේ නානාවාදයෙක් වේ ද?"

8. [වාසෙට්ඨ:] "භවද් ගෞතමයිනි, අපගේ විග්‍රහය, නානාවාදය මඟ තොමඟ දෙක්හි ය. අධ්වර්යුබ්‍රාහ්මණයන් ද, තෛත්තිරීය බ්‍රාහ්මණයන් ද, ඡාන්දෝග්‍යබ්‍රාහ්මණයන් ද, බහ්වෘචබ්‍රාහ්මණයන් ද නානාමාර්ග පණවතත් ඒ සියල්ලෝ නෛර්යාණික හ. ඒ සියල්ලෝ පිළිපදනහුට බඹහු හා එක්වනු පිණිස යෙත්. භවද් ගෞතමයිනි, යම්සේ ගමකට හෝ නියම්ගමකට හෝ තොදුරෙහි නානාවිධ මාර්ගයෝ බොහෝ වෙත් ද, එතෙකුදු වුවත් ඒ සියල්ලෝ ගමට ම බස්නාහු ද, භවද් ගෞතමයිනි, එ පරිදෙන් ම අධ්වර්යුබ්‍රාහ්මණයන් ද, තෛත්තිරීය බ්‍රාහ්මණයන් ද, ඡාන්දෝග්‍යබ්‍රාහ්මණයන් ද, බහ්වෘචබ්‍රාහ්මණයන් ද නානාමාර්ග පණවත් නුමුදු වැලි ඒ සියල්ලෝ නෛර්යාණික හ. ඒ සියල්ලෝ පිළිපදනුවහට බඹහු හා එක්වනු පිණිස යෙත්.

9. [භාග්‍යවත්හු:] "වාසෙට්ඨය, ඔහු හැම බ්‍රහ්මසහභාවය පිණිස යෙති යි කියෙහි ද?."

[වාසෙට්ඨ:] "භවද් ගෞතමයිනි, ඔහු හැම බ්‍රහ්මසහභාවය පිණිස යෙති යි කියමි"

[භාග්‍යවත්හු:] "වාසෙට්ඨය, ඔහු හැම බ්‍රහ්මසහභාවය පිණිස යෙති යි කියෙහි ද?"

[වාසෙට්ඨ:] "භවද්ගෞතමයිනි, ඔහු හැම බ්‍රහ්මසහභාවය පිණිස යෙති යි කියමි."

"නියාතීති වාසෙට්ඨ වදෙසි?"

"නියාතීති භො ගොතම වදාමි."

10. "කිං පන වාසෙට්ඨ අත්ථි කොචි තෙවිජ්ජානං බ්‍රාහ්මණානං එකබ්‍රාහ්මණො'පි යෙන බ්‍රහ්මා සක්ඛි දිට්ඨො?" ති.

"නො හිදං භො ගොතම."

"කිං පන වාසෙට්ඨ අත්ථි කොචි තෙවිජ්ජානං බ්‍රාහ්මණානං එකාචරියො'පි යෙන බ්‍රහ්මා සක්ඛි දිට්ඨො?" ති.

"නො හිදං භො ගොතම."

"කිං පන වාසෙට්ඨ අත්ථි කොචි තෙවිජ්ජානං බ්‍රාහ්මණානං එකාචරියපාචරියො'පි යෙන බ්‍රහ්මා සක්ඛිදිට්ඨො?" ති.

"නොහිදං භො ගොතම."

"කිං පන වාසෙට්ඨ අත්ථි කොචි තෙවිජ්ජානං බ්‍රාහ්මණානං යාව සත්තමා ආචරියමහයුගා යෙන බ්‍රහ්මා සක්ඛි දිට්ඨො?" ති.

"නො හිදං භො ගොතම"

"කිං පන වාසෙට්ඨ යෙ'පි තෙවිජ්ජානං බ්‍රාහ්මණානං පුබ්බකා ඉසයො මන්තානං කත්තාරො මන්තානං පවත්තාරො යෙසමිදං එතරහි තෙවිජ්ජා බ්‍රාහ්මණා පොරාණං මන්තපදං ගීතං පවුත්තං සමිහිතා තදනුගායන්ති තදනුභාසන්ති භාසිතමනුභාසන්ති වාචිතමනුවාචෙන්ති, සෙය්‍යථිදං: අට්ඨකො වාමකො වාමදෙවො වෙස්සාමිත්තො යමතග්ගි අඞ්ගීරසො භාරද්වාජො වාසෙට්ඨො කස්සපො භගු, තෙ'පි එවමාහංසු: මයමෙතං ජානාම මයමෙතං පස්සාම යත්ථ වා බ්‍රහ්මා යෙන වා බ්‍රහ්මා යත්ථං වා බ්‍රහ්මා'ති ?".

"නො හිදං භො ගොතම."

11. "ඉති කිර වාසෙට්ඨ නත්ථි කොචි තෙවිජ්ජානං බ්‍රාහ්මණානං එකබ්‍රාහ්මණො'පි යෙන බ්‍රහ්මා සක්ඛි දිට්ඨො. නත්ථි කොචි තෙවිජ්ජානං බ්‍රාහ්මණානං එකාචරියො'පි යෙන බ්‍රහ්මා සක්ඛිදිට්ඨො. නත්ථි කොචි තෙවිජ්ජානං බ්‍රාහ්මණානං එකාචරියපාචරියො'පි යෙන බ්‍රහ්මා සක්ඛිදිට්ඨො. නත්ථි කොචි තෙවිජ්ජානං බ්‍රාහ්මණානං යාව සත්තමා ආචරියමහයුගා යෙන බ්‍රහ්මා සක්ඛි දිට්ඨො-

[භාග්‍යවත්හු:] "වාසෙට්ඨය, ඔහු හැම බ්‍රහ්මසහභාවය පිණිස යෙති යි කියයහි ද?".

[වාසෙට්ඨ:] "භවද් ගෞතමයිනි, ඔහු හැම බ්‍රහ්මසහභාවය පිණිස යෙති යි කියමි"

10. [භාග්‍යවත්හු:] "වාසෙට්ඨය, යම්ක්හු විසින් බ්‍රහ්මයා සියැසින් දක්නා ලදේද නම් එබඳු එක් බමුණෙක් නමුත් තෙවිදු බමුණන් අතුරෙහි ඇද්ද?"

[වාසෙට්ඨ:] "භවද් ගෞතමයෙනි, මේ බත්දෙක් නොමැත."

[භාග්‍යවත්හු:] "වාසෙට්ඨය, යම්ක්හු විසින් බ්‍රහ්මයා සියැසින් දක්නා ලද නම්, එසේ වූ කිසි එක් ඇදුරෙකුත් තෙවිදු බමුණන් අතුරෙහි ඇත්ද?"

[වාසෙට්ඨ:] "භවද් ගෞතමයිනි, මේ බත්දෙක් නැති ම ය."

[භාග්‍යවත්හු:] "වාසෙට්ඨය, තෙවිදු බමුණන්ගේ එක් ආචාර්‍යප්‍රාචාර්‍යයකුත් සියැසින් බඹහු දුටුවා ඇද්ද?"

[වාසෙට්ඨ] "භවද් ගෞතමයිනි, මේබත්දෙක් නැත් ම ය."

[භාග්‍යවත්හු:] "වාසෙට්ඨය, තෙවිදුබමුණන්ගේ සත්වන ඇදුරුමහ පුගය තෙක් වූ කිසිවකුත් සියැසින් බඹහු දුටුවා ඇද්ද?"

[වාසෙට්ඨ:] 'මේවැන්නක් නොමැත, භවද් ගෞතමයිනි."

[භාග්‍යවත්හු:] "කිමෙක් ද? වාසෙට්ඨය, තෙවිදු බමුණන්ගේ පූර්වජරුම වූ මන්ත්‍රකාරක වූ මන්ත්‍රප්‍රවර්තක වූ අට්ඨක වාමක වාමදෙව වෙස්සාමිත්‍ර යමතග්ග අඞ්ගිරස භාරද්වාජ වාසෙට්ඨ කස්සප භගු යන යම් යෑයි කෙනෙක් වූහු ද, මේ කලෑ තෙවිදු බමුණෝ ඒ යම් යෑයි කෙනෙකුන් විසින් ගයන ලද කියන ලද රැස් කොට තබන ලද මේ පැරැණි මන්ත්‍රපද ඔවුන් අනුව ගයත් නම්, ඔවුන් අනුව කියත් නම්, ඔවුන් හඳුලා අනුව හඳුරත් නම්, කියැවුවා අනුව කියවත් නම්, 'යම් තැනෙක හෝ යම් දෙසෙක හෝ යම් පෙදෙසක හෝ බ්‍රහ්මයා ඇතැ යි අපි මෝහු දනිමු, අපි මෝහු දකිමු 'යි මෙසේ ඒ යෑයිහු එත් කිවහු ද?"

[වාසෙට්ඨ:] "මේ බත්දෙක් නොමැත, භවද් ගෞතමයිනි."

11. [භාග්‍යවත්හු:] "වාසෙට්ඨය, මෙසේ යම්ක්හු විසින් බඹා සියැ-සින් දක්නා ලද නම්, තෙවිදුබමුණන් අතුරෙහි එබඳු කිසි එක් බමුණෙක් ද නැත් ල. යම්කු විසින් බඹා සියැසින් දක්නා ලද නම්, එසේ වූ කිසි එක් ඇදුරෙක් ද නැත් ල. යම්කු විසින් බඹා සියැසින් දක්නා ලද නම්, එසේ වූ කිසි එක් ආචාර්‍යයෙක් ප්‍රාචාර්‍යයෙක් ද නැත් ල. යම්කු විසින් සියැසින් බඹා දක්නා ලද නම්, තෙවිදු බමුණන්ගේ සත්වන ඇදුරුමහ පුගය තෙක් ද එබඳු කිසිවෙක් නැත් ල.-

යෙ'පි කිර තෙවිජ්ජානං බ්‍රාහ්මණානං පුබ්බකා ඉසයො මන්තානං කත්තාරො මන්තානං පවත්තාරො, යෙසමිදං එතරහි තෙවිජ්ජා බ්‍රාහ්මණා පොරාණං මන්තපදං ගීතං පවුත්තං සමිහිතං තදනුගායන්ති තදනුභාසන්ති භාසිතමනුභාසන්ති වාචිතමනුවාචෙන්ති, සෙය්‍යථිදං: අට්ඨකො වාමකො වාමදෙවො වෙස්සාමිත්තො යමතග්ගි අඞ්ගීරසො භාරද්වාජො වාසෙට්ඨො කස්සපො භගු, තෙ'පි න එවමාහංසු: මයමෙතං ජානාම මයමෙතං පස්සාම යත්ථ වා බ්‍රහ්මා යත්ථ වා බ්‍රහ්මා'ති. තෙ වත තෙවිජ්ජා බ්‍රාහ්මණා එවමාහංසු: යං මයං න ජානාම යං න පස්සාම, තස්ස සහව්‍යතාය මග්ගං දෙසෙමඃ අයමෙව උජුමග්ගො අයමඤ්ජසායනො නියාණිකො නිය්‍යාති තක්කරස්ස බ්‍රහ්මසහව්‍යතාය'ති.

12. තං කිම්මඤ්ඤසි වාසෙට්ඨ, නනු එවං සන්තෙ තෙවිජ්ජානං බ්‍රාහ්මණානං අපාරිගීරකතං භාසිතං සම්පජ්ජති?" ති.

"අඤ්ඤා ඛො භො ගොතම, එවං සන්තෙ තෙවිජ්ජානං බ්‍රාහ්මණානං අපාරිගීරකතං භාසිතං සම්පජ්ජති" ති.

13. සාධු වාසෙට්ඨ. තෙ වත වාසෙට්ඨ තෙවිජ්ජා බ්‍රාහ්මණා යං න ජානන්ති යං න පස්සන්ති තස්ස සහව්‍යතාය මග්ගං දෙසෙස්සන්ති: 'අයමෙව උජුමග්ගො අයමඤ්ජසායනො නියාණිකො නිය්‍යාති තක්කරස්ස බ්‍රහ්මසහ-ව්‍යතාය'ති තෙතං ඨානං විජ්ජති. සෙය්‍යථාපි වාසෙට්ඨ අන්ධවෙණිපරම්පරා සංසත්තා පුරිමො'පි න පස්සති මජ්ඣිමො'පි න පස්සති පච්ඡිමො'පි න පස්සති, එවමෙව ඛො වාසෙට්ඨ අන්ධවෙණූපමං මඤ්ඤෙ තෙවිජ්ජානං බ්‍රාහ්ම-ණානං භාසිතං. පුරිමො'පි න පස්සති. මජ්ඣිමො' පි න පස්සති. පච්ඡිමො'පි න පස්සති. තෙසමිදං තෙවිජ්ජානං බ්‍රාහ්මණානං භාසිතං හස්සකඤ්ඤෙව සම්පජ්ජති, නාම්කඤ්ඤෙව සම්පජ්ජති, රිත්තකඤ්ඤෙව සම්පජ්ජති, තුච්ඡකඤ්ඤෙව සම්පජ්ජති.

14. "තං කිම්මඤ්ඤසි වාසෙට්ඨ, පස්සන්ති තෙවිජ්ජා බ්‍රාහ්මණා චන්දිම-සූරියෙ අඤ්ඤෙ වාපි බහූ ජනා, යතො ච චන්දිමසූරියා උග්ගච්ඡන්ති, යත්ථ ච ඔගච්ඡන්ති, ආයාචන්ති, පොක්ඛරණිකා නමස්සමානා අනුපරිවත්තන්ති?"ති.

"එවං භො ගොතම. පස්සන්ති තෙවිජ්ජා බ්‍රාහ්මණා චන්දිමසූරියෙ අඤ්ඤෙ වාපි බහුජනා, යතො ච චන්දිමසූරියා උග්ගච්ඡන්ති යත්ථ ච ඔගච්ඡන්ති, ආයාචන්ති, පොක්ඛරණිකා නමස්සමානා අනුපරිවත්තන්ති"ති.

තෙවිදු බමුණන්ගේ පූර්වපුරුෂ වූ මන්ත්‍රකාරක වූ මන්ත්‍රප්‍රවර්තක වූ අට්ටක වාමක වාමදෙව වෙස්සාමිත්‍ර යමතග්ග අඛිරස භාරද්වාජ වාසෙට්ඨ කස්සප භගු යන යම් ඍෂි කෙනෙක් වූහු ද, මේ කලෑ තෙවිදු බමුණෝ යම් ඒ ඍෂි කෙනෙකුන් විසින් ගයන ලද, කියන ලද, රැස් කොට තබන ලද, මේ මන්ත්‍රපද ඔවුන් අනුව ගයත් නම්, ඔවුන් අනුව කියත් නම්, ඔවුන් හදලා අනුව හදරත් නම්, ඔවුන් කියැවුවා අනුව කියවත් නම්, ඔව්හු ද බඹහු ඉඳුනා තැනක් හෝ දෙසක් හෝ පෙදෙසක් හෝ අපි දනිමු යි, අපි දකිමු යි, මෙසේ නො කිවෝ ල. පුදුමයෙකි, එසේ වූ ඒ තෙවිදු බමුණෝ "යමකු අපි නො දන්මෝ නම්, යමකු අපි නො දක්මෝ නම්, ඔහු හා එක් වනුවට මඟ දෙසමු, (ඒ බඹහු හා එක් වනු පිණිස) එය පිළිපදිනුවාහට මෙය ම ඉදිමඟ ය, මෙය ම ඉඳුරාමඟ ය, මේ නෛයාණික මඟ ම බඹහු හා එක් වීම පිණිස සේ යැ 'යි මෙසේ කියත්.

12. වාසෙට්ඨය, ඒ කිමැ යි සිතයි ද, මෙසේ ඇති කලෑ තෙවිදු බමුණන්ගේ වචනය ප්‍රතිහරණ රහිතයක් (ප්‍රතිපක්ෂ කථා බැහැර නො කරත්තක්, විරුද්ධ කථාවන්ට දිය හැකි උත්තර නැතියක්) කරන ලද්දේ නො වේ ද?"

[වාසෙට්ඨ] "භවද් ගෞතමයිනි, මෙසේ ඇති කලෑ තෙවිදු බමුණන්ගේ වචන ප්‍රතිහරණ රහිත (ප්‍රතිවිරුද්ධයනට දිය හැකි උත්තර නැත්තේ) ම වෙයි."

13. [භාග්‍යවත්තු:] මැනැව වාසෙට්ඨය. ඒ තෙවිදු බමුණෝ වාසෙට්ඨය, තුමූ යමකු නො දනිත් නම්, යමකු නො දකිත් නම්, ඔහු හා එක් වනු පිණිස 'මේ ම මඟ ය, මේ ම ඉඳුරා මඟ ය, එය පිළිපදිනුවාහට මේ නෛයාණික මඟ ම බඹහු හා එක් වනුවට සේ' යැ යි මඟක් දෙසත්තාහ යන මේ කාරණය නැත්තේ ය (මේ නො කරුණෙකි, නො වියැ හැක්කෙකි). (පසු පසු වැ සිටියහු පළමු පළමු සිටියහු අත හැත්මෙන්) උනුන් එකට බැඳුණු අඹිවෙණිය (අඳුන් වැල) යම්සේ ද, එහි යම්සේ පළමු ව යන්නේත් නො දක්නේ ද, මැද යන්නේත් නො දක්නේ ද, පසු වැ යන්නේත් නො දක්නේ ද, වාසෙට්ඨය, එසේ ම තෙවිදු බමුණන්ගේ වචනය අඹිවෙණිය බඳු යැ යි සිතම්. ඔවුන්ගේ පළමු පුරුෂයා ද නො දකී. මැදුම් තැනැත්තත් ද නො දකී. පැසිම් තැනැත්තේ ද නො දකී. ඒ තෙවිදු බමුණන්ගේ මේ වචනය හාස්‍යක ම (සිනහවට ලක් වූවක් ම) වෙයි. ලාමක ම වෙයි. හිස් ම වෙයි. තුච්ඡ ම වෙයි.

14. "වාසෙට්ඨය, ඒ කිමැ යි සිතයි ද, යම් වේලාවෙක සඳහිරුහු තැඟෙත් නම්, යම් වෙලාවෙක සඳහිරුහු බසිත් නම්, ඒ හැම කල්හි තෙවිදු බමුණෝත් අන් බොහෝ දෙනාත් සඳහිරුත් දකිත් ද? ඔවුන් යදින් ද? ඔවුනට සොත්‍ර කෙරෙත් ද? දෙගොත් මුදුන් තබා ගත්තාහු වඳනාහු ඔබ මොබ පෙරැළෙත් ද?"

[වාසෙට්ඨ:] "භවද් ගෞතමයිනි, එසේ ය, සඳහිරුත් උදා වන කල්හිත් බස්නා කල්හිත් තෙවිදු බමුණෝත් අන් බොහෝ දෙනාත් ඔවුන් යදිත්. ඔවුනට සොත්‍ර කෙරෙත්. දෙගොත් මුදුන් තබා වඳනාහු ඔබ මොබ පෙරැළෙත්."

15. 'තං කිම්මඤ්ඤසි වාසෙට්ඨ, යං පස්සන්ති තෙවිජ්ජා බ්‍රාහ්මණා වන්දිමස්සරියෙ අඤ්ඤෙ වාපි බහූ ජනා, යතො ච චන්දිමස්සරියා උග්ගච්ඡන්ති, යත්ථ ච ඔගච්ඡන්ති, ආයාචන්ති පොක්ඛරණිකා නමස්සමානා අනුපරිවත්තන්ති, පස්සන්ති තෙවිජ්ජා බ්‍රාහ්මණා චන්දිමස්සරියානං සහව්‍යතාය මග්ගං දෙසෙතුං: අයමෙව උජුමග්ගො අයමඤ්ජසායනො නියාණිකො නියාති තක්කරස්ස චන්දිමස්සරියානං සහව්‍යතායා"?ති.

"තො හිදං භො ගොතම."

16. ඉති කිර වාසෙට්ඨ යං පස්සන්ති තෙවිජ්ජා බ්‍රාහ්මණා චන්දිමස්සරියෙ, අඤ්ඤෙ වාපි බහූ ජනා, යතො ච චන්දිමස්සරියා උග්ගච්ඡන්ති, යත්ථ ච ඔගච්ඡන්ති, ආයාචන්ති පොක්ඛරණිකා නමස්සමානා අනුපරිවත්තන්ති, තෙ'පි නපපහොන්ති චන්දිමස්සරියානං සහව්‍යතාය මග්ගං දෙසෙතුං: අයමෙව උජුමග්ගො අයමඤ්ජසායනො නියාණිකො නියාති තක්කරස්ස චන්දිමස්සරියානං සහව්‍යතායාති. කිං පන, න කිර තෙවිජ්ජානි බ්‍රාහ්මණෙහි බ්‍රහ්මා සක්ඛි දිට්ඨො. න පි කිර තෙවිජ්ජානං බ්‍රාහ්මණානං ආචරියෙහි බ්‍රහ්මා සක්ඛිදි ට්ඨො. න පි කිර තෙවිජ්ජානං බ්‍රාහ්මණානං ආචරියපාචරියෙහි බ්‍රහ්මා සක්ඛිදිට්ඨො. න පි කිර තෙවිජ්ජානං බ්‍රාහ්මණානං යාව සත්තමා ආචරියමහයුගා යෙන බ්‍රහ්මා සක්ඛිදිට්ඨො. "යෙ'පි කිර තෙවිජ්ජානං බ්‍රාහ්මණානං පුබ්බකා ඉසයො මන්තානං කත්තාරො මන්තානං පවත්තාරො, යෙසමිදං එතරහි තෙවිජ්ජා බ්‍රාහ්මණා පොරාණං මන්තපදං ගීතං පවුත්තං සමිහිතං, තදනුගායන්ති තදනුභාසන්ති භාසිතමනුභාසන්ති වාචිතමනුවාචෙන්ති, සෙය්‍යථිදං: අට්ඨකො වාමකො වාමදෙවො වෙස්සාමිත්තො යමතග්ගි අඞ්ගීරසො භාරද්වාජො වාසෙට්ඨො කස්සපො භගු. තෙ'පි න එවමාහංසු: මයමෙතං ජානාම්, මයමෙතං පස්සාම, යත්ථ වා බ්‍රහ්මා යෙන වා බ්‍රහ්මා යහිං වා බ්‍රහ්මා'ති. තෙ වත තෙවිජ්ජා බ්‍රාහ්මණා එවමාහංසු: යං න ජානාම යං න පස්සාම, තස්ස සහව්‍යතාය මග්ගං දෙසෙම: අයමෙව උජුමග්ගො අයමඤ්ජසායනො නියාණිකො නියාති තක්කරස්ස බ්‍රහ්මසහව්‍යතායා"ති.

"තං කිම්මඤ්ඤසි වාසෙට්ඨ, නනු එවං සන්තෙ තෙවිජ්ජානං බ්‍රාහ්මණානං අපාටිහීරකතං භාසිතං සම්පජ්ජති?"ති.

"අථා බො භො ගොතම එවං සන්තෙ තෙවිජ්ජානං බ්‍රාහ්මණානං අපාටිහීරකතං භාසිතං සම්පජ්ජති" ති.

17. සාධු වාසෙට්ඨ තෙ වත වාසෙට්ඨ තෙවිජ්ජා බ්‍රාහ්මණා යං න ජානන්ති යං න පස්සන්ති තස්ස සහව්‍යතායතා මග්ගං දෙසෙස්සන්ති: අයමෙව උජුමග්ගො අයමඤ්ජසායනො නියාණිකො නියාති තක්කරස්ස බ්‍රහ්මසහව්‍යතායාති නෙතං ඨානං විජ්ජති ති.

15. [භාග්‍යවත්හු:] ' වාසෙට්ඨය, ඒ කිමැයි සිතයි ද, යම් කෙනෙකින් සදහිරුන් නැගෙන බසින වේලාවන්හි තෙවිදු බමුණෝත් අන් බොහෝ දෙනාත් සදහිරුන් දකින් ද, අයදින් ද, ඔවුනට සොත්‍ර කෙරෙත් ද, දෙහොත් මුදුනැ තබා වඳනාහු ඔබ මොබ පෙරැලෙත් ද, එහෙයින් ඒ තෙවිදු බමුණෝ 'එය අනුව පිළිපදනාහට සදහිරුන් හා එක් වනුවට මේ ම ඉදි මඟ යැ, මේ ම ඉදුරා මඟ යැ, ඔවුන් හා එක්වනුවට මේ තෙරිරාණික මාර්ග ම වේ යැ' යි සදහිරුන් හා එක් වනුවට මඟ දෙසන්නට හැකි වෙත් ද?".

[වාසෙට්ඨ:] "හවද් ගෞතමයිනි, මෙය නො ම වන්නෙකි."

16. [භාග්‍යවත්හු:] වාසෙට්ඨය, මෙසේ යම් කෙනෙකින් තෙවිදු බමුණෝ අන් බොහෝ දෙනාත් සදහිරුන් නැගෙන කල්හිත් බස්නා කල්හිත් සදහිරුන් දකින් ද, අයදින් ද, ඔවුනට සොත්‍ර කෙරෙත් ද, දෙහොත් මුදුනැ තබා වඳනාහු ඔබ මොබ පෙරැලෙත් ද, ඔහු පවා 'එය පිළිපදනාහට සදහිරුන් හා එක් වීමට මෙය ම ඉදි මඟ ය, මෙය ම ඉදුරා මඟ ය. මෙය ම තෙරිරාණික වූයේ සදහිරුන් හා එක් වීමට යේ' යැ යි සදහිරුන් හා එක් වන බවට මඟ දෙසන්නට නො සමත්හ. තෙවිදු බමුණන් විසින් බඹා සියැසින් නො දක්නා ලද්දේ ය. තෙවිදු බමුණන්ගේ ඇදුරන් විසින් බඹා සියැසින් නො දක්නා ලද්දේ ය. තෙවිදු බමුණන්ගේ ආචාර්ය ප්‍රාචාර්යයන් විසිනුදු බඹා සියැසින් නො දක්නා ලද්දේ ය. තෙවිදු බමුණන්ගේ සත්වන ඇදුරුමඟ යුගය තෙක් දු කිසිවකු විසිනුත් බඹා සියැසින් නො දක්නා ලද්දේ ය. තෙවිදුබමුණෝ යම් කෙනෙකුන් විසින් ගයන ලද, කියන ලද, රැස් කරන ලද මේ මන්ත්‍රපද ඔවුන් අනුව ගයත් නම්, ඔවුන් අනුව කියත් නම්, ඔවුන් හදලා අනුව හදරත් නම් ඔවුන් කියවූවා අනුව කියවත් නම්, තෙවිදු බමුණන්ගේ පූර්වපුරුෂ වූ, මන්ත්‍රකර්තෘ වූ, මන්ත්‍ර පැවැත්වූ ඒ අටවක වාමක වාමදෙව වෙස්සාමිත්‍ර යමතග්නි අඞ්ගිරස භාරද්වාජ වාසෙට්ඨ කස්සප භගු යන ඍෂීහු ද ඔඹහු වසන දෙස බඹහු වසන පෙදෙස අපි දනිමු යි අපි දකිමු යි මෙසේ නො කීහ. එහෙත් ඒ තෙවිදු බමුණෝ 'යමකු නො දනුමෝ නම්, යමකු නො දකුමෝ නම්, ඔහු සමග වන බව පිණිස මඟ දෙසමු' යි මෙය ම ඉදිමඟය, මෙය ම ඉදුරා මඟ යැ' මෙය පිළිපදනාහට තෙරිරාණික වූයේ බඹහු හා එක්වනුවට යේ යැ යි මෙසේ කියත්.

"වාසෙට්ඨය, එය කිමැ යි සිතහි ද, මෙසේ ඇති කල්හි තෙවිදු බමුණන්ගේ වචනය ප්‍රතිහරණ රහිතයෙක් නො වේ ද?"

[වාසෙට්ඨ:] "හවද් ගෞතමයිනි, මෙසේ ඇති කල්හි තෙවිදු බමුණන්ගේ වචනය එකාන්තයෙන් ප්‍රතිහරණ රහිත වෙයි." '

17. [භාග්‍යවත්හු:] වාසෙට්ඨය, මැනැව. "මෙය ම ඍජු මඟ ය, මෙය ම ඉදුරා මඟ ය, මෙය ම තෙරිරාණික ය, මෙය ම මෙය අනුව පිළිපදිත්වාහට බ්‍රහ්මයා හා එක් වන බවට යේ" යැ යි ඒ තෙවිදු බමුණෝ තමන් නොදන්නා නොදක්නා එකක්හුගේ සහභාවය පිණිස මඟ දක්වන්නාහ යන මේ කාරණය නැත්තේ ය.

18. සෙය්‍යථාපි වාසෙට්ඨ පුරිසො එවං වදෙය්‍ය: අහං ඛො යා ඉමස්මිං ජනපදෙ ජනපදකල්‍යාණී, තං ඉච්ඡාමි තං කාමෙමීති. තමෙනං එවං වදෙය්‍යුං: අමෙහා පුරිස, යං ත්වං ජනපදකල්‍යාණිං ඉච්ඡසි කාමෙසි, ජානාසි තං ජනපදකල්‍යාණිං ඛත්තියී[1] වා බ්‍රාහ්මණී[2] වා වෙස්සී[3] වා සුද්දී[4] වා?'ති ඉති පුට්ඨො 'නො'ති වදෙය්‍ය තමෙනං එවං වදෙය්‍යුං: "අමෙහා පුරිස යං ත්වං ජනපදකල්‍යාණිං න ජානාසි, න පස්සසි, එවංනාමා වා එවංගොත්තා වා, දීඝා වා රස්සා වා මජ්ඣිමා වා කාළී වා සාමා වා මඤ්ඤුරවජ්ජී වා'ති, අමුකස්මිං ගාමෙ වා නිගමෙ වා නගරෙ වා" ති ඉති පුට්ඨො 'නො'ති වදෙය්‍ය. තමෙනං එවං වදෙය්‍යුං: "අමෙහා පුරිස යං ත්වං න ජානාසි, න පස්සසි, තං ත්වං ඉච්ඡසි කාමෙසී "ති. ඉති පුට්ඨො 'ආමො'ති වදෙය්‍ය. තං කිම්මඤ්ඤසි වාසෙට්ඨ නනු එවං සන්තෙ තස්ස පුරිසස්ස අපාටිභිරකතං භාසිතං සම්පජ්ජති?" ති.

"අඤ්ඤා ඛො හො ගොතම තස්ස පුරිසස්ස අපාටිභිරකතං භාසිතං සම්පජ්ජති"ති.

19. එවමෙව ඛො වාසෙට්ඨ න කිර තෙවිජ්ජානි බ්‍රාහ්මණානි බ්‍රහ්මා සක්ඛි දිට්ඨො. තපි කිර තෙවිජ්ජානං බ්‍රාහ්මණානං ආචරියෙහි බ්‍රහ්මා සක්ඛි දිට්ඨො. නපි කිර තෙවිජ්ජානං බ්‍රාහ්මණානං ආචරියපාචරියෙහි බ්‍රහ්මා සක්ඛි දිට්ඨො. තපි කිර තෙවිජ්ජානං බ්‍රාහ්මණානං යාව සත්තමා ආචරිය-පරම්පරායෙන බ්‍රහ්මා සක්ඛි දිට්ඨො. යෙ'පි කිර තෙවිජ්ජානං බ්‍රාහ්මණානං පුබ්බකා ඉසයො මන්තානං කත්තාරො මන්තානං පවත්තාරො යෙසමිදං එතරහි තෙවිජ්ජා බ්‍රාහ්මණා පොරාණං මන්තපදං ගීතං පවුත්තං සමුහිතං තදනුගායන්ති තදනුභාසන්ති භාසිතමනුභාසන්ති වාචිතමනු-වාචෙන්ති, සෙය්‍යථීදං අට්ඨකො වාමකො වාමදෙවො වෙස්සාමිත්තො යමතග්ගි අඞ්ගීරසො භාරද්වාජො වාසෙට්ඨො කස්සපො භගු, තෙ'පි න එව-මාහංසු: මයමෙතං ජානාම මයමෙතං පස්සාම යත්ථ වා බ්‍රහ්මා යෙන වා බ්‍රහ්මා යත්ථ වා බ්‍රහ්මා'ති. තෙ වත තෙවිජ්ජා බ්‍රාහ්මණා එවමාහංසු: යං න ජානාම යං න පස්සාම, තස්ස සහව්‍යතාය මග්ගං දෙසෙම: අයමෙව උජුමග්ගො අයමඤ්ජසායනො නිය්‍යාණිකො නිය්‍යාති තක්කරස්ස බ්‍රහ්ම-සහව්‍යතායා' ති. තං කිම්මඤ්ඤසි වාසෙට්ඨ, නනු එවං සන්තෙ තෙවිජ්ජානං බ්‍රාහ්මණානං අපාටිභිරකතං භාසිතං සම්පජ්ජති?"ති.

"අඤ්ඤා ඛො හො ගොතම එවං සන්තෙ තෙවිජ්ජානං බ්‍රාහ්මණානං අපාටිභිරකතං භාසිතං සම්පජ්ජති" ති.

20. සාධු වාසෙට්ඨ. තෙ වත වාසෙට්ඨ, තෙවිජ්ජා බ්‍රාහ්මණා යං න ජානන්ති, යං න පස්සන්ති, තස්ස සහව්‍යතාය මග්ගං දෙසෙස්සන්ති: අය මෙව උජුමග්ගො අයමඤ්ජසායනො නිය්‍යාණිකො නිය්‍යාති තක්කරස්ස බ්‍රහ්මසහව්‍යතායා' ති නෙතං ඨානං විජ්ජති ති.

---

1. ඛත්තියිං, සයා
2. බ්‍රාහ්මණිං. සයා
3. වෙස්සිං, සයා
4. සුද්දිං, සයා

18 වාසෙට්ඨය, යම්සේ පුරුෂයෙක් 'මම වනාහි මේ දනව්වෙහි යම් දනවුකැලණක් ඇත් ද, ඇය රිසියෙම්, ඇය කැමැත්තෙම්'යි මෙසේ කියන්නේ නම්, ඔහුට අන්‍යයෝ "එම්බා පුරුෂය, තෝ යම් දනවුකැලණක රිසියෙහි නම්, කැමැත්තෙහි නම්, ඒ දනවුකැලණ කැත්කුල කතක් හෝ යි, බමුණු කුලකතක් හෝ යි, වෙළෙඳ කුල කතක් හෝයි, සුදුරුකුල කතක් හෝයි දන්නෙහි ද?"යි මෙසේ කියන්නාහු ය: මෙසේ විචාරන ලදුයේ, 'නො දනිමි'යි හෙ තෙම කියන්නේ ද, ඔහුට අන්‍යයෝ "එම්බා පුරුෂය, තා රිසියත, තා කැමැති ඒ දනවුකැලණ මෙනම් ඇත්තී යැ යි හෝ මෙ ගොත් ඇත්තී යැ යි හෝ උස් යැ යි හෝ මිටි යැ යි හෝ මැදුම් යැ යි හෝ කළුපැහැ යි හෝ සම්වණැ යි හෝ මඳුරුපැහැ ඇත්තී යැ යි හෝ, අසෝ ගමැ හෝ නියම්ගමැ හෝ නුවරැ හෝ වේ යැ යි දන්නෙහි ද?"යි. මෙසේ විචාරන ලදුයේ, 'නැතැ'යි කියන්නේ ද, ඔහුට අන්‍යයෝ මෙසේ කියන්නාහු ය; "එම්බා පුරුෂය, තෝ යමක නො දක්නෙහි නම්, නො දන්නෙහි නම්, ඇය තෝ රිසියෙහි ද කැමැත්තෙහි ද?"යි. මෙසේ විචාරන ලදුයේ, 'එසේ යැ' යි කියන්නේ ද, වාසෙට්ඨය, මෙසේ ඇති කලැ ඒ පුරුෂයාගේ වචනය ප්‍රතිහරණරහිතයක් කරන ලදුයේ නො වේ ද?

[වාසෙට්ඨ:] "භවද් ගෞතමයෙනි, මෙසේ ඇති කල්හි ඒ පුරුෂයාගේ වචනය එකාන්තයෙන් ප්‍රතිහරණරහිතයක් කරන ලද්දේ වෙයි"

19. [භාග්‍යවත්හු:] වාසෙට්ඨයෙනි, එපරිද්දෙන් ම තෙවිදු බමුණන් විසින් බඹා සියැසින් දක්නා ලද්දේ නො වෙයි. තෙවිදු බමුණන්ගේ ඇදුරන් විසිනුදු බඹා සියැසින් දක්නා ලද්දේ නො වෙයි. තෙවිදු බමුණන්ගේ ආචාර්යප්‍රාචාර්යන් විසිනුදු බඹා සියැසින් දක්නා ලද්දේ නො වෙයි. තෙවිදු බමුණන්ගේ සත්වන ඇදුරුම්හයුගය තෙක් වූවන් විසිනුදු බඹා සියැසින් දක්නා ලද්දේ නො වෙයි. අට්ඨක වාමක වාමදෙව වෙසාමිත්‍ර යමතග්ගි අඞ්ගීරස භාරද්වාජ වාසෙට්ඨ කස්සප භගු ඝන යම් කෙනෙකුන් විසින් ගයන ලද පවත්වන ලද රැස් කරන ලද මෙ මන්ත්‍ර පද ඔවුන් අනුව ගයත් නම්, ඔවුන් අනුව කියත් නම්, ඔවුන් කීම අනුව කියත් නම්, කියැවීම අනුව කියවත් නම්, ඒ තෙවිදු බමුණන්ගේ පූර්ව පුරුෂ වූ මන්ත්‍රකර්තෘවූ මන්ත්‍රප්‍රවර්තයිතෘ වූ යම් ඍෂි කෙනෙක් වූහු නම්, ඔහු ද බඹහු සිටිනා තැන හෝ දෙස හෝ පෙදෙස හෝ අපි දනිමු යි අපි දකිමු යි නො කීහ. එහෙත් ඒ තෙවිදු බමුණෝ, "මෙය ම ඍජු මඟ ය, මෙය ම ඉදුරු මඟ ය, මෙය ම නෛර්යාණික වූයේ එය පිළිපදනහුට බඹහු හා එක් වනුවට යේ යැ' යි යමකු අපි නො දනුමෝ නම් යමකු නොදකුමෝ නම්, ඔහු හා සහභාවය පිණිස මඟ දක්වමු'යි මෙසේ කියත්. වාසෙට්ඨයිනි, ඒ කිමැ යි සිතහි ද මෙසේ ඇති කල්හි තෙවිදු බමුණන්ගේ වචනය ප්‍රතිහරණ රහිත නො වේ ද?"

[වාසෙට්ඨ:] "භවද් ගෞතමයිනි, මෙසේ ඇති කල්හි තෙවිදු බමුණන්ගේ වචනය එකාන්තයෙන් ප්‍රතිහරණරහිත වෙයි."

20. [භාග්‍යවත්හු:] මැනැව, වාසෙට්ඨයිනි. තෙවිදු බමුණෝ තුමූ යමකු නොදන්නාහු නම්, නො දක්නාහු නම්, ඒ බඹහු හා එක්වනුවට මෙය ම ඍජු මඟ ය, මෙය ම ඉදුරු මඟ ය, එය පරිදි පිළිපදනාහට බ්‍රහ්ම-සහභාවය පිණිස මේ මඟ ම නෛර්යාණික වන්නේ යැ' යි මඟ දෙසන්-නාහ යන මේ කාරණය අවිද්‍යමාන ය (නොවිය හැක්කේය).

21. සෙය්‍යථාපි වාසෙට්ඨ පුරිසො වාතුම්මහාපථෙ නිස්සෙණිං කරෙය්‍ය පාසාදස්ස ආරොහණාය, තමෙනං එවං වදෙය්‍යුං: අමෙහො පුරිස යස්ස ත්වං පාසාදස්ස ආරොහණාය නිස්සෙණිං කරොසි, ජානාසි තං පාසාදං පුරත්ථිමාය වා දිසාය දක්ඛිණාය වා දිසාය පච්ඡිමාය වා දිසාය උත්තරාය වා දිසාය, උච්චො වා නීචො වා මජ්ඣිමො වා'ති ඉති පුට්ඨො 'නො'ති වදෙය්‍ය, තමෙනං එවං වදෙය්‍යුං: අමෙහො පුරිස යං ත්වං න ජානාසි න පස්සසි තස්ස ත්වං පාසාදස්ස ආරොහණාය නිස්සෙණිං කරොසී'ති. ඉති පුට්ඨො 'ආමා'ති වදෙය්‍ය. තං කිම්මඤ්ඤසි වාසෙට්ඨ, නනු එවං සන්තෙ තස්ස පුරිසස්ස අපාටිහීරකතං භාසිතං සම්පජ්ජතී? ති.

"අද්ධා ඛො හො ගොතම එවං සන්තෙ තස්ස පුරිසස්ස අපාටිහීරකතං භාසිතං සම්පජ්ජතී" ති

22. එවමෙව ඛො වාසෙට්ඨ න කිර තෙවිජ්ජෙහි බ්‍රාහ්මණෙහි බ්‍රහ්මා සක්ඛි දිට්ඨො තපි කිර තෙවිජ්ජානං බ්‍රාහ්මණානං ආචරියෙහි බ්‍රහ්මා සක්ඛි දිට්ඨො. තපි කිර තෙවිජ්ජානං බ්‍රාහ්මණානං ආචරියපාචරියෙහි බ්‍රහ්මා සක්ඛි දිට්ඨො. තපි තෙවිජ්ජානං බ්‍රාහ්මණානං යාව සත්තමා ආචරියමහයුගා යෙන බ්‍රහ්මා සක්ඛි දිට්ඨො. යෙ'පි කිර තෙවිජ්ජානං බ්‍රාහ්මණානං පුබ්බකා ඉසයො මන්තානං කත්තාරො මන්තානං පවත්තාරො, යෙසමිදං එතරහි තෙවිජ්ජා බ්‍රාහ්මණා පොරාණං මන්තපදං ගීතං පවුත්තං සමිහිතං තදනුගායන්ති තදනුභාසන්ති භාසිතමනුභාසන්ති වාචිතමනුවාචෙන්ති, සෙය්‍යථීදං: අට්ඨකො වාමකො වාමදෙවො වෙස්සාමිත්තො යමතග්ගි අඞ්ගිරසො භාරද්වාජො වාසෙට්ඨො කස්සපො භගු, තෙ'පි න එවමාහංසු: මයමෙතං ජානාම මයමෙතං පස්සාම යත්ථ වා බ්‍රහ්මා යෙන වා බ්‍රහ්මා යහිං වා බ්‍රහ්මා'ති. තෙ වත තෙවිජ්ජා බ්‍රාහ්මණා එවමාහංසු: යං න ජානාම යං න පස්සාම තස්ස සහව්‍යතාය මග්ගං දෙසෙම 'අයමෙව උජුමග්ගො අයමඤ්ජසායනො නිය්‍යානිකො නිය්‍යාති තක්කරස්ස බ්‍රහ්මසහව්‍යතාය'ති තං කිම්මඤ්ඤසි වාසෙට්ඨ? නනු එවං සන්තෙ තෙවිජ්ජානං බ්‍රාහ්මණානං අපාටිහීරකතං භාසිතං සම්පජ්ජතී?" ති.

"අද්ධා ඛො හො ගොතම එවං සන්තෙ තෙවිජ්ජානං බ්‍රාහ්මණානං අපාටිහීරකතං භාසිතං සම්පජ්ජතී" ති.

23. සාධු වාසෙට්ඨ. තෙ වත වාසෙට්ඨ තෙවිජ්ජා බ්‍රාහ්මණා යං න ජානන්ති, යං න පස්සන්ති, තස්ස සහව්‍යතාය මග්ගං දෙසෙස්සන්ති 'අයමෙව උජුමග්ගො අයමඤ්ජසායනො නිය්‍යානිකො නිය්‍යාති තක්කරස්ස බ්‍රහ්මසහව්‍යතාය'ති තෙසං ඨානං විජ්ජති.

24. සෙය්‍යථාපි වාසෙට්ඨ අයං අච්චිරවතී නදී පූරා උදකස්ස සම්තිත්තිකා කාකපෙය්‍යා, අථ පුරිසො ආගච්ඡෙය්‍ය පාරත්ථිකො පාරගවෙසී පාරගාමී පාරං තරිතුකාමො, සො ඔරිමෙ තීරෙ ඨිතො පාරිමං තීරං අවෙක්ඛෙය්‍ය: එහි පාරාපාරං, එහි පාරාපාරන්ති, තං කිම්මඤ්ඤසි වාසෙට්ඨ අපි නු තස්ස පුරිසස්ස අවක්ඛායනහෙතු වා ආයාචනහෙතු වා පත්ථනාහෙතු වා අභිනන්දනහෙතු වා අච්චිරවතියා නදියා පාරිමං තීරං ඔරිමං තීරං ආගච්ඡෙය්‍යා?" ති.

21. වාසෙට්ඨය, යම්සේ පුරුෂයෙක් පහයකට නැගෙනුවට සිවුමං-තන්දියෙක ගිණක් බඳනේ ද, ඔහුට අන්හු 'හෙම්බා පුරිස, යම් පහයකට නැගෙනුවට තෝ ගිණක් බඳනෙහි නම්, ඒ පහය පෙරැදිගැ තෝ දකුණු-දිගැ තෝ පැසිම්දිගැ තෝ උතුරුදිගැ තෝ වේ යැ යි, එය උස් හෝ මිටි තෝ මැදුම් හෝ වේ යැ යි තෝ දනු දැ?' යි මෙසේ කියන්නාහු නම්, මෙසේ විචාරන ලද හේ 'නො දනිමි' යි කියන්නේ නම්, ඔහුට ඒ අන්හු 'හෙම්බා පුරිස, තෝ තමා නොදන්නා පහයකට නැගෙනුවට ගිණක් කෙරෙයි ද?'යි මෙසේ කියන්නාහු නම්, මෙසේ විචාරන ලද හේ 'එසේ'යි කියන්නේ නම්, වාසෙට්ඨය, ඒ කිමැ යි සිතයි ද, මෙසේ ඇති කලැ ඒ පුරිස්හු බස ප්‍රතිහරණරහිත නො වේ ද?"

[වාසෙට්ඨ:] "භවද් ගෞතමයිනි, මෙසේ ඇති කලැ ඒ පුරිස්හු බස ඒකාන්තයෙන් ප්‍රතිහරණරහිත වෙයි."

22. [භාග්‍යවත්හු:] වාසෙට්ඨය, එසේ ම තෙවිදු බමුණන් විසින් බඹා සියැසින් නොදක්නා ලද්දේ ය. තෙවිදු බමුණන්ගේ ඇදුරන් විසිනුදු බඹා සියැසින් නො දක්නා ලද්දේ ය. තෙවිදු බමුණන්ගේ ආචාර්‍යප්‍රාචාර්‍යයන් විසිනුදු බඹා සියැසින් නො දක්නා ලද්දේ ය. තෙවිදු බමුණන්ගේ සත්වනු ඇදුරුමාගුග තෙක් වූවන් විසිනුදු බඹා සියැසින් නො දක්නා ලද්දේ ය. තෙවිදු බමුණෝ යම් කෙනෙකුන් විසින් ගයන ලද පවත්-වන ලද රැස් කරන ලද යම් පැරැණි මන්ත්‍රපද මෙ කලැ ඔවුන් අනුව ගයත් ද, කියත් ද, ඔවුන් කී දෑ අනුව කියත් ද, කියැවූ දෑ අනුව කිය-වද්ද, අවටක වාමක වාමදෙව වෙස්සාමිත්‍ර යමතග්ගි අඞ්ගීරස භාරද්වාජ වාසෙට්ඨ කස්සප භගු යන මන්ත්‍රකර්තෘ වූ මන්ත්‍රප්‍රවර්තයිතෘ වූ, තෙවිදු බමුණන්ගේ පූර්වපුරුෂ වූ යම් ඍෂි කෙනෙක් වූහු නම්, ඔහු ද 'යම් තැනෙක හෝ යම් දෙසෙක හෝ යම් පෙදෙසකැ හෝ බඹා වේ නම්, 'අපි ඔහු දනිමු යි, අපි ඔහු දකිමු' යි මේසේ නො කීහ. එහෙත් ඒ තෙවිදු බමුණෝ 'අපි යමකු නො දනුමෝ ද, යමකු නො දකුමෝ ද, එ බඹහු හා එක් වන බවට මඟ දෙසන්නමු. එය අනුව පිළිපදනාහ බඹහු හා එක් වනුවට මෙය ම ඍජු මඟ යැ, මෙය ම ඉඳුරා මඟ යැ,ට මේ මඟ ම නෛර්යාණික වනුයේ එයට යේ යැ' යි මෙසේ කියත්. වාසෙට්ඨය, එය කිමැ යි සිතයි ද, මෙසේ ඇති කලැ තෙවිදු බමුණන්ගේ වචනය ප්‍රතිහරණ රහිත නො වේ ද?

[වාසෙට්ඨ:] "භවද් ගෞතමයිනි, මෙසේ ඇති කලැ තෙවිදු බමුණන්ගේ වචනය එකාන්තයෙන් ප්‍රතිහරණරහිත වෙයි."

23. [භාග්‍යවත්හු:) වාසෙට්ඨය, මැනැව. ඒ තෙවිදු බමුණෝ 'මෙය ම ඍජු මඟ ය, මෙය ම ඉඳුරා මඟ ය, මෙය ම නෛර්යාණික වනුයේ එය පිළිපදනාහට බඹහු හා එක් වනුවට යේ යැ' යි තමන් නොදන්නා නොදක්නා ඒ බඹහු හා එක් වනු පිණිස මඟ දෙසන්නාහ යන මේ කරුණ තැන්නේ ය (නො විය හැක්කේය).

24 වාසෙට්ඨය, යම්සේ මේ අචිරවතී නදිය කවුඹන් විසින් පිය ගැකි පරිදි දියෙන් පිරී දෙගොඹතලා ගලන්නේ ද, එකලැ පරතෙරට යැමෙන් වැඹක් ඇති, පරතෙර අපේක්ෂා කරන සුලු, පර තෙර යන පුරුෂයෙක් පර තෙරට යනු කැමැත්තේ එන්නේ නම්, ඔහු තෙම මෙ ගොඹැ සිටියේ, 'හෙම්බා එ තෙර, මෙ තෙරට එන්නැ, හෙම්බා පර තෙර, මෙ තෙරට එන්නැ'යි පර තෙරට හඬ ගසන්නේ නම්, වාසෙට්ඨය, ඒ කිමැ යි සිතහි ද, ඒ පුරුෂයාගේ කැඳවීම් හෙතු කොටගෙන හෝ අයැදීම් හෙතු කොට ගෙන හෝ පැතීම් හෙතු කොට ගෙන හෝ සතුති කිරීම් හෙතු කොට ගෙන හෝ අචිරවතී නදියගේ එ තෙර මෙ තෙරට එන්නේ ද?

"තො හිදං භො ගොතම".

25. එවමෙව ඛො වාසෙට්ඨ තෙවිජ්ජා බ්‍රාහ්මණා යෙ ධම්මා බ්‍රාහ්මණ කරණා තෙ ධම්මෙ පහාය වත්තමානා, යෙ ධම්මා අබ්‍රාහ්මණකරණා තෙ ධම්මෙ සමාදාය වත්තමානා එවමානංසු: ඉන්දමවහයාම, සොමමවහයාම වරුණමවහ යාම, ඊසානමවහයාම, පජාපතිමවහයාම, බ්‍රහ්මමවහයාම, මහින්දමවහයාම යාමමවහයාමා'ති. තෙ වත වාසෙට්ඨ තෙවිජ්ජා බ්‍රාහ්මණා යෙ ධම්මා බ්‍රාහ්මණකරණා තෙ ධම්මෙ පහාය වත්තමානා, යෙ ධම්මා අබ්‍රාහ්මණකරණා තෙ ධම්මෙ සමාදාය වත්තමානා, අවහානහෙතු වා ආයාචනහෙතු වා පත්ථනාහෙතු වා අභිත්ථනහෙතු වා කායස්ස භෙදා පරම්මරණා බ්‍රහ්මුණො[1] සහව්‍යූපගා භවිස්සන්තීති තෙතං ඨානං විජ්ජති.

26. සෙය්‍යථාපි වාසෙට්ඨ අයං අචිරවතී නදී පූරා උදකස්ස සම්තිත්තිකා කාකපෙය්‍යා, අථ පුරිසො ආගච්ඡෙය්‍ය පාරත්ථිකො පාරගවෙසී පාරගාමී පාරං තරිතුකාමො, සො ඔරිමෙ තීරෙ දළ්හාය අත්ථියා[2] පච්ඡා-බාහං ගාළ්හබන්ධනං බන්ධො, තං කිම්මඤ්ඤසි වාසෙට්ඨ, අපි නු සො පුරිසො අචිරවතියා නදියා ඔරිමං තීරං පාරිමං තීරං ගච්ඡෙය්‍යා?" ති.

"තො හිදං භො ගොතම"

27. "එවමෙව ඛො වාසෙට්ඨ පඤ්චිමෙ කාමගුණා අරියස්ස විනයෙ අත්ථ'ති'පි වුච්චන්ති බන්ධනන්තිපි වුච්චන්ති. කතමෙ පඤ්ච? චක්ඛු-විඤ්ඤෙය්‍ය රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. සොතවිඤ්ඤෙය්‍යා සද්දා -පෙ- ඝාණවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. ඉමෙ ඛො වාසෙට්ඨ පඤ්ච කාමගුණා අරියස්ස විනයෙ අත්ථ'ති'පි වුච්චන්ති බන්ධනන්ති'පි වුච්චන්ති. ඉමෙ ඛො වාසෙට්ඨ පඤ්ච-කාමගුණෙ තෙවිජ්ජා බ්‍රාහ්මණා ගථිතා මුච්ඡිතා අජ්ඣොපන්නා අනාදීනව-දස්සාවිනො අනිස්සරණපඤ්ඤා පරිභුඤ්ජන්ති.

28. තෙ වත වාසෙට්ඨ තෙවිජ්ජා බ්‍රාහ්මණා යෙ ධම්මා බ්‍රාහ්මණ-කරණා තෙ ධම්මෙ පහාය වත්තමානා, යෙ ධම්මා අබ්‍රාහ්මණකරණා තෙ ධම්මෙ සමාදාය වත්තමානා, පඤ්චකාමගුණෙ ගථිතා මුච්ඡිතා අජ්ඣො-පන්නා අනාදීනවදස්සාවිනො අනිස්සරණපඤ්ඤා පරිභුඤ්ජන්තා කාමෙසු-බන්ධනබද්ධා කායස්ස භෙදා පරම්මරණා බ්‍රහ්මුනො සහව්‍යූපගා භවිස්සන්තීති තෙතං ඨානං විජ්ජති.

---

1. බ්‍රහ්මානං PTS. 2. රජ්ජුයා, සත්‍ය

[වාසෙට්ඨ:] "භවද් ගෞතමයිති, මෙය නො වේ ම ය."

25. [භාග්‍යවත්හු:] වාසෙට්ඨය, එසේ ම තෙවිදු බමුණෝ, යම් බ්‍රාහ්මණකරණ ධර්ම කෙනෙක් ඇත් නම්, ඒ ධර්ම බැහැර කොට පවත්නාහු, යම් අබ්‍රාහ්මණකරණ ධර්ම කෙනෙක් ඇත් නම් ඔවුන් සමාදන් කොට ගෙන පවත්නාහු, 'ඉන්ද්‍ර දෙවියා කැඳවම්හ, සොම දෙවියා කැඳවම්හ, වරුණ දෙවියා කැඳවම්හ, ඊශාන දෙවියා කැඳවම්හ, ප්‍රජාපතිහු කැඳවම්හ, බ්‍රහ්මයා කැඳවම්හ, මහෙන්ද්‍රයා කැඳවම්හ' යි මෙසේ කියත්. වාසෙට්ඨය, එකාන්තයෙන් ඒ තෙවිදු බමුණෝ, යම් බ්‍රාහ්මණකරණ ධර්ම කෙනෙක් ඇත් නම්, ඒ ධර්ම බැහැර කොට පවත්නාහු, යම් අබ්‍රාහ්මණකරණ ධර්ම කෙනෙක් ඇත් නම්, ඒ ධර්ම සමාදන් කොට ගෙන පවත්නාහු, ආවාහනහෙතුයෙන් හෝ ආයාවනහෙතුයෙන් හෝ ප්‍රාර්ථනා හෙතුයෙන් හෝ අභිනන්දන (සෙනොත්‍ර කරණ) හෙතුයෙන් හෝ කාබුත් මරණින් මතු බඹහුගේ සහභාවයට පැමිණියෝ වන්නාහ යන මේ කරුණ නැත්තේ ය (විය නොහැක්කේය).

26. වාසෙට්ඨය, යම්සේ මේ අචිරවතී නදිය කවුඩත් විසිතුදු පිය හැකි පරිදි දියෙන් පිරුණේ, දෙකොඩ තලා ගලන්නේ ද, එකල්හි පර තෙරට යෑමෙන් වැඩක් ඇති, පර තෙර අපෙක්ෂා කරන සුලු, පර තෙර යන පුරුෂයෙක් පරතෙරට යනු කැමැත්තේ එන්නේ නම්, හේ මේ තෙරැ දැඩි දමෙකින් පිටිතල හයා දැඩි කොට බඳනා ලද්දේ වේ නම්, වාසෙට්ඨය, ඒ කිමැ යි සිතහි ද, ඒ පුරුෂ තෙම අචිරවතී නදියේ මේ තෙරින් එ තෙරට යා හැකි වන්නේ ද?"

[වාසෙට්ඨ:] "භවද් ගෞතමයිති, මේ නො වේ ම ය."

27. [භාග්‍යවත්හු:] "වාසෙට්ඨය, එ පරිද්දෙන් ම මේ පස් කාමගුණයෝ (කාමබන්ධන පස) ආර්‍ය විනයයෙහි දම්වැල යි ද කියනු ලැබෙත්, බැමිමැ යි ද කියනු ලැබෙත්. කවර පස් දෙනෙක් ද? ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ප්‍රියසභාවය ඇති, කාමෝපනිශ්‍රිත වූ, රාගයට කාරණ වූ චක්ෂුර්විඥෙය රූප ද, ඉෂ්ට වූ ... ශ්‍රෝත්‍රවිඥෙය ශබ්ද ද, ඉෂ්ට වූ...ඝ්‍රාණ විඥෙය ගන්ධ ද, ඉෂ්ට වූ... ජිහ්වාවිඥෙය රස ද, ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ප්‍රිය සභාවය ඇති, කායවිඥෙය සප්‍රස්පර්ශ ද යන පස ය. වාසෙට්ඨය, මේ කාමගුණයෝ පස් දෙන ආර්‍යවිනයයෙහි දම්වැලැ යි ද කියනු ලැබෙත්, බන්ධන යැ යි ද කියනු ලැබෙත්. වාසෙට්ඨය, තෙවිදු බමුණෝ (මෙහි) ගිජු වූවාහු, මූර්ඡිත වූවාහු, බැස ගත්තාහු, දෙස් නොදක්නා සුලු වූවාහු, නිඃශරණප්‍රඥ රහිත වූවාහු මේ පංච කාමගුණයන් පරිභෝග කෙරෙත්.

28. වාසෙට්ඨය, එකාන්තයෙන් ඒ තෙවිදු බමුණෝ යම් බ්‍රාහ්මණ කරණ ධර්ම කෙනෙක් ඇත් නම්, ඒ ධර්ම බැහැර කොට පවත්නාහු, යම් අබ්‍රාහ්මණ කරණ ධර්ම කෙනෙක් ඇත් නම්, ඔවුන් සමාදන් කොට ගෙන පවත්නාහු, (පස්කාමයි) ගිජු වූවාහු, මූර්ඡිත වූවාහු, බැස ගත්තාහු, දෙස් නො දක්නා සුලු වූවාහු, නිඃශරණ ප්‍රඥරහිත වූවාහු, පංච කාමගුණයන් පරිභෝග කරත්නාහු කාබුත් මරණින් මතු බඹහුගේ සහභාවයට පැමිණියෝ වන්නාහ යන මේ කාරණය නැත්තේ ය.

29. සෙය්‍යථාපි වාසෙට්ඨ අයං අචිරවතී නදී පූරා උදකස්ස සමතිත්තිකා කාකපෙය්‍යා, අථ පුරිසො ආගච්ඡෙය්‍ය පාරත්ථිකො පාරගවෙසී පාරගාමී පාරං තරිතුකාමො, සො ඔරිමෙ තීරෙ සසීසං පාරුපිත්වා නිපජ්ජෙය්‍ය, තං කිම්මඤ්ඤසි වාසෙට්ඨ, අපි නු සො පුරිසො අචිරවතියා නදියා ඔරිමා තීරා පාරිමං තීරං ගච්ඡෙය්‍යා ති.

"නො හිදං භො ගොතම"

30. එවමේව ඛො වාසෙට්ඨ පඤ්චිමෙ නීවරණා අරියස්ස විනයෙ ආවරණා'ති'පි වුච්චන්ති, නීවරණා' ති' පි වුච්චන්ති, ඔත්තාහා'ති'පි වුච්චන්ති. පරියොත්තාහා'ති'පි වුච්චන්ති. කතමෙ පඤ්ච? කාමච්ඡන්දනීවරණං ව්‍යාපාදනීවරණං පිනමිද්ධනීවරණං උද්ධච්චකුක්කුච්චනීවරණං විචිකිච්ඡා-නීවරණං. ඉමෙ ඛො වාසෙට්ඨ පඤ්චනීවරණා අරියස්ස විනයෙ ආවරණා'ති' පි වුච්චන්ති, නීවරණා'ති'පි වුච්චන්ති, ඔත්තාහා'ති'පි වුච්චන්ති, පරියොත්තාහා'ති'පි වුච්චන්ති. ඉමෙහි ඛො වාසෙට්ඨ පඤ්චහි නීවරණෙහි තෙවිජ්ජා බ්‍රාහ්මණා ආවුටා නිවුටා ඔවුටා[1] පරියොත්තා. තෙ ච්ත වාසෙට්ඨ තෙවිජ්ජා බ්‍රාහ්මණා යෙ ධම්මා බ්‍රාහ්මණකරණා තෙ ධම්මෙ පහාය වත්තමානා, යෙ ධම්මා අබ්‍රාහ්මණකරණා තෙ ධම්මෙ සමාදාය වත්තමානා, පඤ්ච නීවරණෙහි ආවුටා නිවුටා ඔවුටා පරියොත්තා කායස්ස භෙදා පරම්මරණා බ්‍රහ්මුනො සහව්‍යූපගා භවිස්සන්ති'ති තෙතං ඨානං විජ්ජති.

31. තං කිම්මඤ්ඤසි වාසෙට්ඨ, කිත්තාපි තෙ සුතං බ්‍රාහ්මණානං වුද්ධානං මහල්ලකානං ආචරියපාචරියානං භාසමානානං:

"සපරිගාහො වා බ්‍රහ්මා අපරිගාහො වා" ති.

"අපරිගාහො භො ගොතම."

"සවෙරචිත්තො වා අවෙරචිත්තො වා?" ති.

"අවෙරචිත්තො භො ගොතම."

"සව්‍යාපජ්ඣචිත්තො වා අව්‍යාපජ්ඣචිත්තො වා?" ති.

"අව්‍යාපජ්ඣචිත්තො භො ගොතම."

"සඞ්කිලිට්ඨචිත්තො වා අසඞ්කිලිට්ඨචිත්තො වා?" ති.

"අසඞ්කිලිට්ඨචිත්තො භො ගොතම."

---

1. අවුතා නිවුතා ඔත්‍රුටා, සොත්‍රුම්.

29. වාසෙට්ඨය, යම්සේ මේ අචිරවතී නදිය දෙගොඩ තලා ගලනුයේ කවුඩන් විසින් පිරී හැකි සේ වූයේ, දියෙන් පිරුණේ ද, එ කලෑ පර තෙරට යෑමෙන් වැඩක් ඇති, පර තෙරට යෑම අපෙක්ෂා කරන, පර තෙර සොයන සුලු, එ ගොඩ යනු කැමැති පුරුෂයෙක් එන්නේ ද, මේ මේ තෙරැ හිස සහිත මුළු කය ම වසා පෙරෙවූ වැදූ හෙන්නේ නම්, වාසෙට්ඨය, ඒ කිමැ සි සිතහි ද, ඒ පුරුෂ තෙම අචිරවතීනදියේ මේ තෙරින් එ තෙරට යන හැකි වන්නේ ද?"

[වාසෙට්ඨ:] "භවද් ගෞතමයිනි, මේය නො ම වන්නේ ය."

30. [භාග්‍යවත්හු:] "එ පරිද්දෙන් ම වාසෙට්ඨය, මේ ආර්‍යවිනයයෙහි මේ පස් නීවරණ කෙනෙක් ආවරණ යැ සි ද කියනු ලැබෙත්. නීවරණ යැ සි ද කියනු ලැබෙත්. අවනාහ (යටිහුරු කොට බැඳීම) යැ සි ද කියනු ලැබෙත්. පර්‍යවනාහ (හාත්පස බැඳීම) යැ සි ද කියනු ලැබෙත්. කවර පස් දෙනෙක් ද, ඉත්: කාමච්ඡන්දනීවරණය, ව්‍යාපාද නීවරණය, ථීනමිද්ධ-නීවරණය, උද්ධච්චකුක්කුච්චනීවරණය, විචිකිච්ඡානීවරණය යන මෙහු ය. වාසෙට්ඨය, ආර්‍යවිනයයෙහි මේ නීවරණයෝ පස් දෙන ආවරණයැ සි ද කියනු ලැබෙත්. නීවරණයැ සි ද කියනු ලැබෙත්. අවනාහයැ සි ද කියනු ලැබෙත්. පර්‍යවනාහ යැ සි ද කියනු ලැබෙත්. වාසෙට්ඨය, තෙවිදු බමුණෝ මේ නීවරණ පසින් ඇවුරුණේ ද පිළිසත් වූවෝ ද වැසුණේ ද හාත්පසින් බැඳුණේ ද වෙති. වාසෙට්ඨය, යම් බ්‍රාහ්මණකරණ ධර්ම කෙනෙක් වෙත් නම්, ඔවුන් බැහැර කොට පවත්නා, යම් අබ්‍රාහ්මණකරණ ධර්ම කෙනෙක් වෙත් නම්, ඔවුන් සමාදන් කොට ගෙන පවත්නා ඒ තෙවිදු බමුණෝ නීවරණ පසින් ඇවුරුණේ පිළිසත් වූවෝ වැසුණේ හාත්පසින් බැඳුණේ කාබුත් මරණින් මතු බඹහුගේ සහභාවයට පැමිණියෝ වන්නාහ යන මේ කාරණය විද්‍යමාන නො වේ (විය නො හැක්කෙකි).

31. වාසෙට්ඨය, එය කිමැ සි සිතහි ද, වැඩි සිටි මහලු වූ ආචාර්‍ය-ප්‍රාචාර්‍ය වූ බමුණන් කියන වචනය තා විසින් කෙසේ අසන ලද ද?

"බ්‍රහ්මයා සස්ත්‍රීපරිග්‍රහය ඇත්තේ ද?"

[වාසෙට්ඨ:] "සස්ත්‍රීපරිග්‍රහය තැත්තේය, භවද් ගෞතමයිනි."

[භාග්‍යවත්හු:] "සවෛර (ව්‍යාපාද සහිත) සිතැත්තේ ද, නැත හොත් අවෛර (ව්‍යාපාද රහිත) සිතැත්තේ ද?"

[වාසෙට්ඨ:] "අවෛරසිතැත්තේ ය, භවද් ගෞතමයිනි."

[භාග්‍යවත්හු:] "සව්‍යාබාධ (ථීනමිද්ධ – චිත්ත ගෙලඝුඤ්ඤ සහිත) සිතැත්තේ ද? අව්‍යාබාධ (ථීනමිද්ධ – චිත්ත ගෙලඝුඤ්ඤ රහිත) සිතැත්තේ ද?"

[වාසෙට්ඨ:] "අව්‍යාබාධ (ථීනමිද්ධ-චිත්ත ගෙලඝුඤ්ඤ රහිත) සිතැත්තේ ය, භවද් ගෞතමයිනි."

[භාග්‍යවත්හු:] "කිලිටි සිතැත්තේ ද නො හොත් නොකිලිටි සිතැත්තේ ද?"

[වාසෙට්ඨ:] "නොකිලිටි සිතැත්තේ ය, භවද් ගෞතමයිනි."

"වසවත්තී වා අවසවත්තී වා?"ති.

"වසවත්තී හො ගොතම."

32. තං කිම්මඤ්ඤසි වාසෙට්ඨ, සපරිගුහා වා තෙවිජ්ජා බ්‍රාහ්මණා අපරිගුහා වා?" ති.

"සපරිගුහා හො ගොතම."

"සවෙරචිත්තා වා අවෙරචිත්තා වා?" ති

"සවෙරචිත්තා හො ගොතම."

"සව්‍යාපජ්ඣචිත්තා වා අව්‍යාපජ්ඣචිත්තා වා?"ති.

"සව්‍යාපජ්ඣචිත්තා හො ගොතම."

"සඞ්කිලිට්ඨචිත්තා වා අසඞ්කිලිට්ඨචිත්තා වා?"ති.

"සඞ්කිලිට්ඨචිත්තා හො ගොතම."

"වසවත්තී වා අවසවත්තී වා?" ති.

"අවසවත්තී හො ගොතම."

33. ඉති කිර වාසෙට්ඨ සපරිගුහා තෙවිජ්ජා බ්‍රාහ්මණා. අපරිගුහො බ්‍රහ්මා. අපි නු ඛො සපරිගුහානානං තෙවිජ්ජානං බ්‍රාහ්මණානං අපරිගුහෙන බ්‍රහ්මුනා සද්ධිං සංසන්දති සමෙති?"ති.

"නො හිදං හො ගොතම."

සාධු වාසෙට්ඨ. තෙ වත වාසෙට්ඨ සපරිගුහා තෙවිජ්ජා බ්‍රාහ්මණා කායස්සභෙදා පරම්මරණා අපරිගුහස්ස බ්‍රහ්මුනො සහව්‍යූපගා භවිස්සන්තීති නෙතං ඨානං විජ්ජති.

34. ඉති කිර වාසෙට්ඨ සවෙරචිත්තා තෙවිජ්ජා බ්‍රාහ්මණා. අවෙරචිත්තො බ්‍රහ්මා. අපි නු ඛො අවෙරචිත්තානං තෙවිජ්ජානං බ්‍රාහ්මණානං අවෙරචිත්තෙන බ්‍රහ්මුනා සද්ධිං සංසන්දති සමෙති?" ති.

"නො හිදං හො ගොතම."

සාධු වාසෙට්ඨ. තෙ වත වාසෙට්ඨ සවෙරචිත්තා තෙවිජ්ජා බ්‍රාහ්මණා කායස්සභෙදා පරම්මරණා අවෙර චිත්තස්ස බ්‍රහ්මුනො සහව්‍යූපගා භවිස්සන්තීති නෙතං ඨානං විජ්ජති.

[භාග්‍යවත්හු:] "වශවර්ති ද (සිත තමා වශයෙහි පවත් වන්නේ ද) නො හොත් අවශවර්ති (සිත තමා යටත් ව පවත්නේ) ද?"

[වාසෙට්ඨ:] වශවර්ති ය, භවද් ගෞතමයිනි."

32. [භාග්‍යවත්හු:] "වාසෙට්ඨය, එය කිමෑ යි සිතහි ද, තෙවිදු බමුණෝ ස්ත්‍රීපරිග්‍රහ ඇත්තෝ ද, නො හොත් ස්ත්‍රීපරිග්‍රහ නැත්තෝ ද?"

[වාසෙට්ඨ:] "ස්ත්‍රීපරිග්‍රහය ඇත්තෝ ය, භවද් ගෞතමයිනි."

[භාග්‍යවත්හු:] "සවෛර සිතැත්තෝ ද, නො හොත් අවෛර සිතැත්තෝ ද?"

[වාසෙට්ඨ:] "සවෛර සිතැත්තෝ ය."

[භාග්‍යවත්හු:] "සව්‍යාබාධ සිතැත්තෝ ද, නො හොත් අව්‍යාබාධ සිතැත්තෝ ද?"

[වාසෙට්ඨ:] "සව්‍යාබාධ සිතැත්තෝ ය, භවද් ගෞතමයිනි."

[භාග්‍යවත්හු:] "කිලිටි සිතැත්තෝ ද, නො හොත් නොකිලිටි සිතැත්තෝ ද?"

[වාසෙට්ඨ:] "කිලිටි සිතැත්තෝ ය, භවද් ගෞතමයිනි"

[භාග්‍යවත්හු:] "වශවර්ති ද නො හොත් අවශවර්ති ද?"

[වාසෙට්ඨ:] "අවශවර්ති හ, භවද්ගෞතමයිනි."

33. [භාග්‍යවත්හු:] "වාසෙට්ඨය, මෙසේ තෙවිජ්ජ බ්‍රාහ්මණයෝ ස්ත්‍රී-පරිග්‍රහසහිතයෝ ය, බ්‍රහ්මයා ස්ත්‍රීපරිග්‍රහරහිත ය. ස්ත්‍රීපරිග්‍රහසහිත වූ තෙවිදු බමුණන්ගේ ස්ත්‍රීපරිග්‍රහරහිත බඹහු හා සැසැඳීමෙක් වේ ද? ගැළැපීමෙක් වේ ද?."

[වාසෙට්ඨ:] "මෙය නො වේ ම ය, භවද් ගෞතමයිනි."

[භාග්‍යවත්හු:] "මැනැව වාසෙට්ඨය, ස්ත්‍රීපරිග්‍රහසහිත තෙවිදු බමුණෝ කාලුත් මරණින් මතු ස්ත්‍රීපරිග්‍රහරහිත බඹහු හා එක් වන ඛවට පැමිණියෝ වන්නාහ'යන මේ කාරණය නැත්තෙ ය (නො විය හැක්කෙකි).

34. [භාග්‍යවත්හු:] "වාසෙට්ඨය, මෙසේ තෙවිදු බමුණෝ වෛරී සිතැත්තෝ ය. බඹා අවෛර සිතැත්තේ ය. වෛරී සිතැති තෙවිදු බමුණන්ගේ අවෛර සිතැති බඹහු හා සැසැඳෙන ඛවෙක් වේ ද? ගැළැපෙන ඛවෙක් වේ ද?

[වාසෙට්ඨ:] "මෙය නො වේ ම ය, භවද් ගෞතමයිනි."

[භාග්‍යවත්හු:] මැනැව, වාසෙට්ඨය. ඒ සවෛර සිතැති තෙවිදු බමුණෝ කාලුත් මරණින් මතු අවෛර සිතැති බඹහු හා එක් වන ඛවට පැමිණියෝ වන්නාහ' යන මේ කාරණය නැත්තෙ ය (නො විය හැක්කෙකි).

35. ඉති කිර වාසෙට්ඨ සව්‍යාපජ්ඣචිත්තා තෙවිජ්ජා බ්‍රාහ්මණා, අව්‍යාපජ්ඣචිත්තා බ්‍රහ්මා. අපි නු ඛො සව්‍යාපජ්ඣචිත්තානං තෙවිජ්ජානං බ්‍රාහ්මණානං අව්‍යාපජ්ඣචිත්තෙන බ්‍රහ්මුනා සද්ධිං සංසන්දති සමෙති?" ති.

"තො හිදං හො ගොතම."

සාධු වාසෙට්ඨ. තෙ වත වාසෙට්ඨ සව්‍යාපජ්ඣචිත්තා තෙවිජ්ජා බ්‍රාහ්මණා කායස්ස භෙදා පරම්මරණා අව්‍යාපජ්ඣචිත්තස්ස බ්‍රහ්මුනො සහව්‍යතං උපගා භවිස්සන්තීති නෙතං ඨානං විජ්ජති.

36. ඉති කිර වාසෙට්ඨ සංකිලිට්ඨචිත්තා තෙවිජ්ජා බ්‍රාහ්මණා, අසංකිලිට්ඨචිත්තො බ්‍රහ්මා. අපි නු ඛො සංකිලිට්ඨචිත්තානං තෙවිජ්ජානං බ්‍රාහ්මණානං අසංකිලිට්ඨචිත්තෙන බ්‍රහ්මුනා සද්ධිං සංසන්දති සමෙති?" ති.

"තො හිදං හො ගොතම."

සාධු වාසෙට්ඨ. තෙ වත වාසෙට්ඨ සංකිලිට්ඨචිත්තා තෙවිජ්ජා බ්‍රාහ්මණා කායස්ස භෙදා පරම්මරණා අසංකිලිට්ඨචිත්තස්ස බ්‍රහ්මුනො සහව්‍යතං උපගා භවිස්සන්තීති නෙතං ඨානං විජ්ජති.

37. ඉති කිර වාසෙට්ඨ අවසවත්තී තෙවිජ්ජා බ්‍රාහ්මණා, වසවත්තී බ්‍රහ්මා. අපි නු ඛො අවසවත්තීනං තෙවිජ්ජානං බ්‍රාහ්මණානං වසවත්තිනා බ්‍රහ්මුනා සද්ධිං සංසන්දති සමෙති?' ති.

"තො හිදං හො ගොතම".

සාධු වාසෙට්ඨ. තෙ වත වාසෙට්ඨ අවසවත්තී තෙවිජ්ජා බ්‍රාහ්මණා කායස්ස භෙදා පරම්මරණා වසවත්තිස්ස බ්‍රහ්මුනො සහව්‍යතං උපගා භවිස්සන්තීති නෙතං ඨානං විජ්ජති.

ඉධ ඛො පන තෙ වාසෙට්ඨ තෙවිජ්ජා බ්‍රාහ්මණා ආසීදිත්වා සංසීදන්ති, සංසීදිත්වා විසෘදං වා පාපුණන්ති. සුක්ඛතරණං[1] මඤ්ඤෙ පතරන්ති. තස්මා ඉදං තෙවිජ්ජානං බ්‍රාහ්මණානං තෙවිජ්ජං[2] ඉරණන්ති'පි[3] වුච්චති. තෙවිජ්ජං විපිනන්ති'පි වුච්චති. තෙවිජ්ජං ව්‍යසනන්ති'පි වුච්චති"ති.

38. එවං වුත්තෙ වාසෙට්ඨො මාණවො භගවන්තං එතදවොච: "සුතං මෙ තං හො ගොතම, සමණො ගොතමො බ්‍රහ්මුනො සහව්‍යතාය මග්ගං ජානාතී"ති.

තං කිම්මඤ්ඤසි වාසෙට්ඨ ආසන්නා ඉතො මනසාකටං, තතිතො දූරෙ මනසාකටන්ති?"

"එවං හො ගොතම. ආසන්නා ඉතො මනසාකටං. තතිතො දූරෙ මනසාකටන්ති."

---

1. සුක්ඛතරං, කොසුම්. 2. තෙවිජ්ජං, බහුසු. 3. ඊරණං, දීඝවිසෙ.

35. [භාග්‍යවත්හු:] වාසෙට්ඨය, මෙසේ තෙවිදු බමුණෝ සව්‍යාබාධ සිත් ඇත්තෝ ය. බ්‍රහ්මයා ව්‍යාබාධ රහිත සිතැත්තේ ය. ව්‍යාබාධ සහිත සිතැති තෙවිදු බමුණන්ගේ අව්‍යාබාධ සිතැති බ්‍රහ්මයා හා සැසැඳීමෙක් වේ ද, ගැළපීමෙක් වේ ද?

[වාසෙට්ඨ:] "මෙය නො වේ ම ය, භවද් ගෞතමයිනි."

[භාග්‍යවත්හු:] මැනැව, වාසෙට්ඨය. සව්‍යාබාධ සිතැති ඒ තෙවිදු බමුණෝ කාබුත් මරණින් මතු ව්‍යාබාධරහිත සිතැති බඹහුගේ සහභාවයට පැමිණියෝ වත්නාහ යන මේ කරුණ අවිද්‍යමාන ය.

36. වාසෙට්ඨය, මෙසේ ඒ තෙවිදු බමුණෝ කිලිටි සිතැතියෝ ය. බ්‍රහ්මයා නොකිලිටි සිතැත්තේ ය. කිලිටි සිතැති තෙවිදු බමුණන්ගේ නොකිලිටි සිතැති බ්‍රහ්මයා සමග සැසැඳෙන ගැළැපෙන බවෙක් වේ ද?"

[වාසෙට්ඨ:] "මෙය නො වේ ම ය, භවද් ගෞතමයිනි."

[භාග්‍යවත්හු:] මැනැව, වාසෙට්ඨය. ඒ කිලිටි සිතැති තෙවිදු බමුණෝ කාබුත් මරණින් මතු නො කිලිටි සිතැති බඹහුගේ සහභාවයට පැමිණියෝ වත්නාහ යන මේ කරුණ අවිද්‍යමාන ය. (නො වන්නෙකි).

37. "වාසෙට්ඨය, මෙසේ තෙවිදු බමුණෝ අවශවර්තීහු ය. බ්‍රහ්මයා වශවර්ති ය. අවශවර්ති තෙවිදු බමුණන්ගේ වශවර්ති බ්‍රහ්මයා හා සැසැඳීමෙක් වේ ද ගැළැපීමෙක් (සම බවෙක්) වේ ද?"

[වාසෙට්ඨ:] "මෙය නො වේ ම ය, භවද් ගෞතමයිනි."

[භාග්‍යවත්හු:] වාසෙට්ඨය, මැනැව. වාසෙට්ඨය, අවශවර්ති වූ ඒ තෙවිදු බමුණෝ කාබුත් මරණින් මතු වශවර්ති වූ බඹහු හා එකීභාවයට පැමිණියෝ වත්නාහ යන මේ කරුණ අවිද්‍යමාන ය (නො වන්නෙකි).

වාසෙට්ඨය, මෙහි වනාහි තෙවිදු බමුණෝ (මඟැ සි වරදවා ගෙන) නොමඟට පැමිණ (මඩෙහි සේ) එහි ගැලෙත්. ගැලී නො නොඉවැසියැ හැකි දුකට හෝ පැමිණෙත්. වියැලි නදියෙක අත් පා ගසමින් පිහිනනවුන් සේ වෙහෙසෙත්. එහෙයින් තෙවිදු බමුණන්ගේ මේ ත්‍රිවිද්‍යාව මහ අරණෙකැ යි ද කියනු ලැබේ. මේ ත්‍රිවිද්‍යාව මහ වනයෙකැ යි ද කියනු ලැබේ. මේ ත්‍රිවිද්‍යාව විපතෙකැ යි ද කියනු ලැබේ.

38. මෙසේ වදාළ කල්හි, වාසෙට්ඨ මාණව තෙම "භවද් ගෞතමයිනි, ශ්‍රමණ ගෞතමයන් වහන්සේ බ්‍රහ්මයා හා එකීභාවයට මඟ දන්නා සේකැ යි මෙය මා විසින් අසන ලදැ"යි කී ය.

[භාග්‍යවත්හු:] "වාසෙට්ඨය, ඒ කිමැයි සිතහි ද, මනසාකටය මෙයට සමීප තන්හි වේ ද? මනසාකටය මෙයින් නොදුරු ම වේ ද?

[වාසෙට්ඨ:] "එසේ ය, භවද් ගෞතමයිනි, මනසාකටය මෙයට සමීප තන්හි ය. මනසාකටය මෙයින් දුරු නො වේ."

39. තං කිම්මඤ්ඤසි වාසෙට්ඨ, ඉධස්ස පුරිසො මනුස්සකටෙ ජාතවද්ධො, තමේනං මනුස්සකටතො තාවදෙව අවිසටං මනුස්සකටස්ස මග්ගං පුච්ඡෙය්‍යුං, සියා නු ඛො වාසෙට්ඨ තස්ස පුරිසස්ස මනුස්සකටෙ ජාතවද්ධස්ස මනුස්සකටස්ස මග්ගං පුට්ඨස්ස දන්ධායිතත්තං වා විත්ථායිතත්තං වා?ති.

"නො හිදං භො ගොතම. තං කිස්ස හෙතු? අපි හි භො ගොතම පුරිසො මනුස්සකටෙ ජාතවද්ධො. තස්ස සබ්බානෙව මනුස්සකටස්ස මග්ගානි සුවිදිතානි" ති

40. "සියා ඛො වාසෙට්ඨ තස්ස පුරිසස්ස මනුස්සකටෙ ජාතවද්ධස්ස මනුස්සකටස්ස මග්ගං පුට්ඨස්ස දන්ධායිතත්තං වා විත්ථායිතත්තං වා, තත්‍රෙව තථාගතස්ස බ්‍රහ්මලොකෙ වා බ්‍රහ්මලොකගාමිනියා වා පටිපදාය පුට්ඨස්ස දන්ධායිතත්තං වා විත්ථායිතත්තං වා. බ්‍රහ්මානඤ්චාහං වාසෙට්ඨ පජානාමි බ්‍රහ්මලොකඤ්ච බ්‍රහ්මලොකගාමිනිඤ්ච පටිපදං. යථාපටිපන්නො බ්‍රහ්ම-ලොකං උපපන්නො, තඤ්චපජානාමි" ති.

41. එවං වුත්තෙ වාසෙට්ඨො මාණවො භගවන්තං එතදවොච: "සුතං මෙතං භො ගොතම 'සමණො ගොතමො බ්‍රහ්මුනො සහව්‍යතාය මග්ගං දෙසෙතී'ති. සාධු නො භවං ගොතමො බ්‍රහ්මුනො සහව්‍යතාය මග්ගං දෙසෙතු. උල්ලුම්පතු භවං ගොතමො බ්‍රාහ්මණිං පජ්"ජනති.

"තෙන හි වාසෙට්ඨ සුණාහි. සාධුකං මනසිකරොහි. භාසිස්සාමි"ති.

'එවං භො'ති ඛො වාසෙට්ඨො මාණවො භගවතො පච්චස්සොසි. භගවා එතදවොච:

42. ඉධ වාසෙට්ඨ තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්ම-සම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිස-දම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා. සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං, සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරි-පුණ්ණං පරිසුද්ධං, බ්‍රහ්මචරියං පකාසෙති.

39. වාසෙට්ඨය, එය කිමැයි සිතහි ද, මෙහි මනඃසාකටයෙහි උපන් මනඃසාකටයෙහි වැඩුණු පුරුෂයෙක් වේ නම්, එ කෙණෙහි ම එසින් නික්මුණු ඔහු අතින් මනඃසාකටයට මඟ විචාරන්නාහු නම්, වාසෙට්ඨය, මනඃසාකටයෙහි උපන්, එහි ම වැඩුණු, මනඃසාකටයට මඟ විචාරනු ලැබූ ඔහුගේ (සැකයෙන් සිතසිතා) කල් යවන බවෙක් හෝ (උත්තර දිය නොහැකි බැවින් වන) කයැ තද බවෙක් හෝ වන්නේ ද.?

[වාසෙට්ඨ:] "මෙය නො වේ ම ය, භවද් ගෞතමයිනි. ඒ කවර හෙයින? භවද් ගෞතමයිනි, ඒ පුරිස් තෙම මනඃසාකටයෙහි උපන්නේ ද වැඩුණේ ද වේ. ඔහුට මනඃසාකටයෙහි සියලු මාර්ගයෝ ඉතා ප්‍රකටයහ. එහයිනි."

40. [භාග්‍යවත්හු:] "වාසෙට්ඨය, මනඃසාකටයෙහි උපන්නා වූ ද, වැඩුණා වූ ද, එසේ මඟ විචාරන ලද එ පුරිස්හට උත්තර දීමට කල් යවන බවක් හෝ උත්තර දිය නොහැකි ව කයැ තද බවක් හෝ වනත්, බඹ-ලොවෙහි (බඹලොව ඇරැඹැ) හෝ බඹලොවට යන මඟෙහි (මඟ ඇරැඹැ) හෝ ප්‍රශ්න කරනු ලැබූ තථාගතයන්ගේ උත්තර දීමට කල් යවන බවෙක් හෝ (ප්‍රශ්නයෙන්) කයැ තද බවෙක් හෝ නො වේ ම ය. වාසෙට්ඨය, මම බඹහු ද බඹ ලොව ද බඹලෝ යන පිළිවෙත ද දනිමි. යම්සේ පිළිපන්නේ බඹලොවට උපපත්ති වශයෙන් පැමිණියේ නම් ඔහු ද දනිමි."

41. මෙසේ වදාළ කලැ වාසෙට්ඨ මාණව තෙම "භවද් ගෞතමයිනි, ශ්‍රමණගෞතමයන් වහන්සේ බ්‍රහ්මයා හා එකීභාවයට මඟ දෙසන සේකැ යි මෙය මා විසින් අසන ලද ය. යළිඳු කරමි. භවද් ගෞතමයන් වහන්සේ අපට බ්‍රහ්මසහභාවය පිණිස මඟ දෙසන සේක් වා. භවද් ගෞතමයන් වහන්සේ බඹුණුදරැ වූ මා අවාමඟින් ඔසොවා බඹලෝමඟැ පිහිටුවන සේක් වා."

[භාග්‍යවත්හු:] "වාසෙට්ඨය, එසේ වී නම් අසව. මොනොවට මෙනෙහි කරව. කියන්නෙමි"

'භවත්නි, එසේ යැ' යි වාසෙට්ඨ මාණව තෙම භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වී. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

42. වාසෙට්ඨය, මෙහි අර්හත් වූ සම්‍යක්සම්බුද්ධ වූ විද්‍යාචරණ-සම්පන්න වූ සුගත වූ ලෝකවිත් වූ තිරුත්තර පුරුෂදම්‍යසාරථි වූ දෙව්-මිනිස්තට ශාස්තා වූ බුද්ධ වූ භගවත් වූ තථාගත තෙමේ ලොවැ පහළ වෙයි. හේ දෙවියන් සහිත වූ මරුන් සහිත වූ බඹුන් සහිත වූ මේ ලොකය ද, මහණබමුණන් සහිත සම්මත දෙවියන් (රජුන්) හා සෙසු මිනිසුන් හා සහිත සත්‍යවප්‍රජාව ද තෙමේ විශිෂ්ට ඥානයින් දැන, ප්‍රත්‍යක්ෂ කොට, (ඔවුනට) අවබෝධ කරවයි හේ දහම් දෙසනුයේ ආදියෙහි භද්‍රක (නිවරද) කොට, මධ්‍යයෙහි භද්‍රක කොට, අවසානැ භද්‍රක කොට, අර්ථ සහිත කොට, ව්‍යඤ්ජන සහිත කොට, සර්වප්‍රකාරයෙන් පරිපූර්ණ කොට, පරිශුද්ධ කොට දහම් දෙසයි. (එසේ දෙසනුයේ ශික්ෂාත්‍රයයෙන් සංගෘහීත වූ) ශාසනබ්‍රහ්මචර්‍යය ප්‍රකාශ කෙරෙයි.

43. තං ධම්මං සුණාති ගහපති වා ගහපතිපුත්තො වා අඤ්ඤතරස්මිං වා කුලෙ පච්චාජාතො. සො තං ධම්මං සුත්වා තථාගතෙ සද්ධං පටිලභති. සො තෙන සද්ධාපටිලාභෙන සමන්නාගතො ඉති පටිසංචික්ඛති: "සම්බාධො ඝරාවාසො රජාපථො.[1] අබ්භොකාසො පබ්බජ්ජා. නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා ඒකන්තපරිපුණ්ණං ඒකන්තපරිසුද්ධං සඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං. යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය"න්ති.

44. සො අපරෙන සමයෙන අප්පං වා භොගක්ඛන්ධං පහාය මහන්තං වා භොගක්ඛන්ධං පහාය අප්පං වා ඤාතිපරිවට්ටං පහාය මහන්තං වා ඤාතිපරිවට්ටං පහාය කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජති. සො එවං පබ්බජිතො සමානො පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො, අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී. සමාදාය සික්ඛති සික්ඛාපදෙසු, කායකම්මෙන සමන්නාගතො කුසලෙන, පරිසුද්ධාජීවො, සීලසම්පන්නො, ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො, භොජනෙ මත්තඤ්ඤූ, සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො, සන්තුට්ඨො.

45. කථඤ්ච වාසෙට්ඨ භික්ඛු සීලසම්පන්නො හොති? ඉධ වාසෙට්ඨ භික්ඛු පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති. නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණභූතහිතානුකම්පී විහරති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං. අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො හොති. දින්නාදායී දින්නපාටිකඞ්ඛී අථෙනෙන සුචිභූතෙන අත්තනා විහරති. ඉදම්පි' ස්ස හොති සීලස්මිං. අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී හොති ආරාචාරී[2] විරතො මෙථුනා ගාමධම්මා. ඉදම්පි'ස්ස හොති සීලස්මිං. මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො හොති සච්චවාදී සච්චසන්ධො ථෙතො[3] පච්චයිකො අවිසංවාදකො ලොකස්ස. ඉදම්පි'ස්ස හොති සීලස්මිං. පිසුණං වාචං පහාය පිසුණාය වාචාය පටිවිරතො හොති: ඉතො සුත්වා න අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය, අමුත්‍ර වා සුත්වා න ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය. ඉති භින්නානං වා සන්ධාතා, සංහිතානං වා අනුප්පදාතා, සමග්ගාරාමො සමග්ගරතො සමග්ගනන්දී සමග්ගකරණිං වාචං භාසිතා හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

---

1. රජොපථො, කත්ථචි. 2. අසාචාරී, මජ්ඣං.
3. ථෙතො, සයං. 4. පෙමනියා, මජ්ඣං.

43. ගෘහපතියෙක් හෝ ගෘහපිපුතෙක් හෝ අන් එක්තරා කුලයෙක උපන්නෙක් හෝ ඒ ධර්මය අසයි. හේ ඒ දහම් අසා තථාගත බුදුරජ්හු කෙරෙහි සැදැහැ ඇති කෙරෙයි. හේ ඒ ශ්‍රද්ධාලාභයෙන් සමන්විත වූයේ, "ගිහිගෙයි විසීම සම්බාධයෙකි, රජස්පථයෙකි, පැවිද්ද (සම්බාධ නැති) අභ්‍යවකාශය (එළිමහන) වැන්න. ගිහිගෙයි වසන්නහු විසින් එකාන්තයෙන් පිරිසිදු කොට, ශඛලිඛිතයක් සේ කොට මේ බඹසර සරන්නට පහසු නො වේ. (එබැවින්) මම කෙහෙරවුලු බහවා, කසාවත් හැඳ පෙරෙවා, ගිහිගෙන් පැවිදිබිමට වදනෙම් නම් යෙහෙකැ"යි මෙසේ නුවණින් සලකයි.

44. හේ පසු කලෙක අල්ප වූ හෝ සම්පත් රැස හැරැ, මහත් වූ හෝ සම්පත් රැස හැරැ, මඳ වූ හෝ නැපිරිස හැරැ, මහත් වූ හෝ නැපිරිස හැරැ, කෙහෙරවුලු බහවා, කසාවත් හැඳ පෙරෙවා, ගිහිගෙන් පැවිදිබිමට වදී. හේ මෙසේ පැවිදි වූයේ ම පාතිමෝක්ඛසංවරයෙන් සමන්විත වූයේ, ආචාරයෙන් හා ගොචරයෙන් හා යුක්ත වූයේ, සුළුපමාත්‍ර වූ ද වරදෙහි භය දක්නා සුලුව වාසය කෙරෙයි. කෙවැරැදි වූ කායවාක්කර්මයෙන් සමන්විත වූයේ, එහෙයින් ම පිරිසිදු ආජීව ඇතියේ, සිල්වත් වූයේ, ඉන්ද්‍රියයන්හි වැසූ දොර ඇතියේ, බොජ්ජන්හි පමණ දන්නේ, (සත් තන්හි) සිහියෙන් හා නුවණින් හා යුක්ත වූයේ, සිවුපසයෙහි තුන් වැදැරැම් සතුටින් සතුටු වූයේ, ශික්ෂාපදයන්හි සම්දන් වැ ගෙන ශික්මෙයි.

45. වාසෙට්ඨය, මහණ තෙමේ කෙසේ නම් සිල්වත් වේ ද යත්: වාසෙට්ඨය, මෙහි මහණ තෙමේ ප්‍රාණඝාතය හැරැලා ප්‍රාණඝාතයෙන් වෙසෙයින් වැළැක්කේ වෙයි. බහා තැබූ දඬුමුගුරු ඇත්තේ (දඬුමුගුරු නො දරන්නේ), බහා තැබූ ආයුධ ඇත්තේ (ආයුධ නො දරන්නේ), පවට පිළිකුල් කරන්නේ, මෛත්‍රියට පැමිණියේ (මෛත්‍රියෙන් යුක්ත වූයේ), සියලු සතුන් කෙරෙහි හිතානුකම්පා ඇති වැ වෙසේ. මේ ද ඔහුගේ ශීලයෙක් වේ. හේ අදත්තාදානය හැරැ ලා නොදුන් දෑ ගැන්මෙන් වැළැක්කේ වෙයි. දුන් දෑය ම පිළිගන්නාසුලු වූයේ, දුන් දෑය ම කැමැති වැ ඉවසනසුලු වූයේ, තොසොර වූ පිරිසිදු සිතින් සුතු වැ වෙසේ. මේ ද ඔහුගේ ශීලයෙක් වේ. හේ අබ්‍රහ්මචරිය දුරැ ලා බඹසර සරන්නේ වෙයි. ගැමිදහමක් වූ මෙවුන්දමින් දුරැ වැ හැසිරෙන්නේ, එයින් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ. හේ බොරු කීම දුරැ ලා බොරු කීමෙන් වැළැක්කේ වෙයි. ඇත්ත කියනසුලු වූයේ, ඇත්තෙන් ඇත්ත ගළපා කියන්නේ, තහවුරු වැ පිහිටි කථා ඇත්තේ, ඇදහිය යුතු කථා ඇත්තේ, ලොව නො රවටන්නේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ. හේ කේලාම් කීම දුරැ ලා කේලාම් කීමෙන් වැළැක්කේ වේ: මේ තැනින් අසා මොවුන් (ඔවුන්ගෙන්) බිඳුවනු පිණිස එතන්හි නො කියනසුලු වූයේ, එ තැනින් අසා ඔවුන් (මොවුන්ගෙන්) බිඳුවනු පිණිස මෙ තන්හි නො කියනසුලු වූයේ, මෙසේ බිඳුණවුන් ගළපන්නේ (සමග කරන්නේ) ද, එකට ගැළැපුණවුන් (සමගියට පැමිණියවුන්) හට රුකුල් දෙන්නේ ද වෙයි. සමගියෙන් සිටින්නවුන් හා වාසය කැමැත්තේ, සමගියෙන් වසන්නවුනට කැමැත්තේ, සමග වැ සිටින්නවුනට සතුටු වනුගේ, සමගිය ඇති කරන බස් කියන්නේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

එරුසං වාචං පහාය එරුසාය වාචාය පටිවිරතො හොති. යා සා වාචා නෙලා කණ්ණසුඛා පෙමනීයා හදයඞ්ගමා පෞරී බහුජනකන්තා බහුජනමනාපා, තථාරූපිං[1] වාචං භාසිතා හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං. සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතො හොති කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී. නිධානවතිං වාචං භාසිතා හොති කාලෙන සාපදෙසං පරියන්තවතිං අත්ථසංහිතං. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

46. බීජගාමභූතගාමසමාරම්භා පටිවිරතො හොති. එකභත්තිකො හොති රත්තූපරතො පටිවිරතො විකාලභොජනා. නච්චගීතවාදිතවිසූක-දස්සනා පටිවිරතො හොති. මාලාගන්ධවිලෙපනධාරණමණ්ඩනවිභූසනට්ඨානා පටිවිරතො හොති. උච්චාසයනමහාසයනා පටිවිරතො හොති. ජාතරූප-රජතපටිග්ගහණා පටිවිරතො හොති. ආමකධඤ්ඤපටිග්ගහණා පටිවිරතො හොති. ආමකමංසපටිග්ගහණා පටිවිරතො හොති. ඉත්ථිකුමාරිකපටිග්ගහණා පටිවිරතො හොති. දාසිදාසපටිග්ගහණා පටිවිරතො හොති. අජෙළක-පටිග්ගහණා පටිවිරතො හොති. කුක්කුටසූකරපටිග්ගහණා පටිවිරතො හොති. හත්ථිගවාස්සවළවාපටිග්ගහණා පටිවිරතො හොති. ඛෙත්තවත්ථු-පටිග්ගහණා පටිවිරතො හොති. දූතෙය්‍යපහිණගමනානුයොගා පටිවිරතො හොති. කයවික්කයා පටිවිරතො හොති. තුලාකූටකංසකූටමානකූටා පටි-විරතො හොති. උක්කොටනවඤ්චනනිකතිසාචියොගා පටිවිරතො හොති. ඡේදනවධබන්ධනවිපරාමොසආලොපසහසාකාරා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

47. යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං බීජගාමභූතගාමසමාරම්භං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: මූලබීජං ඛන්ධබීජං ඵලුබීජං අග්ගබීජං බීජබීජමෙව පඤ්චමං. ඉති වා ඉති එවරූපා බීජගාමභූතගාමසමාරම්භා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

---

1. එවරූපිං, කත්ථචි

හේ රළු කිණුම් දුරු ලා රළු බස් දෙඩුවමෙන් වැළැක්වෙක් වෙයි නිදොස්, කන්කලු, පෙම් උපදවන, පහසුවෙන් සිතැ වැදගන්නා, නොගැඹි, බොහෝ දෙනාට ප්‍රිය, බොහෝ දෙනාගේ මන වඩන යම් බසෙක් වේ ද, එබඳු වූ බස් කියන්නේ වෙයි. මේ ද ඔහුගේ සීලයෙක් වේ. හේ බොල් හිස් දෙඩැවිලි හැරලා බොල් දෙඩැවිල්ලෙන් වැළැක්කේ වෙයි. සුදුසු කාලවේලායෙහි කථා කරනසුලු වූයේ, ඇත්ත ම කියනසුලු වූයේ, වැඩ සලසන බසක් ම කියනසුලු වූයේ, තව ලොවුතුරුදහම් ඇසුරු කොට ම කියනසුලු වූයේ, හික්මීම ඇති කරන බසක් ම කියනසුලු වූයේ, සිතැ තබා ගන්නට සුදුසු වූ, කරුණු සහිත වූ, ඉමක් කොනක් ඇති (ප්‍රමාණවත් වූ), දෙලෝ වැඩ හා සම්බඳ වූ ම බසක් සුදුසු කාලයෙහි කියන්නේ වෙයි. මේ ද ඔහුගේ සීලයෙක් වේ.

46 හේ බීජසමූහ (පැළ වන දෑ) ද, භූතසමූහ (පැළ වුණු දෑ) ද සිඳීමෙන් කිඳීමෙන් වැළැක්කේ වෙයි. රෑ බොජුනෙන් වැළැක්කේ, එක් වේලේ වළඳන බත් ඇත්තේ, නොකල්බොජුනෙන් වැළැක්කේ වෙයි. නටනු ගනු වයනු විසුළුදසුන් යන මෙයින් වැළැක්කේ වෙයි. ඇඟැ අඹු නැන් පිරැවීමට, ඇඟ සැරැසීමට කරුණු වන මල්ගඳවිලෙවුන් දැරීමෙන් වැළැක්කේ වෙයි. පමණ ඉක්මි උසසුන් ද, නොකැප වූ මහඅසුන් ද යන දෙකින් ම වැළැක්කේ වෙයි. රන් රිදී මසු කහවණු පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. අමු ධාන්‍ය පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. අමු මස් පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. ස්ත්‍රීන් කුමාරිකාවන් පිළි-ගැන්මෙන් වැළැක්කේ වෙයි. දාසිදාසන් පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. එළුවන් බැටළුවන් පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. කුකුළන් හූරන් පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. ඇතුන් අසුන් වෙළෙඹුන් ගෙරින් පිළිගැන්මෙන් වැළැක්කේ වෙයි. කෙත්වතු පිළිගැන්මෙන් වැළැක්වෙක් වෙයි. කිහියතට දූත මෙහෙවර කිරීමෙහි ද ගෙන් ගෙට පණිවුඩ පණිත් ගෙන යැමෙහි ද යෙදීමෙන් වැළැක්වෙක් වෙයි. වෙළෙඳ ගනුදෙනුයෙන් වැළැක්කේ වෙයි. හොරතරාදියෙන් කිරුමෙන්, බොරු රන් පැමෙන්, හොර මිනුම්වලින් මිනුමෙන් වැළැක්කේ වෙයි. අල්ලස් ගෙන හිමියන් නොහිමි කිරීමෙන්, තාතා උපායයෙන් අනුන් රැවැටීමෙන්, අගතා දූයට හුරු නොඅගතා දූයක් පෙන්නා කරන මායායෙන්, මෙ කී නොකී හැම කෙරුවික කම්වලින් ම වැළැක්කේ වෙයි. අත් පා ආදිය සිඳීමෙන් ද, මැරීමෙන් ද, රැහැන් ආදියෙන් බැඳීමෙන් ද, සැහැසිකම් කිරීමෙන් ද වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ සීලයෙක් වෙයි.

47. යම්සේ සමිහර භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, මූලවිජ ද (හිඟුරු ආදි පැළ වන මුල් ද), සකඛ්‍ධ විජ ද (කුඟ ආදි පැළ වන කඳ ද), පරුවිජ ද (උක් උණ බට ආදි පැළ වන පුරුක් ද), අග්‍රවිජ ද (ඉරිවේරිය ආදි පැළ වන දලු ද), පස් වනු විජවිජ ද (වී ආදි පැළ වන ඇට ද) යන මෙ කී විජසමූහ ද (පැළ වන දෑ ද) භූතසමූහ ද (පැළ වුණු දෑ ද) පෙළීමෙහි (කිඳුම් කිඳුම් කැළුම් යැ සි) කියන ලද සමාරම්භයෙහි යෙදුණෝ වෙසෙත් ද, හෙ තෙමේ මේ හෝ මෙ බඳු වූ විජ-ග්‍රාමභූතග්‍රාමසමාරම්භයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ සීලයෙක් වේ

48. යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං සන්නිධිකාරපරිභොගං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: අන්නසන්නිධිං පානසන්නිධිං වත්ථසන්නිධිං යානසන්නිධිං සයනසන්නිධිං ගන්ධසන්නිධිං ආමිසසන්නිධිං. ඉති වා ඉති එවරූපා සන්නිධිකාරපරිභොගා පටිවිරතො භොති. ඉදම්පි'ස්ස භොති සීලස්මිං.

49. යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විසූකදස්සනං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: නච්චං ගීතං වාදිතං පෙක්ඛං අක්ඛානං පාණිස්සරං වෙතාලං කුම්භථූනං සොභනකං චණ්ඩාලං වංසං ධොපනකං හත්ථියුද්ධං අස්සයුද්ධං මහිසයුද්ධං උසභයුද්ධං අජයුද්ධං මෙණ්ඩයුද්ධං කුක්කුටයුද්ධං වට්ටකයුද්ධං දණ්ඩයුද්ධං මුට්ඨියුද්ධං නිබ්බුද්ධං උය්‍යොධිකං බලග්ගං සෙනාබ්‍යූහං අනීකදස්සනං. ඉති වා ඉති එවරූපා විසූකදස්සනා පටිවිරතො භොති ඉදම්පි'ස්ස භොති සීලස්මිං.

50. යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං ජූතප්පමාදට්ඨානානුයොගං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: අට්ඨපදං දසපදං ආකාසං පරිහාරපථං සන්තිකං ඛලිකං ඝටිකං සලාකහත්थං අක්ඛං පඩගච්චරං වඩකං මොක්ඛචිකං චිඞ්ගුලකං පත්තාළ්හකං රථකං ධනුකං අක්ඛරිකං මනෙසිකං යථාවජ්ජං. ඉති වා ඉති එවරූපා ජූතප්පමාදට්ඨානානුයොගා පටිවිරතො භොති. ඉදම්පි'ස්ස භොති සීලස්මිං.

51. යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං උච්චාසයනමහාසයනං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: ආසන්දිං පල්ලඞ්කං ගොනකං චිත්තකං පටිකං පටලිකං තූලිකං විකතිකං උද්දලොමිං එකන්තලොමිං කට්ඨිස්සං කොසෙය්‍යං කුත්තකං හත්थත්थරං අස්සත්थරං රථත්थරං අජිනප්පවෙණිං කදලිමිගපවර-පච්චත්थරණං සඋත්තරච්ඡදං උභතොලොහිතකූපධානං. ඉති වා ඉති එවරූපා උච්චාසයනමහාසයනා පටිවිරතො භොති. ඉදම්පි'ස්ස භොති සීලස්මිං.

48 යම්සේ ඇතැම් භවත් මහණබමුණු කෙනෙක් සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, කත දැ රැස් කොට තබා ගැන්ම, බොන දැ රැස් කොට තබා ගැන්ම, වස්ත්‍ර රැස් කොට තබා ගැන්ම, (රිය ගැල් ආදිය ද පාවහන් ආදිය ද යන) යාන රැස් කොට තබා ගැන්ම, ඉඟනැ කී දැ හැර (තවත් තල සහල් ආ වුව මනා) පසය රැස් කොට තබා ගැන්ම යන මෙසේ වූ සන්නිධිකාරපරිභෝගයෙහි (පසය රැස් කොට තබා ගෙන වැළැඳීමෙහි) යෙදී වෙසෙන් ද, හෙ තෙමේ මේ හෝ මෙබඳු වූ හෝ සන්නිධිකාර පරිභෝගයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

49. යම්සේ සමහර භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, නැටුම් ගැයුම් වැයුම්, නටසමජ්ජා (නළුවන් සමූහයක් එක් වැ ජනාසමූහයා ඉදිරියේ දක්වන නැටුම්), ආඛ්‍යාන (මහාභාරතාදිය කීම හෝ ඇසීම), පාණිසවර (අතින් ලොහොබෙර ගැසුම හෝ අත්තල ගැසුම), වේතාල (දඬුමුවා තාලම්පට ගැසීම හෝ මතුරු දපා මළසිරුරු නැඟිටුවීම), කුම්භථූන (සිවුරස් බෙර වැයුම), සොභනක (රංගබලිකරණය හෙවත් රඟමඩුල්ලෙහි දී දෙවතාවනට සෙනෙත්‍ර වශයෙන් නෘත්‍යගීත ගායනය හෝ ප්‍රතිභානචිත්‍ර කිරීම), සණදෙවුන් කෙළිය (හෝ අයොගුඩක්‍රීඩාව), උණගස් ඔසොවා ගෙන කරන ක්‍රීඩාව, අසිඩාවනය (මළවුන්ගේ ඇට නෝද සුවඳ කවා තබා තකන්සෙමෙහි ඒ වටා සිට උත්සව කිරීම), ඇත්පොර, අස්පොර, මියුපොර, ගොන්පොර, එළුපොර, බැවෙළුපොර, කුකුළුපොර, වටුපොර, පොළුහරඹ, මිටුසුද, මල්ලපොර, සුද පවන්නා තැන් දක්නට ගැම්, බලසෙන් ගණිනා තැන් දක්නට ගැම් යන මෙබඳු විසුළු දස්නෙහි යෙදී වෙසෙන් ද, හෙ තෙමේ මේ හෝ මේ බඳු වූ විසුළු දස්නෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ

50. යම්සේ සමහර භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, අවපාකෙළිය, දසපාකෙළිය, අඨස්දූකෙළිය, මඬුලු පැනුම, සන්නිකාක්‍රීඩාව, දදුකෙළිය, කල්ලි ගැසුම, සලාඅත්කෙළිය, ගුළකෙළිය, කොළතලා පිඹුම, කෙළිතඹුලින් හැම, කරණම් ගැසුම, කන්තංගුරුවා කෙළිය, කොළනැළියෙන් වැලි ඇ මැනුම, ක්‍රීඩාරථ පැදවීම, කුඩා දුන්නෙන් විදීම, ඇකිරිකෙළිය (පිළේ හෝ අහසේ අකුරු ඇඳ ඒ කියැවීම), සිතු දැය කීමේ ක්‍රීඩාව, විකලාංගානුකරණය (කඳුන් කොරුන් යන ආදීන් සේ ඉරියවු පැවැත්වීම) යන මෙබඳු වූ පමාවට කරුණු වූ දූකෙළියෙහි යෙදී වෙසෙන් ද, හෙ තෙමේ මේ හෝ මෙ බඳු වූ පමාවට කරුණු වූ දූකෙළියෙහි යෙදීමෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

51. යම්සේ ඇතැම් භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, දික්ඝඝළා පුටු ය, පළඟය, මහඝොදුපලඟය, වියමනෙන් විසිතුරු කළ එළුලොම්මුවා ඇතිරිය, එළුලොම්මුවා සුදු ඇතිරිය, ගතමල් යෙදූ එළුලොම් ඇතිරිය, තිලිය (පුලුන් මෙත්තය), සිංහරුපාදි රූපවලින් විසිතුරු කළ එළුලොම් ඇතිරිය, දෙපැත්තේ ම ලොම් ඇති එළුලොම්මුවා ඇතිරිය, එක් පැත්තේ පමණක් ලොම් ඇති එළුලොම්මුවා ඇතිරිය, රත්කසුකම් කළ පසතුරුණ, කොසෙය්‍ය හුයින් විසූ ඇතිරිය, ඇතු පිට එළන ඇතිරිය, අසු පිටැ එළන ඇතිරිය, රියැ එළන ඇතිරිය, ඇදව සරි ලන සේ අඳුන් දිවිසමින් මසා කළ ඇතිරිය, කෙහෙල්මුවසමින් කළ මහඟු පසතුරුණ, ඉස්දෙර පාමුල රත්කන්වයින් තබා ඇති රතු උඩුවියන් සහිත මහඟු යහන යන මෙබඳු වූ උස්යහන් මහයහන් පරිහරණය කිරීමෙහි යෙදී වෙසෙද්ද, හෙ තෙමේ මේ හෝ මෙ බඳු වූ උස්යහන් මහයහන් පරිභෝගයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

52. යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං මණ්ඩනවිභූසනට්ඨානානුයොගං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: උච්ඡාදනං පරිමද්දනං නහාපනං සම්බාහනං ආදාසං අඤ්ජනං මාලාවිලෙපනං මුඛචූණ්ණකං මුඛලෙපනං හත්ථබන්ධං සිඛාබන්ධං දණ්ඩකං නාළිකං ඛග්ගං ඡත්තං චිත්‍රූපාහනං උණ්හීසං මණිං වාලවීජනිං ඔදාතානි වත්ථානි දීඝදසානි. ඉති වා ඉති එවරූපා මණ්ඩනවිභූසනට්ඨානානු-යොගා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

53. යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං තිරච්ඡානකථං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: රාජකථං චොරකථං මහාමත්තකථං සෙනාකථං භයකථං යුද්ධකථං අන්නකථං පානකථං වත්ථකථං සයනකථං මාලාකථං ගන්ධකථං ඤාතිකථං යානකථං ගාමකථං නිගමකථං නගරකථං ජනපදකථං ඉත්ථි-කථං පුරිසකථං [කුමාරකථං කුමාරිකථං] සූරකථං විසිඛාකථං කුම්භට්ඨාන-කථං පුබ්බපෙතකථං නානත්තකථං ලොකක්ඛායිකං සමුද්දක්ඛායිකං ඉතිභවාභවකථං. ඉති වා ඉති එවරූපාය තිරච්ඡානකථාය පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

54. යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විග්ගාහිකකථං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි. අහං ඉමං ධම්මවිනයං ආජානාමි. කිං ත්වං ඉමං ධම්මවිනයං ආජානිස්සසි? මිච්ඡාපටිපන්නො ත්වමසි. අහමස්මි සම්මාපටිපන්නො. සහිතං මෙ, අසහිතං තෙ. පුරෙ වචනීයං පච්ඡා අවච. පච්ඡා වචනීයං පුරෙ අවච. ආචිණ්ණං තෙ විපරාවත්තං. ආරොපිතො තෙ වාදො, නිග්ගහීතො ත්වමසි චර වාදප්පමොක්ඛාය. නිබ්බෙඨෙහි වා සචෙ පහොසි. ඉති වා ඉති එවරූපාය විග්ගාහිකකථාය පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

55. යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං දූතෙය්‍යපහිණගමනානුයොගමනුයුත්තා විහරන්ති, සෙය්‍යථිදං: රාජූනං රාජමහාමත්තානං ඛත්තියානං බ්‍රාහ්මණානං ගහපතිකානං කුමාරානං "ඉධ ගච්ඡ අමුත්‍රාගච්ඡ. ඉදං හර. අමුත්‍ර ඉදං ආහරා"ති. ඉති වා ඉති එවරූපා දූතෙය්‍යපහිණගමනානුයොගා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

52. යම්සේ ඇතැම් භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, සුවඳසුණුගෙන් ඇඟ ඉලීම, අත්පාඇඟි මනා සටහන් ගන්වනුවට තෙල් ගා මැඩීම, සුවඳ දියෙන් නැවීම, උරහිස්ඇඟි මස් වැඹෙනුවට මුගුරින් තැළීම, කැඩපතින් මුහුණ බැලීම, අලංකාර වශයෙන් අඳුන් ගැම, මල් පැලැඳීම හා විලෙවුන් දැරීම, මුවසුණු මුව-පිළෙවුන් දැරීම, හස්තාභරණ දැරීම, හිසැ කුඩුම්බිය බැඳීම, විසිතුරු සරයපි දැරීම, විසිතුරු බෙහෙත්තළ දැරීම, කඩු දැරීම, විසිතුරු කුඩ දැරීම, විසිතුරු පාවහන් දැරීම, නලල්පට බැඳීම, සිළුමිණ පැලැඳීම, විසිතුරු සෙමෙර වල්විදුනා දැරීම, දික් දවලු ඇති සුදු රෙදි හැඳීම යන ආදි ඇඟ අඩු තැන් පිරුවීමටත් ඇඟ සැරැසීමටත් කරුණු වන දෑ පරිභෝග කිරීමෙහි යෙදී වෙසෙත් ද, ඒ මහණ තෙමේ මේ හෝ මේ බඳු දෑ පරිභෝග කිරීමෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ සීලයෙක් වේ.

53. යම්සේ වනාහි ඇතැම් භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, රාජකථා චෝරකථා මහාමාත්‍යකථා සෙනාකථා භයකථා යුද්ධකථා ආහාරකථා පානකථා වස්ත්‍රකථා ශයනකථා මාලාකථා ගන්ධකථා ඥාතිකථා යානකථා ග්‍රාමකථා නිගමකථා නගරකථා ජනපදකථා ස්ත්‍රීකථා පුරුෂකථා [කුමාරකථා කුමාරිකථා] ශූරකථා විශිකථා කුම්භට්ඨානකථා තාතාත්වකථා ලෝකාඛ්‍යායිකා කථා සමුද්‍රාඛ්‍යායිකාකථා ඉතිභවාභවකථා යන මෙබඳු වූ තිරශ්චීන කථාවන්හි යෙදී වෙසෙත් ද, ඒ මහණ තෙමේ මෙ කී හෝ මෙයින් අන්‍ය වූ හෝ මෙ බඳු කථාවලින් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ සීලයෙක් වේ.

54. යම්සේ ඇතැම් භවත් මහණ බමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, "තෝ මේ දහම් විනය නො දනිහි. මම මේ දහම් විනය දනිමි. මේ දහම් විනය කිමැ යි තෝ දනිහි ද? තෝ වරදවා පිළිපන්නෙහි. මම මැනැවින් පිළිපන්නෙමි වෙමි. මා බස කරුණු සහිත ය. තා බස කරුණු රහිත ය. තෝ පළමුයෙන් කියැ යුත්ත පසු වැ කීයෙහි ය. පසු වැ කියැ යුත්ත පළමුයෙන් කීයෙහි ය. තා කලක් ම පුහුණු කළ දය මාගේ එක් වචනයෙන් ම පෙරැළී ගියේ ය. මා විසින් තව දොස් නැගිණ. මා විසින් නිගන්තා ලද්දෙහි. මා තැඟ දෙසින් මිදෙන්නව හැකිරෙව (ඒ ඒ තැන ගොස් උගනුව). හැකි නම් එය පිහදව" යන ආදීන් මෙබඳු වූ උනුන් බැණ දොඩා ගැනුම්හි යෙදෙත් ද, ඒ මහණ තෙමේ මෙ කී හෝ අන් මෙබඳු වූ හෝ බැණ දොඩා ගැන්මෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ සීලයෙක් වේ.

55. යම්සේ සමහර භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ "මෙහි යන්නැ. අසෝ තැනට එන්නැ. මෙය ගෙනැ යන්නැ අසෝ තැනට මෙය ගෙනෙන්නැ"යි කළ නියෝග පිළිගෙන, රජුන්ගේ රජමහඇමැතියන්ගේ ක්ෂත්‍රියයන්ගේ බමුණන්ගේ ගෘහපතියන්ගේ රජ-කුමරුවන්ගේ මෙ බඳු දූත මෙහෙවරෙහි, පණිවුඩ ගෙන යෑමෙහි යෙදී වෙසෙත් ද, ඒ මහණ තෙමේ මෙ කී හෝ අන් මෙ වැනි වූ හෝ දූත මෙහෙවරින්, පණිවුඩ ගෙන යෑමෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ සීලයෙක් වේ.

56. යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ කුහකා ච හොන්ති ලපකා ච නෙමිත්තිකා ච නිප්පෙසිකා ච ලාභෙන ච ලාභං නිජිගිංසිතාරො. ඉති වා ඉති එවරූපා කුහනලපනා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

57. යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථිදං: අඞ්ගං නිමිත්තං උප්පාතං සුපිනං ලක්ඛණං මූසිකවස්සිතං අග්ගිහොමං දබ්බිහොමං ථුසහොමං තණ්ඩුලහොමං සප්පිහොමං තෙලහොමං මුඛහොමං ලොහිතහොමං අඞ්ගවිජ්ජා වත්ථුවිජ්ජා ඛත්තවිජ්ජා සිවවිජ්ජා භූතවිජ්ජා භූරිවිජ්ජා අහිවිජ්ජා විසවිජ්ජා විච්ඡිකවිජ්ජා මූසිකවිජ්ජා සාකුණවිජ්ජා වායසවිජ්ජා පක්කජ්ඣානං සරපරිත්තානං මිගචක්කං. ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

58. යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථිදං: මණිලක්ඛණං වත්ථලක්ඛණං දණ්ඩලක්ඛණං අසිලක්ඛණං උසුලක්ඛණං ධනුලක්ඛණං ආවුධලක්ඛණං ඉත්ථිලක්ඛණං පුරිසලක්ඛණං කුමාරලක්ඛණං කුමාරිලක්ඛණං දාසලක්ඛණං දාසිලක්ඛණං හත්ථිලක්ඛණං අස්සලක්ඛණං මහිංසලක්ඛණං උසභලක්ඛණං ගොලක්ඛණං අජලක්ඛණං මෙණ්ඩලක්ඛණං කුක්කුටලක්ඛණං වට්ටකලක්ඛණං ගොධාලක්ඛණං කණ්ණිකාලක්ඛණං කච්ඡපලක්ඛණං මිගලක්ඛණං. ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

59. යථා වා පනෙකෙ භොනෙතා සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථිදං: "රඤ්ඤං නියානං භවිස්සති. රඤ්ඤං අනියානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං උපයානං භවිස්සති. බාහිරානං රඤ්ඤං අපයානං භවිස්සති. බාහිරානං රඤ්ඤං උපයානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං අපයානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං ජයො භවිස්සති. බාහිරානං රඤ්ඤං පරාජයො භවිස්සති. බාහිරානං රඤ්ඤං ජයො භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං පරාජයො භවිස්සති. ඉති ඉමස්ස ජයො භවිස්සති. ඉමස්ස පරාජයො භවිස්සති." ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

56. යම්සේ සමහර භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳා, කුහකකම් කරන්නෝ වෙත් ද, ලාභසත්කාර පතා අනුන් සිත් ඇදෙන සේ වූ වාචු ඛස් දෙඛන්නෝ වෙත් ද, සිවු පසය ලබනු සඳහා කයින් හෝ බසින් ඇඟැවීම් කරන්නෝ වෙත් ද, ලාභාපේක්ෂයෙන් අනුනට ගරහන්නෝ වෙත් ද, ලාභයෙන් ලාභය සොයන්නෝ වෙත් ද, ඒ මහණ තෙමේ මේ කී ද මේ බඳු වූ ද කුහනලපනවලින් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ සීලයෙක් වේ.

57 යම්සේ ඇතැම් භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, අංගශාස්ත්‍රය, නිමිත්තශාස්ත්‍රය, උත්පාතලක්ෂණය, සුප්ත-ශාස්ත්‍රය, ලක්ෂණශාස්ත්‍රය, මූෂිකවෘත්තිකත්වය, අග්නිහෝමය, දර්වීහෝමය, තුෂහෝමය, කණහෝමය, තණ්ඩුලහෝමය, සර්පිර්හෝමය, තෛලහෝමය, මුඛහෝමය, ලෝහිතහෝමය, අංගවිද්‍යාව, වාස්තුවිද්‍යාව, ක්ෂත්‍රවිද්‍යාව, ශිවවිද්‍යාව, භූතවිද්‍යාව, භූරිවිද්‍යාව, අහිවිද්‍යාව, විෂවිද්‍යාව, වෘශ්චිකවිද්‍යාව, මූෂකවිද්‍යාව, ශාකුනවිද්‍යාව, වායසවිද්‍යාව, පක්වඛ්‍යානය, ශරපරිත්‍රාණය, මෘගලක්ෂය යන මේ කී හෝ මෙබඳු වූ හෝ තිරශ්චීනවිද්‍යයෙන්, මිථ්‍යාජීවයෙන් දිවි පවත්වන් ද, ඒ මහණ තෙමේ මේ කී ද මේ බඳු වූ ද තිරශ්චීනවිද්‍යයෙන් මිථ්‍යාජීවයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ සීලයෙක් වෙයි.

58. යම්සේ ඇතැම් භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, මණිලක්ෂණ, වස්ත්‍රලක්ෂණ, දණ්ඩලක්ෂණ, කඩ්ගලක්ෂණ, ඊලක්ෂණ, දුකූලලක්ෂණ, අවිලක්ෂණ, ඉසිරිලක්ෂණ, පුරිස්ලක්ෂණ, කුමාරලක්ෂණ, කුමාරිලක්ෂණ, දාස්ලක්ෂණ, දාසිලක්ෂණ, ඇත්ලක්ෂණ, අස්ලක්ෂණ, මිගලක්ෂණ, වෘෂභලක්ෂණ, ගෝලක්ෂණ, එළුලක්ෂණ, බැටෙළුලක්ෂණ, කුක්කුටලක්ෂණ, වට්ටලක්ෂණ, ගෝධලක්ෂණ, කැණිලක්ෂණ, කප්පිලක්ෂණ, මූවිලක්ෂණ යන ආදි මේ බඳු තිරශ්චීන විද්‍යයෙන්, මේ බඳු මිථ්‍යාජීවයෙන් දිවි පවත්වන් ද, ඒ මහණ තෙමේ මේ කී ද මෙබඳු වූ ද තිරශ්චීන විද්‍යයෙන් මිථ්‍යාජීවයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ සීලයෙක් වේ.

59. යම්සේ ඇතැම් පින්වත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, "අසෝ දිනැ අසෝ නැකැතින් (ශුද සඳහා) සිය නුවරින් අසෝ රජුන්ගේ නික්මීම වන්නේ ය. අසෝ නැකැතින් පෙරළා සිය නුවරම ඒම වන්නේ ය. අසෝ නැකැතින් පිටතැ සිටින සතුරු රජුන් හමු වන්නට රම තුළ හුන් රජුන්ගේ යෑම වන්නේ ය. අසෝ නැකැතින් පිටතැ සිටින සතුරු රජුන්ගේ ඉවත් වැ යෑම වන්නේ ය. අසෝ නැකැතින් රට තුළැ සිටින රජුන් කරා පිටතැ සිටින සතුරු රජුන්ගේ පැමිණීම වන්නේ ය. අසෝ නැකැතින් ඇතුළතැ සිටින රජුන්ගේ ඉවත් වැ යෑම වන්නේ ය. රට ඇතුළතැ සිටින රජුනට ජය වන්නේ ය. පිටතැ සිටින සතුරු රජුනම පරාජය වන්නේ ය. පිටතැ සිටින සතුරු රජුනට ජය වන්නේ ය. රම තුළැ සිටින රජුනට පරාජය වන්නේ යැ" යි මෙසේ 'මෙහුට ජය වන්නේ ය. මෙහුම පරාජය වන්නේ යැ' යි කියමින් මෙ බඳු වූ තිරශ්චීනවිද්‍යයෙන්, මේ බඳු වූ මිථ්‍යාජීවයෙන් දිවි පවත්වන් ද, ඒ මහණ තෙමේ මේ හෝ මේ බඳු වූ තිරශ්චීනවිද්‍යයෙන්, මිථ්‍යාජීවයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ සීලයෙක් වේ.

60. යථා වා පනෙකෙ මහාමත්තා සමණබ්‍රාහ්මණෙ සද්ධාදෙය්‍යානි හොජ්ජානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථිදං: "චන්දග්ගාහො භවිස්සති. සූරියග්ගාහො භවිස්සති. තක්ඛත්තග්ගාහො භවිස්සති, චන්දිමසූරියානං පථගමනං භවිස්සති. චන්දිමසූරියානං උපපථගමනං භවිස්සති. තක්ඛත්තානං පථගමනං භවිස්සති. තක්ඛත්තානං උපපථගමනං භවිස්සති. උක්කාපාතො භවිස්සති. දිසාඩාහො භවිස්සති. භූමිචාලො භවිස්සති. දෙවදුන්දුභි භවිස්සති. චන්දිම-සූරියනක්ඛත්තානං උග්ගමනං ඔගමනං සංකිලෙසං වොදානං භවිස්සති. එවංවිපාකො චන්දග්ගාහො භවිස්සති. එවංවිපාකො සූරියග්ගාහො භවිස්සති. එවංවිපාකං චන්දිමසූරියානං පථගමනං භවිස්සති. එවංවිපාකං චන්දිමසූරියානං උපපථගමනං භවිස්සති. එවංවිපාකං තක්ඛත්තානං පථගමනං භවිස්සති. එවංවිපාකං තක්ඛත්තානං උපපථගමනං භවිස්සති. එවංවිපාකො උක්කා-පාතො භවිස්සති. එවංවිපාකො දිසාඩාහො භවිස්සති. එවංවිපාකො භූමිචාලො භවිස්සති. එවංවිපාකො දෙවදුන්දුභි භවිස්සති. එවංවිපාකං චන්දිමසූරිය-තක්ඛත්තානං උග්ගමනං ඔගමනං සඞ්කිලෙසං වොදානං භවිස්සති". ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

61. යථා වා පනෙකෙ මහාමත්තා සමණබ්‍රාහ්මණෙ සද්ධාදෙය්‍යානි හොජ්ජානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථිදං: "සුභික්ඛකං භවිස්සති. දුබ්භික්ඛකං භවිස්සති. සුභික්ඛං භවිස්සති. දුබ්භික්ඛං භවිස්සති. ඛෙමං භවිස්සති. භයං භවිස්සති. රොගො භවිස්සති. අරොගත්තං භවිස්සති. මුද්දා ගණනා සංඛානං කාමෙය්‍යං ලොකායතං". ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

62. යථා වා පනෙකෙ මහාමත්තා සමණබ්‍රාහ්මණෙ සද්ධාදෙය්‍යානි හොජ්ජානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථිදං: ආවාහනං විවාහනං සංවදනං විවදනං සංකිරණං විකිරණං සුභගකරණං දුබ්භගකරණං විරුද්ධගබ්භකරණං ජිව්හානිජ්ජොහනං හනුසංහනනං හත්ථාභිජ්ජපනං හනුජ්ජපනං කණ්ණ-ජ්ජපනං ආදාසපඤ්හං කුමාරිපඤ්හං දෙවපඤ්හං ආදිච්චුපට්ඨානං මහතු-පට්ඨානං අග්ගිහුජ්ජනං සිරිව්හායනං. ඉති වා ඉති එවරූපාය තිරච්ඡාන-විජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

60. යම්සේ වනාහි ඇතැම් භවත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, "අසෝ දිනැ චන්ද්‍රග්‍රහණය වන්නේ ය. අසෝ දිනැ සූර්‍යග්‍රහණය වන්නේ ය. අසෝ දිනැ සඳ හිරු දෙදෙනා තිසි මඟින් යැම වන්නේ ය. අසෝ දිනැ ඔවුන් නොමඟින් යැම වන්නේ ය. අසෝ දිනැ නක්ෂත්‍රයන් තිසිමඟින් යැම වන්නේ ය. අසෝ දිනැ ඔවුන් නොමඟින් යැම වන්නේ ය. අසෝ දිනැ උල්කාපතනය වන්නේ ය. දිග්දහය වන්නේ ය. භූමිකම්පනය වන්නේ ය. වැසි නැති වැ අහස් ගෙරැවුම් වන්නේ ය. සඳහිරුන්ගේ ද නක්ෂත්‍රයන්ගේ ද උදාව බැසීම කෙලෙසීම පිරිසිදුබව වන්නේ ය. චන්ද්‍රග්‍රහණය ලොවට මෙබඳු පල ගෙනැ දෙන්නේ ය. සූර්‍යග්‍රහණය මෙබඳු පල ගෙනැ දෙන්නේ ය. නක්ෂත්‍රග්‍රහණය මෙබඳු පල ගෙනැ දෙන්නේ ය. සඳ හිරුන් තිසි මඟින් යැම මෙබඳු පල ගෙනැ දෙන්නේ ය. සඳ හිරුන් දෙදෙනාගේ නොමඟින් යැම මෙ බඳු පල ගෙනැ දෙන්නේ ය. නක්ෂත්‍රයන්ගේ පථගමනය මෙබඳු පල ගෙනැ දෙන්නේ ය. ඔවුන්ගේ උත්පථගමනය මෙ බඳු පල ගෙනැ දෙන්නේ ය. උල්කාපතනය මෙ බඳු පල ගෙනැ දෙන්නේ ය. දිග්දහය මෙ බඳු පල ගෙනැ දෙන්නේ ය. භූමිකම්පනය මෙබඳු පල ගෙනැ දෙන්නේ ය. වැසි නැති වැ අහස්ගෙරැවුම මෙබඳු පල දෙන්නේ ය. සඳහිරුන්ගේ ද නක්ෂත්‍රයන්ගේ ද උදාවත් බැසීමත් කෙලෙසීමත් පිරිසිදු වීමත් මෙ බඳු පල දෙන්නේ යැ" යි කියතුවෝ, මෙ බඳු තිරශ්චීනවිද්‍යයෙන්, මෙ බඳු මිථ්‍යාජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ තෙමේ මෙ හෝ මෙ බඳු වූ තිරශ්චීනවිද්‍යයෙන්, මිථ්‍යාජීවයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

61. යම්සේ ඇතැම් පින්වත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, "මෙ සමයෙහි වැසි වස්නේ ය. මෙ සමයෙහි නියං වන්නේ ය. මෙ සමයෙහි රට සුභික්ෂ වන්නේ ය. මෙ සමයෙහි රට දුර්භික්ෂ වන්නේ ය. මෙ සමයෙහි රටට උවදුරු වන්නේ ය. මෙ සමයෙහි රටට භය වන්නේ ය. මෙ කලැ රෝග වන්නේ ය. මෙ කලැ රෝග නැති බව වන්නේ යැ" යි පලාපල කීම ද, මුද්‍රාව (ඇඟිලි පුරැක්ඟි සංඥ තබා ගිණීම) ද, ගණනාව (එක දෙක යන ආදීන් ගිණීම) ද, කාව්‍යශාස්ත්‍රය, ලෝකායතශාස්ත්‍රය යන මේ හෝ මෙ බඳු තිරශ්චීන විද්‍යයෙන්, මිථ්‍යාආජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ තෙමේ මෙ හෝ මෙ බඳු වූ තිරශ්චීනවිද්‍යයෙන්, මිථ්‍යාඅජීවයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

62. යම්සේ ඇතැම් පින්වත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, ආවාහ සඳහා නක්ෂත් කීම, විවාහ සඳහා නක්ෂත් කීම, වෙන් වූ අඹුසැමියන් එක් වන්නට නක්ෂත් කීම, අඹුසැමියන් වෙන් වන්නට නක්ෂත් කීම, දුන් ණය රැස් කිරීමට නක්ෂත් කීම, මුදල් ණයට පොලියට දීමට නක්ෂත් කීම, සෞභාග්‍යය ඇති වනුවට යන්ත්‍ර මන්ත්‍රාදිය කර දීම, බිම් පාළු වන්නට හදි හුනියම් කිරීම, නැසෙන්නට යන දරැගබ් රැකෙන්නට පිළියම් කිරීම, දිවගුලු බැඳීම, මන්ත්‍රාදියේ බලයෙන් ඔනු නද කිරීම, අත් පෙරැළෙන්නට මතුරු දැපීම, ඔනු පෙරැළෙන්නට මතුරු දැපීම, කන් අගුලු වැටෙන්නට මතුරු දැපීම, කැඩපතෙහි දෙවතාවෙශය කොට ප්‍රශ්න ඇසීම, කුමරියක ලවා ජෙන කියැවීම, දෙවිදැස්සක ලවා ජෙන කියැවීම, ජීවිකා පිණිස හිරු පිදීම, මහබඹු පිදීම, මතුරු දපා ඹුවින් ගිතිජල් විසිදුවීම, මතුරු දපා සිරිකත කැඳැවීම යන මේ හෝ අන් මෙ බඳු වූ තිරශ්චීන විද්‍යයෙන්, මිථ්‍යාජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ තෙමේ මෙ හෝ මෙ බඳු වූ තිරශ්චීනවිද්‍යයෙන්, මිථ්‍යාජීවයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

63. යථා වා පනෙකෙ භොතො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කපෙන්ති, සෙය්‍යථිදං: සන්තිකම්මං පණිධිකම්මං භූතකම්මං භූරිකම්මං වස්සකම්මං වොස්සකම්මං වත්ථුකම්මං වත්ථුපරිකිරණං ආචමනං නහාපනං ජ්‍රහනං වමනං විරෙචනං උද්ධවිරෙචනං අධොවිරෙචනං සීසවිරෙචනං කණ්ණතෙලං නෙත්තතප්පනං අඤ්ජනං පච්චඤ්ජනං සාලාකියං සල්ලකත්තියං දාරකතිකිච්ඡා මූලභෙසජ්ජානං අනුප්පදානං සීසධිතං පටිමොක්ඛං. ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

64. ස ඛො සො භික්ඛවෙ භික්ඛු එවං සීලසම්පන්නො න කුතොචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතො. සෙය්‍යථාපි භික්ඛවෙ ඛත්තියො මුද්ධාභිසිත්තො නිහතපච්චාමිත්තො න කුතොචි භයං සමනුපස්සති යදිදං පච්චත්තිකතො. එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු එවං සීලසම්පන්නො න කුතොචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතො. සො ඉමිනා අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො අජ්ඣත්තං අනවජ්ජසුඛං පටිසංවෙදෙති. එවං ඛො භික්ඛවෙ භික්ඛු සීලසම්පන්නො හොති.

65. කථඤ්ච භික්ඛවෙ භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති? ඉධ භික්ඛවෙ භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති. රක්ඛති චක්ඛුන්ද්‍රියං. චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝාණෙන ගන්ධං ඝායිත්වා- පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති. රක්ඛති මනින්ද්‍රියං. මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සො ඉමිනා අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො අජ්ඣත්තං අබ්‍යාසෙකසුඛං පටිසංවෙදෙති. එවං ඛො භික්ඛවෙ භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති

63. යම්සේ ඇතැම් පින්වත් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳ, ශාන්තිකම්, ප්‍රණීතිකම්, හුරිකම්, පණ්ඩිතයා පිරිමියකු කිරීම, පිරිමියා පණ්ඩිතයකු කිරීම, වාස්තුකම්, වාස්තු පරිකිරණ, මතුරු දපා ඹුව දෙවුම්, මතුරු දපා අනුන් නැවීම, සෙත් පතා ගිනි පිදීම, ගිහියනට වමන කැරැවීම, බඩ විරේක කැරැවීම, ළය විරේකයට බෙහෙත් දීම, වස්ති කිරීම ශීර්ෂවිරේචන බෙහෙත් දීම, කන් ලෙඩට තෙල් පිසැ දීම, ගිහියන් සඳහා ඇස පමලයට හිසිල ගන්වන තෙත්තෙල් පිසීම, ගිහියනට තස්‍ය දීම, කාරම් අඳුන් සාදා දීම, ඇස හිසිල ගන්වන අඳුන් සාදා දීම, ගිහියන්ගේ ඇසැ උල්ඇත ලෙඩට බෙහෙත් කිරීම, ගිහියනට ශල්‍ය කර්ම කිරීම, ළදරුවන්ගේ ලෙඩට පිළියම් කිරීම, මුල් බෙහෙත් දීම (කායවිකිත්සාව) කාරම් බෙහෙත් බැඳ වණ සුව වූ පසු ඒවා ගළවා දැමීම යැ" යි මේ ආදි වූ හෝ මෙබඳු වූ තිරශ්චීනවිද්‍යයෙන්, මිථ්‍යාආජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ තෙමේ මේ හෝ මේ බඳු වූ තිරශ්චීන විද්‍යයෙන්, මිථ්‍යාජීවයෙන් වැළැක්කේ වෙයි. මේ ද මහුගේ සීලයෙක් වේ.

64. වාසෙට්ඨය, ඒ මහණ තෙමේ මෙසේ සීලසම්පන්න වූයේ, සීල-සංවරහෙතුයෙන් කිසි ම එක ද අසංවරතායෙකින් පහළ වියැ හැකි බියක් නො දකී. වාසෙට්ඨය, ක්ෂත්‍රියාභිෂෙකයෙන් අභිෂෙක ලත්, වැනැසූ සතුරන් ඇති ක්ෂත්‍රියයෙක් කිසි ම එක ද සතුරකුගෙන් වියැ හැකි බියක් යම්සේ නො දක්නේ ද, එසේ ම මහණ තෙමේ මේ පරිද්දෙන් සීලසම්පන්න වූයේ, සීලසංවරහෙතුයෙන් කිසි ම එක ද අසංවරයෙකින් වියැ හැකි බියක් නො දකී. හේ මේ ආදී සීලස්කන්ධයෙන් සමන්විත වූයේ සිය සතන්හි නිදොස් වූ කායික චෛතසික සුඛය විඳී. වාසෙට්ඨය, මේසේ මහණ තෙමේ සීලසම්පන්න වේ.

65. වාසෙට්ඨය, මහණ තෙමේ කෙසේ නම් ඉඳුරන්හි වැසූ දොර ඇත්තේ වේ ද යත්: වාසෙට්ඨය, මෙ සත්නෙහි මහණ තෙමේ ඇසින් රූපයක් දැක ශුභාදිවශයෙන් එහි ලකුණු නො ගන්නේ වේ. ශුභාදිවශයෙන් අත්පා ආදි අවයවයන්ගේ ආකාර සිතට නො ගන්නේ වේ. යම් කරුණෙකින් චක්ෂුරින්ද්‍රිය වසා නොගෙන වසන්නහුගේ චිත්තසන්තානය විෂමලෝභ දෞර්මනස් ආදි ලාමක අකුශල සභාවයෝ ලුහුබඳනාහු ද, ඒ චක්ෂුරින්ද්‍රියයාගේ සංවරය පිණිස හේ පිළිපදී. චක්ෂුරින්ද්‍රියය රකී. චක්ෂුරින්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. කනින් හඬ අසා ... නාසයෙන් ගඳ ආඝ්‍රාණය කොට ... දිවෙන් රස ආස්වාදය කොට... කයින් ස්ප්‍රෂ්ටව්‍යය (ඇඟට හැපෙන දෑ) ස්පර්ශ කොට ... සිතින් ධර්මාලම්බන දැක ශුභාදිවශයෙන් එහි ලකුණු ගන්නේ නො වේ. ශුභාදිවශයෙන් ආකාර සිතට ගන්නේ නො වේ. යම් කරුණෙකින් මනඉන්ද්‍රියය සංවර කොට නොගෙන වසන්නහුගේ චිත්තසන්තානය විෂමලෝභ දෞර්මනස් ආදි ලාමක අකුශල සභාවයෝ ලුහුබඳනාහු ද, ඒ මනඉන්ද්‍රියයාගේ සංවරය පිණිස පිළිපදී. ශ්‍රෝත්‍ර ... ඝ්‍රාණ ... ජිහ්වා ... කාය ... මනඉන්ද්‍රියය රකී. එහි සංවරයට පැමිණේ. හේ මේ ආදී වූ ඉන්ද්‍රියසංවරයෙන් සමන්විත වූයේ සිය සතන්හි අව්‍යාසෙකසුඛය (කෙලෙසුන්ගෙන් මිශ්‍ර නොවීමෙන් වූ පිරිසිදු අකිලිෂ්ටසුඛය) විඳී. වාසෙට්ඨය, මෙසේ මහණ තෙමේ ඉන්ද්‍රියයන්හි වැසූ දොර ඇත්තේ වේ.

66. කථඤ්ච වාසෙට්ඨ භික්ඛු සතිසම්පජඤ්ඤේන සමන්නාගතො හොති? ඉධ වාසෙට්ඨ භික්ඛු අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී හොති. ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති. සම්මිඤ්ජිතෙ පසාරිතෙ සම්පජානකාරී හොති. සඞ්ඝාටිපත්තචීවරධාරණෙ සම්පජානකාරී හොති. අසිතෙ පීතෙ ඛායිතෙ සායිතෙ සම්පජානකාරී හොති. උච්චාරපස්සාවකම්මෙ සම්පජානකාරී හොති. ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ සම්පජානකාරී හොති. එවං ඛො වාසෙට්ඨ භික්ඛු සතිසම්පජඤ්ඤේන සමන්නාගතො හොති.

67. කථඤ්ච වාසෙට්ඨ භික්ඛු සන්තුට්ඨො හොති? ඉධ වාසෙට්ඨ භික්ඛු සන්තුට්ඨො හොති කායපරිහාරියෙන චීවරෙන කුච්ඡිපරිහාරියෙන පිණ්ඩපාතෙන. සො යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති. සෙය්‍යථාපි වාසෙට්ඨ පක්ඛී සකුණො යෙන යෙනෙව ඩෙති සපත්තභාරො'ව ඩෙති, එවමෙව ඛො වාසෙට්ඨ භික්ඛු සන්තුට්ඨො හොති කායපරිහාරියෙන චීවරෙන කුච්ඡිපරිහාරියෙන පිණ්ඩපාතෙන. සො යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති. එවං ඛො වාසෙට්ඨ භික්ඛු සන්තුට්ඨො හොති.

68. සො ඉමිනා ච අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො, ඉමිනා ච අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො, ඉමිනා ච අරියෙන සතිසම්පජඤ්ඤේන සමන්නාගතො, ඉමාය ච අරියාය සන්තුට්ඨියා සමන්නාගතො, විවිත්තං සෙනාසනං භජති අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං. සො පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා.

69. සො අභිජ්ඣං ලොකෙ පහාය විගතාභිජ්ඣෙන චෙතසා විහරති. අභිජ්ඣාය චිත්තං පරිසොධෙති. බ්‍යාපාදපදොසං පහාය අබ්‍යාපන්නචිත්තො විහරති සබ්බපාණභූතහිතානුකම්පී. බ්‍යාපාදපදොසා චිත්තං පරිසොධෙති. ථීනමිද්ධං පහාය විගතථීනමිද්ධො විහරති ආලොකසඤ්ඤී සතො සම්පජානො. ථීනමිද්ධා චිත්තං පරිසොධෙති. උද්ධච්චකුක්කුච්චං පහාය අනුද්ධතො විහරති අජ්ඣත්තං වූපසන්තචිත්තො. උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසොධෙති. විචිකිච්ඡං පහාය තිණ්ණවිචිකිච්ඡො විහරති අකථංකථී කුසලෙසු ධම්මෙසු. විචිකිච්ඡාය චිත්තං පරිසොධෙති.

66. වාසෙට්ඨය, මහණ තෙමේ කෙසේ නම් සම්‍යක්සම්ප්‍රජානතයෙන් (සිහි නුවණින්) සමන්විත වේ ද යත්: වාසෙට්ඨය, මේ සස්නෙහි මහණ තෙමේ ඉදිරියට යෑමෙහි ද පෙරලා ඒමෙහි ද මතා නුවණින් දැන ම (එය) කරනුයේ වෙයි. ඉදිරි බැලීමෙහි, අනුදික් බැලීමෙහි (වට පිට බැලීමෙහි) මතා නුවණින් දැන ම (එය) කරනුයේ වෙයි. අත් පා ආදිය හැකිලීමෙහි, දිගු කිරීමෙහි නුවණින් දැන ම (එය) කරනුයේ වෙයි. සඟලසිවුර ද පාත්‍රය ද සෙසු සිවුරු ද දැරීමෙහි නුවණින් දැන ම කරන්නේ වෙයි. ආහාර ගැන්මෙහි, පෑන් පිමෙහි, පිපිකැවිලි ආදිය කෑමෙහි, මී ආදිය රස විඳීමෙහි නුවණින් දැන ම කරනුයේ වෙයි. මල මුත්‍ර පහ කිරීමෙහි නුවණින් දැන ම කරනුයේ වෙයි. ගමනෙහි සිටීමෙහි ඉඳීමෙහි නිදීමෙහි කථා කිරීමෙහි නොකිණීමෙහි නුවණින් දැන ම කරනුයේ වෙයි. වාසෙට්ඨය, මෙසේ මහණ තෙම සිහිනුවණින් සමන්විත වෙයි.

67. වාසෙට්ඨය, කෙසේ නම් මහණ තෙමේ ලද පමණෙහි සතුටු වේ ද යත්: වාසෙට්ඨය, මේ සස්නෙහි මහණ තෙමේ කායපරිහරණයට ප්‍රමාණ වූ සිවුරින් ද කුක්ෂිපරිහරණයට ප්‍රමාණ වූ ආහාරයෙන් ද සතුටු වෙයි. ගේ යම් යම් තැනකට නික්මෑ යේ ද, අට පිරිකර පමණක් ගෙන ම නික්මෙයි. වාසෙට්ඨය, (පියා හඹනුවට තරම්) අත්තවූ ඇති කුරුලු තෙමේ යම් යම් තැනක ට පියා හඹා යේ නම්, පියාපත් බර සහිත ව ම යම් සේ පියා හඹා ද, එසේ ම ඒ මහණ තෙමේ කායපරිහරණයට ප්‍රමාණ වූ සිවුරින් ද කුක්ෂිපරිහරණයම ප්‍රමාණ වූ ආහාරයෙන් ද සතුටු වෙයි. ගේ යම් යම් තැනකට යේ ද, පා සිවුරු (ආදි අට පිරිකර) රැගෙන ම යෙයි. වාසෙට්ඨය, මෙසේ මහණ තෙමේ ලද පසයෙහි සතුටු වේ.

68. වාසෙට්ඨය, ඒ මහණ තෙමේ මේ ආර්‍ය්‍ය ශීලස්කන්ධයෙන් ද සමන්විත වූයේ, මේ ආර්‍ය්‍ය ඉන්ද්‍රියසංවරයෙන් ද සමන්විත වූයේ, මේ ආර්‍ය්‍ය සමෘතිසම්ප්‍රජානතයෙන් ද සමන්විත වූයේ, මේ ආර්‍ය්‍ය සන්තුෂ්ටියෙන් ද සමන්විත වූයේ, අරණ්‍ය වෘක්ෂමූල පර්වත කඳුරැලි ගිරිගුහා සොහොන් වනපෙත් (වනප්‍රස්ථ) අභ්‍යවකාශ (එළිමහන්) පිදුරුලෙන් යන මේ කී ජනශූන්‍ය කිසි සෙනස්නක් භජනය කෙරෙයි. ගේ පිඬු සෙවීමෙන් පෙරලා ආයේ, පසුබත් සෙමෙහි පලක් බැඳ උඩු කය කෙළින් පිහිටුවා කම්වහනට යොමු කොට සිහි එළවා හිඳී.

69. ගේ ලොවැ (පඤ්ච උපාදානස්කන්ධය කෙරෙහි) ඇල්ම හැර, විෂමලොභණප්‍රහාණයෙන් (යට පත් කිරීමෙන්) පහ වූ අභිජ්ඣායෙන් යුත් සිතින් වෙසෙයි. අභිජ්ඣාව කෙරෙන් සිත පිරිසිදු කෙරෙයි. ව්‍යාපාද ප්‍රදෝෂය (ක්‍රෝධය) හැර, ව්‍යාපාද රහිත සිතැත්තේ, සියලු පණ ඇති සතුන් කෙරේ හිතානුකම්පා ඇති වැ වෙසෙයි. ක්‍රෝධය කෙරෙන් සිත පිරිසිදු කෙරෙයි. ස්ත්‍යානමිද්ධය හැර, පහ වූ ස්ත්‍යානමිද්ධය ඇත්තේ, දව රැ දෙක්හි ම දුටු එළිය හඳුනනු හැකි පිරිසිදු සංඥ ඇත්තේ, සිහියෙනුත් නුවණිනුත් යුක්ත වූයේ වෙසෙයි. ස්ත්‍යානමිද්ධය කෙරෙන් සිත පිරිසිදු කෙරෙයි. උද්ධච්චත් (සිතැ නොසංහුන්බවත්) කුකුච්චත් (කළ නොකළ දෙයෙහි පසුතැවිල්ලත්) සිතින් දුරැ ලා, අනුද්ධත වැ (නොසංහුන් බැවින් තොර වැ), සංහිඳුණු සිතැති ය විහරන්නේය ඇත්තේ, උද්ධච්ච කුකුච්ච දෙක කෙරෙන් සිත පිරිසිදු කෙරෙයි. සැකය දුරැ ලා, පහ වූ සැක ඇත්තේ, කුසල් දහමෙහි සැක නො කරනුයේ, සැකය කෙරෙන් සිත පිරිසිදු කෙරෙයි.

70. සෙය්‍යථාපි වාසෙට්ඨ පුරිසො ඉණං ආදාය කම්මන්තෙ පයොජෙය්‍ය, තස්ස තෙ කම්මන්තා සමිජ්ඣෙය්‍යුං, සො යානි ච පොරාණානි ඉණමූලානි තානි ච ඛ්‍යන්තීකරෙය්‍ය, සියා චස්ස උත්තරිං අවසිට්ඨං දාරභරණාය, තස්ස එවමස්ස: "අහං බො පුබ්බෙ ඉණං ආදාය කම්මන්තෙ පයොජෙසිං. තස්ස මෙ තෙ කම්මන්තා සමිජ්ඣිංසු. සොඃහං යානි ච පොරාණානි ඉණමූලානි තානි ච ඛ්‍යන්තීකාසිං. අත්ථි ච මෙ උත්තරිං අවසිට්ඨං දාරභරණාය"න්ති. සො තතො නිදානං ලභෙථ පාමොජ්ජං, අධිගච්ඡෙය්‍ය සොමනස්සං-

71. සෙය්‍යථාපි වාසෙට්ඨ පුරිසො ආබාධිකො අස්ස දුක්ඛිතො බාළ්හගිලානො, භත්තඤ්ච චස්ස නච්ඡාදෙය්‍ය, න ච්ඡ්‍ස කායෙ බලමත්තා, සො අපරෙන සමයෙන තම්හා ආබාධා මුච්චෙය්‍ය, භත්තඤ්චස්ස ජීරෙය්‍ය, සියා චස්ස කායෙ බලමත්තා, තස්ස එවමස්ස: "අහං බො පුබ්බෙ ආබාධිකො අහොසිං දුක්ඛිතො බාළ්හගිලානො. භත්තඤ්ච මෙ නච්ඡාදෙසි. න ච්ඡ්‍ස මෙ ආසි කායෙ බලමත්තා. සොඃදානි එතරහි තම්හා ආබාධා මුත්තො. භත්තඤ්ච මෙ ජීරෙති. අත්ථි ච මෙ කායෙ බලමත්තා"න්ති. සො තතො නිදානං ලභෙථ පාමොජ්ජං, අධිගච්ඡෙය්‍ය සොමනස්සං-

72. සෙය්‍යථාපි වාසෙට්ඨ පුරිසො බන්ධනාගාරෙ බද්ධො අස්ස, සො අපරෙන සමයෙන තම්හා බන්ධනාගාරා මුච්චෙය්‍ය සොත්ථිනා අභිනිස්සක්කෙය්‍ය, න ච්ඡ්‍ස කිඤ්චි භොගානං වයො, තස්ස එවමස්ස: "අහං බො පුබ්බෙ බන්ධනාගාරෙ බද්ධො අහොසිං. සොඃදානි එතරහි තම්හා බන්ධනාගාරා මුත්තො සොත්ථිනා අභිනිස්සක්කෙය්‍ය. නත්ථි ච මෙ කිඤ්චි භොගානං වයො" න්ති. සො තතො නිදානං ලභෙථ පාමොජ්ජං, අධිගච්ඡෙය්‍ය සොමනස්සං-

73. සෙය්‍යථාපි වාසෙට්ඨ පුරිසො දාසො අස්ස අනත්තාධීනො පරාධීනො න යෙනකාමංගමො, සො අපරෙන සමයෙන තම්හා දාසබ්‍යා මුච්චෙය්‍ය අත්තාධීනො අපරාධීනො භුජිස්සො යෙනකාමංගමො, තස්ස එවමස්ස: "අහං බො පුබ්බෙ දාසො අහොසිං අනත්තාධීනො පරාධීනො න යෙනකාමංගමො. සොඃදානි එතරහි තම්හා දාසබ්‍යා මුත්තො අත්තාධීනො අපරාධීනො භුජිස්සො යෙනකාමංගමො"න්ති. සො තතො නිදානං ලභෙථ පාමොජ්ජං, අධිගච්ඡෙය්‍ය සොමනස්සං-

74. සෙය්‍යථාපි වාසෙට්ඨ පුරිසො සධනො සභොගො කන්තාරද්ධානමග්ගං පටිපජ්ජෙය්‍ය දුබ්භික්ඛං සප්පටිභයං, සො අපරෙන සමයෙන තං කන්තාරං නිත්ථරෙය්‍ය, සොත්ථිනා ගාමන්තං අනුපාපුණෙය්‍ය ඛෙමං අප්පටිභයං, තස්ස එවමස්ස: "අහං බො පුබ්බෙ සධනො සභොගො කන්තාරද්ධානමග්ගං පටිපජ්ජිං දුබ්භික්ඛං සප්පටිභයං. සොඃදානි එතරහි තං කන්තාරං නිත්ථිණ්ණො සොත්ථිනා ගාමන්තං අනුපත්තො ඛෙමං අප්පටිභය"න්ති. සො තතො නිදානං ලභෙථ පාමොජ්ජං, අධිගච්ඡෙය්‍ය සොමනස්සං-

70. වාසෙට්ඨය, යම්සේ පුරුෂයෙක් ණය මුදලක් ගෙන කර්මාන්ත කරන්නේ ද, ඔහුගේ ඒ කර්මාන්ත සමෘද්ධ වන්නේ නම්, හේ යම් පරණ ණය මුදල් වී නම්, ඒ සියල්ල ගෙවා අවසන් කරන්නේ ද, මත්තෙහි ඉතිරි වූ යමක් ඇත් නම්, එය අඹුදරුවන් රක්නා පිණිස වන්නේ ද, එසේ වූ ඔහුට "මම පලමුගෙන් ණයට මුදල් ගෙන කර්මාන්ත කෙළෙමි. ඒ මාගේ කර්මාන්ත සමෘද්ධ විය. ඒ මම යම් පරණ ණය මුදල් වී නම්, එය ගෙවා අවසන් කෙළෙමි. අඹුදරුවන් රක්නට වැඩිපුර ඉතිරි වූ මුදලෙක් ද මට ඇතැ" යි මෙසේ සිතෙක් වන්නේ ද, හේ ඒ ණය නැතිබව කරණ කොට ගෙන සතුට ලබන්නේ ද, සොම්නසට පැමිණෙන්නේ ද-

71. වාසෙට්ඨය, යම් සේ පුරුෂයෙක් රෝගී වූයේ, දුකට පැමිණියේ, දැඩි ලෙස ගිලන් වන්නේ ද, ඔහුට බතුත් නො රිසියෙන්නේ ද, ඔහුගේ ඇඟපත ශක්ති පමණකුත් නො වන්නේ ද, හේ මෑත කාලයෙහි ඒ ආබාධයෙන් මිදෙන්නේ නම්, ඔහුට බතුත් රිසියෙන්නේ නම්, ඔහු ඇඟපත ශක්තිය ද වන්නේ නම්, "මම වූ කලි පෙරැ දුකට පත්, දැඩි ගිලන්බව් ඇති ලෙඩෙක් වීමි. මට අහර ද රිසි නො වී ය. මා ඇඟපත ශක්තිය ද නො වී ය. ඒ මම දැන් ඒ ලෙඩින් මිදුණෙමි වෙමි. ඒ මට අහර ද රිසියෙහි. මා ඇඟපත ශක්තිය ද ඇතැ" යි ඔහුට මෙසේ සිතෙක් වන්නේ නම්, හේ ඒ කරුණින් සතුට ලබන්නේ ද, සොම්නසට පැමිණෙන්නේ ද -

72. වාසෙට්ඨය, යම් සේ පුරුෂයෙක් හිරගෙහි බැඳුණේ වන්නේ ද, හේ පසු කලෙක ධනය වියදම් නො කොට පහසුවෙන් ඒ හිරගෙන් මිදෙන්නේ ද, (ඒ හෙතුයෙන්) ඔහුගේ කිසි භොගවිනාශයෙක් නො වන්නේ ද, "මම වූ කලි පෙරැ හිරගෙහි බැඳුණෙමි වීමි. ඒ මම දැන් ධන වියදම් නො කොට පහසුවෙන් ඒ හිරගෙන් මිදුණෙමි වෙමි. මාගේ භොගයනට කිසි විනාශයෙක් ද නැතැ" යි ඔහුට මෙසේ සිතෙක් වන්නේ ද, හේ ඒ කරුණින් සතුට ලබන්නේ ද, සොම්නසට පැමිණෙන්නේ ද -

73. වාසෙට්ඨය, යම්සේ තමා අයත් පැවැතුම් නැති, අනුන් අයත් පැවැතුම් ඇති, කැමැති අතෙක යන්නට අවසර නැති දස පුරුෂයෙක් වන්නේ ද, හේ මෑත භාගයෙහි තමා අයත් පැවැතුම් ඇතියේ, පරා අයත් පැවැතුම් නැතියේ, නිදහස් වූයේ, කැමැති අතෙක යා හැකි වූයේ, ඒ දාසභාවයෙන් මිදෙන්නේ ද, එසේ වූ ඔහුට "මම වූ කලි පෙරැ තමා අයත් පැවැතුම් නැති, පරා අයත් පැවැතුම් ඇති, කැමැති අතෙක යා නො හැකි දාසයෙක් වීමි. ඒ මම දැන් ඒ දාසභාවයෙන් මිදුණෙමි, තමා අයත් පැවැතුම් ඇතියෙමි, පරා අයත් පැවැතුම් නැතියෙමි, නිදහස් වූයෙමි කැමැති අතෙක යා හැකියෙමි වෙමි" යි මෙසේ සිතෙක් වන්නේ ද, හේ ඒ කරුණින් සතුට ලබන්නේ ද, සොම්නසට පැමිණෙන්නේ ද-

74. වාසෙට්ඨය, යම්සේ ධනවත් වූ භොගසම්පත් ඇති පුරුෂයෙක් දුර්ලභ ආහාර ඇති, උවදුරු ඇති, දිය නැති දික් මඟකට බස්නේ ද, හේ පසු කලෙක සුවසේ ඒ නිරුදක පෙදෙස ඉක්මෑ යන්නේ ද, උවදුරු නැති විපත් නැති ගම්මානයකට බස්නේ ද, එසේ වූ ඔහුට "මම වූ කලි පෙර ධන ඇතියෙමි, භොගසම්පත් ඇතියෙමි, දිය නැති, ආහාරදුර්ලභ, ප්‍රතිභය සහිත දික් මඟකට බවුයෙමි. ඒ මම දැන් සුවසේ ඒ කාන්තාරය තරණය කෙළෙමි. නිරුපද්‍රැත භයරහිත ගමකට පැමිණියෙමි වෙමි"යි සිතෙක් වන්නේ ද, හේ ඒ කරුණින් සතුට ලබන්නේ ද, සොම්නසට පැමිණෙන්නේ ද-

75. එවමේව ඛො වාසෙට්ඨ භික්ඛු යථා ඉණං යථා රොගං යථා බන්ධනාගාරං යථා දාසබ්‍යං යථා කන්තාරද්ධානමග්ගං, එවං ඉමේ පඤ්ච නීවරණෙ අප්පහීණෙ අත්තනි සමනුපස්සති. සෙය්‍යථාපි වාසෙට්ඨ ආනණ්‍යං, යථා ආරොග්‍යං, යථා බන්ධනා මොක්ඛං, යථා භුජිස්සං, යථා ඛෙමන්තභූමිං එවමෙව ඛො වාසෙට්ඨ භික්ඛු ඉමෙ පඤ්ච නීවරණෙ පහීණෙ අත්තනි සමනුපස්සති.

76. තස්සිමෙ පඤ්ච නීවරණෙ පහීණෙ අත්තනි සමනුපස්සතො පාමොජ්ජං ජායති. පමුදිතස්ස පීති ජායති. පීතිමනස්ස කායො පස්සම්භති. පස්සද්ධකායො සුඛං වෙදෙති. සුඛිනො චිත්තං සමාධියති.

77. සො මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති තථා දුතියං තථා තතියං තථා චතුත්ථිං. ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය[1] සබ්බාවන්තං ලොකං මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අව්‍යාපජ්ජෙන ඵරිත්වා විහරති. සෙය්‍යථාපි වාසෙට්ඨ බලවා සඛධමො අප්පකසිරෙනෙව චතුද්දිසං සරෙන විඤ්ඤාපෙය්‍ය, එවමෙව ඛො වාසෙට්ඨ එවං භාවිතාය මෙත්තාය චෙතොවිමුත්තියා යං පමාණකතං කම්මං න තං තත්‍රාවසිස්සති, න තං තත්‍රාවතිට්ඨති. අයම්පි ඛො වාසෙට්ඨ බ්‍රහ්මුනො[2] සහව්‍යතාය මග්ගො.

78. පුන ච පරං වාසෙට්ඨ භික්ඛු කරුණාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති. තථා දුතියං තථා තතියං තථා චතුත්ථිං. ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං කරුණාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අව්‍යාපජ්ජෙන ඵරිත්වා විහරති. සෙය්‍යථාපි වාසෙට්ඨ සඛධමො අප්පකසිරෙනෙව චතුද්දිසං සරෙන විඤ්ඤාපෙය්‍ය, එවමෙව ඛො වාසෙට්ඨ එවං භාවිතාය කරුණාය චෙතොවිමුත්තියා යං පමාණකතං කම්මං න තං තත්‍රාවසිස්සති න තං තත්‍රාවතිට්ඨති. අයම්පි ඛො වාසෙට්ඨ බ්‍රහ්මුනො සහව්‍යතාය මග්ගො.

---

1. සබ්බත්ථතාය. (සොතුළු) 2. බ්‍රහ්මානං P T S.

75. වාසෙට්ඨය, එසේ ම මහණ තෙමේ ණයක් මෙන් ලෙඩක් මෙන් හිරගෙයක් මෙන් වහල්බවක් මෙන් දිය නැති දික්මඟක් මෙන් (පිළිවෙළින්) මේ පඤ්ච නීවරණ පස තමා කෙරෙහි දකී. වාසෙට්ඨය, ණය නැති බව යම්සේ ද, ලෙඩ නැති බව යම්සේ ද, හිරගෙන් මිදුණුබව යම්සේ ද, නිවහල්බව යම්සේ ද, උවදුරු නැති බිම යම්සේ ද, එසේ ම වාසෙට්ඨය, හෙතෙම (පිළිවෙළින්) මේ පඤ්ච වූ නීවරණ පස (හෙවත් නීවරණ පසේ දුරු වීම) තමා කෙරෙහි දකී.

76. තමා කෙරෙහි පහ වූ මේ නීවරණ පස දක්නා ඔහුට සතුට උපදී. සතුටු වූවහුට ප්‍රීතිය උපදී. සිතැ ප්‍රීතිය ඇත්තහුගේ කායය සංකිඳේ. සංහුන් කාය ඇත්තේ සුව විඳී. සුවැතියහු සිත සමාධිගත වේ (එකඟ වේ).

77. හේ මෛත්‍රීසහගත සිතින් එක් දිශාවක් පැතිරී ගෙන (අරබුණු කොට) වෙසෙයි. එසේ දෙවෙනි දිශාව ද, තෙවෙනි දිශාව ද, සිවුවන දිශාව ද පැතිරී ගෙන වෙසෙයි. එසේ ම උඩ දෙස ද, යට දෙස ද, සරස දැසි මෙහැම තැන ම සර්වාත්මතායෙන් (සියල්ල තමා හා සමතයෙන්) සර්වත් (සියලු සතුන් ඇති) ලෝක විපුල වූ ප්‍රමාණරහිත වූ වෛරරහිත වූ නිදුක් මෛත්‍රී සහගත සිතින් පැතිරී ගෙන වෙසෙයි. වාසෙට්ඨය, යම්සේ කාබලැති සක්පිඹින්නෙක් පහසුවෙන් ම (සිය) සක්හඬින් සිවුදිගුන් හඟවන්නේ ද (සිවු දිග ම සක්හඬ පතුරුවන්නේ ද), එපරිද්දෙන් ම වාසෙට්ඨය, මෙසේ (අප්‍රමාණ ව)වඩනා ලද මෛත්‍රීචිත්තවිමුක්ති කරණකොට ගෙන, ප්‍රමාණ පිසින් කරන ලද යම් කර්මයෙක් (හෙවත් යම් කාමාවචර මෛත්‍රී කර්මයෙක්) ඇත් නම්, එය එහි අවශිෂ්ට (ඉතිරි) නො වේ. (ඒ මහද්ගතකර්ම අතරැ ලැග ගත්තව කාමාවචර කර්ම සමත් නො වේ.) එය එහි ඒ මහද්ගත කර්මය මැඩ ගෙන ද නො සිටී (කාමාවචරකර්ම ඒ මහද්ගතකර්ම විපාක මැඩ තමනට ඉඩ ගන්නට ද සමත් නොවෙයි). වාසෙට්ඨය, මේ මෛත්‍රී චිත්ත විමුක්තිය ද බඹහුගේ සහභාවයට මඟ ය.

78. තව ද අනෙකක් කියමි. වාසෙට්ඨය, මහණ තෙම කරුණා සහගත සිතින් එක් දෙසක් පැතිරී ගෙන වෙසේ, එසේ දෙවෙනි දෙස ද, එසේ තෙවෙනි දෙස ද, එසේ සිවුවන දෙස ද පැතිරී ගෙන වෙසේ. මෙසේ උඩ දෙස ද යට දෙස ද සරස ද සි මෙහැම තැන ම සියල්ල තමා හා සමතයෙන් සියලු සතුන් ඇති ලෝක (සියලු සත්ලොව) විපුල වූ මහද්ගත වූ ප්‍රමාණරහිත වූ වෛරරහිත වූ නිදුක් වූ කරුණාසහගත සිතින් පැතිරී ගෙන වෙසෙයි. වාසෙට්ඨය, යම්සේ කාබලැයි සක්පිඹින්නෙක් පහසුවෙන් ම සිය සක්හඬින් සිවුදිගුන් හඟවන්නේ ද (සක්හඬින් සිවුදිග ම සක්හඬ පතුරවන්නේ ද,) එ පරිද්දෙන් ම වාසෙට්ඨය, මෙසේ වඩනා ලද කරුණාචිත්තවිමුක්තිය හෙතු කොට ගෙන, ප්‍රමිත වූ (කාමාවචර වූ) යම් කර්මයෙක් ඇත් නම් එය එහි අතරැ ඉතිරි වී නො රැඳේ. එය එහි ඒ මහද්ගතකර්මය මැඩ ගෙන ද නො සිටී. වාසෙට්ඨය, මේ කරුණාචිත්තවිමුක්තිය ද බ්‍රහ්මසහභාවයට මඟ වේ.

79. පුන ච පරං වාසෙට්ඨ භික්ඛු මුදිතාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති තථා දුතියං තථා තතියං තථා චතුත්ථිං. ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං මුදිතාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අව්‍යාපජ්ජෙන ඵරිත්වා විහරති. සෙය්‍යථාපි වාසෙට්ඨ බලවා සඛධමෙ අප්පකසිරෙනෙව චාතුද්දිසං විඤ්ඤාපෙය්‍ය, එවමෙව ඛො වාසෙට්ඨ එවං භාවිතාය මුදිතාය චෙතො-විමුත්තියා යං පමාණකතං කම්මං න තං තත්‍රාවසිස්සති. න තං තත්‍රාවතිට්ඨති. අයම්පි ඛො වාසෙට්ඨ බ්‍රහ්මුනො සහව්‍යතාය මග්ගො.

80. පුන ච පරං වාසෙට්ඨ භික්ඛු උපෙක්ඛාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති තථා දුතියං තථා තතියං තථා චතුත්ථිං. ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං උපෙක්ඛාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අව්‍යාපජ්ජෙන ඵරිත්වා විහරති. සෙය්‍යථාපි වාසෙට්ඨ බලවා සඛධමෙ අප්පකසිරෙනෙව චාතුද්දිසං, විඤ්ඤාපෙය්‍ය එවමෙව, ඛො වාසෙට්ඨ එවං භාවිතාය උපෙක්ඛාය චෙතොවිමුත්තියා යං පමාණකතං කම්මං න තං තත්‍රාවසිස්සති. න තං තත්‍රාවතිට්ඨති. අයම්පි ඛො වාසෙට්ඨ බ්‍රහ්මුනො සහව්‍යතාය මග්ගො.

81. තං කිං මඤ්ඤසි වාසෙට්ඨ? එවංවිහාරී භික්ඛු සපරිග්ගහො වා අපරිග්ගහො වා?ති.

"අපරිග්ගහො හො ගොතම."

"සවෙරචිත්තො වා අවෙරචිත්තො වා?"ති.

"අවෙරචිත්තො හො ගොතම."

"සබ්‍යාපජ්ඣ චිත්තො වා අබ්‍යාපජ්ඣචිත්තො වා?ති.

"අබ්‍යාපජ්ඣ චිත්තො හො ගොතම."

"සංකිලිට්ඨචිත්තො වා අසංකිලිට්ඨචිත්තො වා?"ති.

"අසංකිලිට්ඨචිත්තො හො ගොතම."

"වසවත්තී වා අවසවත්තී වා?"ති.

"වසවත්තී හො ගොතම."

82. ඉති කිර වාසෙට්ඨ අපරිග්ගහො භික්ඛු. අපරිග්ගහො බ්‍රහ්මා. අපි නු ඛො අපරිග්ගහස්ස භික්ඛුනො අපරිග්ගහෙන බ්‍රහ්මුනා සද්ධිං සංසන්දති සමෙති?"ති.

"එවං හො ගොතම."

79. තව ද අනෙකක් කියම්. වාසෙට්ඨය, මහණ තෙම මුදිතාසහගත සිතින් එක් දෙසක් පැතිර ගෙන වෙසෙයි. එසේ දෙවෙනි දෙස ද, තෙවෙනි දෙස ද, සිවුවන දෙස ද පැතිරී ගෙන වෙසෙයි. එසේ ම උඩ දෙස ද යට දෙස ද සරස ද යි මේ හැම තැන ම සියලුදෙනා ම තමා හා සමතිමයෙන් සියලු සතුන් ඇති ලෝව (සියලු සත්ලොව) විපුල වූ, මහද්ගත වූ, නොපමණ වූ, වෛර නැති, තිදුක් වූ මුදිතාසහගිය සිතින් පැතිරී ගෙන වෙසෙයි. වාසෙට්ඨය, යම්සේ කාබලැති සක්පිඹින්නෙක් පහසුයෙන් සිය සක්හඬින් සිවුදිගුන් හඟවන්නේ ද, එ පරිදි ම වාසෙට්ඨය, මෙසේ වඩනා ලද මුදිතාචිත්තවිමුක්තිය කරණ කොට ගෙන, ප්‍රමිත වූ කම් (කාමාවචර කම්) අවශිෂ්ට නො වේ එය මහද්ගත කම් මැඩ තමාට ඉඩ ගන්නට නො ද සමත් වේ. වාසෙට්ඨය, මේ මුදිතාචිත්තවිමුක්තිය ද බ්‍රහ්මසහභාවයට මඟ ය.

80. තව ද, අනෙකක් කියම්, වාසෙට්ඨය, මහණ තෙම උපෙක්ෂාසහගත සිතින් එක් දෙසක් පැතිරී ගෙන වෙසෙයි. එසේ දෙවෙනි දෙස ද, තෙවෙනි දෙස ද, සිවු වන දෙස ද, පැතිරී ගෙන වෙසෙයි. එසේ ම උඩ දෙස ද යට දෙස ද සරස ද යි මේ හැම තැන ම සියලු දෙනා ම තමා හා සමතිමයෙන් සියලු සත්ලොව විපුල වූ මහද්ගත වූ, නොපමණ වූ, වෛර නැති, තිදුක් වූ උපෙක්ෂාසහගත සිතින් පැතිරී ගෙන වෙසෙයි. වාසෙට්ඨය, යම්සේ කාබලැති සක්පිඹින්නෙක් පහසුයෙන් සිය සක්හඬින් සිවුදිගුන් හඟවන්නේ ද, එ පරිදි ම වාසෙට්ඨය, .මෙසේ වඩනා ලද උපෙක්ෂාචිත්තවිමුක්තිය හෙතු කොට ගෙන ප්‍රමාණකාන කම් (කාමාවචරකම්) අවශිෂ්ට නො වේ. එය මහද්ගතකම් මැඩ තමහට ඉඩ ගන්නට නො ද සමත් වේ. වාසෙට්ඨය, මේ උපෙක්ෂාචිත්තවිමුක්තිය ද බ්‍රහ්මසහභාවයට මඟ ය.

81. වාසෙට්ඨය, ඒ කිමැ යි සිතයි ද? මෙසේ (ඔබවෙහෙරින්) වසන මහණ තෙම ස්ත්‍රීපරිග්‍රහය ඇත්තේ ද? ස්ත්‍රීපරිග්‍රහය නැත්තේ ද?"

[වාසෙට්ඨ:] "ස්ත්‍රීපරිග්‍රහය නැත්තේ ය, භවද් ගෞතමයිනි."

[භාග්‍යවත්හු:] "වෛර සිතැත්තේ ද? වෛර සිත් නැත්තේ ද?"

[වාසෙට්ඨ:] "වෛර සිත් නැත්තේ ය, භවද් ගෞතමයිනි."

[භාග්‍යවත්හු:] "තිදුක් සිත් ඇත්තේ ද? තිදුක් සිත් නැත්තේ ද?"

[වාසෙට්ඨ:] "තිදුක් සිත් නැත්තේ ය, භවද් ගෞතමයිනි."

[භාග්‍යවත්හු:] 'කිලිටි සිතැත්තේ ද? කිලිටි සිත් නැත්තේ ද?"

[වාසෙට්ඨ:] "කිලිටි සිත් නැත්තේ ය, භවද් ගෞතමයිනි."

[භාග්‍යවත්හු:] "වශවර්තී (චිත්තවශිතා ඇත්තේ) ද? අවශවර්තී (චිත්තවශිතා නැත්තේ) ද?"

[වාසෙට්ඨ:] "වශවර්ත්ති (චිත්තවශිතා ඇත්තේ) ය, භවද් ගෞතමයිනි."

82. [භාග්‍යවත්හු:] වාසෙට්ඨය, මෙසේ වූ කලි භික්ෂු තෙම ස්ත්‍රීපරිග්‍රහ නැත්තේ ය. බඹා ද ස්ත්‍රීපරිග්‍රහ නැත්තේ ය. ස්ත්‍රීපරිග්‍රහ නැති බඹා හා ස්ත්‍රීපරිග්‍රහ නැති භික්ෂුහුගේ සැසැඳෙන බවෙක් වේ ද? සමබවෙක් වේ ද?"

[වාසෙට්ඨ:] "එසේ ය, භවද් ගෞතමයිනි"

"සාධු වාසෙට්ඨ. සො වත වාසෙට්ඨ අපරිඤ්ඤහො භික්ඛු කායස්ස භෙදා පරම්මරණා අපරිඤ්ඤහස්ස බ්‍රහ්මුනො සහව්‍යුපගො භවිස්සතීති ඨානමෙතං විජ්ජති"

83. ඉති කිර වාසෙට්ඨ අවෙරචිත්තො භික්ඛු. අවෙරචිත්තො බ්‍රහ්මා. අපි නු ඛො අවෙරචිත්තස්ස භික්ඛුනො අවෙරචිත්තෙන බ්‍රහ්මුනා සද්ධිං සංසන්දති සමෙතී?"ති

"එවං හො ගොතම."

"සාධු වාසෙට්ඨ. සො වත වාසෙට්ඨ අවෙරචිත්තො භික්ඛු කායස්ස භෙදා පරම්මරණා අවෙරචිත්තස්ස බ්‍රහ්මුනො සහව්‍යුපගො භවිස්සතීති ඨානමෙතං විජ්ජති."

84. ඉති කිර වාසෙට්ඨ අබ්‍යාපජ්ඣචිත්තො භික්ඛු. අබ්‍යාපජ්ඣචිත්තො බ්‍රහ්මා. අපි නු ඛො අබ්‍යාපජ්ඣචිත්තස්ස භික්ඛුනො අබ්‍යාපජ්ඣචිත්තෙන බ්‍රහ්මුනා සද්ධිං සංසන්දති සමෙතී?"ති.

"එවං හො ගොතම."

"සාධු වාසෙට්ඨ. සො වත වාසෙට්ඨ අබ්‍යාපජ්ඣචිත්තො භික්ඛු කායස්ස භෙදා පරම්මරණා අබ්‍යාපජ්ඣචිත්තස්ස බ්‍රහ්මුනො සහව්‍යුපගො භවිස්සතීති ඨානමෙතං විජ්ජති.

85. ඉති කිර වාසෙට්ඨ අසංකිලිට්ඨචිත්තො භික්ඛු. අසංකිලිට්ඨචිත්තො බ්‍රහ්මා. අපි නු ඛො අසංකිලිට්ඨචිත්තස්ස භික්ඛුනො අසංකිලිට්ඨචිත්තෙන බ්‍රහ්මුනා සද්ධිං සංසන්දති සමෙතී"ති.

"එවං හො ගොතම."

"සාධු වාසෙට්ඨ. සො වත වාසෙට්ඨ අසංකිලිට්ඨචිත්තො භික්ඛු කායස්ස භෙදා පරම්මරණා අසංකිලිට්ඨචිත්තස්ස බ්‍රහ්මුනො සහව්‍යුපගො භවිස්සතීති ඨානමෙතං විජ්ජති."

86. ඉති කිර වාසෙට්ඨ වසවත්තී භික්ඛු. වසවත්තී බ්‍රහ්මා. අපි නු ඛො වසවත්තිස්ස භික්ඛුනො වසවත්තිනා බ්‍රහ්මුනා සද්ධිං සංසන්දති සමෙතී?"ති.

"එවං හො ගොතම."

[භාග්‍යවත්හු:] "මැනැව වාසෙට්ඨය. ඒ ස්ත්‍රීපරිග්‍රහ නැති භික්ෂු තෙම එකාන්තයෙන් කාබුත් මරණින් මතු ස්ත්‍රීපරිග්‍රහ නැති බඹහුගේ සහභාවයට පැමිණෙන්නේ ය යන මේ කාරණය විද්‍යමාන ය (ඇති එකක, වියැ සුත්තකක).

83. [භාග්‍යවත්හු:] "වාසෙට්ඨය, මෙසේ භික්ෂු තෙම වෛර සිත් නැත්තේ ය. බඹා ද වෛරසිත් නැත්තේ ය. වෛරසිත් නැති බඹා හා වෛර සිත් නැති භික්ෂුහුගේ සැසැඳෙන බවෙක් වේ ද? සම්බවෙක් වේ ද?"

[වාසෙට්ඨ:] "එසේ ය, භවද් ගෞතමයිනි."

[භාග්‍යවත්හු:] "මැනැව වාසෙට්ඨය, ඒ වෛරසිත් නැති භික්ෂු තෙම එකාන්තයෙන් කාබුත් මරණින් මතු වෛරසිත් නැති බඹහුගේ සහභාවයට ගියෙක් වන්නේ ය යන මේ කාරණය විද්‍යමාන ය.

84. "වාසෙට්ඨය, මෙසේ මහණ තෙම නිදුක් සිතැත්තේ ය. බඹා ද නිදුක් සිතැත්තේ ය. නිදුක් සිතැති බඹා හා නිදුක් සිතැති භික්ෂුහුගේ සැසැඳෙන බවෙක් වේ ද?"

[වාසෙට්ඨ:] "එසේ ය, භවද් ගෞතමයිනි."

[භාග්‍යවත්හු:] "මැනැව වාසෙට්ඨය, ඒ නිදුක් සිතැති භික්ෂු තෙම එකාන්තයෙන් කාබුත් මරණින් මතු නිදුක් සිතැති බඹහුගේ සහභාවයට ගියෙක් වන්නේ ය යන මේ කාරණය විද්‍යමාන ය.

85. [භාග්‍යවත්හු:] වාසෙට්ඨය, මෙසේ භික්ෂු තෙම නොකිලිටි සිතැත්තේ ය. බඹා ද නොකිලිටි සිතැත්තේ ය. නොකිලිටි සිතැති බඹහු හා නොකිලිටි සිතැති භික්ෂුහුගේ සැසැඳෙන බවෙක් වේ ද? සම්බවෙක් වේ ද?"

[වාසෙට්ඨ:] "එසේ ය, භවද් ගෞතමයිනි."

[භාග්‍යවත්හු:] "මැනැව වාසෙට්ඨය, ඒ නොකිලිටි සිතැති භික්ෂු තෙම එකාන්තයෙන් කාබුත් මරණින් මතු නොකිලිටි සිතැති බඹහුගේ සහභාවයට පැමිණියෙක් වන්නේ ය යන මේ කාරණය ඇත්තේ ය (විය සුතු ය)."

86. [භාග්‍යවත්හු:] "වාසෙට්ඨය, මෙසේ භික්ෂුතෙම පුරුදුකළ චිත්තවශිතා ඇත්තේ ය බඹා ද පුරුදුකළ චිත්තවශිතා ඇත්තේ ය. පුරුදු කළ චිත්තවශිතා ඇති බඹා හා පුරුදු කළ චිත්තවශිතා ඇති භික්ෂුහුගේ සැසැඳෙන බවෙක් වේ ද? සම්බවෙක් වේ ද?"

[වාසෙට්ඨ:] "එසේ ය, භවද් ගෞතමයිනි."

"සාධු වාසෙට්ඨ. සො වත වාසෙට්ඨ වසවත්ති භික්ඛු කායස්ස භෙදා පරම්මරණා වසවත්තිස්ස බ්‍රහ්මුනො සහව්‍යතාය භවිස්සතීති ඨානමෙතං විජ්ජතී"ති.

87. එවං වුත්තෙ වාසෙට්ඨභාරද්වාජා මාණවා භගවන්තං එතදවොචුං: "අභික්කන්තං භො ගොතම අභික්කන්තං භො ගොතම. සෙය්‍යථාපි භො ගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති, එවමෙව භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එතෙ මයං භගවන්තං ගොතමං සරණං ගච්ඡාම ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකෙ නො භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතෙ සරණංගතෙ"ති.

තෙවිජ්ජසුත්තං නිට්ඨිතං තෙරසමං.

සීලක්ඛන්ධවග්ගො නිට්ඨිතො පඨමො.

[භාග්‍යවත්හු:] "මැනැව් වාසෙට්ඨය. ඒ පුරුදු කළ චිත්තවශිතා ඇති භික්ෂු තෙම කාමුත් මරණින් මතු එකාන්තයෙන් පුරුදු කළ චිත්තවශිතා ඇති බඹහුගේ සහව්‍යතාවට ගියෙක් වන්නේ ය යන මේ කාරණය ඇත්තේ ය. (වියැසුත්තේ ය)."

87. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ කල්හි වාසෙට්ඨ භාරද්වාජ මාණවයෝ දෙදෙන "භවද් ගෞතමයිනි, දෙශනාව අභික්‍රාන්ත යැ. භවද් ගෞතමයිනි, දෙශනාව අභික්‍රාන්ත යැ. භවද්ගෞතමයිනි, යම්සේ යැපිකුරු කොට තබන ලද්දක් උඩුකුරු කරන්නේ ද, පිළිසත් දැයක් විවෘත කරන්නේ ද, මංමුලා වූවක්හට මඟ කියන්නේ ද, ඇස් ඇතියන් රූප දකිති යි අඳුරෙහි තෙල් පහනක් හෝ දරන්නේ ද, එසේ ම භවද් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් කරුණින් ධර්ම ප්‍රකාශ කරන ලද යැ. ඒ අපි භවද් ගෞතමයන් වහන්සේ ද, ධර්මය ද භික්ෂුසඞ්ඝයා ද ශරණ යමහ. භවද් ගෞතමයන් වහන්සේ අප අද පටන් දිවි හිමි කොට සරණ ගිය උවසුවන් කොට දරන සේක් වා (සලකා වදාරන සේක් වා)" යි මේ බස් කිවු ය.

තෙලෙස්වන තෙවිජ්ජ සූත්‍රය නිමියේ ය.

ප්‍රථම ශීලස්කන්ධවර්ගය නිමි.

දීඝනිකායෙ
සීලක්ඛන්ධවග්ගෙ
පදානුක්කමණිකා

පිටුඅංකා

අ

අකටවිධං 98
අකටං 98
අකණ්ටකං 138
අකණ්ඩකා 262
අකිච්චකාරී 262
අකිරියං 92
අකුසලසඛාතා 358
අක්ඛරිකං 12, 114
අක්ඛං 12, 114
අක්ඛානං 10, 112, 114
අක්ඛායති 62
අක්ඛිතෙතා 226
අක්ඛුද්දවිකාසො 226
අගරු 154
අගතිජං 112
අගාළ්හං 154
අගිපරිචරියං 208
අගිහොත්තිං 16
අග්ගිං පරිචරන්තො 208
අග්ගාගාරං 208
අඞ්ගවිජ්ජා 16
අඞ්ගං 16
අඞ්ගුලිපතොදකෙහි 156
අඤ්ඤතු 222
අච්ඡරිකා 418
අච්චරපරිනිබ්බුතෙ 438
අච්චලතියා 594
අචෙලකො 364
අච්චගමා 146
අච්චයෙන 30
අච්චයො 148
අඤ්ජති 208
අඤ්ඤ 138
අඤ්ඤා 132
අජ්ඣගා 114
අජ්ලක්ඛණං 16
අජ්ඣතතෙ 248
අජිනක්ඛිපං 366
අජිනපාවෙණි 12, 114
අජිනං 366
අජෙළකපටිග්ගහණා 112
අඤ්ඤා 536
අඤ්ඤතතං සම්පජානදෙතං 62, 130
අඤ්ඤතතං වූපසන්තචිත්තො 124
අඤ්ඤායකො 150
අඤ්ඤාවිමුත්ති 260
අඤ්ඤාගාහති 206
අඤ්ඤාපත්තා 608
අඤ්ඤං 20
අඤ්ඤලිමපණ්ණමෙත්ං 88
අඤ්ඤාසායනො 594
අඤ්ඤධනතිකෙන 410
අඤ්ඤතරෙ'පි 30
අඤ්ඤතිත්ථියපුබ්බා 386
අඤ්ඤතිත්ථියා 382
අඤ්ඤත්‍රාවරියකෙන 410
අඤ්ඤත්‍රායොගෙන 410
අඤ්ඤත්‍රෙව 372
අඤ්ඤථා'ති'පි 44
අඤ්ඤදත්ථු 156, 206
අඤ්ඤදත්ථුදසො 30, 532
අඤ්ඤදිට්ඨිකෙන 410
අඤ්ඤමඤ්ඤං 34
අඤ්ඤරුවිකෙන 410
අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං 338
අඤ්ඤදිසො 214
අට්ටියාමි 486
අට්ඨපදං 12, 114
අට්ඨංසො 132
අට්ඨකමෙම 92
අණිකදස්සනං 10, 114
අණ්ණිතෙතසු 110
අණ්ණං 538

	පිටුඅංකය
අතක්කාවචරං	20
අතච්ඡං	4
අතරමානෙ	154
අතික්කන්තමානුසිකාය	138
අතීපි	232
අතිබාළ්හං	158
අතියානං	16
අතිරිකාලෝ	216
අතිවේලං	34
අතීතෙ අත්තපටිලාභෙ	434
අත්තනෙ සමසමං	380
අත්තපටිලාභෙ	424
අත්තා	22, 408
අත්තාධීනෙ	126
අත්තානං	22
අත්ථගමං	28
අත්ථචරකෙන	216
අත්ථජාලං	80
අත්ථවාදී	8, 110
අත්ථසඤ්හිතං	110
අත්ථසංහිතං	414
අත්ථිකවතො	156
අත්ථිකවාදං	96
අත්ථෙ	266
අත්ථෙනෙව	6, 110
අදුක්ඛමසුඛසුඛුමසත්තසඤ්ඤ	402
අදුක්ඛමසුඛී අත්තා	54
අද්ධගතො	82
අද්ධමාසිකං	372
අද්ධරියා	596
අද්ධා	236, 276
අද්ධානමග්ගපටිපන්නො	2, 138
අද්ධුනො	30
අධිගවෙජ්ජ	540
අධිගතා	260
අධිවචසමුප්පන්නං	50
අධිවචසමුප්පන්නිකා	50
අධිජෙගුච්ඡං	380
අධිපඤ්ඤ	380
අධිප්පෙතං	236
අධිමුත්ති	380
අධිවුත්තිපදානි	20
අධිසිතුකාමෙ	226

	පිටුඅංකය
අධොවිරෙචනං	20
අනගාරියං	32
අනඛණෙ	136
අනඤ්ඤ	152
අනත්තමනවාචං	92
අනත්තසඤ්ඤී	40
අනත්තාධීනතා	126
අනනුප්පත්තෙ	548
අනන්තවා අත්තා	54
අනන්තසඤ්ඤී ලොකසමිං	40
අනන්තං	538
අනඛක්ඛාතුකාමා	356
අනභිභූතො	30
අනභිරති	30
අනභිරදධි	4
අනභිසඞ්ඛරොතො	404
අනභිසම්භුණමානෙ	206
අනවජ්ජසඞ්ඛාතා	362
අනවජ්ජසුඛං	122
අනවජ්ජං	362, 548
අනවයො	150, 226
අනාගතෙ අත්තපටිලාභෙ	434
අනාදීනවදස්සාවී	608
අනාචරිකාරො	266
අනාවත්තිධම්මො	332
අනාවිලො	132, 146
අනිකුජ්ජනතා	92
අනිච්චා	32
අනිච්චුච්ඡාදනපරිමද්දනභෙදන-විද්ධංසනධම්මො	132
අනිච්ඡාරෙකං	92
අනිදස්සනං	538
අනිම්මානා	98
අනිම්මිතං	98
අනිස්සරණපඤ්ඤ	608
අනුකූලයඤ්ඤති	278
අනුගාණඛනෙතා	92
අනුජ්ඣකන්තා	156
අනුඤ්ඤාතපටිඤ්ඤාතො	150
අනුත්තරං විත්තං	138
අනුත්තරො	86
අනුත්තරො සඞ්ඛාමවිජ්ජයො	80

	පිටුව
අනුපක්‍ඛුවෙය්‍ය	226
අනුපක්‍ඛන්දති	240
අනුපගච්ඡති	96
අනුපජ්ජතො	168
අනුපරිවත්තනති	600
අනුපාදාවිමුත්තො	28
අනුප්පබ්‍බාහිසඤ්ඤිරෙඛ-සමපජ්ජනසමාපත්ති	404
අනුපෙති	96
අනුපදතා	8, 110
අනුපාදෙතු	262
අනුපීලා	262
අනුබ්‍යඤ්ජනගාහී	122
අනුමිතා	170
අනුමිනිපක්‍ඛා	264, 276
අනුමිසි	214
අනුයාඛිතො	274
අනුයුත්තා	112, 264
අනුයොගභයා	46
අනුයොගමත්‍ථය	22
අනුවිලොකෙත්‍වා	88
අනුසාසනීපාටිහාරියං	486
අනුසරති	22
අනෙකාංසිකං	418
අනෙකපරියායෙන	2
අනෙකබ්‍යඤ්ජනං	212
අනෙකවිහිතානි	20
අනෙකසූපං	212
අනෙළගලාය	226
අන්තරං	268, 274
අන්තරා	2
අන්තරායකරෙ	544
අන්තරායො	44
අන්තරෙන	98
අන්තලික්ඛචරා	30
අන්තමිං අත්තා	54
අන්තවා අයං ලොකො	3
අන්තානන්තං	40
අන්තානන්තං ලොකස්ස	38
අන්තානන්තිකා	38, 40
අන්තෙවාසිකතා	78
අන්තෙවාසිමුඤ්චපොසිකි	130
අන්ධ	608
අන්ධවෙණි	600
අන්ධවෙණූපමං	600
අන්ධං	418
අන්‍යතිත්‍ථිකානි	112
අන්‍යය	22
අන්‍යත්‍රවෙය්‍යුං	122
අපකඩ්ඪති	390
අපක්‍කමම	210, 274
අපගතකාළකං	220, 320
අපතාමෙය්‍යං	246
අපයානං	16
අපරද්ධං	392
අපරන්තං ආරබ්ධ	54
අපරන්තකප්පිකා	54
අපරන්තානුදිට්ඨිතො	54
අපරපච්චයො	220, 320
අපරාමසතො	28
අපරිඤ්ඤෙ	610
අපරිපක්‍කං වා කම්මං	94
අපරිමාණවණ්ණා	232
අපරිසෙසතා	40
අපරිසෙසා	530
අපවදති	240
අපසාදෙතබ්බං	92, 164
අපාතකමනුස්සුතෙතා	366
අපාතකො	366
අපාපපුරෙක්‍ඛාරො	230
අපායමුඛානි	206
අපාරුතඝරා	262
අපෙති	390
අපච්චයො	4
අපටිභයං	128
අපවත්තරො	278
අපදුක්‍ඛටිහාරිං	358
අපමත්තාය	158
අපමත්තො	386
අපමාණසඤ්ඤී අත්තා	54
අපමාදමත්‍ථාය	22
අපසදදකාමෙ	388
අපසම්‍රම්භතරො	278
අපාංපිඝිරකතං	420, 60

පිටුඅංකා

අපාතඛකං 438
අපාබාධං 438
අපාශුකතරා 32
අපෙපකච්චානි 130
අපෙපවනාම 82, 388, 438, 542
අපෙසක්ඛතරා 32
අපත්‍රවං 128
අබලා 92
අබ්බයෙන 126
අබ්භනුමොදති 276
අබ්භනුමොදෙය්‍ය 416
අබ්භාකුටිකො 230
අබ්භාචික්ඛති 356
අබ්භුට්ඨාසි (වඩ්ඩකම්මං) 212
අබ්භුජ්ජලනං 18
අබ්භුන්නාමෙය්‍යං 246
අබ්භොකාසං 124
අබ්භොකාසිකො 366
අබ්භොකාසෙ 152
අබ්භොකාසො 108
අබ්‍යත්තතා 234
අබ්‍යාකතං 410
අබ්‍යාපන්නචිත්තතා 124
අබ්‍යාසෙකසුඛං 122
අභික්කන්තතං 146
අභික්කන්තෙන 124
අභික්කම 86
අභිජ්ඣිතුං 92
අභිජ්ඣාති 276
අභිජ්ඣාසි 90
අභිජ්ජමානෙ (උදකෙ) 136
අභිජ්ඣං 124
අභිජ්ඣා දෙමනස්සා 122
අභිඤ්ඤ 20
අභිඤ්ඤතකොලඤ්ඤ 154
අභිඤ්ඤතා 594
අභිනන්දනහෙතු 608
අභිනන්දිං 92
අභිනිත්තාමෙති 132
අභිනිපථාදෙය්‍ය 136
අභිනිබ්බත්තියා 546
අභිනිමන්තෙතය්‍යාමපි 104

පිටුඅංකා

අභිනීහරති (චිත්තං) 132, 136, 158
අභිපත්ථිදිස්සති 484
අභිභු 30
අභිරූපො 226
අභිරුහිත්වා 86
අභිවදතති 20
අභිවිජය 260
අභිසඞ්ඛරෙය්‍ය 404
අභිසජ්ජිතුං 158
අභිසඤ්ඤතිරොධං 390
අභිසන්දෙති 128
අභිහටං 364
අමනසිකාරා 402
අමරාවික්ඛෙපං 44
අමරාවික්ඛෙපිකා 44
අමහග්ගතං චිත්තං 138
අමාඝං 488
අමුත්‍ර 22
අම්බං වා පුට්ඨා 92
අම්බට්ඨා 150
අම්බපිණ්ඩියා 80
අම්බවනෙ 82
අයොකූටං 164
අරඤ්ඤං 124
අරඤ්ඤායතනං. 206
අරහති භවිතුං 276
අරියානං උපවාදකා 142
අරියා පරමා පඤ්ඤා 380
අරියාය සතතුට්ඨියා 122
අරියෙන ඉන්ද්‍රියසංවරෙන 124
අරියෙන සතිසම්පජඤ්ඤෙන 124
අරියෙන සීලක්ඛන්ධෙන 124
අරූපො අත්තපටිලාභො 424
අරූපි අත්තා 56
අරොගො 54, 420
අවණ්ණං භාසෙය්‍යුං 4
අවසටං 613
අවසවත්තී 612
අවසා 92
අවිජ්ජාසවං 144
අවිනිපාතධම්මෙමං 332
අවිපරිණාමධම්මෙමා 32

පිටුඅංකය

අවිමුත්තං චිත්තං 138
අවිසංවාදකෝ 6, 110
අවුසිතවා 156
අවුසිතවාදෙන 156
අවෙරචිත්තෝ 610
අව්‍යාපජ්ඣචිත්තෝ 610
අවහාසනමගතු 606
අසඛිලිත්‍ථචිත්තෝ 610
අසජ්ජමානෝ 136
අසඤ්ඤසත්තා 50
අසඤ්ඤී 390
අසඤ්ඤිගබ්භා 94
අසමාහිතං චිත්තං 138
අසමිත්තාඛත්තියකුලා 230
අසිතෙ 124
අසිලක්ඛණං 16
අස්සතරං 12, 114
අස්සථ 4
අස්සපිට්ඨෙ 210
අස්සප්‍රෙට්ඨ 168
අස්සගුත්තිං 114
අස්සලක්ඛණං 16
අස්සවාය 266
අස්සාදං 28
අස්සාරොහා 88
අස්සුමුඛා 274
අහිවිජ්ජා 16
අහිනිප්‍රිතං 134
අහිනිප්‍රිතෙ 60, 424
අහු 86
අහුමහා 32
අහෙතුඅපච්චයා 92
අහො වත 30
අහො වත රෙ 216

ආ

ආකඩ්ඩති 386
ආකඩ්ඩිතං 236
ආකාසං 12, 96, 114
ආකාසානඤ්චායතනප්‍රතිලාභ-
සච්චසඤ්ඤ 402
ආකාසානඤ්චායතනූපගෝ 60
ආකිඤ්චඤ්ඤායතනප්‍රතිලාභ-
සච්චසඤ්ඤ 404
ආකිඤ්චඤ්ඤායතනූපගෝ 62
ආකිණ්ණමනුස්සා 484
ආකිරිතුං 128
ආකොටෙති 154
ආගතිං 358
ආචමනං 20
ආචරියපාචරියා 226
ආචරියමත්‍රගා 598
ආචාමිහකෝ 366
ආචාරගොචරසම්පන්නා 110
ආචික්ඛිය 146
ආජීවකසතෙ 94
ආතපපරිඛ්‍රාය 22
ආතපපා 22
ආතාපී 386
ආදාසපඤ්ඤං 18
ආදාසං 12
ආදෙසෙ 138
ආදිකල්‍යාණං 150
ආදිච්චුපට්ඨානං 18
ආදිතො'ව 164
ආදිත්තං 164
ආදිබ්‍රහ්මචරියකං 414
ආදිසති 488
ආදීනවං 28
ආදෙසනාපාටිහාරියං 486
ආනන්දිතෝ 6
ආනුපුබ්බී කථා 220
ආනෙඤ්ජප්පත්තෙ 132
ආපොකායං 96
ආභස්සරසංවත්තනිකා 30
ආමිකඛාදඤ්ඤපටිග්ගහණා 112
ආමිකමංසපටිග්ගහණා 112
ආමිසසන්නිධිං 10, 112
ආවුත්තමණිකුණ්ඩලාභරණා 212
ආමෝ 606
ආයතිසංවරාය 146
ආයමුඛං 130
ආයාචනති 600
ආලක්ඛයා 30

	පිටුඅංකය
ආරක්‍ඛා	208, 366
ආරද්ධචිත්තතා	386
ආරාවාරී	6, 110
ආරාධෙය්‍ය	236
ආරොග්‍යං	18
ආරොහණීයං	86
ආලිඛෙය්‍ය	548
ආලිඳං	154
ආලෝකසඤ්ඤී	124
ආලෝකිතෙ	124
ආලෝප	8, 112
ආවටං	168
ආවරණා	610
ආවෘතං	18
ආවාහවිවාහවිනිබද්ධං	172
ආවාහවිවාහෙ වා	172
ආවෘතෙ වා	172
ආවිභාවං	136
ආවුටා	610
ආවුතං	132
ආවුධලක්ඛණං	16
ආසජ්ජ	216
ආසනපටික්ඛිත්තො	366
ආසන්දිපඤ්චමා	96
ආසන්දිං	12, 114
ආසවනිරොධො	144
ආසවනිරොධගාමිනී පටිපදා	144
ආසෙවසම්භදයෙ	144
ආසවා	144
ආසවානං ඛයඤ්ඤාණ	144
ආසි	276
ආහාරෙති	364
ආහුතියො	96
ආළාරිකා	88

ඉ

ඉඤ්ජිතං	236
ඉඤ්ජිතෙ	98
ඉණමූලානි	126
ඉණං	126
ඉතිහවාභවකථං	14
ඉතිහ	2
ඉතිහාසපඤ්චමානං	150
ඉත්ථත්තං	30
ඉත්ථිකුමාරිකාපටිග්ගහණා	112
ඉත්ථිලක්ඛණං	16
ඉත්ථෙකෙ	390
ඉදප්පච්චයා	408
ඉදමෙව සච්චං	410
ඉදං දුක්ඛන්ති	144
ඉද්ධා	484
ඉද්ධාභිසඞ්ඛාරං	214
ඉද්ධිපාටිහාරියං	484
ඉද්ධිවිධං	136, 486
ඉන්දමච්ඡයාම	608
ඉන්ද්‍රියසතෙ	94
ඉන්ද්‍රියානි	96
ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො	110, 122, 456
ඉඛා	154
ඉසයො	210
ඉසිකං	134
ඉසිත්තාය	210
ඉස්සරො	30

ඊ

ඊසාතමච්ඡයාම	608

උ

උක්කටඨං	150
උක්කංසාවකංසෙ	94
උක්කාපාතො	18
උක්කාමුඛං	158
උක්කාසිතසද්දෙ	86
උක්කාසිත්වා	154
උක්කාසු	86
උක්කිණ්ණපරිඛාසු	212
උක්කුජ්ජෙය්‍ය	146
උක්කුටිකප්පධානං	366
උක්කුටිකො	366
උක්කොටෙත	8, 112
උගතවජ්ජානි	600
උගමනං (වඩ්ඪමසුරිය නක්ඛත්තානං)	18
උගා	88
උච්චාරපස්සාවකම්මෙ	124

පිටුව අංකය

උවාසයනමහාසයනං 12, 113
උවේදනං 12
උවජ්ජති 60
උවජ්ජිත්වා හවේ තත්තිකෝ 80
උවේජදවාතු 60
උවේජං (සතෝ සත්තස්ස) 60, 96
උස්සිඤ්ඤං 594
උස්සිවිපච්චනීකවාදී 2
උණ්හීසං 12
උත්තරිතරං 28
උත්තරිමනුස්සධම්මං 484
උත්තරිං 126
උත්තානත්ථිකෝ 230
උදකදහං 78
උදකරහදේ 130
උදකානුගතානි 130
උදකාරෝහණානුයෝගං 366
උදගතචිත්තං 220
උතුනං උදනෙසි 82
උද්දලෝමිං 12, 114
උද්දිස්සකථං 364
උඛගතිකං 88
උඛවත්තුකුක්කුච්චනීවරණං 610
උඛවත්තුක්කුච්චං 124
උඛමිඤ්ජනානං 54
උඛමිඤ්ජනිකං 54
උඛවිරෙවතං 20
උඛං 80
උළීසිස්සති 166
උත්තාදිනියා 388
උපකඩ්ඪති 390
උපක්කොසති 356
උපක්ඛටෝ 248
උපජ්ඣතති 544
උපට්ඨිතෝ (සෝ) 364
උපනිජ්ඣායති 34
උපනෙය්‍ය 216
උපඩ්ඪං 422
උපජ්ජනති 22
උපජ්ජිතං 276
උපපත්තිං 358
උපපන්නෝ 22

පිටුව අංකය

උපපාදිං 22
උපයානං 16
උපරිපාසාදවරගතෝ 82
උපරිවෙහාසං 164
උපරුජ්ඣති 538
උපවදමානෝ 156
උපශමාය 414
උපශමේන 88
උපගතෝ 148
උපාදානපච්චයා භවෝ 78
උපාදානපරිජේගුච්ඡං 46
උපාදානභයං 46
උපාසකකුලානි 220
උපෙක්ඛාසතිපාරිසුද්ධිං 66, 152
උපෙක්ඛාසුඛසුඛුමසච්චසඤ්ඤී 402
උපපථගමනං (මජ්ඣිමපටිපදානං) 18
උපලිත්තියං 130
උපාතං 16
උබ්බිලාවිතත්තං 6, 62
උබ්බිලාවිතෝ 6
උබ්භවඨිකෝ 366
උබ්භිදෙදකෝ 130
උභතොලෝහිතකූපධානං 12, 114
උම්මුජ්ජනිම්මුජ්ජං 136
උම්මුජ්ජමානං 78
උය්‍යොධිකං 10, 114
උරබ්භ 248
උරෙ 262
උලූකපක්ඛිකං 366
උලුම්පතු 616
උසභසුද්ධිං 114
උසභලක්ඛණං 16
උසභසතානි 248
උසුලක්ඛණං 16
උසාකෙක්‍යා 548
උසාගිංසු 262

ඒ

ඒකංසභාවිතෝ 328
ඒකංසිකං 416
ඒකංසිකා 418
ඒකංසෙන 246
ඒකකෝ 544

	පිටුඅංකය
එකච්චඅස්සස්සතිකා	28
එකච්චසස්සතිකා	28
එකච්චං අස්සස්සතං	28
එකච්චං සස්සතං	28
එකත්තසඤ්ඤී අත්තා	54
එකත්තදුක්ඛී අත්තා	54
එකත්තපරිපුණ්ණං	108
එකත්තලෝකී	12, 114
එකත්තසුඛං ලොකං	420
එකත්තසුඛී	54, 420
එකංපස්සගිකො	366
එකභත්තිකො	8, 110
එකමංසබලං	90
එකමංසපුඤ්ජං	90
එකසාලකෙ	388
එකාගාරිකං කරොතො	90
එකාගාරිකො	364
එකාලොපිකො	364
එකාහිකං	364
එකොදිභාවං	130
එත්තකපරමා	244
එත්තකවණ්ණො	232
එවංඅභිසම්පරායං	28
එවංගතිකා	28, 88
එවංගහිතා	28
එවංගොත්තා	28
එවංපරාමසා	28
එවමාදිපරියත්තා	22
එවමීහාරො	22
එවමපි තො	44
එවංවණ්ණො	22
එවංසුඛදුක්ඛපටිසංවෙදී	22
එසිකවත්ථිවසීතො	22, 98
එහිභදන්තිකො	364
එහිසංගතවාදී	230
එළකමන්තරං	364

ඔ

ඔකාසං කරොති	88
ඔක්කිත්තපළිකාය	212
ඔගවජ්ජති	600
ඔගාහිතං (වඤ්ඤිමුරියානං)	18
ඔඤ්ඤරෙය්‍ය	78
ඔදනකුම්මාසුපමයො	132
ඔදහති (ඝාතං)	548
ඔදාතවිපාවසනා	212
ඔදාතවසනානං	484
ඔතාරා	610
ඔතිතපත්තපාණී	322
ඔපපාතිකා	48
ඔපපාතිකො	332
ඔපානභූතො	266
ඔමුඤ්චවත්‍ථං	246
ඔරමත්තකා	6
ඔරම්භාගියානං	332
ඔවාදපටිකරාය	266
ඔවුවා	610
ඔසධිතං පටිමොක්ඛො	20
ඔසාකකන්තියා	548
ඔහාය	550
ඔළාරිකං	62
ඔළාරිකා සඤ්ඤා	404
ඔළාරිකො අත්තපටිලාභො	424

ක

කංසකූට	8, 112
කංසථාලෙ	128
කඛති	214
කච්ඡලක්ඛණං	16
කටීසුං	12, 114
කණ්ඩකො	366
කණ්ඩොමං	16
කණ්ඩකාපස්සයිකො	366
කණ්ණජ්පපතං	18
කණ්ණතෙලං	20
කණ්ණසුඛා	8, 110
කණ්ණසොතානි	214
කණ්ණිකාලක්ඛණං	16
කණ්ණාභිඛාතං	358
කණ්හා	154, 358
කතපරපවාදා	46, 358
කත්තා	80
කත්තරෙ (මත්තානං)	600
කථාසල්ලාපො	216
කදාචි	30
කත්තරධාතමිගා	128

පිටුඅංකා

කන්දමූලඵලභෝජනං 206
කන්දරං 124
කපකා 88
කපාපෙති 86
කපිතකෙසමිස්සු 212
කපිතෝති 86
කපෙති 86
කබලීකාරාහාරභක්ඛා 60
කම්මකරා 274
කම්මකරෝ 104
කම්මනෙත පයොජෙය්‍ය 126
කම්මවාදී 230
කම්මුනෝ 92
කමෙම ච 92
කයවික්කයා 8, 112
කරහචි 30
කරොතෝ 90
කල්‍යාණවාක්කරණං 160, 226
කල්‍යාණවාචෝ 226
කල්‍යාණං 220
කල්‍යාණෝ 80
කලලවිත්තං 226
කලලං වවතාය 370
කසිණගාරක්ඛ 262
කහං 88
කළෝපිම්බා 364

කා

කාකපජ්‍ජා 606
කාදලිඉගපවරපච්චත්ථරණං 12, 114
කාපොතකානි 96
කාමගුණා 608
කාමවජ්ජනතීවරණං 610
කාමන්දුබන්ධනබද්ධා 608
කාමලාපිනී 158
කාමාසවාපි 144
කාමූපසංහිතානි 226
කාමෙමි 420
කායපරිහාරිකෙන 124
කායා 34, 98
කායෙන වසං වත්තෙතෙති 136
කායො පස්සම්භති 334

පිටුඅංකා

කාරකාරකො 106
කාරයතෝ 90
කාලවාදී 110, 362
කාලං ච සමයං ච උපාදාය 438
කාලං මඤ්ඤසි 148
කාවෙය්‍යං 18
කාළී 420

කි

කිඛකාරපටිස්සාවී 104
කිඤ්චිදෙව දෙසං 88
කිමංගම්ම 28
කිමාරබ්භ 28
කිර 438
කිරියවාදී 230
කිලන්තකායා 34
කිලමියතෝ 90

කු

කුක්කුටයුද්ධං 114
කුක්කුටලක්ඛණං 16
කුක්කුටස්සකරපරිගාහණා 112
කුඛිපරිහාරිකෙන 124
කුතොපභුතිකා 162
කුත්තකං 12, 114
කුත්තවාළෙහි වළවාරණෙහි 212
කුඳලපිටකං 206
කුමාරලක්ඛණං 16
කුමාරිකපඤ්හං 18
කුමාරිලක්ඛණං 16
කුම්භකාරෝ 88, 136
කුම්භථූනං 10
කුම්භදාසියා 370
කුම්භීමුඛා 364
කුලාවකෙ 158
කුසවීරං 366
කුසලං 44
කුසලං ධම්මං 540
කුහනලපනා 14

කූ

කූටවෙඨා 22
කූටාගාරසාලායං 324

පිටුව අංකය

කෙ

කෙවලෙටං 78
කෙවලපරිපුණ්ණං 150
කෙවලං 212
කෙසකම්බලං 366
කෙසමස්සුලොචකො 366
කෙසමස්සුලොචනානුයොග-
මනුයුත්තො 366
කෙසෙසු ගහෙත්වා 592

කො

කොමුදියා 82
කොසලකා 324
කොසෙය්‍යං 12, 114
කොසොහිතෙ ච වත්ථගුය්හෙ 214

ඛ

ඛතෙ 148
ඛත්තවිජ්ජා 16
ඛත්තං 248
ඛත්තියි 604
ඛත්තෙ 222
ඛණ්ඩබීජං 112
ඛමෙය්‍ය 106
ඛලිකං 12, 114

ඛා

ඛාණුමත්තකා 248
ඛාරිවිවිධමාදාය 206

ගි

ගිඛිනා 34
ගිඛිනොපදෙසිකා 34
ගිපිතසද්දෙ 86

ගී

ගීණකාමරාගො 230

ගු

ගුරුපරියත්තෙන 90
ගුරුපං 164
ගුරුමුණ්ඩං 168
ගුංසත්තෙන 158

ගෙ

ගෙත්තවත්ථුපටිග්ගහණෙ 112
ගෙමවසිතා 262

පිටුව අංකය

ගෙමත්තගුම්බං 128
ගෙමං 18

ග

ගණකා 88
ගණනා 18
ගණාචරියසංවත්තනිකා 358
ගණාචරියො 82
ගණි 82
ගණිභූතා 222
ගති (පුඤ්ඤානං) 106
ගතියො (දෙව) 152
ගතිං ච 358
ගතෙ 124
ගජිතා 608
ගන්ධත්තිකිං 110
ගම්භීරා 22
ගලග්ගාහා 278
ගහපතිනෙමසිකා 270

ගා

ගාඛති 538
ගාමකතා 262
ගාමධම්මා 110
ගාමිසරණානි 596
ගාමසාමන්තං 208
ගාළ්හබන්ධනං 608

ගි

ගිරිගුහං 124

ගී

ගීතං 114

ගො

ගොතමසංවත්තනිකා 360
ගොත්තපරිහාරිනො 170
ගොත්තවාදවිනිබන්ධා 172
ගොත්තවාදෙ 172
ගොධාලක්ඛණං 16
ගොතකං 12, 114
ගොමයහත්ථකා 366
ගොලක්ඛණං 16

ඝ

ඝටිකං 12, 114
ඝරාවාසො 108
ඝාසච්ඡාදනපරමතාය 104

පිටුඅංකා

ම

චක්කවත්ති	152
චක්ඛුන්ද්‍රියෙ අසංවුතං	122
චක්ඛුන්ද්‍රියෙ සංවරං	122
චක්ඛුවිඤ්ඤෙය්‍යා	608
චණ්ඩාලං	10, 114
චතුත්ථං ඛානං	132
චතුද්වාරං	208
චතුරඞ්ගිනියා සෙනාය	266
චපලතාගෙහා	18
චන්දිමසුරියා	600
චන්දිමසුරියානං උපපථගමනං	18
චන්දිමසුරියානං පථගමනං	18
චම්මයොගිනො	88
චරණසම්පදා	206
චලකා	88
චවන්ති	22

ඡ

ඡාතුද්දිසං ගඞ්ගං	280
ඡාතුම්සිනියා	82
ඡාතුම්මහාපථෙ	208, 422
ඡාතුම්මහාභූතිකො	60, 132
ඡාතුයාමසංවරං	100
ඡාතුරන්තා	152

ජ

ජඞ්ගුලකං	12, 114
ජාලකං	12, 114
ජාලසම්පදා	366
ජාලානි	34
ජිත්‍රුපාහනං	12
ජිරපබ්බජිතො	82
ජිරං දීඝමද්ධානං	30

ඤ

ඤතිං	358
ඤාතුපපාතඤාණය	204

ඤ

ඤලාසීතිකපපුතො	94

ඤ

ඤෙතයමානස්ස	404
ඤෙතසිකං	488
ඤෙතයො එකොදිභාවං	62
ඤෙතෙය්‍යං	404
ඤෙතොපරියාය ඤාණය	138
ඤෙතොවිමුත්ති	332
ඤෙතොසමාධි	22

පිටුඅංකා

ඤෙලකා	88

ඨ

ඨොදනාරහා සත්ථාරො	548

ත

තණ්හු	44
තණ්හුකා	596
තම්බුසාණි	366
තමතිතත්තං	86
තලාතිජාතියො	94

තා

තාදෙති	126
තාදෙහි (ජීවතාය)	126

ති

තිජ්ජිංසු	274

තෙ

තෙදන	112

ත

තඞ්කාවිකාරං	594
තතපදකල්‍යාණි	420
තතපදසංවරියපපතො	152

තා

තාගරිතෙ	124
තාතරූපරජතපටිග්ගහණා	112
තාතවඩ්ඩකස්ස	616
තාතිපච්චයා පරාමරණං	78
තාතිමා	132
තාතිවාදෙන	226
තාතිවාදවිනිබන්ධා	172
තාතිවාදෙ	172
තාතිසමෙදභයා	158
තානපදා	264
තානං පඤ්ඤං	422
තාලෙන	78

ති

තිගුඛජ්ජෙ	486
තිවතානිසම්මතං	18

ති

තිවා	92
තිවිතපරියාදානා	80

ත්‍ර

ත්‍රිගතං	20

ත්‍ර

ත්‍රිතපපමාදවත්තානුයොගං	19, 114

ත්‍රා

ත්‍රායන්ති	86

පිටුඅංකය

සු

සුතො 82
සුණදසනාය 132
සුණං 406
සුණුපාදෙ 408
සුතිපරිමවටං 106

සී

සීතෙ 124

සෙ

සෙති 124

ත

තක්කපරිගහිතං 26
තක්කී 26
තඤ්ඤ 148
තවජ්ජං 414
තවජ්ජ 548
තණ්ඩුලඛොමං 16
තණ්හාගතානං 70
තණ්හාපච්චයා උපාදානං 78
තතියං ඣානං 130
තතො අමිත්ත 404
තපපරිනිබ්බායී 332
තථා පවිජදං 414
තථාගතක්ඛො'ව 536
තථාගතො 28, 172, 412
තථාතිපි 44
තථාරූපං 22
තථාරූපිං 110
තදඤ්ඤ 160
තදඤ්ඤාති 80
තදමිනාපෙතං 408
තදනුපෙක්ඛතෙ 82
තං ජීවං තං සරීරං 334
තපප්‍රහ්මචාරී 384
තපස්සිං 356
තපං 356
තපෙන 94
තපෙක්කකමෑ 366

තා

තාණගවෙසී 164

පිටුඅංකය

ති

තිවස්ඛදනතිකො 364
තිණහත්ථකා 366
තිණණවිවිකිත්ඡා 124, 220, 320
තිණණ ඣානානං 440
තිතතිරියා 596
තිපථං කරොති 82
තිරවජ්ජනකථං 14
තිරීමානි 366
තිරොකුඩ්ඩං 136
තිරොජනපද 230
තිරොදුස්සෙන 210
තිරොපබ්බතං 136
තිරොපාකාරං 136
තිරොභාවං 136
තිරොරට්ඨා 230

තී

තීරදස්සිං සකුණං 536

තු

තුච්ඡකස්සකුඩ්ඩ 600
තුණ්ඩිභාවෙ 124
තුලාකූට 8, 112

තූ

තූලිකා 12
තූලිකා 114

තෙ

තෙජොකායො 96
තෙලපජ්ජොතං 146
තෙලඛොමං 16
තෙවිජ්ජකෙ 150
තෙවිජ්ජානං 598

ථ

ථණ්ඩිලසෙය්‍යා 366

ථා

ථාලිපාකෙ 166

ථි

ථිනමිද්ධනීවරණං 610
ථිනමිද්ධං 124

ථු

ථුසහොම 51
ථුසොදකං 364

ථූ

ථූනූපනීතානි 248

පිටුඅංකය

ඵ

ඵෙතො 6, 110

ඵො

ඵොමියතති 600

ද

දක්ඛතති 80, 146
දක්ඛො 128
දණ්ඩකං 12
දණ්ඩතජ්ජිතා 274
දණ්ඩපහාරං 278
දණ්ඩමිත්තරං 364
දණ්ඩයුද්ධං 114
දණ්ඩලක්ඛණං 16
දත්තිකං 210
දත්තියා 364
දත්තුපඤ්ඤත්තං 96
දද්දුලභක්ඛා 366
දඩ්ඩාසිතත්තං 616
දඛ්ඛං 274
දඛ්ඛිණාමං 16
දමේන 90
දයාපත්තො 6, 110
දසපදං 12, 114
දසසහස්සී ලොකධාතු 80
දස්සුබිලං 262
දහතති (පිතාමහං) 158

ද

දරක්ඛතිකිච්ඡං 20
දරහරණාය 126
දරුපත්තිකං 334
දසකපුත්තා 88
දසඛ්යා 126
දසලක්ඛණං 16
දසා 274
දසිදසපටිඝාණං 112
දසිලක්ඛණං 16

දි

දිට්ඨධම්මනිබ්බානවාදා 62
දිට්ඨධම්මො 220, 320
දිට්ඨිගතං (ජාපකං) 540
දිට්ඨිගතානි 46, 358
දිට්ඨිජාලං 80
දිට්ඨිවක්ඛාතා 28
දිත්තපාටිකඛ්ඛි 6, 110
දිත්තාදයි 6, 110
දිඛ්ඛා ගඛ්ඛා 546
දිඛ්ඛාතං ඛවාතං 546
දිඛ්ඛාය සොතධාතුයා 138
දිඛ්ඛෙන චක්ඛුනා 142
දිඛ්ඛො 60
දිවාසෙය්‍යං 250
දිසා 160
දිසාඛාහො 18

දී

දීඝායුකතරෝ 32
දීඝාසිඛ්ඛෙහි 212

දු

දුක්ඛනිරොධො 144
දුක්ඛනිරොධගාමිනී පටිපදා 144
දුක්ඛසමුදයො 144
දුක්ඛස්සන්තං 94
දුජ්ජානො 162
දුජ්ජානො 372
දුතියං ඛ්ඛානං 130
දුද්දසා 20
දුබ්බණ්ණතරා 32
දුබ්භගකරණං 18
දුබ්භික්ඛං 18
දුරනුබොධා 20

දෑ

දූතෙය්‍ය 8
දූතෙය්‍යපහිතගමන 8, 14

දෙ

දෙවදුන්දුභි 18
දෙවපඤ්ඤං 18
දෙවයානියො මිගො 526

දො

දොණමිතෙ 94
දොසිනා 82
දොසො 44

පිටුඅංකා

ඛ

ඛචිතතරකපෙපා 94
ඛචිතපිපද 94
ඛතතිංසම්භාප්‍රිසලක්ඛණානි 152
ඛාගාරිකො 364
ඛාලොපිකා 364

ඛ

ඛනුකා 12, 114
ඛනුගාහා 88
ඛනුලක්ඛණං 16
ඛමමවක්ඛු 148, 320
ඛමමජාලං 80
ඛමමවිතිතං 416
ඛමමතො 268
ඛමමනියාමකං 416
ඛමමපරියායො 80
ඛමමරාජානං 146
ඛමමවාදි 110
ඛමමසංගිතං 414
ඛමමිකං 104
ඛමමිකා 548
ඛාරං අනුපපවෙජ්ජය 130
ඛුවා 32

ඛො

ඛොපනකං 114
ඛොමතං 10

ග

ගඅලම්රියසඛ්ඛතා 358
ගඅලම්රියා 358
ගක්ඛත්තගගාහො 18
ගක්ඛත්තතානං පථගමනං 18
ගක්ඛත්තතානං උපපථගමනං 18
ගඟරුපකාරිකාසු 212
ගවවං 114
ගවවසිතවාදිත 112
ගවෙවත්තා 262
ගවජත්තං 156
ගඤ්ඤගමමං 20
ගරකපපපාතං 592
ගවං ඛඤ්ඩතං 540

පිටුඅංකා

ගවනීතං 434
ගහාපකා 88
ගහාපතං 20
ගහාපිතො 542
ගළකාරා 88
ගළාටමණ්ඩලං 214

ගා

ගාගමතා 324
ගාගස්ස භූමි 88
ගාගාමිසසතෙ 94
ගාතිඛ්ඛිවති 212
ගාතතතකථං 14
ගාතතතසඤ්ඤිතං. 60, 402
ගාතතතසඤ්ඤී අතතා 54
ගාතතතවා 54
ගාතාධිඛ්ඛිතතිකතා 4
ගාතාමිඤ්ඤති 596
ගාමකඤ්ඤදව 600
ගාසිකාසොතානි 214
ගාළිකං 12

ගි

ගිකති 8, 112
ගිකුජීතං 146
ගිගණිගබ්ඛා 94
ගිගමිසතා 262
ගිගමිසාමිනතං 208
ගිඝසාසා 86
ගිවවා 32
ගිජ්ඝිංසිතාරො 14
ගිවඛාතං 274
ගිඛ්ඛාසිතඛ්ඛං 550
ගිපරෙය්‍ය 128
ගිඛානවතිං 8, 110
ගිත්‍යාමෙත්‍ය 214
ගිපුණා 20, 158
ගිපජිතිකෙන 132
ගිපෙසිකා 14
ගිඛිදය 414
ගිඛ්ඛුති 28
ගිඛ්ඛුධං 10, 114
ගිඛ්ඛුසිතතතා 30

පිටුඅංකා

නිඛෙඛඝියමානමේව 94
නිඛ්ඛඛයේතඛ්ඛං 4
නිමිත්තතං 364
නිමිත්තෙත්‍යාමපි 104
නිමිත්තං 16
නිමිත්තගාහී 122
නිව්ජ්ජමානා 78
නිම්මානා 30
නිම්මානෙහි 158
නිම්මිතා 30
නිරන්තරඛාතිභාවපරිණතා 92
නියතො 332
නිය්‍යාණං 16
නිය්‍යාණිකා 594
නිය්‍යාති 594
නිය්‍යාසි 89
නිරයගතෙ 94
නිරෝධං ඵුසති 404
නිරෝධාය 414
නිලලාපං ගරතො 90
නිවුතං 610
නිවෙසෙහි 440
නිසිත්තො 124
නිස්සරණා 28
නිස්සෙණිං 422
නිහතපච්චාමිත්තො 122
නිහිතදණ්ඩා 6, 110
නිහිතසත්තො 6, 110

නී

නීරණ 610
නීවාරගන්ධිකා 366

නෙ

නෙගමා 264
නෙත්තතපපතං 20
නෙමිත්තිකා 14
නෙවත්තතවා අත්තා 54
නෙවරූපි නාරූපි අත්තා 54, 56
නෙවසඤ්ඤානාසඤ්ඤාය
තනූපගො 62
නෙළා 8, 110

පිටුඅංකා

නහ

නහාපකත්තෙවාසී 128
නහාපකො 128
නහානීයවුණ්ණානි 128
නහානීයපිණ්ඩි 128

ප

පකතඤ්ඤු 390
පකති 372
පකපපතු 262
පකරණෙ 168
පක්කරණ්ඩකතං 16
පක්ඛන්දිනො 88
පක්ඛි සකුණො 124
පඤ්ඤරණි 128
පඞ්ගවිරං 12, 114
පච්චඤ්ඤං 20
පච්චත්තඤ්ඤුව 28
පච්චත්ථිකතො 122
පච්චත්ථිකො 6, 110
පච්චවෙක්ඛිය 132
පච්චුපට්ඨිතං 544
පච්චුපට්ඨිතානං 4
පච්චුපත්තො අත්තපරිලාභො 434
පවෙච්ඡා 86
පවෙච්ඡි 40
පවෙච්ඡාරොහණං 246
පවෙච්ඡාරොහිණී 88
පවජ්ජනිපාතී 104
පවජ්ජාසමණෙ 440
පජං 616
පජාතතං 28
පජාපතිම්හියාම 608
පඤ්ච නීවරණෙ 128
පඤ්ඤිකා 600
පඤ්ඤ 242
පඤ්ඤක්ඛන්ධස්ස 440
පඤ්ඤගතෙන 46, 358
පඤ්ඤපරිඛෙතං 242
පඤ්ඤපාරිපූරිං 426
පඤ්ඤපෙතති 22
පඤ්ඤවිමුත්තිං 332

	පිටුඅංකය
පඤ්ඤාසම්පදා	366
පටලිකං	12, 114
පටිකං	12, 114
පටිකරොසි යථාධම්මං	148
පටික්කමන්ත	124
පටික්කොසිං	92
පටිගාහකෙසු	268
පටිඝසඤ්ඤානං	60, 402
පටිඝං	44
පටිවරිස්සති	162
පටිවජ්ජතං	146
පටිහාතු	244
පටිමොක්ඛතුං	160, 162
පටිවිනොදෙසි	268
පටිවෙදෙසි	86
පටිසල්ලිතො	326
පටිසංවෙදිස්සන්ති	78
පටිහරෙය්‍යාම	274
පඨමපෙස්සං (දන්තානි)	276
පඨමං ඛ්‍යානං	128
පඨවිකායං	96
පඨවිමණ්ඩලං	260
පණිධිසම්මා	20
පණිතා	20
පණ්ඩිතක	216
පණ්ඩිතවේදනීයා	20
පණ්ඩුපුත්තං	132
පණ්ණරසෙ	82
පත්පති	266
පතිට්ඨාපෙසි	440
පතිමානෙන්තා	214
පත්තධම්මා	220, 320
පත්තාළකා	12
පත්තිකො	88
පථගමනං (වඩිමුස්සරියානං)	18
පදකො	150
පදසංගෙව	216
පදුට්ඨචිත්තා	34
පදුමිනියා	130
පදූසෙන්ති	34
පධානමඤ්ඤාය	22
පධානං	22
පන්ථදූහනං	262
පපාතා	94
පබ්බජති	32
පබ්බජ්ජං	108
පබ්බතං	124
පබ්බාජ්ජනාය	262
පබ්බාජෙය්‍යුං	168
පබ්‍යාකාසි	160
පයතං	210
පයිරුපාසෙය්‍යාම	82
පරං විය මත්තාය	402
පරඛෙත්තං	550
පරමදිට්ඨධම්මනිබ්බානං	60
පරමනිගීතතං	172
පරමසක්‍යා	160
පරමාය වණ්ණපොක්ඛරතාය	226
පරම්පරං සංසත්තා	600
පරම්මුඛිං	548
පරසෙනපමද්දනා	152
පරාගීතො	126
පරාමසති	28
පරිකම්මානි	274
පරික්ඛයා	332
පරික්ඛාරා	276
පරික්ඛාරා (යඤ්ඤස්ස)	264
පරිවාරකො	206
පරිවාරෙති	62
පරිවුත	138
පරිජ්ගුවත්‍ථා	46
පරිණතො	50
පරිතසිතවිප්පකිතං	70
පරිතස්සතා	30
පරිත්තං	78
පරිත්තසඤ්ඤී අත්තා	54
පරිපක්කං වා සම්මා	94
පරිපන්ථෙ තිට්ඨතො	90
පරිපාචෙති	546
පරිපාචෙස්සාම	94
පරිපූණ්ණකායසක්ඛිට්ඨාගාරො	260
පරිපූරානි	130
පරිපූරෙති	128
පරිපථරති	128

	පිටුව
පරිපඤ්ඤාති	130
පරිපඤ්ඤාසකං	128
පරිබ්බාජකසතෙ	94
පරිබ්බාජකො	2, 418
පරිභවෙය්‍ය	234
පරිභුඤ්ජෙය්‍ය	544
පරිමජ්ජති	136
පරිමද්දනං	12
පරිමසි	212
පරිමුඛං	124
පරියන්තකතෙ	94
පරියන්තවතිං	8, 110
පරියාපන්නා	78
පරියායභත්තං	364, 366
පරියායමසාසි	388
පරියොගාළ්හධම්මා	220, 320
පරියොනද්ධා	610
පරියොනාහා	610
පරියොසානකල්‍යාණං	150
පරිවත්තිමෝ	38
පරිවසති	386
පරිසගතො	246
පරිසඤ්ඤි	128
පරිසන්නානි	130
පරිහාරපථං	12, 114
පලෙමහසි	86
පලාලපුඤ්ජං	124
පලුඛකං	12, 114
පලුඛකං ආහුජිත්වා	124
පලුඛකා කමති	136
පලෙලාමෙ	166
පවත්තඵලභොජිනො	206
පවත්තඵලභොජී	366
පවත්තාරො (මත්තානං)	600
පවත්තෙතසි	216
පවුටා	94
පවුත්තං	210, 598
පවෙදෙති	20
පසාරිතෙ	124
පසාධකායො	128, 334
පසුමතති	128
පහිතත්තතා	386
පහූතජාතරූපරජතො	260
පහූතජිවහතාය	214
පහූතධනධඤ්ඤ	260
පහූතවිත්තූපකරණො	260
පහෙනගමිතානුයොගා	112
පළෙති	94
පා	
පංසුකූලානි	366
පාටිහාරියානි	486
පාණිසරං	10, 114
පාණුපෙතං	146
පාතිමොක්ඛසංවර සංවුතො	110
පාතසතනිධිං	10, 112
පාපියො	404
පාඝතං	262
පාමොජ්ජං	334
පායාසි	86
පාරගවෙසී	606
පාරගාමී	606
පාරතික්‍ඛො	606
පාරාපාරං	606
පාරිසජ්ජා	264
පාරිසජ්ජේ	160
පාවචනෙ	150
පාසාදිකා	82
පාහුනෙ	166
පි	
පිඤ්ඤාකහක්ඛා	366
පිවතිතො	2
පිණ්ඩදායකා	88
පිණ්ඩපාතපටික්‍ඛිත්තා	124
පිතා භූතභව්‍යානං	30
පිතාමහයුගා	226
පිතිතො	168
පිඝරූපානි	326
පියවාදි	104
පිසුණං වාචං	110
පී	
පීතිගතං	62
පීඨිහක්ඛා	30
පීතිමනසා	128

පිටඨඛකා

පිතෙ 124
පිතෙනති 88

ප

ප්‍රකෘතිකඛගයා 30
ප්‍රණිධිරීකිනියං 130
ප්‍රණිමිය 82
ප්‍රතිපත්කරාතං 232
ප්‍රතිපිපායතනානි 88
ප්‍රඛකා ඉසයො 600
ප්‍රඛනතකපිකා 20
ප්‍රඛනතං ආරඛ 20
ප්‍රඛනතානුදිවසිනතා 20
ප්‍රඛනතාපරනතකපිකා 66
ප්‍රඛපුරිසො 162
ප්‍රඛභාසී 231
ප්‍රඛුවඨායි 104
ප්‍රඛෙනිවාසං 22
ප්‍රඛෙනිවාසානුස්සතිඤාණය 104
පුරක්ඛතෙ 88
පුරාණඛඩිතං 540
පුරිමිතරානි 390
පුරිමානි දිවසානි 390
පුරිසකාරෙ 92
පුරිසථාමෙ 92
පුරිසදම්මසාරථි 86
පුරිසන්තරගතාය 364
පුරිසපරක්කමෙ 92
පුරිසභූමියො 94
පුරිසලක්ඛණං 16
පුරොහිතං 262

පෙ

පෙක්ඛං 112
පෙක්ඛානං 10
පෙමණියා 110
පෙසකාරා 88
පෙහාවා 94
පෙසසා 274

පො

පොරාණානි ඉණමූලානි 126
පොරිසා 226
පොරි 8, 110

පිටඨඛකා

ඵ

ඵන්දයතො 90
ඵරුසං වාචං 110
ඵරුසා 156
ඵලකවිරං 366
ඵලකසෙය්‍යං 366
ඵස්සපච්චයා 72
ඵස්සායතනෙහි 78
ඵළිකිජං 112
ඵාසුවිහාරං 438

බ

බිතා 484

බු

බුසති 22
බුස්ස බුස්ස ඛ්‍යන්ජිකරොති 78, 94

ඛ

ඛඩිතං 608
ඛඩිතාගාරෙ බඳ්ධා 126
ඛඩ්ගපාදූපච්චා 154
ඛරිහිසපායය 274
ඛලගතං 10, 114
ඛලමත්තතා 126
ඛලි 274
ඛලිබුද්ධිරෙය්‍ය 262
ඛවහිරිවා 596
ඛහුජනකන්තා 110
ඛහුජනමාතාපා 110
ඛහුස්සුතක 216

ඛා

ඛාලෙ 94, 234

ඛී

ඛීජගාමි 8, 10, 112
ඛීජඛීජමෙව 112
ඛීජභත්තං 262

ඛු

ඛුද්ධං සරණං ගච්ඡති 280
ඛුද්ධා 86
ඛ්‍යාපාදපදෙසං 124

පිටුව අංකය

බ

ब्रह्मकायिका 532
ब्रह्मचरियं 6, 94
ब्रह्मचारी 6
ब्रह्मजालं 2, 80
ब्रह्मसुद्दसङ्घाता 364
ब्रह्मसुद्दू 369
ब्रह्मसुद्दूय पञ्ञाय 230
ब्रह्मदेय्यं 150
ब्रह्मविहारा 608
ब्रह्मयानियो 532
ब्रह्मलोकगामिनिया पटिपदाय 616
ब्रह्मवच्चसी 226
ब्रह्मवण्णी 226
ब्रह्मसंवत्तनाय 596
ब्रह्मं 30, 534
ब्रह्मुनो सहव्यतताय मग्गं 616

ब्रा

ब्राह्मणकरणा 608
ब्राह्मणधूतं 324
ब्राह्मणं पसुपेति 236
ब्राह्मणिं पजं 616
ब्रह्मणी 604
ब्राह्मणो 366

भ

भगवन्तरूपो 90
भत्तं वस्स नवज्झादेति 126
भत्तवेतनं 262
भयं 18
भयतज्जिता 274
भयदस्सावी 110
भवं 274
भवपच्चया जाति 78
भवासवापि 144
भव्यानं 80
भसमत्ता 96
भस्सकस्सुद्दव 600

भा

भाविततयो 242
भाजनविकत्तिं 136
भासितं 124

भि

भियो 380

भु

भुञ्जसो 126

भू

भूतं 416
भूतगामं 8, 110
भूतभव्यानं 30
भूतवादी 110, 352
भूतविज्जा 16
भूतो 548
भूमिवालो 18
भूरिकम्मं 20
भूरिविज्जा 16

भे

भेरिसद्दम्पि 138
भेसज्जमत्तता 428

भो

भोगक्खन्धं 106

म

मक्खिका 364
मगधानं ब्राह्मणगामो 248
मिगामेसो 594
मधुरवज्जि 420
मज्झं 364
मज्झगुम्बम्पि 146
मज्झिमसल्लाणा 150
मज्झिमसिखरकेन 144
मञ्ञसु 46, 266
मञ्चरुपि 164
मणिका 488
मणिलक्खणं 16
मणि वेळुरियो 132
मण्डन 12, 110
मण्डनजातिकका 138
मण्डलमाले 4, 86
मत्तता 372
मत्तिकाय 136
मनापचारी 104
मनिन्द्रियं 122

පිටුඅංකා

මනසිකං 12, 114
මනොපදොසිකා 34
මනොමයං කායං 134
මනොමයා 30
මනොමෙයා 60, 408
මනොමයො අත්තපටිලාභො 424
මන්තජ්ජිකා 226
මන්තධරො 150, 226
මන්තපදං 210, 598
මන්තා 238
මන්තානං කත්තාරො 210
මන්තානං පවත්තාරො 210
මෙඝු 48
මසාණෙති 366
මහග්ගතං චිත්තං 138
මහච්ච 86
මහතුපට්ඨානං 18
මහානගා 88
මහානිසංසතරො 280
මහාපුරිසලක්ඛණානි 212
මහාපුරිසස්ස 152
මහාබ්‍රහ්මා 30, 534
මහාභූතා 530
මහායඤ්ඤෙ 248
මහාරාජානො 528
මහාසයනා 112
මහිඳමච්චයාම 608
මහෙසක්ඛතරො 32

මා

මාගධකා 324
මාතාපෙතිකාසම්භවො 60, 132
මාතකූටා 8, 112
මානවාදවිනිබ්ධං 172
මානවාදෙ 172
මානුසකා භොගා 260
මානුසො 94
මාලාකාරා 88

මි

මිගපක්ඛං 16
මිගලක්ඛණං 16
මිච්ඡාජීවං 16

පිටුඅංකා

මිච්ඡාදිට්ඨි 544
මිච්ඡාදිට්ඨිකම්මසමාදානා 144
මිත්තාමච්චෙ 88

මු

මුඛනිමිත්තං 138
මුඛභාගං 16
මුඛුල්ලාකකා 104
මුච්ඡිතා 608
මුඤ්චනති 536
මුඤ්ජමා 134
මුට්ඨිසුද්ධං 114
මුණ්ඩකා 154
මුත්තාවාරො 364
මුද 262
මුදිඞ්ගසද්දම්පි 138
මුදුචිත්තං 220
මුඳ 18
මුද්දිකා 88
මුධා ඵලිස්සති 162
මුධාවසිත්තා 122
මුසලමන්තරං 364
මුස්සති 34

මූ

මූලබීජං 112
මූලභෙසජ්ජානං අනුපඛනං 20
මූසිකවණ්ණං 16
මූසිකවිජ්ජා 16
මූළ්හස්ස 146

මෙ

මෙණ්ඩයුද්ධං 114
මෙණ්ඩලක්ඛණං 16
මෙත්තාචිත්තං 368
මෙරයං 364

මො

මොක්ඛවිකං 12, 114
මොඝමිදුදං 412
මොඝො 430
මොදතං 274
මොමුහො 48

පිටුඛකා

ය

යගෙහ 104
යජතං 268
යජ්ජෙතා 90
යඤ්ඤකාලො 264
යඤ්ඤදානය 248
යඤ්ඤසම්පද 250, 276
යඤ්ඤසාමි 276
යඤ්ඤවංසෙ 276, 322
යඤ්ඤේ 166
යන්වාධිකරණමේතං 122
යථරිව 154
යථාඅකුසලං 146
යථාකථං 216
යථාකම්මූපගෙ සත්තෙ 142
යථා පටිපන්නානං 426
යථාපෙමං 88
යථාබාලං 146
යථාභුච්චං 20
යථාභූතං 28
යථාමුළ්හං 146
යථාවජ්ජං 12, 114
යථාසන්තතිකො 366
යදගෙහ 326
යදාකඛසි 88
යදිදං 122
යසස්සී 82
යසොලද්ධා 236

යා

යාජෙතා 276
යානසන්නිධිං 112
යාමිවහයාම 608
යාවතිකා 88

සි

සිවථං 96
සිවථස්ස 268
සිවත්ථිකාමස්ස 268

සු

සුවා 138

ශ්‍රී

ශ්‍රුපත්ථාය 274

ශෙ

ශෙනකාමඛකෙ 126
ශෙතුශ්‍යෙන 30

ශො

ශොනිපමුඛසතානි 92
ශොතිසො 234

ර

රක්ඛාවරණගුත්තිං 104
රජකා 28
රජතං 320
රජනීයානි 328
රජාපථෙ 108
රජෝජල්ලධරෙ 366
රජෝධාතුයො 94
රත්තිධම්මං 34
රත්තඤ්ඤු 82
රත්තූපරතො 8, 110
රථකං 12, 114
රථත්ථරං 12, 114
රපිකා 88
රට්ඨපත්ථරෙ 210
රහසා 156
රහදම්ව 88
රහොගතස්ස 260

රා

රාගො 44
රාජදණ්ඩං 150
රාජපුත්තා 88
රාජභණ්ඩිතං 210
රාජභොගං 150
රාජාගාරකෙ 2
රාජාමච්චපරිවුතො 82
රාසිකෙ 262
රාසිවඩ්ඪකො 106

රි

රිත්තකඤ්ඤව 600

පිටුඅංකා

රූ

රුක්ඛමූලං 124
රූපසඤ්ඤිතං 60
රූපසඤ්ඤිතං සමතික්කමා 402
රූපී 60
රූපී අත්තා 54, 56
රූපී ච අරූපී ච අත්තා 56

රෝ

රෝගො 18

ල

ලක්ඛණඤ්ඤූ 82
ලජ්ජී 6
ලඤ්ඡිකා 158
ලපකා 14
ලඝුජං ව්‍යාකරෙය්‍ය 92
ලහුවත්‍ථානං 438
ලහුසා 156

ලි

ලිච්ඡවිපරිසාය 324

ලූ

ලූඛාජීවිං 356
ලූසිංසු 274

ලෙ

ලෙණගවෙසී 164

ලො

ලොකං 22
ලොකක්ඛායිකං 14
ලොකනිරුත්තිඅයා 436
ලොකපඤ්ඤත්තිඅයො 436
ලොකවිදූ 86
ලොකවොහාරා 436
ලොකසමඤ්ඤා 436
ලොකායතං 18
ලොකායතමහාපුරිසලක්ඛණේසු අනවයො 150
ලොහධම්මං 540
ලොමහට්ඨජාතා 86, 164
ලොමහංසො 86
ලොහිතඅහාමිං 16

පිටුඅංකා

ව

වඩ්ඪකං 12, 114
වච්ඡතරසතානි 248
වච්ඡතරීසතානි 248
වජෙජ්සු 110
වඤ්චන 8, 112
වඤ්චෙසි 86
වඤ්ඤා 98
වඤ්ඤා 22
වට්ටකයුද්ධං 114
වට්ටකලක්ඛණං 16
වණවජ්ජිතතාය 80
වණවපටිබද්ධානි 80
වණණං 20
වණණවන්තතරො 32
වණ්ණා 238
වත හො 82
වතෙන 94
වට්ටලක්ඛණං 16
වට්ටසන්නිධිං 112
වඩ්ඪකම්මං 20
වත්තුපරිකම්මං 20
වත්තුපරිකිරණං 20
වත්තුවිජ්ජා 16
වත්තුහි 22
වදෙන්ති 358
වඩ්ඪකිත්ත 112
වඩිඪා 168
වනපත්ථං 124
වනමූලඵලාහාරෙ 366
වමනං 20
වමෙහනෙතා 156
වයො අනුප්පත්තෙතා 82
වයො (හොගානං) 126
වසවත්තී 30, 532, 612
වසී 30
වස්සකම්මං 20
වළවාරථමාරුයා 154
වංසං 10, 114

වා

වාකචීරං 366
වාවාවිකෙඛපං 44, 46

පිටුඅංකා

වාවාසතතිතොදකෙන 414
වාවිතමනුවාවෙනති 210
වාදානුවාදෙ 356
වාදිතං 112
වායසවිජ්ජා 16
වායොකායං 96
වාහනෙ 212
වාලකම්බලං 366
වාලවිජ්ජති 12
වාලවෙධිරූපා 46, 358

විකවභොජනානුයොගං 366
විකතිකං 12, 114
විකාලභොජනා 110
විකිරණං 18
විකිත්තනවිත්තං 138
විගවජිස්සති 268
විගතකථංකථො 220, 320
විගතවාපලෙලා 230
විගතාභිජ්ඣෙන 124
විගතූපක්කිලෙසෙ 136, 138, 140
විඤ්ඤාණං 596
විඤ්ඤාණිකකථං 14
විඤ්ඤාතො 44
විවාරිතං 62, 488
විවිකිච්ඡති 214
විවිකිච්ඡා 124
විවිකිච්ඡානීවරණං 610
විවිත්තකාළකං 212
විවෙකවිජ්ජා 16
විජ්ජාසම්පදා 206
විජ්ජාසම්පන්නො 86, 206
විඤ්ඤාණං 538
විඤ්ඤාණඤ්චායතනසුඛුම සච්ච-
සඤ්ඤා 400
විඤ්ඤාණඤ්චායතනූපගො 62
විඤ්ඤාපනියා (අත්ථසා) 226
විතක්කිතං 62, 488
විතක්කෙකථ 488
විත්ථායිතත්තා 616
විදිතධම්මො 320, 220
විධා (තිස්සො) 268

පිටුඅංකා

විනයවාදී 110
විනීවරණවිත්තං 220
විපතෙය්‍ය 276
විපරාමොස 8, 112
විපරාවත්තං 14
විපරිණමනති 98
විපරිණාමධම්මා 62
විපරිණාමඤ්ඤථාභාවා 62
විපරියායනති 212
විපුලා 260
විපක්කතා 4
විපපටිසාරො 268
විපස්සනෙනා 132
විභවං 60
විභූසන 12
විභූසනට්ඨානා 112
විමුත්තං චිත්තං 138
විමුත්තසමිං විමුත්තමිතිඤාණං 144
විරාගාය 414
විරූඪිගබ්භකරණං 18
විරෙචනං 20
විලාපො 96
විලොකිතෙ 124
විවට්ටකපෙ 140
විවට්ටති 30
විවත්තවජ්ජෙ 152
විවදතං 18
විවරමනුපතති 98
විවෙරෙය්‍ය 146
විවාදෙ 596
විවාහතං 18
විවාහො 172
විවිච්ච 128
විවිත්තං සෙනාසනං 124
විවෙකජපීතිසුඛසුඛුමසච්චසඤ්ඤ
400
විසවිජ්ජා 16
විසාරදෙ 382
විස්සුකදස්සනං 10, 112, 114
විස්සට්ඨාය 226
විහඤ්ඤති 236
විහාරදානෙන 280
විහාරපච්ඡාභාගං 326

පිටුඅංකා

වි

විතදෙසං විත්තං 138
විතමෝහං විත්තං 138
විතරාගං විත්තං 138
විතිසඤ්චරන්ති 144
වීමංසානුචරිතං 26
වීමංසී 26
විරඹහරූපා 152

වු

වුත්තවාදිනො 356
වුඩ්ඪසීලෙන 226
වුඩ්ඪසීලී 226

වූ

වූපකට්ඨො 386

වෙ

වෙකටිකො 366
වේඨනං 246
වේඨනසපසාරිහි තාරීහි 212
වෙතාලං 10, 114
වෙදනානං සමුදයං 28
වෙදනාපච්චයා තණ්හා 78
වෙදයිතං 70
වෙදිසාරම් 152
වෙපුල්ලත්තං 426
වෙය්‍යාකරණං නාජ්ඣගා 536
වෙය්‍යාකරණස්මිං 80
වෙය්‍යාකරණාය 88
වෙය්‍යාකරණෙන 150, 212
වෙසාරජ්ජපත්තො 220, 320
වෙසයී 604

වො

වොක්කම්ම 548
වොදානං (වණ්ඩිමුසරිය තක්කත්තානං) 18
වොදානියා ධම්මා 426
වොහින්දන්තා 46, 358
වොරොපෙසි 146
වෙසක්කම්මං 20

පිටුඅංකා

ව්‍යා

ව්‍යාකරොති 46
ව්‍යාපාදනීවරණං 610
ව්‍යාබාධෙන්ති 98

ස

සඋත්තරවණ්ඩං 12, 114
සඋත්තරං විත්තං 138
සඋදෙසං 22, 140
සඋපපීළො 262
සකණ්ටකං 138
සකණ්ටකො 262
සකදාගාමී 332
සකම්මපස්සුතා 262
සකං චෙතනං 550
සකසඤ්ඤී 404
සකුණවිජ්ජා 16
සකුණිකා 158
සක්ඛරකඨලම්පි 146
සක්ඛිදිට්ඨො 598
සක්‍යකුලා පබ්බජිතො 150
සක්‍යජාති 156
සක්‍යපුත්තො 150
සඛිලො 230
සඛ්කමිත්ති 96
සඛ්කිත්තිසු 364
සඛ්කිරණං 18
සඛ්කිලිට්ඨචිත්තො 610
සඛ්කිලෙසං 18
සඛ්කිලෙසිකා 426
සඛ්ඛපණ්ව 138
සඛ්ඛලිඛිතං 108
සඛ්ඛිත්තං විත්තං 138
සඛ්ඛානං 18
සඛ්ඛියාධම්මො 4
සඛ්ඛසංසි 222
සංඝාටිපත්තචීවරධාරණෙ 124
සඛ්ඛාතං 274
සංඝි 82
සච්චවජ්ජෙන 90
සච්චසන්ධො 6, 110
සච්චො 430
සච්ඡිකත්වා 20

	පිටුව
සජිතා	30
සජෝතිභූතං	164
සජ්ජිතං	268, 274
සඤ්ඤානතා	156
සඤ්ඤාභාරිං	414
සඤ්ඤුගතං	404, 406
සඤ්ඤු	392, 406
සඤ්ඤුපෙතුං	594
සඤ්ඤුමයා	424
සඤ්ඤිං අත්තානං	54
සඤ්ඤිගබ්භා	94
සඤ්ඤිවාදා	54
සඤ්ඤුප්පාදං	50
සඤ්ඤුප්පාදා	408
සණ්ඨපෙසි	388
සණ්ඩසණ්ඩචාරිනී	364
සද්ධාපටිලාභෙන	108
සද්ධි	166
සති	34
සතිණකවෙත්‍රදකං	150
සතිසම්පජඤ්ඤේන	124
සතො සම්පජානො	124
සත්ත රතනානි	152
සත්තාගාරිකා	364
සත්තාහං විසුද්ධියා	92
සත්තාලෝපිකා	364
සත්තුස්සදං	150
සත්ථා දෙවමනුස්සානං	82
සත්ථාරෝ	548
සත්ථුසාසනා	548
සදෙවකං	108
සද්ධිතං චිත්තං	138
සඛිනා සහොගෝ	128
සනංකුමාරෙන	170
සනිඝණ්ඩිකෙවුහානං	150
සන්තත්තතාය	50
සන්තරබාහිරා	128
සන්තා	20
සන්තිකං	12, 114
සන්තිකමමං	20
සන්තික වචරෝ	440
සන්තිකෙ පච්චාගතො	536
සන්තුට්ඨෝ	124, 458
සන්ථාගාරෙ	156
සන්දස්සෙසි	268, 274
සන්දිට්ඨිකං සිප්පඵලං	88
සන්දිස්සසි	208
සන්ධිතා	110
සන්ධාවන්ති	22
සන්නිධිකාරපරිභොගං	10, 112
සපත්තෙ චිත්තෙ	544
සපත්තභාරෙ'ව	124
සපරිගාහෙහි	610
සපපටිභයං	128
සපි	434
සපිමණ්ඩා	434
සපිභොමං	16
සබ්බඛපච්චඛී	60, 424, 134
සබ්බතාපහං	538
සබ්බපාණභූතහිතානුකම්පී	6, 110, 124
සබ්බවාරිධ්‍රතො	100
සබ්බවාරිධ්‍රුවා	100
සබ්බවාරියුතො	100
සබ්බවාරිවාරිතො	100
සබ්බාකාරසම්පන්නා	132
සබ්බාවතො	128
සබ්‍යඤ්ජනං	150
සබ්‍රහ්මකං	108
සම්ඛකරණීං	110
සම්ඛනන්දී	8, 110
සම්ඛාරතො	8, 110
සම්ඛාරාමෝ	8, 110
සම්ඛිභූතො	62
සම්ණකා	154
සම්ණුදෙසො	326
සම්ණෝ	366
සමතිත්තිකා	606
සමනුගාහෙයුං	46
සමනුභාසෙයුං	46
සමනුයුඤ්ජෙයුං	46
සම්පන්නාසි	212
සම්පිතො	64
සම්‍යප්පවාදකෙ	388

	පිටුඅංකය
සමයො	30
සම්සමො	242
සමාදපෙසි	268, 440
සමාදයෙව පක්කමති	124
සමාදිසතු	484
සමාධික්ඛන්ධිසස	440
සමාධිජපීතිසුඛසුඛුම-සච්චසඤ්ඤ	402
සමාරකං	108
සමාරම්භා	8, 110
සමාහිතං චිත්තං	138
සමිඤ්ජිතං	126
සමිඤ්ජිතෙ	124
සමීපචාරී	440
සමුත්තේජෙසි	268
සමුදයං	28
සමුදයසඤ්ඤාති	544
සමූහනිස්සාමි	262
සමූහිතං	210, 598
සමෙති	598
සමෙහං වා චිත්තං	138
සම්පජානකාරී	124
සම්පජානි	206, 600
සම්පජ්ජලිතං	164
සම්පදඹිදං	540
සම්පඹිදති	214
සම්පහංසෙසි	268
සම්පායෙය්‍යං	46
සම්ඵප්පලාපං	110
සම්බහුලා	154
සම්බාධො	108
සම්බාහනං	12
සම්බොධිපරායණෙ	332
සම්මගතා	96
සම්මදෙව	220
සම්මත්ති	160
සම්මාදිට්ඨිකම්මන්තාජීවා	142
සම්මාපටිපත්තා	96
සම්මාමනසිකාරමත්තාය	22
සම්මාසම්බුජ්ඣිතෙතා	60
සම්මාසම්බුද්ධො	86
සම්මුඛා	536
සම්මුඛීභාවමපි	510
සම්මොදකො	230
සම්මොදනීයං	90
සම්මොසා	34
සයනාසනනිධිං	112
සයම්පටිභානං	26
සයම්පභා	30
සරණගමනෙහි	280
සරණගමෙහි	164
සරපරිත්තාණං	16
සරා	94
සරාගං චිත්තං	138
සලාකභත්තං	114, 12
සල්ලකත්තියං	20
සවෙරචිත්තො	610
සව්‍යාපජ්ඣචිත්තො	610
සස්සතවාදෙ	22
සස්සතිසමං	22
සස්සතො	22
සස්සමණබ්‍රාහ්මණිං පජං	108
සහධම්මිකො	162, 356
සහධමෙන	240
සහව්‍යතං	30
සහනාකාරා	8, 112
සහිතං	14
සංයමෙන	90
සංයොජනානං	332
සංවවකපෙ	140
සංවවති	30
සංවවමිවවකපෙ	140
සංවවමිවවං	24
සංවදනං	18
සංවධානි	130
සංවිගගා	86
සංවිදහෙය්‍යාම	106
සංවිධානං	262
සංවුතඉරියො	154
සංවුතො	104
සංසරතෙ	22
සංසාරසුද්ධිං	94
සංසුද්ධගහණිකො	226
සංහිතානං	8, 110
සඋගතං	388

පිටුව අංකය

සා

සාකච්ඡාමණ්ඩලං 366
සාකච්ඡාමණ්ඩා 158
සාකච්ඡාමණ්ඩා 158
සාකාරං 22, 142
සාක්ඛරප්පභේදනං 150
සාගරපරියන්තං 152
සාවියෝගං 8, 112
සාණානි 366
සාපථං 150
සාධුසම්මතා 82
සාපදේසං 8, 110
සාමඤ්ඤඵලා 548
සාමඤ්ඤඵලං 82
සාමඤ්ඤසඞ්ඛාතා 364
සාමඤ්ඤේ 366
සාමඤ්ඤේව 362
සාමා 420
සාමාකහලකා 366
සාමික්ක සිකා 220
සාමුද්දිකා වාණිජා 536
සායතතියකං 366
සාසිතෙ 124
සාරාණීයං 90
සාලාකියං 20
සාලීනං ඕදනං 212
සාවජ්ජසංඛාතා 358

සි

සික්ඛා 392
සික්ඛාපදානි සමාදියති 282
සිඛාඛණ්ඩං 12
සිඛාවලෙ 144
සිතා 78
සිපඵලං 88
සිපිසම්බුකම්පි 146
සිරිවිහානං 18
සිවවිජ්ජා 16

සී

සීලක්ඛන්ධස්ස 440
සීලපඤ්ඤතං 242
සීලපරිඛාතං 242

සීලසම්පදා 366
සීලසම්පන්නා 442
සීසවිරේචනං 20
සීහනාදං 382
සීහනාදසුත්තං 358
සීහා 358

සු

සුකවදුක්කටානං 48
සුකුසලෙ 390
සුක්කසඞ්ඛාතා 362
සුඛදුක්ඛි 54
සුඛුමවජිරකෙන 78
සුඛෙනති 88
සුගතෙ 86, 390
සුවිහුතෙන 6, 10
සුවිමංසුපසෙවතං 212
සුජාතෙ උභතෙ 226
සුඤ්ඤං බ්‍රහ්මවිමානං 30
සුතජාතස්ස 266
සුත්තගුළෙ 94
සුතෙන 124
සුදුජ්ජාතෙ 372
සුදදසෙ 210
සුද්ධි 104
සුනඛාත 212
සුපරිකම්මකතාය 136
සුපරිකම්මකතෙ 132
සුපිතා 94
සුබ්බුවසීඝ 18
සුභගකරණං 18
සුභවඨාසිතෙ 30
සුභික්ඛං 18
සුභෙ 132, 438
සුරියඝාණෙ 18
සුවිලිත්තා 212
සුසානං 124
සුස්සුසනති 548

සූ

සූද 88
සූරා 88, 152

පිටුව අංකය

ස

සෙවෙථ 30
සෙනාබ්‍යූහං 10, 114
සෙය්‍යො 404
සෙවිතබ්බා 362

සො

සොචයතො 90
සොතාපත්තෙ 332
සොත්ථිතා 126
සොත්ථිස්සාම 212
සොහනකං 10, 114
සොම්මවනයාම 608
සොවග්ගිකං 88
සොළසපරික්ඛාරං 250

සෙන

සෙනහපරෙතා 128
සෙනහානුගතා 128

හ

හටහත්ථෙ 366
හතාවසෙසකා 262
හත්ථත්ථරං 12
හත්ථබන්ධං 12
හත්ථූපලෙඛනෙ 364, 366
හත්ථාභිජ්ජපනං 18
හත්ථාරොහා 88

පිටුව අංකය

හත්ථිගවාස්සවළවාපටිග්ගහණෙ 112
හත්ථිගීවාය වා තිසිනෙනා 210
හත්ථිනිකා 86
හත්ථියානානි 86
හත්ථියුද්ධං 114
හත්ථිලක්ඛණං 16
හදයඞ්ගමා 8, 110
හනුජ්ජපනං 18
හනුසංහනනං 18
හන්ද ච ඨිති 148
හරායාම 486
හස්සඛිඩ්ඩාරතිධම්මසමාපන්නා 34

හා

හායනවඩ්ඪනෙ 94

හි

හිතානුකම්පි 544

හු

හුතං 96

හෙ

හෙවං 94

හො

හොන්තං 486

සඤ්ඤානාමානුක්කමණිකා

	පිටුඅංකා
අගගිවෙස්සන	120
අඞ්ගකො	240
අඞ්ගීරසො	210
අවෙලො කස්සපො	356
අජාතසත්තු	82
අජිතො කෙසකම්බලො	84
අච්චිමුඛො	210
අම්බලට්ඨිකායං	2, 246
ආනන්දො	438
ඉච්ඡානඞ්ගලං	150
ඊසාතො	608
උක්කාමුඛො	158
උද්දකො	356
උරුගිහඤ්ඤ	88
ඔක්කාකො	158
ඔට්ඨද්ධො	324
කණ්ණකත්ථලො	356
කරකණ්ඩු	158
කස්සපො	210, 326
කාසිකොසලං	546
කූටදන්තො	248
කූටාගාරසාලායං	324
කෙවට්ටො	484
කෙසකම්බලො	84
කොමාරභච්චස්ස	82
කොසම්බියං	334
කොසලෙසු	150, 540, 594
ඛාණුමතං	248
ගඟාරාය	222
ගිජ්ඣකූටෙ	384
ගොතමො	150
ගොසිතාරාමෙ	334
චඞ්කී	594
චම්පා	222
චම්පෙය්‍යකා	222
චාතුම්මහාරාජිකා	526
චිත්තො	416
චේතකො	440
ජානුස්සොණී	594
ජාලියො	334
ජීවකො කොමාරභච්චො	84
ජෙතවනෙ	388
තාරුක්ඛො	594
තාවතිංසා	528
තිත්ථකාවිරෙ	388
තුසිතා	530
තෙදෙය්‍යපුත්තො	438
තෙදෙය්‍යො	594
තාලජඞ්ඝ	2, 484
නිගණ්ඨො නාතපුත්තො	84
නිග්‍රොධො	384
නිම්මාණරතී	530
පකුධො කච්චායනො	84
පජාපතී	608
පරනිම්මිතවසවත්තී	532
පසෙනදි කොසලො	546
පූරණො කස්සපො	82
පොක්ඛරසාති	150, 594
පොට්ඨපාදෙ	388, 416
බිම්බිසාරෙන	222, 248
බ්‍රහ්මදත්තෙන	2
භගු	210
භාරද්වාජො	212
මෙඝියො	542
මක්ඛලි ගොසාලො	82
මණ්ඩිස්සො	334
මිතසාකටං	594
මල්ලිකාය	388
මහාවනෙ	324
මහාවිජිතො	260, 274
මහින්දං	608
යමිතග්ගි	210
යාමං	608
යාමා දෙවා	528
රාජගහ	2, 82, 384
ලොහිතච්චා	540
වජිරපාණී	164
වරුණං	608
වාමකො	210
වාමදෙවො	210
වාසෙට්ඨභාරද්වාජ	594
වාසෙට්ඨො	210

	පිටුඅංකය
වෙදෙහිපුත්තො	82
වෙසාලියං	324
වෙස්සාමිත්තො	210
සක්කො දෙවානමින්දො	528
සක්‍යකුලා	150
සඤ්ජයො බෙලට්ඨපුත්තො	84
සන්තුසිතො	330
සාලවතිකා	540
සාවත්ථි	388
සුනක්ඛත්තො	326
සුනිම්මිතො	532
සුප්පියො	2
සුභො මාණවො	440
සුයාමො	530
සොණදණ්ඩො	222
සොමං	608
හත්ථිකං	158
හත්ථිසාරිපුත්තො	416